# පැරණි අහසේ
# අලුත් සඳ

## ආචාර්ය පූජ්‍ය දොඩම්ගොඩ රේවත නාහිමියන් විසින් ලියන ලද වෙනත් කෘති

බාරාණසියං ඉසිපතනේ. (සිංහල)

දඹදිව බෞද්ධ සිද්ධස්ථාන. (සිංහල)

ලෝටස් පාත්. (ඉංග්‍රීසි)

ත්‍රිපිටක දීසදර්ශිකා. (හින්දි)

සිංහල භාෂා පරිචය. (හින්දි)

ථේරවාද බෞද්ධ ධර්ම යෝග ඔෟර්සාධනා, (හින්දි)

බුද්ධාස් ෆස්ට් ඇන්ඩ් ලාස්ට් සර්මන්ස්. (ඉංග්‍රීසි)

ඉන්දියානු බුදුසමයේ ඉතිහාසය. (සිංහල)

චීන බුදුසමයේ ඉතිහාසය (සිංහල)

ජපන් බුදුසමයේ ඉතිහාසය (සිංහල)

දඹදිව ධර්මදේශනා (සිංහල)

## 2011 - 2012 බුද්ධත්ව ජයන්තිය.

**සිදුහත් මහාබෝසතාන් වහන්සේ බුද්ධත්වය අවබෝධකරගෙන වසර 2600 ක් පිරෙන පිංබර මොහොතේ ඔබ සැමට පිරිනැමෙන දහම් තිළිණයයි.**

# පැරණි අහසේ අළුත් සඳ

## දෙවෙනි මුද්‍රණයේ පෙරවදන

සුප්‍රසිද්ධ වියට්නාම් ලේඛක තික් නත් හන් විසින් රචනා කර ඇති ග්‍රන්ථ ප්‍රමාණය විශාලය ඒවා ජනප්‍රිය වී ඇත්තේ ජාත්‍යන්තර වශයෙනි. "පැරණි අහසේ අළුත් සඳ" උන්වහන්සේගේ "ඕල්ඩ්පාත් වයිට් කලවුඩ්ස්" ග්‍රන්ථයේ සිංහල අනුවාදය ඕල්ඩ්පාත් වයිට් කලවුඩ්ස් සිංහලට පරිවර්තනය කලවිට පැරණි මාවත සුදුවළාකුළු යනුවෙන් කියවිය යුතුය. මේ වදන සිංහල පාඨකයාට හුරුනැති නිසා පැරණි අහසේ අළුත් සඳ නමින් නම් කලෙමු.

පැරණි අහස නම් වේදවේදාන්තයි. අළුත් සඳනම් බුදුරජාණන් වහන්සේයි. දඹදිව වේදවේදාන්ත තුලින් මතුවූ ශාස්තෘවරුන් බොහොමයකි. නමුත් ඒ අතරින් සඳක් හැටියට ලෝකයට පෙන්විය හැක්කේ මහාකාරුණික බුදුරජාණන් වහන්සේය.

වේද වේදාන්ත අනුගමනය කරන අය පැරණිමතයේම එල්බගෙන තම ජීවිතය ගතකරති. නෑම, නිපොතු කැපීම, කෙස් කැපීම, මරණයේදී හිසහුගෑම, අංක තුනක දෙයක් අතට නොගැනීම, සතියේ දවස් ගනනට කෑම වර්ග කිරීම, සෙනසුරාදාට කිචඩි පමණක් කෑම ආදී තිස්තුන්කෝටියක් දෙවිවරුන්ට ගැලපෙන ආකාරයට කටයුතු කිරීම මේ අයගේ සමාජක්‍රමයයි. මේ නිසා සිංහලෙන් කීවොත් එකතැන පල්වෙමින් පවතින සිතුවිලි සමූහයකින් මේඅය වෙලී සිටින බව දැනගත හැක.

අළුත් සඳ හැටියට පෙන්නුම්කරන බුදු රජුන්ගේ දහමේ කිසිම බැඳීමක් නැත. එය නිදහස් සිතුවිල්ලකි. මේනිසා බුදුදහම නිසියාකාරව අදහන අය හැම අතින්ම ප්‍රගතිය කරා ගමන් කරයි. කිසිම වස්තුවකට බැඳීමක් නැතිව සැමටම සමාන මෛත්‍රී කරුණා ආදි සිතුවිලි වඩමින් නිදහස් සැහැල්ලු ජීවිතයක් ගත කිරීම බෞද්ධ ලක්ෂණයයි.

පැරණි අහස වේදවේදාන්ත සඳහාත් අලුත් සඳ බුදුරජාණන් වහන්සේ හැටියට දැක්වූයේ මේනිසාය.

ථෙරවාදී බෞද්ධ පරම්පරාවට සම්පූර්ණ වූ බුද්ධචරිත ග්‍රන්ථයක් මේ දක්වා නැත. අපවත්වී වදාළ අගගමහාපන්ඩිත බලංගෙඩ ආනන්ද මෛත්‍රිය මහානායක මා හිමියන් විසින් රචිත බුද්ධ චරිතයත් සම්පූර්ණ වූවක් නොව උන්වහන්සේ අපවත් වීමට පෙර මෙකී ග්‍රන්ථය සංශෝධනය කිරිමට බලාපොරොත්තුව සිටියත් එසේ කිරිමට හැකි උනේ නැත.

ශ්‍රී ලංකාවේ සමහර මිෂනාරි පාසල්වල දරුවන්ට මිෂනාරින් බුද්ධචරිතයේ වැරදි පෙන්වා පුංචි දරුවන්ගේ මල්කැකුලු වැනි හදවත් බුදු දහම කෙරෙහි කලකිරවීමට පත්කරන අදහසක් දක්වන බව ප්‍රසිද්ධකරුණකි.

උදාහරණයකට ගතහොත්

සිදුහත් මහාබෝසතුන් රාහුලකුමරුන් ඉපදුන දාම රාත්‍රියේ යශෝධරාදේවිය හා රාහුලකුමරුන් අතහැර බුදුවීමට ගිය ගමන ගැන වැරදි හැඟීම් ඇතිකර කලකිරීමට පත්කරවති.

පැරණි අහසේ අළුත් සඳ ග්‍රන්ථයේ මේ ප්‍රශ්නයට මනාව පිළිතුරු දී ඇත.

බුදු දහම පිලිබඳ ක්‍රිස්තියානි මිෂනාරීන් පතුරුවන වැරදි අදහස් සියල්ලටම පැරණි අහසේ අළුත් සඳේ පිළිතුරු ඇත. මේ නිසා ශ්‍රී ලංකාවාසි සෑම බෞද්ධයකුම පැරණි අහසේ අළුත් සඳ කියවිය යුතුය.

පොත කියවන විට දැනෙන්නේ බුදුරජුන් තමන් සමග එකට ගමන් ගන්නා ආකාරයයි.

පොත කියවා අවසාන වනවිට අනිත්‍ය, දුකඛ, අනාත්ම යන ත්‍රි ලක්‍ෂණයේ ඡායාවක් හදවතට දැනීම සිදුවේ.

සිදුහත් මහාබෝසතානන් වහන්සේ බුද්ධත්වය අවබෝධකරගෙන වසර 2600 ක් ක්‍රි. ව. 2011 දි සම්පූර්ණ වේ. මෙකී උතුම් අවස්ථාවට ශ්‍රී ලංකාවාසීන්ට උතුම් ධර්ම ත්‍යාගයක් හැටියට මේ පොත නොමිලයේ ලබාදීමට

තායිවානයේ ප්‍රධාන සංඝනායක ශ්‍රී ලංකාවේ ජනාධිපති අතිගරු මහින්ද රාජපක්‍ෂ මැතිතුමාගේ ජාත්‍යන්තර ආගමික කටයුතු පිලිබඳ උපදේශක පූජ්‍ය ආචාර්ය බොදාගම චන්දිම ස්වාමින් වහන්සේ ඉතා සතුටින් බාරගත් බව සඳහන් කරන්නේ උන්වහන්සේට නිදුක් නිරෝගී දිගාසිරි පතමිනි.

මේගාසන හිතකාමි
ආචාර්ය දොඩම්ගොඩ රේවත නාහිමි
ඉන්දීය මහාබෝධි සමගමේ මහ ලේකම්
භාරතයේ ප්‍රධාන සංඝනායක
ශ්‍රී ධර්මරාජික චෛතිය විහාරය
මහාබෝධි මුලස්ථානය
කල්කටා, ඉන්දියා.
01-07-2010

දුරකථන. - 0091-33-22415214
ෆැක්ස්. - 0091-33-22199294
විද්‍යුත් තැපෑල - mbsi_kolkata@yahoo.co.in

භික්ෂු තිච් නාත් හන්ගේ

# පැරණි අහසේ අලුත් සඳ

පරිවර්තනය

ආචාර්ය පූජ්‍ය දොඩම්ගොඩ රේවත හිමි

සියලු හිමිකම් ඇවිරිණි.

© ආචාර්ය පූජ්‍ය දොඩම්ගොඩ රේවත හිමි

ප්‍රථම මුද්‍රණය : 2008 ජනවාරි

ISBN 978-955-661-110-6

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය - ප්‍රකාශනගත සුචිකරණ දත්ත

හන් හිමි, තිච් නාත්
පැරණි අහසේ අලුත් සඳ = Old path white clouds/
තිච් නාත් හන් හිමි; පරි. දොඩම්ගොඩ රේවත හිමි විසිනි.-
කොළඹ : සදීපා ප්‍රකාශන, 2008.-
පි. 568; සෙ. මී. 21
ISBN 978-955-661-110-6 මිල : රු. 850.00
i. 891.483 ඩිවි 22 ii. ග්‍රන්ථ නාමය
iii. රේවත හිමි. දොඩම්ගොඩ - පරි
1. ප්‍රබන්ධ - සිංහල

"PARANI AHASE ALUTH SANDA"

Sinhala translation of "Old Path White Ctouds"

By Ven. Thich Nhat Hanh Thero of Viatnam

Translated in to Sinhala by

**Dr. Ven. Dodangoda Rewatha Thero**

Published by

SADEEPA PUBLISHING HOUSE

1060 Maradana Road

Colombo 08, Sri Lanka

Printed for free distribution by

**The Corporate Body of the Buddha Educational Foundation**

11F., 55 Hang Chow South Road Sec 1, Taipei, Taiwan, R.O.C.

Tel: 886-2-23951198 , Fax: 886-2-23913415

Email: overseas@budaedu.org

Website:http://www.budaedu.org

**This book is strictly for free distribution, it is not for sale.**

**නොමිලයේ බෙදාදීම පිණිසයි.**

# කර්තෘගෙන්........

මේ ග්‍රන්ථය සම්පාදනය කිරීමේ දී මා කිසිම සම්ප්‍රදායක් අනුගමනය කළේ නැත. ථේරවාදය සහ මහායාන යන බුද්ධාගමේ සම්ප්‍රදායන් දෙකින්ම කරුණු ගෙන බුදුරදුන්ගේ උත්තරීතර මනුෂ්‍යත්වය සහ මහා කරුණාව, මෛත්‍රිය, සමානාත්මතාව ආදී උතුම් මානුෂික ගති ගුණ හුවා දැක්වීමට මම මෙහි දී මහන්සි දැරුවෙමි. මහායාන ග්‍රන්ථවලින් කරුණු ගැනීමේ දී ඉතාම කල්පනාකාරී වීමි.

බුදුරදුන්ගේ මූලික ගුණාංග ඇති කොටස් හැකි පමණ මෙම ග්‍රන්ථයට එකතු කිරීමට උත්සාහ ගත් බව ග්‍රන්ථය කියවීමේ දී වටහා ගත හැකිය. නිකාය සහ ආගම බුද්ධ දේශනාවට ඉතාම සමීපය. නමුත් කාලය ගතවීමත් සමඟ මේ සියල්ලේම පරිවර්තනයක් සිදු වූ බව ද පිළිගත යුතුය. මේ නිසා වර්තමාන බුදු දහම ගැන කතා කිරීමේ දී ථේරවාද සහ මහායාන යන සම්ප්‍රදාය දෙක ගැනම දැනගත යුතුය. මේ සම්ප්‍රදාය දෙක ගැනම දන්නා අය ඉතාම අඩුය.

බුදුරදුන් ලෝකෝත්තර, දිව්‍යමය, අද්භූත, දිව්‍ය පුත්‍රයෙකු හැටියට දැක්වීමට මා කිසිසේත්ම සිතුවේ නැත. එදා සමාජයත් එදා තම ශිෂ්‍ය පිරිස නිසා ඇති වූ සමාජ තත්වය ගැනත් විස්තර කිරීමට මම උත්සාහ ගතිමි. මේ ග්‍රන්ථයේ දී බුදුරදුන් මට සහ ඔබට උත්තම ආධ්‍යාත්මික පුරුෂයෙකු හැටියට පැහැදිලි වෙයි.

ස්ථාන සහ පුරුෂයන් පිළිබඳව ශබ්දාවලිය පාළි ග්‍රන්ථවලින් ගත් බව සඳහන් කිරීමට කැමැත්තෙමි. නමුත් සංස්කෘත හුරුව ද ඒ සඳහා ලබා දීමට ද මම සිත යෙදුවෙමි.

මීට

භික්ෂු තිච් නාත් හන්
(Ven. Thich Nhat Hanh)

# පරිවර්තකගෙන්

## පැරණි අහසේ අලුත් සඳ

අහස පැරණිය. සඳ අලුත්ය. බුදු දහම ස්වභාව ධර්මය අනුව ගැලපෙන එකම ධර්මයයි. අහස සහ සඳ ද එසේමය. සිදුහත් අවබෝධ කරගත් දහම පෙර බුදුවරු විසින් ද අවබෝධ කරගෙන ඇති බව අප දන්නා කරුණකි.

බුදුරජුන් බෞද්ධයන්ට ධර්ම දේශනා කළ බවක් ත්‍රිපිටකයේ සඳහන් වී නැත. දුකින් පෙළෙන සත්වයන්ට උන් වහන්සේ මෛත්‍රී, කරුණා, සමානාත්මතා, චතුරාර්‍ය සත්‍යය, මධ්‍යම මාර්ගය දේශනා කළහ.

උන් වහන්සේගේ අතීත කතාවේ සිට බුද්ධත්වය දක්වා කතාව සැම කෙනෙකුටම ආධ්‍යාත්මික ශක්තිය ලබා දෙන්නකි.

ථේරවාද සම්ප්‍රදායට අංගසම්පූර්ණ බුද්ධ චරිතයක් නැති නිසා අන්‍ය ආගමිකයන් බුදු සිරිතේ හිස් තැන් හුවා දක්වා අපේ පුංචි දරුවන්ගේ සමාජය නොමඟ යවන බව ප්‍රසිද්ධ කරුණකි.

වියට්නාම් ජාතික සුප්‍රසිද්ධ බෞද්ධ භික්ෂුවක් වූ භික්ෂු **තිච් නාත් හන්ගේ** "Old Path White Clouds" ග්‍රන්ථය භාෂා කිහිපයකට පරිවර්තනය වී ඇත. බුදු සිරිත ගැන ශ්‍රී ලංකාවේ අන්‍ය ආගමිකයන් සොයන හිස් තැන්වලට මේ ග්‍රන්ථයේ පිළිතුරු ඇත.

මේ ග්‍රන්ථය කියවන විට මට වැටහී ගිය කරුණු දෙකකි. මුල සිට අග දක්වාම දනෙන්නේ බුදුරදුන් තමන් සමඟ වැඩම කරවන බවයි. දෙවන කරුණ නම් ඉබේම වාගේ අනිත්‍යතාවට සිත යොමු වීමයි.

මේ ග්‍රන්ථය පරිවර්තනය කළා සේම පරිගණක යන්ත්‍රයේ සියලුම කටයුතු සකසා දීම සහිත අනර්ඝ පිට කවරයක් සකසා දීම යන වැදගත්ම කරුණු කිහිපය සිද්ධ වූයේ, ඉන්දියානු මහා බෝධි සමාගමේ බුද්ධගයා මධ්‍යස්ථානයේ සහායක භික්ෂූන්

වහන්සේ නමක් වූ පැල්පිට ඤාණෝභාස (මහින්ද) පොඩි හාමුදුරුවන් අතිනි.

ආචාර්ය පූජ්‍ය දොඩම්ගොඩ රේවත හිමි.
මහ ලේකම්
ඉන්දියානු මහාබෝධි සමාගම
ශ්‍රී ධර්මරාජික විහාරය
කල්කටාව.
2007 ජූනි 10

# OLD PATH WHITE CLOUDS
## මුල් කෘතිය පිළිබඳ කෙටි හැඳින්වීමක්

ගෞතම බුද්ධ චරිතය කේන්ද්‍ර කොට වියට්නාම ජාතික ආචාර්ය තිච් නාත් හන් මාහිමියන් විසින් ලියන ලද OLD PATH WHITE CLOUDS නම් කෘතිය බෞද්ධ සාහිත්‍යය පෝෂණය කරමින් විශ්ව සාහිත්‍යයට එක් වූ විශිෂ්ට ග්‍රන්ථයකි. වියට්නාම්, ප්‍රංශ, ඉංග්‍රීසි, හින්දි ආදී භාෂාවලින් දනට පළ වී ඇති මෙය හෙළ බසට නඟා පළ කිරීමට ආචාර්ය පූජ්‍ය දොඩම්ගොඩ රේවත හිමියන් පියවර ගැනීම සිංහල පාඨකයාගේ බලවත් ප්‍රසාදයට හේතු වනු ඇත. ප්‍රධාන කොටස් තුනකින් හා පරිච්ඡේද අසූ එකකින් සමන්විත මෙම සුවිසල් ග්‍රන්ථය හෙළ බසට නැඟීම පහසු කාර්යයක් නොවේ. අසීරු වූ එම කර්තව්‍යය පූජ්‍ය රේවත හිමියන් මැනවින් ඉටු කොට තිබේ. ලේඛන කලාවේ ප්‍රගමණයට පාදක වූ විෂය වස්තු අතර ගෞතම බුදුරජාණන් වහන්සේට සම කළ හැකි අන් වස්තුවක් නොමැත. එසේ ද වුව බුදුරජාණන් වහන්සේගේ ශ්‍රී සද්ධර්මය තත්වාකාරයෙන් දක ගැන්ම සඳහා සම්භාව්‍ය සිංහල සාහිත්‍යයෙන් ද දුරසථ වත්මන් සිංහල පාඨකයා සඳහා ලියැවෙන පොතපත විරල සමයෙක හෙළ බසින් මෙවැනි කෘතියක් පළ කිරීම කාලීන අවශ්‍යතාවක් පිරිමසාලීමක් වේ.

මහායාන බෞද්ධ රටක් වන වියට්නාමය මෑත අතීතයේ විඳි කටුක අත්දැකීම් සියැසින් දක ඇති තිච් නාත් හන් හිමියන් බෞද්ධ දර්ශනය හා ලෝක සාමය පිළිබඳ ලියා ඇති පොත්පත් සංඛ්‍යාව මහත්ය. මානව ගැටුම් නිරාකරණයේ දී බෞද්ධ දර්ශනය කොතරම් දුරට අදාළ විය හැකි ද යනු ඒ තුළින් පෙන්වා දීම උන් වහන්සේගේ අභිප්‍රාය විය. සාමය වෙනුවෙන් ඉටු කළ මෙහෙවර අරභයා උන් වහන්සේ 1967 දී නෝබෙල් සාම ත්‍යාගයෙන් පුදනු ලැබීය. සයිගොන්හි වෑන් හැන් බෞද්ධ සරසවියේ නිර්මාතෘ වන උන් වහන්සේ කලක් පැරිස්හි සෝර්බෝන් සරසවියේ ද එක්සත් ජනපද කොළොම්බියා සරසවියේ ද ආචාර්ය පදවි දැරූහ.

නවීන විද්‍යාවේ බලපෑම් නිසාදෝ බටහිර ලොව ආගම් ලඝු කොට සැලකීමේ ප්‍රවණතාවක් දක්නට ලැබේ. විද්‍යාව හමුවේ ඇතැම් ආගමික ඉගැන්වීම් දුර්මුඛ වීම මෙම ප්‍රවණතාවට හේතු

විය හැකිය. බුදු දහම ජීවන දර්ශනයක් මිස ආගමක් නොවන බවත් බුදුන් වහන්සේගේ ඉගැන්වීම් කිසියම් කාලයකට හෝ දේශයකට හෝ සීමා නොවූ නවීන විද්‍යාවලට ද අනුකූල ඒවා බවටත් ඉහත කී සමාජ කොටස් දැනුවත් කිරීම අවශ්‍ය කරුණක්ව පවතී. පිටු දැකිය යුතු ධර්මතා ලෙස බුදුන් වහන්සේ දේශනා කළ මෝහය හා තෘෂ්ණාව විසින් වෙළා ගනු ලැබූ ලොව ජන කොටස් අද දවසේ අත් විඳින දුක් පීඩා අසීමිතය.

ලොව පහළ වූ අද්විතීය ශාස්තෘන් වහන්සේ වන ගෞතම බුදු රජාණන් වහන්සේ ජීවමානව වැඩ විසූයේ මින් වසර දෙදහස් පන්සීයකට පෙරය. ගත වූ දීර්ඝ කාලය තුළ ඒ ඒ ගුරුකුළ විසින් ද සාහිත්‍යකරුවන් හා චිත්‍රමූර්ති ශිල්පීන් විසින් ද උන් වහන්සේ නන් අයුරින් නිරූපණය කරනු ලැබ තිබේ. බුදුන් වහන්සේ මහා පුරුෂයකු සේ නිර්මාණය වුව ද උන් වහන්සේ හෙළි කළ ආර්ය මාර්ගයෙහි ප්‍රායෝගික අගය ලොවට දායාද කිරීමේ කාර්යය නිම වී ඇතැයි සතුටු විය නොහැක. බෞද්ධ දර්ශනය බටහිර ලොවට ගෙන ගිය උගත් හිමිනමක් ලෙස කර්තෘ හිමියන් මෙම වරද නිවැරදි කරමින් බුදුන් වහන්සේගේ චරිතාපදානය හා සමඟ උන් වහන්සේ අවබෝධ කළ ශ්‍රී සද්ධර්මය සරල හා සුගම ශෛලියකින් වත්මන් පාඨකයා වෙත දායාද කිරීමට මෙම කෘතියෙන් පියවර ගෙන තිබේ.

සාම්ප්‍රදායික චරිතාපදාන ස්වරූපයෙන් බැහැර උසස් නව කථාවක ආකාරයෙන් නිරූපිත සිද්ධාර්ථ ගෞතම චරිතය වටා එක් කළ චරිත සමූහය හා සමඟ අනායාසයෙන් පෙළ ගැස් වූ සිද්ධි මාලාව මෙම රසවත් කෘතිය උසස් නිර්මාණයක් බවට පත් කරයි. මෙහි පැනෙන චරිත හා සිද්ධි ඉපැරණි ඒවා වුව ද ජීව ගුණයෙන් හා නවතාවෙන් අනූනය. නව අරුත් ඔස්සේ චරිත හා සිද්ධී හැසිරවීමෙන් සමාජයේ මුල්බැස පවත්නා සාවද්‍ය මත බැහැර කිරීමෙහි ද කතුවරයා ප්‍රශස්ථ උත්සාහයක් ගෙන තිබේ. සිදුහත්කුමරු තරුණ බිසවුන් හා දිනක් වයසැති රාහුල පුතුන් අත් හැර ගිහිගෙන් නික්ම යාමේ අසාධාරණයක් එම හේතුවෙන් යසෝදරාවන් තුළ බලවත් කළකිරීමක් ගොඩ නැඟී පැවති බවට වූ ආකල්පත් කතුවරයා මැනවින් බේරුම් කොට තිබේ.

මෙහි එන සිදුහත් කුමරු පිය රජුගේ ඇතැම් සීමා ඉක්මවා ගොස් රට වැසියාගේ සුව දුක් විමසා පිළිසරණ වන කාරුණික

කුමරෙකි. යසෝදරා හුදකලාව ද සැමියා කැටිව ද ගිලානෝපස්ථානය ආදී අසරණසරණ සේවාවල නිරත වන්නා වූ උත්තමාවකි. මිනිසුන්ගේ දුක්ඛ වේදනා මඟින් සැබෑ ලොව දකින කුමරා සසර දුක පිටු දකින සත්‍ය මාර්ගය සොයා යාමේ නොතිත් ආශාවෙන් පෙළේ. බිරියට මේ බැව් සැඟවිය යුතු නොවේ. දෙදෙනා අතර පවත්නා යහපත් සන්නිවේදනයෙන් කුමරිය මනා කොට දැනුවත් වේ. සිය අභිලාශය පහදමින් කුමරා පිය රජුගේ අවසරය පතයි. එවිට පුතනුවන්ගේ අත ගන්නා පිය රජු පුතු අමතයි.

''සිද්ධාර්ථ, මට ඔබ කොතරම් අවශ්‍ය දැයි ඔබ නොදන්නේ ද? මගේ සියලු බලාපොරොත්තු ඔබයි! මා හැර දා නොයන්න පුතණුවනි,''

''මා ඔබ හැර දා යනවා නොවෙයි පියාණෙනි! මා අවසර ඉල්ලන්නේ යම් කලකට පිට වී යාමටයි. විමුක්ති මාර්ගය සොයා ගත් සැනින් මම ආපසු එන්නෙමි.''

මුහුණ සෝ වළාවකින් වැසෙද්දී තවත් එක් වදනකුදු නොබිනූ පිය රජු ඇතුළුගැබට පිවිසිණි.

රාහුල පුත්‍ර ලාභයෙන් ද කුමරාගේ අපේක්ෂාව තුනී වූයේ නැත. සතර පෙර නිමිති දකින වල්ලභයාගේ අභිලාශයෙන් අසරණ වන යසෝදරා ඔහුගේ ගමන් මඟ නොඅවුරා භාර්යාවක විසින් ඉටු කළ යුතු පරම යුතුකම හමුවේ දැඩි තීරණයකට එළඹියාය. ඇය නොවලහා සැමියාගේ ගමනට අඩු වැඩිය සූදානම් කළාය. පිය රජුගේ හා ප්‍රජාපති සුළුමවුන්ගේ ද සියලු උපාය මාර්ග බිඳ වැටෙද්දී ඡන්න හමු වූ යසෝදරා ඔහු වෙත සියලු උපදෙස් දුන්නාය. දැන් සැමියාට තනි නැත. කන්ථක දුර ගමනකට සූදානම්ය. අභිනිෂ්ක්‍රමණය සිදුවන මොහොත කුමරියට දැනේ. උත්‍ර සල පුන් පොහෝදා තුරු හිස් මතින් පුන් සඳ අවරට යද්දී මැදුරේ සැදෑ සැණකෙළි සංගීත රාවය දුර්වලව ගොස් නතර විණි. ගමනට සුදුසු සැමියාගේ ඇඳුම් සකසා අසුන මත තැබූ ඇය රාහුල පුතු හා සයනට පිවිසියාය.

මිනිසත් බව ඉක්මවූ මහා පුරුෂයකු ලෙස හඳුන්වා දීමෙන් බුදුන් වහන්සේ පිළිබඳ ගොඩ නැඟී ඇති අනියත බිය දුරු කරනු වස් සිත් ගන්නා උත්සාහයක ද කතුහිමියෝ යෙදෙති. ගයාවේ බවුන් වඩන සිදුහත් තවුස් තෙම තම මිතුරු ස්වස්ති ගෙන ආ

ආහාරත් සුජාතාවන් පිදූ ආහාරත් සමසේ දරුවන් සමඟ අනුභව කොට එකම බඳුනෙන් පැන් ද පානය කොට ඉක්බිති මෙසේ පවසයි.

''දරුවනි, මිනිසුන් කුලය අතින් ගෙන උපදින්නේ නෑ. කොයි කාගේත් කඳුළු ලුනු රසයි. රුධිරය කාගේත් රතුයි. මිනිසුන් කුල වශයෙන් වෙන් කිරීමත් මදි පුංචිකම් කිරීමත් වරදක්. මෙය භාවනා කරද්දී මට හොඳින් පෙනී ගිය දෙයක්.''

හිරු නැඟ එද්දී මලින් බර නේරංජනා ගංතෙර තණ නිල්ලෙහි සක්මන් භාවනාවේ යෙදෙන සිදුහත් ඇඳුරන්ගේ නෙත් තමන් වෙත පිය නඟන ළමයෙක් කරා යොමු වෙයි. බුදු රැසින් දිලෙන සිද්ධාර්ථ ගෞතම ඇදුරන් දැක දරුවා මවිත වෙයි.

''ඇඳුරුතුමනි, ඔබ අද හුඟක් වෙනස්!''

''කුමක් ද සබඳනි, ඔබ මා තුළ දකින වෙනස?''

''එය තේරුම් කරන්න අමාරුයි, ඇදුරුතුමනි. ඔබ අද පෙනුමෙන් තාරකාවක් වගෙයි.''

දරුවාගේ හිස ආදරයෙන් පිරිමදින සිදුහත් ඇඳුරු, ''එහෙම ද? වෙන කුමක් සේ මා පෙනේ ද?''

''ඔබ මේ දැන් පිපුණු නෙළුම් මලක් වගේ. ගයා ශීර්ෂය මුදුනේ පායා එන පූර්ණ චන්ද්‍රයා වාගේ.''

''ඔබ හරියට කවියකු වගේ නේ. ඇයි අද උදෙන්ම?''

අන් දිනෙක අත් නුදුටු සැඩ සුළං සහිත මහා වර්ෂාව හේතුවෙන් පෙර දින රාත්‍රි දිරාපත් වහලෙන් තම නිවස තෙමී නින්දෙන් තොරව රැය පහන් කොට අළුයම ගවහලට ගොස් ඉක්බිති සිදුහත් ඇඳුරනට රාත්‍රි වර්ෂාවෙන් ගැහැටක් වී දැයි සොයා බලනු වස් පැමිණි බැව් කියා සිටී. චණ්ඩ මේඝයෙන් නොසැලී අනෝරා වැසි මැද පෙර දින රාත්‍රි තමන් සර්වඥතාවබෝධය කළ බැව් දරුවනට කිව යුතුය. අපර භාගයෙහි සෙසු දරුවන් ද හා සමඟ පැමිණෙන ලෙස උන් වහන්සේ ස්වස්තිගෙන් ඉල්ලා සිටිති.

''දරුවෙනි, මගේ ජීවිතයේ ප්‍රීතිමත්ම දවස අදයි. ආහාර පානාදිය සපයමින් මා දිරිමත් කළේත් උපකාර කළේත් ඔබයි. එබැවින් මේ සතුට ඔබටත් හිමියි.''

අපරභාගයෙහි දරුවන් අමතා උන් වහන්සේ එසේ පැවසූහ. පෙරදින රාත්‍රි තමන් වහන්සේ සත්‍ය මාර්ගය අවබෝධ කළ බැව් ද හෙළි කළහ. දරුවෝ ඉන් මහත් සතුටට පත් වූහ.

''එසේ නම් ඇඳුරුතුමනි, අපි බුද්ධ කියා ඔබ අමතන්නෙමු.'' දරුවන්ගේ යෝජනාවෙන් සතුටට පත් උන් වහන්සේ හිස සැලීමෙන් ඒ අනුදැකිති.

''ඔබ වහන්සේට බුද්ධත්වය සඳහා සෙවණ දුන් මේ වෘක්ෂය බෝධි වෘක්ෂය නොවේ ද? ඔබ හයමසක් බවුන් වැඩුවේ මේ පිප්පලී වෘක්ෂ සෙවණේ යැයි, සුජාතාවන් අපට කියා තිබෙනවා.'' නාලක නම් දරුවා පවසයි.

''වනයේ ඇති වඩාත් සිත් ගන්නා සුලු වෘක්ෂයයි මේ. එය බෝධි වෘක්ෂය යයි නම් කිරීමට අපට අවසර ද ඇඳුරුතුමනි?'' හිස සැලීමෙන් උන් වහන්සේ එය ද අනුමත කරති.

දරුවන්ගේ සිත් ගනු සඳහා කර්තෘ හිමියන් යොදා ගන්නා උපාය මාර්ගය අපූරුය. සිදුහත් ඇඳුරන් බුද්ධ ලෙසත් පිප්පලී වෘක්ෂය බෝධි වෘක්ෂය ලෙසත් දරුවන් විසින් නම් කරනු ලැබීම කොතෙක් නම් විචිත්‍ර ද?

බොහෝ සූත්‍ර දේශනාවල සඳහන් බුදුන් වහන්සේගේ ඍද්ධීන් හෝ අධිමානසික හෝ බලය මතුකොට නොපෙන්වීම කර්තෘවරයාගේ අභිප්‍රාය වී ඇත. එපරිද්දෙන්ම හීනයාන හා මහායාන සම්ප්‍රදායන් එකසේ අධ්‍යයනය කොට බුද්ධ චරිතය හා බුදුන් වහන්සේගේ මූලික ඉගැන්වීම් නිවැරදි ලෙස නැවත ලිවීමටත් එහි දී අසා දැන ගත් හෝ ජනප්‍රවාදයේ පැනෙන හෝ කරුණු අත් හැරීමටත් නිරායාසයෙන් පෙළඹෙති. බුද්ධ දේශනාවල එන දිව්‍ය, බ්‍රහ්ම ලෝක හෝ පිසාචාදී අමනුෂ්‍ය කොටස් හෝ පිළිබඳ වැඩි අවධානය යොමු නොකිරීමේ හේතුවෙන් දම්සක් පැවතුම් සූත්‍ර දේශනාව වුව නව මුහුණුවරක් ගෙන ඇති බැව් පෙනේ. එක් එක් කරුණක් පිළිබඳ විශ්වාසනීයත්වය අලංකාරෝක්තිවලට වඩා අගය කළ කතුවරයානන් පර්යේෂණයක තිබිය යුතු මූලිකාංග පිළිබඳ බෙහෙවින් සැලකිලිමත් වී තිබේ. කුමාර අවධියේ සිට භාෂාශාස්ත්‍ර, වේදවේදාන්ත, යුද ශිල්පය හා අන්‍ය වූ විවිධ විෂයයන් මනා කොට හැදෑරීමේ ප්‍රතිඵලය වූයේ සිදුහත් කුමරු අලාර කළාම, උද්දක රාමපුත්‍ර වැනි ආචාර්යවරයන් සතු ශාස්ත්‍ර ඥානය කෙටි කලකින් ග්‍රහණය කිරීමේ සමත් වීමය. ඉන් නොනැවතුණු එතුමා අත්ථකිලමතානුයෝගය පුහුණු කොට සිරුරට මහත් වේදනා දුන්නේය. මැදුම් පිළිවෙතට පිවිසි එතුමා ඉක්බිති බවුන් වඩා සය මසකින් අභිමතාර්ථ සාධනය කළෝය.

සත්‍ය මාර්ගය සොයා සමකාලීන බොහෝ ඇඳුරන් වෙහෙසෙද්දී වයසින් මුහුකුරා නොසිටි සිදුහත් තවුසන්ගේ බුදුවීම වැඩි හිටි ඇදුරන්ගේ විමතියට හේතු විය. උන් වහන්සේගේ මිත්‍ර පස්වග තවුසන් පමණක් නොව උරුවෙල් කාශ්‍යපාදී ජ්‍යෙෂ්ඨ ඇදුරන් ද පසේනදී කොසොල් රජු ද බුදුන් දෙස සැකයෙන් බැලූ මුත් සියලු සංකා දින කිහිපයකට සීමා විය. සිදුහත් කුමරු බුදු වූ බැව් සැල වීමෙන් සතුටට පත් ශාක්‍ය කුමාරවරු ද සෙසු තරුණ පිරිස් ද උන් වහන්සේ සොයා පැමිණියේ මහෝසයක් සේය. ඉන් බහුතරය බුදුන් සරණ ගොස් පැවිද්ද ලැබූ අතර රජවරු ද අමාත්‍යවරු ද තෙරුවන් සරණ ගියහ.

බුදුන් වහන්සේගේ චරිතයෙහි ප්‍රකට අල්පෙච්ඡතා ගුණය මඟින් කතුවරයා ලොවට දෙන පණිවුඩය ද ප්‍රබලය. ලුම්බිණි සල් උයනෙහි තුරු සෙවනක බිහිවන සිදුහත් කුමරු සුව පහසු රජ මාලිගා තුළ රඳවා තැබීමට පිය රජු ගන්නා උත්සාහය ව්‍යර්ථ වේ. එකුන් තිස් වියේ දී රජ මැදුරට පිටු පා වන වාසයට යන කුමරා සය වසකින් කෙළෙසුන් නසා වෘක්ෂ මූලයේ දී බුද්ධත්වය සාක්ෂාත් කරයි. ඉන් අනතුරුව පන්සාලිස් වසරක් උන් වහන්සේ වස්සාන කාලයෙහි හැර ආරාම ප්‍රිය කළේ නැත. නේරංජනා නදී තීරය, බෝධි වෘක්ෂය, වේළුවනය, ගිජුකුළු පව්ව, අනුපිය අඹ උයන රක්ඛිත වනය, උන් වහන්සේට ප්‍රිය මනාප තැන් විය. අවසන කුසිනාරා සල් වනයේ දී පිරිනිවන් පෑහ. අල්පාහාරය අගය කරමින් ශ්‍රාවක පිරිස් හා පිඬු සිඟා වැඩි උන් වහන්සේ එක් වේලක් පමණක් වැළඳූහ. වේරන්ජා සාගතයේ දී අසුන් සඳහා වූ යව ධාන්‍යයෙන් යැපෙමින් සිය අසරණ දායකයන් වෙනුවෙන් එහිම රැඳී සිටියහ. කපිලවස්තුවේ දී පිණ්ඩපාතයෙන් ලද ආහාරය දුටු සුදොවුන් රජු විපිලිසර වුව ද පැල්පතකින් ලද එම ආහාරය උන් වහන්සේගේ සතුටට හේතු විය. රාහුල පුතුටත් සමාජය කොන් කළ සුනීතටත් උන් වහන්සේගේ අරම එක සේ විවෘත විය.

ගංගා නිම්නයෙහි සොලොස් මහා ජනපද අතර පා ගමනින් සංචාරය කොට දම් දෙසූ බුදුන් වහන්සේ ප්‍රමුඛ ශ්‍රාවකයන් වෙත පැමිණ පැවිදි වූ පිරිස් දහස් ගණනක් වීමට ගත වූයේ වසර කිහිපයකි. රාජානුග්‍රහය හා සමඟ දානපතීන්ගේ නිර්ලෝභී දායකත්වය ද වැඩෙන්නට විණි. මෙම ජනතා ප්‍රබෝධයෙන් නොසන්සුන් වූයේ අන්‍යාගමික පූජ්‍ය පක්ෂ පමණක් නොවේ.

බුදුන් වහන්සේ හා එකම ආරමෙහි වැඩ විසූ දෙව්දත් තෙරුන් නායකත්වය අරභයා රෝපණය කළ ද්වේෂයේ බීජ අප්‍රසන්න ලෙස දළු ලා වැඩෙන්නට විය. රහසිගත කුමන්ත්‍රණයක ප්‍රතිඵලය ලෙස අජාසත් කුමරු දෙව්දතුන්ගේ වසඟයට පත් විය.

ශ්‍රාවක භික්ෂු සංඝයාගෙන් කණ්ඩායමක් ගොඩ නැඟූ දෙව්දතුන්ගේ උපදෙස් මත අජාසත් පියරජුගෙන් සිහසුන ලබා ගත්තේය. සංඝයාගේ නායකත්වයට දෙව්දතුන් පත් කරන ලෙස කළ ඉල්ලීම ඉටු නොවූ ඉක්බිති බිම්බිසාර රජ නිවාස අඩස්සියේ තැබීමෙන් බුදුන් සිය අරමුණෙහි පොළඹවාලීම කුමන්ත්‍රණයේ දෙවැනි පියවර විය. එහි අනිටු ප්‍රතිඵලය වූයේ තම පියාණන් සිරකරුවකුව නිරාහාරව දුක් විඳිනු දැකීමට අජාසතුනට සිදු වීමය. සැමියා වෙත අහර ගෙන ගිය විදේහී දේවිය ද ඉන් වළකාලන ලදි. ගිජුකුළු පවුවේ වැඩ සිටිමින් ඊට නුදුරෙහි සිරකරුවකුව සිය ප්‍රධාන අනුග්‍රාහක බිම්සර රජු නිරාහාරව මිය යනු ඇසීමට බුදුන් වහන්සේට සිදු විය. සත්‍ය මාර්ගය සොයා යන ගමනේ දී දැක පැහැදී රාජ්‍ය පාලනයෙහි හවුල් වීමට නතර වන ලෙස හෝ බුදු බව ලැබ මගධයට වැඩ තමාගේ අනුශාසකයා වන ලෙස හෝ ඉල්ලා සිටියේ මේ රජුය. බුද්ධත්වයෙන් පසු රජගහ නුවරට වැඩි තමන් වහන්සේ හා භික්ෂු සංඝයා ශ්‍රද්ධාවෙන් පිළිගෙන වේළුවනාරාමය කරවා පූජා කළේත් එතුමාය. ප්‍රධාන ගිහි අනුග්‍රාහකයා වීමෙන් බුදුන් වහන්සේට මහත් ධෛර්යයක් වූ එතුමා එම හේතු වෙන්ම නිරාහාරව සිර ගෙයක මිය යයි.

කුලී හේවායකු යෙදවීමෙන් හෝ ගල් කුලක් පෙරළීමෙන් හෝ බුදුන් වහන්සේගේ දිවි තොර කිරීමට ගත් ප්‍රයත්න ව්‍යර්ථ වූ කල්හි රජුගේ චණ්ඩ ඇතු නාලාගිරි රෑහැනින් මුදා උන් වහන්සේ අබිමුවට එවන ලද්දේ වුව එය ද ඵල රහිත විය. චිංචි මාණවිකාව යෙදවීමෙන් හෝ නගරසෝභනියක මරා ජේතවනාරාම භූමියේ වළ දැමීමෙන් හෝ තවත් පිරිසක් බුදුන් වහන්සේ අපහසුවට පත් කිරීම් වස් කරන ලද උත්සාහ ව්‍යර්ථ විය. මෙම සිදුවීම්වලත් යථාර්ථයට එබී බලන කර්තෘ හිමියෝ මෙසේ කියති.

''බුදුන් වහන්සේ වෙත පුළුල් ජන සමාජයෙන් පමණක් නොව තම ශිෂ්‍ය ගණයාගෙන් එල්ල වූ අනේක විධ බාධා කම්කටොළු සඟවා ලීමට මම මැලි වුනෙමි. මෙම කෘතියෙහි උන්

වහන්සේ අපට ඉතා සමීප වූ මිනිසකු ලෙස පෙනී සිටී නම් ඒ යට කී බාධක පුනරාවර්ජනය කිරීමේ හේතුවෙනි.''

සාහිත්‍යකරුවකු වීමේ අරමුණක කතුවරයා නොසිටිය ද උන් වහන්සේ ප්‍රවීණ සාහිත්‍යකරුවකු බැව් ප්‍රකට කරමින් මෙම නිර්මාණය නව නළු රස පිරි උසස් කලා කෘතියක් බවට නිරායාසයෙන් පරිවර්තනය වී තිබේ. මෙහි පැනෙන සිද්ධාර්ථ චරිතය උටයාන වීර්යයෙන් හා අධිෂ්ඨානයෙන් සසර කතරෙහි අතරමං වූ සත්වයා ඉන් මුදා ලනු පිණිස කැප වූ මානව හිතවාදියකු නිරූපණය කරයි. සැරියුත්, මුගලන්, මහා කස්සප, උපාලි, අනුරුද්ධ, ආනන්දා දී ශ්‍රාවක මහා සංඝයා සමාජය වසා ගත් තෘෂ්ණාදී කෙලෙස් සතුරන් මැඩලීම් වස් පෙරමුණ ගන්නා හමුදා බල මුළුවක් වැන්න. මහත් වූ පති භක්තියෙන් යුතු යශෝදරාවන් නිහතමානී වූ ද පරාර්ථකාමී වූ ද කුමාරිකාවකි. සැමියාගේ ගමන් මඟ පහන් ටැඹක් වන ඇය කාන්තා ලෝකයට ආලෝකයකි. සැකි කුල ගර්වයෙන් නොඅඩු සුදොවුන් රජු දාරක ප්‍රේමය හා රජකම අතර අතරමං වෙයි. පවුල වැනි සාම්ප්‍රදායික සංස්ථාවක් රැක ගැන්ම සඳහා සිය අදිකාරී බලය මඳක් හෝ යෙදවීමෙහි ඉවසීමේ සීමාන්තයට පැමිණි රජුට සිදු වෙයි. බුදු හිමියන් හා ආරාමයට ගිය රාහුල කුමරු පැවිදි වූ බැව් සැල වීමෙන් පසු දිනක් ගෝතමී හා යශෝදරාවන් කැටිව අරාමයට ගිය සුදොවුන් රජ බුදුන් වහන්සේට ආචාර කොට නන්ද හා රාහුල කුමරුන් ඉදිරියේ දෝෂාරෝපණයක් කරන්නට විණි.

''මහණ දම් පුරන්නට ඔබ රජ මැඳුර හැර ගිය වේලේ මා විඳි වේදනාව හිතන්නට බැරි තරම්. ඒ මදිවාට පසුගිය දා නන්ද මා හැර ගියා. මට රාහුල අහිමි වීම නම් කොහෙත්ම දරා ගන්නට බැහැ. මං වාගේ පවුල්කාරයකුට පිය පුතු සෙනෙහස සීයා මුණුබුරු බැඳීම් බොහෝ වැදගත්. ඔබ ගිය වේලේ මා වින්ද වේදනාව මගේ සම පිහියකින් පසාරු කළා වාගේ උනා. සම කපා ඇතුළු වූ ඒ පිහිය මස කැපුවා. මස කපා ඇතුළු වූ පිහිය සිරුරේ ඇට කපන්නට උනා. ඔබ වහන්සේගේ ඔය කටයුතු සුදුසු දැයි සලකා බලන ලෙස මා ඉල්ලා සිටිනවා. මින් මත්තෙහි තම දෙමාපිය අවසරය ලබා නොමැති දරුවකු පැවිදි කිරීමට ඔබ වහන්සේ ඉඩ නොදිය යුතුයි.''

බුදුන් වහන්සේගේ කාරුණික කරුණු වටහා දීමෙන් පසු පිය රජු හා පිරිස නික්ම ගිය ද එදින රාත්‍රි සැරියුත් තෙරුන් කැඳවූ බුදුරජාණන් වහන්සේ මින් මතු දෙමාපිය අවසරයෙන් මිස දරුවන් පැවිදි නොකළ යුතු බවට සටහන් කර ගන්නා ලෙස උපදෙස් දුන්හ.

බිම්බිසාර, පසේනදී කොසොල්, අජාසත්, අනේපිඩු, ජීවක, සුජාතා, අම්බපාලී, විදේහී, විශාඛා ආදී ගිහි චරිත මෙන්ම ශ්‍රාවක මහා සංඝයා වහන්සේගේ හා ථේරීන්ගේ චරිත සමඟින් පෙළ ගැසෙන සිද්ධි මාලාව රසොත්පාදනයෙහි බෙහෙවින් සමත්ය. වේළුවනාරාමයට පැමිණ බුදුන් බැහැදකින රුවෙන් අගපත් අම්බපාලි දේවිය දැකීමෙන් නවක භික්ෂුන් වහන්සේලා විපිළිසර වන ආකාරය කතුවරයා සඳහන් කරන්නේ මහත් සංයමයෙනි. කෙළිලොල් ලිච්ඡවී කුමාරවරු අතර මග දී අම්බපාලි දේවියගේ රිය නතර කොට ඇය අපහසුවට පත් කරති. එසේම අනඳ හිමියනට පෙම් බැඳි තම දියණියගේ මනදොළ පුරනු වස් මවක උන් වහන්සේට ඉනාවක් දෙන්නීය.

පාඨක අවධානය තරයේ ග්‍රහණය කෙරෙන කතුවරයාගේ රචනා ශෛලිය රන් හුයක් සේ කෘතිය පුරා දිවෙයි. හමුදා ඛණ්ඩයක් හා සමඟ යන කොසොල් රජ පිඬු සිඟා වඩින බුදුන් දැක අසු පිටින් බැස උන් වහන්සේට ආචාර කරයි.

''රජතුමනි කවර නම් ප්‍රශ්ණයක් ද? කිසියම් රාජ්‍යයක් ඔබගේ දේශසීමා ආක්‍රමණය කරලා ද?''

''කිසිවකු කෝසලය ආක්‍රමණය කර නෑ ස්වාමිනී. මා මෙම සේනාව රැස් කර ගත්තේ මිනීමරු අංගුලිමාලයන් ඇල්ලීමටයි. ඔහු අතිශය අන්තරාය කරයි. නීතිය ඉදිරියට ඔහු ගෙනෙන්නට මෙතෙක් කිසිවකුට හැකි වී නෑ. දෙසතියකට පෙර ඔහු නගරයේ දකින්නට ඉඳ තිබෙනවා. මගේ වැසියා පසු වන්නේ මහත් බියෙන්.''

''අංගුලිමාල එතරම් දරුණු බව ඔබට විශ්වාස ද?''

''ස්වාමිනි, අඟුල්මල් හැම මිනිසකුටම, කාන්තාවකටම හා දරුවකුටම අන්තරාවක්, ඔහු සොයා මරා දමන තෙක් මට ඉවසීමක් නෑ.''

''අංගුලිමාල ඔහුගේ කල්ක්‍රියා ගැන පසුතැවිලි වී නැවත මිනී නොමරන්නට පොරොන්දු වී ජීවීනට මෛත්‍රී කරන භික්ෂු ජීවිතයකට ඇතුළු උනොත් ඔබට තව දුරටත් ඔහු අල්ලා මරා දමන්නට අවශ්‍ය ද?''

''හිමියනි, එසේ උනොත් මගේ සතුටට සීමාවක් නොතිබේවි. මා ඔහුට ජීවිත දානය පමණක් නොවෙයි; සිව්රු ආහාර හා ඖෂධත් පූජා කරනවා. නමුත් ඕවා කෙරෙන දේවල් ද?''

එකල්හි බුදුන් වහන්සේ තමා පසු පස සිටි භික්ෂුවක රජුට පෙන්වූහ.

''රජතුමනි, මේ භික්ෂුව අඟුල්මල් හැර අන් කිසිවකු නොවේ. මින් දෙසතියකට පෙර පැවිදි වූ ඔහු දැන් යහපත් මිනිසෙක්.''

බිහිසුණු මිනීමරුවකු වෙත තමා මෙතරම් සමීපව සිටින බැව් සිහි වූ කොසොල් රජ සන්ත්‍රාසයට පත් විය.

හීනයාන සම්ප්‍රදායෙන් ත්‍රිපිටකය මෙන්ම මහායාන සම්ප්‍රදායේ එන සූත්‍ර මෙම ශාස්ත්‍රීය පර්යේෂණයේ ප්‍රධාන මූලාශ්‍ර වී ඇත. තවද ලාලිත විස්තරය අශ්ව ඝෝෂ බුද්ධ චරිතය, ජාතක පාලි, ධම්ම පද, ථේර ථේරී ගාථා වැනි පාලි සංස්කෘත හා චීන කෘති ද කතුවරයා පරිශීලනය කොට තිබේ. උතුරු (මහායාන) දකුණු (හීනයාන) සම්ප්‍රදායන් එක සේ හැදෑරීමේ අවස්ථා සාමාන්‍ය පාඨකයා ලබනුයේ කලාතුරකිනි. ඒ සඳහා පහසුකම් හෝ ප්‍රමාණවත් භාෂා නිපුනත්වය හෝ බහුතරයක් දෙනා සතු නොවේ. එවන් පසු බිමෙක සම්ප්‍රදායන්ගේ බෙදීම වඩාත් තර වනු විනා හීන වීමක් සිදු නොවේ. අලංකාරොක්ති හා කල්පිතයෙන් නිදහස් පිවිතුරු බෞද්ධ දර්ශනය සම්ප්‍රදාය කුමක් වුව ද ලොවට දායාද කිරීම බලධාරීන්ගේ යුතුකමකි. දෛනික දිවියේ අත්වැලක් විය යුතු බෞද්ධ දර්ශනය පාඨ ග්‍රන්ථ තුළ සිර වී තිබීම ඉන් ලද හැකි විපුල ඵල ජනතාව කෙරෙන් ඈත් කිරීමකි.

බුදු දහමේ පමණක් පැනෙන විමසා බලා පිළිගැනීමෙහි රුචි වත්මන් සමාජයට වඩාත් ගෝචර වනුයේ වෙහෙස කර පාඨ ග්‍රන්ථ කියවීමට වඩා සරල බසින් පැහැදිලි කෙරෙන බුදු දහමේ මූලික ඉගැන්වීම් හඳුනා ගැනීමයි. කල් පිනූ ක්‍රම වේදවලින් බැහැරව නව ප්‍රවේශයක් මඟින් බෞද්ධ දර්ශනය ලොවට දායාද කිරීමේ දී මෙම කෘතිය මහඟු ආදර්ශයක් විය හැක්කේ එබැවිනි. මුල් කෘතියේ ඇතැම් අන්තර්ගත කරුණු ථේරවාදී ආචාර්යවරුන්ගේ උදහසට හේතු විය හැකි වුව ද පරිවර්තනයේ දී එවන් තත්ත්වයක් වළකා ගැන්ම දුෂ්කර නොවේ.

අසූ වසක බුදුන් වහන්සේගේ ජීවන කථා ප්‍රවෘත්තිය හා බැඳුණු සූත්‍ර, විනය දේශනා, සංවාද, උපදෙස් හා විනය රීති සමූහයක් අතුරෙන් තෝරා ගත් ඉගැන්වීම් යම් ප්‍රමාණයක් ස්වස්ති, රාහුල, ආනන්ද, අස්සජී තෙරවරුන් හා ප්‍රජාපතී ගෝතමී තෙරණියන් මඟින් හා ඍජුවම ද සරල හා චිත්තාකර්ෂණීය ලෙස හෙළි කිරීමෙහි කර්තෘ ප්‍රයත්නය ප්‍රසංසනීය වේ.

ආර්ය මාර්ගයට පිවිසි ශ්‍රාවකයන් වහන්සේලා හා ගිහි සමාජය සඳහා වෙන්වෙන් වශයෙන් ද දෙපාර්ශවයට ම පොදු වශයෙන් ද දේශිත සූත්‍ර, විනය හා ධර්මෝපදේශ පමණක් නොව බුදුන් වහන්සේගේ හා ශ්‍රාවක මහා සංඝයාගේ චරිතයෙන් ලද හැකි අප්‍රමාණ වූ ආදර්ශ මතු කොට දක්වන කතුවරයා උන් වහන්සේලාගේ ජීවන රටාව හා හැසිරීම්වලින් වත්මන් හා අනාගත බුද්ධ ශ්‍රාවකයන් වහන්සේ වෙත ද ගිහි සමාජය වෙත ද ලබා දෙන ආදර්ශය මහත්ය.

බුදුන් වහන්සේ පන්සාලිස් වසරක් මුළුල්ලේ සොළොස් මහා ජනපද අතර සංචාරයේ යෙදෙමින් දම් දෙසූ ආකාරය ස්වස්ති තෙරණුවන් හට මැවී පෙනෙන්නට වෙයි. ගයාවේ බවුන් වඩද්දී කුස තණ මිටි කිහිපයක් පිදූ දින පටන් තම සමීප මිතුරා ලෙස සිදුහත් ඇඳුරනට ස්වස්ති උවටැන් කළේය. තරුණ වියට එළඹෙද්දී බුදුන් හා සමඟ ගොස් පැවිදිව ආර්ය මාර්ගය පුහුණු කරමින් පරිනිර්වාණය දක්වාම උන් වහන්සේ හා විසූහ. ප්‍රථම ධර්ම සංගායනාව ද නිම කොට මානසික සුවය පතා ගම් පියස වූ උරුවේලාවට වැඩම කළ උන් වහන්සේ සුපුරුදු නේරංජනා නදී තෙර හුදකලා වෙති. ගෙවී ගිය දිගු කාලය තුළ පැරණි උරුවේලාවෙහි වූ වෙනසක් දක්නට නැත. කුඹුරු, වතුපිටි එදා වූ පරිද්දෙන්මය. සුජාතාවන් අන් ගමකට විවාහ වී ගොසිනි. ගමෙහි දක්නට සිටිනුයේ එදා වූ ගැමි දරුවන් හා සම වූ නව පරපුරක දරු කැළකි.

මී ගවයන් රැගෙන ගඟ හරහා එන ගොපලු දරුවන් දකින ස්වස්ති තෙරුනට තමා එකොළොස් වැනි වියේ දී පවුලේ නඩත්තුව සඳහා මෙසේ ගවයන් රැක බලා ගත් සැටි සිහිවේ. නේරංජනා ගං දිය නිසලව ගලා බසී. මෙම තණ නිල්ලෙහි සක්මන් කරමින් සිටි සිදුහත් ඇඳුරන් තමා මුල්වරට හමු වූ අයුරු

තෙරණුවෝ සිහි කරති. සිය පැවිදි මිතුරා වූ රාහුල පොඩි පුතු හා මෑණියන් රජ මැදුරෙහි තනි කොට ආර්යය මාර්ගය සොයා වනයට පිවිසි සිදුහත් කුමරුන්ගේ ජය භූමිය වූයේ ගයාවයි.

බෝධි වෘක්ෂ මූලයේ දී සාක්ෂාත් කළ සත්‍ය මාර්ගය ලෝකයට දායාද කරනු වස් වඩිද්දී සටහන් වූ උන් වහන්සේගේ සිරිපා සළකුණු අදත් නේරංජනා ගඟ බඩ නොමැකී පවත්නා සැටි තෙරණුවෝ දකිති. මෙහි සිට උන් වහන්සේ රජගහ නුවරටත්, ඉසිපතනයටත්, වේසාලියට හා සැවැත් නුවරටත් වැඩියේ මෙම අඩි පාරේය. ඒ පිය සටහන් හා සමඟ ගං දිය ඉහළ නිල් අහස් කුස පාවී යන සුදු පැහැති වළා පෙළ තෙරණුවන්ගේ හද ගැබෙහි බුදුන්ගේ රුව සිතුවම් කිරීමට සමත් වෙයි. පිරිනිවණින් සැනසුණු ද උන් වහන්සේ මේ මොහොතේත් ජීවමානව තමන් තුළ වැඩ වෙසෙතැයි තෙරණුවෝ සිතති. කුල හීන ගොපළු දරුවකුව සිටි තමා වෙත විමුක්තිය ගෙන ආ මේ උතුම් සත්‍ය මාර්ගය සෙසු දරුවනට ද විවර කොට දීමෙන් සර්වඥයන් වහන්සේගේ නොනිම් මෙහෙවර ලෝකානුකම්පාවෙන් පෙරට ගෙන යා යුතු යයි තෙරණුවෝ අදිටන් කෙරෙති.

ආචාර්ය නිමල් සමරසුන්දර
බුද්ධ ශාසන අමාත්‍යාංශයේ
හිටපු ලේකම්.

කැලිපෝර්නියා ප්‍රාන්තයේ
නිව් පෝට් බීච් හිදීය.
2007 සැප්. 25 දින

## ප්‍රථම පරිච්ඡේදය

# පා ගමනින් ගමින් ගමට

නිල් වදුලු සහිත උණ ගස් උයනේ තරුණ භික්ෂූන් වහන්සේලා පද්මාසනගතව භාවනාවෙන් වැඩ සිටිති. තම තමන්ගේ ආශ්වාස ප්‍රශ්වාස ක්‍රියාවන් පිළිබඳව සිත යොමු කරමින් සිටින උන් වහන්සේලා වේළුවන උයනේ භාවනාවට වාඩි වී දැන් හෝරාවකටත් අධික කාලයක් ගත වී ඇත. දහසකට අධික වූ අනෙක් භික්ෂූහු පිදුරු සෙවිලි කළ කුටි තුළම භාවනා කරමින් සිටිති.

ප්‍රධාන ආචාර්යවරයාට ඉතාම ආදරයෙන් ශිෂ්‍ය පිරිස එතුමන්ට ''බුද්ධ'' යන නම ව්‍යවහාර කළහ. දහසක් භික්ෂූන් වැඩසිටියත් පරිසරය ඉතාම ශාන්ත විය. වේළුවනය සම්පූර්ණ අක්කර හාරසියයක පමණ ක්ෂෙත්‍ර ඵලයෙහි පිහිටා තිබිණි. උණ ගස්වල වර්ග කීපයක් සහ විවිධ ගස් වර්ග පාටලීපුත්‍ර නගරයෙන් ගෙනැවිත් මෙහි රෝපණය කරන ලදී. මගධයේ රාජධානිය වූ රාජගිරිය සිට වේළුවනය එතරම්ම ඈත්ව නොපිහිටියේය. අවුරුදු හතකට පෙර බිම්බිසාර රජු විසින් වේළුවන විහාරය බුදුරජාණන් වහන්සේට පූජා කරන ලදී.

ස්වස්ති තම දෑස පිස දමා සිහින් සිනහවකින් මුව සරසා ගත්තේය. දෙපය තවමත් නවාගත් ගමන්ය. ඔහු ක්‍රමයෙන් දෙපය දිග හැරියේය. දවස් තුනකට පෙර පැවිදි වූ සාරිපුත්ත හිමියන් බුදුරදුන්ගේ ප්‍රධාන ශිෂ්‍යයන්ගෙන් කෙනෙක් විය.

උන් වහන්සේ භික්ෂු සංඝයාගේ සාමාජිකත්වය ලැබීමෙන් පසු ඉතාම ප්‍රසන්නභාවයට පත් විණි. බොහෝ අය වස්තු සම්පන්න ගෙවල්වලින් පැමිණ පැවිදි වූ අයයි. බුදුරදුන්ගේ පරම්පරාවෙන් පැමිණි නන්ද, දේවදත්ත, අනුරුද්ද සහ ආනන්ද යන හිමිවරු ද මේ අය අතර විය. තවමත් සාරිපුත්ත හිමියන් සමඟ මේ අය දැන හැඳුනුම්කම් ඇතිකර ගෙන තිබුණේ නැත. ඒ අය දැක්කේ ඉතාම දුරිනි. දුර්වර්ණ සිවුරු පොරවාගෙන සිටියත් සාරිපුත්තගේ ශරීරයේ අලංකාර වර්ණයට හානියක් වී තිබුණේ නැත.

''උසස් පවුල්වලින් පැමිණි අය සමඟ සම්බන්ධ වන්නට මට තව තරමක් කල් ගත වේවි,'' යි ස්වස්ති සිතුවේය. රජ කෙනෙකුගේ පුතකු වුවත් බුදුරදුන් හා තමන් අතර ඒ තරම්ම පරතරයක් දකින්නට තිබුණේ නැත. දඹදිව ජාති කුල පරම්පරා අනුව අඩුම ජාතියෙනුත් අඩුම කුලයේ උපන් කෙනෙකි ස්වස්ති. පසුගිය අවුරුදු දහයේම කළේ මී හරකුන් දැක්කීමය. මී හරකුන්ට කෑම දීමය. දවස් හතක් ගතවීමෙන් පසුව සියලුම ජාතිවලින් පැමිණ පැවිදි වූ පිරිස සමඟ සාරිපුත්ත සතුටින් කල් ගෙවූ අතර සමහර අය සාරිපුත්තට නමස්කාර ද කරන ලදී.

ටික වේලාවකින් ස්වස්තිට රාහුල ගැන සිහිපත් විය. සිත තුළින් සම්පූර්ණ සිනහවක් පහළ විය. සිද්ධාර්ථගේ පුත්‍ර රාහුල තවම වයස දහඅටට එළඹියා පමණි. වයස අවුරුදු දහයේ සිටම සංඝ සමාජයේ සම්මාන පූර්වකව වැඩ වසයි. සති දෙකක් තුළ ස්වස්ති සහ රාහුල අතර දැඩි සම්බන්ධතාවක් ඇති විය. රාහුල විසි අවුරුදු වයස් සම්පූර්ණ කර නැති නිසා භික්ෂුභාවය ලැබී තිබුණේ නැත. එහෙත් ආනාපානසතිය පිළිබඳව ස්වස්ති ඉගෙනගෙන ගත්තේ රාහුලගෙනි.

ස්වස්තිට තමන්ගේ මුල්ම සති දෙක සිහිපත් විය. බුදුරදුන් ගයාවේ බේලුව ගමට වැඩම කර වූ සිද්ධිය සිහිපත් විය. බුදුරදුන් ස්වස්තිගේ ගමට වැඩම කර වූ අවස්ථාවේ දී ස්වස්ති තම බාල සහෝදරයා සමඟ ගවයන්ට තණ කැවීම සඳහා පිටත්ව ගොස්

තිබිණි. තම කුඩා පුංචි සහෝදරියන් වූ බාලා සහ හීමා පමණක් ගෙදර සිටියහ. බුදුරජුන් දුටු විටම බාලා උන් වහන්සේ අඳුනා ගත්තීය. ස්වස්ති සෙවීමට මහන්සි ගත්තීය. නමුත් එසේ මහන්සි නොගන්නා ලෙස බුදුහිමියෝ ඇයට දැනුම් දුන්හ. ගඟ බඩ ගොස් තමන් විසින්ම ස්වස්ති සොයා ගන්නා බව උන් වහන්සේ දැන්වූ සේක.

සවස් වරුවේ බුදුරදුන් නේරංජනා නදියේ ඉවුරේ වඩිනා අතර ස්වස්ති සහ රූපක් යන දෙදෙනා මී හරකුන් අතුල්ලවමින් නහවන ආකාරය දැක ඒ දෙසට වැඩි සේක. බුදුරජුන් හඳුනාගත් ස්වස්ති සහ රූපක් දෙදෙනා වහා බුදුරදුන් සමීපයට ගොස් දණ ගසා නමස්කාර කළහ.

ස්වස්ති සහ රූපක් දුටු බුදුන් වහන්සේ මහත් සේ කරුණා බරව සෙනෙහසින් ''අහා! නුඹලා දෙදෙනා දැන් තරුණ අය වෙලානේ යැයි,'' කීහ.

බුදුරජුන්ගේ සෙනෙහෙබර මුහුණ දුටු ස්වස්තිගේ මුහුණ ද සෙනෙහසින් බර විය. කෙත්වත් ලියදි ක්‍රමයට කැපූ දඹ රන්වන් සිවුරු පෙරවූ බුදුරජුන්ගේ හිස සිට සිරිපතුල දක්වා බැලූ විට ඔහුට දක්නට ලැබුණේ තවමත් පා වහනක් නැතිවම වැඩම කරවන බවයි.

දැනට අවුරුදු දහයකට පමණ පෙර ද මේ දෙදෙනා මුණගැසුණේ මෙතැන දීය. ''දැනට අවුරුදු දහයකට කලින් නේරංජනා නදී තෙර ඇසතු වෘක්ෂය මුල අප දෙදෙනා කොපමණ වේලාවක් සාකච්ඡා කරමින් සිටියා ද,'' යි ස්වස්තිට නිතැතින්ම සිහි ගැන්විණි.

නේරංජනා නදියේ සිට බෝධි මූලයට ඇත්තේ මිනිත්තු දහයක පමණ වේලාවක ගමනකි. බුදුරජුන්ගේ පසු පස ගමන් ගත් විසි නමක් පමණ භික්ෂු පිරිස ද පා වහන් පාවිච්චි කර නො තිබුණු අතර කුඹුරු ලියදි ක්‍රමයට කපා මසන ලද සිවුරු පෙරවූ අය වූහ. ස්වස්ති සියලුම භික්ෂූන්ගේ සිවුරු දෙස බලා බුදුරදුන්ගේ සිවුර දෙස බැලූ විට දැන ගන්නට ලැබුණේ එය අනෙක් භික්ෂූන්ගේ සිවුරුවලට වඩා එක් අතක් පමණ දිග පළල අධික වූ බවයි. බුදුරජුන් සමඟ ස්වස්තිගේ වයසේ සාමණේර නමක් ද විය. උන් වහන්සේ කෙළින්ම ස්වස්ති දෙස බලා සතුටු සිනහවක් පහළ කළහ.

බුදුරජුන් ස්වස්තගේ සහ රූපක්ගේ හිස් මත තම ශ්‍රී හස්ථය තබා, ''මම රාජගිරියට යන ගමන් මේ මඟ ආවේ නුඹලා දැකීම සඳහායි. ගවයන් නහවා අවසන් වීමෙන් පසු නුඹලා සමඟ ම අපිත් නුඹලාගේ පැලට එනවා,'' යි පැවසූහ. පැලට යන අතර මඟ දී බුදුරදුන් ස්වස්ති සහ රූපක් යන දෙදෙනා ගැන රාහුලට විස්තර කීවෝය.

රාහුල ස්වස්තට අවුරුදු තුනකට වයසින් අඩු විය. නමුත් දෙදෙනාගේම ශරීර උසමහත එක හා සමාන විය. සාමණේර වුවත් රාහුලගේ සිවුරු ද අනෙක් භික්ෂූන්ගේ සිවුරු හා සමාන විය. රාහුල තම පාත්‍රය රූපක අතට දුන්නේ. ස්වස්ති රූපක් යන දෙදෙනා මැදටකර අත දමාගෙන මිතුරන් තුන් දෙනා ඉදිරියට ගියහ. බුදු රදුන්ගෙන් ඇසූ කරුණු අනුව ස්වස්ති, රූපක් දෙදෙනා සහ ඒ අයගේ දෙමාපියන් ගැන බුදුරදුන් කල් ඇතිව දැන සිටි බව රාහුලට අවබෝධ විය.

රාහුලගේ ආදර බර සෙනෙහස් මිතුරුකම ස්වස්තට සහ රූපකට අමුතුම අලුත් පිවිතුරු හැඟීම් ඇති කරන්නක් විය.

ස්වස්තගේ පැලට ළඟා වූ විට බුදුරජාණන් වහන්සේ ඔහු අමතා භික්ෂු මහා සංඝයාගේ සමාජයට එකතු වෙන ලෙස කියා සිටියහ. අවුරුදු දහයකට පෙර ස්වස්ති බුදුරජුන් හමු වූ විට ධර්මය ගැන, භාවනා ගැන කරුණු සාකච්ඡා කළ බව දෙදෙනාට ම හොඳට මතකය. ඒ අවස්ථාවේ දී තමන්ගේ ශිෂ්‍යයෙකු හැටියට ස්වස්ති භාර ගන්නා බවට බුදුරජුන් පොරොන්දු වූ බව ද දෙදෙනාට ම මතකය. බුදුරදුන් ඒ පොරොන්දුව ඉටු කිරීමට පැමිණි බව දන්වා සිටි සේක.

රූපක් ගවයන් භාර දීමට උන්ගේ අයිතිකරු වන රාම්භුල්ගේ ගෙදරට ගියේය. බුදුරජුන් ස්වස්තගේ පැල්පත ඉදිරිපිට පුංචි බංකුවක වැඩ සිටි අතර අනෙක් භික්ෂූන් පසු පසින් හිඳගෙන උන්හ. කටුමැටි බිත්ති මතින් පිදුරු සෙවිලි කළ පුංචි පැල්පත තුළ මේ තරම් පිරිසකට ඇතුළුව සිටීමට තරම් ඉඩ කඩ තිබුණේ නැත.

බාලා ස්වස්ති අමතා, ''අයියේ ඔබ බුදුරජානන් වහන්සේ සමඟ යන්න. රූපක් දැන් හොඳට ශක්ති සම්පන්න කෙනෙක් නේ. ඒ නිසා හරකුන් රැළ හොඳින් රැකබලා ගැනීමට රූපක්ට හැකියි. ගෙදර කටයුතුත් මට දැන් ඉස්සරට වඩා හොඳින් කරන්න පුළුවන්. අයියා අවුරුදු දහයේ සිට මාවත් කවාපොවා ඇති දැඩි කළා නේ. ඒ නිසා දැන් කරදරයක් වෙන්න ඉඩ දෙන්නේ නැහැ,'' යි කීවාය.

වර්ෂා ජලය එකතු වීමට තබා තිබූ මැටි භාජනය ළඟ වාඩි වී සිටි හීමා කිසිවක්ම නොකියා තම වැඩිමහල් සහෝදරයා දෙස බලා සිටියාය. ස්වස්ති හීමා දෙස බැලීය. ඇය ඉතා පුංචි දැරියක්ව සිටි සමයේ ස්වස්ති මුලින්ම බුදුරජුන් හමු විය. ඒ කාලයේ බාලාගේ වයස අවුරුදු හයක් පමණ වන්නට ඇත. රූපක් අවුරුදු තුනක වයසේ පුංචි ළමයෙකි. හීමා ද පුංචි ළදැරියකි. බාලා සියලුදෙනාගේ කෑම පිසීය. රූපක් මැටි අනමින් සෙල්ලම් කළේ ය. ඔවුන්ගේ පියා කළුරිය කර හය මසක් ගත වීමෙන් පසු මව ද කළුරිය කළාය. අවුරුදු එකොළහේ දී ස්වස්ති පවුලේ වගකිවයුත්තා බවට පත් විය. මී හරක් බැලීම සහ උන්ට කෑම දීමේ රැකියාව ස්වස්තිට ලැබිණි. ඔහු ඉතාම මහන්සියෙන් කටයුතු කරන තරුණයෙක් විය. ඒ නිසා හරි හම්බ කිරීම ද තරමක් සරු විය. මේ නිසා පවුලේ කටයුතු කරදරයකින් තොරව සිදු වූ අතර පුංචි නංගීට බීම සඳහා කිරි ද රැගෙන ආවේය.

ස්වස්ති, හීමා දෙස බලා සිටියේ ඇයගේ අදහස් දැන ගැනීමට දරන උත්සහයෙන් බව ඇයට හැඟිණි. තරමක ලැජ්ජාවෙන් සහ භයින් යුතුව, ''අයියේ, අයියා බුදු හාමුදුරුවන් සමඟ යන්න,'' යයි කියා කඳුළු පිරි දෑස නොපෙන්වීම සඳහා හිස අනෙක් අතට හරවා ගත්තාය. බුදුන් හමු වී බුදුන් සමඟ භාවනා කිරීමට ස්වස්ති අදහස් කරන බව කිහිපවරක් ම කී බව හීමාට හොඳට මතකය. එහෙත් අවස්ථාව ලද විට දුකින් බරිතව තම අදහස් මුදුන් පමුණුවා ගැනීමට අපහසු තත්වයක ස්වස්ති පසුවන බව හීමාට හැඟිණි.

ඒ සමඟම රූපක් ගමේ සිට ආපසු ගෙදරට පැමිණියේ ය. ''අයියේ, ඔබ බුදුන් සමග යන්න,'' යන වචන කිහිපය හීමාගේ මුවින් පිටවනු රූපක්ට ඇසිණි. ඊට සහයෝගය දැක්වීම් වශයෙන් රූපක් ද ''අයියේ, අයියා බුදුන් සමඟ යන්නැ,'' යි කියද්දී මුළු පැල්පතම ශෝකාකුල ස්වභාවයක් ගත්තේය.

බුදුන් වහන්සේ දෙස ඉතාම දුක් බර හැඟීමෙන් දෙනෙත යොමු කළ රූපක්, ''භාග්‍යවතුන් වහන්ස, ඔබ වහන්සේ මගේ සහෝදරයාට කරුණාවෙන් ධර්මය සහ භාවනා ක්‍රම ඉගෙන ගැනීම සඳහා අනුමැතිය දෙනු ඇත කියා මම හිතනවා,'' යැයි කියා කඳුළු පිරුණු දෑස වැසීමට හිස අනෙක් අතට හරවාගෙන ගෙදර සියලු කටයුතු සම්පූර්ණ කිරීමට තමන් සමත් බවත්, ඉදහිට ගෙදර අය දැකීමට වරින්වර ගමට ඒමට බුදුන් අවසර දෙන්නේ දැයි, ද විමසුවේය.

බුදුරජුන් අසුනෙන් නැඟිට හීමාගේ හිස කරුණාවෙන් පිරිමැද, ''හා, දූන් නුඹලා කෑම කනවා නම් හොඳයි. හෙට ස්වස්ති රාජගිරියට එක්කර ගෙන යෑමට අප එනවා. අද රාත්‍රිය අපි සැම බෝ රුක් සමීපයෙහිම ගත කරනවා,'' යැයි වදාළෝය.

බුදුන් දොරකඩින් තරමක් ඈත්ව නැවත හිස හරවා ''ස්වස්ති, හෙට ගමනට කිසිවක්ම සූදානම් කිරීමට අවශ්‍ය වන්නේ නෑ. ඇඳගෙන සිටින ඇඳුම පමණක් ගමනට සෑහේ,'' යැයි වදාළෝය.

එදා රාත්‍රියම මුළු පවුලේ සියලු දෙනාම නින්දට නො ගොස් අවදියෙන් ගත කළහ. ගෙදරින් පිට වීමට පෙර පියෙකු දරුවන්ට කරුණු කියන්නා සේ ස්වස්ති සියලු දෙනාටම තම හදවතට තුරුළු කරගෙන ගෙදර මුළුමහත් කටයුතු සියල්ල සමඟියෙන් එකතුව ඉටු කරන ලෙස කීවේය. ඇසේ කඳුළු සැඟ වීමට අසමත් වූ හීමා ස්වස්තිගේ උකුලේ හිස සඟවා ගත්තාය. පසුව හිස ඔසවා දිග සුසුමක් හෙළා තම සහෝදරයාගේ මුහුණ දෙස බලා සිනහසුණාය. ඇසේ කඳුළු දැක තම සහෝදරයා දුකට පත් කිරීමට ඇයට කිසිසේත්ම අවශ්‍ය නොවීය. තෙල් පහනේ

සිහින් දැල්ල, පුංචි පැල ඇතුළේ අඳුර තරමක් දුරු කිරීමටත් හීමාගේ සුරතල් සිනහව දකීමටත් තරම් ප්‍රමාණවත් විය. හීමාගේ සිනහව ස්වස්ති ගේ සතුටට කරුණක් විය.

පසුදා උදෑසන ස්වස්තිගේ මිතුරිය වූ සුජාතා ඔහුට සුභ පැතීමට පැමිණියාය. පසුගිය දා සවස නේරංජනා නදී ඉවුරේ යන විට ඇය බුදුන් සහිත පිරිස දුටුවාය. බුදුන් හමු වූ ඇයට ස්වස්ති පැවිදි වන බව දැන ගන්නට ලැබිණි. ගම් සභාපතිතුමාගේ දියණිය වූ සුජාතා ස්වස්තිට වඩා අවුරුදු දෙකකින් වැඩිමහල්ය. ඇයත් සිදුහත් බුදුවීමට කලින් මුණගැසී තිබිණි. සුජාතා ස්වස්තිට ගෙනයාම සඳහා කොළ, පොතු, මුල්වලින් සෑදූ බොහෙත් වර්ග කිහිපයක් අතට දුන්නාය. ඒ සමඟම බුදුන්ගේ ශිෂ්‍යයෙක් එතැනට පැමිණියේය. සුජාතාට ස්වස්ති සමඟ වැඩිපුර කිසිදෙයක් කතා කිරීමට හැකි වුයේ නැත.

ස්වස්තිගේ සහෝදරියන් දෙදෙනා සහ සහෝදරයා වේලාසනින් නැඟිට ඔහුගේ ගමනට සුභ පැතීමට සූදානමින් සිටියහ. ඉතාමත් ආදරයෙන් සහෝදරියන් දෙදෙනාත් සහෝදරයාත් අමතා ඉතාම සමගියෙන් කටයුතු කරන ලෙස කී ස්වස්ති, උරුවේලා පෙදෙසට එන සෑම අවස්ථාවකම පවුලේ සියලු දෙනා දකීමට පැමිණෙන බවට පොරොන්දු විය.

ස්වස්තිගේ පවුලේ අයත් සුජාතාත් බුදුන්, රාහුල, ස්වස්ති සහ භික්ෂු සංඝයා නේරංජා නදී තෙර දක්වා වැඩම කරවා දෑත් එකතු කර ආචාර කොට වෙන් විය.

ස්වස්තිගේ හදවතේ භය හා සතුට පිරී තිබිණි. ඔහු උරුවේලාවෙන් පිටතට යන පළමු ගමන ද මෙය විය. රාජගිරියට ළඟා වීමට දවස් දහයක් ගත වන බව බුදුන් වදාළහ. සමහර අය ඉතාම ඉක්මනින් ගමන් කළහ. නමුත් බුදුන් සමඟ සමහර භික්ෂූන් තමන්ගේ සවභාවිකගතියෙන්ම වැඩම කරන ලදී. ස්වස්ති ද ගමන් වේගය අඩු කළේය. ඔහුගේ හදවත සිසිල් වී බුද්ධ, ධම්ම, සංඝ යන තුනුරුවන් උදෙසා සමර්පිත විය. නැවත හිස හරවා බැලූ ඔහුට පසු වූ වන ලැහැබ්, ගස්, කටු පඳුරු හැර පවුලේ කිසිවකු

හෝ සුජාතා හෝ දකීමට ලැබුණේ නැත. බුදුන් පා ගමනේ සතුට සඳහා පයින් වැඩම කරවන බව ඔහුට අවබෝධ විය. තමන් කොතැනකට ළඟා වුණේ ද කියා කිසිම චින්තාවක් ද දැන ගැනීමට නැත. සන්තුළිත, ශාන්ත ගමනින් ඉදිරියට යෑම අද අසවල් තැනට යා යුතුය කියා ද නියමයක් නැත. සියලුදෙනාම දැන් ස්වාභාවික පා ගමනින්ය. එහෙත් දවසකට සෑහෙන දුරක් ගමන් කර ඇති බව ද හැඟේ. හැමදාම ළඟම ඇති ගමක් සමීපයේ ලැගුම් ගත් අතර පසු දා එකී ගම අවට පිඬු සිඟා වැඩියහ. සියලුම භික්ෂූන් බුදුන් පසුපස පේළියට ගමන් ගත්හ. ගෞරව පූර්ව ශාන්ත ගමනින් ශ්‍රී නෙත් බඹයක් පමණ දුරින් යොමු කරමින් උන් වහන්සේලා වැඩම කළහ. පා ගමනේ දී ගම් වැසියන් ශ්‍රද්ධාවෙන් දෙන දේ ඉතාම කරුණාවෙන් පිණ්ඩපාතය හැටියට භාරගත් අතර සමහර අය පිදීමට යමක් නැති වූ විට මඟ දෙපස සිට ශ්‍රද්ධාවෙන් හිස නමා නමස්කාර කළහ.

පිණ්ඩපාතය වැළඳීමට පෙර බුදුන් සහ මහා සඟණ දානය පිදූ අයට යහපත, නිරෝගී සුව, සැප සම්පත් සහ ලෝක ශාන්තිය ප්‍රාර්ථනා කරන ලදී.

යම්කිසි කෙනෙකුගේ පාත්‍රයේ පිණ්ඩපාතය නැත්නම් ඒ අයට අනෙක් අය තම පිණ්ඩපාතයෙන් කොටසක් පිදූහ. සියලුම දෙනා එකට එකතු වී වෘක්ෂ යට පිරිසිදු තැනෙක පිණ්ඩපාතය වැළඳූ අතර සියලු දෙනාටම පැන් ආදිය ගෙන ඒම රාහුල විසින් කරන ලදී. බුදුන් ඇතුළු මහා සංඝයාගේ දැත් දෝවනයෙන් පසු රාහුල ස්වස්ති අසලට ගියේ ය. ස්වස්තිට පාත්‍රයක් තිබුණේ නැත. අසල කෙසෙල් ගසකින් කෙසෙල් කොලයක් කඩාගෙනැවිත් රාහුල තම පාත්‍රයේ තිබුණු පිණ්ඩපාතයෙන් කොටසක් ස්වස්තිට කෑම සඳහා දුන්නේය.

පිණ්ඩපාත දානය වැළඳීමෙන් පසු සමහර භික්ෂූන් සක්මන් කරමින් භාවනා කළහ. සමහර අය පද්මාසනයෙන් හිඳ භාවනා කළහ. සමහර අය තද නින්දට වැටුණහ. දවසේ උෂ්ණ සමය තරමක් දුරු වූ විට ඔවුහු නැවතත් ගමන ආරම්භ කළහ. ඇඳිරි වැටෙන තෙක් එම ගමන දිගටම කරන ලදි. රාත්‍රිය ගත කිරීමට

හොඳම ස්ථාන වනාන්තර විය. සියලු භික්ෂූන් සඳහා තම තමන් සතු ආසන තිබූ අතර සමහර භික්ෂූන් බද්ධ පර්‍යංකයෙන් පද්මාසනයෙන් වැඩ සිට රාත්‍රියේ සැහෙන කාලයක් භාවනාවේ ම යෙදී කාලය ගත කළහ. ඊට පසු තමතමන්ගේ සඟල සිවුරු එළා සැතපුණාහ. සියලුම භික්ෂූන් ළඟ සිවුරු දෙක ගණනේ තිබිණි. එක සිවුරක් ශරීරය වැසීමටත් අනෙක් සිවුර බිම එළා සැතපීමටත් ගන්නා ලදී. අනෙක් අය මෙන් ස්වස්තිත් භාවනා කළ අතර ගසක මුලක් කොට්ටය ලෙස පාවිච්චි කොට නිදා ගත්තේය.

උදෑසන ස්වස්ති අවදි වූ විට දක්නට ලැබුණේ බුදුන් ඇතුළු මහා සංඝයා භාවනාවේ යෙදී සිටින ආකාරයයි. හිරු උදාවන විට බුදුන් ඇතුළු සියලුම භික්ෂූන් තම තමන්ගේ සිවුරු සහ පාත්‍ර අතට ගෙන පා ගමන ආරම්භ කළහ.

දවල් දවසට ගමන් කරමින් හා රාත්‍රී විශ්‍රාම ගනිමින් දවස් හයකින් මගධයේ රාජධානිය වන රාජගිරියට (රජගහ නුවරට) ළඟා වූහ.

ස්වස්ති ජීවිතයේ පළමුවරට නගරයක් දුටුවේ එදාය. නගරයේ මහ මඟ දෙපස විශාල ගෙවල් ද විශාල ජනකායක් ද නිතරනිතර අශ්ව කරත්ත එහාමෙහා යන අයුරු ද දුටුවේ පළමු වතාවටය. නමුත් භික්ෂූන් වහන්සේලා බුදුන් සමඟ ශාන්ත ගමනින් නිහඬව ගමන් කළහ. බුදුන් හඳුනාගත් පිරිස් ඉදිරියට විත් නමස්කාර කරන ලදී. ගම්දනවු, කෙත්, වනවදුළු මැදින් වැඩම කළා සේම රාජගිරි නගරය මැදින් වේළුවනය දක්වා වැඩම කරන ලදී. බුදුන් වේළුවනයට වැඩම කළ ආරංචිය මුළු පළාතේම පැතිරී ගියේය. සුළු වේලාවකින් හාරසියයක් පමණ භික්ෂූන් බුදුන් පිළිගැනීම සඳහා ඉදිරියට වැඩම කළහ. බුදුන් වැඩිපුර යමක් නොදෙසා කුසල් කිරීම, භාවනා කිරීම, ආදිය ගැන පමණක් කරුණු සඳහන් කොට කෙටි අනුශාසනාවක් කළ සේක.

ස්වස්ති සාරිපුත්ත හිමියන්ට භාර කරන ලදී. සාරිපුත්ත හිමියෝ රාහුලගේ ද ගුරුතුමා විය. සාරිපුත්ත වේළුවන විහාරයේ සිටි සාමණේරවරුන්ගේ ගුරුතුමාය. පනහක් පමණ සාමණේරයන් වහන්සේලාගේ ආධ්‍යාත්මික ගුරුතුමා සාරිපුත්ත හිමියෝ වූහ. විහාරයේ සියලුම ප්‍රධාන කටයුතු සොයා බලා ක්‍රියාත්මක කළේ කොණ්ඩඤ්ඤ නම් භික්ෂූන් වහන්සේය.

ස්වස්තිගේ ආරාම ජීවිතයේ අංග පිළිබඳව ඉගැන්වීමේ කාර්‍යය පැවරුණේ රාහුලටය. ආරාමයේ ඇවිදින ආකාරය, වාඩිවන ආකාරය, සිටගෙන සිටින ආකාරය, අනෙක් අයට නමස්කාර කරන පිළිවෙළ, සක්මන් භාවනා කරන ක්‍රමය මෙන්ම භික්ෂූන් වහන්සේ නමක් සිවුරු පොරවන ක්‍රමය ද පිණ්ඩපාත පාත්‍රය අල්ලන ක්‍රමය හා පාවිච්චි කරන පිළිවෙළ ද වන්දනා කරන ක්‍රම ආදිය ද රාහුල ස්වස්තිට කියා දුන්නේය. මේ සියල්ලම සිත යොදා ඉතා ඕනෑකමින් ඉගෙන ගත් ඔහු තවතවත් කරුණු දැනගැනීම සඳහා නිතර රාහුලගේ ආශ්‍රය පැතුවේය. මේ සියලුම කරුණු තවතවත් ඉගෙන ඉදිරියට ක්‍රියාත්මක කිරීමට තවත් අවුරුද්දක් වත් ගතවේ යැයි ස්වස්තිට සිතිණි. එහෙත් අවශ්‍ය මූලික කටයුතු රාහුල විසින් දන්වා අවසන් වූ විට සාරිපුත්ත ස්වස්ති තම කුටියට කැඳවා කරුණු පැහැදිලි කළහ.

භික්ෂූන් වහන්සේ කෙනෙකු යනු ගිහිගෙය අතහැර බුදුන් වහන්සේත් ධර්මයත් සංඝයාත් ගුරු තන්හි තබා මෙලොව පරලොව දෙකෙහි සුභ සිද්ධිය පතා සසරින් එතෙර වීමට නිවන් අවබෝධ කර ගැනීමට ශීල, සමාධි, ප්‍රඥා වඩන තැනැත්තායි. භික්ෂූන් වහන්සේගේ ජීවිතය ඉතාම සරල අතර ඉතාම නිහතමානී ද වේ. භෝජනය සඳහා පිණ්ඩපාත කිරීම නිසා අහංකාරය සිතින් තුරන් කිරීම සිදු වේ. පිණ්ඩපාතය වැඩීම ජනීජනයන් සමඟ සම්පර්ක කිරීමට ද මාර්ගය වේ. ඉන් සමාජයේ සැබෑ තත්වය අවබෝධ කර ගැනීමට ද හැකි වේ. ඉන් ප්‍රඥාව ද වැඩේ.

අවුරුදු දහයකට පෙර බුදුන් සමඟ ඇසතු වෘක්ෂය මුල දී සාකච්ඡාවල යෙදුණු ස්වස්ති අද සාරිපුත්ත හිමියන් ළඟ ඉතාම ශාන්ත ගම්භීර ස්වභාවයක් දැරූ අතර ඔහුගේ හදවත ද කරුණාවෙන් පිරී ගොස් තිබිණි. සාමණේර ශික්ෂා පිංකමක් ළඟ දී සිදුවන බවත් එහි දී ස්වස්ති සාමණේර ශීලයෙහි පිහිටුවන බවත් ඒ අවස්ථාවේ දී නිවැරදිව උච්චාරණය කළ යුතු සමහර වැදගත් වචනත් ස්වස්තිට සාරිපුත්ත හිමියන් විසින් උගන්වන ලදී.

සාමණේර පිංකමේ ප්‍රධානියා වූයේ සාරිපුත්ත හිමියෝ ය. මේ පිංකම සඳහා විසි නමක් භික්ෂූන් වහන්සේලා සහභාගි

වූහ. මේ අවස්ථාවට බුදුන් සහ රාහුල ද සහභාගි වූහ. සාරිපුත්ත හිමියන් සිතින් ගාථාවක් කියා ස්වස්තිගේ හිස කෙස් රොදක් කපන ලදී. ඊට පසු ඉතිරි කටයුතු රාහුලට භාර දුන් විට රාහුල ස්වස්තිගේ ඉතිරි කෙස් කපා හිස බූ ගාන ලදී.

සාරිපුත්ත හිමියෝ ස්වස්තිගේ අතට සිවුරු දෙකක් සහ පාත්‍රයක් දුන්හ. කලින්ම පාත්‍රය අල්ලන ආකාරය සිවුර පොරවන ආකාරය රාහුල විසින් උගන්වා තිබූ අතර සිවුරු පෙරවීමේ දී ස්වස්තිට අමතර ගැටලුවක් ඇති නො වීය. මේ සියල්ලම ලැබීමෙන් පසු ස්වස්ති ඉතාමත් සතුටට පත්ව තමාට පැවිදි දිවියට ඇතුළත් වීමට උපකාර කළ සියලුම භික්ෂූන්ට හිස නමා නමස්කාර කරන ලදී. භික්ෂූන් වහන්සේ නමක් ලෙස ස්වස්ති පළමු වරට පිණ්ඩපාතයේ වැඩියේ එදාය. භික්ෂූන් වහන්සේලා කොටස් කිහිපයකට බෙදී රජගහ නුවර වීථිවල පිණ්ඩපාතයේ වැඩියෝය. ස්වස්ති පිණ්ඩපාතය වැඩිය පිරිසේ නායකයා වූයේ සාරිපුත්ත හිමිය. පිණ්ඩපාතයට වඩින විට කලින් ඇසූ අවවාද අනුව සිහිණුවනින් ගමන් කර පිඬුසිඟා වැඩීමට ස්වස්ති අමතක නො කළේය. රාහුල, ස්වස්තිගේ පිටුපසින් ගමන් කළේය. ස්වස්ති දන් සාමණේර නමකි. රාහුලට වඩා තමන් දැනුමෙන් අඩු බව ස්වස්ති නිතර සිතීය.

# දෙවනි පරිච්ඡේදය

# දක්ෂ ගොපල්ලා, දක්ෂ භික්ෂුව සහ සිත

එදින සීතල කාලගුණ තත්වයක් පැවතිණි. සියලුම භික්ෂූන් වහන්සේලා පිණ්ඩපාතය වළඳා අවසන්ව පාත්‍ර පිස දමා වේලීමට තබා බුදු අසුන ඉදිරිපිට එයට මුහුණ දී වැඩ සිටියහ. වේළුවන විහාරයේ සිටි ගේ කුරුල්ලා නිතර එහාට මෙහාට තම පෙම්වතියට යමක් කියනවා සේ චංචලව සිටි බව  දක්නට ලැබිණි. රාහුල බුදුන් ඉදිරිපිටම වාඩි වී සිටි බව ස්වස්ති දුටුවේය. පිරිස මැදින් හෙමිහිට ගමන් කළ ස්වස්තිත් රාහුල ළඟට ගොස් වාඩි විය. සියලුම දෙනා ඒකාකාරව පද්මාසනයෙන් වැඩ හුන්හ. සැවොම බුදුන්ගේ දේශනා ආරම්භ වන තෙක් සමථ භාවනාවේ යෙදී සිටින බව ස්වස්තිට දකින්නට ලැබිණි.

උණ ගස් කපා සාදා තිබුණු ආසනය එතරම් උස් වත් පහත් වත් වූයේ නැත. එනිසා සියලු දෙනාටම බුදුන්ගේ මුහුණ දැක ගැනීමට අපහසු වූයේ නැත.

ශාන්ත ගම්භීර ස්වභාවයෙන් යුතුව පිරිස මැදින් බුදුන් වඩින විට රාහුල සහ ස්වස්ති දෙදෙනා එක තැන වාඩි වී සිටි

ආකාරය දුක උන් වහන්සේ ස්නේහ සහගත සිනහවක් පහළ කළෝය. ඉන් පසු තම දේශනාව ආරම්භ කළහ.

''අද මම බලාපොරොත්තු වන්නේ ඔබලාට ගවයන් රංචුවක් රැක බලා ගන්නා ආකාරය කියා දීමටයි. ඥානවන්ත ගොපල්ලෙකුට තිබිය යුතු සුදුසුකම් මොනවා ද කියා ඔබලාට කියා දෙන්න අදහස් කරනවා. ගොපල්ලා පළමුවෙන්ම තමන්ගේ ගව රැලේ ගවයන් හඳුනා ගත යුතුයි. සෑම හරකෙකුගේම ස්වභාවය වෙනවෙනම දැන ගත යුතුයි. ගවයන්ට තණ කෑවීමට යන මඟ සුරක්ෂිත ද නැද්ද යන්න ඉතාම හොඳින් දැන ගත යුතුයි. ළා තණ ඇති නැති තැන් ද කල් ඇතිවම දැන ගත යුතු යැ,'' යි යන ආකාරයට දක්ෂ ගෝ පාලකයෙකුට තිබිය යුතු සුදුසුකම් පිළිබඳව කරුණු වදාළහ.

''දක්ෂ ගොපල්ලෙකු තමන්ගේ ගවයන් වෙනවෙනම හැඳින ගන්නේ කෙසේ ද? මහණෙනි, දක්ෂ භික්ෂුව තම ශරීරයේ අංග ප්‍රත්‍යංග පිළිබඳව වෙනවෙනම කරුණු දැන ගත යුතුයි. දක්ෂ ගෝපාලයා ගවයන්ගේ චර්යාව පිළිබඳ කරුණු හොඳින් දන්නා සේම දක්ෂ භික්ෂුව තමන්ගේ සිත, කය, වචනය යන තුන් දොරෙහි හොඳ සහ නරක පැත්ත පිළිබඳව දැන ගත යුතුයි. දක්ෂ ගොපල්ලා තම ගවයන් අල්ලා ඉතා හොඳට නහවන්නේ කෙසේ ද? එසේම දක්ෂ භික්ෂුව තම සිතේ ඇති ලෝභ, ද්වේෂ, මෝහ ආදී අකුශල ක්‍රියාවලින් සිත පිරිසිදු කිරීම දත යුතු,'' බව වදාළෝය.

බුදුන් දේශනා කරන අතර කෙළින්ම බලාගෙන සිටියේ ස්වස්ති දෙසය. ස්වස්තිගේ මතකය අලුත් විය. දැනට අවුරුදු දහයකට පෙර බුදුන් බෝධීන් වහන්සේ අභියස වැඩ සිටි දිනක තමන්ගේ මී හරකුන් පාලනය කරන ආකාරය සම්පූර්ණයෙන්ම විස්තර සහිතව දැනගත් අයුරුත් ඒ අනුව අද දේශනාව වදාළ ආකාරයත් පැහැදිලි කර ගත්තේය.

එසේ නොවේ නම් රජ ගෙදරක හැදුණුවැඩුණු කුමාරයෙකු හට ගවයන් පාලනය පිළිබඳව දැන ගැනීමට වෙන ක්‍රමයක් තිබුණේ නැත.

බුදුන් දේශනා කළේ සාමාන්‍ය ස්වරයෙනි. නමුත් සෑම වචනයක්ම ඉතාම සරල වූ අතර ඉතාම පැහැදිලි විය. හරියටම දක්ෂ ගොපල්ලා ගවයෙකුගේ තුවාලවලට බෙහෙත් කරන්නා මෙනි. දක්ෂ භික්ෂුව ඇස, කන, නාසය, දිව, ශරීරය සහ සිත යන

ඉන්ද්‍රිය හය කෙලෙස් මළවලින් නිදහස් කරයි ද එසේ ම දක්ෂ ගොපල්ලා දුම් වැටි මාර්ගයෙන් මී හරකුන්ගේ මදුරුවන් පන්නා දමන්නා සේ භික්ෂුව ධර්ම දේශනා ශ්‍රවනය කර සිත නිවැරදි මගට යොමු කිරීමට උත්සහ දැරිය යුතුය. දක්ෂ ගොපල්ලා තම ගව රැළ ගෙන යා යුතු නොයා යුතු මාර්ගය දැන ගන්නා සේ දක්ෂ භික්ෂුව චතුරාර්‍ය්‍ය සත්‍යය පිළිබඳව නිතර විමසිල්ලෙන් සිටිය යුතුය. දක්ෂ ගොපල්ලා ගව රැළට ළා තණ සොයන්නා සේ ඉහත කී කාරණා මනා සේ පිළිපැදීමෙන් අවුරුදු හයක් ඇතුළත "අරහත්" බව අවබෝධ කරගත හැකි බව වදාළහ. ස්වස්ති ආශ්චර්යයෙන් සියල්ල අසාගෙන සිටියේය. බුදුන්ට දැනට අවුරුදු දහයකට පෙර තමා විසින් කියූ සියලුම කරුණු තවමත් එසේම මතක ඇති ආකාරය ස්වස්තිට සිහිපත් විය. තමන් දැනට අවුරුදු දහයකට පෙර සාකච්ඡා කළ දේ බුදුන් අද මේ ආකාරයට ගලපා භික්ෂූන්ට නිවන් මඟ අවබෝධ කර ගැනීමට දෙසූ ආකාරය ගැන ඔහු සතුටු විය. බුදුන් තම දේශනාව සිදු කළේ සියලුම භික්ෂූන් සඳහායි. නමුත් ගවයන් සහ ගොපල්ලා ගැන දේශනා කළ නිසා ස්වස්තිට දැනුණේ මේ දේශනාව තමන් සඳහාම කරන ලද්දක් බවයි. බුදුන් වහන්සේගේ ශ්‍රී මුඛ පාඨයන් කෙළින්ම හදවතට කාවදින සුළුය. නමුත් ඉන්ද්‍රිය හය, චතුරාර්‍ය්‍ය සත්‍යය, සම්‍යක් ජාගරතා, චතුර් චරණ ආදී වචන ඇසුවා මිස ස්වස්තිට ඒ ගැන කිසිදු අවබෝධයක් ලැබුණේ නැත. නමුත් බුදුන්ගේ පළමු දේශනාවේ හරය ඔහු අවබෝධ කරගත්තේය. ඉතිරි ටික පසුව රාහුලගෙන් දැන ගැනීමට අවශ්‍ය බව සනිටුහන් කර ගත්තේය.

බුදුන් දේශනා කරමින් සිටියේ ගවයන් සුරක්ෂිත මාර්ගයක ගෙන යෑම පිළිබඳ කතාවයි. යම්කිසි විදියකින් කටු ඇති මාර්ගයක ගවයන් රැගෙන ගියොත් එකී ගවයන්ගේ කුරවල කටු ඇනී උන්ට උණ ගැනීමට ඉඩ ඇති බවත් තුවාල විශාල වී හරකා මරණයට පත් වීමට ඉඩ ඇති බවත් රාහුල සඳහන් කළේය. සම්‍යක් මාර්ගය අනුගමනය කිරීම ද ඒ හා සමානය. භික්ෂුව සම්‍යක් මාර්ගය නො දැනීමෙන් ඔහුගේ සිත සහ කය තුවාල විය හැක. ලෝභය සහ ක්‍රෝධය ඔහුගේ ඒ තුවාල තවතවත් ගම්භීර කිරීමට ඉඩ ඇත. නිවන් මඟ ඇහිරීමට ද එයම හේතුවක් වනවාට සැකයක් නැත.

බුදුන් තම දේශනාව අතර මඟ දී නතර කළහ. ස්වස්තිට සංකේත කර තමන් ළඟට පැමිණෙන ලෙස දන් වූවේය. ස්වස්ති තම දෑත එකතු කර නැගිට සිටියේය.

බුදුන් වහන්සේ සිනාසුණහ. පැමිණ සිටි භික්ෂූන් වහන්සේලාට ස්වස්ති හඳුන්වා දෙන ලදී.

''දැනට අවුරුදු දහයකට පෙර ගයාවේ පුංචි වන රොදක දී අපි දෙදෙනා මුණගැසුණේ. ඒ දිනවල මම බුද්ධත්වය සඳහා අවශ්‍ය භාවනා ක්‍රම පුරුදු පුහුණු කරමිනුයි සිටියේ. ඒ කාලයේ මා සිතන විදිහට ස්වස්ති අවුරුදු එකොළහක් පමණ වයස ළමයෙක්. ස්වස්ති මට කුස තණ මිටියක් ගෙනත් දුන්නා. එයින් මම ආසනයක් සාදා ඇසතු රුක් මුල වාඩි වුණා. ගවයන් සහ ගොපල්ලා පිළිබඳව මා දූන් මෙම සැමට කී සියලුම කරුණු එදා ස්වස්ති සමඟ සාකච්ඡා කිරීමෙන් පසු මා දූනගත් දේ මිස, මගේ දූනුමෙන් ලද අත්දැකීම් නිසා දේශනා කළ දෙයක් නොවෙයි. මා දූනගෙන සිටියේ ස්වස්ති ඉතා දක්ෂ ගෝපාලයෙක් බවයි. අද මට සඳහන් කරන්න පුලුවන් ස්වස්ති දක්ෂ භික්ෂුවක් වන බව.''

සියලුම දෙනාගේ දෑස් ස්වස්ති දෙසට යොමු විය. ස්වස්ති කන් සහ නාසය සමඟ සම්පූර්ණයෙන්ම මුහුණ රතු විය. සියලු දෙනාම තමන්ගේ ආසනවලින් නැඟී සිට ස්වස්තිට නමස්කාර කළහ. දහසය ක්‍රමයක ආශ්වාස, ප්‍රශ්වාස ක්‍රියා පිළිබඳව කරුණු විස්තර කිරීමට රාහුලට කියා බුදුන් තම දේශනාව අවසන් කළෝය. රාහුල සිටි තැනින් නැගිට ඉතාම පැහැදිලිව ආනාපාන සති භාවනාවේ ක්‍රම දහසය විස්තර කර දුන්නේ ය.

දේශනාව අවසානයේ භික්ෂූන් වහන්සේලා බුදුන් වහන්සේට නමස්කාර කළහ. බුදුන් තම ආසනයෙන් නැඟී සිට සංවර ගමනින් තම කුටිය වෙත වැඩම කළ සේක.

ඉන් පසු සියලු භික්ෂූන් වහන්සේලා තම තමන්ගේ පත්කඩ රැගෙන වේළුවනයේ තමතමන්ගේ කුටිවලට වැඩම කළහ. බොහෝ භික්ෂූන් කුටිවල වැඩ සිටි අතර සමහර අය උණ පඳුරු යට නිදහසේ ගත කරන ලදී. භාවනා කරන ලද්දේ උණ පඳුරු යට ය. වැස්ස වහින විට දහම් දෙසන ශාලාවට යාම සිරිතක්ව තිබිණි.

ස්වස්තිගේ ආචාර්යවරයා වූ සාරිපුත්ත හිමියන් විසින් ස්වස්තිට රාහුල සමඟ නිදහස් ස්ථානයක ගත කරන ලෙස දන්වා සිටියේය. රාහුල පුංචි කාලයේ සාරිපුත්තගේ කුටියේ වසන ලදී.

සාරිපුත්ත රාහුලගේ මාර්ග දර්ශකයා විය. රාහුල සමඟ උණ පඳුරු සෙවනේ ගත කිරීමට අවස්ථාව ලැබීමෙන් ස්වස්ති ඉතා සතුටට පත් විය.

එදා තුන් වන යාමයේ (සන්ධ්‍යා යාමයේ) ස්වස්ති තනිවම ධ්‍යාන වැඩීම ආරම්භ කළේය. තනිවම ආරම්භ කරන ලද ධ්‍යාන ක්‍රමයේ ආනාපානසති භාවනාව ඉතාම අපහසු කාර්යයක් බව ස්වස්තිට වැටහිණි. තම හිත තමන්ට හොරෙන් ගෙදර ගොස් තම සහෝදරයා සහ සහෝදරියන් සමඟ හැසිරුණු අතර නේරංජනා නදී තෙර සිහියට නැඟිණි. පුංචි හීමා තම කඳුළු බිඳු සැඟවීම සඳහා හිස සඟවා ගත් අයුරු සිතින් දුටුවේය. රූපක් තනිවම රාම්භුල්ගේ මී හරකුන්ට තණ කවන ආකාරය දැක්කේය. මේ සියල්ලම සිතින් අතහැර ධ්‍යාන භාවනා කිරීමට බොහෝ වෙහෙස මහන්සි ගත්තත් ඒ කිසිවක් සාර්ථක වූයේ නැත. තමන්ට ධ්‍යාන කිරීමට නොහැකිවීම ගැන ද ස්වස්ති ලැජ්ජාවට පත් විය. ''මා බුදුන්ගේ විශ්වාස කෙනෙක් නොවන්නේය,'' යන හැඟීම ඔහුට ඇති විය.

මීට ඇති එකම මාර්ගය රාහුලගෙන් උපකාර ගැනීම හැර වෙන දෙයක් නොවේ. ඊට අමතරව තවතවත් සාකච්ඡාවට කරුණු තිබිණි. එනම්, බුදුන් උදේ දේශනා කළ දේශනාවේ සමහර කරුණු තවමත් ස්වස්තිට අවබෝධ වූයේ නැත. තේරුම් නොගත් සියල්ල රාහුල ස්වස්තිට තේරුම් කර දෙනු ඇත, යන හැඟීමක් ද ඇති විය. රාහුල ගැන සිතනවාත් සමඟ උත්සාහවත් වූ අතර සිත ද ශාන්ත විය.

මේ නිසා සමත භාවනා කිරීම් ද තරමක් පහසු විය. රාහුල සෙවීමට අවශ්‍ය වූයේ නැත. රාහුල ස්වස්ති හමු වීමට ආවේය. රාහුල ස්වස්ති සමඟ උණ පඳුරු වදුලට ගොස් වාඩි විය.

''අද හවස් වරුවේ මා ආනන්ද හිමියන් මුණගැසුණා. උන් වහන්සේ ඉතා කැමැත්තෙන් ඉන්නවා, ඉස්සර බෝධි මූලය යට ඔබත් බුදුන් වහන්සේත් අතර කතා වූ දේ පිළිබඳව විස්තර දැන ගැනීමට,'' රාහුල ස්වස්ති අමතා කීවේය.

''රාහුල, ආනන්ද හිමි කවුද?''

''එතුමා ශාක්‍ය වංශයෙන් පැමිණ පැවිදි වූ රාජ කුමාරයෙක්. බුදුන්ගේ පරම්පරාවේම කෙනෙක්. අවුරුදු හතරකට පෙර භික්ෂු භාවයට පත් වූ කෙනෙක්. ඉහළ පංතියේ ශිෂ්‍යවරුන්ගේ ගණයට

ගැණෙන කෙනෙක්. බුදුන්ගේ කුඩු මහත් කටයුතුත් ශරීර සෞඛ්‍ය පිළිබඳවත් සොයා බලන්නේ උන් වහන්සේයි. ආනන්ද හාමුදුරුවන් හෙට හවසට අප දෙදෙනාටම තමන්ගේ කුටියට එන ලෙස කීවා. බුදුන් ගයාවේ තපස් රකින විට සිදු වූ සියලු දේ ගැන දැනගන්න මමත් ආසයි.''

''ඇයි? බුදුහාමුදුරුවන් ඒ පිළිබඳව ඔබට මේ දක්වා කිසිවක් ම කීවේ නැද්ද?''

''කිව්වා, නමුත් විස්තර සහිතව කිවුවේ නැහැ. විස්තර සහිතව මම නුඹගෙන්ම දැනගන්න කැමතියි.''

''විස්තර නම් එතරම්ම නැහැ, නමුත් මතක තියන තරමක් කියන්නම්. රාහුල, ආනන්ද හිමියන් කොහොම කෙනෙක් ද? එතුමා හමු වීමට මට බියක් දැනෙනවා.''

''කිසිම දෙයක් සිතන්න එපා. කිසිම දෙයකට බය වෙන්න එපා. බොහෝම දයාවන්ත මෛත්‍රී පූර්වකව අමුත්තන් හමුවන කෙනෙක්. මම නුඹගේ පවුලේ අය ගැන ආනන්ද හිමියන්ට කරුණු කීවා. එය අසා බලවත් සතුටට පත් වුණා.''

රාහුල නැඟිට යන්න සූදානම් වන විට ස්වස්ති රාහුලගේ සිවුරු කොනින් අල්ලා ''ඔබ තව ටික වේලාවක් නතර වෙන්නේ නැතිව යන්න සූදානම් වන්නේ ඇයි ද'' යි ඇසීය. ''මට ඔබගෙන් යමක් අසා දැනගන්න තිබෙනවා. අද උදේ බුදුන් දේශනා කළ සියල්ලම පිළිපදින්න ඕනෑ. නමුත් දේශනා කළ සියල්ල මතක නැහැ. ඒ සියල්ල නැවත මට කියා දෙනවා ද?''

''බුදුන් දේශනා කළ සියල්ලෙන්ම මටත් මතක කිහිපය යි. බය වෙන්න දෙයක් නැහැ. අපි ආනන්ද හිමියන්ගෙන්ම ඒ ගැන අසා දැනගනිමු.''

''ඔබට තදින්ම විශ්වාස ද ආනන්ද හාමුදුරුවන්ට ඒ සියලුම දේ මතකයි කියලා?''

''ඔව්, සම්පූර්ණයෙන් ම මට විශ්වාසයි. ඔබ තවම උන් වහන්සේ ගැන දන්නේ නැහැ. වේළුවනාරාමයේ සිටින සියලුම දෙනා උන් වහන්සේගේ ස්මරණ ශක්තිය ගැන පුදුම වෙනවා. බුදුන් දේශනා කරන සෑම පුංචි දේශනාවක්ම ආනන්ද හාමුදුරුවන් කිසිම අඩුවක් නැතිව නැවත දේශනා කරනවා. උන් වහන්සේ බුදුන්ගේ ශිෂ්‍යයන් අතර ඉතා බුද්ධි සම්පන්න භික්ෂුව හැටියට කවුරුත් අවිවාදයෙන්ම පිළිගන්නවා. බුදුන්ගේ දේශනාවේ යම් කරුණක් යමෙකුට දැන ගන්න ඕනෑ නම් සියලු දෙනාම කරුණු දැන ගන්නේ ආනන්ද හාමුදුරුවන් ගෙන්.''

''හා, එසේ නම් මා ඉතාම වාසනාවන්ත කෙනෙක්. හෙට උන් වහන්සේ මුණ ගැසීමෙන්ම මා දැන ගන්නම්. මා ඔබගෙන් යමක් දැන ගන්න කැමතියි. ධ්‍යාන කරන අවස්ථාවේ දී ඔබ සිත එකඟ කර ගන්නේ කොහොම ද?''

''ඔබ කියන්නේ ධ්‍යාන කරන විට සිතට නොයෙක් අදහස් ඒම ගැන නේ ද? ගෙදර අය මතක් වීම ආදිය ගැන නේ ද?''

ස්වස්ති තම මිතුරාගේ දෑත අල්ලා ගත්තේය.

''ඔබට මේ සියල්ල දැන ගන්න ලැබුණේ කොහොම ද?''

''මටත් එහෙම කාලයක් තිබුණා.''

''සිතාගන්න අමාරුයි. අද මට මගේ පවුලේ සියලු දෙනා ම සිහිපත් වුණා. මට ලැජ්ජා හිතුණා බුදුන්ගේ දේශනාව පිළිපදින්න නොහැකිවීම ගැන.''

''ඒ ගැන ලැජ්ජා වෙන්න දෙයක් නැහැ. මමත් මුලින්ම සංඝ සමාජයට පැමිණි විට මගේ මව, සීයා, ආච්චී, යාලුවෝ යන සියලු දෙනා මතක් වුණා. දවස් කීපයක්ම රාත්‍රියේ මා තනිවම දෑතින් දෑස වසාගෙන හැඬුවද නමුත් ටික දවසකට පස්සේ ඒ සියල්ලම සාමාන්‍ය දේ වුණා.''

රාහුල ස්වස්තිගේ දෑත අල්ලා මිත්‍රභාවයෙන් ඔවුහු එකිනෙකා ගෙල වැළඳගත්හ.

''නුඹගේ සහෝදරසහෝදරියෝ ඉතාම ප්‍රේමවන්තයි. ඒ සියල්ල සැමදා පවතින ස්වභාවයයි. ඒ අය සිහිපත් වීම ද ස්වාභාවිකයි. නමුත් ඉතාම ඉක්මනට නුඹ මේ අලුත් ජීවිතයට පුරුදු වේවි. අපි දෙන්නාට හුඟාක් වැඩ තියෙනවා. භාවනා කරන්න ඕනෑ. ඉගෙනගන්න බොහෝ දේ තිබෙනවා. මට විවේක ඇති වෙලාවක මගේ පවුලේ සම්පූර්ණ විස්තර කියන්නම්. හොඳයි නේද?''

ස්වස්ති රාහුලගේ දෑත අල්ලා තම දෑතට හිර කර ගත්තේ ය. එය අනුමත කිරීමට ඔහු හිස සෙලවීය. ඉන්පසු රාහුල තම සිවුර සේදීම සඳහා පිටත් විය. ස්වස්ති ඉදල ගෙන වටපිට වැටී තිබුණු උණ කොළ අතු ගාන්න පටන් ගත්තේය.

## තුන් වන පරිච්ඡේදය

# කුස තණ මිටිය සහ මිනිස් කම

නිදා ගැනීමට පෙර උණ පඳුර යට වාඩි වී ස්වස්ති බුදුන් තමන්ට දැනට අවුරුදු දහයකට කලින් හමු වූ මුල්ම අවස්ථාව ගැන සිතන්නට පටන් ගත්තේය. ඒ කාලයේ ස්වස්තිගේ වයස අවුරුදු එකොළහක් පමණ විය. ඔහුගේ මව පරලොව ගොස් ගත වූයේ ටික දවසකි. සහෝදරියන් දෙදෙනාත් සහෝදරයාත් බලා කියා ගැනීමේ සම්පූර්ණ වගකීම ස්වස්තිට පැවරිණි. පුංචි නංගී කිරි බොන වයසේ වූවාය. මී ගවයන් සතර දෙනාගෙන් එකෙක් කිරි දෙනක නිසා තණ කැවීමෙන් පසු කිරි ටිකක් දොවා ගෙනැවිත් පුංචි නංගීට බීමට දුන්ණේය. ස්වස්ති ඉතාම ආදරයෙනුත් ප්‍රවේසමෙනුත් මී ගවයන් ගැන සොයා බැලුවේ මේ හැර කළ හැකි වෙනත් රැකියාවක් නොතිබූ නිසයි. එසේ නොවුණා නම් සහෝදරියන් දෙදෙනාත් සහෝදරයාත් කුසගින්නේ මිය යාමට ද ඉඩ තිබිණි.

පියාගේ මරණින් පසු පැල්පතේ වහලෙහි පිදුරු දැමීමට ද නොහැකි විය. වරින්වර වැස්ස ඇති වන විට පිදුරු වහලයේ තැන්නැන්වලින් වැටෙන වැහි දිය නතර කිරීමට තැනින් තැන

මැටි භාජන තැබීම ස්වස්තිට කළ හැකි එකම දෙය විය. දෙවන නංගී වන බාලාගේ වයස අවුරුදු හයක් වූවා පමණි. එහෙත් පුංචි නංගී බලා කියා ගැනීම, කෑම පිසීම, ගින්දර සඳහා වන රොදෙන් දර කඩාගෙන ඒම ආදිය ඇය ක්‍රමයෙන් ඉගෙන ගත්තාය. පුංචි නමුත් ඇය පිටි අනා පවුලේ සැමට චපාති සූදානම් කර දුන්නාය. පරිප්පු හෝ එළවලු හෝ චපාති සමඟ කෑමට ලැබුණේ ඉතාම කලාතුරකිනි.

ස්වස්ති දවස පුරා මී හරකුන්ට කවාපොවා සවසට රාම්හුල්ගේ ගෙදරට හරක් ටික භාරදීම සිරිතක්ව තිබිණි. රාම්හුල්ගේ ගෙදර සවස් යාමයේ එළවලු තෙම්පරාදු කරන සුවඳ ස්වස්තිගේ නැහැයට දැනුණු විට මුවට කෙළ උනන්නට විය. තම පියාගේ මරණින් පසු තෙම්පරාදු කරන ලද මස් හොද්දක් හෝ එළවලු හොද්දක් හෝ සමඟ චපාති කෑමට ලැබුණේම නැත. පුංචි අයගේ රෙදි ඉරී වැරහැලි බවට පත් වී තිබිණි. ස්වස්තිට තිබුණේ එකම පරණ වේට්ටියකි. ශීත කාලයේ දී පෙරවීමට යමක් නැති වූ විට පරණ ඉරුණු රෙදි පාංකඩවලින් ශරීරය වසා ගත්තේය.

ඊළඟ දවසේ මී හරක් රැළ ගෙන යාමට හොඳ තණ කොළ ඇති ප්‍රදේශයක් ගැන සෙවිල්ලෙන් සිටීමට ඔහුට සිදු විය. හේතුව මී හරකුන් බඩගින්නේ සවසට ආපසු රැගෙන ගියහොත් රාම්හුල්ගෙන් හොඳටම බැට කෑමට සිදුවන නිසාය. ඊට අමතරව මී හරකුන්ට රෑට කෑමට තණ කොළ මිටියක් ද කපාගෙන යා යුතු විය. මදුරුවන් වැඩි කාලයක දී නම් දුම් ගස්සවා උන් එළවීම ද ස්වස්ති විසින් කළ යුතුව තිබිණි. මේ සඳහා ස්වස්තිට දින තුනකට වරක් පිටි, සහල් සහ ලුණු යන තුන් වර්ගය ලැබිණි. ඉඳහිට ස්වස්ති නේරංජනා නදියෙන් මසුන් ටික දෙනෙකු අල්ලාගෙන යෑම ද සිරිතක් කරගෙන තිබිණි.

එක් දිනක් මී හරකුන්ට හොඳින් කුස පිරෙන තෙක් තණ කවා සවසට අවශ්‍ය තණ මිටිය ද කපා දමා ගස් සෙවනේ විවේක ගැනීමට සූදානම් විය. නමුත් මී හරකුන් රැළ නේරංජනා නදී තීරයේ තවත් තණ කමින් හැසිරුණහ. ස්වස්ති යළි ඉතා හොඳ සෙවන ඇති රුකක් සොයමින් වදුලේ ඔබ මොබ ඇවිද්දේ ය. අහම්බෙන් තැනක නතර වූ විට එතැන සිට අඩි විස්සක් පමණ දුරින් ගසක් මුල එක් පුද්ගලයෙක් ශාන්තදාන්තව වාඩි වී

සිටිනවා දුටුවේය. ස්වස්ති ඔහු දෙස පුදුමයෙන් බලා සිටියේය. මේ ආකාරයට වාඩි වී භාවනා කරන කෙනෙකු මීට කලින් ස්වස්ති දැක නොතිබිණි. ශරීරය ඉතාම කෙළින් තබා බද්ධපර්යංකයෙන් වාඩි වී සිටියේය. එතුමාගේ දෑස් අඩවන්ව තිබිණි, උඩට හැරුණු වම් අත්ල මත ඒ අයුරින්ම දකුණු අත්ල තබා තිබිණි; එක් උරහිසක් පමණක් වැසෙන සේ කහ පැහැති පොරෝනයක් පෙරවා තිබිණි. එක් වරක් දුටු සැනින් මනස ශාන්ත භාවයට පැමිණෙන මේ දසුන පුදුම උපදවන සුළු විය. ස්වස්තිගේ පපුව ගැහෙන්න පටන් ගත්තේය. මේ මහා පුරුෂයා සමඟ හමු වීමක් සිදු වූයේ නැත. එහෙත් හදවතේ මෙතරම් හැඟීම් රාශියක් ඇති වූයේ කෙසේදැයි සිතීම ද අපහසු විය. ස්වස්ති උන් වහන්සේ දෙස බොහෝ වේලාවක් බලා සිටියේය.

ටික වේලාවකට පසුව එතුමා දෑස් විවර කළෝය. පළමුව උන් වහන්සේ ස්වස්ති දක්කේ නැත. හේතුව දෑස විවර කොට හෙමින් සීරුවේ බද්ධපර්යංකයෙන් වූ දෙපය දිග හැරීම නිසාය. හෙමින් සීරුවේ නැඟිට ගත් එතුමා ගමන් කරන්නට පටන් ගත්තේ උතුරු දිසාවටය. ඒ නිසා එතුමා කිසිසේත්ම ස්වස්ති දුටුවේ නැත. තපස්වීන් වහන්සේ ඉතාම ශාන්ත මුව පොවුවකු ගමන් කරන ආකාරයෙන් හිමිහිට වන රොද මැදින් ගමන් ගන්නා අයුරු ස්වස්ති දුටුවේය.

ටික දුරක් ගොස් නැවත ආපසු හැරී බැලූ විට උන් වහන්සේට ස්වස්ති දැක ගත හැකි විය. උන් වහන්සේ ස්වස්ති දෙස බලා සිනහවක් පහළ කළහ. ස්වස්තිගේ ජීවිතයේ එවැනි සිනහවක් දුටු පළමු අවස්ථාව ද එය විය.

නොදුටු ආශ්චර්ය ජනක සිදුවීමක් නිසා ස්වස්ති සිනහසෙන එතුමා වෙත දිව ගියේය. අඩි කිහිපයක් දිව ගිය ද ඉබේම ගමන අතර මඟ නතර විණි. උසස් කුලයක කෙනෙකු වෙත යෑමට ස්වස්තිට අවසර නොමැති බව හැඟුණේ ඉන් පසුව ය.

ස්වස්ති සමාජයේ උසස් කුළවලින් එකකට වත් අයත් නැති කුලයක කෙනෙකු විය. මිය යෑමට පෙර තම පියාණන් කී පරිදි සමාජයේ ඉතාම උසස් අය බ්‍රාහ්මණයෝ වෙති. එකී සමාජයේ

උපදින අය ගුරු වෘත්තිය, වේද ග්‍රන්ථ උච්චාරණය කිරීම, දෙවි දේවතාවුන් සඳහා පුදපූජා කිරීම, රජවරුනට අනුශාසනා කිරීම ආදිය සිදු කරන පිරිසයි. උත්පත්ති ක්‍රමය අනුව බ්‍රාහ්මණයන් ඉපදී ඇත්තේ මහා බ්‍රහ්මයාගේ මුවිණි. බ්‍රාහ්මණයන්ගෙන් පසුව සමාජයේ ඉහළම ජනයා වූයේ ක්ෂත්‍රියයන්ය. ඒ අය යුධ කිරීම, රට පාලනය කිරීම, හමුදා සංවිධානය කිරීම ආදිය කළ පිරිසයි. ඒ අය ඉපදී ඇත්තේ මහා බ්‍රහ්මයාගේ දෙබාහුවෙනි. වෛශ්‍ය කුලයේ අය ව්‍යාපාර, කෘෂි, කාර්යාල සේවය ආදිය කළ අතර ඒ අය ඉපදී ඇත්තේ මහා බ්‍රහ්මයාගේ දණ හිසින්ය. ක්ෂුද්‍රයන් ඉපදී ඇත්තේ මහා බ්‍රහ්මයාගේ යටි පතුලින්ය. වර්ණ ව්‍යවස්ථාව අනුව ඉතාම පහත් කුලය වූයේ ක්ෂුද්‍රයෝයි. ස්වස්තිගේ පවුල ඉතාම පහත් කාලයේය. ඔවුහු ගම්මානයෙන් ඉතාම ඈත පුංචි පැල්පත් සාදාගෙන ජීවත් වූහ. ලස්සන හොඳ ගෙවල් සෑදීමට ඒ අයට අවසර තිබුණේ නැත. සමාජයේ ඉතා පහත්ම තත්වයේ රැකියා ඒ අය සඳහා වෙන් කර තබන ලදී. මළමිනී දැවීම, මළ සතුන් අස් කිරීම, වැසිකිළි පිරිසිදු කිරීම, අසුචි ඇදීම, අනුන්ගේ රෙදි සේදීම, බෙරදවුල් වැයීම, ඌරන් පාලනය කිරීම ආදී කටයුතු ඔවුනට පැවරී තිබිණි. මී හරකුන් බලා ගන්නා ගොපල්ලන් හැටියට ජීවිකාව ගෙවීම ද එක් අංගයක් විය. ස්වස්ති ඉපදුණ සමාජය මහා බ්‍රහ්මයා විසින් ඇති කරන ලද්දක් නිසා බ්‍රාහ්මණ සමාජය ලියා ඇති ග්‍රන්ථවල අනුව සමාජයේ ජීවත් වීම අනිවාර්‍යව තිබිණි.

නොදැනුවත්ව හෝ ස්වස්ති උසස් කුලයේ කෙනෙකුට අත තැබුව හොත් ඔහුට තදින්ම පහර කන්නට සිදුවීම සාමාන්‍ය සිද්ධියක් විය. උරුවේලා ගමේ අඩු කුලයේ කෙනෙක් බමුණෙකුගේ ඇඟේ ගෑවීම හේතු කොටගෙන ඉතාම බරපතළ ආකාරයට පහර කෑවේය. අඩු කුලයේ කෙනෙක් බමුණෙකු හෝ ක්ෂත්‍රිය කුලයේ කෙනෙක් හෝ සමඟ ස්පර්ෂ වුවහොත් ඒ අය අපවිත්‍ර වූ අය හැටියට සැලකූහ. එසේ වූ විට ඉන් නිදහස් වීමට නම් ගෙදර ගොස් සති ගණන් උපවාස කිරීමට සිදු විය. ස්වස්ති රාම්භල්ගේ ගෙදරට මී හරකුන් දක්කාගෙන යන අතරතුර උසස් කුලයේ කෙනෙකු ඉදිරියට හමු නොවන ආකාරයට ගමන් මඟ සාදා ගත්තේය. සමහර අවස්ථාවල දී ''මී හරකුන් තමන්ට වඩා

වාසනාවන්ත යැ,'' යි ස්වස්තිට සිතුණු වාර ද විය. හේතුව මී හරකෙකු ඇඟ හැපීමෙන් උසස් කුලයේ අය අපවිත්‍ර නොවන නිසාය.

තමන් ඉදිරියේ දිලිසෙන උසස් සිරුරකින් යුක්තව පෙනී සිටින උතුමාණන් මේ අනුව ඉතාම උසස් කුලයේ කෙනෙකු විය හැකි නිසා උතුමන් ළඟට යෑම සිහිනයක් පමණක් බව ඔහු සිතුවේය.

කරුණාබර සිනහවකින් යුක්තව තමන් දෙස බැලූ නිසා ස්පර්ශ කිරීමෙන් කවදාවත් බැට කෑමට සිදු නොවන බව හැඟුණත් එතුමන් ස්පර්ෂ කර අපවිත්‍ර කිරීම අනවශ්‍ය කාරණයකට මුල පිරීමක් බව ඔහුට හැඟිණි.

ස්වස්ති තමා දෙස සැකයෙන් මෙන් බලා සිටින බව දුටු ස්වස්ති ඉදිරියේ වූ ඒ උතුම් පුරුෂයා අඩි කිහිපයක් ඉදිරියට ආවේය. එහෙත් ස්වස්ති තමා සමඟ විය හැකි ස්පර්ශයෙන් වැළකීමට සිතා පස්සෙන් පස්සට ගමන් කළේය. එහෙත් උසස් පුරුෂයාණන් ඉදිරියට විත් එක් අතක් ස්වස්තිගේ උරහිසට තැබූ අතර අනෙක් අතින් ස්වස්තිගේ හිස පිරිමදින ලදී. ස්වස්ති පුදුම සතුටකට පත් විය. කවරදාවත් ජීවිතයේ තමන් හිසට මේ තරම් කරුණාබරව කිසිම කෙනෙක් මේ දක්වා අත තබා නැත. ඒ නිසා තරමක බියක් ද ඇති විය. "දරුව බිය වන්න එපා," කියූ පමණින් ස්වස්තිගේ සිතේ තිබූ බිය සම්පූර්ණයෙන්ම නැති වී ගියේය. වෙවුලන දෙතොලින් "උතුමාණනි මට ඔබ වහන්සේ ගැන පුදුම ආදරයක් ඇති වුණා," යයි ස්වස්ති කීවේය. තේජස් වී උතුමාණන් වහන්සේ ද ස්වස්ති දෙස තම දෑස යොමු කර, "මටත් නුඹ හොඳ කෙනෙක් බව දැනුණා. කොහෙද ඉන්නේ මේ ළඟ ද?" යි ඇසූහ.

ස්වස්ති උත්තර දුන්නේ නැත. තේජස් වී උතුමාණන්ගේ දෑත තම දෑතින් අල්ලාගත් ඔහු, ''උතුමාණෙනි, මා වැනි කෙනෙක් ඔබ ස්පර්ශ කළ විට ඔබ අපවිත්‍ර නොවන්නේ ද,'' යි ඇසීය.

තේජස් වී උතුමාණන් හිස සලා සිනාසී එසේ නොවන බව සඳහන් කළේය. ''දරුව, ඔබත් මනුෂ්‍යයෙක්. මමත් මනුෂ්‍යයෙක්. ඔබ මා අපවිත්‍ර කරන්නේ කොහොම ද? නුඹට ඒ ගැන කවුරුන් හෝ මොනවා හෝ කියනවා නම් ඒ ගැන කිසි සේත්ම සිත යොමු කරන්න එපා.''

ස්වස්තිගේ අත අල්ලාගෙන වන රොද අයිනෙන් යන විට මී හරකුන් තවමත් විවේකයෙන් තණ කන අයුරු දැක ගන්නට ලැබිණි. ස්වස්ති දෙස බලා, ''නුඹ මී හරක් රැළ බලා ගන්නේ මේ තණ පිටියේම ද? නුඹගේ ගෙදර ළඟ ද තියෙන්නේ?''

ස්වස්ති ඉතාම නිහතමානීව, ''ඔව්, මම මේ මී හරක් තුන් දෙනත් කිරි දෙනත් බලා ගන්නවා. මගේ පැල උරුවේලා ගමේ කෙළවරේමයි තියෙන්නේ.''

''කරුණාකර ඔබ ඔබගේ නම කුමක් ද කියා කියනවා ද? ඔබ ඉන්නේ කොහේ ද? දරුව, මගේ නම සිද්ධාර්ථයි. මගේ ගෙදර මෙතැන් සිට බොහෝම දුරයි. නමුත් මේ දවස්වල මා මේ වන රොදේ තමයි ඉන්නේ.''

''ඔබ සාධු වරයෙක් ද?''

සිදුහත් හිස සලා එසේ වන බව කීය. සාධුවරු උරුවේලාවේ කඳු වනාන්තරවල වැඩ සිටින බව ස්වස්ති දැන සිටියේය. දෙදෙනා කතාබස් කරමින් සිටියේ සුළු කාල සීමාවකුයි. පුංචි කතා බහක් හැර විස්තර සම්පූර්ණයෙන්ම දෙදෙනාම දැන ගත්තේ නැත. නමුත් ස්වස්තිට තම අලුත් මිත්‍රයා ගැන පුදුම ආදරයක් ඇති විය. උරුවේලාවේ කිසිම කෙනෙක් ඔහු සමඟ කවදාවත් මෙතරම්ම ආදරයෙන් කතා කර නැත. මේ නිසා පුදුම සතුටක් ඇති විණි. තම කෘතඥතාව පළ කිරීමට කිසිම ක්‍රමයක් ස්වස්ති වෙත තිබුණේ නැත. ''සිද්ධාර්ථ, මම සිතුවා ඔබට කුමක් හෝ උපහාරයක් කළ යුතුයි කියා. ඒත් ඒ සඳහා මා ළඟ කිසිම දෙයක් නැහැ,'' යි ඔහු පැවසීය.

සිද්ධාර්ථ ස්වස්ති දෙස බලා, ''නැහැ, නුඹ ළඟ මට දෙන්න දෙයක් තියෙනවා. ඒක මට හරි ප්‍රයෝජනවත්.''

''මගේ ළඟ?''

''ඔව්, තියනවා,'' කියමින් සිද්ධාර්ථ කුස තණ මිටිය දෙසට අත දිගු කළේය. ''මී හරකුන් සඳහා ඔබ එකතු කළ තණ කොළ ඉතාම මෘදුයි; සුවඳයි. ඉන් ටිකක් නුඹ මට දුන්නොත් භාවනා කිරීමට ආසනයක් සඳහා මට ප්‍රයෝජනයට ගන්නට පුළුවන්. ඉන් ටිකක් ලැබුණොත් මම ඉතාම සතුටට පත්වන්නෙමි,''

ස්වස්තිගේ දෑස දිළිසෙන්නට විය. තම දෑතට කුස තණ ගත හැකි වුණේ කොපමණක් ද එපමණ තම දෑතින් ගෙන සිද්ධාර්ථගේ දෑත මත තැබීය.

''මේ තණ මම නේරංජනා නදී ඉවුරෙන් කපා ගත්තේ. කරුණාකර මෙය බාර ගන්න. මී හරකුන් සඳහා මම වෙනමම තණ කොළ කපා ගන්නම්.''

සිද්ධාර්ථ ඉතාම ආදරයෙන් දෑත දිගු කර කුස තණ ගෙන ''නුඹ ඉතා දයාවන්ත දරුවෙක්. යන්න ඇඳිරි වැටෙන්නට පෙර ඉක්මනට ගොස් මී හරකුන්ට රෑට කෑමට තණ කොළ කපා ගන්න. හෙට විවේක තිබුණොත් හවසට වන රොදට එන්න. නැවත අපි දෙන්නා මුණගැසෙමු.''

ස්වස්ති සිද්ධාර්ථට දෑත ඔසවා නමස්කාර කළේය. සිද්ධාර්ථ නැවත වන රොදට යන තෙක්ම ඔහු බලා සිටියේය.

ඉන් පසු ස්වස්ති ඉතාම සතුටු සිතින් සිනාසිසී නේරංජා ගඟ ඉවුර දිගේ තම ගමනට පිටත් විය. අලුත් නිල් තණ දමා යෑමට මී හරකුන් සූදානම් නොවූවත් නේරංජාවේ වතුර අඩු තැනින් උනුත් දක්කාගෙන රාමිභුල්ගේ ගෙදරට ඔහු ළඟා විය.

## සිවු වන පරිච්ඡේදය

# තුවාල වූ හංසයා

දෙවන දවසේ ස්වස්ති මී හරකුන්ට තණ කැවීම සඳහා උන්ව ගං තෙරට රැගෙන ගියේය. දවල් වන විට තණ මිටි දෙකක් කපා එකතු කර ගත්තේය. මී හරක් ටික නේරංජනා නදී තීරෙයේ වන ලැහැබේම තණ කමින් සිටිනු දැකීම ස්වස්තිගේ සතුටට හේතුවක් විය. තණ කපා එකතු කර මී හරක් රංචුව තණ කන තැන බලා ස්වස්ති සතුන් ගොයම් කුඹුර දෙසට නොයන බවට තහවුරු වූ පසු, තරමක් විවේක ගත්තේය. දහවල් කෑම සඳහා බාලා නැඟණිය කෙසෙල් කොළයේ ඔතා බැඳ දුන් බත් මුල දිග හැරියා පමණි. ඔහුට සිද්ධාර්ථ සිහිපත් විය.

එසේ සිහිපත් වීමෙන්, ''අද මා මෙ බත් මුල සිද්ධාර්ථට භෝජනය පිණිස දෙනවා,'' යි කියා සිතා ගත්තේය. "සිද්ධාර්ථ මගේ මේ බත් මුල සුළුකොට නොතකන බව මා දන්නවා." බත් මුල නැවත කෙසෙල කොළයේ ඔතාගෙන මී හරකුන්ට තණ කන්න ඉඩ හැර ඔහු, පෙර දිනයේ සිදධාර්ථ හමු වූ තැන සොයා ගෙන ගියේය. තමන්ගේ අලුත් මිත්‍රයා ඇසතු වෘක්ෂය අභියස

භාවනා කරමින් සිටින බව ඈත දී ම දකින්නට ලැබිණි. සිද්ධාර්ථ සිටියේ තනිවම නොවේ. සුදු පැහැති වස්ත්‍ර ඇඳගත් තමාගේම වයසේ ගැහැනු ළමයෙක් සිද්ධාර්ථ ඉදිරිපිට වාඩි වී සිටිනු ඔහු දුටුවේය. සිද්ධාර්ථගේ ඉදිරිපිට ආහාර ද තබා තිබිණි. මේ සිද්ධිය දැක ස්වස්ති තරමක් ඈතින් වාඩි වූවේය. නමුත් සිද්ධාර්ථ ඈතින් වාඩි වී සිටින ස්වස්ති දැක ''ස්වස්ති,'' යන නමින් ආමන්ත්‍රණය කළේය. ස්වස්තිට ළඟට පැමිණ පසු අසලින් වාඩි වන ලෙස ද උන් වහන්සේ ඉල්ලා සිටියේය.

සුදු වස්ත්‍ර හැඳ සිටි ගැහැනු ළමයා තරමක් ඈත් වී ස්වස්තිට වාඩි වීමට ඉඩ සලසා දුන්නාය. සිද්ධාර්ථ ඉදිරිපිට කෙසෙල් කොළයක බත් පිඬු කිහිපයක් සමඟ තෙල් මිශ්‍ර කළ ලුණු ටිකක් ද දක්නට ලැබිණි. සිද්ධාර්ථ මේ බත් පිඬු කීපය කොටස් දෙකකට බෙදා වෙන් කරන ලදී.

''දරුවනේ, නුඹලා කෑවා ද?''

''නැහැ, අපි තවම කිසිදෙයක් කෑවේ නැහැ.''

''හා ! එහෙනම් හරි. මේ කෑම ටික අපි බෙදාගෙන කමු.''

සිද්ධාර්ථ බත් කොටසක් ස්වස්තිට දුන්නේය. ඔහු ස්තුති පූර්වකව දෑත් එකතු කර නමස්කාර කළ අතර බත් බාර ගත්තේ නැත. තමන් ළඟ තිබුණ පුංචි බත් පාර්සලය දිග හැර ''මමත් බත් පොඩ්ඩක් ගෙනාවා,'' යි කියා තමන්ගේ පුංචි බත් පාර්සලය දිග හැරියේය. ස්වස්තිගේ බත්මුලේ තිබුණේ දුඹුරු පාට ලොකු සහල්වලින් පිසින ලද බත්ය. සිද්ධාර්ථගේ කෙසෙල් කොළයේ සුදු සියුම් සහල්වලින් පිහින ලද බත් තිබිණි. ස්වස්තිගේ බත් මුලෙහි ලුණු නොතිබිණි. මේ දුටු සිද්ධාර්ථ ''අද අපි අපේ බත් මුල් කලවම් කරගෙන කමු,'' යැයි යෝජනා කළේය.

තමන්ට කෑමට තිබූ සුදු බත්වලින් තෙල් හා ලුණු සහිත කොටස් කෑමට ස්වස්තිට දුන්නේය. ස්වස්තිගේ බත් මුලෙන් කොටසක් රැගෙන ඉතාම සතුටින් සිද්ධාර්ථ අනුභව කළේය. ස්වස්තිට මේ සිද්ධිය අමුතුම ආශ්වාදයක් සහ පුදුම සහගත දෙයක් විය. ඊට පසු ස්වස්තිත් කෑමට පටන් ගත්තේය.

''ඔබගේ කෑම ඉතා රසවත්,''යි ස්වස්ති කීවේය.

''ඒ කෑම ගෙනාවේ සුජාතා,'' යි සිද්ධාර්ථ කීය.

''හා, මේ ගැහැනු ළමයාගේ නම සුජාතා ද?''

සුජාතා තමන්ට වඩා අවුරුදු දෙකකින් පමණ වැඩිමහල් යැයි ස්වස්තිට සිතිණි. සුජාතාවගේ සෞම්‍ය කළු දෑස දෙස බලා, ''මා කීප වරක්ම යන එන අතර නුඹ දැක තියෙනවා. නමුත් නුඹ සුජාතා බව මා දන්නේ අදයි.''

''ඔව්, මගේ නම සුජාතා තමයි. උරුවේලාවේ ගම්පති මගේ තාත්තායි. නුඹගේ නම ස්වස්ති නේ ද? ගුරු සිද්ධාර්ථ මේ දැන් නුඹ ගැන මට විස්තර කියමිනුයි හිටියේ. සාධු වරයෙකුට ශ්‍රීමාන් කියනවාට වඩා ගුරු දේව යැයි කියා ආමන්ත්‍රණය කිරීම ඉතා හොඳයි,'' සුජාතා ඉතා සියුමැලි හඬින් ස්වස්ති සමඟ කීවාය. ස්වස්ති ඇය කියූ කරුණ තේරුම් ගත් බව හැඟවීමට හිස සැලීය.

''හා දැන් හරි, මට නුඹලා එකිනෙකා ගැන අමුතුවෙන් හඳුන්වා දීම අවශ්‍ය වන්නේ නැහැ,'' යි යනුවෙන් සිද්ධාර්ථ කීය.

''දරුවනි, නුඹලා දන්නවා ද මා කෑම කන විට කතා නොකරන්නේ ඇයි ද කියා? මේ තෙල්, ලුණු සහිත බත් ඉතාම මිල අධිකයි. ඒ නිසා මා මේ කෑම කාලා එහි රසය සම්පූර්ණයෙන්ම ලබා ගන්න ඕනෑ. ඒකයි රහස.''

''සුජාතා නුඹ කවදා හරි දුඹුරුපාට ලොකු සහල්වලින් වියපු බත් කාලා තියනවා ද? ඒවාත් හරිම රසයි. කාලා බලන්න.'' සිදුහත් ස්වස්තිගේ බත් මුලෙන් කොටසක් සුජාතාට ද දී, ''හා අපි දැන් නිහඬව මේ කෑම කමු. කෑමෙන් පස්සේ මා නුඹලාට ඉතාමත් රසවත් කතාවක් කියන්නම්.'' වනාන්තරයේ ශාන්තදාන්ත පරිසරයේ තිදෙනාම කෑම බෙදාගෙන නිහඬව අනුභව කළහ.

ආහාර ගැනීමෙන් පසුව සුජාතා කෙසෙල් කොළ එකතු කර පසෙකට දමා තමන් ගෙන ආ ජලය ඈ සතුව තිබූ එකම කෝප්පයට දා සිද්ධාර්ථ දෙසට දෑතින් දිගු කළාය. සිද්ධාර්ථ ඉතා ම කරුණාවෙන් එය රැගෙන ස්වස්ති අතට දිණි.

''ගුරු දේවයිනි, ඔබ ඒ කළේ කුමක් ද? ඒ වතුර මා පිළිගැන්වූයේ ඔබටයි.''

''දරුවනි, ඉස්සරවෙලා ඔබලා වතුර බොන්න,'' කියා දෙවන වතුර කෝප්පය සුජාතා අතට දුන්නේය.

ස්වස්තිට කුමක් සිද්ධ වුණා ද යන්න තේරුම් ගැනීමට අපහසු විය. බලාපොරොත්තු නොවූ දෙයක් ප්‍රතික්ෂේප කිරීම කිසිසේත් කළ හැකි දෙයක් නොවේ. අන්තිමට සිද්ධාර්ථ එකම කෝප්පයෙන් ජලය පානය කළේය. ගම්පතිගේ දුව සුජාතාවගේ ජීවිතයේ පළමු වතාවට සිද්ධ වූ මේ සිද්ධිය අදහන්නට අපහසු එකක් විය. නමුත් සිද්ධාර්ථ ගුරු දේවයාණන් ද එකම කෝප්පයේ වතුර බීවේය. සිද්ධාර්ථගේ සිත අපිරිසිදුවීම පිළිබඳව කිසිම හැඟීමක් තිබුණේ නැති බව සුජාතාත් ස්වස්තිත් දෙදෙනම දුටුවේය. කරුණාවෙන් සිනාසුණු සිද්ධාර්ථ ස්වස්තිගේ හිසට අත තැබීය. සියල්ල සිදු වූයේ අහම්බෙන් නිසා ස්වස්තිට පැත්තකට වීමට ඉඩ ලැබුණේ නැත. සුජාතා සිද්ධාර්ථ දෙස බලා සිනාසුණාය.

සිද්ධාර්ථ දෙදෙනා දෙසම දෑස රඳවා, ''දරුවනි, නුඹලා මගේ අදහස කුමක් ද කියා තේරුම් ගත්තා නේ ද? කිසිම කෙනෙක් උපතින් නීච හෝ උසස් හෝ වන්නේ නැහැ. සියලු දෙනාගේම ඇස්වල කඳුළු ලුණු රසයි. සියලු දෙනාගේම ලේ රතු පාටයි. මිනිසුන් ශරීරයේ පාට අනුව, ජාති අනුව උසස් පහත් හැටියට බෙදීම සම්පූර්ණයෙන්ම වැරදියි. භාවනා කිරීමෙන් මේ අදහස මට සුම්පූර්ණයෙන්ම අවබෝධ වුණා,'' යැයි කීවේය.

ඉතා සතුටට පත් වූ සුජාතා ''අපි ඔබ වහන්සේගේ ශිෂ්‍යයෝ වෙනවා. අපි ඔබ වහන්සේගේ දේශනා ගැන විශ්වාස කරනවා. නමුත් මේ ලෝකයේ ඔබ වහන්සේ වැනි වෙන කෙනෙක් දකින්නට නැහැ. අපේ සමාජය සිතන්නේ බමුණන් මහා බ්‍රහ්මයාගේ මුවින් සහ ශුද්‍රයින් පයින් උපන් බවයි. වේද ශාස්ත්‍රයේ මෙසේ සඳහන් වී ඇති නිසා ඊට විරුද්ධව යෑමට කිසි කෙනෙකුට ශක්තියක් නැහැ.''

''ඔව්. ඒක මම දන්නවා. කවුරු විශ්වාස කළත් නො කළත් සත්‍ය වසන් කරන්න පුළුවන්කමක් නැහැ. කෝටියක් මිනිස්සු බොරුව කොපමණ විශ්වාස කළත් බොරුව බොරුවමයි. සත්‍ය දේශනා කිරීමට, සත්‍ය මාර්ගයේ ගමන් කිරීමට පුදුම ශක්තියක් අවශ්‍යයි. ඒ ගැන මා ඔබලා දෙන්නාට පුංචි කතාවක් කියන්නම්.

මගේ වයස අවුරුදු නමයේ දී පමණ දවසක් මම මගේ උයනේ සිටින විට හංසයෙක් මා ඉදිරිපිටට ආකාශයෙන් ඇදගෙන වැටුණා. තුවාල වී ඉතාම දුස්සාධ්‍ය තත්වයේයි ඒ හංසයා සිටියේ. මම දුවලා ගිහිල්ලා ඉක්මනට ඒ හංසයා අතට ගත්තා. මං දැක්කා ශරීරය පසා කරගෙන ඊතලයක් විදලා තියෙන බව. මං හැකි ශක්තිය යොදලා උගේ ඊතලය අරන් දැම්මා. තුවාලය රිදීමෙන් හංසය මහත් වේදනාවට පත් වී සිටි අතර ශරීරයෙන් ලේ ගලන්න පටන් ගත්තා. මං තුවාලයට මගේ ඇඟිල්ල තියලා තද කළා. ඊට පස්සේ ලේ වැගිරීම අඩු වුණා. මම හංසයා රජ මාළිගාවට අරගෙන ගියා. රාජ කුමාරි සුන්දරී දිහා බැලුවා. ඇයට මගේ අදහස දැනුණා. ඖෂධ කොළ කිහිපයක් කඩාගෙන විත් අඹරා හංසයාගේ තුවාලයට තැබුවා. හංසයා අමාරුවෙන් දඟලන්න ගත්තා. මගේ උඩුකය ඇඳුම ගලවා හංසයා ඒකෙන් ඔතා ගත්තා. ඊට පස්සේ රජ මාළිගවේ මිදුලේ කොනක තැබුවා.''

සිද්ධාර්ථ කතාව නතර කර ස්වස්ති දෙස බැලුවේය. ''මම මේ දක්වා නුඹට කීවේ නැහැ, පුංචි කාලේ මම රාජ කුමාරයෙක් කියලා. මගේ පියාගේ නම සුද්ධෝදන. රාජධානිය කපිලවස්තුව. සුජාතා ඒ කතාව දන්නවා.

"මම හංසයාට කෑම ටිකක් ගේනන ගබඩා ගෙට යන්න හදන කොටම මගේ මාමාගේ පුතා, දේවදත්ත, හදිසියේ දුවගෙන කාමරය ඇතුළට ආවා. දේවදත්තගේ අතේ දුන්නක් සහ ඊතල කිහිපයක් ද තිබුණා. ඔහු කේන්තියෙන් මගෙන් ඇහුවා, නුඹ සුදු හංසයෙකු ඇද වැටෙනවා දැක්කා ද? කියලා.

''මගේ උත්තරය දීමට පෙර දේවදත්ත දැක්කා හංසයා මිදුලේ කොනක ඉන්න බව. දේවදත්ත හංසයා අල්ලා ගන්න පනින කොටම මම ඉස්සරහට ගිහින් හංසයා අල්ලා ගැනීම නතර කළා.

'''නුඹට මේ පක්ෂියා ගෙන යන්න දෙන්නේ නැහැ,' යි මා කිවුවා. දේවදත්ත කිවුවා 'මේ පක්ෂියා විදලා බිමට දැම්මේ මමයි. ඒ නිසා මේ පක්ෂියා අයිති මටයි කියා.'

"නමුත් මම දේවදත්ත සහ පක්ෂියා අතරට විත්, මේ පක්ෂියා ඉන්නේ බොහාම වෙදනාවෙන්. ඒ නිසා උඹට අවශ්‍ය

ප්‍රතිකාරයි. කිසිසේත්ම ඌව රැගෙන යන්න දෙන්නේ නැහැ කියා, මම කීවා.

''එහෙත් දේවදත්ත තමන්ගේ අයිතිය තහවුරු කිරීමට අවශ්‍ය කරුණු කීවා මිස පක්ෂියාට බෙහෙත් කිරීමට හෝ තමන්ගේ අයිතිය අත් හැරීමට හෝ සූදානම් වුණේ නැහැ.

'''මේ පක්ෂියා ආකාශයේ පියාඹන විට කාටවත් අයිතිව සිටියේ නැහැ. නමුත් මමයි දුන්නෙන් විදලා ඌ බිමට ගත්තේ. ඒ නිසා අයිතිය මගෙයි.'

'''දේවදත්තගේ තර්කය හරි. නමුත් ඒ කතාව අහලා මට කේන්ති ආවා. දේවදත්තගේ තර්කයේ යම් අඩුවක් ඇති බව මගේ හදවතට දැනුණා. නමුත් මම උත්තර දෙන්න ගියේ නැහැ. කම්මුලට පහරක් ගහන්න හිතුණා. ඒක කළෙත් නැහැ. නමුත් මට උත්තරයක් ලැබුණා.

'සහෝදරයා මේ අහන්න. ආදරයෙන් ප්‍රේමයෙන් සිටින අය ඉන්නේ එකටයි. විරුද්ධකාරයෝ ඉන්නේ වෙනවෙනමයි. නුඹ හංසයට විද්දා. ඒ නිසා නුඹ හංසයගේ සතුරායි. පක්ෂියා බිමට වැටුණට පස්සේ උගේ ඇගේ තිබුණු ඊතලය මම අරන් දැම්මා; ශරීරයේ ලේ ගැලීම නතර කළා; තුවාලයට බෙහෙත් දැම්මා; වතුර පෙව්වා. ඌට කෑම ගේන්න යන විටයි උඹ මැදට පැන්නේ. හංසයට මම ආදරෙයි. ඌ ජීවත් කරවන්නයි මම මහන්සි ගන්නේ. අපි දෙන්න ඉන්නේ ආදරෙන්. ඒ නිසා මා සමඟ ජීවත් වීමේ සම්පූර්ණ අයිතිය හංසයට තියෙනවා. පක්ෂියා මහන්සි ගන්නේ ජීවත් වෙන්න. ඒකට මා සෑම උත්සාහයක්ම ගන්නවා. ඒ නිසා පක්ෂියාට ඕනෑ කරන්නේ නුඹ නොවෙයි මාවයි.'''

මේ කතාව ඇසූ සුජාතා හයියෙන් අත්පොලසන් දුන්නා. ''හරියට හරි, ඔබ තුමා හරියටම හරි.''

සිද්ධාර්ථ ස්වස්ති දෙස බලා දරුවා, ''මේ කතාව ගැන නුඹ සිතන්නේ කුමක්ද'' යි ඇසුවේය.

තරමක් නිහඬ වී සිට, ''ගුරුදේව, ඔබගේ අදහස සම්පූර්ණයෙන්ම හරි. නමුත් සමාජයේ බොහෝ දෙනෙක් ඒ අදහසට එකඟ වන්නේ නැහැ. ක්ෂණික තීරණ ගන්නා සමාජය වැඩිදෙනා ගන්නේ දේවදත්තගේ පැත්තයි,'' යැයි ස්වස්ති කීවේය.

''නුඹගේ කතාව හරියට හරි. බොහෝ අය ගන්නේ දේවදත්තගේ පැත්තයි. දැන් මා කියන්නම් ඊට පස්සේ වුණේ මොකක් ද කියා. අපි දෙන්නගේ ප්‍රශ්නය විසඳ ගන්න බැරි වුණා. අන්තිමේ දී රජගෙදර උසාවියට ගියා. එතන ඉතාම වැදගත් පිරිසක් හිටියා. මම හංසයා මගේ දෑතෙන් උස්සාගෙන ගියා. දෙවදත්තගේ අතේ දුන්න සහ ඊතල තිබුණා. මගේ අදහස් උසාවියට දන්වා විසඳුම දැන ගන්න කැමති වුණා. දෙවදත්ත තමන්ගේ පැත්තට කරුණු ඉදිරිපත් කළා. නමුත් තීරණය ගන්න කිසි කෙනෙකුට පුළුවන් වුණේ නැහැ. වැඩිපුරම අය දේවදත්තගේ පැත්තට නැඹුරු බව දැක ගන්න ලැබුණා. කාරණය තේරුම් ගත් මගේ පියා කීප වරක්ම කැස්සා. සියලු මන්ත්‍රීවරු කතා කිරීම නතර කළා. පක්ෂියා මට භාර දුන්නා. දේවදත්ත කේන්ති ගත් බව මං දැක්කා. නමුත් තීරණයට විරුද්ධව කළ හැකි කිසිදෙයක් තිබුණේ නැහැ.

''පක්ෂියා මට ලැබුණා. නමුත් මා ඒ තරම්ම සතුටට පත් වුණේ නැහැ. ඒ කාලේ මා ඉතා කුඩා ළමයෙක්. මට දැනුණා මගේ ජය ගැනීම සම්මාන සහගත එකක් නොවෙයි කියා. හේතුව මන්ත්‍රීවරු මගේ පියා සතුටු කරන්න ගත්ත තීරණයක් හැර මගේ තර්ක අනුව ගත් තීරණයක් නොවූ නිසා. ඊට පසු මා හංසයා දෙස බැලුවා. මං දැක්කා හංසයා ජීවත් වෙනවා. ඒක දැකලා මම සතුටු වුණා. එහෙම නොවුණා නම් දේවදත්ත හංසයා මරලා මස් කරලා කන බව ස්ථිරයි. මේ ලෝකයේ හදවතේ කරුණාව ඇති අය ඇත්තේ බොහොම ටික දෙනයි. බොහෝ අය හදවතේ කුරිරුකම් ඇති කරගෙන ඉන්න බව මින් පැහැදිලි වෙනවා.

''ශක්ති සම්පන්න අය හැම විටම දුර්වල අය යටපත් කරනවා; තලනවා; පෙළනවා. එදා මා ඉදිරිපත් කරපු තර්කය නිවැරදියි. හේතුව ප්‍රේමය සහ කරුණාව එහි සම්පූර්ණයෙන්ම පිරී තිබීමයි. ප්‍රේමයෙන්, මෛත්‍රියෙන් කරුණු තේරුම් ගන්නවා නම් ලෝකයේ ප්‍රශ්න විසඳන්න ඉතාම පහසුයි. ඇත්ත ඇත්තම යි. ලෝකයේ බොහෝ දෙනෙක් ඒක පිළිගත්තා හෝ නොගත්තා හෝ කියා සිතන්න දෙයක් නැහැ. ඒ නිසා දරුවනි, හරි දේ හරියට ම කීමට ලෝකයාට සිතේ පුදුම ශක්තියක් තිබිය යුතුයි.

''ගුරු දේවයාණනි, හංසයට ඊට පස්සේ මොකද වුණේ?'' ඉතාම උනන්දුවෙන් සුජාතා ඇසුවාය.

''දවස් හතරක් දක්වා හංසයාට මා ඉතා හොඳින් සැලකුවා. ඊට පස්සේ මම දැක්කා උගේ තුවාලය තරමක් සුව වී ඇති බව. පසුව හංසය නිදහසේ යන්න අතහැර දැම්මා.''

සිද්ධාර්ථ, ස්වස්ති සහ සුජාතාව දෙස බැලුවේය. ''සුජාතා නුඹ ප්‍රමාද නොවී ගෙදර යන්න. ප්‍රමාද වුණොත් අම්මා කලබල වේවි. ස්වස්ති නුඹගේ මී හරක් රැළ තවමත් තණ කනවා ඇති. නුඹත් උන්ට රෑට ඕනෑ කරන තණ කොළ ටික කපා ගනින් ඉක්මනට. ඊයේ නුඹ මට දුන් කුස තණ ටික භාවනා කිරීමට වාඩි වීම සඳහා මා පුංචි පත් කඩයක් හදා ගත්තා. ඊයේ රෑත් අද උදේත් මා වාඩි වී භාවනා කළේ ඒ කුස තණ පත්කඩය මතයි. මගේ භාවනාව ඉතා හොඳට සිද්ධ වුණා. බොහෝ කරුණු මට ස්පෂ්ට වුණා. ස්වස්ති, නුඹ මට බොහෝ උපකාරී වුණා. භාවනා කරන විට මට අවබෝධ වන සෑම දෙයක්ම නුඹලා දෙන්නාට මම කියා දෙන්නම්. දැන් ඉතින් මම භාවනාව පටන් ගන්නම්.''

ඔහු දුන් කුස තණ ටිකෙන් ආසනයක් සාදා ඇති බව ස්වස්ති දුටුවේය. ඉන් සුවඳ ද වහනය විය. සුජාතා සහ ස්වස්ති සිටි තැනින් නැඟිට දෙඅත් එකතු කර ගුරු දේවයන්ට නමස්කාර කර එතැනින් පිටත්ව ගියහ. සිද්ධාර්ථ භාවනාව පටන් ගත්තේය.

## පස් වන පරිච්ඡේදය

# කිරි කෝප්පයක ශක්තිය

සෑම දාම ස්වස්ති සිද්ධාර්ථ හමු වීමට වන රොදට ගියේය. උදේ වරුවේ තණ මිටි කිහිපයක් කපා තබා ගෙනෙන බත් මුල ද සෑම දාම දෙදෙනා අතර බෙදාගෙන අනුභව කළේය. ඔහු දවස් තුනකට වරක් කුස තණ ගෙනවිත් ආසනයක් සාදා දුන්ණේය. උෂ්ණ කාලය ක්‍රමයෙන් ළඟා වූ නිසා මෘදු නිල් තණකොළ ද ක්‍රමයෙන් අඩු වන්නට විය. ඒ නිසා හවස් වරුවේත් ගුරු දේවයන් හමු වීමට යෑම ස්වස්ති සිරිතක් කර ගත්තේය. ඉඳහිට සමහර දිනවල දී සිද්ධාර්ථ භාවනාවේ යෙදී සිටියේය. ඒ අවස්ථාවල දී ස්වස්ති ටික වේලාවක් එහි වාඩි වී සිට නැවතත් මී හරක් රැළට තණ කැවීමට ගියේය. හේතුව ගුරු දේවයන්ගේ භාවනාවට කරදර කිරීම නුසුදුසු බව ඔහු තේරුම් ගත් නිසාය. සිද්ධාර්ථ වන රොදේ ඇවිදිමින් සක්මන් කරන විට ස්වස්ති ද පසුපසින් ගියේය. ඉඳහිට සැප දුක ද කතා කළේය. සුජාතා ද ඉඳහිට වන රොදට පැමිණි විට ස්වස්ති හමු වීම සිරිතක් කරගෙන තිබිණි. ඒ එන හැම විටම සුජාතා සෑම දාම කිරි බඳුනක් සමඟ ආහාර සඳහා ද කිසිවක් සිද්ධාර්ථට රැගෙන ආවාය. සමහර අවස්ථාවල සුජාතා සහ ස්වස්ති

නේරංජනා ගඟ අයිනේ එකට එකතු වී සැප දුක් ද කතා කළහ. සුජාතා ඉඳහිට තම මිතුරිය වූ සුප්‍රියා ද කැඳවාගෙන ආවාය. සුප්‍රියා ස්වස්තිගේ වයසේම ගැහැනු ළමයෙකි. ස්වස්ති තමන්ගේ සහෝදරයා සහ සහෝදරියන් එක්කරගෙන විත් සිද්ධාර්ථට හඳුන්වා දීමට සිතීය. නේරංජනා නදියේ දිය අඩු තැනින් තම සහොදරයා සහ කුඩා සහෝදරියන් දෙදෙනාම එතෙරට විය හැකි බව ඔහුට විශ්වාස විය.

සිද්ධාර්ථ සුජාතාට පළමු වර මුණ ගැසුණේ කෙසේ ද යන්න ඇය ස්වස්තිට විස්තර ඇතිව කියා දුන්නාය. එදා පටන් මේ දක්වා සිද්ධාර්ථට දහවල් කෑම ගෙන ආවේ සුජාතාය. එදා පුර පුන් පොහෝ දාය. මැණියන්ගේ කීම පිට එදින ඇය හැඳ සිටියේ රෝස පැහැති ඇඳුමකි. බන්දේසියක කිරිබත් ආදිය තබා එදා වන දේවතාවුන්ට පූජා කිරීම සඳහා වන රොදට ගියාය. දේවතාවුන්ට පූජා කිරීම සඳහා කිරිබත්, කිරි, මී පැණි ආදියෙන් බන්දේසිය පුරවා තිබිණි. දහවල් කාලය ඉතා තද හිරු රශ්මිය පැවතිණි. නේරංජනා නදී තීරයට යන විට එක් පුරුෂයෙක් සිහි නැතිව ඇද වැටී සිටිනු ඈ දුටුවාය. පූජාවට ගෙන ආ පූජා බන්දේසිය පසෙක තබා ඇය එතැනට දිව ගියාය. ඔහු අවසන් හුස්ම හෙළන තත්වයට පත් වී සිටියේය. ඇස් දෙක සම්පූර්ණයෙන් ම වැසී තිබිණි. දුටු ඕනෑ කෙනෙකුට සිතෙන්නේ එතුමා දින ගණනාවකින් ආහාර ගෙන නැති බවයි. දිගට වැවුණු හිස කෙස්, අවුල් වූ දිග රැවුල හා පරණ වැරහැලි පොරෝණය දකින කෙනෙකුට සිතෙන්නේ කඳු වැටියේ ගුහාවක තපස් රකින තාපස කෙනෙක් බඩ ගින්නේ මරණයට සූදානම් වන බවයි. සුජාතා ඉක්මනින් කෝප්පයට කිරි ටිකක් දැම්මාය. සිහි නැතිව ඇද වැටී සිටින තැනැත්තා ළඟට ගොස් දෙතොලෙහි කිරි පොදක් තැබුවාය. මුලින්ම කිසිදු ප්‍රතික්‍රියාවක් නොදැක්වූවත් පසුව මදින්මද දෙතොල් සෙලවිණි. සුජාතා ඔහුගේ මුවට කිරි බිඳ බිඳ දැමුවාය. ඔහු ටිකෙන් ටික කිරි පානය කළ අතර සුළු වේලාවකින් කෝප්පය හිස් විය.

සුජාතා නේරංජා නදී ඉවුරේ මේ තැනැත්තාට සිහිය ඒ ද නැද්දැයි සිතමින් බලා සිටියාය. මද වේලාවකින් ඔහු දෑස් විවර කෙළේය. හිමින් සීරුවේ නැඟී සිටි මේ තැනැත්තා නැවත වාඩි විය. සුජාතා දුටු පසු සිහින් සිනාවකින් ඇයට සලකා ඇඳ සිටි

රෙදි කඩ පිටට දමා නැවතත් පද්මාසනයෙන් වාඩි වූවේය. ඔහු මුලින්ම හුස්ම ගැනීම කළේ ඉතා අපහසුවෙනි. ඉන් පසු ඉතා හොඳින් හුස්ම ගැනීමත් හෙළීමත් කළේය. වාඩි වී සිටි අයුරු ඉතා රමණීය සිත්ගන්නා සුළු විය.

ශරීරයට කෂ්ඨ දී භාවනා කරන තාපස කෙනෙක් බව දැනගත් පසු සුජාතා දෑත් එකතු කර එතුමාට නමස්කාර කළාය. නමුත් එතුමා සංකේතයකින් එසේ නොකරන ලෙස දන්වා සිටියේය. සුජාතා ඒ සමීපයෙන් වාඩි වූවාය. ඉතාම මිහිරි ස්වරයෙන් සුජාතා අමතා, ''දරුව, මට තව කිරි ටිකක් දෙන්න,'' යැයි කීය. කිරි ඉල්ලීම නිසා සුජාතා ඉතා සතුටට පත් වූවාය. ඈ ඉක්මනින් කිරි කෝප්පයක් ඔහුගේ අතට දුන්නාය. ඔහු එය එක උගුරටම බී අවසන් කළේය. ඒ කිරි බීමෙන් තමන්ට ලොකු ශක්තියක් ලැබුණු බව ඔහුට දැනිණි. ටික වේලාවකට පෙර ඔහුට අද අන්තිම හුස්ම හෙළන්න සූදානම් වූ බව දැනිණි. ඔහු දෑස් විවර කර මුව සරසා සුජාතා දෙස බලා සිනාසිණි.

''ඔබ මහා මාර්ගයේ සිහිසන් නැතිව ඇද වැටුණේ කෙසේ ද?''

''මා කඳු මුදුනේ වනාන්තර ගුහාවල හැසිරෙමින් ශරීරයට අන්තිම කෂ්ඨ දෙන අත්තකිලමතානුයෝගය නම් වූ යෝග ක්‍රමය පුරුදු කළා. ඒ තපස් ක්‍රමය මා ඉතාම ක්‍රමවත්ව ඉතාම හොඳින් සිද්ධ කළා. ඒ නිසා මගේ ශරීරය මේ තරම් දුර්වල වුණා. ඉන් පලක් නොවන බව දුටු විට මට සිතුණා කඳු මුදුනෙන් බැස විත් ගමෙහි පිණ්ඩපාතය කර භෝජන ගැනීමට. නමුත් එන අතර තුර මගේ සිරුර මට පිළිතුරු දුන්නා මෙතැනින් එහාට යාමට නොහැකියි කියා. නුඹට බොහෝම ස්තුතියි. නුඹ නිසා මගේ ශරීරයත් මගේ ප්‍රාණයත් බේරුණා.''

සුජාතා තමන් ගැන සම්පූර්ණ විස්තර එතුමාට කීවාය. එතුමා විසින් ද තමන් ශාක්‍ය වංශයේ සුද්ධෝදන රජුගේ පුත්‍ර සිද්ධාර්ථ බව හඳුන්වා දෙන ලදී. සිද්ධාර්ථ කී සියල්ල සුජාතා ඉතා ආශාවෙන් අසාගෙන සිටියාය.

''මට අවබෝධ වුණා ශරීරය සමඟ අනවශ්‍ය පරීක්ෂණ කිරීමෙන් මා බලාපොරොත්තු වන සුවය අත් කර ගැනීමට නො ලැබෙන බව. ශරීරය යන්ත්‍ර මාත්‍රයක් පමණක් නොවෙයි. ශරීරය නැවකට සමානයි. එය උපයෝගී කර ගත යුත්තේ සසරින් එතෙර වීම සඳහා පමණි. සිරුර තවතවත් දුර්වල වන තෙක් දුෂ්කර ව්‍රත දැරීම මහා අනුවණකමක්. හෙට මම පිණ්ඩපාතය සඳහා ගමට යනවා.

සුජාතාව දෑත් එකතුකර ස්වාමීනි, ''මට අවසර දෙන්නේ නම් මා හැම දාම ඔබට කෑම මගේ ගෙදරින් රැගෙන එන්නම්. පිණ්ඩපාතය සඳහා කාලය යොදවා භාවනාවට අවහිර කර ගන්න ඕනෑ නැහැ. මගේ ගෙදර මෙතන ඉඳලා ඒ තරම් දුර නැහැ. මා දන්නවා ඔබතුමාට කෑම දෙන්න කිවුවොත් මගේ අම්මාත් තාත්තාත් ඉතාම සතුටු වන බව.''

සිද්ධාර්ථ මද වේලාවක් නිහඬව සිටියේය. ඉන්පසු ''මම ඉතාම සතුටෙන් ඔබගේ ආරාධනාව බාරගන්න කැමතියි. නමුත් මා වරින්වර පිණ්ඩපාතය සඳහා ගමට යන්න ඕනෑ. හේතුව ගමේ අය මුණ ගැසෙන්න ලැබෙනවා. මම නුඹගේ අම්මා තාත්තා ගමේ අනෙක් ළමයින් හමුවන්න කැමතියි,'' යැයි කීවේය.

සුජාතා ඉතාම සතුටට පත් වූවාය. දෑත් එකතු කර කෘතඥතාවෙන් යුතුව ඇය සිද්ධාර්ථට නමස්කාර කළාය. සිද්ධාර්ථ සුජාතාගේ ගෙදර එන බවත් අම්මා තාත්තා මුණගැසීමට බලාපොරොත්තු වන බවත් අසා ඉමහත් සතුටට පත් වූවාය. සිද්ධාර්ථට තමන්ගේ ගෙදරින් කෑම රැගෙන ඒම අපහසුවක් නො වන බව ඇය ඉතාම හොඳින් දැනගෙන සිටියාය. හේතුව සුජාතාගේ පවුල ගමේ ඉතාම පොහොසත් පවුලක් වීමයි. සුජාතා ඒ පිළිබඳ කිසිදු දෙයක් සිද්ධාර්ථට කීවේ නැත. මේ සාධුවරයා එසේ මෙසේ කෙනෙක් නොව, වන දෙවතාවුන් දහසකට පුද කරනවාට වඩා මෙතුමාට භෝජන කරවීම ඉතාම වැදගත් බව ඇයට වැටහී ගියේය.

යම් කිසි ආකාරයකින් සිද්ධාර්ථගේ භාවනා ක්‍රම සාර්ථක වුව හොත් ඉන් සසර දුක් විඳින විශාල පිරිසකට මහත් සෙතක් සැලසෙන බව සුජාතාවගේ දැඩි විශ්වාසය විය. සිද්ධාර්ථ

දුංගේශ්වරියට අත දිගු කර සුජාතා තමන් තපස් රැක්ක ගුහාව තිබුණු ස්ථානය පෙන්නුවේය. ''අදින් පසු මා එහි යන්නේ නැහැ. ඒ ගුහාව තිබුණු වනාන්තරය ඉතාම සැපදායකයි; ශීතලයි. ඒ පැත්තේ මහ විශාල ඇසතු වෘක්ෂයක් තිබුණා. මා සිතා සිටින්නේ ඒ ගස යට මගේ භාවනාව කරන්න කියලා. හෙට දහවල් කෑම එතනට ගෙන එන්න. මා සමඟ එන්න නුඹට මා නියම තැන පෙන්වන්නම්.''

සිද්ධාර්ථ සුජාතා නේරංජරා නදී ඉවුරේ අනෙක් පැත්තේ වන රොදට එක්කරගෙන ගියේය. සුජාතාට ඒ විශාල ඇසතු රුක පෙන්වීය. තමන් ඒ රුක් සෙවනේ භාවනා වඩන බව ද කීය. සතර දිශාවට විශාල අතු විහිදී ගිය ඒ රමණීය ඇසතු වෘක්ෂය සෙවනේ කුරුල්ලන්ගේ මිහිරි නාදය සුජාතාට ඇසිණි. එම ස්ථානය ඉතාම ශාන්ත පරිසරයක් බව ඇයට හැඟී ගියේය.

මේ සුවිශාල වෘක්ෂය අභියසට සුජාතා ද මීට පෙර කිහිප වරක්ම වන දේවතාවුනට පුද පූජා කිරීම පිණිස තම දෙමාපියන් සමඟ පැමිණ තිබිණි. ''හොඳයි, ගුරු දේවයාණනි, මේ ඔබගේ අලුත් නිවාසයයි. එහෙම ද? මම හැම දාම මේ ස්ථානයට ඔබව දකින්න භෝජනත් රැගෙන එන්නම්.''

ඉන් පසු සෑම දිනකම හිරු උදාවත් සමඟම සුජාතා සිද්ධාර්ථ සඳහා බත් හෝ චපාති හෝ රැගෙන ගියාය. ඇතැම් දිනෙක කිරි සහ කිරිබත් ද රැගෙන ගියාය. සමහර අවස්ථාවල සිද්ධාර්ථ පිණ්ඩපාතය සඳහා ගමට ගියේය. ඒ ගමනේ දී සුජාතාගේ මව හා පියා ද මුණ ගැසිණි. සුජාතා සිද්ධාර්ථට හඳුන්වා දුන් අය අතර ගමේ පුංචි ළමයි ද වූහ. ගමේ අයගේ කෙස්රැවුල් කපන කරණවෑමියා ද ඇය සිද්ධාර්ථට හඳුන්වා දුන්නාය.

සිද්ධාර්ථගේ ශරීර සෞඛ්‍ය දූන් ක්‍රමයෙන් හොඳ අතට හැරෙමින් පවතින බව පෙනිණි. තමන්ගේ භාවනා ක්‍රම දූන් ක්‍රමයෙන් සාර්ථක වන බව ඔහු සුජාතාට කීවේය.

දෙවන දිනයේ සුජාතාට ස්වස්ති මුණ ගැසිණි. එහෙත් ඔහු සමඟ වැඩි වේලාවක් කතා කිරීමට නොසිටි ඇය ගුරු දේව සිද්ධාර්ථට ආහාර ගෙන යාම ඉක්මන් කළාය. ඇය මඟ දී ස්වස්ති

මුණ ගැසුණු බවත් ඉක්මනින් පැමිණි නිසා වැඩිපුර කතා කිරීමට නොහැකි වූ බවත් ඇය සිද්ධාර්ථට කීවාය.

මේ කතාව ඇසීමෙන් පසු ස්වස්ති මුණ ගැසිය යුතු බව සිද්ධාර්ථ සුජාතාට කීය. ඒ සමඟම ස්වස්ති සිද්ධාර්ථ සමීපයට පැමිණියේය. ඔහු හමු වූ හැම අවස්ථාවකම ඔහුගේ සහෝදරසහෝදරියන්ගේ සැපසනීප විමසීමට සිද්ධාර්ථ අමතක නොකළේය. සිද්ධාර්ථ, සුජාතා සහ ඇගේ මෙහෙකාරිය වූ පුණ්ණා ස්වස්තිගේ සහෝදරසහෝදිරියන් දැකීමටත් ඔවුන්ගේ සැපදුක් විමසීමටත් ස්වස්තිගේ නිවසට ගියහ. රාධා නම් මෙහෙකාරිය වසූරිය රෝගයෙන් මිය ගිය පසු සුජාතා තම මෙහෙකාරිය ලෙස පුණ්ණා හෙවත් පූර්ණිමා පත්කර ගත්තාය.

සුජාතා, පූර්ණිමා සමඟ ස්වස්තිගේ නිවසට යන සමහර දිනවල ඔහුගේ පුංචි සහෝදරසහෝදරියන්ට ඇඳීම සඳහා රෙදිපිළි ද රැගෙන ගියාය. සුජාතා පැලට ගොඩවනවාත් සමඟ පුංචි භීමාව ඔසවා උකුළේ තබාගෙන ආදරය දැක්වූවාය. ආපසු යන අතරතුර ඒ බව තම මවට හා පියාට නොකියන ලෙස සුජාතා පුණ්ණාට කීය. අඩු කුලේ දරුවෙකු උකුළට ගත් බව ඔවුන් දැන ගතහොත් අනිවාර්යයෙන්ම සිය දෙමාපියන්ගෙන් තමන්ට දඬුවම් විඳීමට සිදුවන බව ඇය දැන සිටියාය.

එක් දිනක් උරුවේලාවේ කුඩා ළමයි රැසක් එකතු වී සිද්ධාර්ථ දැකීම සඳහා යාමට කතිකා කර ගත්හ. ස්වස්තිගේ පවුලේ සැම දෙනා ද ඒ සඳහා සූදානම් වූහ. සුජාතා ද තමන්ගේ මිතුරියන් වූ බාලා, ගුප්තා, විජයසේනා, විල්ලකී සහ ජටලිකා ද එකතු කර ගති.

ඇය, තම නැන්දනියගේ දියණිය වූ සොළොස් වියැති නන්දබාලා ද තම සහෝදරයා වන දහ හතර වියෙහි වූ නාලකවත් අවුරුදු නවයක් වූ සුභාෂ්වතීත් ගමනට එකතු කර ගත්තීය.

එදින පුංචි දරුවන් එකොළොස් දෙනෙක් සිද්ධාර්ථ හමුවීමට ගොස් ඔහුව වට කරගෙන වාඩි වී සිටියහ. සිද්ධාර්ථ පුරුදු පරිදි තම දහවල් ආහාරය ගත්තේය. ඔහු නිහඬව කෑම

කන්නේ ඇයි ද කියා ස්වස්ති බාලාටත් රූපකටත් විස්තර කර දුන්නේය.

ස්වස්තිගේ උකුළෙහි වූ හීමා ද නිහඬව කෑම කෑවාය. ස්වස්ති සිද්ධාර්ථට ආසනය සාදා ගැනීමට අවශ්‍ය තරම් කුස තණ රැගෙන ආවේය. ඔහු සිද්ධාර්ථ සමඟ දහවල් කෑම කා එන තෙක් රාම්භූල්ගේ මී හරකුන් බලා ගන්නා ලෙස තම මිත්‍ර ගෝපාලයා වූ ගවම්පතිට කියා ආවේය. කුඹුරුවල හිරු රැස් තදින් දිස් විය. නමුත් වනයේ ඇසතු වෘක්ෂය යට සිද්ධාර්ථ සහ කුඩා ළමයින් සීතල සුවය විඳිමින් සිටියහ. ඇසතු වෘක්ෂය යට කෙතරම් ඉඩකඩ තිබුණා ද කිවහොත් ඔවුන්ගේ ගෙවල් දහයක තරම් ඉඩක් එහි විය. ළමයි සැම දෙනම තමතමන්ගේ කෑම බෙදාගෙන කෑහ. රූපක්ට සහ බාලාට තෙල් හා ලුණු සමඟ චපාති කෑම ඉතාම ප්‍රිය ජනක විය. එයට සුවඳ සුදු හාල් බත් එකතු වුණොත් එය ඉතා රසවත් භෝජනයකි. සුජාතා සහ බාලා ගුප්තා රැගෙන ආ ජලය සියලු දෙනාටම පානය සඳහා සෑහුණි. ස්වස්තිගේ සතුට නිම් හිම් නැති විය. පරිසරය ද ඉතා ම ශාන්ත විය.

එදා සුජාතාගේ ඉල්ලීම මත සිද්ධාර්ථ තම මුළු ජීවිත කතාවම ළමයින්ට කියා දුන්නේය. සැම ළමයෙක්ම සම්පූර්ණ කතාවම මුල සිට අග තෙක් ඉතා ආශාවෙන් අසාගෙන සිටියහ.

## හය වන පරිච්ඡේදය

# සී සෑම සහ භාවනාව

සිද්ධාර්ථට වයස නවයේ දී තමන් මෑණියන් වූ මහාමායා බිසව මහාමායා කුස පිළිසිඳ ගැනීමේ දී ඇය දුටු සිහිනය පිළිබඳව දැන ගන්නට ලැබිණි. ඔහු පුංචි දරුවනට එය විස්තර කර දුන්නේය.

හිම කන්දක් බඳු සුදු පාට ඇත් පැටවෙක් සුදු නෙළුම් මලක් හොඬින් ගෙන ආකාශයේ සිට කුංචනාද කරමින් බිමට බැස්සේය. සැතපී සිටි මහාමායා දේවියගේ සයනය ළඟට විත් සයනය වටා තුන් වරක් පැදකුණු කොට නෙළුම් මල ඇගේ සිරුර තුළ තැන්පත් කළේය. පසුව ඒ ඇත් පැටවා ද දේවියගේ කුස තුළට ඇතුළු විය. මහා මායා දේවියට මහත් සතුටක් දැනිණි. ඇයට කිසිදු වේදනාවක් දැනුණේ නැත. අවදි වී සයනයෙන් බසින තෙක් ඇයට දිව්‍ය තූර්‍ය වාදන හඬ ඇසිණි.

පසු දා උදෑසන සුද්ධෝදන රජතුමාට සිහිනය ගැන කී විට රජතුමා ද මහත් පුදුමයට පත් විය. මෙම සිහිනය යමක පූර්ව නිමිත්තක් දැයි දැන ගැනීමට ඔහුට අවශ්‍ය විය. රජතුමා නගරයේ සිහින පලාඵල කියන පඬිවරුන් සැවොම ගෙන්වා සිහිනය පිළිබඳ විස්තර කීය. එය ඇසූ පඬිවරු, ''මහරජතුමනි, මෙය ඔබතුමාට මහත් සතුටු විය හැකි පෙර නිමිත්තකි. ඔබතුමාගේ බිසවගේ කුස

පිළිසිඳගෙන ඇති දරුවා මේ ලෝකයට බිහි කළ පසු තුන් ලෝකයට ම නායකයෙක් වනවාට සැකයක් නැත. ඒ දරුවා දිනක චක්‍රවර්ති රජෙකු වී සතර දිශාවම පාලනය කරනු ඇත. එසේ නොවුණහොත් දෙවුලොවත්, පොළොවේත් වසනා සියල්ලන්ටම සත්‍යයේ මාවත පෙන්වන මහා ඇදුරු කෙනෙකුන් වන්නේය. අපේ මේ මහා පොළොව බලා සිටින්නේ එබඳු මහා පුරුෂයෙකු කවදා ඒ ද කියායි,'' යනුවෙන් ප්‍රකාශ කළහ.

මේ කතාව ඇසූ සුද්ධෝදන රජු මහත් සතුටට පත් විය. මහාමායා බිසව සමඟ සාකච්ඡා කොට මේ සතුට නිමිත්තෙන් රාජ භාණ්ඩාගාරයෙන් ධනය ගෙන රටේ සිටින රෝගීන්ටත් දුප්පතුන්ටත් දින හතක් යන තෙක් බෙහෙත් හා ආහාර බෙදා දීමට නියෝග කළේය. මේ අයුරින් රාජ්‍යයේ වැසි සියලුම දෙනා ශාක්‍ය වංශයට ලැබෙන්න යන උතුම් සම්පත ගැන සතුටට පත් වූහ.

මහාමායා නම් වූ සිද්ධාර්ථගේ මව ඉතාම ගුණ සම්පන්න කාන්තාවක වූවාය. ඇගේ හදවතේ, සියලු ප්‍රාණීන් කෙරෙහි මෙන්ම ගස් වැල් කෙරෙහි පවා පුදුම ආදරයක් හා කරුණාවක් තිබිණි. කාන්තාවක දරු ප්‍රසූතිය සඳහා තම දෙමාපියන් වෙත යාම සිරිත විය. මහාමායා කෝලිය පරපුරෙහි කුමරියක වූවාය. එබැවින් පළමු දරුවා බිහි කිරීම සඳහා කෝලිය දේශයේ අග නුවර වූ රාම ග්‍රාමය බලා පිටත් වූවාය. ගමන යන අතර මඟ දී විවේක ගැනීම සඳහා ලුම්බිනි සල් උයනේ නතර වූවාය. ලුම්බිනි සල් උයන විවිධ මල් වර්ගවලින් පිරී තිබිණි. උදෑසන හිරු එළිය මෝරාගෙන එන අවස්ථාවේ මොනරු ද පිල් විදහාගෙන නටන්ට වූ අතර මල් වදුළුවල කුරුල්ලන් ගීත ගයමින් ඔබ මොබ පියාසර කළහ. ඇයට ශරීරය තරමක් බර වූ බව දැනී උයනේ තිබූ අශෝක ගසක සෙවනට ගොස් එහි අත්තක් අල්ලා ගත්තාය. නොබෝ වේලාවකින් රන්වන් රුවෙන් යුත් පුත්‍ර රත්නයක් මෙලොවට බිහි කළාය.

මහාමායාගේ සේවිකාවන් විසින් කුමරු පිරිසිදු දියෙන් නහවා කහ පැහැති සේද රෙදිවලින් සිරුර ඔතන ලදී. දැන් තව දුරටත් රාම ග්‍රාමයට යාමේ අවශ්‍යතාවක් නැත. එබැවින් බිසව හා අලුත උපන් කුමරු අශ්වයන් සිවු දෙනා බැඳි ඔවුන්ගේ කරත්තයෙන් ආපසු කපිලවස්තුවට රැගෙන යන ලදී. රජ මාළිගාවට ගිය විගස ම රජ කුමරා උණු වතුරෙන් නැහැ වූ අතර බිසව ළඟම නිදි කරවී ය.

තම බිසවට පුතෙකු ලැබුණු බව අසා සුද්ධෝදන රජතුමා මහත් සතුටින් දෙදෙනාම බැලීම සඳහා පැමිණියේය. රජතුමාගේ නිම්හිම් නැති සතුට එතුමාගේ දෑසින් ද දකීමට ලැබිණි. තම පුත්‍රයාගේ නම ''සිද්ධාර්ථ'' නමින් නම් කරන ලදි. රාජ්‍යපුරාම මේ සිද්ධිය ආරංචි වීමෙන් බිසවටත් උපන් කුමාරයාටත් සුභ පැතීමට බොහෝ පිරිස් ආහ.

රජතුමා සිද්ධාර්ථගේ අනාගතය දැන ගැනීම සඳහා මහාර්ෂිවරුන්ට ආරාධනා කළහ. කුමරුන්ගේ ශරීර ලක්ෂණ දුටු හැමදෙනාම කීවේ මේ කුමරා මහා පුරුෂයෙකු වන බවත් ඒ ගැන කිසිම සැකයක් නොකරන ලෙසත්ය. කුමරු ඉපදී සතියකට පසුව මහර්ෂී කාලදේවල සුද්ධොදන මාලිගාවට පැමිණියේය. වයස අධික වූ නිසාම කාලදේවලගේ ශරීරය කුදු වී තිබිණි. එතුමාට තපස් රැකි කඳුකරයෙන් පහළට බැසීමට සැරයටියක උපකාරය අවශ්‍ය විය. රජවාසලේ දොරටුව ළඟට පැමිණි විට දොරටුපාලයා ඉක්මනින් ගොස් කාලදේවල පැමිණි බව දැන්වීය. කිසිවෙකු නොඑවා රජතුමාම වහා ඉදිරියට ගොස් කාලදේවල තාපසතුමා ඉතා අදරයෙන් පිළිගත්තේය. මහර්ෂි තෙම කෙළින්ම අලුත උපන් කුමරු දැකීම සඳහා ගියේය. ඔහු දිගු වේලාවක් වචනයකුදු කතා නොකර රජ කුමරු දෙස බලා සිටියේය. ඉක්බිත්තෙන් ඔහු වැළපෙන්නට පටන් ගත්තේය. අතෙහි වූ සැරයටිය එතුමාගේ වෙවුලන සිරුර දරා සිටීමට උපකාර විය. දෑසින් ඉනූ කඳුළු වැල් එතුමාගේ කම්මුල් දිගේ ගලා යන්නට විය. එය සුදොවුන් රජුගේ සිත තුළ තැතිගැන්මක් ඇති කළේය. බිය මුසු දෑසින් යුතු රජු, ''මුනිවරය, ඔබ හඬන්නේ ඇයි? ඔබ දරුවාට වරදක් වන යම් පෙර නිමිත්තක් දකින්නේ ද?'' යි ඇසී ය. ඉසිවරයා තම දෑසින් කඳුළු පිස හිස සැලීය.

''මහ රජතුමෙනි, මේ දරුවාට අහිතක් වන කිසිවක් දක්කේ නැත; සිතුවේත් නැත. මා ගැනයි හැඬුවේ. මේ දරුවාගේ මහා ගුණ සමූහයක් මට පෙනෙනවා. මේ දරුවා මුළු මහත් විශ්වයේම සත්‍යය දැනගන්න ශක්තිය ඇති කෙනෙක් වෙනවා. මහ රජ, ඔබගේ පුත්‍රයා රාජ්‍ය කරවන කෙනෙක් වන්නේ නැහැ. මේ දරුවා සද්ධර්මය පිළිබඳව මහා ආචාර්යවරයෙක් වෙනවා. භූ ලෝකය හා සවර්ග ලෝකය මේ ළමයාගේ නිවාසය වෙනවා. සියලු ප්‍රාණීන් මේ දරුවාගේ සම්බන්ධීන් වෙනවා. මේ සියල්ල අවබෝධ

කරගෙන දේශනා කරන අවස්ථාව වන විට මා පරලොව ගිහින්. රජතුමනි, ඔබත් ඔබගේ රාජ්‍යයත් මෙබඳු පුතෙකු බිහි කිරීම නිසා මුළු ලෝකයේම පැසසුමටත් ස්තුතියටත් ලක් වේවි.''

අසිත ආපසු යාමට හැරුණු බව දුටු රජු, ''තවුස්තුමනි, ටික වේලාවක් නැවතී යාමට හැකි ද,'' යි ඇසීය. එහෙත්, ''නැත,'' යන්න එතුමාගේ පිළිතුර විය. වයෝවෘද්ධ තවුසා ඔහුගේ කඳු මුදුන වෙත ආපසු ගමන් කළේය. අසිත තාපසතුමාගේ පැමිණීම සුද්ධෝදන රජුගේ සිත මහත් ව්‍යාකූලත්වයට පත් කළේය. ඔහු කිසිසේත්ම තම පුත්‍ර රත්නය පැවිද්දෙකු වනවා දැකීමට කැමති වූයේ නැත. රජුගේ සිහිනය වූයේ තම පුතු සිහසුනෙහි වාඩි වී තමා සතු රාජ්‍යය සීමාව තවතවත් පුළුල් කර ගනු දැකීමයි. අසිත යනු සෙසු තවුසන් දහසකගේ දැනුමටත් වැඩි පිරිසිදු දැනුමක් ඇති කෙනෙකි. එහෙත් කුමරුන් දුටු සෙසු තවුසන් කීවේ කුමරු සක්විති රජකු වනවා යන්නයි. ''ඇතැම් විට අසිත තවුසාට වැරදීමක් වන්නට ඇත. අනිවාර්යයෙන්ම අනෙත් තවුසන් කී අනාවැකි අනුව සිදුහත් දිනෙක මහා අධිරාජ්‍යයෙකු වනවා ඇත,'' යි සිතා රජු සිත සතුටු කර ගැනීමට උත්සාහ කළේ ය.

සිද්ධාර්ථගේ උපත නිසා සැමගේ පුද සත්කාරය ලැබූ මහාමායා දේවිය දින හතකට පසු මිය ගියාය. මුළු රාජ්‍යයම ඇගේ වියෝව ගැන ශෝක විය. මහාමායාවගේ නැගනිය වූ මහා ප්‍රජාපතී, නව බිසව වීමට සුද්ධෝදන රජුගෙන් ඇරයුම් ලැබුවේය. ගෝතමී යන නමින් ද හැඳින් වුණු ඇය ඊට එකගව සිද්ධාර්ථ තමන්ගේ පුතු ලෙස කිරි පොවා පෝෂණය කළාය. වයසින් වැඩෙද්දී සිදුහත්ට තම නියම මව කවුදැයි දැන ගැනීමට අවශ්‍ය විය. තම සහෝදරියට ගෝතමිය කෙතරම් ආදරය කළා ද යන්නත් මෙලොව වෙන කිසිවෙකුටත් වඩා තමන්ට ගෝතමිය ආදරය කරන බවත් ඇගේත් තමන්ගේම මවගේත් ආදරයේ වෙනසක් නැති බවත් සිදුහත්ට හොඳින් වැටහී ගියේය. ප්‍රජාපතී ගෝතමියගේ රැකවරණය යටතේ සිදුහත් නිරෝගීවත් ශක්තිමත් වත් වැඩෙන්නට විය.

එක් දිනක් සිද්ධාර්ථ උද්‍යානයේ කෙළිසෙල්ලම් කරමින් සිටින විට ඔහුට රන් ආභරණ පැළඳීම පුරුදු වීමට දැන් වයස එළැඹ ඇතැයි ප්‍රජාපතී ගෝතමියට සිතිණි. ඈ රාජ ආභරණ තනන්නන් කැඳවා ඔවුන් ළඟ ඇති හොඳම ආභරණ කුමරුට ගෙනෙන ලෙස දැන්වූවාය. ඇය පුදුමයට පත් වූවාය. රන්කරුවන්

ගෙනා කිසිදු ආභරණයකින් කුමරුගේ ස්වාභාවික කඩවසම් බව වැඩි කිරීමට නොහැකි විය. ඒවා පැළඳවීමෙන් වූයේ ඔහු අපහසුතාවකට පත් වීම පමණකි. ආභරණ ඉවත් කළ පසු කුමරුන් ඉතාම සුන්දරව පෙනිණි. සිද්ධාර්ථ ද ආභරණ පැළඳීමට කැමැත්තක් දක්වූයේ නැත. සිද්ධාර්ථ ඉවතට යනතෙක් සිටි ගෝතමිය සියලු ආභරණ ආපසු ගෙන යන ලෙස රන්කරුවන්ට දන්වූවාය.

සිද්ධාර්ථ ඉගෙනීමේ වයසට පැමිණි විට සංගීතය, සාහිත්‍යය, උත්තම ලේඛනය, කෙළිසෙල්ලම් ආදිය අනෙක් ශාක්‍ය කුමාරවරුන් සමඟම ඉගෙන ගත්තේය. මේ කුමාරවරු අතර තමන්ගේ ඥාති සහෝදරයෙක් වූ දේවදත්ත ද කිම්බිල හා රජ මැදුරේ ප්‍රධානියාගේ පුතා වූ කාළුදායී ද සිටියහ. ඉතා පැහැදිලි බුද්ධියක් තිබූ නිසා සිද්ධාර්ථ ඉක්මනින්ම පාඩම් මතක තබා ගත්තේය. මේ අයගේ ප්‍රධාන ආචාර්යවරයා වූ විශ්වමිත්‍රට සිද්ධාර්ථ මෙන්ම දේවදත්තත් ඉතාම දක්ෂ බව වැටහී තිබිණි. එහෙත් සිද්ධාර්ථගේ තියුණු පැහැදිලි බුද්ධිය දේවදත්තට තිබුණේ නැති බවත් ඔහු දුටුවේය.

වයස අවුරුදු නවයේ දී එක් දවසක් සිද්ධාර්ථටත් ඔහු හා එකට ඉගෙන ගන්නා යහළුවන්ටත් කපිලවස්තුවේ සී සාන උත්සවය දැකීමට ඉඩ ලැබිණි. මහා ප්‍රජාපතී තමන් විසින්ම කුමරුට ඇඳුම් අන්දවා පයට පහසු වන පාවහන් ද පළඳවා උත්සවය පැවැත්වෙන කුඹුර වෙත රැගෙන ගියාය. උත්සවයේ ප්‍රධානියා වූයේ සුද්ධෝදන මහ රජතුමාය. විවිධ තරාතිරම්වල සාධුවරු බ්‍රාහ්මණයන් විවිධ වර්ණවලින් යුත් සිවුරු හා වස්ත්‍ර හැඳ උත්සවයට සහභාගි වූහ. රාජධානියේ තිබූ හොඳම කුඹුරෙහි මෙම උත්සවය පැවැත් වූ අතර එය මාළිගයට සමීපයෙන් පිහිටියේ ය. ඇතුළු වන සෑම දොරටුවක්ම පාටපාට කොඩිවලින් සරසා තිබිණි. මඟ දෙපස විවිධ වර්ගවල කෑමබීම ආදිය විකිණීම සඳහා තබන ලදී. සංගීත කණ්ඩායම් විසින් උත්සවයට පැමිණෙන සෑම දෙනාම සතුටු කරවනු ලැබීය. මුළු පළාතම සතුටු උත්සව ශ්‍රීයක් ගත්තේය. සුදොවුන් මහ රජු විසින් කරනු ලැබූ ආරාධනාව අනුව පැමිණි සාධුවරු මන්ත්‍ර උච්චාරණය කරන විට රජතුමා ඇතුළු සියලු දෙනාම නැඟී සිට දෑත් එසවූහ.

සිද්ධාර්ථ පසුපසින් සිටි අතර ඔහුට පිටුපසින් දෙපැත්තේ දේවදත්ත සහ කාළුදායී සිටියහ. පුංචි අය මේ උත්සවය ගැන මහත් උනන්දුවකින් සිටියහ. උත්සවය අවසානයේ සැමට රසවත් ආහාර දෙන බව කලින් දන්වා තිබිණි. සිද්ධාර්ථට රජ මහළින් පිටතට ඒමට ලැබුණේ ඉතා කලාතුරකිනි. එනමුත් ඔහු වාඩි වී ඉතාම ශාන්තව මන්ත්‍ර උච්චාරණය අසා සිටියේය. මන්ත්‍ර කියවීම දික් වන විට සිද්ධාර්ථට වාඩි වී සිටීම එපා වී හෙමිහිට නැඟිට ඉවතට ගියේය. කාළුදායී ද නැඟිට සිද්ධාර්ථගේ අත අල්ලාගෙන හෙමිහිට සංගීතකරුවන් සංගීත නැටුම් කරන පෙදෙසට ගියේය. තද හිරු රශ්මිය නිසා ඉණූ දහදියෙන් සංගීතකරුවන්ගේ හා නැටුම්කරුවන්ගේ සිරුරු බොහෝ සෙයින් තෙත් වී තිබිණි. සිද්ධාර්ථ තද හිරු රැසින් මුවා වනු පිණිස අසල තිබූ විශාල මා දම් ගස යටට ගියේය. දඹ ගස් සෙවනින් ඔහුට මහත් සිසිලක් දැනිණි. මේ දුටු ගෝතමිය, ''හා! හා! නුඹ මෙතනට ආවා නේද්?'' යි ඇසී ය. ''මම නුඹව සොයමිනුයි ඇවිදින්නේ. උත්සවයට සහභාගි වෙන්න ඉක්මනට එන්න, ඔබ දුටු හැටියේ තාත්තා ඉතාම සතුටු වෙයි.''

''අම්මේ උත්සවය ඉතාම දිග නේ ද? අර බ්‍රාහ්මණ පණ්ඩිතවරු ඔය තරම් දිගට මොනවා ද කියන්නේ?''

''ඒ පුතේ වේද මන්ත්‍ර. වේද මන්ත්‍රවල තේරුම අපි කාටවත් ඉක්මනට අවබෝධ කර ගන්න අමාරුයි. මහ පොළොව ඇති වෙච්ච දවසේ සිට මහා බ්‍රහ්මයා මන්ත්‍ර උච්චාරණය කිරීමේ අයිතිය බ්‍රාහ්මණයන්ටයි දී තිබෙන්නේ. නුඹත් ඉක්මනට ඔය වේද මන්ත්‍ර ඉගෙන ගන්න ඕනෑ.''

''බ්‍රාහ්මණයන් නැතිව තාත්තාට බැරි ද ඔය මන්ත්‍ර උච්චාරණය කරන්න.''

''මගේ පුතේ, වේද මන්ත්‍ර උච්චාරණය කිරීමේ අයිතිය සම්පූර්ණයෙන්ම තියෙන්නේ බ්‍රාහ්මණයන්ට පමණයි. රජතුමා කොතරම් ශක්තිසම්පන්න වුණත් එතුමාට වේද මන්ත්‍ර කියන්නටත් බ්‍රාහ්මණයන්ට කියන්න ඕනෑ.''

සිද්ධාර්ථ, ගොතමියගේ කතාව ඉතාම කල්පනාවෙන් අසා සිටියේය. ටික වේලාවකට පසුව, ''අම්මේ තාත්තාට කියන්න මට මේ ගස යට ඉන්න දෙන්න කියලා. මේ ගහ යට හරිම සිසිලයි. ඒක මට සැපක්. ඒ වගේ ම සතුටක්,'' යි කීය.

පුංචි කුමරුගේ වදන් පෙළ අසා ගෝතමිය සිනාසී ඔහුට මාදන් ගස යට සීතල සෙවනේ සිටීමට අවසර දුන්නාය. සිද්ධාර්ථගේ හිස මත අත තැබූ ගෝතමිය එතැනින් ඉවත්ව ගියා ය. බ්‍රාහ්මණයන්ගේ මන්ත්‍ර පාඨ කියවීම ද අවසන් විය. සුද්ධෝදන මහ රජතුමා අසුනෙන් නැඟී සිට තම ප්‍රධාන නිලධාරීන් සමඟ ගොස් කුඹුරේ පළමු සී සෑම ආරම්භ කළහ. පළමු සී සෑම අවසන් කළ පසු රැස්ව සිටි සියලු දෙනාම ඉතා සතුටට පත්ව අත්පොළසන් නාද කළහ. අත්පොළසන් නාදය ඇසූ සිද්ධාර්ථ ද ඒ දෙසට ගියේය. සී සාද්දී මී ගවයන් නඟුල් ඇදීම සඳහා වෙහෙස වන අයුරු සිද්ධාර්ථ බලා සිටියේය. එක් හැඩිදැඩි මිනිසෙක් කෙවිටක් ගෙන මී ගවයනට වැරෙන් තැලීය. දැඩි හිරු රැසින් ඔහුගේ සිරුර දහදියෙන් නැහැ වී තිබිණි. පණුවන් හා වෙනත් ප්‍රාණීන් නඟුල් තලයට කැපී කැබලි වූ කොටස් මඩ මත වේදනාවෙන් දඟලන්නට විය. කවුඩෝ හා පිළිහුඩුවෝ වහා පැමිණ එම දඟලන කැබලි උන්ගේ හොටෙන් උස්සාගෙන ගියහ. එක් උකුස්සෙකු ආකාශයේ සිට වේගයෙන් පහළට විත් පුංචි කුරුල්ලෙකු තම දැඩි නියපොතුවලින් හිර කරගෙන පියාඹා ගියේ ය.

මේ සියලු සිදුවීම් දකිමින් අව්වේ සිටි සිද්ධාර්ථගේ සිරුරින් දහඩිය වැගිරිණි. ඔහු නැවතත් මාදන් ගස යටට ගියේය. ජීවිතේ කිසි දිනෙක නොදැනුණු හැඟීමක් මේ සිදුවීම් පෙළින් සිද්ධාර්ථට දැනෙන්නට විය. මාදන් ගස යටට වී තමන් දුටු සියල්ල නැවත නැවත සිහි කරන්නට උත්සාහ කළේය. කුඹුරේ සී සාද්දී කුඩා ප්‍රාණීන්ට සිදු වූ දේ ඔහුට නැවතත් මැවී පෙනෙන්නට විය. ඒ සියල්ල ඔහුගේ සිතට තදින් කා වැදී තිබිණ. උත්සව අවස්ථාවේ දී ඇසුණු සංගීත හෝ නැටුම් හෝ ආදී කිසිවකට සිද්ධාර්ථගේ සිත ගියේ නැත. ටික වේලාවකට පසු සුද්ධෝදන රජු හා ගෝතමිය එතැනට පැමිණෙද්දීත් සිද්ධාර්ථ හිඳගෙන ගැඹුරු කල්පනාවක නිමග්නව සිටින අයුරු දුටහ. පුංචි ලස්සන පිළිමයක් මෙන් හිඳගෙන සිටින සිද්ධාර්ථ දුටු ප්‍රජාපතී ගෝතමියගේ දෙනෙතට කඳුළු පිරිණි. මෙම දර්ශනය දුටු සුද්ධෝදන රජු තැති ගත්තේය. මේ තරම් පුංචි වයසේ දරුවෙකු මෙලෙස වාඩි වී සිටින්නේ කෙසේ ද? අසිත තවුසාගේ අනාවැකිය ඇත්ත වීගෙන එන්නේ ද? රජතුමා උත්සවය ගැන කිසිත් නොසිතා තම රාජකීය රථයේ නැඟී තනිව මාළිගාවට ගියේය.

ගමේ දුප්පත් ළමයින් කිහිප දෙනෙක් ගස අයිනෙන් කතා කරමින් හඬ නඟා සිනාසෙමින් සතුටින් සිටියහ. ගෝතමිය ඔවුන්ට නිශ්ශබ්දව යන ලෙස ඉඟි කර කියා සිද්ධාර්ථ වාඩි වී සිටින ආකාරය යළිත් බලා සිටියාය. අමුතුම සිද්ධියක් වූ මේ දෙස එතැනින් යාමට ආ පුංචි ළමයින් පිරිස ද නැවතී බලා සිටියේය. එක් වරටම සිද්ධාර්ථ දෙනෙත් විවර කළේය. මෑණියන් දැක සිනාසුණේය.

''අම්මේ, බ්‍රාහ්මණයන්ගේ වේද මන්ත්‍රවලින් පණුවන්ටවත්, කුරුල්ලන්ටවත් කිසිම පිහිටක් වුණේ නැහැ.''

සිද්ධාර්ථ දිවගෙන ගොස් ගෝතමියගේ අතෙහි එල්ලිණි. සියලුම ළමයින් තමා දෙස බලා සිටින බව ඔහු දුටුවේය. සිද්ධාර්ථගේම වයසේ පුංචි දරුවන් රැසක් එහි වූහ. එහෙත් ඉරුණු වැරහැලි ඇඳුම් ඇඳ සිටි ඔවුහු ඉතා සිහින් සිරුරින් යුතු වූහ. ළමයින් සැම දෙනම සිද්ධාර්ථ සමඟ සෙල්ලම් කිරීමට ඉතා ආශාවෙන් සිටින බව පෙනිණි. සිද්ධාර්ථ සිනාසී ඒ අය දෙසට ගොස් අත වැනීය. එක් ළමයෙක් සිනාසී සිද්ධාර්ථගේ සිනහවට පිළිතුරු දිණි. උත්සවය අවසානයේ අවසන් භෝජනයට ළමයින් සියලු දෙනාට ආරාධනා කිරීමට සිද්ධාර්ථ, මවගෙන් අවසර ඉල්ලීය. මව ටික වේලාවක් නිශ්ශබ්ද වී සිට සිනාසී සියලු ළමයින්ට සී සාන උත්සවයේ අවසන් භෝජනයට ආරාධනා කළාය.

## හත්වන පරිච්ඡේදය
# සුදු ඇත්පොවුවෙකු තෑගි ලැබීම

සිද්ධාර්ථට දහහතර වන විය සම්පූර්ණ වූ විට ගෝතමිය නන්ද කුමරු බිහි කළාය. එම සතුට නිමිත්තෙන් එදා මුළු රාජ මාළිගාව පුරාම විශාල උත්සවයක් පැවැත්විණි. සිද්ධාර්ථ ද තමන්ට මල්ලී කෙනෙකු ලැබුණු නිසා ඉතාම සතුටු විය. තමන්ගේ දවසේ ඉගෙනීම් කටයුතු අවසන් වූ වහාම නන්ද බැලීමට සිද්ධාර්ථ ගෙදර දිවීය. සිද්ධාර්ථගේ වයසේ හැටියට වෙනත් දේ සිතට ඒමට තිබුණත් ඒ පැත්ත ගැන නොසිතා සැම දාම දේවදත්ත ද නන්ද දැකීමට යන ගමන එකතුකර ගත්තේය.

සිද්ධාර්ථ ප්‍රිය කළ මහානාම, භද්දිය සහ කිම්බිල ද ඔහුගේ ඥාති සහෝදරයෝ වූහ. මාළිගාව පිටුපස උද්‍යානයේ ක්‍රීඩා කිරීම සඳහා ඔවුහු නිතර එකතු වූහ. ප්‍රජාපතී බිසව නෙළුම් විල අසල ලී බංකුව මත වාඩි වී ඔවුන්ගේ කෙළිසෙල්ලම් දකිමින් සතුටු වූවාය. ඇගේ මෙහෙකරුවෝ ඇය විසින් දරුවන් සඳහා ඉල්ලන කෑමබීම දීමට හැම විටම සූදානම් වී සිටියහ.

පසු ගිය සෑම වසරකම ඉගෙනීමේ දී සිද්ධාර්ථ සෑම විට ම ප්‍රථමයා වූ අතර දේවදත්තට තමන්ගේ ඊර්ෂ්‍යාව තද කරගෙන

සිටීමට නොහැකිව පීඩා වින්දේය. සටන් කලාවේ ශිල්පක්‍රම හොඳින් පුහුණු කළ සිද්ධාර්ථ පැරදවීමට මහත සිරුරක් තිබූ දේවදත්තට කිසිවිටකත් නොහැකි විය. ගණිත ගුරුවරයා වූ අර්ජුන සිද්ධාර්ථ අසන ගැඹුරු ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් කාලය ගෙවීය.

සංගීතය සිද්ධාර්ථට ලැබුණු ස්වාභාවික දායාදයකි. ඔහු සැම දාම සන්ධ්‍යා සමයේ තනි වී බටනලාව වාදනය කළේය. සිද්ධාර්ථගේ බටනලා රාවය අසන අයට තමන් වලාකුළුවලිනුත් ඉහළට ගෙනයන්නාක් මෙන් දැනිණි. ගෝතමිය සැම දිනකම සැන්දෑ කාලයේ උද්‍යානයේ වාඩි වී සිද්ධාර්ථගේ බටනලා හඬ අසා සිටියාය. එය රස විඳින සැම විටකම ඒ හඬත් සමඟ තමනුත් ගලාගෙන යන්නේ නම් කෙතරම් හොඳදැයි ඇයට සිතිණි.

සිද්ධාර්ථ වයසින් වැඩි වෙද්දී ධාර්මික හැඟීම් ද වර්ධනය කර ගනිමින් සිටියේය. වේදවේදාන්ත සමඟ ඒවායේ සැඟවුණු අර්ථ ද අධ්‍යයනය කළේය. ඔහු ඍග් වේදය සමඟ අථර් වේදය පිළිබඳව ද ගැඹුරු ලෙස අධ්‍යයනය කළේය. බ්‍රාහ්මණයන් මන්ත්‍ර ජප කරන ආකාරය පුංචි කාලයේ සිටම සිද්ධාර්ථ දැන ගෙන සිටියේය. මෙකී ග්‍රන්ථ බ්‍රාහ්මණයන් විසින් පූජ්‍ය කොට සලකන ලදී. නියම ආකාරයට එම මන්ත්‍ර උච්චාරණය කිරීමෙන් හා ශබ්ද නඟා කියවීමෙන් ද මහත් ප්‍රතිඵල ලැබෙන සැටි ද ඔහු දැන සිටියේය. එකී ශක්තිවලින් සතුන් හා ගස් කොලන් වල පවා පරිවර්තනයක් ඇති කිරීමට හැකි අතර එය පුදුමයක් නොවන බව ද ඔහු අවබෝධ කර ගත්තේය. ග්‍රහ ලෝක, ස්වභාව ධර්මය, ඍතු සහ ප්‍රාර්ථනා, යාඥා ආදිය අතර තද සම්බන්ධයක් ඇති බව වටහා ගත් ඔහු පෘථිවිය තුළ ඇති රහස් පිළිබඳ යමක් දැන ගැනීමේ ශක්තිය බ්‍රාහ්මණයන් සතුව ඇතැයි තේරුම් ගත්තේය. මේ නිසා ප්‍රාර්ථනා සහ යාඥා කරවීමේ සම්පූර්ණ අයිතිය බ්‍රාහ්මණයන් සතු විය.

මේ ලෝකය මැවුවේ මහා පුරුෂයෙකු වූ මහා බ්‍රහ්මයා බවත් සමාජයේ සියලු දෙනා මහා බ්‍රහ්මයාගේ ශරීරයේ අංශ බවත් ඔහු අසා තිබිණි. සිද්ධාර්ථ බ්‍රාහ්මණ හා උපනිෂද් දහම් ගැන ගැඹුරු අවබෝධයක් ලබා ගත්තේය. ඔහුගේ ආචාර්යවරු තම පාරම්පරික විශ්වාස ඇදහිලි ඉගැන් වීය. එහෙත් සිද්ධාර්ථ එම පරම්පරා ගත විශ්වාස ගැන ආචාර්යවරුන්ගෙන් ඇසූ ප්‍රශ්නවලට පිළිතුරු දීමට නොහැකිව ආචාර්යවරු නිරුත්තර වූහ.

දවසේ ඉගෙනීම් කටයුතු අවසන් වූ පසු සිද්ධාර්ථ තම මිතුරන් සමඟ කපිලවස්තුවේ එවකට සිටි දැන උගත් ප්‍රසිද්ධ බමුණන් වෙත ගොස් ගැඹුරු විෂය පිළිබඳව සාකච්ඡා කළේය. දඹදිව කීපවරක්ම බ්‍රාහ්මණයන්ගේ ඒකාධිකාරය බිඳ දැමීමට බලවේග කීපයක්ම පැමිණි බව එම සාකච්ඡාවල දී ඔහුට දැන ගන්නට ලැබිණි. මෙම බලවේග මෙහෙය වන ලද්දේ සමාජයේ පුංචි මිනිසුන් විසින් නොව බ්‍රාහ්මණ සමාජයේම උදාරවාදී හැඟීම්වලින් යුක්ත වූවන් විසින්මය.

සීසෑමේ උත්සවයේ අවසන් භෝජනයට සහභාගි වූ ගම්වැසි ළමයින්ගේ ගෙවල්වලට ඉඳ හිට ගොස් ඔවුන් හා කතා කිරීමට එදිනට පසු සිද්ධාර්ථට අවස්ථාව සැලසිණි. එසේ යන සෑම අවස්ථාවකම ඔහු ගමේ ළමයින් අඳින සාමාන්‍ය ඇඳුම් ඇඳගෙන ගියේය. ගමේ අය හා කතාබහ කරද්දී සිද්ධාර්ථට බොහෝ දේ ගැන කරුණු දැන ගන්නට ලැබිණි. එම කරුණු රජ මාළිගාව තුළ සිට කිසිදාක දැන ගත නො හැකි ඒවා විය.

ගම් වැසි සාමාන්‍ය ජනතාව බ්‍රහ්ම, විෂ්ණු හා ශිව දෙවිවරුනට පුද පූජා කරන්නට වූහ. එමඟින් බ්‍රාහ්මණ පිරිස් සාමාන්‍ය ජනතාවගේ මුදල් හා දේපොළ කපටිකමින් සූරා ගන්නා බවත් ජන්ම, විවාහ, මළමිනී දැවීම් ආදියේ දී කෑම, මුදල් සහ තෑගි වශයෙන් ධාන්‍ය, කෙත් වතු ආදිය දෙන ලෙස ඉල්ලා බමුණන් ඔවුන්ට කරදර කරන බවත් සිද්ධාර්ථට දැන ගන්න ලැබිණි. ඔවුන්ගේ දිළිඳුකම ගැන බමුණෝ කිසිසේත් නොසිතූහ. අනුකම්පා විරහිතව ඔවුහු දුප්පත් මිනිසුන්ගේ ධනය සූරා ගත්හ.

එක් දිනක් සිද්ධාර්ථ පිදුරු සෙවිලි කළ කුඩා පැල්පත් කිහිපයක් ඇති පුංචි ගම්මානයක් මැදින් යද්දී එක් පැල්පතක් තුළින් කෙනෙකු හඬන ශබ්දයක් ඇසිණි. පැල තුළට ගොස් කුමක් සිදු වී ඇද්දැයි බලා එන ලෙස සිද්ධාර්ථ දේවදත්තට කීය. ඇදගෙන වැටීමට ආසන්නව තිබූ මේ පැල්පතේ ප්‍රධානියා ටික වේලාවකට පෙර මිය ගොස් ඇති බව ආපසු පැමිණි දේවදත්ත කීය. දුර්වල, ඉතා සිහින් වූ බිරිඳගේත් දරුවන්ගේත් සිරුරු ඔවුන්ගේ දිළිඳු බව හොඳින් කියා පෑවේය.

ගෙහිමියා කුස්සියක් තනා ගැනීමට බ්‍රාහ්මණයන් ලවා භූමි පූජාවක් කර ගැනීමට අදහස් කළේය. මුදල් නැති නිසා

පූජාවට පෙර තමන්ට සේවය කරන්නැයි බ්‍රාහ්මණයෝ කීහ. දර කැපීම, විශාල කළු ගල් ඔසවාගෙන යෑම වැනි බර වැඩ රාශියක් එක දිගටම කළ ඔහු රොගාතුර විය. තවත් වැඩ කිරීමට නොහැකි වූ තැන ඔහුට ගෙදර යාමට බමුණා අවසර දුන්නේය. දැඩිසේ ගිලන්ව සිටි ඔහු බඩ ගින්නත් මහන්සියත් නිසා නිවසට එන අතර මහ මඟ වැටී මිය ගියේය.

තමන්ගේ සිතට ආ හැඟීම් අනුව සිද්ධාර්ථ බ්‍රාහ්මණයන්ගේ පාරම්පරික ආගමික හැඟීම්වල නරක පැත්තේ දුර්විපාකවලින් සමාජයට වන හානිය ගැන සිතන්නට විය. වේද ඉගෙන ගැනීමේ සම්පූර්ණ අයිතිය ඇත්තේ බමුණන්ට පමණි. වේදය අනුව සම්පූර්ණ පරිපාලන ශක්තිය ඇත්තේ මහා බ්‍රහ්මයාටයි. මහා බ්‍රහ්මයාට පුද පූජා කරන අයට ශක්තිය ලැබෙන බව සාමාන්‍ය ජනයා තදින් විශ්වාස කළහ. සාමාන්‍ය ජනයාට මේ මෝඩ අදහස් දෙන පූජකයන් හෙවත් බ්‍රාහ්මණයන් ගැන සිද්ධාර්ථට අනුකම්පාවක් දැනිණි. ඒ නිසා වේදවේදාන්ත ගැන ගැඹුරු දැනුමක් ලබා ගැනීමට සියලු වේද ග්‍රන්ථ ඉතාම ගැඹුරින් අධ්‍යයනය කළේය.

තාපසවරුන් හමු වී සාකච්ඡා කිරීම සිද්ධාර්ථගේ ජීවිතයේ ප්‍රියතම කාර්යයක් විය. එහෙත් ඔහුගේ පියාණන් ඒ අදහසට එතරම් කැමති වූයේ නැත. සිද්ධාර්ථ රජ මාළිගාවෙන් පිටවන සෑම විටකම ගමන් මඟ සාදා ගත්තේ ඒ මඟෙහි දී වැඩිපුරම තාපසවරුන් හමුවන ආකාරයටය. එකී තාපසවරුන්ට සාමාන්‍ය ලෝකයේ නම්බු නාම, ධන සම්පත් ආදියෙන් එලක් වූයේ නැත. ඔවුන් ඒවා පිළිබඳව සිතුවේම නැත. බ්‍රාහ්මණයන් තාපසයන්ට වඩා වෙනස් වූහ. බ්‍රාහ්මණ පිරිස් සෑම විටම ධනය, පදවි, නම්බු, නමස්කාර ගැන ලෝභකමින් සිටියහ. තපස්වරු සසර දුකින් මිදීම පිණිස සියල්ලම අතහැර දැමූ පිරිසක් වූහ. ඔවුහු වේදය ඉතාම ගැඹුරින් උගත් පිරිසක් ද වූහ. එබඳු තාපසවරු කෝසල රාජ්‍යයේ (මගධයේ) බහුලව සිටින බව දැනගත් සිද්ධාර්ථ කවදා හෝ ඔවුන් මුණගැසී ගැඹුරින් ඉගෙනීමට දිනක් ඒ යැයි බලාපොරොත්තු විය.

සුද්ධෝදන රජු සිද්ධාර්ථගේ මේ අදහස් හොඳින් දැනගෙන සිටියේය. කිසියම් දිනෙක සිද්ධාර්ථ රජ මාළිගාව අතහැර ගොස් පැවිදි වේ යැයි රජතුමා බියෙන් සිටියේය. දිනක් රජතුමා තම

බාල සහෝදරයා මෙන්ම නන්දගේ හා දේවදත්තගේ පියා වූ දෘඪධනරාජ සමඟ මේ පිළිබඳව සාකච්ඡා කළේය.

''කෝසල රාජ්‍යය බොහෝ කලක සිට අපේ රාජ්‍ය ආක්‍රමණය කිරීමට ඇස ගසාගෙනයි සිටින්නේ. ඒ නිසා අපි අපේ බාල පරම්පරාව කෙසේ හෝ ආරක්ෂා කරගත යුතුයි. විශේෂයෙන් ම සිද්ධාර්ථ, දේවදත්ත දෙදෙනා අතයි අපේ රාජ්‍යයේ අනාගතය රැඳී ඇත්තේ. මට ලොකු බියක් දැනෙනවා අසිත තාපසතුමාගේ අනාවැකියේ ආකාරයට සිද්ධාර්ථ පැවිදිවීමට තීරණය කරාවි කියා. යම් විදියකින් මෙය සැබෑ වුවහොත් දේවදත්ත ද සිද්ධාර්ථගේ අඩිපාරේම යන බව නොඅනුමානයි. නුඹ දන්නවා ද ඔවුන් මාළිගාවෙන් පිට වී ගොස් තවුසන් මුණගැසීමට කෙතරම් කැමති ද කියා?''

රජුගේ කතාව ඇසූ දෘඪධනරාජ පුදුමයට පත් විය. මොහොතක් නිහඬව සිටි ඔහු සුදොවුන් රජුගේ කණට කොඳුරා මෙසේ කීය; ''ඔබ මම කියන දෙයට එකඟ වන්නේ නම් මම හිතන්නේ ඔබ සිද්ධාර්ථට බිරිඳක් සෙවිය යුතුයි කියා. ඔහු ගැන සොයා බලා නිරත වීමට බිරිඳක් සිටියහොත් ඔහු මේ පැවිදිවීමේ අදහස අතහැර දමාවි,'' සුද්ධෝදන රජු ද මෙ අදහසට එකඟ විය.

එදින රාත්‍රි මහරජතුමා මේ පිළිබඳව ප්‍රජාපතී ගෝතමිය සමඟ සාකච්ඡා කළේය. මහා ප්‍රජාපතී ගෝතමිය වැඩි දිනක් ගත වීමට පෙර කුමරුට සුදුසු විවාහයක් සූදානම් කිරීමට පොරොන්දු වූවාය. නොබෝ දිනකට පෙර ඇය සුන්දරී නන්දා නම් වූ දියණිය බිහි කර සිටිය ද කල් නොයවා වහාම රාජ්‍යයේ තරුණ තරුණියන් එක් රැස් කරවීම් කිහිපයක්ම සංවිධානය කිරීමට පටන් ගත්තාය. සිද්ධාර්ථ මේ සැඳෑ සංගීත සාද, ක්‍රීඩා තරඟ, ධාවන තරඟ ආදිය සඳහා ඉතා සතුටින් සහභාගි විය. මේ නිසා ඔහුට අලුත් මිතුරුමිතුරියන් රැසක්ම හඳුනා ගැනීමට හැකියාව ලැබිණි.

සුද්ධෝදන රජුගේ බාල නැගණිය නමින් පමිතා වූවාය. දණ්ඩපානි කෝලිය රජ ඇයගේ සැමියා විය. රාම ග්‍රාමය කෝලිය රාජ්‍යයේ අගනුවර වූ අතර ශාක්‍ය රාජ්‍යයේ අගනුවර කපිලවස්තුව විය. ශාක්‍ය කෝලිය රාජ්‍ය දෙක වෙන් වූයේ රෝහිණී නදිය නිසා

පමණි. රාජ්‍ය දෙකෙහිම වැසියෝ පරම්පරා ගණනක සිටම ඉතා සමීප සුහදත්වයෙන් ජීවත් වූහ. අගනුවර දෙක අතර දුර එක් දිනක් තුළ දී යා හැකි පමණ දුරක් විය. ගෝතමියගේ ඉල්ලීම මත කොලිය රාජ්‍යයේ රජු හා බිසව කුනාවූ විල අසල පිහිටි විශාල පිට්ටනියෙහි සටන් තරඟයක් සංවිධානය කිරීමට එකඟ වූහ. සුද්ධෝදන රජු සිය කැමැත්තෙන්ම මෙහි ප්‍රධානත්වය ගෙන තම රාජ්‍යයේ තරුණයන්ගේ යුද හැකියාව වර්ධනය කිරීමට ධෛර්යය දුනනේය. අගනුවර වැසි සියලුම තරුණතරුණියන් මෙම අවස්ථාවට සහභාගි වීම සඳහා ආරාධනා ලැබුවෝය. තරුණියන් සටන් කිරීම සඳහා සම්බන්ධ නොවීය. එහෙත් අත්පොළසන් හා ජය හඬ නැඟීම් ආදියෙන් තරඟ වදින තරුණයන් දිරිමත් කිරීමට හැකි විය. පමිතා බිසවගේ හා දණ්ඩපානි රජුගේ දියණිය වූ යශෝදරාට පැමිණෙන සියලු අමුත්තන් පිළිගැනීමේ වගකීම පැවරී තිබිණි. ඇය ඉතා සුන්දර හා චාම් යුවතියක වූවාය. නැවුම් ස්වභාවික රූමත්කමකින් යුතු වූ ඇය සැබවින්ම ස්වභාව ධර්මයේ සුන්දර නිර්මාණයක් විය.

දුනු ශිල්පය, අසුන් ධාවන තරගය, බර ඉසිලීම ආදී සෑම තරඟ ඉසව්වකින්ම සිද්ධාර්ථ ප්‍රථම ස්ථානය දිනා ගත්තේය. මෙයින් සතුටට පත් යශෝදරා සිද්ධාර්ථට තෑගි කිරීම පිණිස සුදු ඇත් පැටියෙක් ද රැගෙන එතැනට පැමිණියාය. එකතු කරගත් දෑතින් හා යාන්තමට නැමුණු හිසින් යුතු ඇය උදාර හා ශාන්ත හඬින් මෙසේ කීවා ය. ''කරුණාකර මේ ඇතු සමඟ මගේ හෘදයාංගම සුභපැතුම් බාර ගන්න සිද්ධාර්ථ කුමරුනි, ඔබේ ප්‍රශංසනීය ජයග්‍රහණයට වෙනුවෙන්.''

රාජ කුමාරිය ස්වභාවයෙන්ම නිහතමානී වූවාය; ප්‍රියංකර වූවාය; ශෝභමාන වූවාය; කාරුණික වූවාය. ස්වාර්ථයෙන් මුක්ත වූ බව මුහුණින් දක්නට ලැබිණි. මඳ සිනහව, අඩක් පිපුණු නෙළුමක ස්වරූපය ගත්තේය. සිද්ධාර්ථ මඳක් හිස නමා ඇගේ දෑස් දෙසම බලාගෙන ගැඹුරු හා ශාන්ත හඬින්, ''ඔබට ස්තූතියි කුමරිය,'' යි කීය.

දේවදත්ත සිද්ධාර්ථගේ පිටුපසින් තමන්ට දෙවන ස්ථානය පමණක් ලැබීම ගැන නොසතුටින් සිටියේය. සුන්දර යශෝදරා තමා ගැන කිසිදු තැකීමක් හෝ නොකිරීම ගැන තවත් උරණ විය. ඔහු ඇත් පැටවාගේ හොඬය තදින් අල්ලා දුෂ්ඨ ලෙස උගේ හිස

මත සංවේදී ස්ථානයෙහි තදින් වැද්දීය. වේදනාව ඉවසා ගත නොහැකි වූ ඇත් පොවුවා දනින් වැටුණේය.

සිද්ධාර්ථ දේවදත්ත දෙස බලා සිට, ''සහෝදරයා, ඔබ කළේ මහා පහත් වැඩක්,'' යි කීය.

සිද්ධාර්ථ ඇත් පොව්වාගේ හොඬ මතුයෙහි වේදනා දෙන සියුම් ස්ථානය පිරිමැද මෘදු ලෙස යමක් කීවේය. හෙමින් නැවත නැඟී සිටි ඇතු කුමරුට ගරු කරනු පිණිස හිස පහත් කළේය. මේ දුටු සියලු දෙනාගේ දෑස් සතුටින් පිරීගිය අතර මහ හඬින් අත් පොළසන් නැඟීය. සිද්ධාර්ථ ඇත් පැටවාගේ පිට හිඳගෙන විජය යාත්‍රාව ආරම්භ කළේය. ඇත්ගොවුවාගේ හැසිරවීම අනුව සුදු ඇත් පැටවා සිද්ධාර්ථ කපිලවස්තු නුවර වටා රැගෙන ගියේය. මඟ දෙපස ජනතාවගේ ජය ඝෝෂා මැදින් යශෝදරා ද ඇගේ සුන්දර වූ පාද තබමින් ඔවුන්ගේ පසෙකින් ගමන් කළාය.

## අටවන පරිච්ඡේදය

# මුතු මාලය

තරුණු වියට පැමිණි සිද්ධාර්ථට රජ මාළිගයේ ජීවිතය එතරම් ප්‍රියමනාප වූයේ නැත. එය එක් රාමුවක් තුළ බැඳීමක් ලෙස දැනෙන්නට විය. මේ නිසා ඔහු නගරයෙන් බැහැර ඇවිදීම වඩාත් ප්‍රිය කළේය. නගරයෙන් පිට දී ජීවිතයේ ඇතුළු පැත්ත ගැන වැඩි පුර දැන ගැනීමට මේ නිසා හැකි විය. ඉතා අහිංසක ගතිගුණවලින් යුතු ඡන්න නිතර සිද්ධාර්ථගේ පසුපසින් ගියේය. සමහර අවස්ථාවල සිද්ධාර්ථගේ සහෝදරයෝ හා මිතුරෝ ද ඔහු සමඟ ගියහ. ඡන්න සිද්ධාර්ථගේ අශ්ව රථයේ රථාචාර්යයාය. සිද්ධාර්ථ ද ඇතැම් විට රථය මෙහෙය විය. සිද්ධාර්ථ කිසි දිනක අශ්වයන්ට තැලුවේ නැත. ඒ අනුව ඡන්න ද අශ්වයන්ට තැළීම නොකළේය.

මුළු කපිලවස්තුවේ අස්සක් මුල්ලක් නැරම සිද්ධාර්ථ සංචාරය කළේය. හිමාලයේ සිට තැනිතලා බිම් සෑම තැනක ද ඇවිද්දේය. කපිලවස්තුව පිහිටා තිබුණේ හිමාලය කඳුවැටිය පාමුලය. කපිලවස්තු පුරයෙහි ජනගහනය අධික වූ අතර ඉතා සශ්‍රීක විය. කෝසල සහ මගධ යන රාජ්‍ය දෙක ගැන සිතන විට

කපිලවස්තුව ඒ දෙකටම වඩා කුඩා විය. රෝහිණී නදියේ හා භාග් නදියේ ජලයෙන් කපිලවස්තුවේ කෙත් වතු සාර විය. මේ නදී දෙකම හිරණ්‍යවතී නදිය කරාගිය අතර ඉන් පසු හිරණ්‍යවතී නදිය ද ගංගා නම් ගඟට එකතු විය. සිද්ධාර්ථට භාග් නදිය අසල ඉවුරේ වාඩි වී එහි දිය රැලි දෙස බලා සිටීම මහත් ආශ්වාදයක් ගෙන දෙන්නක් විය.

භාග් නදියෙන් ස්නානය කළහොත් මේ ජන්මයේ කළ පවු සියල්ල සොදා හළ හැකි බවට සාමාන්‍ය ජනතාවගේ ඇදහීමක් විය. එනිසා කොතරම් ශීත කාලයක දී වුව ද එම ප්‍රදේශයේ ජනතාව භාග් නදියේ දිය නෑම කළහ. දිනක් සිද්ධාර්ථ භාග් නදියේ දිය රැළි දෙස බලා සිටිමින් ඡන්නගෙන් මෙසේ විමසීය:

''ඡන්න, නුඹත් විශ්වාස කරනවා ද මේ නදියෙන් දිය නෑවාම සියලු පවු සේදී යනවා කියා?''

''ඔව්, මා විශ්වාස කරනවා. නැත්නම් මෙතරම් විශාල පිරිසක් මේ නදියේ දිය නෑම සඳහා එන්නේ නැහැනේ.''

සිද්ධාර්ථ සිනහසුනේය. ''හා! එහෙනම් මේ නදියේ සැම දා ජීවත්වන ඉබ්බන් සහ මසුන් කෙතරම් පුණ්‍යවන්ත ද? ඔවුන්ගේ කිසිදු පවක් ඉතිරි වන්නේ නැත.''

''එහෙත් මා එකක් නම් දන්නවා,'' යි ඡන්න පිළිතුරු දිණි. ''අඩු තරමින් මේ ගඟේ දිය නෑමෙන් ඇඟේ දූවිලි මඩ ආදිය සේදී ගොස් ශරීරය පිරිසිදු වෙනවා.''

සිද්ධාර්ථ සිනාසී ඡන්නගේ පිටට තට්ටු කර, ''හා! නුඹගේ ඒ මතයට මා සම්පූර්ණ එකඟයි,'' කීය.

දිනක් සිද්ධාර්ථ ගං ඉවුරේ සිට රජ මාළිගය වෙත යන අතරතුර යශෝදරා තම සේවිකාවක සමඟ ගම්මානයේ සිටිනු දුටුවේය. ඔහු මහත් පුදුමයට පත් විය. ඇය දුප්පත් දරුවකුගේ ඇසට බෙහෙත් කරමින් සිටියාය. ඒ පුංචි දරුවා චර්ම රෝගයකින් පෙළෙන බව දුටු හැටියේම සිද්ධාර්ථට පෙනී ගියේය. යශෝදරා සාමාන්‍ය ඇඳුමින් සැරසී සිටි අතර දුප්පත් ගම් වැසියන් මැද ඇය දෙවඟනක් සේ පෙනිණි. මේ දසුනින් සිද්ධාර්ථ මහත් සේ සතුටට පත් විය. එක් රාජ කුමාරිකාවක තමන්ගේ සියලු සැපසම්පත් පසෙක තබා දුප්පත් අහිංසක මිනිසුන් අතරට විත් ඒ අයගේ දුක සැප බලා සේවය කිරීම ගැන ඔහු සොම්නසට පත් විය. ඇස නරක් වූ පුංචි දුප්පත් දරුවා නහවා බෙහෙත් දමා දරුවාගේ අපිරිසිදු රෙදි ටික සොදා දුන්නීය.

''කුමරිය, ඔබ කොපමණ කලක සිට මෙසේ ක්‍රියා කරන්නේ ද,'' යි සිද්ධාර්ථ ඇසීය. පුංචි ගැහැනු ළමයාගේ උර හිස සෝදමින් සිටි යශෝදරා හිස ඔසවා සිද්ධාර්ථ දෙස බැලීය.

''මේ වන විට වසර දෙකක් පමණ වනවා, කුමරුනි, එහෙත් මම මේ ගමට පැමිණි දෙවන වතාවයි මේ.''

''මා නිතරම මේ ගමෙහි නැවතී යනවා. මෙහි ළමයින් මා හොඳින් හඳුනනවා.''

''කුමරියනි, ඔබේ මේ ක්‍රියාවලින් ස්ථිරවම ඔබට ලොකු සතුටක් දැනෙනවා ඇති.''

යශෝධරා පිළිතුරු නොදී සිනාසුනාය. ඇය නැවතත් පහතට නැමී දැරියගේ සිරුර සේදීම කළාය.

එදා සිද්ධාර්ථට යශෝදරා සමඟ පුංචි කතාබහකට ඉඩ ලැබිණි. සිද්ධාර්ථ ඉතාම සතුටට පත් විය. තමාගේත් යශෝදරාගේත් සිතුම්පැතුම් එක හා සමාන යැයි සිද්ධාර්ථට සිතිණි. යශෝදරා රජ සුව විඳිමින් මාළිගාවට වී දෑස් පියාගෙන සිටීමට කැමති නො වූවාය. ඇය ද වේදවේදාන්ත ගැන දැනුමක් ලබා තිබිණි. බ්‍රාහ්මණ සමාජයේ අසාධාරණකම් ගැන ඇය ද විරෝධය පළ කළාය. සිද්ධාර්ථ මෙන් ඇය ද රජ සැප සඳහා පමණක් තම ජීවිතය කැප කිරීමට කැමති වූයේ නැත. රජතුමා හා රජ ගෙදර සිදුවන පුටු මාරුව සහ ඒ සඳහා බමුණන්, ඇමතියන් ඇතුළු සියලු දෙනා කරන කුමන්ත්‍රණ ගැන ද කළකිරීමක් ඈ තුළ විය. එහෙත් තමා එක් කාන්තාවක පමණක් බැවින් එතරම් විශාල සමාජ පරිවර්තනයක් කිරීමට තමන්ට තනිව නොහැකි බව ඇය දැන සිටියාය. එනිසා සේවා සත්කාර මඟින් තමන් දරන අදහස් සමාජයට කියා පෑමට ඇය ඉදිරිපත් වූවාය. ඇගේ මිතුරන් තමා උදාහරණයකට ගෙන අනුගමනය කරනු ඇතැයි ඇය බලාපොරොත්තු වූවාය.

යශෝදරා දුටු පළමු දිනයේම සිද්ධාර්ථගේ සිතේ ඇය පිළිබඳව විශේෂිත හැඟීම් රැසක් ඇති විය. ඉන් පසු යශෝදරා කී සෑම වචනයකම තමා කිමිදෙන්නාක් මෙන් සිද්ධාර්ථට දැනිණි. සුදොවුන් රජු සිතා සිටියේ හැකි ඉක්මනින් සිද්ධාර්ථට විවාහයක් කර දෙන්නය. ඊට සුදුසුම තැනැත්තිය යශොදරා බව රජුට හැඟී ගියේය. තරග පැවැත්වෙන දිනයේ පැමිණ සිටි තරුණියන් අතර සුන්දරම තරුණිය යශෝදරා වූවාය. ඇය ළඟ තමන්ගේකමක් ද දක්නට තිබිණි.

එක් වරක් ගෝතමී බිසව රාජධානියේ සියලු යුවතියන්ගේ එක් රැස් වීමක් සංවිධානය කළාය. යශෝධරාවගේ මව වූ පමිතාට ද ඒ සඳහා උදවු කරන ලෙස ඇය ආරාධනා කළාය. කපිලවස්තුවේ සිටි සෑම යුවතියක්ම මේ සඳහා ආරාධනා ලැබූ අතර සෑම කෙනෙකුටම තමන්ට හොඳ ආභරණ ත්‍යාග වශයෙන් ලැබෙන බව දන්වා තිබිණි. සටන් තරගයේ දී යශෝදරා සෑම කෙනෙකුම පිළිගත්තා සේ සෑම කෙනෙකුටම සිද්ධාර්ථ විසින් ත්‍යාගයක් පිරිනැමීමට පමිතා බිසව යෝජනා කළාය. සුද්ධෝදන රජු හා රජ පවුලේ සාමාජිකයන් මේ සඳහා සහභාගි වීමට නියමිතව තිබිණි.

මනෝහර සිසිල් සැන්දෑවක මෙම උත්සවය පැවැත් වීය. රජ මහලේ අමුත්තන්ට සංග්‍රහ කරන ශාලාවේ කෑම බීම ආදිය සූදානම් කර තිබිණි. සංගීතඥයෝ උත්සවයට පැමිනෙන අමුත්තන් මනෝරංජනය කළහ. මලින් සැරසූ ලන්තෑරුම්වල දිලෙන එළි යටට රන් හුයෙන් මෝස්තර දැමූ සළු හැඳගත් යුවතියෝ පැමිනුණාහ. සෑම කෙනෙකුම රජුත් බිසවත් ඇතුළුව උත්සව ශාලාවට ඇතුළු වූහ. රාජ කුමාරයෙකුගේ සම්පූර්ණ ඇඳුමින් සැරසුණු සිද්ධාර්ථ වම් පසින් මේසයක් අසල සිටියේය. එම මේසය මත පැමිණෙන දහසකට ආසන්න යුවතියනට තෑගි දෙනු පිණිස මුතු මාල, රන් මාල ආදී ආභරණ පුරවා තිබිණි.

සිද්ධාර්ථ මුලින්ම තෑගි බෙදීම ප්‍රතික්ෂේප කළේය. පසුව ගෝතමී සහ පමිතාගේ ඉල්ලීම මත නැවතත් ඊට එකඟ විය. ''නුඹගේ අතින් තෑගි ගන්නා ඕනෑම කෙනෙක් එය තමන්ට වූ ගෞරවයක් සේ පිළිගන්නවා. එය නුඹ තේරුම් ගත යුතුයි,'' එසේ කී පමිතා විශ්වාසවන්ත සිනහවක් පෑවාය. තව කෙනෙකු සතුටු වන කටයුත්තක් සිද්ධාර්ථ කිසි විටෙකත් ප්‍රතික්ෂේප කළේ නැත. පැමිනෙණ ඒ ඒ යෞවනියන් මොනමොන ආභරණවලට කැමති වේදැයි තීරණය කිරීම සිද්ධාර්ථට අපහසු කාර්යයක් විය. පළමු තෑග්ග ලැබුණේ රාජ කුමාරිකාවක වූ සෝමාටය. පමිතාගේ සංවිධානය අනුව වේදිකාව මතට පැමිණි යෞවනියෝ රජ බිසෝවරුනට හිස නමා ආචාර කොට දෙවනුව සිද්ධාර්ථ කුමරු වෙත ගොස් තෑගි ලබා ගත්හ. ඒ අනුව සෝමා කුමරිය ද බිසෝවරුන්ට ආචාර කිරීමෙන් පසුව සිද්ධාර්ථ ඉදිරියට ගොස් නැමී ආචාර කළාය. සිද්ධාර්ථ ද හිස මදක් නමා ආචාර කොට ඇයට මුතු මාලයක් තෑගි කළේය. රැස්ව සිටි සෑම දෙනම

අත්පොළසන් හඬ නැගුහ. සෝමා ගෞරවාන්විතව ඉතාම මෘදු හඬින් සිද්ධාර්ථට ''ස්තුතියි,'' කීවාය.

දෙවන තැනැත්තිය ලෙස පැමිණියේ රෝහිණීය. සිද්ධාර්ථ පැමිනෙණ කුමරියට අනුව තෑගි තේරීම නතර කොට ඊ ළඟට ඇති තෑග්ග පැමිනෙණ කුමරියට දෙන්නට තීරණය කළේය. තෑගි ලැබීමට සිටින පිරිස අධික වුව ද සිද්ධාර්ථ තෑගි දුන් ක්‍රමයෙන් තෑගි දීමේ උත්සවය ඉක්මනින්ම අවසන් විය. රාත්‍රී විසි දෙවන පැය වන විට තෑගි දීමේ උත්සවය බොහෝ දුරට අවසන් වෙමින් තිබිණි. තෑගි ලබන අවසාන යුවතිය ශෛලා යැයි බොහෝ දෙනා සිතා සිටියේය. සිද්ධාර්ථ ද ශෛලාගෙන් පසුව තෑගි උත්සවය අවසන් යැයි සිතීය. එහෙත් සභාවෙන් නැගී සිටි එක් යුවතියක හෙමින්හෙමින් වේදිකාව වෙත ආවාය. සුදු පැහැති සළුපිළිවලින් සැරසී සිටි ඈ යශෝදරාය. රජුටත් බිසවටත් ගෞරවයෙන් හිස නමා ආචාර කළ ඇය සිද්ධර්ථ සමීපයට පැමිණ සිනාසී ''උතුමාණනි, මා සඳහා කිසිවක් ඉතිරි වී නැති ද?'' යි ඇසුවාය.

යශෝදරා දෙස බැලූ සිද්ධාර්ථ මේසය මත ඇති ආභරණ දෙස ද බැලීය. එහෙත් යශෝදරාගේ සුන්දර රුව පමණට වටිනා අලංකාර ආභරණයක් එහි නොවීය. එක් වරටම සිනාසුණු සිද්ධාර්ථ තම ගෙලෙහි තිබූ මුතු මාලය ගලවා දී, ''කුමරිය, මේ ත්‍යාගය මගෙන් ඔබටයි,'' කීය.

යශෝදරා හිස සලා, ''මා මෙතනට ආවේ ඔබට ස්තුති කරන්නයි. කොහොම ද මම ඔබේ ගෙලේ මාලය ගන්නේ,'' යි කීය.

''මගේ මෑණියන් නිතරම කියන්නේ මා ආභරණ නැතිව සිටින විට ඉතාම ලස්සනයි කියා. ඒ නිසා රාජ කුමාරියනි, කරුණාකර මගේ මේ තෑග්ග පිළිගන්න.'' මෙසේ කී සිද්ධාර්ථ යශෝදරා වෙත මදක් ළං වූයේ අපහසුවකින් තොරව ඔහුට ඒ දිදුළන මාලය ඇගේ ගෙල වටා පැළඳවිය හැකි වනු පිණිසය. එසේ පැළඳ වූ වහාම රැස්ව සිටි සියලු දෙනාම අසුන්වලින් නැගී සිට ප්‍රීතියෙන් අත්පොළසන් දුන්හ.

## නව වන පරිච්ඡේදය
# දයාවේ මාවත

ඊළඟ සරත් ඍතුවේ දී යශෝදරා සහ සිද්ධාර්ථගේ විවාහය සිදු කෙරිණි. මුළු රාජ්‍යයම සතුටින් ඉපිල ගියේය. කපිලවස්තු නගරය පුරාම ධජ, පතාක ආදියෙන් සරසා තිබිණි. සෑම තැනකම සංගීත රාවය ගලා යන්නට විය. සිද්ධාර්ථ හා යශෝදරා තම රථයේ නැගී යන සෑම තැනක්ම ජය ඝෝෂා හඬින් පිරී ගියේය. ඔවුන් එසේ යන සෑම විටකම ගම් වැසි දුප්පතුන්ට බෙදා දීම සඳහා රෙදිපිළි ආදිය රැගෙන ගියහ.

සුද්ධෝදන රජුගේ මනා නිරීක්ෂණය යටතේ තරුණ යුවළට ඍතු තුනට වෙනවෙනම මාළිගා තුනක් නිර්මාණය කෙරිණි. උෂ්ණ කාලය සඳහා කඳුකරයේ රමණීය ස්ථානයක එක් මාළිගයක් කරවීය. නමුත් වර්ෂා හා ශීත කාල දෙක සඳහා රාජධානියේම මාළිගා දෙකක් සෑදවීය. සෑම මාළිගයකම රමණීය පොකුණු කරවූ අතර ඒ පොකුණුවල සුදු නෙළුම්, රතු නෙළුම් හා නිල් මහනෙල් වෙනවෙනම සිටුවා තිබිණි.

නව යුවළට අවශ්‍ය අලුත් වස්ත්‍ර ආදිය ද රාත්‍රියට දල්වීම සඳහා විශේෂයෙන් කාශි රාජ්‍යයෙන් ගෙනෙන ලද සුවඳ වර්ග ද

සම්පාදනය කරන ලදී. සුද්ධෝදන රජුගේ සිත ඉතාම ශාන්ත විය. හේතුව රජු සිතූ ආකාරයටම සිදුහත් තම ගිහි ජීවිතය ආරම්භ කිරීමයි. අලුත විවාහ වූ දෙදෙනා සඳහා නිතර විනෝදයෙන් සිටීමට සුප්‍රසිද්ධ හා ඉතාම දක්ෂ සංගීතඥයන් කැඳවා අවශ්‍ය සංගීතය සැපයීමට කටයුතු සංවිධානය කළේය. නමුත් සිද්ධාර්ථ සහ යශෝදරා ධන සම්පත්ති සහ සංගීතයෙන් බැඳ තබන්නට හැකි නොවීය. දෙදෙනාම තමතමන්ගේ අදහස් අනුව ඉදිරියට යන්න සිතා ගත්හ. ඉතාම රසවත් කෑම, කසී සළු ආදියෙන් දෙදෙනාම සෑහීමට පත් වූයේ නැත. සංගීතඥයන්ගේ දක්ෂතාවන් පිළිබඳව ප්‍රශංසා කළහ. එහෙත් සංගීතයේ ගැලුණේ නැත. දෙදෙනාගේම සිහිනය වූයේ සමාජයට සුබ සෙතක් කිරීම සහ සමාජ පරිවර්තනයක් කිරීමයි.

ඊළඟ උෂ්ණ කාලයේ යශෝදරා සමඟ ග්‍රීෂ්ම කාලීන මාළිගාවට ගිය පසු සිද්ධාර්ථ ඇයට තමා පෙර දුටු සියල්ල පෙන්වී ය. ඇය මීට පෙර මේ සියලු දේ දැක නොතිබිණි. දෙදෙනා ඇවිදින අතර තැනතැන නතර වූහ. සමහර අවස්ථාවල ගම් ප්‍රධානීන්ගේ නිවෙස්වල ද ලැගුම් ගත්හ. ඔවුන් ගන්නා සාමාන්‍ය කෑම තමනුත් ආහාරයට ගත්හ. එසේම උණ බට දමා වියන ලද ඇඳන්වල දෙදෙනාම නිදාගත්හ. ගිය සෑම පළාතකම ඒ ඒ පළාත්වල මිනිසුන්ගේ ජීවන චරියා පිළිබඳව ඉගෙන ගත්හ.

ඉඳහිට ඉතා කටුක අවස්ථාවට ද මුහුණ දෙන්නට ඔවුනට සිදුවිය. ඔවුනට මුණගැසුණු ඇතැම් පවුල්වල ළමයින් දහයක් පහළොවක් පමණ සිටියහ. ඉන් බොහෝ දෙනෙක් කුමන හෝ රෝගයකින් පෙළෙන්නෝ වූහ. දෙමාපියන් කෙතරම් මහන්සි වුව ද යැපීමට අවශ්‍ය තරම් යමක් හරි හම්බ කරගැනීමට ඔවුනට නොහැකි විය. පවුලේ සෑම දෙනාටම කෑම බීම හා ඇඳුම් ගැනීමට තරම් ගොවියන්ගේ ද ආර්ථික තත්වය සරු නොවීය. ආහාර අහේනිය නිසා ඇතැම් දරුවන්ගේ සිරුරු දුර්වල වී අත පය වියළී දර මෙන් වූ අතර උදරය වඩාත් ඉදිරියට නෙරා විත් තිබිණි. ඇතැම් අන්ධ හා කොර වූ ළමයින් ගමේ සිඟා යන අයුරු සිද්ධාර්ථ දුටුවේය. මේ හැම දසුනකින්ම පසු සිද්ධාර්ථ තුළ තිබූ සතුට මුළුමනින්ම නැති වී ගියේය. මිනිසුන් හසු වී ඇති ජීවන ප්‍රශ්න ඔහු දුටුවේය. මේ සියල්ලෙන් ඔවුනට ගොඩ ඒමට මඟක් සිද්ධාර්ථ

ද නොදුටුවේය. දුප්පත්කමත් ලෙඩ රෝගත් ඒ හැමට අමතරව බමුණන් කරන අකටයුතුකම් පිළිබඳවත් ඔහු දැක ගත්තේය. ඔවුන් වෙනුවෙන් කිසිවෙක් වචනයකුදු කතා කිරීමට නොසිටියහ. රාජධානිය ද පිහිටියේ ඉතා දුරිනි. මඟ දුර නොතකා රාජධානියට ගිය ද ඔවුන් කියන කිසිවකට ඇහුම්කම් දෙන්නේ කවු ද? ඇති වී ඇති තත්වය රජතුමාට ද වෙනස් කළ නොහැකි බව ඔවුහු දැන සිටියහ.

මාළිගාව තුළ සිදුවන දේ පිළිබඳව සිද්ධාර්ථට ඉක්මනින් දැන ගන්නට හැකි විය. සියලුම අධිකාරිවරු තමන්ගේ රාජ්‍යය හා පදවි සුරක්ෂා කිරීමට මහන්සි ගත්තා හැර මහ ජනතාවගේ අවශ්‍යතා ගැන සිතුවේ නැත. එක් අයෙක් තව කෙනෙකුට විරුද්ධව කුමන්ත්‍රණ කළේය. මේ සියලු දෑ දැකීමෙන් සිද්ධාර්ථට රාජ්‍ය කිරීමේ කාර්යය මහත් සේ අරුචි කර කරුණක් විය.

සිද්ධාර්ථට තම පියාගේ රාජ්‍යයේ රාජ්‍ය තාන්ත්‍රික දුර්වල පරිසරය ගැන ද හොඳ අවබෝධයක් තිබිණි. රජ කෙනෙක් වුවත් එතුමාට අවශ්‍ය තීරණ ඍජුව ගැනීමට නොහැකි වූ අතර විශාල සැපපහසුකම් ඇති හිර ගෙදරක සිරකරුවකු මෙන් සිටියේය. බහුතරයක් නිලධාරීන් ප්‍රලෝභයන් වූ අතර සමහරුන් එකිනෙකා භේද කරවමින් සිටියහ. සමහර නිලධාරීහු සම්පූර්ණයෙන්ම දූෂණවලින් පිරී සිටියහ. නමුත් රජතුමාට රාජ්‍ය කරගෙන යෑමට ඔවුන්ගේ උපකාර නැතිවම බැරි විය. තමා රාජ්‍ය බාර ගත් පසු තමාට ද පියා මුහුණ පාන ප්‍රශ්නවලට අනිවාර්යයෙන් මුහුණ දීමට සිදුවන බව සිද්ධාර්ථට වැටහී ගියේය. යම් විදියකින් මිනිසුන්ගේ හදවත්වලින් ලෝභය සහ ක්‍රෝධය අස්කර දැමිය හැකි නම් එයින් කිසියම් ප්‍රගතියක් ඇති වේය, යනු ඔහුගේ හැඟීම විය.

යශෝදරා දුර දිග සිතා බලා වැඩ කරන ඥානවන්ත කාන්තාවක වූවාය. සිද්ධාර්ථ සිතන දුර ගමන කුමක් ද කියා ඈ කල් ඇතිවම දැන සිටියාය. මේ සියල්ලෙන් නිදහස්ව තමන් සිතන විමුක්ති මඟට සිද්ධාර්ථ සිත යොමු කළහොත් එය අනිවාර්යයෙන් ම සාර්ථක වනු ඇතැයි ඇය සිතුවාය. යශෝධරා නිතරම ක්‍රියාශීලී කාර්ය පිළිබඳව විශ්වාස කළ ගැහැනියකි. සිද්ධාර්ථ සිතන කාරණයෙන් තව කෙනෙකුට සැප ලැබෙන බවත් එයින් සමහර

කෙනෙකුට දුක් ඇති වන බවත් ගමන ඉතා දුර නිසා ප්‍රමාද වීම ද හොඳ නැති බවත් ඇය අවබෝධ කර ගත්තීය. ඇගේ සමාජ සේවයෙන් සමාජයේ සියලුම දෙනාගේ දුක් කරදර අවසන් නූනත් තරමක හෝ සහනයක් ලැබුණු බව ඇයට පිළි ගැනීමට හැකි විය. සිදුහත් කුමරුගේ ගමනින් එය තව දුරටත් සාර්ථක කරගැනීමට හැකි වනු ඇතැයි ඇය සිතුවාය. පසු ගිය සමයේ කරන ලද කටයුතු සිහි කිරීමෙන් ඇයට සතුටක් ඇති විය.

නව යුවලගේ අඩුපාඩු සම්පූර්ණ කිරීම සඳහා කපිලවස්තු පුර සේවකයෝ උෂ්ණ කාලයට දෙදෙනාට කිසිම ආකාරයක කරදරයක් නොවන ලෙස කටයුතු කිරීමට වගබලා ගත්තෝය. සිද්ධාර්ථ සහ යශෝදරා බොහෝ මෙහෙකරුවන් ආපසු පිටත් කර යැවූහ. මාළිගාවේ කටයුතු, උද්‍යානය බැලීම, කෑම පිසීම ආදියට පමණක් කීප දෙනෙකු ඇය තබා ගත්තාය. ඡන්න සෑම දාම ඔවුන් සමඟ එකට සිටියේය. යශෝදරා රජ මාළිගාවේ දෛනික කටයුතු සාමාන්‍ය ආකාරයට සොයා බැලීය. ඇය කුස්සියට ගොස් සිද්ධාර්ථට ඔහු කැමති සාමාන්‍ය කෑම වර්ග සූදානම් කළාය. සිද්ධාර්ථගේ ඇඳුම්පැළඳුම් ගැන සොයා බැලීම ද ඇය විසින්ම කරන ලදී. රාජධානියට ආපසු පැමිණි විට යශෝධරා සමාජ සේවය පිළිබඳව සිද්ධාර්ථගෙන් අවශ්‍ය උපදෙස් ලබා ගත්තීය. සිද්ධාර්ථට ඒ සඳහා සම්පූර්ණ සහාය දුන්නාය. මේ කරුණු නිසා සිද්ධාර්ථ ගැන ඇය තුළ වූ විශ්වාසය දිනෙන් දින වැඩි විය. සිද්ධාර්ථ යශෝධරාගේ සමාජ සේවය ගැන ඉතාම හොඳ පැහැදීමකින් සිටියේය. ඇගේ සමාජ සේවයෙන් සමාජයේ කිහිප දෙනෙකුගේ දුක් කරදර දුරු කළ නමුත් එය ඒ සඳහා සම්පූර්ණ පිළිතුරක් නොවීය. කවදා හෝ දිනක යශෝදරාට කෝපයක් හෝ කලකිරීමක් හෝ ඇති වුවහොත් සමාජ සේවය කිරීමේ ශක්තිය පිරිහීයනු ඇත. සමාජ සේවය අවංකව සිදු කිරීමට නම් සිත තුළින් ක්‍රෝධය, කලකිරීම ආදිය සම්පූර්ණයෙන්ම අස් කළ යුතු බව සිද්ධාර්ථගේ පිළිගැනීම විය. රජ මැදුරේ සිදුවන සිද්ධි දැක සිද්ධාර්ථ ස්වයංව සැක, නිරාෂා, කෂ්ඨ ආදිය තම සිතින් වින්දේය. සමාජ සේවයේ නියම සතුට ඇති වන්නේ හදවත තුළින්ම එය සිදු වුණොත් පමණි. නමුත් සිද්ධාර්ථ කවදාවත් මේ පිළිබඳව යශෝදරා සමඟ සාකච්ඡා කළේ නැත. එසේ සාකච්ඡා කළා නම් ඇය තමා කරන සමාජ සේවයෙන් පසු බැසීමට ඉඩ තිබිණි.

ශීත කාලීන මාළිගයට ගිය විට බොහෝ නෑදෑ හිතමිතුරන්ට සංග්‍රහ කිරීමට යශෝදරාට සිදු විය. සිද්ධාර්ථ ඒ අය සමඟ ආගමදහම ගැන කථා කරන විට යශෝදරා ද ඒ සියල්ල අසා සිටියාය. මෙහෙකරුවන්ට යමක් කීමට ගියත් සිද්ධාර්ථ කතාකරන දේ ගැන නිතරම සිත යොමු කළාය. දනට රැස් වී සිටින පිරිසගෙන් කිහිප දෙනෙකු තමන්ගේ සමාජ සේවයට සම්බන්ධ කර ගැනීමට හැකිවේ යැයි සිදධාර්ථට සිතිණි. නමුත් ඒ සඳහා කිසිවෙක් සූදානම් නොවූහ. ඒ කාරණය පසෙක තබා දෙදෙනා එකතු වී සියලු දෙනාට ඉතාම ආදරයෙන් සත්කාර සම්මාන කළහ. මේ දෙදෙනාගේ කටයුතු පිළිබඳව එකට සාකච්ඡා කර එක සිතින් සමානව සතුටු වූ එක් අයෙක් සිටියේය. ඒ මහා ප්‍රජාපතී ගෝතමිය යි. ඇය තම ලේලියගේ හැම කටයුත්තක්ම සොයා බලා ඉතා හොඳින් ඉටු කළාය. යශෝදරා සතුටින් සිටී නම් සිද්ධාර්ථ ද සතුටින් සිටින බව ඇය දන සිටියාය. මහා ප්‍රජාපතී ඉතා කරුණාවන්ත කෙනෙකු වූවා ය. යශෝදරා සමඟ සාමාජ සේවයට ගිය පළමු ගමනේ දීම ඇය යශෝදරාගේ අවංක අදහස් දනගෙන තවතවත් ආදරය කරන්ට පටන් ගත්තාය. දුප්පත් අයට සහල්, පිටි, බෙහෙත්, ඇඳුම් ආදිය දීමම සමාජ සේවයක් නොව, දුකින් සිටින සාමාන්‍ය ජනතාව ගැන හෘදයාංගමව කරුණාවෙන් මෛත්‍රී සහගතව කටයුතු කිරීම ඉතා වැදගත් බව ඇය ද පිළිගත්තාය.

ප්‍රජාපතී ගෝතමිය රජ මැදුරේ අනෙක් අය මෙන් නො වීය. ඇය නිතරම කීවේ ස්ත්‍රීන් ද පුරුෂයන් මෙන් ශක්තිසම්පන්න විය යුතුයි යනුවෙනි. තම පවුලේ සාමාජිකයන් ගැන මෛත්‍රී පූර්වක වීම ඉතාම වැදගත් කොට සැලකිය යුතු බව ඇය කීවාය. රජ මැදුරේ කුස්සියේ කටයුතුවලට පමණක් සීමා වී සිටීම ඇය අගය කළේ නැත. ඇය සිතුපැතු ආකාරයට නිදහස් අදහස් ඇති ලේලියක ලැබීම ගැන ඇය බෙහෙවින් සතුටු වූවාය. යශෝදරා කළ සෑම සාමාජික කාර්යයකටම ඇය සම්පූර්ණ සහයෝගය දක් වූවාය.

## දස වන පරිච්ඡේදය

# නූපන් දරුවා

දැන් සිද්ධාර්ථ කුමාරයා ගිහි ජීවිතයට ක්‍රමයෙන් නැඹුරු වූ නිසා තමා සමඟ වැඩි පුර කාලය ගත කළොත් රාජකාරිය පිළිබඳව සියලු අදහස් ක්‍රමයෙන් පුරුදු පුහුණු කරවිය හැකි බව සුද්ධෝදන රජතුමා සිතුවේය. රැස්වන සෑම රාජ සභාවකටම සිද්ධාර්ථ ද එකතු කර ගැනීමට රජතුමා සෑම උත්සාහයක්ම දැරීය. සෑම අවස්ථාවකම රාජ පුරෝහිතයන් සහ අනෙක් ඇමතිවරු ද මේ දෙදෙනා සමඟ සභාවට රැස් වූහ.

සිද්ධාර්ථ රාජ සභාවේ අසන සෑම ප්‍රශ්නයකටම පිළිතුරු දෙන ආකාරය ඉතාම කල්පනාවෙන් යුතුව රජතුමා අසා සිටියේය. යුද්ධ කිරීම, ආර්ථික ප්‍රශ්න, රාජ්‍ය ආරක්ෂා කිරීම ආදිය එම සාකච්ඡාවල ප්‍රමුඛ විෂයයන් විය. රාජ්‍ය ආරක්ෂා කිරීමට සෑම උත්සාහයක්ම දරූ නිසා සාමාන්‍ය ජනතාවගේ සැපදුක් ගැන සොයා බැලීම කිසිසේත් කළ හැකි දෙයක් නොවීය.

දූෂණවලට සම්බන්ධ ඇමතිවරු සදාචාරය, අවංකකම ගැන කතා කරන ආකාරය සිද්ධාර්ථ දුටුවේය. සිද්ධාර්ථගේ හදවත කෝපයෙන් පිරී යන්නට වූ නමුත් කෝපය මැඩ ගත්තා හැර වෙනත් කිසිවක් කිරීමට අවකාශයක් තිබුණේ නැත. සභාවට

කිසිවක් ඉදිරිපත් කිරීමට ඔහුට අවසර තිබුණේ නැත. දිනක් අමාත්‍යවරුන් ඉදිරියේ රජතුමා සිද්ධාර්ථගෙන්, ''නුඹ රාජ්‍ය සභාවේ දී කිසිම අදහසක් දක්වන්නේ නැතිව නිශ්ශබ්දව සිටින්නේ ඇයි ද?'' යි ඇසීය.

''පියාණනි, ඒ රාජ සභාවේ මගේ අදහස් ඉදිරිපත් කිරීම ප්‍රයෝජන රහිතයි. එහෙත් රෝගයත් රෝග නිධානයත් ගැන කථා කළ හැකියි. රාජ සභාවේ දූෂණවලින් පිරි, ආත්මාර්ථකාමී මන්ත්‍රීවරුන්ට කුමන බෙහෙත දෙන්නේ ද කියා මා තවම තීරණය කළේ නැහැ. උදාහරණයකට විශ්වමිත්‍රව ගන්න. රජ ගෙදර ඉතාම ශක්ති සම්පන්න ඇමතිතුමා ඔහුයි. ඒ වගේම ඉතාම භ්‍රෂ්ඨ ඇමතිවරයාත් ඔහුයි. භ්‍රෂ්ඨකමෙනුත් අග තැන්පත් ඇමතිවරයාත් ඔහුයි. සමහර අවස්ථාවල ඔබට අයිති රාජකාරිවලටත් අත තිබ්බා මට මතකයි. ඒ වුණත් ඔබත් එතුමාට විරුද්ධව කිසිම දෙයක් කරන්න සූදානම් නැහැ. හේතුව ඔබගේ කටයුතුත් වැඩිපුරම එතුමා තමයි කරන්නේ. එහෙම වෙන්නේ ඇයි? ඔබ දන්නේ නැද්ද එහෙම කරගෙන ගියොත් ඉදිරියට රටේ අරාජික තත්වයක් ඇතිවේය කියා?''

සිද්ධාර්ථ මදක් නිහඬව සිටින විට සුද්ධෝදන රජ තුමා කතා කළේය.

''සිද්ධාර්ථ නුඹ දන්නවා නේද රාජ්‍යයක් කරන විට රටේ ශාන්තිය ආරක්ෂා කිරීම සඳහා තමන්ගේ පැත්තෙනුත් යම්කිසි ආකාරයක් පරිත්‍යාගයක් කරන්න සිදුවෙන බව? මටත් මගේ රජකමේ සීමාවක් තියෙනවා. නමුත් නුඹ රජකම බාර ගන්න සූදානම් නම් මගේ ලොකු විශ්වාසයක් තියෙනවා නුඹට මට වඩා හොඳට රාජ්‍ය කරන්න පුළුවන්කමක් තියෙන බව. මා දන්නවා නුඹ රජකමට පත් වුණොත් භ්‍රෂ්ඨාචාරයන් නැති වී රටේ අරාජිකත්වය ද නැති වී යන බව.''

සිද්ධාර්ථ දුකින් බර හඬින් තම පියාණන් වූ සුද්ධෝදන රජු ඇමතීය. ''පියාණනි, මා හිතන්නේ නැහැ මේ කටයුත්තට වෙනමම දක්ෂකමක් අවශ්‍ය වෙනවා කියා. අවශ්‍ය වන්නේ අප සමඟ සිටින පිරිස තමතමන්ගේ සිත්වල ඇති ක්‍රෝධය, ඊර්ෂ්‍යාව, භය වැනි දුර්වලකම් සිත් තුළින් මුලින්ම අස් කර දැමීමයි.''

දෙදෙනාගේ කථාව අවසානයේ වූයේ සුදොවුන් රජු සිතුවිල්ලට නැඹුරු වීමෙනි. ලෝකය පිළිබඳව තමාගේ දැනුමට වඩා සිද්ධාර්ථගේ දැනුම අධික බව එතුමාට අවබෝධ විය. වේලාව පැමිණි විට සිද්ධාර්ථ තම වගකීම බාරගෙන රාජ්‍ය තමාට වඩා හොඳින් කරනු ඇත, යන හැඟීම රජු ඇති කර ගත්තේය.

රාජ්‍ය සභාවට සහභාගී වීම, යශෝධරාගේ කටයුතුවලට සම්බන්ධ වීම හැරුණු විට සිද්ධාර්ථ මුනිවරුන්, තපස්වරුන් සමඟ සාකච්ඡා කිරීමට ද යොමු වීය. ධර්මාචාර්යයන් වහන්සේලා ධර්ම ග්‍රන්ථවලට පමණක් සීමා නොවන බව සිද්ධාර්ථට අවබෝධ විය. තපස්වරුන්ගෙන් හා සාධුවරුන්ගෙන් ඉගෙන ගත් සියල්ල ඔහු රජ මැදුරේ සිට ක්‍රියාත්මක කළේය. එයින් ලැබුණු ප්‍රතිඵල ගැන යශෝදරා සමඟ ද සාකච්ඡා කළේය. මේ දහම් කරුණු හැකි පරිදි ඉගෙනගන්නැයි ඔහු යශෝදරාට කීය. එයින් හදවතට ශාන්තියක් ලැබෙන බවත් මෙමඟින් සමාජ සේවා කටයුතුත් දිගින්දිගට වැඩියෙන් කිරීමට ශක්තිය ඇතිවන අයුරුත් පැහැදිලි කර දුන්නේ ය.

යශෝධරා ද සිද්ධාර්ථ අනුගමනය කළාය. කොපමණ කටයුතු තිබුණ ද භාවනා කිරීම, ධර්මය ගැන සිද්ධාර්ථ සමඟ සාකච්ඡා කිරීම ආදිය ඇය අතහැරියේ නැත. සමහර විටෙක දෙදෙනාම මුනිවත රකිමින් භාවනා කළාහ.

බ්‍රාහ්මණ ධර්මයේ ආශ්‍රම සතරක් ඇති බව සිද්ධාර්ථ කුඩා කල සිටම ඉගෙන ගෙන තිබිණි. බ්‍රහ්මචාරී ආශ්‍රමය, වේදය ඉගෙන ගන්නා අවදියයි. ගෘහස්ත ආශ්‍රමයේ දී විවාහ වී දරුමල්ලන් පෝෂණය කිරීම සහ සමාජ සේවය ද තුන්වන ආශ්‍රමය වූ වානප්‍රස්ථයේ දී දරුවන් වැඩි වියට පත් වූ පසු අවාහ විවාහ කර දී තමන් ධාර්මික කටයුතුවල යෙදීමත්, සතර වැනි ආශ්‍රමයේ දී හෙවත් සන්‍යාසි අවදියේ දී සියලු ගිහි කටයුතුවලින් මිදී ආශ්‍රම ජීවිතයක් ගත කිරීමක් ඊට ඇතුළත් විය. සිද්ධාර්ථ සතර වන ආශ්‍රමය ගැන සිත යෙදීය. වයසට ගොස් සන්‍යාසි වීමෙන් පලක් නැති බවත් ජීවිතයේ වැදගත්ම අවදිය වන තරුණ වියේ දී එය කළ යුතු බවත් ඔහු සිතීය. ජීවිතය ගැන විමුක්තිය සෙවීම ගැන කාලය යෙදවීමට එතරම් ප්‍රමාද වීම සුදුසු නැති බව ඔහු කල්පනා කළේය.

''මේ ආශ්‍රම හතරම එකට එකතු කිරීමට කවුරුත් මහන්සි නොගන්නේ ඇයි?'' සිද්ධාර්ථගේ ප්‍රශ්නය විය.

අඹුදරුවන් සමඟ නිවසේ සිටත් ධාර්මික ජීවිතයක් ගත කළ හැකි බව සිතූ සිද්ධාර්ථ තමන්ගේ වර්තමාන ජීවිතයේම මේ කාර්ය ආරම්භ කිරීමට සිත යොමු කළේය. ශ්‍රාවස්ති, රාජගිරි වැනි ප්‍රදේශවල වැඩ වෙසෙන තවුසන් පිළිබඳ තොරතුරු දැනගත් සිද්ධාර්ථ ඔවුන්ගෙන් යමක් ඉගෙන ගන්නත් එහි භාවනා කරන්නත් හැකි වෙතොත් කෙතරම් යහපතක් දැයි කල්පනා කළේය.

******

එක් දිනක් සමාජ සේවා කටයුතු කර මාළිගාවට පැමිණි යශෝදරාගේ මුහුණ යම් කළකිරීමකින් යුතු බව සිදුහත්ට පෙනිණි. මාළිගාවේ කිසිවෙකුත් සමඟ කතා බහක් නොකළ යශෝදරා සිතේ තද දුක තිබිය දී එය තද කරගෙන භාවනා කරන්නට පටන් ගත් අතර ඇගේ දෑසින් කඳුළු වැගිරෙන්නට විය. සිතිවිලි වේග පාලනය කිරීමට ඇයට නොහැකි විය. රාජ සභාවට ගොස් එන සිද්ධාර්ථ දැක ඇය හඬා වැළපෙන්නට වූවාය. දින ගණනක සිට සාත්තු සප්පායම් කළ පුංචි දරුවා මියගොස් ඇති බවත් කොතරම් මහන්සි වුවත් ඒ දරුවා මරණයෙන් බේරා ගැනීමට නොහැකි වූ බවත් ඉකිගසමින් ඇය සිද්ධාර්ථ සමඟ කීවාය. සිද්ධාර්ථ ඇය පපුවට තද කරගෙන හිස අතගා සනසන්නට මහන්සි ගත්තේය.

''ගෝපා, දුක් වන්නට එපා. හෙට ඒ දරුවාගේ අවමඟුලට මා ඔබ සමඟ එන්නම්. දැන් අඬන තරමක් අඬන්න. හදවතේ බර තරමක් හෝ දුරට අඩු වේවි. ඉපදීම, ලෙඩ වීම, මහලු වීම, මරණය මේ ජීවිතයේ හැමටම පොදුයි. ඒ දරුවාට වෙච්ච දේ කවදා හරි අපටත් කිනම් මොහොතක හෝ සිද්ධ වෙන්න පුලුවන්.''

ඉකි බිඳ හඬන ගමන් යශෝදරා, '' ඔබ කී හැම දෙයක්ම සත්‍ය බව මට වැටහෙනවා. මිනිසුන්ගේ දුක දිහා බලන විට මගේ මේ දැන් කෙතරම් කුඩා ද? මගේ හදවත නිතර දුකින් සහ පීඩාවෙන් පිරිලයි තියෙන්නේ. මගේ ආදරණීය ස්වාමීනි, කරුණාකර මට කියා දෙන්න මේ පීඩාවෙන් නිදහස් වෙන්න ක්‍රමයක් තියෙනවා ද කියා?'' සිද්ධාර්ථ තම දෑතින් යශෝදරාව තුරුලු කර ගත්තේය.

''ප්‍රියේ ! මා මේ සියලු කරදර දුක්පීඩාවලින් මිදීම පිණිස මාර්ගයක් සොයමින් සිටින්නේ. සමාජයත් ඒ දුකින් පෙළෙන බව ඔබත් මාත් දෙදෙනාම දුටුවා. කොතරම් වෙහෙසක් මහන්සියක් දැරුවත් මට තවම නොහැකි වුණා ඉන් මිදෙන මාර්ගය සොයා ගන්න. නමුත් මට හොඳටම විශ්වාසයි කවදා හෝ දිනක මා බලාපොරොත්තු වන කාර්යය ඉෂ්ට වන බව. ගෝපා, මාව විශ්වාස කරන්න.''

''ප්‍රියතමය, මා හැම දාම ඔබ විශ්වාස කළා. මට හොඳට ම විශ්වාසයි ඔබ යමක් කිරීමට එක් වරක් සිතුවොත් එය සාර්ථක වන තෙක් දිගටම කරගෙන යන බව. මට මේ ගැනත් හොඳටම විශ්වාසයි, කවදා හරි මේ සියලුම සැප සම්පත් අතහැර ඔබ සත්‍ය සෙවීමට යන බව. ඒ වුණත් ප්‍රියතමය, මා අතහැර දැන්ම යන්න එපා. මට ඔබේ අවශ්‍යතාව දැන් වැඩියෙන් දැනෙනවා.'' සිද්ධාර්ථ යශෝදරාගේ නිකට අල්ලා ආදරයෙන් මුහුණ ඔසවා, ''නැහැ, නැහැ, ප්‍රියාවිය, එහෙම කරන්නේ නැහැ. දැන්ම මා ඔබ අතහැර යන්නේ නැහැ,'' යැයි කීවේය.

යශෝදරා සිද්ධාර්ථගේ මුව මත අත තබා, ''ඇති, ඇති, තවත් කිසිවක් කියන්න ඕනෑ නැහැ. මා එක් කරුණක් ඔබගෙන් දැනගන්න කැමතියි. අහන්න ද? යම් කිසි ක්‍රමයකින් මට දරුවෙක් ලැබුණොත් ඒ දරුවා ගැහැනු දරුවෙක් වෙනවට ද ඔබ කැමති නැත්නම් පිරිමි දරුවෙක් වෙනවට ද කියන්න?''

සිද්ධාර්ථ මඳ වේලාවක් යශෝදරා දෙස බලා හිඳ, ''යශෝදරා, නුඹ මේ කියන්නේ මොනවා ද? ඒ කියන කතාවේ අදහස කුමක් ද?'' යශෝදරා හිස සලා ''මා ඉතාම සතුටුවන මේ කාරණය නිසා අප දෙදෙනාගේ ප්‍රේමයේ ප්‍රතිඵල දැන් දැන් මට දැනෙනවා,'' කියා තම උදරයට අත තැබුවාය.

''මා කැමති පුතකු බිහි කරනවා නම්, හේතුව නුඹ වගේ ඉතා හොඳ ළේලියක් මට ලැබෙනවානේ, ඒකයි.''

සිද්ධාර්ථ යශෝදරා ළයට ගෙන ආදරයෙන් සිප ගත්තේ ය. ''ප්‍රියේ, ලැබෙන දරුවා දුවෙක් වුවත් පුතෙක් වුවත් මම ආදරයෙන් පිළිගන්නවා. යශෝදරා, ඔබ මේ කතාව අම්මාට කිවුවේ නැද්ද?'' ''මේ කතාව මා ඔබට පමණයි කිවුවේ. අද සවස මා ප්‍රධාන මාළිගයට යනවා. අම්මා, ගෝතමිය සමඟ මේ ගැන කියනවා. මෑණියන්ගෙන් මා දැනගත් නම් පළමු දරුවාට සත්කාර කරන්නේ කොහොම ද කියා. මා දන්නවා, මේ ප්‍රවෘතිය අසා මව් ගෝතමිය ඉතාම සතුටට පත් වන බව.''

සිද්ධාර්ථ හිස සැලීය. මේ ආරංචිය ලැබුණු විගස මෑණියන් එය පියාණන්ට දන්වන බව සිද්ධාර්ථට සිතිණි. ඒ සමඟම සතුට ප්‍රකාශ කිරීමට උත්සව සිද්ධ කරන බව ද සිද්ධාර්ථ ස්ථිරවම දැන ගෙන සිටියේය. ඒ සමඟ ම ටිකින්ටික රජ මැදුරෙහි කටයුතුවලට සම්බන්ධ වී වැඩ කිරීමට සිදුවන බව ද ඔහුට කල්පනා විය.

## එකොළොස් වන පරිච්ඡේදය

# සඳ එළියෙහි වස් දැඩු රාවය

සිද්ධාර්ථගේ මිතුරන් වන උදය, දේවදත්ත, කිම්බිල, භද්දිය, මහානාම, කාලුදායී සහ අනුරුද්ධ යන අය සිද්ධාර්ථ ළඟට පැමිණ නිතර රාජ නීති, රට පාලනය කිරීම ආදී දේ ගැන සාකච්ඡා කළහ. සිද්ධාර්ථ රජකමට පත් වුණොත් ආනන්ද, නන්ද හැර මේ අයත් ප්‍රධාන තනතුරුවලට පත්වන බවට රාවයක් තිබිණි. සාකච්ඡාවට ප්‍රථම සියලු දෙනා තරමක් මද්‍යපානය ද කළහ. මිත්‍රයන්ගේ බලවත් කැමැත්ත මත නාට්‍යාංගනාවන්ට රෑ වන තුරුත් තම නාට්‍ය දර්ශන, නෘත්‍ය සඳහා සිද්ධාර්ථ අනුමැතිය දුන්නේය.

දේවද්ත්ත සෑමවිටම රාජ නීති ගැනත් අනෙක් ප්‍රශ්න ගැනත් සාකච්ඡා කළේ අන්තගාමීවයි. දේවදත්ත ඇසූ සෑම ප්‍රශ්නයකටම උදය සහ මහානාම ඉතාම හොඳ පිළිතුරු දුන්හ. මේ අයගේ සාකච්ඡාවල දී සිද්ධාර්ථ කතා කළේ ඉතාම අඩුවෙනි. සමහර අවස්ථාවල නැටුම්ගැයුම් මැද රාත්‍රියේ මධ්‍යම යාමයේ දී අනුරුද්ධ කිරා වැටෙන බව ද දක්නට ලැබිණි. සවස් වරුවේ සිදුවන බොහෝ වැඩ සටහන්වල දී අනුරුද්ධ නිතරම සිටියේ මහන්සි ගතියෙනි. සිද්ධාර්ථ නිතරම ඇඟිල්ලෙන් ඇණ අවදි කරන

සිරිතක් විය. අනුරුද්ධත් සිද්ධාර්ථත් දෙදෙනා නිශ්ශබ්දව සඳ රැස් ඇති රැයේ ගඟ ඉවුරට ගොස් ගඟේ රැලි දෙස බලා සතුටට පත් වූහ. අනුරුද්ධ මහානාමගේ බාල සහෝදරයා විය. අනුරුද්ධගේ පියා අමිතෝධන, සිද්ධාර්ථගේ බාප්පා විය. අනුරුද්ධ ලස්සන ශික්ෂාකාමී තරුණයෙක් විය. රජ මැදුරේ සිටි බොහෝ තරුණයෝ අනුරුද්ධ බොහෝ සේ ප්‍රිය කළහ. නමුත් අනුරුද්ධ කිසි කෙනෙකුගේ ආදරය පසුපස නොගියේය. ඇතැම් දිනවල සිද්ධාර්ථ සහ අනුරුද්ධ උයනේ බොහෝ වේලා සාකච්ඡා කරමින් සිටියහ. මේ අතර මේ අයගේ මිත්‍ර පිරිස් සුරා පානය අධිකවීම නිසා සිහිසන් නැති වූ විට නිදා ගැනීමට ආගන්තුක ශාලාවට යාම සිරිතක්ව තිබිණි. සඳ ඇති රැයේ සිද්ධාර්ථ තම බට ලී නලාව ගෙන වාදනය කරන්ට පටන්ගත් විට යශෝදරා ද කොනක සිටගෙන බට ලී නලා හඬ අසා එහි රස වින්දාය.

මේ අයුරින් කාලය ගත වී ගියේය. යශෝදරාගේ දරු කුසට මාස ගණන ද සම්පූර්ණ වෙමින් තිබිණි. මේ බව දැනගත් ගෝතමිය දරු ප්‍රසූතිය සඳහා තම මව වෙත යාම අවශ්‍ය නැතැයි ඇයට කීවාය. මේ දින වන විට ඇයගේ මව කපිලවස්තුවේ සිටීම ද එයට එක් හේතුවකි. ප්‍රමිතා බිසව හා ප්‍රජාපතී දෙදෙනාම සාකච්ඡා කර කපිලවස්තුවේ එවකට සිටි ප්‍රසිද්ධම සාත්තු සේවිකාවන් මේ සඳහා යොදා ගත්තහ. යශෝදරාට ප්‍රසව පීඩාව සිදුවන අවස්ථාවේ දී ප්‍රමිතා සහ ගෝතමී දෙදෙනාම ඇය අසල සිටියෝය. සම්පූර්ණ රජ මැදුරෙහි උත්සව ශ්‍රීයක් ගත්තේය. එහෙත් සුද්ධෝදන රජතුමා එතැනට පැමිණියේ නැත. තම පියා ඔහුගේ මුණුබුරාගේ මුහුණ දැකීමට කොපමණ තද බලාපොරොත්තුවකින් සිටිනවා ද යන වග සිද්ධාර්ථ දැනගෙන සිටියේය.

යශෝදරාවට ප්‍රසූත වේදනා අධික වන්නට වූ විට සාත්තු සේවිකාවෝ ඇයව මාළිගාවේ ඇතුළු කාමරයකට රැගෙන ගියහ. ඒ දහවල් කාලය වූ නමුත් එදින තරමක අඳුරු ගතියක් ඇති වී තිබිණි. සිද්ධාර්ථ මාළිගාවේ පිට පැත්තේ වෘඩි වී සිටියේය. තම බිරිඳත් තමනුත් අතර බිත්තියක් බැන්දාක් වැනි හැඟීමක් සිදුහත්ට දැනිණි. ගෙවන හැම මොහොතක්ම සිද්ධාර්ථ සිතුවිලි සාගරයේ ගිල්වමින් ගත විය. යශෝදරාව හමුවීම ද කිසිසේත් කළ නො හැකිය. බැරිම තැන ඔහු මිදුලට විත් ඔබ මොබ සක්මන් කරන්නට පටන් ගත්තේය. තමා උපන් ටික දිනකින්ම තම මැණියන් වූ

මහාමායා බිසව මිය යෑම සිහි කොට සිද්ධාර්ථට මහත් දුකක් දැනෙන්නට විය. මේ මොහොතේ යශෝදරා විඳින වේදනාව ගැන ඔහු සිතන්නට පටන් ගත්තේය. කාන්තාවකට දරුවෙකු බිහි කිරීමේ දී ඇති වන වේදනාව දන්නේ ඇය පමණි. සමහර අවස්ථාවල මව මිය යන අතර ඇතැම් විට දරුවා මිය යයි. නැත්නම් දෙදෙනාම මිය යන අවස්ථා ද එළඹ ඇත. සිද්ධිය දුන් සිද්ධාර්ථට දැකීමට හැකි වුවත් යශෝදරා විඳින වේදනාවට කළ හැකි දෙයක් නැත. තවුසෙකු දුන් උපදෙසක් සිහි කළ සිද්ධාර්ථ පද්මාසනයෙන් වාඩි වී සිත එකඟ කිරීමට මහන්සි ගත්තේය. මේ වේලාව ගත කරන ආකාරය සිද්ධාර්ථගේ ශක්ති පරීක්ෂණයක් මෙන් විය. භාවනා කිරීමට වාඩි වූ සිද්ධාර්ථගේ සිතට පුංචි දරුවකුගේ සුරතල් මුහුණ නිතර ඇතුළු වන්නට විය. සියලු දෙනාම පුතෙකු ලැබේවි යැයි බලාපොරොත්තුවෙන් සිටියහ. දරුවෙකු ලැබීම ඉතාම සතුටට කාරණයකි. ඔහුට ඒ ගැන බොහෝ විට සිතිණි. දුකින් මිදීමේ මාර්ගයක් සෙවීමට කොපමණ මහන්සි ගත්ත ද එය සොයා ගන්නට නොහැකි විය. කළ යුත්තේ කුමක් ද, යා යුත්තේ කොහේ දැයි කියා තීරණය කිරීමට නොහැකි විය. සෙමින්සෙමින් අශ්වාසය, ප්‍රශ්වාසය, වෙත සිත යොමු කරමින් භාවනා කරන අතරතුර පුංචි දරුවෙකු හඬන හඬ කණට වැටිණි. සිද්ධාර්ථ තම නළලේ දහදිය පිස දැමීය.

ගෝතමී බිසව සිනාසෙමින් එළියට පැමිණෙන විට සිද්ධාර්ථට කරුණු වැටහී ගියේය. ''යශෝදරාට පුතෙකු ලැබුණා,'' යැයි ගෝතමී සිද්ධාර්ථට කීවාය.

සිද්ධාර්ථ සිනා සී ගෝතමිය වෙත කෘතඥතා පූර්වක සිනහවක් පහළ කළේය. දරුවාගේ නම ''රාහුල'' නමින් නම් කළේය. එදා සවස සිද්ධාර්ථ තම බිරිඳ සහ පුතු දැකීම සඳහා ඇයගේ යහන ඇති කාමරයට ගියේය. යශෝදරා ඉතා ඕනෑකමින් සිද්ධාර්ථ දෙස බැලීය. ඇයගේ දෑස ආදරයෙන් බර වී දිලිසෙන්නට විය. පුංචි දරුවා යශෝදරාවගේ දකුණු පැත්තේ පට රෙදි මැද අඩ නින්දේ සිටියේය. සිද්ධාර්ථ දුටුවේ පුංචි පුතුගේ මුහුණ පමණි. සිද්ධාර්ථ යමක් කීමට මහන්සි වන බව යශෝදරා දුටුවාය. ඇය ඒ කුමක් දැයි තේරුම් ගෙන ''පුතා අතට ගන්න,'' යි කීවාය. සිද්ධාර්ථ තම පුංචි පුතාව ඉතාම ආදරයෙන් දෑතට ගත්තේ ය. යශෝදරා පියා සහ පුතු දෙස ආදර බැල්මක් හෙළුවාය. තමන් සුළගේ

පාවෙන්නාක් මෙන් සිද්ධාර්ථට දැනිණි. නමුත් ඔහු සිතුවිල්ලෙන් බර වී සිටියේය.

යශෝදරා දින කිහිපයක්ම විවේක ගත්තාය. ගෝතමී බිසව ඇයව සෑම අංශයකින්ම ආරක්ෂා කරන්නට වූවාය. දිනක් සිද්ධාර්ථ රාහුල තම දෑතෙහි ගෙන නළවමින් සිටියේය. මිනිස් ජීවිතය කෙතරම් අගනේ ද? එසේම කෙතරම් සෞම්‍ය දැයි ඔහුට සිතිණි. යශෝදරා සමඟ අවුරුදු හතරක ගමේ පුංචි ගැහැනු දරුවාගේ මළ ගමට සහභාගි වූ දිනය සිද්ධාර්ථට සිහිපත් විය. දෙදෙනා දුප්පත් ගෙදරට යන විට කලින් දුටු පුංචි දරුවා මෘත ශරීරයක් බවට පත් වී තිබිණි. ජීවිතයේ සියලුම ලක්ෂණ විනාශ වී තිබිණි. මුහුණ තරමක් කහ පැහැ ගැන් වී තබිණි. සිරුර පෙනුණේ ඇට සැකිල්ලට සම අලවා තිබුණාක් මෙනි. කැඩුණු වැල් ඇඳක් මත වාඩි වී සිටි දරුවාගේ මව හඬමින් සිටියාය. ටික වේලාවකට පසුව බමුණෝ අවසන් කටයුතු සඳහා පැමිණියහ. අසල්වැසි සියලුම දෙනා මුළු රාත්‍රියම අවදියෙන් සිටියහ. කිහිප දෙනෙක් මිනිය ගෙනයාම සඳහා උණ බට කපා තටුවක් සාදමින් සිටියහ. සිද්ධාර්ථ සහ යශෝදරා මළ ගමට යන දුප්පත් මිනිසුන් පසු පස ගියහ. ගං ඉවුරේ කුඩා චිතකයක් ඉදි කර තිබිණි. මෘත දේහය ගං දියෙන් නැහැ වූ පසු සියලු පවු සේදී විමුක්තිය ලැබෙතැයි විශ්වාසයක් සැමදෙනා තුළම තිබිණ. එක් අයෙක් මිනිය මත සුවඳ ආදිය තැබීය. ඉන් පසු මිනිය චිතකය මත තැබීය. බ්‍රාහ්මණයන්ගේ මන්ත්‍ර උච්ඡාරණයෙන් පසුව චිතකයට ගිනි දල්වනු ලැබීය. චිතකයට ගිනි ඇවිලෙන ආකාරය සිද්ධාර්ථ බලා සිටියේය. සුළු වේලාවකින් පුංචි දරුවාගේ මෘත දේහය අළු බවට පත් විය. සිද්ධාර්ථ යශෝදරා දෙස බැලීය. ඇගේ දෑස් කඳුළින් පිරී ඇති අයුරු ඔහු දුටුවේය. සිද්ධාර්ථගේ සිත ද හැඬෙන තරම් දුකකින් පෙළෙන්නට විය. ''අනේ පුංචි දුවේ නුඹ මී ළඟට යන්නේ කොතැනකට,'' දැයි සිද්ධාර්ථට සිතිණි.

සිද්ධාර්ථ රාහුල යශෝදරාගේ අතට දුන්නේය. මාළිගයෙන් පිටතට පැමිණි ඔහු සැන්දෑ කළුවර වැටෙන තුරුම උද්‍යානයෙහි තනි වී හිඳගෙන සිටියේය. එක් සේවකයෙකු ඔහු සොයාගෙන පැමිණියේය. ''කුමරුනි, බිසවුන් වහන්සේ මට ඔබව සොයන්න කිවුවා. මහ රජතුමා ඔබව බලන්න ඇවිත්.''

සිද්ධාර්ථ මාළිගාව තුළට පිවිසියේය. සෑම තැනකම ආලෝක වත් වී තිබූ බැවින් මාළිගාවම දීප්තිමත්ව බැබළෙමින් තිබිණි.

# දොළොස් වන පරිච්ඡේදය

# කන්ථක

යශෝදරා ඉතා ඉක්මනින්ම පෙර පරිදි සුවපත්ව සාමාජ සේවා කටයුතුවලටත් රාහුල පුතුගේ කටයුතුවලටත් යොමු වූවා ය. දිනක් ඡන්න ගෝතමියගේ දැන්වීම මත යශෝදරා සහ සිද්ධාර්ථ ගමෙහි ඇවිදීමට රැගෙන ගියේය. රාහුල ද රැගෙන ගිය බැවින් ඔහුගේ කටයුතු පහසුව තකා රත්නා නම් මෙහෙකාරිය ද කැඳවාගෙන ගියහ.

ගස්වල ළා දළු මතට හිරු කිරණ වැටී දිළිසෙමින් තිබිණි. අශෝක හා මාදම් ගස්වල සමනලුන් ද කුරුල්ලන් ද ඔබ මොබ පියාසර කළහ. ඡන්න අශ්වයන්ට හිරිහැර නොකොට හෙමිහිට යන්න ඉඩ හැරියේය. යශෝදරා හා සිද්ධාර්ථ දුටු ගම් වැසියෝ ඔවුන් හඳුනා ගත් බැවින් නැඟී සිට දෑත් ඔසවා ආචාර කරන්නට වූහ. ''භාන්'' ගඟ සමීපවත්ම ඡන්න අශ්වයන්ගේ තෝන් ලණු ඇද්දේය. සියලු රථ නතර කෙරිණි. අශ්ව කරත්ත ඉදිරියෙන් එක් මනුෂ්‍යයෙක් සිහිසුන්ව ඇද වැටී සිටියේය. දෙපා ඇඹරී ගොස් තිබූ අතර දෑත් පපුව මත රැඳී තිබිණි. මුවින් කෙඳිරිලි හඬක් නිකුත්වනු ඇසූ සිද්ධාර්ථ රථයෙන් බැස ඔහු වෙත ගියේය. ඡන්න

ද සිද්ධාර්ථ අනුගමනය කරමින් පසුපසින් ගියේය. සිද්ධාර්ථ විසි වයස ද නොඉක්මවූ සිහිසුන් පුද්ගලයාගේ අත අල්ලා ගත්තේය.

''මා හිතන්නේ දැඩි උෂ්ණය නිසා ඔරොත්තු දීමට නොහැකිවයි මොහු සිහි මූර්ජා වී ඇත්තේ,'' යි සිද්ධාර්ථ කීය. ඡන්න හිස සෙල වීය. ''නැහැ කුමාරයාණනි, මා හිතන්නේ උෂ්ණත්වය නිසා නොවෙයි, සුව කළ නොහැකි දරුණු රෝගයකුයි මොහුට වැළඳී ඇත්තේ.''

සිද්ධාර්ථ ඡන්න දෙස බලා, ''මේ කියන කතාව නුඹට හොඳට විශ්වාස ද? අපට බැරි ද මේ ලෙඩා වෛද්‍යවරයා ළඟට ගෙනියන්න?''යි ඇසීය.

රජකුමරුනි, වෛද්‍යවරයාටත් මේ ලෙඩෙිට බෙහෙත් කරන්න අපහසුයි. මේ රෝගය බෝ වන එකක්. අපේ රථයෙන් මේ ලෙඩාව රැගෙන ගියොත් ඔබටත්, මේ කුමාරයාටත්, යශෝදරා කුමරියටත් මේ රෝගය වැළඳෙන්න පුළුවන්. ඒ නිසා තමන්ගේ සෞඛ්‍ය ගැන සිතා මේ ලෙඩා අත හරින්න.

එහෙත් සිද්ධාර්ථ ලෙඩාගේ අත අතහැරියේ නැත. තමන්ගේ අත දෙස බලන ගමන් ඔහු ලෙඩාගේ අත දෙස බැලීය. සිද්ධාර්ථගේ ශරීර සෞඛ්‍ය සැම දාම හොඳින් තිබිණි. එහෙත් මේ රෝගියා තමන්ටත් වඩා අඩු වයසක කෙනෙකු බැවින් සිද්ධාර්ථ තමන්ගේ නිරෝගීකම ගැන තිබූ සිතේ සතුට අඩුකර ගත්තේය. නදී ඉවුරෙන් දුක් බර හඬක් ඇසිණි. ගං ඉවුරේ චිතකයක් සාදමින් තිබෙන බව සිද්ධාර්ථ දුටුවේය. දුක් අඳෝනා හඬත් මන්ත්‍ර උච්චාරණ හඬත් එක්ව ඇසෙන්නට විය. චිතකයේ තැන්පත් කෙරුණු මිනිය චටපට හඬින් ඇවිලුණේය. සිද්ධාර්ථ හිස හරවා බැලීය. තම අත අල්ලාගෙන සිටි රෝගී තරුණයා හුස්ම ඉහළපහළ දැමීම නතර කළේය. දෑස් උඩු අතට හැරී විවර විය. සිද්ධාර්ථ ඔහුගේ අත අතහැරියේය. නිශ්ශබ්දව දෑස් වසා ගත්තේය. මොහොතක් සිට දෑස් හැර බැලූ සිද්ධාර්ථ තමා පිටුපසින් යශෝදරා සිටිනු දුටුවේය. කොපමණ වේලාවක සිට ඈ තමන් පිටුපස සිටියා දැයි සිද්ධාර්ථ දැන සිටියේ නැත.

''මගේ ප්‍රියතමය, කරුණාකර ගඟට ගොස් අතපය සෝදා ගන්න,'' යශෝදරා සිහින් හඬින් කීවාය. ''ඡන්න, නුඹත් යන්න. අපි අනෙක් ගමට යමු. ගමේ නිලධාරීන්ට කියමු, මේ මිනියේ අවසන් කටයුතු කරන්න කියලා.''

එහෙත් ඉන් පසු ඉදිරියට ගමන් කිරීමට කිසිවෙකුටත් සිතුණේ නැත. සිද්ධාර්ථ, ''ආපසු යමු,'' යැයි ඡන්නට කීය. මාළිගාවට පැමිණෙන තුරුත් කිසිවෙක් කිසිදු වචනයක් හෝ කතා කළේ නැත.

එදින රාත්‍රිය සිහින දැකීම නිසා යශෝදරාගේ නින්දට තුන් වරක්ම බාධා විය. පළමු වර නළලෙහි දිලිසෙන මාණික්‍යයක් ඇති සුදු ගවයෙක් දුටුවාය. ඒ මාණික්‍යය පහන් තරුව මෙන් දිලුණේය. ඒ ගවයා කපිලවස්තුවෙන් පිටවීම සඳහා නගර දොරටුව දෙසට යමින් සිටියේය. ඒ සමඟම අදෘශ්‍යමාන කෙනෙකුගේ හඬක් ඇසිණි. ''යම් විදියකින් මේ ගවයා කපිලවස්තුවෙන් පිටව යෑම නතර කළේ නැත්නම් මුළු නගරයේම ආලෝකය නැති වී යනු ඇත.'' බොහෝ දෙනෙක් ගවයා පසුපස දිවූහ. නමුත් කිසිම කෙනෙකුට ඌ නතර කිරීමට හැකි වූයේ නැත. ගවයා නගර දොරටුව වෙත ගොස් අතුරුදහන් විය.

නොබෝ වේලාවකින් යශෝදරා යළිත් සිහිනයක් දුටුවාය. සුමේරු පර්වතයේ මුදුනෙන් ආකාශයේ සිට දෙවුරජවරුන් සතර දෙනෙක් කපිලවස්තු නගරයට ආලෝකයක් විහිදුවමින් සිටියේය. ටික වේලාවකින් ඉන්ද්‍ර දේවතාවාගේ ආසනය සෙලවී ඔහුගේ කොඩිය ද බිමට ඇද වැටුණේය. ආකාශයේ සිට සෑම පාටකම මල් වැස්සක් ඇද හැළෙන්නට විය. මිහිරි සංගීත රාවයන් මුළු නගරය පුරාම ගලා ගියේය.

තුන්වන වරට දුටු සිහිනයේ ''කාලය පැමිණියා, කාලය පැමිණියා,'' යැයි මහ හඬක් දෙවුලොව සිට ඇසෙන්නට විය. බිය වූ යශෝදරා වහාම සිද්ධාර්ථගේ අසුන දෙස බැලූ විට ඔහු එහි නොසිටියේය. ඇගේ හිස පළඳා තිබූ සමන් මල් දාමය බිම වැටී දූවිලි බවට පත් වී තිබිණි. ඈ මහත් සේ බියට පත් වූවාය. ඉන්ද්‍ර දේවතාවාගේ කොඩිය පට පට හඬ නඟමින් ලෙළදෙන්නට පටන් ගත්තේය. ''කාලය පැමිණියා, කාලය පැමිණියා,'' යි මහ හඬ නැගෙන්නට විය.

අවදි වූ යශෝදරාගේ නළලත හා මුහුණ දහඩියෙන් පිරී ගොස් තිබිණි. සිද්ධාර්ථ දෙස බැලූ ඇය, ''සිද්ධාර්ථ අවදි වන්න, සිද්ධාර්ථ අවදි වන්න,'' යි කෑ ගැවාය. සිද්ධාර්ථ සිටියේ අවදියෙනි. සිද්ධාර්ථ යශෝදරා දෙසට අත දිගුකර ඇගේ හිසට අත තබා

''ගෝපා, නුඹ දුටු සිහිනය මට කියන්න,'' යි කීවේය. යශෝදරා ඇය දුටු සිහින සියල්ලම සිද්ධාර්ථට විස්තර කළාය.

''මේ සිහිනවල අදහස විමුක්තිය සෙවීම සඳහා ඔබ මා අතහැර යන බව වෙන්න බැරි ද?'' යි අවසනයේ ඈ දුක් මුසුව විමසුවාය. සිද්ධාර්ථ කිසිත් නොකියා නිශ්ශබ්දව සිටියේය.

ටික වේලාවකට පසු සිද්ධාර්ථ, ''යශෝදරා, බිය වන්න එපා. නුඹ ගම්භීර දැනුමක් ඇති කාන්තාවක්. එසේම මගේ ජීවිතයේ ප්‍රධානම අංගයක්. ඔබ මගේ අදහස් මොනවාදැයි හොඳින්ම දන්නවා. මා ළඟ දී රජවාසල අතහැර ගියත් ආරම්භ කළ හැම කටයුත්තක්ම ඉදිරියට කරගෙන යාමට ඔබට ශක්තිය ඇති බව මම දන්නවා. ශාරීරිකව මා බොහෝ දුර ගියත් අප සිත් දෙකක් නොවෙ. දෙදෙනාගේම එක් සිතක් සේ සිතා කටයුතු කරන්න. යශෝදරා, මා නුඹට ඇති ආදරය කිසිදාක අඩු කරන්නේ නැහැ. මා දන්නවා නුඹට මගේ වෙන්වීම ඉවසීමට හැකි තරම් චිත්ත ශක්තියක් ඇති බව. ජීවිතයේ සියලු දුක්වලින් මිදෙන ඒ මඟ සොයාගත් පසු මා ඔබවත් මගේ රාහුල පුතුවත් බලන්න එනවා. දැන් නුඹ ටිකක් විවේක ගන්නවා නම් හොඳයි.'' සිද්ධාර්ථගේ මෘදු වචන කිහිපය යශෝධරාගේ හදවත තවත් මෘදු කළේය. ඇය සැනසී දෑස වසා නින්දට ගියාය.

දෙවන දිනයේ සිද්ධාර්ථ තම පියා හමුවට ගියේය. ''පිය රජතුමනි, මා ඔබගෙන් අවසර ගන්නයි ආවේ, විමුක්තිය ලැබීමේ මාර්ගය සෙවීම සඳහා ගිහි ගෙය අතහැර ගොස් පැවිදි වීමට.''

මේ වචන කීපය ඇසූ සුද්ධෝදන රජු සිතුවිලි රාශියක් මැද තනි විය. මේ දිනය කවදා හෝ එළැඹෙන බව ඔහු දැන සිටියේය. නමුත් එය මෙතරම් ඉක්මනින් වේ යැයි සිතුවේ නැත. සිද්ධාර්ථ දෙස මඳ වේලාවක් බලා සිටි සුද්ධෝදන රජු, ''අපේ පරපුරේ මීට පෙරත් සමහරු මේ අයුරින් විමුක්ති මාර්ගයක් සෙවීම සඳහා ගිහිගෙය හැර ගොස් තියෙනවා. නමුත් නුඹගේ වයසේ දී කිසි කෙනෙක් එසේ කර නැහැ. එසේ ගිය හැමෝම ගොස් ඇත්තේ පනස් වයස් පිරුණායින් පසුවයි. ඇයි නුඹටත් ඒ වයස එන තෙක් ඉන්න අපහසු? නුඹගේ පුතාත් තවම ඉතා කුඩා නො වේ ද? මුළු කපිලවස්තුවම නුඹ ගැනයි බලාපොරොත්තු තබාගෙන සිටින්නේ.''

''පියතුමනි, සිංහාසනය මත එක් දිනක් හෝ වාඩි වී සිටීම මට චිතකයක ගිනි දැල් මත වාඩි වී සිටීම හා සමානයි. මගේ සිත සැනසී නැත්නම් මා කෙසේ ද සිංහාසනයේ වාඩි වී රට වැසියාට සැනසුම දෙන්නේ. මොහොතින් මොහොත කාලය ගත වී යන අයුරු මම දකිමි, පියාණනි. තරුණ විය තව බොහෝ කලක් පවතින්නේ නැහැ. එනිසා කරුණාකර මට මේ ගමන යාමට අවසර දෙන්න.''

''නුඹේ රට, මා, ප්‍රජාපතී, යශෝදරා, පුංචි රාහුල ගැන වත් තව ටිකක් සිතා බලන්න. ඉන් පසු තීරණයක් ගන්න.''

''මේ සියලු දේ ගැන මා ඉතා හොඳින් සිතා බලායි මේ තීරණය ගත්තේ, පියාණනි. ඉන්පසුවයි ඔබගේ අවසරය ලබා ගැනීමට ආවේ. මා මගේ වගකීම් පැහැර හැර යන්න හදනවා යැයි කිසි විටෙකත් සිතන්න එපා. මගේ සිතේ ඇති වේදනාව මට හැර වෙන කිසිවෙකුටවත් සන්සිඳවන්න හැකි වේ යැයි මා සිතන්නේ නැහැ. ඔබත් තවම ඔබගේ හදවතේ දුක්වලින් නිදහස් වී නැහැ නේ ද?''

රජතුමා වාඩි වී සිටි තැනින් නැගිට සිද්ධාර්ථගේ දෑත තදින් අල්ලා ගත්තේය. ''සිද්ධාර්ථ, නුඹ දන්නවා නේද මට නුඹ කොච්චර ඕනෑ කරනවා ද කියා, මගේ ජීවිතයේ සියලුම බලාපොරොත්තු තබා සිටියේ නුඹ මතයි. ඒ නිසා මා අතහැර යන්න එපා.''

''පියාණනි, කිසිම දාක ඔබ අතහැර යන්න මට කිසිසේත් ම හැකියාවක් නැහැ. ටික දවසකට පමණක් යන්න අවසර ගන්නයි ආවේ. අප සැමගේම සියලු දුක්වලින් මිදෙන මඟ සොයාගත් පසු ඔබ සැම දකින්න මා එනවාමයි.'' සුද්ධෝදන රජතුමාගේ මුහුණේ වෙදනාව පිරී පැතිරී යන අයුරු දකිනනට තිබිණි. රජතුමා කිසිම දෙයක් නොකියා තමන්ගේ සිංහාසනය වෙත ගියේය.

පියාගෙන් සමුගත් සිද්ධාර්ථ යශෝදරා සමඟ මුළු දවසම ගත කරන අරමුණින් ඈ වෙත ගියේය. සවස සිද්ධාර්ථගේ මිත්‍රයන් වූ උදය, දේවදත්ත, ආනන්ද, භද්දිය, අනුරුද්ද හා කිම්බිල ආදීන් සිද්ධාර්ථ හමු වීමට ආහ. උදය, එදින රාත්‍රී උද්‍යානයේ භෝජන සංග්‍රහයක් සූදානම් කර තිබිණි. කපිලවස්තුවේ සිටි ඉතාම දක්ෂ නෘත්‍යාංගනාවන්ට ඒ සඳහා ආරාධනා කර තිබිණි. මුළු මාළිගාව ම ආලෝකමත්ව බැබළුණේය. සිද්ධාර්ථ මාළිගාවේ නතර කර

ගැනීම සඳහා කළ හැකි සැම දෙයක්ම කරන්නැයි සුද්ධෝදන රජු උදයට කියා ඇති බව ප්‍රජාපතී බිසව යශෝදරාට කීවාය. මේ සියලු උත්සව, නෘත්‍ය ආදිය එබැවින් සූදානම් වූ බව ඈ යශෝදරාට දන්වූවාය. ගෝතමී හා යශෝදරා නින්දට යාමට පෙර පැමිනෙන ආගන්තුකයන්ට අවශ්‍ය පරිදි සංග්‍රහ කරන්නැයි මෙහෙකරුවන්ට කීහ. එන අය පිළිගැනීම සඳහා සිද්ධාර්ථ ද මාළිගාවෙන් පිටතට පැමිණියේය. ඇසල මස පුර පසළොස්වක සඳ පායා අවට ආලෝකමත් වී තිබිණි.

ගෝතමී සහ යශෝදරා බොහෝ රෑ බෝවන තුරුත් කතා බහ කරමින් සිටියහ. පසුව ගෝතමිය තම සයනයට ගියාය. මාළිගා ගර්භයෙන් පිටතට පැමිණි යශෝදරා පුර සඳ රැස් එළියෙන් මුළු ප්‍රදේශයම බැබළෙන අයුරු දුටුවාය. සංගීත හඬත් සිනහ හඬත් මුසු වී මාළිගාවෙන් පිටතට හොඳින් ඇසිණි. දොරටුව ළඟට පැමිණි යශෝදරා ඡන්න සෙවුවාය. නිදා සිටි ඡන්න දුටු යශෝදරා ඔහු අවදි කළාය.

''ඡන්න, සමහරවිට රාජ කුමාර සිද්ධාර්ථට අද රාත්‍රියේ නුඹගේ සේවය අවශ්‍ය විය හැකියි. ඒ නිසා කන්ථක අශ්වයා සූදානම් කරපන්. නුඹ සඳහා ද වෙනත් අශ්වයෙකු සූදානම් කරපන්.''

''රාජ කුමාරියනි, සිද්ධාර්ථ කුමරු යන්නේ කොහි ද?''

''කරුණාකර ඒවා අහන්න එපා. දැන් මා කී දේ කරන්න. කුමරුට සමහරවිට අද රෑම යන්න අවශ්‍ය වේවි.''

ඡන්න අශ්ව ගාල වෙත ගියේය. යශෝදරා මාළිගාව තුළට ගියාය. ගමනට අවශ්‍ය ඇඳුම් ආදී සියල්ල සූදානම් කළ යශෝදරා එවා සිද්ධාර්ථගේ ආසනය මත තැබුවාය. රාහුල, සිනිඳු රෙද්දකින් වසා ඇකයේ තබා ගත් ඇය නින්දට ගියාය. සිනහ හඬත් සංගීත හඬත් නොකඩවාම යශෝදරාට ඇසිණි. වේලාව ගෙවී යද්දී ක්‍රමයෙන් සිනහ හඬ ද සංගීත හඬ ද අඩු වී ගියේය. කටයුතු අවසාන වී ආගන්තුකයන් සියලු දෙනාම යන්නට ඇතැයි යශෝදරා සිතුවාය. ඝෝෂා හඬ මැකී මාළිගාවට නැවත ශාන්ත බව පැමිනෙණ විටත් යශෝදරා නොනිදා සයනයෙහි වැතිරී සිටියා ය. ඇය බොහෝ වේලාවක් බලා සිටියාය. එහෙත් සිද්ධාර්ථ ඇගේ කාමරය වෙත පැමිණියේ නැත.

සිද්ධාර්ථ මිදුලේ වාඩි වී ආකාශයේ දිලෙන දහසක් තාරකා දෙස බලා සිටියේය. අද රාත්‍රී මාළිගාව අතහැර යන්නෙමියි ඔහු තිර අධිෂ්ඨානයක් ඇති කර ගත්තේය. අවසන ඔහු තම කුටිය වෙත ගොස් ආසනය මත තබා තිබූ ඇඳුම් ඇඳ ගත්තේය. පසුව දොර තිරය අතින් මෑත් කර යශෝදරා නිදා සිටි සයනය දෙස මද වේලාවක් බලා සිටියේය. සැකයක් නැත; ඇය තද නින්දේය. රාහුල ඇගේ පසෙකින් නිදා සිටියේය. කුටිය තුළට ගොස් යශෝදරා සමඟ කතා කිරීමට ඔහුට අවශ්‍ය විය. නමුත් ඔහුගේ දෙපා ඉදිරියට නොගියේය. තමා යන ගමන ගැන යශෝදරා සමඟ කතා කළ යුතු සියල්ල කතා කර අවසන් නොවේ දැයි ඔහුට අවසානයේ සිතිණි. නැවතත් ඇය අවදි කිරීමෙන් වන්නේ වෙන් වී යන ගමන සිතට තවතවත් වේදනාකාරී වීම පමණකැයි සිතූ සිද්ධාර්ථ තිරය පහතට දමා පිටත් වීමට සූදානම් විය. එහෙත් ඔහුට පිට වීම සඳහා සිත ඉඩ දුන්නේ නැත. ඔහු නැවතත් තිරය මෑත් කොට යශෝදරා සහ රාහුල දැක ගැනීම සඳහා පය තැබීය. නැවතත් පය ආපසු ගත් සිද්ධාර්ථ තිරය පහතට හෙළීය.

ආගන්තුක ශාලාව පසුකරද්දී නෘත්‍යාංගනාවන් ශාලාවේ පලස මත නිදා සිටිනු ඔහු දුටුවේය. කපිලවස්තුවේ දක්ෂම නෘත්‍යාංගනාවෝ වූ ඔවුහු රාත්‍රී රඟ දෙද්දී ඉතා සුන්දරව සුරූපීව සිටියහ. එවිට සරසා තිබූ ඔවුන්ගේ කෙස් අවුල් වී විසිරී තිබිණි. මැරුණු මසුන්ගේ මුව සේ ඔවුන්ගේ කටවල් විවරව තිබිණි. රංගනයන් දක්වද්දී කෝමලව නැළවුණු ඔවුන්ගේ අත් ඇද වූ ලී දඬු මෙන් ඇඹරී තිබිණි. එක් අයෙකුගේ සිරුර මත තවෙකෙක් වැටී සිටියහ. විරූප රූපවලින් යුතු මොවුන් යුද්ධ භූමියක වැටී තිබෙන මළමිනී මෙනැයි සිද්ධාර්ථට හැඟිණි. තමා මළමිනීවලින් යුක්ත අමු සොහොනක සිටින්නාක් වැනි හැඟීමක් ඔහුට ඇති විය. අශ්ව ගාලට ගිය සිද්ධාර්ථ අවදියෙන් සිටින ඡන්න දුටුවේය.

''ඡන්න, කන්ථක සූදානම් කර රැගෙන එන්න,'' ඡන්න හිස සැලීය. ඒ වනවිටත් සියල්ල සූදානම් කර තිබූ ඡන්න කන්ථක කුමරු වෙත රැගෙන ආවේය. ''කුමාරයාණනි, මාත් ඔබ සමඟ එන්න ද?'' ඡන්න ඇසීය. සිද්ධාර්ථ හිස සලා ඔහුගේ අදහසට එකඟ විය. ඡන්න තමා සඳහා සූදානම් කර තිබූ අශ්වයා රැගෙන ආවේය.

සිද්ධාර්ථත් ඡන්නත් අශ්වයන් රැගෙන උද්‍යානය මැදින් මාළිගාවෙන් පිටතට පැමිණියහ. මාළිගාවෙන් පිටතට පැමිණ නැවතුණු සිද්ධාර්ථ කන්ථකගේ නම කියා ඇමතීය. ''කන්ථක, අද ඉතාම වැදගත් රාත්‍රියක්. නුඹ නුඹට හැකි උපරිම සහය මා වෙත දිය යුතුයි,'' යැයි පවසමින් අශ්වයාගේ හිස පිරිමැද්දේය. සිද්ධාර්ථ කන්ථක අසුපිට හිඳගත් අතර ඡන්න තමාගේ අශ්වයා මත හිඳගත්තේය. දෙදෙනාම තමන්ගේ අශ්වයන්ගේ කුර හඬ ඇතට නොඇසෙන සේ හෙමින් අසුන් මෙහෙය වූහ. දොරටුපාලයන් සියලු දෙනා තද නින්දේ පසු වූහ. සිද්ධාර්ථට සහ ඡන්නට කරදරයකින් තොරව මැදුරෙන් පිට වීමට එය මහත් උපකාරයක් විය. මාලිගාවෙන් පිටතට පැමිණි සිද්ධාර්ථ අවසන් වරට කපිලවස්තුව දැක ගැනීම සඳහා නැවතී අසු ආපසු මාලිගාව වෙත හැරවීය. මේ සිද්ධාර්ථ උපන් දා සිට හැදී වැඩුණු නගරයයි. මේ නගරයේ තමන් සතුටු වූ හා දුක් වූ අත්දැකීම් බොහෝය. ඒවා එකිනෙක ඔහුට සිහිපත් විය. ඔහුට මේ නගරය තුළ ලැබුණු දේත් නැති වූ දේත් බොහෝය. එකම නගරයේම සිටිය ද මේ මොහොතේ තමාට සමීප හැම කෙනෙක්ම තද නින්දේ පසුවෙති. ඔහුගේ පියා, ගෝතමිය, යශෝදරා, රාහුල හා සෙසු හැම දෙනම නින්දේ පසුවෙති. ''මට දුකින් මිදෙන මාවත සොයා ගන්න බැරි වුණොත් ආපසු කපිලවස්තුවට එන්නේ නැහැ,'' ඔහු තමාගේම සිතට පොරොන්දු විය.

සිද්ධාර්ථ කන්ථක අශ්වයා දකුණු දෙසට හරවා ඉදිරියට ගිය අතර ඡන්න ද ඒ අනුව පසු පසින් තම අශ්වයා හැසිරවීය.

## දහ තුන් වන පරිච්ඡේදය

# ආධ්‍යාත්මික පුහුණුවේ ආරම්භය

කන්ථක අසු කොපමණ වේගයෙන් දිවූව ද අළුයම වන තෙක් ඔවුනට කපිලවස්තුවෙන් පිටතට පැමිණීමට හැකි නොවී ය. අවසන අනෝමා නදී තීරයට පැමිණි ඔවුහු ගඟ පහළට ඉවුරදිගේ සෙමින්සෙමින් අශ්වයාට එතෙර වීමට පහසු තැනක් සොයමින් ගමන් කළහ. ඔවුහු ක්‍රමයෙන් වනාන්තරය දෙසට සමීප වූහ. මුව පොවුවෙකු ගසක් අස්සෙන් එබී බලා නැවතත් කැලය තුළට ගියේය. කුරුල්ලන් කිහිප දෙනෙකු කිසිදු බියකින් තොරව ඔවුන් සමීපයෙන් ඔබ මොබ පියැඹූහ. අසුපිටින් බැසගත් සිද්ධාර්ථ සිනාසී කන්ථකගේ නම කියා ඇමතීය.

''කන්ථක, නුඹ නම් පුදුම අශ්වයෙක්, කොහොම හරි නුඹ මා මෙතනට ගෙනාවා, නුඹට ඒකට බොහෝම ස්තුතියි.''

කන්ථක හිස ඔසවා ඉතා ප්‍රේම පූර්වකව තම ස්වාමියා දෙස බැලීය. සිද්ධාර්ථ තම කඩුව ගෙන දිගට වැවී තිබූ කෙස් වැටිය කපා දැමීය. ඡන්න ද අශ්වයාගේ පිටින් බැස්සේය. සිද්ධාර්ථ තම කෙස් වැටියත් කඩුවත් සියලු රාජ ආභරණත් ඡන්නට බාර දුන්නේය.

''ඡන්න, මගේ මේ රාජ ආභරණ, කඩුව හා කෙස් වැටිය රැගෙන ගොස් පිය රජතුමාට බාර දෙන්න. කියන්න මා ගැන විශ්වාස කරන්න කියා. මා කියූ දෙය ඉටුකිරීමට කපිලවස්තුවට එන බව කියන්න. මගේ කිසිම ස්වාර්ථයක් නැහැ. ස්වාර්ථය සඳහා රජකම අත හැරියේ ද නැහැ. මා සියලු සත්වයා වෙනුවෙන් ජීවිතය හා කාලය කැප කරමි. පිය රජතුමා, මෑණියන්, දේවී යශෝදරාව ද මා වෙනුවෙන් අස්වසන්න. මේ කාරණය මා නුඹට පවරණවා.''

රාජ ආභරණ අතට ගත් සැනින්ම ඡන්නගේ දෑසින් කඳුළු කඩා හැළෙන්න පටන් ගත්තේය. ''රාජ කුමාරයාණනි, සියලු දෙනාටම බොහෝ වේදනා ඇති වේවි. මේ සියල්ල මා ගිහින් කියන්නේ කෙසේ ද? රජ මැදුරේ සුවපහසු යහන් මත සැතපුණු ඔබ, සිනිඳු සළු හැඳ පෙරවා පුරුදු ඔබ දැන් ඉන්නේ කොහොම ද? සීත රාත්‍රියේ දී පොරවන්නේ මොනවා ද කියා ඔවුන් ඇසුවොත් මා දෙන පිළිතුර කුමක් ද? තවුසෙකු හෝ සාධුවරයෙකු හෝ හැටියට ඔබ ගස් යට නිදා ගන්නේ කෙසේ ද? මෙපමණ කලක් රාජ මන්දිරයේ ඔබ ගත කළ අයුරු මම දනිමි.''

සිද්ධාර්ථ සිනාසුනේය. ''ඡන්න නුඹ ඒ ගැන සිතන්න එපා. අනෙක් තවුසන් ඉන්නා ලෙස මම ද මගේ ජීවිතය ගත කරන්න පුරුදු වෙන්නම්. නුඹ ඉක්මනින් මාළිගාවට ගොස් සියලු දෙනාට විස්තර කියපන්. නැත්නම් ඒ අය තවත් වේදනාවට පත් වේවි. දැන් මට තනිවම ඉන්න ඇරපන්.''

''රාජ කුමරුනි, මමත් කැමතියි ඔබ සමඟ යන්න. ඔබට සේවය කරන්න. මට අනුකම්පා කරන්න. මට ඔබ සමඟ මෙහි නවතින්න ඉඩ දෙන්න. මේ සිද්ධිය මා අනෙක් අයට කියන්නේ කෙසේ ද?'' ඡන්න කඳුළු පිස දමමින් කීය.

සිද්ධාර්ථ ඡන්නගේ පිටට තට්ටු කර, ''ඡන්න, යන්න, කරුණාකර ඉක්මනින් ගොස් මේ කාරණය කියන්න. නුඹ මට අවංකවම ආදරේ නම් කරුණාකරලා යන්න. මා කියන දේ කරන්න. ඡන්න මට මේ වෙලාවේ නුඹෙන් ගන්න සේවයක් නැහැ. තාපසයෙකුට පෞද්ගලිකව සේවකයෙක් තබා ගන්න අවශ්‍ය වන්නේ නැහැ. ඒ නිසා ආපසු යන්න ඡන්න,'' යි කීය.

ඡන්න ඉතාම අපහසුවෙන් රාජ කුමරුගේ කීම පිළිපැද්දේ ය. රාජ ආභරණ, කඩුව, කෙස් වැටිය ආදිය ඉතාම ගෞරවයෙන් තම දෑතට ගත්තේය. ''කුමරුනි, ඔබගේ අණ පරිදි ඔබ කියන දෙය මා කරන්නම්. ඔබ සොයන මාවත මුණගැසුණු පසු අප අමතක කරන්න එපා. ආපසු අප බලන්න එන්න.'' සිද්ධාර්ථ හිස සලා එකඟත්වය පළ කළේය. පසුව ඔහු කන්ථක අශ්වයාගේ හිස අතගා මගේ මිත්‍ර කන්ථක, නුඹත් ඡන්න සමඟ ආපසු මාළිගාවට යන්නේ නම් හොඳයි කීය.

ඡන්න කන්ථකගේ තෝන් ලණුව අල්ලාගෙන තම අශ්වයාගේ පිටට නැගුණේය. කන්ථක කඳුළු පිරි දෙනෙතින් දෑස් විවර කර සිද්ධාර්ථ දෙස බැලීය. තම ස්වාමියා නැවත හමුනොවන බව හැඟී කන්ථක වෙදනාවට පත්ව ඇති බව ඡන්න දුටුවේය. ඔහු ආපසු හැරවූ තම අශ්වයාට පිටත් වීමට සන් කළේය. අසු පිට නැගි ඡන්න කන්ථක ද රැගෙන ඈතින් ඈතට නොපෙනී යන තෙක්ම සිද්ධාර්ථ බලා සිටියේය.

සිද්ධාර්ථ තම අලුත් ජීවිතය ආරම්භ කිරීම සඳහා වනයට පිවිසියේය. තම සිත තුළ සතුට හා නිදහස පිළිබඳ නැවුම් හැඟීම් ඇතිවීමට පටන්ගෙන ඇති බව සිද්ධාර්ථට දැනිණි. සිද්ධාර්ථ වනයට ඇතුළු වන විට තව කෙනෙක් වනයෙන් පිට වන බව ඔහු දුටුවේ ය. බාහිර පෙනුමෙන් ඔහු තවුසෙකු යැයි සිද්ධාර්ථ අනුමාන කළේය. ඔහු ඇඳසිටියේ තවුස් ඇඳුම් වුව ද ඔහු අත දුන්නක් හා පිටෙහි ඊ තළ පිරවූ හම් කොපුවක් ද විය.

''ඔබ දඩයක්කරුවෙකු වගෙයි පේන්නේ?'' සිද්ධාර්ථ ඇසීය.

''ඔබගේ අදහස නිවැරදියි,'' ඔහු පිළිතුරු දිණි.

''නුඹ දඩයක්කරුවෙකු නම් තාපසයෙකුගේ ඇඳුම් ඇයි ඇඳ සිටින්නේ?''

''තාපස ඇඳුම් හැඳ සිටින විට පශුපක්ෂීන් නොබියව මා ළඟට එනවා. ඉන් පස්සේ ඔවුන් මට පහසුවෙන් අල්ලාගත හැකියි.''

''හෝ නුඹ දයාව, කරුණාව ඇති මුනිවරුන්ගේ ඇඳුම් ඇඳගෙන කරන්නේ රැවටීමක්. නුඹේ වස්ත්‍ර මට දී මගේ වස්ත්‍ර නුඹ ගෙන හුවමාරුවක් කරන්න කැමති ද?''

දඩයක්කරු මොහොතක් සිද්ධාර්ථගේ ඇඳුම් දෙස බලා හිඳ තීරණයකට ආවේය. එතුමා ඇඳ සිටින්නේ රාජකීය ඇඳුම්. මේ

ඇඳුම් මිල කිරීමටත් නොහැකි තරම් අගනා ඒවා. ''ඇත්තටම ඔබ ඇඳුම් මාරු කරන්න කැමති ද?'' යි ඔහු විමතියෙන් ඇසීය.

''ඔව්, නුඹට අවශ්‍ය නම් මේ වස්ත්‍ර විකුණා මුදල් ද ලබා ගත හැකියි. ඉන් පසු සත්ව දඩයමට වඩා හොඳ ව්‍යාපාරයක් ආරම්භ කරන්න හැකියි. මා තවුස් දම් රැකීමටයි පැමිණියේ. ඔය ඇඳුම් ඒ සඳහා මට පහසුවක්.''

දඩයක්කරු සතුටින් ඉපිලී ගියේය. ඔහු තම වස්ත්‍ර ගලවා සිද්ධාර්ථට දුන්නේය. තවුස් ඇඳුම් හැඳගත් සිද්ධාර්ථ වනාන්තරය තුළට පිවිසියේය. විශාල ගසක් මුල ඔහු වාඩි වීම සඳහා තෝරා ගත්තේය. රජ මැදුර අතහැර අසු පිටින් පැමිණ ගං ඉවුරේ වන රොදෙහි ඇඳගත් සැහැල්ලු ඇඳුම් හා ඒකාන්තභාවය සිද්ධාර්ථට නැවුම් හැඟීමක් ගෙනදෙන්නක් විය. නිදහසක් ගැන පළමුවරට හැඟීමක් ඇති විය. මේ හැඟීම් මැද සිද්ධාර්ථ භාවනාවට පටන් ගත්තේය.

ගස්වැල් පත් අතරින් මිදී ඉදිරියට ආ සූර්ය රශ්මිය කිරණ සිද්ධාර්ථගේ දෙනෙතට වැදිණි. දෑස විවර කර බැලූ ඔහු තමන් ඉදිරියේ සාධුවරයෙක් සිටිනවා දුටුවේය. ශරීරය ඉතා දුබලව සිටි සාධුවරයා දුටු විට එතුමා කයෝර තපස් රකින කෙනෙකුන් බව පැහැදිළිව පෙනේ. සිද්ධාර්ථ නැඟී සිට දෑත් ඔසවා එතුමාට ආචාර කළේය. ඔහු නමින් ''භාර්ගව'' විය. මා අලුත තවුස් දිවියට ඇතුළු වූ කෙනෙකු නිසා තවමත් කිසිවෙකු ආචාර්යවරයා ලෙස තෝරා නොගත් බව සිද්ධාර්ථ ඔහුට හෙළි කළේය. ''එහෙත් මා ධර්ම ගුරු ආලාරකාලාම වෙත ගොස් එතුමාගේ ධර්මය ඉගෙනීමට බලවත් කැමැත්තෙන් සිටින්නෙමි,'' යි ඔහු තවදුරටත් තවුසාට කීය. ''මමත් ආලාර කාලාම ගුරු ළඟ ධර්මය ඉගෙන තිබෙනවා. එහෙත් දැන් ඔහු වෛශාලියේ උතුරු ප්‍රදේශයේ ධර්මය උගන්වන විද්‍යාලයක් ආරම්භ කර හාරසීයක පමණ ශිෂ්‍ය පිරිසකට උගන්වනවා,'' යැයි තවුසා සිද්ධාර්ථට කීය. එහි යන මඟ තොරතුරු කියන්නැයි සිද්ධාර්ථ තවුසාගෙන් ඉල්ලීය. තවුසා සිද්ධාර්ථ එහි රැගෙන යාමට පොරොන්දු විය. සිද්ධාර්ථ ඉතාම සතුටින් වනාන්තරය මැදින් ඔහු පසුපස ගමන් කළේය. කඳුවැටි තරණයකින් පසු ඔවුහු නැවතත් තවත් වනාන්තරයකට ඇතුළු වූහ. දහවල් කාලය එළඹෙද්දී ඔවුනට කුසගිනි දැනෙන්නට විය. තවුසන් වනාන්තරයේ දී ආහාර ලෙස කැලෑවේ ඇති කොළ, දළු, පොතු

සහ පලතුරු කන ආකාරය ගැන තවුසා සිද්ධාර්ථට කියා දුන්නේය. මේ සියල්ල නැති වූ කල අල හා මුල් වර්ග ආහාර ලෙස ගත හැකි බව ඔහු කියා දුන්නේය. සිද්ධාර්ථ වනාන්තරයේ ඇති ඵලවල විස්තර හොඳින් අසා ගත්තේය.

වනයේ ආහාර ගැනීමෙන් පසු භාර්ගව හා සිද්ධාර්ථ ආලාරකාලාමයන්ගේ අනුපිය නම් අඹ වනයට පැමිණියහ. ගුරුකුලයට ඇතුළුවන විට ආචාර්ය ආලාරකාලාම භාරසියයක් පමණ ශිෂ්‍යයන්ට ධර්මය උගන්වමින් සිටියේය. වයෝවෘද්ධ ඔහු හැත්තෑවන වියෙහි පමණ පසුවේ යැයි පෙනිණි. සිරුර තරමක් දුර්වලව තිබිණි. ඉතා ගැඹුරට ඇසුණු කටහඬින් යුතු ඔහු දේශනා කළ ධර්මය සිද්ධාර්ථ හා ඔහුගේ මිතුරු භාර්ගව පසෙකට වී අසා සිටියහ. ආලාරකාලාමගේ ධර්ම දේශනය අවසන් වූ පසු ශිෂ්‍ය පිරිස තනිතනිව භාවනා කිරීම සඳහා කැළයට ගියහ. පසුව ඉදිරියට ගිය සිද්ධාර්ථ තමන් පිළිබඳ සියලු විස්තර ආලාරකාලාමට දන්වා තමාව ශිෂ්‍යයෙකු ලෙස භාර ගන්නැයි කීය. තමන් ඉතා කීකරු ශිෂ්‍යයෙකු ලෙස සියලු උපදෙස් පිළිපදිමින් ධර්මය අනුගමනය කරන බවට පොරොන්දු විය. ආචාර්යවරයා සිද්ධාර්ථ දෙස බලා හිස සලා ඔහුගේ ඉල්ලීම පිළිගත්තේය. ''නුඹට මගේ ධර්මය අනුගමනය කළොත් ඉතා ඉක්මනින් එහි ප්‍රතිඵල ගන්න පුලුවන්,'' යි ආචාර්යවරයා සිද්ධාර්ථට කීවේය. තමන්ගේ කෘතඥතාව පළ කරනු සඳහා සිද්ධාර්ථ ආලාරකාලාමට දණගසා නමස්කාර කළේ ය.

තම ශිෂ්‍යයන් විසින් සාදාදෙන ලද කුඩා ආරාමයක ආලාරකාලාම වාසය කළේය. වනයේ තැනින් තැන ශිෂ්‍යයන් ද තමතමන්ගේ වාසස්ථාන සඳහා කුටි තනාගෙන තිබිණි. එදා රාත්‍රියේ සිද්ධාර්ථ ගසක් මුල සමතලා පොළොවක නිදා ගත්තේය. ගමන් මහන්සිය ද නිසා සිද්ධාර්ථට හොඳින් නින්ද ගියේය. සිද්ධාර්ථ අවදිවන විට වනාන්තරයේ කුරුල්ලෝ උදෑසන ගී ගයමින් සිටියහ. සිද්ධාර්ථ නැඟිට වාඩි විය. අනෙක් තාපසවරුන් පුරුදු පරිදි තමතමන්ගේ කුටිවල භාවනා කරමින් සිටියහ. සමහරු පිඬුසිඟා යාමට සූදානම් වූහ. සිද්ධාර්ථට ද පාත්‍රයක් ලැබිණි. පිණ්ඩපාතය කරන්නේ කෙසේ ද යන්නත් ඒ සඳහා අනුගමනය කරන පිළිවෙත් ද අනෙක් තවුසන් විසින් ඔහුට කියා දෙන ලදී. සෙසු තවුසන් පිටුපසින් සිද්ධාර්ථ ඒ අය සමඟ පිණ්ඩපාතය සඳහා පිටත් විය.

පිණ්ඩපාත පාත්‍රය ද රැගෙන සිද්ධාර්ථ විශාලා මහ නුවර පෙදෙසට ගියේය. පළමුවරට පිණ්ඩපාත පාත්‍රය අතට ගත් සිද්ධාර්ථට බොහෝ හැඟීම් ඇති විය. එක් තවුසෙක් හා අකර්මණ්‍ය මිනිසකු අතර කෙතරම් වෙනස්කම් ඇත්දැයි ඔහුට සිතිණි. ගම්වැසියෝ පිණ්ඩපාතය සඳහා තවුසන් පැමිණෙන තුරු බලාපොරොත්තුවෙන් සිටියහ. පිණ්ඩපාත පාත්‍රය අල්ලන ආකාරය, භික්ෂාව ලැබුණු විට ඒවා පිළිගන්නා ආකාරය, නැවත එයට ස්තුති කරන ආකාරය ආදිය මෙම ගමනේ දී සිද්ධාර්ථ උගත්තේ ය. එදින සිද්ධාර්ථට බත් හා කඩල පිටිවලින් සෑදූ කිරිහොදි සමඟ පිණ්ඩපාතය ලැබිණි. අනෙක් තවුසන් සමඟ ආපසු වනයට ගිය සිද්ධාර්ථ සියලු දෙනාම සමඟ එක්ව පිණ්ඩපාතය වැළඳූහ. ආහාරයෙන් පසු ධර්මය ඉගෙනීම සඳහා ඔහු ආලාරකාලාම වෙත ගියේය. ඒ මොහොතේ ආලාරකාලාම සමාධිගතව සිටියේය. සිද්ධාර්ථ පසෙක වාඩි වී සිත එකඟ කිරීමට උත්සාහ ගත්තේය. බොහෝ වේලාවකට පසුව ආලාරකාලාම දෑස් විවර කළේය. සිද්ධාර්ථ දණගසා වැඳ ධර්මය පිළිබඳ උපදෙස් දෙන ලෙස අයැද සිටියේය.

ආලාරකාලාම නවක සිසුන්ට පළමුව උගන්වන්නේ ශ්‍රද්ධාව, විශ්වාසය හා නිරතුරු උත්සාහය යන කරුණු තුන පිළිබඳවයි. ආනාපානසති භාවනාව මඟින් සිත එකඟ කරන ආකාරය ඔහු ඉගැන්වීය. තම ඉගැන්වීම් සෛද්ධාන්තික පමණක් නො වන බවත් මානසික තර්ක විතර්කවලින් පමණක් තමා උගන්වන අධ්‍යාත්මික ශක්තිය නොලැබෙන බවත් සඳහන් කළේ ය. භාවනා කරන අවස්ථාවේ දී ඉන් ඉතා ඉහළම ප්‍රතිඵල ලබා ගැනීමට නම් සිතේ අතීත රාග, ද්වේෂ, මෝහ ආදි අකුසල් සිත් මෙන්ම අනාගත බලාපොරොත්තුවලින් ද සිත මුදවාගත යුතු බවත් එය කරන ආකාරයත් ඔහු සිද්ධාර්ථට ඉගැන්වීය. ශරීරයේ හා සිතේ ආවේග අඩුකර ගන්නේ කෙසේදැයි සිද්ධාර්ථ ආචාර්යවරයාගෙන් ඇසීය. ප්‍රශ්නයට පිළිතුරු ලැබීමෙන් පසුව සිද්ධාර්ථ ආලාරකාලාමට වැඳ නමස්කාර කොට වනයේ ඒකාන්ත ස්ථානයකට ගොස් භාවනා කිරීමට පටන් ගත්තේය. ඔහු තම අතින්ම සල්ගස යට පුංචි කුටියක් තනා ගත්තේය. තමන්ට ඔනෑ කරන ආකාරයට භාවනා කිරීම සඳහා ඉතාම ඕනෑකමින් උත්සාහයෙන් භාවනා කිරීමට පටන් ගත්තේය. සෑම දින පහකට වරක්ම සිද්ධාර්ථ ආලාරකාලාම මුණගැසී භාවනාවෙන් තමන්

ලැබූ අත්දැකීම් පිළිබඳව සාකච්ඡා කළේය. මෙසේ නොබෝ කලකින්ම සිද්ධාර්ථ තම භාවනාවල ප්‍රතිඵල ලැබීය. භාවනා කරන අතරතුර ඔහු තම අතීත සිද්ධිවලට හෝ අනාගත සිතුම්පැතුම්වලට හෝ තම සිත තුළට ඒමට ඉඩ නොදුන්නේය. මේ හේතුවෙන් ඔහුගේ සිතට මහත් ශාන්තියක් දැනෙන්නට විය. එහෙත් කෙළෙස් කහට තවමත් සිතෙන් බැහැර නොවූ බව ඔහුට දැනුණේය. තවත් භාවනා කරද්දී සතුට හා පීඩාව යන හැඟීම් සිතෙන් දුරුකර සමාධිගත වී සිටීමට හැකි තත්වයට ඔහු භාවනාව දියුණු කළේය. ඉඳුරන් පහේම ගති විධීන් නතර වූ බව සිත වායුවෙන් නොසැලෙන විලක් මෙන් නිහඬ වූ බවක් ඔහුට දැනෙන්නට විය. මේ සියලු සිද්ධි ආලාරකාලාමට දැන්වූ පසු ඔහු මහත් සතුටට පත් විය. ''නුඹ ඉතාම කෙටි කලකින් අවශ්‍ය කරන දැනුම ලබා ගත්තා,'' යැයි ආලාරකාලාම සිද්ධාර්ථට කීය. ඔහු සිද්ධාර්ථට ඊළඟ පාඩම කියා දුන්නේය. එමඟින් සිරුර සැහැල්ලු කර ආකාශයේ යා හැකි තත්වයක් උදාවන බව සඳහන් කළේය. ඒ අවස්ථාවේ දී භෞතික ලෝකයේ ඇති වස්තු පිළිබඳව ඇති වන හැඟීම් නැති වන ආකාරය ද විස්තර කළේය.

සිද්ධාර්ථ තම ආචාර්යවරයාගේ උපදෙස් පරිදි එකී භාවනා ක්‍රම පුහුණු කිරීම ආරම්භ කළේය. දින තුනක් ඇතුළත ඉහත කී සියලු දේ කිරීමේ ශක්තිය ඇති කර ගත්තේය. ආකාශයේ පිහිණුව ද සිතේ දුක් ආදී දේ නැති වූයේ නැහැ නොවේ දැයි සිද්ධාර්ථට හැඟිණි. නැවතත් ආලාරකාලාම වෙත ගිය ඔහුට, ''දැන් නුඹ මී ළඟ පියවර තබන්න ඕනෑ,'' යැයි ආලාරකාලාම කීය. එය අනන්ත ආකාශය අරමුණු කරගෙන කරන පුහුණුවක් විය. දින දෙකකින් එහි ද ප්‍රතිඵල ලැබිණි. නමුත් තම සිත තවමත් දුක් නැති කිරීමට සමත් නොවූ බව සිද්ධාර්ථට දැනිණි. සිද්ධාර්ථ නැවතත් ආලාරකාලාම වෙත ගොස් තම සිතේ ඇති හැඟීම් ගැන කීය. ආචාර්යතුමා සිද්ධාර්ථගේ දෑස දෙස බලා, ''නුඹ දැන් අන්තිම ලක්ෂ්‍යයට ළඟා වීමට ආසන්නවයි සිටින්නේ, දැන් මුළු ලෝකය ම මායාවක් බව මෙනෙහි කරමින් භාවනා කරන්න,'' යැයි උපදෙස් දුන්නේය.

''රූප, ශබ්ද, ගන්ධ, රස, ශීත, උෂ්ණ, සැප, දුක යන මේ සියල්ලෙහිම උත්පත්ති ස්ථානය සිතයි. මේ සියල්ල ගැන අප සිතන අයුරින් ඒ කිසිවක් නොපවතියි. නුඹ උත්සාහයෙන් භාවනා

කොට සිත අපධාර්ථයන්ගෙන් නිදහස් කර ගතහොත් ඉන් ලැබෙන සතුට අපමණයි. ඉන් පසු ඉහත කී විකාර සියල්ල සිතින් සම්පූර්ණයෙන්ම නැති වී යනවා.'' සිද්ධාර්ථ තම ගුරුවරයාට දෑත් එකතු කර වැඳ තම කුටිය වෙත ගියේය.

ආලාරකාලාමගෙන් ධර්මය ඉගෙන ගන්නා අතරතුර සිද්ධාර්ථට තවත් බොහෝ අය සමඟ සම්බන්ධවීමට අවස්ථාව ලැබිණි. සියලු දෙනාම සිද්ධාර්ථගේ ප්‍රියමනාප කරුණාශීලී ගති පැවතුම් ගැන පැහැදුණහ. මුල් කාලයේ සිද්ධාර්ථට තම ආහාර සඳහා පිණ්ඩපාතයෙහි යාමට සිදු විය. පසුව තමන්ගේ කෑම කුටිය තුළ තබා ඇති බව දැන ගන්නට ලැබිණි. භාවනා කර අවසානයේ දෑස් හැර බලන විට තම ආහාර කොටස කෙසෙල් කොලයක හෝ වෙනත් භාජනයක හෝ තබා තිබිණි. බොහෝ තාපසවරු සිද්ධාර්ථ සමඟ ළඟ ඇසුරට තරඟ කළහ. ඊට හේතුව වූයේ සිද්ධාර්ථ පැමිණ ඉතා කෙටි කලකින්ම අවශ්‍ය සියලු දේ ඉගෙන ගත් අතර ගුරුතුමා ද නිතරනිතර සිද්ධාර්ථගේ ප්‍රගතිය ගැන කථා කළ නිසාය.

සිද්ධාර්ථ කිනම් පරපුරකට අයත් දැයි ආලාරකාලාමට ද පසුව දැන ගැනීමට අවශ්‍ය විය. ඔහු රජ පවුලකට අයත් එක් රාජ කුමාරයෙකු බව පසුව ඔහුට දැන ගැනීමට හැකි විය. අනෙක් තවුසන් සිද්ධාර්ථ රාජ පරම්පරාවකට අයත් රාජ කුමාරයෙක් දැයි ඔහුගෙන් විමසද්දී ඔහු සිනහ පහළ කළා පමණි. කිසිවක් කීවේ නැත. ඒ කතාවල එතරම් වැදගත්කමක් නැතැයි ඔහු ඉතාම කාරුණික හඬින් කීය. වැදගත් වන්නේ සත්‍ය ධර්මය පිළිබඳව හැකි තරම් දුරට ප්‍රගතිය ඇති කර ගැනීමයි.

ටික දිනකින් සිද්ධාර්ථ ආකිඤ්චඤ්ඤායතන යන ධ්‍යානයට පත් විය. එහෙත් සිතේ දුක් නැති කිරීම සඳහා එය සමත් වූයේ නැත. නැවත ආලාරකාලාම වෙත පැමිණ සිද්ධාර්ථ කී සියල්ල ආලාරකාලාම හොඳින් අසා සිටියේය. කතාව සම්පූර්ණයෙන් අසා සිටි ආලාරකාලාමගේ දෙනෙත් දීප්තිමත්ව බැබලිණි. ''සිද්ධාර්ථ, නුඹ ඉතාම දක්ෂ ප්‍රතිභාශීලී කෙනෙක්. ධර්මය පිළිබඳව උපදෙස් දීමට මට තිබූ හැකියාවේ තත්වයට දැන්

නුඹ පත් වී සිටිනවා. දැන් අප දෙදෙනාම එක හා සමානයි. මේ ශිෂ්‍ය පිරිසට ඉගැන්වීම් කරන්න නුඹත් මා සමඟ එකතු වන්නේ නම් මා කැමතියි,'' ආලාරකලාම තවුසා කීවේය.

ආලාරකාලාමගේ ආරාධනාව නිහඬව අසා සිටි සිද්ධාර්ථ කිසිවක්ම කීවේ නැත. ආකිඤ්චඤ්ඤායතන අවස්ථාව ඉතාම වැදගත්ය. එහෙත් ජන්මය සහ මරණය නැති කිරීම සඳහා ඉන් පලක් නොවන බව සිද්ධාර්ථට දැනිණි. සිද්ධාර්ථගේ අදහස වූයේ කිසියම් සම්ප්‍රදායක නායකයා වීම නොවේ. සත්‍ය සෙවීමයි. සිද්ධාර්ථ ආලාරකාලාමට දෑත් එකතු කර නමස්කාර කොට ''ගුරු දේවයානණි, ඔබගේ උපදෙස් පරිදි මම ආකිඤ්චඤ්ඤායතනය තෙක් ඉගෙන ගත්තා. ඒ සඳහා ඔබ වහන්සේට අනේකවාරයක් ස්තුතිවන්ත වෙමි. ආකිඤ්චඤ්ඤායතනයෙන් මා බලාපොරොත්තු වන දේ ලැබෙන්නේ නැහැ. ඒ නිසා මා බලාපොරොත්තු වන දෙය ඉටුකර ගැනීමට සියලු දෙනා අතහැර මට යන්න අවසර දෙන්න.''

ආලාරකාලාම නිරාශා විය. නමුත් සිද්ධාර්ථ තමන්ගේ තීරණය වෙනස් කළේ නැත. දෙවන දින සිද්ධාර්ථ තමන්ගේ අදහස ඉටුකර ගැනීම සඳහා ආලාරකාලාමගේ අසපුවෙන් නික්මී ගියේය.

## දහ හතර වන පරිච්ඡේදය

# ගංගා නම් ගඟ තරණය

ආලාරකාලාමගේ ආරාමයෙන් පිටත් වී සිද්ධාර්ථ ගංගා නදියෙන් එතෙර විය. ඔහු මගධ රාජ්‍යයට පැමිණියේය. මගධ රාජ්‍යය විවිධ ප්‍රාතිහාර්ය පාන ඍෂිවරු, තපස්වීන්, ධ්‍යාන ලාභීන් ගැන ප්‍රසිද්ධියක් ඉසිලූ රාජ්‍යයකි. සිද්ධාර්ථ තවතවත් ගුරුවරුන් සෙවීමට මහන්සි ගත්තේය. ඉපදීම සහ මරණය යන දෙක නැති කිරීමේ මාර්ගය සොයා ගැනීම ඔහුගේ දැඩි උත්සාහය හා ප්‍රධාන ම අවශ්‍යතාව විය. බොහෝ ගුරුවරු කඳු හා වනාන්තරවල වාසය කළහ. ඒ ගුරුවරුන් ගැන අසමින් ඔවුන් සොයා ගැනීමට කොපමණ කඳු ගිරිහෙල් තිබුණ ද ඒ සියල්ල පසුකර ඔවුන් සමීපයට යෑමට සිද්ධාර්ථ සෑම උත්සාහයක්ම දැරීය. අව්ව හෝ වැස්ස හෝ කාලය හෝ ගැන කිසිදු තැකීමක් නොකළ ඔහු තමන් පැමිණි ගමන සාර්ථක කර ගැනීමට හැකි සෑම උත්සාහයක්ම ගත්තේය.

මේ ගමනේ දී සිද්ධාර්ථට නිර්වස්ත්‍ර සාධූන් ද හමු විය. ඔවුහු ආහාර ලෙස කොළ, මුල් හා අල ආදිය පමණක් ගත් පිරිසකි. ඇතැමුන් විශාල ගිනි ගොඩක් රවුමට සාදා ඒ මැදට වී ශරීරය ගින්නෙන් තැවූහ. ඒ ශ්‍රමණ පිරිස් විශ්වාස කළේ ශරීරයට

දුක් දීමෙන් මරණින් මතු දිව්‍යලෝකයට යා හැකි බවයි. දිනක් සිද්ධාර්ථ ඒ අයගෙන් ''ඔබ දිව්‍ය ලෝකයට ගියත් මිහිපිට සිටින අයගේ දුකෙහි කිසි අඩුවක් එයින් වන්නේ නැහැ නේද?'' යි ඇසීය. විමුක්තිය සෙවීම යනු සසර දුක නැති කිරීම මිස ජීවිතයෙන් පලා යාම නොවන බව ඔවුනට සිද්ධාර්ථ කියා දුන්නේය.

ඇතැම් අසපුවල මාස තුනක් හෝ හතරක් හෝ ද ඇතැම් අසපුවල මාස හයක් පමණ කාලයක් ද වශයෙන් සිද්ධාර්ථ තවුසා කාලය ගත කළේය. සිත එකඟ කිරීමේ ශක්තිය ද දිනෙන් දින වැඩි විය. එහෙත් ඉපදීම හා මරණය නැති කිරීමේ මඟක් සොයා ගැනීමට තවමත් ඔහුට හැකි වූයේ නැත. දින, සති, මාස ගත වී ගියේ ඔහුට නොදැනීමය. සිද්ධාර්ථ තම මාළිගය අතහැර පැමිණ දැනට වසර තුනක් ගත වී අවසානය. සමහර අවස්ථාවල භාවනාවට වාඩි වූ විට ළමා කාලය, මාළිගාව, පියා, යශෝදරා ආදී බොහෝ දේ සිහිපත් විය. මේ සියල්ලෙන් මිදීම ඒ තරම් පහසු කාර්යයක් වූයේ නැත. එහෙත් සිද්ධාර්ථ කෙදිනක හෝ තමන් දුකින් මිදෙන මාර්ගය සොයා ගන්නා බව තදින්ම විශ්වාස කළේය.

කලක් සිද්ධාර්ථ මගධයේ පාණ්ඩව පර්වතයේ තනිව වාසය කළේය. ඔහු පිණ්ඩපාත කිරීම සඳහා පාත්‍රය ද රැගෙන පර්වතයෙන් පහළ නගරයට පැමිණියේය. සිද්ධාර්ථගේ මන්ද, ශෝබන, සහන ශීලී ගමනත් ශරීරයේ සුන්දරත්වයත් කේශ කලාපයත් නිසා බොහෝ අය සිද්ධාර්ථ දැකීමට පෙරමුණට පැමිණියෝය. මේ අතරතුර දිනක් මගධයේ රජු බිම්බිසාර නගර සංචාරය සඳහා තම අශ්ව රථයෙන් නගරයට පැමිණියේය. කවදාවත් නොදුටු ශෝභමාන පුරුෂයෙකු සාධුවරයෙකුගේ වේශයෙන් යනු දුටු විට එතුමා, ඉතා හොඳින් දැක ගැනීම සඳහා රථය නතර කරන ලෙස රථාචාර්යවරයාට දන්වීය. මේ තවුස්තුමාට දන් පිළිගන්වා ඔහු පසුපස ගොස් නැවතී සිටින්නේ කොහේදැයි බලාගෙන එන ලෙස සේවකයෙකු පිටත් කර හැරියේය.

දෙවන දිනයේ රජු සිද්ධාර්ථ නතර වී භාවනා කළ තැනට ගියේය. රථය කඳු පාමුල නතර කොට සෙවකයන් ද සමඟ පයින්ම

සිද්ධාර්ථ තවුසා වෙසෙන තැනට ගියේය. ගසක් මුල භාවනා කරමින් සිටින සිද්ධාර්ථ දුටු රජු ඉදිරියට ගොස් දෑත් එකතු කර නමස්කාර කළේය. නැඟී සිටි සිද්ධාර්ථ හැඳ සිටි ඇඳුම්වලින්ම මේ මගධයේ රජු විය යුතු බව වටහා ගත් අතර දෑත් එකතු කොට ආචාර කළේය. රජුට එහි වූ ගලක් මත වාඩි වෙන ලෙස ආරාධනා කළ ඔහු රජු ඉදිරිපිට ගලක් මත වාඩි විය.

සිද්ධාර්ථගේ ශීලාචාර සම්පන්න බව දුටු බිම්බිසාර රජු ඉතාම සතුටට පත් විය. මගධයේ බිම්බිසාර රජු මම යැයි එතුමා ම කීහ. මා පැමිණියේ ඔබ මගේ රාජධානියට කැඳවාගෙන යාමට යැයි ද එතුමා සඳහන් කළහ. ''ඔබතුමා මා සමඟ ටික කලක් ගත කරන්නේ නම් මට ධර්මය පිළිබඳව ඉගෙන ගත හැකියි, මගේ ලොකු විශ්වාසයක් තියනවා, ඔබතුමා මා සමඟ සිටියොත් මගේ රාජ්‍යය සමෘද්ධිමත් වී ශාන්තියක් ඇති වේය කියා. ඉතින් මා කැමතියි ඔබ තුමා මා සමඟ මගේ රාජධානියට එන්නේ නම්,'' රජු තව දුරටත් කීය. සිද්ධාර්ථ සිනා සී, ''රජතුමනි දැන් මා පුරුදු වී සිටින්නේ වනයේ ඉන්න,'' යැයි කීවේය.

''මේ ජීවිතය ඉතාම දුක් බර එකක්. නිදා ගන්න ඇතිරිල්ලක්, ඇඳක්, උපකාරයට කිසි කෙනෙක් දකින්න නැහැ. ඔබතුමා මා සමඟ යන්න සූදානම් නම් මම මගේ මාළිගයේ නතර කර ගන්නම්. කරුණාකර ධර්මය ඉගෙනීම සඳහා මගේ මාළිගයට එන්න.''

''මහ රජතුමනි, රජ ගෙදර ජීවිතය මට ගැළපෙන්නේ නැහැ. සියලුම ප්‍රාණීන්ගේ දුක නැති කිරීම සඳහායි මා මේ උත්සාහ දරන්නේ. ඒ නිසා මා වැනි තාපසයෙකුට රජ මැදුර හීන තැනක් ලෙසයි මට සිතෙන්නේ.''

''ඔබගෙයි, මගෙයි වයස එක හා සමානයි. අප දෙදෙනාට එකට එකතු වුණොත් අදහස් හුවමාරු කර ගන්න පහසුයි. ඔබ දුටු අවස්ථාවේ සිටම මා ඔබ සමඟ ප්‍රකෘතියෙන් සම්බන්ධයක් ඇති කර ගත්තා. මා සමඟ යන්න එන්න. ඔබ කැමති නම් මගේ රාජ්‍යයෙන් බාගයක් ඔබට දෙන්න මා සූදානම්. වියපත් වූ පසු තාපස ජීවිතයක් ගත කිරීමට නැවත යා හැකියි.''

''ඔබගේ ආදර හැඟීම්වලට බොහොම ස්තුතියි. මගේ එකම අදහස දුකින් පෙළෙන සත්වයා ඉන් මුදවා ගැනීමයි. මහ රජතුමනි, තරුණ වයස නොදැනීම ගෙවී යනවා. තරුණ ශක්තිය මේ සඳහා යෙදෙවුවේ නැත්නම් වියපත් වූ පසු මේ කාර්යය කිසි සේත් කළ නොහැකියි. අනෙක ජීවිතය ගැන කිසිදු විශ්වාසයක් තැබිය නොහැකියි. ලෙඩ රෝග හා මරණය කවදා ඒ ද දන්නේ නැහැ. ලෝභ, ක්‍රෝධ, තණ්හා, අහංකාර ආදියෙන් සිත පිරී ගොස් ඇති නිසා ඉන් මිදීම ද එතරම් පහසු නැහැ. මා සත්‍යය අවබෝධ කරගත හොත් සියලුම ප්‍රාණීන්ගේ දුක නැති කිරීමට මඟ පෙන්වා දීම සඳහා මට ශක්තිය තිබෙනවා. ඔබ මට ඉතාම ආදරේ නම් මා යන මාර්ගයේ යාමට මට ඉඩ දෙන්න.''

සිද්ධාර්ථගේ වචන ඇසූ රජු තවතවත් පැහැදීමට පත්ව, ''ප්‍රිය තාපසතුමනි, ඔබගේ කතාව අසා මා මහත් පැහැදීමට පත් වීමි. මා කැමතියි ඔබතුමා පැමිණියේ කොහේ සිට දැයි දැනගැනීමට. ඔබගේ වංශය කුමක් ද?'' යි ඇසීය. ''රජතුමනි, වංශය ගැන කියනවා නම් මා අයිති ශාක්‍ය වංශයටයි. මගේ පියා කපිලවස්තුවේ සුද්ධෝදන රජතුමායි. මගේ මව මාහාමායා බිසවයි. මා කපිලවස්තුවේ ඊළඟ ඔටුන්න හිමි කුමාරයායි. නමුත් දුකින් මිදෙන මඟ අවබෝධ කරගැනීම සඳහා මම තපස් ජීවිතයට ඇතුළු වුණෙමි. මේ නිසා මා මගේ රාජ්‍යය, පියා, බිරිඳ, පුතු සියල්ලම අත හැර දැනට අවුරුදු තුනකට පෙර තාපස ජීවිතය ආරම්භ කළා.''

මේ අසා පුදුමයට පත් රජු, ''එහෙනම් ඔබ රජ පවුලකට අයිති කෙනෙක්. කරුණාවන්ත තාපසතුමනි, ඔබ හමු වීමෙන් මා බලවත් සතුටට පත් වුණා. ශාක්‍ය හා මගධ රජවරුන් බොහෝ කාලයක සිටම ඉතාම සමීප සම්බන්ධකම් ඇතිව සිටි රාජ්‍ය දෙකක්. මගේ රාජ්‍යයට පැමිණ මා සමඟ රජකම් කිරීමට ආරාධනා කිරීමෙන් මා කළේ මහා මෝඩකමක්. මට සමා වන්න. මගේ එකම ආරාධනාව ඔබතුමා මගේ මාළිගාවට පැමිණ යන ලෙසයි. මගේ දානය පිළිගැනීමට අනුකම්පා කර එන්න. ඔබ සොයන මාර්ගය අවබෝධ කර ගැනීමෙන් පසු කරුණාකර මා ඔබගේ ශිෂ්‍යයෙකු ලෙස පිළිගන්න. ඒ සඳහා කරුණාකර මට පොරොන්දු වන්න.''

සිද්ධාර්ථ දෑත් එකතුකර ආචාර කොට, ''මා දුකින් මිදෙන මඟ අවබෝධ කරගත් පසු ඔබ හමුවීමට එන්නෙමි,'' යි කියා පොරොන්දු විය. බිම්බිසාර රජු ද දෑත් එකතුකර නමස්කාර කර තම සේවකයන් සමඟ පාණ්ඩව පර්වතයෙන් පහළට බැස්සේය.

රජු පිට වී ගිය පසු සිද්ධාර්ථ තාපසයාණෝ තමන් සිටින ස්ථානය වෙනස් කළහ. තරුණ රජතුමා නිතරනිතර කෑම බීම ආදිය රැගෙන සේවකයන් සමඟ පැමිණ තපස් රැකීමට කරදර කරාවි යැයි එතුමාට සිතුණු බැවිණි ඒ. එතුමා දකුණු පෙදෙසට ගොස් තමන්ගේ භාවනාවට සුදුසු ඉතාම හොඳ තැනක් තෝරා ගත්තේය. මේ අතර උද්දකරාමපුත්ත නම් ඉතා ප්‍රසිද්ධ තාපසතුමා ගැනත් එතුමා සිටින ස්ථානය ගැනත් සොයා බලන්නට විය. එතුමාගේ අසපුව රාජගිරියට නුදුරුව ඇති බවත් ශිෂ්‍යය පිරිස තුන්සියයක් පමණ සිටින බවත් එතුමාට දැන ගන්නට ලැබිණි. තවත් විවිධ තාපසවරු ඒ අවට හාරසියයක් පමණ තවුස් දම් රකිමින් සිටියහ. සිද්ධාර්ථ තාපසතුමා ද ක්‍රමයෙන් උද්දකරාම පුත්තගේ ආරාමය සොයා ගියේය.

## පසළොස් වන පරිච්ඡේදය

# වනාන්තරයේ තවුසා

උද්දකරාම පුත්තගේ වයස අවුරුදු හැත්තෑ පහක් පමණ විය. ඔහු දෙවියන් පුදන ආකාරයෙන් පිදුම් ලබන කෙනෙක් විය. ඔහු ළඟට එන ශිෂ්‍යයනට මුල සිට ධර්මය ඉගැන්වීම ඔහුගේ සිරිතක්ව පැවතිණි. ඒ අනුව සිද්ධාර්ථට ද එසේ කරන්නට සිදු විය. එහෙත් සිද්ධාර්ථ තමා ආකිඤ්චඤ්ඤායතන නමැති මානසික තත්වයට පැමිණ ඇති බව පෙන්වීය. මේ බව දැනගත් උද්දකරාම පුත්ත ඉතාම සතුටට පත් විය. ඔහු තමාගේ ඉගැන්වීම් විස්තර කරමින් තමන් නේවසඤ්ඤා නාසඤ්ඤායතන ධ්‍යානය දක්වා පැමිණ ඇති බවත් උත්සාහයෙන් භාවනා කිරීමෙන් ඔබටත් එම තත්වයට පැමිණිය හැකි වන බවත් දේශනා කළේය. ඒ සමඟම උද්දකරාම පුත්ත තවුසා තමන්ගේ මරණින් පසු තම ශිෂ්‍ය පිරිසට ප්‍රධානියා ලෙස සිද්ධාර්ථ කටයුතු කරනු ඇතැයි යටි සිතින් බලාපොරොත්තු තැබීය. මේ නිසා ඉතා අවධානයෙන් සිද්ධාර්ථට ඉගැන්වීම් කටයුතු සිද්ධ කළේය.

සිද්ධාර්ථ උද්දකරාමගේ ඉගැන්වීම් ද ඉතා උත්සාහයෙන් යුතුව ප්‍රගුණ කළේය. නොබෝ දිනකින් නේවසඤ්ඤා නාසඤ්ඤායතනයෙහි කෙළවරට පැමිණි සිද්ධාර්ථ උද්දකරාම

පුත්ත ළඟට ගිය විට ඔහු සිද්ධාර්ථට මුව පුරා ප්‍රශංසා කළේය. ''සිද්ධාර්ථ, නුඹ මගේ ඉතාම ශ්‍රේෂ්ඨ ශිෂ්‍ය රත්නයක්. මට නුඹ මෙන් දක්ෂ ශිෂ්‍යයෙක් මේ දක්වා ලැබුණේ නැහැ. මෙතරම් සුළු කාලයක දී නුඹ ඉතාම හොඳ දියුණුවක් ලැබුවා. මා දැන් වයසට පත්ව සිටිමි. මේ ලෝකයෙහි තවතවත් ජීවත් වීමට අවශ්‍ය නැහැ. නුඹ මා සමඟ ඉන්න සූදානම් නම් අප දෙදෙනා එකතු වී මේ ශිෂ්‍යයන්ට ධර්ම කියා දිය හැකියි. මගේ මරණින් පසු මේ ශිෂ්‍ය පිරිසගේ ප්‍රධානියා ලෙස ඔබ කටයුතු කරන්න.''

සිද්ධාර්ථට නේවසඤ්ඤා නාසඤ්ඤාවේ ඉපදීම හා මරණයට විසඳුමක් නැති බව වැටහී ගියේය. එය කෙතරම් උසස් ආධ්‍යාත්මික තත්වයක් වුව ද සත්වයාව සියලු දුක්වලින් මිදවීමට ඉන් හැකියාවක් නැත.

සිද්ධාර්ථ ඒ ආරාධනාව භාර ගැනීමට නොහැකි බව ඉතාම ගරුසරු ඇතිව සඳහන් කළේය. උද්දකරාම පුත්තගේ ඉගැන්වීම්වලින් ද ඉපදීම හා මරණය නැති කිරීමට උපායක් නැති බව සිද්ධාර්ථට අවබෝධ විය. මෙතැනින් එහාට යම් කිසි දෙයක් ඇතැයි සිද්ධාර්ථට සිතිණි. ආචාර්ය උද්දකරාම පුත්තට හා අනෙක් තපස්වීන්ට නමස්කාර කර එකී අසපුවෙන් පිටවී යාමට අවසර පැතීය. උද්දකරාම පුත්තගේ අසපුවේ සිටි සියලුම දෙනා සිද්ධාර්ථට මහත් සේ ඇලුම් කළහ. සිද්ධාර්ථ වෙන්වී යන අවස්ථාවේ සැම දෙනාගේම දෙනෙත්වලින් කඳුළු ගැලීය.

උද්දකරාම පුත්ත සමඟ එතුමාගේ අසපුවේ සිටින අතරතුර එක්තරා තවුසෙකු වූ කොණ්ඩඤ්ඤ සමඟ සිද්ධාර්ථ මිත්‍ර වූයේ ය. කොණ්ඩඤ්ඤ සිද්ධාර්ථට ඉතාම ප්‍රිය මනාප විය. උද්දකරාම පුත්තගේ මරණින් පසු අසපුවේ ප්‍රධානියා ලෙස සිද්ධාර්ථ පත් කර තැබීමට උද්දකරාම පුත්ත තීරණය කර තිබුණු බව කොණ්ඩඤ්ඤ දැන සිටියේය. සිද්ධාර්ථ දැකීමෙන් පසු කොණ්ඩඤ්ඤ භාවනාව ගැන තවතවත් උනන්දු වූයේය. විවේක ඇති සැම විටකම ඔහු භාවනා ගැන ඉගෙනීමට සිද්ධාර්ථ ළඟට ගියේය. තම මිත්‍රයා අසපුව අතහැර යාම අනෙක් සැමටම වඩා කොණ්ඩඤ්ඤට වේදනා ගෙන දෙන්නක් විය. සිද්ධාර්ථ පසු පසින් ටික දුරක් කඳු මුදුනෙන් පහළට පැමිණ නැවතුණු ඔහු සිද්ධාර්ථ ටිකෙන්ටික නොපෙනී යන තෙක් බලා සිටියේය. නොපෙනී ගිය පසු කඳුළු බර දෑසින් නැවතත් කඳු මුදුනට නැග්ගේය.

රටේ සුප්‍රසිද්ධ ඉතාම සිල්වත් ආචාර්යවරු දෙදෙනෙකුගෙන් ධර්මය ඉගෙනීමට හැකිවීම ගැන සිද්ධාර්ථ සතුටට පත් විය. නමුත් සිද්ධාර්ථ සිතු ඉපදීම හා මරණය පිළිබඳ ප්‍රශ්නය තවමත් සිත තුළ රැවු දෙමින් තිබිණි. මේ සඳහා පිළිතුරු දීමට සමත් කිසිම ආචාර්යවරයෙක් රටේ නැතැයි සිද්ධාර්ථට සිතිණ. මේ කරුණ සිතට ගත් සිද්ධාර්ථ තමාම මේ මාර්ගය සොයා ගත යුතුයැයි සිතට ගෙන තනිව භාවනා කරන්නට පටන් ගත්තේය.

පෙර දිග ප්‍රදේශයේ මඩ වගුරු, කුඹුරු, ලියැදි, ජලධාරා පසු කරමින් සිද්ධාර්ථ නේරංජනා නදීය සමීපයට ළඟා විය. නේරංජනා නදියෙන් එතෙර වී දුංගේස්වරී කඳු වැටි වනාන්නතරයට සිද්ධාර්ථ ගමන් කළේය. දුංගේස්වරී පර්වතයේ සිට දවස් බාගයක් පමණ ගමන් කර උරුවේලාවට ළඟා විය. තමන් සොයන දුකින් මිදෙන මාර්ගය අවබෝධ වන තෙක් උරුවේලාවෙහිම තපස් රැකිය යුතු යැයි සිද්ධාර්ථ තීරණය කළේ ය. ඒ සඳහා සුදුසු ගල් ගුහාවක් ද ඒ අසලින් ලැබිණි. එම ගල් ලෙනට වන් සිද්ධාර්ථ පර්යංකයෙන් වාඩි වී අවුරුදු පහක කාලයක් පුරුදු කරන ලද සියලුම භාවනා නැවත සිහි කරන ලදී. ආරාමවල තපස්වීන් සමඟ සිටින විට ශරීරයට කෂ්ඨ දී නොගැළපෙන පීඩාවන් ශරීරයට කිරීම නොකරන ලෙස ඒ අයට උපදෙස් දුන් අයුරු සිද්ධාර්ථට සිහිපත් විය. දුකින් පිරි සසර තවතවත් දුකට පත් වනවා මිස ඉන් පලක් නොවන බැවිනි. එහෙත් මුක්ති ලාභය සාධනය සඳහා ආත්ම සාධනා සහ විරාග අවස්ථා ප්‍රාප්ත කර ගැනීම සඳහා ශරීරයට කයෝර වද දී තපස් රකිමියි, අධිෂ්ඨාන කර ගත්තේය.

මේ අනුව සිද්ධාර්ථ තාපසතුමා ශරීරයට දුක් දීමේ දුෂ්කර ක්‍රියාව ආරම්භ කළේය. ඝන, ඝෝර, ඇඳිරියේ භයානක මහා වනාන්තරවල ඇවිද්දේය. ඒ ඒ ස්ථානවලට යෑමට සිතීමේ දී පවා මරණ භය ඇතිවන සුළු විය. එවැනි ස්ථානවල රාත්‍රිය ගත කළේය. සිතට කෙතරම් බිය පැමිණිය ද භාවනාවට වාඩි වී නොසෙල් වී සිටියේය. සමහර අවස්ථාවල මුවන් ඔබමොබ ඇවිදිද් දී කොළ පයට පෑගෙන හඬට, රාක්ෂයන් හෙමිහිට තමන් ළඟට එන්නේ යැයි සිතිණි. එහෙත් ඒ කිසි විටක සිද්ධාර්ථ සෙලවුණේ නැත.

ඇතැම් විට මොනරෙක් වියැලුණු අත්තක් කැඩුව විට දැනුණේ සෙමින්සෙමින් පිඹුරෙකු තමන් සමීපයට එන බවයි. සිතට තදින් බිය පැමිණිය ද නොසැලී දැඩි අධිෂ්ඨානයෙන් භාවනාවේම යෙදී සිටියේය. මේ ආකාරයට සියලු භෞතික භය සිතින් දුරුකර ගත්තේය. සිතෙන් බිය දුරුවෙද්දී විඳීමේ දුක ද දුරුකර ගත හැකි වේ යැයි සිතිණි. සමහර අවස්ථාවල තම දිවෙන් බඩ ලෙවීම ද කළේය. එසේ කළේ බිය සහ ආතංක නැති කිරීම පිණිසය. සිරුර දහඩියෙන් තෙමී ගිය ද ඒ කිසිවක් ගණනකට ගත්තේ නැත. සමථ භාවනාවෙන් ද ඇතැම් විට හුස්ම ඉහළපහළ දැමීම නතර කළේය. ඒ අවස්ථාවේ දී දෙකනින් හුස්ම පිට වෙනවා දැනිණි. හිස තුළ මේඝ ගර්ජනා සේ හඬ ඇසෙන්නට විය. ඇතැම් විට පොරවකින් හිස දෙකඩ කරන්නාක් මෙන් ද ඇතැම් විටක හිස යකඩ පටිවලින් බැඳ තද කරන්නාක් මෙන් ද දැනෙන්නට විය. එළුවන් කපන්නෙකු ඉතා තදින් එළු බොකු මිරිකා පුපුරවන්නා සේ, මහ ගින්දරක් මැද තැවෙන බවක් මුළු ශරීරයටම දැනිණි. හඨයෝග නම් වූ විශේෂ දුෂ්කර ක්‍රියා භාවනාවේ දී වේදනාව අනන්ත අප්‍රමාණව දැනෙන්නට විය. තවමත් සිද්ධාර්ථ බලාපොරොත්තු වූ පරමාර්ථය ඉෂ්ඨ වූයේ නැත.

හඨයෝගය මාස හයක් යන තෙක් නොකඩවා කරගෙන ගියේය. මුල්ම මාස හය සිද්ධාර්ථ ගත කළේ තනිවමය. පසුව උද්දකරාම පුත්තගේ ශිෂ්‍යයන් පිරිසක් වන කොණ්ඩඤ්ඤ ඇතුළු පිරිස විසින් සිද්ධාර්ථ සොයා ගන්නා ලදී. තම මිත්‍ර කොණ්ඩඤ්ඤ නැවත මුණ ගැසීම ගැන සිද්ධාර්ථ සතුටට පත් විය. කොණ්ඩඤ්ඤද උද්දකරාම පුත්තගෙන් ඉගෙන ගත යුතු සියලු දේ ඉගෙන අවසන් කර තවත් මිත්‍රයන් සතර දෙනෙකු සමඟ සිද්ධාර්ථ සොයා පැමිණියේය. සිද්ධාර්ථ හමුවීමෙන් පසු ඒ පස්දෙනා ද සිද්ධාර්ථ සමඟ සිටිය යුතු යැයි තීරණය කළහ. සිද්ධාර්ථ ඒ අයගෙන් ඔවුන් ආත්මය පිළිබඳව සෙවීමේ යෙදී සිටින්නේ ඇයි දැයි විමසීය. සියලුම දෙනා තමතමන් සඳහා වෙනවෙන ම ගුහා තෝරා ගත්හ. දිනකට එක් අයෙකු පමණක් පිණ්ඩපාතය සඳහා යාමට කතිකා කරගත්හ. එක් අයෙකු රැගෙන එන පිණ්ඩපාතය සියලු දෙනාම බෙදා ගෙන අනුභව කළහ. හැම කෙනෙකුටම ලැබුණේ අත මිට මොලවන තරම් සුළු කෑම ප්‍රමාණයක් පමණි.

මේ අනුව දින සති මාස ගත වී ගියේය. තාපසයන් සතර දෙනාගේම සිරුරු ඉතාම දුර්වල වී ගියේය. සියලු දෙනාම දුංගේස්වරිය අතහැර උරුවේලාවට ගොස් නේරංජනා නදී තීරයෙහි භාවනා කරන්නට පටන් ගත්හ. සිද්ධාර්ථගේ දුෂ්කරක්‍රියා දුටු සෙසු තවුසෝ මේ තරම් දුක්ඛදායක දුෂ්කරක්‍රියා තමන්ට කිසිසේත් කළ නොහැකි යැයි සිතූහ. සිද්ධාර්ථ නේරංජනා නදියෙහි ස්නානය කිරීමත් භෝජන ගැනීමත් නතර කළේය. ඇතැම් දිනවල ගස්වලින් තමන් සමීපයට වැටෙන ගෙඩි හෝ කොළ වර්ග හෝ පමණක් ආහාර පිණිස ගත්තේය. මේ නිසා සිද්ධාර්ථගේ සිරුර අතිශයින් ම දුර්වල විය. සිරුරෙහි ඇට පමණක් ඇති බව පෙනෙන්නට විය. මාස කිහිපයකින් කෙස් කැපීමක් හෝ රැවුල බෑමක් හෝ කළේ නැත. සමහර අවස්ථාවල හිස අතගෑ විට කෙස් ගැලවී අතට ආවේය. සමේ ශක්තිය සම්පූර්ණයෙන්ම නැති වී ගියේය. හිසකෙස් සමේ රඳවා ගැනීමට තරම් ශක්තියක් නොවීය.

දිනක් නේරංජනා නදී තීරයේ සුසාන භූමියෙහි භාවනා කරන විට සිද්ධාර්ථට මේ කරන දුෂ්කරක්‍රියාව තමන්ව රවටා ගැනීමක් පමණක් යැයි අවබෝධ විය. හිරු බැස යමින් තිබිණි. තරමක සීතල සුළඟ ශරීරයට සැනසීමක් ගෙන දුන්නේය. සිද්ධාර්ථගේ සිතට දහවල් දවසේ නොදැනුණු සතුටක් දැනිණ. ශරීරය සහ සිත එකිනෙකට සම්බන්ධ බව ඔහුගේ සිතට දැනිණි. එය වෙන් කර දැකීම අපහසු බව ඔහුට වැටහී ගියේය. ශරීරය සමඟ අන්‍යය හෙවත් සිරුරට අනවශ්‍ය ලෙස පීඩා කිරීමත් සිත සමඟ අන්‍ය දේ කිරීමත් සමාන බව ඔහුට දැනිණ.

වයස අවුරුදු නමයේ දී සී සෑමේ උත්සවය දින මාදන් ගස යට භාවනා කරද්දි තම සිතට ආ හැඟීම් ද ඡන්න තමන්ගෙන් වෙන් වී යන විට ඇති වූ හැඟීම් ද සිද්ධාර්ථට සිහිපත් විය. ආලාරකාලාමගේ අසපුවේ දී මුල්ම කාලයේ දී භාවනා කරන අවස්ථාවේ දී ඇති වූ සමාධි සිත ගැන ද සිහිපත් විය. එමඟින් සිත දියුණු වූ ආකාරයත් එමඟින් ඉදිරියට සිත එකඟ කර ගැනීමට ලැබුණු උපකාරයත් ගැන ද සිතා සතුටු විය.

එසේම තම ශරීර සෞඛ්‍ය ගැන ද කල්පනාකාරී විය යුතු යැයි සිද්ධාර්ථ සිතීය. භාවනා මාර්ගයෙන් සිත සහ කය යන දෙකම ප්‍රවේසම් කර ගත යුතු බව ද සිතීය. ඊට පසු දින සිට

පිණ්ඩපාතය සඳහා යාම ආරම්භ කළේය. තමන්ගේ ගුරුවරයා තමන්ම වීම සුදුසු බවත් තවත් කෙනෙකුගේ ධර්මය ඉගෙනීම අවශ්‍ය නැති බවත් සිතුවේ ය. වලාවන්ගෙන් තොර පැහැදිලි අහසේ පුර පසළොස්වක සඳපානේ සිසිලස ද ශරීරයට ඉතා හොඳින් දැනුණේය. සිද්ධාර්ථ මහ පොළොව මත වැතිරිණි. ඉතා හොඳින් ඔහුට නින්ද ගියේය.

දෙවන දින සිද්ධාර්ථ තාපසතුමා කුරුල්ලන්ගේ කටහඬ අසා අවදි විය. පෙර දින රාත්‍රියේ සිතට ආ සියල්ල නැවත සිහිපත් කළේය. මුළු සිරුරම දූවිල්ලෙන් හා වැලිවලින් අපිරිසිදු වී තිබූ අතර ඇඳ සිටි වස්ත්‍ර ඉරී කැලිකැලිවලට පත්ව තිබිණි. සිරුර වැසීමට තරම් ඒවා ප්‍රමාණවත් නොවීය. දින කිහිපයකට පෙර සුසාන භූමියෙහි දුටු මළ මිනියක් ඔහුට සිහිපත් විය. තව දින දෙක තුනකින් එහි හිමිකරුවන් පැමිණ ගං ඉවුරේ එය ආදාහනය කරනු ඇත. මිනිය ළඟට ගිය සිද්ධාර්ථ එය දුඹුරු පැහැති රෙද්දකින් වසා ඇති අයුරු දුටුවේය. මැරුණු සිරුරකට වස්ත්‍රවලින් පලක් නැත. කරුණා පූර්වක සිතින් මළ සිරුරට අත තැබූ සිද්ධාර්ථ එම වස්ත්‍රය සිවුරක් කර ගැනීම සඳහා අතට ගත්තේ ය. එය තරුණ කාන්තාවකගේ මළ සිරුරක් වූ අතර ඉදිමී දුර්වර්ණ වී ගඳගසන්නට පටන් ගෙන තිබිණි.

නේරංජනා නදිය වෙත ගිය සිද්ධාර්ථ වස්ත්‍රය සෝදා තමන් ද ස්නානය කළේය. නදියේ සීතල දියෙන් ඔහුගේ සිරුර මහත් සුවයක් වින්දේය. බොහෝ වේලාවක් නදියේ ස්නානය කළ පසුව වස්ත්‍රය ද මිරිකා ගත්තේය. එහෙත් ගඟ දියෙන් එතෙර වීමට තරම් ඔහුගේ ශරීර ශක්තිය සමත් නොවීය. ඔහුට ගං ඉවුරට පැමිණීමට නොහැකිව ඉතා වෙහෙසට පත්ව සිටියේය. හෙමිහිට නැගී සිටි සිද්ධාර්ථ ඉතා අපහසුවෙන් හුස්ම ඉහළපහළ හෙළීම කරන්නට විය. එක් පැත්තකින් ගං ඉවුරෙහි වැඩුණු ගසක අත්තක් ගඟ දෙසට නැමී ඇති අයුරු ඔහු දුටුවේය. එම අත්තෙහි කොළ ගං දියෙන් තෙමෙමින් තිබිණි. හෙමින් එදෙසට ගිය සිද්ධාර්ථ එම අත්ත අල්ලාගෙන ගං ඉවුර වෙත අමාරුවෙන් පැමිණියේය.

ටික වේලාවක් විවේක ගැනීම සඳහා ගං ඉවුරේ නතර විය. සූර්යයා ද ක්‍රමයෙන් තම තේජස පතුරවන්නට විය. සේදූ රෙද්ද අවුවේ මද වේලාවක් දමා වෙලා ගත් සිද්ධාර්ථ එය පොරවාගෙන උරුවේලාව දෙසට ගියේය. ගමනේ මද දුරක් ගිය

විට සිරුර තවතවත් මහත් වෙහෙසට පත් වී හුස්ම ගැනීම අපහසුව ගියේය. සිද්ධාර්ථ සිහි සුන්ව පොළොව මත ඇද වැටිණි.

ටික වේලාවක් සිහිය නැතිව වැතිරී සිටියේය. මේ අතර ගමෙහි එක් ගැහැනු ළමයෙක් ඒ අසලින් ගියාය. අවුරුදු දහ තුනක් පමණ වයස ඇති මේ දැරිය අත ඇගේ මව විසින් කිරිබත් රොටී ආදිය වන දේවතාවා සඳහා පූජා කිරීම පිණිස එවා තිබිණි. මඟ වැටී සිටි තාපසයා ඉතා අපහසුවෙන් හුස්ම ගන්නා අයුරු ඇය දුටුවාය. ඇය හෙමිහිට ඔහු ළඟට ගොස් තම අත තිබූ කිරි ටිකක් දෙතොල් මත ගෑවාය. දුෂ්කර ව්‍රත දරන තාපසයෙකු කෑම නොගැනීම නිසා ඇද වැටී ඇති බවට ඈ අනුමාන කළාය. කිරි උගුරට ගිය විට සිද්ධාර්ථගේ සිරුරට ශක්තියක හැඟීම් මාත්‍රයක් පමණක් ඇති විය. ඉන් පසු සුජාතා නම් වූ ඒ ගැහැනු ළමයා තම සෙම්බුවෙහි වූ කිරි සියල්ලම සිද්ධාර්ථට පෙවීය. විනාඩි කිහිපයකට පසුව සිද්ධාර්ථ නැගිට සිට ගත්තේය. ශරීරයට ශක්තිය ලැබීමෙන් පසු දුෂ්කර ක්‍රියා වැනි නිෂ්ඵල ක්‍රියා අත් හැරිය යුතු යැයි ඔහු තීරණය කළේය.

එයින් පසු දින සිට තරමක් ආහාර ගැනීම ආරම්භ කළේ ය. සමහර අවස්ථාවල සුජාතා සිද්ධාර්ථ තාපසතුමාට දානය ගෙනා අතර බොහෝ දිනවල එතුමා පිණ්ඩපාතය කළේය. බොහෝ විට නේරංජනා නදී තීරයේ සක්මන් කරමින් භාවනා කළ අතර සමහර අවස්ථාවල පද්මාසනයෙන් හිඳ භාවනා කළේය. සෑම දිනකම සන්ධ්‍යා සමයෙහි නේරංජනා නදියෙන් දිය නෑම සිද්ධ කළේය. පාරම්පරික වේදාන්ත ආදිය අනුගමනය කිරීම අතහැර නිදහස් මාර්ගයක් ගැන සිතීය. තමන් යන ගමනෙහි ජය පරාජය දෙකින් පාඩම් උගත්තේය. භාවනාවෙන් සිත සහ ශරීරය පෝෂණය වූයේ නම් සිද්ධාර්ථ එපමණකින් සතුටු වූයේය. සතුට සිතට දැනෙන්නට ගත්තේය. සිතට ඇතිවන විචාර එනයන ආකාරය ගැන විමසිල්ලෙන් සිටියේය. එක්එක් හුස්ම ගැනීමකින් එය නියම ආකාරයට හැසිරවුව හොත් තමන් සොයන සත්‍ය මාර්ගය සොයා ගැනීමට එයම සෑහෙන බව අවබෝධ විය.

තමන්ගේ සිතට එන එකඑක හැඟීම් ගැන සිද්ධාර්ථ සිතන්නට ගත්තේය. සිද්ධාර්ථට ආත්මය කියා කිසිවක් නැති බවත් සියල්ලම අනාත්ම බවත් දැනිණි. අලුත්අලුත් අදහස් ගලා එන්නට පටන් ගත්තේය.

මේ අතර මිත්‍රයන් පස් දෙනා සිද්ධාර්ථ ගැන සැක පහළ කරන්නට විය. ඒ අය සිද්ධාර්ථ නේරංජනා නදී ඉවුරේ වාඩි වී සිටින ආකාරයත් ශරීරයට දුක් දීම නතර කර කෑම ගන්නා ආකාරයත් දුටුවෝය. ඒ අතර එක් තරුණියක සමඟ ද නිතර හමුවී කතා කරන අයුරු ද ගමෙහි පිණ්ඩපාත කරන බව ද ඔවුහු දුටුවෝය. යහළුවන් සියලු දෙනාම එකතු වී සිද්ධාර්ථ දැන් විශ්වාස තැබිය හැකි කෙනෙකු නොවේ යැයි සාකච්ඡා කළාහ. ''සිද්ධාර්ථ දැන් ඔහුගේ ශරීරය ගැන පමණයි සිතන්නේ. දැන් ඔහු ළඟ සිටීමෙන් පළක් නොවන බැවින් අපි වෙන තැනක් සොයාගෙන යමු,'' යැයි ඔවුහු තීරණය කළහ.

මිත්‍රයන් පස් දෙනා තමන් අතහැර යාම නිසා සිද්ධාර්ථගේ සිත ඒ දෙසට ගියේය. ඔහුගේ සිතට අලුත් ධාර්මික හැඟීම් ගලන්නට පටන් ගත්තේය. ඔහු දිගින්දිගටම භාවනා කළේය. අලුත් හැඟීම තම මිත්‍රයන්ට විස්තර කිරීමට වේලාවක් ලැබුණේ නැත. ඒ පිළිබඳ විස්තර කර ඒ අය තමන්ගේ අදහස්වලට එකඟ කර ගැනීමට උත්සහ ගත්තේ ද නැත. ''දුකින් මිදෙන මඟ අවබෝධ කර ගැනීමට මගේ සම්පූර්ණ ශක්තිය යොදන්න ඕනෑ. ඒ මඟ සොයාගත් පසු ඒ අයට ඒ බව දැන් වීම සුදුසු යැයි,'' ඔහු සිතීය.

ස්වස්ති, සිද්ධාර්ථට පුරුදු පරිදි වාඩි වී භාවනා කරන්නට කුස තණ මිටක් දුන්නේය. සිද්ධාර්ථ ඉතාම ආදරයෙන් එය පිළි ගත්තේය. නමුත් සුජාතා ස්වස්ති සහ අනෙක් පිරිස තවමත් සුදුසු වයසට පත් නොවී සිටියේය. එහෙත් සිද්ධාර්ථ තමන්ගේ අලුත් අත්දැකීම් කිහිපයක් ගැන ඒ අයට විස්තර කළේය. සිද්ධාර්ථ විස්තර කළ අලුත් අත්දැකීම් ඒ අය කෙතරම් හොඳින් අසා සිට සිතට ගත්තේ දැයි ඔහුට වැටහී ගියේය.

සිද්ධාර්ථට තම සිතට අලුත් යමක් ඇතුළු වීමට වෙහෙස දරන බව දැනෙන්නට විය. අනාත්මය පිළිබඳ කරුණු අවබෝධ වීමෙන් පසුව ඒ හැඟීම් ඈත් වීමට පටන් ගත්තේය.

## දහසය වැනි පරිච්ඡේදය

# යශෝදරා නින්දේ සිටියා ද?

දුප්පත් පවුලක ඉපදුණු ස්වස්ති කවර දාකවත් පාසලකට ගියේ නැත. සුජාතා කතාවෙන් බහෙන් ස්වස්තිට පාඩම් කියා දුන්නාය. එහෙත් තවමත් අවශ්‍ය ශබ්ද කෝෂය සූදානම් කිරීමට අපොහොසත් විය. බුදුරදුන් ගැන කතා කරද්දී ඔහු සමහර වචන තලු මරන්නට විය. හේතුව අවශ්‍ය කරන කරුණු ප්‍රකාශ කිරීමට උවමනා වචන සුදුසු අවස්ථාවේ දී සුදුසු තැනට යෙදීමට ස්වස්තිට හැකියාවක් නොතිබීමයි.

රාහුල මහා ප්‍රජාපතී ගෝතමිය ස්වස්තිට හඳුන්වා දුන්නේ ය. ස්වස්ති පුදුමයට පත් විය. මහා ප්‍රජාපතී ගෝතමිය සිද්ධාර්ථගේ මවගේ නැඟනිය වූ අතර සිද්ධාර්ථට කවා පොවා ඇති දැඩි කළ කාන්තාවය. භික්ෂුණී සමාජයට ඇතුළත් වූ පළමු කාන්තාව වූයේ ද ඇයයි. දැන් ඇය හත් සියයකට අධික භික්ෂුණීන්ගේ ප්‍රධානත්වය දරන්නීය. ඇය බුදුන් හමු වීම සඳහා උතුරේ සිට මේ ප්‍රදේශය දක්වා පැමිණියාය. ඇය මෙහි පැමිණ ඇත්තේ ඊයේ සවස බව සිද්ධාර්ථගේ පුත්‍ර රාහුල දැන සිටියේය. බුදුන් තමන්ගේ අත්දැකීම් තමන් විසින්ම ස්වස්තිට කියා තිබීම ගැන ඔහු මහත් සතුටට පත්

වී සිටියේය. ස්වස්ති දෑත් එකතු කර මහා ප්‍රජාපතී ගෝතමියට නමස්කාර කළේය. මහා ප්‍රජාපතී ගෝතමිය ඔහු දෙස ඉතා කරුණාවෙන් බැලුවාය. රාහුල, අස්සජී ද ස්වස්ති හඳුන්වා දුන්නේ ය. අස්සජී සිද්ධාර්ථ සමඟ දුෂ්කර ව්‍රත සමාදන්ව භාවනා කරන ලද්දේ ස්වස්තිගේ නිවස සමීපයේ බව අසා ඔහු සතුටු විය. සිද්ධාර්ථ දුෂ්කර ක්‍රියාවෙන් පසුව ආහාර ගැනීම ආරම්භ කළ නිසා තමන් ඇතුළු පිරිස සිද්ධාර්ථ අතහැර ගිය තොරතුරු ඔහු ස්වස්තිට කීවේය. එහෙත් අස්සජී අද බුදුන්ගේ ශිෂ්‍යයෙකු ලෙස සිටින බව දකීමෙන් ස්වස්ති පුදුමයට පත් විය. මේ පිළිබඳව පසුව රාහුල සමඟ කතා කර දැන ගන්නෙමියි ඔහු සිතීය.

තමන්ගේ කතාව සම්පූර්ණ කර ගැනීමට ස්වස්තිට මහා ප්‍රජාපතීගෙන් උදවු ලැබිණි. විස්තර කිරීමට එතරම් වැදගත් නො වන දේ ස්වස්ති අතහැර දැම්මේය. ඇතැම් අවස්ථාවල මහා ප්‍රජාපතී ගෝතමිය ද විස්තර දැන ගැනීම සඳහා ඔහුගෙන් ප්‍රශ්න ඇසීය. සිද්ධාර්ථ තපස් රකින කාලයේ කොපමණ දවසක් කුස තණ ගෙනැවිත් දුන්නා ද? ඒ කුස තණ කපා ගත්තේ කුමන තැනකින් ද? සිද්ධාර්ථ තවුසාට කුස තණ දුන් පසු ගවයන්ට දීමට තමන්ට කුසතණ ඉතිරි වුණා ද? කුස තණ අඩු වූ විට නුඹේ ස්වාමියා නුඹට තරවටු කළේ නැද්ද? ආදී විවිධ ප්‍රශ්න ඇය ස්වස්තිගෙන් ඇසුවාය. කතාව බොහෝ දුර ගිය බැවින් ''ඉතිරිය පසුව කතා කරමු,'' යැයි සමු ගැනීමට ස්වස්ති අවසර ඉල්ලීය. නැවතීමට පෙර තමන්ට ද එක් කරුණක් දැන ගැනීමට අවශ්‍ය යැයි ස්වස්ති කීවේය. ''ඔබ අසන දෙයට පිළිතුරු දීමට මට හැකි වෙතොත් මා ඉතාම සතුටු වෙනවා,'' යි ගෝතමිය කීවාය.

''ගෝතමියනි, සිද්ධාර්ථ කුමරු මාළිගයෙන් පිට වී යන්න සූදානම් වූ මොහොතේ ඇත්තෙන්ම යශෝදරා කුමරිය නිදා සිටියා ද? එසේ ම, ඡන්න සිදුහත් කුමරුගේ රාජ ආභරණ කඩුව ආදිය රැගෙන ගිය විට පිය රජතුමා හා යශෝදරා කීවේ මොනවා ද? සිද්ධාර්ථ අවුරුදු හයක්ම මාළිගාවේ නොසිටි නිසා ඇය මාළිගාවේ කාලය ගත කළේ කෙසේ ද? සිද්ධාර්ථ බුද්ධත්වයට පත් වූ බව මාළිගාවේ අය දැන ගත්තේ කෙසේ ද? බුදුරදුන් කපිලවස්තුවට ගිය පළමු ගමනේ දී උන් වහන්සේ පිළිගැනීමට පළමුවෙන්ම ආයේ කවුද? කපිලවස්තු නගරයට ගිය පසු ඒ පළාතේ සියලුම

දෙනා බොහෝ සතුටට පත් වන්නට ඇති නේද?'' ආදී ප්‍රශ්න රැසක් ස්වස්ති ඇසීය.

ප්‍රජාපතී ගෝතමිය ස්වස්ති දෙස බලා සිනා සී, ''හා! නුඹේ සිතේ ප්‍රශ්න මහා ගොඩක්? මා නුඹේ ප්‍රශ්නවලට කෙටියෙන් පිළිතුරු දෙන්නම්. නුඹේ පළමු ප්‍රශ්නය යශෝදරා නිදා සිටියා ද නැද්ද කියලනේ. මේ ගැන නුඹට දැන ගන්න ඕනෑ නම් ඇත්තෙන් ම යශෝදරාගෙන් දැන ගත යුතුයි. මගෙන් ඇසූ නිසා මා පිළිතුරු දෙන්නම්. එදා ඒ අවස්ථාවේ යශෝදරා නිදා සිටියේ නැහැ. යශෝදරා සිද්ධාර්ථගේ ගමනට අවශ්‍ය රෙදිපිළි සියල්ල සූදානම් කර දුන්නා. සිද්ධාර්ථ සඳහා කන්ථක අසු සූදානම් කිරීමට ඡන්නට කීවේ ද යශෝදරාමයි. මා හිතන්නේ සිද්ධාර්ථ තුළ වෙන්වීමේ දුක ඇති කිරීමට ඇයට අවශ්‍ය වුණේ නැහැ. ස්වස්ති, නුඹ යශෝදරා ගැන දන්නේ නැහැ. රාහුලගේ මව යශෝදරා දැඩි අදහස් ඇති කෙනෙක්. ඇය සිද්ධාර්ථගේ සිතේ තිබූ දැඩි අදහස් දැන ගෙන සිටියා. එහෙත් සිද්ධාර්ථට ඒ බව පෙන්නුවේ නැහැ. නමුත් හදවතින් ඇය සිද්ධාර්ථගේ සෑම කටයුත්තකටම එකඟ වුණා. සිද්ධාර්ථ මාළිගාව අතහැර ගියාට පසුව ඇය කා හට හෝ වැඩියෙන් කිට්ටු වූවා නම්, ඒ මා වෙත පමණයි. පසුදා උදෑසන සිද්ධාර්ථ කුමරු මාළිගාව අතහැර ගිය බව සියලු දෙනාම දැනගත් පසු යශෝදරා හැර සියලු දෙනාම දුකට පත් වුණා. සුද්ධෝදන රජු හොඳටම කෝපයට පත් වී සිටියා. ඉදිරියට හමු වූ සැමගෙන්ම සිද්ධාර්ථගේ ගමන නතර නොකළේ මන්දැයි ඇසුවා. මා යශෝදරා ළඟට ගිය විට දකින්න ලැබුණේ ඇය නිහඬව වාඩි වී සිටින බවයි. සෑම දිශාවකටම අශ්වයින් සහිත පණිවිඩකරුවන් යවා සිද්ධාර්ථ සිටින තැනකින් සොයාගෙන එන ලෙස සුද්ධෝදන රජු දැන් වූවා. දකුණු පෙදෙසට ගිය අයට ඡන්න හිස් කන්ථක අසු රැගෙන එද්දී මුණ ගැසුණා. මේ කරුණ සඳහා ඉදිරියට යන ගමනේ කිසිම තේරුමක් නැතැයි ඡන්න ඔවුනට කියා තිබෙනවා. සිද්ධාර්ථ කුමරු ඔහු සොයන මාර්ගය සොයාගෙන මිස නැවත නොපැමිණෙන දැඩි අධිෂ්ඨානයෙනුයි ගියේ. දැන් කුමරු වෙනත් රාජ්‍යයක ඝන වනාන්තරවල තවුසන් සමඟ ඇති නිසා පසුපස යාම කිසිම පලක් නැති බව ඡන්න කියා තිබුණා.

''ඡන්න රජ මැදුරට පැමිණ පණිවිඩය කීමට පෙර තුන් වරක් නැමී රජතුමාට නමස්කාර කළා. ඉන් පසුව කඩුව, කෙස් වැටිය, රන් ආභරණ ආදිය රජතුමාට දීමට ඉදිරියට ගියා. රජතුමා සමඟ ගෝතමී සහ යශෝදරා ද සිටියා. ඡන්නගේ දුක් බර මුහුණ දුටු රජු මේ සිද්ධිය මේ අයුරින් වූයේ කෙසේදැයි ඇසුවේය. ඡන්න තමා අත ඇති කඩුව, රාජ ආභරණ, කෙස්වැටිය ආදිය යශෝදරා අතට දෙන ලෙස සිද්ධාර්ථ කුමරු කීවා යැයි ද කීය.

''මුළු රජ මැදුරම දුක් අඳුරේ වැසී තිබුණේය. රජතුමා තම සයනාසනය ඇති කාමරය වෙත ගියේය. බොහෝ දින ගණනක් යන තෙක් පිටතට පැමිණියේ නැත. රජතුමා වෙනුවෙන් එතුමාගේ අමාත්‍ය විශ්වමිත්‍ර රාජ්‍ය කටයුතු සොයා බැලුවේය.

අශ්ව ශාලාවට පැමිණි පසු කන්ථක අසු කිසිම දෙයක් කෑවේත් බීවේත් නැතිව දින කිහිපයකට පසුව මිය ගියේය. කන්ථක අසු මිය යාමෙන් පසු ඡන්න යශෝදරා වෙත ගොස් චාරිත්‍ර හා පුද පූජා සහිතව කන්ථකගේ අවසන් කටයුතු සිදු කළ යුතු යැයි ඉල්ලා සිටියා,'' යැයි ගෝතමී භික්ෂුණිය ස්වස්ති සමඟ කීවාය.

සියලු දෙනාටම දෙවන දින තමන්ගේ කුටිවලට එන ලෙස ගෝතමී භික්ෂුණිය දැන්වී ය. ස්වස්ති රාහුල දෙදෙනා භික්ෂුණී ගෝතමී, ආනන්ද සහ අස්සජිට දෑත් එකතු කර නමස්කාර කළහ. ඉන් පසු භික්ෂු සාරිපුත්තගේ කුටියට ගියෝය. තරුණ මිත්‍රයන් දෙදෙනාම කිසිවක් කතා නොකරම ආනාපානසති භාවනාවට වාඩි වූහ. හුස්ම ඉහළ ගැනීමත් පහළ හෙළීමත් පිළිබඳව සිත යොමු කළහ.

## දහ හත් වන පරිච්ඡේදය

# පිප්පලි පත්‍රය

ඇසතු රුක මුල වැඩ හුන් සිද්ධාර්ථ තවුසාණන් මේ දක්වා තමන් සිදු කළ භාවනාවලින් දියුණු කරන ලද චිත්ත ශක්තිය එක තැනකට එක්තැන් කිරීමට උත්සාහ ගත්තේය. ජීවිතයත් මරණයත් අතර පරතරයක් නැතැයි සිද්ධාර්ථට දැනිණි. ශරීරයෙහි කිසිදු අංගයක් ස්ථිර කමක් නැති බව ද ඔහුට වැටහෙන්නට විය. භාවනාවේ ධාරාවන් ක්‍රමයෙන් බිංදුව, බිංදුව එකතු වී මහා ධාරාවක් බවට පත්වෙමින් එන්නට විය. සමහර හැඟුම් සුවදායක වූ අතර ඇතැම් ඒවා දුක්ඛදායක ද මධ්‍යස්ථ ද විය. හැඟීම් කෙසේ කොහොම වූවත් ඒ සියල්ලම අනිත්‍ය බවත් නැසෙන සුළු බවත් ශරීරයේ අංග විනාශ වන්නා සේම අදහසුත් විනාශ වන බව සිදුහත් තවුසාණන්ට වැටහී ගියේය.

ඒ අදහස් සමගම සිදුහත් දැඩි භාවනා ක්‍රම මඟින් සිතත් ශරීරයත් දෙකම එකම ප්‍රවාහයක් මෙන් ඇති වෙමින් නැති වෙමින් පවතින බව ඉපදීම, පැවතීම හා මරණය ද ප්‍රවාහයක් මෙන් ගලා යන ස්වභාවයක් තිබෙන බව දැන ගත්තේය.

ඊට පසු සිද්ධාර්ථ ගෞතම ඉතාම ගැඹුරින් සිතා සිතෙහි ඇති ගැඹුරුම තැන් ගැන අවබෝධ කර ගැනීමට මහන්සි ගත්තේ

ය. භය, කෝපය, තණ්හාව, අහංකාරකම ආදිය සිතෙහි අඥානකම සලකුණු කරන අවස්ථායි.

මේ දක්වා සිද්ධාර්ථ භය, ක්‍රෝධය, ලෝභය ආදී සිතේ අගුණ නැති කිරීම සඳහා වෙහෙස දැරීය. නමුත් ඒවා යටපත් කිරීම හැර වෙනත් කිසිම දෙයක් කිරීමට හැකි වූයේ නැත. මේ සියල්ලටම හේතුව මෝඩකමේ අන්ධකාරය බවත් සූර්යයාගේ උදය සමඟ අන්ධකාරය නැති වන්නා සේ සත්‍යය අවබෝධ කර ගැනීමෙන් සිතෙහි ඇති අඳුරුකම වැඩි කරන මෝඩකම නැති වන බව ද දැනිණි.

සිද්ධාර්ථගේ සිතට මහත් සතුටක් දැනෙන්නට විය. අහසේ ලෙළදෙන කොළ පාට පිප්පලි නුග පත් දෙස බලා සිටිද්දී ඔහුගේ මුහුණ සතුටින් පිරී යන්නට විය. ලෙළදෙන ඇසතු පත් දැක එතුමාට සිතුණේ යම් කිසි වැදගත්ම කටයුත්තක් සඳහා තමන්ට ආමන්ත්‍රණය කරන ආකාරයයි.

ඇසතු නුග පත් දෙස ඉතා ඕනෑකමින් බලා සිටි සිද්ධාර්ථට ඒ තුළ හිරු, තාරකා ආදිය දකින්න ලැබිණි. සූර්ය රශ්මිය නැතිව උෂ්ණත්වය නැතිව කිසිදාක නුග පත්‍ර ජීවත් නොවන බව ඔහුට අවබෝධ විය. ඒවා මේ දක්වා ජීවත් වන්නේ මේ සියල්ලම එකතු වීමේ ශක්තිය නිසා බව සිහි කළේය. එකී නුග කොළවල ජලය ඇති බව ද වළාකුලක් නැතිව වැස්සක් ඇති නොවන බව ද වැස්සක් නැතිව නුග පත්‍ර ජීවත් නොවන බව ද මහ පොළොව, කාලය, ආකාශය, මනස ආදී සියල්ල එකී පත්‍රවල විද්‍යාමාන වන බව ද සිද්ධාර්ථට අවබෝධ විය. මුළු ලෝකයේම ඇති ස්වභාවය එකී නුග වල අන්තර්ගතව තිබුණු බව සිද්ධාර්ථට ක්‍රමයෙන් දැනගන්නට ලැබිණි.

සාමාන්‍ය වශයෙන් පිළිගත් කාරණයක් ලෙස පිප්පලි හෙවත් ඇසතු නුග රුක් වසන්ත ඍතුවෙහි දී දළු ලෑම සිරිතකි. එහෙත් අනන්ත කාලයක සිට සූයර්‍යාලෝකය වලාකුළු ආදිය මේ සියල්ලම තුළ විද්‍යාමානව පැවත ආ බව දකින්නට ලැබිණ.

තමන්ගේ ශරීරය හා නුග පත යන දෙකෙහි වෙනසක් සිඳුහත් දුටුවේ නැත. සූයර්‍ය, වළාකුළු, ජලය ආදිය අනන්ත කාලයක සිට නුග පතෙහි විද්‍යාමානව තිබුණු බවත් දැනටත් පවතින බවත් ඉදිරියට ද ඇති වන බවත් ඔහු දුටුවේය. මේ අනුව පිප්පලි පත කවරදාවත් තනිව ඇති නොවන ස්වභාවයක් ඇති දෙයක් ලෙස

හැඳින ගත්තේය. එය හිරු රශ්මිය, ජලය, වායුව ආදියෙහි සම්මිශ්‍රණයක් මිස කිසිසේත් ඉපදීමක් හෝ විනාශයක් හෝ ඇති දෙයක් හැටියට දුටුවේ නැත. පිප්පලි පත්‍ර හා තමන් ගැන නියම තත්වය අවබෝධ වීම මෙතැන් පටන් ආරම්භ විය. සියල්ල එකක් බවත්, එකක් සියල්ල බවත් යන හැඟීම ද ඇති විය.

ඇසතු ගස ඉහළින් මහා කලු වලාවන් ඇදෙමින් තිබිණි. ඇතැම් විට තව සුළු මොහොතකින් වලාකුළ වර්ෂාවක් බවට පත් වීමට ඉඩ තිබේ. වලාකුළත් වර්ෂාවත් දෙකක් මෙන් පෙනුණ ද එය එකක් මිස දෙකක් නොවේ. වැහි වළාකුලෙහිත් ඉපදීමක් හෝ මරණයක් හෝ සිදු වූයේ නැත.

තම ශරීරය, අදහස්, මනසේ ස්වභාවය, චේතනා, නදී සහ ආලෝකය පිළිබඳ කරුණු සිද්ධාර්ථට අවබෝධ විය. යම්කිසි කෙනෙක් සියලු වස්තුවල අසාර බව තේරුම් ගතහොත් සංකල්ප විකල්ප සියල්ලෙන් එතෙර වී සියලු කරදරවලින් නිදහස් වීමේ මාර්ගයට එළඹිය හැකිය.

එක් රැයක්, දෙකක්, තුනක් සිද්ධාර්ථ ගෞතම ඇසතු රුක මුල වාඩි වී තම ශරීරය, සිත සහ ලෝකය ගැන විවිධ ආකාරයට සිතමින් සිටියේය. සිදුහත්ගේ පළමු මිතුරන් පස් දෙනා මීට ටික දිනකට පෙර තමන් අත්හැර ගිය බව ද වරින්වර සිහියට ආවේ ය. සිදුහත් සමඟ එකට සිටින අය ලෙස දැකීමට ඇත්තේ කැළෑවේ ගස්, නදී, පක්ෂීහු, මහ පොළොව සහ මහ පොළොවේ සිටින දහසක් පුංචි ප්‍රාණීන්ය. සිදුහත් කරන භාවනාවේ දී පිප්පලි නුග රුක තම වැඩි මහළු සහෝදරයා ලෙස දැනෙන්නට විය. සෑම රාත්‍රියකම භාවනාව සඳහා වාඩි වූ විට අහසේ තාරකා දැකීමෙන් සිදුහත් කුමරුට දැනුණේ තාරකා ද තමන් සමඟ භාවනා කරන බවයි.

ගමේ පුංචි ළමයින් දහවල් දවසේ සිද්ධාර්ථ හමු වීමට ඒම සිරිතක්ව තිබිණි. දිනක් සුජාතා කිරිබත් පිසගෙන මී පැණි සමඟ සිදුහත්ට ආහාර පිණිස ගෙන ආ අතර ස්වස්ති ඉතාම පිරිසිදු කුස තණ මිටියක් ගෙනැවිත් දුන්නේය. ස්වස්ති සවස් වේගන යන අවස්ථාවේ දී තම ගව රැළ ආපසු ගෙදර රැගෙන යාමට සූදානම් වෙද්දී සිද්ධාර්ථගේ ඇතුළු සිතට අද රාත්‍රියේ තමන්ට සත්‍ය අවබෝධ කරගැනීමට හැකි වෙතැයි හැඟිණි.

පෙර දින රාත්‍රියේ සිද්ධාර්ථ සිහින කිහිපයක් දුටුවේය. මහ පොළොව තම සයනාසනය ලෙස පාවිච්චි කරන බවත් කොට්ටය ලෙස මහාමේරු පර්වතය පාවිච්චි කරන බවත් පළමුව දුටුවේය. තම වම් අත මහා සාගරය දක්වා ද දකුණු අත මහා කාන්තාරය දක්වා ද විහිදී තිබිණ. දෙපා දකුණු මහා සාගරයේ කෙළවර දක්වා විහිදී තිබිණි.

දෙවන වර කුස තණ වැනි තණ වර්ගයක් තම නාභියෙන් නැගී ආකාශය දක්වා පැතිරී ගිය බවත් අන්තිමේ රථයක රෝදයක් මෙන් විශාල නෙළුම් මලක් එහි පිපී තිබෙණු දුටුවේය.

නැවතත් සිහිනයක් දුටු සිද්ධාර්ථ විවිධ දිශාවලින් විවිධ වර්ණවත් පක්ෂීන් තමන් වෙතට පැමිණෙනු දුටුවේය. මේ සියල්ලෙන් සිදුහත්ට සත්‍ය අවබෝධ කරගැනීමට දූන් කාලය ඉතාම ළඟ යැයි සිතට හැඟෙන්නට හේතු විය.

එදා සවස සිද්ධාර්ථ නේරංජනා නදී ඉවුරෙහි සක්මන් කරමින් සිටියේය. පසුව නදියට බැස ඉතා හොඳින් ස්නානය කළේය. උරුවේලාව අසල ගෝදුලී තලාවේ තිබුණු විශාලම ඇසතු රුක වූ පිප්පලි වෘක්ෂය මුල වාඩි වී භාවනා කරන්නට පටන් ගත්තේය.

ගස මුල පැළ වී තිබුණ තණ තිල් පලස දැක සිද්ධාර්ථ සිනහ පහළ කළේය. මීට පෙර මේ වෘක්ෂය මුල වාඩි වී කරන ලද භාවනාවලින් සිතට අලුත් ආකාරයේ හැඟීම් රාශියක් ඇති වූ බව ඔහුට සිහිපත් විය.

සසර කුමක් සඳහා මෙතරම් දුර ආවේ යන්න සිහිපත් කරමින් ජීවිතයේ බලාපොරොත්තු වූ පරම සත්‍යය අවබෝධ කර ගැනීමට තමන් ඉතාම ආසන්නයේ සිටින බව හැඟී ගියේය.

අනතුරුව සිද්ධාර්ථ පද්මාසනයෙන් වාඩි වී ඉතාම දුරක් දක්වා ශාන්තව ගලන නදිය දිහා දෙනෙත් යොමු කළේය. සීතල මන්ද මාරුතයෙන් කුස තණ ලෙළදෙන්නට පටන් ගත්තේය. පළගැටියෝ ද හෙමිහිට දස දෙසින් තණ පඳුරු අතරින් එළියට එන්නට වූහ. අහසේ තරු ක්‍රමයෙන් දිළෙන්නට පටන් ගත්තේය. පද්මාසනයෙන් වාඩි වූ සිදුහත් තවුසාණන්ගේ දෑස අඩවන් වී ගියේය.

## දහ අට වන පරිච්ඡේදය

# උදා තරුව නැඟී තිබේ

සිත අවදි වීම නිසා සිද්ධාර්ථගේ සිතුවිලි ශරීරය සහ හුස්ම ගැනීම යන සියල්ල ඒකාකාර විය. සමාධිය වැඩීම නිසා කුසල සිත තවතවත් ශක්තිමත් විය.

ජීවීන්, ඛනිජ වස්තු, තණ කොළ, ගස් වැල් ආදී සියල්ලගේ ම එකතු වීමක් ලෙස තම ශරීරය දුටුවේය. මිය ගිය ජීවීන් ද ඉපදීමට සිටින ජීවීන් ද සිද්ධාර්ථ තම නුවණින් දකින්නට විය. දහස් ගණන් ග්‍රහ ලෝකවල ඇතිවීම ද නැති වීම ද දුටුවේය. ජීවීන් අලුත් ජීවිත ඇති කර ගන්නා ආකාරයත් තමන්ගේ අතීත ජීවිතවල ආකාරයත් කුමක් ද කියාත් ඉතාම හොඳින් දැන ගත්තේ ය.

සිද්ධාර්ථ ඉතාම තදින් සමාධිය තවතවත් වැඩූ විට දකින්නට ලැබුණේ ගණන් කිරීමට අපහසු තරම් ලෝකවල ඇති වීම් සහ නැති වීමයි. ගිණිය නොහැකි තරම් ප්‍රාණීන්ගේ ඇති වීම හා නැති වීම ද කෙළවරක් නැතිව දුටුවේය. ඉපදීම මරණය යන දෙක නිමිති මාත්‍රයක් පමණි. එයම සත්‍ය නොව. එය සමුද්‍රයේ රළ පෙරළීම හා සමානව ඇති වීම හා නැති වීම ගැන සංකේතයක් පමණි. සමුද්‍රයේ ඉපදීමක් හෝ මරණයක් හෝ නැත.

ඒ සමඟම මහා ගර්ජනා හඬ සතර අතින් ඇසෙන්නට පටන් ගත්තේය. ආකාශය දෙකට කැඩී බිඳී යැමක් මෙන් එය මහත් සේ හඬනැඟීය. කළුමකළු වලාකුළුවලින් සඳ සහ තාරකා සියල්ල වැසී ගියේය. තද වර්ෂාවක් ඇති වීමේ සියලුම ලකුණු පහළ විය.

සිද්ධාර්ථ මේ කිසිවක් සැලකුවේ වත් ගණනකට ගත්තේ වත් නැත. තමන් යන ගමන දිගටම යාම සඳහා තද අධිෂ්ඨානයකින් ඇසතු වෘක්ෂය මුල නිසලව සිටියේය. ඔහුගේ සමාධියට මේ කිසිවකින් කිසිදු බාධාවක් නොවීය. සිතෙහි සමාධිය තවත් වැඩෙන විට සියලුම ප්‍රාණීන් අඥානකම නිසා දුක් විඳින බව සිද්ධාර්ථට අවබෝධ වන්නට විය. ලෝභ, ක්‍රෝධ, අහංකාර, භ්‍රම දෝෂ සහ භය යන නරක සිතුවිලි මෝඩකම තවත් දියුණු කරන අකුසල් සිත් බව අවබෝධ කර ගත්තේය. යම්කිසි සමාධියකින් සිත ශාන්ත කර සත්‍යය අවබෝධ කර ගත හොත් ඥානය ලැබීම යනු එයයි. එයින් සියලු ප්‍රාණීන්ට ප්‍රේම කිරීම ද ආරම්භ වේ.

ඉන් පසු තමන්ගේකම හා ප්‍රේමය යනු එකක්ම බව සිද්ධාර්ථට අවබෝධ විය. තමන්ගේකම අතහැරිය හෙවත් ප්‍රේමය ඉතිරි නොවන බව දැනිණි. සියලුම ප්‍රාණීන්ගේ ස්වභාවය එකී සමාජය අනුව නිර්මිතවීම ස්වාභාවිකය. මේ තත්වය අවබෝධ කර ගැනීමෙන් පසුව සමාජයේ නරක ආකාරයට ව්‍යවහාර කරන අයට ද මෛත්‍රී කිරීම ස්වාභාවික වේ. තමන්ගේකම නිසා කරුණා මෛත්‍රී ආදී උතුම් ගුණාංග ඇතිවීම ද ස්වාභාවිකය. මේ නිසා පුද්ගලයා සත් ක්‍රියාවලට නැඹුරු වීම සිරිතකි. ප්‍රේම කිරීමට සම්පූර්ණ සත්‍ය අවබෝධවීම ද අනිවාර්‍යය සිද්ධියකි. බ්‍රම හෙවත් චංචල රහිත ඥානය සඳහා ව්‍යක්ති නිතර සිහියෙන් යුක්තව සිටිය යුතුය. මේ මොහොතේ තමන් ජීවත් වන ආකාරය ඊට තවත් උපකාර වෙයි. ඒ සමඟම මිනිසාගේ ඇතුළත සහ පිටත සිදුවන දේ ගැන සම්පර්කයක් ඇති වේ. සිහි නුවණින් කටයුතු කිරීමේ දී එකී පුද්ගලයාට යමක් ගැඹුරට සිතීමේ ශක්තිය ලැබේ. ශුද්ධ ඥානය, ශුද්ධ විචාරය, ශුද්ධ වචන, පිරිසිදුකම, ශුද්ධ ආචාරණය, සත්‍ය උත්සාහය, සත්‍ය පිබිදීම, සිත සමාධිගත කිරීම ආදිය සිද්ධාර්ථ ආර්ය මාර්ගය ලෙස හැඳින ගත්තේය.

වැඩූ සමාධියේ ශක්තියෙන් සියලුම ප්‍රාණීන්ගේ සිත් ඔහු දැන ගත්තේය. එම සත්වයන් කොපමණ දුරක සිටිය ද සිද්ධාර්ථගේ දියුණු සමාධි සිතට එය ගැටලුවක් වූයේ නැත. දිව්‍ය චක්ඛු, දිව්‍ය සෝත ආදී ඥාන එකින් එක ඇති වූයේය. මෙය සම්බෝධියේ තුන්වන අවස්ථාව විය. ක්‍රමයෙන් සඳ කළු වලාකුළුවලින් ඈත් වී තාරකා ද ඉතාම පැහැදිලිව පෙනෙන්නට විය.

දහස් වරක් ඉපදීම නැමති සිර ගෙදරින් තමන් නිදහස් වූ බව සිද්ධාර්ථට අවබෝධ විය. මෙතෙක් කල් සසර සැරි සැරූ සිර ගෙදර මුරකරුවා මෝඩකමයි. මෝඩ සිත නිසා මනස නිතරම චංචලව තිබිණි. මහා අඳුරු කළු වලාකුළින් සඳ සහ තාරකා වැසී යන්නා සේ නිර්මල සිත මෝඩකම නැමති ඝන අඳුරෙන් වැසී තිබිණි. මෝඩකම නිසා ශුද්ධ විචාර යටපත් වී සත්‍ය, කත්‍ය, කර්ම, ඉපදීම හා මරණය යන කරුණු අවබෝධ කරගැනීම අසීරු විය. ඉපදීම, වියපත් වීම, රෝගී වීම සහ මරණය සසර දික් කිරීමට මහත් සේ උපකාරී විය. මෙවැනි අවස්ථාවක සසර නැමති ගෙය හදන වඩුවා දැකීමම ඉන් මිදීමට ඇති එකම මාර්ගය විය. එම මාර්ගය ආර්‍ය අෂ්ඨාංගික මාර්ගය පමණක් බව සිද්ධාර්ථට මනාව පසක් විය. ආර්ය අෂ්ඨාංගික මාර්ගයෙන් තොර සසරින් මිදීමක් නැත. සිද්ධාර්ථ ගෞතම සිනාසී, ''සංසාර නැමති ගෙය සාදන වඩුව, මා විසින් තොප දකින ලදී. සංසාරයේ කොපමණ යෝනි ගණනක නුඹ ඉපදීම හා මරණය අතර මා සිර කරගෙන සිටියා ද? නමුත් දැන් මා නුඹගේ නියම ස්වරූපය දැන ගතිමි. අදින් පසු නුඹ මා වෙනුවෙන් ගෙවල් සෑදීම කරන්නේ නැත. ගෙයි කැණි මඬල සම්පූර්ණයෙන්ම විනාශ කරන ලදී,'' යි උදන් ඇනුවෝය.

දෑස විවර කළ සිද්ධාර්ථට දකින්න ලැබුණේ ඈත අහස අඳුරු කරමින් සඳු සහ තරු අතුරුදහන් වන ආකාරයයි. තමන් මෙතරම් කලක් භවයෙන් භවය ඇවිදිමින් සෙවූ සසර ගමන නතර කරන බුද්ධත්වය අවබෝධ වූ බව සිද්ධාර්ථට දැනිණි. ඒ සමඟම සිතට මේ දක්වා නොලැබුණු මහත් ශාන්තියක සුවය ද දැනිණි. සසර ගමනේ දී ඇති වූ ආශා හා නිරාශා දෙක ගැන ද ඔහු සිතන්නට පටන් ගත්තේය. තම පියාණන්, ආදරණීය මැණියන්,

යශෝදරා, සුළු මව, රාහුල සහ තම මිත්‍ර පිරිස ද කපිලවස්තුව හා එහි ජනයා ද සිහිපත් විය.

ළා තණ පත්වල අග පිණි බිඳු පිරී තිබිණි. සුන්දර උදෑසන සමන් පිච්ච පිපෙමින් සුවඳ දසත පුරා පතුරවමින් තිබිණි. වේලාව ළඟා විය. තිබූ සියලුම වේදනා නැති වී ගියේය. සියල්ල අලුත්ම අලුත් නැවුම් සුවඳකින් යුක්ත විය. නිල් අහසේ පාවෙමින් තිබූ සුදු වළා කුළු පෙළ ද පුදුම තරම් අසිරිමත් සිරියකට සුභ පතන්නා සේ දැනිණි. මුළු ලෝකයම තමන් වෙනුවෙන් අලුතින් නිර්මාණය වූ බව සිදුහත්ට දැනෙන්නට පටන් ගත්තේය.

මේ සමඟම ස්වස්ති එතනට ළඟා විය. ස්වස්ති තමා වෙත දිව එන බව දුටු සිද්ධාර්ථ සිනහසිණි. ටික දුරකට විත් ස්වස්ති සිද්ධාර්ථ දැක මඟ නතර විය. ඔහුගේ මුව විවර විය. සිද්ධාර්ථ ඔහුට කතා කළේ ය. ''ස්වස්ති,'' ඒ ඇසූ ස්වස්ති ''ගුරු දේවයාණනි,'' යි පිළිතුරු දුන්නේය. ඔහු දෑත් එකතු කර නමස්කාර කළේය. ටික දුරක් ඉදිරියට පැමිණි ඔහු නැවතත් නතර විය. ඔහු විමතියෙන් යුතුව යළිත් සිද්ධාර්ථ දෙස බලා සිට ''ගුරු දේවයාණනි, ඔබ අද පෙරට වඩා බොහෝ වෙනස්,'' යැයි කීය. සිද්ධාර්ථ ස්වස්තිට ළඟට එන්නැයි කතා කළේය. විමතියෙන් යුතුව ළඟට පැමිණි ස්වස්තිගේ අතින් අල්ලාගත් සිද්ධාර්ථ, ''ඔබට මොන වගේ වෙනසක් ද අද මගේ පෙනෙන්නේ,'' යැයි ඇසීය.

සිද්ධාර්ථ දෙස ඇසිපිය නොහෙළා බලා සිටිමින් ස්වස්ති පිළිතුරු දුන්නේය. ''මට හරියටම කියන්න බැහැ. ඔබගේ ලොකු වෙනසක් ඇති බව විතරයි කිව හැක්කේ. හරියට ඔබ තරුවක් වෙලා වගෙයි."

සිද්ධාර්ථ ස්වස්තිගේ හිස පිරිමදිමින් ''වෙන කොයි වගේ වෙනස්කම් ද නුඹට මගේ පෙනෙන්නේ,'' යි ඇසීය.

''ඔබව පෙනෙන්නේ මේ දැන් පිපුණු නෙළුම් මලක් වගෙයි. හරියට ඔබ ගයා ශීර්ෂ කඳු වැටිය මුදුනෙන් සඳ නැඟෙනවා වගෙයි."

බුදුන් ස්වස්තිගේ, දෑස් දෙස බලා සිනා සී, ''ආ! ස්වස්ති ඇයි නුඹ කවියෙක් වුණා ද?'' යි ඇසීය. "කමක් නැහැ, දැන් කියන්න නුඹ අද මෙතරම් උදයෙන් ඇයි මෙහි ආවේ. කෝ නුඹේ ගව රංචුව?"

ගව රංචුව සී සෑම සඳහා පිටත් කර යැවූ බැවින් අද නිවාඩු ලැබුණු බව ස්වස්ති කීවේය. එක් ගවයෙක් පමණක් තණ කෑම සඳහා ගං ඉවුරේ අත හැර ආ බවත් ඒ ගවයා සඳහා පමණක් අද තණ කපාගෙන යාම සෑහෙන බවත් ඔහු කීවේය.

ඊයේ රාත්‍රියේ ඇති වූ මහා සුළඟ නිසා සියලු දෙනා නිදි වැරූ බවත් වහල පරණ වී ගෙතුළට වතුර ආ නිසා සියලු රෙදි පිළි තෙත් වූ නිසාත් මුළු රාත්‍රියම ඉතා අපහසුවෙන් උන් බවත් ඊටත් වැඩියෙන් සිද්ධාර්ථට මේ මහා සුළි සුළඟ ඉවසාගෙන මොන ආකාරයෙන් ඉන්නවා ද යන්නත් කියන කරුණු තමන්ගේ සිතට නිතර කරදර කළ නිසා මුළු රාත්‍රියම නිදි නැතිව සිටි බවත් ස්වස්ති කීවේය.

බුදුන් ස්වස්තගේ අතින් අල්ලාගෙන, ''ස්වස්ති, මගේ ජීවතයේ මා දන්නා ප්‍රීතිමත්ම දිනය අදයි. ඔබට හැකි නම් සියලුම ළමයින් අද දහවල් පිප්පලි ගස මුලට කැඳවාගෙන එන්න. ඔබේ සහෝදරයාත් සහෝදරියනුත් කැඳවාගෙන ඒමට අමතක කරන්න එපා. නමුත් පළමුවෙන්ම ඔබගේ ගවයන්ට අවශ්‍ය කුස තණ ටික කපාගෙන ඉන්න.''

ස්වස්ති ඉතාම සතුටින් පිටවී ගියේය. සිද්ධාර්ථ උදෑසන සූර්ය කිරණින් නැහැවෙමින් නේරංජනා නදී ඉවුරේ සක්මන් කරන්නට පටන් ගත්තේය.

## දහ නව වන පරිච්ඡේදය

# නාරං රස සිහියෙන් විඳීම

සුජාතා සිද්ධාර්ථට ආහාර රැගෙන ආ විට පිප්පලි වෘක්ෂය යට හිරු කිරණින් දිළිසෙන රන් පිළිමයක් සේ සිද්ධාර්ථ තවුසාණන් වහන්සේ සමාධියෙන් වැඩ සිටිනු දුටුවාය. උන් වහන්සේගේ මුව මඬලින් සහ ශරීරයෙන් ශාන්ත බව, සතුට සහ සෞම්‍ය බව විහිදෙන ආකාරය ඇය දුටුවාය.

සිද්ධාර්ථ මේ වෘක්ෂය මුල වාඩි වී සිටි වාර අප්‍රමාණව සුජාතා දැක තිබිණි. එහෙත් අද උන් වහන්සේ වැඩ සිටින ආකාරය අමුතුම අසිරියකින් යුක්ත බව ඇයට දක්නට ලැබිණි.

සිද්ධාර්ථ දුටු විට අද ඔහු සිටින්නේ සියලුම කාෂ්ඨ වේදනාවලින් මිදී ප්‍රසන්න සිතකින් යැයි සුජාතාට හැඟී ගියේය. වසන්තයේ මන්දහාසයක් මෙන් හදවතට මහත් නැවුම් බවක් දැනිණි. සිද්ධාර්ථට පිප්පලි වෘක්ෂය මුලින් තවත් ලබා ගැනීමට දෙයක් නැතැයි ඇයට හැඟිණි. එමෙන්ම මේ ලෝකයෙන් ද සිද්ධාර්ථට ලැබිය යුතු ඉහළම දේ ලැබී ඇති බව ද සුජාතා සිදුහත්ගේ මුහුණ දැකීමෙන් සිතා ගත්තාය. සුජාතා පියවර කිහිපයක් ඉදිරියට ගොස් සිදුහත් ඉදිරිපිට තමන් ගෙන ආ ආහාර පාන

තැබුවාය. දැත් එකතු කළ ඇය නැමී සිද්ධාර්ථට නමස්කාර කළා ය. පෙර නොවූ මහත් ශාන්තියක් හා සතුටක් සිද්ධාර්ථ වෙතින් ඇයට දැනෙන්නට විය.

සිද්ධාර්ථ ඇය හා සිනාසී, '' ඇවිත් මා සමඟ වාඩිවන්න. මා ඔබට ස්තුති කරනවා පසුගිය මාසය තිස්සේ මට ආහාර හා පැන් ගෙනැවිත් දීම ගැන. අද මගේ ජීවිතයේ ප්‍රීතිමත්ම දිනයයි. මෙතෙක් කල් සෙවූ දුකින් මිදෙන මාවත ඊයේ රාත්‍රියේ මා සොයා ගත්තා. ඔබටත් එය ලොකු සතුටක් වනු ඇති. නොබෝ දිනකින් මා පිටත්ව යනවා ඒ මාවත සෙසු ලෝකයාටත් ඉගැන්වීම සඳහා.''

සුජාතා පුදුමයෙන් සිද්ධාර්ථ දෙස බලා සිට, ''ඔබ යන්න යනවා ද? ඔබ අපව හැර යනවා ද?'' යි ඇසීය.

සිද්ධාර්ථ කරුණාබරව සිනාසුණි. ''ඔව්, මා අනිවාර්යයෙන් යා යුතුයි, නමුත් දරුවනි, මට ඔබලා අත්හරින්න අවශ්‍යකමක් නැහැ. පිටත්ව යාමට පෙර ඔබට පෙන්වන්නම්. මා සොයාගත් මාර්ගය.''

සුජාතාට යමක් කීමට අවශ්‍ය විය. එහෙත් ඊට පෙර සිද්ධාර්ථ කථා කළේය. ''මා ටික දිනක් මේ ස්ථානයේ ඉන්නවා. මා අවබෝධ කරගත් ධර්මය පිළිබඳව නුඹලා සමඟ එකතු වී සාකච්ඡා කරන්න ඕනෑ. ඉන් පස්සේ තමයි මා ඊළඟ මාර්ගයට පය තබන්නේ. කොහොම වුණත් ඉඩ ලැබුණු හැමවිටම නුඹලා සියලු දෙනාව දකින්න එන්න මා උත්සාහ කරනවා.''

ඒ කතාවෙන් පසුව සුජාතාට සතුටක් දැනිණි. ඇය කෙසෙල් කොළය දිග හැර සිද්ධාර්ථට ආහාර පූජා කළාය. සිද්ධාර්ථ ආහාර ගන්නා අතර ඇය නිහඬව ඒ අසල වාඩි වී උන්නාය. සිද්ධාර්ථ කෙසෙල් කොළය දිග හැර බත් පතට තෙල් මිශ්‍ර ලුණු කලවම් කරන ආකාරය බලා සිටියාය. සිද්ධාර්ථ බත් අනන ආකාරය දුටු සුජාතාගේ සිතට මහත් සතුටක් දැනිණි.

ආහාර ගැනීමෙන් පසුව සිද්ධාර්ථ සුජාතාට ගෙදර යන්නැයි කීය. අද සවස වන රොදෙහි දී ගමේ දරුවන් මුණගැසෙන්න අවශ්‍ය බවත් කීවේය.

එදින සවස සියලු ළමයි පිප්පලි වෘක්ෂය මුලට රැස් වූහ. ඒ අතර ස්වස්තිගේ සහෝදරයා සහ සහෝදරියන් ද විය. සහෝදරියන් එදින ඉතා අලංකාර වස්ත්‍රවලින් සැරසී සිටියෝය.

විවිධ වර්ණවලින් යුත් වස්ත්‍ර හැඳ සිටි ළමයි අද පිපුණ මල් මෙන් පෙනෙන්නට විය. සියලු දෙනාම සිද්ධාර්ථ වටා පිප්පලි ගස හෙවනේ වාඩි වූහ.

සුජාතා කුඩයක පොල් සහ හකුරුවලින් සෑදූ විශේෂ කෑමක් සියලු දෙනා සඳහාම සූදානම් කර ගෙනැවිත් තිබිණි. පුංචි ළමයි සියලු දෙනාම සුජාතා ගෙනැවිත් තිබූ රස කැවිලි ඉතාම සතුටින් රස වින්දාහ. නන්දබාලා සහ සුභා කුඩයක් පුරවා නාරං ගෙනවිත් තිබිණි. සිද්ධාර්ථ දරුවන් සමඟ හිඳගෙන සිටියේය, සිද්ධාර්ථගේ සියලු බලාපොරොත්තු හා සතුට සම්පූර්ණ වී ඇත. රූපක පිප්පලි පතක් මත පොල් හකුරු සහ රස කැවිලි කිහිපයක් තබා සිද්ධාර්ථට පිළිගැන්වීය. නන්දබාලා ජමනාරං පිළිගැන් වූවාය. සිද්ධාර්ථ ඔවුන් විසින් පිළිගන්වනු ලැබූ දේ පිළිගෙන ළමයින් සමඟම අනුභව කළේය.

ළමයින් හැමදෙන ම ආහාර රසවිඳිමින් සතුටු වෙමින් සිටිය දී සුජාතා සැමටම ආමන්ත්‍රණය කළාය. ''මා ප්‍රිය මිතුරනි, අද දවස අපේ ගුරු දෙවයන්ගේ ජීවිතයේ ප්‍රීතිමත්ම දිනයයි. එතුමා සියලු සත්වයන් දුකින් මුදවා ගත හැකි උතුම් මාවත සොයාගෙන ඇත. මට හැඟෙනවා මෙය මටත් ඉතාම වැදගත් දිනයක් කියා. සහොදර සහෝදරියනි, අපි හැම දෙනාම මේ විශේෂ දිනය අපි හැමටම උතුම් දිනයක් ලෙස සමරමු. අපි හැම දෙනාම අද මෙතැනට පැමිණ සිටින්නේ අපේ ගුරු දේවයන් සත්‍යය අවබෝධ කර ගැනීම සැමරීම සඳහායි. ගෞරවනීය ගුරුතුමනි, උතුම් මාවත හමු වී ඇත. ඔබතුමාට අප සමඟ සැමදාම සිටිය නොහැකි බව අපි දන්නවා. කරුණාකර අපට තේරුම් ගැනීමට හැකි යයි ඔබ වහන්සේ සිතන දෙයක් අපට කියා දෙන්න.''

සුජාතා තම දෑත් එකතු කර ගෞරවයෙන් යුතුව සිද්ධාර්ථ ගෞතමයන් වහන්සේට නමස්කාර කළාය. නන්දබාලා හා සෙසු දරුවෝ තම දෑත් එකතු කරමින් හදවතේ කෘතඥතාව දක්වමින් වන්දනා කළහ.

සිද්ධාර්ථ නිහඬව ළමයින්ට වාඩි වීමට අතින් සංඥා කළේ ය. පසුව ඔහු ළමයින් ඇමතීය. ''ඔබ සැම දෙනාම ඉතා බුද්ධිමත් දරුවෝයි. මට හොඳින් විශ්වාසයි මා ඔබ සමඟ සාකච්ඡා කරන

දේ තේරුම් ගැනීමටත් පුහුණු කිරීමටත් ඔබට හැකිවන බව. මා අවබෝධ කරගත් ධර්ම මාර්ගය ඉතාම ගැඹුරුයි. එසේම ප්‍රණීතයි. එහෙත් ඕනෑම කෙනෙකු තම හදවතත් මනසත් යොමු කළ හොත් එය අනුගමනය කර අවබෝධ කර ගත හැකියි.''

''දරුවනි, නුඹලා නරං කන විට ඔබට එය සිහියෙන් යුතුව හෝ සිහියෙන් තොරව හෝ කෑමට හැකියි. සිහියෙන් යුතුව නාරං ගෙඩියක් කෑමෙහි තේරුම කුමක් ද? ඔබ නාරං කන විට සිහියෙන් යුතුව කන්නේ නම් එහි නියම රසය ඔබට දැනේවි. ඒ සුවඳ හා රස දැනෙන විට ද ඒ ගැන සිහියෙන් යුතුව අනුභව කරන්න. ඒ පිළිබඳව යම් හැඟීමක් ඇති වුව හොත් ඒ ගැන ද සිහියෙන් යුක්ත වන්න. නන්දබාලා මට දුන් නාරං ගෙඩිය එකින් එක බික් ගලවා අනුභව කළා. අනුභව කළේ ඉතාම හොඳ සිහියෙන්. ඉන් මට සතුටක් ලැබුණා. එහි ඇති අගය දැනුණා. ඒ සියල්ල ඒ ආකාරයෙන් සිදු වූ විට ලැබුණු සතුට අනුභව කළ පුද්ගලයායි දන්නේ. මට ලැබුණු සතුට මා පමණයි දන්නේ. මේ ආකාරයට සිහියෙන් යුක්තව කටයුතු කිරීමේ වටිනාකම දැනෙන්නේ එය කර අත්දැකීම් ඇති පුද්ගලයාටයි.

''සිහි නැතිව කෑම ගැනීමේ තේරුම කුමක් ද? නුඹලා කෑම ගන්නා විට දන්නේ නැත්නම් කෑම ගන්නා බව එහි ඇති වැදගත්කම කුමක් ද? ඒ කෑම රස සහ සුවඳ යන දෙකම නුඹට ලබා ගන්න හැකියාවක් නැහැ.

''සිහියෙන් යුක්තව කටයුතු කරන පුද්ගලයා ජීවිතයේ සැම දෙයක්ම සැබෑ තත්වයෙන් දැකීමේ හැකියාව ඇති කෙනෙක් වෙනවා. වෙනත් අය නොදකින දේ දැකීමේ ශක්තිය සිහියෙන් යුක්තව කටයුතු කරන පුද්ගලයාට ඇති වෙයි.''

සිද්ධාර්ථ ගෞතමයන් වහන්සේ සුජාතා දෙස බලා ඇගේ නම කීවෝය.

''එහෙමයි ගුරුතුමනි,'' ඇය දෑත් එකතු කර පිළිතුරු දුන්නාය.

''ඔබ හිතන්නේ සිහියෙන් යුක්තව සිටින පුද්ගලයා අතින් වැරදි සිදුවිය හැක්කේ වැඩියෙන් කියා ද නැත්නම් අඩුවෙන් කියා ද?''

''ගෞරවනීය ගුරුතුමනි, සිහියෙන් යුතුව ජීවත් වන පුද්ගලයා අතින් වැරදි සිදුවිය හැක්කේ අඩුවෙනි. මගේ අම්මා නිතරම කියනවා ගැහුනු ළමයෙක් වැඩ කරනවිට, සිටගෙන සිටින විට, කථා කරන විට, හා සිනහවන විට සෑම වචනයක් ගැනමත් හැසිරීම් ගැනත් අවධානයෙන් ඉන්න ඕනෑ කියලා. තමන්ට හෝ අනුන්ට හෝ ඒවායින් සිත් නොරිදෙනු පිණිස. එයින් ගැහැනු ළමයෙකුගේ සුන්දරත්වය ද වැඩිවෙනවා යැයි ඇය කියනවා.''

''දරුවනි, සිහියෙන් ජීවත් වනවා යනු වර්තමානයේ මේ මොහොතේ ජීවත් වනවා යන්නයි. ඒ හේතුවෙන් සහන සීලතා ආදී විවිධ ගුණ වැඩිවන අතර තමන් අතින් සිදුවන හොඳ නරක ගැන ද දැනීමක් ඇතිවීම ස්වභාවිකයි. එයින් ප්‍රේමය ද වර්ධනය වෙනවා. සංසාරයේ දුක මෙමඟින් ක්‍රමයෙන් තුරන් වෙනවා. මේ අනුව එකිනෙකාගේ මෛත්‍රී සම්බන්ධය ද වර්ධනය වෙයි. ස්වස්ති ඔබ කුමක් ද සිතන්නේ? අවබෝධයක් නැතිව මිනිසුන්ට ආදරය කළ හැකි ද?''

''ගුරු දේවයාණනි, අවබෝධයක් නැතිව ආදරයක් ඇති වීම ඉතාම දුෂ්කරයි. මගේ නැඟණිය වූ හීමාට වූ සිද්ධියක් මට මතකයි. එක් දිනක් හීමා මුළු රාත්‍රියම හඬමින් සිටියා, මගේ අනෙත් නැඟණිය වූ බාලාගේ ඉවසීම අවසන් වන තුරු. අන්තිමේ බාලා හීමාගේ කම්මුලට පහරක් ගැසුවා. ඉන්පසුව හීමා තවත් හඬන්න පටන් ගත්තා. මම හීමාව දෑතින් තුරුළු කර ගත්තා. මට දැනුණා හීමාගේ ඇඟ රත් වී උණ ගැනෙමින් පවතින බව. එසේ ම හිසරුදාව ද ඇති බව මට හොඳින් වැටහුණා. මම බාලාට කතා කර හීමාගේ හිසට අත තබන්නැයි කීවා. එසේ කළ පසු බාලාට එක වරටම අවබෝධ වුණා හීමා එතෙක් වේලා හැඬුවේ ඇයි ද කියා. බාලා ඉතා ආදරයෙන් හීමා වඩාගෙන නැළවිලි ගී ගයන්න පටන් ගත්තා. හීමාගේ ඇඬීම නතර වූයේ එවිටයි. ඒ අවස්ථාව වින විටත් හීමාට උණ සෑදී කෙඳිරිගාමිනුයි හිටියේ ගුරු දේවයාණනි, මෙයින් මා හිතන්නේ අවබෝධයක් නොමැතිව ආදරයක් ඇති විය නො හැකියි.''

''එය එසේමයි ස්වස්ති, ආදරයක් ඇති වන්නේ අවබෝධයක් ඇත්නම් පමණයි. දරුවනි, නිතර සිහියෙන් සිටීමේ

පුරුද්ද ඇති කර ගන්න. ඉන් නුඹලාගේ අවබෝධ ශක්තිය තව තවත් වැඩි වෙනවා. එසේම තමන් ගැනම ගැඹුරු අවබෝධයක් ඔබට ලැබෙනු ඇති. සමාජයේ අනෙත් අය ගැන ද සියලු දේ ගැන ද ඔබට අවධියෙන් සිටීමට හැකි වේවි. තමන්ගේ හදවත ද ආදරයෙන් පිරී යාවි. එයයි මා අවබෝධ කරගත් ආශ්චර්යමත් මාවත.

ස්වස්ති තම දෑත් එකතු කරගනිමින්, ''ගෞරවනීය ගුරු දේවයාණනි, අපිට මේ මාවතට 'අවබෝධයේ මාවත' යැයි කිව හැකි ද?'' යි ඇසීය.

සිද්ධාර්ථ සිනාසුනේය. ''ඔව්, අපිට එම මාවතට අවබෝධයේ මාර්ගය කියා කිව හැකියි. මම එයට බොහෝම කැමතියි. අවබෝධය ලබා ගැනීමේ මාවත සම්පූර්ණ අවබෝධය හෙවත් විමුක්තිය කරා ඔබ ගෙනයාවි.''

සුජාතා දෑත් එකතු කර කතා කිරීමට අවසර පැතුවාය. ''ඔබ වහන්සේ අවබෝධය ලබාගත් තැනැත්තායි. අවධියෙන් යුතුව ජීවත් වන්නේ කෙසේදැයි පෙන්වා දෙන තැනැත්තා වන ඔබට 'පිබිදුණු තැනැත්තා' කියා ඇමතිය හැකි ද?

සිද්ධාර්ථ හිස සැලීය. ''එය තමයි මට ඉතාම ගැලපෙන නාමය.''

සෙසු දරුවන් අතර තරමක් උගත් දැරියක වූ සුජාතාගේ දෑස් දීප්තිමත් විය. ඈ දිගටම කථා කළාය. 'පිබිදුණ' යන්න මාගධී බසෙහි 'බුද්' යන්නයි. යම් පුද්ගලයෙක් පිබිදුණු කෙනෙකු නම් ඔහුට මාගධියෙන් කිව හැක්කේ 'බුද්ධ' යනුවෙනි. අපිට ඔබට 'බුද්ධ' කියා කතා කළ හැකියි.'' සිද්ධාර්ථ හිස සැලීය.

ළමයින් සැම දෙනම ඉතා සතුටට පත්ව සිටියහ. කණ්ඩායමේ වැඩිමලම තැනැත්තා වූ දහ හතර වියැති නාලක ''ගෞරවණීය බුද්ධ, අවබෝධය ලැබීමේ මාර්ගය සඳහා ඔබගේ මඟ පෙන්වීම ලැබීම ගැන අපි හැමෝටම හුඟක් සතුටුයි. සුජාතා මට කියා තිබුණා පසුගිය මාස හය දී ඔබ මේ පිප්පලි වෘක්ෂය යට කෙසේ ද භාවනා කළේ කියා. එසේම ඔබ ඊයේ රාත්‍රියේ එතෙක් සෙවූ මාර්ගය සොයා ගත් බවත් ඇය මට කිවුවා. ගෞරවණීය

බුදුන් වහන්ස, මේ පිප්පලි ගස මේ මුළු වනාන්තරයේම ඇති ලස්සනම ගසයි. අපි මේ ගසට බුද්ධත්වය ලබා ගැනීමට පිට දීමට උපකාර වූ වෘක්ෂය නිසා බෝධි වෘක්ෂය කියන්න ද?

බුදුන් හිස සැලීය. එසේම දරුවන්ගේ අදහස් ගැන එතුමා සතුටට පත් වූයේය. සිද්ධාර්ථ ගෞතමයන් වහන්සේ මේ ළමයින්ගේ මුණගැසීම මෙතරම් විශේෂිත වේය කියා හෝ තමන්ටත් මේ පිප්පලි වෘක්ෂයටත් මෙසේ උසස් නාමයන්ගෙන් විශේෂත්වයක් ලැබේ ය කියා හෝ අනුමාන කළේවත් නැත. නන්දබාලා ගෞරවයෙන් දෑත් එකතු කර "දූන් අඳුරු වැටීගෙන එන නිසා අපිට ගෙදර යන්න වෙනවා. ඒත් අපි ඔබ වහන්සේගෙන් තවත් ඉගෙනගන්න ආපසු එනවා," යි කීවේය. ළමයින් සියලු දෙනාම නැඟී සිට දෑත් නෙළුම් පොහොට්ටු මෙන් එක් කොට බුදුන්ට ස්තුති කිරීමට නමස්කාර කළහ. ඔවුහු ප්‍රීතිමත් කුරුලු රැනක් මෙන් නොරක් නැතිව සිද්ධාර්ථ ගැන කතා කරමින් නිවෙස් කරා පියමන් කළහ. සිද්ධාර්ථ ද කිසිදු තැවුලක් නැති ප්‍රීති සිතින් යුතුව වැඩ සිටියහ. සෙසු ලෝ සතුන්ගේ ද හිත සුව පිණිස තමන් අවබෝධ කරගත් උතුම් සම්බුද්ධත්වයේ බීජ වැපිරීම සඳහා සුදුසු කාලය පැමිණෙන තෙක් ඒ උතුම් නිවීමේ සුවය විඳිමින් තවත් කලක් මේ වනයෙහි ම සිටිය යුතු යැයි උන් වහන්සේ තීරණය කළහ.

# විසි වන පරිච්ඡේදය

# මුවා

සෑම දිනකම බුදුන් වහන්සේ ස්නානය සඳහා නේරංජනා නදී තීරයට පැමිණියෝය. උන් වහන්සේ ගං ඉවුර දිගටත් තමන්ගේ පා නැගීමෙන්ම සෑදුණ පුංචි අඩි පාර දිගටත් සක්මන් කරමින් භාවනා කළෝය. ගලා බසින නේරංජනා නදිය සමීපයේ පිහිටි බෝධි වෘක්ෂයේ විහිදී ගිය අතු පතර මත සිය ගණන් කුරුල්ලන්ගේ හඬ නැගෙද්දී උන් වහන්සේ ඒ බෝධි මුල හිඳ සමාධි සුව වින්දෝය. සිද්ධාර්ථ තමන් කී සියල්ල සම්පූර්ණ කර ඇත. තමන් නැවත කපිලවස්තුවට යා යුතු බව උන් වහන්සේට සිහිපත් විය. එහි තමන් පිළිබඳ තොරතුරක් හෝ ලැබෙන තුරු බොහෝ කලක සිට බොහෝ දෙනා මඟ බලා සිටිති. ඔහුට රජගහ නුවර බිම්බිසාර රජතුමා ද සිහිපත් විය. ඒ තරුණ රජු තමන් සමඟ වූ විශේෂ සබඳකම සිහිපත් කර ඔහුද දැකීමට යා යුතු යැයි තීරණය කළෝය. තමන් දුෂ්කර ව්‍රත දරමින් විමුක්තිය ලැබීමට උත්සාහ කරන සමයෙහි තමන්ට උදවු කළ මිතුරන් පස් දෙනා ද සිහිපත් කළෝය. ඔවුනට ඉතා ඉක්මනින් තමන් අවබෝධ කරගත් විමුක්තිය වෙත පැමිණිය හැකි වේ යැයි හැඟුණ බැවින් ඔවුන් සොයා ගත යුතු

යැයි සිතීය. සැකයක් නොමැතිව ඔවුන් මේ නුදුරෙහිම කොතැනක හෝ වෙසෙනවා විය යුතුය.

ගංගා, අහස, සඳ, තරු, කඳු, වනාන්තර, තණ පත් හා හැම දුහුවිල්ලක්ම පරිවර්තනය වී ඇත. ගත කළ අවුරුදු ගණනක කාලය තමන් විසින් අපතේ හැර නොමැති බව බුදුරජානන් වහන්සේට දැනිණි. අති දුෂ්කරතා මැදින් කළ පරීක්ෂණවලින් පිරි අතීතය කෘත ගුණ පූර්වකව සිහිපත් කළෝය. මෙතෙක් කල් තමන් අයාලයේ යමින් ගත කළ දුෂ්කර වසර ගණනක කාල සීමාව කාලය අපතේ යැවීමක් යැයි උන් වහන්සේ කෙසේවත් සිතුවේ නැත. අවසානයේ තමා විසින්ම සෑම සත්වයෙකුටම සියලු දුක්වලින් මිදෙන මාර්ගය සොයාගෙන ඇත. සෑම ජීවතයකටම එම අන්ධ ස්වභාවයෙන් ගෙවන දුක්බර සසරින් මිදී යෑමේ හැකියාව හිමි වී ඇත. කිසිවෙකුටත් මෙතැන් සිට තමාගෙන් පිටත ලෝකයේ විමුක්තිය සොයමින් වෙහෙසීමට අවශ්‍ය නැත. මක්නිසා ද, ප්‍රඥාවත්, ශක්තියත් යන දෙකම පවතින්නේ සත්වයා තුළම බැවිනි. සියලු දුකින් නිදහස්ව සදාකාලික සුවය අත්කරගත හැකි බුදුරදුන්ගේ ශ්‍රේෂ්ඨ වූ මහා සොයා ගැනීම මෙයයි.

බුදුරදුන්ට වන්දනා කිරීම සඳහා ළමයි නිතර පැමිණියහ. බුදුරදුන් සරලව හා ස්වාභාවිකව විමුක්ති මාර්ගය ජනතාව අතර පැතිරී යනවා දකින්නට කැමති විය. පාසල් නොයන දුප්පත් ගැමි ළමයින්ට පවා උන් වහන්සේගේ ඉගැන්වීම් තේරුම් ගත හැකි විය.

දිනක් ජමනාරං පිරවූ කූඩයක් රැගෙන ළමයින් බුදුරදුන්ගේ ඉදිරියට පැමිණියහ. සිහියෙන් යුතුව ජමනාරං කන හැටි බුදු රදුන් ඔවුනට ඉගැන්වූහ. පළමු පාඩම යළියළි පුහුණු කිරීමට ඔවුනට අවශ්‍ය විය. සුජාතා ගෞරවයෙන් යුතුව නමස්කාර කර කූඩය බුදුරදුන් වෙත අල්ලාගෙන සිටියාය. නෙළුම් පොහොට්ටුවක් මෙන් දෑත් එක් කළ බුදුරදුන් ජමනාරං ගෙඩියක් සුරතට ගත්හ. සුජාතා බුදුන් වහන්සෙගේ පසෙකින් සිටගෙන සිටි ස්වස්ති වෙතට කූඩය පිරිනැමුවාය. ඔහු ද පළමුව දෑත් එක්කොට ගෙඩියක් අතට ගත්තේය. සුජාතා සෑම ළමයෙකුටම ජමනාරං ගෙඩියක් ලැබෙන තුරු කූඩය එකිනෙකා වෙත ගෙන ගියාය. අවසානයේ ඇය ද බිම වාඩි වී දෑත් එක්කොට ආචාර කර ගෙඩියක් අතට ගත්තාය.

ළමයින් සැම දෙනම නිහඬව වාඩි වී සිටියහ. බුදුරදුන් කාරුණිකව සිනා සී ළමයින්ට තමන්ගේ හුස්ම ගැනීම හා හෙළීම අනුව සිත යොමු කරන ලෙස දැන් වීය. ජමනාරං ගෙඩිය ගත් උන් වහන්සේ ඉතා සිහියෙන් යුතුව ඒ දෙස බැලූහ. ළමයින් උන් වහන්සේ අනුකරණය කළහ. උන් වහන්සේ සෙමින් සෙමින් ජමනාරං ගෙඩිය පොතු අරින්නට වූ අතර ළමයින් ද එසේ කළහ. ගුරුතුමා හා සිසුවෝ තම අතැති ජමනාරං ගෙඩිය පිළිබඳව නිහඬව සිහි නුවණ යෙදීම විඳින්නට වූහ. සැම කෙනෙකුම අනුභව කොට අවසන් වූ පසු බාලා නාරං ලෙලි එකතු කළාය. සැම ළමයෙකුම බුදුරදුන් සමඟ සිහියෙන් යුතුව නාරං කෑමේ සතුට අත් වින්දේය. ළමයින් සමඟ මේ පුහුණුව බෙදා ගැනීමට හැකි වීම පිළිබඳව බුදුරජානන් වහන්සේ මහත් සේ සැහීමට පත් වූහ.

දිවා ආහාරයට පසුව ළමයින් බුදුරදුන් දැකීමට පැමිණියහ. තරහවක් හෝ ගැටීමක් හෝ සිතේ කැළඹීමක් හෝ ඇති විට හිඳගෙන ආශ්වාසයට සිත යොමු කරමින් සිත සන්සුන් කරගන්නා ආකාරය උන් වහන්සේ ළමයින්ට පෙන්වූහ. සක්මන් භාවනාවෙන් තම සිත හා ශරීරය ප්‍රබෝධමත් කොට නව පණක් ලබා ගන්නා ආකාරය ඔවුනට ඉගැන්වූහ. එසේම අන් අය තේරුම් ගෙන ඔවුන්ට ආදරය දක්වීම සඳහා සෙස්සන් දෙස ගැඹුරින් බලන ආකාරය උගැන්වූහ. ඒ ඉගැන්වූ සැමෙකක්ම ළමයි ඉතා හොඳින් තේරුම් ගත්හ.

නන්දබාලාත් සුජාතාත් බුදුරදුන්ට පූජා කිරීමට සිවුරක් මැසීම සඳහා මුළු දවසම මහන්සි වූහ. එම සිවුර බුදුරදුන්ගේ පැරණි සිවුර හා සමාන දුඹුරු පැහැයෙන් යුක්ත විය. උන් වහන්සේ එම පැරණි සිවුර ලබා ගත්තේ තම නිවසේ මෙහෙකාරියව සිට උණසන්නිපාතයෙන් මිය ගිය සේවිකාව වූ රාධාගේ මළ සිරුරින් බව දැනගත් විට ඇයට හඬා වැළපීමට අවශ්‍ය විය. ගැහැනු ළමයින් දෙදෙනා බුදුරදුන්ට සිවුර පූජා කිරීමට පැමිණෙද්දී උන් වහන්සේ බෝ ගස මුල වාඩි වී සිටියෝය. උන් වහන්සේ භාවනාවෙන් අත මිදෙන තුරු ඔවුන් දෙදෙනා නිහඬව බලා සිටියහ. අලුත් සිවුර ද අතැතිව තමන් හමුවට ගැහැනු ළමයින් දෙදෙනා පැමිණ සිටිනු දැක බුදුරදුන් සතුටට පත් විය.

''මට මේ සිවුර අවශ්‍යව තිබුණා,'' උන් වහන්සේ කීහ. තම නව සිවුර සේදීමට අවශ්‍ය වූ විට හැඳීම සඳහා පැරණි සිවුර ද පරිස්සම් කර ගන්නා බව උන් වහන්සේ කීහ. නන්දබාලාත් සුජාතාත් ඉක්මනින් උන් වහන්සේට තවත් සිවුරක් මැසීමට සිතා ගත්හ.

දිනක් සුජාතාගේ යෙහෙළිය වූ දොළොස් හැවිරිදි බාල ගුප්තා තමන්ට මිතුරුකම ගැන කියා දිය හැකි දැයි බුදුරදුන්ගෙන් ඇසුවාය.

ඊට පෙර දින ඇය තම හොඳම මිතුරිය වූ ජටලිකා සමඟ වූ කතාවක් නිසා අමනාපව සිටියාය. ඒ ළඟ දිනයේ ඇය බුදුරදුන් දැකීමට එන ගමනේ දී ජටලිකාගේ නිවස ළඟ ඇය එනතුරු රැඳී සිටීමට අවශ්‍ය නොවූ අතර ඇය සිටියේ සුජාතාගේ බල කිරීම මතය. ජටලිකා ද ඔවුන් හා ගමනට එකතු වීමට කැමති වූයේ සුජාතා සිටි නිසාය. ගැහැනු ළමයින් බුදුරදුන් හමුවට පැමිණි අතර ජටලිකා හා බාල ගුප්තා එකිනෙකාට සමීප නොවී ඈත්ව හිඳගත්හ.

බුදුරදුන් ළමයින්ට මුවෙක්, කුරුල්ලෙක් හා ඉබ්බෙකු පිළිබඳ කතාවක් විස්තර කරමින් මිත්‍රත්වය ගැන කියා දුන්හ. උන් වහන්සේ මෙය වසර දහස් ගණනකට පෙර භවයක තමන් මුවෙක්ව ඉපිද සිටිය දී සිදු වූ කතා පුවතක් බව දරුවන්ට කීහ. ළමයින් පුදුමයට පත්ව උන් වහන්සේ දෙස බැලූහ. එහෙත් උන් වහන්සේ කතාව විස්තර කරන්ට වූහ. "මේ ජන්මයට පෙර අප හැමෝම මසුන් වී, ඉබ්බන් වී, කුරුල්ලන්, ක්ෂීරපායින් වී නොයෙක් වාරවල නොයෙක් ජාතිවල ඉපදී හිඳ තිබෙනවා. මම මේ සියල්ල ඉතා පැහැදිලිව මගේ භාවනා තුළින් දැක තිබෙනවා. මේ අයුරින් එක් භවයක මා මුවෙක්ව සිටියා. මෙය සසරෙහි ස්වාභාවික වූ දෙයක්. මට තවත් මතකයි ඊට පෙරත් පසුවත් මා විවිධ ආත්මවල ඉපදී සිටිය අයුරු. මා පමණක් නොවෙයි, ඔබත් මා මෙන්ම බොහෝ ජන්මවල විවිධ ජීවීන්ව ඉපදී තිබෙනවා. මම ඔබට කියන්න සූදානම් වන කතාව මුවෙක්, කුරුල්ලෙක්, ඉබ්බෙක් හා වැද්දෙකු ගැනයි. සමහර විට ඔබෙන් කෙනෙකු කුරුල්ලා හා ඉබ්බා වී ඉන්න ඇති. අපි හැමෝම පෙර ආත්මවල මිනිසුන් වී පමණක් නොව විවිධ සතුන් වී පොළොව මත ඉපිද තිබෙනවා.

"මම ඔබට කියන්න යන කථාන්තරය වසර දහස් ගණනකට පෙර සිදු වූ දෙයක් වුව ද මේ මොහොතේ සිදු 'වූ දෙයක් මෙන් සිහිකර කියන්න මට පුළුවන්. මේ කතාවේ සතුන් පිළිබඳව සිදුවීම් ඔබට සාමාන්‍ය ලෙස හැගුණත් එසේ නොහැගුණත් පරිස්සමින් හා විමසිල්ලෙන් මේ කතාව අසා සිටින්න."

බුදුරදුන් කතාව ආරම්භ කළේය. "මේ කියන කාල සීමාවේ බුදුරදුන් මුවෙක්ව ඉපිද සිටියා. මේ මුවා සිටි වනයේ ඉතා පැහැදිලි පිරිසිදු දිය පිරි විලක් තිබුණා. ඉබ්බා ජීවත් වූයේ මේ විලෙහිය. ඒ විල අසල තිබූ විලෝ ගසක ඔවුන්ගේ මිත්‍ර කැරලෙකු ද ජීවත් විය. මුවාත්, ඉබ්බාත්, කැරළාත් ඉතාම ලොකු මිත්‍රත්වයකින් ජීවත් වුණා. දිනක් වැද්දෙක් මුවා දිය බීමට විලට එන පාරේ ඉතා ශක්තිමත් රැහැන් යොදා උගුලක් අටවා කැලේ මෑතක් දුරින් පිහිටි ඔහුගේ පැලට ආපසු ගියා. ඊට පසු දින මුවා දිය බීම සඳහා පුරුදු මාර්ගයෙන් විල වෙත පැමිණියා. මුවා වැද්දාගේ උගුලෙහි අසු වී හිර වුණා. මුවා ඉබ්බාටත් කැරළාටත් ඇසෙන සේ මහ හඬින් කෑ ගැසුවා. ඉබ්බා දිය යට සිට වහාම මතු පිටට ආවා. කැරළා විලෝ ගස මුදුනේ සිය කැදැල්ලේ සිට පියාඹා පහළට ආවා. පසුව කැරළාත් ඉබ්බාත් තම යහළු මුවා බේරා ගන්නා විදිය ගැන සාකච්ඡා කළා. අන්තිමේ දී කැරළා ඉබ්බාට මෙසේ යෝජනා කළා. 'යාළුවේ ඔබේ කටේ හණු ඉතාම ශක්තිමත්. ඔබට ඒවායින් හපලා මේ වරපටවල් කඩන්න පුලුවන්. මම වැද්දා එන මඟ රැක සිට ඔහු එනවා ද බලන්නම්,' මෙසේ කී කැරළා වැද්දා සිටින ඉසව්ව සොයා පියාඹා ගියා.

"ඉබ්බා මුවා සිරවී සිටි රැහැන් කටින් හපන්න පටන් ගත්තා. කැරළා වැද්දාගේ පැලෙහි ඉදිරි දොර අසල අඹ ගසේ අත්තක නැවතී මුළු රාත්‍රියම ඔහු පැලෙන් එළියට එන තෙක් බලා ගෙන සිටියා. ඊළඟ දවස එළඹුණා. වැද්දා මුවහත් පිහියක් ද රැගෙන පැලේ ඉදිරිපස දොරෙන් පිටවුණා. වැද්දා දුටු කැරළා හැකි තරම් වේගයෙන් වැද්දාවෙත පියෑඹුවා. පියඹා ගොස් ඒ වේගයෙන්ම වැද්දාගේ මුහුණේ හැපුණා. ටික වේලාවක් නැවතී කල්පනා කළ වැද්දා ආපසු පැල තුළට ගොස් ඇඳේ හාන්සි වුණා. නිදාගෙන ටිකකින් අවදි වී නැවතත් ඔහුගේ මුවහත් පිහියත් රැගෙන පැලෙහි පිටුපස දොරටුවෙන් පිට වුණා. එහෙත් දක්ෂ

කැරළා අනුමාන කර තිබුණා ඔහු පිටුපස දොරින් ඒවි කියා. ඒ නිසා කැරළා වැද්දා එනතුරු පිටුපස දොර අසල කොස් අත්තක වාඩි වී දඩයක්කරු එළියට එනතුරු බලා සිටියා. වැද්දා එළියට එත්ම කැරළා පෙර සේම වේගයෙන් පියඹා ගොස් ඔහුගේ මුහුණේ හැපුණා. නැවතත් පැල තුළට ගිය වැද්දා කල්පනා කරන්නට වුණා. අද මහ අසුභ දවසක් හෙට උදේම පිට වී යාම හොඳ යැයි කියා.

"ඊළඟ දිනයේ උදෑසනම අවදි වූ වැද්දා ඔහුගේ තියුණු මුවහත් පිහියත් රැගෙන මුහුණ තොප්පියකින් වසාගෙන පැලෙන් එළියට නික්මුණා. මුහුණ තොප්පියෙන් වසා සිටින වැද්දා දුටු කැරළා මෙවර ඔහුට බාධා කළ නොහැකි බව වටහාගෙන වැද්දා එන බව තම මිතුරන්ට දන්වනු පිණිස කැලයට පියාඹා ගියා.

"වැද්දා මඟ එනවා," යැයි කෑගැසුවා.

"ඉබ්බාට කැපීමට තිබුණේ අවසාන රැහැණ පමණි. එහෙත් එය බොහෝම තද එකක් විය. රාත්‍රී දෙකක් හා දවල් දවසක් එක දිගටම රැහැන් කැපීම නිසා ඉබ්බාගේ හණු තුවාල වී ලේ ගලමින් තිබුණා. තවමත් ඔහු රැහැන් කැපීම නොනවත්වාම කරමින් ගියා. එක් වරටම දඩයක්කරු ඔවුන් වෙත පැමිණියා. බියපත් වූ මුවා අඩක් සිඳුණු අවසන් රැහැන් පටට පය පහරක් ගසමින් නැගී සිටියා. රැහැන කැඩී ගොස් මුවා නිදහස් විණි. මුවා කැලයට දිව ගියා. කැරළා විලෝ ගස මුදුනට පියාඹා ගියා. එහෙත් ඉබ්බා බොහෝ සෙයින් විඩාපත්ව සිටි බැවින් ඌව මදක් හෝ ඉවතට යාමට නොහැකි වුණා. මුවා පලා යාම නිසා වැද්දා මහත්සේ කෝපයට පත්ව ඉබ්බාත් රැගෙන විලෝ ගසේ අත්තක එල්ලා තිබූ තම බෑගය තුළට දැම්මා. පසුව ඔහු මුවා සොයා කැලයට ගියා. අසල පඳුරක් ළඟ සැඟ වී සිටි මුවා ඉබ්බාට සිදු වී ඇති විපත දුටුවා. මගේ යහළුවෝ මා වෙනුවෙන් ඔවුන්ගේ ජීවිත පරදුවට තැබුවා. ඔවුන් වෙනුවෙන් තමාට ද එසේ කිරීමට දැන් වේලාව පැමිණ ඇතැයි මුවා සිතුවා. මුවා දඩයක්කරුට තමා සම්පූර්ණයෙන් පෙනෙන ලෙස පඳුරු අතරින් මෑත් වූවා. ඔහු තමාට බොහෝම වෙහෙස බවත් දුර්වල බවත් හඟවමින් ඉතා අමාරුවෙන් මෙන් අඩිපාර දිගේ පහළට ගැටුවා.

"මේ දුටු වැද්දා මුවා අතිෂයින් දුර්වලව ඇතැයි සිතා ඉක්මනින් ගොස් මුවා මරා ගත යුතු යැයි මුවහත් පිහිය අතට ගත්තා.

''මුවා පසුපසින් දඩයක්කරු ටිකෙන්ටික කැලය තුළට ඇදුණා. මුවා ද ඔහුට අල්ලා ගැනීමට හැකි නොහැකි පමණින් සමීපව නුදුරින් ගමන් ගත්තා. වනාන්තරයේ බොහෝ දුරක් ගිය පසු එක් වරටම මුවා පැන ගොස් වෙනත් මඟක් ඔස්සේ විල වෙත ආවා. ඔහු තම අඟින් විලෝ අත්තේ එල්ලා තිබූ සම් මල්ල ගෙන ඉබ්බාව බිම හෙළුවා. කැරළා ද ඔහුට එකතු වුණා.

''ඔබ දෙදෙනා මා බේරා නොගත්තානම් මා අනිවාර්යයෙන්ම දඩයක්කරු අතින් මැරෙන්න ඉඩ තිබුණා. මුවා කීවා. මට බයයි. දැන් වැද්දා මෙතැනට ඒවි කී කැරළා විලෝ ගස මුදුනට ඉගිළුණා. ඉබ්බා විලට පැන දිය යටට ගොස් සැඟ වුණා. මුවා කැලය තුළට නැවතත් ආපසු දිව ගියා. නැවතත් විල වෙත පැමිණි වැද්දා පිහියත් අතට ගෙන හම් මල්ල දිග හැර බැලුවා. එහෙත් මල්ල හිස්ව තිබෙනු දුටු ඔහු හිස් අතින්ම ගෙදර ගියා,'' යනුවෙන් බුදුරදුන් තම අතීත කතාව අවසන් කළෝය.

පුළුල් වූ දෙනෙතින් යුතුව ළමයි බුදුරදුන්ගේ කථාව අසා සිටියහ. බුදුරදුන් මුවා බේරා ගැනීම සඳහා ඉබ්බා ලේ වැගිරෙන හනුවලින් යුතුව තද වරපට හපන හැටි කියද්දී රූපක් සහ සුභාෂ් හැඬීමට ඉතාම ආසන්නව සිටියහ. ''දරුවනේ, ඔබ මොකද හිතන්නේ? බොහෝ කාලයකට ඉහත මා මුවා සිටිද්දී ඔබලාගෙන් කවුද ඉබ්බා වෙලා සිටියේ?'' සුජාතා ඇතුළු සියලු ළමයි ඔවුන්ගේ අත් ඉහළට එසවූහ.

''එහෙනම් ඔයාලගෙන් කවුද කැරළා?'' බුදුරදුන් ඔවුන්ගෙන් නැවතත් ඇසීය.

''ජටලිකා හා බාල ගුප්තා සමඟ ස්වස්ති සිය අත් එසවූහ. සුජාතා ජටලිකා දෙස බැලුවාය. ''ඔයාල දෙන්නම කැරළා වෙලා හිටියා ද? ඒ කියන්නේ ඔයාලා දෙන්නම එක්කෙනෙක්. දෙන්නම එක කැරළා වෙලා හිටියත් ඇති හොඳ මොකක් ද? අපිට අපේ මිතුරුකම කැරළා, මුවා, ඉබ්බා තරම් සමාන කරන්න බැරි ද?''

බාලගුප්තා නැගී සිට ජටලිකා සිටි තැනට ගියාය. ඇය තම යෙහෙළියගේ අත තම දෑතින්ම අල්ලා ගත්තාය. ජටලිකා බාලගුප්තාගේ බාහුවෙන් ඇද ගනිමින් තමා ළඟින් ඉඳගැනීමට හැදුවාය.

බුදුරදුන් සිනා සී ''දරුවෝ, ඔබ කථාව හොඳින් තේරුම් ගත්තා. මතක තියා ගන්න අද කියලා දුන්න වගේ කතාවක් හැම දාම මම නුඹලාට කියලා දෙනවා,'' යි කීහ.

# විසි එක් වන පරිච්ඡේදය
# නෙළුම් පොකුණ

ළමයින් ගෙදර ගිය පසු බුදුන් වහන්සේ සක්මන් භාවනාව කළහ. සිවුර මදක් කෙටි කර ගත් උන් වහන්සේ ගඟ හරහා ගමන් කළහ. දෙපසින් පිහිටි කුඹුරු පසු කරමින් අඩිපාර දිගේ ගමන් කළ බුදුරදුන් තමන් වහන්සේට ඉතාම ප්‍රියජනක වූ නෙළුම් පොකුණ වෙත පැමිණියේය. පොකුණ අසලින් වාඩි වූ උන් වහන්සේ ඉතා පියකරු නෙළුම් මල් දෙස බලා සිටිමින් භාවනා කරන්ට විය.

උන් වහන්සේ නෙළුම් දඬු, කොළ, හා මල් දෙස බලා සිටිද්දී මෙසේ මෙනෙහි කරන්නට විය. සියලුම අවස්ථාවන් එකිනෙකට වෙනස් වෙමින් නෙළුම් වැවෙනවා. එහි මුල් ඇත්තේ මඩෙහිය. සමහර දඬු දියෙන් උඩට එස වී නැහැ. තවත් සමහර කොළ යම්තම් දියෙන් උඩට අනාවරණය වී ඇතත් කොළය වකුටු වී තදින් එතී ඇත. නොපිබිදුණු නෙළුම් මල් තිබේ. දියෙන් උඩට මතු වූ සමහර නෙළුම් මල්වල පෙති දිග හැරී සම්පූර්ණයෙන්ම පිපී තිබේ. සියලු පෙති හළා දැමූ ඇට පිරි නෙළුම් කෝෂද ඒ අතර ම තිබේ. සුදු නෙළුම් නිල් හා රෝස පැහැති නෙළුම් ද තිබේ.''

බුදුරදුන් මෙනෙහි කරන්නට විය. ''මිනිසුන් ද මේ නෙළුම් මල් වලට වඩා වෙනසක් නැත. දේවදත්ත, ආනන්ද මෙන් නොවේ. යශෝදරා, පමිතා බිසවට සමාන නැත. සුජාතා, බාලා මෙන් නොවූවාය. පෞරුෂත්වය, යහ ගුණය, බුද්ධිමත්බව හා සහජ කුසලතා පිළිබඳ විවිධත්වය මිනිසකුගෙන් මිනිසකුට ඉතා පුළුල් වෙනස්කමින් යුතුය. මා සොයාගත් විමුක්ති මාවත කියා දීමට විවිධ වූ ක්‍රම මේ විවිධ මිනිසුන් වෙත යොදන්නට සිදු වනු ඇත. ගැමි ළමයින්ට ඉගැන්වීම පහසු යැයි විය හැකිය.

වෙනස් වූ ඉගැන්වීම් ක්‍රම විමුක්තිය අවබෝධ කරගැනීමට වෙනස්, වෙනස් වූ ස්වභාවයන් ඇති මිනිසුන්ට විවිධ වූ දොරවල් මෙනි. ධර්මය අවබෝධය සඳහා දොරටු නිර්මාණය කළ හැක්කේ ජනතාව සෘජුව මුණගැසීමෙනි. දහම් සක කරකැවීමටත් විමුක්ති බීජ වැපිරීම සඳහාත් ආපසු සමාජය වෙත යෑම අවශ්‍ය යි කියා බුදුරජුන් කල්පනා කළෝය. උන් වහන්සේගේ විමුක්ති අවබෝධයෙන් දූන් දින හතලිස් නවයක් ගෙවී ඇත. මේ උරුවෙල් දනවුවෙන් නික්මීමට කාලයයි. ''හෙට උදෑසනම පිට වී යා යුතුය,''යි උන් වහන්සේ තීරණය කළහ. සිසිල් වනාන්තරයෙනුත්, නේරන්ජනා නදී තීරයෙනුත්, බෝධි වෘක්ෂයත්, ළමයිනුත් හැර යා යුතු යි. පළමුවෙන්ම උන් වහන්සේට තම ගුරුවරුන් දෙදෙනා සොයා ගැනීමට අවශ්‍ය විය. ආලාරකාලාම, උද්දකරාමපුත්ත, හා පසුව තමන් සමඟ පුහුණු වෙමින් විමුක්තිය සෙවූ යහළුවන් පස් දෙනා ද සොයාගත යුතුය. පසුව බිම්බිසාර රජු සොයා මගධයට යන්නට ද තීරණය කර ගත්තේය.

පසුදා උදෑසන අලුත් සිවුර පොරවාගත් උන් වහන්සේ උරුවේලාව බලා ගමන් කළහ. තවමත් උදෑසන මීදුමෙන් බරවී තිබිණි. ස්වස්තිගේ පැල වෙත ගිය බුදුරදුන් තරුණ ගොපලු කොලුවාටත් ඔහුගේ පවුලේ අයටත් තමන්ට පිටත් වීමට කාලය පැමිණ ඇති බව කීය. සෑම ළමයෙකුගේම හිස මත අත තබා ආශීර්වාද කළ උන් වහන්සේ ඔවුන් ද සමඟ සුජාතාවගේ නිවස බලා ගමන් කළහ. මේ පුවත දැනගත් සුජාතා හැඬුවාය.

''මගේ වගකීම සම්පූර්ණ කිරීම සඳහා මා යා යුතුයි,'' බුදුරජානන් වහන්සේ කීහ. ''නමුත් මම පොරොන්දු වෙනවා ඔබව බලන්න නැවත එන බවට. කවදා හෝ මට අවස්ථාවක් ලැබුණු විට. දරුවනේ ඔබලා මට ඉතා උසස් ලෙස උදවු කළා. ඔබට එයට බොහෝම ස්තුතියි. කරුණාකර ඔබලාට කියා දුන් කරුණු මතක තබාගෙන ප්‍රගුණ කරන්න. එසේ කිරීමෙනුයි ඔබලාත් මාත් සමීප වන්නේ. සුජාතා, දූන් ඔය කඳුළු පිසදා මා සමඟ සිනාසෙන්න.''

සුජාතා සිය සලුපොටින් කඳුළු පිසදැමුවාය. ඈ සිනාසීමට උත්සාහ කළාය. පසුව ළමයින් සැම දෙනාම බුදුරදුන් සමඟ ගම කෙළවරට යනතෙක් ඇවිදගෙන ගියහ. මාර්ගය ඉදිරියෙන් තවුසෙකු ඒ මඟින් යාමට තමන් සිටින දිශාවට එන බව ළමයින් ගෙන් සමුගැනීම සඳහා බුදුරදුන් ඔවුන් වෙත හැරෙත්ම උන් වහන්සේ දුටුවෝය. තවුසා දෑත් එක් කොට ආචාර කරමින් බුදු රදුන් දෙස මහත් උනන්දුවෙන් හා විස්මයෙන් යුතුව බලා සිටියේය. දිගු මොහොතකට පසු ඔහු බුදුරදුන් ඇමතීය. ''භික්ෂුව, ඔබේ ඉන්ද්‍රියයන් ඉතා පැහැපත්. එසේම ඉරියවු ඉතාම ශාන්තයි. ඔබේ නම කුමක් ද? ඔබේ ගුරුවරයා කවු ද?''

''මගේ නම සිද්ධාර්ථ ගෞතම. මම ගුරුවරු බොහෝ දෙනෙකුගෙන් ඉගෙන ගෙන තිබෙනවා. එහෙත් දැන් මගේ ගුරුවරයා ලෙස හැඳින්විය හැකි කිසිවෙක් නැහැ. ඔබේ නම කුමක් ද? ඔබ එන්නේ කොහි සිට ද?''

තවුසා පිළිතුරු දෙමින් මෙසේ කීය. ''මගේ නම උපක. මම මේ උද්දකරාමපුත්ත ගුරුතුමාගේ විද්‍යාලයේ සිට එන ගමන්.''

''උද්දකරාමපුත්ත ගුරුතුමා සුවසේ සිටිනවා ද?''

''දින කිහිපයකට පෙර එතුමා මිය ගියා.''

බුදුරදුන් කල්පනා කරන්නට විය. තම පැරණි ගුරුවරයාට උදවු කිරීමට අවස්ථාවක් තව දුරටත් තමන්ට නොවීය. උන් වහන්සේ නැවතත් මෙසේ ඇසීය. ''ඔබ කවදා හෝ ආලාරකාලාම ගෙන් ඉගෙනගෙන තිබෙනවා ද?''

උපක පිළිතුරු දිණි. ''ඔව්. නමුත් ඔහුත් මෑතක දී මිය ගියා.''

''ඔබ කොණ්ඩඤ්ඤ නැමති භික්ෂුවක් ගැන අසා තිබෙනවා ද?''

''ඔව් ඇත්තෙන් ම මා ඔහු හොඳින් දන්නවා,'' උපක කීය. ''මට අසන්ට ලැබුණා ඔහුත් අනෙක් භික්ෂූන් සතර දෙනාත් ගැන. මා උද්දකරාම ගුරුතුමාගේ ආරාමයෙන් එද්දී මට අසන්නට ලැබුණා ඔවුන් වාරානාසි නගරය සමීපයේ ඇති ඉසිපතන මුව වනයේ පුහුණු වීම් කටයුතු කරමින් ජීවත් වන බව. ගෞතම, ඔබ මට සමාවෙන්න ඕනෑ. මම දින ගණනක් ගත වන දිගු ගමනක් යමිනුයි සිටින්නේ. මා දැන් නැවතත් ගමන් ආරම්භ කළොත් හොඳයි,'' උපකට ආචාරශීලීව සමු දුන් බුදුරදුන් ළමයින් දෙසට හැරිණි. ''මම වාරානාසි දෙසට ඇති මාවත දිගේ මගේ යහළුවන් පස් දෙනා සොයා යා යුතුයි. කරුණාකර ඔබ සැම ආපසු ගෙවල් බලා පිටත් ව යන්න,'' යැයි පැවසුවේය.

ළමයින්ගෙන් සමුගත් බුදුරදුන් ගඟෙහි උතුරු දෙස බලා ගමන් කරන්නට විය. එය ඉතා දුර පාරක් බව බුදුරදුන් දැන සිටියෝය. එහෙත් එහි ගමන් කිරීම පහසුය. නේරංජනා ගඟ මදක් උතුරු දෙසින් ගංගා නම් ගඟට එකතු වෙයි. එතැනින් ගංගා ගඟෙහි බටහිර දෙසට ගමන් කළහොත් දින කීපයක් තුළ උන් වහන්සේට පාටලී නම් ග්‍රාමයට ළඟාවීමට හැකි වෙයි. එතැනින් ගංගා නදිය තරණය කොට ගඟේ අනිත් පැත්තට ගියහොත් වාරාණාසියට පැමිණිය හැකිය. එය කාසි ජනපදයේ අගනුවරයි.

බුදුරදුන් නොපෙනී යන තෙක්ම ළමයින් පිරිස උන් වහන්සේ යන දෙස බලා සිටියහ. ඔවුනට ලොකු දුකක් හා තනිකමක් දැනෙන්නට විය. සුජාතා හැඬුවාය. ස්වස්තිට ද හඬන්නට අවශ්‍ය වූ මුත් තම සහෝදරයා හා සහෝදරියන් ඉදිරිපිට හැඬීමට ඔහු අකැමැති විය. දිගු වේලාවකට පසු, ''සුජාතා අක්කේ, මට හරකුන් තණකොළ කැවීමට සූදානම් වෙන්න ඕනෑ. දැන් අපි ගෙදර යමු,'' යි ස්වස්ති, කීය. අද රූපක් නැහැවිය යුතු බව බාලා සිහිපත් කළාය.

ඔවුහු ගං ඉවුර දිගේ ගම දෙසට ගමන් කළහ. කිසිවෙක් තවත් එක් වචනයකුදු කතා නොකළහ.

*********

තුරුණු වියට පත්ව සිටි ආනන්ද හිමි කඩවසම් මෙන්ම ප්‍රිය ශීලී විය. එසේම ඔහුට වෙනත් අයට නැති අකාරයේ අද්භූත මතක ශක්තියක් තිබිණි. බුදුරදුන් ඔහුට කියා තිබූ සැම කරුණක්ම බිඳකුදු අඩු නැතිව ඔහුගේ මතකයෙහි තිබිණි. බුදුරදුන් රාහුලටත් ස්වස්තිටත් දේශනා කළ ගවයන් රැකබලා ගැනීම සම්බන්ධ සූත්‍රයහි දැක් වූ කරුණු එකොළහ ඔහු මතකයෙන් නැවත කීය. ආනන්ද හිමියන් සැම දෙයක්ම මතක ඇති බව ස්වස්තිට වැටහී ගියේය. උරුවෙල් දනව්ව අසල වනයේ දී බුදුරදුන් කියා දුන් කරුණු ඔහු එකින් එක සිහි කරන්නට විය.

ස්වස්ති තම පෙර කතාව කියන අතරතුර වරින්වර භික්ෂුණී ගෝතමිය දෙස බැලීය. ඒ කතා අසා සිටීමෙන් කොතරම් සතුටු ද යන්න ඇගේ දීප්තිමත් ඇස් ස්වස්ති කියාපෑවේය. ඔහු තම මතකයේ හැටියට විශේෂ වූ සියලු විස්තර කීවේය. ඇය වැඩිපුරම සතුටු වූයේ උරුවේලාවේ ළමයින් සමඟ වනයේ දී සිහි නුවනින් නාරං රස විඳීම ආදී කතා කියද්දීය.

ස්වස්ති කියූ පැරණි විස්තර ඇසීමෙන් රාහුල ද සතුටු වන අයුරු දැක ගැනීමට පහසු විය. වැඩිහිටි වූ අස්සජී හිමියන් ද ස්වස්තිගේ විස්තරය කියන අතරතුර කිසිදු ශබ්දයක් නොකළේ ය. ඔහු ද ඒවා ඇසීමට ඇති ප්‍රියතාව එයින් පැහැදිළි විය. අස්සජී බුදුරදුන් සමඟ දුෂ්කර ක්‍රියා කළ මිතුරන් පස් දෙනාගෙන් කෙනෙකු බව ස්වස්ති දැන සිටියේය. අස්සජී ඇතුළු පිරිස මාස හයක් වෙන් වී සිට නැවත බුදුරදුන් මුණගැසුණු මොහොතේ කුමක් සිදුවීදැයි දැන ගැනීමේ අවශ්‍යතාවෙන් ස්වස්ති පසුවිය.

''ස්වස්ති, අස්සජිතුමා උරුවේලාවෙන් ගිය පසු වුණේ කුමක් ද කියා දැනගන්න ඕනෑද?'' ගෝතමී භික්ෂුණිය හරියට ස්වස්තිගේ හිත තුළ ඇති දේ දුටුවා සේ කීවාය.

''දැන් අවුරුදු දහයක් තිස්සේ අස්සජි බුදුරදුන් සමඟ සිටිනවා. ඒත් මා හිතන්නේ නැහැ ඔහු මුව වනයේ දී වූයේ කුමක්දැයි කිසි දිනෙක කියා තිබෙනවා කියලා. ස්වාමීනි අස්සජි, ඔබ වහන්සේ කැමති ද අපිට බුදුරදුන්ගේ පළමුවෙන්ම කළ ධර්ම දේශනයත් ගිය අවුරුදු දහය තුළ සිදු වූ දේ ගැනත් කියන්න?''. අස්සජි හිමි දෑත් එක් කොට ආචාර කරමින්, ''ගෝතමී මෙහෙණියනි, මට ස්වාමීනි කියා අමතන්න ඕනෑ නැහැ. අපි අද ස්වස්ති හිමියන්ගෙන් ගොඩක් උසස් දිග විස්තරයක් දැනගත්තා. දැන් භාවනා කරන වේලාව ඇවිත් තියෙන්නේ. හෙට මගේ කුටියට හැමෝටම එන්න පුළුවන් නේ ද? මා මට මතක තියන හැම දෙයක්ම කියන්නම්.''

# විසි දෙවන පරිච්ඡේදය

# දහම් සක කරකැවීම

අස්සජී මුව වනයේ තම තපස් දම් පුහුණු කරමින් කල් ගෙවීය. එක් දිනක් ඔහු සක්මන් භාවනාවට පසු ඈතින් තමන් සිටින දෙසට භික්ෂුවක් පැමිණෙමින් සිටින බව දුටුවේය. ඒ තවුසා ටිකෙන් ටික ළං වෙත්ම ඒ වෙන කවුරුත් නොව සිද්ධාර්ථ බව ඔහු දැන ගත්තේය. අස්සජී තවුසා වහාම තම යහළුවන් හතර දෙනාට සිද්ධාර්ථ තමන් කරා පැමිණෙන බව දන්වා සිටියේය.

භද්දිය සියලු දෙනාම අමතා මෙසේ කියන්ට වීය. ''සිද්ධාර්ථ විමුක්ති මාර්ගයේ මද දුරක් ගොස් අතහැරියා. ඔහු බත් කෑවා. කිරි බිව්වා. ගමේ ළමයින් සමඟ ඇසුරු කරන්න පටන් ගත්තා. ඔහු දැන් හොඳටම පහළ මට්ටමට පත් වෙලා. මම කියන්නේ අපි ඔහුට අඩු තරමින් ගරු කරන්නවත් ඕනෑ. ඔහුව පිළිගන්න උයනේ ගේට්ටුව අසලට නොයන්න. ඔහුගේ කතාව අනුමත කරමින් යහළු තවුසන් පස්දෙනාම තීරණය කළෝය. ''යම් හෙයකින් ඔහු තමන්ම මිගදාය තුළට පැමිණියොත් ඔහුට සැලකීමට හෝ අඩු තරමින් අසුනෙන් නැගී සිටීමවත් නොකරමු,'' යනුවෙන් ඔවුහු කතිකා කර ගත්හ. එහෙත් සිද්ධාර්ථ ඔවුන් වෙත පැමිණෙද්දී ඔවුන්ගේ ස්ථාවර වෙනස් වන්නට විය.

සිද්ධාර්ථ උද්‍යානයේ දොරටුවෙන් ඇතුළු වනවාත් සමඟ ඒ දර්ශනය ඔවුන්ගේ සිත්වල වෙනසක් ඇති කරවන්නට විය. තවුසන් පස් දෙනා එක් වරටම නැගී සිටියහ. සිද්ධාර්ථගේ සිරුර වටා ආලෝකයක් විහිදෙන්නේයි ඔවුනට සිතිණි. ඔහුගේ සෑම පියවර තැබීමක්ම පෙර නොදුටු විරූ විය. තවුසන්ගේ යටි සිත් තමන් සිටි ස්ථාවරවල සිටීමට තරම් ශක්තියක් ඇති නොකළේ ය. කොණ්ඩඤ්ඤ වහා දිවගොස් උන් වහන්සේගේ පාත්‍රය අතට ගත්තේය. මහානාම රැගෙන ආ පැන්වලින් උන් වහන්සේගේ දෑත් හා දෙපා දෙවීය. භද්දිය උන් වහන්සේට හිඳගැනීම සඳහා ආසනයක් පැනවීය. වප්ප තල් කොළ වටාපතක් ගෙන පවන් සලන්නට විය. කුමක් කරන්නදැයි සිතාගත නොහැකි වූ අස්සජී පසෙකින් සිටගෙන උන්නේය.

සිද්ධාර්ථ දෑත් දෙපා සොදාගෙන අවසන් බව දුටු අස්සජීට පාත්‍රය සිසිල් පැන්වලින් පුරවා පිළිහැන්විය යුතු යැයි අදහස් විය. මිතුරු තවුසන් පස් දෙනා සිද්ධාර්ථ වටා කවාකාරව බිම වාඩි වූහ. ඔවුන් දෙස ඉතා කාරුණිකව බැලූ බුදුරදුන් මෙසේ ආමන්ත්‍රණය කළේය. ''මගේ සොයුරනි, මම මාර්ගය සොයා ගත්තෙමි. ඉතින් ඔබට එය පෙන්වමි.''

අස්සජී සිද්ධාර්ථගේ වචනය අඩක් විශ්වාස කළ අතර අඩක් සැක කළේය. ඇතැම් විට අන් අයට ඇති වූ හැඟීම් ද අස්සජීගේ හැඟීම්වලට සමාන වන්නට ඇත. එක් අයකුදු කතා නොකිරීම නිසා බොහෝ වේලාවක් පැවති නිහඬතාව ඒ බව තහවුරු කළේය. අන්තිමේ කොණ්ඩඤ්ඤ නිහඬතාව බින්දේය. ''ගෞතම, ඔබ අඩක් ගොස් මාර්ගය අතහැරියා. ඔබ බත් කමින්, කිරි බොමින් හා ගැමි ළමයින් ආශ්‍රය කරමින් කාලය අපතේ හැරියා. ඉතින් දුකින් නිදහස් වීමේ විමුක්ති මාර්ගය ඔබට හමු වූවා කියන්නේ කෙසේ ද?''

සිද්ධාර්ථ කොණ්ඩඤ්ඤගේ දෙනෙත් තුළට යොමු කළ කාරුණික දෑසින් යුතුව මෙසේ ඇසීය. ''කොණ්ඩඤ්ඤ මගේ මිත්‍රය, ඔබ මාව හඳුනන්නේ ඉතා දිගු අතීතයක සිටයි. ඒ මුළු කාලයම ඇතුළත කිසි දිනෙක මා ඔබට බොරුවක් කියා තිබෙනවා ද?''

කොණ්ඩඤ්ඤ සිහිපත් කරන්නට විය. ඔහු කිසි දිනෙක එසේ කර නැත. ''ඇත්තෙන්ම සිද්ධාර්ථ, සත්‍ය නොවන කිසිවක් ඔබ කිසිම වරෙක කියා නැත.''

ඉන්පසු බුදුරදුන් කතා කළහ. ''ඉතින් අසන්න, මිතුරනි, ඒ ශ්‍රේෂ්ඨ මාර්ගය මට හමුවුණා. මා ඔබටත් එය පෙන්වන්නෙමි. පළමු වරට මගේ ඉගැන්වීමට සවන් දෙන්නේ ඔබයි. මේ ධර්මය සිතීමෙන් ලත් ප්‍රතිඵලයක් නොවෙයි. එය සෘජු අත්දැකීමෙන් ලත් ඵලයයි. ඔබේ සම්පූර්ණ සිහිනුවණ යොමා අසන්න.''

ආධ්‍යාත්මික බවින් පිරුණු සිද්ධාර්ථගේ හඬට යොමු වූ සිත් ඇති තවුස් මිතුරෝ පස් දෙන දෑත් එක් කොට ඇඳිලිබැඳ සම්බුදු මුව කමල දෙස බලා සිටියහ. කොණ්ඩඤ්ඤ සියලු දෙනා වෙනුවෙන්ම සිද්ධාර්ථ ඇමතීය. ''මිත්‍ර ගෞතම, කරුණාකර අපට අනුකම්පාව දක්වා ඒ මාර්ගය උගන්වන්න.''

බුදුරදුන් නොකැළඹුණු ශාන්ත හඬින් ආරම්භ කළේය. ''මගේ සොයුරනි, මාවතට එළඹුණ තැනැත්තා නොවැටී බේරිය යුතු දිය පහරවල් දෙකක් ඇත. පළමු දිය පහර නම් ඉඳුරන් පිනවීමට ඇති ආශාවට යටත් වීමයි. අනෙක් දිය පහර නම් සිරුරට ඇවසි දෑ නොදෙමින් පුහුණුව සඳහා දුක් දෙමින් පීඩා කිරීමයි. මේ දිය පහරවල් දෙකම විමුක්තිය සොයන තැනැත්තා පරාජය කරා ගෙන යයි. මා සොයාගත් මාර්ගය මැද මාවතයි. දිය පහරවල් දෙකින්ම වැළකුණ, අවබෝධයට, නිදහසට, සාමයට, විමුක්තියට ඇති මාවත එයයි. නිවැරදි අවබෝධය, නිවැරදි සංකල්පය, නිවැරදි වචනය, නිවැරදි ක්‍රියාකාරකම්, නිවැරදි දිවි පැවැත්ම, නිවැරදි ව්‍යායාමය, නිවැරදි සිහිය, නිවැරදි සමාධිය යන අංග අටෙන් යුතු ආර්ය මාර්ගයයි. මම මේ උතුම් ආර්ය මාර්ගයෙහි ගියෙමි. එමගින් ශාන්ත වූ, ප්‍රණීත වූ, නිදහස් වූ, සදාකාලික සුවය අත් කර ගත්තෙමි.

''පින්වත් සොයුරනි, ඇයි මා මේ මාවත නිවැරදි මාවත ලෙස හඳුන්වන්නේ? එහි කිසිදු වේදනාවක් හෝ ප්‍රතික්ෂේප කිරීමක් හෝ මඟ හැරීමක් හෝ නැහැ. එය ගැටුමට හෙවත් දුකට සෘජුව පැමිණෙන්නට හැර එය මැඩ පවත්වනවා. ආර්ය අෂ්ඨාංගික මාර්ගය යනු සැබවින්ම සිහනුවනින් යුතුව ජීවත් වීමයි. සිහි නුවණ මේ

මාර්ගයේ අත්තිවාරමයි. සිහිය හෙවත් සතිය පුහුණු කිරීමෙන් ඔබට අවබෝධය ලබාදෙන සිතේ එකඟගත්වය දියුණු කළ හැකියි. සිතෙහි නිවැරදි එකඟතාව හේතුවෙන් ඔබට ආර්ය අෂ්ඨාංගික මාර්ගය අවබෝධ කරගත හැකියි. ඒ අවබෝධය තුළින් සියලු දුක්වලට හේතුව වන ඉපදීම අවසන් කළ හැකියි.

''මා ප්‍රිය සොයුරනි, දුක, දුකට හේතුව, දුක නැති කිරීම හා දුක නැති කිරීමේ මාර්ගය යැයි උතුම් වූ සත්‍ය සතරක් පවතී. මම එයට චතුරාර්ය සත්‍ය යැයි කියමි. එහි පළමු වැන්න පවතින්නා වූ සැබෑ දුකයි. ඉපදීම, ජරාවට පත්වීම, රෝගීවීම හා මරණය යන දුක් රැසයි. සිත් වේදනාව, තරහව, ඊර්ෂ්‍යාව, පසු තැවීම, සැකය, බිය හා කැමති දෙය නොලැබීම ද දුකකි. ප්‍රියයන්ගෙන් වෙන්වීම ද දුකකි. අප්‍රියයන් හා එක්ව විසීමට සිදුවීම ද දුකකි. ආශාව, බැඳීම හා අල්ලා ගැනීම් වශයෙන් මුළු පඤ්චස්කන්ධයම දුකකි.

''පිංවත් සොයුරනි, දෙවන සත්‍යය නම් දුකට හේතුවයි. අවිද්‍යාව නිසා, මිනිසුන්ට ජීවිතය පිළිබඳ සත්‍යය දැකිය නොහැකි ය. එනිසා ඔවුහු අශාව, තරහව, ඊර්ෂ්‍යාව, ශෝකය, දුක, බිය හා මරණයේ ගිනි දැල්ලට හසු වෙති.

''සොයුරනි, තෙවන සත්‍යය නම් දුක නැති කිරීමයි. ජීවිතය පිළිබඳ සත්‍යය අවබෝධ කරගැනීම සියලු දුක් හා පසුතැවීම්වලට විරාමය ගෙන දී සාමය හා සතුට ලබා දෙයි.''

''පින්වත් සොයුරනි, සතර වන සත්‍යය නම් දුක නැති කිරීම සඳහා වන් මාර්ගයයි. මා දැන් සුළු මොහොතකට පෙර ඔබට විස්තර කළ ආර්‍ය්‍ය අෂ්ඨාංගික මාර්ගය නම් එයයි. ආර්‍ය්‍ය අෂ්ඨාංගික මාර්ගය වැඩිය හැක්කේ සිහි නුවණින් ජීවත් වීමෙනි. සිහිනුවණින් විසීම සිතෙහි එක් තැන් කිරීමට හා ඔබ සියලු දුක් වේදනාවන්ගෙන් නිදහස් කරවන අවබෝධයට මඟ පෙන්වයි. සාමය හා සතුට ඇති කරවයි. ඒ අවබෝධය ලබා ගැනීමට ඇති මාර්ගයෙහි යාමට මම ඔබට මඟ පෙන්වන්නෙමි.''

සිද්ධාර්ථ මෙසේ ආර්ය සත්‍ය සතර විස්තර කර අවසන් වෙද්දී කොණ්ඩඤ්ඤට තම හදවතෙහි මහත් ආලෝකයක් ඇති වූවාක් මෙන් දැනෙන්නට විය. ඔහුට මෙපමණ කල් සොයන ලද විමුක්තියේ රසය දැනිණි. ඔහුගේ මුහුණ ප්‍රීතියෙන් බැබළෙන්නට

විය. බුදුරදුන් කොණ්ඩඤ්ඤට සිදු වූ වෙනස වටහා ගෙන ඔහු අමතා ''කොණ්ඩඤ්ඤ ඔබ එය ලබා ගත්තෙහිය, ඔබ එය ලබා ගත්තෙහිය,'' යනුවෙන් ප්‍රීතියෙන් තෙවරක් සාදු, සාදු, සාදු යැයි ප්‍රකාශ කළේය.

කොණ්ඩඤ්ඤ දෑත් එක් කොට බුදුරජාණන් වහන්සේට පසඟ පිහිටුවා වැන්දේය. හද පත්ලෙන් නැඟී මහත් ගෞරවයෙන් යුතුව කතා කළේය. ''ගෞරවනීය ගෞතම, මා ඔබේ ශ්‍රාවකයෙක් ලෙස පිළිගන්න. ඔබේ මඟපෙන්වීම යටතේ උතුම් අවධිය ලබා ගැනීමට හැකි බව මම දනිමි,'' යැයි ප්‍රකාශ කළෝය.

අනෙත් තවුසන් සිවු දෙනා ද බුදුන්ගේ දෙපා වැන්දාහ, දෑත් නෙළුම් පොහොට්ටු මෙන් දෑත් එක් කර වැඳගත් වනම ඔවුන් ද තමන්ද උන් වහන්සේගේ ශ්‍රාවකයන් කර ගන්නා මෙන් ඉල්ලා සිටියහ. බුදුරදුන් නැඟී සිටින ලෙස ඔවුනට සන් කළහ. නැවතත් තමන් සිටි තැන්වල හිඳගත් තවුසන් ඇමතූ බුදුරදුන්, ''සොයුරනි, උරුවෙල් දනවුවෙහි ළමයින් මට 'බුද්ධ' කියා නමක් දුන්නා. ඔබ කැමති නම් ඔබටත් ඒ නමින් මා ඇමතිය හැකියි.''

''බුද්ධ යන්නෙහි තේරුම 'පිබිදුණ තැනැත්තා' යන්න නො වේද?'' කොණ්ඩඤ්ඤ ඇසීය.

'' එය ඇත්තයි. එසේම ඔවුන් මා සොයාගත් මාවත 'අවදි වීමේ මාවත කියා හඳුන්වනවා.' ඔබ ඒ නම ගැන කුමක් ද සිතන්නනේ?,''

'''අවදි වූ තැනැත්තා' 'අවදි වීමේ මාවත' පුදුමයි, පුදුමයි. ඒ නම සත්‍යයි, සරලයි. අපි ඉතාම සතුටින් ඔබට බුද්ධ කියා අමතන්නම්. ඔබ සොයාගත් මාර්ගය අවදි වීමේ මාර්ගයයි. තවුසන් පස් දෙනම එකම සිතින් ගෞතම එතැන් සිට තම ගුරුවරයා ලෙස පිළිගැනීමටත් බුද්ධ කියා ආමන්ත්‍රණය කිරීමටත් සතුටු වූහ.

බුදුරදුන් ඔවුන් දෙස බලා සිනා සී මෙසේ කීහ, ''සොයුරනි, කරුණාකර සිහියෙන් යුතුව පුහුණුවන්න. බුද්ධියේ ඇස විවෘත කිරීමට උත්සාහ කරන්න. තෙමසක් ඇතුළත ඔබට විමුක්තිය අවබෝධ කරගත හැකි වනු ඇත.'' බුදුරදුන් උන් වහන්සේගේ මිතුරන් පස් දෙනාට මඟ පෙන්වීම සඳහා ඉසිපතනයෙහි නතර විය. උන් වහන්සේගේ ඉගැන්වීම් යටතේ ඔවුහු පුහුණුව දිගටම

කළහ. සෑම දිනකම තිදෙනෙක් පිණ්ඩපාතය සඳහා පිටත්ව ගොස් හය දෙනා අතරම ඒවා බෙදා ගැනීම සඳහා නැවත ආපසු පැමිණිය හ. බුදුරදුන් එක් එක් තවුසා වෙත පෞද්ගලිකවම සොයා බලමින් ඔවුනට පුහුණුව සඳහා උදවු කළහ.

බුදුරදුන් ඔවුනට ස්කන්ධ පස ගැනත් එහි ඇති අනිත්‍ය ස්වභාවය ගැනත් ඉගැන්වූහ. රූප, වේදනා, සඤ්ඤා, සංකාර, විඤ්ඤාන යන එකිනෙක අතර හා විශ්වය සමඟ ඇති පුදුම සහගත සම්බන්ධය භාවනාව තුළින් ඔවුනට දැක ගත හැකිවිය. ඔවුන්ගේ කැප වූ උත්සාහය නිසා ඔවුන් සෑම දෙනාටම මාර්ගය අවබෝධ කරගත හැකිවිය. පළමුවෙන්ම විමුක්තිය අවබෝධ කර ගත්තේ කොණ්ඩඤ්ඤය, පසුව එකිනෙකා ක්‍රමයෙන් දෙමසක් තුළ වප්පත් බද්දියත් ඉන්පසුව මහානාමත්, අවසන අස්සජිත් අර්හත් භාවයට පත් වූහ.

භික්ෂූන් පස් දෙනා ඇමතූ බුදුරදුන්, ''දැන් අපට අපූරු කණ්ඩායමක් ඇත. අපි මේ අපේ සමූහයට සංඝ කියා කියමු. අපි සමූහය මෙතැන් පටන් විමුක්තියේ බීජ ගෙන ඒවා සෑම තැනක ම වැපිරිය යුතුයි.''

# විසි තුන් වෙනි පරිච්ඡේදය
# දහම් අමෘතය

බුදුරජාණන් වහන්සේ පුරුද්දක් ලෙස වේලාසනින් අවදි වී හිඳගෙන භාවනා කිරීමත් වනයේ ගස් අතර සක්මන් භාවනා කිරීමත් සිදු කළෝය. එක් උදයක උන් වහන්සේ සක්මන් භාවනාවෙහි යෙදී සිටිද්දී, කඩවසම් ලෙස හැඳ ගත් වයස විස්සක පමණ තරුණයෙක් මීදුමින් අඩක් මතු වී එනු දුටුවෝය. බුදුරදුන් ගල් තලාව මත හිඳගත්හ. බුදුරදුන් තවමත් නොදක හෙමින්හෙමින් ගල් තලාව අසලට ළඟා වූ ඔහු තොල් මතුරන්නට විය. ''පිළිකුල් සහගතයි, අප්‍රසන්නයි''.

බුදුරදුන් කථා කළෝය. ''පිළිකුල් කිරීමට කිසිවක් නැහැ. අප්‍රසන්න වීමට කිසිත් නැහැ.''

තරුණයා තමන් ආ මඟෙහි නතර විය. බුදුරදුන්ගේ හඬ පැහැදිළිය ශාන්තය. ඔහු හිස ඔසවා හිඳගෙන සිටි බුදුරදුන් දෙස බැලීය. සන්සුන්ය; ශාන්තය. තරුණයා සිය පාවහන් යුගල ගලවා තබා බුදුරදුන් අසල හිස බිම තබා වැන්දේය. ඉන් පසු ඔහු අසල තිබූ ගලක් මත හිඳගත්තේය.

''එතරම්ම පිළිකුල් කුමක් ද? එතරම්ම අප්‍රසන්න කුමක් ද?'' බුදුරදුන් තරුණයාගෙන් ඇසීය.

තරුණයා තමන් ''යස'' බවත්, බරණැස ඉතා ප්‍රසිද්ධ වෙළෙන්දෙකුගේ පුතා බවත් විස්තර කළේය. යස නිතරම ඉතා ප්‍රීතියෙනුත් සැහැල්ලුවෙනුත් ජීවිතය අත් විඳිමින් සිටියේය. ඔහුගේ දෙමාපියෝ ඔහුට හැම සැප සම්පතක්ම දුන්නාහ. එහෙත් සංවේදී හිතක් තිබූ යස විකෙන්ටික ජීවිතයේ කිසිඳු අර්ථයක් නැතැයි සිතන්නට විය. හැම දෙයකම ඇත්තේ හිස් බවක් යැයි ඔහුට සිතිණි. වැඩි කල් නොගොස් ඔහු ජීවිතයේ අර්ථය සෙවීමට පටන් ගත්තේය.

ඔහු වා කවුළු නැති කාමරයක සිර වූවෙක් ලෙස ඔහුට දැනෙන්නට විණි. ඔහුට සරල සාමාන්‍ය ජීවිතයේ නැවුම් සුළඟ ලැබෙන්නට එළි මහනකට යන්නට අවශ්‍ය විය. දිනකට පෙර යස සිය යහළුවන් කිහිප දෙනෙකු සමඟ කා, බී, සංගීත රස විඳ පසුව ඉතා රූමත් ගණිකාව වෙත පැමිණියේය. මධ්‍යම රාත්‍රියේ අවදි වී තම මිතුරන් සොයන්නට වූ යස අතපය දිග හැර ඉතා අශෝභන ලෙස වැතිරී නිදා සිටි වෛශ්‍යාව දුටුවේය. තව දුරටත් මේ මඟ ජීවත් විය නොහැකි යයි යසගේ සිතට තදින් කා වැදිණි. ඔහු තම කබාය ගලවා විසි කළේය. පා වහන් පැළඳගත් යස ඉදිරි දොරටුවෙන් නික්මිණි. තමා යන්නේ කොහේ දැයි නොදත් යස හිස හැරුණු අත ගියේය. රාත්‍රිය මුළුල්ලේම ඇවිද ආ ඔහුගේ වාසනාවට මෙන් ඉසිපතන මිගදාය වෙත පැමිණ සිටියේය. දූන් හිරු නැඟෙන උදයේ ඔහු බුදුරදුන් අබියසට පැමිණ සිටී.

බුදුරදුන් යසට ආමන්ත්‍රණය කළේය. ''යස මේ ජීවිතය දුක්වලින් පිරී ඇත. එහෙත් එය අසිරිමත් දෙයින් ද පිරී පවතී. අධික ලෙස ඉඳුරන් පිනවීම නිසා සිරුරේත් මනසේත් සෞඛ්‍ය පිරිහී යයි. ඔබ ආශාවලට යට නොවී සරලව ජීවත් වන්නේ නම් එයින් ජීවිතයේ බොහෝ අසිරිමත් දේ අත්දැකීමට හැකි වෙයි. යස, ඔබ අවට ඇති ගස් දෙස බලන්න. ඔබට පෙනෙනවා ද ඒවා මී දුම් මැදින් නැඟී සිටි ආකාරය? ඒවා ලස්සන නැද්ද? සඳ, තරු, ගංගා, කඳු, හිරු එළිය, කුරුල්ලන්ගේ ගී හඬ හා ගලා හැළෙන දිය ඇලි ආදී හැම දෙයකින්ම විද්‍යමාන වන්නේ විශ්වයේ අවසානයක් නැති සතුටයි.''

''මේ සෑම දෙයකින්ම අපි ලබන සතුට සිරුරත් මනසත් පෝෂණය කරයි. ඔබේ දෑස් වසා ගන්න. හොඳින් හුස්ම ගන්න.

පිට කරන්න. කිහිප වරක් මෙසේ කරන්න. දැන් දෙනෙත් හැර බලන්න. ඔබ කුමක් ද දකින්නේ? ගස්, මීදුම, අහස, හිරු කිරණ. ඔබේම දෙනෙතත් කෙතරම් ආශ්චර්යමත් ද? ඔබට එයින් අනෙකුත් අසිරියන් දැක ගත හැකියි. ඔබ ඔබේ ශරීරය පහත් කොට සලකා තිබෙනවා. සමහරුන් තම සිරුරටත් මනසටත් ගර්හා කරනවා. බොහෝ දෙනෙක් එසේ කොට සිය දිවි නසා ගන්නවා. ඔවුන් දකින්නේ ජීවිතයේ ඇති දුක් පමණයි. නමුත් දුක යනු විශ්වයේ ඇති සැබෑ ස්වභාවය නොවේ. දුක යනු ජීවිතය ගැන අපට ඇති වැරදි තේරුම් ගැනීමත් අප ජීවත් වන මාර්ගයේත් ප්‍රතිඵලයක්.''

බුදුරදුන්ගේ වචන යසගේ වියැළී ගිය හදවතට සිසිල් නැවුම් දිය බිඳු පතිත වන්නාක් මෙන් සනසවන්නට විය. ප්‍රීතියෙන් ප්‍රීතියට පත් යස බුදුරජානන් වහන්සේ ළඟ මුනින් දිගා වී වැඳ තමන්ව ශිෂ්‍යයෙකු කර ගන්නා මෙන් අයැද සිටියේය.

ඔහුට නැඟී සිටීමට උදවු කළ බුදුරදුන් මෙසේ කීහ. ''පැවිදි ජීවිතය ඉතා සරල හා නිහතමානී ජීවිතයක්. භික්ෂුවකට මුදල් නැත. තණ සෙවෙනි කළ පැළක් තුළ හෝ ගසක් යට හෝ ඔහු නිදයි. ඔහු ආහාරයට ගන්නේ පිඬු සිඟීමෙන් ලද දෙයක් පමණි. එය ද දිනකට එක් වරකි. ඔබට එවැනි ජීවිතයක් ගත කළ හැකි ද?''

''එහෙමයි ගුරුතුමනි, මම එවැනි ජීවිතයකට ඉතාම කැමතියි.''

බුදුරදුන් තව දුරටත් ඔහුට විස්තර කළහ. ''භික්ෂුව තම සිතත් සිරුරත් විමුක්තිය අවබෝධ කරගැනීම පිණිස කැප කරනවා. තමන්ටත් අන් සියල්ලන්ටත් උපකාර පිණිස කැප කරනවා. ඔහු සියලු දුකින් නිදහස් වීම සඳහා සිත එක්තැන් කොට සමාධි වැඩීමට ප්‍රයත්න දරනවා. එවැනි මාවතකට කැප වීමට ඔබට හැකි ද?''

''එසේය ගුරුතුමනි, එම මාවත අනුගමනය කිරීමට මම කැප වෙනවා.''

''එසේ නම් මම ඔබ මගේ ශිෂ්‍යයෙකු ලෙස පිළිගන්නවා. මගේ ශාසනයෙහි ශිෂ්‍යයන් භික්ෂුව හෙවත් භික්ෂාව ලබන්නා නමින් හැඳින්වෙනවා. ඔබේ පෝෂණයට අවශ්‍ය ආහාර ලබා ගැනීම සඳහාත්, නිහතමානී බව පුහුණුවටත් අන් අයට විමුක්ති මාර්ගය පෙන්වීම සඳහා ඔවුන් සමඟ සම්බන්ධව සිටීමටත් ඔබ සෑම දිනකම පිඬුසිඟා යන්න.''

මේ මොහොතේ බුදුරදුන්ගේ මිතුරන් පස් දෙනාත් බුදුරදුන්ගේ පළමු ශිෂ්‍යයාත් එකිනෙකා මුණගැසිණි. යස නැඟී සිට එකිනෙකාට ගෞරවයෙන් යුතුව ආචාර කෙළේය. බුදුරදුන් ඔවුනට යස හඳුන්වා දී කොණ්ඩඤ්ඤ දෙසට හැරිණි. ''කොණ්ඩඤ්ඤ, යස භික්ෂුවක් වීමට බලාපොරොත්තු වෙනවා. මම ද ඔහුව එසේ පිළිගත්තා. කරුණාකර ඔහුට පෙන්වා දෙන්න කෙසේ ද සිවුර පොරවන්නේ, කෙසේ ද පිණ්ඩපාතය සඳහා පාත්‍රය රැගෙන යන්නේ කියා. එසේම ආනාපානසති භාවනාව කරන ආකාරයත්, හිඳගෙන හා සක්මනින් භාවනා කරන ආකාරයත් පෙන්වා දෙන්න.''

බුදුරදුන්ට නමස්කාර කළ යස කොණ්ඩඤ්ඤ පිටුපසින් ගියේය. කොණ්ඩඤ්ඤ යසගේ හිස මුඩු කොට බුදුරදුන් අදහස් කළ පරිදි අවශ්‍ය උපදෙස් දුන්නේය. මීට පෙර කෙනෙකු කොණ්ඩඤ්ඤට පූජා කළ පාත්‍රයක් හා සිවුරක් වැඩිපුර ඔහු සතුව තිබිණි. එය ඔහු පාවිච්චි කර නොතිබිණි. එම පාත්‍රයත් සිවුරත් කොණ්ඩඤ්ඤ යසට දුන්නේය.

එදින සවස යසගේ පියා යස සොයා පැමිණියේය. උදේ සිට දවස පුරාම නිවසේ සැම කෙනෙක්ම පියාගේ නියමය මත යස සොයන්නට වෙහෙසුණහ. එක් සේවකයෙක් යසගේ පියවර සටහන් අනුව යමින් මුව වනය වෙත පැමිණියේය. ලොකු ගලක් අසල හැරදමා ගොස් තිබූ යසගේ රන්වන් පාවහන් සඟළ ඔහු දුටුවේය. සලකුණු විපරම් කළ සේවකයාට තම තරුණ ස්වාමියා මෙහි භික්ෂූන් සමඟ වෙසෙන බව දැනගන්නට ලැබිණි. ඔහු චකිතයෙන් යුතුව වහාම යසගේ පියා වෙත ගියේය.

යසගේ පියා පැමිණෙණ විට බුදුරදුන් නිසලව ගලක් මත වාඩි වී සිටියේය. දොහොත් මුදුන් තබා ගෞරවයෙන් යුතුව ඔහු බුදුරදුන්ගෙන් මෙසේ ඇසී ය. ''ගෞරවනීය හිමියනි, ඔබතුමා මගේ පුතා යස දුටුවා ද?''

බුදුරදුන් යසගේ පියාට ගල් තලය අසලින් වාඩි වන ලෙස සඤ්ඤාවෙන් ආරාධනා කළහ. ''යස පැල තුළ සිටිනවා. තව සුළු මොහොතකින් එළියට ඒවි,'' බුදුරදුන් කීහ.

යසගේ පියා බුදුරදුන් උදෑසන සිදු වූ සියල්ල විස්තර කරන අයුරු උනන්දුවෙන් අසාගෙන සිටියේය. බුදුරදුන් යසගේ

චිත්තාභ්‍යන්තරය හා ඔහුගේ අභිලාෂය වටහා ගැනීමට යසගේ පියාට උදවු කළේය. ''යස දියුණු හා සංවේදී සිතක් ඇති තරුණයෙක්. ඔහුට ඔහුගේ හදවතේ නිදහස හා විමුක්තිය හමු වී තිබෙනවා. විශ්වාසය, සතුට, සාමය මේ හැම දෙයක්ම දැන් ඔහු සතු වී තිබෙනවා. කරුණාකර ඔහු වෙනුවෙන් සතුටුවන්න,'' යි බුදුරදුන් යසගේ පියාට කීහ.

බුදුරදුන් යසගේ පියාට ද ඔහු ජීවත්වන මාර්ගයේ සිට සියලු දුක්වලින් මිදී සාමය සතුට ලබා ගන්නේ කෙසේ දැයි විස්තර කළේය. බුදුරදුන්ගේ සෑම වචනයකින්ම තම හදවත ආලෝකමත් වන ආකාරය වෙළෙන්දාට දැනෙන්නට විය. නැගිටි යසගේ පියා දෑත් එක් කොට වඳිමින් තමන් ගිහි ශ්‍රාවකයෙකු ලෙස පිළිගන්නා ලෙස බුදුරදුන් ගෙන් ඉල්ලා සිටියේය.

බුදුරදුන් මොහොතක් නිහඬව සිට කතා කළේය. ''මගේ ශ්‍රාවකයන් සරලව හා සිහිනුවණින් ජීවත් වීමට උත්සාහ ගන්නෝ යි. ඔවුහු කිසිවෙකු ඝාතනය කිරීමෙන්, කාමයෙහි වරදවා හැසිරීමෙන්, සෙස්සන් මුසාවෙන් රැවටීමෙන්, සුරාපානයෙන්, සහ සොරකමින් යන මේවායින් වැළකී සිටින්නෝ වෙති. ඔබට හැඟෙනවා නම් මෙබඳු මාවතක් අනුගමනය කරන්නට හැකියි කියා, මම ඔබ මගේ ගිහි ශ්‍රාවකයෙකු ලෙස පිළිගන්නම්.''

බුදුරදුන් අභියස දණගසා ගත් යසගේ පියා දෑත් හිස් මුදුනින් එක්කොට ගත්තේය. ''ඔබගේ දහමෙහි සරණ යන්නට මට ඉඩ දෙන්න. කරුණාකර මට මේ ජීවිතයේ මාවත පෙන්වා දෙන්න. මම මගේ මුළු දවසම කැප වෙනවා ඔබේ ඉගැන්වීම් පිළිපදින්නට,'' යි කීවේය.

බුදුරදුන් වෙළෙන්දාට ආපසු නැගී සිටීමට උදවු කළෝය. ඔවුන් වෙතට පැමිණි යස ගිහි ඇඳුම් වෙනුවට සිවුරක් පොරවා සිටියේය. ඔහුගේ හිසකෙස් කපා මුඩු කොට තිබිණි. නවක භික්ෂුව සතුටින් සිනාසී තම දෑත් නෙළුම් කැකුළක් මෙන් එක් කොට තම පියාට වැන්දේය. මහත් දීප්තියක් හා ප්‍රභාවක් යස වෙතින් පෙනෙන්ට විය. ඔහු එවැනි සතුටකින් සිටින අයුරු ඔහුගේ පියා කිසි දිනක දුටුවේ නැත. යසගේ පියා සිය පුතුට වැඳ මෙසේ කීය. ''ඔබේ මෑණියන් නිවසේ බලා සිටිනවා. ඈ ඔබ ගැන බොහෝ දුකින් සිටින්නේ.''

''ඇගේ දුක් නිවීම සඳහා මා ඇය දැකීමට යන්නම්,'' යස පිළිතුරු දුන්නේය. ''එහෙත් මම බුදුරදුන් අනුගමනය කිරීමටත්, සියලු සත්වයාට පිහිට පිණිස ජීවත් වීමටත් කැපවුණා.''

යසගේ පියා බුදුරදුන් වෙත හැරුණේය, ''ස්වාමීනි, කරුණාකර මට අවසර දෙන්න ඔබ වහන්සේටත් ඔබ වහන්සේගේ භික්ෂූන්ටත් හෙට මගේ නිවසේ ආහාර ගැනීමට ආරාධනා කරන්නට. අපි ඔබ වහන්සේට බොහෝ කෘතඥ වෙනවා අපගේ නිවසට පැමිණ විමුක්ති මාර්ගය ලබන්නට උපදෙස් දිය හැකි නම්.''

බුදුරදුන් හැරී, යස දෙස බැලීය. නවක භික්ෂුවගේ දෙනෙත් දීප්තිමතව තිබිණි. ඔහුගේ බලාපොරොත්තුව උන් වහන්සේ හඳුනා ගත්හ.

ඊ ළඟ දිනයෙහි බුදුරදුන් හා උන් වහන්සෙගේ භික්ෂූන් යසගේ දෙමාපියන්ගේ නිවසෙහි ආහාර ගත්හ. යසගේ මව සිය පුතු නිරුපද්‍රිතවත් සතුටිනුත් සිටිනු දැක වැළපෙන්නට වූවාය. බුදුරදුන් ඇතුළු භික්ෂූන්ට පැනවූ ආසනමත් හිඳ ගැනීමට ආරාධනා කෙරිණි. යසගේ මව ඇය විසින්ම ආහාර පිළිගැන්වූවාය. බුදුරදුන් හා භික්ෂූන් නිහඬව ආහාර වැළඳූහ. කිසිවෙකුත් කතා නොකළහ. නිවසේ සේවකයෙකු පවා කතා නොකළහ. ආහාර වැළඳීමෙන් පසු පාත්‍ර සෝදනු ලැබිණි. බුදුරදුන්ට නමස්කාර කළ යසගේ දෙමාපියන් බුදුරදුන් ඉදිරියෙහි වූ කුඩා බංකු මත වාඩි විණි. ගිහි ශ්‍රාවක බවෙහි පදනම වූ පංච ශීලය බුදුරදුන් ඔවුන්ට ඉගැන්වූවෝය.

''පළමු ශීලය ප්‍රාණ ඝාතයෙන් වැළකීමයි. ජීවත් වන සෑම සත්වයෙකුම මරණයට බිය ඇත්තේය. අපි අවංකවම අවබෝධයේ හා මෛත්‍රියේ මාවත අනුගමනය කරන්නේ නම් අපි මේ ශීලය සමාදන් විය යුතුමයි. අපි ආරක්ෂා කළ යුත්තේ මනුෂ්‍ය ජීවිත පමණක් නො වේ; මනුෂ්‍ය ජීවිත මෙන්ම සතුන්ගේ ජීවිතත් අප ආරක්ෂා කළ යුතුයි. මෙම ශික්ෂාව සමාදන් වීමෙන් දයාවත්, ප්‍රඥාවත් පෝෂණය වෙනවා.

''දෙවන සිල් පදය සොරකම් නොකිරීමයි. අන්සතු වස්තුවක් සොරකම් කිරීමට හෝ බලයෙන් ලබා ගැනීමට හෝ අපට කිසිදු අයිතියක් නැත. අප අන්අයට උදවු කිරීම සඳහා මාර්ගයක් සොයාගත යුතුයි.

''තෙවන ශීලය නම් වැරදි ලෙස වන කාම සේවනයෙන් වැළකීමයි. තවත් කෙනෙකු දූෂණය කිරීමට හෝ තවත් කෙනෙකුට බලහත්කාරකම් කිරීමට හෝ අයිතියක් කිසිවෙකුට නැත. නිතරම ඔබේ සහකරුවාට හෝ සහකාරියට හෝ විශ්වාසවන්ත වීමට වගබලා ගත යුතුයි.

''සිවුවන ශික්ෂාව සත්‍යය නොවන කිසිවක් නොකීමයි. තවත් කෙනෙකු රවටන අදහසින් තමා නොදන්නා පුවතක් නිර්මාණය කර නොකිව යුතුය.

''පස්වන සිල් පදය ප්‍රමාදයට හා මදයට පත් කරවන මත් බීම හෝ වෙනත් මත් ද්‍රව්‍ය හෝ නොගැනීමයි.

''ඔබ මේ පංච ශීලයෙහි හරයට අනුව ජීවත් වුවහොත්, ඔබත් ඔබේ පවුලේ අය හා ඔබේ මිතුරනුත් සියලු දුක්වලින් හා ගැටීම්වලින් වැළකී ජීවත් වේවි. ඔබට ඔබේ ජීවිතය තුළම විවිධාකාර වූ සතුට භුක්ති විඳින්නට නිමක් නැති අවස්ථා ලබා ගත හැකි වේවි.''

යසගේ මෑණියන් බුදුරදුන්ගේ වචනයට ඇහුම්කම් දී සිටිද්දී ඇගේ හදවත තුළ සතුටෙහි ද්වාරය විවෘත වන්නාක් මෙන් හැඟෙන්නට විය. සිය සැමියා දැනටමත් බුදුරදුන්ගේ ගිහි ශ්‍රාවකයෙකු බවට පත්ව ඇති බව අසන්නට ලැබීම ඇයට මහත් සතුටට හේතුවක් විය. ඇය බුදුරදුන් ඉදිරියේ දණගසා දැත් එක්කොට ගත්තාය. ඇය ද බුදුරදුන්ගේ ගිහි ශ්‍රාවිකාවක බවට පත්වූවාය.

බුදුරදුන් සමඟ උන් වහන්සේගේ භික්ෂූන් හයදෙනා ඉසිපතනය බලා ආපසු ගියහ.

## විසි හතර වන පරිච්ඡේදය

# සරණයාම

යස පැවිදි වීමේ පුවත ඔහුගේ මිතුරන් අතර ඉතා වේගයෙන් පැතිරී ගියේය. ඔහුගේ ළඟම මිත්‍රයින් වූ විමල, සුබාහු, පුණ්ණජි සහ ගවම්පති ඉසිපතනයට ගොස් ඔහු මුණගැසීමට තීරණය කළහ. ඔවුන් යන අතරතුර දී සුබාහු මෙසේ කීය. ''යස පැවිදිවීමට තීරණය කළා නම් ඔහුගේ ගුරුවරයා අනිවාර්යයෙන්ම අසාමාන්‍ය පුද්ගලයෙක් විය යුතුයි. එසේම ඔහුගේ ඉගැන්වීම් මඟ ඉතාම උසස් එකක් විය යුතුයි. යස රැවටියහැකි කෙනෙක් නොවෙයි.''

''එතරම් තදින් විශ්වාස කරන්න එපා. සමහර විට ඔහු ආශාවට පැවිදිවෙන්න ඇති. ඒ පැවිද්ද එතරම් දිගුකල් පවතින එකක් නැහැ. මාස හයකට හෝ වසරකට හෝ පසුව ඔහු පහසුවෙන්ම ඒ ජීවිතය අතහැර ඒවි,'' විමල සරදම් ලෙස කීය.

ගවම්පති ඒ මතයට එකඟ නොවීය. ''ඔබ යස ගැන හරියට දැනගෙන සිට නැහැ. මම ඔහුගේ ඉරියව් හා හැඟීම් හොඳින් දැක හඳුනාගෙන තිබෙනවා. මා දැනගෙන සිටියා ඔහු කවදා හෝ මෙවැන්නක් කරන බව.''

ඔවුනට මිගදායේ දී යස මුණගැසුණු පසු යස ඔවුන් බුදුරදුන්ට හඳුන්වා දුන්නේය. ''ගුරුතුමනි, මේ මගේ ඉතා හොඳ යහළුවන් සතර දෙනායි. කරුණාකර අනුකම්පාවෙන් ඒ අයට විමුක්ති මාර්ගයට දෙනෙත් විවර කර දෙන්න.''

තරුණයන් සිවුදෙනා සමඟ කතා කිරීම සඳහා බුදුරදුන් හිඳගත්හ. පළමුවෙන් විමල මේ මාතෘකාව පිළිබඳව කතා කළේ එතරම් විශ්වාසයකින් නොවේ. එහෙත් ඔහු බුදුන්ගේ වචන අසන තරමටම ඔහුගේ අවබෝධය දියුණු වන්නට විය. අවසානයේ ඔහු අනෙක් තිදෙනාට ''බුදුරදුන්ගෙන් අප සියලු දෙනාම පැවිදි කරන ලෙස ඉල්ලාසිටිමු,'' යැයි යෝජනා කළේය. තරුණයන් සිවුදෙනා බුදුරදුන් ඉදිරියෙහි දණින් සිට ගත්තහ. ඔවුන්ගේ අපේක්ෂාව අවබෝධ කරගත් බුදුරදුන් එහි දීම එය ඉටුකර දුන්හ. කොණ්ඩඤ්ඤට කතා කළ උන් වහන්සේ අවශ්‍ය මූලික උපදෙස් ඒ අයට ලබාදෙන ලෙස දැන්වූහ.

යසගේ සියයක් පමණ තවත් මිතුරන්ට යස හා ඔහුගේ ළඟ ම මිතුරන් පැවිදි වූ ආකාරය ඉක්මනින් දැන ගන්නට ලැබිණි. එකසිය විස්සක් වූ ඔවුන් ද උදෑසනම ඉසිපතනයට ගොස් යස මුණගැසීමට තීරණය කළහ. ඔවුන් පැමිණි බව දැනගත් යස තම මිතුරන් පිළිගැනීම සඳහා පිටතට පැමිණියේය. තමන් පැවිදි වීමට තීරණය කළ හැටි විස්තර කළ යස තම මිතුරන්ට ද බුදුරදුන්ගෙන් දහම් ඇසීමට ඉඩ සලසා දුන්නේය.

වට වූ තරුණ සමූහය මැද හිඳ සිටි බුදුරදුන් දුක් සිඳ දමන මාර්ගයත් සාමය, සැනසීම, සතුට වෙත පැමිණෙන මඟත් විස්තර කළහ. උන් වහන්සේ තමන් කළ සත්‍ය ගවේෂණය ගැනත් විමුක්ති මාර්ගය සොයා ගැනීම සඳහා තම තරුණ කාලයේ කැප වූ ආකාරයත් ඔවුන්ට කීහ. එකසිය විස්සක් වූ තරුණ පිරිස බුදුරදුන්ගේ කතාව එල්බී අසා සිටියහ. අවසානයේ එයින් පනස් දෙනෙකුට එහි දීම පැවිදි කරන ලෙස ඉල්ලා සිටියහ. අනෙත් අයට ද පැවිදි වීමට අවශ්‍ය වූ මුත් බොහෝ දෙනෙකුට තමන් සැමියෙකු හෝ පියෙකු හෝ වශයෙන් අත්හළ නොහැකිව පැවති වගකීම ඒ සඳහා ගැටලුවක් වූයේය.

යස පැවිදි වීමට අවශ්‍ය තම යහලුවන් පනස්දෙනාගේ ඉල්ලීම ඉටු කර දෙන ලෙස බුදුරදුන්ගෙන් ඉල්ලීය. බුදුරදුන් එයට

එකඟ වූහ. බුදුරදුන් වෙත එළඹි යස, ''ස්වාමීනි, ඔබ වහන්සේ අවසර දෙන්නේ නම්, මම හෙට මගේ දෙමාපියන්ගේ නිවෙස් පසුකර පිණ්ඩපාතය සඳහා යන්නම්, මගේ දෙමාපියන්ට කිව හැකියි ඔවුන් කැමති නම් සෙසු භික්ෂූන්ට සිවුරු සහ පාත්‍ර පූජා කරන්න කියා.''

මේ වන විට ඉසිපතන මිගදායෙහි බුදුරදුන් සමීපයේ භික්ෂූන් හැට නමක් විය. බුදුරදුන් තෙමසක් තම සංඝ සමූහයට මඟ පෙන්වීම සඳහා කාලය ගත කළ අතර ඒ කාලය තුළ තවත් සිය ගණනක් ගැහැනුන් හා මිනිසුන් ගිහි ශ්‍රාවක ශ්‍රාවිකාවෝ බවට පත් වූහ.

බුදුරදුන් මේ භික්ෂූන් පිළිබඳව හා ඔවුන්ගේ ශරීරය, හැඟීම්, අවබෝධය, මානසික හැඩගැසීම හා ඔවුන්ගේ සිහිනුවණ වැඩීම සඳහා පුහුණු කරන ආකාරය සිතන්නට වූහ. උන් වහන්සේ ඔවුනට සෑම දෙයකම එකිනෙකා මත රඳා පැවැත්මේ ස්වභාවය පිළිබඳව ඉගැන්වූහ. එය භාවනාව සඳහා ඉතාම වැදගත් වෙයි. ලොව සෑම දෙයක්ම තවත් දෙයක් මත රඳා පවතින බවත් කිසිවක් තනිව නොපවතින බවත් උන් වහන්සේ ඉගැන්වූහ. හේතුවක් නැතිව කිසිවක් නොපවතී. එක් දෙයක් තවත් බොහෝ දේවල පැවැත්මට හේතු වෙයි. ලොව සෑම දෙයක්ම සෑදී ඇත්තේ පස්, දිය, ගිනි හා සුළඟ යන සතර මත රඳා පැවතීමෙනි.

ශාස්තෘවරයෙකු වශයෙන් බුදුරදුන් තමන් වහන්සේගේ වගකීම දැනගෙන සිටියහ. ආදරණීය වැඩිමල් සහෝදරයෙකු මෙන් උන් වහන්සේ ඔවුන්ට මඟ පෙන්වමින් ඔවුන්ව රැගෙන ගියහ. උන් වහන්සේ ඒ වගකීම් තම පළමු ශිෂ්‍ය පස්දෙනා සමඟ ද බෙදා ගත්හ. වප්ප, භද්දිය, මහානාම, අස්සජි දස දෙනෙකු බැගින් තරුණ භික්ෂූන්ට මඟ පෙන්වද්දී, කොණ්ඩඤ්ඤ තරුණ භික්ෂූන් විසි දෙනෙකුට මඟ පෙන්වමින් කටයුතු කළේය. සියලු භික්ෂූහු උසස් හා විශාල ව්‍යාපෘතියක් සැලසුම් කරමින් විමුක්ති මාර්ගය උදෙසා ක්‍රියාත්මක කළෝය.

මේ බව දුටු බුදුරජානන් වහන්සේ සියලු සංඝයාට රැස්වන ලෙස දන්වා මෙසේ කීහ. ''මහණෙනි, කරුණාකර අසන්න. අපි සම්පූර්ණයෙන්ම නිදහස් වූවෝ වෙමු. කිසිවකින් බැඳී නැත්තෙමු. ඔබලා දැන් විමුක්ති මාර්ගය අවබෝධ කරගෙන සිටින්නෝය.

විශ්වාසයෙන්ම ඔබලා මහත් වූ උදාර ක්‍රියාදාමයක් කරනවා ඇත. ඔබ කැමති ඕනෑම මොහොතක ඔබට ඉසිපතනයෙන් නික්මී යා හැකිය. නිදහස් පුද්ගලයෙකු සේ ගමන් කරන්න. එක් මඟකින් දෙදෙනෙකු නොයන්න. අන් අයට සතුටත් සැනසීමත් සියලු දුකින් අතමිදීමත් ලබා දෙන විමුක්තියේ බීජ වපුරන්න. මුල, මැද, අග පිරිසිදුව පැහැදිළි සේම සියල්ල අන්තර්ගත වූ ධර්මය දේශනා කරන්න. දහම් පැතිරවීමෙන් ගණන් කළ නොහැකි ජනතාව ඔබේ දේශනාවේ ප්‍රතිඵල ලබනවා ඇති. මම ද තනිව උතුරු දෙසට යන්නට අදහස් කර සිටිනවා. මා බෝධි වෘක්ෂයත් උරුවෙල් දනවුවෙහි දරුවනුත් දැකීම සඳහා යාමට කැමතියි. ඉන් පසු මම මගේ විශේෂ මිත්‍රයෙකු දැකීමට රජගහනුවරට යන්න බලාපොරොත්තු වෙනවා.''

බුදුරදුන්ගේ වචනය ඇසීමෙන් පසු කහ සිවුරු පොරවාගත් විශාල පිරිසක් වූ භික්ෂූහු තම පිණ්ඩපාත පාත්‍රය පමණක් රැගෙන ධර්ම ප්‍රචාරය සඳහා පිටත් වූහ. භික්ෂූන් විසි නමක් පමණක් ඉසිපතනයෙහි ඉතිරි විය.

බොහෝ දිනකට පෙර සිට කශි හා මගධ රාජ්‍යවල ජනතාව බුදුරදුන් හා උන් වහන්සේගේ ශිෂ්‍යයන් පිළිබඳව අසා තිබිණි. ශාක්‍ය වංශයේ කුමාරයෙකු විමුක්තිය අවබෝධ කරගෙන ඒ මාර්ගය බරණැස් නුවර සමීපයෙහි ඉසිපතනයේ සිට උගන්වන බව ඔවුහු දැන සිටියහ. තවමත් නිවන් අවබෝධ කර නොගත් බොහෝ භික්ෂූහු විමුක්ති මාර්ගයෙහි ඉතා උත්සාහයෙන් යෙදෙමින් ඉසිපතනය කරා පාර සොයා එන්නට වූහ. බුදුරදුන්ගේ දහම් ඇසීමෙන් පසු බොහෝ දෙන පැවිදි ජීවිතය සඳහා කැප වූහ. ඉසිපතනයෙන් පිට වූ භික්ෂූහු තම දහම් දෙසීම් ඇසීමෙන් පසු පැවිද්ද අපේක්ෂා කළ බොහෝ ගණනක් වූ පිරිස් පැවිද්ද ලබා දීම සඳහා ඉසිපතනය කරා රැගෙන එන්නට ද වූහ. ඉතා ඉක්මනින්ම භික්ෂූන්ගේ සංඛ්‍යාව විශාල ලෙස ගණනින් වැඩෙන්නට විය. එක් දිනක් බුදුරජානන් වහන්සේ සියලු භික්ෂූන් මුව වනයට රැස්කර මෙසේ කීහ. ''මහණෙනි, තව දුරටත් පැවිදිවීමට අවශ්‍ය අය ඉසිපතනය වෙත රැගෙන ඒම කළ නොහැකියි. එනිසා ඔබ මින් ඉදිරියට යමෙකුට යම් ස්ථානයක දී පැවිදි වීමට අවශ්‍ය යැයි කිවහොත් ඒ ඒ ග්‍රාමයන්හි දීම ඔහු පැවිදි කරවීමට ඔබට අවසර

දෙමි. එසේම මමත් ඔබ මෙන් ඉසිපතනයෙන් නික්මී දහම් දෙසීම් සඳහා මෙතැන් සිට සැරිසරන්නෙමි. මෙතැන් පටන් ඉදිරියට පැවිදිවීමට අභිලාෂය ඇති අවංක වූවන් හමු වුවහොත් ඔබ කොතැනක සිටියත් ඒ ස්ථානයේම ඔබට ඔහු පැවිදි කළ හැකිය.''

කොණ්ඩඤ්ඤ විසින් නැඟී සිට බුදුරදුන්ට නමස්කාර කර ''ස්වාමීනි, කරුණාකර අපට කියා දෙන්න පැවිදි කිරීමේ උත්සවයක් සිදු කරන ආකාරය. එවිට අනාගතයේ දී අප විසින්ම එය කළ හැකිය.''

''කරුණාකර මා පෙර කළ සේම ඔබත් කරන්න,'' බුදුරදුන් පිළිතුරු දුන් සේක.

එවිට නැඟී සිටි අස්සජි හිමියන් මෙසේ කීය. ''ස්වාමීනි, ඔබ වහන්සේ පෙනුමින්ම, ගෞරව උපදවන සුළුය. ඔබ වහන්සේ පැවිදි කරද්දී විශේෂයෙන් විධිමත් උත්සව සිදු කිරීම අවශ්‍ය නො වේ. එහෙත් අප වැනි අය එබඳු විශේෂ කාර්යයක් කිරීමේ දී විශේෂිත වූ විධිමත් ක්‍රමයක් අවශ්‍ය වෙයි. කොණ්ඩඤ්ඤ සොයුර, සමහරවිට ඔබට යම් විධියක් යෝජනා කළ හැකි වේවි.''

කොණ්ඩඤ්ඤ හිමි මොහොතක් නිහඬව කල්පනා කළේය. පසුව ඔහු කතා කළේය. ''භාග්‍යවත් බුදුරජානන් වහන්ස, මම හිතන්නේ පැවිදි අපේක්ෂක තැනැත්තාට එය ලබා දීමේ දී පළමු පියවර විය යුත්තේ ඔහුගේ හිස් රැවුල් බා පිරිසිදු කරවීමයි. දෙවනුව ඔහුට සිවුරු අඳින පොරවන ආකාරය ගැන උපදෙස් ලබා දීම කළ හැකියි. චාරිත්‍රානුකූලව දකුණු උරහිස විවෘත වන පරිදි සිවුරු පෙරවූ පසු භික්ෂු සංඝයා ඉදිරියෙහි දණින් හිඳුවා භික්ෂූන් විසින් පැවිදිභාවය දිය හැකියි. බුදුරදුන් නියෝජනය කරමින් පැවිදිභාවය දෙන භික්ෂුව ඉදිරියෙහි දණින් සිට පැවිද්ද ලබා ගැනීම නිවැරදිය. පැවිදි වන තැනැත්තා තම දෑත් නෙළුම් කැකුළක් මෙන් එක් කොට තෙවරක් මෙසේ උච්ඡාරණය කළ යුතුය. මම ජීවිතයේ මාර්ගය පෙන්වාදෙන බුදුරජානන් වහන්සේගේ සරණ යමි. මම අවබෝධයේ මාර්ගය වූ ධර්මයේ සරණ යමි. 'මම සිහිනුවණින් වෙසෙන මහා සංඝරත්නය සරණ යමි.' මෙසේ තෙවරක් උච්ඡාරණය කළ පසු ඔහු සම්පූර්ණයෙන්ම බුදුරදුන්ගේ ශ්‍රාවක භික්ෂු සමූහය අතරින් එක් අයෙක් බවට පත් වෙයි. එහෙත් මෙය මගේ අඩුපාඩු සහිත යෝජනාවක් පමණයි. ගුරුතුමනි, කරුණාකර එය නිවැරදි කර දෙන්න.''

''එය ඉතාම නිවැරදියි කොණ්ඩඤ්ඤ, දැනටමත් පැවිදි වී සිටින භික්ෂු සංඝයා ඉදිරියෙහි දණින් සිටිමින් තෙවරක් බුදුන්, දහම්, සඟුන් සරණ යාමෙන් නවපැවිද්ද අපේක්ෂා කරන්නාට සම්පූර්ණයෙන් පැවිදි බව ලැබිය හැකි වන්නේය.''

මේ තීරණයට සියලු භික්ෂු සංඝයා සතුටු වූහ.

දින කිහිපයකට පසු බුදුරදුන් තමන් වහන්සේගේ සිවුර පොරවාගෙන පාත්‍රය අතට ගත්හ. ඉන්පසු උන් වහන්සේ ඉසිපතනයෙන් නික්මුණහ. එය ඇත්තෙන්ම සුන්දර උදෑසනක් විය. උන් වහන්සේ ගංගා නදිය දෙසට හැරී ගමන් කළේ මගධයට යන අදහස ඇතිවය.

## විසි පස් වෙනි පරිච්ඡේදය

# කා සෙවීම ද වඩා වැදගත්?

මින් පෙර ද බුදුරදුන් බරණැස සිට රජගහනුවර දක්වා මේ මාර්ගයෙහි ගමන් කර තිබිණි. මඟ දෙපස වනාන්තරත් ගොයමින් පිරි කෙත් යායවලත් චමත්කාරය විඳිමින් උන් වහන්සේ හෙමින් ගමන් කළහ. දහවල් වීමට පෙර උන් වහන්සේ මඟ හමු වූ කුඩා ගෙවල්වලින් පිණ්ඩපාතය ලැබීම සඳහා ගමන නතර කළහ. ලබා ගත් පිණ්ඩපාතය නිහඬ වනය තුළට ගොස් වැළඳූ උන් වහන්සේ එහිම මඳක් සක්මන් කරමින් භාවනා කළහ. සක්මන් භාවනාව අවසන් වූ පසු ගස් සෙවනෙහි වාඩි වී භාවනා කළහ. හුදකලා වනයෙහි සුන්දරත්වය උන් වහන්සේ අත් විඳින්නට වූහ. නැවතත් පැය කිහිපයක් හිඳගෙන භාවනා කරන්නට වූහ. ඉතා හොඳින් හැඳපැළඳ ගත් තරුණ පිරිසක් ඉතා කලබලයෙන් කුමක් හෝ සොයමින් එතැනින් යන්නට විය. ඔවුන්ගෙන් සමහර දෙනෙකු සංගීත වාදන භාණ්ඩ අතින්ගෙන සිටිනු දක්නට ලැබිණි. එම කණ්ඩායමෙහි නායකයා බුදුරදුන්ට ගෞරව සහිතව හිස නමා මෙසේ ඇසීය.

''භික්ෂුව, මෙතැනින් ගැහැනු ළමයෙක් දුවනවා ඔබ වහන්සේ දුටුවා ද?''

''ඇයි ඔබ ඇයව සොයන්නේ?'' බුදුරදුන් ඇසූහ.

තරුණයා ඔවුන්ගේ කතාව මුල සිට කියන්නට පටන් ගත්තේය. ඔවුහු වාරාණාසි නගරවැසි තරුණයෝ වූහ. ඔවුහු එදින උදෑසන වාදන භාණ්ඩ හා තරුණිය ද රැගෙන විනෝද වීම පිණිස වනයට ඇතුළු වූහ. ඔවුහු නටා, ගයා, කා, බී, අවසන් වූ පසු වනයෙන් එළියට විත් බිම මත වැතිරී මදක් නිදා ගත්හ. එහෙත් ඔවුන් අවදි වන විට තරුණිය ඔවුන්ගේ ආභරණ සොරකම් කොට පලා ගොස් තිබිණි. ඒ මොහොතේ සිට තවමත් ඔවුහු ඇ සොයමින් සිටිති.

තරුණයන් දෙස ශාන්ත බැල්මක් හෙළු බුදුරදුන් ඔවුන්ගෙන් මෙසේ ඇසූහ. ''මිතුරනි, මට කියන්න. මේ මොහොතේ ඔබට වඩා වැදගත් වන්නේ තරුණ ගැහැනියක සෙවීම ද, නැතහොත් ඔබ ගැන සෙවීම ද?''

තරුණයන් පිරිස තැති ගත්හ. බුදුරදුන්ගේ ප්‍රභාවිත පෙනුමත්, උන් වහන්සේගේ අසාමාන්‍ය ප්‍රශ්නයත් ඔවුන්ව ඔවුන් වෙතම නැවත රැගෙන ආහ. ''ගුරුතුමනි, මා හිතන්නේ පළමුව අපි අපව සොයා ගැනීමට උත්සාහ කළ යුතු විය හැකිය,'' පළමු තරුණයා පිළිතුරු දුන්නේය.

''ජීවිතය සෙවිය හැකි වන්නේ වර්තමාන මොහොත තුළ පමණි. එහෙත් අපේ සිත් වර්තමානයෙහි ඇත්තේ ඉතා කලාතුරකිනි. හැම විටම එය අතීතය හෝ දිගු අනාගතය හෝ ලුහුබඳිමින් සිටිනවා. අපි සිතනවා අපි සිටින්නේ අප සමගමයි කියා. නමුත් ඇත්තෙන්ම අප අප සමඟ පවතින නියම සම්බන්ධතාවකින් යුතුව කොහෙත්ම නැහැ. අපේ සිත් නිතරම බොහෝ කාර්ය බහුලව සිටින්නේ ඊයේ මතක හෝ හෙට දවසේ සිහින හෝ ලුහුබඳිමිනි. ජීවිතය සමඟ සම්බන්ධව සිටීමට නම් ඇත්තේ එකම මාර්ගයයි. එය නම් වර්තමාන මොහොතට ආපසු පැමිණීමයි. ඔබෙන් කෙනෙක් දන්නේ නම් වර්තමාන මොහොතට පැමිණෙන්නේ කෙසේ ද කියා, ඔබ අවදි වූවකු, අවබෝධයට පැමිණි තැනැත්තෙකු වන්නේය. එසේම ඒ මොහොතේ ඔබට හමු වේවි සැබෑ ඔබ කවුද කියා.''

බුදුරදුන් විමුක්ති මාර්ගය, චතුරාර්ය සත්‍යය හා අර්ය අෂ්ඨාංගික මාර්ගය විස්තර කළහ. තරුණයෝ ඉතා උනන්දුවෙන් යුතුව අසා සිටියහ. බුදුරදුන් කතා කර අවසන් වන විට සියලුම

දෙනා දණින් වැටී තමන් ශිෂ්‍යයන් ලෙස පිළිගන්නා මෙන් ඉල්ලා සිටියහ. බුදුරදුන් ඔවුන් සැම දෙනාම පැවිදි කළහ. පසුව උන් වහන්සේ ඔවුනට ඉසිපතනය බලා යන ලෙසත් එහි සිටින කොණ්ඩඤ්ඤ හිමියන් මුණගැසී තමන්ට විමුක්ති මාර්ගය පුහුණු කිරීමට මඟ පෙන්වූයේ කවුදැයි ඔහුට දන්වන ලෙසත් උපදෙස් දුන්හ. වැඩි කාලයක් නොගොස් තමන් වහන්සේ ඔවුන් නැවතත් මුණගැසෙන බව ද බුදුරදුන් ඔවුනට කීහ.

එදින රාත්‍රියේ බුදුරදුන් වනාන්තරය තුළ තනිව නිදා ගත්තේය. පසු දා උදෑසන ගංගා නදිය තරණය කළ උන් වහන්සේ උතුරු දෙස බලා ගමන් කළහ. රජගහනුවර බිම්බිසාර රජු දැකීම සඳහා යාමට පෙර උරුවෙල් දනව්වෙහි කුඩා දරුවන් දැකීමට උන් වහන්සේට අවශ්‍ය විය.

# විසි හය වන පරිච්ඡේදය

# උරුවේල කාශ්‍යප

දින හතකට පසු බෝධිවෘක්ෂය පිහිටි වනයට පැමිණීමෙන් බුදුරදුන්ගේ සිතට සතුටක් දැනිණි. උන් වහන්සේ එදින රාත්‍රිය එහි විවේක ගත්හ. උදෑසන අනපේක්ෂිතව ස්වස්ති ගං ඉවුරෙහි සිටිනු බුදුරදුන් දුටුවෝය. ගවයන්ට අවශ්‍ය තණකොළ කැපීම කළ යුතු බව බුදුරදුන් ස්වස්තිට කියන කෙත්ම ඔවුහු හුදකලා ගං ඉවුරෙහි බොහෝ වේලාවක් වාඩි වී සිටියහ. උන් වහන්සේ ද ස්වස්තිට තණකොළ ටිකක් කැපීමට උදවු කළහ. ඉන් පසු බුදුරදුන් ස්වස්තිගෙන් සමුගෙන පිණ්ඩපාතය සඳහා ගම දෙසට වැඩම කළහ.

ඊළඟ උදයේ ගැමි ළමයින් බුදුරදුන් දැකීම සඳහා වනයට පැමිණියහ. ස්වස්තිගේ පවුලේ සැම දෙනම එහි වූහ. සුජාතා ඇගේ යහළුවන් සියලු දෙනාවම කැඳවාගෙන විත් තිබිණි. බුදුරදුන් නැවත දැකීමට හැකි වීම නිසා ළමයින් සැම දෙනාම බොහෝ සෙයින් සතුටට පත්ව සිටියහ. පසුගිය අවුරුද්දේ තමන්ට අත්දකින්නට සිදුවූ සියලු විස්තර බුදුරදුන් පවසද්දී ඔවුහු ඉතා රසවත්ව හා උනන්දුවෙන් ඒවා අසා සිටියහ. සවස්තිට වයස අවුරුදු විස්ස පිරුණු පසු ඔහුව පැවිදි කරවන බවට බුදුරදුන්

පොරොන්දු වී තිබිණි. ඒ වන විට ඔහුගේ සහෝදර සහෝදරියන් ද තමතමන් ගැන බලා ගත හැකි තරම් පමණට වැඩී සිටිනු ඇත.

පසුගිය මාස කිහිපය තුළ බ්‍රාහ්මණයෙකු විසින් පිහිටුවන ලද පූජක සංවිධානයක් ඒ අසල ඇති බව ළමයින් බුදුරදුන්ට කීහ. ඔවුහු සියලුදෙනා අතර පන්සියයක පිරිස වූහ. ඔවුහු භික්ෂූන් මෙන් කෙස් නොකැපූහ. ඒ වෙනුවට කොණ්ඩය එක් කොට හිස් මුදුණින් බැඳ ගත් අතර හිසවටා ජටාවක් බැන්දාහ. ඔවුහු ගිනි දෙවියන්ට වැඳීම්පිදීම් කළහ. ප්‍රධාන බ්‍රාහ්මණයා ''කාශ්‍යප'' නම් විය. ඔහුව මුණගැසෙන හැම කෙනෙක්ම ඔහුට ඉතාම ගරුබුහුමන් දැක්වූහ.

පසුදින උදයේ ගඟින් එතෙර වූ බුදුරජානන් වහන්සේට කාශ්‍යප ආචාර්යවරයාගේ පිරිස මුණගැසිණි. ඔහුගේ ශ්‍රාවකයෝ කොළඅතු සෙවිලි කළ කුඩා මැටි පැල්පත්වල ජීවත් වූහ. ගස්වල පොතුපට්ටාවලින් සකස් කරගත් ඇඳුම් ඇන්දාහ. ඔවුහු පිඬු පිණිස ගමට ඇතුළු නොවූහ. එහෙත් ගැමියන් යමක් ඔවුන් වෙත රැගෙන විත් පිළිගැන්වීමේ බලාපොරොත්තුවෙන් සිටියහ. එසේ ම ඔවුහු බිලිදීම හා ආහාර පිණිස සතුන් ඇති කරන්නට ද වූහ. කාශ්‍යප වේදයෙහි පරතෙරට පත් කෙනෙකු බවත් දැහැමි බවෙහි උපරිමත්වයට පත්ව ජීවත් වන බවත් කාශ්‍යපගේ එක් අනුගාමිකයෙක් බුදුරදුන්ට කීහ. උන් වහන්සේ ඔහු සමඟ කතා කිරීමට නතර වූහ. කාශ්‍යපගේ බාල සහෝදරයන් දෙදෙනෙකු ද ගිනි දෙවියන් පිදීමේ ආගමික නායකයන්ව සිටින බව ද ඔහු බුදුරදුන්ට විස්තර කළේය. විශ්වයේ නියම සාරය ස්වභාවය බවට පත්වීම සඳහා සහෝදරයන් තිදෙනාම එම ගින්දර නොනිවා පවත්වාගෙන යති. උරුවේල කාශ්‍යපට ඔහුගේ සොහොයුරන් දෙදෙනා ඉතාමත් ආදරයෙන් සිටිති. තුන්සියයක කණ්ඩායමක් සහිත වූ නදී කාශ්‍යප නේරංජනා නදිය අසබඩම ජීවත් වී සිටියේය. ගයා කාශ්‍යප ද ගයාවෙහි ජීවත් වූ අතර ඔහුගේ කණ්ඩායම දෙසියයකින් සමන්විත වූහ.

කාශ්‍යපගේ ශිෂ්‍යයා බුදුරදුන්ට සිය ආචාර්යවරයාගේ කුටියට යාමට ඉඩ දුන් පසු උන් වහන්සේට ඔහු සමඟ කතා කරන්නට ලැබිණි. කාශ්‍යප තරුණයෙකු නොවූවත් කඩිසර හා දක්ෂ කෙනෙකු විය. ඔහු මේ අසාමාන්‍ය ගුරුවරයාගේ ස්වභාවය දැකීමෙන් පසු උන් වහන්සේ විශේෂ අමුත්තෙකු ලෙස දැනෙන්නට

විය. වහවහාම අවශ්‍ය සැලකිලිසත්කාර කරන්නට විය. කාශ්‍යප බුදුරදුන්ට පැල් පතින් පිටතට ගොස් නිදහසේ වාඩි වී ටික වේලාවක් කතාකරමින් සතුටු වීමට ආරාධනා කළේය. දිගු වේලාවක් යන තෙක් ඔවුහු සාකච්ඡා රසය වින්දාහ. වේදය ගැන බුදුරදුන්ට තිබූ ගැඹුරු දැනුම පිළිබඳව කාශ්‍යප මහත් පුදුමයට පත් විය. මේ තරුණ භික්ෂුව වේදය ගැන තමා දන්නා දෙයටත් වඩා එහි අඩංගු බොහෝ සංකල්ප ග්‍රහණය කරගෙන තිබීම පිළිබඳව අනාවරණය වීමෙන් ඔහු තවතවත් මවිතයට පත් විය. අතර්වේදය හා ඍග් වේදයහි අඩංගු බොහෝ කරුණු කාශ්‍යප දන්නේ යැයි සිතා සිටියත් තමන් එය නොදන්නා බව බුදුරදුන් ඒ පරිච්ඡේද විස්තර කරද්දී ඔහුට අවබොධ විය. බුදුරදුන් ඔහුට එහි අඩංගු සංකල්ප අවබෝධ කර ගැනීමට උදවු කළහ. මේ තරුණ භික්ෂුවට තිබූ බ්‍රාහ්මණ ඉතිහාසය ගැන, එහි සිද්ධාන්ත ගැන හා බ්‍රාහ්මණ සිරිත්විරිත් ගැන දැනුම කාශ්‍යප ඊටත් වඩාත් පුදුමයට පත් කරවන්නට හේතු විය. උරුවේල කාශ්‍යප එදින දහවල් ඔහු සමඟ ආහාර ගැනීම සඳහා කළ ආරාධනාව බුදුරදුන් පිළිගත්හ. බුදුරදුන් ඉතා පිළිවෙළට උන් වහන්සේගේ සඟළ සිවුර සතරැස්ව නවා ඒ මත හිඳගත්හ. ආහාර ගනිද්දී සිහිනුවණින් හා නිශ්ශබ්දව ආහාර ගත්හ. බුදුරදුන්ගේ ශාන්තභාවය ආදී සෑම ඉරියව්වක්ම තදින් කාශ්‍යපගේ සිතෙහි කා වැදිණි. ඔහු ද නිශ්ශබ්දතාව නොකඩා ආහාර ගත්තේය.

දහවල් ආහාරයෙන් පසුවත් ඔවුන්ගේ සාකච්ඡාව දිගටම කරගෙන ගියහ. ''කාශ්‍යප ආචාරීනි, ඔබට පුළුවන් ද මට විස්තර කර දෙන්න, කෙසේ ද ගිනි දෙවියන් පිදීම සත්වයා සියලු දුක්වලින් මුදවා විමුක්තිය කරා රැගෙන යන්නේ කියා?''

උරුවේල කාශ්‍යප එක්වරටම පිළිතුරු නොදුන්නේය. මේ අසාමාන්‍ය භික්ෂුවට එහෙන් මෙහෙන් දෙන සාමාන්‍ය පිළිතුරක් ප්‍රමාණවත් නොවන බව ඔහු ඉතා හොඳින් දැන ගත්තේය. විශ්වයේ මූලික හරය ගින්න බව විස්තර කරමින් කාශ්‍යප පිළිතුරු දීමට පටන් ගත්තේ එහෙයිනි. "ගින්නේ ප්‍රභවය බ්‍රහ්මගෙනි. ගිනි දෙවියන් පුදනුවන්ගේ ප්‍රධාන පූජාසනයේ නිතරම ගිනි දැල්වෙමින් පවතිනවා. ඒ ගින්දර බ්‍රහ්මයා විසින් මවන ලද්දක්. අතර්වේදයෙහි ගිනි පිදීම පිළිබඳව කියා තිබෙනවා. අග්නිය යනු ජීවයයි. ගින්දර නොමැතිව ජීවයක් තිබිය නොහැකියි. ආලෝකය හා උණුසුම

යනු ගින්නයි. හිරුගේ සාරය වූ ගින්නෙන් ගස්වැල්වලට, සතුන්ට, මිනිසුන්ට ජීවය ලැබෙයි, එය අඳුරු සෙවනැලි පළවා හරියි. දැඩි සීතල පරාජය කරනු ලබයි, සියලු ජීවීන්ට ජීවයත් සතුටත් ගෙන දෙයි. ආහාර කෑමට හැකි තත්වයට පත් කරවන්නේ ගින්නෙනි. එබැවින් ගින්නට කෘතඥ විය යුතුය. මරණය මිනිසුන් නැවතත් බ්‍රහ්මයා සමඟ එකතු කරවයි. මක්නිසාද අග්නි යනු ජීවයය; බ්‍රහ්මයි. අග්නි යනු ගින්නෙහි දෙවියායි, බ්‍රහ්මගේ දහසක් මැවුම් අතරින් එකකි. ගිනි පූජාසනය මත අග්නි හිස් දෙකක් විද්‍යමාන කරයි. එක් හිසක් ගින්නෙහි නිරතුරු භාවිත කිරීම සළකුණු කරයි. අනෙත් හිස යාග කිරීම හා බ්‍රහ්ම සහව්‍යතාව සළකුණු කරයි. ගිනි දෙවියන් වන්දනා කරන්නන් විසින් යාග විදි හතලිහක් සිදු කරයි. පූජක පිරිස යම් දිනක විමුක්තියට පමුණුවන මාවත අනුගමනය කිරීම සඳහා දැඩි සදාචාරාත්මක පුහුණුව, කැප වීමෙන් පූජා විධි කිරීම අපේක්ෂා කරනවා,"

බ්‍රාහ්මණයන් සමාජයේ තම බලය පාවිච්චි කරමින් ධනය අත්කර ගැනීම හා ඒවා නාස්ති කිරීමත් පස්කම් සැප පසුපසු හඹා යාමත් සම්බන්ධයෙන් කාශ්‍යප දැඩි විරෝධයකින් සිටියේය. ඔහු කීවේ එවැනි බ්‍රාහ්මණයන් කටයුතු කරන්නේ සැප විඳීමත් ධනවත් වීමත් සඳහා පමණක් බවයි. ඒ කාරණය නිසාම සාම්ප්‍රදායික බ්‍රාහ්මණික කීර්තියත් මාර්ගයත් කෙලෙසී ඇත.

''කස්සප ආචාරීනි, ඔබ කුමක් ද සිතන්නේ ජලය අදහන අය ගැන. ඔවුන් ජීවයේ හරය ලෙස සලකා තරයේ ම ඒ ඇදහීම කරගෙන යනවා. කවුරුන් ද කියන්නේ එයින් ආත්මය පිරිසිදු කර නැවත බ්‍රහ්ම සහව්‍යතාවට ගෙන යනවා කියා,?"

කාශ්‍යප චකිතයට පත් විය. මේ මොහොතේත් ගංගානම් ගඟෙහි හා වෙනත් පූජනීය ගංගාවල පාරිශුද්ධත්ව ලැබීම සඳහා ස්නානය කරන සිය දහස් ගණන් මිනිසුන් ඔහුට සිහිපත් විය.

''ගෞතම, එක් අයෙකුට හෝ විමුක්තිය ලැබීම සඳහා උදවු කිරීමට ඇත්තෙන්ම ජලයට නොහැකිය. ස්වභාවයෙන්ම ජලය ගමන් කරන්නේ පහළටයි. ඉහළට නැඟෙන්නේ ගින්දර පමණයි. ගින්දරට ස්තුති වන්නට අප මළ පසු අපේ සිරුර දුම් මඟින් ඉහළට ගෙන යනවා.''

''කාශ්‍යප ආචාරීනි, එය සත්‍යය නොවෙයි. ඉහළින් පාවෙන සුදු වලාකුළු ද ජලයෙහි ස්වභාවයයි. මෙසේ ජලය ද

ඉහළට නැඟෙනවා. ඇත්තෙන්ම දුමම වාෂ්ප වන ජලයට වැඩි යමක් නොවෙයි. වලාකුළු හා දුම යන දෙකම අවසානයේ එකම ජලයේ ස්වභාවයට පත් වෙනවා. මට විශ්වාසයි ඔබට වැටහෙනවා කියා, 'සෑම දෙයක් ම චලනය වන චක්‍රයක් බව,'

''නමුත් සෑම දෙයක්ම මූලික ස්වභාවයෙහි කොටසක් ලෙස සෑදී නැවත මූලික ස්වභාවයටම පත් වෙනවා.

''කස්සප ආචාරීනි, ලෝකයෙහි ඇති සෑම දෙයක්ම එහි පැවැත්ම සඳහා සෙසු සියල්ලෙහි උපකාරය ලබයි. මේ මගේ අත ඇති කොළය උදාරහණයක් ලෙස සිතන්න. මහ පොළොව, ජලය, උණුසුම, බීජ, ගස්, වලාකුළු, හිරු, කාලය, අවකාශය යන සෑම දෙයක්ම මේ කොළයෙහි පැවැත්මට උපකාරීව සම්බන්ධ වී ඇත. අඩුතරමින් මේ කී සියල්ලෙන් එක් දෙයක් හෝ නොලැබුණහොත් මේ කොළයෙහි පැවැත්ම නැති වන්නේය. ජීවී අජීවී සියලුම දේ එකකටඑකක් සම්බන්ධ හේතු හා ඵලයන්ගෙන් යුක්ත වූ ක්‍රියාදාමයක්. එක් දෙයක මුල් සිද්ධාන්තය අනෙක් සෑම දෙයක්මය. කරුණාකර මෙය ප්‍රවේශමෙන් සිතා බලන්න. ඔබට පෙනෙනවා ද, මගේ මේ දුන් අතෙහි ඇති කොළය විශ්වයේ ඇති ඔබගේ සිහි නුවණින් සිටීම ද ඇතුළුව සියලු සංසිද්ධිවල එකට කාවැදීමේ ප්‍රතිඵලය නිසා වූවක් බව?''

මේ වන විටත් සන්ධ්‍යා සමය පැමිණ තිබූ බැවින් අඳුර පැමිණීම ආරම්භ වෙමින් පැවතියේය. බුදුරදුන්ට තමන් සමඟ තම අසපුවෙහි නිදා ගැනීමට කාශ්‍යප ආරාධනා කළේය. මීට පෙර ඔහු වෙනත් කිසිවෙකුට යමක් පිළිගැන්වූ අවස්ථා බොහෝ විය. නමුත් ඔහුට මෙබඳු අසාමාන්‍ය භික්ෂුවක් මුණගැසුණු ප්‍රථම අවස්ථාව මෙය විය. නමුත් බුදුන් වහන්සේ තමන් තනිවම රාත්‍රී නිදා ගැනීම පුරුදු කර ඇති බව කියමින් එම ඉල්ලීම ප්‍රතික්ෂේප කළහ. ගිනි පූජා හලෙහි නිදා ගැනීමෙන් ඔබට කරදරයක් නො වේ නම් මා එහි නිදා ගැනීමට කැමති බව උන් වහන්සේ කීය.

එයට පිළිතුරු දුන් කාශ්‍යප ''දින කිහිපයකට පෙර ඉතා විශාල නාගයෙක් ගිනි පූජා හලෙහි රැකවරණයට ආවා. ඌ ඉවතට එළවා දැමීමට ගත් සියලු ප්‍රයත්න අසාර්ථක වුණා. මිත්‍ර ගෞතමයිනි, ඔබ එහි නිදා ගැනීම භයානකයි; එය මහත් ම අනතුරුදායකයි. අපි එහි කවදාවත් යන්නේ නැහැ. සර්පයාට ඇති බිය නිසා

පූජාව පවා පවත් වන්නේ පූජා හලෙන් පිටතයි. කරුණාකර ඔබේ ආරක්ෂාව ගැන සිතා මගේ පැල තුළ නිදා ගන්න.''

''කණගාටුවෙන්න එපා, මම එහි නිදාගන්න කැමතියි. එයින් මට කිසිදු අනතුරක් වෙන්නේ නැහැ,'' යි බුදුරදුන් පිළිතුරු දුන්හ.

මහ කැලය මැද උන් වහන්සේ විමුක්තිය ලැබීම සඳහා කළ පුහුණු වීම් පිළිබඳව සිහිපත් කළහ. වන සතුන් කිසිදු කරදරයක් නොකර උන් වහන්සේව පසුකර ගියහ. හිඳගෙන භාවනා කරන ඇතැම් අවස්ථාවල විශාල සර්පයන් උන් වහන්සේගේ ඉදිරියෙහි සිටිනු දක්නට ලැබිණි. එවැනි සතුන්ට බිය නොවන්නට වගබලා ගන්නේ නම් ඔවුන්ගෙන් කිසිදු විපතක් නො වන බව උන් වහන්සේ දැන සිටියෝය.

බුදුරදුන් වැළැක්වීමට නොහැකි බව දුටු කාශ්‍යප, ''ඔබට අග්නි පූජා හලෙහි නිදා ගැනීමට අවශ්‍ය නම් නිදා ගන්න. කැමති රාත්‍රී ගණනක් එහි ගත කිරීමට ඔබට හැකියි,'' කීය.

එදින රාත්‍රියේ බුදුරදුන් අග්නි පූජාහලට ඇතුළු විය. මැද පිහිටි පූජාසනය මත පන්දම් බොහෝ ගණනකින් යුතු ශුද්ධ ගින්න දල්වෙමින් පැවතියේය. එළිමහනේ පූජා උත්සව සඳහා ගැනීමට තිබූ විශාල සඳුන් කඳන් සමූහයක් කාමරයේ එක් පසෙකින් ගොඩගසා තිබිණි. ස්ථිර වශයෙන්ම සර්පයා මේ ලී කොටන් අතර දරණ ගසා ඇතැයි බුදුරදුන් අනුමාන කළේය. එබැවින් උන් වහන්සේ කාමරයේ අනිත් පැත්තෙහි තමන් වහන්සේගේ සඟළ සිවුර නවා බිම එලා භාවනාව සඳහා වාඩි වූහ. රාත්‍රියේ බොහෝ වේලාවක් උන් වහන්සේ භාවනා කළහ. භාවනාව අවසන් වන විට සර්පයා දඟරයක් මෙන් දරණය ගසා කාමරය මැද තමන් දෙස බලා ගෙන සිටින බව උන් වහන්සේ දුටුවේය. බුදුරදුන් ඉතා මෘදුව ඌට කතා කළහ. ''යාළුවා, ඔබේ ආරක්ෂාව සඳහා ආපසු කැලයට යන්න.''

බුදුරදුන්ගේ හඬ ආදරයෙනුත්, කරුණාවෙනුත් පැහැදිලි බව්නුත් පිරී තිබිණි. සර්පයා හෙමින් හෙමින් උගේ දරණය දිග හරිමින් දොරින් එළියට නික්මුණේය. බිම එළූ සිවුර මත භාන්සි වූ බුදුරදුන් නින්දට ගියෝය.

උන් වහන්සේ අවදි වන විට දීප්තිමත් හඳ එළිය ජනේලය තුළින් උන් වහන්සේ නිදා සිටි තැනට වැටී තිබිණි. සඳ එළිය ඉතා සුන්දරව තිබිණි. මේ එළිය සක්මන් භාවනාව සඳහා කෙතරම් සුදුසුදැයි උන් වහන්සේට සිතිණි. තම සිවුරෙහි දූහුවිලි ගසා දැමූ උන් වහන්සේ එය ඉදිරියෙන් තබා පූජා හලෙන් පිටතට පැමිණියෝය.

එළිවීමට පැයකට පමණ පෙර කිසියම් අයුරකින් අග්නි පූජා හලට ගිනි ඇවිලී තිබිණි. එය දුටු පළමු තැනැත්තා සෙසු අයට කෑගසා අඬගැසුවේය. සැම කෙනෙක්ම ගඟෙන් වතුර පුරවාගත් භාජන ගෙනැවිත් ගින්න නිවීමට උත්සාහ කළහ. එහෙත් එය සාර්ථක වුයේ නැත. අවසානයේ පන්සියයක් දෙනාට පූජා හල අළු බවට පත් වී පොළොවට සමතලා වන අයුරු බලා සිටීම හැර වෙන කිසිවක් කළ හැකි වුයේ නැත.

උරුවේල කාශ්‍යප සිය පිරිසත් සමඟ නැඟී සිටියෝය. ඔහුගේ හදවතට මහත් බරක් දැනිණි. ඔහුට ඉතා සත්ගුණ ඇති නිපුණත්වයෙන් පිරි ඒ තරුණ භික්ෂුව සිහිපත් විණි. ඔහුට ඒ භික්ෂුව හමු වී එක් දිනක් වූවා පමණය. ස්ථිරවම ඒ යහපත් භික්ෂුව රාත්‍රී ගින්නෙන් දැවී යන්නට ඇත. තමන් කී දේ අසා ගෞතම ඊයේ රාත්‍රියේ තම පැලෙහි නිදා ගත්තා නම් අදටත් ඔහු ජීවතුන් අතර සිටිනවා නොවේ දැයි කාශ්‍යපට සිතිණි. ඔහු මෙසේ සිතනවාත් සමඟම බුදුරජානන් වහන්සේ ඔහු ඉදිරියට පැමිණියෝය. උන් වහන්සේ සක්මන් භාවනා කරමින් කන්දෙහි ඇවිදින අතර ගිනි ඇවිලෙන අයුරු දුටුවෝය. යම් හෝ උදවුවක් විය හැකි යයි සිතා උන් වහන්සේ ආපසු එතැනට පැමිණියෝය.

සිතේ ඇති වූ සැනසිල්ලෙන් හා සතුටින් යුතු කාශ්‍යප දිවගෙන විත් බුදුරදුන්ගේ අත අල්ලා ගත්තේය. ''දෙවියන්ට ස්තුතිවේවා! මිත්‍ර ගෞතම, ඔබ ජීවතුන් අතර. ඔබට කිසිදු කරදරයක් වී නැහැ. මට දැනෙන්නේ ඉතා විශාල සතුටක්.''

බුදුරදුන් කරුණාවෙන් බ්‍රාහ්මණයාගේ අතත් උරහිසත් අල්ලා ගෙන සිනා සුණහ. ''ඔබට බොහෝම ස්තුතියි මිත්‍රය. ඇත්තෙන් ම මට කිසිදු කරදරයක් නැහැ.''

උරුවේල කාශ්‍යප සිය අනුගාමිකයන්ට එදින දේශනයක් කිරීමට සූදානම් වන බව බුදුරදුන් දැන සිටියෝය. අවසානයේ අසල ගම්වලින් දහසක් දෙනා එක් රැස් වන්නට විය. දහවල් ආහාරයට පසුව දේශනය පැවැත්වීමට නියමිත වී තිබිණි. දහවල් පිණ්ඩපාතය සඳහා ගම කරා ගිය බුදුරජානන් වහන්සේ ලබා ගත් ආහාර රැගෙන නෙළුම් විල අසලට ගියෝය. දහවල් ආහාරය ගත් උන් වහන්සේ තමන් කැමති පරිසරය වූ ඒ විල අසල ටික වේලාවක් ගත කළෝය.

දහවල් කාලය ගතවෙද්දී උරුවේල කාශ්‍යප බුදුරදුන් සොයා පැමිණියේය. බුදුරදුන් නෙළුම් විල අසල සිටිනු දුටු කාශ්‍යප ''මිත්‍ර ගෞතමයිනි, අප දහවල් ආහාරය සඳහා ඔබ පැමිණෙන තුරු බලා සිටියෙමු. ඇයි ඔබ අප සමඟ ආහාර ගැනීමට නො පැමිණියේ?'' යි ඇසුවේය. තමන් වහන්සේ දේශනය අවස්ථාවට සහභාගී නොවන බව උන් වහන්සේ පිළිතුරු දුන්නේය.

''ඇයි ඔබ දේශනයට සහභාගී නොවන්නේ?'' යි උරුවේල කාශ්‍යප ඇසුවේය.

බුදුරදුන් කාරුණිකව සිනාසුනා පමණකි. බ්‍රාහ්මණයා කිසිවක්ම කීවේ නැත. තම සිතෙහි ඇති දේ බුදුරදුන් තේරුම්ගෙන ඇති බව කාශ්‍යපට වැටහිණි. ගෞතම කෙතරම් ඥාණවන්ත කෙනෙක්දැයි ඔහුට සිතිණි.

නෙළුම් පොකුණ අසලින් වාඩි වූ ඔවුහු කතාබහට වැටිණි. ''ඊයේ ඔබ කිවුවා ඔබ අත තිබූ කොළය විවිධ වෙනස් තත්වවල ප්‍රතිඵලයක් බව. මනුෂ්‍යයාගේ පැවැත්මත් විවිධ තත්වවල හේතු නිසා සිදුවන බවත් කිවුවා. එහෙත් මේ සියලු තත්වවල නැවතීමෙන් පසු ඒ සියල්ල යන්නේ කොතැනකට ද?''

බුදුරජානන් වහන්සේ පිළිතුරු දුන්හ. ''බොහෝ කලක් තිස්සේ මනුෂ්‍යයා ආත්ම යන මතයෙහි පැටලී, සිරවී සිටියා. සදාකාලික ආත්මයක් ඇතැයි විශ්වාස කළා. අපි එය විශ්වාස කළේ අපේ ශරීරය මිය ගිය විට එය සදාකාලික ආත්මය හා එක්වීම හෙවත් බ්‍රහ්ම සහව්‍යතාවට යන ලෙසයි. එහෙත් යහළු කස්සපයිනි, එය පරම්පරාවෙන් පරම්පරාවට, ගිනිය නොහැකි පරම්පරා ගණනක් තිස්සේ දිගටම ආ වැරදි වැටහීමකි.

''ඔබ වටහාගත යුතුයි මිත්‍ර කාශ්‍යප, සියල්ල පවතින්නේ සියල්ලෙහිම එකිනෙකට ඇති සම්බන්ධය හෙවත් හේතුඵල ධර්මතාව මතයි. ඒ හේතුඵල සම්බන්ධය නැති වීමෙන් ඒ හැම දෙයකම නැවතීම හෙවත් අවසානය ද සිදු වෙනවා. මෙය ඇත්තේ එය නිසයි. එය නැති නම් මෙය ද නැත. මෙය ඉපදුනේ එය ඉපදුණ නිසයි. එය මැරුණු විට මෙය ද මැරෙයි. මම මගේ භාවනාවෙන් අවබෝධ කර ගත් සොබාදහමෙහි පවතින ආසිරිමත් නීතිය මෙයයි. සත්‍ය වශයෙන්ම වෙනස් වූ හෝ සදාකාලික වූ හෝ කිසිවක් නැත. උසස් වූ හෝ පහත් වූ හෝ ආත්මය යැයි ගත හැකි දෙයක් නැත. කාශ්‍යප ඔබ කවදා හෝ ඔබේ ශරීරය, විඳීම්, දැනීම්, සංස්කාර හා විඤ්ඤාණය පිළිබඳව භාවනා කර තිබෙනවා ද? පුද්ගලයෙකු සෑදී ඇත්තේ මේ ස්කන්ධ පහෙනි. ඉතා වේගයෙන් වෙනස් වෙමින් පවතින ප්‍රදායන් වූ මේවා එකකට එකක් මුණගැසෙන තරම්වත් ස්ථිරව නොපවතින මහා භූතයන්ගෙන් සකස් වී ඇත්තේය.''

උරුවේල කාශ්‍යප දිගු මොහොතක් නිහඬව රැඳී සිටියේය. ඉන්පසු ඔහු මෙසේ ඇසුවේය. ''කෙනෙකුට කිව හැකි ද ඔබ අස්සත්තා දහමක් දේශනා කරන බව?''

බුදුරදුන් සිනා සී ඔහුගේ අත සෙලවීය. ''නැහැ. පටු අදහස් නැමති වනයේ අස්සත්තා සංකල්පය ද එක් පටු දර්ශනයකි. වෙන් වූ සදාකාලික ආත්මයක් පිළිබඳ සංකල්පය මෙන් අස්සත්තා සංකල්පය ද වැරදි වටහා ගැනීමක් පමණයි. කස්සප, මේ නෙළුම් විල මතුපිට බලන්න. මා කියන්නේ නැහැ දිය හා නෙළුම් පවතින්නේ නැහැ කියා. මා පවසන්නේ ජලය හා නෙළුම් පවතින්නේ අනෙත් සියලු මූල ධාතුන්ගේ එකිනෙකට ඇති සම්බන්ධතාව නිසා බව පමණයි. කිසිවක කිසි සේත්ම තනිව පැවතීමක් හෝ ස්ථිර ලෙස පැවතීමක් හෝ නැහැ.''

කස්සප හිස ඔසවා බුදුරදුන්ගේ දෙනෙත් දෙස බැලුවේය. ''මම කියා කෙනෙක් නැත්නම්, ආත්මයක් නැත්නම්, කෙනෙක් විමුක්තිය සඳහා ආධ්‍යාත්මික මාවතක පුහුණු කළ යුත්තේ ඇයි? එයින් විමුක්තිය ලැබෙන්නේ කාටද?''

බුදුරදුන් සිය බ්‍රාහ්මණ මිත්‍රයාගේ දෙනෙත් දෙස ඍජු බැල්මක් හෙළුවෝය. උන් වහන්සේගේ කිසිදු සසල බවක් නැති, ඒකාග්‍ර වූ බැල්ම හිරු මෙන් තේජසින් ද සෞම්‍ය සඳ එළිය මෙන් ආදරය හා කරුණාවෙන් ද යුක්ත විණි. දයාන්විත සිනහවින් ආලෝක වූ මුවින් බුදුරදුන් මෙසේ පැවසුවෝය. ''කස්සප, ඔබම දැක ගන්න උත්තරය කුමක් ද කියා.''

ඔවුහු කස්සපගේ ආරාමය වෙත ආපසු ගියහ. බුදුරදුන්ට රාත්‍රී නිදා ගැනීම සඳහා තම පැල දිය යුතු යැයි උරුවේල කස්සප තීරණය කළේය. ඉන්පසු ඔහු නිදා ගැනීම සඳහා තම එක් ප්‍රධාන ශිෂ්‍යයෙකුගේ කුටියට ගියේය. කස්සපගේ ශිෂ්‍යයන් තම ගුරුවරයාට කෙතරම් උසස් ලෙස ගරු බුහුමන් කරනවා ද කියා බුදුරදුන් දුටුවෝය.

## විසි හත් වන පරිච්ඡේදය

# සියලු ධර්මයෝ ගින්න මත පිහිටියේය

සෑම උදෑසනකම කස්සප බුදුරදුන්ට ආහාර රැගෙන ආ බැවින් බුදුරදුන්ට ගමෙහි පිණ්ඩපාතය කිරීම සඳහා යාමට අවශ්‍ය වූයේ නැත. සෑම දිනකම උන් වහන්සේ ආහාර ගැනීමෙන් පසු වනයෙහි අඩිපාර දිගේ හෝ නෙළුම් පොකුණ වෙත යන පාර දිගේ හෝ ඇවිදගෙන ගියෝය. ඉන්පසු සන්ධ්‍යා කාලයේ ගසක් යට දී හෝ නෙළුම් පොකුණ අසල දී හෝ බුදුරදුන් හා සාකච්ඡා කිරීම සඳහා කස්සප භික්ෂූන් වහන්සේ පැමිණියේය. ඔහු බුදුරදුන් සමඟ සාකච්ඡා කරන ප්‍රමාණය වැඩි වන තරමටම ඔහු බුදුරදුන් කෙතරම් බුද්ධිමත් හා ආධ්‍යාත්මික දියුණුවකින් යුතු දැයි වටහා ගත්තේය.

එක් දිනක් රාත්‍රියේ මහා වැස්සක් ඇද හැළී එම වර්ෂාව එන්නඑන්නම වැඩි වන්නට විය. පසු දා උදෑසන නේරංජනා නදිය පිරී ඉවුරු ඉතිරී පිටාර ගලන්නට විය. කුඹුරු ආසන්න ගම යට වී ගියේය. ඔරුවල නැඟී බේරුණු අසල් වැසියන් වහාම යට වූ ගම් වැසියන් සොයන්නට පිටත් වූහ. කස්සපගේ අනුගාමිකයනට දියෙන් යට වන අවස්ථාවේ උස් තැන්වලට ගොස් දිවි බේරා ගැනීමට හැකි විය. එහෙත් ගෞතමට කුමක් වී දැයි සොයාගන්නට

ඔවුනට නොහැකි විය. කස්සප උන් වහන්සේ සෙවීමට බෝට්ටු කිහිපයක්ම පිටත් කර යැවීය. අවසානයේ දී බුදුරදුන් උස් බිමක සිටගෙන සිටිනු දැක ඔවුහු උන් වහන්සේ සොයා ගත්හ.

දිය කඳ නැග ආ වේගයෙන්ම ආපසු බැස ගියේය. බුදුරදුන් තම පිණ්ඩපාත පාත්‍රය ද රැගෙන දියකඳ බැස යාමෙන් පසු ගම් වැසියන්ගේ තත්වය කෙසේ ද යි දැක සුව දුක් සොයා බැලීමට ගියහ. වාසනාවට මෙන් කිසිවෙකුත් ගහගෙන ගොස් නොතිබිණි. තමන් සතුව බොහෝ ධන සම්පත් නොතිබූ බැවින් ගං දියට තමන්ට ලොකු පාඩුවක් කිරීමට නොහැකි වූයේ යැයි ගම් වැස්සෝ බුදුරදුන්ට කීහ.

කස්සපගේ අනුගාමිකයෝ ගින්නෙන් විනාශ වූ තම ගිනි පූජා හලත් දිය පහරින් සොදාගෙන ගිය තම පැල්පතුත් නැවත ගොඩනැඟීමට පටන් ගත්හ.

දිනක් බුදුරදුන් හා කස්සප නේරංජනා ගං ඉවුරෙහි සිටගෙන සිටිය දී කස්සප බුදුරදුන්ට මෙසේ කීය. ''ගෞතම, එදා ඔබ කිවුවා කෙනෙකුගේ ශරීරය, වේදනාවන්, සඤ්ඤා, සංකාර හා සිත පිළිබඳව භාවනා කිරීම ගැන. මා ඒ භාවනා පුහුණු කළා. එසේම මට වැටහෙන්න පටන් ගත්තා කෙසේද කෙනෙකුට හැඟීම් හා දැනීම් ඇති වෙන්නේ කියාත්, ජීවිතයේ යහපත් දේ තීරණය කරන්නේ කෙසේ ද කියාත්. එසේම මේ පස් විධ ප්‍රවාහයන්ගේ ස්ථිර වූ කිසිදු මූල ධාතුවක් නැති බවත් මා දුටුවා. ස්ථිර වූ ආත්මයක් ඇත යන විශ්වාසය ද වැරදි බව මට තේරුම් ගත හැකියි. එහෙත්, මට තවමත් තේරුම් ගන්න බැහැ, ආත්මයක් නැති නම්, ඇයි පුද්ගලයෙකු විමුක්තිය සඳහා ආධ්‍යාත්මික මාර්ගයක් අනුගමනය කරන්නේ කියා? පුද්ගලයෙකු නැතිනම් කවුද විමුක්තිය ලබන්නේ?

''කස්සප, දුක සත්‍යයක් යැයි ඔබ පිළිගන්නවා ද?''

''ඔව් ගෞතම, මම පිළිගන්නවා දුක සත්‍යයයි කියා.''

''ඒ දුකට හේතුවක් ඇතැයි යන්නට ඔබ එකඟ ද?''

''ඔව් මම එකඟයි. ඒ දුකට හේතුවක් ඇත.''

''කස්සප, දුක් සඳහා වන හේතු පවතින විට දුක් ද පවතියි. දුක් සඳහා වන හේතු නැති කළ විට දුක ද නැති වෙයි.''

''ඔව්, මට එය පැහැදිළියි. දුකෙහි හේතු නැති කළ විට, දුක් ද එසේම නැති වෙයි.''

''දුකට හේතුව අවිද්‍යාවයි, ඇති සැටියෙන් නොදැකීමයි. අස්ථිර දෙය ස්ථිර යැයි සිතීම අවිද්‍යාවයි. ආත්මයක් නැති විට ආත්මයක් ඇතැයි සිතයි නම් එය අවිද්‍යාවයි. අවිද්‍යාව නිසා තණ්හාව උපදියි. ද්වේශය, බිය, ඊර්ෂ්‍යාව සහ ගණන් නොකළ හැකි තරම් සෙසු දුක් ද උපදියි. විමුක්තියට ඇති මාර්ගය යනු සියලු දෙයෙහි සැබවින් ඇති අනිත්‍ය ස්වභාවය අවබෝධයෙන් යුතුව දැකීමේ මාර්ගයයි. සියලු දේවල් එකිනෙකට බැඳුණු හේතු ඵලක්‍රියාදාම රැසක් මිස ලොව කිසිවක් ආත්ම යැයි හෝ මම වශයෙන් හෝ නැති බව දැකීමේ මාර්ගයයි. මේ මාර්ගය අවිද්‍යාව නැති කිරීමේ මාර්ගයයි; මෝහය නැති කිරීමේ මාර්ගයයි. කෙනෙකු අවිද්‍යාව මැඩපැවැත්වූයේ නම්, දුක ද නැති කළා වන්නේය. එය සැබෑ වූ විමුක්තියයි. විමුක්තිය සඳහා ආත්මයක් තිබීම අවශ්‍ය වන්නේ නැහැ.''

උරුවේල කාශ්‍යප මොහොතක් නිසලව වාඩි වී සිටියේ ය. පසුව ඔහු කතා කළේය. ''ගෞතම, මම දන්නවා ඔබ කතා කරන්නේ ඔබගේ ඍජු අත්දැකීමේන්ම පමණක් බව. ඔබගේ වචනවල ඇත්තේ සිතින් ගත් සංකල්ප විස්තර කිරීමක් නො වෙයි. ඔබ කියා තිබෙනවා විමුක්තිය ලැබිය හැකි වන්නේ උත්සාහයෙන් භාවනා කිරීමෙන්, දේවල් දෙස ඇති සැටියෙන් දැකීමෙන් පමණක් බව. ඔබ සිතනවා ද චාරිත්‍රවාරිත්‍ර, පූජා විධි, යාඥා සියල්ල නිෂ්ඵල දේවල්ය කියා.''

බුදුරදුන් ගඟෙහි අනෙත් ඉවුර දෙසට අත දිගුකොට ''කස්සප, යම් පුද්ගලයෙකුට මේ නේරංජනා ගඟෙහි අර ඉවුරට යන්නට අවශ්‍ය නම් ඔහු කළ යුත්තේ කුමක් ද?'' යි ඇසී ය.

''ගඟෙහි දිය ගැඹුරු නැත්නම් ඔහු පයින් ඇවිද යාවි. නැතහොත් ඔහු පිහිනා යාම හෝ ඔරුවක් පැදගෙන යාම හෝ කරාවි.''

''මම එයට එකඟයි. එහෙත් ඔහු පයින් ඇවිදගෙන යාමට හෝ පිහිනීමට හෝ ඔරුවකින් එතෙරවීමට හෝ කැමති නැත්නම්? ඔහු මෙගොඩ සිට අනෙක් ඉවුරට තමා අසලට එන ලෙස යාඥා කරයි නම්, පූජා විධි කරයි, නම් ඔබ එබඳු පුද්ගලයෙකු ගැන කුමක් ද හිතන්නේ?''

''මට කියන්න ඇත්තේ ඔහු නම් මහාම මෝඩයෙක් කියලා.''

''ඒ වගේම තමයි කස්සප, යම් පුද්ගලයෙක් ආධ්‍යාත්මික පුහුණුවෙහි යෙදී අවිද්‍යාව නැති නොකරයි නම් ඒ පුද්ගලයාට විමුක්තිය නැමති අනෙක් ඉවුරට යා නොහැකියි. මුළු ජීවිත කාලයම යාඥා කළත් ඔහුට විමුක්තිය ලැබිය නොහැකියි.''

උරුවේල කාශ්‍යප එක් වරටම කඳුළු හැළෙන දෑසින් යුතුව බිම වැටී බුදුරදුන්ගේ දෙපතුල් අල්ලා ගත්තේය. ''ගෞතම, මම මගේ ජීවිතයෙන් භාගයකටත් වැඩියෙන් අපතේ හැර ඇත්තෙමි. කරුණාකර මාව ඔබගේ ශිෂ්‍යයෙකු ලෙස පිළිගන්න. මට ඔබගෙන් විමුක්ති මාර්ගය ඉගෙන පුහුණු කිරීමට අවස්ථාව දෙන්න.''

බුදුරජානන් වහන්සේ කස්සපට නැගිටීමට උදවු කළහ. පසුව උන් වහන්සේ ඔහුට මෙසේ කීහ. ''ඔබ මගේ ශිෂ්‍යයෙකු ලෙස පිළිගැනීමට මගේ කිසිම අකැමැත්තක් නැහැ. ඒත් එවිට ඔබගේ පන්සියයක් අනුගාමිකයන්ට කුමක් වෙයි ද? ඔබ ඔවුන් හැර ගියහොත් ඔවුනට මඟ පෙන්වන්නේ කවුරුන් ද?''

කස්සප පිළිතුරු දුන්නේය. ''ගෞතම, මම අද උදෑසන ඔවුන් හා කතා කරන තෙක් ඉඩ දෙන්න. හෙට දහවල් මම ඔබට මගේ තීරණය කියන්නම්.''

''උරුවේලාවෙහි ළමයින් මට කතා කරන්නේ බුද්ධ කියා යි,'' බුදුරදුන් කාශ්‍යපට කීහ.

කාශ්‍යප මහත් සතුටට පත් විය. ''එහි තේරුම පිබිදුණු තැනැත්තා යන්න නො වේ ද? මමත් ඔබට එහෙම කතා කරන්නම්.''

ඊළඟ උදයේ බුදුරදුන් පිණ්ඩපාතය සඳහා ගමට වැඩම කළහ. ටික දුරක් ගොස් උන් වහන්සේ මදක් හිඳිනු පිණිස නෙළුම් පොකුණ වෙත ගියහ. දහවල් ප්‍රමාද වූ බැවින් කාශ්‍යප බුදුන් සොයා පොකුණ වෙත පැමිණියේය. ඔහු බුදුරදුන් හමු වී තම අනුගාමිකයන් පන්සිය දෙනාම බුදුරදුන්ගේ ශිෂ්‍යයන් ලෙස උන් වහන්සේගේ මඟ පෙන්වීම යටතේ මේ නව දහම පුහුණු වීමට අපේක්ෂාවෙන් සිටින බව කීය.

ඊළඟ දිනයේ උරුවේල කාශ්‍යප හා ඔහුගේ සියලු අනුගාමිකයෝ සිය හිසකෙස් හා රැවුල් කපා දැමූහ. ඔවුහු එම කෙස් රැවුල් නේරංජනා නදියට විසි කළහ. එතෙක් කල් පාරම්පරිකව අනුගමනය කළ පස්විධ වන්දනා ඇතුළු සියලු පූජා විධි ද ඒ සමඟම හැර දැමූහ. බුදුරදුන් ඉදිරියේ දෑත් හිස මුදුනෙහි තබා ඇඳිළි බැඳ ''මම බුදුන් සරණ යමි, මම දහම් සරණ යමි, මම

සංඝරත්නය සරණ යමි''යි යනුවෙන් තෙරුවන් සරණ ගියහ. ඔවුන්ගේ තිසරණ සජ්ඣායනය වනය පුරා දෝංකාර දුන්නේය.

පැවිදි කිරීමේ කටයුතු අවසන් වූ පසු බුදුරදුන් නව භික්ෂූන්ට චතුරාර්ය සත්‍යය පිළිබඳවත් ශරීරය, හුස්ම ගැනීම හා සිත පාලනය කිරීම පිළිබඳවත් දේශනා කළහ. ආහාර සිඟා ගන්නා ආකාරයත් නිශ්ශබ්දව හා සිහියෙන් එම ආහාර ගන්නා ආකාරයත් උන් වහන්සේ ඔවුන්ට වටහා දුන්හ. ඔවුන් එතෙක් කල් ආහාර පිණිසත් යාග කිරීම පිණිසත් ඇති කළ සතුන් සියලු දෙනාම මුදා හරින ලෙස ද බුදුරදුන් ඔවුන්ට කියා සිටියහ.

දහවල් කාලයේ බුදුරදුන් කාශ්‍යප හා ඔහුගේ ප්‍රධාන ශිෂ්‍යයන් දස දෙනෙකු මුණගැසිණි. විමුක්ති මාර්ගය වැඩීම සඳහා අවශ්‍ය මූලික කරුණු හා සංඝ සමාජය සංවිධානය කළ යුතු ආකාරය ගැන ඔවුන් සමග සාකච්ඡා කළහ. කාශ්‍යප සමාජ සංවිධානය කිරීමෙහි නිපුනයෙක් මෙන්ම දක්ෂ නායකයෙක් ද විය. ඔහු බුදුරදුන් සමග තම දක්ෂ දෙටු ශිෂ්‍යයන්ට බුදුරදුන් ඉසිපතනයේ සිදු කළ අයුරින් නවක භික්ෂූන් පුහුණු කිරීමට කාශ්‍යපට භාර දුන්නේය.

ඊළඟ දිනයේ උරුවේල කාශ්‍යපගේ බාල සහෝදරයා වූ නදී කාශ්‍යප හදිසියේම ඔහුගේ අනුගාමිකයන් ද සමග පැමිණියේ ය. නේරංජනා නදී තීරයෙහි සෑහෙන තරම් දුරක් පහළින් වාසය කළ ඔහුත් ඔහුගේ තුන් සියයක් අනුගාමිකයනුත් පෙර දිනයේ ගඟ දිගේ පහළට ගලා යන සිය ගණනක් කෙස් රැවුල් හා පූජා උපකරණ දුටුවෝය. තම සහෝදරයා හා ඔහුගේ කණ්ඩායමට යම් කරදරයක් වී ඇතැයි ඔවුහු සිතුහ. නදී කාශ්‍යප එහි පැමිණෙන විට භික්ෂූන් පිණ්ඩපාතය කරන වේලාව ද පැමිණ තිබිණි. මේ නිසා ඔහුට කිසිවෙක් දක ගැනීමට නොහැකි විය. ඔහු සිත තුළ වූ සැකය හා බිය නිසැකයෙන්ම තම වැඩිමල් සොහොයුරාටත් ඔහුගේ අනුගාමිකයන්ටත් විශාල අනතුරක් වී ඇති බවට ස්ථිර කර ගත්තේය. එහෙත් ටික වේලාවකින් එක් එක් කෙනා බැගින් භික්ෂූහු එතැනට ළඟාවන්නට වූහ. ඔවුහු තමන් ගෞතම බුදුරදුන්ගේ විමුක්ති මාර්ගය පුහුණු කිරීමට යොමු වූ ආකාරය නදී කස්සප ඇතුළු පිරිසට විස්තර කරන්නට ද වූහ. පිණ්ඩපාතය කර අවසන්ව බුදුරදුන් සමග එහි පැමිණි උරුවේල කස්සප තම බාල සහෝදරයා දක මහත් සතුටට පත් විය. ඔහු තම සහෝදරයාට

වනයෙහි ඇවිදීම සඳහා යාමට යෝජනා කළේය. ඔවුහු බොහෝ වේලාවක් වනයෙහි කාලය ගත කළහ. ආපසු පැමිණෙන අතර දී නදී කාශ්‍යප තමන් හා තම අනුගාමිකයන් තුන්සිය දෙනා ද බුදුන් සරණ යාමට කැමති බව ප්‍රකාශ කළේය. සොයුරන් දෙදෙනාම තම අනිත් සහෝදරයා වූ ගයා කාශ්‍යප වෙත කෙනෙකු පිටත් කර හැරීමට එකඟ වූහ. මෙසේ දින හතක් තුළ දී ගයා කාශ්‍යප ද සිය අනුගාමිකයන් දෙසිය දෙනා සමඟ බුදුන් වහන්සේ ළඟ ශිෂ්‍යයන් ලෙස පැවිදි විණි. කස්සප සහෝදරයන් තිදෙනා ඉතා හොඳින් සහෝදර ප්‍රේමය ඇතිව සිටි අය වූ අතර ඔවුනොවුන්ගේ සමාන අදහස් ද හොඳින් හුවමාරු කරගත්හ. සියලු දෙනාම එක්ව බුදුරදුන්ගේ ශ්‍රාවකයෝ බවට පත් වූහ.

එක් දිනක් සියලු භික්ෂූන් පිණ්ඩපාතය කර පැමිණි පසු බුදුරදුන් ඔවුන් ගයාවෙහි එක් කඳු බෑවුමක් වෙත කැඳවූහ. කාශ්‍යප සොයුරෝ තිදෙනා සමඟ නව සියයක් භික්ෂූහු ඉතාමත් නිහඬව හා ශාන්තව ආහාර වැළඳූහ. කෑම ගෙන අවසන් වූ පසු ඔවුහු සියලු දෙනාම බුදුරදුන් වෙත හැරුණාහ.

පර්වතයෙහි ඉහළ තැනකට පැමිණි බුදුරදුන් නවසියයක් භික්ෂූන් අමතමින් ගින්නෙන් දැවෙන පසිඳුරන් හා අරමුණු පිළිබඳව දේශනා කළහ. ඇස, කන, නාසය, දිව හා ශරීරය යන ඉන්ද්‍රියයන් රූප, ශබ්ද, ගන්ධ, රස හා ස්පර්ශ යන අරමුණු සියල්ල ද දැකීම්, ඇසීම, ආඝ්‍රාණය, රසය, ස්පර්ශය හා සිතීම යන ක්‍රියා ද ගින්නක් මෙන් දැවෙන අයුරු දේශනා කළහ. ආශාව, ද්වේෂය හා මෝහය යන ගිනිවලින් දැවෙමින් ඒවා ඉපදීම, වියපත් වීම, ලෙඩ වීම හා මරණයත් තවත් බොහෝ ගිනිවලිනුත් දැවෙමින් පවතී.

සෑම භික්ෂුවක්ම නිහඬව අසා සිටියහ. බුදුරදුන්ගේ විමුක්ති මාර්ගය හමු වීම පිළිබඳව ඔවුන් සිත් තුළ ඇති කළේ මහත්ම ප්‍රීතියකි; සතුටකි. සිහිනුවණින් සිටීම මඟින් සත්‍යය දැකීමත් ඒ අයුරින් විමුක්තිය සඳහා වන මාර්ගය අනුගමනය කළ හැකි බවත් ඔවුනට අවබෝධ විය. එහි වූ සියලු භික්ෂූන්ගේ සිත් එතෙක් කල් නොවූ විරූ සතුටකින් පිරී තිබිණි.

නවක භික්ෂූන්ට මඟ පෙන්වනු පිණිස බුදුරජාණන් වහන්සේ තවත් තෙමසක් ගයා ශීර්ෂයෙහි වැඩ සිටියහ. එනිසාම එම භික්ෂූන්ට ද මහත් දියුණුවක් ලබන්නට හැකි විය. කාශ්‍යප සොයුරන් බුදුරදුන්ට ඉතා දක්ෂ ලෙස සහාය වූහ. ඔවුහු භික්ෂූන්ට මඟ පෙන්වීම සඳහාත් ඉගැන්වීමටත් බුදුරදුන්ට උදවු කළහ.

## විසි අට වන පරිච්ඡේදය

# තල් අරණ

ගයා ශීර්ෂයෙන් නික්මී උදෑසන පැමිණි බුදුරජානන් වහන්සේ රජගහනුවර වෙත පියමන් කළහ. භික්ෂූන්ට ද උන් වහන්සේ සමඟ යන්නට ඉඩ දෙන්නැයි උරුවේල කාශ්‍යප බුදුරදුන්ගෙන් ඉල්ලා සිටියේය. බුදුරදුන් එයට කැමැත්තක් දක්වූයේ නැත. එහෙත් උරුවේල කාශ්‍යප බුදුරදුන්ට නවසියයක් එකට ගමන් කිරීමේ දී ඇති පහසුව විස්තර කළේය. රජගහනුවර අවට බොහෝ වනාන්තර ඇත්තේය. භික්ෂූන්ට ඒවායෙහි විසිය හැකි ය. භික්ෂූන්ට පිණ්ඩපාතය කිරීම සඳහා ඕනෑතරම් නිවෙස් ද ප්‍රධාන නගරය ද වෙයි. බොහෝ ජනතාව සමඟ සම්බන්ධ වීමට ද අවස්ථාව ලැබෙනු ඇත. කස්සප තව දුරටත් විස්තර කළේය. ගයාවෙහි දහම් දෙසීම සඳහා මෙහි සිටින භික්ෂූන්ගේ ජනගහනය බොහෝ සෙයින් ප්‍රමාණය ඉක්මවා සිටියි. රජගහනුවරට ගියහොත් එය හැම අතින්ම යහපත් වේවි. උරුවේල කාශ්‍යපට මගධයේ තත්වය ගැන ඇති දැනුම පිළිබඳ සිතූ බුදුරදුන් නවසියයක් භික්ෂූන් ද තමන් සමඟ රැගෙන යාමට කැමති වූහ.

කස්සප සොයුරන් භික්ෂූන් විසිපස් දෙනා බැගින් කණ්ඩායම් තිස් හයකට කොටස් කරන ලදී. සෑම කණ්ඩායමක්ම ප්‍රධාන ශිෂ්‍යයෙකුගේ නායකත්වයෙන් යුතු විය. මේ සැලසුම නිසා භික්ෂූන්ට උසස් ලෙස විමුක්ති මාර්ගය දියුණු කර ගැනීම සඳහා ඉඩ ලැබිණි.

සියලු දෙනාටම රජගහනුවරට පැමිණීම සඳහා සම්පූර්ණ දින දහයක් ගත විය. සෑම උදෑසනකම පුංචි ගම්මානයක පිණ්ඩපාතය කළ භික්ෂූහු කැලයේ හෝ කුඹුරු යායක හෝ නැවතී නිහඬව ආහාර ගත්හ. ආහාර ගෙන අවසන් වූ පසු ඔවුහු පුංචි කණ්ඩායම් වශයෙන් නැවතත් ගමන් කරන්නට වූහ. භික්ෂූන්ගේ නිහඬ හා ශාන්ත ගමන් විලාසය සියලු දෙනාගේ සිත්තුළ කා වදින්නට විය.

ඔවුහු රජගහනුවර සමීපයට පැමිණි පසු උරුවේල කාශ්‍යප සියලු දෙනාම සුප්පතිට්ඨිතාරාමය පිහිටි තල් වනය වෙත කැඳවාගෙන ගියේය. එය නගරයට සැතපුම් දෙකක් පමණ උතුරින් පිහිටා තිබිණි. ඊළඟ උදයේ භික්ෂූහු සිය පාත්‍ර රැගෙන නගරය වෙත පිණ්ඩපාතය සඳහා ගියහ. සිහියෙන් යුතුව පියවරෙන් පියවර තබමින් ගිය භික්ෂූහු බුදුරදුන්ගේ උපදෙස් මත එක් ගෙයක් හෝ මඟ නොහැර දුප්පත් හෝ පොහොසත් හෝ වූ සෑම නිවසකටම පිණ්ඩපාතය පිණිස ගියහ. සුළු මොහොතක් නිවස ඉදිරියෙහි නැවතී සිට කිසිවෙක් පෙනෙන්නට නොසිටියහොත් ඊළඟ නිවස වෙත ගියහ. ආහාර පාත්‍රයට පිළිගන්වන අතර නිහඬව තම අශ්වාස ප්‍රශ්වාස වෙත සිත යොමු කරමින් සිටියහ. ආහාර ලැබුණු පසු දෑත් එක් කොට ස්තුති කළහ. ආහාර හොඳ හෝ නරක හෝ වූ මුත් ඒ පිළිබඳ ප්‍රසාදයක් හෝ අප්‍රසාදයක් හෝ ඉඟියකින් වත් ඔවුහු ප්‍රකට නොකළහ. සමහර අවස්ථාවල ගිහි පිරිස් ආහාර පූජා කොට ධර්මය ගැන ප්‍රශ්න ඇසූහ. ඒ අවස්ථාවල දී භික්ෂූහු ඉතා ඕනෑකමින් තමාගේ හැකියාවට අනුව ඔවුනට පිළිතුරු දුන්හ. භික්ෂූහු තමන් ගෞතම බුදුරදුන්ගේ ශාසනයට අයත් සංඝයා බව විස්තර කළහ. ඔවුහු චතුරාර්ය සත්‍යය පිළිබඳවත්, පංච ශීලය ගැනත්, ආර්ය අෂ්ඨාංගික මාර්ගය ගැනත් කියා දුන්හ.

සෑම දිනකම පිණ්ඩපාතයෙන් පසු දහවල් සෙසු භික්ෂූන් සමඟ සාමූහිකව වැළඳීමටත්, බුදුරදුන්ගේ ධර්මය ශ්‍රවණය කිරීම

පිණිසත් ආපසු තල් වනය වෙත පැමිණියහ. මෙසේ දහවලින් පසු සන්ධ්‍යා කාලයෙහි කිසිදු භික්ෂුවක් නගරයෙහි දක්නට නො වීය.

දෙසතියක් අවසන් වන විට නගරයේ සියලුම දෙනාට මේ භික්ෂූන් පිළිබඳව දැන ගන්නට ලැබී තිබිණි. සීතල සන්ධ්‍යා කාලයේ බොහෝ ගිහි ජනතාව බුදුරදුන්ගෙන් විමුක්ති මාර්ගය ඉගෙනීම පිණිස තල් අරණ වෙත පැමිණෙන්නට වූහ. බුදුරදුන් තම පැරණි මිත්‍රයා වූ තරුණ බිම්බිසාර රජු දැකීමට යාමට පෙරම උන් වහන්සේ රජගහනුවරට පැමිණ ඇති බව රජුට දැන ගන්නට ලැබී තිබිණි. මේ තමන් පෙර කඳු මුදුනේ හමු වූ තරුණ භික්ෂුව විය යුතු යැයි ඔහු තුළ දැඩි විශ්වාසයක් හට ගත්තේය. තම රථයට අශ්වයන් බැඳ වූ රජු වහාම තල් වනය කරා පදවන ලෙස නියම කළේය. සියගණනකට වැඩි බ්‍රාහ්මණයන් ඇතුළු බොහෝ දෙනට රජු ඔහු සමඟ පැමිණෙන ලෙස ආරාධනා කර තිබූ අතර එම සියලු රථ ද රජුගේ රථය අනුව යමින් තල් වනය වෙත හැරවූහ. වනයෙහි සීමාවට පැමිණෙත්ම රජු සිය බිසව හා පුතු අජාසත්ත සමඟ රථයෙන් බැස්සේය.

රජු වනයට පැමිණි බව දැනගත් වහාම බුදුරදුන් හා උරුවේල කාශ්‍යප රජු ඇතුළු ආගන්තුක පිරිස පිළිගැනීම සඳහා පිටතට පැමිණියහ. සියලුම භික්ෂූහු විශාල රවුමක්ව බුදුරදුන්ගේ ධර්ම දේශනය ඇසීම සඳහා නිහඬව බිම වාඩි වී උන්හ. බුදුරදුන් රජු, බිසව, කුමාරයා හා සෙසු ආගන්තුකයනට ද වාඩි වීමට ආරාධනා කළහ. බිම්බිසාර රජු ඔහුගේ මතකයේ හැටියට බොහෝ අයගේ නම් සඳහන් කරමින් බුදුරදුන්ට හඳුන්වා දුන්හ. එහෙත් සමහර අවස්ථාවල සමහර බ්‍රාහ්මණයන්ට තමන් විසින්ම තමන් ව හඳුන්වා දෙන ලෙස කීමට සිදු විය. වේදයන්හි බොහෝ උගතුන් ද විවිධ උගතුන් ද විශාල පිරිසක් මේ අතර වූහ.

මෙහි වූ බොහෝ දෙනෙක් උරුවේල කාශ්‍යපගේ නම අසා තිබිණි. ඔවුන්ගෙන් සමහරෙක් ඔහු පෞද්ගලිකවම මුණගැසී ද තිබිණි. එහෙත් කිසිවෙකුත් බුදුරදුන් ගැන අසා තිබුණේ නැත. ගෞතම ශාක්‍යයන් කාශ්‍යපට වඩා බෙහෙවින් ළාබාල වයසේ සිටියදීත්, කස්සප බුදුරදුන්ට කෙතරම් ගෞරවයෙන් සලකන්නේ

යැයි දැක ඔවුහු පුදුමයට පත් වූහ. ඔවුහු එකිනෙකාගේ මුහුණු දෙස පුදුමයෙන් බලා සිටියහ. ගෞතම කාශ්‍යපගේ ගෝලයෙක් ද නැතහොත් කාශ්‍යප ගෞතමගේ ගෝලයා දැයි ඔවුහු මොහොතක් කල්පනා කරන්නට වූහ. ඔවුන්ගේ මනසේ වූ අවුල් සහගත බව මග හරිමින් කාශ්‍යප නැඟිට බුදුරදුන් ඉදිරියට ගියේය. නෙළුම් කැකුලක් මෙන් දෑත් සකසා වැඳගෙන ඔහු පැහැදිලි හඬින් හා මහත් ගෞරවයෙන් යුතුව කතා කළේය. ''ගෞතම බුදුරජානන් වහන්ස, මේ ජීවිතයේ දී බොහෝ දෙනාගේ ගෞරවයට ලක් වූ ගුරුවරයෙකු වී සිටි උරුවේල කාශ්‍යප නම් වූ මම ඔබ වහන්සේගේ ශිෂ්‍යයා වෙමි. ඔබ වහන්සේට මගේ හෘදයාංගම ගෞරවය පිළිගැන්වීමට අවසර දෙන්න.'' ඉන්පසුව ඔහු බුදුරදුන් ඉදිරියෙහි පසඟ පිහිටුවා තෙවරක් වැන්දේය. අත දිගුකර කාශ්‍යපට නැඟී සිටීමට උදවු කළ බුදුරදුන් තමන් වහන්සේගේ පසෙකින් අසුන්ගන්නැයි කීහ. බුදුරදුන්ට වැඳීම සඳහා අපේක්ෂාවෙන් වෙනත් කිසිවෙක් බ්‍රාහ්මණයන් අතර නොවීය. එහෙත් බුදුන් වෙත වැඳගෙන නිහඬව හිඳසිටි කහ සිවුරු පොරවාගත් නවසියයක් භික්ෂූන්ගේ දර්ශනය ඔවුන් සැමගේම සිත් තුළ බුදුන් කෙරෙහි ගෞරවය නැඟී ඒ මට හේතු විය.

බුදුරදුන් විමුක්ති මාර්ගය පිළිබඳව දේශනා කළහ. ජීවිතයේ ඇති සියලුම දේවල්වල ස්ථිර නොවන ස්වභාවය හා එකිනෙකට බැඳී සිදුවන හේතුඵල ධර්මතාව පිළිබඳව උන් වහන්සේ කීහ. විමුක්තිය ලැබීමේ මාර්ගය අවිද්‍යාව මැඩපැවැත්වීමටත් සියලු දුක්ඛයන් නැති කිරීමටත් උදව් වන බව උන් වහන්සේ කීහ. කෙනෙකුට සිත එකඟ කර ගැනීමටත් අවබෝධය ලැබීමටත් ශීලය හේතුවන්නේ කෙසේ ද කියාත් උන් වහන්සේ විස්තර කළේය. උන් වහන්සේගේ හඬ විශාල සීනු හඬක් මෙන් රාවප්‍රතිරාව නැගුණේය. දහසකටත් වඩා ජනතාවට ඒ හඬ පැහැදිලිව ඇසෙන්නට විය. උන් වහන්සේගේ මියුරු හඬට බාධා වන සේ කිසිවකුත් කිසිදු ශබ්දයක් නොනැගුහ. කිසිවෙක් තදින් හුස්ම ගැනීම පවා නො කර දෙසවන් යොමා සිටියහ.

මේ මොහොතේ බිම්බිසාර රජුගේ දෙනෙත් දීප්තියෙන් බැබළෙන්නට වූයේය. ඔහු බුදුන්ගේ හඬට ඇහුම්කන් දෙන

තරමටම ඔහුගේ හදවත ද විවෘත වන්නට විය. ඔහු තුළ තිබූ අපමණ සැක හා කරදර අතුරුදන්ව ගියේය. දීප්තිමත් සිනහවක් රජුගේ මුවෙහි ඇඳෙන්නට විය. බුදුරදුන් තමන් වහන්සේගේ ධර්ම දේශනය අවසන් කරත්ම බිම්බිසාර රජු නැගී සිට දෑත් ඔසවා එක් කර ගත්තේය. ඔහු මෙසේ කීය. ''ස්වාමීනි, මා තරුණ අවධියෙහි මගේ සිතෙහි ප්‍රාර්ථනා පහක් තිබුණා. අද මගේ ඒ ප්‍රාර්ථනා සියල්ල සම්පූර්ණ කර ගත්තා. පළමු පැතුම වූයේ මගධයේ රජ වීමයි. එය සම්පූර්ණ වී ඇත. දෙවන ප්‍රාර්ථනාව කෙසේ හෝ මේ ජීවිතය තුළ දී විමුක්තිය අවබෝධ කළ ගුරුවරයෙකු මුණ ගැසීමයි. එයත් සම්පූර්ණ වී ඇත්තේය. තෙවන බලාපොරොත්තුව වූයේ එබඳු ගුරුවරයෙකුට මගේ ඇති ගෞරවය පෙන්වීමට හැකි වීමයි. එය ද මේ මොහොතේ සම්පූර්ණ කරගත හැකි විය. සිවුවන බලාපොරොත්තුව වූයේ ඒ ගුරුවරයා විසින් මා හට සත්‍යයේ මාවත පෙන්වනු ඇත යන්නයි. එය ද මේ මොහොතේ ඉෂ්ඨ වූයේය. පස් වන පැතුම වූයේ ඒ විමුක්තිය අවබෝධ කළ ගුරුවරයාගේ ඉගැන්වීම මට අවබෝධ කරගත හැකි වීමයි. ස්වාමීනි, ඒ කරුණ ද මේ මොහොතේ සම්පූර්ණ කරගත්තෙමි. ඔබ වහන්සේගේ පුදුම සහගත ඉගැන්වීම මා වඩාත් අවබෝධය කරා රැගෙන ආවේය. ස්වාමීනි, කරුණාකර මා ඔබ වහන්සේගේ ගිහි ශ්‍රාවකයෙකු ලෙස පිළිගන්න.''

කාරුණිකව සිනාසුණ බුදුරදුන් ඔහුව පිළිගත්හ.

බුදුරදුන් හා උන් වහන්සේගේ නවසියයක් භික්ෂූන්ට පසලොස්වක සඳ දින දානය සඳහා තම මාළිගාවට පැමිණෙන ලෙස ආරාධනා කළේය. බුදුරදුන් කරුණා පිරි සිතින් යුතුව රජුගේ ආරාධනාව පිළිගත්තේය.

සෙසු සියලු ආගන්තුකයන් ද බුදුරදුන්ට ස්තුති කිරීම සඳහා නැගී සිටියහ. ඔවුන්ගෙන් විසි දෙනෙක් බුදුරදුන්ගේ ශ්‍රාවකයන් වීමට අවසර ඉල්ලා සිටියහ. බුදුරදුන් හා උරුවේල කාශ්‍යප, වනයේ කෙළවර තෙක් බිම්බිසාර රජුත් බිසවත් පුංචි අජාසත් කුමරුත් සමඟ ගියහ.

මසකට අඩු කාලයක් ඇතුළත වැසි කාලය ආරම්භ වන බව බුදුරදුන්ට වැටහී ගියේය. එනිසා ඊට පෙර උන් වහන්සේගේ මව්දේශයට යාමට ඉඩක් නොලැබෙන්නේය. තවත් තෙමසක් මේ භික්ෂූන් නවසියයත් සමඟ තල් වනයේ නතර වන්නෙමියි

උන් වහන්සේ තීරණය කළහ. තව තෙමසක පුහුණුවෙන් පසු සංඝයා ශක්තිමත් වන බැවින් තමන්ට පිටවී යාම සඳහා ශාසනයේ ස්ථාවරත්වය ප්‍රමාණවත් බව උන් වහන්සේට වැටහිණි. වර්ෂා කාලයෙන් පසු පැළෑටිවලින් ළා දලු නැගෙන, පැහැදිලි අහස ඇති වසන්ත ඍතුවෙහි උන් වහන්සේට පිටත් විය හැකිය.

හදිසියේම සේනිය බිම්බිසාර රජු බුදුරදුන් ඇතුළු මහා සංඝරත්නය පිළිගැනීම සඳහා සූදානම් වන්නට පටන් ගත්තේය. ඔහු තම අතවැසියන්ට මාළිගයට එන මාවත සරසන්නට දැනුම් දුන්නේය. මඟ දිගට ලන්තෑරුම් දල්වා ඒ ඒ තැන්වල බුදුරදුන් හා මහා සංඝරත්නය පිළිගැනීම සඳහා මල් අතැතිව පිරිස් තැබුවේය. ඔහු මේ උත්සවය සඳහා සියලු ප්‍රභූන්ටත් ඔවුන්ගේ පවුල්වල අයටත් ආරාධනා කළේය. ඒ අතර සියලු රාජ්‍ය නිලධාරීහු ද වූහ. වයස දොළහක් වූ අජාසත් කුමරු තම වයසට ආසන්න ළමයින්ට ආරාධනා කළේය. බුදුරදුන් හා මහා සංඝරත්නය සත්ව ඝාතනයට ඉඩ නොදෙන බව දැන ගත් බැවින් ශාක ආහාර පමණක් දානය සඳහා සූදානම් කිරීමට රජු දැනුම් දෙන ලදී. ඔවුනට පිළිගැනීමේ උත්සවය සංවිධානය කිරීමට දින දහයක් තිබිණි.

## විසි නව වන පරිච්ඡේදය

# මග සෙවූ මිතුරන් දෙදෙනා

එම සතිය ගතවීමත් සමඟ ම බොහෝ දෙන බුදුරදුන් වෙත පැමිණ භික්ෂුවක් ලෙස පැවිදි වීමට අවසර ඉල්ලූහ. ඔවුන්ගෙන් බොහෝ දෙන ධනවත් පවුල්වල උගත් තරුණයෝ වූහ. බුදුරදුන්ගේ ජ්‍යෙෂ්ඨ ශිෂ්‍යයන් විසින් පැවිදි කිරීමේ කටයුතු කළ අතර මෑත දී පැවිදි වූවන් විසින් නවක භික්ෂූන්ට අවශ්‍ය මූලික පුහුණුවේ උපදෙස් දීම කරන ලදී. සෙසු වැඩිහිටි තරුණ හා බාල බොහෝ ගිහි පිරිස් තල් වනයට පැමිණ තෙරුවන් සරණ ගියහ.

එක් දිනක් තුන්සියයකට ආසන්න තරුණ පිරිසකට කොණ්ඩඤ්ඤ හිමියන්, තෙරුවන් සරණ සමාදන් කරවන ලදී. උත්සවයෙන් පසුව ඔහු බුදුන්, දහම්, සඟුන් යන ත්‍රිවිධ රත්නය පිළිබඳව විස්තර කර දෙමින් කථා කළේය.

''බුද්ධ යනු අවධි වූ හෙවත් නිර්වාණය අවබෝධ කරගත් උතුමායි. බුද්ධත්වය ලැබූ තැනැත්තා ජීවිතයේත් සකල ලෝකයේ මත් සැබෑ ස්වභාවය දකින්නෙහිය. මේ නිසා බුදු කෙනෙකුන් හට කිසි සේත්ම මෝහයෙන් වන බැඳීම්, බිය, තරහ හෝ ආශා

නැත්තේය. බුද්ධ යනු නිදහස් වූ ද සාමයෙන් හා සතුටින් පිරුණා වූ ද ආදරයෙන් හා අවබෝධයෙන් යුතු වූ ද තැනැත්තායි. අපගේ ශාස්තෲන් වහන්සේ වූ ගෞතම මුළුමනින්ම පිබිදුණු තැනැත්තෙකි. සම්පූර්ණයෙන්ම විමුක්තිය ලැබූ තැනැත්තෙකි. උන් වහන්සේ අපට මේ ජීවිතයේ මාර්ගය පෙන්වා දුන්නා. දුකින් මිදීමේ මාර්ගය පෙන්වා දුන්නා. ඒ මඟ ඔස්සේ දූන් අපට ද විමුක්තිය අවබෝධ කරගත හැකියි. අපි සැම කෙනෙකුම උන් වහන්සේගේ මාර්ගයෙහි යන්නෝ වෙමු. අපි හැම විමුක්තිය අවබෝධ කර ගැනීමේ මාර්ගයෙහි සිටින්නෙමු. බුදුරජුන් ළඟ නිවන අවබෝධ කර ගැනීමට අවශ්‍ය අයට, දුකින් මිදීමට අවශ්‍ය අයට ඕනෑතරම් ඉඩ තිබේ. උන් වහන්සේගේ ඉගැන්වීම් යමෙක් පුහුණු කරන්නේ නම් දිනෙන් දින බුදුරදුන් කවුරුන් දැයි දීප්තිමත් වෙමින් පෙනේ වි. අපි සැම කෙනෙකුම බුදුන් වහන්සේ අපේම හදවතින් අවබෝධ කරගත් යුතු වෙමු. බුද්ධ යනු මේ ලෝකයේ අපට සරණ යාමට ඇති පළමු රත්නයයි.

''ධර්මය යනු අවධියට හෙවත් නිර්වාණයට මඟ පෙන්වන මාර්ගයයි. බුදුරදුන් අවබෝධ කරගත් ධර්මය සියලු කල්හිම සැම සත්වයෙකුටම දුකින් නිදහස් වීමට අවශ්‍ය සත්‍ය දැකීමට හේතු වෙයි. බුදුරදුන්ගේ ඉගැන්වීම එයයි. ද්වේශය, බිය, අශාව ආදිය මැඩපැවැත්වීමටත් නිදහස, සාමය සහ සතුට ලබා ගැනීමටත් එක ම මාර්ගයයි. ආදරයත් අවබෝධයත් සෙසු සියල්ලන් විෂයෙහි පැතිරවීමට එයින් අපට ඉඩ සැලසෙයි. මේ නිවන් මඟෙහි ආදරයත් අවබෝධයත් ඉතා උසස්ම ඵල දෙකකි. ධර්මය දෙවන මා ගැඟි රත්නයයි.

''මේ විමුක්තිය ලැබීමේ මාර්ගයේ එක්ව ගමන් කරන පුද්ගල සමූහය සංඝයායි. ඔබටත් මේ නිදහස් මාර්ගයේ පුහුණු වීමට අවශ්‍ය නම්, මේ සංඝ සමාජය හා එක් වී පුහුණු වීම ඉතාම වැදගත්. ඔබ තනිව පුහුණු වීමට අපේක්ෂා කරන්නේ නම් එවිට විමුක්ති මාර්ගය නිරාවරණය කර ගැනීමට බොහෝ බාධා ඇති විය හැකියි. එනිසා ඔබ පැවිදි වී හෝ ගිහිව හෝ සිට මහා සංඝයාගේ සරණ යාම ඉතාම වැදගත් වෙයි. සංඝ යනු තෙවන උතුම් රත්නයයි.

''පිංවත් යෞවනයිනි, ඔබට අද බුදුන්, දහම් හා සඟුන් සරණ යා හැකියි. මේ තෙරුවන්හි සරණ යාමෙන් ඔබට අරමුණක්

නැතිව අයාලේ යනවා වෙනුවට නිර්වාණ මාර්ගයෙහි සැබෑ දියුණුවක් ලැබීමට හැකි වේවි. මම තෙරුවන් සරණ ගොස් දැනට වසර දෙකක් වෙනවා. ඔබටත් අද මේ මා යන මාවතේම යාමට කැප විය හැකියි. මේ දියුණුවේ රත්න සරණ සමාදන් වීමට හැකි වීම ගැන අපි එක්ව සතුටු වෙමු. ඇත්තෙන්ම මේ රත්නයන් ඇරඹුමක් නැති දීර්ඝ කාලය පුරාම අපේ හදවත්වල පැවතී තිබෙනවා. අපි හැමෝම එක් වී මේ විමුක්ති මාර්ගය පුහුණු කරමු. ත්‍රිවිධ රත්නයට අප තුළ දීප්තිමත්ව බැබළෙන්නට ඉඩ සලසමු.''

තරුණ පිරිස කොණ්ඩඤ්ඤ හිමියන්ගේ දේශනයෙන් මහත්සේ ධෛර්යමත් වූහ. ඔවහු සැම දෙනාගේම සිත් තුළ විශාල උද්යෝගයක් ඇති වී තිබිණි. මේ දින වකවානුව තුළ බුදුරදුන්ගේ සංඝ සමාජයට අලුත් විශේෂ ශිෂ්‍යයන් දෙදෙනෙක් ඇතුළු විය. නමින් ඔවුහු ශාරිපුත්ත හා මොග්ගල්ලාන වූහ. ඔවුන් දෙදෙනාම රජගහනුවර ජීවත් වූ ප්‍රසිද්ධ තාපසයෙකු වූ සංජයගේ ශිෂ්‍යයෝ වූහ. සංජයගේ අනුගාමිකයන් පරිබ්‍රාජක නමින් හඳුන්වනු ලැබිණි. ශාරිපුත්ත හා මොග්ගල්ලාන දෙදෙනා ඉතා බුද්ධිමත් හා විවෘත සිත් ඇති ඉතාම සමීප මිතුරන් දෙදෙනෙකි. එක් අයෙකුට හෝ විමුක්ති මාර්ගය හමු වුවහොත් වහාම අනෙක් කෙනාට දැනුම් දෙන බවට ඔවුන් දෙදෙනාම එකිනෙකාට පොරොන්දු වී තිබිණි.

එකී දිනක් අස්සජී හිමියන් රජගහනුවර පිණ්ඩපාතය කරන ආකාරයත් උන් වහන්සේගේ ශාන්ත සංවර ඉරියව් පැවැත්වීමත් ශාරිපුත්ත දුටුවේය. ශාරිපුත්තගේ සිත එය දැකීමෙන් උන් වහන්සේ වෙත මහත් සේ ඇදී ගියේය. ශාරිපුත්ත මෙසේ සිතීය. ''මේ තැනැත්තා අනිවර්යයෙන්ම කුමක් හෝ විමුක්ති මාර්ගයකට පැමිණි තැනැත්තෙක් විය යුතුයි. මා දැන සිටියා කවදා හෝ මෙබඳු උතුමෙකු මට මුණගැසේ වි කියා. මේ ගුරුවරයා වෙත ගොස් ඔහු කවුද කියාත් ඔහුගේ ඉගැන්වීම කුමක් ද කියාත් දැන ගත යුතුයි.''

ශාරිපුත්ත සිය ගමන ඉක්මන් කළේය. ඔහුට ඉක්මනින්ම මේ භික්ෂුව නවතා ගත යුතු යැයි සිතුණත් පසුව ඔහු යළිත් නතර විණි. ගෙයින් ගෙට පිණ්ඩපාතයේ යන මේ උතුමාට බාධා නො කළ යුතු යැයි ඔහුට සිතිණි. පසුව ඔහු අස්සජී හිමියන් යන පසුපසුන් ම ඔහුට කතා නොකරම ගමන් ගත්තේය. උන් වහන්සේ පිණ්ඩපාතය කර අවසන්ව නගරයෙන් පිට වී යාමට හැරිණි.

ඉදිරියට ගිය ශාරිපුත්ත, දෑත් එක් කොට නමස්කාර කරමින් ''ස්වාමීනි, ඔබතුමාගේ ඉරියව් ඉතාම ශාන්තයි; තැන්පත්. ඔබ වහන්සේ ඉතා ශ්‍රේෂ්ඨ මාර්ගයකට පත්ව ඇති බව ඔබගේ හැසිරීමෙනුත් මුහුණෙනුත් දැක සිතාගත හැකියි. කරුණාකර මටත් දැන ගන්න ඉඩ දෙන්න, ඔබතුමා කුමන මාර්ගය ද අනුගමනය කරන්නේ කියා. ඔබතුමා දේශනා කරන ධර්මය කුමක් ද?''

අස්සජී ශාරිපුත්තගේ මුහුණ දෙස මොහොතක් බලා සිටියේය. පසුව ඔහු හා සිනාසී පිළිතුරු දුන්නේය. ''මා පුහුණු වන ධර්ම මාර්ගය ඉගෙන ගන්නේ ශාක්‍ය වංශයේ ගෞතම නම් ගුරුවරයාගෙන්. උන් වහන්සේ හැමෝම හඳුන්වන්නේ බුද්ධ යන නමිනුයි. උන් වහන්සේ මේ දිනවල වැඩ සිටින්නේ තල් වනයේ ඇති සුපත්තිත ආරාමය අසලයි.''

ශාරිපුත්තගේ දෙනෙත් දීප්තිමත්ව බැබළෙන්නට විය.

''එතුමාගේ ඉගැන්වීම කුමක් ද? ඔබතුමාට හැකි ද මටත් ඒ ගැන ටිකක් කියා දෙන්න?''

''උන් වහන්සේගේ ඉගැන්වීම් ඉතාම මනෝහරයි. එසේ ම ගැඹුරුයි. මම තවම ඒවා සම්පූර්ණයෙන්ම ඉගෙන ගෙන හෝ පුහුණු කර හෝ නැහැ. ඔබම පැමිණ සෘජුවම උන් වහන්සේගෙන් ම ධර්ම මාර්ගය ලබා ගැනීම වඩාත් සුදුසුයි.''

එහෙත් ශාරිපුත්ත අස්සජීගෙන් නැවතනැවතත් ඉල්ලා සිටින්නට විය. ''කරුණාකර ඔබට හැකි ද බුදුරදුන්ගේ ඉගැන්වීම්වලින් වචන කිහිපයක් හෝ මට කියන්න? එය මට බොහෝ වටින උපකාරයක් වේවි. මම තවත් ඉගෙනගන්න පසුව එන්නම්.''

අස්සජී සිනාසී බුදුරදුන්ගේ ඉගැන්වීමක පුංචි ගාථාවක් සජ්ඣායනා කළේ ය.

සියලුම ධර්මයෝ
හේතුන් නිසා හට ගනියි.
හටගත් සියලු ධර්මයෝ
නැති වී යන්නේ ය.
මෙය තථාගත බුදුරජානන් වහන්සේගේ
ඉගැන්වීමයි.

ශාරිපුත්තට සිය හදවත විවෘතවන අයුරු දැනෙන්නට විය. ඔහුගේ හදවතෙහි ආලෝකයක් දැල්වුණාක් මෙන් ඔහුට හැඟුණේ ය. මෙබඳු සත්‍ය වූ ධර්මයක් ඔහුට මින් පෙර කිසිම දිනක අසන්නට ලැබුණේ නැත. සිහිනයකින් අවදි වූවාක් මෙන් විශ්වයේත් සොබාදහමේත් සැබෑ සත්‍යය වැටහී ගියේය. ජීවී අජීවී සියල්ල හේතුවකින් හට ගන්නේය. එසේ හටගත් සැම දෙයක්ම නැති වීම ස්වභාව කොට ඇත්තේය. මේ සත්‍යය දැකීමෙන් ඔහුගේ සිත සතුටින් පිරී ගියේය. අස්සජීගේ දෙපා වන්දනා කළ ශාරිපුත්ත වහා තම මිතුරු මොග්ගල්ලාන සොයා දිව ගියේය.

ශාරිපුත්තගේ සතුටින් බැබලෙන මුහුණ දුටු මොග්ගල්ලාන මෙසේ ඇසීය. ''මගේ සොයුර, ඔබගේ මුහුණ මෙතරම් සතුටට පත් කරන්න හැකි වූයේ කුමකට ද? ඇයි? ඔබට නිවැරදි මාර්ගය හමු වුණා ද? කරුණාකර මටත් කියන්න මිතුර.''

ශාරිපුත්ත සිදු වූ සියල්ල මොග්ගල්ලානට විස්තර කර පසුව තමන්ට අස්සජි හිමියන් ඉගැන් වූ ගාථාව ද සජ්ඣායනා කළේය. ඒ ගාථාව ඇසීමෙන් මොග්ගල්ලානගේ ද හදවත තුළ මහත් ආලෝකයක් ඇති වූවාමෙන් විශ්වයේ සත්‍යය අවබෝධ විය. මෙතෙක් කල් මංමුලා වූවකු මෙන් තමන් නිවැරදි මාවත නොදැන ඇවිද ඇති බවත් මේ වචන කිහිපයෙන් මුලාවෙන් මායාවෙන් වැසුණු හදවතට සත්‍යයේ දොර විවර වූ බවත් ඔහුට අවබෝධ විය. එක් වරටම ඔහුට මුළු විශ්වයම එකිනෙකට සම්බන්ධ වූ ජාලයක් මෙන් පෙනෙන්නට විය. එය ඇති වූ නිසා මෙය ඇති වී ඇත. මෙය ඉපදී ඇත්තේ එය ඉපදී ඇති නිසයි. එය නො තිබුණා නම් මෙය ඇති වන්නේ නැත. එය නැති වූ නිසා මෙය නැති වූයේය. මැවුම්කරුවකු පිළිබඳව වන අන්ධ විශ්වාසය නිසා විශ්වයේ එකිනෙකට ඇති සම්බන්ධතාවෙන් සිදුවන සියල්ලෙහිම පැවැත්ම පිළිබඳ අවබෝධය නැති වී යන්නේය. නිමක් නොමැති ඉපදීමේ හා මරණයේ චක්‍රය සිඳ දමන්නේ කෙසේදැයි දැන් ඔහුට අවබෝධ විය. විමුක්තියේ, නිදහසේ දොරටුව ඔහු ඉදිරියෙහි විවරව තිබේ.

''සොයුර, අපි දැන්මම බුදුරජානන් වහන්සේ වෙත යා යුතුයි. අපි මෙතෙක් කල් සොයසොයා සිටි ගුරුවරයා එතුමායි,'' මොග්ගල්ලාන කීය.

ශාරිපුත්ත එකඟ විය. එහෙත් ඔහු සිය මිත්‍රයාට යමක් සිහිපත් කළේය. ''අපගේ අනෙත් පරිබ්‍රාජක දෙසියපනහක් පිරිස අප ගැන මහත් විශ්වාසයකින් බලාපොරොත්තුවකින් යුතුව සිටිනවා. ඔවුන් අප ගැන සිතන්නේ තමන්ගේම වැඩිමල් සහෝදරයින් ලෙසටයි. අපට එක් වරටම ඔවුන් අතහැර දමා යා නොහැකියි. අපි වහාම ගොස් පළමුව ඔවුන්ට අපගේ තීරණය දැනුම් දිය යුතුයි.''

මිතුරන් දෙදෙනාම වහා තම ප්‍රධාන පරිබ්‍රාජක මූලස්ථානයට ගොස් තමන් සමඟ වෙසෙන අනුගාමිකයන්ට තම තීරණය විස්තර කළහ. අප පරිබ්‍රාජක ආරාමය හැර යන බවත් බුදුරදුන්ගේ ශ්‍රාවකයන් වී ඒ මාර්ගය අනුගමනය කරන බවත් ඔවුහු තව දුරටත් කීහ. ශාරිපුත්ත හා මොග්ගල්ලානගේ විස්තරය අසා සිටි පරිබ්‍රාජක පිරිස ඔවුන්ගේ තීරණයට එකඟ විය. එහෙත් තමන්ගේ වැඩිමහල් සොයුරන් බඳු මේ ශාරිපුත්ත හා මොග්ගල්ලාන නැතිව තව දුරටත් පරිබ්‍රාජක පිළිවෙත් දිගටම පැවැත්විය නො හැකි බව ඔවුහු කීහ. එනිසා ඔවුන් සැම දෙනාම ද ශාරිපුත්ත හා මොග්ගල්ලාන සමඟ යාමටත් බුදුරදුන්ගේ ශ්‍රාවකයන් බවට පත් වීමටත් කැමති බව ප්‍රකාශ කළහ. ශාරිපුත්ත හා මොග්ගල්ලාන මිතුරන් දෙදෙනා සංජය ආචාර්යවරයා වෙත ගොස් තම තීරණය පිළිබඳව එතුමාට දැනුම් දුන්හ. සංජය පරිබ්‍රාජකතුමා ඔවුන් දෙදෙනාට බැහැර නොගොස් එහි දිගටම සිටින ලෙසත් එසේ සිටින්නේ නම් මේ පරිබ්‍රාජක පිරිසෙහි නායකත්වය ඔවුන් දෙදෙනාට පිරිනමන බවත් කීය. ඔහු මෙසේ තෙවරක්ම කී නමුත් ශාරිපුත්ත හා මොග්ගල්ලාන දෙදෙනා තම තීරණය වෙනස් කළ නොහැකි බව කීහ.

ඔවුන් දෙදෙනා සංජය ආචාර්යවරයාට මෙසේ කීහ. ''ගෞරවනීය ගුරුතුමාණනි, විමුක්තිය ලැබීමට ඇති එකම මාර්ගය අපට හමු විය. දැන් ආගමක නායකයන් වීමේ පුළුවන්කමක් නැත. අපි නිවැරදි මාවත සම්පූර්ණයෙන්ම දන්නේ නැතිනම් සෙසු අයට මඟ පෙන්වන්නේ කෙසේ ද? අපි හැකි ඉක්මනින්ම ගෞතම ආචාර්යතුමා සොයාගත යුතුයි. මෙතෙක් කල් අපි සොයමින් සිටි විමුක්තියට එතුමා පැමිණ ඇත.''

ශාරිපුත්ත හා මොග්ගල්ලාන සංජය පරිබ්‍රාජක තුමා ඉදිරියෙහි බිම වැතිරී නමස්කාර කොට පිටත් වී ගියහ. සෙසු පරිබ්‍රාජක පිරිස ද ඔවුන් අනුව ගියහ. බුදුරදුන් වැඩසිටින තල් වනාන්තරය සොයා ගිය ඔවුහු බුදුරදුන් ඉදිරියෙහි වැඳ වැටී තමන් පැවිදි කරවන ලෙස ඉල්ලා සිටියහ. පළමුව චතුරාර්ය සත්‍යය ගැන ඔවුනට දේශනා කළ බුදුරජානන් වහන්සේ ඔවුන් පැවිදි කළහ. පැවිදි කිරීමේ උත්සවයෙන් පසු තල් අරණේ සංඝ සමූහය සංඛ්‍යාවෙන් 1,250 ක් වූහ.

## ''පැරණි අහසේ අලුත් සඳ'' පළමු කොටස නිමියේය.

# දෙවන කොටස

## තිස් වෙනි පරිච්ඡේදය

# වේළුවනය

එදින පුර පසළොස් වක පොහොය දිනය විය. බුදුරජානන් වහන්සේ පිණ්ඩපාත පාත්‍රය ගෙන 1250ක් භික්ෂූන් වහන්සේලා සමඟ පිඩු පිණිස රාජගහ නගරයට පැමිණියහ. ඉතා ශාන්ත තැන්පත් පියවරින් උන් වහන්සේලා නගරය මැදින් ගමන් කළහ. නගර වීථි පුරාම ලන්තෑරම් එළිවලින් හා අලුත් මල්වලින් මුළුමනින්ම අලංකාර කර තිබිණි. බුදුරදුන්වත් මහා සංඝරත්නයත් පිළිගැනීම සඳහා මහ ජනයා පාර දෙපස පිරී සිටියහ.

බිම්බිසාර රජතුමා හය දහසක් පමණ පිරිසක් සමඟ බුදුරදුන් පිළිගැනීම සඳහා පැමිණ සිටියේය. අමුත්තන්ට අව්ව රශ්මියෙන් වැළකීම සඳහා රජු පෙරාතුවම රාජාංගනයෙහි සෙවනක් සාදා තිබූ අතර ඔහු බුදුරදුන් ඇතුළු මහා සංඝයා එහි වැඩම කරවාගෙන ගියේය. රාජාංගනය මධ්‍යයෙහි බුදුරදුන්වෙත වෙනම සාදා තිබූ උසස් ආසනය බුදුරදුන්ට පිළිගන්වනු ලැබීය. සියලුම සංඝරත්නය වෙනුවෙන් ඉතාම සැලකිල්ලකින් යුතුව වෙනවෙනම ආසන සකස් කර තිබිණි. බුදුරදුන් ආසනයෙහි හිඳගත් පසු රජු සියලු

දෙනාටම වාඩිවීම සඳහා ආරාධනා කළේය. බුදුරදුන්ට පසෙකින් බිම්බිසාර රජු හා උරුවේල කාශ්‍යප හිඳගත්හ.

බුදුරදුන්ට දෑත් හා දෙපා දෝවනය සඳහා අජාසත් කුමරු දිය භාජනයක් හා තුවායක් රැගෙන ආවේය. අනෙත් සියලු සහායකයෝ සෑම භික්ෂූන් වහන්සේ නමකටම දිය හා තුවා රැගෙන ආහ. ඉන්පසු ශාකවලින් පමණක් සකස් කළ ආහාර වර්ග මේස පුරා තබන ලදී. රජු සිය අතින්ම බුදුරදුන්ට ආහාර පිළිගැන්වූ අතර විදේහි දේවිය භික්ෂූන් වහන්සේලාට ආහාර පිළිගැන්වූවාය. බුදුරදුන් හා මහා සංඝරත්නය ආහාර ගැනීමට පෙර ගාථාවක් සජ්ඣායනා කළහ. බිම්බිසාර රජු හා ඔහුගේ රාජකීය අමුත්තෝ බුදුරදුන් ආහාර වළඳන කාලය තුළ ඉතා නිශ්ශබ්දතාවක් ආරක්ෂා කළහ. හස දහසක් පමණ අමුත්තෝ බුදුරදුන් හා මහා සංඝරත්නය නිශ්ශබ්දව, සංවරව හා ශාන්තව ආහාර ගන්නා ආකාරය සිතේ ගැඹුරට කා වැදුණු ප්‍රසාදයෙන් හා ගෞරවයෙන් යුතුව බලා සිටියහ.

එක්දහස් දෙසියපනහක් වූ මහා සංඝරත්නයත් බුදුරජානන් වහන්සේත් ආහාර වළඳා අවසන් වූ පසුව සියලු පාත්‍ර ගෙන සෝදා නැවත ආපසු පිළිගන්වන ලදී. බුදුරදුන් ඉදිරියට ගොස් දෑත් එක් කොට දණගසා රජු නමස්කාර කළේය. රජතුමාගේ අදහස වටහාගත් බුදුරජානන් වහන්සේ ධර්මය දේශනා කිරීමට අරම්භ කළහ. රජ පවුලේත් මුළු රාජ්‍යයේ සෑම දෙනෙකුටමත් සතුට සාමය ලබා ගත හැකි වන පංච ශීලය ගැන උන් වහන්සේ දේශනා කළහ.

''පළමු සිල්පදය පර පණ නොනැසීමයි. මෙම සිල් පදය සමාදන් වීම නිසා දයාව, කරුණාව සිත් තුළ වර්ධනය වෙයි. ජීවත් වන සෑම සත්වයෙක්ම මරණයට බිය ඇත්තේය. අපි අපේ ජීවිතය ආරක්ෂා කරන්නා සේම අපි අන් සැමගේ ද ජීවිත ආරක්ෂා කළ යුතුයි. එකිනෙකාට ආදරය කිරීමෙන් හා එකිනෙකාගේ ගෞරවය ආරක්ෂා කිරීමෙන් රාජ්‍යයේ සැමටම සතුටින් හා නිර්භයව ජීවත් විය හැකියි. එයින් ආරක්ෂාව ද ඉබේම තහවුරු වන නිසා සෙසු රාජ්‍යවලින් වන උවදුරුවලට ද ශක්තිමත්ව මුහුණ දිය හැකි වෙයි. ජීවිත හානි කිරීම වෙනුවට ජීවිත ආරක්ෂා කිරීම සිදුවන විට රටේ හමුදාවක් අවශ්‍ය නොවෙයි. ඒ අයගේ

ශ්‍රමය රටේ සංවර්ධනයට හේතුවන මංමාවත්, පාලම් තැනීම, ගොඩනැගිලි ඉදිකිරීම, රට සශ්‍රීක කිරීම ආදී ක්‍රියා සඳහා යෙදවිය හැකිය.

''දෙවන ශික්ෂා පදය සොරකම් නොකිරීමයි. කෙනෙක් දුක් මහන්සියෙන් උපයා ගත් දේ තවත් කෙනෙකුට සොරකම් කර ගැනීමට කිසිම අයිතියක් නැත. සොරකම ඇති විට ධනය ආරක්ෂා කර ගැනීමට ආයුධ අවශ්‍ය වෙයි. ආයුධ ගැනීම නිසා ඝාතනය සිදුවෙයි. අධිකරණය, සිරගෙවල් ආදී තවත් බොහෝ හිංසනයට ලක්වන දේද ඒ තුළින් ඇති වේ. ඒ වෙනුවට සෙස්සන්ගේ ධනය ආරක්ෂා කිරීම සිදු කළ හොත් එයින් වන බොහෝ හානි වැළකී යයි. සෙසු අය වංචාවෙන් හෝ රැවටීමෙන් හෝ තමන්ගේ හැකියාව බලය යොදවා හෝ අනුන්ගේ සම්පත් භුක්ති විඳීම ද නොකළ යුතුය. අනුන්ගේ ශ්‍රමය ද අසාධාරණ හෝ වංචනික හෝ ලෙස ගැනීම මේ ශික්ෂාපදය කඩ කිරීමකි. රට වැසියන් මේ ශික්ෂා පදය ආරක්ෂා කරන්නේ නම් රට තුළ සමානාත්මතාව ඇති වී මංකොල්ලකෑම, මිනීමැරීම ඉතා ඉක්මනින්ම රටෙන් තුරන් වනු ඇත.

''තෙවන සිල් පදය වැරදි කාම සේවනයෙන් වැළකීමයි. කාමයෙහි හැසිරීම සිදු කළ යුත්තේ ඔබගේ සහකරුවා, සහකාරිය සමඟ පමණි. මේ ශික්ෂාපදය ආරක්ෂා කිරීම මඟින් පවුලේ විශ්වාසයත්, සතුටත් ආරක්ෂා වෙයි. එසේම සෙස්සන්ට අනවශ්‍ය දුක් වේදනා ද තමන් නිසා ඇති නොවෙයි. ඔබට සතුටත්, කාලයත් අවශ්‍ය නම්, ඔබේ රටේ ජනතාවත් සමඟ සතුටින් ඔවුන්ට උදවු කරමින් ජීවත් වීමට අවශ්‍ය නම් බහුභාර්යා සේවනයෙන් හා බහුපුරුෂ සේවනයෙන් වළකින්න.

''සතර වන ශික්ෂාපදය බොරු නොකීමයි. නිර්මාණය කර බොරුවක් හෝ අනුන් රවටන අදහසින් යමක් හෝ කීම නො කළ යුතුය. ඔබගේ වචනවල අඩංගු විය යුත්තේ සත්‍යය පමණි. ඔව් නම්, ඔව් කිව යුතුය; නැත නම් නැත කිව යුතුය. වචනවලට විශ්වාසය හා සතුට ඇති කිරීමේ විශාල බලයක් ඇත. එසේම වචනවලට වැරදි වැටහීම් ද වෛරය ද මිනීමැරීම හා යුද්ධ ද ඇති කිරීමට හැකියාව ඇත. කරුණාකර මහත් සැලකිල්ලෙන් යුතුව ඔබේ වචන පාවිච්චි කරන්න.

''මත්පැන් හෝ වෙනත් මත් ද්‍රව්‍ය හෝ පාවිච්චියෙන් වැළකීම පස්වන ශික්ෂා පදයයි. මත් පැන්වලින් හෝ වෙනත් මත් ද්‍රව්‍යවලින් හෝ සිතේ පැහැදිළි බව නැති කරයි. මත් වූ තැනැත්තා විසින් තමන්ටත්, තම පවුලේ අයටත්, සෙසු අසල් වැසියන්ටත් හැමටත් අප්‍රමාණ දුක් ඇති කරන්නට පුළුවන. මේ ශික්ෂාව සමාදන් වීමෙන් කයේත් මනසේත් යහපත් සෞඛ්‍යය ආරක්ෂා වෙයි. මෙය සෑම විටකම සමාදන්ව ආරක්ෂා කළ යුතු සිල් පදයකි.

''මහරජතුමනි, ඔබත් රජයේ සියලු නිලධාරීනුත් මේ පංච ශීලය ඉගෙන ආරක්ෂා කරන්නේ නම්, ඒ මඟින් රජයට විශාල ප්‍රතිලාභයක් හිමි වෙයි. මහරජතුමනි, රටේ නියමුවා රජතුමායි. එය ඉදිරියට ගමන් කරවන්නේ ඔහුයි. එනිසා ඔහු සෑම විටම අවධියෙන් සිටිය යුතුය. එසේම තම රාජ්‍යයේ සිදුවන සෑම දෙයක් පිළිබඳවම සෑම විටකම රජු දැනුවත්ව සිටිය යුතුය. ඔබතුමා යටතේ සිටින රටවැසියන් පංච ශීලය ආරක්ෂා කරනවා දකින්න ඇත්නම් මගධ රාජ්‍යයේ සතුටත් සාමයත් පිරී මහත් දියුණුවකට පැමිනෙනවා අනිවාර්යය.''

ප්‍රීතියෙන් උද්දාමයට පැමිණි රජු නැඟී සිට බුදුරදුන් ඉදිරියෙහි දෑත් එක් කොට වන්දනා කළේය. විදේහි බිසව ද පුත් කුමරු අජාසත්තගේ අතින් අල්ලා ගෙන බුදුරදුන් අභියසට පැමිණියා ය. ඇය තම පුත් කුමරුට උතුම් වූ බුදුරජානන් වහන්සේට ඔහුගේ දෑත් නෙළුම් කැකුළක් සේ එක් කොට නමස්කාර කරන්නේ කෙසේ දැයි කර පෙන් වූවාය. ඇය බුදුරදුන්ට මෙසේ කීවාය. ''බුදුරජානන් වහන්ස, අජාසත්‍ත කුමාරයා සමඟ ළමයින් හාරසීයක් අද ඔබ වහන්සේ දැකීමට පැමිණ සිටිනවා. ඔබ වහන්සේට පුළුවන් ද ඔවුන්ට සිහිනුවනින් සිටීමේ මාර්ගයත් ආදරයත් ගැන කියා දෙන්න.''

බුදුරදුන් ඉදිරියෙහි රැජින නමස්කාර කළාය. බුදුරදුන් සිනා සී කුමරු වෙත ළංව ඔහුගේ අත අල්ලා ගත්හ. රැජින සෙසු දරුවන් දෙස හැරී ඔවුන්ට ළඟට පැමිනෙන ලෙස සංඥා කළාය. ඉතා වැදගත් ලෙස ඇඳුම් හැඳ සිටි ඒ සෑම ළමයෙකුම වැදගත් පවුල්වලින් පැමිණි අය වූහ. පිරිමි ළමයින් මෙන්ම ගැහැනු ළමයින් ද අත්වල හා පාවල රන්මය වළලු පා පළඳනා පැළඳ සිටියහ. ඔවුන් සැවොම විවිධ වර්ණවත් අගනා ඇඳුම් හැඳ සිටියහ. අජාසත්

කුමරු බුදුරදුන්ගේ දෙපතුල් මත වැටී වැන්දේය. බුදුරදුන්ට බොහෝ ඉහත කපිලවස්තුවේ දී තමන් දඹ ගසක් යට පුංචි දරුවන් හා එක්ව සතුටු වූ හැටි සිහිපත් විය. නැවත ගෙදර ගිය විට එබඳු ගැමි ළමයින් සොයා ගොස් ඔවුන්ට දහම් මාර්ගය ගැන කියා දිය යුතු යැයි උන් වහන්සේ සිතින් සිතා ගත්හ.

බුදුරජානන් වහන්සේ ළමයින්ට තම අතීත කතාවක් සිහිපත් කර දුන්හ. ''දරුවනේ, මා මීට පෙර මනුෂ්‍ය භවයන්හිත්, කුරුල්ලන් ආදී විවිධ වූ බොහෝ භවයන්හිත් ඉපිද තිබෙනවා. ඔබ සැම දෙනාමත් මීට පෙර මං වගේම කුරුලු ආදී විවිධ වූ ජන්ම ලබා තිබෙනවා. සමහර විට ඔබත් මීට පෙර මා සමඟ විවිධ ජන්මවල එකට ජීවත් වී ඉන්න ඇති. ඒ ජන්මවල අපි එකිනෙකාගේ දුක් සැප බෙදා ගන්නටත් ඇති.

''එසේ වසර දහස් ගණනකට පෙර සිදු වූ එක් සිදුවීමක් මම ඔබලාට කියන්න කැමතියි. ඒ කතාව එක් කොකෙක් හා කකුළුවෙකුත් තවත් බොහෝ කූනිස්සන් හා මාළුන් ගැනයි.

''මා කියන කොකා හිටියේ පස් පියුම් පිපි නිල් වන් දිය පිරි අලංකාර පොකුණක් අසල පිහිටි ගසකයි. වැසි නැති ඉඩවර කාලය පැමිණි විටත් විශාල ගස්වලින් වට වී තිබූ මේ විලේ දිය නො සිඳී පිරී ඉතිරී යමින් සිසිල්ව තිබිණි. එහෙත් ඊට නුදුරින් තිබූ තවත් එක් පොකුණක වර්ෂාව නොමැතිකමින් දිය සිඳී යමින් තිබූ අතර එහි සිටි මසුන් හා කූනිස්සන් විශාල ප්‍රමාණයකට ඉතා තද බදයෙන් යුතුව ඉතිරිව තිබූ දිය පොදෙහි ජීවත් වීමට සිදුවුණා.

''මේ විලට උඩින් පියඹා ගිය කොකා ඒ දැක විල ළඟට හැරී විත් එහි ඉවුරේ සිටගෙන ඉතා දුක් මුසු මුහුණින් යුතුව මසුන් දෙස බලා ගෙන සිටියා. මේ විලෙහි කුඩා මසුන් මෙන්ම කූනිස්සන් ද කකුළුවකු ද වාසය කළා.

''දුක් මුසු මුහුණින් යුතුව විල දෙස බලා සිටින කොකා අසලට පැමිණි කුඩා මාළුන් හා කකුළුවා කොකාගෙන් මෙසේ ඇසුවා. 'කොක් යහළුවේ, මොනවා ඔබතුමා ඉතා දුකෙන් කල්පනා කරන්නේ?'

'''මම කල්පනා කරන්නේ ඔබලාගේ දුප්පත් ජීවිත ගැනයි. මේ විල මඩවලිනුත් ඔබලාගෙනුත් පිරිලා. දියත් නැහැ; කෑමත් නැහැ. ලස්සන පුංචි ඔබලාගේ දුක්බර ජීවිත ගැන මට හරිම දුක යි.'

'''ඔබ දන්නවා ද අපිට උදවු කරන්න පුළුවන් මඟක් ගැන?' පුංචි සතුන් ඇසුවා.

'''හොඳයි, ඔයාලා කැමති නම්, මීට ටිකකට එහායින් ලස්සන නෙළුම් පොකුණක් තියනවා. ඒ පොකුණ සීතල වතුරින් පිරිලා. කෑම වර්ගත් ගොඩක් තියනවා. මට පුළුවන් ඔයාලා එක් එක්කෙනා ගානේ එතනට ගෙනියන්න.'

''ඒක අහපු කකුළුවා කිවුවා 'හොඳයි අපි කැමතියි ඔබ තුමාව විශ්වාස කරන්න. ඒත් අපි කවදාවත් අහලා නෑ කොකෙක් මාළුවකුව ආරක්ෂා කළා කියලා. සමහර විට ඔබට අවශ්‍ය අපිව එක්එක්කෙනා ගෙනිහින් කන්න වෙන්නත් පුළුවන්.'

'''ඇයි ඔයාලා මට ඔය තරම් බය වෙන්නේ? මම ඔයාලට ඉතා කරුණාවන්ත පියෙක්, සහෝදරයෙක් වගේ හිතන්න. මට ඔයාලට විපතක් කරන්න කිසිම හේතුවක් නැහැ. ඇත්තටම නෙළුම් මල් පිපිච්ච ලස්සන පොකුණක් තියනවා. ඒකේ සීතල වතුර ගොඩාක් තියනවා. ඒ පොකුණ මෙතන ඉඳන් වැඩි දුරක් නැහැ. ඔයාලට සැකයක් තියනවා නම් මම ඉස්සෙල්ලාම එක්කෙනෙක් එක්ක ගිහින් පෙන්නලා නැවත ආපසු මෙතනටම ගේන්නම්. එයාට පුළුවන් මම කියන කතාවේ ඇත්ත නැත්ත ඔයාලට කියන්න.'

''පුංචි මාළුත් කුනිස්සෝත් මේ ගැන සාකච්ඡා කළා. අන්තිමට තීරණය කළා එක වැඩිමල් මාළුවෙක් කොකත් එක්ක ගිහිල්ලා කොකා කියන පොකුණ බලලා එන්න. කොකා මේ මාළුවාගේ පිටිපස පෙදෙස හොටයෙන් අල්ලගෙන නෙළුම් පොකුණ වෙත පියාඹා ගියා. පොකුණ ඉහළට ආ කොකා මාළුවා පොකුණ වෙත මුදා හැරියා. මාළුවා ඒ මේ අත පීනලා බැලුවා. ඇත්තටම හරිම පිරිසිදු සීතල වතුර. කෑම වර්ගත් ගොඩක් තියනවා. කොකා නැවතත් මේ මාළුවා රැගෙන පැරණි පොකුණ වෙත ගියා. මාළුවා තමන් දුටු විස්තර සියල්ලම අනෙත් අයට කිවුවා.

''පුංචි මාළුත් කුනිස්සෝත් කොකාගේ කරුණාවන්තකම ගැන කතා වුණා. අන්තිමට මාළු හැමෝටම කොකා එක්ක යන්න ඕනෑ වුණා. ඔවුන් ඉල්ලා සිටියා තමන් එක්එක්කෙනා ගානේ නෙළුම් පොකුණට ගෙනියන්න කියලා. කපටි කොකා මේකට සතුටින් කැමති වෙලා මාළුන් හොටයෙන් අරගෙන ඉගිලී ගියා. ඒත් මෙවර කොකා මාළුවා රැගෙන පොකුණට ගියේ නැහැ. ඌ

මාළුවා හොටයෙන් ගෙන විල ළඟ තිබූ ගස උඩට පියඹා ගියා. ඉන්පසු ඔහු මාළුවාගේ මස්, කටුවලින් ගලවලා ගිල දැම්මා. මාළුවාගේ කටුව ගස යටට අතහැරියා. ඉන් පසු ඔහු තවත් මාළුවෙක් එක්ක එන්න පියාඹා ගියා. ඒ ළඟ මාළුවාත් ඒ අයුරින්ම කා දමා කටුව ගස මුලට දැම්මා.

''මෙලෙස සෑම වරකම ඔහු මාළුවෙකුව පෙන්දෙන් අල්ලාගෙන විත් කෑවා. මෙසේ දින කිහිපයකින් ඔහු සියලු මසුන් අවසන් කළා. අන්තිමට විලේ කකුළුවා පමණක් ඉතිරි වුණා. තවමත් බඩගිනි අවසන් නොවූ කොකා කකුළුවා වෙත ගොස් මෙසේ කී ය. 'යාළුවේ, ඔන්න මම ඔබේ සියලුම මිතුරු මසුන් නෙළුම් පොකුණට ගිහින් දැම්මා. ඔවුන් එහි ඉතාම සතුටින් පිහිනමින් ඉන්නවා. ඔබ විතරක් මේ විලේ තනිවී ඉන්නේ ඇයි? එන්න මම ඔබවත් ඒ විලට ගෙනිහින් දාන්නම්.'

'''ඔබ කොහොම ද මාව එක්ක යන්නේ?' 'අනිත් හැමදෙනාවම වගේ මම ඔයාවත් මගේ හොටයෙන් අරන් යන්නම්.' 'බැරිවෙලාවත් හොටයෙන් මාව ලිස්සුවොත් මාව බිම වැටිලා මගේ කටුව කෑලි සීයකට විතර කැඩෙයි.' 'බය වෙන්න එපා මම පරිස්සමට ඔයාව හොඳින් අල්ල ගන්නම්.'

''කකුළුවා හොඳින් කල්පනා කළේය. සමහරවිට කොකා කියන්නේ ඇත්ත වෙන්නත් පුළුවන්. එයා සේරම මාළුන් නෙළුම් පොකුණට දාන්න ඇති. ඒත් සමහර විට එයා ඒ මාළුන් හා කුනිස්සන් සේරම කෑවා වෙන්නත් බැරි ද? කකුළුවා තමන්ගේ ආරක්ෂාව ගැන හොඳින් කල්පනා කළේය. 'කොක් යාළුවේ, මට බයයි. ඔයාගේ හොටය එච්චර ශක්තිමත් නැහැ මාව හයියෙන් අල්ලගන්න තරම්. මම මගේ අඬුදෙකින් ඔයාගේ බෙල්ල වටේට අල්ලා ගන්න ද? ඔයා ඉගිල්ලෙන කොට මට බය දැනෙන්නේ නැතිව ඉන්න පුළුවන් වෙයි.'

''කොකා කකුළුවා තමන්ගේ බෙල්ල වටා අල්ලා ගන්නා තුරු සිට පියාපත් විහිදා පියඹා ගියේය. එහෙත් ඔහු නෙළුම් පොකුණ වෙත නොගියේය. ඒ වෙනුවට ඔහු විල අසල පිහිටි ගස මුදුනෙහි නතර වීය.

'''යාළුවේ, ඇයි ඔබ මාව විලට ගෙනිහින් දැම්මේ නැත්තේ? ඇයි අපි මේ ගහ උඩට ආවේ?'

'''උඹට පිස්සු ද කකුළුවෝ ? මාළුන්ව නෙළුම් පොකුණට ගෙනිහින් දැමීමෙන් මට මොනව ද ලැබෙන්නේ? පේන්නේ නැද්ද මේ ගහයට තියන මාළු කටුයි, ඉස්සන්ගේ පොතු ගොඩයි? මේක ඔබගේත් ජීවිතයේ අවසානය.'

'''කොක් යාළුවේ, මාලුන්වයි, කුනිස්සන්වයි ලේසියෙන් ම රවටන්න පුළුවන් වුණාට ඔබට මාව ලේසියෙන් රවටන්න බැහැ. වහාම මාව නෙළුම් පොකුණට ගෙනිච්චේ නැත්නම් මම මගේ මේ අඬුවලින් ඔබගේ බෙල්ල කපනවා.'

''කකුළුවා ඔහුගේ තියුණු අඬුවලින් කොකාගේ බෙල්ල හිරකරන්න පටන් ගත්තා. තියුණු අඬුවලින් තද කරන විට දැනෙන වේදනාව නිසා කොකා කෑ ගහන්න පටන් ගත්තා. 'ඔච්චර හයියෙන් හිර කරන්න එපා. මම දැන්මම ඔබව නෙළුම් පොකුණට ගෙනියන්නම්. මම පොරොන්දු වෙනවා ඔබව කන්න හදන්නේ නැහැ කියලා.'

''කොකා හැකි ඉක්මනින් කකුළුවාවත් රැගෙන නෙළුම් පොකුණට පැමිණියා. නමුත් කකුළුවා කොකාගේ බෙල්ල අතහැරියේ නැහැ. කිසිදු දයාවක් නැතිව කෲර ලෙස කොකා තමන්ගේ යහළු මසුන්ව කා දැමූ හැටි ඔහු සිහි කෙරුවා. ඔහු ටිකෙන් ටික තම අඬුවලින් කොකාගේ ගෙල සිර කෙරුවා. අන්තිමේ දී කොකාගේ ගෙල කැපී ගොස් පොකුණට වැටුණා. කකුළුවා දිය යටට පිහිණා ගියා.

''දරුවනි මම මෙයින් ලොකු දෙයක් ඉගෙන ගත්තා. අපි යමෙකුට කරුණාවෙන් සැලකුවොත් ඒ අයත් අපිට නැවත කරුණාවෙන් සලකනු ඇත. එහෙත් අපි කෲර ලෙස කෙනෙකුට සැලකීම නිසා ඊට සමානවම සැලකීමක් නැවතත් ඒ සමගම හෝ පසුව හෝ ආපසු ලැබෙනු ඇත.''

ළමයින් බුදුරදුන්ගේ කථාව ඉතා උනන්දුවෙන් අසා සිටියහ. ඔවුහු කොකා ගැනත් අහිංසක මසුන් හා කුනිස්සන් ගැනත් කකුළුවා ගැනත් කථා කළහ.

බිම්බිසාර රජු නැඟී සිට දෑත් එක් කොට බුදුරදුන්ට නමස්කාර කළේය. ''බුදුරජානන් වහන්ස, ඔබ වහන්සේ ළමයින්ටත් වැඩිහිටියන්ටත් කියා දුන්නේ ඉතාම උසස් පාඩමකි. මම ප්‍රාර්ථනා කරනවා ඔබ වහන්සේගේ කතාව අජාසත්තට සැමදාටම මතක සිටින්න කියා. එසේම මම ප්‍රාර්ථනා කරනවා ඔබ වහන්සේ අපිත්

සමඟ අපගේ රාජ්‍යයේ සිටින්න කියා. ඔබ වහන්සේ එකඟ වෙනවා නම් මම ඔබ වහන්සේටත් මහා සංඝරත්නයටත් තෑග්ගක් ප්‍රදානය කරන්න කැමතියි.''

රජු දෙස බලා සිටි බුදුරජානන් වහන්සේ, ඔහුට කීමට ඇති දේ විස්තර කරන තුරු සිටියහ. මොහොතක් නිහඬව සිටි රජු කතා කළේය. ''රජගහ නුවරට සැතපුම් දෙකක් පමණ දුරින් ඉතා සුන්දර වනාන්තරයක් තියනවා. එහි නම වේළුවනය, උණ කැලෑව. නැවුම් සුළඟ නිතර හමන ඒ වනය ඉතාම ශාන්තයි; නිහඬයි; සිසිලසයි. අලංකාර ලෙහෙනුන්ගේ වාසස්ථානයකි. ඔබ වහන්සේටත් ඔබ වහන්සේගේ මහා සංඝරත්නයටත් ධර්ම මාර්ගය ඉගැන්වීමටත් පුහුණු වීම සඳහාත් එය තෑගි කරන්න මම කැමතියි. දයාවන්ත ගුරුවරයාණනි, මගේ හදවතින්ම දෙන මේ දානය පිළිගනු මැනවි.''

බුදුන් වහන්සේ මොහොතක් සිතන්නට විය. මෙය මහා සංඝරත්නයට ආරාමයක් සඳහා භූමියක් පූජා කරන ප්‍රථම අවස්ථාවයි. වැසි කාලය සඳහා භික්ෂූන්ට විසීම සඳහා ද එබඳු ආරාමයක අවශ්‍යතාව ඇති වෙමින් පවතියි. බුදුරජානන් වහන්සේ සිනහ සී හිස සලා රජුගේ නිර්ලෝභී උදාර පූජාව පිළිගත්හ. බිම්බිසාර රජුගේ සිත මහත් ප්‍රීතියෙන් පිරී ගියේය. වේළුවනය පිළිගත්තා යනු බුදුරදුන් බොහෝ කාලයක් තම මගධ රාජ්‍යයේ වාසය කරනවා යන්නයි.

එදින මාළිගයේ බොහෝ අමුත්තන් අතර විශාල සංඛ්‍යාවක් බ්‍රාහ්මණ පූජක නායකයෝ ද වූහ. ඔවුන්ගෙන් බොහෝ අය රජුගේ තීරණයට සතුටු නොවූහ. එහෙත් එයට විරුද්ධව යමක් කීමට කිසිවෙකුත් ඉදිරිපත් නොවූහ.

රජු පිරිසිදු පැන් පිරවූ රන් කෙණ්ඩියක් ගෙන්වා ගත්තේ ය. එම පැන් බුදුරදුන්ගේ සුරතට වත් කරමින් ගරු ගාම්භීර ලෙස මෙසේ කීය. ''ගුරුදේවයාණනි, මේ රන් කෙණ්ඩියේ පිරිසිදු දිය ඔබ වහන්සේගේ හස්තයට ගලා එන්නා සේ, වේළුවනය ඔබ වහන්සේටත්, ඔබ වහන්සේගේ මහා සංඝරත්නයටත් පැවරෙන්නේ ය.''

මේ වේළුවන පූජාවත් සමඟම රාජකීය උත්සවය නිමා විය. බුදුරජානන් වහන්සේ සහ එක්දහස් දෙසිය පනහක් මහා සංඝරත්නය මාළිගයෙන් පිටත් වූහ.

## තිස් එක් වන පරිච්ඡේදය

# වසන්ත කාලයෙහි මම ආපසු එන්නෙමි

ඊළඟ දිනයේ උදෑසන බුදුරජානන් වහන්සේ සිය ජ්‍යෙෂ්ඨ ශිෂ්‍යයන් කිහිප දෙනෙකු ද සමඟ වේළුවනය නැරඹීම සඳහා පැමිණියහ. ඉතා හොඳින් වැඩුණු උණ ගස් සහිත අක්කර සියයක් පමණ විහිදී ගිය එම ශාන්ත පරිසරය සංසරත්නය සඳහා ඉතාම යෝග්‍ය භූමියක් විය. එහි විවිධ වර්ගවලට අයත් උණ ගස් වැවී තිබිණි. වනය මැද පිහිටි කලන්දක විල සංඝයාට ස්නානය පිණිසත් සිවුරු සෝදා ගැනීම පිණිසත් පරිහරණය කළ හැකිය. ගස් සෙවනෙහි සක්මන් භාවනා කිරීමටත් එය ඉතාම කදිම ස්ථානයකි. උණ ගස් බොහෝ සෙයින් ඇති බැවින් මහලු භික්ෂූන්ට කුඩා පැල් පත් සකසා දීම ද පහසු වනු ඇත. කොණ්ඩඤ්ඤ, කාශ්‍යප හා ශාරිපුත්ත ඇතුළු බුදුරදුන්ගේ ජ්‍යෙෂ්ඨ ශිෂ්‍යයෝ ද සියලු දෙනාම වේළුවනය පිළිබඳව බොහෝ සෙයින් සතුටට පත් වූහ. ඉන් පසු එහි ඉතා හොඳ සංඝාරාමයක් සකස් කරන්නේ කෙසේ දැයි ඔවුහු සැලසුම් කරන්නට වූහ.

බුදුරදුන් ඔවුන්ට මෙසේ කීහ, ''මෝසම් කාලය සංචාරය සඳහා හොඳ කාලයක් නොවෙයි. භික්ෂූන්ට වැසි කාලයේ එක්ව වසමින් පුහුණු වීම සඳහා සුදුසු ස්ථානයක් අවශ්‍යයි. වැසි සමයේ සංචාරය කිරීමෙන් ලෙඩ රෝග ඇති වීමත්, ඇවිදීම නිසා පොළොවෙන් වර්ෂාවට මතුවන පනුවන් ආදී කුඩා ප්‍රාණීන් පෑගීමත් ආදී තවත් බොහෝ කරදරත් සිදු විය හැකියි. මෙබඳු ස්ථානයක වැසි කාලය ගත කිරීමෙන් ඒ සියල්ල වළකා ගත හැකියි. මෙතැන් සිට මම භික්ෂූන්ට දන්වා සිටිනවා සෑම වස් කාලයකම තමන් කොතැනක සැරිසරමින් සිටියත් භික්ෂූන් වසන පොදු තැනකට නැවත ආපසු පැමිණ වර්ෂා සමය අවසන් වනතුරු එහි වාසය කරන ලෙස. ගිහි ශ්‍රාවකයන්ගෙන් අපට ඉල්ලා සිටිය හැකියි වර්ෂා තෙමස ගත වන තුරු ආහාර හා පූජා ආරාමය වෙත රැගෙන එන ලෙස. ඒ ගිහි උපාසක පිරිසට ද භික්ෂූන් විසින් ධර්ම මාර්ගය ඉගැන් වීමෙන් ප්‍රති උපකාර කළ යුතුයි. වැසි කාලය ගිහි පිරිසට ද එමඟින් බොහෝ ලාභයක් සිදුවනු ඇත.'' මෙසේ වැසි කාලය තුළ වස් විසීමේ චාරිත්‍රය ආරම්භ විය.

මොග්ගල්ලාන හිමියන්ගේ උපදෙස් යටතේ බාල භික්ෂූන් විසින් සියලු සංඝරත්නයට අවශ්‍ය කුටි සෑදෙන්නට විය. බුදුරදුන්ට සෑදූ කුටිය කුඩා වූත් ඉතා පියකරු වූත් කුටියක් විය. රන්වන් පැහැති විශාල උණ පඳුරක් එහි පිටුපසින් විය. ඉතා උසට සණව වැඩුණු කොළ පැහැති උණ පඳුරක් සිසිල් සෙවන දෙමින් කුටියෙහි එක් පසෙකින් විය. නාගසමාල භික්ෂුව බුදුරදුන්ට සැතපීම සඳහා කුඩා මැස්සක් ලීවලින් තැනීය. ඔහු බුදුරදුන්ගේ කුටියට පිටුපසින් මුහුණ සේදීම ආදිය සඳහා විශාල දිය භාජනයක් ද මැටිවලින් සෑදීය. නාගසමාල උරුවේල කාශ්‍යපගේ ශිෂ්‍යයෙක් විය. මහා සංඝයා වේළුවනයට පැමිණි පසු ඔහු තමන්ට බුදුරදුන්ගේ උපස්ථායක වීමට හැකි ද යි කාශ්‍යපගෙන් ඇසීය.

සාරිපුත්ත හිමි නගරයේ ගිහි උපාසකයන් සමඟ සාකච්ඡා කොට විශාල සීනුවක් වේළුවනාරාමයට පූජා කිරීම සඳහා කටයුතු යෙදීය. එය කලන්දක පොකුණ අසල පැරණි ලොකු ගසක අත්තක එල්ලනු ලැබීය. භාවනාවට හා පුහුණු වීම් වේලාවන් දැනුම් දීම සඳහාත් විශේෂ අවස්ථාවලත් සීනුව නාද කරනු ලැබීය. සීනු හඬ ඇසෙන සෑම අවස්ථාවකම තම හුස්ම ගැනීම හා හෙළීම

සම්බන්ධයෙන් සිහිනුවන යොදවන ලෙස බුදුරදුන් තම භික්ෂූන් වහන්සේට දනුම් දුන්හ.

ගිහි උපාසක පිරිස් විවිධ අයුරින් බොහෝ උදවු කළහ. කාශ්‍යප ඔවුන්ට වස් කාලය පිළිබඳව විස්තර කර දුන්නේය. ''මේ වස්සාන කාලයේ සියලුම භික්ෂූන්ට බුදුරදුන්ගේ අනුශාසනා යටතේ විමුක්ති මාර්ගය ඉගෙනීමටත් පුහුණු වීමටත් අවස්ථාව සැලසෙනවා. උන් වහන්සේලාට මේ කාල සීමාවෙහි වැඩි අවධානයකින් භාවනා කිරිමට කාලය ලැබෙනවා. ඊට අමතරව වැසි කාලයේ පොළොවෙන් මතුවන පණුවන් හා කෘමීන් පෑගීමෙන් වන හානිය වැළකී යාම ද වස් විසීමෙන් වන තවත් යහපතකි. ඔබ සැමටත් මේ වස්කාලයේ සිවුපසය ගෙනැවිත් සැලකීමෙන් සංසරත්නයට සහාය විය හැකියි. ඉතාම දුප්පත් කෙනෙකුට වුවත් තමාට හැකි පමණින් එක් වපාතියක් හෝ දෙකක් හෝ ගෙනැවිත් පූජා කිරීමටත් පුළුවනි. සෑම දිනකම බුදුරජානන් වහන්සේ විසින් හෝ උන්වහන්සේගේ ජ්‍යෙෂ්ඨ ශිෂ්‍යයෙකු විසින් හෝ ධර්ම දේශනා කරනු ඇත. සෑම කෙනෙකුටම එක සමානව පැමිණ වාඩි වී ධර්මය ශ්‍රවණය කළ හැකිය.''

කාශ්‍යප පැවිදි පක්ෂය මෙන්ම ගිහි පක්ෂය ද ඉතා දක්ෂ ලෙස සංවිධානය කළේය. ඔහු ආරාමයේ ගිහි දායකයන් මුණගැසී ආහාර පූජා කිරීම් ආදී සියලු කාර්යයන් කරන ආකාරය දනුවත් වීමට උදවු කළේය. ඔහු හැම විටම සෑම භික්ෂුවකටම තම පෞද්ගලික පාවිච්චිය සඳහා සිවුරක්, පාත්‍රයක්, භාවනා කිරීම සඳහා මෙට්ටයක්, තුවායක් හා පැන් පෙරණයක් ඇත්දැයි සොයා බලා සැක හැර ගත්තේය.

වස්කාලය පැමිණීමෙන් පළමු දිනයේ බුදුරදුන් හා උන් වහන්සේගේ ජ්‍යෙෂ්ඨ ශිෂ්‍යයන් ඉතා කල්පනාකාරීව සකස් කළ දිනචරියාව අනුගමනය කළහ. අළුයම සිවු වන පැයේ දී අවදි වීම සඳහා සීනුව නාද කරනු ලැබිණි. මුව දොවා අවසන්ව භික්ෂූහු තම තමන්ගේ ස්ථානවල සක්මන් භාවනා කරන ලදහ. ඔවුහු සක්මන් භාවනාවත් හිඳගෙන භාවනා කිරීමත් උණපඳුරු මුදුනින් හිරු නැගෙන තුරු මාරුවෙන් මාරුවට සිදු කළහ. සාමාන්‍යයෙන් එය භික්ෂූන් පිඬුසිඟා යන වේලාවය. එහෙත් මේ වස්සාන කාලය බැවින් ඔවුන්ට අවශ්‍ය ආහාරපාන ගිහි උපාසක පිරිස් විසින්

ආරාමයට ගෙන එන ලදහ. එම නිසා භික්ෂූන්ට තම පෞද්ගලික ගුරුවරුන් මුණගැසී උපදෙස් ලබා ගැනීමටත් පුහුණුවන අවස්ථාවල දී තමන්ට ඇතිවන දුෂ්කරතා හා ගැටලු පිළිබඳව සාකච්ඡා කිරීමටත් අමතර කාලයක් ලැබිණි. භාවනා පුහුණු වීම්වලින් ගැඹුරු දියුණුවක් ලබන ශිෂ්‍යයෝ ගුරුවරුන් විසින් සලකුණු කරගනු ලැබූහ. කොණ්ඩඤ්ඤ, අස්සජී, කාශ්‍යප, ශාරිපුත්ත, මොග්ගල්ලාන, වප්ප ආදී භික්ෂූහු එක්එක්කෙනා පනහක් හෝ හැටක් හෝ පමණ පිරිසකට වෙන්වෙන්ව මඟ පෙන්වනු ලැබූහ. සෙසු ගුරුවරුනට භික්ෂූන් විස්සක හෝ තිහක හෝ වගකීම පැවරී තිබිණි. සෑම නවක භික්ෂුවකටම තම වැඩිමල් සහෝදරයා මෙන් පෞද්ගලිකවම පුහුණුව සඳහා උපදෙස් දෙන හා උදවු කරන භික්ෂුවක් ගුරුවරයෙකුව සිටියේය. කාශ්‍යප හා ශාරිපුත්ත දෙදෙනා පෞද්ගලිකවම මේ ක්‍රමය සංවිධානය කළහ.

මධ්‍යාහ්නයට පෙර වේලාසනින්, භික්ෂූන් වහන්සේලා විල අසලට පැමිණ තම පිණ්ඩපාත පාත්‍ර ද රැගෙන පෙළට සිට ගත්හ. ආහාර සමානව බෙදන ලදී. සෑම කෙනෙකුටම ආහාර ලැබුණු පසුව තණ වැවුණු උණගස් සෙවෙන්හි හිඳ නිහඬව සිහිනුවණින් යුතුව වැළඳූහ. වැළඳීම් අවසන් වූ පසුව පාත්‍ර සෝදනු ලැබිණි. ඉන් පසු සියලු භික්ෂූහු බුදුරදුන් වෙත හැරී හිඳගත්හ. බුදුරදුන් භික්ෂූන්ට නිර්වාණ මාර්ගය ගැන දේශනා කළහ. ඇතැම් දිනවල පැමිණ සිටි ගිහි උපාසක පිරිස් අරමුණු කරමින් ධර්ම දේශනා කළහ. තවත් ඇතැම් දිනවල පැමිණ සිටි කුඩා දරුවන් වෙනුවෙන් උන් වහන්සේගේ දේශනාව පැවැත් වූහ. ඒ දිනවල සෑම විටකම බුදුරදුන් දේශනා කළේ තමන් වහන්සේගේ පෙර සංසාරයේ සිදු වූ කතා පුවත්ය.

ඇතැම් දිනවල බුදුරදුන් වෙනුවට උන් වහන්සේගේ ජ්‍යෙෂ්ඨ ශිෂ්‍යයෙකු විසින් ධර්ම දේශනා පවත් වනු ලැබීය. එබඳු අවස්ථාවල උන් වහන්සේ හිඳගෙන ඒ ධර්ම දේශනා නිහඬව අසා සිටියහ. පිරිසිදුව පැහැදිළිව දේශනා කරන එම දේශනා අවසානයේ බුදුරදුන් ඒ පිළිබඳව වර්ණනා කර ඔහු, දිරිමත් කළහ. ධර්ම දේශනාව අවසානයේ ගිහි උපාසක පිරිස් නිවෙස් කරා ගියහ. භික්ෂූහු සක්මන් භාවනාවට සීනුව නාද කරන තෙක් විශ්‍රාම ගත්හ. උන් වහන්සේලා නින්දට පෙර මධ්‍යම රාත්‍රිය වන තෙක් ම පුහුණුවීම කළහ.

බුදුරජාතන් වහන්සේ රාත්‍රී කාලයේ භාවනා කිරීම සඳහා හිඳගත්හ. උන් වහන්සේගේ කුටියට පිට පැත්තෙන් නාගසමාල තනා දුන් ලී මැස්සට උන් වහන්සේ බෙහෙවින් ප්‍රිය කළහ. උන් වහන්සේ විශේෂයෙන් සඳ ඇති රාත්‍රී කාලයේ ඒ මත හිඳ රාත්‍රී සුළඟෙහි සිසිලස වින්දාහ. උදා එළිය වැටීමට පෙර උන් වහන්සේ කලන්දක විල වටා සක්මන් භාවනා කිරීමට ද ප්‍රිය කළහ. සෑම මොහොතකම සතුටින්, සාමයෙන්, සන්සුනව බුදුරදුන් වැඩ සිටියහ. උන් වහන්සේට කුඩා භික්ෂූන්ට මෙන් බොහෝ වේලාවක් නිදා ගැනීමට අවශ්‍ය නොවීය. කාශ්‍යප ද රාත්‍රී කාලයේත් වාඩි වී භාවනා කළේය.

බිම්බිසාර රජු ඉතා ශ්‍රද්ධාවෙන් යුතුව වේළුවනය නැරඹීම සඳහා ගියේය. ඔහු තල් වනාන්තරයට මෙන් වේළුවනයට බොහෝ අමුත්තන් රැගෙන නොගියේය. ඇතැම් අවස්ථාවල ඔහු විදේහි බිසවත් අජාතසත්‍ත කුමාරයාත් එහි කැඳවාගෙන ගියේය. ඔහු තනිව පැමිණි සෑම විටකම වේළුවනය කෙළවර රථය නවතා බුදුරදුන්ගේ කුටිය වෙත තනිව පයින්ම ගියේය. එක් දිනක් වැස්සේ තෙමෙමින් මහා සංඝයා බුදුරදුන්ගේ ධර්මදේශනයට සවන් දෙමින් සිටිනවා දුටු රජු බුදුරදුන් වෙත පැමිණ සංඝරත්නයට දන් වැළඳීමත්, ධර්ම ශ්‍රවණය කිරීමත් යන කාර්ය දෙකම වැස්සෙන් කරදරයක් නැතිව කිරීම සඳහා විශාල ධර්ම ශාලාවක් ගොඩනැඟීමට අවසර ඉල්ලීය. බුදුරදුන් ඊට අනුමැතිය දීමෙන් පසු ඊට නුදුරින්ම විශාල ධර්මශාලාවක කටයුතු ආරම්භ විය. එම ශාලාව එක් දහසක් භික්ෂූන්ටත් එක් දහසක් ගිහි ශ්‍රාවකයනටත් පහසුවෙන් සිටීමට තරම් ප්‍රමාණවත් තරම් විය. රජු ඉදි කරවූ ධර්ම ශාලාව ආරාමයට බොහෝ සෙයින් ප්‍රයෝජනවත් වීය.

බුදුරදුන් හා බිම්බිසාර රජු නිතර උණ ලී වේදිකාව මත හිඳ බොහෝ වේලාවක් සාකච්ඡා කළහ. එයින් පසු නාගසමාල විසින් බුදුරදුන්ට පැමිණෙන අමුත්තන් හා පහසුවෙන් සාකච්ඡා කළ හැකි වන පරිදි තවත් කුඩා උණලී පුටු කිහිපයක් සාදනු ලැබී ය. එක් දිනක් බුදුරදුන් හා බිම්බිසාර රජු මේ කුඩා පුටු මත හිඳ සාකච්ඡා කරමින් සිටින අතරතුර දී බුදුරදුන්ට තම ජීවිතයේ එක් රහසක් කීවේය. ''මට තවත් එක් පුතෙක් ඉන්නවා, ඔබ වහන්සේ තවම දැක නැති. මම ඉතාම ආශාවෙන් ඉන්නවා ඔබ වහන්සේට ඔහුවත් ඔහුගේ මවවත් මුණ ගස්වන්න. ඔහු විදේහී රැජිනගේ

දරුවෙක් නොවෙයි. ඔහුගේ මවගේ නම අම්බපාලී. ඔහුගේ නම ජීවක. ජීවක දැන් දහසයවන වියට ඉතාම ආසන්නයි. අම්බපාලි ජීවත් වන්නේ පාටලීපුත්‍ර නගරයට උතුරින් පිහිටි වේශාලියේයි. ඇය මාළිගයේ සිරවුණු ජීවිතයට කැමති නැහැ. එසේම ඇය නම්බුනාමවලට හෝ කීර්තිනාමවලට හෝ ආශා කරන්නේ නැහැ. ඇය ඇගේ නිදහස පමණයි උතුම්කොට සලකන්නේ. මම ඔවුනට ඔවුන්ගේ ජීවන පහසුව පිණිස සුන්දර අඹ උයනක් සහිතව යම් යම් දේ පිරිනැමුවා. ජීවක හමුදා හෝ දේශපාලන හෝ කටයුතුවලට කැමැත්තක් නැති ඉතා දක්ෂ බුද්ධිමත් දරුවෙක්. ඔහු අගනුවර අසල වෛද්‍ය අධ්‍යාපනයෙහි යෙදී ජීවත් වෙනවා. මම ඔහුට ඉතාමත් ආදරෙයි. මම බලාපොරොත්තු වෙනවා ඔබ වහන්සේත් ඔවුන්ට ඉතාම ආදරය වෙයි කියා. අහෝ අනුකම්පා ඇති බුදුහිමියනි, ඔබ වහන්සේ ජීවකත් ඔහුගේ මවත් මුණ ගැසීමට කැමති වෙනවා නම්, මම ඔවුන්ගෙන් ඉල්ලා සිටින්නම් ළඟදීම වේළුවනයට එන්න කියලා.''

බුදුරදුන් නිහඬව සිනාසෙමින් එකඟත්වය පළ කළේය. දෑත් එක්කොට බුදුරදුන්ට වන්දනා කළ රජු පිටත් වී ගියේය. ඔහුගේ හදවත කෘතඥභාවයෙන් පිරී තිබිණි.

මේ කාලය තුළ දීම වේළුවනයට තවත් විශේෂ අමුත්තන් දෙදෙනෙකු පැමිණියහ. ඔවුහු කපිලවස්තුවෙහි බුදුරදුන්ගේ නිවසේ සිට පැමිණියෝ වූහ. ඔවුහු බුදුරදුන්ගේ පැරණිම මිතුරන් වූ කාලුදායී හා ඡන්න වූහ. ඡන්න බොහෝ ඉහත සිද්ධාර්ථ කුමරුගේ රථය පැද වීය. ඔවුන්ගේ පැමිණීම වේළුවනාරාමයට විශේෂ උණුසුම් සහගත බවක් ලබා දුන්නේය.

බුදුරදුන් නිවසින් නික්මී මේ වන විට වසර හතකට වැඩියෙන් ගත වී තිබූ අතර උන් වහන්සේ නිවසින් යම් තොරතුරක් ලැබෙතැයි බලාපොරොත්තුවෙන් සිටියහ. උන් වහන්සේ කාලුදායීගෙන් රජතුමා හා බිසවත්, යශෝදරා, නන්ද, සුන්දරී නන්දා, තම යහළුවන් ගැනත් තම පුතු රාහුල කුමරු ගැනත් ඇසූහ. කාලුදායී තවමත් නිරෝගී හා කාය බලයෙන් යුතු වුව ද ඔහුගේ මුහුණ වයෝවෘද්ධ භාවයේ රේඛා වැටෙමින් තිබිණි. ඡන්න වෙතිනුත් වයොවෘද්ධ බවක් පෙනෙන්නට තිබිණි. කුටියෙන් පිටත හිඳගෙන බුදුරදුන් ඔවුන් සමඟ බොහෝ වේලාවක් කතා කරමින් සිටියහ. කාලුදායී දැන් රජයේ සැලකියයුතු නිලයක් දරන්නෙක් හා

සුද්ධෝදන රජුගේ විශ්වාසවන්ත උපදේශකයෙක් වී සිටින බව බුදුරදුන්ට දැනගන්න ලැබිණි. බුදුරජුන් නිර්වාණ මාර්ගය සොයාගෙන ඇති බවත් දෙමසකට පමණ පෙර සිට මගධයට පැමිණ එය දේශනා කරමින් සිටින බවටත් ලැබුණු ආරංචිය කිසිවෙක් විශ්වාස නොකළහ. විශේෂයෙන් සුද්ධෝදන රජුටත්, බිසවටත්, ගෝපාටත් එය ඇදහිය නොහැකි තරම් විය. රජු තමන්ගේ ප්‍රියතම හා විශ්වාසවන්තම සේවකයා වූ කාලුදායී නැවත නිවසට ආපසු එන ලෙස බුදුරදුන්වෙත ආරාධනා කිරීමට පිටත් කර එවීය. ඔහු දින තුනක සිට ගමනට සූදානම් වූයේය. දැඩි උද්යෝගයත් උනන්දුවත් නිසා ඔහුට ඒ දින කිහිපයම හරි හැටි නින්දක් නොවීය. තනිවම නොගොස් ඡන්නත් සමඟ යන ලෙස යශෝදරා යෝජනා කළාය. කාලුදායි එයට එකඟ වන විට ඡන්න සතුටින් උතුරා ගියේය. මේ දෙදෙනාට වේළුවනාරාමයට පැමිණීමට මසකට ආසන්න කාලයක් ගතවීය.

කාලුදායී කී ආකාරයට සුදොවුන් රජු වසරක පමණ කාලයක සිට ශාරීරිකව රෝගී තත්වයෙන් පසුවෙමින් සිටියි. මානසිකව ද එතුමා ඉතා සිත් වේදනාවෙන් සිටින බවත් ඔහු බුදුරදුන්ට කීය. රජු දක්ෂ උපදේශකයන් කිහිපදෙනෙක්ම රට පාලනය කිරීමේ කටයුතුවලට උපදෙස් ලබා ගැනීම සඳහා ගෙන තිබිණි. ගෝතමිය සෑම දිනකම ඉතා වීර්යවත් කෙනෙක වූවාය. නන්ද කුමරු දැන් යොවුන් වියට පත්ව සිටි අතර ඔහු කුළවත් කාන්තාවක හා විවාහ ගිවිසගෙන සිටියේය. නමින් ඇය කල්‍යාණී නම් වූවාය. නන්ද ඉතා කඩවසම් තරුණයෙකු වූ අතර ඉතා හොඳ ඇඳුම් ඇඳීමට වඩාත් ප්‍රිය කළේය. එහෙත් සුද්ධෝදන රජු නිතර කීවේ නන්ද තවමත් සුදුසු වයසට පත්ව නැත කියායි. බුදුරදුන්ගේ සොයුරිය වූ සුන්දරී නන්දා ඉතා සුන්දර තරුණියක්ව සිටියාය. යසෝදරා ගැන පවසන්නේ, ඇය සියලු ආභරණ පැළඳීම අතහැරියේ බුදුරදුන් නිවසින් පිට වූ දා සිට බවය. ඉතා චාම් ඇඳුම් අඳින්නට වූ ඇය ඈ සතුව තිබූ සියලු අගනා දේ දුප්පතුන්ට මුදල් දීම පිණිස විකුණා දැමුවාය. බුදුරදුන් දිනකට එක් වේලකට වඩා ආහාර නොගන්නා බව දැනගත් ඇය ද එසේම කරන්නට වූවාය. රාහුල සැමගේම ආදරයට ලක්ව සතුටින් මාලිගයේ සිටියි. ඔහුගේ කළු පැහැති දෙනෙත් බුද්ධිමත් බවත් අධිෂ්ඨාන ශීලීත්වයත් විදහා පෑවේය. ඔහුගේ සීයා ඔහු ඉතා ආදරයෙන් බලා ගත්තේය. සිද්ධාර්ථ කුඩා කල ආදරයෙන් බලාගත් පරිද්දෙනි.

කාලුදායී කී සෑම කරුණක්ම සැබෑ බව කියමින් ඡන්න ඒ සියල්ල ස්ථිර කළේය. නිවසේ සියලු තොරතුරු බුදුරදුන්ගේ හදවත උණුසුම් කරන්නට විය. අවසානයේ බුදුරදුන් ආපසු කපිලවස්තුවට පැමිණෙන්නේ කවදාදැයි කාලුදායී ඇසීය. ''වැසි කාලය අවසන් වූ පසු යන්නෙමි,'' බුදුරදුන් පිළිතුරු දුන්හ. ''මේ තරුණ භික්ෂූන් තමන්ගේ පුහුණුවීම් තවදුරටත් සම්පූර්ණ කරගන්නා තුරු ඔවුන් හැර දමා යාමට මම නොකැමැත්තෙමි. මා සිතනවා මේ වස්කාලය අවසන් වූ පසු මට ආපසු යාමට පහසු වේවි කියා. ඒත් කාලුදායී, ඡන්න, ඇයි ඔබ මේ ජීවිතයෙහි රසය විඳීම සඳහා මසක් හෝ ටික කලක් හෝ මෙහි නොසිටින්නේ. ඔබට තවත් කලක් ඉතිරිවේවි කපිලවස්තුවට ගොස් රජුට කියන්නට මා මෝසම් කාලය අවසන් වූ පසු ගෙදර එන බව.''

කාලුදායී හා ඡන්න වේළුවනයේ ආගන්තුකයන් ලෙස කලක් නතර වීමට වඩාත් සතුටු වූහ. ඔවුහු බොහෝ භික්ෂූන් සමඟ මිත්‍රත්ව ඇති කර ගත්හ. එසේම මේ ප්‍රීතිමත් හා සාමකාමී ජීවිතය ගිහිගෙය හැර ගොස් විමුක්ති මාර්ගයෙහි යන අය සමඟ රස විඳීමට ඔවුනට ද හැකි විය. සිහිනුවනින් සිටීමේ මාර්ගය පුහුණුවන අයුරු ඉගෙනගත් ඔවුහු, දිනපතා ජීවිතය තුළින් සිත දමනය කරන ක්‍රම වැඩූහ. කාලුදායී බුදුරදුන් සමීපයෙන්ම වැඩි කාලයක් ගත කරමින් ඉතා උවමනාවෙන් හා සැලකිල්ලෙන් උන් වහන්සේ කී කරුණු පිළිපැද්දේය. ඔහු බුදුරදුන්ගේ පුදුම සහගත සැනසිල්ල සම්පූර්ණයෙන්ම ලබා ගත්තේය. එය බුදුරදුන් පත්ව තිබූ තත්වයම බව පැහැදිලි විය. ඔහු තවදුරටත් කිසිදු ආශාවක් පසුපස ලුහු නොබැන්දේය. බුදුරදුන් නිදහසේ දියෙහි පිහිනා යන මත්ස්‍යයෙකු මෙන් නිදහස්ය. නිදහස් අහසේ සෙමින් සෙමින් පාවෙන වලාකුලක් මෙනි. උන් වහන්සේ සම්පූර්ණයෙන්ම වර්තමාන මොහොතේ ජීවත් වන්නෙහිය. උන් වහන්සේගේ දෙනෙතත්, සිනහවත් උන් වහන්සේ භුක්ති විඳින අසීමිත නිදහසටත් පුදුම සහගත විමුකිතියටත් සාක්ෂ්‍ය පෑවේය. උන් වහන්සේට මෙලොව කිසිදු බැඳීමක් හෝ සීමාවක් හෝ නොවීය. එසේම උන් වහන්සේ මෙන් සෙස්සන්ව මෙතරම් හොඳින් තේරුම් ගෙන, ආදරය කරන වෙනත් කිසිවෙක් නොවීය. තම පැරණි මිත්‍රයා ගිය විමුක්තියේ මාවත කාළුදායී දුටුවේය. එක් වරටම

විළංගුවලින් මිදී ගිය ශාන්ත නිදහස් භික්ෂුවකගේ ජීවිතය ඔහුම දැක ගත්තේය. තමන් සතු සියලු තනතුරු, සම්පත්, කීර්තිනාම හා ජීවිතයේ ඇති සියලු දුක් වේදනා මෙන්ම කාංසාවන් ද ඕනෑම් මොහොතක අතහැරීමට තමන් සූදානම් බව ඔහුට දැනිණි. වේළුවනයේ දින හතක් ගතවීමෙන් පසුව බුදුරදුන් ළඟ භික්ෂුවක් ලෙස පැවිදි වීමේ අදහස ඔහු ස්ථිර කර ගත්තේය. බුදුරදුන් මද වේලාවක් පිළිගත නොහැකි දෙයක් දෙස බලන්නාක් මෙන් කාළුදායී දෙස බලා සිටියහ. පසුව සිනාසුණු උන් වහන්සේ ඔහුගේ බාලාපොරොත්තුව පිළිගනිමින් හිස සැලූහ.

ඡන්න ද ඒ සමානවම පැවිදි වීමේ තීරණයෙන් යුතුව සිටියේය. එහෙත් රජ පවුල වෙනුවෙන් තමන්ට ඇති යුතුකම සිහි කළ ඔහු යශෝදරාගෙන් නොඅසා තමන් පැවිදිවීම නො කළ යුතු යැයි තම අදහස යටපත් කර ගත්තේය. තම ඉල්ලීම බුදුරදුන්ට ඉදිරිපත් කිරීමට උන් වහන්සේ ආපසු කපිලවස්තුවට පැමිනෙණ තෙක් ඉවසා සිටීමට ඔහු අධිෂ්ඨාන කර ගත්තේය.

## තිස් දෙවනි පරිච්ඡේදය

# ඇඟිල්ල සඳ නො වේ

දිනක් දහවල් කාලයේ ශාරිපුත්ත හා මොග්ගල්ලාන බුදුරදුන් හමුවට එක් මිත්‍රයෙක් කැඳවාගෙන ආහ. ඔහු දීඝනක නම් වූ තවුසායි. දීඝනක ශාරිපුතතගේ මාමා කෙනෙකි. තම බෑණා බුදුරදුන්ගේ ශිෂ්‍යයෙකු වී ඇති බව දැන ගත් පසු ඔහුට ද බුදුරදුන්ගේ ඉගැන්වීම් පිළිබඳව දැන ගැනීමට කුතුහලයක් ඇති විය. තමන්ටත් බුදුරදුන් උගන්වන දහම ගැන යමක් කියන ලෙස ඔහු ශාරිපුත්ත හා මොග්ගල්ලානගෙන් විමසූ විට ඍජුවම බුදුරදුන්ව මුණගැසෙන ලෙස ඔවුහු දීඝනකට යෝජනා කළහ.

දීඝනක බුදුරදුන්ට මෙසෙ කීය. ''ගෞතම, ඔබගේ ඉගැන්වීම කුමක් ද? මා නම් කිසිවෙකුගේ කිසිදු වාදයකට හෝ ධර්මයකට හෝ කැමති නැහැ. මම ඒ කිසිවක් පිළිගන්නේත් නැහැ.''

බුදුරදුන් සිනාසී ඔහුගෙන් මෙසේ ඇසී ය. ''ඔබගේ දහම කිසිදු දහමකට කැමති නොවීම ද? කිසිවකුගේ ධර්මයක් හෝ වාදයක් හෝ පිළි නොගැනීම ද?''

මදක් පසුබා ගිය දීඝනක මෙසේ පිළිතුරු දුන්නේය. ''ගෞතම, මා ඒවා පිළිගත්තත් නැතත් ඒවායෙහි කිසි වැදගත් කමක් නැහැ.''

බුදුරදුන් ඉතා මෘදු හඬින් කථා කළහ. ''යම් පුද්ගලයෙක් යම් වාදයක් හෝ දහමක් හෝ විශ්වාසයෙන් දැඩිව අල්ලා ගතහොත් ඔහුගේ සම්පූර්ණ නිදහස් බව නැති වී යන්නේය. යමෙක් අන් අයගේ ධර්ම හෝ වාද හෝ නොරුස්නා නොපිළිගන්නා තත්වයට පැමිණි පසු ඔහු සිතන්නේ තමන්ගේ වාදය පමණක් සත්‍ය හා නිවැරදි බවයි; සෙසු සියලු ධර්ම හා වාද මිත්‍යා බවයි. සියලු මතභේද හා ගැටුම් ඇති වන්නේ මේ පටු දෘෂ්ඨී නිසායි. ඔවුනට මේ වාද බොහෝ දුර කරගෙන යා හැකියි. අවසානයේ යුද්ධයක් දක්වා ද පමුණුවන්නට ඒ වාදවලට හැකියාව තිබේ. යම් දෘෂ්ඨියකට බැඳී සිටීම විමුක්තිය ලැබීමේ මාර්ගයට ඇති විශාලතම බාධාවයි. යමෙකුගේ තමන් එතෙක් එල්බගෙන සිටි පටු දෘෂ්ඨී අතහැරීම සිදු වන්නේ නම් ඔහුට වැඩි කලක් ගත නොවී සත්‍යයේ දොර විවර කර ගැනීමට හැකි වන්නේය.

''මම ඔබට කියා දෙන්නම් එක් වැන්දඹු පුරුෂයෙක් ගැන. ඔහු ජීවත් වූයේ ඔහුගේ පස් වියැති පුත්‍රයා සමඟයි. ඔහු ඔහුගේ ජීවිතයටත් වැඩි ආදරයකින් තම පුතු ආදරයෙන් පෝෂණය කළේය. එක් දිනක් ඔහු තම ව්‍යාපාර කටයුත්තක් සඳහා පුතු ගෙදර දමා පිට වී ගියේය. ඔහු ගිය අතරතුර ගමට කොල්ලකරුවන් පැමිණ සියලු දේ පැහැරගෙන නිවෙස්වලට ද ගිනි තබා ගියහ. ඔවුහු දරුවා ද පැහැරගෙන ගියහ. නිවෙස් හිමියා නැවත ගෙදර පැමිණි විට තම නිවස අසල බාගෙට පිළිස්සී ගිය ලාබාල දරුවකුගේ මළ සිරුරක් දුටුවේය. ඔහු එම සිරුර තම පුතාගේ යැයි සිතා ගත්තේය. මළ සිරුර ළඟ වැටී එය ඇකයෙහි තබාගෙන ඔහු හැඬුවේය; විලාප තැබුවේය. අවසානයේ මළ සිරුර ආදාහනය කොට එහි අළු ටිකක් මල්ලක දමාගෙන ඔහු යන යන තැන රැගෙන ගියේය. මක් නිසාද යත් ඔහු තම පුතුට හද පත්ලෙන්ම ආදරය කළ බැවිනි. මාස කිහිපයකට පසු එම දරුවා සොරුන් අතරින් පැන ගොස් තම නිවස සොයා පැමිණියේය. මැදියම් රැයේ නිවසට පැමිණි පුතු දොරට තට්ටු කළේය. ඒ මොහොතේ පියා අළු මල්ලක් එල්ලාගෙන වැළපෙමින් සිටියේය. දරුවා ඔහුගේ පුතා යැයි හඳුන්වමින් කතා කරද්දීත් ඔහු දොර හැරීම ප්‍රතික්ෂේප කළේය. ඔහු තම පුතා මිය ගිය බව තදින් විශ්වාස කර සිටියේය. දොරට ගහන ළමයා ගැන ඔහු සිතුවේ අසල් වැසි ළමයෙක් තමන්ගේ ශෝකීභාවයට සමච්චල් කිරීම සඳහා එසේ කරනවා

කියායි. අවසානයේ දරුවාට තීරණයක් ගැනීමට නොහැකිව ඉබාගාතේ ඇවිදගෙන ගියේය. මෙසේ පියාටත් පුතාටත් ඔවුනොවුන් එකිනෙකාට සදහටම නැති වී ගියේය.

''බලන්න මගේ මිත්‍රය, අපි යම් විශ්වාසයකට බැඳී එය පරම සත්‍යය යැයි අල්ලාගෙන සිටින අතර යම් දිනෙක සැබෑම වූ පරම සත්‍යය අප වෙත සුළු මොහොතක දී පැමිණේ වි. එහෙත් අපට දැනටමත් සත්‍යය මුණගැසී ඇතැයි යන සිතුවිල්ලෙහි සිටින බැවින් තරුණ වැන්දඹුවාට සිදු වූ සිදුවීම මෙන් සැබෑ සත්‍යය පැමිණ අපගේ දොරට තට්ටු කරද්දී පවා එය පිළිගැනීමට අපේ මනස විවෘත කර ගැනීමට අපට නොහැකි වේවි.''

''ඒත් ඔබගේ ඉගැන්වීම ගැන කොහොමද අපි හිතන්නේ? යම් කෙනෙක් ඔබගේ ඉගැන්වීම් අනුගමනය කළොත් ඔහුත් පටු දෘෂ්ඨියක් අල්ලා ගත්තා වේවි ද?''යි දීඝනක ඇසීය.

''මගේ ඉගැන්වීම වාදයක් හෝ දෘෂ්ඨියක් හෝ නොවෙයි. එය ව්‍යාඛ්‍යානාත්මක සිතුවිල්ලක ප්‍රතිඵලයක් හෝ නොවේ. ගින්න හෝ ජලය හෝ පොළොව හෝ සුළඟ හෝ ආත්මය හෝ විශ්වයේ සීමිත අසීමිත හෝ බව, තාවකාලික හෝ සදාකාලික හෝ බව ආදි විශ්වයේ මූලික සාරය අඩංගු වන විවිධ දාර්ශනික මතයක් හෝ මනෝමය අනුමානයක් හෝ ද නොවේ. සත්‍යය ගැන මනෝමය අනුමානයක් හෝ අක්‍රමික සිතුවිල්ලක් හෝ යනු කුහුඹුවන් බඳුනක මුව දාරය මත රවුමට ගමන් කරන්නාක් මෙනි. ඔවුනට කිසි දිනක කිසිවක් හමු නොවෙයි. මගේ ඉගැන්වීම දර්ශනයක් නොවෙයි. එය ඍජුවම අත්දැකීමෙහි ප්‍රතිඵලයකි. මා කියන සෑම දෙයක්ම පැමිණෙන්නේ මගේ අත්දැකීම් තුළිනි. ඔබට ඒ සියල්ලම ඔබේම අත්දැකීම් තුළින් තහවුරු කරගත හැකියි. මා උගන්වන්නේ සියල්ල අනිත්‍ය හා එකිනෙකට වෙන් නොවී පවතින බවයි. මෙය මා උගෙන ඇත්තේ මගේම ඍජු අත්දැකීමෙනි. එය ඔබටත් කළ හැකියි. සියලු දේම ඒවායෙහි ඇති වීම, පැවැත්ම හා නැති වීම සඳහා අනෙත් සියලු දේ මත පිහිටා පවතින බව මගේ ඉගැන්වීමයි. සියල්ල මවන්නා වූ ඒකාත්මික පුද්ගලයෙක් හෝ තනි දෙයක් හෝ නැත. මවිසින් මේ සත්‍යය ඍජුවම අත්දැක ඇත්තෙමි. ඔබට ද එය එසේම අත්දැකිය හැකියි. මගේ අරමුණ වනුයේ සෙස්සනට සත්‍යයෙහි ඍජු අත්දැකීම ලබා ගැනීම සඳහා

මඟ පෙන්වීම මිස විශ්වය පිළිබඳව විස්තර කිරීම නොවේ. සත්‍යය පෙන්වා දීමට වචනවලට නොහැකිය. සත්‍යයේ සැබෑ මුහුණ දැකිය හැක්කේ අපගේ සෘජු අත් දැකීමෙන් පමණි.''

''පුදුමයි ගෞතම, ආශ්චර්යයි,'' දීඝනක මොර දුන්නේය.

''ඒත් ගෞතම, යම් කෙනෙක් ඔබගේ ඉගැන්වීම දෘෂ්ටියක් ලෙස පිළිගත්තොත් කුමක් වේවි ද?'' මොහොතක් නිහඬව සිටි බුදුරදුන් හිස සැලූහ. ''දීඝනක, ඒක බොහොම හොඳ ප්‍රශ්නයක්. මගේ ඉගැන්වීම දෘෂ්ටියක් හෝ ඇදහිල්ලක් හෝ නොවේ. එහෙත් කිසිම සැකයක් නැහැ, යමෙක් යම් දිනක එය එසේ පිළිගනු ඇත. මම පැහැදිළිවම කියමි. මගේ ඉගැන්වීම සත්‍යය අවබෝධයට හෙවත් විමුක්තියට මඟ පෙන්වීම මිස එයම විමුක්තිය නොවේ. හරියට කෙනෙකුට ඇඟිල්ල දිගුකොට සඳ පෙන්වද්දී සඳම සඳ මිස ඇඟිල්ල සඳ නොවන්නාක් මෙනි. බුද්ධිමත් මිනිසෙකු සඳ දැක්වීම සඳහා ඇඟල්ල දිගු කරද්දී සඳ දැකීමට කැමති තැනැත්තා ඇඟිල්ල දෙස පමණක් බලයි නම්, සඳ දෙස නොබලයි නම්, ඔහු ඇඟිල්ල සඳ යැයි වරදවා වටහා ගනු ඇත. ඔහු කිසි දිනෙක සැබෑ සඳ නො දකිනු ඇත. මගේ ධර්මය ප්‍රායෝගික පුහුණුව සඳහා මිස අල්ලාගෙන වන්දනා කිරීම සඳහා නොවන්නේය. මගේ ධර්මය ගඟ තරණය කිරීම සඳහා වන පහුරක් මෙනි. ගඟ තරණය කළ පසුව පහුර ඔසවාගෙන තැනතැන ගෙන යන්නේ මෝඩයෙකු පමණි.''

දීඝනක දෑත් එක් කළේය. ''බුදුරජානන් වහන්ස, කරුණාකර වේදනා සහගත විඳීම්වලින් නිදහස් වන මඟ මට පෙන්වන්න.''

බුදුරදුන් ඔහුට මෙසේ කීහ. ''ප්‍රසන්න, අප්‍රසන්න හා මධ්‍යස්ථ ලෙස වේදනාවෝ තුන් වර්ගයක් වෙති. මේ තෙවර්ගයේ ම වේදනාවනට සිත හා කය මුල් වෙයි. සෙසු සෑම මනෝමය හෝ ද්‍රව්‍යමය හෝ දේවල් මෙන්ම විඳීම් ද ඇති වී නැති වී යයි. ඒ විඳීම් ප්‍රසන්න වුව ද අප්‍රසන්න වුව ද මධ්‍යස්ථ වුව ද මගේ ඉගැන්වීම වනුයේ සියලු විඳීම් ඇති වීමේ හේතුව පැහැදිලි කර ගන්නා ආකාරය ගැඹුරින් දැකීමයි. ඔබ ඔබගේ විඳීම්වලට හේතුවන මූලය දකින විට එහි ස්වභාවය ද අවබෝධ වේවි. විඳීම් ස්ථිර නොවන බව හා ක්‍රමයෙන් ඒවායේ ඇති වීමත් නැතිවී යන

ආකාරයත් ඔබ දකිනු ඇත. සැබෑ සත්‍ය දැකීමේ සාවද්‍ය මාර්ගය තුළ දුක් වේදනා සියල්ලකම හේතුව ද පවතී. ඔබ විසින් වැරදි දෘෂ්ඨි මුලිනුපුටා දැමූ කල සියලු දුක් වේදනා ද නිවාරණය වන්නේය. මනුෂ්‍යයා අස්ථිර දේ ස්ථිර යැයි සලකන්නේ වැරදි දෘෂ්ඨි හේතුවෙනි. සියලු දුක්වලට හේතුව අවිද්‍යාවයි. ඒ අවිද්‍යාව හෙවත් මෝහය අභිබවනය සඳහා අපි සිහිනුවණ වැඩීමේ මාර්ගය පුහුණු කරන්නෙමු. යමක සත්‍ය ස්වභාවය අවබෝධ කර ගනු පිණිස කෙනෙකු ඒ දෙය දෙස ගැඹුරින් බැලිය යුතුය. පූජා කිරීමෙන් හෝ යැදීමෙන් හෝ කිසිවෙකුටත් අවිද්‍යාව මැඩලිය නොහැක.''

බුදුරදුන් දීඝනකට විස්තර කළ මේ සියල්ල ශාරිපුත්ත, මොග්ගල්ලාන, කාලුදායී, නාගසමාල හා ඡන්න යන සියලු දෙනා ද අසාගෙන සිටියහ. බුදුරදුන්ගේ ඉතා ගැඹුරු වචනවල තේරුම ශාරිපුත්තට ග්‍රහණය කරගත හැකි විය. දීප්තිමත් හිරු බැබලෙන්නාක් මෙන් ඔහුගේ සිත ද දීප්තිමත්ව බැබලෙන අයුරු ශාරිපුත්තට දැනුණේය. ඔහුගේ සිත තුළ ඇති වූ සතුට සඟවාගත නොහැකි වූ තැන ශාරිපුත්ත බුදුරදුන්ට දෑත් එක් කොට දණගසා වැන්දේය. ඒ සමඟම මොග්ගල්ලාන ද ශාරිපුත්ත මෙන්ම බිම වැතිරී වැන්දේය. බුදුරදුන් කී සියල්ලෙන්ම අපමණ සතුටට පත්ව සිටි දීඝනක ද බුදුරදුන් ඉදිරියෙහි වැතිරී වැන්දේය. කාලුදායී හා ඡන්නගේ සිත්වල මේ දර්ශනය තදින් කාවැදී ගියේය. ඔවුනට බුදුරදුන් සමඟ ඇති සම්බන්ධතාව පිළිබඳව ආඩම්බරයක් දැනුණේය. ඔවුනට බුදුරදුන්ගේ මාර්ගය පිළිබඳව වූ විශ්වාසයත් ඇදහීමත් තවතවත් ශක්තිමත් වූයේය.

ටික දිනකට පසුව විදේහී බිසව තම සහායකයෙකු සමඟ පැමිණ සංඝයාට ආහාර පූජා කළේය.

බුදුරදුන්ගේ මඟ පෙන්වීම යටතේ භික්ෂූන් වහන්සේලා විමුක්ති මාර්ගය පුහුණු කිරීමෙහි විශාල දියුණුවක් ලබමින් සිටියහ. ඒ භික්ෂූන් අතර ශාරිපුත්ත හා මොග්ගල්ලාන දෙදෙනා ඔවුන්ගේ තියුණු බුද්ධිමත්කමත්, කඩිසරකමත්, නායකත්වයේ හැකියාවත් නිසා දීප්තිමත් තරු දෙකක් මෙන් බැබැලෙන්නට වූහ. ඔවුහු කොණ්ඩඤ්ඤ හා කාශ්‍යප සමඟ භික්ෂූන්ට මඟ පෙන්වීම සඳහා ක්‍රියා කළහ. කෙසේ වෙතත් සංඝයාගේ කීර්තිය වැඩී පැතිරී යනවා මෙන්ම සමහර මිනිසුන් බුදුරදුන්ගේ හා සංඝයාගේ වැරදි කියන්නට පටන් ගත්හ. සංඝයාට රජු කරන උදවු පිළිබඳව ඊර්ෂ්‍යාව ඇති වූ

ආගමික කණ්ඩායම් ඇතැම් දූෂමාන ආරංචි පැතිරවීම සිදුකළහ. වේළුවනයට නිතර පැමිණෙන ගිහි උපාසක පිරිස් මේ කතාවලින් ඉතා ඉක්මනින් කලබල වන්නට වූහ. රජගහ නුවර උසස් පවුල්වල සෞඛ්‍යසම්පන්න හොඳ තරුණයන් විශාල ප්‍රමාණයක් පැවිදි වීම දැකීමෙන් සමහරෙක් ශෝකයට පත් වන්නට වූහ. තව නොබෝ කලකින් මෙසේ සියලුම තරුණයන් සිය නිවෙස් අතැර පැවිදි වනු ඇත. එවිට රජගහ නුවර කුලවත් පවුල්වල තරුණියන්ට ඉතා ඉක්මනින් ම සුදුසු සැමියෙකු සොයා ගැනීමට නොහැකි වනු ඇතැයි ඇතැම්හු බියට පත් වූහ. මෙතෙක් පැවත ආ වැදගත් පවුල් පරම්පරා තව දුරටත් ඉදිරියට නොපවතිනු ඇතැයි ඔවුහු අනතුරු ඇඟවූහ.

බොහෝ භික්ෂූහු මෙබඳු කතා ඇසෙද්දී ඒවා ගණනකට නොගත්හ. එහෙත් ගිහි පක්ෂයත් පැවිදි පක්ෂයත් යන දෙපිරිස ම බුදුරදුන් වෙත පැමිණ මේ ගැන දන්වද්දී ''මෙබඳු දේ පිළිබඳව කණගාටු නොවන ලෙසත්, ඉතා ඉක්මනින් හෝ ක්‍රමයෙන් හෝ එම කතා කීම් නැති වී යනු ඇත'' යි කියමින් ඔවුන්ව සන්සුන් කළහ. එය එසේම සිදු විය. මසකටත් අඩු කාලයක් තුළ එබඳු නොවැදගත් බියක් ගැන කතා කිරීම තව දුරටත් සිදු නොවීය.

## තිස් තුන් වන පරිච්ඡේදය

# ලස්සන නැති නොවේ

වස්සාන කාලය අවසන් වීමට දෙසතියකට පෙර අසාමාන්‍ය රූමත් බවකින් යුතු කාන්තාවක බුදුරදුන් දකීමට පැමිණියාය. ඈ පැමිණියේ සුදු අශ්වයන් දෙදෙනෙකු විසින් ඇදගෙන යනු ලබන සුදු පැහැති කරත්තයකිනි. වයස අවුරුදු දහසයට ආසන්න වූ නව යොවුන් වියෙහි පසුවන පිරිමි ළමයෙකු ද ඈ සමඟ විය. ඇයගේ ඇඳුම් විලාසිතා මෙන්ම හැසිරීම් ද ඉතාමත් විනීත හා ශෝභමාන විය. ඈ තරුණ භික්ෂුවක් වෙත ගොස් බුදුරදුන් වෙසෙන කුටියට යන පාර පෙන්විය හැකි ද යි ඇසුවාය. එහෙත් ඔවුන් එහි පැමිනෙන විට බුදුරදුන් සක්මන් භාවනාවෙහි යෙදී සිටියහ. භික්ෂූන් වහන්සේලා ඇයට බුදුරදුන්ගේ කුටිය ඉදිරිපිට උණ ලී පුටු මත වාඩි වී සිටින ලෙස දැන්වීය.

ටික වේලාවකට පසුව බුදුරදුන් කාලුදායී, ශාරිපුත්ත හා නාගසමාල සමඟ පැමිණියහ. කාන්තාව හා යෞවනයා නැඟී සිට ඉතා ගෞරවයෙන් බුදුරදුන් වෙත නමස්කාර කළහ. උණ ලී පුටුවක් මත වාඩි වූ බුදුරදුන් ඔවුන්ට ද නැවතත් අසුන් ගන්නා ලෙස ආරාධානා කළහ. මේ කාන්තාව අම්බපාලී බවත් යෞවනයා බිම්බිසාර රජුගේ පුත් ජීවක බවත් බුදුරදුන් වටහා ගත්හ.

කාලුදායී මෙතරම් රූමත් කාන්තාවක ඔහුගේ මුළු ජීවිත කාලයටම දැක නොතිබුණේය. ඔහු භික්ෂුවක් වී ගතවී ඇත්තේ යන්තම් මාසයක් පමණි. භික්ෂුවකට රූමත් කාන්තාවක දෙස බැලීම සුදුසු ද නැද්ද යන්න ඔහුට අවුල් සහගත ගැටලුවක් විය. කුමක් කරන්න දැයි සිතාගත නොහැකි වූ ඔහු දෙනෙත් බිමට හරවා ගත්තේය. නාගසමාලට ද ගත හැකි වූයේ ඒ මඟම පමණි. කාන්තාවගේ දෙනෙත් දෙස ඍජුව බැලුවේ බුදුරදුන් හා ශාරිපුත්ත පමණි.

ශාරිපුත්ත අම්බපාලි දෙස බලා යළි බුදුරදුන් දෙස බැලී ය. බුදුරදුන්ගේ හැසිරීම් කෙතරම් ස්වභාවික ද කෙතරම් සන්සුන් දැයි ඔහු දුටුවේය. උන් වහන්සේගේ මුහුණ සුන්දර වූ පූර්ණ චන්ද්‍රයා මෙන් බැබළෙයි. උන් වහන්සේගේ දෙනෙත් කරුණාවෙන් හා පැහැදිලි බවින් පිරී තිබිණි. බුදුරදුන්ගේ හදවතෙහි සෑම අවස්ථාවකම එකසේ පවතින සන්තෘෂ්ඨිය, සහනය හා ප්‍රීතිය එකෙනෙහි ද ශාරිපුත්තගේ සිතට දැනී ගියේය.

අම්බපාලි ද බුදුරදුන්ගේ දෙනුවන් දෙස කෙළින්ම බැලුවා ය. බුදුරදුන් ඇය දෙස දැන් බලන අයුරින් මින් පෙර කිසි දිනෙක කිසිදු පිරිමියෙක් ඈ දෙස බලා නැත. ඇයට මතක ඇති දිගු කාලයේ සිට ඇය දෙස ඕනෑකමින් බලා සිටි මිනිසුන්ගේ දෙනෙත්වල වූයේ අපහසුතාවක් හෝ දැඩි ආශාවක් හෝ පමණි. එහෙත් බුදුරදුන් ඈ දෙස බලා සිටියේ උන් වහන්සේ වලාකුළක් හෝ ගඟක් හෝ මලක් හෝ දෙස බලා සිටින්නාක් මෙනි. බුදුරදුන්ට තමන්ගේ හදවත තුළ ඇති වූ සිතුවිලි ගැඹුරින් දැකිය හැකි වී යැයි යන හැඟීමක් ඈ තුළ ඇති විය. ඇය දෑත් එකතු කර තමන්වත් තම පුතුවත් බුදුරදුන්ට හඳුන්වා දුන්නාය.

''මම අම්බපාලි, මේ මගේ පුතා ජීවක. ඔහු වෛද්‍යවරයෙක් වීමට ඉගෙන ගන්නවා. අපි ඔබ ගැන හුඟාක් දේවල් අසා තිබෙනවා. අපි දෙන්නාම මේ මොහොත උදාවෙනතුරු හුඟාක් ආශාවෙන් බලා සිටියා.''

බුදුරදුන් ජීවකගෙන් ඔහුගේ ඉගෙනීම් කටයුතු හා දෛනික ජීවිතය ගැන තොරතුරු ඇසූහ. ජීවක ඉතා විනීතව පිළිතුරු දුන්නේ ය. ඔහු ඉතා කාරුණික සිතක් ඇති බුද්ධිමත් දරුවකු බව බුදුරදුන්ට පෙනී ගියේය. ඔහුත් අජාසත්ත කුමරුත් එකම පියාගේ දරුවන් වූ

මුත් අජාසත්ත කුමරුට වඩා ජීවකගේ චර්යාවෙහි පැහැදිළිව විශාල වෙනසක් තිබිණි. ජීවකගේ සිත බුදුරදුන් කෙරෙහි ගෞරවයෙනුත් සෙනෙහසිනුත් පිරිණි. තමන්ගේ වෛද්‍ය අධ්‍යාපන කටයුතු අවසන් වූ පසු බුදුරදුන් ළඟ නතර වීමට වේළුවනයට පැමිනෙණ බව ජීවක කීවේය.

බුදුරදුන් හමුවීමට පෙර අම්බපාලි සිතා සිටියේ උන් වහන්සේ ද තමන් පෙර හමු වී ඇති බොහෝ ප්‍රසිද්ධ ගුරුවරුන්ට සමාන විය යුතු යැයි කියාය. එහෙත් ඇය මීට පෙර කිසි දිනෙක බුදුරදුන් වැනි කෙනෙකුන් හමු වී නොතිබිණි. උන් වහන්සෙගේ බැල්ම කිව නොහැකි තරම් දයාවකින් හා කරුණාවකින් යුතු විය. තමන්ගේ හදවතෙහි සිරවී ඇති සියලු දුක්ඛ උන් වහන්සේට වැටහී ඇතිවාක් මෙන් ඇයට හැඟිණි. බුදුරදුන් තමන් දෙස බලා සිටින ආකාරයෙන්ම පමණක් තමන්ගේ හදවතෙහි ඇති දුක්වේදනාවලින් බොහෝමයක් සංසිඳී යන්නාක් මෙන් දැනෙන්නට විය. ඇඟි පිහාටු මත දිලෙන කඳුළු කැටිවලින් යුතු ඇ මෙසේ කීවාය.

''ගුරුතුමනි, මගේ ජීවිතය දුකෙන් පිරී ඇත. මුදල්වලින් හෝ දේපළවලින් හෝ කිසිදු අඩුවක් මට නැති වුණත් මා අපේක්ෂා කළ කිසිවක් මේ වන තෙක් මට ලැබී නැහැ. අද මගේ ජීවිතයේ ප්‍රීතිමත්ම දිනයයි.''

අම්බපාලි ගායන හා රංගන ශිල්පයෙහි පරතෙරට පැමිණ සිටියාය. එහෙත් ඇය කිසිවෙකු වෙනුවෙන් හෝ ඒවා ඉදිරිපත් නොකළාය. කිසිවෙකු අමනාප වනු වැළකීම සඳහා හෝ කිසිවෙකු කෙතරම් රත්රන් පිරිනැමීමට සූදානම් වූ විටක හෝ ඇය රංගන ගායන කිසිවක් ඉදිරිපත් කිරීම ප්‍රතික්ෂේප කළාය. ඇය දහසය වන වියෙහි පසුවෙද්දී ආදර සම්බන්ධයක පැටළිණි. අන්තිමේ සිත් බිඳීමෙන් එය අවසන් විය. ඉතා කෙටි කලකින් ඇයට තරුණ බිම්බිසාර කුමරු මුණගැසිණි. ඔවුහු එකිනෙකා කෙරෙහි ආදරයෙන් බැඳුණහ. නොබෝ කලකින් ඇය ඔවුන්ගේ පුත් ජීවක බිහි කළා ය. එහෙත් මාළිගාවෙහි කිසිවෙකුත් අම්බපාලී හා ඇගේ පුතු පිළිගැනීමට කැමති නොවීය. ජීවක මාර්ගය අසල කසල බඳුනක සිට හමුවී බිම්බිසාර කුමරු විසින් බේරා ගැනීම පමණක් සිදු කර ඇති බවට රජ පවුලේ ඇතැම් සාමාජිකයන් විසින් කටකතා පැතිරවීම පවා සිදු කෙරිණි. මේ අපවාදවලින් අම්බපාලිගේ සිත

තදින්ම රිදී ගියේය. මාළිගයේ සෙසු අය විසින් ඊර්ෂ්‍යාව හා ද්වේෂය හේතුකොටගෙන කරන මේ නින්දා අපවාද ඇය ඉවසා සිටියාය. තමන්ට ආරක්ෂා කර ගැනීමට ඇති එකම දෙය තමන්ගේ නිදහස බව ඉක්මනින්ම ඇය දුටුවාය. මාළිගයේ ජීවිතය ප්‍රතික්ෂේප කළ ඇය, ඇයගේ පෞද්ගලික නිදහස කිසිවෙකු නිසාවත් අත් නොහැරීමට තරයේම තීරණය කළාය.

බුදුරදුන් ඇයට ඉතාමත් ආදරයෙන් කතා කළහ, ''අනෙක් සෑම දෙයක් මෙන්ම රූමත් බව ද ඇති වෙයි. යළි නැති වී යයි. යසස හා සැප සම්පත්හි ද ඊට වැඩි වෙනසක් නැත. සැබෑ සතුට වනුයේ භාවනාවෙහි ඵලයන් වන සාමය, සතුට හා ස්වාධීනත්වය පමණි. අම්බපාලි, ඔබගේ ජීවිතයේ ගත වන සෑම මොහොතක්ම ඉතාම හොඳින් සලකන්න. අලසකමින් හෝ අමතක වන සුළු බවින් හෝ ඔබ විසින්ම අසමත් නොවීමට වගබලා ගන්න. උපරිම වැදගත් දෙය වන්නේ මෙයයි.''

අලුත් මාර්ගය ඔස්සේ තම ජීවිතය සකස් කර ගන්නේ කෙසේ දැයි බුදුරදුන් අම්බපාලීට කියා දුන්හ. හුස්ම ගැනීම, හිඳීම, සිහි නුවණින් යුතුව සක්මන් කිරීම, පංච ශීලය සමාදන් වීම හා එය පුහුණු කිරීම ආදිය උන් වහන්සේ විස්තර කර දුන්හ. මේ මහඟු ඉගැන්වීම ලැබ ගැනීමට හැකි වීම ගැන ඇගේ සතුට ඉහවහා ගියේය. පිටත් වීමට පෙරාතුව ඇය බුදුරදුන්ට මෙසේ කීවා ය.

''විශාලා නගරයට පිට පැත්තෙන් මට හිමි අඹ උයනක් තිබෙනවා. එය ඉතා නිස්කලංක සිසිල් පරිසරයක්. මම බලාපොරොත්තු වෙනවා ඔබ වහන්සේ මහා සංඝයාත් සමඟ එය නැරඹීමට පැමිණේවි කියා. එය මටත් මගේ පුතාටත් විශාල ගෞරවයක් වේවි. බුදුරජානන් වහන්ස, අනුකම්පා කර මගේ ඉල්ලීම ගැන සලකා බලන්න.''

බුදුරදුන් සිනා සී ඇගේ ආරාධනය බාර ගත්හ.

අම්බපාලී පිටත්ව ගිය පසු, කාලුදායී බුදුරදුන්ගේ පසෙකින් වාඩි වීමට අවසර ඉල්ලීය. ශාරිපුත්ත තවමත් සිටගෙන සිටින බැවින් කාලුදායී ඔහුගෙන් ද අනෙක් පුටුවෙන් වාඩි වන ලෙස ඉල්ලා සිටියේය. කුටිය පසුකර යමින් සිටි තවත් භික්ෂූන් කිහිප දෙනෙක් ද පිරිස අතරට එකතු වූහ. ශාරිපුත්ත කාලුදායී දෙස බලා සිනාසුනේය. ඔහු ද නාගසමාල දෙස බලා සිනාසුනේය.

පසුව ඔහු බුදුරදුන්ගෙන් මෙසේ ඇසීය; ''ගුරුතුමනි, කාන්තාවකගේ සුන්දරත්වය ගැන භික්ෂුවක් සැලකිය යුත්තේ කෙසේ ද? සුන්දරත්වයක්, විශේෂයෙන් කාන්තාවකගේ සුන්දරත්වය ආධ්‍යාත්මික පුහුණුවට බාධාවක් විය හැකි ද?''

බුදුරදුන් සිනාසුනහ. ශාරිපුත්ත ඔහු වෙනුවෙන් මේ ප්‍රශ්නය නොඅසන බවත් අනෙක් භික්ෂූන් වෙනුවෙන් එය අසන බවත් බුදුරදුන් දැනගත්හ. උන් වහන්සේ පිළිතුරු දුන්හ. ''මහණෙනි, සියලු ධර්මයන්ගේ සැබෑ ස්වභාවය ලස්සනත් කැත බවත් ඉක්මවා යන්නේය. ලස්සන හා කැත යනු අපගේ සිත තුළ නිර්මාණය වන සංකල්පයක් පමණයි. ඒවා වෙන් කළ නොහැකි ලෙස වෙළුණු පස්විධ එකතුවක නිර්මාණයකි. සිත්තම්කරුවකුගේ ඇස්වලට ඕනෑම දෙයක් ලස්සන කරන්නත් කැත කර පෙන්වන්නත් හැකියාව තිබෙනවා. ගඟක් හෝ වළාවක් හෝ ගසක කොළයක් හෝ මලක් හෝ දිලෙන හිරුගේ කිරණක් හෝ රන්වන් දහවලක් හෝ වැනි ඕනෑම දෙයක් සුන්දරත්වයෙන් ගත හැකියි. අප අසල වැවෙන මේ රන් වන් උණ පඳුරු කෙතරම් ලස්සන ද? එහෙත් ඇතැම් විට පුරුෂයෙකුගේ චිත්ත සමාධිය බිඳ සිත අවුල් කිරීමට ගැහැනියකගේ සුන්දරත්වයට වැඩියෙන් ශක්තිය ඇති වෙනත් සුන්දරත්වයක් නැහැ. යමෙකුගේ සිතෙහි ගැහැනියකගේ සුන්දරත්වය බල පැවැත්වෙන්නේ නම් ඔහුට ඔහුගේ මාර්ගය නැති වී යා හැකිය.

''මහණෙනි, ඔබ මාර්ගයට අවතීර්ණව සිටිද්දී ඔබ ඉතා ගැඹුරින් දකිද්දීත් ඔබට ලස්සන දේ ලස්සන ලෙසත් කැත දේ කැත ලෙසත් පෙනෙන්නට පුලුවනි. එහෙත් ඔබ නිවන් අවබෝධ කරගත් පසුව ඔබට ඒ දෙකම බාධාවක් නොවන්නේය. නිවන් අවබෝධ කරගත් තැනැත්තෙක් සුන්දර දෙයක් දෙස බලන විට එය සැකසී ඇත්තේ බොහෝ ලස්සන නොවන පදාර්ථවලින් බව ඔහුට දැකිය හැකියි. එබඳු වූ තැනැත්තා සුන්දරත්වය හා අසුන්දරත්වය යන දෙක ද ඇතුළුව සියලු දේවල ඇති අස්ථිර බව හා හිස් බව වටහා ගනු ලබයි. මෙපරිද්දෙන් ඔහුට සුන්දර දෙයින් වශී වීමක් හෝ අසුන්දර දෙයින් පලායාමක් හෝ සිදු නොවන්නේය.

''නිවන් අවබෝධ වූ සානුකම්පිත සිතකින් දකින සුන්දරත්වයක් පමණයි, මැලවීමකට හෝ දුක්වලට හෝ හේතු වීමකට පත් නොවන්නේ. කරුණාව සීමාන්තිකව ආදරය කිරීමේ හැකියාවයි. එහි නැවත බලාපොරොත්තු කිසිත් නැත්තේය. නිවන ලත් සිත කොන්දේසිවලින් නොබැඳුණේය. නිවන ලත් සිත සැබෑ සුන්දරත්වයයි. ඒ සුන්දරත්වයෙහි සැනසීම හා සන්තෘෂ්ඨිය සැබෑ සැනසිල්ල හා සැබෑ සන්තෘෂ්ඨිය වෙයි. මහණෙනි, අනලස්ව මේ මාර්ගය පුහුණු කරන්න. ඔබට ප්‍රත්‍යක්ෂයෙන්ම ඒ සුන්දරත්වය අත්විඳිය හැක්කේය.''

කාලුදායී සහ සෙසු භික්ෂූන්ට තම පදනම සකස් කරගැනුමට බුදුරදුන්ගේ වදන් මුළුමනින්ම ඉවහල් විය.

වස්සාන කාලය අවසන් විය. බුදුරදුන් කාලුදායීට සහ ඡන්නට කතා කොට, ප්‍රථමයෙන් ඔවුන් දෙදෙනා කපිලවස්තුව බලා පිටත්ව ගොස් බුදුරදුන් ඉතා ආසන්නයේම දිනයක පැමිනෙණ බව දැනුම් දීමට යෝජනා කළහ. කාලුදායී හා ඡන්න ප්‍රමාද නොවී ඔවුන්ගේ ගමනට සූදානම් වූහ. මේ වන විට ශාන්ත භික්ෂුවක්ව සිටින කාලුදායී අග නගරයෙහි සියලු දෙනා තමන් දැකීමෙන් පුදුමයට පත් වන බව දැන සිටියේය. බුදුරදුන් නැවත පැමිණීමේ ආරංචිය දැනුම් දීමේ කටයුත්ත කිරීම සඳහා ඔහු සතුටින් බලා සිටියේය. එහෙත් මෙතරම් කෙටි කලකින්ම වේළුවනය හැර යාමට සිදුවීම ගැන ඔහු කණගාටු වූවේය.

# තිස් හතර වන පරිච්ඡේදය

# නැවත හමුවීම

බුදුරදුන් ඉතා ආසන්නයේම පැමිණෙන ප්‍රවෘතිය කාලුදායී, රජුටත්, බිසවටත්, යශෝදරාටත් දැනුම් දුන්නේය. පසුව ඔහු තමන්ගේ පිණ්ඩපාත පාත්‍රය පමණක් ගෙන බුදුරදුන් කපිලවස්තුවට එන මාවත ඔස්සේ උන් වහන්සේ හමුවීම සඳහා පිටත් විය. සෙමින්සෙමින් පියවර තබන භික්ෂුවකගේ ශාන්ත සන්සුන් ඉරියව්වෙන් කාලුදායී ඇවිදගෙන ගියේය. දිවා කාලයේ ගමන් කළ ඔහු රාත්‍රී කාලයේ විවේක ගත්තේය. ආහාර සිඟා ගැනීම සඳහා පුංචි ගම්මානයක කුඩා විවේකයක් පමණි ඔහු අර ගත්තේ. ඔහු ගිය සෑම තැනකම සිද්ධාර්ථ නිර්වාණ මාර්ගය සොයාගත් බවත් නැවත ගෙදර එමින් සිටින බවත් සැමටම දැනුම් දුන්නේය. දින නවයකට පසුව ඔහු කපිලවස්තුවෙන් පිටතට පැමිණියේය. කාලුදායීට බුදුරදුන් මුණගැසිණි. උන් වහන්සේ සමඟ භික්ෂූහු තුන් සියයක් ගමන් කරමින් සිටියහ. මොග්ගල්ලාන, කොණ්ඩඤ්ඤ සහ කාශ්‍යප සොහොයුරෝ සෙසු භික්ෂූන් සමඟ වේළුවනයෙහි රැඳී සිටියහ.

කාලුදායීගේ යෝජනාව අනුව බුදුරදුන් හා භික්ෂූන් වහන්සේලා කපිලවස්තුවට සැතපුම් තුනක් උතුරින් පිහිටි නිග්‍රෝධ

උද්‍යානයෙහි රාත්‍රිය විවේක ගත්හ. ඊළඟ දිනයෙහි ඔවුහු පිණ්ඩපාතය සඳහා නගරයට ඇතුළු වූහ.

කහ සිවුරු පොරවාගෙන අතින් ගත් පාත්‍ර අතැතිව නිහඬව හා ශාන්තව ආහාර සිඟමින් යන තුන්සියයක් පමණ භික්ෂූන්ගේ දර්ශනය නගරයේ ජනතාව තුළ ගැඹුරු හැඟීමක් ඇති කළේය. ඔවුන්ගේ පැමිණීමේ ආරංචිය රජ මැදුරට ලැබීම සඳහා වැඩි වේලාවක් ගත නොවීය. සුද්ධෝදන රජු වහාම තමන් තම පුතුව මුණගැසීමට රැගෙන යාම සඳහා රථය සූදානම් කිරීමට අණ කළේය. මහා ප්‍රජාපතී බිසව හා යශෝදරා මාළිගය තුළ ඉතා නොඉවසිල්ලෙන් යුතුව බලා සිටියහ.

රජුගේ රථය නගරයේ නැගෙන හිර කොටසට ඇතුළු වන විට ඔවුනට භික්ෂූන් වහන්සේලා මුණගැසුනහ. රථාචාර්යා පළමුව සිද්ධාර්ථ හඳුනා ගත්තේය. ''මහ රජතුමනි, අන්න එතුමා! එතුමා අනෙත් අයගෙන් වෙන් වී ඉදිරියට යනවා. එතුමා ඇඳ සිටින සිවුර අන් අයගේ සිවුරුවලට වඩා තරමක් දිගයි.''

කහ සිවුරු පොරවාගත් භික්ෂූන් අතරින් සුද්ධෝදන රජු තම පුතුව හඳුනා ගත්තේය. ඔහු විස්මයට පත් වූයේය. බුදුරදුන්ගේ ප්‍රතාපවත් බව ආලෝකයක් මෙන් විහිදෙන්නට විය. උන් වහන්සේ සිය පාත්‍රයත් අල්ලාගෙන කබල්ව ගිය දුප්පත් නිවසක් ඉදිරියෙහි සිටගෙන සිටියහ. ඒ මොහොතේ උන් වහන්සේ සිටියේ තමන් වහන්සේගේ ජීවිතයේ ඉතාම වැදගත් දෙය වන පිඬු සිඟා යන ඉරියව්වෙනි. වැරහැලි ඇඳුමක් හැඳ ගත් ගැහැනියක් දුගී පැල්පතින් එළියට පැමිණ තැම්බූ එක් කුඩා වැල් අලයක් බුදුරදුන්ගේ පාත්‍රයෙහි දමන අයුරු රජු බලා සිටියේය. කෘතඥතා පූර්වකව එය බාරගත් බුදුරදුන් කාන්තාවට ආශීර්වාද කළහ. ඒ මොහොතේ බුදුරදුන් තම පියා පැමිණ සිටිනු දුටුවේය. බුදුරදුන් රජු දෙසටත් රජු බුදුරදුන් දෙසටත් ගමන් කළහ. සුද්ධෝදන රජු තම පියවර ඉක්මන් කළේ ය. බුදුරදුන් සන්සුන් සංවර ගමනින් පියවර තැබූහ.

''සිද්ධාර්ථ!''

''තාත්තේ!''

බුදුරදුන් වෙත පැමිණි නාගසමාල සිය ගුරුවරයාගේ පාත්‍රය අතට ගත්තේය. බුදුරදුන්ට පියාණන්ගේ අත තමන් වහන්සේගේ දෑතින්ම අල්ලාගත හැකි විය. රජුගේ රැලි වැටුණු කම්මුල් දිගේ කඳුළු කැට ගලාගෙන පහළට වැටිණි. බුදුරදුන් සිය පියා දෙස

මහත් ඕනෑකමින් බලා සිටියහ. උන් වහන්සේගේ දෙනෙත් ආදරයේ උණුසුමින් පිරී තිබිණි. මහ රජුට තම පුතු සිද්ධාර්ථ තව දුරටත් කිරුළ දරන කුමාරයා නොව, පූජනීය ආධ්‍යාත්මික ගුරුවරයෙකු බව අවබෝධ විය. ඔහුට සිද්ධාර්ථ තුරුළු කර ගැනීමට අවශ්‍ය විය. එහෙත් එය සුදුසු දෙයක් නොවිය හැකි යැයි යළිත් සිතිණි. ඒ වෙනුවට ඔහු තම දෑත් එක් කොට තමන්ට වැඩි ඉහළ ශ්‍රේණියේ රජකෙනෙකුට අචාර කරන සිරිත අනුව ආධ්‍යාත්මික ගුරුවරයෙකු වූ සිය පුතුට ප්‍රණාම කළේය.

බුදුරදුන් තමන් අසල සිටි ශාරිපුත්ත දෙසට හැරී මෙසේ කීහ.

''පිණ්ඩපාත කර අවසන් වූ භික්ෂූන් කරුණාකර නිග්‍රෝධ උද්‍යානය වෙත ආපසු යන්න. මම නාගසමාල මාළිගය වෙත කැඳවාගෙන යනවා. එහි දී අපට අපගේ ආහාර ගැනීම කළ හැකියි. අපි මධ්‍යාහ්ණය ගත වූ පසුව නැවත සංඝයා වෙත පැමිණෙනවා.''

සාරිපුත්ත බුදුරදුන්ට නමස්කාර කොට භික්ෂූන් වහන්සේලා සමඟ නිග්‍රෝධාරාමටය බලා පිටත් විය.

මහත් අපහසුතාවෙන් බොහෝ වේලාවක් බුදුරදුන් දෙස බලා සිටි රජු මෙසේ කීය. ''මා සිතාගෙන සිටියේ නුඹ සියල්ලට ම පෙර අප දැකීම සඳහා රජමැදුරට ඒවි කියායි. කවුරු කොහොම සිතන්න ද නුඹ රජ මැදුරට නොපැමිණ නගරය පුරා ආහාර සිඟා යාවි කියා. නුඹ රජ මැදුරෙහි දානය සඳහා නොපැමිණියේ ඇයි?''

බුදුරදුන් තම පියාණන් දෙස බලා සිනහ මුසු මුහුණින් යුතුව මෙසේ කීය. ''පියාණනි, මම තනිව නොවෙයි. භික්ෂු මහා සංඝයා ද සහිතවයි ගමන් කරන්නේ. මා ද භික්ෂුවකි. එනිසා අනෙක් භික්ෂූන් වහන්සේලා සේම මා ද පිණ්ඩපාතය කිරීම සඳහා යා යුතුයි.''

''ඒක එහෙම වුණත් මේ දුගී දුප්පතුන් සිටින පැත්තේම පිණ්ඩපාතය කරන්නේ නැතිව මීට වඩා ධනවත් අය සිටින ප්‍රදේශයක පිණ්ඩපාතය කරන්න තිබුණා නො වේද? ශාක්‍ය වංශයේ කිසිවෙක් කවදාවත් මෙවැනි දෙයක් කර නැති බව නුඹ දන්නවා නේද?''

මුව පුරා සුගන්ධිත සිනහවක් පහළ කළ බුදුරදුන් ''ඔබගේ කතාව ඇත්තයි. ශාක්‍ය වංශයේ කිසිම කෙනෙක් කවර දා වත් එහෙම කර නැහැ. නමුත් මා බුද්ධ වාංශයේයි. ඒ නිසා පිණ්පාතය කිරීම අපේ සිරිතයි. පියාණනි, පිණ්ඩපාතයත් එක්තරා ආධ්‍යාත්මික භාවනාවක්. මෙයින් භික්ෂූන් වහන්සේගේ සිතේ නිහතමානීත්වය ඇති වෙනවා. ගෙපිළිවලින් පිණ්ඩපාතය සඳහා වඩින විට සමානාත්මතාව සිතේ දියුණු වෙනවා. මට දුප්පත් කෙනෙක් අල ගෙඩියක් පිළිගැන්වූවත්, රජ කෙනෙකු රාජ භෝජනයක් පූජා කළත් මා ඒ දෙකම දකින්නේ එක හා සමානවයි. මගේ දහමේ සියලුම දෙනා එක හා සමානයි. කෙතරම් දුප්පත් වූවත් මට එහි වෙනසක් දකින්න නැහැ. ආධ්‍යාත්මික දියුණුවේ ඇති යහපත එය යි. පිණ්ඩපාතයෙන් මගේ සම්මානය වැඩි වනවා මිස අඩු වන්නේ නැහැ. මේ නිසා සමාජයේ දියුණුවට ආධ්‍යාත්මික දියුණුව අත්‍යවශ්‍යයි.''

සුද්ධෝදන රජතුමා බුදුරදුන්ගේ වචන නිහඬව අසා සිටියේය. සිදුහත් පුංචි කාලයේ තමන් සමඟ පණ්ඩිතයින් කී දේ අද සත්‍ය වී ඇති බව රජුට සිතිණි.

පිය රජතුමාගේ අත අල්ලා ගත් බුදු රදුන් මාළිගාව දෙසට වැඩම කළේය. නාගසමාල ද ඒ පසුපසින් ගියේය. රජ මැදුරේ සෙවකයෙකු බුදුරදුන් සහ නාගසමාලව දුටුවේය. බුදුරදුන් සමඟ සුදොවුන් රජු කතා කරමින් පැමිණෙන අයුරුත් සුදොවුන් රජු බුදුරදුන්ට නමස්කාර කරන අයුරුත් ගෝතමී බිසව, යශෝදරා, සුන්දරී නන්දා මෙන්ම රාහුල ද දුටුවෝය. බුදුන් සහ සුදොවුන් රජු රජ මැදුරට සමීප වෙද්දී යශෝදරා රාහුලගෙන්, ''පුත, රාහුල, සීයා සමඟ රජ මැදුරට පිවිසෙන සන්නාසිවරයා දක්කා නේ ද?'' යි ඇසීය. රාහුල හිස සලා ''ඔව්'' යැයි පිළිතුරු දුන්නේය.

''ඒ සන්නාසිවරයා ඔබගේ ආදරණීය පියතුමායි. ඉක්මනින් පෙරමඟට ගොස් උන් වහන්සේට නමස්කාර කරන්න. ඒ සමඟ ම ඔබට අයිති දායාදය ද ඉල්ලා ගන්න.''

බුදුරදුන් රාහුලගේ දෙකොපුල් පිරිමැද සිනා සී, ''නුඹට අයිති දායාදය සුදුසු වේලාවට ලැබේවි,'' යි කීය. බුදුරදුන් රාහුලගේ අත එක් අතකින් අල්ලා ගත් අතර සුදොවුන් රජුගේ අත ද අනෙක් අතින් අල්ලා ගෙන මාළිගාව තුළට ඇතුළු විය.

වසන්තයේ පිබිදි මල්වල සුවඳ මද සුළඟින් දස අත විසුරුවමින් තිබිණි. කෝකිල, ගිරා හා මලිත්තන් ආදී සියොතුන් ප්‍රීතියෙන් නටමින් හා ගයමින් සිටියහ.

බුදුරදුන් සුදොවුන් රජු සමඟ රජ මැදුරෙහි මැද මීදුලේ පනවා තිබූ කිරිගරුඬ ආසනය මත වාඩි විය. නාගසමාලට ද එන්නැයි කී බුදුන් වහන්සේ එකී අසුනෙහිම වාඩිකර ගත්තේය. මේ සමඟම නන්දා, යශෝදරා හා ගෝතමිය ද උයනට පිවිසුණහ. බුදුන් වහන්සේ අසුනෙන් නැඟිට කාන්තාවන් තිදෙනා ඉදිරියට ගියහ. ගෝතමී බිසව ශරීර සෞඛ්‍යයෙන් පරිපූර්ණව සිටියාය. ළා කොළ පැහැති සළු හැඳ සිටි බුදුරදුන්ගේ නැඟණිය වූ නන්දා සොළොස්විය පිරි සුන්දර තරුණියකව සිටියාය. එහෙත් සුදු මැළි වූ මුහුණින් යුතුව සිටි ගෝපා හිම පැහැති සළු හැඳ සිටි අතර කිසිදු ආභරණයක් පැළඳ සිටියේ නැත. කාන්තාවන් තිදෙනාම දෑත් එකතු කර බුදුරදුන්ට නමස්කාර කළහ. බුදුරදුන් දෑත් ඔසවා ආශීර්වාද කළේය. බුදුන් දැකීමෙන් පසුව මහා ප්‍රජාපතී හා යශෝදරා යන දෙදෙනාම හඬන්නට පටන් ගත්හ. මහා ප්‍රජාපතී ගෝතමියගේ අතින් අල්ලා ආසනය මත වාඩි කළ බුදුරදුන් මගේ සහෝදරයා නන්ද කොහිදැයි ඇසීය. ඔහු යුද්ධ අභ්‍යාස කරන්නට ගිය බවත් ඉක්මනින්ම ආපසු එන බවත් ඇය කීවාය. ''නුඹගේ පුංචි නංගි අඳුනනවා ද? නුඹ නැති අතර ඇය තරුණියක් වුණා,'' යි අනතුරුව ප්‍රජාපතී ගෝතමිය බුදුරදුන්ට කීවාය. බුදුරදුන් තම නැඟණිය දෙස ඉතා ඕනෑකමින් බැලීය. බුදුරදුන් ඇය දුටුවේ අවුරුදු හතකට පසුවය. ''සුන්දරි නන්දා, නුඹ නම් දැන් තරුණියක් නේද?''

බුදුරදුන් යශෝදරා සමීපයට ගොස් ඉතාම ආදරයෙන් ඇගේ අත අල්ලා ගත්තේය. යශෝදරා මහත් කම්පනයට පත්ව සිටියාය. ඇය ගෝතමී බිසව ළඟින්ම වාඩි කර වූ බුදුරදුන් තම අසුන වෙත ගොස් හිඳ ගත්තේය.

රජ මැදුරට පැමිණෙන අවස්ථාවේ සුදොවුන් රජු බුදුරදුන්ගෙන් බොහෝ ප්‍රශ්න ඇසීය. එහෙත් දැන් කිසිවෙක් වචනයකුදු කතා නොකර නිහඬව සිටින්නට වූහ. අඩු තරමින් රාහුල හෝ කිසිවක් නොකීවේය. බුදුන් වහන්සේ පිය රජුගේත් මෑණියන්ගේත් සුන්දරි නන්දාගේ හා යශෝදරාගේත් මුහුණු දෙස බැලීය. සියලු දෙනාගේම මුහුණේ නැවත හමුවීමේ සතුට ඉපිළී

යමින් ඇති අයුරු බුදුරදුන් දුටුවේය. දිගු නිහැඬියාවකට පසුව, බුදුරදුන් කථා කළේය.

''පියාණනි, මා ආපසු පැමිණ ඉන්නේ. මෑණියනි, මා ආපසු ආවා, බලන්න ගෝපා, මා ආපසු ඔබ වෙත ආවා.''

කාන්තාවන් දෙ දෙනාම යළිත් හඬන්නට වූහ. එහෙත් ඔවුන්ගේ ඒ කඳුළු සතුටු කඳුළු විය. බුදුන් ඒ අයට හඬන්නට ඉඩ හැර නිශ්ශබ්ද වී තමා ළඟින් වාඩි වෙන්නැයි රාහුලට කීහ. උන් වහන්සේ සිය පුතුගේ හිස කෙස් ආදරයෙන් අතගෑහ.

සළු පොටින් කඳුළු පිස දැමූ ගෝතමිය බුදුන් දෙස බලා සිනහසුණා ය. ''නුඹ මාළිගාවෙන් පිට වී ගොස් සෑහෙන කාලයක් ගත වුණා. අවුරුදු හතකටත් වැඩියි. නුඹ දන්නවා ද ගෝපා කොතරම් ධෛර්‍ය සම්පන්න කාන්තාවක් ද කියලා?''

''අම්මේ, මා ඇගේ ධෛර්‍ය මීට කලිනුයි දැනගෙන හිටියේ. ඔබත් යශෝදරාත් මා දන්නා කාන්තාවන්ගෙන් ධෛර්‍යමත්ම කාන්තාවන් දෙදෙනායි. ඔබ දෙදෙනා අවබෝධයෙන් යුතුව ඔබලාගේ සැමියන්ට සහාය වූවා පමණක් නොවෙයි, ඔබ දෙදෙනා හැමටම ශක්තිය හා ආත්ම විශ්වාසය ලබා දුන්නා. ඔබ වැනි දෙදෙනෙකු මේ ජීවිතයේ මුණ ගැසීමෙන් මා වාසනාවන්තයෙකු වුණා. ඒ නිසා මගේ අරමුණ පහසුවෙන් ඉටු කර ගත හැකි වුණා.

යශෝදරා සිනාසුණාය. එහෙත් ඈ කථා නොකළාය.

''නුඹ සද්ධර්ම මාර්ගය සෙවීම සඳහා ගත් මහන්සිය, රකින ලද තපස් ගැන මට කීවා වගේම අනෙක් අයටත් විස්තර කර දුන්නොත් ඒ අයත් සතුටට පත් වේවි.''

බුදුරදුන් කෙටියෙන් අතීත අත්දැකීම් විස්තර කර දුන්නේ ය. බිම්බිසාර මගධ රජු කඳු මුදුනෙහි දී හමු වූ සිද්ධිය හැමටම විස්තර කළේය. උරුවේලාවේ දුප්පත් ළමයින් සමඟ ගත කළ කාලය ගැන ද කීවේය. තමන් සමඟ තපස් රැකි මිතුරන් පස් දෙනා ගැනත්, රජගහ නුවර දී භික්ෂූන් සහිත තමන් පිළිගත් ආකාරය ගැනත් සියල්ල කීය. සියලුම දෙනා බුදුරදුන් කී සියල්ල හොඳින් අසා සිටියහ. රාහුල අඩුම තරමින් හෙල්ලුණේ වත් නැත.

බුදුන්ගේ හඬ ප්‍රේමයෙන් හා උණුසුම් බවින් පිරී තිබිණි. කියූ කිසිවක් දෙවරක් නොකීවේය. එහි කිසිදු අයුරකින් අනවශ්‍ය විස්තර කිසිත් නොවීය. කී හැම දෙයක්ම ඒ හැමගේම ආධ්‍යාත්මික හැඟීම් උපදවන සුළු විය.

උද්‍යානයේ සිට පැමිණි මෙහෙකරුවෙක් ගෝතමියගේ කණට කර යමක් කීවේය. ගෝතමිය ද ඔහුට ආපසු යමක් එපරිද්දෙන්ම කීවාය. සේවකයන් පිරිසක් එකතු වී උද්‍යානයේ එක් තැනක දිවා ආහාරය සඳහා මේස කිහිපයක් තැබූහ. ඒ සමඟ ම ආහාර පාන වර්ග මේස මත තැන්පත් කෙරිණි. නන්ද පැමිණියේ ය. බුදුරදුන් නන්ද ආදරයෙන් පිළිගත්තේය.

''නන්ද, මා මාළිගයෙන් යන විට නුඹට වයස අවුරුදු පහළොවයි. දැන් නුඹ ලොකු මිනිහෙක්.''

නන්ද සිනාසුණි. ගෝතමිය නන්දට තරවටු කළාය. ''නන්ද, නුඹේ අයියාට හරියට ආචාර කරපන්. දැන් ඔහු පැවිදි උතුමෙක්. අත් එකතු කර නමස්කාර කරපන්.''

නන්ද බුදුරදුන්ට දෑත් එක් කොට නමස්කාර කළේය. බුදුහු තම බාල සහෝදරයාට ආශීර්වාද කළහ.

සියලු දෙනාම භෝජනය සඳහා පිටත් වූහ. බුදුරදුන් නාගසමාලව තමන් ළඟින්ම වාඩි කර ගත්තේය. සේවිකාවෝ ජලය ගෙනැවිත් සියලු දෙනාගේම දෑත් සේදූහ.

''නුඹගේ පිණ්ඩපාත පාත්‍රයට ලැබුණේ මොනවා ද?'' රජු බුදුරදුන් දෙස බලා ඇසීය. ''මට නම් තැම්බූ අල කිහිපයක් ලැබුණා. එහෙත් මා දුටුවා නාගසමාලට කිසිවක් තවම ලැබුණේ නැහැ,'' බුදුරදුන් පිළිතුරු දුන්නේය.

සුදොවුන් රජු නැඟී සිට, ''කරුණාකර ඔබ දෙදෙනාට අපේ මේසයෙන් ආහාර පිළිගන්වන්න ඉඩ දෙන්න,'' යි ඉල්ලා සිටියේය. යශෝදරා භික්ෂූන් දෙනමට ආහාර පිළිගැන්වීය. බුදුන් සහ නාගසමාල නිහඬව ආහාර ගැනීම වෙත යොමු කළ සිහියෙන් යුතුව වැළඳූහ. ආහාර වැළඳීමෙන් පසුව ප්‍රජාපතී ගෝතමිය බුදුරදුන්ගෙන් හා සුදොවුන් රජුගෙන් නැවතත් කිරිගරුඬ ආසනය මත වාඩි වන්නැයි ඉල්ලා සිටියාය. සේවකයෙකු දොඩම් පිරවූ කුඩයක් රැගෙන ආවේය. එහෙත් දොඩම් රස විඳීමට සිටියේ රාහුල පමණි. සියලු දෙනාම බුදුරදුන් සොයාගත් දහම ගැන විස්තර කිරීම ඇසීමට පමණක් උනන්දු වූහ. මහා ප්‍රජාපතී ගෝතමිය සැමදෙනාට ම වැඩියෙන් ප්‍රශ්න ඇසුවාය. බුදුරදුන් වේළුවනයේ කුටියක ජීවත් වූ බව ඇසූ සුදොවුන් රජු තමන්ට ද බුදුරදුන් වෙනුවෙන් නිග්‍රෝධ උද්‍යානයෙහි එවැනි කුටියක් තනවන්නට

ඉඩ දෙන්න හැකි දැයි ඇසීය. එසේම ''අපටත් ඔබ සොයා ගත් මඟ ඉගැන්වීම සඳහා මාස කිහිපයක් කපිලවස්තුවේ නැවතී සිටින්න,'' යි රජු බුදුන් වහන්සේගෙන් ඉල්ලා සිටියේ ය. මහා ප්‍රජාපතී, යශෝදරා, නන්ද හා සුන්දරී නන්දා ද සුදොවුන් රජුගේ යෝජනාවට එකතු වූහ.

අවසානයේ බුදුරදුන් තම භික්ෂු සංඝයා හමු වීමට නිග්‍රෝධ උයනට යාමට කාලය පැමිණි බව දන්වීය. මහ රජු සුද්ධෝදන අසුනෙන් නැගී සිට, ''මම ඔබ වහන්සේට ආරාධනා කරනවා මාළිගයේ දානය සඳහා සියලුම භික්ෂු සංඝයා සමඟ වඩින්න කියලා. ''මගධ රාජ්‍යයේ දානය පිළිගැන්වූ ආකාරයෙන්ම මා මගේ මාළිගයේත් දානය පූජා කරන්නම්. රජ පවුලේ සැමටත් රජයේ හැම සාමාජිකයෙකුටමත් මම එම වේලාවටම භෝජනය සඳහා ආරාධනා කරනවා. ඒ නිසා ඒ අයටත් ඔබ සොයාගත් දුකින් මිදීමේ මාර්ගය ගැන ඉගෙනීමට හැකි වේවි.''

බුදුන් වහන්සේ තමන් ඒ ආරාධනාව සතුටින් පිළිගත් බව දැන් වූහ. දින හතකින් පසුව මේ දානය ''මාළිගාවේ සූදානම් කරන්නෙමි,'' යි රජු බුදුරදුන්ට පැවසුවේය.

සියලු සාකච්ඡාවලින් පසුව රජතුමාට බුදුරදුන්ව රාජ රථයෙන් නිග්‍රෝධ උයනට කැඳවාගෙන යාමට අවශ්‍ය විය. එහෙත් බුදුරදුන්, ''නැහැ, පා ගමනට මා ඉතා කැමතියි,'' කියා නාගසමාල සමඟින් පයින්ම නිග්‍රෝධ වනය කරා වැඩම කළහ. බුදුන් සහ නාගසමාල මාළිගයෙන් පිටව යද්දී රජු ඇතුළු සියලුම දෙනා දෙපසට වී දෙනමට ගෞරවයෙන් යුතුව නමස්කාර කරගෙන සිටියහ.

# තිස් පස් වැනි පරිච්ඡේදය
# අරුණෝදය

සිද්ධාර්ථ කපිලවස්තුවට නැවත පැමිණි ආරංචිය මුළු පළාතේම ඉතාම ඉක්මනින් පැතිරී ගියේය. කපිලවස්තුවේ භික්ෂූන් පිණ්ඩපාතය කිරීම නිසා මෙම කරුණ තවතවත් වේගයෙන් ප්‍රසිද්ධ විය. බොහෝ අය භික්ෂූන්ට දානය දීමට උත්සාහවත් වූ අතර ධර්මය ගැන යමක් දැන ගැනීමට ද ඉතා කැමැත්තෙන් සිටියහ.

බුදුන් සමඟ මහා සංඝයා රජ මැදුරෙහි දානය සඳහා පැමිණෙන දිනට මහ මඟ මල්වලින් සරසන ලෙස රජතුමා නගර වාසීන්ට දන්වා සිටියේය. රජු බුදුන් ඇතුළු භික්ෂූන්ට නිග්‍රෝධ උයනේ පුංචි පුංචි කුටි තනවා තිබිණි.

බොහෝ දෙන බුදුන් ඇතුළු මහා සංඝයා දැකීමට නිග්‍රෝධ උයනට ඇදී එමින් සිටියහ. නගරයේ බොහෝ දෙනා ඒ අයගේ යුවරජ සිදුහත් නගරයේ පිණ්ඩපාත කරනු දැක ඉතා ප්‍රසන්නව සිටියහ.

මහා ප්‍රජාපතී සහ යශෝදරා බුදුන් හමුවීමට යාම සඳහා සූදානම් වෙමින් සිටියහ. රජ මහළේ සැම දෙනාට ද නගරයේ

සියලුම සම්මානණීය ප්‍රභූන්ට ද රජතුමා ආරාධනා කළ අතර ආහාරය සම්පූර්ණයෙන් ම නිර්මාංශ විය යුතු බව ද දන්වා සිටියේ ය.

නන්ද සතියට දෙවරක්ම බුදුන් හමු වීමට පැමිණියේය. සිතේ දියුණුවෙන් ඇතිවන ශ්‍රේෂ්ඨ ප්‍රතිඵල ගැන බුදුන් දේශනා කරන විට නන්ද ඉතාම උනන්දුවෙන් අසා සිටියේය. නන්ද තම වැඩිමහලු සහෝදරයාට දැඩි ආදරයක් දැක් වීය. තමනුත් භික්ෂුවක් වූවා නම් කොතරම් හොඳ දැයි ඔහුට සිතිණි. තමන් භික්ෂූත්වයට පත් වුව හොත් නියම භික්ෂුවක් විය හැකි වේදැයි නන්ද බුදුරදුන්ගෙන් විමසීය. නන්දගේ වචන ඇසූ බුදුන් වහන්සේ සිනාසිණි. නන්ද හොඳ චරිතයක් ඇති තරුණයෙක් වුවත් භික්ෂු ජීවිතයක් ගත කිරීමට තරම් ඔහුට තවම ආත්ම ශක්තිය අඩු බව බුදුරදුන් දැන සිටියේය. ඔහු බුදුන් ළඟ හිඳගෙන සිටින විට භික්ෂුවක් වීම ගැන සිතන්නට විය. එහෙත් මාළිගාවට ගිය පසු ඔහුගේ සිත තිබුණේ තම ආදරණීය පෙම්වතිය වූ ජනපද කල්‍යාණී පිළිබඳවය. නන්ද භික්ෂුභාවය හා ජනපද කල්‍යාණී පිළිබඳ සිතුවිලි දෙකට සිර වී දවස ගෙවීය.

රජ මැඳුරෙහි දානය දින මුළු කපිලවස්තු නගරයම ඉතා ම අලංකාරව සරසා තිබිණි. නගර වැසි සියලු දෙනා මඟ දෙපැත්තෙහි පේළි සෑදී බලා සිටියහ. සංගීතඥයෝ තම තමන්ගේ දක්ෂකම් පෙන්වමින් මධුර සංගීත සහ ගීත ගායනා කළහ. ලොකු කුඩා සැම කෙනෙක්ම බුදුන් තම දෑසින් දැකීමට මහත් උත්සාහවත්ව සිටියහ.

රජතුමා ආරාධනා කළ සැම කෙනෙකුවම මහා ප්‍රජාපතී සහ යශෝදරා විසින්ම පිළිගැනීම කළහ. ප්‍රජාපතී ගෝතමියගේ ඉල්ලීමෙන් යශෝදරා අගනා වස්ත්‍රයකින් සැරසී රන් ආභරණ පැළඳ සිටියාය.

මහ සෙනඟ මැදින් බුදුන් ඇතුළු මහා සංඝයා රජ මාළිගය වෙත ශාන්ත ගමනින් වැඩම කළහ. බුදුරදුන් සෙනඟ මැදින් වඩිද්දී සැම දෙනම දෑත් එකතු කරමින් හිස නමා නමස්කාර කළහ. වැඩිහිටියෝ පුංචි දරුවන් කරමත තබාගෙන බුදුන් පෙනෙන්නට සැලැස්වූහ.

සුදොවුන් රජතුමා බුදුරදුන් ඇතුළු මහා සංඝයා රජ මැඳුරෙහි දොරකඩ සිටගෙන පිළිගෙන ආලින්දය වෙත වැඩම

කරවාගෙන ගියේය. සුදොවුන් රජතුමා සැමටම පෙර දැත් එකතු කර බුදුරදුන්ට හා මහා සංඝයාට ආචාර කළ අයුරු දැක අනෙක් අය ද ඒ අනුව ආචාර කළහ.

මේ සියල්ල දුටු ඇතමෙක් මේ තරුණ සාධුවරයාට මෙතරම් සලකන්නේ ඇයි ද කියා පුදුමයට පත් වූහ.

බුදුරදුන් සහිත භික්ෂු සංඝයා වැඩහුන් විට දානය පිළිගැන්වීම ආරම්භ කළේය. ආගන්තුකයන්ට ආහාර බෙදුවේ සේවකයන් විසිනි. මේ ආගන්තුකයන් අතර සාධුවරු, සන්නාසිවරු හා බ්‍රාහ්මණ ආදීන් ද සිටියහ. බුදුරදුන් ආහාර වළඳන ආකාරයට ම සෙසු භික්ෂූන් වහන්සේලා ද ආහාර වැළඳූහ. දානය වළඳා අවසාන වීමෙන් පසු සුදොවුන් රජු බුදුන් වහන්සේ වෙත පැමිණ සිටින අයට ධර්මය දේශනා කරන්නැයි ආරාධනා කළේය.

බුදුරදුන් මොහොතක් නිහඬව සිට පැමිණ සිටින පිරිස දෙස මොහොතක් නිහඬව බලා සිටියේය. ප්‍රථමයෙන්ම සද්ධර්ම ගවේශණය පිණිස තමන් වහන්සේ දැරූ වෙහෙස පිළිබඳව විස්තර කළ සේක. ඒ අනුව පසුගිය වසර හය තුළ රජ මාළිගාවෙන් පිට වී තමන් කළේ මොනවා දැයි සැමටම දැනගත හැකි විය. ඉන් පසු අනිත්‍ය, දුක්ඛ, අනාත්ම ආදී ගැඹුරු දහම් දේශනා කළ සේක. දෛනික ජීවිතයේ දී සිහිකල්පනාවෙන් ජීවත් වීමෙන් ජීවිතයේ කරදර අඩු කර ගත හැකි ආකාරය විස්තර කර එමඟින් සසර දුක නැති කර ගන්නා ආකාරය ද පැහැදිළි කර දුන්හ. දානය දීමෙන් හෝ ශ්‍රද්ධාව වැඩීමෙන් හෝ පමණක් සසර දුකින් නිදහස් නො විය හැකි බව ද විස්තර කළහ.

ආර්‍ය්‍ය සත්‍ය සතර ගැන, ඉපදීම හා මරණය හැර තවත් දුක් රාශියක් ඇති බව ද තමන් සතු යම් දුකක් වේ නම් මනුෂ්‍යයා එහි වගකීම තමන් විසින්ම බාරගත යුතු බව පැහැදිලි කර දුන්හ.

නොදැනුවත්කම, මෝඩකම නිසා විවිධ මාර්ග අනුගමනය කර මිනිසුන් තමන් විසින්ම කරදර තමන් වෙතට ළඟා කරගෙන දුක් විඳින බවත් ඒ සමඟම අනෙක් අයත් කරදරවලට පත් කරන ආකාරය තමන් ඉදිරි පිටම දැකිය හැකි බවත් විස්තර කළහ.

ක්‍රෝධ, තෘෂ්ණා, සැක, නිරාශා, ආශා ආදී සිතිවිලි සැම විටම කරදර පමුණුවන ආකාරය පැහැදිලි කළහ.

කිසියම් දේවතාවකුට පූජා කිරීමෙන් හෝ යාඥා කිරීමෙන් හෝ මේ කිසිම කරදරයකින් මිදිය නොහැකි බවත් කියා දුන්හ.

සිත ගැන සිතා සිතේ ඇති විච්ඡේද දුරු කළ විට සිතේ සතුට හා සැපත ඇති වන ආකාරයත් පැහැදිලි කළ සේක.

දුක ඇති වූ කාරණය තමන් විසින්ම තමන්ගේ සිතින්ම දැන ගත යුතු බවත් දුකින් නිදහස් වන ක්‍රමයත් සිතින්ම දැන ගත යුතු බවත්, සඳහන් කළහ.

''ඔබට කිසිවෙකු කේන්තියෙන් හෝ තරහින් හෝ යමක් කිවහොත් හෝ කළහොත් හෝ ඔබත් එසේම කිරීම සාමාන්‍ය ස්වභාවයයි. මින් දුක අධික වනවා මිස අඩු වීමක් වන්නේ නැත. ඔබ බුද්ධිය මෙහෙයවා කටයුතු කළහොත් ක්‍රෝධයෙන් පිළිතුරු දෙන්නේ හෝ පහර දෙන්නේ හෝ නැත.

''දුක අවබෝධ කරගත යුතුය. දුක ඇති වූ විට ඇඬීම, කඳුළු හෙළීම, වැළපීම නොව, අවශ්‍ය වන්නේ දුක අවබෝධ කර ගැනීමයි.

''මහ රජතුමනි, ආගන්තුකයිනි, නියම වස්තු විෂයන් ගැන මෙනෙහි කිරීමෙන් දුකින් මිදෙන මාර්ගය සොයාගත හැකියි.

''ප්‍රඥාව ලබා ගැනීම සඳහා හොඳ සිහියෙන් යුතු විය යුතු මයි. මේ සඳහා ආශ්වාස ප්‍රශ්වාස භාවනාව පුරුදු කළ යුතුයි.

''මේ සියල්ල සඳහා ශීලවන්ත විය යුතුයි. ශීලවන්ත නොවුවහොත් බලාපොරොත්තු වන ප්‍රඥාව ලබා ගැනීම කළ නොහැකියි.

''මේ සියල්ල මඟින් ශාන්තිය සහ සතුට ලබා ගැනීම පහසුයි. ශීලවන්ත වූ විට භාවනාවේ ශක්තිය ද ක්‍රමයෙන් වැඩි වෙයි.

''බුද්ධිය කොපමණ වර්ධනය වන්නේ ද, අනෙක් අයට ප්‍රේම කිරීම ද එතරම්ම අධික වේ.

''බුද්ධි වර්ධනය වූ විට ලෝකයේ අප විඳින කරදරවලින් තරමක් හෝ මිදිය හැකියි.

''මුක්තිය ලබා ගැනීමේ නියම මඟ ප්‍රඥාවයි.''

බුදුන් වහන්සේ තම දේශනාව නතර කොට සිනහවක් පහළ කර නැවතත් දේශනාව ආරම්භ කළහ.

''දුක ජීවිතයේ එක් පැත්තක් පමණයි. ජීවියේ බැඳීම්වලින් නිදහස් විය හැක්කේ කොපමණ ද ජීවිතයේ සතුටත් එතරම්ම

වෙයි. අපේ හදවත සහ සිත කෙතරම් පුදුම සහගත ද? අපේ ශරීරය කෙතරම් පුදුම සහගත ද? දිය ඇලි, ගස් වැල්, සඳ මේවා කොතරම් සුන්දර ද?

''නිර්වාණය අවබෝධ වීමෙන් පසුව සියලුම මානසික දුක් වේදනාවලින් මිදීම සිදු වේ.

''ආගන්තුකයිනි, දවසක සුළු වේලාවක් ලබාගෙන උදෑසන හිරු කිරණ, දිය ඇල්ලක් ආදී ස්වාභාවික දෙයක් දිහා බලන්න සිතන්න, ඉන් ඔබ කොපමණ සතුටක් ලබා ගන්නවා ද කියා.''

බුදුරදුන්ගේ දේශනාව අතිගම්භීර නොවූවත් අසා සිටි පිරිස ඉන් සතුටට පත් වූහ. රජතුමා ද සතුටට පත් විය. ගෝතමී බිසව සහ යශෝදරා ද එතරම්ම සතුටට පත් වූහ.

සැම දෙනාම ප්‍රාණීන් හා පදාර්ථ ගැන තවතවත් දැන ගැනීමට උනන්දු වූහ.

දේශනාවෙන් පසුව රජතුමා ඇතුළු පිරිස බුදුරදුන් හා මහා සංඝයා මාළිගාවෙන් පිටතට පැමිණෙන තෙක්ම පසු පසින් ගියහ.

රජතුමාට තම පුත්‍ර රත්නය ලබා දුන් පදවිය පිළිබඳව සැම දෙනම මුව පුරා ප්‍රශංසා කරන්නට වූහ.

නිග්‍රෝධ වනය ක්‍රමයෙන් ආරාමයක් බවට පරිවර්තනය විය. විශාල වෘක්ෂවල සිසිල් සෙවනැල්ලෙන් නිග්‍රෝධාරාමය කාගේත් සිත් ගත් ස්ථානයක් විය. බොහෝ දෙන බුදුන් වහන්සේ වෙත පැමිණ භික්ෂුභාවය ලබා ගත්හ. ශාක්‍ය වංශයේ බොහෝ තරුණයන් පන්සිල් රැකීමට පොරොන්දු වූහ.

යශෝදරා, ගෝතමී, රාහුල ඉඩ ලැබුණු හැම විටකම නිග්‍රෝධාරාමයට ගොස් බුදුන්ගේ දේශනා හැකි පමණ ශ්‍රවණය කළහ. බුදුරදුන් තනිව සිටින විට ධර්මය සහ සමාජ සේවය අතර ඇති සම්බන්ධය ගැන සාකච්ඡා කළහ.

ආශ්වාස ප්‍රශ්වාස කරන ආකාරයත් මෙකී ක්‍රියාව අනුව සිත සමාධි ගත කළ හැකි ආකාරයත් බුදුන් වහන්සේ විස්තර කර දුන්හ. තමන්ගේ සිත ශාන්ත කර ගන්නේ නැතිව අනෙක් අයට සේවය කිරීමේ අදහස නිශ්ඵල දෙයක් ලෙස ඒ අයට වැටහී ගියේ ය. යම් කිසි කෙනෙක් අවංකව සමාජ සේවය කිරීමට සූදානම් නම් සේවයට පෙර තමන්ගේ සිත ශාන්ත කරගත යුතු බව පැහැදිළිවම සඳහන් කළේය.

ඒ අනුව ගෝතමී බිසව සද්ධර්ම මාර්ගයේ බොහෝ දුරට ප්‍රගතියක් ඇති කර ගත්තාය.

## තිස් හය වැනි පරිච්ඡේදය

# නෙළුම් මලින් කළ ප්‍රාර්ථනාව

යශෝදරා දේවිය තම මාළිගාවේ දානයට බුදුරදුන්, කාළුදායි, නාගසමාල සහ ගෝතමී මහ බිසවට ආරාධනා කළාය.

දානයෙන් පසුව සිදුහත් සහ යශෝදරා සමාජ සේවය කළ ගමට ඒ දිනවල තමන් උදවු කළ පුංචි දරුවන් දැකීම සඳහා මේ සියලුම දෙනාව කැඳවාගෙන ගියහ. රාහුල ද මේ පිරිස සමඟ එක් වී සිටියේය.

ඔවුන්ගෙන් බොහෝ දෙන විවාහ වී සිටියහ. අවුරුදු හයේ හතේ ළමයින් බොහෝ දෙනෙක් නුග රුක මුල ක්‍රීඩා කරමින් සිටි අයුරු බුදු රජානන් වහන්සේ දුටුවෝය. බුදුරදුන් වඩිනු දැක ඔවුන් පෙළට සැදී බලා සිටියහ. පුංචි දරුවන් සියලු දෙනා බුදුරදුන්ට දෑත් එකතු කර නමස්කාර කළහ. උන් වහන්සේ උණ බටවලින් සාදන ලද කුඩා ආසනයක් මත වැඩ සිටි සේක. සෙසු සැම දෙනා බිම එලූ පැදුරුවල වාඩි ගත්හ.

මේ පිරිස මැද වැඩ සිටි බුදුරදුන්ගේ මුහුණේ දකින්නට ලැබුණේ සතුටු සිනහවකි. උරුවෙල් දනවුවේ පුංචි දරුවන් සමඟ ගත කළ දවස් බුදුරදුන් සිහිපත් කළේය.

ස්වස්ති සහ සුජාතා ගැන තොරතුරු ළමයින්ට විස්තර කළේය. දේවදත්ත තම හීයෙන් හංසයෙකු විද බිම දැමීමෙන් පසුව තමන් විසින් හංසයාගේ තුවාලයට බෙහෙත් දමා සනීප කළ ආකාරය ද දරුවන්ට විස්තර කළේය. බුදුරදුන් කී සියල්ල පුංචි දරු පිරිස ඉතා අවධානයෙන් අසා සිටියහ.

''බොහෝම ඉස්සර කාලෙක හිමාලය පර්වතය සමීපයේ මේඝ කියා එක් මිනිසෙක් සිටියා. මේඝ ඉතාම හොඳ කෙනෙක්. මහන්සි වී මුදල් උපයා ධාර්මික ධනයෙන් ජීවත් වූ කෙනෙක්. එහෙත් ඔහු ළඟ හුඟක් ධනය තිබුණේ නැහැ.

''දිනක් ඔහු යමක් වැඩි පුර ඉගෙනීම සඳහා අගනුවරට යන්න පිටත් විය. එක කමිසයක්, තොප්පියක් හා වතුර බොන භාජනයක් ද ඔහුට තිබූ එකම කබාය ද අතට ගත්තේය.

''යන අතරතුර පුංචිපුංචි අත් වැඩ කළ නිසා තැනකින් මුදල් හා තැනකින් කෑම ආදිය ලැබිණි. අගනුවරට ළගා වනවිට ඔහු ළඟ කහවනු පන්සියයක් පමණ එකතු වී තිබිණි. නුවරට ඇතුළු වෙද්දී විශාල උත්සවයකට නගර වැසියන් සූදානම් වන බව ඔහුට දැනිණි. මේ ගැන දැන ගැනීමට කෙනෙකු ඇද්දැයි මේඝ විපරම් කරන අතර ඔහු ළඟින් රූමත් යුවතියක් යනු දුටුවේය. ඇගේ අත නෙළුම් මල් මිටක් විය.

''අද නගරයේ කුමක් හෝ උත්සවයක් ඇද්දැයි මේඝ යුවතියගෙන් ඇසීය. රූමතිය මේඝ දෙස බලා 'අග නුවරට නුඹ අලුත් කෙනෙක් ද' යි ආපසු ඇසුවාය. 'අද මේ නගරයට ප්‍රසිද්ධ ආචාර්ය දීපංකර හිමියන් එනවා. ඒ බව දන්නේ නැද්ද? එතුමා ප්‍රාණීන්ට දිව්‍ය ප්‍රසාද ඇති කරවන කෙනෙක්. අරකිමත රජුගේ පුත්‍රයායි. සත්‍ය සෙවීම සඳහා ගිහිගෙය අතහැර සන්නාසි වේශය ගෙන ධර්ම මාර්ගය අවබෝධ කර ගත් කෙනෙක්. එතුමාගේ දේශනාවලින් ලෝකයාටම ශාන්තිය ලැබෙනවා. එනිසා එතුමා පිළිගන්න මුළු නගරයම සූදානම් වෙනවා.'

''මේඝ ද මේ කාරණය අසා අතිප්‍රසන්න විය. මේඝ ද ආචාර්යවරයාට යමක් පූජා කළ යුතු යැයි සිතීය. එතුමාගේ ශිෂ්‍යයෙකු වීමට මටත් හැකිවෙතොත් කෙතරම් වාසනාවක් දැයි සිතිණි.

'''ඔබට නෙළුම් මල් මිටිය ලැබුණේ කොහෙන් ද?' මේඝ යුවතියගෙන් ඇසීය.

'''මම නෙළුම් මල් පහක් මුදල් දී ගත්තා. අනෙක් දෙක ගෙදර ළඟ ඇති විලෙන් කඩාගෙන ආවා.' යුවතිය පිළිතුරු දුන්නා ය.

'''මිලට ගත් නෙළුම් මල් පහේ මිල කීයක් වුණා ද?'

'''කහවනු පන්සිය යයි.'

'''මම කහවනු පන්සියයක් දී ඔබගේ නෙළුම් මල් පහ මිලට ගන්න කැමතියි,' මේඝ යුවතියට යෝජනා කළේය.

''එහෙත් යුවතිය ඒ යෝජනාවට කැමති නොවූවා ය. 'මා නෙළුම් මල් මිටිය ගෙනාවේ දීපංකර හිමියන්ට පූජා කිරීමට මිස විකිණීමට නො වේ,' යි ඇය කීවාය.

'''ඔබ ඔබගේ විලෙන් කඩාගෙන ආ නෙළුම් දීපංකර හිමිට පූජා කරන්න. මිලට ගත් මල් පමණක් මට විකුණන්න. මේ වැනි මහා ආචාර්යවරයෙකු මා ජීවිතයේ දකින පළමු වතාවයි මේ. එනිසා මට මේ නෙළුම් මල් ඉතාම වැදගත් වෙනවා. මට එතුමාගේ ශිෂ්‍යයෙකු වීමට අවශ්‍යයි. ඔබ ඔය මල් පහ මට දුන්නොත් මා සදහටම ඒ උදවුව මතක තබා ගන්නෙමි,' යි මේඝ නැවතත් කීය. එහෙත් යුවතිය කිසිවක් නොකීවාය. මේඝ නැවතත් ඇයට කතා කළේය. 'ඔබ මේ නෙළුම් මල් පහ මට දුන්නොත් ඔබ කියන ඕනෑම දෙයක් මා කරන්නම්,' තරුණිය කිසිවක් කරකියා ගත නොහැකිව මේඝගේ වචන තුළ අතරමං වූවාය. ටික වේලාවක් නිහඬව සිටි ඇය, 'සංසාරේ අප දෙදෙනාගේ හමු වීම නැවතත් සිදු වූයේ කෙසේදැයි සිතා ගන්න බැහැ. අද මා ඔබ ගැන ආදරයෙන් වෙලී යන බවක් දැනෙනවා. මා හට මීට පෙර බොහෝ තරුණයන් මුණගැසී තිබෙනවා. එහෙත් අද මෙන් හදවතට සමීප වූ කෙනෙක් කවදාවත්ම මුණගැසී නැහැ. ඔබ සමඟ කතා කිරීමෙන් පසුව ඇති වූ හැඟීම් වචනවලින් ප්‍රකාශ කළ නොහැකියි. මේ නෙළුම් මල් මිට ඔබට මා දෙන්නම්. දීපංකර හිමිට පූජා කරන්න. මේ නෙළුම් පූජා කොට ප්‍රාර්ථනා කරන්න ඕනෑ මේ ජන්මයේ දීත් ඊළඟ ජන්මවලත් ඔබ මගේ ස්වාමි පුරුෂයා වෙන්න කියලා.'

''ඉතා කලබලයෙන් මේ වචන ඈ කී නිසා මේඝට ඇය කී දේ අවබෝධ වූයේ නැත.

'''ඔබ ඉතාම අවංක උසස් අදහස් ඇති කෙනෙකි,' යි මේඝ යුවතියට කීය. 'ඔබ මුලින්ම දුටු විගස මට සිතුණා ඔබ

විශිෂ්ඨ කෙනෙක් කියලා. මා විමුක්තිය සොයාගෙනයි ආවේ. යම් කිසි විදියකින් මා ඔබ සමඟ විවාහ වුණොත් මගේ ඒ මාර්ගය අවහිර වීම නියතයි. එසේ වුවහොත් සද්ධර්ම මාර්ගය වැසී යාම අනිවාර්යයෙන්ම සිද්ධ වන බව මා දන්නවා.'

'''ඔබ මගේ ස්වාමි පුරුෂයා වීමට පොරොන්දු වන්නේ නම් ස්දධර්ම මාර්ගය සොයන ගමනට මා ද ඔබ සමඟ එක් වන බවට පොරොන්දු වන්නම්. විමුක්තිය සොයන ගමනේ දී සැම විටම මා ඔබ සමඟ සෙවනැල්ලක් සේ සිටින බවට පොරොන්දු වෙන්නම්,' යි තරුණිය කීවාය.

''මේඝ ඉතාම සතුටින් ඇගේ යෝජනාවට එකඟ විය. ඉන් පසු දෙදෙනාම ආචාර්ය දීපංකර හිමියන් දැකීම සඳහා පිටත්ව ගියහ.

බොහෝ සෙනඟ රැස්ව සිටි බැවින් දීපංකර හිමි සිටින තැනට කිට්ටු වීමට එතරම් පහසු වූයේ නැත. දෙදෙනාම ඉතාම අපහසුවෙන් සෙනඟ අතරින් ගොස් දීපංකර හිමියන් දැක ගත්හ. මේඝ බොහෝ සතුටට පත් වූ අතර තමන් ද කවදා හෝ දීපංකර හිමි මෙන් මහා ආචාර්යවරයෙක් වෙන්නෙමි යැයි අධිෂ්ඨාන කර ගත්තේය. ඔවුනට දීපංකර හිමි සිටි තැනට ළඟා විය නොහැකි වූ බැවින් ඔහු මල් මිටිය සෙනඟ අතරින් උන් වහන්සේ සිටි තැනට විසි කළේය. පුදුමයකට මෙන් ඒ මල් සියල්ලම දීපංකර හිමිගේ උකුළ මත වැටිණි. මේඝ පුදුමයට පත්ව 'මගේ පිරිසිදු අදහස් මුදුන් පත් වීමේ පෙර ළකුණු මේ,' යැයි සිතීය. ඔහු තරුණියට ද තමන් අත ඇති මල් පූජා කරන ලෙස කීවේය. ඈ ද ඔහු සේම මල් දෙක හිමියන් වෙත විසි කළාය. එම මල් ද දීපංකර හිමිගේ දැතටම වැටිණි. එවිට දීපංකර හිමි කථා කොට 'මේ මල් මගේ දැතට විසි කළ අය ඉදිරියට එන්න,' යි කීය. මහා සෙනඟ මේඝට හා යුවතියට දීපංකර හිමි වෙත යාමට ඉඩ දුන්හ. යුවතියගේ අත අල්ලා ගෙන ඉදිරියට ගිය මේඝ ඇත් සමඟම දණගසා හිමියන්ට වැන්දේය. දීපංකර මුනි මේඝ දෙස බලා, 'මා ඔබගේ පිරිසිදු අදහස් දනිමි,' යි කීය. 'මා දන්නවා නුඹ සත්වයාට සෙත සඳහා මුක්ති මාර්ගය සෙවීමට මහන්සි වන බව. මීළඟ භවයේ දී ඔබගේ සියලු ප්‍රාර්ථනා ඉටුවන බව සිතාගන්න,'' යි ආශිර්වාද කළේය.

''අනතුරුව දීපංකර මුනි යුවතිය දෙස බලා 'නුඹ මේ ආත්මයෙහි දී ඔබ ළඟින් ඉන්න මේ පුරුෂයා කවුද කියා හෝ දන්නේ නැති වුණත් ඔබට ඔහු හුඟාක් සමීපයෙනුයි ඉන්නේ. ඊ ළඟ ආත්මයේ දීත් ඔබ දෙදෙනා ඉතාම සමීපව සිටින බව ස්ථිරවම කිව හැකියි. තම තමන්ගේ යුතුකම් ඉටු කිරීමට දෙදෙනාම අමතක නොකළ යුතුයි. නුඹ මේසව තම ස්වාමියා ලෙස සිතා ඔහු කරන සෑම දෙයකටම උදවු කරන්න ඕනෑ,' යි කීවේය. මේසත් යුවතියත් දෙදෙනාම දීපංකර හිමිගේ කතාව අසා අති ප්‍රසන්නභාවයට පත් වූහ.

''දිව්‍ය ඥානය ඇති දීපංකර ආචාර්යවරයාගෙන් 'ඔබ වහන්සේ ලබා ගත් ඥානය මා හටත් ලබා ගැනීම සඳහා අවශ්‍ය උපදෙස් දෙන්න,'යි මේස ඉල්ලා සිටියේය.

''අසල සිටි සෙනඟ ඇමතූ දීපංකර මුනි, 'මේ දෙදෙනා පෙර ජන්මවල දී ද සැමියා හා බිරිඳ ලෙස සිටියා. තම ස්වාමියා සද්ධර්ම මාර්ගය සෙවීම සඳහා ගිහි ගෙය හැර ගිය සෑම විටම බිරිඳක් ලෙස හැම උපකාරයක්ම කළා. බිරිඳක් හැටියට කවර දාවත්ම ඔහුගේ සද්ධර්ම මාර්ගය සෙවීමේ ගමනට අවහිර කළේ නැහැ,' යි ප්‍රකාශ කළේය.

''දරුවනි, යසය, කීර්තිය හා ධනයෙහි වටිනාකම ඇත්තේ එක් සීමාවක් තුළයි. ඒත් මේ සියල්ල ඉතාම ඉක්මනින්ම නිරාසයට පත් කරවන දේවල් බවට පත් වෙනවා. ජීවිතයේ ආදරය සහ බුද්ධිය හෙවත් සම්‍යක් ඥානය ඉතාම වැදගත් වෙනවා. නුඹගේ සිතේ බුද්ධිය සහ ප්‍රේමය ඇත්නම් ඒ ජීවිතය ඉතාම ආනන්ද ජනක බව අමුතුවෙන් කිව යුතු නැහැ.''

යශෝදරා දෑත් එකතු කර බුදුරදුන්ට වැන්දාය. ඇගේ දෑසින් සතුටු කඳුළු වැගිරිණි. බුදුන් මේ කතාව කීවේ පුංචි දරුවන්ට යැයි යශෝදරාට එවෙලෙහි සිතුණ ද එය කියා ඇත්තේ තමන්ට බව ඇයට පසුව වැටහී ගියේය. බුදුරදුන් තමන්ට ස්තුති කළ අයුරු වැටහී ගියේය. ප්‍රජාපතී බිසව ද ඒ කතාව කීවේ ඔබට යැයි යශෝදරා දෙස බලා ඉඟියකින් කීවාය.

මහා ප්‍රජාපතී ගෝතමිය යශෝදරාගේ උරහිස මත අත තබා ''ඔබ දන්නවා ද එදා මේස අද කවුද කියා. ඒ වෙන කෙනෙකු නොවෙයි. බුදුන් වහන්සේයි. ඔහුගේ බිරිඳ මේ ජන්මයේ දී යශෝදරා වූ ඔබයි,'' කීවාය.

සිදුහත්ට ගිහි ගෙයින් නික්මී සත්‍ය සෙවීමට අවසරය දුන්නේ යශෝදරාගේ හොඳ අවබෝධය නිසාය. මේ නිසා සිදුහත් බුද්ධත්වය ලැබීමේ කතාවේ දී යශෝදරාට අනිවාර්යයෙන්ම ස්තුතිය පිරිනැමිය යුතුය.

පුංචි දරුවන්ගේ සිත් තුළ යශෝදරා පිළිබඳව මහත් ආදරයක් ඇති විය. ඔවන්ගේ හදවත් තුළ වූ ඒ ආදරය දක්වමින් ඔවහු ඇය දෙසට හැරී දෑත් එක් කොට ආචාර කළහ. ශාන්තව නැඟී සිටි බුදුන් වහන්සේ කාළුදායී සහ නාගසමාල සමඟ සෙමින් සෙමින් සෙනඟ අතරින් ආපසු විහාරය බලා වැඩම කළහ.

## තිස් හත්වන පරිච්ඡේදය

# අලුත් විශ්වාසයක්

සති දෙකකට පසුව සුදොවුන් මහ රජතුමා බුදුරදුන්ටත් සැරියුත් හිමි ඇතුළු මහා සංඝයාටත් රජ මැඳුරෙහි දානය සඳහා ආරාධනා කළේය. ගෝතමී බිසව, යශෝදරා, නන්ද, සුන්දරී, රාහුල යන අය ද මේ අතර වූහ. දානය මොහොතේ පැමිණ සිටි ධනවත් ආගන්තුකයන්ට සමථ භාවනාව කුමක් දැයි බුදුරදුන්ගෙන් දැන ගැනීමට හැකි විය. පසුව බුදුරදුන් කළ ආනාපනාසති භාවනාව ගැන විස්තරය නොදත් අයට එය අලුත් අදහසක් වූවා පමණක් නොව හදවතට බලවත් සතුට ගෙන දෙන්නක් ද විය.

බුදුන් වහන්සේ සිහි කල්පනාවෙන් කටයුතු කිරීමෙන් ඇති වන මානසික සතුට පිළිබඳව ද විස්තර කර දුන්හ.

රාහුල ශාරිපුත්ත හිමියන් ළඟින්ම වාඩි වී සිටියේය. තම පුංචි අත වැඩි මහලු භික්ෂූන්ගේ අත තබා ඒ අයට තමන්ගේ ආදරය පෙන් වීය. රාහුල සාරිපුත්ත හිමියන්ට අනෙක් අයට වඩා කැමැත්තක් දැක් වීය. බුදුරදුන් හා සාරිපුත්ත හිමියන් විහාරයට යෑමට පිටත් වූ විට ඒ අයව මඟක් දුරට ඇරලීමට රජ පවුලේ වැඩි හිටි සියලු දෙනාම පසු පස ආහ. බුදුරදුන් නන්දගේ අතට පිණ්ඩපාත පාත්‍රය දී නිහඬව ගමන් කළේය. නන්දත් පාත්‍රය

රැගෙන බුදුන් පසුපස නිහඬව ගමන් කළේය. දැන් දැන් බුදුරදුන් තම අතින් පාත්‍රය ගනීවි යැයි නන්ද සිතීය. එහෙත් විහාරයට යන තෙක්ම බුදුරදුන් නන්ද අතින් පිණ්ඩපාත පාත්‍රය නොගත්තේය.

විහාරයට ගිය පසු නන්ද ඇමතූ බුදුරදුන්, ''නුඹට පැවිදි බවේ රසය විඳින්න නම් දින කිහිපයක් ආරාමයෙහි මා සමඟ භික්ෂූන්ගේ ආශ්‍රයෙහි සිටින් ඕනෑ,'' යි කීය. තම වැඩි මහල් සහෝදරයාට ඇති ආදරය සහ ගෞරවය නිසා නන්ද බුදුරදුන්ගේ අදහසට එකඟ විය. භික්ෂූන්ගේ සරල ශාන්ත ස්වභාවය නන්දගේ සිත් ගත්තේය.

දින හතක් ගත වීමෙන් පසු බුදුරදුන් පැවිදි වීමට කැමති දැයි නන්දගෙන් ඇසීය. නන්ද එක සිතින්ම එයට කැමති විය. නන්දගේ කැමැත්ත ප්‍රකාශ කළ පසු බුදුරදුන් සාරිපුතත හිමියන්ට කතා කොට නන්දට භික්ෂු විනය ආදිය උගන්වා පැවිදි කරවන්නැයි කීය. නන්ද ටික දිනකට පැවිදි කරවන්න අවශ්‍යයැයි බුදුරදුන් කලින්ම සුදොවුන් රජුගෙන් අවසර ගෙන තිබිණි. නන්ද ඉතාම පිරිසිදු චරිතයක් ඇති තරුණ කුමාරයෙක් වුවත් අනාගත රජ කෙනෙක් හැටියට හැඳින්වීමට තරම් ශක්ති සම්පන්න කෙනෙකු වූයේ නැත.

නන්දට අධිෂ්ඨාන ශක්තිය ඇතිවන ආකාරයේ ජීවන රටාවක් සකස් කර දීමට මේ දින කිහිපය ප්‍රයෝජනයට ගන්නා බව බුදුරදුන් සුදොවුන් රජතුමාට කීය. මේ අදහස ගැන රජතුමා සතුටට පත්ව සිටියේය.

එහෙත් මාසයක් වත් ගත වීමට පෙර නන්ද තම ආදරවන්තිය වූ කල්‍යාණි දැකීමට දැඩි ආශාවෙන් පෙළෙන්නට විය. මේ ගැන ඔහු නොකීව ද නන්දගේ හැසිරීමෙන් හා මුහුණේ ස්වභාවයෙන් ඒ බව බුදුන්ට දැනිණ. බුදුන් දිනක් නන්දට කතා කොට ''නුඹ බලාපොරොත්තු වන දේ ලබා ගන්න ඕනෑ නම් බාරගත් කාර්යය දැඩි උත්සාහයෙන් කරන්න,'' යි කීය.

මේ අතර රාහුල තම බාප්පා බුදුරදුන්ට ඉතා සමීපව විහාරයේම සිටිනු දැක තමනුත් නන්ද මෙන් විහාරයෙහි පදිංචි වුවහොත් බුදුන්ටත් භික්ෂූන්ටත් සමීපව සිටිය හැකි බව සිතීය. රාහුල තම අදහස තම මෑණියන් වූ යශෝදරාට දැන්වීය. යශෝදරා තම පුතුගේ හිස ආදරයෙන් පිරිමැද පැවිදි වීමට තව ටිකක් වයස් ගත විය යුතු බව කීවාය.

''අම්මේ, ඉක්මනින් ලොකු මිනිහෙක් වීමට කරන්න ඕනෑ මොනවා ද?'' රාහුල සුරතල් හඬින් ඇසීය. ''හොඳ කෑම කාලා හොඳට ව්‍යායාම කරන විට ශරීරය මෙන්ම සිත ද ක්‍රමයෙන් වර්ධනය වේ,'' යැයි යශෝදරා පුංචි පුතුට කීවාය.

දිනක් යශෝදරා බුදුන් සහිත මහා සංඝයා කපිලවස්තුවේ පිණ්ඩපාත කරන ආකාරය දුටුවාය. ඇය රාහුලට අඬගසා පියා ළඟට ගොස් දායාදය ඉල්ලා ගන්නැයි කීය. රාහුල රජ මැදුරෙන් පහළට බැස්සේය.

පුංචි රාහුල තම ආදරණීය මෑණියන්ගේ ආදරයේ උණුසුම නොඅඩුව ලැබුවේය. නමුත් පියාගේ ආදරය ලැබීමට පෙර තම පියා ගිහිගෙය අතහැර පැවිදි වීමට ගියේය.

කෙසේ නමුත් රාහුල ඉතාම ආදරයෙන් බුදුන් සමීපයට ළං වී තම දෑතින් බුදුන්ගේ දකුණත අල්ලා ගත්තේය. තද සූර්ය රශ්මිය තිබුණත් රාහුලට බුදුන්ගේ සෙවනැල්ල සිසිලක් ගෙන දුන්නේය.

මේ සිද්ධිය යශෝදරා රජ මැදුරෙහි උඩුමහලේ කවුලුවකින් බලා සිටියාය. රාහුල පුංචි කුමාරයා බුදුන්ගේ දකුණත අල්ලාගෙන තමන්ගේ දායාදය දෙන ලෙස ඉල්ලා සිටියේය. බුදුන් ඉතාම කරුණාවෙන් ''මා සමඟ විහාරයට යන්න එන්න. මගෙන් ඔබට හිමි දායාදය දෙන්නම්,'' යි කීවේය.

රාහුල බුදුන් සමඟ විහාරයට ගොස් සාරිපුත්ත ආදී විද්වත් මහ රහතුන් මැද නිහඬව කෑම කෑවේය. රාහුලගේ බාප්පා වූ නන්ද ඒ දැක සතුටට පත් විය.

බුදුන් රාහුලට අද රාත්‍රිය ශාරිපුත්ත මහ රහතන් වහන්සේගේ කුටියෙහි ගත කරන්නැයි කීය. සියලුම භික්ෂූන් රාහුලට ආදරයෙන් සැලකූහ. භික්ෂූන් වහන්සේලාගේ ආදරයත් බුදුන්ගේ මහා කරුණාවේ සිසිලත් නිසා මාළිගාවට වඩා විහාරයේ පරිසරය රාහුලගේ සිත් ගත්තේය. දිගට විහාරයේ ඉන්න ඇත්නම් කොපමණ හොඳදැයි ඔහුට සිතිණි.

රාහුල මේ ගැන ශාරිපුත්ත මහ රහතන් වහන්සේගෙන් ඇසූ විට බුදුරදුන් සාරිපුත්තට රාහුලව පැවිදි කරන ලෙස කීය. රාහුලගේ පුංචි වයස නිසා ශාරිපුත්ත බුදුරදුන්ගෙන් මෙතරම් පුංචි වයසේ දී පැවිදි කරන්නේ කෙසේදැයි ඇසීය. රාහුල සාමණේර ප්‍රව්‍රජාවෙන් පැවිදි කරන ලෙස බුදුරදුන් ශාරිපුත්ත හිමියන්ට

පැවසීය. බුදුරදුන්ගේ අනුදැනුම ඇතිව සාරිපුත්ත තෙරුන් රාහුලගේ හිස කෙස් බූ ගා තිසරණ සහිත දස ශීලය සමාදන් කරවීය. ඉන් පසු කරුණා, මෛත්‍රී, අහිංසා ආදී මානව ගුණ ගැන විස්තර කර සතර ආර්ය සත්‍යය ගැන විටින් විට විස්තර කර දුන්නේය. සාරිපුත්ත මහ රහතන් වහන්සේ තමන්ගේම සිවුරක් දෙකට කපා පුංචි සිවුරු දෙකක් සූදානම් කොට රාහුලට අඳින්න දුන්නේය. සිවුරු පොරවන ආකාරය ද පිණ්ඩපාතය සඳහා පාත්‍රය අල්ලන ආකාරය ද කියා දුන්නේය.

රාහුල කාටත් ප්‍රිය මනාප විය. සාරිපුත්ත මහරහතන් වහන්සේගේ කුටියෙහි නිතර හැසිරුණු රාහුල රාත්‍රිය ගත කළේ ද එහිමය. පිණ්ඩපාතය සඳහා ද ගම්වලට ගොස් තමන්ට අවශ්‍ය ප්‍රමාණයට පිණ්ඩපාත කරගෙන ඒම සිරිතක් කරගෙන තිබිණි. සියලුම භික්ෂූන් දවසට වරක් දානය ගැනීම සිරිතක්ව තිබුණ ද රාහුල පුංචි නිසා සවස් වරුවෙහි කිරි ආදිය ගැනීමට පහසුකම් යෙදීය. ගමේ අයත් රාහුලට හවස් වරුවේ කිරි ගෙනැවිත් දුන්හ.

රාහුල හිස බා භික්ෂු වේෂයෙන් පිණ්ඩපාතයේ යන බව සුදොවුන් රජතුමාට දන ගන්න ලැබී තමන් සන්තකව ඉතිරිව තිබූ අනෙක් වස්තුවත් තමන් අතින් ගිලිහී ගියේ යැයි ශෝක වන්නට විය. රජුටත් ගෝතමියටත් රාහුල නිතරම සිහිපත් විය. එහෙත් ටික දිනක් විහාරයේ සිට රාහුල නැවත මාළිගාවට ඒ යැයි මේ අය විශ්වාස තබා සිටියහ. රාහුල සාමණේර භාවයට පත් වී විහාරයෙහිම පදිංචි වේ යැයි මේ අය කිසි විටකත් නොසිතුහ. දරුවන් මාළිගාවේ නැති නිසා රජුටත් ප්‍රජාපතී ගෝතමියටත් යශෝදරාටත් මහත් පාළුවක් දැනෙන්නට විය.

දිනක් සුදොවුන් රජු හා ප්‍රජාපතී ගෝතමිය රථයෙහි නැඟී විහාරයට ගියහ. විහාරයට පැමිණෙන රාජ යුවල දුටු නන්ද හා රාහුල දෙදෙනාම ඉදිරියට ගොස් ඔවුන්ව ඉතාම ආදරයෙන් පිළිගත්හ. රාහුල තම ආදරණීය මෑණියන් දැක ගෙල වැළඳ ගත්තේ ය.

බුදුරදුන් දැක නමස්කාර කළ රජු දුකින් බර කටහඬින් කථා කළේය.

''නුඹ මාළිගාව අතහැර තපසට ගිය වෙලාවේ මට කොපමණ වේදනාවක් ඇති වුණා ද? මේ ගැන නුඹ නම් විශ්වාස

කරන්නේ නැතිව ඇති. ටික දවසකට පෙර නන්ද මාව අතහැර ගියා. මා ගිහි කෙනෙක්. දරුවෝ ගැන වේදනාව දන්නේ දරුවෝ ඉන්න අයයි. ඔබ වහන්සේ බුදු බව අවබෝධ කරගත් කෙනෙක්. මේ ගැන මට වඩා ඔබ වහන්සේ දන්නවා. නමුත් ඔබ වහන්සේට ඉවසීම තියනවා. අපි ගිහි අයයි. අපේ ඉවසීම සීමා සහිතයි. මගේ මස්, නහර, ඇට, ඇට මිදුළු දක්වා මේ වේදනාව පැතිරී තවමත් ඒ ආකාරයෙන්ම පවතිනවා. මා ඔබ ගෙන් එක ඉල්ලීමක් කරනවා. දෙමවුපියන්ගෙන් අවසරයක් නැතිව දරුවන් පැවිදි නොකරන ලෙස.''

''පියාණනි, දූනට නන්දත්, රාහුලත් ගත කරන මේ උතුම් ජීවිතය ගැන ඔබ සතුටට පත් වෙන්න ඕනෑ.''

බුදුරදුන්ගේ මේ වදනින් රජුගේ සිත් වේදනාව තරමක් අඩු වී ගියේය. ප්‍රජාපතී සහ යශෝදරාත් බුදුන්ගේ වදනින් සිත සැහැල්ලු කර ගත්හ. ඉන් පසුව බුදුරදුන් ධර්මයේ ආචාර සංහිතාවට දෙමවුපියන්ගේ අවසරය නැතිව දරුවන් පැවිදි කිරීම තහනම් කරන්න යැයි ශාරිපුත්ත හිමියන්ට නියම කළේය.

ඉන් පසුව බුදුරදුන් රජ පවුලේ සැමට ධර්ම දේශනා කළේය. ධර්මය ඇසීමෙන් පසුව රජතුමා ඇතුළු සෙසු සැම ද සැනසීමට පත් විය.

කාලය ක්‍රමයෙන් ගෙවී ගියේය. බුදුරදුන් ඇතුළු මහා සංඝයා කපිලවස්තුවෙහි ගත කළ කාලය ක්‍රමයෙන් මාස හය ඉක්ම ගියේය. අලුත් තරුණ පිරිස පැවිදිවීම නිසා භික්ෂු සංඝයාගේ ගණන පන්සියය ද ඉක්ම වීය. සාමාන්‍ය උපාසක උපාසිකාවන්ගේ ගණන ද ගිණිය නො හැකි තරමට අධික විය. සුද්ධෝදන රජු සිද්ධාර්ථ කුමරුගේ ග්‍රීෂ්ම කාලීන මාළිගය භික්ෂු සංඝයාට පූජා කළේය. එකී මාළිගාව වටා සීතල පරිසරයක් ඇති කිරීම සඳහා විශාල වශයෙන් ගස් වවා තිබිණි. ශාරිපුත්ත මහ රහතන් වහන්සේ විසින් එකී මාළිගය අවටත් භික්ෂු මහා සංඝයාගේ වැඩ හිඳීමට සුදුසු වන පරිදි සූදානම් කර දුන්නේය. මේ කරුණු නිසා කපිලවස්තුවේ ධර්මය ගැන විමසන පිරිසගේ ගණන ද වැඩි වන්නට පටන් ගත්තේය.

තම පොරොන්දුව අනුව බුදුරදුන් වේළුවනාරාමයෙහි වස් වැසීමට වැඩම කිරීමට තීරණය කළේය. මගධයට වැඩම කිරීමට පෙර මාළිගාවට වැඩම කරවා දහවල් දානය වළඳා රජ ගෙදර අයට ධර්මය දේශනා කරන ලෙස සුදොවුන් රජු ඉල්ලා සිටියේ ය.

බුදුරදුන් ඇතුළු මහා සංඝයා මාළිගාවට වැඩම කර දානය වළඳා රාජ කාර්යය ජනතාවට හිත සුව පිණිස හසුරුවන ආකාරය ගැන ධර්ම දේශනා කළ සේක. සද්ධර්මය අනුව කටයුතු කිරීමේ දී කරුණා, මෛත්‍රී ආදී ගුණ වර්ධනය වන විට රාජ්‍යය කරගෙන යාමට ජනතාවගෙන් ලැබෙන සහයෝගය අධික වන ආකාරය ගැන විස්තර කර දුන් සේක. කරුණාවෙන් මෛත්‍රියෙන් කටයුතු කිරීමෙන් මරණීය දණ්ඩනය, හිර ගෙදර දැමීම්, ශාරීරික වධ හිංසා කිරීම අවශ්‍ය නොවන ආකාරය ද විස්තර කර දුන්නේය.

රාජ නීතිය සුදුසු තරම් ප්‍රඥාවෙන් යුක්ත නම්, මෛත්‍රියෙන් යුක්ත නම් උත්පීඩන, කප්ඨ ආදියෙන් මිදීම එතරම් අපහසු නොවන බව අවබෝධ කර දුන්නේය. මෙයින් දුප්පත් බව හා පොහොසත් බව ද නැති වෙයි. රජතුමා හෙවත් පාලකයා ධර්මිෂ්ඨ නම් ප්‍රජාව ද ඒ දෙස බලා ධර්මිෂ්ඨ වීම ස්වාභාවිකය.

සුදොවුන් රජු ඇතුළු පිරිස බුදුන්ගේ දේශනා අසා අති ප්‍රසන්න බව ප්‍රකට කළේය. සිදුහත් සමයේ මාමා හා දේවදත්තගේ පියතුමා නන්ද යන තුන් දෙනාම බුදුන් වෙත පැමිණ සැම දාම සුන්දර සුඛී ශාසනයක් සඳහා ඔබතුමා කී අදහස් ඉතාම අගනේ ය. එතරම් උදාර අදහස් ඇති ඔබ කපිලවස්තුවේම නතර වී ශාක්‍ය රාජ වංශයට මඟ පෙන්වීමක් කරන්නේ නම් එය ඉතා හොඳ යැයි කීය. ඔබ සඳහන් කළ සත්‍යයේ මාර්ගයට ශාක්‍යයන් යොමු කළ හැක්කේ ඔබටම පමණයි. ඒ නිසා කපිලවස්තු රාජ්‍යයේ ශාන්තිය සැප සඳහා කපිලවස්තුවේම නතර වන්නැයි ආරාධනා කළහ.

සුද්ධෝදන රජු ද ''මා වයස්ගත වී සිටින නිසා නුඹ කපිලවස්තුව බාරගන්න සූදානම් නම් මමත් සිංහාසනය අතහරින්නම්. ශාක්‍ය වංශයට ආදරේ ඇති සැම දෙනාම නුඹ සමඟ එකට එකතු වන බව මා හොඳින් දන්නා කාරණයක්. නුඹ රාජ්‍යය බාර ගත්තොත් එදා සිට ශාක්‍ය රාජ්‍යය සමෘධිමත් වීම ද

කිසිම සැකයක් නැතිව සිදු වන බව මම දන්නවා,'' යි කීවේය.

මෙයට ඉක්මනින් පිළිතුරක් නොදුන් බුදුරදුන් තම ආදරණීය පියාණන් දෙස සෙනෙහස් බැල්මක් හෙළීය.

''පියාණනි, දැන් මා තනි පියෙකුට හෝ වංශයකට හෝ එක රටකට හෝ අයිති කෙනෙක් නොවෙමි. මුළු ලෝකයේම සියලු ප්‍රාණීන් මගේ පවුලේ අයයි. මහ පොළොවේ සෑම තැනක් ම මගේ නිවසයි. මා දැන් එක් භික්ෂුවක් පමණයි. මා මගේ ජීවිතයට සද්ධර්මය සම්බන්ධ කර ගත්තා. රාජ නීතිය සමඟ මගේ කිසිම ගනුදෙනුවක් නැහැ. මා ගත කරන ජීවිතය අනුව මා දන්නවා මගෙන් මුළු ලෝකයේම ප්‍රාණීන්ට විශාල සේවයක් සිද්ධ වේවි කියලා.''

මහා ප්‍රජාපතී ගෝතමිය හා යශෝදරා දේවිය මේ මොහොතේ කිසිම දෙයක් කීවේ නැත. එහෙත් බුදුරදුන්ගේ කථා අසා දෑසින් කඳුළු සලන්නට පටන් ගත්හ. එහෙත් බුදුරදුන් දැක් වූ අදහස් නිවැරදි යැයි දෙදෙනාම සිතූහ.

බුදුරදුන් තමන් ඉදිරියේ සිටි සියලු දෙනාට තම දේශනාව දිගටම කරගෙන ගියේය. පන්සිල් පද එකින් එක රැගෙන විස්තර කර ඒවා රැකීම සැපවත් ජීවිතයක් හා සමෘද්ධිමත් සමාජයක අඩිතාලම බවත් රටක් රාජ්‍යයක් පාලනය කරන පාලකයා පන්සිල් ආරක්ෂා කළහොත් මුළු රටම එකී පාලකයාට අවනත වන බව දේශනා කළේය.

තමන් වහන්සේ ඉතාම ඉක්මනින් මගධය කරා වැඩම කරවන බව බුදුන් වහන්සේ රජු ඇතුළු පිරිසට දැන්වූහ. නමුත් අනාගතයේ කවදා හෝ දවසක නැවතත් කපිලවස්තුවට පැමිණෙන බව ද දැන් වූහ. යළිත් කපිලවස්තුවට පැමිණෙන බව ඇසූ එහි සිටි සෑම දෙනම මහත් සතුටට පත් වූහ.

## තිස් අට වන පරිච්ඡේදය

# සතුටින් පිරී ඉතිරී යාම

ශාක්‍ය රාජ්‍යයෙන් පිට වූ බුදු හිමියන් එකසිය විස්සක් භික්ෂූන් සමඟ උතුරු කෝසල රාජ්‍යයට ප්‍රවේශ වී එහි ''අනුපිය'' නම් වූ අඹ වනයෙහි විවේක ගත්තේය.

බුදුන් සමඟ ශාරිපුත්ත, කාළුදායී, නන්ද භික්ෂූන් සහ සාමණේර රාහුලට අමතරව උසස් කුලවලින් පැමිණ පැවිදි වූ තරුණ භික්ෂූන් බොහෝ දෙනෙක් වූහ.

බුදුරදුන් කපිලවස්තුවෙන් පිටත් වී ගොස් මාසයකට පසුව ශාක්‍ය රජ පවුලේ මහානාම හා අනුරුද්ධ යන දෙදෙනාට ද පැවිදි වීමට ඇත්නම් හොඳ යැයි සිතිණි. මේ දෙදෙනාට ද ඍතු තුනට මාළිගා තුනක් සූදානම් කර තිබිණි. මහානාමගේ මිත්‍රයන් විශාල පිරිසක් කලින්ම පැවිදි වී සිටියහ. මේ නිසා මහානාමට පැවදි වීමේ ආශාව දිනෙන් දිනම වැඩි විය. තම සහෝදරයා ද පැවිදි වීමට සූදානම් බව ඔහුට දැන ගන්නට ලැබිණි. මහානාමගේ පවුලේ සිටියේ සහෝදරයන් දෙදෙනා පමණක් නිසා දෙදෙනාම පැවිදි වුවහොත් වංශය විනාශ වේය යන අදහස නිසා පසුව මහානාම පැවිදි වීමේ අදහස අතහැරීමට තීරණය කළේය. අනුරුද්ධ පැවිදි වීමට දෙමාපියන්ගෙන් අවසරය ඉල්ලූ විට ඒ පිළිබඳව

දෙදෙනාම සතුටු නොවූහ. උසස් කුලවල විශාල පිරිස් පැවිදි වී සිටින අයුරු ඔහු දෙමාපියන්ට විස්තර කළේය. නිග්‍රෝධ වනයේ ධර්මශ්‍රවණය කිරීමෙන් පසුව තම මවට මේ ගැන තවත් විස්තර කීවේය.

එකී විස්තර කිරීමෙන් පසුව මහානාමට පැවිදි වීමට දෙමාපියන් විසින් අවසර දෙන ලදී. මහානාම සමඟ භද්දියට ද පැවිදි වීමට අවසර ලැබුණේය. භද්දිය රජ පවුලේ සාමාජකයෙකු බව කවුරුත් දැන සිටියහ. මේ නිසා ඔහු පැවිදිවේ යැයි කිසිවෙක් නොසිතූහ. භද්දිය උතුරු ප්‍රදේශයේ පාලකයා ද විය. ඔහුට වෙනම ම හමුදාවක් සිටි අතර ආරක්ෂාව සඳහා සිවු දෙසින්ම වෙනමම ආරක්ෂක පිරිසක් ද සිටියහ.

අනුරුද්ධ ඉක්මනින්ම භද්දිය ළගට ගියේය, ''මට පැවිදි වීමට අවසර ලැබුණා. නමුත් නුඹ නිසා තවම මගේ අදහස ඉටු කර ගැනීමට නොහැකි වුණා,'' යි ඔහු භද්දියට කීවේය. භද්දිය සිනාසුනේය.

''මේ ගැන නුඹට මගෙන් ඇති අවහිරය මොකක් ද? ඒ කෙසේ වෙතත් නුඹගේ සිතේ යම් අදහසක් ඇත්නම් ඒ සියල්ල සම්පූර්ණ කිරීමට මා සැම විටම සූදානම්,'' යැයි ඔහු කීවේය. සියල්ල අසා සිටි අනුරුද්ධ, ''නුඹ පැවිදිවීමට සූදානම් නම් පමණක් මා ද පැවිදි වෙමි,'' යි කීය. ''අනුරුද්ධ, නුඹ වෙනුවෙන් මා ඕනෑම පරිත්‍යාගයක් කිරීමට සූදානම්.''

භද්දිය අනුරුද්ධගේ කතාවෙන් ජීවිතයේ කවදාවත්ම නො වූ පොරොන්දුවක් වී අපහසුතාවකට පත් වූ බව පෙනිණි. ඔහු පැවිදි වීමට අදහසක් තිබුණ ද කාටවත්ම මේ ගැන කීවේ නැත. පසුව සැමට දන්වන්නෙමියි යන අදහසින් ඔහු නිහඬව සිටියේය. අනුරුද්දට වූ පොරොන්දුව අනුව පැවිදිවීම සඳහා තව වසර හතක කාලයක් දෙන ලෙස ද පසුව අවුරුදු තුනක කාලයක් ද අන්තිමේ දී මාස හතක කාලයක් ද ඉල්ලීය. ඔහුගේ අත්‍යවශ්‍ය රාජකාරි කටයුතු ක්‍රමයෙන් අවසන් කිරීමට තිබූ හෙයිනි. සද්ධර්මයට ඇතුළුවීමට මෙතරම් කාලයක් අවශ්‍ය වන්නේ ඇයි දැයි අනුරුද්ධ ඇසීය. භික්ෂුභාවයට පත් වූ විට අවශ්‍ය වේලාවක ඕනෑම දෙයක් අතහැරීමට හැකියාව ඇතිවන බව ඔහු කීවේ ය. මේ ගැන මේ තරම් නොසිතා අදහස වෙනස් කරන්නැයි ඔහු ඉල්ලා සිටියේය. අනුරුද්දගේ කීම නිසා ඔහු, ''හොඳයි මම දවස් හතකින් ඔබත් සමග එන්නම්,'' යි කීය.

මේ ගැන සතුටු වූ අනුරුද්ද තම මෑණියන්ට සියලුම විස්තර දන්වා සිටියේය. ඔහු මෙතරම් රාජ සම්පත් අත හැර පැවිදි වේ යැයි මෑණියන් කෙදිනක හෝ සිතුවේ නැත.

මවගේ අවසරය පරිදි අනුරුද්ධ භගු, කිම්බිල, දේවදත්ත යන අය ද තමන් සමඟ පැවිදි වීමට යාම සඳහා කැමති කරවා ගත්තේය. ඔවුන් සැම දෙනම රාජ කුමාරවරු වූහ. දේවදත්තගේ නිවසට රැස් වූ ඔවුහු බුදුරදුන් වැඩ සිටින ස්ථානය සොයා යන්නට පිටත් වූහ.

ආනන්දගේ වයස අවුරුදු දහ අට වූවා පමණි. ඔහු තම සහෝදරයා වූ දේවදත්ත සමඟ මේ ගමන යෑමට පියාගෙන් අවසර ගත්තේය. සියලුම රාජ කුමාරවරු කෝසල රාජ්‍යයේ සීමාව දක්වා තමතමන්ගේ රාජකීය රථවලින් ගියහ. බුදුරදුන් අනුපිය අඹ වනයේ සිටින බව මේ අයට දැන ගන්නට ලැබිණි.

''දැන් අපේ රාජ ආභරණ ගළවා දමමු. ඒවා කවුරුන් හෝ දුප්පතෙකුට දෙමු,'' යි අනුරුද්ධ සෙස්සන්ට යෝජනා කළේය. ඔවුනට දුප්පත් කරණවෑමියෙකු මුණගැසිණි. ඔහු නමින් උපාලි බව අනුරුද්ධ ඇතුළු කුමාරවරුනට කීවේය. අනුරුද්ධ තමන්ට බුදුරදුන් හමු වීමට මඟ පෙන්වන්නැයි ඔහුගෙන් ඉල්ලා සිටියේ ය. කුමාරවරු පිරිස පැවිදි වීමට යන බව ඇසූ උපාලි මඟ පෙන්වීම සඳහා ඉතාම සතුටින් ඉදිරිපත් විය. තමතමන්ගේ රාජාභරණ එකතු කර බැඳ තිබූ පොදිය පිටින්ම ඔවුහු උපාලිට දී, ''අපට දැන් මේවායින් පලක් නැහැ. නුඹ මේවා විකුණා මුදල් ලබාගෙන සැපවත් ජීවිතයක් ගත කරපන්,'' යි කීහ.

රාජ කුමාරවරුන් බුදුරදුන් සිටින අනුපිය අඹවනය වෙත යොමු කළ උපාලි වහාම ආපසු පැමිණ ඔවුන් දුන් පොට්ටනිය ලිහා බැලීය. ජීවිතයේ කිසිදු දිනක සිහිනෙකින් හෝ නොදුටු ආකාරයේ රත්රන් ආභරණ හා රෙදිපිළි දුටු ඔහු පුදුමයට පත් විය. උපාලි දුප්පත් තරුණයෙකු වූ බැවින් කිසිදිනෙක රත්‍රන් පැළඳීමට වාසනාවක් නොතිබිණි. සතුට ඉහවහා ගිය ඔහු පිස්සෙකු මෙන් හැසිරෙන්නට විය. යළිත් ඔහුට බියක් දැනිණි. මෙවන් රත්තරන් ගොඩක් කවුරුන් හෝ ඔහු ළඟ ඇති බව දුටුවහොත් ඒ සියල්ල ගැනීමට තමාව මරන්නටත් බැරිකමක් නැතැයි ඔහුට සිතිණි. සියලු වස්තුව තිබූ ලෙසම පොට්ටනි පිටින්ම ආපසු බැඳ තැබූ ඔහු කල්පනා කරන්නට විය. සුළු වේලාවකින් උපාලි නැවතත්

සිතන්නට විය. මෙතරම් සැප සම්පත් ඇති රාජ කුමාරවරු එම රජ සැප සම්පත් පවා හැර දමා පැවිදි වීමට සූදානම් නම්, මා ද ඒ මඟ යා යුතු යැයි සිතුවේය. රන් බැඳි පොට්ටනිය කැමති කෙනෙකුන් හට ගන්නට සිතා හැර දමූ උපාලිගේ සිත තුළ රජ සැපටත් වඩා උතුම් සැපතක් වූ මේ මඟ තමා කෙසේ හෝ යා යුතු යැයි වූ දැඩි උනන්දුවක් ඇති විය. මේ නිසා ඉතා ඉක්මනින් නැවතත් කුමාරවරුන් වෙත සමීප වීමට ඔහුට හැකි විය.

උපාලිව දුටු දේවදත්ත ''උපාලි, නුඹ අපේ පසු පස දුවගෙන ආවේ ඇයි? කෝ නුඹට දුන් ආභරණ හා ඇඳුම්?'' යැයි විමසීය. ''මා ඒ සියල්ල ගසක අත්තක් උඩ තබා ආවා. මාත් පැවිදි වෙන්න බුදුරදුන් සමීපයට යන්නයි ආවේ,'' උපාලි පිළිතුරු දුන්නේය. දේවදත්ත උපහාසයෙන් සිනා සී යමක් කීමට සූදානම් වන බව දුටු අනුරුද්ධ ඔහු නතර කළේය.

''නුඹ අපත් සමඟ එක්කරගෙන යන්න ලැබීමම බලවත් සතුටක්,'' යි කී අනුරුද්ධ උපාලි සතුටින් පිළිගත්තේය. බුදුරදුන්ගේ දේශනාව අනුව සංඝ යනු මහා සාගරය වැනිය. දස දෙසින් ගලා එන ගංගා සයුරට වැටුණු පසු සාගරය යන නම, කියනවා හැර ගංගා අනුව ජලය වෙන් කෙරෙන්නේ නැත. සියලුම දෙනා බුදු සසුනට කුමන පැත්තක සිට ප්‍රවේශ වූවත් සංඝ සමාජයට එකතු වූ විට සංඝ යන නම හැර වෙන නමක් පාවිච්චි කරන්නේ නැති නිසා සාගරයේ ජලය සේ සියලු දෙනා එක හා සමාන බව උන් වහන්සේ විස්තර ඇතිව කියා දී තිබේ.

භද්දිය තමන් කවුද කියා උපාලිට විස්තර කර දුන්නේය. ඉන් පසුව සෙසු කුමාරවරුන් ගැන ද විස්තර කියා හඳුන්වා දුන්නේය. උපාලි සැම දෙනාටම දෑත් එකතු කර නමස්කාර කළේය.

සියලු දෙනාම අනුපිය අඹ වනයට ඇතුළු වී බුදුරදුන් සමීපයට පැමිණියහ. භද්දිය තමන් ආ කාරණය බුදුරදුන්ට විස්තර ඇතිව කීවේය. හැම කෙනෙකුගේම අදහස් එක සේ ප්‍රකාශ කළ බැවින් උන් වහන්සේ ඔවුන් පැවිදි කරවීමට පොරොන්දු වූ සේක. එහෙත් සැමටම පෙර උපාලි පැවිදි කරවන්නැයි භද්දිය බුදුරදුන්ගෙන් ඉල්ලා සිටියේය. ඒ අනුව උපාලි පළමුව පැවිදි කරවීය. ආනන්ද මේ වන විට දහ අට වන වියේ සිටි බැවින් ඔහුට සාමණේර පැවිද්ද දෙන ලදී. රාහුලට පසු එතෙක් අඩුම වයසින් පැවිදි වී සිටියේ ආනන්දය. ආනන්ද දුටු රාහුල මහත්සේ සතුටට පත් විය.

පැවිදි වීමෙන් පසුව දින තුනක් බුදුරදුන් සමඟ එකට සිට නැවත සැම දෙනම වෛශාලි නුවර බලා පිටත් වූහ. දින තුනක් එහි ද ගත කර රාජගිරියෙහි වේළුවනයට ගියහ. මේ ගමනට සම්පූර්ණ දින දහයක් ගත විය.

වේළුවනයේ සිටි භික්ෂූන් හයසිය නමට අමතරව කාශ්‍යප මහ රහතන් වහන්සේ මුගලන් මහ රහතන් වහන්සේ, කොණ්ඩඤ්ඤ ආදී භික්ෂූන් බුදුරදුන්ගේ වේළුවන ගමන ගැන අති ප්‍රසන්න වූහ. බුදුරදුන් පැමිණි බව අසා බිම්බිසාර රජු බුදුරදුන් හමුවීමට ප්‍රථමයෙන්ම පැමිණියේය.

වස්සාන ඍතුව ළඟළඟ ම එන බැවින් කොණ්ඩඤ්ඤ සහ කාශ්‍යප මේ පිළිබඳව සූදානමින් සිටියහ. බුද්ධත්වයෙන් පසුව මේ එළඹෙන්නේ තුන් වන වස්සාන ඍතුවය. පළමු වස් සමය ඉසිපතන මිගදාය මුව වනයෙහි ගත කළ බුදුරදුන් දෙවන වස් සමය වේළුවනයෙහි ගත කළේය.

රාජ්‍ය පාලන පදවිය දැරීමට පෙර භද්දිය ජීවිතය ගත කළේ ආධ්‍යාත්මික කටයුතුවල නිරත වෙමිනි. වේළුවනයෙහි දී මහා කාශ්‍යප හිමියන්ගේ අනුසාසනා පරිදි ඒ කටයුතු තවත් හොඳින් සිදු කිරීමට අවකාශ ලැබිණි. කුටිවල සැතපෙනවාට වඩා ගස් යට සැතපීම භද්දිය ප්‍රිය කළේය. දිනක් රාත්‍රියේ භාවනා කරමින් සිටි භද්දිය ආනන්දය, ආනන්දය යි කෑ ගැසීය. සෙසු භික්ෂූන් බුදුන් වෙත ගොස් ඊයේ රාත්‍රියෙහි භද්දිය නැති වූ රාජ සම්පත් ගැන හිතලා කෑ ගැසුවේ යැයි කීහ. බුදුරදුන් හිස සලා සිනාසුණේය.

දහවල් ආහාර ගැනීමෙන් පසු බුදුරදුන් මහා සංඝයාට ධර්මය දේශනා කළහ. එහි දී භද්දියගේ සිද්ධිය ගැන ද ප්‍රශ්න කළේය. භද්දිය බුදුරදුන්ට වැඳ ''ස්වාමීනි, මා රාජ්‍ය පාලන කාලයෙහි ප්‍රසිද්ධිය මෙන්ම ධනයෙන් ද සම්පූර්ණ සැප වින්දෙමි. මගේ ආරක්ෂාවට වෙනමම හමුදා නිලධාරීන් සිටියහ. මගේ නිවස වටා දිවා රාත්‍රී මුරකරුවන් සිටියහ. එහෙත් මා හැම මොහොතක ම සිටියේ භයින්. දැන් මේ වනයේ මා කැමති වේලාවක කැමති තැනකට යන්න පුළුවන්. කැමති තැනක වාඩි වී භාවනා කරන්නත් පුළුවන්. මට දැන් කිසිම භයක් නැහැ. කිසි දෙයක් ගැන සිතන්න ඕනෑ නැහැ. මේ වනාන්තරයෙහි මා ඉතා සතුටින් හා නිර්භයව සිටිනවා. මේ සතුට ජීවිතයේ කිසි දිනක මට විඳින්න ලැබුණේ නැහැ.

''ඊයේ රාත්‍රියෙහි භාවනා කරන විට මට මේ ගැන ප්‍රත්‍යක්ෂවම දැනුණා. ඒ නිසා මගේ හදවතේ හඬ මුවින් පිට වුණා. මේ ගැන අනෙක් අයට කරදරයක් වුණා නම් මට සමාවෙන්න.''

භද්දියට ප්‍රශංසා කළ බුදුරජානන් වහන්සේ, ''භද්දිය මෙය නම් ඉතාම සතුට ගෙන දෙන දෙයක්. නුඹ රජසැප අතහැර ආවා. ඉතාම ඉක්මනින් විමුක්ති සැපයේ රසයත් දැන ගත්තා,'' යි කීහ.

වර්ෂා ඍතුවත් සමඟ ම බුදුරදුන් බොහෝ දෙනෙක් ප්‍රව්‍රජ්‍යා භූමියට ඇතුළත් කර ගත්තේය. මේ අය අතර මහා කාශ්‍යප ද ප්‍රධාන කෙනෙක් ලෙස හැම දෙනාම සැලකූහ. පැවිදිවීමට පෙර ඔහුගේ බිරිඳ විශාලා මහ නුවර ''භද්‍රා කපිලානි'' නම් වූවා ය. විවාහ වී වසර දොළහක් ගත කිරීමෙන් පසුව දෙදෙනාම ධර්මය ගැන වඩාත් තදින් සිත යොමු කරන්නට වූහ.

දිනක් උදෑසන අවදි වූ කාශ්‍යපගේ සිරුර වටා සර්පයෙකු කැරකෙමින් තැවරෙනු දුටුවේය. ඔහු මහත් බියට පත් විය. එහෙත් සර්පයා ඔහුට කිසිදු කරදරයක් කළේ නැත. ඔහු ද සර්පයාට කිසිත් හිරිහැරයක් නොකළේය. සර්පයා හෙමිහෙමින් කාමරයෙන් එළියට ඇදී ගියේය. බිරිඳ අවදි වූ පසු මේ විස්තර සියල්ල ඔහු ඇයට කීවේය.

මේ ගැන සාකච්ඡා කිරීමෙන් පසු දෙදෙනාටම ජීවිතය කෙතරම් අස්ථිර දැයි සිතිණි. මේ අය බුදුරදුන් ගැනත් උන් වහන්සේගේ දේශනා ගැනත් කලින් අසා තිබිණි. ඔවුනට බුදුරදුන් හමු වී ධර්මය ඇසීමට බලවත් අවශ්‍යතාවක් ඇති විය. උන් වහන්සේ වේළුවනයෙහි සිටින බව සොයා දැනගත් පසු දෙදෙනා ම එහි ගියහ. බුදුරදුන් දුටු හැටියේම තමන්ට මාර්ගය කියා දිය හැකි එකම ගුරුවරයා වෙත අප පැමිණ ඇතැයි දෙදෙනාටම සිතිණි.

කාශ්‍යපව දුටු හැටියේම මොහු ධාර්මික ක්‍රියාවල නිරතව සිටින කෙනෙකියි බුදුරදුන්ට සිතිණි. සාකච්ඡාවෙන් පසුව කාශ්‍යප පැවිදි කළේය. ඉන්පසු බුදු සසුනෙහි මහා කාශ්‍යප නමින් උන් වහන්සේ ප්‍රසිද්ධ විය. බිරිඳට ද පැවිදි වීමට අවශ්‍ය බව දැන්වූව ද ඒ සඳහා සුදුසු කාලය තවම පැමිණ නැති බව බුදුරදුන් සඳහන් කළේය.

# තිස් නව වන පරිච්ඡේදය
# අරුණෝදය තෙක්

වස් පවාරණයෙන් දින තුනකට පසුව සුදත්ත නම් තරුණයෙක් බුදුරදුන් හමුවට පැමිණියේය. තමා වසන කෝසල රාජ්‍යයට පැමිණ ඒ ප්‍රදේශයේ අයට සද්ධර්මය පහදා දෙන්න යැයි ඔහු බුදුරදුන්ට ආරාධනා කළේය. සුදත්ත කෝසල රාජධානියෙහි ශ්‍රාවස්ති නුවර වාසය කළේය. ධනවතෙකු වූ හෙතෙම ඉතා සතුටින් දුගී දුප්පතුන්ට උපකාර කළේය. දුප්පත් අසරණ අයට හිත පුරවා උපකාර කරන නිසා කවුරුත් සුදත්ත හැඳින්වූයේ අනාථපිණ්ඩික නමිනි.

රත්තරන් හා රිදී මිල දී ගැනීමටත් විකිණීමටත් සුදත්ත මගධයට වරින්වර පැමිණියේය. රජගහනුවර ඇති තමන්ගේ වැඩිමහල් මස්සිනාගේ නිවසෙහි නතර වන ඔහුට ආහාරපාන ආදී සියලු සත්කාර මෙහි දී ලැබෙන්නේය. වස්සාන ඍතුවෙන් පසුව ඔහු මෙවර රාජගිරියට පැමිණියේය.

මෙවර සුදත්තගේ වැඩිමහලු මස්සිනා වෙනත් අමුත්තෙකුගේ පැමිණීම ගැන විමසිල්ලෙන් සිටි බැවින් සුදත්ත ගැන එතරම් සෙවීමක් නොකළේය. මෙහි පැමිණෙන එතරම්

වැදගත් අමුත්තා කවුදැයි විමසූ විට හෙට දහවල් දානය සඳහා බුදුරදුන් භික්ෂු මහා සංඝයා සමඟ තමන්ගේ ගෙදරට පැමිණෙන බව සුදත්තගේ මස්සිනා කීවේය.

සුදත්ත බුදුරදුන් ගැන මීට පෙර දැන සිටියේ නැත. ''කවුද බුදුන් කියලා කියන්නේ? බෝධිසත්වභාවයෙන් පසුව සම්බෝධිය අවබෝධ කරගත් කෙනෙක් වගේ අයෙක් ද?'' යි සුදත්ත විමසීය. ''හරියටම හරි. සම්බෝධිය ප්‍රාප්ත කළ තැනැත්තාට 'බුද්ධ' කියලා කියනවා. එතුමා ඉතාම තේජස් ඇති පෙර කිසිවකු නොදුටු කෙනෙක්. හෙට නුඹට එතුමන් දැක ගැනීමට හැකි වේවි.''

''බුද්ධ'' යන වචනය ඇසීමෙන්ම සුදත්තගේ සිත සතුටින් පිරී ඉතිරී ගියේය. සුදත්ත බුදුරදුන් පිළිබඳව තවතවත් කරුණු දැන ගන්නට ආශාව දැක්වීය. මස්සිනා ඒ ගැන විස්තර කළේය. ශාන්ත දාන්ත භික්ෂූන් රජගහනුවර පිණ්ඩපාතයේ වැඩිය ආකාරයත් ඒ සියල්ලම දැකීමෙන් තමන් ප්‍රසන්න වූ බවත් ධර්මය ශ්‍රවණය කිරීමට වේළුවනයට ගිය ආකාරයත් ඉන් පසුව බෞද්ධ උපාසකයෙකු වූ ආකාරයත් විස්තර කළේය.

ඇතැම් විට සංසාරයේ පෙර සම්බන්ධයක් වන්නට ඇත. එසේ නූනානම් සුදත්ත බුදුරදුන් ගැන ඇසූ පමණින්ම ප්‍රමෝද වන්නේ නැත. සුදත්තගේ සතුටේ තරමටම දෙවන දා තෙක් ඉවසා සිටිය නොහැකි විය. තෙවරක්ම අවදි වී බලන විට අළුයම් වී නොමැති නිසා රාත්‍රියේම ඇඳුම් ඇඳගෙන වහාම බුදුන් දැකීමට වේළුවනයට ගියේය. අළුයම් සිහිල් සුළඟින් පරිසරය අවධි වෙමින් පැවතියේය. සුදත්ත වේළුවනයට ඇතුළු වන විට හිරුගේ පළමු කිරණ වේළුවනයේ උණ දළු අතරින් විහිදෙන්න පටන් ගත්තා පමණි.

බුදුරදුන් දැකීමට වහවහාම එහි ගිය ද එහි ගිය පසු එක වරටම බුදුන් හමුවට යාමට සුදත්ත බිය විය. එනමුත් බුදුරදුන් සක්මන් භාවනාවේ යෙදෙමින් නොදැනුවත්වම සුදත්ත සිටින තැනට ළඟා විය.

සුදත්ත දෑත් එකතු කර බුදුරදුන්ට නමස්කාර කොට බුදුරදුන්ගේ පසුපසින්ම කුටිය වෙතට ගියේය.

තමන් ඊයේ රාත්‍රිය ගත කළේ කෙතරම් අපහසුවෙන් දැයි සුදත්ත බුදුරදුන්ට විස්තර කළේය.

''මම ඔබ වහන්සේගෙන් සද්ධර්ම මාර්ගය දැන ගන්න බලවත්ම ආශාවෙනුයි ඉන්නේ.''

බුදුරදුන් සුදත්තට මෛත්‍රී කරුණා ගැන කියා දුන්නේය. බුදුරදුන්ගේ දේශනය ඇසූ සුදත්ත බෞද්ධ උපාසකයෙකු බවට පත් විය. සුදත්ත බුදුරදුන් ඇතුළු මහා සංඝයාට තම මස්සිනාගේ නිවසෙහි පසු දා දානය සඳහා ආරාධනා කළේය. බුදුරදුන් ශාන්ත සිනහවකින් යුක්තව සුදත්තට ''අද අපි දානය ගන්නා නිවසට නැවත හෙට දානය සඳහා යාමේ කිසි තේරුමක් නැහැ නේ ද?'' යි ඇසීය. සුදත්ත නැවතත් ''අද ඔබ වහන්සේ මගේ මස්සිනාගේ ආගන්තුකයායි. හෙට මගේ ආගන්තුකයායි. මට දුක රජගහනුවර මට මගේ කියා නිවසක් නැති එක ගැනයි. ඒ කෙසේ වෙතත් මගේ ආරාධනාව කරුණාවෙන් බාර ගන්න කියා මා නැවතත් ආරාධනා කරනවා,'' යි බුදුරදුන්ට කීය. සුදත්තගේ ආරාධනාව බුදුරදුන් කරුණාවෙන් බාරගත් පසු ඔහුගේ සතුට නිම්හිම් නැති විය. ඔහු ඉක්මනින්ම ගෙදර ගොස් දානය සූදානම් කිරීමට උදවු විය.

දානයෙන් පසුව බුදුරදුන් කළ දේශනාව අසා සුදත්ත තවතවත් සතුටු විය. බුදුරදුන් ඇතුළු මහා සංඝයා ආපසු වඩිද්දී තරමක් දුරට පසු පසින් ගිය සුදත්ත නැවත ආපසු පැමිණ පසු දින දානය සූදානම් කිරීමට පටන් ගත්තේය. සුදත්ත තමන් දෙන දානය සඳහා තම මුදල් පමණක් යෙදවීමට දැඩි සේ අධිෂ්ඨාන කර ගත්තේය. වැඩි මහලු මස්සිනා කොපමණ උපකාර කිරීමට කතා කළත් ඒ ගැන ඇහුම්කම් දුන්නේම නැත. මස්සිනාට දුන්නේ කෑම තමන්ගේ ගෙදර පිසීමට සහ දානය බෙදීමේ කටයුතු දෙක පමණි.

සුදත්තගේ දානයෙන් පසු බුදුරදුන් කළ දේශනාව ඇසූ සුදත්තගේ සිත අලුත පිපුණ නෙළුම් මලක් සේ පිවිතුරු විය. බුදුරදුන් ඉදිරියේ දණ ගසා වන්දනා කළ සුදත්ත, ''ස්වාමීනි ඔබ වහන්සේ සහ මහා සංඝයාගේ දර්ශනය තවමත් කෝසල ජනපදයේ අයට නොලැබීම මහා දුර්භාග්‍යයකි. ඒ නිසා කරුණාකර කෝසල ජනපදයටත් මහා සංඝයා සමඟ වැඩම කරවන්න,'' යි ආයාචනා කළේය. බුදුරදුන් සෙසු භික්ෂූන් සමඟ සාකච්ඡා කර තීරණයක් ගන්නා බව සුදත්තට කීවේය.

දින කීපයකට පසු සුදත්ත නැවතත් වේළුවනයට ගිය විට බුදුරදුන් සුදත්තගේ ආරාධනාව පිළිගත් බව ඔහුට දැන ගන්නට ලැබිණි. එහෙත් ශ්‍රාවස්තියෙහි භික්ෂු මහා සංඝයාට නවාතැන් ගැනීමට ප්‍රදේශයක් ඇත්දැයි විමසීය. එම සියලුම වගකීම් තමන් බාර ගන්නා බව සුදත්ත බුදුරදුන්ට ප්‍රකාශ කළේය. එසේම බුදුන් සහිත මහා සංඝයා ශ්‍රාවස්තියට වැඩම කිරීමට පෙර කටයුතු සූදානම් කිරීම සඳහා තමන් සමඟ සාරිපුත්ත මහ රහතන් වහන්සේට වැඩම කිරීමට අවසර දෙන්නැයි ද බුදුරදුන්ගෙන් ඉල්ලා සිටියේය. බුදුන් සාරිපුත්ත හිමියන් සමඟ සාකච්ඡා කොට සුදත්ත සමඟ ශ්‍රාවස්තියට යාමට අවසර ලබා දුන්නේය.

දින හතකට පසුව සුදත්ත වේළුවනයට පැමිණ සාරිපුත්ත මහ රහතන් වහන්සේ මුණගැසිණි. දෙදෙනාම එකට පිටත් වී ගංගා නදියෙන් එතෙරව වෛශාලියට ළඟා වූහ. වෛශාලියේ ආම්‍රපාලී හමු වී දෙදෙනාම ආම්‍රපාලිගේ අඹ වනයේ රාත්‍රිය ගත කළහ.

බුදුරදුන් සහිත මහා සංඝයා කෝසලයෙන් වඩින අතර තුර වෛශාලියෙහි මාස හයක් වැඩ සිටින බව ශාරිපුත්ත හිමියෝ ආම්‍රපාලිට කීහ. ඒ අසා බලවත් සතුටට පත් ආම්‍රපාලි බුදුන් ඇතුළු මහා සංඝයාට වැඩසිටීම සඳහා අවශ්‍ය සියලු පහසුකම් තමන් විසින් සූදානම් කරන බව කීවාය. මෙවන් පිනක් නැවත ජීවිතයේ කවදා ලැබේ ද? මම ඉතා පින්වන්ත වීමියි ඇය බෙහෙවින් සතුටු වූවාය.

ආම්‍රපාලිගේ ආගන්තුක සත්කාර ලැබ දෙදෙනාම අචිරවතී නදිය (රජකි) ඉවුර දිගේ උතුරු පෙර දිගට ගියහ. සුදත්ත මීට පෙර කිසිදිනක මෙතරම් දුරක් පා ගමනින් ගොස් තිබුණේ නැත. මහ මඟ නතර වෙමින් ගිමන් නිවමින් බුදුරදුන් සහිත භික්ෂු මහා සංඝයා වඩින බවත් උන් වහන්සෙලා ඉතාම ආදරයෙන් ගෞරවයෙන් පිළිගන්නා ලෙසත් සියලුම දෙනාට කීවේය.

කොසොල් ජනපදය ඉතාම සමෘද්ධිමත් රාජ්‍යයක් ලෙස එවකට ප්‍රසිද්ධව තිබිණි. එය මගධය මෙන්ම ශක්ති සම්පන්න කමින් ද සමානව තිබිණි. සුදත්ත කොහේ ගියත් එතුමා

අනාථපිණ්ඩික නමින් කවුරුත් හඳුන්වන්නට වූහ. සුදත්ත කියන ඕනෑම දෙයක් කිරීමට ජනතාව සූදානමින් සිටියහ. මේ අනුව බුදුරදුන් පිළිගැනීමට සියලුම දෙනා සූදානම්ව සිටියහ. සෑම දිනක ම සාරිපුත්ත හිමි පිණ්ඩපාතයේ යන විට සුදත්ත හැකි පමණ පිරිසට බුදුරදුන්ගේ පැමිණීම ගැන දනුම් දුන්නේය.

මසකට පමණ කාලයකට පසු දෙදෙනාම ශ්‍රාවස්තියට පැමිණියහ. ශාරිපුත්ත මහ රහතන් වහන්සේගේ දානය සුදත්තගේ නිවසේම සූදානම් කළේය. සුදත්ත තම දෙමාපියන්ට හා බිරිඳට ශාරිපුත්ත මහ රහතන් වහන්සේ හඳුන්වා දුන්නේය. දානය වැළඳීමෙන් පසුව ශාරිපුත්ත ධර්ම කරුණු විස්තර කළේය. මුළු පවුලම තිසරණ පංච ශීලය සමාදන් වී උපාසක උපාසිකාවන් බවට පත් වූහ.

ශාරිපුත්ත මහ රහතන් වහන්සේ සෑම දිනකම පිණ්ඩපාතයෙන් පසුව නදිය අසල වනයෙහි නිදා ගත්හ. මේ අතර සුදත්ත බුදුරජානන් වහන්සේ ඇතුළු මහා සංඝයාට වැඩසිටීම සඳහා සුදුසු ස්ථාන සූදානම් කරමින් සිටියේය.

## හතලිස් වන පරිච්ඡේදය

# ජේතවන භූමිය රනින් වැසීම

බුදුරදුන්ට විහාරයක් සෑදීම සඳහා සුදත්ත සෙවූ ස්ථාන අතරින් එකක් වත් ඔහුගේ සිත තෘප්තිමත් කිරීමට සමත් වූයේ නැත. විහාරයක් සඳහා සුදත්තගේ සිත ගිය එකම ස්ථානය වූයේ ජේත කුමාරයාගේ ජේත උයනයි. ජේත කුමාරයාගේ උයනෙහි විහාරයක් කරවා බුදුරදුන් එහි වැඩ සිටියොත් මුළු කෝසල රාජ්‍යයෙහිම සද්ධර්මය ප්‍රචාරය කිරීමට ඉතා පහසු බව සුදත්තට අවබෝධ විය.

සුදත්ත මේ ගැන කතා කිරීමට ගිය විට කුමාරයා එක් ඇමතිවරයකුගේ සත්කාරයේ යෙදී සිටියේය. සුදත්ත දෙදෙනාට ම ආදරයෙන් නමස්කාර කළේය. කිසිදු පැකිලීමකින් තොරව ඔහු ජේත කුමාරයාගෙන් සද්ධර්මය ප්‍රචාරය කිරීම සඳහා කටයුතු සංවිධානය කිරීමට ඔහුගේ උද්‍යානය දෙන්නේ දැයි ඇසීය.

මේ අවස්ථාව වන විට ජේත කුමරුගේ වයස අවුරුදු විස්සක් පමණ විය. පසේනදී රජු ජේත කුමරුට මෙම උයන තෑගි වශයෙන් දී වසරක් ගත වූවා පමණි. ජේත කුමරු සුදත්තගෙන් ''ඔබට මේ උයන පුරා රත්රන් ඇතිරිය හැකි ද? එසේ කළහොත්

පමණක් මම මේ උයන ඔබට දෙන්නෙමි,''යි කීය. සුදත්ත මේ යෝජනාව බාර ගත්තේය. ''මම ඔබේ යෝජනාව බාර ගන්නවා. හෙට ඉඳන් උයනේ රන් ඇතිරීම මා සිද්ද කරනවා,'' යැයි සුදත්ත ජේත කුමරුට කීවේය. ජේත කුමාරයා තදින් සිනා සී ''මා කළේ විහිළුවක්. උද්‍යානය විකුණන්න මට අවශ්‍ය නැහැ. හෙට ඔබ රත්රන් ගේන්නත් අවශ්‍ය නැහැ,'' යි තවදුරටත් කීවේ ය.

සුදත්ත තද අධිෂ්ඨානයෙන් යුතුව, ''ඔබ රාජ කුමාරයෙක්. ඔබගේ වචනයේ වටිනාකමක් තියනවා. වගකීමක් තියනවා නේ ද?'' යි ඇසී ය. ''ඇමතිතුමනි, මගේ කතාව හරි නේ ද?'' යි ඔහු එතන සිටි ඇමතිවරයාගෙන් ද ඇසීය.

ඇමතිතුමා ද කුමාරයාට කතා කොට, ''ඔබ උයනේ වටිනාකම කලින් කීවේ නැතිනම් කමක් නැහැ. ඉඩමේ වටිනාකම කලින් කියා පසුව විකුණන්නේ නැතැයි කීම ඔබ වැනි රාජ කුමාරයෙකුට ගැළපෙන්නේ නැහැ. අනාථපිණ්ඩික වැනි සිටු කෙනෙක් සමඟ එසේ කිරීම කිසිසේත් ම සුදුසු නැහැ,'' යි පැහැදිළි කළේ ය.

මේ කතාවෙන් පසු ජේත කුමරු උයන අනාථපිණ්ඩිකට විකිණීමට තීරණය කළේ ය. එහෙත් මෙතරම් මුදලක් ගෙවීමට සිටුවරයා ළඟ මුදල් තිබේ ද නැද්දැයි ඔහුට සැකයක් ඇති විය.

දෙදෙනාගේ සාකච්ඡාවට අනුව පසු දා උදෑසන සිට අනාථපිණ්ඩික සිටුතුමා කරත්තවලින් රන් කාසි ගෙනැවිත් ජේත කුමරුගේ උයනෙහි අතුරන්න පටන් ගත්තේය. මෙතරම් රත්‍රන් කාසි ප්‍රමාණයක් දැක කුමාරයා පුදුමයට පත් විය. අනාථපිණ්ඩික සාමාන්‍ය සිටුවරයෙක් නොවේ යැයි ඔහුට සිතිණි. එහෙත් මේ උයන මිල දී ගැනීමට මෙතරම් මුදලක් කිසිවෙක් වැය කරන්නේ නැතැයි ඔහුට හොඳින්ම විශ්වාසය. සුදත්ත සිටුවරයා මෙතරම් මහන්සි වන්නේත් වියදම් කරන්නේත් බුදුන් හා මහා සංඝයාගේ යම් කිසි මහා ගුණ සම්භාරයක් අනිවාර්යයෙන්ම තිබිය යුතු යැයි ඔහු සිතුවේ ය. කුමාරයා තමන්ටත් බුදුරදුන් ගැන යමක් කියාදෙන්නැයි සිටුතුමාගෙන් ඉල්ලා සිටියේය.

අනාථපිණ්ඩික සිටුතුමා බුද්ධ, ධම්ම, සංඝ යන තෙරුවන් ගැන විස්තර කියාදෙන විට ජේත කුමාරයා දෑස් අයාගෙන බලා සිටියේය. ඔහුගේ හදවතෙහි සතුට ඉතිරී ගියේය. සිටුතුමා තමා සමඟ වැඩම කළ සාරිපුත්ත මහ රහතන් වහන්සේ ගැන ද විස්තර

කළේය. ඒ ඇසූ ජේත කුමරු, ''හෙට මා සාරිපුත්ත මහ රහතන් වහන්සේ මුණගැසෙන්නට යන්නෙමි,'' යි කීය.

කතාව අවසාන වින විට සුදත්තගේ සේවකයන් උයනෙන් තුනෙන් දෙකක ප්‍රමාණයක් රන් කාසි අතුරා අවසාන කර තිබිණි. මේ අතර හතර වන රන් කරත්තය කාසි පුරවාගෙන පැමිණියේ ය. කුමාරයා පුදුමයට පත් වී, ''මෙතරම් කාසි ඇතිරුවා හොඳටම ඇති, ඉතිරි බිම් තීරුව මා ගණනේ නොමිලේම දෙන්නම් යැයි කීය. එය මගෙන් තෑග්ගක් ලෙස බාර ගන්නැ,''යි පැවසීය.

පසු දින ශාරිපුත්ත මහ රහතන් වහන්සේ දැක උන් වහන්සේගේ ශාන්ත ස්වභාවය නිසා කුමාරයා තවත් පැහැදීමට පත් විය. සියලු දෙනාම උද්‍යානය පුරා ඇවිද බැලීය. කුමාරයා මිලක් නොගෙන බිම් කොටසක් පූජා කළ නිසා එහි කෘත ගුණ සලකනු පිණිස මෙය ජේතවනාරාමය ලෙස නම් කළේය.

නව විහාර කර්මාන්තයේ අවශ්‍ය උපදෙස් දීමට ජේතවනයේ වැඩ සිටින්නැයි සුදත්ත සාරිපුත්ත හිමියන්ගෙන් ඉල්ලා සිටියේය. එයට එකඟ වූ සාරිපුත්ත හිමියන් ඒ අනුව කටයුතු කළේය. උන් වහන්සේට අවශ්‍ය දානමාන ආදී සියලු පහසුකම් සුදත්තගේ ගෙදරින් සම්පාදනය කෙරිණි.

ශාරිපුත්ත හිමි, ජේත කුමරු හා සුදත්ත සිටුතුමා එක් වී භාවනා කුටි, සක්මන් මළු, ස්නානය කරන ළිං ආදී විහාරයකට අවශ්‍ය අංගෝපාංග සැළසුම් කර සම්පූර්ණ මහා විහාරයක් ලෙස එය නිර්මාණය කොට විහාරය ජේතවනාරාමය නමින් නම් කළේ ය.

රන්කාසි අතුරා සුදත්ත සිටුතුමා ජේත කුමරුගෙන් ඉඩමක් මගධයේ සිට බුදුරදුන් ඇතුළු මහා සංඝරත්නය උදෙසා මිල දී ගත් බවත් කෝසල රාජධානියට වඩින නිසා ජේත උයනේ බුදුරදුන් ඇතුළු මහා සංඝ රත්නයට වෙහෙර විහාර සංඝාරාම ආදිය ඉදිකරන බවත් මුළු පළාතේම ප්‍රසිද්ධ විය.

බුදුරදුන් වැඩම කිරීමට පෙර සාරිපුත්ත මහ රහතන් වහන්සේ සෑම දිනකම සන්ධ්‍යා භාගයේ ධර්මය දේශනා කිරීම ආරම්භ කළහ. ධර්මය ශ්‍රවණය කිරීම සඳහා ක්‍රමයෙන් පළාතේ හැම දෙනම පැමිණෙන්නට පටන් ගත්තේය. උන් වහන්සේගේ ධර්ම දේශනාවලින් පසුව බුදුරජානන් වහන්සේ ගැන ජනතාව තුළ පැහැදීම දිනෙන් දින වැඩි වීමට පටන් ගත්තේය.

ජේතවන විහාරයේ කටයුතු සම්පූර්ණ කිරීමට මාස හතරක් ගත විය. ශාරිපුත්ත මහ රහතන් වහන්සේ බුදුරදුන් ඇතුළු මහා සංඝයා වැඩම කරගෙන ඒම සඳහා රජගහනුවරට වැඩම කළේ ය. භික්ෂූන් වහන්සේලා විශාලා මහ නුවර පිණ්ඩපාතය කරනු දක සැරියුත් හිමියන් උන් වහන්සේලාව මුණ ගැසිණි. බුදුරදුන් ඇතුළු භික්ෂූන් දින කිහිපයකට පෙර වැඩම කළ බවත් බුදුරදුන් මහ වනයේ වැඩ සිටින බවත් උන් වහන්සේට දන ගන්නට ලැබිණි. බුදුරදුන් ඇතුළු මහා සංඝ රත්නයට වැඩසිටීම සඳහා ශ්‍රාවස්තියේ කටයුතු සම්පූර්ණයෙන්ම සූදානම් බව සාරිපුත්ත හිමියන් බුදුරජානන් වහන්සේට දනුම් දුන්නේය.

වේළුවනයෙහි කොණ්ඩඤ්ඤ සහ උරුවේල කාශ්‍යපගේ ප්‍රධානත්වයෙන් භික්ෂු පිරිසක් නතර කළ බව බුදුරජානන් වහන්සේ සාරිපුත්තට දන්වීය.

බුදුරජාණන් වහන්සේ සමඟ වැඩම කළ භික්ෂූන් දෙසිය නමක් වෛශාලියෙහි ධර්ම ප්‍රචාරක කටයුතුවල නිරත වන බවත් තුන්සියයක් දෙනා තමන් වහන්සේ සමඟ ශ්‍රාවස්තියට වැඩම කරවන බවත් උන් වහන්සේ සඳහන් කළ සේක. ආම්‍රපාලි තම නිවසෙහි බුදුරදුන් ඇතුළු මහා සංඝරත්නයට දානය සූදානම් කරන නිසා එම දානය අවසන් කර පසු දා ශ්‍රාවස්තිය බලා පිටත් වන බව ද උන් වහන්සේ ශාරිපුත්ත හිමියන්ට දනුම් දුන්හ.

ආම්‍රපාලි තම අඹ වනයෙහි බුදුරජානන් වහන්සේ ඇතුළු මහා සංඝයාට දානය පූජා කොට අති ප්‍රසන්න බව ප්‍රකට කළේ ය. එහෙත් තම පුත් ජීවක මේ අවස්ථාවේ නො සිටීම ඇගේ දුකට හේතු වූ එකම කරුණ විය.

ආම්‍රපාලි දානය පූජා කළ දිනයෙහි පුදුම සිදුවීමක් විය. ඇය බුදුරජානන් වහන්සේට දානය පූජා කොට ආපසු එන විට ලිච්ඡවී රාජ්‍යයේ රජවරු ඇය ට මහ මඟ දී වටකර ගත්හ. ''බුදුරදුන්ට ආරාධනා කිරීමෙන් ඇති අර්ථය කුමක් ද? අපට එන්න කීවා නම් කෝටි ගණන් රන් කාසි දෙනවා,'' ලිච්ඡවී රජවරු නොසන්සුන්ව කීහ.

එය ඇසූ ආම්‍රපාලි ''මේ කතාවෙන් දැනෙන්නේ නුඹලා බුදුරජානන් වහන්සේ කියන්නේ කවුද කියා නොදන්න බවයි. උන් වහන්සේ කවුද කියා දනගෙන සිටියා නම් මේ වාගේ කතාවක් කවදාවත් මා ඉදිරියේ කියන්නේ නැහැ,'' යි කීවාය. ''ඔබ සැම එකතු වී මුළු ලිච්ඡවී රාජ්‍යයම මට දුන්නත් නුඹලාගේ මේ ඉල්ලීමට

මම එකඟ වන්නේ නැහැ,'' යි ඇය තවදුරටත් කීවාය. අවසානයේ පුදුමයට පත් රජවරු ඇයට යාමට පාර ඉඩ දුන්හ.

අම්‍රපාලි මේ තරම් පැහැදුණු ආචාර්යවරයා කවුද කියා දැන ගන්න ලිච්ඡවී රජවරුන් උත්සාහ ගත්හ. රථවලින් බැස්ස රජවරු බුදුරදුන් දැකීම සඳහා වනයට ගියහ.

මේ තරුණ පිරිස දුටු බුදුරදුන් මොවුන් දයාන්විතව කරුණු වටහා ගැනීමට සමත් පිරිසක් බව තේරුම් ගත්තේය. තමන් ළඟින්ම මොවුන් වාඩි කරගත් බුදුරදුන් තමන්ගේ ජීවිත කතාවත් සමඟම සද්ධර්මය ගැන විස්තර කර දුන්නේය. දුකින් මිදෙන මාර්ගය තමන් වහන්සේ අවබෝධ කරගත් බව ලිච්ඡවී රජවරුනට විස්තර කර දුන්නේ ය. තමනුත් බුද්ධත්වයට පෙර ක්ෂත්‍රිය කුලයට අයත් කෙනෙක් නිසා ලිච්ඡවී රජවරුන් සමඟ ඒ අනුව කතා බහ කළේය.

බුදුරදුන්ගේ ද්ශනා ඇසූ රජවරුන්ගේ සිත් විවෘත විය. තමන් කවුද කියා ඒ අයට පළමු වරට දැනිණි. සැපවත් සතුටු දායක ජීවිතයක් ගත කිරීම සඳහා මුදල් හා පදවි පමණක් ප්‍රමාණවත් නොවන බව අවබෝධ විය. ඔවුහු තමන් බුදුරදුන්ගේ උපාසකයන් බවට පත් කර ගන්නා ලෙස අයැද සිටියහ. එය පිළිගත් බුදුන් වහන්සේ සියලු දෙනාම තිසරණ පංච ශීලයෙහි පිහිටු වීය. දෙවන දිනයේ තමන්ගේ දානය බාර ගන්නා ලෙස ලිච්ඡවී රජවරු බුදුරදුන් ඇතුළු මහා සංඝරත්නයට ආරාධනා කළහ. ආම්‍රපාලිගේ දානයට පසුව තමන් සඳහා අවස්ථාව ලැබීම ගැන රජවරු මුලින්ම නො සතුටු වූ මුත් ඇගේ ආරාධනාව කලින්ම බාරගත් එකක් නිසා එය කිසි සේත්ම වෙනසක් කිරීමට බුදුරදුන් එකඟ වූයේ නැත.

බුදුරදුන් අම්‍රපාලිගේත් ලිච්ඡවී රජවරුන්ගේත් දානය එකහා සමානව සලකා වැළඳූහ. වෛශාලිය පුරාම මේ ගැන කවුරුත් කථා කළහ. කුමාරවරු දොළොස් දෙනෙක් පැවිදි බවට පත් වූහ. දානයෙන් පසු ධර්ම දේශනාව අවසානයේ බුදුරදුන්ට ලබන වස වෛශාලියෙහි ගත කරන ලෙස ආරාධනා කළේය. බුදුරදුන් ඇතුළු මහා සංඝයාට පහසු වන පරිදි වැඩ සිටීමට කුටි ආදිය සූදානම් කරන බවට පොරොන්දු වූහ.

දින දෙකකට පසුව ආම්‍රපාලි බුදුරදුන් හමුවීමට ගියාය. ඇය තමන්ගේ ඉතාම වටිනා අඹ වනය බුදු රදුන්ට පූජා කිරීමට කැමති බව ප්‍රකාශ කළාය. බුදුරජානන් වහන්සේ එකී පූජාව පිළිගෙන වෛශාලියෙන් තුන්සියයක් භික්ෂූන් සමඟ ශ්‍රාවස්තිය බලා වැඩම කළහ.

## හතලිස් එක් වන පරිච්ඡේදය

# ප්‍රේමය දුක ද ඇති කරයි

වෛශාලි මාර්ගයෙහි සෑම දෙන සාරිපුත්ත හිමියන් දැනගෙන සිටියහ. අනාථපිණ්ඩික සහ සාරිපුත්ත මහ රහතන් වහන්සේ ගැන සමාජය තුළ ඇති කර තිබූ අදහස් නිසා උන් වහන්සේ වැඩම කරවන සෑම තැනක දී ම උන් වහන්සේ ඉතාම ගෞරවයෙන් පිළිගත්හ. බුදුරජාණන් වහන්සේ සහ භික්ෂු පිරිස රාත්‍රියට අචිරවතී නදිය අසබඩ විශ්‍රාම ගැනීම සිරිතක්ව තිබිණි. භික්ෂූන් වහන්සේලා කාණ්ඩ තුනකින් යුතුව වැඩම කළහ. පළමු කණ්ඩායමට බුදුන් වහන්සේ සහ ශාරිපුත්ත මහ රහතන් වහන්සේ ද ඇතුළත් විය. දෙවන කණ්ඩායමේ අස්සජි සහ තුන්වන කණ්ඩායමට මහා මොග්ගල්ලාන රහතන් වහන්සේගෙන් යුක්ත විය. ගමන් මඟ දී වන රොද, ගංගා, නදී ආදී ස්ථානවල මහ ජනතාවට සුදුසු පරිදි ධර්ම දේශනා කළහ. බුදුරදුන්ගේ දේශනා ඇසීමට බොහෝ සෙනඟ එකතු වූහ.

ශ්‍රාවස්තියට වැඩම කළ විට සුදත්ත සහ ජේත කුමාරයා ඇතුළු බුදුරදුන් සමඟ මහා සංඝයා ගෞරවයෙන් පිළිගෙන ජේතවනාරාම විහාරයට ගෞරවයෙන් වැඩමවාගෙන ගියහ.

ජේතවනාරාමයෙහි වූ මනා සංවිධානාත්මක බව දැක බුදුරජානන් වහන්සේ සුදත්තට ප්‍රශංසා කළහ. එහෙත් සුදත්ත මේ සියලු කටයුතු ශාරිපුත්ත හිමියන්ගේ හා ජේත කුමාරයාගේ යැයි කීය.

මේ වන විට සාමණේර රාහුලට වයස අවරුදු දොළහක් පමණ වී තිබිණි. ඔහු ශාරිපුත්ත මහ රහතන් වහන්සේගේ යටතේ ධර්ම ශාස්ත්‍ර ඉගෙනීම් කටයුතුවල නිරතව සිටියේය. ශාරිපුත්ත මහරහතන් වහන්සේ පිටතට වැඩම කර සිටින දිනවල මුගලන් මහ රහතන් වහන්සේගෙන් ධර්මය ඉගෙනීම සිදු කළේය. ජේතවනාරාමයට පැමිණි පසු නැවතත් ශාරිපුත්ත හිමියන්ගෙන් ධර්මය ඉගනීමේ කටයුතුවල ආරම්භ කරන ලදි.

ශාරිපුත්ත මහරහතන් වහන්සේ ඇසුරු කිරීමෙන් සුදත්ත බුදුරදුන් ගැන කරුණු රාශියක් ම දැන ගත්තේය. ධර්මය ගැන ද හොඳ අවබෝධයක් ලබා ගත්තේය.

බුදුන් වහන්සේගේ ධර්මය ශ්‍රවණය කිරීම සඳහා සුදත්ත අවට සිටි අයට ද ආරාධනා කළේය. ධර්මය ශ්‍රවණය කිරීමට පැමිණි අය අතර ජේත කුමරුගේ මව වූ මල්ලිකාත් අවුරුදු දහසයක් වයසැති සහෝදරියත් සිටියහ. සියලු දෙනාම උගත් පිරිසක් වූ නිසා බුදුරදුන් මේ අයට චතුරාර්ය සත්‍යය හා ආර්ය අෂ්ඨාංගික මාර්ගය පිළිබඳ දේශනා කළේය.

ධර්ම දේශනාව ශ්‍රවණය කිරීමෙන් පසුව මල්ලිකා දේවියගේත් රාජ කුමාරියගේත් හදවත් පිනෙන් පුබුදු විය. දෙදෙනාම බුදුරදුන්ගේ ශිෂ්‍යයන් වීමට කැමති බව ප්‍රකාශ කළහ. නමුත් ඊට පෙර පසේනදී කොසොල් රජුගෙන් ඒ සඳහා අවසර ගැනීමට අවශ්‍ය විය. මේ අයට පසේනදී කොසොල් රජතුමා තව දින කිහිපයකින් බුදුරදුන් හමු වීමට එන බවට හොඳටම විශ්වාසයක් තිබිණි. පසේනදී කොසොල් රජුගේ නැගණිය බිම්බිසාර රජුගේ බිරිඳ වූවාය. ඇය මීට පෙර බුදුන් වැඳ බුදුරජානන් වහන්සේගේ සරණ සමාදන් වූ කෙනෙකි. ශ්‍රාවස්තියේ බොහෝ ධර්ම ගුරුවරුන් ද බුදුන් වහන්සේගේ දේශනා ඇසීමට උත්සාහ දැරූහ. සමහර ධර්මදේශනා ශ්‍රවණය කිරීමට ප්‍රසිද්ධ ධර්ම ආචාර්යවරයන් පවා පැමිණියහ. අනෙක් ධර්ම ගුරුවරුනට බුදුන් වහන්සේගේ දේශනා තමන්ගේ දේශනාවලට තර්ජනයක් බව වැටහී ගියේය. එහෙත්

බුදුරදුන්ගේ ශ්‍රාවස්තියට පැමිණීම මෙහි වැසියන්ගේ ජීවිතයට අලුත් පරිසරයක් ඇති කරනු ඇතැයි මධ්‍යස්ථ ධර්ම ගුරුවරු කල්පනා කළහ.

ජේතවනාරාමය පූජා කිරීමෙන් පසුව මෙය ඉතාම අලංකාර මෙන්ම මෙහි වසන භික්ෂූන් වහන්සේලා වැසි, සුළං, අවු රශ්මි ආදියෙන් පමණක් නොව මදුරුවන්, සර්පයන් ආදී සතුන්ගෙන් ද උන් වහන්සේලා ආරක්ෂා කර ගනු ඇතැයි බුදුරජානන් වහන්සේ ප්‍රකාශ කළහ. එසේම ජේතවන විහාරයට සතර දිගින් වඩින මහා සංඝරත්නයෙන් ධර්මය ශ්‍රවණය කර සැමට තවතවත් ධර්මය ගැන දැනුම වැඩි කරගත හැකි බව ද උන් වහන්සේ දේශනා කළ සේක.

දෙවන දින භික්ෂූන් වහන්සේලා පසළොස් නම ගණනේ කණ්ඩායම් සෑදී පිණ්ඩපාතය සඳහා පිටත් වූහ. ශාන්තදාන්ත වූ භික්ෂූන්ගේ ගමන් විලාසය දුටු ජේතවනාරාම ප්‍රදේශයේ සෑම දෙනාම මහත් පැහැදීමට පත් වූහ. රජතුමා රාජ කාර්යයේ කාර්ය බහුල වූ නිසා ධර්මය ශ්‍රවණය සඳහා වේලාවක් වෙන්කර ගැනීමට අපහසු විය.

දිනක් මල්ලිකා දේවිය, කොසොල් රජතුමා හා රජ පවුලේ අය රාත්‍රී කෑම ගන්නා අතරතුර බුදුරජානන් වහන්සේ ගැන සාකච්ඡා කළහ. මල්ලිකා දේවිය ජේත කුමාරයා ජේතවනාරාමය සාදා විවෘත කිරීම පිළිබඳ සම්පූර්ණ විස්තරය රජතුමාට දැන්වීය. මේ ගැන තවතවත් විස්තර කියන ලෙස ජේත කුමරුගෙන් රජතුමා ඉල්ලා සිටියේය. ඒ සමඟ තමන්ට බෞද්ධ උපාසිකාවක වීමට මල්ලිකා දේවිය රජුගෙන් අවසර ඉල්ලීය.

පාරමිතා ආදී බුදු බව අවබෝධ කර ගැනීමට අවශ්‍ය ගුණාංග ගැන නොදැන සිටි රජතුමා සිද්ධාර්ථ කුමාරයා මෙතරම් ඉක්මනට තරුණ වයසේ දී බුදු බව අවබෝධ කර ගත්තේ කෙසේ ද යන්න ගැන කල්පනා කළේය. මේ වන විට බුදුරදුන්ගේ වයස අවුරුදු තිස් නවයක්ව තිබිණි. කොසොල් රජතුමා ද එම වයසේ ම පසු විය.

පූර්ණ කශ්‍යප, මක්ඛලී ගෝසාල, නිඝන්ඨ නාථ පුත්ත, සංජය බෙල්ලට්ඨී පුත්ත යන අය ගැන රජතුමා දැන සිටියේය.

මේ කිසිවෙකුටත් තවම හරි හැටි ධර්මය අවබෝධ කර ගත නොහැකිව තිබිය දී සිද්ධාර්ථ මෙතරම් ඉක්මනින් ධර්මය අවබෝධ කරගෙන අන් අයටත් දේශනා කරන්නේ කෙසේ ද යි තනිව ම කල්පනා කළේය. කෙසේ හෝ බුදුරජාතන් වහන්සේ දකින්න යන්න අවශ්‍ය යැයි ඔහු තීරණය කළේය.

වස්සාන ඍතුව ළඟළඟ ම එන ලකුණු පහළ වෙමින් තිබිණි. බුදුරජාතන් වහන්සේ ජේතවනාරාමයෙහි වස් වැසීමට තීරණය කළෝය. වේළුවනාරාමයේ දී ලත් අත්දැකීම් අනුව ජේතවනාරාමයෙහි වස්සාන කාල සීමාවේ කටයුතු සැලසුම් කරන ලදී. ශ්‍රාවස්තියේත් නවක භික්ෂූන් හැට නමක් මුල්ම දිනයේ දීම සසුනට ඇතුළත් වූහ.

දිනක් බුදුරදුන් සැවැත් නුවර ජේතවනාරාමයේ වැඩ වසන විට දුප්පත් අයෙක් පැමිණ වේදනා බර මුහුණින් බුදුරදුන් ඉදිරියෙහි සිට ගත්තේය. මොහු ගැන විස්තර ඇසීමේ දී දැනගන්නට ලැබුණේ ඔහු තමන්ගේ පුතා මිය යෑමෙන් පසුව දුකට පත් ව කිසිවක් කන්නේ හෝ බොන්නේ හෝ නැතිව තම දරුවාගේ නම කියමින් වේදනාවෙන් ජීවත් වන බවයි. ඔහුගේ සිරුර දකින ඕනෑ කෙනෙකුට බොහෝ දින ගණනක් නිරාහාරව දුකින් පෙළෙන බව වැටහී යයි.

දරු ප්‍රේමය දෙමාපියන්ට හැර වෙන කෙනෙකුට දැනෙන්නේ නැත. ඒ ප්‍රේමය ශෝකයට පත් වීම ඒ තරම්ම බලවත්ය. මේ සිද්ධිය අනුව ප්‍රේමය නිසා ශෝකය ඇති වීම ස්වභාවික බව බුදුරජාතන් වහන්සේ දේශනා කළෝය.

එහෙත් ඒ මනුෂ්‍යයා බුදුරදුන්ට, ''ඔබ වහන්සේගේ කථාවෙහි ඇත්තක් නැහැ. ප්‍රේමයෙන් ඇති වන්නේ වේදනාවක් නොව සතුටකි,'' යි කියා එතැනින් පිට වී යන්න ගියේය. බුදුරදුන්ට වෙන කිසිත් කීමට ලැබුණේ නැත. එම මිනිසා ආපසු යන ගමනේ දී සූදු ක්‍රීඩාවෙහි යෙදුණු කිහිප දෙනෙක් ළඟ නතර වී බුදුරදුන් හමු වී වූ සිදුවීම ඔවුන්ට විස්තර කළේය. ඒ සියලුම දෙනා බුදුරදුන්ගේ කීම වැරදි බවත් නුඹගේ කතාව හරි බවත් කියා ඔහු හා එකඟ විය.

මේ කතාව ශ්‍රාවස්තිය පුරා පැතිරී ගියේය. කවුරුත් වාද විවාද කළහ. අන්තිමේ පසේනදී කොසොල් රජුට ද මේ කතාව

ආරංචි විය. දිනක් රාත්‍රී ආහාර ගනිමින් සිටිය දී රජු, ''නුඹලා සිතන තරම් බුදුහාමුදුරුවෝ ධර්මාචාර්ය කෙනෙක් නොවේ,'' යැයි කීවේය. එහෙත් මල්ලිකා දේවිය එයට එකඟ නොවූවාය. ''බුදුරදුන් යම් දෙයක් කීවා නම් එයයි සත්‍යය. ඒ ගැන කිසිම සැකයක් සිතන්න දෙයක් නැහැ,'' යයි ඇය කීවාය.

කොසොල් රජු එයට සතුටු නො වී, ''නුඹ එක පාරටම එසේ කියන්න එපා. ප්‍රශ්නය ගැන ඉස්සර වෙලා තරමක් හිතන්න,'' යි කීය.

තවමත් රජතුමා බුදුරදුන් හමු වී නැති නිසා දේවිය නිශ්ශබ්ද විය. රජු දෙවන දින බුදුරදුන් හමුවට බමුණු පණ්ඩිතයෙක් යැවීය. ඔබ ගොස් බුදුරදුන් එවැනි දෙයක් කියා ඇත්නම් ඒ ගැන පැහැදිලි කරගෙන බුදුහාමුදුරුවන් දක්වන අදහස්‚ඉතාම කල්පනාවෙන් අසාගෙන විත් තමන්ට විස්තර කරන්නැයි ඔහු බමුණු පණ්ඩිතයාට කීවේය.

බුදුරදුන් හමුවට ගිය බමුණු පඬිවරයා මේ ගැන විස්තර ඇසීය.

බුදුන් වහන්සේ බමුණාට ඒ ගැන දේශනා කළ සේක. ''මට දැනගන්නට ලැබුණා පසුගිය දිනවල එක් ස්ත්‍රියකගේ මව මියගිය බව. මේ නිසා ඇය දුකින් පීඩිතව සිටියා. දුක නිසා ඇය උමතුභාවයට පත් වුණා. ඇයගේ මව දුටුවාදැයි හමුවෙන හැම කෙනෙකුගෙන්ම අසමින් ඇවිද්දා. එසේම ඇය එක් තරුණයෙකුට පෙර සිට ප්‍රෙම කළ අතර ඔහු හා විවාහ වීමට නොලැබී වෙනත් කෙනෙකු සරණයන්නට වූ නිසා ද ඇය තවත් දුකකින් පෙර සිටම පෙළෙමින් සිටි බව ද දැන ගන්නට ලැබුණා. අන්තිමේ ඇයට දුක ඉවසා ගත නොහැකිව සිය දිවි හානි කරගත් බව ද දැන ගන්න ලැබුණා.''

බමුණු පඬිතුමා නැවත රජ මාළිගාවට ගොස් බුදුරදුන් දේශනා කළ ආකාරයටම වචනයක් වත් නැර රජුට විස්තර කළේ ය. අන්තිමට මේ දෙදෙනාගේම ප්‍රේමයෙන් ලැබුණේ දුකක් මිස වෙන කුමක් දැයි ප්‍රශ්න කළේය. කතාව කියා අවසානයේ බමුණා රජුගෙන්, ''ඔබතුමා රැජිනියට ප්‍රේම කරන්නේ නැද්ද?'' කියා ඇසීය.

දිනක් රජු විවේක ගන්නා වේලාවක් බලා මල්ලිකා දේවිය මේ ප්‍රශ්නය රජතුමාගෙන් ඇසුවාය. රජු මෙයින් පුදුමයට පත් විය. ''ඔව් මා ඔබට තදින් ප්‍රේම කරනවා,'' යි රජතුමා පිළිතුරු දුන්නේය. ''යම් කිසි දවසක මට අනතුරක් වුණොත් ඔබ දුක් වන්නේ නැද්ද?'' යි දේවිය නැවතත් ඇසීය.

රජතුමා දේවියගේ ප්‍රශ්නයට පුදුම විය. අන්තිමේ රජතුමාට ප්‍රේමය නිසා දුක ඇති වන බව අවබෝධ වී ගයේය. ''බුදුරදුන්ගේ වචනවල සත්‍යය සැබෑ සැඟවී ඇති බව දැන් ඔබට වැටහෙනවා ද,'' දේවිය රජුගෙන් ඇසුවාය. කෝසල රජු අසුනෙන් නැඟී සිටියේය. ''මා බුදුරදුන් හමුවෙන්නම ඕනෑ,'' යි ස්ථිර හඬින් කීය. ඉතාම සතුටට පත් බිසව ඔබතුමා මොහොතකට හෝ බුදු රදුන් හමු වුණොත් මීට වඩා තවත් බොහෝ කරුණු අවබෝධ කර ගන්නට හැකි වේවි යැයි කීවාය.

## හතලිස් දෙවන පරිච්ඡේදය

# ආදරය යනු අවබෝධයයි

පසේනදී කොසොල් රජතුමා සේනාවේ කිසි කෙනෙක් නැතිව තනිව ම බුදුරදුන් හමු වීමට ගියේය. රථයත් රථාචාර්යවරයාත් විහාරයේ පිටතින් නතර කළ රජු ආරාමයට ඇතුළු විය. බුදුරදුන් කුටියෙන් පිටතට විත් රජුතුමාව පිළිගත්තේය. සතුටු සාමීචියෙන් පසුව රජතුමා බුදුරදුන් සමඟ සාකච්ඡාවට යොමු විය.

''ගෞතමයන් වහන්ස, ඔබ වහන්සේට සමාජයේ අය 'බුදු' කියා කියන්නේ ඇයි?'' රජු පළමුවෙන්ම ඇසීය. ''මට තනිවම නැඟෙන ප්‍රශ්නයක් තමයි මේ තරම් අඩු වයසේ දී මේ තරම් උසස් ආධ්‍යාත්මික තත්වයකට ඔබ වහන්සේ පත් වුණේ කොහොම ද කියන එක. මා දන්නා බොහෝ ආචාර්යවරු අවුරුදු අසූවක් ගත කරලත් තවම සද්ධර්ම මාර්ගයක් අවබෝධ කරගත් බවක් පෙනෙන්න නැහැ. පකුධ කච්චායන සහ අජිත කේස කම්බල පවා තවම මේ තත්වයට පත් වූ බවක් දැන ගන්න නැහැ. ඔබතුමා මේ ආචාර්යවරුන්ගේ නම් අසා තිබෙනවා ද?''

බුදුරදුන් පිළිතුරු දුණි, ''මහ රජතුමනි, ඔය කියන මහා ආචාර්යවරුන් සියලු දෙනාවම මා දන්නවා. බොහෝම ප්‍රසිද්ධ ආචාර්යවරුන් බොහෝ දෙනෙකුව මා හමු වී තිබෙනවා. ධාර්මික

බව හා ආධ්‍යාත්මික බව වයස වැඩි වූ තරමට වැඩි වන්නේ නැහැ. මාස සහ අවුරුදු අනුවත් ධාර්මික හැඟීම් මනින්න බැහැ. ගින්න, සර්පයා හා ආගමික ජීවිතයට ඇතුළත් වූ පූජ්‍ය උතුමනුත් වයස හෝ ශරීර ප්‍රමාණය අනුව හෝ පුංචි යැයි සුළු කොට තකන්න එපා. රජතුමා තරුණ වුවත් එක රජතුමෙකුට අවශ්‍ය ගුණ සහ පුණ්‍යවන්තකම වාගේම තීරණ ගැනීමේ ශක්තියත් දඬුවම් තීරණය කිරීමේ අයිතියත් ඇති බව, පුංචි සර්පයෙක් වුවත් විෂ ඇති නිසා දෂ්ට කළොත් ඒ විෂ ශරීර ගත වීමෙන් මරණය සිදුවිය හැකි බව, ගිනි දළුව පුංචි වුවත් විශාල විනාශයක් කරන්න ඒ පුංචි ගිනි දළුවට හැකි බව තේරුම් ගත යුතුයි. තරුණ වුවත් භික්ෂුවකට සද්ධර්මය අවබෝධ කර ගන්න පුළුවන් ශක්තිය තිබෙනවා. ඒ ගැන නොදැන කතා කිරීමෙන් මහා පාප කර්මයකට හසුවන බවත්, එයින් නිරය ආදී මහා දුකකට පත් විය හැකි බවත් සිතිය යුතුයි.''

බුදුරජානන් වහන්සේ සරල වචනවලින් ඉතා ශාන්ත දාන්තව මේ කරුණු විස්තර කර දුන්හ. බුදුරජානන් වහන්සේගේ වචන අසා රජු අති ප්‍රසන්න බවට පත් වූයේය. ඉන් පසු රජතුමා තවත් ප්‍රශ්නයක් නැඟීය. ''ඔබතුමා ප්‍රේම කරන්න එපා කියලා කාට හරි කියල තියනවා ද? සමහරු කියනවා ඔබගේ දේශනාවේ ප්‍රේම කිරීම තහනම් දෙයක් හැටියටත් ප්‍රේමය තදින් කරන තරමට ම වේදනාවට පත් වීමටත් සිදුවන බව උගන්වනවා කියලා. නිරාශාව ද ඒ සමඟ පසු පස එන බවත් සමහරු ඔබගේ දේශනාව අනුව කියනවා. මේ කාරණයේ යම් කිසි සත්‍යයකුත් දකින්න තිබෙනවා. මේ කාරණය මටත් මහා වේදනාවක් ගෙන දෙන කාරණයක්. මේ නිසා මේ ගැන තවත් කරුණු ටිකක් පැහැදිළි කර දෙන්න.''

බුදුරජානන් වහන්සේ රජතුමා දෙස හැරී සිනා සී, ''මහ රජතුමනි, ඔබගේ මේ ප්‍රශ්නයේ ඉතාම වැදගත්කමක් තියනවා. ප්‍රේමයේ අංශ කිහිපයක් තිබෙනවා. ජීවිතයට ප්‍රේමය ඉතාම අවශ්‍යයි. කාමාශාව, ආකර්ෂණය, භේද භාව ආදී හැඟීම්වලින් බර ප්‍රේමය ශෝකය අනිවාර්යයෙන්ම ගෙන දෙනවා. මා දේශනා කරන ප්‍රේමය, කරුණාව සහ මෛත්‍රිය සමඟ මිශ්‍ර වූ එකක්. මා දේශනා කරන ප්‍රේමය දෙමාපියන් දරුවන් අතර, බිරිඳ සහ ස්වාමි

පුරුෂයා අතර, ගුරුවරයා සහ ශිෂ්‍යයා අතර, රටවාසීන් අසල් වාසීන් අතර ඇති වන ප්‍රේමයයි. ලෝකයේ අනෙක් ප්‍රාණීන්ට ඇති වන ප්‍රේමය කොතරම් ද? ප්‍රේමයට සීමා දැක්වීම අපහසුයි. ප්‍රේමය අසීමිතයි. එක පුද්ගලයෙකුට පමණක් සීමා වන ප්‍රේමය මා ප්‍රේමය හැටියට හඳුන්වන්නේ නැහැ. මෛත්‍රිය හා කරුණාව නැති ප්‍රේමය ප්‍රේමයක් හැටියට හඳුන්වන්න බැහැ.'' යනුවෙන් උන් වහන්සේ ප්‍රෙමය ගැන දරන අදහස් දක්වා සිටියහ.

''ඔබ රටේ රජ කෙනෙක්. ඔබ ප්‍රජාව ගැන කරුණාවෙන් යුක්තව, මෛත්‍රියෙන් යුක්තව, ප්‍රේම පූර්වකව කටයුතු නො කළොත් ඔබගේ රජකමෙහි අර්ථයක් නැහැ. ප්‍රජාව ඔබ රජ කෙනෙක් ලෙස ආදරයෙන් සලකන්නේත් නැහැ. ඔබගේ රජකම රට වාසීන් ආදරයෙන් හදවතින් බාර ගන්නේත් නැහැ. ඔබ ඉහත කී ගුණාංගවලින් යුක්ත වුවහොත් එය ඔබටත් රට වාසීන්ටත් සියලුම දෙනාට මහා කල්‍යාණකාරී වන බවට කිසිම සැකයක් නැහැ,'' බුදුන් වහන්සේ තවදුරටත් පවසා සිටියහ.

රජතුමා මොහොතක් සිතන්නට විය. පසුව කථා කළේ ය. ''බුදුරජානන් වහන්ස, මගේ රජ පවුල මා විසින්ම පාලනය කළ යුතුයි. ඒ සමඟම රට පාලනය කිරීමට රජකම ද කළ යුතුයි. මේ දෙපැත්තටම මා ප්‍රේම නොකළොත් ඒ අය පාලනය කරන්නේ කොහොම ද? මේ ගැන කරුණා කර මට විස්තර කර දෙන්න.''

''ඔබ ස්වභාවයෙන්ම තම පවුලට හා ප්‍රජාවට ප්‍රෙම කළ යුතුමයි. ඒ කෙසේ වෙතත් ඔබගේ ප්‍රේමය එතැනින් ඔබ්බට ද විකසිත කළ හැකියි. ඔබ රජ කුමාරයාට සහ රජ කුමාරියට ප්‍රෙම කරනවා නේ ද? නමුත් ඔබ ඒ ප්‍රේමය මුළු රටේම තරුණ පිරිසට කරන්නේ නැහැ නේ ද? ඔබ ඒ ප්‍රේමය අනෙක් තරුණයන්ටත් කරන්නේ නම් එය අසීමිත ප්‍රේමයක් ලෙස හැඳින් විය හැකියි. එසේ වුවහොත් ඔබගේ රටේ සිටින සියලුම තරුණ පිරිස් ඔබගේ දරුවන් හැටියට සැලකිය හැකියි. මෙය ආදර්ශයක් පමණක් නො වෙයි. එය ව්‍යවහාරික ස්වරූපයක් ගත යුතුයි. මේ සඳහා ඔබ ළඟ සියලුම සම්පත් සම්පූර්ණයෙන්ම තිබෙනවා. ඊට පසුව ඊ ළඟ රාජ්‍යයේ අනෙක් තරුණ පිරිසට මොක ද වෙන්නේ. අනෙක් රාජ්‍යවල තරුණ පිරිසට ආදරය කිරීම තහනම් කළ හැකි වන්නේ කාට ද? සමහර විට ඒ අය ඔබගේ රාජ්‍ය සීමාවෙහි සිටින අය විය

හැකියි. එක ප්‍රාන්තයක රජ කෙනෙක් තම ප්‍රාන්තයේ ජනතාවට ප්‍රේම කරනවා නම් අනෙක් රාජ්‍යයේ අයට ප්‍රේම කිරීමට නො හැකියි කියා කිව නොහැකිය. රජතුමනි, රටක ශාන්තිය, සමෘද්ධිය පවතින්නේ රටේ සියලු දෙනා අවංකවම කිසිම පෞද්ගලික ලාභ සත්කාරයක් නොබලා එකට එකතු වී රට ගැන සිතා කටයුතු කළොත් පමණි. ඔබගේ රාජ්‍යයේ ශාන්තිය සමගිය කැමති නම් අනෙක් රාජ්‍යවල ද ශාන්ති සමගිය අවංකවම පැතිය යුතුයි.

''විදේශීය නීතිය, ආර්ථික නීතිය ආදිය කරුණාව පෙරදැරිව සූදානම් කළ හොත් ඇත්ත වශයෙන්ම ශාන්තිය සමගිය ඇති වීම සම්භව බව සඳහන් කිරීම උචිතයි.

''රජතුමනි, මා ගිය වසරේ මගේ පූර්ව වංශ ශාක්‍යවරුන් හමු වන්න ගියා. මේ අතර හිමාලයේ කෙත් වතු පරිසරයේ ටික දවසක් ගත කළා. මේ කාලය තුළ මා අහිංසාව සමඟ රාජ්‍ය පාලනය කිරීම ගැන බොහෝ දුරට හිතුවා. මේ ගැන ගම්භීරව සිතුව මට අන්තිමට හිතුණා මරණීය දණ්ඩනය, හිර ගෙදර යන දෙක ම නැතුවත් රටක් ඉතා හොඳින් පාලනය කරන්න පුළුවන් කියලා. මේ ගැන මගේ පියා සුද්දෝධන රජු සමඟත් හුඟාක්ම සාකච්ඡා කළා.

''මේ නිසයි මා ඔබතුමාට මේ ගැන කියන්නේ. යම් කිසි රජකෙනෙක් කරුණාවෙන්, ප්‍රේමයෙන්, මෛත්‍රියෙන්, රජ කරනවා නම් කවදාවත් ඒ රටේ හිංසා පීඩා ඇති වන්නේම නැහැ. මේ නිසා හිංසාව සඳහා අවශ්‍ය දේ සම්පාදනය කරන්න මුදල් වියදම් කිරීමට ද අවශ්‍ය නැහැ.''

අද්භූතයි, අද්භූතයි. මේ තරම් සඵල රාජ ධර්මයක් මේ දක්වා කිසිම ධර්මාචාර්යවරයෙක් මට විස්තර කර දුන්නේ නැත, රජතුමා ප්‍රීතියට පත් වී කීවේය. ''ඔබතුමා බුද්ධත්වය අවබෝධ කරගත් බව මේ සුළු කාලය තුළ දී මට හොඳටම අවබෝධ වුණා. ඔබතුමාන් දේශනා කළ දේ ගැන මා ගම්භීරව සිතා ඉදිරියට වැඩ කරන්න කටයුතු සූදානම් කරනවා,'' යැයි රජතුමා පොරොන්දු විය.

''මට තව පුංචි ප්‍රශ්නයක් තියනවා. සාමාන්‍යයෙන් ප්‍රේමය සමඟ භේද භාව බලාපොරොත්තු, ඇල්ම ආදී මානසික ස්වභාව අනිවාර්යයෙන්ම සම්බන්ධයි. ඔබ කියන්නේ මේ නිසා සිතුවිලි බහුල වන බවත් දුක ඇති වන බවත් නිරාශාව ඇති වන බවත්

ආදී කරුණුයි. මගේ දරුවන්ට මා ප්‍රේම කරන විට මේ සිතුවිලිවලින් නිදහස් වෙන්නේ කොහොම ද?

මේ සඳහා බුදු රජානන් වහන්සේ තමන් කරන ප්‍රේමය ගැන යථා තත්වය ගැන අවබෝධයක් ඇති විය යුතු බව දේශනා කළෝය. ''සැම දෙනාටම පෙන්වීම සඳහා කරන ප්‍රෙමයෙන් සැපයක් සනීපයක් දැනෙන්නේ නැහැ. ඒ ප්‍රේමය ක්‍රමයෙන් කරදරයක් බවට පත් වෙනවා. ඒ ප්‍රේමය හිරගෙදරක් හැර වෙන දෙයක් නොවෙයි. ප්‍රේමයෙන් යම් කිසි සැපයක් සැනසීමක් ලැබෙන්නේ නැත්නම් ඉන් මිදීමට සැම උත්සහයක්ම දැරීම සවභාවිකයි. ඒ ප්‍රේමය ක්‍රමයෙන් ක්‍රෝධය සහ පළිගැනීම යන කරුණු දෙකට හැරී හිංසාත්මක මාර්ගයක් සඳහා යොමු වීම ස්වාභාවිකයි.

''දැනට දවස් දහයකට පෙර ශ්‍රාවස්තියේ එක පවුලක සිටි එකම පිරිමි දරුවා විවාහයක් කර ගත්තා. ඒ තරුණයාගේ මව හිතුවා තමන්ගේ පුතා තමන් අත් හැරියා, කියලා. විවාහයෙන් ටික දිනකට පස්සේ සුදුසු සමයේ දී යුවලට ගැහැනු දැරියකගේ ඉපදීම සිදු වුණා. ක්‍රමයෙන් ප්‍රේමය වෛරයට පරිවර්තනය වුණා. වෛරය ක්‍රමයෙන් වර්ධනය වුණා. අන්තිමට තුන් දෙනාටම වස දීලා මරලා දැම්මා. මහ රජතුමනි, උදාර සිත් නැති අයට ප්‍රේම කිරීම එතරම් පහසු නැත. උදාර බව ප්‍රේමයයි කීවාට වරදක් නැහැ. ඔබ ළඟ ප්‍රඥාවේ යම් අඩුවක් ඇත්නම් එතන ද ප්‍රේම කිරීමේ හැකියාව අඩු බව සිතිය යුතුයි. සහෝදර සහෝදරියෝ තමන් එක් එක්කෙනා ගැන හඳුනා ගන්නේ නැතිව සහෝදරකම ගැන අවබෝධයක් නැතිව ප්‍රේම කරන්නේ කොහොම ද? අම්මා, තාත්තා, දරුවෝ එකිනෙකා තමතමන් අඳුන ගන්නේ නැතිව කොහොම ද ප්‍රේම කරන්නේ?

''මහ රජතුමනි, කෝසල රාජ්‍යයේ ජනතාවට කරදර තියනවා, ආශාවල් ද තියනවා. මේ සියල්ලම ඔබට අවබෝධ කර ගැනීමේ ශක්තිය ඇත්නම් ඒ සියල්ල්ම නැති කිරීමේ ශක්තිය ද තිබිය යුතුයි. ඒ ශක්කිය ද අනිවාර්යයෙන් ඇති වීම ද ස්වාභාවිකයි. ජනතාවගේ දුක්කරදර නැති වූ විට ජනතාව ඔබ කෙරෙහි ප්‍රේම කරන්න පටන් ගන්නවා. සදාතන රජතුමා හැටියටත් ඔබතුමා පිළිගන්නවා. මහා බිසවට, රාජ කුමාරයාට කරදර ආශා තියනවා.

මේ සියල්ල ඔබට තේරුම් ගන්න පුළුවන් නම් ඔබ දක්ෂයෙක්. ඒ ප්‍රශ්න විසඳන්න තරම් ප්‍රේමභාවයක් ඔබ ළඟ ඇත්නම් එය ද ඔබගේ දක්ෂකමක්. සද්ධර්මය අනුව ප්‍රේමය යනු පුළුල් අර්ථයක් ඇති මානසික තත්වයක්.''

කොසොල් රජතුමා මේ වචන අසා තව තවත් සතුටට පත් විය. මේ දක්වා කිසිම ආචාර්යවරයෙක්, බමුණෙක් කොසොල් රජතුමාට මේ වැනි විස්තරයක් කර තිබුණේ නැත. මෙවැනි ආචාර්යවරයෙක් රටේ සිටීම ඉතා වැදගත් යැයි මෙතුමා සිතුවේය. එතුමා බුදු රජුන්ගේ ශිෂ්‍යයකු වීමට කැමැත්ත පළ කළේය. ටික වේලාවක් නිහඬව සිටි ඔබතුමන් දුන් මේ උපදේශවලට බොහෝම ස්තුතියි යැයි රජතුමා කීවේය. නමුත් බලාපොරොත්තු බොහෝමයක් ඇතිව කරන ප්‍රේමය අන්තිමට වේදනාවක් වෙන බව දුකක් වෙන බව ප්‍රකාශ කෙළේය. බලාපොරොත්තු රහිත ප්‍රේමය සැනසීම සහ ප්‍රසන්නභාවය ලබා දෙන බව සත්‍යය බව හැඟෙන බව ද කීවේය. දුක හඳුන ගැනීමට ශක්තිය ඇත්නම් වේදනාවලින් නිදහස් වීම ද ඉතා පසු බව බුදු රජානන් වහන්සේ දේශනා කළෝය. දුකක් ඇති වූ විට හැඬීම, වැළපීම, සිහි බුද්ධිය නැති කර ගැනීම කළ යුත්තේ දුක කුමක් ද කියා හඳුනා ගැනීම බව ද එතුමා පැවසුවෝය. දුක හඳුනා ගැනීමට ශක්තිය නැති අය දුකක් ඇති වූ විට ඇඬීම, වැළපීම, වේදනාවට පත් වීම ආදී දෙයින් කාලය විනාශ කිරීම සිරිතකි. බලාපොරොත්තු රහිත ප්‍රේමය කවරදාකවත් දුක ගෙන දෙන්නේ නැතැයි බුදුන් වහන්සේ ප්‍රකාශ කළහ.

''මීළඟට කරුණාව ගැන හිතන්න. කරුණාව උසස්ම මනුෂ්‍ය ගුණයක්. අනිත්‍ය වූ සංසාරයේ කරුණාවෙන් යුක්ත ප්‍රේමයත් දුකින් තොර බව මා සඳහන් කරනවා. මේ ලෝකයේ සියලුම වස්තු අනිත්‍යයි. කිසිම දෙයක් කිසිම තැනක ස්ථිර නැහැ. යම් කිසි දවසක ඔබගේ ශරීරයටත් අනිත්‍ය ස්වාභාවයට මුහුණ දෙන්න වෙනවා. මේ ගැන ගැඹුරින් සිතන අයගේ සිත ශාන්තවීමත් ස්වභාවිකයි. සිත චංචල වෙන්නේත් නැහැ. කරුණාවෙන් යුක්ත ප්‍රේමය සිතට ශක්තිය වැඩිපුර දෙනවා. චිත්ත ශක්තිය අධික වන්නට වන්නට ක්‍රමයෙන් මනුෂ්‍යත්වය ද සම්පූර්ණ වෙනවා. මහ රජතුමනි, අද අප සද්ධර්මය ගැන තරමක් සාකච්ඡා කළා.

අනෙක් දවසක තවත් මේ ගැන සාකච්ඡා කරමු,'' යැයි බුදුන් වහන්සේ පැවසූහ.

කොසොල් මහ රජතුමාගේ හදවත ප්‍රීතියෙන් පිනා ගියේය. බුදුරජුන් ඉදිරියේ වැඳ වැටී නමස්කාර ද කළේය. ඉතාම ඉක්මනට තමන්ට බුදුරජුන්ගේ උපාසකයකු හැටියට ඉදිරි කාලය ජීවත් වෙන්න හැකි වේ යැයි රජතුමා සිතුවේය. මල්ලිකා මහ බිසව, ජේත කුමාරයා, රාජ කුමාරි වෘජ යන තුන් දෙනාම බුදු රජාණන් වහන්සේ ගැන අපරිමිත ශ්‍රද්ධාවෙන් යුක්ත බව රජතුමා දැනගෙන සිටියේය. මේ තුන් දෙනා අතරට තමන්ටත් එක් වීමට ලැබීම භාග්‍යයක් හැටියට රජතුමා සිතුවේය. තමන්ගේ නංගී කෝසලා දේවී සහ එතුමියගේ ස්වාමි පුරුෂයා වූ බිම්බිසාර යන දෙදෙනාම බුදු රජාණන් වහන්සේගේ සරණ සමාදන්ව උන් වහන්සේගේ සසුනේ උපාසකඋපාසිකා බවට පත් වී ඇති බව කොසොල් මහ රජතුමා දැනගෙන සිටියේය.

එදා සවස කොසොල් රජතුමාගේ මුහුණේ යම්කිසි සතුටු දායක පරිවර්තනයක් මහා රාණි මල්ලිකා හා වෘජ කුමරිය යන දෙදෙනාම දුටුවෝය. එය සතුට සම්පූර්ණයෙන්ම පිරි අලුත්ම පරිවර්තනයකි. එය, බුදුරජාණන් වහන්සේ හමු වීමේ ප්‍රතිඵලයක් යැයි මේ දෙදෙනාම සිතුවෝය.

නමුත් දෙදෙනාම ඒ පිළිබඳ කලබල නොවී කාලය එළඹෙන තෙක් සිටීමට තීරණය කරන ලදි. බුදුරජානන් වහන්සේ සමඟ රජතුමා කතා කළේ කුමන කරුණක් සම්බන්ධයෙන් ද යන්න දැන ගැනීමට මේ දෙදෙනාටම අවශ්‍යව තිබිණි.

## හතලිස් තුන් වන පරිච්ඡේදය

# සියලු දෙනාගේම කඳුළු ලුණු රසයි

පසේනදී කොසොල් රජතුමා බුදුරදුන් හමු වීම පිණිස ජේතවනය කරා පැමිණි නිසා බුදුන් වහන්සේ දැක ගැනීමට, එහි එන පිරිස ක්‍රමයෙන් අධික වන්නට විය. මේ නිසාම මිනිසුන් තුළ බුද්ධ දේශනා ශ්‍රවණය කිරීමට ඇති ආශාව ද සංඝයා පිළිබඳ ඇති ගෞරවය ද බුද්ධ දේශනා ශ්‍රවණය කිරීමට කිරීමට ඇති ආශාව ද සංඝයා පිළිබඳ ඇති ගෞරවය ද වැඩි වර්ධනය වීමට පටන් ගැනිණි. හැම සතියකම, ධර්මය ශ්‍රවණය කිරීමට රජතුමා යන විට, ඒ සමඟ රජයේ අධිකාරිවරු ද එතුමා සමඟ එක් වී ධර්ම ශ්‍රවණයට සහභාගි වූහ. ඒ අතර සමහර කෙනෙක් සද්ධර්ම ශ්‍රවණයට සහභාගි වූයේ රජතුමා සතුටු කොට තමනට ඉහළ තනතුරක් ලබා ගැනීමේ අපේක්ෂාවෙනි. ජේතවනයට යන අය අතර බුද්ධිමත් පිරිස ද තරුණ පිරිස ද ක්‍රමයෙන් අධික වන්නට පටන් ගත්තේය. තුන් මසක් යන්නට පෙර ශාරිපුත්‍ර තෙරුන් වහන්සේට තරුණ පිරිස අතරින් එකසිය පනස් දෙනෙකුට අධික පිරිසක් පැවිදි කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීමට අවශ්‍ය විය.

විවිධ ධර්ම පිළිබඳව තදින් එල්බ සිටි රාජාශ්‍රය ලබා සිටි බොහෝ නායකයන් පවා පැවිදි බිමට ඇතුළත් වූ බව හොඳින්

පෙනෙන්නට තිබිණි. ජේතවනයේ සිදුවන මේ කටයුතු නොඉවසූ පිරිසක් ද මේ අතර විය. වස්සාන කාලය අවසන් වූ දා කොසොල් රජතුමා භික්ෂූනට දාන, චීවර ආදිය පූජා කර දුප්පත් දුගීමඟී යාචකාදීන්ට ආහාරපාන ද ලබා දුන්නේය. එදා කළ පිංකමේ දී රජතුමා ඇතුළු රජ පවුලේ සෑම සියලුදෙනම බුදුරදුන් ඉදිරියේ බුද්ධං සරණං ගච්ඡාමි, ධම්මං සරණං ගච්ඡාමි, සංඝං සරණං ගච්ඡාමි යනුවෙන් පවසා, තුනුරුවන් සරණ ගියහ.

වස්වාසයෙන් පසුව, බුදුරදුන් සහිත මහා සංඝයා සංඛ්‍යාව වැඩි විණි. වැඩිවැඩියෙන් ධර්මය ප්‍රචාරය කිරීම සඳහා ගම්දනව් සැරිසැරීමට මහා සංඝයා පටන් ගත්තෝය. දිනක් බුදුරදුන් ඇතුළු මහා සංඝයා ගංගා නදී ඉවුරේ ගමක පිණ්ඩපාතයේ වැඩියහ. එසේ වඩින අතර එක්තරා අහිංසක මනුෂ්‍යයෙක් මලමූත්‍ර කදක් ද රැගෙන මගමඟ ගමන් කරන බව දුටුවෝය. බුදුරදුන් ඒ මිනිසා තමන් වහන්සේ ළඟට කැඳවා ඔහුගේ නම කුමක් දැයි ඇසුවෝය. ඔහු තමාගේ නම සුනීත යැයි පවසා සිටියේය. සුනීත මීට පෙර බුදුරජානන් වහන්සේ පිළිබඳව අසා තිබුණත් උන් වහන්සේ දැක තිබුණේ නැත. සුනීත ඇඳ සිටි රෙදිපෙරෙදි මලමූත්‍ර ගඳින් ගඳ ගසමින් තිබිණි. සුනීත පාරෙන් ඉවත් වී වෙනත් පාරකට පිළිපන්නේය. එහෙත් සුනීතට ධර්මය දේශනා කළ යුතු යැයි බුදුරදුන් අදහස් කළෝය. සුනීත වෙනත් මාර්ගයකින් එතැනින් ඉවත්ව යාමට උත්සාහ දැරුව ද බුදුරජානන් වහන්සේ ද එම මාර්ගයට තෝරා ගත්හ. බුදුරදුන්ගේ අදහස වටහා ගත් ශාරිපුත්ත හා මෙඝීය යන තෙරුන් වහන්සේලා ද බුදුරදුන් පසුපසට ගමන් ගත්හ. අනෙක් භික්ෂූන් ගමන නතර කර සිදුවන්නට යන්නේ කුමක් ද යන්න ගැන විමසිල්ලෙන් බලා සිටියහ.

මේ සම්භාවනීය පිරිස දැක සුනීත බියට පත් විය. කුමක් සිදු වන්නට යන්නේ දැයි තේරුම් ගැනීමට අපොහොසත් වූ නිසා සුනීත අසූචි කද පසෙක තබා සැඟවී යන්නට ස්ථානයක් සෙවීය. පසුව ඔහු නදියට බැස දණහිස තෙක් ජලයේ ගිලුණේය. සුනීත දෑත් එක්ක බුදුන් වහන්සේ දෙසට දෑත් එක්කර වැඳ නමස්කාර කළේය. බුදුරදුන් සමඟ එන මහා සංඝයා තමන් රැගෙන යන අසූචිවල ගඳින් අපවිත්‍ර වනු ඇතැයි සුනීත සිතුවේය. තමන් සමාජයේ සලකන ආකාරයට අඩු කුලයේ කෙනෙකු බව සුනීත

දැන සිටියේය. ඉදිරියට එන පිරිස උසස් කුලවල අය බවත් ඒ අයගේ හමුවීම ඔවුන් අපවිත්‍ර කිරීමකට සමාන අපරාධයක් බවත් සිතා තමන් නදියට බට විට බුදුන් වහන්සේ ඇතුළු පිරිස තම ගිය මඟ නිදහසේ වඩිනු ඇතැයි සුනීත සිතුවේය. එහෙත් බුදුරදුන් එසේ කල්පනා කෙළේ නැත. කෙසේ හෝ සුනීත හමුවිය යුතු යැයි උන් වහන්සේ අදහස් කළෝය. බුදුරදුන් සුනීත සිටි ස්ථානයට වැඩම කළහ. සුනීත අසලට ගිය බුදුරදුන් ''මිත්‍රය, මා ළඟට එන්න. අපට ඔබ සමඟ ටිකක් ළඟින් ආශ්‍රය කරන්න, කතා කරන්න ඕනෑ,'' යැයි පැවසුවෝය.

සුනීත දෑත් එක්කර බුදුන් වහන්සේට නමස්කාර කරමින්, ''මා එහෙම කරන්නේ කොහොම ද? මට ඒ සඳහා ශක්තියක් නැහැ,'' පවසා සිටියේය.

''ඇයි නැත්තේ,'' යනුවෙන් බුදුරදුන් පිළිවිසීය.

''මා සමාජයේ ඉතාම අඩු කුලයේ අයෙක්. මා ඔබ වහන්සේලා අසලට ඇවිත් ඔබ වහන්සේලා අපවිත්‍ර කරන්නේ කෙසේ ද?'' යැයි සුනීත විමසීය. ''සුනීත, මා අවබෝධ කර ගත් දහමේ ජාති කුල භේදයක් නෑ. නුඹත් මා වාගේම මනුෂ්‍යයෙක්. අපි අපවිත්‍ර කරනවානම් එසේ කරන්නේ නුඹ නොවෙයි; ලෝභ, දෝෂ, මෝහ, ඊර්ෂ්‍යා ආදියෙන්. ඒ හැර මිනිසුන් දෙදෙනෙක් හමුවීම නිසා අපවිත්‍ර වීමක් සිදු වන්නේ නෑ. මා අවබෝධ කර ගත් ධර්මයේ කිසිම තැනක දක්නට නැති අපවිත්‍ර වීමක් ගැනයි ඔබ කියන්නේ. නුඹ වැනි කෙනෙක් හමු වීම මට සතුටට කාරණයක්. මා නුඹේ නම ඇසුවාම නුඹ කීවා, මගේ නම සුනීත කියලා. මං අහන්නේ සුනීත, ඔබ කැමති නැද්ද අනෙක් අය වගේ භික්ෂුත්වය ලබා ගන්න?'' බුදුරජාණන් වහන්සේ සුනීතගෙන් ඇසුවෝය.

''මා භික්ෂුත්වය ලැබීමට සුදුසු කෙනෙක් නෙවෙයි.''

''ඇයි ඒ?''

''මම අපේ සමාජයේ පහත්ම යැයි සම්මත කුලයක කෙනෙක්! ඒ නිසා ඔබ වහන්සේගේ ආරාධනය කිසිසේත් පිළිගත නොහැකියි,'' සුනීත කීවේය.

''සුනීත, මා මුලින්ම කීවා නේද මා අවබෝධ කර ගත් ධර්මයට අනුව ජාතිකුල භේද කිසිවක් නැහැයි කියලා? ගංගා, ජමුනා, අචිරවතී යන ගංගා වෙනවෙනම ගැලුවත් සමුද්‍රයට ගිය

විට එකසේ ජලය එකම රසයකින් යුක්ත වන්නා සේම මගේ ධර්මය අවබෝධ කර ගෙන එකී සද්ධර්ම මාර්ගයට ඇතුළු වූ විට, සියලු මිනිසුන්, මිනිසුන් ලෙස සලකනවා හැර කිසිම ජාතී විශේෂයකින් හඳුන්වන්නේ නෑ. නුඹ කැමති නම් අනෙක් අයට වගේ පැවිදි ජීවිතයක් ගත කරන්න පුළුවං," යැයි බුදුරදුන් තව දුරටත් පැවසීය.

තමන් හට මේ ඇසෙන්නේ කුමක් ද, මේ ඇසෙන දේ සත්‍යය ද යන්න ගැන වැටහීමක් සුනීතට නොවීය. දෑත මත නළල තබා ගෙන ඔහු කල්පනා කෙළේය. ජීවිතයේ කවර නම් දිනයක හෝ කිසිවෙක් හෝ මේ තරම් කරුණාභරිතව ඔහු අමතා කතා කර නැත. අද තමාගේ ඉතාමත්; සුබ වැදගත් දවසක් යයි සුනීතට සිතුණේය.

බුදුරදුන් තම අත වූ පිණ්ඩපාත පාත්‍රය මේසීය අතට දී සුනීත නහවා පිරිසිදු කිරීමට උදව්වන ලෙස ශාරිපුත්තගෙන් ඉල්ලා සිටියේය. "සුනීත මේ නදිය අසල දීම ඔබ පැවිදි කරන්නයි මගේ අදහස," බුදුරදුන් සුනීත අමතා පැවසුවෝය.

ශාරිපුත්ත සිනාසී තමන්ගේ පාත්‍රය පසෙකින් තබා බුදුන් සමීපයට පිය නැගුවෝය. බුදුරජුන් සහ ශාරිපුත්ත දෙදෙනා එකතු වී සුනීතගේ ඇඟ අතුල්ලා හොඳින් නහවන විට සුනීතට ජීවිතයේ කිසිම දවසක ඇති නො වූ තරම් නැවුම් හැඟීමක් හිතට දැනෙන්නට ගත්තේය. නමුත් ඒ ගැන කිසිවක්ම කියන්න තරම් ශක්තියක් තිබුණේ නැත. බුදුරජුන් මේසීයට අමතා ආනන්ද හාමුදුරුවන්ගෙන් අඳනයක් සහ සිවුරක් රැගෙන එන ලෙස දැන්වීය.

ඉන් පසු සුනීත පැවිදි කර ඉතිරි ශික්ෂා දීම සඳහා ශාරිපුත්ත මහ රහතන් වහන්සේට භාර කළෝය. ශාරිපුත්ත සුනීත සමඟ ජේතවනය කරා ගියෝය. බුදුරජුන් අනෙක් භික්ෂූන් සමඟ පිණ්ඩපාතය සඳහා වැඩම කළහ.

ප්‍රදේශවාසී ජනතාව මේ සියලු සිදුවීම කල්පනාවෙන් ඇස ගසාගෙන සිටියෝය. සමාජයේ ඉතාම අඩු කුලේ යයි සලකන කෙනෙකු බුදුරජුන් පැවිදි කර භික්ෂු සමාජයට ඇතුළත් කර ගත් බව පළාතේම ප්‍රසිද්ධියට පත් විය. මේ ආරංචිය නිසා සමාජයේ උසස් යයි සම්මත අය අතර මහා ආන්දෝලනයක් ඇති විණි. කෝසල රාජධානියේ මේ දක්වා කිසිම ධර්ම සම්ප්‍රදායක අඩු

කුලයේ කෙනෙකුව පැවිදි සමාජයට ඇතුළත් කරගෙන තිබුනේ ම නැත. බුදු රජාණන් වහන්සේ විසින් ආරම්භ කළ මේ ධර්ම සම්ප්‍රදාය ගැන බොහෝ අය අප්‍රසන්න බව ප්‍රකට කළහ. කෝපයට පත් සමහරු බුදුරජුන් රට ප්‍රපාතයට ඇදගෙන යාමේ කාර්යයක් ආරම්භ කර ඇතැයි කීවෝය.

සමාජයේ අදහස් බුදුරදුන් දැන සිටියත් උපාසක පිරිස සහ භික්ෂූන් නිරතුරුවම මේ ගැන දැනුම් දුන්හ. බුදුරදුන්ගේ ප්‍රධාන ශිෂ්‍යයන් වූ ශාරිපුත්ත, මොග්ගල්යාන, මහා කාශ්‍යප, අනුරුද්ධ ආදී භික්ෂූන් මේ කරුණ පිළිබඳ දැඩි අවධානය යොමු කළහ. සංඝ සමාජයට අඩු කුලයේ අයට ඇතුළත් කිරීම කාලය අනුව සමාජයේ අවශ්‍යතාවක් බව බුදුරදුන් ඒ භික්ෂූන් සමඟ පැවසුවෝය. "මා අවබෝධ කර ගත් දහම සියලුම දෙනාට සමානයි. කිසිම හේතුවකින් වත් භේදයක් ඇති වන්නට හේතුවක් නැතුවා වාගේ ම මේ කාර්යය ඉදිරියට කරගෙන යෑමට කාටත් ලොකු ධෛර්යයක් අවශ්‍යයැ,'' යි උන් වහන්සේ සඳහන් කළෝය.

අපේ භික්ෂු සමාජයේ උත්සාහය සහ ධෛර්යයේ කිසි ම අඩුවක් නැති වුවත් භික්ෂූන්ගේ සාධනා ක්‍රම සරලව ක්‍රමානුකූලව කරගෙන යාමට සමාජයෙන් එල්ල වන ප්‍රහාරයන්ට ප්‍රතිඋත්තර දීමට සූදානම්ව සිටිය යුතු යැයි ශාරිපුත්ත හිමියෝ කීහ. ප්‍රධාන වශයෙන් අප අපේ භික්ෂු ජීවිතයේ ධාර්මික කටයුතු පිළිබඳව කල්පනා කාරී විය යුතු බව ද සුනීත ශීලවන්ත ගුණවන්ත බෞද්ධ භික්ෂූන් වහන්සේ නමක් හැටියට තම භාවනා ආදී සද්ධර්මයේ කටයුතු හොඳින් සිදු කළොත් මේ සඳහා වෙනමම පිළිතුරු දීමක් අවශ්‍ය වන්නේ නැති බව ද උන් වහන්සේ තවදුරටත් පැවසූහ. එහෙම සිදු වුවහොත් සමානාත්මතාව පිළිබඳව පිළිතුරු සෙවීම අවශ්‍ය නොවන බව තදින්ම කියා සිටියේය.

බුදුරදුන් ශාරිපුත්තගේ උර මත අත තබා කිවුවා ඔබ මගේ අදහස් ප්‍රකට කළා යැයි පැවසූහ.

සුනීතව පැවිදි කළ බව කොසොල් රජතුමාටත් දැන ගන්න ලැබිණි. අනෙක් ධර්ම අදහන ආචාර්යවරු රජතුමා මුණ ගැසී සුනීත පැවිදි කළ ප්‍රශ්නය ගැන දිගින් දිගටම සාකච්ඡා කළහ. රජතුමා බුදුරදුන් ගැන කොපමණ පැහැදුනත් අනෙක් ආගමික ප්‍රධානීන්ගේ අදහස් පිළිබඳව තදින් සිතූ රජතුමා මේ සිද්ධිය ගැන

මා මීට වඩා ගැඹුරින් සිතිය යුතු බව සඳහන් කළේය. දවස් කීපයකට පසු රජතුමා ජේතවනයට ගොස් බුදුරජාණන් වහන්සේ හමු විය. විහාරයේ ඉදිරිපිට රථය නතර කළ රජතුමා බුදුරජුන් හමුවට පයින්ම ගමන් කළේය. ඉදිරියට හමු වන සෑම භික්ෂූන් වහන්සේ නමකටම හිස නමා ආචාර කළේය. භික්ෂූන්ගේ නිහතමානීබව දුටු රජතුමා ප්‍රසන්නභාවයට පත් විණි. පුංචි කඳු ගැටයක් වැනි ස්ථානයක එක භික්ෂූන් වහන්සේ නමක් උපාසක පිරිසකට ධර්මය දේශනා කරමින් සිටිනු එතුමා දුටුවේය. ඒ දර්ශනය ඉතාම සිත් ඇද ගන්නා සුළු දර්ශනයක් විය. ධර්මය දේශනා කරන භික්ෂූන් වහන්සේගේ වයස අවුරුදු හතළිහට අඩු බවත් පෙනිණි. නමුත් මුහුණේ ශාන්ත බව මෙන්ම බුද්ධිමත් බව ද ඉතාම පැහැදිළිව පෙනිණි. සියලු දෙනා උන් වහන්සේගේ ධර්මය ශ්‍රවණය කළහ. මේ භික්ෂූන් වහන්සේ දේශනා කරන්නේ කුමක් ද අරඹයා යන්න ද දැන ගැනීමට රජතුමා එහි මද වේලාවක් නැවතී සිටියේය. නමුත් රජතුමා පැමිණියේ ධර්මය ශ්‍රවණය කිරීමට නොවේ යැයි සිතා ආපසු ගමනේ දී ධර්මය ශ්‍රවණය කිරීමට සිතා ගත්තේය.

බුදුරජුන් රජතුමා ඉතාම ආදරයෙන් පිළිගත්තේය. ආසන ග්‍රහණයෙන් පසුව රජතුමා පුංචි කඳු මුදුනේ ධර්ම දේශනා කරන්නේ කවර භික්ෂූන් වහන්සේ ද යැයි ඇසුවේය. බුදුරදුන් සිනා සී ''ඒ සුනීත, සුනීත මීට කලින් අශුචි සුද්ධ කරපු කුලයේ කෙනෙක්. ඔබතුමාට ඔහුගේ ධර්ම දේශනාව ගැන කොහොම හැඟීමක් ද ඇති වුණේ,'' යනුවෙන් රජතුමාගෙන් ඇසුවෝය.

රජතුමා පුදුමයට පත් විණි. ඒ වැනි කෙනෙක් මේ තරම් උසස් තත්වයකට පත් වූයේ කෙසේ ද යනු එතුමාට අදහාගත නොහැකි විය. රජතුමා තවත් යමක් කීමට පෙර බුදුරජුන්, ''සුනීත පැවිදි වූ දාම ඉතාම අවංකව මහන්සි වී භික්ෂු ජීවිතයට අවශ්‍ය ධ්‍යාන භාවනා ආදිය සිද්ධ කළා. සුනීත අවංක උත්සහයෙන් යුක්ත භික්ෂූන් වහන්සේ නමක්. පැවිදි වී මාස තුනකින් සුනීත තමන්ගේ දක්ෂකම සැමගේ ඉදිරියේ ප්‍රදර්ශනය කළා. ඔබතුමා සුනීත හමුවෙන්න කැමති නම් කියන්න. උන් වහන්සේට යම් කිසි තෑග්ගක් වගේ දෙයක් දෙනවා නම් ඉතා හොඳයි,'' යැයි තවදුරටත් බුදුන් වහන්සේ කියා සිටියෝය.

රජතුමා ''ඔව් මා උන් වහන්සේ හමුවෙන්න ඕනෑ. පුංචි තෑග්ගකුත් දෙන්න ඕනෑ. ගුරු දේවයාණනි, ඔබතුමාගේ ශිෂ්‍යයන් ඉතාම දක්ෂ අය නේද? මා මේ දක්වා ඔබතුමා වැනි ආධ්‍යාත්මික ගුරුවරයෙක් හමු වුණේ නැහැ. ඔබගේ ධර්මය මනුෂ්‍යයන් පමණක් නොවෙයි. පශු, පක්ෂි සහ ගස් කොළන් පවා ප්‍රභාවිත කරන ධර්මයක්. ඇත්තෙන්ම මා කියන්නම් මා ඔබ වහන්සේ හමු වීමට ආවේ සමාජයේ අඩු කුලයේ කෙනෙකුව ඔබ වහන්සේ පැවිදි කළේ මොන අදහසකින් ද කියා දැන ගන්නයි. මේ සියල්ලටම පිළිතුරු ඔබ වහන්සේ හමුවීමට පෙර මට ලැබුණා. ඔබ වහන්සේ හමු වීමෙන් පස්සේ කාරණය තවත් ඉතාම පැහැදිළි වුණා,'' යනුවෙන් ද කොසොල් රජතුමා පැවසුවෝය.

රජතුමා නැඟිට ආපසු යාමට සූදානම් වූ විට බුදුරජුන් එතුමාගේ අත අල්ලාගෙන, ''මහාරජතුමනි, නිවන් දකින මාර්ගයේ කිසිම තැනක ජාතිය බාධාවක් වන්නේ නැහැ. මා අවබෝධ කර ගත් ධර්මයේ සියලුම දෙනා එක හා සමානයි. සියලුම මනුෂ්‍යයන්ගේ ලේ රතු පාට වගේම කඳුළුත් ලුණු රසයි අපි සියලුම දෙනා මනුෂ්‍යයන් කියලා හිතන්න කාලය දැන් එළඹී තියනවා. මනුෂ්‍යයන්, මනුෂ්‍යයන් හැටියට සලකන සමාජයක් සූදානම් කිරීම සඳහා මා සුනීතව පැවිදි කළා යනුවෙන් ද උන් වහන්සේ පැවසූහ.

''ඔබ වහන්සේ තෝරා ගත් මාර්ගය ඉතා ශ්‍රේෂ්ඨ වුණත් එය ඉතාම කටුක මාර්ගයක්. නමුත් සියල්ලටම පිළිතුරු දීමේ ශක්තියක් ඔබ වහන්සේට තියන බව මා තදින්ම විශ්වාස කරනවා,'' රජතුමා පැවසුවෝය. බුදු රජුන්ගෙන් සමුගෙන සුනීත ධර්මදේශනා කරන ස්ථානයට ක්‍රමයෙන් ගියත් දේශනාව අවසාන වී සියලුම දෙනා එතනින් පිට වී ගොස් තිබිණි. රජතුමා ධර්මය ගැන සිතමින් එතන සක්මන් කරන්න ගත්තෝය.

# හතලිස් හතර වන පරිච්ඡේදය

# ස්ථිර කිසිත් නොමැති බව

නන්ද ඉතාම අප්‍රසන්න භික්ෂූන් වහන්සේ නමක් බව මේඝීය හිමියන් බුදුරදුන් හමුවේ තමන්ගේ ප්‍රේමිකා ගැන සිතමින් වේදනා විඳින බව උන් වහන්සේ සඳහන් කළහ. ''මට හොඳටම මතකයි, බුදු හාමුදුරුවෝ මට පිණ්ඩපාත පාත්‍රය දුන් දවසේ ජනපද කල්‍යාණිය මා දෙස බලා දෑසට දෑස යොමු කර ඉඟියෙන් කතා කළ ආකාරය ගැන. එදා ඇය කිවුවා ඉක්මනින් එන්න, මා ඔබ ගැන බලාපොරොත්තුවෙන් ඉන්නේ කියලා. භාවනා කරන හැම මොහොතකම ඇගේ සම්පූර්ණ චිත්‍රය මගේ හිතේ පාවෙනවා. ඒ සමඟම ඇය ගැන ඇතිවන හැඟීම් ධාරාව අධික වෙනවා මට ඇය නැතුව බැහැ,'' යනුවෙන් නන්ද මා සමඟ පැවසුවා යැයි මේඝීය බුදුන් වහන්සේ සමඟ වැඩිදුරටත් කීවෝය.

''මෙන්න මේ වාගේ දේවල් කියන මහා කැත භික්ෂූන් වහන්සේ නමක් නන්ද කියන්නේ. කිසිම දවසක සතුටට පත්වෙන කෙනෙක් නොවෙයි,'' මේඝීය තවදුරටත් කියා සිටියේය.

දෙවන දවසේ බුදුරජුන් නන්දට තමන් වහන්සේ සමඟ එන ලෙස පවසා නන්ද සමඟ ගමේ ඇවිදින්න පිටත් වුණෝය. ජේතවනයෙන් පිටත් වෙලා එක් ගමක තිබුණු වැවක් අසල මත

බුදුරදුන් ආනන්ද සමඟ ගලක් මත වාඩි වූවෝය. විලේ තාරාවෝ, හංසයෝ ආනන්ද ජනකව පිහිණූ අතර ගස් මුදුනේ කුරුල්ලන්ගේ මිහිරි නද පැතිරිණි.

''මට දැනගන්න ලැබුණා නුඹ භික්ෂු ජීවිතය ගැන එතරම් සතුටක් නැතිව නිකම්ම කාලය ගත කරනවා කියලා. මේ කතාව ඇත්ත ද?'' බුදුන්වහන්සේගෙන් නන්ද ඇසුවෝය.

නන්ද කිසිවක්ම පැවසුවේ නැත. කපිලවස්තුවට ගොස් රජකම බාර ගන්න කැමති ද යනුවෙන් බුදුරජානන් නන්ගෙන් ඇසුවෝය.

''මා සැමටම කියලා තියෙන්නේ රජකම් රාජ නීති දෙකම මට සුදුසු නැත කියලා. මා තේරුම් අරන් තියෙන්නේ රජකමකට අවශ්‍ය සුදුසුකම් මා ළඟ නැත කියලා,'' යැයි, නන්ද එකවරම ප්‍රකාශ කළෝය.

''එහෙනම් පැවිදි වෙලා ඇයි සතුටින් ඉන්නේ නැත්තේ. මොකද ජනපද කල්‍යාණිව මතක් වෙනව ද?''

නන්ද ලැජ්ජාවෙන් යුක්තව සිටියා මිසක කිසිම දෙයක් කතා කළේ නැත.

බුදුරජුන් ''නන්ද, කොසොල් ජන පදයේ ජනපද කල්‍යාණිට වඩා ලස්සන ගැහැනු ළමයි ඕනෑ තරම් ඉන්නවා. කොසොල් රජතුමාගේ මාළිගයේ තිබුණු උත්සවය නුඹට මතක නේද? එතන ඔබ දැක්කේ නැද්ද කල්‍යාණිට වඩා ලස්සන තරුණියන් සිටිය බව,'' බුදුන් වහන්සේ ආනන්දගෙන් ඇසුවෝය.

''කවුරු කොහොම කිව්වත් ජනපද කල්‍යාණිගේ ඇති සුන්දර බව වෙන කෙනෙකුගේ දකින්න නැති නිසා මට ජනපද කල්‍යාණිව ඕනෑ. මගේ ජීවිතයේ ජනපද කල්‍යාණිලා එක්කෙනයි. වෙන කෙනෙක් නැහැ,'' ආනන්ද හිමි පැවසුවෝය.

බුදුරජුන් ''නන්ද, ආධ්‍යාත්මික ජීවිතයට මෝහය මහා බාධාවක්. කාන්තාවකගේ රූප සෞන්දර්ය රෝස මලක ලස්සන නැති වන්නේ කොහොම ද ඒ වගේ නැති වෙලා යනවා. මේ ලෝකයේ ඇති වන යම් ලස්සන දේ පමණක් නොවෙයි ඇති වන සැම දෙයක්ම නැති වීම අනිවාර්යයෙන්ම සිද්ධ වෙනවා. මේකයි ලෝක ස්වභාවය. නුඹත් අනිත්‍යතාව පිළිබඳව සිතනවා නම් හොඳයි,

මේ අතර බුදුන් සහ නන්ද සිටි තැනට දුරින් වයසක මහලු උපාසිකාවක ඉතාම අමාරුවෙන් හැරමිටියක වාරුවෙන් යනවා සිටියාය. ඇගේ මුහුණ ජීවිතයේ අන්තිම කාලයේ වයසක කෙනෙකුගේ ශරීරයක ඇති විය යුතු සියලුම ජරාජීර්ණ අංගවලින් පරිපූර්ණ වෙලයි තිබුණේ.

''මේ වයසක අම්මා කවදා හෝ ඉතාම ලස්සන සුන්දරම යුවතියක් හැටියට ඉන්න ඇති නේ? මේ වාගේ කාලය සමග ජනපද කල්‍යාණි ද මේ තත්වයට පත් වන බව සිතන්න. මේ ගැන තවත් සිතලා සංසාරයේ ඇත්ත තත්වය අවබෝධ කරගෙන මේ ජීවිතයත් පරලොව ජීවිතයත් සැපවත් කර ගන්න,''යැයි බුදුන්වහන්සේ පැවසූහ.

නන්ද බුදුරදුන්ගේ කතාව නතර කර; ''කරුණාකරලා තව කිසිවක් නොකියා ඉන්න. මට දැන් අවබෝධ වුණා ඔබතුමන් කියන්න යන්නේ කුමක් ද කියා. මා මගේ සම්පූර්ණ කාලය යොදලා භාවනා කරන්න අධිටන් කරගන්නම්.''

තමන්ට නැදැකමින් පුංචි මල්ලී වූ නන්ද දෙස බැලූ බුදුන් වහන්සේ සිනා සී, 'ආශ්වාස ප්‍රශ්වාස ගැන සිත යොමන්න. භාවනා කිරීමේ දී සිතේ නොයෙක් දේ ඇති වීම ස්වාභාවිකයි. විකාර ඕනෑ තරම් ඇති වේවි. යම් කිසි ප්‍රශ්නයක් ඇති වුණොත් මා හෝ ශාරිපුත්ත හෝ මුණගැසෙන්න. නන්ද, සසරින් නිදහස් වුණොත් එයම තමයි පරම සැපත. ඒ සතුට කිසිදාක නැති වෙන්නේ නැති සතුටක්,'' යනුවෙන් අවසාන වරට බුදුන් වහන්සේ පැවසූහ.

ඇඳිරි වේගන එන විට බුදුරදුන් තම කුටිය දෙසට පා නැඟුවෝය.

ජේතවනය දැන් අලංකාර අංග සම්පූර්ණ විහාරයකි. භික්ෂූන්ගේ ගණන ද පන්සියයක් පමණ වී තිබිණි. ලබන වස්සාවාස කාලය බුදුරදුන් විශාලා මහ නුවර වස් වැසීමට තීරණය කළෝය. ලිච්ඡවී රජවරුන් මහා වනය බුදුරජානන් වහන්සේ ඇතුළු මහා සංඝරත්තනයට වැඩ විසීමට අවශ්‍ය පරිදි සූදානම් කළහ. ලිච්ඡවී රජවරුන් සාදා දුන් විහාරය කුටාගාර ශාලාව නමින් හැඳින් විය. අනෙකුත් භික්ෂූන් සඳහා පුංචි කුටි සූදානම් කර දුන් අතර මේ සියල්ල සූදානම් කිරීමට අම්‍රපාලීත් හැකි පමණ උදවු කළාය.

මගධයෙන් හා ශාක්‍ය ජනපදයෙන් පැවිදි වූ දහස් ගණන් භික්ෂූන් වස් සමාදන් වීම පිණිසත් ධර්මය ශ්‍රවණය කිරීමට උපාසක උපාසිකා පිරිස් ද බොහෝ දෙනෙක් කූටාගාර ශාලාවට පැමිණෙන්නට පටන් ගත්හ. වස්සාන කාලය අවසන් වීමත් සමඟ ම බුදුරජානන් වහන්සේට පණිවිඩයක් ලැබිණි. සුද්ධොදන රජු කපිලවස්තුවේ අන්තිම හුස්ම හෙළීමට සූදානම්ව සිටින බවය ඒ. අන්තිම මොහොතේ බුදුන් දැකීමට රජතුමා කැමැත්තෙන් සිටින බව මහානාම කුමාරයාට රජතුමා කීවේය. කූටාගාර ශාලාවට ගොස් උන් වහන්සේට දනුම් දෙන ලෙස රජතුමා මහානාම කුමාරයාගෙන් ඉල්ලා සිටියෝය.

මහානාමගේ පණිවිඩය ලැබුණු වහාම බුදුරදුන් කපිලවස්තුව බලා පිටත් වූවෝය. අනුරුද්ධ, නන්ද, ආනන්ද සහ රාහුලත් බුදුරදුන් සමඟ ගියහ. මේ පිරිස කපිලවස්තුවට බලා ගිය බව ලිච්ඡවී රජවරුන් හෝ අම්‍රපාලි දැන සිටියේ නැත. බුදුරදුන් කපිලවස්තුව බලා පිටත් වූ පසුව හා ශාක්‍ය රජවරුන් පැවිදි වී දවස් කීපයකට පසුව දෙසියයක් පමණ පිරිස පයින් ම කපිලවස්තු නුවර බලා පිටත්ව ගියහ. මේ පිරිස ද ශුද්ධෝදන රජතුමාගේ පාංශු කූල කටයුතු සඳහා සහභාගී වීමට අදහස් කරගෙන සිටියෝය.

රජ පවුලේ සැම දෙනාම බුදුරදුන් රජ මැදුරේ පිටත පැත්තේ දී හමු වූහ. මහා ප්‍රජාපතී බුදුරජාණන් වහන්සේ ශුද්දෝධන රජතුමා අන්තිම හුස්ම හෙළමින් සිටි කාමරය වෙත කැටුව ගියාය. ඇඳේ අවසන් හුස්ම හෙළමින් දෑස් කහ පැහැ වී ජරා ජීර්ණව සිටි රජතුමා බුදුරජුන් දැකීමෙන් පසු නව පණක් ලැබුණු සේ පිබිදිණි. බුදුරදුන් රජතුමා ළඟම වාඩි වී එතුමාගේ අත අල්වා ගත්තෝය. මේ වන විට රජතුමාගේ වයස අවුරුදු අසූ දෙකක් සම්පූර්ණ වී තිබුණු අතර ශරීරය ඉතාම දුර්වලව දුර්වර්ණ වී තිබිණි.

බුදුරදුන් පියාණන් අමතා ''පියාණනි, හෙමින් හුස්ම ගන්න; සිනාසෙන්න. මේ වෙලාවේ ඔබගේ හුස්ම ගැනීමයි ඉතාම වැදගත්, ඉතාම වටිනා ම දේ ඔබගේ හුස්ම ගැනීමයි. ආනන්ද, නන්ද, රාහුල, අනුරුද්ද යන අයත් ඔබ සමඟයි,'' යනුවෙන් පැවසුවෝය. රජතුමා ඉතාම අපහසුවෙන් සිනා සී තමන්ගේ හුස්ම ගැනීම ගැන සිත යොමු කළේය. ''මා ජීවිතයේ අනිත්‍යය, දුක්ඛ කියන කරුණු ප්‍රත්‍යක්ෂයෙන්ම දැක්කා. යම් කිසිවෙකුට සතුට අවශ්‍ය නම් ජීවිතයේ ආශා අත හැරිය යුතුයි. සරල ජීවිතයේ සතුට පිරී

ඉතිරි ඇත්තේ,'' යැයි රජතුමා බුදුන් වහන්සේ දෙසට හැරී ඉතාමත් අසීරුවෙන් පැවසීය.

''දූන් හුඟ දවසක සිට රජතුමා ගත කළේ ඉතාම සරල ජීවිතයක්. ඔබගේ ධර්මය ගැන පවුලේ සැමටම වරින්වර ප්‍රකාශ කළා. මේ නිසා පවුලේ සැමගේම පෙරට වඩා ආධ්‍යාත්මික පරිවර්තනයක් ඇති බව වී තිබෙනවා,'' යැයි ප්‍රජාපතී ගෝතමිය පැවසුවාය.

රජතුමාගේ අත් තදින් අල්ලා ගත් බුදුරදුන් නන්ද සහ රාහුල දෙස හොඳට බලන්න. ජීවන චක්‍රය කැරකැවෙමින් පවතීවි. ඔබ අපගේ ජීවිතයේ මතක සටහන් මැද රැඳී සිටීම අනිවාර්යයෙන් ම සිදුවෙනවා. නමුත් අනිත්‍යයෙන් යුක්ත ශරීරය කවදා හෝ සතර මහා භූතයන්ට එක් වනවා,'' යැයි පැවසුවෝය. රජතුමා රාහුල අනෙක් අතින් අල්ලා ගත්තේය. මරණ මොහොතේ සිටි රජතුමාගේ මුවට සිනා රැල්ලක් නැගුණේය. රජතුමා බුදුරදුන් පැවසූ කරුණ වටහා ගත්තේය. මරණය ගැන කිසිසේත්ම බියක් ඇති වූ බව දූන ගන්න තිබුණේ නැත. රජතුමා අසල මන්ත්‍රීවරුන් සහිත පවුලේ සැම දෙනාම සිටියෝය. අතින් සන් කරමින් රජතුමා සියලු දෙනාටම තමන් වෙතට එන්නැයි සන් කළේය. ''මගේ රාජ්‍ය කාලය තුළ ඔබ සැමට මගේ කටයුතුවල දී යම් කිසි කටුක බවක් දැනෙන්න ඇති යැයි මා හිතනවා. මරණයට පෙර ඔබ සැමගෙන් සමාව ගන්න ඕනෑ,'' රජතුමා පැමිණ සිටි සියලු දෙනා අමතා කීවේය. මන්ත්‍රීවරු ඇතුළු අවට සිටි සියලු දෙනාගේම ඇස්වලින් කඳුළු කඩාගෙන හැළුණි.

''මහරජතුමනි, ඔබතුමා කාටත් ප්‍රිය ධාර්මික රජ කෙනෙක් හැටියට කවුරුත් පිළිගන්නවා. මෙතන සිටින කිසි කෙනෙක් ඔබතුමාගේ රාජ්‍ය කාලයේ කිසිම තැනක අඩුවක් දකින එක් පුද්ගලයෙක් වත් නැති බව සිතන්න,'' සුද්ධෝදන රජතුමා අසල දණ ගසා ගෙන සිටි මහානාම පැවසුවේය. ''මගේ එකම ආශාව නන්ද සිවුරු හැර කපිලවස්තුවට පැමිණ රාජ්‍ය බාරගෙන කපිලවස්තුවේ රජතුමා හැටියට රජ කරනවා දකින්නයි,'' ඔහු තවදුරටත් කීවේය.

තමා කාර්යයෙන් මුදා ගන්නා ලෙස අයදින්නාක් මෙන් නන්ද බුදු රජාණන් වහන්සේ දෙස බැලුවේය. ''මන්ත්‍රීවරුනි,

ඇමතිවරුනි, මේ ගැන මටත් යමක් කියන්න ඉඩ දෙන්න. රාජ නීති ක්‍රියාත්මක කිරීමට නන්දගේ කිසිම කැමැත්තක් නැතුවා සේම ඒ ගැන කිසිම හැකියාවක් නැති බව ද මා ඉතා හොඳින් දන්නවා. මගේ අදහස හැටියට රාජ කුමාර මහානාම මේ ගැන සිතුවොත් හොඳයි. මහානාම රජකමට ඉතාම සුදුසුයි. බුද්ධිමත් , දක්ෂ, අවුරුදු හයක්ම රාජ්‍ය සභාවේ ප්‍රධාන සම්පාදක හැටියටත් කටයුතු කර තියනවා. රටේ ජනතාව වෙනුවෙන් මේ බැරෑරුම් කාර්යය කරන්න කියලා මා විශේෂයෙන් ඉල්ලනවා,''යි බුදු රජාණන් වහන්සේ විශේෂයෙන් ඉල්ලා සිටියෝය. මහානාම දෑත් එකතු කර නමස්කාර කර රජකමක් කරන්න තරම් ශක්තියක් තමන්ට නැති බව කියා සිටියේය.

''සුදුසු වෙන කෙනෙකුට මේ බැරෑරුම් කාර්යය බාර දෙන්න,'' යැයි බුදුරජුන් ඇතුළු ඇමතිවරුන්ගෙන් මහානාම කුමරු ඉල්ලා සිටියේය. නමුත් බුදුරජානන් වහන්සේගේ අදහසට අනෙක් මන්ත්‍රී පිරිස එකඟ විණි. ''මහානාම මගේත් ජීවිතයේ අන්තිම පැතුම එයයි. මේ ගැන බුදුරදුන් තමන්ගේ අදහස දැන්නුවා. නුඹ ශාක්‍යවංශය අවුරුදු සියයක් පවත්වාගෙන යෑමට සමත්කම ඇති කෙනෙක් කියලා මට හොඳටම විශ්වාසයි අන්තිම හුස්ම හෙළමින් සිටියත් රජතුමා මහානාමගේ අත අල්ලගෙන රජතුමාගේ ජීවිතයේ අන්තිම කැමැත්ත ඉදිරිපිට මහානාම දණ නැමුවේය. මහානාමගේ කැමැත්ත පළ වූ විට රජතුමා සතුටු විය. ''මා දන් නිදහසේ දෑස් පියාගන්න තරම් ශක්තියක් ඇති කෙනෙක් හැටියට හිතනවා,'' යැයි රජතුමා පැවසීය. මහානාමට රජකම කරගෙන යන්න අනුශාසනා කරන්න බුදුරජානන් වහන්සේ ටික දවසක් කපිලවස්තුවේ නතර වනු ඇතැයි ද පැවසීය.

අවසන් හුස්ම හෙළීමට පෙර රජතුමා වරක් බුදුරදුන් දෙස බැලුවේය. ''මහානාම, නුඹගේ වංශය අවුරුදු සියයක් කිසිම කරදරයක් නැතිව පවතීවි,'' මෙම වචනත් සමඟ රජතුමාගේ කටහඬෙහි ශක්තිය අඩුවෙන්න ගත් බව පෙනිණි. මගේ අවශ්‍යතාව කොපමණ කොතැනකට අවශ්‍ය වන්නේ ඒ දක්වා මා නුඹ සමගයි,'' යනුවෙන් ද රජතුමා පැවසීය.

රජතුමාගේ දෙතොල් නලියන්න පටන් ගත්තේය. නමුත් දෑස දිලිසිණි. දෑස වසාගත් රජතුමා ජීවිතයෙන් සමුගත්තේය.

ගෝතමී සහ යශෝධරා අඬන්න පටන් ගත්තෝය. මන්ත්‍රී පිරිස හිස පහත් කරගෙන ශෝකයෙන් හරිත වන්නට විය. බුදුරජුන් රජතුමාගේ දකුණු අත තමන් අතට ගෙන අනෙක් අයට සන් හඬන්න එපා යැයි සන් කළෝය. දෙවන කාමරයට ගොස් අවසන් කටයුතු සූදානම් කරන්න යැයි ද උන් වහන්සේ කීහ.

ආදාහන කටයුතු සිදුකළේ දවස් හතකට පසුවයි. දහසකට වඩා බ්‍රාහ්මණ පිරිස ආදාහන කටයුතුවලට සහභාගී වූහ. පන්සියයකට වඩා භික්ෂූන් ද සහභාගී විය. පාරම්පරික වෛදික මන්ත්‍ර සමඟ බෞද්ධ භික්ෂූන්ගේ සූත්‍ර මැද ආදාහන කටයුතු සිද්ධ කෙරිණි. චතුරාර්ය සත්‍යය, පටිච්ච සමුප්පාදය ආදී ගාථා උච්ඡාරණය කරන ලදි. සියලුම සූත්‍ර මාගධී භාෂාවෙන් සිද්ධ විය. බුදුරදුන් චිතකයේ තුන් වටයක් ගොස් සැම කෙනෙක්ම ඉපදෙනව සේම ජරා මරණයට ගොදුරු වීම ස්වාභාවිකයි, ජීවත් වන සියලුම දෙනා මේ ගැන සිතිය යුතුයි යනුවෙන් පැවසූහ. මේ ගැන සිතීමෙන් ඊර්ෂ්‍යා කිරීම, අඬ දබර කිරීම ආදී සමාජයට අහිතකර සිතුවිලිවලින් මිදී යහපත් සමාජයක් බිහි කිරීමට ඉවහල් වන බව සඳහන් කළෝය.

සද්ධර්මය අවබෝධ කරගත් පුද්ගලයා ජන්ම, ජරා, ව්‍යාධි, මරණ කියන මේ ස්වභාව ධර්මය අනිවාර්යයෙන්ම අවබෝධ කරගත් පුද්ගලයා හැටියට හැඳින්විය හැකි බව ද උන් වහන්සේ සඳහන් කළෝය.

චිතකයට ගින්දර ඇතුළු කළ විගසම චිට්චිට් හඬින් ඉක්මනටම ගිනි ඇවිළිණි. මේ දක්වා භික්ෂූන් අනිත්‍ය පිළිබඳ එවකට දේශනා කර තිබුණු ගාථා සජ්ඣායනා කරමින් සිටියෝය. රජතුමාගේ චිතකයට ගින්දර දැල්වූයේ බුදුරජානන් වහන්සේයි. මේ දර්ශනය දැකගන්න කපිලවස්තුවේ බොහෝ ජනතාව එක් රැස් වී සිටියහ.

මාහානාම රජකමට පත් වී මාස තුනක් ගත වන තෙක් බුදුරජානන් වහන්සේ කපිල වස්තුවේ වැඩ සිටියහ. දිනක් ප්‍රජාපතී ගෝතමිය, නිග්‍රෝධාරාමයට පැමිණ භික්ෂූන් සඳහා සිවුරු රාශියක් පූජා කර අවසානයේ කාන්තාවන් ද භික්ෂුත්වයට ඇතුළත් කර ගන්නා මෙන් බුදුන් වහන්සේගෙන් ඉල්ලා සිටියාය. කාන්තාවනට

භික්ෂුත්වය ලබා ගැනීමට ඉඩ ලැබුණ හොත්, සාසනයේ චිරස්ථිතියට ඉමහත් රුකුළක්, ලාභයක් වනු ඇත යනු ඇයගේ විශ්වාසය විය.

තම පරම්පරාවේ බොහෝ තරුණයන් පිරිසක් පැවිදි වූ නිසා තරුණියන් විශාල පිරිසක් ද පැවිදි වීමේ අපේක්සාවෙන් පසුවන බවත් ඇය තවදුරටත් ප්‍රකාශ කළාය. ඇය ප්‍රකාශ කළේ සුදොවුන් රජතුමාගේ මරණයෙන් පසු තම එකම බලාපොරොත්තුව සදහම් මාර්ගයේ ගමන් කිරීම බවය. එය තම ජීවිතයට සතුටක් ලබා දෙන එකම කාරණය බව ඇය කීවාය. එහෙයින් ඇය තමාටත් භික්ෂු තත්ත්වයට පත්වීමට අවස්ථාව උදා කර දෙන ලෙස බුදුරදුන්ගෙන් ඉල්ලා සිටියාය.

බුදුන් වහන්සේ ඉල්ලීමට පසුව මඳ වේලාවක් නිහඬව සිටියෝය. ඉන්පසුව උන් වහන්සේ කීවේ, භික්ෂුණී සාසනයක් ආරම්භ කිරීම අපහසු බවය. මේ ප්‍රතික්ෂේප කිරීම අසා සිටි ප්‍රජාපතී ගොතමිය කියා සිටියේ, ''මේ කාර්යය සිදු කිරීම ඔබට අපහසු බව මට හොඳින් පැහැදිලියි. සංඝ සමාජයට කාන්තාවන් ඇතුළත් කර ගැනීමෙන් සමාජයේ විවිධ කතා ඇති වීමට ඉඩ ඇති බවත් ඒවාට පිළිතුරු දීමට සිදුවන බවත් මා පිළිගන්නවා. ඒ කාරණ පිළිබඳව ඔබ වහන්සේ කිසි දවසක බිය නොවන බවත් මම හොඳින් දන්නවා,'' යැයි ඇය කීවාය. බුදුරදුන් නැවත වරක් නිශ්ශබ්දව සිට, මෙසේ ප්‍රකාශ කළේය; ''රාජගිරියේ කාන්තාවන් බොහෝ පිරිසක් භික්ෂුණීන් වීමට බලවත් කැමැත්තෙන් සිටින බව මා දන්නවා. ඒත් ඒ ගැන පියවරක් ගන්නට තාමත් කාලය පැමිණ නැත,''යි බුදුන් වහන්සේ පැවසූහ.

භික්ෂුණී සාසනයක් ආරම්භ කිරීමට තමා බුදුරජාණන් වහන්සේගෙන් තුන්වරක්ම ඉල්ලා සිටියත් ඒ ඉල්ලීම උන් වහන්සේ විසින් ප්‍රතික්ෂේප කළ බව ප්‍රජාපතී ගෝතමිය කපිලවස්තු රජ මැදුරට ගොස් යශෝදරා සමඟ කීවාය.

ටික දිනකට පසුව බුදුරජාණන් වහන්සේ වෛශාලිය බලා පිටත් වී ගියහ. මේ අතර ගෝතමිය පැවිදිවීමට කැමති සියලුම කාන්තාවන් එක් රැස් කළාය. ඒ සියලු දෙනාම ශාක්‍ය වංශයේ අය වූහ. මේ අතර විවාහ දිවයට පත් නොවූ අය ද වූහ.

ගෝතමිය, සද්ධර්ම මාර්ගය සියලු දෙනාටම සමාන බව ද කාන්තා පක්ෂය ද පුරුෂ පක්ෂය මෙන්ම දක්ෂකම් ඇති පිරිසක් බව ද කියා සිටියාය.

''අප විසින්ම අපගේ හිස මුඩු කරගෙන, කසාවතින් සැරසී, පයින්ම විශාලාවට ගමන් කරමු,'' යැයි ඇය රැස්ව සිටි පිරිස අමතා යෝජනාවක් කළාය.

'' පයින්ම විශාලාවට ගොස් බුදුරජානන් වහන්සේගෙන් පැවිදි බව ඉල්ලා සිටිමු. මේ ගමනින් අපි බුදුරජානන් වහන්සේට පෙන්වා දෙමු, පැවිදි බව උන් වහන්සේගෙන් ඉල්ලා සිටීමට ඉතිරි වී ඇති එකම මාර්ගය මෙයයි.'' ගෝතමිය තවදුරටත් ඒ පිරිස ඉදිරියේ පැවසුවාය. පැමිණ සිටි, පැවිදිවීමට කැමති කාන්තාවන් සියලු දෙනාම ඒ යෝජනාවට එකඟ වූහ. ඔවුනට හොඳ නායිකාවක හමු වී ඇත. මේ සියල්ල අසා යශෝදරා සිනා පහළ කළාය. ගෝතමියගේ උතුම් කාර්යයේ ආරම්භයේ සිටම යශෝදරා සිටියේ මහත් වූ සතුටකිනි. මොනයම් කරදරයක දී වුව ද ගෝතමිය පසුපස්සට පියවර තැබූ කාන්තාවක නොවන බව ද යශෝදරා දැන සිටියාය. පා ගමනින් විශාලා නුවර කරා යන දිනය කාන්තාවෝ සියලු දෙනාම එක් රැස්වී තීරණය කළහ. මේ ගමනට එක් නොවන ලෙස ගෝතමිය, යශෝදරාගෙන් ඉල්ලා සිටියාය. ''අපේ උත්සාහය සාර්ථක වූ පසුව ඔබ නිවී සැනසිල්ලේ ඊට එක් විය යුතුය, යන බවයි මගේ අදහස,'' ගෝතමිය යශෝදරා සමඟ පැවසුවාය.

සියල්ල හොඳින් වටහා ගත් යශෝදරා එම අදහසට එකඟත්වය පළ කරමින් හිස සලා සිනාසුණාය.

## හතලිස් පස්වන පරිච්ඡේදය

# පැවිදි වීමට මග පෑදීම

එක් දිනක උදෑසන ජලය ගෙන ඒමට පොකුණ කරා යන අතරේ, මහා ප්‍රජාපතී ගෝතමිය ඇතුළු කාන්තාවන් පිරිසක් බුදුරජානන් වහන්සේගේ කුටිය අසල රැස්වී සිටින බව, ආනන්ද හිමියන් දුටුවේය. සියලුම කාන්තාවෝ හිස බූ ගා කහ පැහැති වස්ත්‍ර ඇඳගෙන සිටියෝය. සමහර අයගේ කකුල් ඉදිමී තිබිණි, යම් කිසි ප්‍රදේශයකින් බුදුරදුන් හමු වීම පිණිස කිසියම් භික්ෂු පිරිසක් පැමිණ ඇතැයි ආනන්ද හිමි මුලින් සිතුවේය. එහෙත් ඒ පිරිස අතර, හිස බූ ගා ගත් කසාවත් පෙර වූ ගෝතමිය දැක ආන්නද හිමි පුදුමයට පත්විය. ''ගෝතමිය, ඔබට මේ මොකද වුණේ? ඔබතුමියගේ දෙපයේ ලේ තැවරී ඇත්තේ ඇයි? ඔබතුමිය ආවේ කොහේ ඉඳලා ද? ඔබතුමිය මෙවැනි තත්ත්වයකට පත් වූයේ ඇයි?'' යනුවෙන් ද ආනන්ද හිමියෝ ගෝතමියගෙන් ඇසුවාය.

මහා ප්‍රජාපතී ගෝතමිය පිළිතුරු දුන්නාය; ''ගෞරවණීය ආනන්ද හිමියනි, අපි අපේ හිස මුඩු කර ගත්තා; අපිම කසාවත් හැඳ ගත්තා; මේ සංසාරයේ අපි ළඟ දැන් කිසි දෙයක් නැහැ.

කපිලවස්තුවෙන් පිට වී දවස් පහළොවකිනුයි අපි මේ පළාතට අද ආවේ! මහ පාරේ නිදාගෙන ඉඳලා; පුංචි ගම්මානවල පිණ්ඩපාතේ කරලයි අපි අද මෙහාට ආවේ. අපි භික්ෂුනී ජීවිතයට අනුව ජීවත් විය හැකි පිරිසක් බව පෙන්වා දෙන්න අපි මෙහෙම කළේ. ආනන්ද හිමියනි, කරුණාකර අපි සියලු දෙනා වෙනුවෙන් බුදුරජාණන් වහන්සේට කරුණු ඉදිරිපත් කරන්න. අපි භික්ෂුණී සාසානයට ඇතුළත් කර දෙන්න.'' ආනන්ද හාමුදුරුවන්ගේ පැනවලට පිළිතුරු වශයෙන් උන් වහන්සේගෙන් ගෝතමිය ඇයැද සිටියාය.

''මෙතැන නතර වී සිටින්න. මම බුදුරජානන් වහන්සේ හමු වී මේ ගැන කතා කරන්නම්. මගෙන් ඉටු විය යුත්තේ කුමන යුතුකමක් ද මා එය ඉටු කරන්නම්,'' යනුවෙන් පැවසූ ආනන්ද හිමියෝ බුදු කුටියට ඇතුළු වූහ.

බුදුරජානන් වහන්සේගේ කුටියට ආනන්ද හිමියන් ඇතුළු වන විට, උන් වහන්සේ සිවුරු පොරවමින් සිටියෝය. ආනන්ද හිමියෝ තමන් වහන්සේ දුටු සියල්ල බුදුරජානන් වහන්සේ ඉදිරියේ විස්තර කළෝය. එහෙත් බුදුරදුන් කිසිවක් ප්‍රකාශ නොකළහ.

''ගුරු දේවයාණෙනි, ස්ත්‍රී බුදු සසුනේ පැවිදි කිරීමට සුදුසු ද?'' යනුවෙන් ආනන්ද හිමියෝ බුදුරදුන්ගෙන් අසා සිටියහ.

''ඒ ගැන සැක කරන්න එපා,''යැයි බුදුරදුන් ඊට පිළිතුරු වශයෙන් පැවසූහ.

''එය එසේ නම්, ඔබ වහන්සේ කාන්තාවන් සංඝ සමාජයට ඇතුළත් නොකර ගන්නේ ඇයි?'' යනුවෙන් ආනන්ද හිමියෙන් ප්‍රශ්න කළේය. ''ගෝතමිය, ඔබ වහන්සේ පුංචි කාලයේ කවා පොවා, තමන්ගෙන්ම පුතනුවන් ලෙස හදාවඩා ගත්තා. අද හිස මුඩු කරගෙන කසාවතින් සැරසී, කපිලවස්තුවේ සිට, පා ගමනින් මෙහි විත්, පුරුෂයන්ට මෙන්ම කාන්තාවන්ටත් යමක් කිරීමේ ශක්තිය ඇති බව පෙන්වා දී තිබෙනවා. ඒ අයට අනුකම්පා කරන්න. ඒ අයටත් බුදු සසුනේ සතුට ලබන්න අවස්ථාව උදා කර දෙන්න,'' නැවත වතාවක් ආනන්ද හිමි බුදුරදුන්ගෙන් ඉල්ලා සිටියෝය.

මඳ වේලාවක් නිහඬව සිටි, බුදුන් වහන්සේ, ශාරිපුත්ත, මොද්ගල්ලාන, භද්දිය, කිම්බිල හා මහා කාශ්‍යප යන තෙරුන් වහන්සේලාට තමා හමුවට පැමිණෙන ලෙස පණිවුඩ යැවූහ. මේ

තෙරුන් වහන්සේලාගේ පැමිණීමෙන් පසුව, කාන්තාවන් සංඝ සමාජයට ඇතුළත් කර ගැනීමේ කාරණය පිළිබඳව දිගින් දිගටම සාකච්ඡා කෙරිණි.

බුදුරජාණන් වහන්සේ කියා සිටියේ, ''මා කිසිම භේදයක් ගැන කල්පනා කළේ නැහැ. මා කල්පනා කළේ කාන්තාවන් බුදු සසුනේ පැවිදි වීමෙන් පසුව භික්ෂූන් අතර ඇති වන ගැටලු ගැන පමණයි,'' යනුවෙනි.

සාකච්ඡාවට බඳුන් වූ සියලු කරුණු ගැන කල්පනා කළ ශාරිපුත්‍රයෝ, අවුරුදු දහස් ගණනක සිට, අප සමාජය කාන්තාවන් පහත් තත්ත්වයක ලා සැලකූ නිසා, මේ ප්‍රශ්නයේ දී, මීට වඩා උදාරව සිතා කටයුතු කළ බව කීවෝය. ඒ අනුව උන් වහන්සේ භික්ෂුණීන් විසින් පිළිපැදිය යුතු කරුණු අටක් ගෙන හැර පෑයේය.

''පළමු කාරණය හැටියට භික්ෂුණීන්ට දනුම් දෙන්න ඕනෑ භික්ෂූන්ට සම්මාන ගෞරව කිරීමට අධික වුවත් මතක තියාගන්න ඕනෑ කියලා. භික්ෂුණීන්ගේ වයස කොපමණ අධික වුවත් භික්ෂුව වයසින් අඩු වුවත් ඒ කාර්යය ඒ ආකාරයෙන්ම සිදු විය යුතු බව.

''වස්සාවාස කාලයේ දී භික්ෂූන් වස් වසන සමීපයකම භික්ෂුණීන් ද වස් සමාදන් වීම සිදු කළ යුතු අතර ධර්ම විනය පිළිබඳ ප්‍රශ්න සාකච්ඡා කිරීමට එය පහසු මාර්ගයක් කරගත යුතු බව දෙවන කරුණ හැටියට හැඳින්වුවා.

භික්ෂූන් සමඟ සාකච්ඡා කර උපෝසථය මාසයේ දවසක තීරණය කිරීම තුන් වන කරුන හැටියට දන්වා සිටියා.

''යම් කිසි භික්ෂුණියක් විනය නීති කඩ කළ හොත් ඒ බව භික්ෂුණීන් මෙන් ම භික්ෂූන්ටත් විස්තර සහිතව දැන්විය යුතු බව පස්වන කරුණු හැටියට සඳහන් කළා.

සාමනේරී කාලය අවසන් වූ විට උපසම්පදාව සඳහා භික්ෂුණීන් මෙන්ම භික්ෂූන් වෙත ඒම හයවන කරුණ හැටියට දැන්වූවා.

''කිසිම භික්ෂුණියක් කවර සිද්ධියක දී වත් භික්ෂූන් විවේචනය කිරීම නොකළ යුතුයි කියා හත්වන කාරණය දන්වා සිටියා.

''කිසිම භික්ෂූණියක් කවර සිද්ධියක දී වත් භික්ෂූන්

විවේචනය කිරීම නොකළ යුතුයි කියා හත්වන කාරණය දන්වා සිටියා.

''කිසිම භික්ෂුණියක් කිසිම භික්ෂූන් වහන්සේ නමකට ධර්ම දේශනා නොකළ යුතුයි කියා අටවන කාරණය දන්වා වදාළා.

මේ නියම අට පැනවීම ඉතා අවශ්‍ය වන්නේ, ගෝතමිය ඉතා බලසම්පන්න වීම නිසා බව ද භද්දිය හිමියෝ පැවසූහ. ''එසේ ම ගෝතමිය අප ආචාරින් වහන්සේගේ ආදරණීය සුළු මෑණියන් වහන්සේ. මේ නීති අට නොමැතිව බුදුරජානන් වහන්සේට හැර වෙන කෙනෙකුට ඇය පාලනය කිරීමේ හැකියාවක් නැහැ,'' යි යනුවෙන් භද්දිය හිමියෝ උන් වහන්සේගේ අදහස විස්තර කර දැක්වූහ.

බුදුරජාණන් වහන්සේ ආනන්ද හිමියන් දෙසට හැරී, ''මේ නීති අට මහා ප්‍රජාපතී ගෝතමිය ඇතුළු අනෙක් පිරිස, පිළිගැනීමට සූදානම් නම්, ඔවුනට භික්ෂුණී සාසනයට ඇතුළත් වීම අපහසු වන්නේ නැහැ,'' යි පවසා සිටියෝය. ඒ වන විට හිරු මුදුන් වී තිබිණි. ගෝතමිය ඇතුළු අනෙක් සියලුම කාන්තාවන් ධෛර්ය සම්පන්නව බලාපොරොත්තු සහගතව බුදුකුටිය අසල රැඳී සිටින බව ආනන්ද හිමියන්ට දැක ගත හැකි විය.

පැනවීමට අදහස් කරන ගරු නියම අට පිළිබඳව පැහැදිලි විස්තරයක් ආනන්ද හිමියන් විසින් ගෝතමිය වෙත ඉදිරිපත් කරන ලදි. ඒ ඇසූ ගෝතමිය මහත් සතුටට පත් වූවාය. ''සුවඳ ජලයෙන් නැහැවූ කාන්තාවන් ඉන් පසු කොණ්ඩයේ මල් ගසා ගන්නා සේ මේ ගරු නියම අට ඉතාම සතුටින් මා ඇතුළු සියලු දෙනා භාර ගන්නා බව බුදුරජාණන් වහන්සේට දන්වන්න,'' යැයි ඇය ආනන්ද හිමියන්ගෙන් ඉල්ලා සිටියාය. පැවිදි බව ලැබීමෙන් පසුවත් ජීවිතාන්තය දක්වාම මේ ගරු ධර්ම අට අනුගමනය කරන බවට ගෝතමිය පොරොන්දු වූවාය. සියලුම කාන්තාවෝ ගෝතමිය දෙස බලාගෙන සිටියහ. ආනන්ද හිමියන් බුදු රජාණන් වහන්සේගේ කුටියට ගොස් ගෝතමියගේ පොරොන්දුව ගැන උන් වහන්සේට විස්තර කර දුන්නෝය.

''සහෝදරියනි, කලබල වෙන්න එපා. භික්ෂුණීභාවය අපට ලැබෙන බව ඒකාන්තයි,'' ඒ පිළිබඳ මාර්ගය අපට පෑදී ඇත. ගෝතමිය අනෙක් කාන්තාවන් අමතා කීවාය.

සියලුම සාකච්ඡා අවසානයේ පනස් එක් නමක් වූ කාන්තාවන්ට භික්ෂුණී සාසනයට ඇතුළත් කර ගන්නා ලදි.

ශාරිපුත්ත මහ රහතන් වහන්සේගේ අනුසාසනා පරිදි අම්‍රපාලි අඹ වනයේ භික්ෂුණීන් හට ආවාස පහසුකම් සූදානම් කෙරිණි.

භික්ෂුණීන් හට සාධනා සඳහා අවශ්‍ය මූලික කටයුතු සියල්ල උගන්වන ලෙස බුදුරජාණන් වහන්සේ ශාරිපුත්ත මහ රහතන් වහන්සේට නියම කරන ලදි.

පැවිදි බිමට ඇතුළු වී දින අටකට පමණ පසුව බුදුරජානන් වහන්සේ හමුවට පැමිණි ගෝතමී භික්ෂුණිය, ''ස්වාමිනී, සසරින් එතෙර වීමට ඇති කෙටිම මඟ කුමක් ද?'' යැයි විමසා සිටියාය.

''ඉතාමත්ම වැදගත් මඟ හා ප්‍රධාන මාර්ගය සිත පාලන කර ගැනීමයි,'' ඊට පිළිතුරු වශයෙන් බුදුරදුන් පැවසූහ.

විශාලා මහනුවරට භික්ෂුණී ආරම සෑදීම වඩාත් සුදුසු යැයි ගෝතමී භික්ෂුණිය අදහස් කළාය. බුදුරජානන් වහන්සේ සමඟ සිටීමෙන් ධර්ම ලාභය මෙන්ම ධර්ම ඥානය ද අත්කර ගැනීමට පහසු නිසාය, ගෝතමී භික්ෂුණිය එසේ කල්පනා කළේ. කපිලවස්තුවේ ද භික්ෂුණී ආරාමයක් පිහිටු වීමට ඇය අදහස් කළාය. කාන්තාවන් හට භික්ෂු සාසනයට ඇතුළත් වීමට අවස්ථාව ලැබී ඇති බව පණිවුඩකරුවකු අත යශෝදරා වෙත දන්වා යැවීමට ද ගෝතමිය කටයුතු කළාය.

එසේම කාන්තාවන්ට පැවිදි වීමට ඉඩ සලසා දීමෙන් සමාජයේ විවිධ මතිමතාන්තර පැතිර යා හැකි බව ද ඒ සමඟ ම, බුදුරජානන් වහන්සේට හා මහා සංඝයාට අවමන් කිරීමට ඉඩ ප්‍රස්ථා උදා විය හැකි බව ද ගෝතමී භික්ෂුණිය දැන සිටියාය. භික්ෂුණී සාසනය ආරම්භයේ දී ගරු නියම අටක් පැනවීම අවශ්‍ය වුවත් භික්ෂුණී සාසනය ක්‍රමානුකූලව සංවිධානය වූ පසුව අවශ්‍ය පරිදි ඒවායේ වෙනස්කම් සිදු කළ හැකි බව ද ගෝතමිය විශ්වාස කළාය.

බුදු සසුනේ භික්ෂු, භික්ෂුණී, උපාසක හා උපාසිකා යන සිව් පිරිස මේ වන විට සම්පූර්ණ වී තිබිණි. භික්ෂුණීන්ගේ සිවුරු හැඳීමේ ක්‍රමය පිළිබඳව විමර්ශනය කළ ගෝතමිය එහි යම් යම් වෙනස්කම් සිදු කළ යුතු යැයි අදහස් කළාය. ඒ අදහස්වලට බුදුන් වහන්සේ ද අනුමැතිය ලැබිණි. තමතමන්ගේ වස්ත්‍රවලට අමතරව තව එක පාත්‍රයක් ද තබා ගැනීමට භික්ෂුණීන්ට අවසර ලැබිණි. මාසයකට දෙවරක් හිස මුඩු කර ගැනීමට ද ඔවුනට නියම විය.

# හතලිස් හය වන පරිච්ඡේදය
# ඇට්ටේරියා කොල මිට

රජගහනුවර වේළුවනය, වෛශාලියේ කූටාගාර ශාලාව, ශ්‍රාවස්තියේ ජේතවනය යන ස්ථාන තුන ම ධර්ම සාකච්ඡා භාවනා ආදී ධාර්මික කටයුතුවල කේන්ද්‍ර හැටියට ප්‍රසිද්ධ වුණා. මගධය කෝසලය සහිත අනෙක් ප්‍රාන්ත රාජ්‍යයවල ද පුංචි පුංචි විහාර සෑදීම ආරම්භ විය. කහ සිවුරු පොරවාගත් භික්ෂූන් ගැන කවුරුත් කරුණු දැනගෙන හිටියහ. බුදු වීමෙන් වසර හයක්ම ගත වීමත් සමඟ බුදු දහමේ ප්‍රචාරක කටයුතු ක්‍රමාණුකූලව සිද්ධ විය. හය වන වස මකුල පර්වතයේ සහ හත් වන වස සංකස්ස පුරයේ බුදුන් වහන්සේ වැඩ සිටියහ. අටවන වස භග්ගයේ සුංසුමාර ගිරියෙහි වැඩ විසූ අතර නව වන වස කොසම්බියෙ වැඩ සිටියෝය. එක ප්‍රසිද්ධ විහාරයක් ගොෂිරා වනයේ ද ඉදි විය. ගෝෂිරා වනයේ බුදුරදුන් වස් වසන සමයේ සැරියුත්, මුගලන්, මහා කාශ්‍යප, ආනන්ද, රාහුල ආදී ප්‍රධාන පෙළේ භික්ෂූන් වහන්සේ බුදුන් වහන්සේ හමුවට පැමිණියෝය.

ගෝෂිරාමයෙහි (සෝෂිතාරාමය) ඇට්ටේරියා ගස් බොහෝ තිබිණි. (සිරිංසපා) උෂ්ණය අධික වූ විට මෙකී ගස් යට භාවනා කිරීම සිරිතක්ව පැවතිණි..

දවසක් බුදුරදුන් භාවනාවෙන් පසුව ඇට්ටේරියා කොළ මිටියක් අතට ගෙන භික්ෂූන් ඉදිරිපිටට පැමිණියෝය. එසේ පැමිණ කොළ මිට පෙන්වා ''වඩා අධික වන්නේ මගේ අතේ ඇති කොළ ගණන ද, නැත්නම් වනාන්තරයේ ඇති කොල ගණන ද? යනුවෙන් ඇසුවෝය.

භික්ෂූන් වහන්සේලා උත්තර දුන්නා ''අතේ ඇති කොළ ගණනට වඩා වනාන්තරයේ ඇති කොළ ගණන වැඩි යි යනුවෙන් භික්ෂූන් වහන්සේ පිළිතුරු දුන්හ.

''එසේ නම් ඔබ සැම මෙසේ සිතන්න. මා දුන් ධර්ම උපදේශ මේ අතේ ඇති කොළ ගණනට සමානයි. එහෙත් නොදුන් ධර්ම උපදේශයන් මේ වනයේ ඇති කොළ ගණනට සමානයි. මා ඔබ සැමට දේශනා කළේ ඔබ සැමටම අවශ්‍ය ප්‍රමාණය පමණයි. ඔබ සැමගේ ජීවිතයට අවශ්‍ය ප්‍රමාණය කොපමණ ද එම ප්‍රමාණය මා දේශනා කළා. ඊට වඩා දේශනා කිරීම කාලය අපතේ යැවීමක් පමණයි කියා මා හිතනවා,'' යැයි බුදුන් වහන්සේ තවදුරටත් ප්‍රකාශ කළෝය.

බුදුරදුන් මේ කරුණ ඝෝෂිතාරාමයේ දී දේශනා කිරීමට හේතු වූයේ එහි සිටි බොහෝ භික්ෂූන් බොහෝම දුරට දාර්ශනික ප්‍රශ්නවලට මැදි වී ඒ ගැන සාකච්ඡා කරමින් සිටි හෙයිනි. භික්ඛු මාලුක්‍යපුත්ත බොහෝ විට අනවශ්‍ය දාර්ශනික ප්‍රශ්නවලට මැදි වී කරදර වන ආකාරය බුදුරදුන් දුටුවෝය. බුදු හාමුදුරුවෝ මාලුක්‍යපුත්තට සද්ධර්ම මාර්ග සාධනා ආදියට අවශ්‍ය දේ හැර අනෙක් අනවශ්‍ය ප්‍රශ්න ඇද කෙරෙහි අවධානය යොමු නොකරන ලෙස බුදුරදුන් මාලුක්‍යපුත්ත හිමියන් අමතා කීවෝය.

මාලුක්‍යපුත්ත හැමවිටම ඇසුවේ කිසිම තේරුමක් නැති කිසිවෙකුටත් පලක් නැති ප්‍රශ්නයි. ලෝකයේ අනන්තයක් තියනවා ද? ලෝකය ස්ථිර ද?, ලෝකය මායාවක් ද? ආදි දේ මාලුක්‍යපුත්තගේ සිතට නිතර ඇති වූ ප්‍රශ්න වියි. බුදුරදුන් කිසි දාක මේ වැනි ප්‍රශ්නවලට පිළිතුරු දුන්නේ නැත. බුදුරදුන්ගේ නිහඬතාව මාලුක්‍යපුත්තට ඉවසුම් නො දෙන කරුණක් විය. අන්තිමේ දී ඔහු තීරණය කළා බුදුරදුන් තමන් ප්‍රශ්නවලට පිළිතුරු නොදෙන්නේ නම් තමා බුදුන් සහිත ත්‍රිවිධරත්නය අත්හැරීමට මාලුක්‍යපුත්ත හාමුදුරුවෝ අවසානයේ තීරණය කළහ. ඔබ වහන්සේට මේ ප්‍රශ්නවලට පිළිතුරු දීමට හැකියාවක් නැත්නම්

ඒ ගැන ද කියන්න. එසේ පිළිතුරු දෙන්න බැරිනම් මා පැවිදි බවත් අත්හැරීමට සූදානම්,'' යැයි ඔහු සඳහන් කළේය.

බුදුරදුන් මාලුක්‍ය දෙස බලා සිනා සී ''ඔබ පැවිදිවන විට මේ ආකාර ප්‍රශ්නවලට පිළිතුරු දියයුතු බවත් සඳහන් කළේ නැහැ නේ ද? එහෙම නූනොත් පැවිදි බව අත්හරින බවක් සඳහන් කළේ නැහැ නේ ද? යැයි ඇසුවෝය. ''මා ඔබට පැවිදි වීමට කීවේ නැහැ නොවේ ද?'' යනුවෙන් ද ප්‍රශ්න කළෝය.

''ගුරු දේවයාණනි එහෙම දෙයක් ඔබ තුමන් හා මා අතර සිදුවුණේ නැහැ,'' යි මාලුක්‍යපුත්ත කීහ.

''එසේ නම් නුඹ ඇයි මගෙන් මෙහෙම ප්‍රශ්න අහන්නේ? නුඹ මට පෙනෙන්නේ මේ වාගේ කෙනෙක්. යම් කිසි පුරුෂයෙකුට විෂ ඊ තළයක් විද්ද විට එකී විෂ ඊ තළය වැදුණ තැන බෙහෙත් කරන්නේ නැතිව ප්‍රශ්න වැලක් අහගෙන අහගෙන යනවා. තුවාලයට බෙහෙත් දැමීමක් නොකරන බැවින් එය තවතවත් උත්සන්න වෙනවා හැර වෙන දෙයක් මෙයින් සිද්ධ වෙන්නේ නැහැ නේද?'' යනුවෙන් ද බුදුරදුන් ප්‍රකාශ කළෝය.

''ඊ තළය විද්දේ කවුද? ඒ පුද්ගලයාගේ ජාතිය කුමක් ද? මොන පළාතේ කෙනෙක් ද? පාට කොහොම ද? උස කොහොම ද? ඒ පුද්ගලයා හැර වෙන නෙනෙක් විද්දේ නැද්ද? ඒ පුද්ගලයා ඔබවම ඊ තළය විදීමට තෝරා ගත්තේ ඇයි? ඊ තළය විදීමට උපයෝගී කරගත් ක්‍රමය කුමක් ද? මොන විෂ ද ඊ තළයට පොවා තිබුණේ? මේ ප්‍රශ්න වලට උත්තර දිදී ඉන්න විට ලෙඩා බෙහෙත් නැතුව මිය යෑම ස්වාභාවික නේ ද? යනුවෙන් උන් වහන්සේ විමසා සිටියෝය.

''දුකින් නිදහස් වීමට අවශ්‍ය කරුණු පමණක් මා ඔබ සැමට ම දේශනා කළා. සමාජයේ සතුටින් ජීවත් වීමට සහයෝගයෙන් ජීවත් වීමට දුකින් නිදහස් වීමටයි කවුරුත් මහන්සි වෙන්නේ. ඒ සඳහා අවශ්‍ය උපදෙස් මා අවබෝධ කරගත් දහමෙන් මා ඔබට දේශනා කළා. ඒ ගැන සිත යොමන්න කිව්වා. අනවශ්‍ය කිසි දෙයක් මා ඔබ සැමට ඉගැන්නුවේ නැහැ,'' යනුවෙන් ද පැවසූහ.

''දුකේ ස්වභාවය, දුකට හේතුව, එකී දුක් නැති කිරීම හෙවත් සැපය හා දුක නැති කිරීමේ හෙවත් සැපය ලැබීමේ උපාය ආදිය මා විසින් කියලා දුන්නා. ඒ අදහස් මමත්වය භාව හීනතාව

සැප දුක නිරපේක්ෂතාව, ශාන්ති සහ මුක්තිය (නිවන) ලබාගැනීමට උපකාර වෙනවා. ඉන් පිට කිසි දේකට මා පිළිතුරු දීමට සූදානම් නැහැ,'' බුදුරදුන් ප්‍රකාශ කළහ. මාලුක්‍යපුත්ත ලැජ්ජාවට පත්ව මෝඩ ප්‍රශ්න ඇසීම ගැන සමාව ඉල්ලා සිටියේය. සියලුම භික්ෂූන්ට අනවශ්‍ය ප්‍රශ්න වලින් මිදී අවශ්‍ය දේ ගැන පමණක් හිත යොමු කරන ලෙස අවවාද බුදුරදුන් අවවාද කළෝය.

සෝෂිතාරාමය සාදා පූජා කළ උපාසක තුමා කුක්කුටාරාමය සහ පාවාරිකම්බ යන විහාර දෙක සාදා පූජා කිරීමට ද යෝජනා කළෝය. හතරවන විහාරය භද්‍රිකාවෙහි සාදා දුන්නේය.

අනෙක් විහාරවල මෙන් සෝෂිතාරාමයේ ද බුද්ධ දේශනාව කට පාඩම් කිරීම ආරම්භ විය. කට පාඩම් කරන භික්ෂූන්ට සූත්‍රාචාර්ය නම ව්‍යවහාර කරන ලදි. එවකට බුදුන්ගේ වචන සූත්‍ර නම්නුයි හැඳින්විය. ධර්මචක්‍ර සූත්‍රයේ මෙකී සියළුම ධර්ම කරුණු අඩංගු සාරාංශය හැටියට දැක්විය හැකියි. සූත්‍ර කටපාඩම් කර මාසකට දෙවරක් සැමට ඇසීමට දේශනා කිරීම සිරිතක් ව තිබිණි.

සූත්‍රාචාර්යට අමතරව ශීලාචාර්යවරු ද සිටියහ. මේ අය පංච ශීල, දස ශීල, සාමනේර ශීල, උපෝසථ ශීල ආදී ශීල ගැන විශේෂතාවක් දැක් වූ අය හැටියට සැලකේ. වයස අවුරුදු විස්සට අඩු අය සාමණේර ශීලය ආරක්ෂා කළ අයයි.

සෝෂිතාරාමයේ දී සුළු ප්‍රශ්නයක් නිසා සූත්‍රාචාර්ය සහ ශීලාචාර්යවරුන් අතර මත භේදයක් හට ගත්තේය සුළු කතාවක් නිසා ඇති වූ විවාදය පසුව මහා විශාල සටනක් බවට පරිවර්තනය විය. සංඝ සමාජය කොටස් දෙකකට බෙදිණි. සූත්‍රාචාර්යවරු වැසිකිලියට ගොස් භාජනයේ වතුර ඉතිරි කර ආහ. නියමය වී ඇත්තේ අතපය සේදූ පසු භාජනයේ වතුර ඉතිරි නොවන ආකාරයට මුනින් අතට හරවා තැබීමයි. නමුත් සූත්‍රධාරී භික්ෂූව ජලය සමඟ භාජනය ඒ ආකාරයෙන්ම තබා ආවේය. මේ කාරණය දුටු ශීලාචාර්යවරු (විනයාචාර්ය) දොස් කීමට පටන් ගත්හ. දැන දැන භාජනයේ ජලය ඉතිරි නොකළ බවත්, මේ නිසා මේ කාරණය ඒ තරම් දෝෂයට කරුණක් හැටියට නොසලකන ලෙසත් සූත්‍රාචාර්ය සඳහන් කළේය. දෙපක්ෂයේ ශිෂ්‍ය පිරිස ද දෙකොටසකට බෙදීම නිසා ප්‍රශ්නය එන්න එන්න උග්‍ර විය. එක් පක්ෂයක් දෙවන පක්ෂයට මෝඩයින්ගේ පක්ෂය කියලත් අවනම්බු කළහ.

සූත්‍රාචාර්ය වරයා මාසෙකට දෙවරක් සිද්ධවන සංඝ සභාවට සහභාගී වීමේ දී සියලු දෙනාම ඉදිරියේ මේ ගැන සවිස්තරව කියා සමාව ඇයදියේ නැත්නම් ප්‍රශ්නය තවත් උග්‍ර විය හැකි බව විනයාචාර්ය ප්‍රසිද්ධියේ ප්‍රකාශ කර සිටියේය.

තත්වය දිනෙන් දින උග්‍ර වුණා. දෙපක්ෂය එකිනෙකාට දොස් කියන්න පටන් ගත්තා. දෙපැත්තටම අවශ්‍ය පිරිස සිටියත් නිහඬව සිටි පිරිසක් ද සිටියේය. මේ ප්‍රශ්නය ඉතා නරක පැත්තට ගමන් කරන බවත් තව ටික දිනකින් උග්‍ර තත්වයකට පත්විය හැකි බව මධ්‍යස්ථව සිටි අය පැවසූහ. මේ සිද්ධිය නිසා සංඝයාගේ හානියට හේතුවක් මිස යහපතක් නොවන බව තේරුම් ගත්තේය. මේ සියල්ලම සිදුවෙද්දී බුදුරජුන් ඝෝෂිතාරාමයේ වැඩ සිටියෝය. නමුත් විෂය පිළිබඳ භික්ෂූන් බුදුරජානන් වහන්සෙ සමීපයට පැමිණ කරුණු ඉදිරිපත් කරන තෙක් මේ සිද්ධිය ගැන බුදුරජාණන් වහන්සේ සිත යොමු කළේ නැත. කාරණය බුදුරජාණන් වහන්සේ ගේ කණට වැටුණු විට බුදුරජුන් ශීලාචාර්යවරයා ළඟට ගොස් කිසිම දෙයක් පමණට වඩා අන්තය දක්වා ගොස් වාද විවාද කිරීම අහිතකර බව ප්‍රකාශ කර සිටියේය. බුදුන් වහන්සේ සූත්‍රාචාර්යවරයා හමුවීමට ගොස් එසේම ප්‍රකාශ කළෝය. ආපසු පැමිණෙන අතර දෙපක්ෂයම තමන් කියූ කරුණු සලකා මත භේදය අතහැර, සියලු දෙනාම සමගි වනු ඇතැයි උන් වහන්සේ සිතුවෝය.

නමුත් බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව දෙපක්ෂයට කිසිම සැලකිල්ලකට ගත්තේ නැත. දෙපැත්තටම කරුණු කියා සමගි කරවන්න තරම් ශක්තියක් මධ්‍යස්ථව සිටි භික්ෂූන්ට තිබුණේ නැත. මේ ප්‍රශ්නය උපාසකවරුන්ගේ අතරටත් පැතිරිණි. අනෙක් ධර්ම සම්ප්‍රදාය අනුගමනය කරන අයගේ අතරටත් මේ ප්‍රශ්නය පැතිරිණි. සංඝ සමාජයේ සමගිය සඳහා මේ ප්‍රශ්නය අති ගම්භීර විය. මධ්‍යස්ථ භික්ෂූන් ඉවසීම දරාගත නොහැකිව බුදුරජාණන් වහන්සේගෙන් තව වරක් මේ කාරණයට හිත යොමු කරන්න ලෙස ඉල්ලා සිටියෝය.

බුදුරදුන් සඟළ සිවුරු පොරවාගෙන විහාරයේ සභා ගැබට වැඩම කළෝය. සියලුම භික්ෂූන්ට තමන් ළඟට පැමිණෙන දන්වමින් සණ්ටාරය නාද කළෝය. සියලුම දෙනා එක තැනකට එකතු වූ විට බුදුරදුන් ඒ අයට වාද විවාද වල ඇති අහිතකර බව විස්තර කර දුන්නෝය. මේ නිසා වාද විවාද අත්හරින ලෙස දැනුම්

දුන්හ. එසේ නොමැති නම් සංඝයාගේ බෙදීම අනිවාර්යයෙන්ම සිදුවිය හැකි බව පැවසූහ. කරුණාකර කවුරුත් කුටිවලට ගොස් ධ්‍යාන භාවනා කරන ලෙස දන්වා සිටියෝය. ''යම් කිසි විධියකින් අප සියලුම දෙනා ලාභ අපේක්ෂාවෙන් තොරව ධ්‍යාන භාවනා කළේ නැත්නම් අහංකාර සහ ක්‍රෝධය මානය ආදිය වර්ධනය වීම හැර වෙන ලැබෙන ලාභයක් නැත,'' යි ද උන් වහන්සේ ප්‍රකාශ කළෝය.

එක භික්ෂූන් වහන්සේ නමක් නැගී සිට ''ස්වාමීනි ඔබ වහන්සේ මේ ප්‍රශ්නයෙන් ඈත්වෙනවා නම් ඉතා හොඳයි. මේ ප්‍රශ්නය මේ අයම විසඳගනීවි'' යනුවෙන් පැවසීය.

මේ භික්ෂුවගේ ප්‍රකාශය අසා මුළු සභා ගර්භයම නිහඬ විය. බුදුරජුන් නිහඬව සභාවෙන් පිටත් වී කුටියට ගොස් තම පාත්‍රය අතට ගෙන පිණ්ඩපාතය සඳහා කෝසම්බිය බලා පිටත් වූහ. බුදුරජුන් තමන් ලබාගත් පිණ්ඩපාතය සෙවනක පාඩි වී තනිවම වැළඳුවෝය. දානයෙන් පසුව ගඟ ඉවුර දිගේ තනිවම වැඩම කළහ. තමන් යන්නේ කොහාටද කියා අඩුම තරමින් ආනන්දටවත් පැවසුවේ නැත.

බුදුරජුන් ක්‍රමයෙන් බාලක ලෝන ගම වෙත ළඟා විය. එහි දී තම ශිෂ්‍ය භගු හමු විය. තමන් සමග වනයට වඩින ලෙස භගු බුදුරජුන්ගෙන් ඉල්ලා සිටියේය. භගු එකී වනයේ තනිවම භාවනා කළ භික්ෂූන් වහන්සේ නමක් විය. භගු බුදුරජාණන් වහන්සේට සඟළ සිවුරක් සහ අතපය සේදීමට පැන් ගැනීමට භාජනයක් පූජා කළේය. බුදු හාමුදුරුවෝ භගුගෙන් ඇසුවෝය. භාවනා ආදී කටයුතු ඉතා හොඳින් සිදු වෙනවා ද යනුවෙන්ය. භාවනාවෙන් බොහෝම හොඳ ප්‍රතිපල ඇති බව භගු ප්‍රකාශ කළේය. භගු වනයේ තනිවමයි භාවනා කළේ. හුඟාක් දෙනෙක් ළඟ ඉන්නවට වඩා ඉඳහිට තනිවම හිටීමත් හොඳයි,'' බුදුරදුන් පැවසූවෝය.

භික්ෂු භගුගෙන් සමු ගත් බුදුරදුන් වේළුවනය බලා වැඩම කළහ. අනුරුද්ධ නන්දිය සහ කිම්බිල සිටි ස්ථානයට බුදුරදුන්ව කැටුව ගියේය. ඒ අය බුදුරජුන්ව දැක සතුටට පත් වූහ. කෙනෙක් බුදුරජුන්ගේ සිවුර ගත් අතර තව කෙනෙක් පාත්‍රය අතට ගත්තේය. උණ බට තලා සෑදූ ඉලපතකින් පොළොව පිස දමා බුදුරජාණන්

වහන්සේට වැඩ සිටීමට අවශ්‍ය ආසනයක් පනවා දී බුදුරජාණන් වහන්සේගේ අතපය සෝදා දෑත් එකතු කර නමස්කාර කළහ.

සියලුම දෙනා වාඩි වූ පසු බුදුරදුන් ඔබ වහන්සේලා සියලු දෙනා මේ ප්‍රදේශයේ සතුටින් ජීවත් වන්නේ දැයි ඔවුන්ගෙන් ඇසූහ. පිණ්ඩපාතය, ධර්මදේශනා, ධර්ම සාකච්ඡා ආදියේ දී කිසිම ප්‍රශ්නයක් ඇත්තේදැයි ද උන් වහන්සේ ඔවුන්ගෙන් ඇසූහ.

''ගුරු දේවයාණනි, අප අපි සැම දෙනාම මේ ස්ථානයේ ඉතාම සතුටින් ඉන්නවා. මේ ස්ථානය කෝලාහල යක් නැති ශාන්ත තැනක් අපට ඕන කරන සියලුම පහසුකම් මේ ස්ථානයේ තියනවා. කිසිම දෙයකින් කිසි ම අපහසුවක් නැහැයි,'' අනුරුද්ධ හිමියෝ ඊට පිළිතුරු දෙමින් පැවසූහ.

''ඔබ සැම එකිනෙකා සමග සුහදව සාකච්ඡා කරලා අදහස හුවමාරු කරගන්නවා නේද?'' බුදුරදුන් ඔවුන්ගෙන් ඇසූහ.

''ඔව් අපි සියලුම දෙනා අනෙක් අය ගැනත් කිසිම අඩුවක් නැතිව සොයා බලනවා. අපි සියලුම දෙනා කිරි පැනි සේ එකට එක් වී කටයුතු කරන වන, නන්දිය සහ කිම්බිල සමඟ ආශ්‍රය කරන්න ලැබීමත් සතුටට කාරණයක්. යමක් කිරීමට පෙර අපි ඒ ගැන ඉතාම හොඳට සාකච්ඡා කරලයි තීරණ ගන්නේ. අපි තුන්දෙනා ශරීරයයෙන් තුන් දෙනෙක් වුණාට අදහස්වලින් එක් අයෙක්,'' යැයි ඊට පිළිතුරු වශයෙන් අනුරුද්ධ හිමි පැවසීය.

මේ අදහස අනුමත කළ බුදුරජුන් සතුටින් සිනා සී අනෙක් භික්ෂූන් දෙනම දෙසත් බැලුවෝය. ''අනුරුද්ධ කියන්නේ ඇත්තයි. අපි ඉතාම සමඟියෙන් ඉන්නේ සතුටෙන් ඉන්නේ; කෑම ගැනීමේ සිට භාවනා කිරීම දක්වා අපි තුන් නම එක් අයෙක් හැටියටයි ඉන්නේ,'' කියල භද්දිය හිමි පැවසූහ.

සියලු දෙනාටම ප්‍රශංසා කළ බුදුරජාණන් වහන්සේ ''ඉතාම හොඳයි, ඉතා ම ශ්‍රේෂ්ඨයි නුඹලා මේ තරම් සමගියෙන් සිටින බව ඇසීම බලවත්ම සතුටට කරුණක්. සංඝ කියන්නේ ඇත්ත වශයෙන්ම මෙන්න මේ වගේ අයටයි. බුදුරජාණන් වහන්සේ මේ භික්ෂූන් තුන් නම සමඟ මාසයක් කාලය ගත කළෝය. එක් භික්ෂූන් වහන්සේ නමක් පිණ්ඩ පාතය කරන්න ගිය විට අනෙක් දෙදෙනා විහාරය හා සංඝාරාම ශුද්ධ පවිත්‍ර කිරීම සිදු කළෝය.

එක් භික්ෂුවක් රැගෙන එන පිණ්ඩපාතය අනෙත් දෙනමටත් සෑහිණි. වැසිකිලි, කැසිකිලි ශුද්ධ කිරීමේ දී තව කෙනෙක් එන තෙක් නොසිට ඊළඟට ඉන්න පුද්ගලයා ඒ කාර්යය තමන් අතින්ම සිද්ධ කිරීම සිරිතක්ව තිබිණි. යම් කාර්යයක් සඳහා එක් අයෙක් හැර තව කිහිප දෙදෙකුගේ අවශ්‍යතාව දැනුණු විට තුන් දෙනාම ඒ සඳහා එකතු වූහ. මේ තුන් දෙනාගෙන් සමුගැනීමට පෙර බුදුරදුන් භික්ෂූන්ට අමතා ''සංඝ සමාජයේ සමගිය සියල්ලටම වඩා වැදගත් වනයේ හෝ ගමේ හෝ සහභාගී වීම වැදගත්,'' යැයි ප්‍රකාශ කළෝය.

එදිනෙදා ජීවිතයට අවශ්‍ය දේ එකට එකතු වී සම්පාදනය කිරීම, සමගිව එකට එකතු වී සීලය ආරක්ෂා කිරීම, සමගිය ආරක්ෂා වන වචන පාවිච්චි කිරීම, සමගිය ආරක්ෂා නොවන වචන උපයෝගී කර නොගැනීම. අත්දැකීම් සහ බුද්ධිය බෙදා ගැනීම, අනෙක් අයගේ අදහස්වලට නිරතුරුව ඇහුම් කන්දීම යන කරුණු භික්ෂු සමාජයේ උන්නතිය සඳහා උපයෝගී වන බව ද ප්‍රකාශ කළෝය.

බුදුන් වහන්සේ මේ අයට දේශනා කිරීමෙන් පසුව වනාන්තරය බලා පිටත් වූහ. තනිවම මේ වස් කාලය මේ වනයේ ගත කිරීමට උන් වහන්සේ තීරණයක කළෝය.

# හතලිස් හත් වන පරිච්ඡේදය
# ධර්මානුගමනය

වනයේ තනිවම බුදු රජානන් වහන්සේ සමාධි සුවයෙන් කාලය ගත කළෝය. සම්පූර්ණ කොළ පාටින් පිරි වනයේ පරිසරය දිය පොකුණු ආදියෙන් සිසිල්ව ශාන්තව පැවතිණි. තනිවම සිටි බුදුරදුන් කෝසම්බි නුවර ආරවුල් ඇති කර ගත් භික්ෂූන් ගැන සිතුවෝය. ඒ පළාතේ උපාසකඋපාසිකාවන් පවා මේ ගැන කෝපයෙන් පසු වූ බව බුදුරජුන් දැන සිටියෝය. උපාසක පිරිස භික්ෂූන් ගැන කල කිරීමෙන් සිටියෝය. බුදුරජාණන් වහන්සේගේ වචනයටවත් ගරු නොකළේ ඇයි ද කීම ගැන. නමුත් බුදු රජුන් තේරුම් ගත්තේ දෙපැත්තේම භික්ෂූන් කේන්තියෙන් සිටි බව.

වනාන්තරයේ බොහෝ සිවුපාවුන් සිටියේය. මේ අතර ඇත් පවුලක් ද විය. ඇත් පවුලේ ප්‍රධානියා ලෙස සිටියේ ඇතින්නකි. මේ ඇතින්න අනෙක් ඇතුන් සමඟ දිය නෑමට විලට එන සිරිතක් පැවතිණි. විලේ වතුර බොන ආකාරය, විලේ නහන ආකාරය පුංචි ඇත් පැටවුන්ට ඇය ඉගැන්වීය. ඇතින්නිය හොඬෙන් වතුර ගෙන පුංචි ඇත් පැටවුන් නහවන ආකාරය බුදු හාමුදුරුවෝ දුටුවෝය. පුංචි ඇත් පැටවුන් ද ඒ අනුව දිය කෙළිමින් පොකුණෙන් දිය නෑම කළෝය.

මේ ඇත් පිරිස බුදුන්ගේ මිත්‍රයින් බවට පත් විණි. ඉඳහිට බුදුරදුන්ට ඇතින්න පළතුරු රැගෙන එන සිරිතක් ද තිබුණේය. ඇතින්නිය කෑ ගසන ආකාරයෙන් නාද කිරීමේ හැකියාවක් බුදුරදුන්ට විය. දවසක් ඇතින්න දකින්නට නොසිටි නිසා බුදුරදුන් ඇතින්න මෙන් හඬ නැගුවෝය. ඇතින්න මේ හඬ අසා බුදුරදුන් සමීපයට පැමිණ දණ ගසා වැන්දාය.

බුදුවීමෙන් පසුව බුදුරජාණන් වහන්සේගේ දසවෙනි වස හැටියට මේ කාලය හැඳින්විය හැකිය. වනාන්තරයක වස් වැසූ දෙවන අවස්ථාවයි. දවස පුරා වනයේ සීතල සුවයෙන් ගත කර වනයෙන් පිටට ගියේ පිණ්ඩපාතය සඳහා පමණකි. වස් කාලයෙන් පසුව ඇත් මිත්‍රයින්ගෙන් වෙන් වී බුදුරදුන් උතුරු දිග පෙදෙසට වැඩම කළෝය. සති දෙකකට පසුව බුදුරදුන් සැවැත්නුවරට ළඟා විය. ශාරිපුත්ත, රාහුල ආදි භික්ෂූන් වහන්සේලා බුදුරජාණන් වහන්සේ වැඩම කිරීම ගැන අති ප්‍රසන්න භාවයට පත් වූහ.

මහා මොග්ගල්ලායන, මහා කස්සප, මහා කච්චායන, උපාලි, මහා කොට්ටිත, මහා කප්පිත, මහා කුණ්ඩ, රේවත, දේවදත්ත ආදී වැඩි මහල් භික්ෂූ පිරිස ද එදා ශ්‍රාවස්තියේ සිටියහ. කාලාම ගමින් බිම්බිල සහ නන්දිය ජේතවනයට එදින ම පැමිණියෝය. භික්ෂූනී ගෝතමියත් එදා ශ්‍රාවස්තියේම වැඩ සිටියාය. සියලුම දෙනා බුදුරජුන් දැක සතුටට පත් වූහ.

තමන්ගේ කුටියට යන ගමනේ දී බුදුන් වහන්සේ ආනන්ද හිමියන් තම කුටිය අතුගානවා දුටුවේය. බුදුන් වහන්සේ ජේතවනයට ආපසු වැඩම කළේ අවුරුද්දක් හා මාස හතරක් ගත වූවාට පසුවය.

බුදුන් වඩිනු දුටු ආනන්ද හිමියන් ඉලපත පසෙක තබා නමස්කාර කළෝය.

කෝසම්බිය ගැන ඇසූ විට, ආනන්ද හිමියන් කීවේ ඔබ වහන්සේගේ පිටව ගිය පසු බොහෝ භික්ෂූන් තනි වූ බවක් දැනෙන බව ප්‍රකාශ කළ බව කීවේය. ''බුදුරදුන් අපව අත් හැරලා ගියා, අපි තනි වුණා. ඔබ ගුරුතුමා සමඟ නොගියේ ඇයි කියා ඔවුන් මගෙන් ඇසුවා යැයි ආනන්ද හාමුදුරුවෝ පැවසූහ. බුදුරදුන් කිසිම කෙනෙකුට නො කියායි ඝෝෂිතා රාමයෙන් පිටත් වුණේ

කියලා. මා හිතන ආකාරයට බුදුරදුන් තනිවම ඉන්න ඕන කරපු නිසයි එහෙම කළේ. මාස හයකට පමණ පස්සේ භික්ෂු සමූහය බුදුරදුන් හමුවට පැමිණ ධර්මය පිළිබඳව යමක් ඇසීමට ලැබුනේ නැතිව බොහෝ කාලයක් ගත වී ඇති බව පැවසූහ.

නුඹ කොසම්බිය සිට පැමිණෙන විටත් භික්ෂූන්ගේ මත භේද එසේම පැවතිණි දැයි බුදුන් වහන්සේ ඇසීය.

''ආචාර්ය තුමනි, සටන තවත් උග්‍ර වුණා. පක්ෂ දෙක අතර සම්බන්ධය සම්පූර්ණයෙන්ම නැති වුණා. අපි වාගේ මධ්‍යස්ථ භික්ෂූණ් පවා නගරයේ පිණ්ඩපාතය සඳහා ගිය විට උපාසිකවරුන් අමුතු අදහස් අප ඉදිරි පිට දී ප්‍රකාශ කරන්නට පටන් ගත්තා. ක්‍රමයෙන් උපාසක වරුත් මේ ප්‍රශ්නය තමන් අතට ගත්තා. විරුද්ධ පක්ෂයේ උපාසක පිරිස විහාරයට පැමිණ කියන්න ගත්තා ඔබ සැම බුදුරදුන්ව වේදනාවට පත් කළ නිසා උන් වහන්සේ විහාරයත් අත්හැරළ ගියා කියලා.

''කෝසම්බියේ සිද්ධිය නිසා භික්ෂූන් වහන්සේ ගැන ජනතාව තුළ තිබුණ ආදරය, ගෞරවය නැතිවී ගියා. මේ නිසා හැසිරීම පිළිබඳව කෝසම්බියේ භින්ෂූන් ගැනත් සිතලා ධර්ම මාර්ගයට පැමිණෙනවා නම් හොඳයි කියලා දායකයනුත් අදහස් දක්වා සිටියා. ආරවුල් ඇති කරගත් භික්ෂූන් උපාසක උපාසිකාවන්ගේ අදහස්වලට ගරු කළේ නැති නිසා දානය දීම නතර කළා. දායකයෝ කිව්වා ඔබ සැම බුදු හාමුදුරුවන්ගේ ශිෂ්‍යයෝ වෙන්න සුදුසු අය නොවෙයි කියලා. ඔබ සැම සමගියෙන් සිටින ශීලාචාර පිරිසක් නොවීම ඊට ප්‍රධාන හේතුවයි කියලා. බුදු හාමුදුරුවන්ගේ අවවාද පිළිගත්තා නම් මේ ප්‍රශ්නය මේ තරම් ම දුරට නොයන බව ඔවුන් සඳහන් කළා. ඔබ වහන්සේ කෝසම්බියෙන් පිට වී ගියත් භික්ෂූන්ගේ අරවුලේ අඩුවක් වුණේ නැහැ.''

බුදුරජුන් ආනන්දගෙන් ඉලපත රැගෙන, '' මා අතුගාන්නම්. මම අතුගාන තෙක් ශාරිපුත්ත හමු වෙලා කියන්න මා ශාරිපුත්තව සොයන බව,'' යැයි පැවසූහ.

හෙමින්හෙමින් අතු ගෑම අවසන් කළ බුදුන් වහන්සේ උණබට පුටුවේ වැඩ සිටියෝය. ජේතවනය ඉතාම ලස්සන වෙලා තිබිණි. සැම අතින්ම කුරුල්ලන්ගේ කිචි බිචි හඬ ඇසුණි. ටික

වේලාවකට පසු ශාරිපුත්ත හිමියෝ බුදු රජාණන් වහන්සේ සමීපයට පැමිණ වාඩි වූහ.

බුදුරදුන් ශාරිපුත්තට තම අදහස් දන්වා සිටියේය. ''මේ සුන්දර ජේතවනය කවරදාකවත් ඝෝෂිතාරාමය වාගේ වාද විවාද ඇති තැනක් වෙන්න ඉඩදෙන්න එපා,'' යැයි පැවසුවෝය. මේ විෂය පිළිබඳව දෙදෙනා අතර බොහෝ වේලාවක් අදහස් හුවමාරු විය. මේ අතර කෝසම්බියේ භික්ෂූන් ශ්‍රාවස්තියට ඇවිත් ඇති බවට ශාරිපුත්තට පණිවුඩයක් ලැබිණි. ඒ අය සම්බන්ධයෙන් කෙසේ පිළිපැදිය යුතුදැයි ශාරිපුත්ත හිමියෝ බුදුන් වහන්සේගෙන් ඇසුවෝය.

ඒ අයට ධර්මය අනුව සලකන්න ලෙස බුදුරජාණන් වහන්සේ පැවසුවෝය. ඒ ප්‍රකාශය තව ටිකක් විස්තර කර දෙන ලෙස ශාරිපුත්ත හිමියෝ ඉල්ලා සිටියාය. බුදු හාමුදුරුවෝ ශාරිපුත්ත ඔබ තවමත් මේ වගේ ප්‍රශ්න අහන්නේ ඇයි දැයි බුදුරදුන් ඇසුවෝය.

ශාරිපුත්ත හිමි නිහඬ වූහ. ඉන් පසු මහා මොග්ගල්යාන කාශ්‍යප, කච්චායන, කොට්ටිය, කපින යන භික්ෂූහු එතනට ආහ. '' කොසම්බියේ සිට ආ භික්ෂූන්ට පිළිපදින්නේ මොන ආකාරයට ද?'' යනුවෙන් ප්‍රශ්න කළහ.

සියලුම දෙනා ශාරිපුත්ත දිහා බැලුවෝය. ශාරිපුත්ත සිනාසිණි. ''ඒ අයගේ ආරාධනාවක් නැතිවම මේ ප්‍රශ්නය ගැන ඔබ වහන්සේලාම සාකච්ඡා කරන්න. දෙපැත්තෙම කරුණු අහලා තීරණය කරන්න. සද්ධර්මය අනුව කවුද කතා කළේ ඊට විපරීතව කවුද කතා කළේ ධර්මය අනුව මේ දෙපැත්තම සමගි කරගන්න ඇති මාර්ගය කුමක් ද කියල සොයන්න,'' වැඩිමහළු භික්ෂූන් අමතා බුදුන් වහන්සේ කීහ. මේ අතර අනාථ පිණ්ඩික බුදු රදුන්ගේ කුටිය වෙත ආවේය. ''ගුරු දේවයිනි, කෝසම්බියේ භික්ෂූන් ජේතවනයට ආවා. මේ අයට සලකන්නේ කෙසේද දෙපක්ෂයටම දානය දිය යුතු නේ ද?'' යනුවෙන් එතුමා ඇසුවේය.

බුදු රජුන් සිනාසී, දෙපැත්තෙම අයට දානයත් දෙන්න ඔබ සංඝයාට ඇති ගෞරවය දක්වන්න මේ අය අතරින් කවුරු හරි සද්ධර්මය ගැන යමක් කීවොත් ඒ ගැන ප්‍රශංසා කරන්න, යනුවෙන් බුදුරදුන් පිළිතුරු දුන්හ.

ආනන්ද හිමියන් පැමිණ කෝසම්බි භික්ෂූන් විහාරය ඉදිරිපිට සිටින බව ශාරිපුත්ත හිමි සමඟ පැවසීය. ඒ අයට ඇතුළට එන්න අවසර දෙන්න ද? යි ඇසීය.

බුදුරජාණන් වහන්සේ ''විහාරයේ දොර දෙකම විවෘත කර ඒ අයව ආදරයෙන් පිළිගන්න. ඒ අය මහන්සි නිසා විවේක ගැනීමට වෙන වෙනම තැන් දෙකක් සූදානම් කරන්න කියල දැනුම් දෙන්නැයි,'' පැවසූහ.

බුදුරජුන් දැන්වූ ආකාරයට ශාරිපුත්ත හිමියෝ අවශ්‍ය සියලුම දේ සම්පාදනය කර දුන්හ. පසු දා උදෑසන සාමාන්‍ය සිරිත් ප්‍රකාර සැම දෙනාටම පිණ්ඩපාතයේ වඩින ලෙස දැන්වීය. බුදු රදුන්ගේ අනුශාසනා පරිදි සියලුම දෙනා කොටස් කර පිණ්ඩපාතය සඳහා පිටත් කර යැවිණි. සන්ධ්‍යා සමයේ ඒ අයට බුදුන් හමු වී සිදු වූ වරදට සමාව ගන්න අවශ්‍ය යැයි එදා සවස සියලුම භික්ෂූන් ශාරිපුත්තට හිමියන් හමු වී ප්‍රකාශ කළෝය.

'' එහෙම නොවෙයි ඉස්සරවෙලාම ඔබ දෙපැත්ත සාකච්ඡා කරලා සමගි වෙනන. ඉන් පසුව ඒ පණිවිඩය බුදුරදුන් හට දන්වන්නම්. ඉන් පසුව කුඩා සංඝ සභාවක් කැඳවා කාරණය සැමටම දැනුම් දීම සුදුසුයි,'' යැයි ශාරිපුත්ත හිමියෝ පැවසූහ.

එදා සවස සූත්‍රාචාර්ය, විනයාචාර්ය හමුවෙන්නට ගොස් ''ඔබ කියූ දේ හරි. මගෙන් සුළු වරදක් වුණා එය දිගට ගියා. ඒක අප දෙපැත්තට පමණක් නොවෙයි. මුලු සමාජයටම අහිතකර වුණා. ඒ ගැන සමාව ගන්නයි ඔබ ළඟට ආවේ,'' යැයි කීවේය.

ආරවුල සංසිඳවීමට තමන්ගේ සිතේ අහංකාරකමත් ඉවත් කළ යුතු බව සූත්‍රාචාර්ය දැනගෙන සිටියේය. ශීලාචාර්යත් මගෙත් නිහතමානීකමේ අඩුවක් තිබුණා. ඔබ මා පිළිගන්නවා. මගේ නමස්කාරයත් පිළිගෙන ප්‍රශ්නය මෙතනින් අවසන් කරමු,'' කියා යැයි කීවේය.

එදා බොහෝ රෑ වෙනතෙක් දෙපැත්ත සමගි සාකච්ඡා කර සම්පූර්ණයෙන්ම ප්‍රශ්නය විසඳාගත්හ.

මේ සිද්ධියේ ප්‍රතිඵල ඇසූ මධ්‍යස්ථ භික්ෂූන් සතුටට පත් විය. ශාරිපුත්ත හිමියෝ බුදු රජුන් හමුවට පැමිණ සම්පූර්ණ සිද්ධිය විස්තර කළහ. බුදුරජුන් හිස වනා සතුට ප්‍රකාශ කළෝය. ප්‍රශ්නය නම් අවසානයි. නමුත් ඉන් සිදු වූ පාඩුව මැකෙන්න කාලයක් ගත වේවි,'' යැයි උන් වහන්සේ පැවසූහ.

## හතලිස් අට වන පරිච්ඡේදය

# සංඝ සමාජයේ ප්‍රශ්න විසඳීමට සිද්ධාන්ත

කෝසම්බියේ භික්ෂූන් අතර සිදු වූ සිද්ධිය නැවත භික්ෂූන් අතර සිදු නොවීම සඳහා සිද්ධියට සම්බන්ධ සියලුම භික්ෂූන් එකතු කර විස්තර සහිතව සාකච්ඡාවක් කරන්නට මහා මුගලන් රහතන් වහන්සේ යෝජනා කළෝය. එහි සභාපති ලෙස මහා කාශ්‍යාප මහරහතන් වහන්සේව තෝරා ගත්තේය.

සාකච්ඡාවට පෙර මහාකාශ්‍යප මහ රහතන් වහන්සේ වේළුවනයේ දී බුදු රජුන් දේශනා කළ කරුණු හය සියලුම දෙනාට විස්තර කරන්න යැයි අනුරුද්ද හිමියන්ගෙන් ඉල්ලා සිටියේය. අනුරුද්ධ මහ රහතන් වහන්සේ කරුණු විස්තර කර අවසාන වූ විට මුගලන් මහ රහතන් වහන්සේ පැවසුවෝය. සෑම විහාරයකම භික්ෂූන්ට මේ කරුණු හය කටපාඩම් කරවන්න යැයි මේ කරුණු හය දවස් හයක්ම සාකච්ඡාවට බඳුන් විය. කිසියම් ප්‍රශ්නයක් ඇති වුවහොත් මේ කරුණු හය උපයෝගී කරගෙන ප්‍රශ්නය විසඳ ගැනීම අවශ්‍ය බවට සියලු දෙනාම එකඟ වූහ. මේ නිසා මේ කරුණු හයට ''සප්තාධිකරණ සමතා'' යන නම යොදා ගන්නා ලදී.

පළමු සිද්ධාන්තය ''සම්මුඛ විනය'' ලෙස හැඳින්විණි. එහි අදහස විවාදයක් ඇති වූ විට දෙපක්ෂයම එක තැනකට එකතු වීමයි. දෙපැත්තම ඇති සාක්ෂි සහ විමසීම් මධ්‍යස්ථාව සාකච්ඡා කිරීම ඉතාම වැදගත්ය. ශාන්තව, ධෛර්යව සියලුම දේට ඇහුම්කම් දීමට සංඝයා ද සූදානම් විය යුතුයි. එසේ වූ විට සැම දෙනාගේම අදහස් මධ්‍යස්ථව සිතා තීරණය ගැනීමේ හැකියාව ඇතිවීම ස්වාභාවිකයි. තුන්වන කාරණය 'අමූදා විනය' යි. ඉන් අදහස් කරන්නේ වරදක් කළ භික්ෂූන් වාද විවාද නොකර සැමගේ ඉදිරියේ විවාදයට හේතු වූ කාරණය හදවතින් සහ මුලින්ම අස් කර ගැනීමයි. දෙපක්ෂයම අදහස් එක් ව ප්‍රකට කළ යුතුයි. විවාදයට හේතු වූ කරුණු දෙපැත්තේම අය හදවතින් අස්කර ගැනීමට සූදානම් බව එක් පක්ෂයක් කිව්වොත් එසේ වරදක් කළේ නොදැනුවත් කම නිසයි, වරදක් බව කිසි සේත්ම දැනගෙන සිටියේ නැත. මින් පසු ඒ වැනි වරදක් සිදුවන්නේ නැහැ යනුවෙන් ස්ථිර විය යුතුය. ඒ වැනි අවස්ථාවක ඒ ගැන විචාර කිරීම යුක්ති සහගත බවට. මේ දෙපක්ෂයම එකඟ විය යුතුයි.

හතරවන කාරණය තත්ව ''භායෂ්‍ය විනය''යි. තමන්ගේ කැමැත්තෙන්ම වරද පිළිගැනීමයි. සැම වරදක දීම තමන් විසින් ම වරද සැමගේ ඉදිරියේ පිළිගන්නේ නම්, එය ඉතාම වැදගත් වේ. එසේ වුවහොත් වරද පිළිගැන්වීම පිණිස දෙවන පක්ෂයකට කරදර කිරීම අවශ්‍ය වන්නේ නැත. වරද පිළිගැනීමට සුදුසු කාලයක් දීම ද ඉතාම වැදගත්ය. වරදක් සුළු වුවත් ඒ එසේමය. අවශ්‍ය තරම් කාලය දුන් විට ඒ ගැන කිසිවකුට කිසි ම දෙයක් වරදක් හැටියට දැක්වීමට හැකි නොවේ. එක් පක්ෂය වරද වරද හැටියට අවංකව පිළිගත හොත් අනෙක් පක්ෂය ද වරද වරද හැටියට පිළිගැනිය යුතුයි. එසේ වූ විට සිතේ කිසි ම කහටක් දෙපක්ෂයේ ම වන්නේ නැත. හදවත පිරිසිදු වූ විට ප්‍රශ්නය විසඳී දෙපැත්තේම සමගිය තහවුරු වීම ස්වාභාවිකයි.

පස්වන සිද්ධාන්තය ''ප්‍රතිඥාකාරක සිද්ධාන්තය'' එනම්, ගත් තීරණය පිළිගැනීමයි. මේ විනය නීතිය අනුව වරද පිළිගත් බව දෙපැත්තම තුන් වරක් හඬ නගා කිව යුතුය. තුන්වරක් සැමදෙනා ඉදිරිපිටම ශබ්ද නගා කීමෙන් ඉදිරිපිට සිටින අයට කාරණය තේරුම් ගිය විට එහි වරදක් ඇත්නම් ඒ අයට එය

ඉදිරිපත් කිරීමද කළ හැක. දෙපැත්තම වරද පිළිගෙන සැමගේම ඉදිරියේ තුන්වරක් කී විට එහි අඩුවක් ඉදිරිපත් කිරීමට කිසිවකුට අවස්ථාව ලැබෙන්නේ ද නැත. සංඝයාගේ තීරණය පිළිබඳව සැම දෙනාම ගෞරවාන්විත ව විශ්වාස කිරීම ද අනිවාර්යයෙන්ම සිදුවන්නකි.

හය වන විනය හැටියට දැක්වූයේ ''යද්භූයාසිකිය'' විනයයි. සියලුම දෙනා සමඟ විචාර විමර්ශනය කිරීමෙන් පසුව සියලුම ලොකු කුඩා ප්‍රශ්න සාක්ච්ඡා කර අවසාන වසයෙන් ගන්නා තීරණයයි.

හත්වන සිද්ධාන්තය හැටියට දක්වා ඇත්තේ ''තෘණසිතාරක විනය'' යි. ගඳ දේ පිදුරු ආදී දෙයින් වසා දැමීම මේ හා සමානය. දෙපැතතේ ම ප්‍රශ්න ගැන සාකච්ඡා කිරීමට බුද්ධිමත් මධ්‍යස්ථ භික්ෂූන් වහන්සේ නමක් පත් කිරීම ඒ භික්ෂුව සැම දෙනාටම පොදු සැම දෙනාම ප්‍රිය කරන මධ්‍යස්ථ කෙනෙක් විය යුතුයි. සැම දෙනාගේම අදහස් මධ්‍යස්ථව ඉවසීමෙන් ඇසීමටත් අඩුවෙන් කතා කිරීමටත් හැකි කෙනෙක් විය යුතුය සුළු වසයෙන් කතාකළත් එකී වචනවල ගරුගාම්භීර බවත් ඇති විය යුතුය. මහා සභාවට කරුණු ඉදිරිපත් කිරීමේ දී අවශ්‍ය කරුණු පමණක් ඉදිරිපත් කිරීමේ හැකියාව ඇති කෙනෙක් විය යුතුය.

මේ කරුණු කීපය බුදුරජුන් ඉදිරියේ තැබූ විට උන් වහන්සේ භික්ෂූන්ට බොහෝ ප්‍රශංසා කළෝය. සංඝ සමාජයේ ප්‍රශ්න විසඳීමට මේ කරුණු ඉතාම වටිනා බව ද සඳහන් කළහ.

රජගහනුවරට වැඩම වීමට පෙර බුදුරජුන් මාස හයක්ම වැඩ සිටියේ ජේතවනයේය. ආපසු එන ගමනේ දී බෝධි වෘක්ෂය දැකීමටත් ස්වස්තිගේ පවුලේ අය දැකීමටත් බුදු රජුන් වැඩියෝය. වයස සම්පූර්ණ වූ විට ස්වස්ති පැවිදි කිරීමට වූ පොරොන්දුවත් සිහිපත් කළෝය. ස්වස්ති පැවිදි වී අන්තිමේ දී රාහුලගේ හොඳම මිත්‍රයා බවට පත් විය.

# හතලිස් නව වන පරිච්ඡේදය

# ශ්‍රේෂ්ඨ ගුරුවරුන්ගේ ශික්ෂා

අස්සජී සහ ආනන්ද යන දෙදෙනා එකතු වී බුදුරජුන්ගේ සද්ධර්මය ගැන සාකච්ඡා කළහ. මේ සියල්ලම ස්වස්ති ඉතා හොඳින් අසාගෙන සිටියේය. භික්ෂුණී ගෝතමී සහ රාහුලත් මේ සියල්ලම කන් යොමා අසාගෙන සිටියහ. ආනන්ද හිමියන්ගේ මතක ශක්ති අද්භූතයි. බුදුරජුන් කොතන ද මොනව ද දේශනා කළේ ඒ සියල්ලම අනන්ද හිමි ඉතා හොඳින් මතක තබාගෙන සිටියෝය. ස්වස්ති රාහුල සහ භික්ෂුණී ගෝතමීට ඉතාම සමීපව සිටියේය.

සුජාතාවගේ සමීපයේ සිටි නිසා ස්වස්ති තරමක් දුරට අධ්‍යාපනය ලැබුවේය. දුප්පත් ළමයෙක් නිසා ස්වස්තිට අධ්‍යාපනය ලැබීමට ශක්තියක් තිබුණේ නැත. සුජාතා විවාහ වීමෙන් පසුව ස්වස්තිගේ අධ්‍යාපන කටයුතු නතර කරන්නට සිදුවිය. රාහුලගෙන් බොහෝ දේවල් ඉගෙනගන්න පුළුවන් කියලා. රාහුල ළඟ ශ්‍රේෂ්ඨ පවුලක ශ්‍රේෂ්ට ගති ගුණ බහුලව දකින්න තිබිණි. උසස් කුළයක ඉපදීම හැර අවුරුදු අටක්ම භික්ෂු මහා සංඝයා අතර සැරි සැරීම ඊට ප්‍රධාන හේතුවක් විය. භික්ෂූන්ගේ ඇසුර, සෞම්‍ය එසේම

සාධාරණ පරම්පරාවක් ලෙස එම පරම්පරාව ස්වස්ති දුටුවේය. රාහුල හා සසඳන විට ස්වස්තිගේ සිරිත්විරිත් දුප්පත් බවක් පෙනිණි. මේ නිසා සොත්ථිය ධර්මය ඉගෙනීම ගැන සම්පූර්ණ ම කාලය යෙදෙව්වේය. ස්වස්තිට සිවුර පොරවන ආකාරය, ඉඳගන්න ආකාරය, කන බොන ආකාරය, පාත්‍රය පාවිච්චි කරන ආකාරය ආදී දේ ගැන හොඳට පැහැදිලි කරන ලෙස කීවේය. විශේෂයෙන් පිරිසිදුකම ගැන හුරු කරන්න යැයි ශාරිපුතත හිමි රාහුල හිමිට කීවෝය. භාවනාව ගැන විස්තර වන කරුණු හතලිස් පහ විස්තර කරන ලෙස අදහස පිරිසිදු නම් භාග්‍යය පෑදේවි යැයි ද සඳහන් කළේය.

රාහුල තවමත් සාමනේර බවින් සිටි කෙනෙකි. අවුරුදු විස්ස සම්පූර්ණ වූ විට රාහුල උපසම්පදා වීමට සුදුසු කෙනෙක් වෙයි. සාමනේර සීලයට අයිති වුයේ සිල් පද දහයකි. උපසම්පන්න භික්ෂූන්ට කෝටියක් සංවර ශීලය රැකීමට නියමව තිබිණි. තව ඉදිරියට තවත් සිල් පද වැඩි වෙන බව රාහුල ස්වස්තිට කීවේය. සංඛ්‍යාව සියයටත් වඩා අධික විය හැකි බව ද පැවසීය.

සංඝ සමාජයේ ආරම්භයේ දී සිල් පද ගැන ඒ තරම්ම සැලකීමක් හෝ සිත යෙදීමක් නොතිබුණු බව ද පැවිදි කිරීම ද ඉතාම සරලව සිදු කෙරුණු බව ද රාහුල ස්වස්ති සමඟ කීවේය. භික්ෂූන්ගේ සංඛ්‍යාව අධික වීම සමඟම සංඝ සමාජයේ විවිධ ප්‍රශ්න ඇති වීමට පටන් ගත්තේය. සියලුම දෙනාටම අනුශාසනාවේ තැබීම සඳහා එකින් එක විනය නීති පනවන්න සිදු විය.

සංඝ සමාජයේ ප්‍රථම හිතුවක්කාර භික්ෂූව සුදින්න බව රාහුල ස්වස්ති කීවේය. සුදින්න නිසා බුදුරජාණන් වහන්සේ එදා සමාජයේ පැවතුණ පංච ශීලය ගැන සිත යොමු කළෝය. පැවිදි වීමට පෙර සුදින්න විවාහ වූ වෛශාලියේ කලන්ද ගමේ කෙනෙක් විය. බුදුරදුන්ගේ දේශනා අසා ඔහු පැවිදි විය. පැවිදි වී ටික දවසකට පසු පවුලේ අයට සුදින්නට දානය සඳහා ගමට ආරාධනා කළේය. ගෙදරට ගිය පසු පවුලේ අය සිවුරු ඇරලා ඇවිත් ගෙදර කටයුතු සොයා බලන්න යැයි කීවෝය. නමුත් සුදින්න ඒ කතාව පිළිගත්තේ නැත. ''නුඹ පවුලේ එකම දරුවයි. වෙළඳාම් ආදී කටයුතු නුඹ නැතිව වෙන කෙනෙකුට පවරන්න අපහසුයි. ඒ නිසා ඇවිත් ගෙදර කටයුතු බාරගන්න,'' යැයි දෙමාපියෝ කීවෝය.

මේ කිසිම දෙයක් ගැන සුදින්න සිත යොමු නොකෙළේය. කරන්නම දෙයක් නැත්නම් දරුවෙක් හදලා දෙන්න යැයි අම්මා අවසානයේ ඉල්ලා සිටියෝය.

ශීලය ගැන අවබෝධයක් නැතිව සිටි සුදින්න තමන්ගේ පෙර බිරිඳ සමඟ රාත්‍රිය ගත කිරීමට කැමති විය. එහි ඵලයක් ලෙස ඔහුගේ බිරිඳට පුතෙක් උපන්නේය. ඒ පුතාට බීජක යනුවෙන් නම තැබුවේය. සුදින්නගේ මිත්‍රයින් සුදින්නට බීජක පිතා කියමින් විහිළු කරන්නට පටන් ගත්තේය. මෙය සංඝ සමාජයේ අනෙක් අයටත් මහ හිසරදයක් විය. බුදුරදුන් භික්ෂූන් වහන්සේ සියලුම දෙනා එක තැනකට එක් රැස් කර සුදින්නගේ කාර්යය ගැන අප්‍රසාදය පළ කළෝය. මේ සිද්ධියෙන් පසු නීත්‍යානුකූලව විනය නීති පැනවීම ආරම්භ විය. මේ වැනි දේ සිද්ධවීමත් සමඟම අනාගත පරම්පරාවේ දිග ගමන සඳහා ප්‍රාතිමෝක්ෂ දේශනාව බුදුරදුන් අනුමත කළෝය.

මින් නීති හතරක් ඉතාම බැරෑරුම් ඒවා විය. ඉන් එකක් හෝ කැඩුවොත් භික්ෂු ජීවිතයෙන් අස් වීම සිදුවිය යුතු යැයි නියමයක් ද පැනවීය.  පළමු නීතියට ස්ත්‍රියක් සමග සහවාසය, සංසර්ගය (කාමයෙහි හැසිරීම) හොරකම් කිරීම, ප්‍රාණ ඝාතය, රහත් නො වී රහතුන් වහන්සේ නමක් ලෙස සමාජයට ඉදිරිපත් වීම යන වරදවල් ඇතුළත් වේ. ඉන් එක් වරදකට වැරදිකරු වුවහොත් භික්ෂු ජීවිතයේ ජීවිතය ගත කිරීමට කිසිම අවසරයක් නැති බව අවධාරණයෙන් ම සඳහන් කළෝය.

බුදු රදුන්ට තම පියා හැටියට ඉතාම ආදරය කරන බවත්. නමුත් ඒ මාර්ගයෙන් අයුතු ලාභ ප්‍රයෝජන ගැනීමට කිසිදාක නො සිතූ බවත්. අවුරුදු එකොළහ වයසේ දී දවසක් සෙල්ලම් කිරීමට ගොස් පියා දැන ගනීවි කියන භයට ශාරිපුත්ත මහ රහතන් වහන්සේට බොරුවක් කී ආකාරයත් රාහුල සිහිපත් කළේය. ශාරිපුත්ත මේ බව තේරුම් නොගනීවි සිතා එක බොරුවක් වහන්න තව බොරු හතරක් කියන්නට රාහුලට සිදු විය. නමුත් ඇත්ත එළි විය. මේ බව දැන ගන්නට ලැබුණු පසුව බුදු හාමුදුරුවෝ රාහුලට අමතා සත්‍යය ඉතාම වැදගත් ගුණ ධර්මයක් බවත්. කවදාවත් බොරුවක් නොකියන ලෙසත් අවවාද කළහ.

මේ කාලයේ රාහුල වේළුවනය අසල අම්බලට්ඨික වනයේ ශාරිපුත්ත සමඟයි සිටියේය. දිනක් බුදුරදුන් එහි වැඩම කළෝය. රාහුල බුදුරදුන්ගේ පා දෙවීම සඳහා ජලය රැගෙන විත් පා දෝවනය කළේය. පාත්‍රයේ වතුර ප්‍රමාණයක් ඉතිරි විය. බුදුරදුන් රාහුලගෙන් ''පාත්‍රයේ වතුර ඇත්තේ ටික ද?'' යැයි ඇසුවෝය.

මගේ පාත්‍රයේ ජලය ඇත්තේ ස්වල්පයක් යැයි රාහුල කීවේය. ''රාහුල, බොරු කියන පුද්ගලයා සමාජය පිළිගන්නේ ඉතාම අඩුවෙන්,'' යැයි බුදුරදුන් රාහුල අමතා කීවෝය.

රාහුල නිහඬ විය. පාත්‍රය අනිත් පැත්ත හරවා වතුර සියල්ලම බිමට හලා බුදුන් වහන්සේ ''බොරු කියන පුද්ගලයා සමාජයේ මේ වතුර බිමට හැලුවා සේ කොන් වෙනවා, විහිළුවට වත් බොරු කීම හොඳ නැතැයි,'' පැවසූහ.

රාහුලගේ මේ විස්තරය අසා ස්වස්ති ජීවිතයේ ඉතා ම වැදගත් සිද්ධාන්ත මොනවා ද වටහා ගත්තේය. දිනක් ස්වස්ති තම මවටත් සුජාතාවටත් බොරු ආකාරය ස්වස්තිට සිහිපත් විය. නමුත් බුදුරදුන් සමීපයේ කිසිම දවසක බොරු කිවුවේ නැත. බුදුන් සමීපයේ බොරු කීමට කිසිවෙකුට ශක්තියක් තිබුණේත් නැත. බුදුන් අසත්‍යය එක වරම හඳුනා ගැනීම ඊට හේතුවයි. බුදුරදුන් තමන් කෙරෙහි කරපු මහා උපකාරයට වෙත දිය හැකි උපහාරයක් නැති නිසා සදේව ශීලය ආරක්ෂා කරමින් කීකරු භික්ෂූන් වහන්සේ නමක් හැටියට ජීවත් වීමට ස්වස්ති අධිෂ්ඨාන කර ගත්තේය.

සෑම මාසයකම දවස් දෙකක් අමාවක පෝ දාට සියලුම භික්ෂූන් එකතු වී ප්‍රාතිමෝක්ෂ දේශනා කිරීම සිරිතක්ව තිබිණි. ප්‍රාතිමෝක්ෂ දේශනාවේ දී සියලුම භික්ෂූන් තමන් අතින් යම් වරදක් වූවානම් සියලුම භික්ෂූන් අතර එය ප්‍රකාශ කිරීම සිරිතක් ව තිබිණි. එක් එක් විනය නීති ගැන සෑමගේ නිර්දෝෂ භාවය හැඟුණ විට දෙවන ශිල්පදයට යෑම සිරිතක් ව තිබුණි. යම් කිසි කෙනෙක් ශීලය භංග කරගෙන තිබුණහොත් එය භික්ෂු මහා සංඝයා ඉදිරියේ සැමටම ඇසෙන සේ කිවයුතු විය. සතර පාරාජිකාව හැර අනෙක් විනය නීති කඩ කිරීමේ දී සංඝ සමාජය ප්‍රාතිමෝක්ෂ දේශනාවේ දී නිර්දෝෂ වීමට හැකි වී තිබිණි.

ශාරිපුත්ත සහ රාහුල පිණ්ඩපාතයේ වඩින විට ස්වස්තිත් ඒ අය සමග යෑම සිරිතක්ව පැවතිණි. මෙවර වස් වැසීම රජගහ නුවර පර්වත සමීපයේ ඒකනාලා බමුණු ගමෙහි සිදු කිරීමට තීරණය විය. දිනක් බුදු රදුන් ඒකනාලා බමුණු ගමේ කුඹුරක් මැදින් ගමන් කරමින් සිටියෝය. ඒ ගමේ සිටි භාරද්වාජ යනුවෙන් ප්‍රසිද්ධ බමුණෙක් බුදුහාමුදුරුවන් වඩින බව දැක ගමන නතර කළේය. භාරද්වාජ හට අක්කර දහස් ගණනක් කුඹුරු අයත්ව තිබිණි. මේ දිනවල කුඹුරු සී සෑම කරන කාලයයි. දහස් ගණන් කම්කරුවෝ කුඹුරුවල වැඩ කරමින් සිටියහ. භාරද්වාජ බුදුරදුන් දෙස බලාගෙන සිටියේය.

බුදුරදුන්, ඉදිරියට තමා ආ විට අපි කුඹුර සීසානවා; වපුරණවා; වතුර බඳිනවා; ගොයම් කපනවා; වී කොටලා හාල් ගන්නවා; මහන්සි වෙලා කෑම හදා ගන්නවා. නුඹ කිසිම දෙයක් නොකර නිකම්ම ඉඳගෙන කනවා, යැයි පැවසීය.

''මාත් සී සෑම කරනවා. බීජවලට පොහොර වතුර දෙනවා කුඹුරු ආරක්ෂාවද කරලා කරල් පැසුණාම කපා ගන්නවා කියලා.

''එහෙම නම් නුඹගේ නඟුල කෝ? බීජ කෝ? මොන කුඹුර ද සී සාන්නේ? මොන කුඹුරේ ගොයම් ද කපන්නේ?

''සත්‍යය කියන හදවතේ විශ්වාසය කියන වී වපුරණවා කියලා. මගේ නඟුල සිහි කල්පනාවයි. මහන්සිය මගේ මී හරක්, භාවනාව මගේ ධාන්‍යයි. හෙවත් වී, යනුවෙන් බුදුන් වහන්සේ භාරද්වාජට පිළිතුරු දෙමින් කීවෝය.

''භාරද්වාජ ප්‍රේමය, විශ්වාසය, සුහදකම, නැති ජීවිතය දුක සහිත මුඩු බිමක් හැටියට මිස වෙන දෙයක් හැටියට සලකන්න බැහැ,'' යි බුදුන් වහන්සේ කීවෝය.

භාරද්වාජ බුදුරදුන්ගේ මේ වචන අසා සතුටට පත් විය. භාරද්වාජ සතුටු වී මෙහෙකරුවෙකුට කතා කිරි ගේන්න ගෙන එන ලෙස දැන්වීය. එම කිරි බුදුරදුන්ට පිළිගැන්වීය. බුදු රදුන් එම කිරි පිළිගත්තේ නැත. ''මා මේ කාරණා ඔබට ප්‍රකාශ කළේ ඔබගෙන් යමක් බලාපොරොත්තුවෙන් නොවෙයි. ඔබ මට යම් භෝජනයක් දෙන්න සූදානම් නම් වෙන දවසක දෙන්න,'' යැයි පැවසුවෝය.

භාරද්වාජ බුදුරදුන්ගේ මේ වචන අසා පැහැදී පැවිදි වීමට කැමැත්ත පළ කළේය. ස්වස්ති මේ සියල්ල තමන් ඉදිරියේ සිදු වුණ ආකාරය බලා සිටියේය. ඔහු සිතුවා ''බුදුරදුන් සමීපයේ සිටින නිසා කොපමණ දේ ඉගෙන ගන්න පුළුවන් ද? මේ වාසනාව අනෙක් භික්ෂූන්ට නැහැ නොවේ ද?'' යැයි ස්වස්තිට සිතිණි.

වස් කාලය අවසන් වූ විට බුදුරජාණන් වහන්සේ ධර්මප්‍රචාරය සඳහා උතුරු පෙර දිග බලා වැඩියෝය. දිනක් උදෑසන පිණ්ඩපාතයට යෑමට පෙර රාහුල වික්ෂිප්තව සිටින බව ස්වස්ති දුටුවේය. පිණ්ඩපාතය සඳහා ගිය ද සිත වික්ෂිප්තව ස්වස්ති දක්කේය. ''මගේ පියා සම්බුද්ධත්වයට පත් නොවුණා නම් මහා සක්විති රජ කෙනෙක් වෙනවා නේ ද? එහෙම වුණා නම් අද කොහොම ඉඳීවිද?'' යනාදී නොයෙක් කරුණු ගැන විවිධ ආකාරයෙන් රාහුල සිතුවේය. ''එහෙනම් මමත් අද කොහොම කෙනෙක් ද?'' මේ සියල්ල ගැන සිත සිතා සිටියා මිසක් භාවනා කළේ නැත.

නමුත් බුදුන් රාහුලව දැක්කේ නැත. රාහුල හොඳ සිහියෙන් නැති බව බුදුරදුන් දැන සිටියෝය. බුදුරදුන් ගමන නතර කරලා හැරී බලන විට භික්ෂූන් ද නතර වී බලන්න ගත්තේය. බුදුන් සැමගෙන්ම නුඹලා සියලුම දෙනා ඉන්නේ හොඳ සිහියෙන් නොවේ ද?'' යනුවෙන් ඇසුවෝය.

රාහුල තම හිස පහත් කළේය. බුදු රජානන් වහන්සේ රාහුලට අමතා ''ආශ්වාස ප්‍රශ්වාස ක්‍රියාව හොඳට කළොත් සිහිය හොඳට සිටීවි'' යැයි කීවෝය.

බුදුරදුන් නැවත ගමන ආරම්භ කළහ. මේ පුංචි කතාවෙන් සියලුම භික්ෂූන් කල්පනාකාරී විය. ටික දුරක් ගොස් රාහුල සියලු දෙනාගෙන් වෙන් වී වන රොදට ඇතුළු වූවේය. ඔහු ගසක් යට තනිවම වාඩි විය. ස්වස්තිත් රාහුලගේ පිටිපස්සේ ගමන් කළේය. රාහුල ස්වස්ති දැක '' ඔබ අනෙක් අය සමඟ යන්න, මට පිණ්ඩපාතය කරන්න හිත දෙන්නේ නැහැ, යැයි පැවසීය.

''බුදුරජුන් සැමගේ ම ඉදිරිපිට මගේ අඩුපාඩු කිවුව. මට ලැජ්ජා හිතුණා. ඒ නිසා මා තනිවම භාවනා කරනවා. ඒ නිසා ඔබ අනෙක් භික්ෂූන් සමඟ යන්න, යැයි කීවේය. මිත්‍රයාට කිසිම

උපකාරයක් කරන්න බැරි බව දැනගත් ස්වස්ති අනෙක් භික්ෂූන් සමග පිණ්ඩපාතය සඳහා පිටත් විය.

පිණ්ඩපාතයෙන් ආපසු එන ගමනේ දී ශාරිපුත්ත හිමියන් සහ ස්වස්ති වනයට ඇතුළු වූහ. රාහුලව ආපසු එක්කගෙන යෑම සඳහා ස්වස්තිගේ පිණ්ඩපාතයෙන් කොටසක් රාහුලට දී ''බුදුරජාණන් වහන්සේ රාහුලව දකින්න කැමැත්තෙන් ඉන්නවා,'' යැයි කීවේය. ස්වස්ති සමඟ පැමිණෙන ලෙස ශාරිපුත්ත හිමියෝ රාහුලගෙන් ඉල්ලා සිටියෝය.

දැන් රාහුල හොඳට බුද්ධිය වර්ධනය වී ඇති කෙනෙක් යැයි බුදුරදුන් සිතුවේය. මහ පොළොව උදාහරණයකට ගෙන කටයුතු කරන්න යැයි කීවෝය. පෘථිවිය සුවඳ, ගඳ, කිරි, අසුචි වශයෙන් සියල්ලම භාරගන්නා සේ තමන්ගේ ජීවිතයත් සෑම දෙයකටම ගැළපෙන පරිදි සූදානම් කර ගෙන කිසිම දේක වසඟයට යන්නේ නැතිව මධ්‍යස්ථව බාරගන්න. අදහස්වල දාසයෙක් නොවන්න. ජලයෙනුත් යමක් ඉගන ගන්න පුලුවන් ආකාරය පෙන්නුව. ගින්දරින් ද යමක් ඉගන ගන්න හැකියි. වායුවෙන් ද ඉගෙන ගැනීමට අවශ්‍ය බොහෝ දේ ඇතැයි,'' බුදුන් වහන්සේ රාහුල අමතා කීවේය.

''ක්‍රෝධයෙන් ජය ගන්න නම් ප්‍රේමය ඉතා අවශ්‍යය කරුණාවෙන් පිරි ප්‍රේමයේ ශක්තිය අපරිමිතය. කෲර බව දයාවෙන් ජයගත හැකිය. අනෙක් අයට උපකාර කිරීමට සිතීමෙන්, උපකාර කිරීමෙන් හදවතට ඇතිවන සතුට වෙන කිසි දෙයකින් නො ලැබෙනවා,'' යැයි ද උන් වහන්සේ කීවෝය.

රාහුල, ප්‍රේමය සමඟ කරුණාව, දයාව සමඟ කරුණාව, සහනුභූතී බව, ආනන්දදායක බව, මමත්වය නැතිකම, සිතේ සුන්දර බව, විශාල හෘදයෙන් යුක්ත වීම. මේ සියල්ලෙන්ම සතුට ඇති වීම සිදු වෙතත් මේ සියල්ලෙන් යුක්ත වුණොත් නුඹ අනෙක් අයටත් සතුට ගෙන දෙන කෙනෙක් වෙනවාට කිසිම සැකයක් නැහැ.

''රාහුල, අනිත්‍ය ගැන සිතුවොත් බැඳීම්වලින් මිදීම ඉතා පහසු බවත් සිතන්න. ජීවිතයේ බලාපොරොත්තුවලින් මිදී සැහැල්ලු ජීවිතයක් ගත කිරීමට අනිත්‍ය මෙනෙහි කිරීම අනිවාර්යයෙන්ම

සිදු කරන්න කිව්වා. ආශ්වාස ප්‍රශ්වාස සිහියෙන් ගැනීමෙන් සිතේ එකඟභාවය අනිවාර්යයෙන්ම සිදුවනවා,'' යැයි ද බුදුරදුන් රාහුල අමතා කීවෝය.

රාහුල සමඟ ස්වස්තිත් මේ කතා සියල්ල අසා සතුටට පත් විය. දෙදෙනාම ධර්ම චක්‍ර සූත්‍රය කට පාඩම් කරගෙනයි සිටියෝය. නමුත් ධර්මය පිළිබඳ මේ තරම් හැඟීම් බර දේශනාවක් ප්‍රථම වරට ශ්‍රවනය කළේ අද කියා ආනන්ද සතුටට පත් විය. ඊට හේතුව බුදුරදුන්ගේ අනෙත් සූත්‍ර මීට කලින් නො අසා තිබීමයි. ස්වස්ති මුලින්ම ඇසූ දේ තමයි ගවයින් පාලනය කරන ක්‍රමය. නමුත් ඒ අවස්ථාවේ දී ස්වස්තිගේ බුද්ධිය එතරම් මුහුකුරා ගොස් තිබුණේ නැත. මේ ධර්ම උපදේශයෙන් පසුව ස්වස්ති සියලුම සූත්‍ර කටපාඩම් කරගන්න ඕනෑ යැයි සිතුවේය.

ආශ්වාස ප්‍රශ්වාස දීර්ඝව, කෙටිව ගන්නා ආකාරය ඉන් සිතේ එකඟකම ඇති වන ආකාරය ඉතාම හොඳට පැහැදිලි විය. ස්වස්ති සහ රාහුල දෙදෙනාම ආශ්වාස ප්‍රශ්වාස ක්‍රියාව ඉතා හොඳින් සිත යොදා භාවනා කරන්න තදින් අධිටන් කර ගත්තෝය.

## පනස් වන පරිච්ඡේදය

# මිටක් පමණ යව හාල්

ඊළඟ වස් කාලය භික්ෂූන් පන්සිය නමක් සමඟ බුදුරදුන් වේරංජාවේ වැඩ සිටියහ. ශාරිපුත්ත, මොග්ගල්ලායන යන භික්ෂූන් වහන්සේලා ද බුදුරදුන් සමඟ වූහ. වස් කාලයේ වේරංජාවේ මහා සාගතයක් ඇති විය. උෂ්ණය ද ඉවසා ගත නො හැකි තරම් විය. බුදුරදුන් නිතර කොහොඹ ගස් යට තම කාලය ගත කළහ. දානය වැළඳීම, ධර්ම දේශනා කිරීම, සැතපීම ආදී සියල්ලම සිදු කළේ කොහොඹ ගස් සෙවනකය.

වස් කාලයේ තුන් වන මාසයේ භික්ෂූන් හට දානය ලැබීම ද අඩු විය. බොහෝ භික්ෂූන්ට උණ සන්නිපාත, පාචනය ආදී රෝග වැළඳෙන්නට පටන් ගත්තේය. උෂ්ණය අධික වීම නිසා ජලය හා කෑම යන දෙකම ක්‍රමයෙන් අඩු විය. රජයේ ආරක්ෂිත කෑම ගබඩාව ද හිස් විණි. බොහෝ භික්ෂූන් පිණ්ඩපාතයට ගොස් හිස් පාත්‍ර රැගෙන ආපසු ආහ. බුදුරදුන්ටත් පිණ්ඩපාතය නොලැබී ගියේය. උන් වහන්සේ සමහර දිනවල ජලය පමණක් පානය කර කාලය ගත කළහ. භික්ෂූන්ගේ ශරීර දුර්වල වී කෘෂවෙන්න පටන් ගත්තේය.

වස් කාලයේ ඉතිරි කාලය ගත කිරීමට උතුරු කුරු දිවයිනට යාමට මොග්ගල්ලයන හිමියේ යෝජනා කළෝය. ඒ පළාතේ කෑම බීමවල අඩුවක් නොවන බවත් උන් වහන්සේ ප්‍රකාශ කළහ. ''මොග්ගල්ලායන කෑම බීම ප්‍රශ්නය අපට පමණක් ඇති වූ දෙයක් නොවෙයි. පොහොසත් කිහිප දෙනෙකුට හැර මේ ප්‍රශ්නය අනෙක් සෑම දෙනෙකුටම තදින් බලපානවා. මේ වෙලාවේ අපි මේ ගම අත් හැරලා යෑම කිසිසේත්ම වටින්නේ නැහැ. ඒ නිසා සම්පූර්ණ වස් කාලය වේරංජාවේම ගත කරමු,'' යි බුදුරජාණන් වහන්සේ මොග්ගල්ලායන හිමියන් අමතා කීවෝය.

බුදුන්ට වේරංජාවේ වස් වසන්න ආරාධනා කළේ අග්ගි දත්ත යනුවෙන් හැඳින්වූ ඒ ප්‍රදේශයේ ප්‍රසිද්ධම ධනවතාය. වස් සමාදන් කරවීමෙන් පසුව අග්ගි දත්ත ව්‍යාපාර කටයුතු සඳහා වේරංජාවෙන් පිට වී ගියේය. මේ සිද්ධි කිසිවක් ගැන එතුමාට කිසිම ආරංචියක් ලැබී තිබුණේ නැත.

මුගලන් මහ රහතන් වහන්සේ විහාරය එක් ස්ථානයක කොළපාට තණකොළ පඳුරු කිහිපයක් පැළ වී තිබෙනු දුටුවෝය. බුදු හාමුදුරුවන් හමු වූ උන් වහන්සේ, ''ගුරු දේවයාණනි, මා දුටුවා, විහාරය අසල තැනක තණ පඳුරු කිහිපයක් වැවී තිබෙන බව. තණ කොළ පැළවී තිබීමට හේතුව ඒ පොළොවේ යම් කිසි ශක්තියක් තිබීමයි. ඒ මැටි අරගෙන වතුරට කළවම් කර රත් කර භික්ෂූන්ට බීමට දුන්නොත් භික්ෂූන්ගේ බඩ ගින්න නැති විය හැකියි,'' යනුවෙන් පැවසීය.

''එසේ කිරීම නුසුදුසුයි. මා දුෂ්කරක්‍රියා කරන කාලයේ ඔය වගේ මටත් සිතුණා. නමුත් එහෙම ආහාරයට සුදුසු පෝෂක තත්වයක් එහි නැති බව මට දැනුණා. අනික සූර්ය රශ්මියෙන් බේරී සිටීමට බොහෝ ප්‍රාණීන් මැටි යට සුරක්ෂිතව ඉන්නවා. අපි මැටි හාරන්න ගත හොත් බොහෝම සත්තු මැරෙන්න පුළුවන්. අනෙක් අතට කොළ පාට ඇති පඳුරු මැරෙන්න ඉඩ තියනවා,'' යි බුදු රජානන් වහන්සේ පැවසූහ.

මේ සියල්ල ඉදිරිපිට මුගලන් හිමියෝ නිරුත්තර විය.

පිණ්ඩපාතයෙන් ලැබෙන ආහාරයෙන් කොටසක් විහාරයේ එක් තැනක තිබුණු භාජනයක තැන් පත් කරන ලෙස

විහාරයේ නියමයක් තිබිණි. යම් කිසි භික්ෂුවකට පිණ්ඩපාතය නොලැබුනොත් එකී භාජනයෙන් දානය ගැනීමට ඒ භික්ෂූන්ට අවසර තිබිණි. ස්වස්ති ඒ භාජනය හිස් වී ඇති බව දුටුවේය. ඒ භාජනයේ බත් ඇටයක් වත් එකම චපාතියක් වත් නොවීය. කොපමණ ආහාර හිඟ වුවත් ඇති දෙයින් පළමු කොටම වැඩිමහල් භික්ෂූන්ට දානය දිය යුතු යැයි රාහුල ස්වස්තිට කීවේය. ''මට තදින්ම බඩගින්න ඇති වූ සමහර දිනවල දී පිණ්ඩපාතය ලැබුණේ ඉතාම අඩුවෙන්. නමුත් මොනවා කරන්න ද මා ඉන් සතුටට පත් වුණා. මෙහෙම ඔබටත් වුණා නේද?'' යනුවෙන් ස්වස්ති රාහුලට කීවේය.

රාහුල බඩගින්න සමඟ නිදිමත බරින් හිස සලා ස්වස්ති කියූ දේට එකඟ විය. ආනන්ද පිණ්ඩපාතයෙන් ආපසු පැමිණ ලිපක් ගිනි මොලවන්න හදන විට ස්වස්ති ළඟට පැමිණ උදව් කළේය. වතුර රත් වන විට ආනන්ද භාජනයට යව ස්වල්පයක් දැමීය. එය පැසුණු විට ''මේ යව ටිකෙන් කොටසක් බුදු රජාණන් වහන්සේටත් පිළිගන්වන්න,'' යි කීය.

ස්වස්ති යව තැම්බෙන තෙක් ලී කැල්ලකින් එය කලවම් කළේය. මේ අතර අශ්ව වෙළඳාම කරන තැනැත්තෙක්, අශ්වයන් පන්සියයක් රැගෙන විත් සිටින බව ආනන්ද හිමි කීවේය. අශ්ව වෙළඳාමේ පැමිණි වෙළෙන්දාට බුදුරදුන් සහිත මහා සංඝයාට සිදු වී ඇති විපත්තිය දැනගන්න ලැබිණි. අශ්ව වෙළෙන්දා ''අශ්වයින්ට කෑම සඳහා යව මා ළඟ තිබෙනවා. ඔබ වහන්සේලාට අවශ්‍ය පරිදි එක් භික්ෂුවකට එක අල්ල බැගින් යව අවශ්‍ය වෙලාවට ගිහිල්ලා කෑම සඳහා ගන්න,'' යි ආනන්ද හිමියන්ට කීවේය.

එදා අශ්ව වෙළෙන්දා විසින් ආනන්දට දෑත පුරා දෙවරක්ම යව දෙන ලදි. එක දෝතක් තමන්ටත් අනෙක් කොටස බුදු රජාණන් වහන්සේටත් කියා ආනන්ද අශ්ව වෙළෙන්දාට කීවේය. ''මේ ආරංචිය අනෙක් භික්ෂූන්ටත් දෙන්නම්,'' යි උන් වහන්සේ පොරොන්දු විය.

මේ අතර ආනන්ද ලිපේ තැබූ යව තැම්බී තිබිණි. එක පාත්‍රයකට එයින් ටිකක් දාගත් ආනන්ද ස්වස්ති සමඟ කොහොඹ ගස අසලට ගියේය. ඒ කොටස ආනන්ද බුදුරජාණන් වහන්සේට පූජා කළේය. බුදුරජාණන් වහන්සේ දෙදෙනාගෙන්ම ''අද

පිණ්ඩපාතයට මොනවා හරි ලැබුණා ද? යි ඇසූහ. ස්වස්ති තම පාත්‍රයට ලැබුණු එක බතල අලයක් පෙන්වා ඒ බතල අලය බෙදාගෙන වළඳන්න සැමට ආරාධනා කළේය. මේ වන විට බුදුරදුන්ට ලැබුණ සුළු යව ටික උන් වහන්සේ වළඳන ලදි. ස්වස්ති බතල ගෙඩිය ගෙන එන විට බුදුරදුන් වළඳා අවසාන බව දුටුවේය. මේ සිද්ධියේ දී ස්වස්තිට ලොකු කනගාටුවක් ඇති විය. ඔහු අඬන්න පටන් ගත්තේය.

පසුදා ධර්ම දේශනාවෙන් පසුව ආනන්ද භික්ෂූන් වහන්සේලා සැම දෙනාටම අශ්ව වෙළෙන්දාගේ දානය ගැන දැනුම් දුන්නේය.

''කාට හරි දානය ලැබුනේ නැත්නම් පමණක් වෙළෙන්දා ළඟට යන්න,'' යි කීවේය. ඒ පිදුරු සහ යව දෙකම අශ්වයිගේ ආහාරයි. ''අපි අශ්වයින්ගේ කෑම කාලා අශ්වයින්ව බඩගින්නේ තියන්න හොඳ නැහැ''

එදින රාත්‍රී සඳ එළියේ ශාරිපුත්ත හිමි කොහොඹ ගහ යටට ගොස් බුදුරදුන් හමු විය. බුදුන් සමීපයේ දී ඔහු ''සද්ධර්මය අද්භූත යි, සද්ධර්මය අනුගමනය කරන්නාගේ ජීවිතය ධාර්මික අංශයට යොමු වීම ස්වාභාවිකයි, ගුරු දේවයාණනි, ඔබ නැති දාට අපි සද්ධර්මය අනුගමනය කරන්නේ කොහොම ද?'' යනුවෙන් ඇසීය.

''ශාරිපුත්ත ධර්මය නිර්මලයි. කිසිම පෞද්ගලික බලාපොරොත්තුවක් නැතිව සූත්‍රවල අර්ථ හරිහැටි තේරුම්ගෙන අනුගමනය කළොත්, ශීලය ආරක්ෂා කළොත්, බුදු සසුන නිර්මලව අවුරුදු දහස් ගණනක් පවතිනවා,'' යි බුදුරදුන් පිළිතුරු දුන්හ.

''ගුරු දේවයාණනි, බොහෝ භික්ෂූන් ඉතා වෙහෙස මහන්සි වී සියලු සූත්‍ර කට පාඩම් කරනවා. මේ ක්‍රමය ඉදිරියටත් දිගටම් පැවතුණොත් ඔබගේ වචනය අනුව ශාසනය දීර්ඝ කාලයක් පැවතීම අනිවාර්යයෙන්ම සිදුවනවා.''

''ශාරිපුත්ත, සූත්‍ර කෙනෙකුගෙන් තව කෙනෙකුට පැවසීම සෑහෙන්නේ නැහැ. සූත්‍රවල සඳහන් කරුණු ජීවිතයට සම්බන්ධ කර ගැනීම ඉතාම වටිනවා. මේ සියල්ලෙනුත් ශීලය ආරක්ෂා කිරීම ගැන දෙසූ දේශනා ඉතාම වැදගත්. ශිලයෙන් තොරව

සද්ධර්මය දීර්ඝ කාලයක් පැවතීම කිසිසේත්ම සිදු නොවේ. ශීලය ආරක්ෂා නොකළොත් සද්ධර්මය ක්‍රමයෙන් විනාශ වනවා.'' යැයි බුදුන් වහන්සේ පැවසීය.

''මේ සඳහා වෙනම මාර්ගයක් නැද්ද? ශීලය ආරක්ෂා කිරීමට කුමක් හෝ සරල උපාය මාර්ගයක් සොයා ගන්න අපහසු ද?

''මේ සියල්ලම එතරම්ම පහසු නැත. සූත්‍රවල සඳහන් කරුණු ජීවිතයට සම්බන්ධ කර ගැනීම එක දවසක් පමණක් කිරීම සෑහෙන්නේ නැහැ. එක් පුද්ගලයෙක් විසින් සිදු කිරීම ද සෑහෙන්නේ නැත. සංඝ සමාජයේ ආරම්භයේ දී ශීලය ගැන යමක් කීම අවශ්‍ය වුණේ නැහැ. ක්‍රමයෙන් භික්ෂූන්ගේ අඩුපාඩුකම් ජීවත් වීමේ රටාව ආදිය වෙනස් වන්නට පටන් ගත් විට ශීලය ගැන නීති පනවන්න සිද්ධ වුණා. මේ දවස්වල එකසිය විස්සක් ශීල සහ අනුශාසනා පනවලා තියනවා. කාලය අනුව මේ ගණන තවතවත් වැඩි වෙන්න පුළුවන්. ශාරිපුත්ත තවම ශීලය සහ අනුශාසනා සම්පූර්ණ වුණේ නැහැ. මේ යන ක්‍රමය අනුව ඉදිරියට ශීලය නීති දෙසියයකට හෝ ඊට වැඩි ගණනක් විය හැකියි'' බුදුන් වහන්සේ පැවසූහ.

වස් කාලයේ අවසන් දිනය පැමිණියේය. අග්ගි දත්ත තම ව්‍යාපාරයේ කටයුතු අවසන් කර වේරංජාවට ආවේය. වස් තුන් මාසයේ බුදුරදුන් ඇතුළු භික්ෂු මහා සංඝයා කුසගින්නේ සිටි බව අසා ඔහු දුක් විය; ලැජ්ජාවටත් පත් විය. ඉන්පසු තමන්ගේ ගෙදරම භික්ෂූන්ට දානය සූදානම් කළේය. එක් එක් භික්ෂූන් වහන්සේට අලුත් සිවුර බැගින් පූජා කළේය. අවසාන දවසේ දේශනාව බුදුරජාණන් වහන්සේ දේශනා කළ පසු සියලුම භික්ෂූහු දකුණු දිශාව බලා වැඩම කළහ.

ඒ ගමන ඉතාම ප්‍රිය ජනක ගමනක් විය. භික්ෂූන් වහන්සේ විවේකීව උදෑසන පිණ්ඩපාතය කරමින් දහවල් කාලයේ විවේක ගනිමින් ගමන් කළහ. රාත්‍රී කාලයේ අඹ වනයක විවේක ගත්හ. සහහර විට සමහර ගම්වල දින කීපයක් ගත කළෝය. ඒ ගම්වල මිනිස්සු ධර්මය ඇසීමට උනන්දුවක් දක්වීම ඊට හේතුව විය. සැතපීමට පෙර සූත්‍ර කට පාඩම් කර භාවනා කිරීම සිරිතක් හැටියට සිද්ධ කෙරිණි.

දිනක් ළමයි කිහිප දෙනෙක් හරක් රැළක් දක්කාගෙන යනු ස්වස්ති දුටුවේය. මේ පිරිස නතර කර ඔහු ඔවුන් සමඟ තොරතුරු කතා කළේය. ස්වස්තිට තම කුඩා කාලය මතකයට ආවේය. බාලා, රූපක්, හීමා, කුස තණ ආදී සියල්ලම මතකයට ආවේය. තමන් දැන් ගත කරන්නේ පැවිදි ජීවිතයක් බව ඔහුට අමතක විය. පවුලේ සැම දෙනම සිහිවිය. පවුලේ සියලුම දෙනා සිහි වන බව රාහුල ද දිනක් කීවේය.

මේ වන විට ස්වස්තිගේ වයස අවුරුදු විසි එකකි. තරුණයන් සමඟ ගත කිරීම ඉතා ප්‍රියජනක විය.

ස්වස්ති සැම විටම තම හදවතේ අදහස් විවෘතව ඉදිරිපත් කළේය. තම ගොපලු ජීවිතය පිළිබඳ සියලුම විස්තර රාහුල සමඟ කීවේය. රාහුල කිසිම දිනක ගවයන් පිට නැඟ තිබුණේ නැත. මී හරකෙක් වගේ ලොකු සතෙක් ඔය තරම්ම අහිංසක බව රාහුල විශ්වාස කළේ නැත. නමුත් ස්වස්ති මී හරකුන්ගේ ඇති අහිංසකකම ගැන රාහුලට විස්තර කළේය. අනෙක් ගෝපාලයන් සමඟ සෙල්ලම් කළ ආකාරය ගැන රාහුලට විස්තර කළේය. මේ සියල්ල අසා රාහුල සතුටට පත් විය. රජ මැදුරේ හැදුණුවැඩුණු රාහුලට මේ කථා සිහින මෙන් දැනිණි. කවද හෝ දවසක මී හරකෙකුගේ පිටට නැඟ ටික දුරක් හෝ ගමන් කළ යුතු යැයි රාහුලට සිතිණි. ස්වස්ති ඒ අවශ්‍යථාව කර දීමට පොරොන්දු විය.

එසේ පොරොන්දු වුවත් ඒ පොරොන්දුව ඉටු කරන්නේ කෙසේ ද යන්න ස්වස්ති දැන සිටියේ නැත. දෙදෙනාම භික්ෂූන් වහන්සේලා නිසා, ඒ කාර්යය මඳක් අසීරු විය. යම් දිනක බුදුන් වහන්සේ තම ගම වූ උරුවේලාවට වැඩිය හොත් උන්වහන්සේගේ අවසරය ගෙන රාහුල මී හරකෙකුගේ පිටේ අරගෙන යන්නෙමියි, ස්වස්ති අදිටන් කර ගත්තේය. ඒ සඳහා රූපක්ගේ ආධාරය ද ලබා ගත හැකි යැයි ඔහු සිතුවේය. සිවුර ගලවා, නේරංජා ගඟ අසබඩ තබා රාහුල කෙසේ හෝ මී හරකෙු පිට ගෙන යාමට ඔහු තදින්ම අදිටන් කර ගත්තේය.

ඊළඟ වසරේ බුදුරජාණන් වහන්සේ චාලිකා පර්වතයේ වස් වැසුවෝය. ඒ බුදු බව ලබා ගැනීමෙන් පසු දහතුන් වන වර්ෂණ ඍතුව විය. මේඝීය හිමියන් ද බුදුරදුන්ගේ උපකාරයට උන් වහන්සේ සමඟ සිටියේය. මෙසේ වස් කාලය ගත කරන

අතර දිනක් මේඝීය හිමි බුදුන් වහන්සේ සමඟ මෙසේ පැවසීය; ''ස්වාමීනී, මේ මහා වනයේ තනිව ගත කරන විට, විකාර අදහස් සිතේ පහළ වෙනවා. ඒ නිසාම සිතටත් කරදරයි. මට අදහා ගන්න බැරි ඔබ වහන්සේ වනයේ ඒකාන්ත බව, මෙතරම් වර්ණනා කරන්නේ ඇයි ද කියලා,'' යැයි පැවසීය.

''ඒකාන්ත වාසය කියන්නේ මිත්‍රයින් නැතිව හැසිරීම නොවෙයි. මිත්‍රයින් සමග එකට ඉඳගෙන ඒත් අනවශ්‍ය කතාබස්වල යෙදිලා කාලය විනාශ නොකිරීමයි. තමන්ගේ ධ්‍යාන භාවනා කටයුතුවල දී මිත්‍රයින්ගේ උපකාර ගැනීම ඉතාම වැදගත්. සංඝ සමාජය හැදුවේ කෙනෙක් තව කෙනෙකුට උපකාර කරාවි යන අදහස ඇතිව. සංඝං සරණං ගච්ඡාමි යන පදයේ අර්ථය හරි හැටි දැන ගත්තේ නැත්නම් සංඝ සමාජයේ සතුටින්, සැනසීමෙන් ජීවත් වීම ගැන සිතිය නොහැකියි. මේ සඳහා කරුණු පහක් සඳහන් කරනවා. සුගත බව පළමු කාරණයයි. සද්ධර්ම මාර්ගයට අනුකූලව කටයුතු කිරීමයි ඒ.

''සද්ධර්ම මාර්ගයට සහයෝගය දීම දෙවන කාරණයයි. ශීල පාලනය තුන්වන කාරණයයි. ධර්මය ඉගෙනීමට අවශ්‍ය කාලය වෙන්කර ගැනීම හතරවන කාරණයයි. උත්සාහයෙන් භාවනා ආදිය සිදු කිරීම පස් වන කාරණයයි. ප්‍රඥාවෙන් කටයුතු කිරීම ඉහත සඳහන් කරුණු පහ සසුනේ දීර්ඝ පැවැත්මට හේතු වනවා යයි සඳහන් කළෝය.

## පනස් එක් වන පරිච්ඡේදය

# සිහි කල්පනාවෙන් ජීවත් වීම

දහතුන් වන වස් කාලය අවසන් වීමෙන් පසුව බුදු රදුන් ශ්‍රාවස්ථිය බලා වැඩම කළෝය. ස්වස්තිත් රාහුලත් ඒ සමඟම ගමන් කළහ. ස්වස්ති ජේතවනයට ගිය පළමුවතාව එය විය. ජේතවනයේ සුන්දර වාතාවරණය ධ්‍යාන භාවනා කරන අයට ආරාධනා කරන ආකාරයේ පරිසරයකි. මේ පරිසරය දැක ස්වස්තිය සතුටට පත් විය. සීතල සුවදායක මෛත්‍රී පූර්වක සුවඳක් ජේතවනයේ ඇති බව ස්වස්තිට දැනිණි. ධ්‍යාන භාවනාවල ඉතාම හොඳ ප්‍රගතියක් මේ ස්ථානයේ දී ලබා ගත හැකි වේ යැයි ස්වස්තිට සිතිණි. බුද්ධ, ධම්ම යන රත්න දෙකට අමතරව සංඝයාගේ වැදගත් කම කොපමණ ද යන බව ස්වස්තිට දැනගන්නට ලැබුණේ ශ්‍රාවස්ථියට පැමිණි පසුවය. සංඝයා යනු ධ්‍යාන භාවනා කර සමාජය යහමඟට යොමු කරන සමූහයයි. මේ අයට උපකාර කරන පිරිසටත් යහපතක් මිස අයහපතක් සිදු නොවේ. ඒ නිසා සංඝං සරණං ගච්ඡාමි යන පදය සමාදන් කෙරෙන බව ස්වස්තිට අවබෝධ විය.

රාහුලගේ වයස අවුරුදු විස්ස සම්පූර්ණ විය. ශාරිපුත්ත හිමි රාහුල උපසම්පදාවෙහි පිහිටු විය. මේ අවස්ථාවේ දී සියලුම භික්ෂූන් සතුටට පත් විණි. උපසම්පදා ශීලයෙහි පිහිටීමට පෙර ශාරිපුත්ත රාහුලට අවශ්‍ය විනය නීති උගන්වා තිබිණි. ස්වස්තින් රාහුල ළඟින්ම ආශ්‍රය කළ නිසා විනය නීති ඉගෙන ගැනීමේ භාග්‍ය ඔහුට ද උදා විය.

උපසම්පදාවෙන් පසු බුදුරදුන් රාහුලට විවිධ ආකාරයට ධර්මය මතක තබා ගැනීමේ ක්‍රම උගැන්වූහ. බුදුරදුන් රාහුලට ඇස, කන, නාසය, දිව, ශරීරය සහ මනස යන ඉන්ද්‍රිය පස ගැන විස්තර කළෝය. ඇසට රූපයත්, කණට ශබ්දයත්, නහයට සුවඳත්, දිවට රසත්, ශරීරයට ස්පර්ශයත් යන කරුණු බලපාන්නේ කෙසේ ද? ඉන් තණ්හා, ආශා, ක්‍රෝධ, මෝහ, පළිගැනීම්, බැඳීම්, ඇලීම, මමය, මාගේය යන කරුණු අනුව සිතට ඇති වන සුඛ දුක්ඛ වේදනා ගැන විස්තර කර දුන්නෝය. ස්වස්ති ද රාහුල සමඟ සිටියේය.

අනිත්‍ය පිළිබඳ විස්තර  ශරීරයේ භාවනාවත් අවධාරණවත් භාවබෝධ චේතනා සහිත පංචස්කන්ධයෙහි අනිත්‍ය බව ශරීරය අනිත්‍ය, දුක්ඛ, අනාත්ම යන ලක්ෂණ තුනට භාජනය වන බවත් ඒ නිසා එහි ගැලීම සුදුසු නැති බවත් දේශනා කළෝය. මෙතරම් ගැඹුරු දර්ශනයක් සිතෙහි ධාරණය කර ගැනීමට රාහුලට හොඳ බුද්ධියක් තිබිණි.

ජේතවනයේ ථේර යනුවෙන් හැඳින් වූ භික්ෂුව කිසිදාක කිසි කෙනෙක් සමඟ කතා නොකර සිටින බව ස්වස්ති දැක්කේය. තම කටයුතු  සියල්ලම තනිවම කළ අතර කිසි කෙනෙකුට කරදර කළේ නැති බව ද දුටුවේය. ඉතාම හොඳින් ශිල්වත් විය. ඉතාම හොඳ ශීලවන්ත කෙනෙක් හැටියටත් ප්‍රසිද්ධ වී සිටියේය. නමුත් අනෙක් භික්ෂූන් සමඟ කිසිම සුහද බවක් පෙන්වූයේ නැත. දවසක් ස්වස්ති ථේර සමඟ කතා කරන්න මහන්සි ගතතේය. නමුත් ඔහු කිසිම කතාබහකට එක් නොවී එතැනින් නික්ම ගියේය. සියලුම භික්ෂූන් උන් වහන්සේට ඒකාන්ත වාසී යන නම ව්‍යවහාර කළේය. නිෂ්ඵල වචන නොකියන ලෙසත් ධ්‍යාන භාවනා කිරීමට යෙදීම නිතර මතක් කළ දෙයක් විය.තම තමන්ගේ කටයුතු තමන් විසින්ම කරගෙන තමන්ට තමන්ම පහනක් එළියක් වීමට නිතර උපදෙස් දුන් බව සිහිපත් කළේය. බුදුන් දේශනා කරන ආකාරයට ථේර

නිහඬව ජීවත් වුවත් බුදුන් දේශනා කළ ආකාරයේ කෙනෙක් නොවන නිසා මේ විෂය ගැන බුදු රජාණන් වහන්සේ සමග සාකච්ඡා කරන්න ඕනෑ යැයි ස්වස්ති සිතුවේය.

දෙවන දින ධර්ම දේශනාවෙන් පසු බුදුන් වහන්සේ ථේර හිමියන් අමතා, ''ඔබ තනිවම තමන්ගේ කටයුතු කරගෙන අනෙක් අය සමඟ ගනුදෙනුවක් නොමැතිව, සුහදකමක් නොමැතිව ඉන්නවා කියන්නේ ඇත්ත ද? අනෙක් භික්ෂූන් සමඟ කිසිම ගනුදෙනුවක් නොමැතිව ඉන්නේ ඇයි ද?'' යි විමසීය.

''ගුරු දේවයිනි, එය සත්‍යයයි. ඔබ වහන්සේ දේශනා කර ඇත්තේ ආත්ම නිර්භරව ඉන්න සැමවිටම උත්සාහ දරන්න කියලා. තනිවම ධ්‍යාන භාවනා කිරීමට ඔබ වහන්සේයි උපදෙස් දුන්නේ,'' යනුවෙන් ථේර හිමි පිළිතුරු දුන්නේය.

බුදුරදුන් භික්ෂූන් අමතා ''ආත්ම නිර්භර බව කුමක් ද කියා සියලුම දෙනාට මා විස්තර කරනවා. හොඳට අහගන්න. සිහියෙන් ජීවත් වන පුද්ගලයා ආත්ම නිර්භර පුද්ගලයා හැටියට මා හඳුන්වනවා. වර්තමානයේ ජීවත්වන පුද්ගලයා ආත්ම නිරභර පුද්ගලයායි. ආත්ම නිර්භර පුද්ගලයා අතීතයේ හෝ අනාගතයේ හෝ ජීවත් වන්නේ නැහැ. ආත්ම නිර්භර පුද්ගලයා සැම විටම වර්තමානයේ තමන් කරන්නේ කුමක් ද සිතන්නේ කුමක් ද සිටින්නේ කොහේ ද කියා සිහිය යොදවනවා. කිසිම බ්‍රමජාලයකට අසුවන්නේ නැත. හේතුව අතීතය ගෙවී අවසානයි. අනාගතය තවම ආවේ නැත. ජීවිතයේ කුමන දේ හෝ වේවා. වර්තමානයේ ජීවත් වීම ඉතාම වැදගත්. යම් කෙනෙක් වර්තමානයේ ජීවත් නොවනවා නම් එහි අදහස ජීවිතය නැති කර ගැනීමයි.

''භික්ෂුවරුනි, අතීතය ගැන කුරුටු ගෑමෙන් ඇති ඵලය කුමක් ද? එහි අදහස ඔබ අතීතයේ කොහොම ද සිටියේ? කළේ මොනවා ද? හමු වුණේ කවුද? යන දේ නේද? මේ සිද්ධි ඔබගේ සිත චංචල කරවීම හැර වෙන කිසිදෙයක් කරන්නේ නැහැ නේ ද?

''අනාගතය ගැන සිහින ඕනෑ තරම් සිතන්න, මවන්න, ඕනෑ කෙනෙකුට පුළුවන්. ඒ සිහින ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පහසුකම් නැති වූ විට හිතට මොකද වෙන්නේ? සිත චංචල වෙනවා. සම්පූර්ණ නූනොත් හිතට දුක වේදනා කෝපය ආදී හැර ලැබෙන්නේ මොනවා ද? සිතේ ඇති වන ඒ සිතිවිලිවලින්

කීයක් සම්පූර්ණ කරගන්න පුළුවන් ද? මේ ගැන සිතසිතා සිටින විට කාලය කොපමණ විනාශ වෙනවා ද? ඉන් ඇතිවන ප්‍රතිපලය කුමක් ද?

''වර්තමානයේ සිහි කල්පනාවෙන් සිටීමේ අදහස ඔබගේ සියලුම කාර්යය ඉතා හොඳින් සිද්ධවීමයි. වර්තමානය සම්පූර්ණයෙන්ම සඵල නම් අතීතයත් වර්තමානයත් යන දෙකම සුන්දර වීම අනිවාර්යයි. වර්තමානයේ ජීවත් වන පුද්ගලයා මා අවබෝධ කරගත් දහමේ ඉතාම සතුටින් ජීවත් වන පුද්ගලයා හැටියට මා අවබෝධ කරගත් බව ඔබ සැමට දැන්වීමට මා කැමතියි.''

මේ සියලුම කාරණා බුදු රජානන් වහන්සේ එක ගාථාවකින් ඉදිරිපත් කළෝය.

අතීතය පස්සේ යන්න එපා.
අනාගත බ්‍රම ජාලයේ පටලැවෙන්න එපා.
අතීතය ගෙවී ගියා.
අනාගතය ආවේ නැහැ.
දැන් මේ දැන් මොහොත.
කොහොමද ඒ ගැන සිත යොදන්නේ
සාධනා ආදියට හොඳම මේ මොහොතයි.
මුක්ත භාවයෙන් ජීවත් වීමට මේ මොහොත හොඳයි.
ඊයේ ගැන සිතීම තේරුමක් නැහැ.
මරණය දන්නෙම නැතිව තමන් ළඟට ඒවි.
මරණය සමඟ එකඟ වෙන්න වෙනවාමයි.
භික්ෂූනි, මේ ගැන සිතන්න.
රෑ දවල් දෙකේම සිහිකල්පනාවෙන් සිටින්න.
ඒකාන්ත වාසය උත්තම බව සිතන්න

ගාථාව අවසානයේ බුදු රදුන් ථේරට ස්තුති කළෝය. තමන්ගේ ආසනයට එන්න යැයි ආරාධනා ද කළෝය. ඒකාන්ත වාසය කුමක් ද එහි ඇති වැදගත්කම කුමක් ද යන්න සියලු දෙනාට වැටහිණි. එදා හවස මේ පිළිබඳව සාකච්ඡා කළ අවස්ථාවේ ''බුදු රජාණන් වහන්සේගේ දේශනාව කොපමණ සුන්දර ද?'' යැයි අන් සියලු දෙනාගෙන් ස්වස්ති ඇසුවේය.

බුදු රජානන් වහන්සේ දේශනා කළේ යම් දේශනාවක් ද එකී දේශනාව ඒ ආකාරයටම ආනන්ද හිමියෝ එය නැවත දේශනා කළෝය. ඒ දේශනාව අසා ස්වස්ති තවත් ප්‍රසන්න විය.

දෙවන දින උදෑසන භික්ෂූන් පිණ්ඩපාතය සඳහා වැඩියෝය. පුංචි ළමයි කිහිප දෙනෙක් කුඹුරක සෙල්ලම් කරනු පෙනිණි. කකුළුවකු දුටු එක් පුංචි දරුවෙක් කකුළුවා අල්ලා ගත්තේය. පසුව කකුළුවගේ එක අතක් කඩලා දැමීය. අනෙක් පුංචි ළමයි සතුටින් අත්පොලසන් නාද කළහ. සතුටින් ඉපිල ගිය පුංචි දරුවා කකුළුවාගේ දෙවන කකුලත් කඩා දැම්මේය. ඊට පසු එක එක බැගින් අඬු කඩා දැම්මේය. අඬු කැඩූ කකුළුවා භාජනයකට දැමූ ඔවුහු තව කකුළුවකුව අල්ලා ගැනීමට ගියේය.

බුදුරජුන් සහ සංඝයා එනු දැක ඔවුහු දෑත එකතු කර නමස්කාර කළහ. නමස්කාර කර ඉන්පසුව අල්ලා ගත් දෙවන කකුළුවාගේ අඬු ද කඩන්න සූදානම් වූහ.

බුදුන් වහන්සේ දරුවන් කකුළුවාගේ අඬු කැඩීමේ කාර්යයෙන් වළකා ලූවෝය. ඉන්පසු මෙසේ පැවසූහ; ''දරුවනි, නුඹලාගේ අතපය කවුරුහරි කඩන්න හැදුවොත් හරි කැඩුවොත් හරි නුඹලා සතුටු වෙනවා ද? ඒ ගැන දුක් වෙනවා ද?'' යනුවෙන් ඇසුවෝය.

''අපි දුක් වෙනවා,'' යි කුඩා ළමයින් පිරිස පැවසූහ.

'' දරුවනි, නුඹලා දන්නවා ද කකුළුවාටත් උගේ අඬු කඩන විට, නුඹලාට දැනෙන වේදනාවම දැනෙන බව?''

ළමයි නිහඬ වූහ.

''දරුවනි, කකුළුවොත් නුඹලාවගේම කන බොන පන ඇති සත්තු. උන්ටත් අම්මලා, තාත්තාලා, සහෝදර, සහෝදරියෝ ඉන්නවා. මේ කකුළුවාට හිරිහැර කිරීමෙන් නුඹලා කරන්නේ මුළු කකුළු පරපුරටම හිරිහැර කරදර කිරීමක්. ඒ සියලුම කකුළුවන්ට ඒ වේදනාව දැනෙනවා. ඒ ගැන කල්පනා කර හිතන්න, මේ කරන්ට යන දේ හොඳද? නරක ද කියලා,'' යැයි බුදුන් වහන්සේ පැවසූහ.

මේ ප්‍රකාශය ඇසූ ළමයින් පිරිස ඔවුන් කළ දේ වැරදි බව වටහා ගත්හ. මේ සිද්ධිය දුටු ගම්වාසිහු ද එතැනට එක් රැස් වූහ. බුදුන් වහන්සේගේ ළමයිනුත් අතර සිදු වන්නේ කුමක්දැයි ඔවුහු සොයා බැලූහ. මේ අවස්ථාව අරමුණු කරගෙන බුදුන් වහන්සේ ඒ ගම්වාසීන් හට සත්ව කරුණාව මාතෘකා කොට ධර්ම දේශනාවක් කළෝය.

''සියලුම ප්‍රාණීන් තම ජීවිතයට ආදරය කරන නිසා ජීවිතය ආරක්ෂා කිරීමට සියලුම ප්‍රාණීන්ට අයිතියක් තියෙනවා. අපේ ජීවිතයට අපි ආදරය කරනවා මෙන්ම අනෙක් ප්‍රාණීන් ද ඔවුන්ගේ ජීවිතවලට ආදරය කරනවා. මෙලොව සෑම කෙනෙකුටම ජීවත්වීමට අයිතියක් තිබෙනවා. අනෙක් ප්‍රාණීන්ට හිංසා කිරිමට කිසිවෙකුටත් අයිතියක් නැහැ.

''මවක් තම දරුවාට ආදරය කරන්නේ කොහොම ද? ඒ වාගේ උඩ හෝ යට හෝ අසල හෝ දුර හෝ සිටින සියලුම ප්‍රාණීන්ට ආදරය, කරුණාව, මෛත්‍රිය දැක්විය යුතුයි. රෑ, දහවල්, සිටගෙන සිටිද්දී, ඇවිදින ගමන්, ආහාර ගන්නා ගමන් ආදී සෑම අවස්ථාවකම සියලුම ප්‍රාණීන්ට මෛත්‍රිය දැක්විය යුතුයි. දරුවනි, ඔබ අල්ලාගත් කකුළුවන් අත හරින්න. මෙසේ මෛත්‍රිය කළ විට ඔබට ශාන්තිය, සතුට ලැබේවි. රාත්‍රියේ දී හොඳින් නිදාගන්න හැකි වේවි. ප්‍රසන්නතාවෙන් අවදිවන්නත් හැකි වෙනවා. නින්දෙන් භයානක සිහින පෙනෙන්නේ ද නැහැ. ඔබලාට දුකක්, කරදරයක්, පීඩාවක් වන්නේත් නැහැ. අසල් වැසියන් ඔබලාගේ වස්තු සම්පත් ආරක්ෂා කරනු ඇත. ඔබලාට යම් කිසි කරදරයක් සිදුවන්නට ඇත්නම් ඒ සියල්ලෙන්ම මිදෙන්න හැකි මාර්ගය සියලුම සත්වයන්ට කරුණාව දැක් වීමයි.

බුදුරදුන් විශේෂයෙන් ළමයින්ට ධර්ම දේශනා කිරීමට සිතට ගෙන ඇතැයි, ස්වස්ති සිතුවේය. මේ නිසා ඔහු රාහුල සමඟ සාකච්ඡා කොට පුංචි ළමයින්ට ධර්ම දේශනා කරන වෙනමම වැඩසටහනක් සූදානම් කළේය. සුදත්ත මේ සඳහා ස්වස්තිටත් රාහුලටත් උපකාර කළේය. සුදත්තගේ පුත්‍රයා මේ කාර්යය සඳහා මුලින් එතරම්ම උනන්දුවක් දැක් වූයේ නැත. නමුත් ස්වස්තිගේ උත්සාහය දුටු ඔහු ද පසුව ඊට සහභාගි විය. මේ කාර්යයේ ඇති වැදගත්කම දුටු වජ්‍රා රජ කුමරියත් ඊට සහාය වූවාය.

පොහොය දවසට බුදුන්ට පුදන්න මල් එකතු කරන්න යැයි දිනක් රජ කුමරිය කුඩා දරුවන්ට කීවාය. කුඩා ළමයි තමන්ගේ ගෙදර සිට විහාරයට එන මග දිගට සෑම තැනක ම තිබුණු මල් කඩාගෙන ආහ. රජ කුමාරි ද තම මාළිගාවේ පොකුණෙන් නෙළුම් මල් කඩාගෙන රැගෙන ආවාය. මේ අය බුදුරදුන් සමීපයට යෑමට පෙර බුදුරදුන් ධර්මශාලාවට වැඩම කර සිටියෝය. රජ කුමාරි කුඩා ළමයින් සමඟ ධර්ම ශාලාවට ගියාය. සියලුම දෙනා දෙපැත්තට වී රාජ කුමාරිටත් ළමයින්ටත් බුදුරදුන් වෙත යාමට

ඉඩ දුන්නේය. බුදුරදුන් ඉදිරි පිට තිබූ මේසය මත සියලුම දෙනා ඔවුන් ගෙන ආ මල් තැබුවෝය. ඉන්පසු ඔවුහු බුදුරජානන් වහන්සේට නමස්කාර කළහ. බුදුරදුන් පුංචි දරුවන් ආදරයෙන් පිළිගෙන ඉදිරියට විත් වාඩි වෙන ලෙස කීවෝය.

එදින බුදුරදුන්ගේ ධර්ම දේශනාවේ විශේෂයක් විය. පුංචි ළමයින් වාඩි වූ පසු බුදුරදුන් නෙළුම් මල් අතරින් එක්ක් ගෙන භික්ෂූන් වහන්සේලා ඉදිරියට ගියෝය. සෑම කෙනෙක්ම සිදුවෙන්න යන්නේ කුමක් දැයි දැන ගැනීමට වික්ෂිප්තව බලා සිටියෝය. බුදුරදුන් නෙළුම් මල නටුවෙන් අල්ලාගෙන නිහඬව බොහෝ වේලාවක් සිටියේය. බුදුරදුන් සංඝයා දෙස බලා කතා කරන්න පටන් ගත්තේය. මගේ සද්ධර්මයේ උත්තරාධිකාරී හැටියට මහා කාශ්‍යපව පත් කළා යැයි ප්‍රකාශ කළේය. සියලුම දෙනා මහා කාශ්‍යප හිමියන් දෙස බැලූහ. මහා කාශ්‍යප හිමියන් සිනා සී බුදුරදුන් දෙස වරක් ද නෙළුම් මල දෙස වරක් ද බලමින් සිටියහ. ආපසු හැරී බලන විට සියලුම නෙළුම් මල් දකින්න ලැබුණු නිසා සතුටින් සිනාසුණේය.

බුදුරදුන් මේ යෝජනාවෙන් පසු මහා කාශ්‍යප සිතන්නට පටන් ගත්තේය. නමුත් කවදා හරි කවුරු හරි ප්‍රධානත්වය ගත යුතු බව ද සිතුවේය. බුදුන් අත නැවත වෙනමම අලුත් සුදු නෙළුම් පොහොට්ටුවක් තිබිණි. බුදුරදුන්ගේ අතත් නෙළුම් මලක් මෙන්ම සෞම්‍යව විය. පරිසරය ද ඉතාම ශාන්ත විය. බුදුරදුන්ගේ මුවින් සුහඳ සිනහ පහළ වෙමින් තිබිණි.

ඉන්පසුව බුදුරදුන් දේශනාව ආරම්භ කළෝය. ''පින්වත්නි, මේ නෙළුම් මල දිහා බලන්න. සත්‍යය වර්තමානයේ ජීවත් වීම, නායකත්වය, අනිත්‍යතාව, යන කරුණු කිහිපය සුදු නෙළුම් මලෙහි මට දකින්න තිබෙනවා. අප ළඟ බොහෝ දෙනෙක් ඉන්නවා. හඳුන් වනයක ඇවිද්දත් කිසි කෙනෙක් දන්නේ නැහැ. ඇවිදින්නේ හඳුන් වනයක කියලා. ජීවිතය නොයෙක් දුෂ්කර දෙයින් පිරී ගිය එකක්. නමුත් හොඳ සිහියෙන් හොඳ සිතින් වර්තමාන ජීවිතය ගත කළ හොත් මේ නෙළුම් මල මෙන් පවිත්‍ර ජීවිතයක් ගත කළ හැකියි.'' මේ වන විට ස්වස්තිගේ වයස අවුරුදු විසි දෙක සම්පූර්ණ වූවා පමණි.

# පනස් දෙ වන පරිච්ඡේදය

# විශේෂ සුදුසුකම් ඇති වීම

බුදුන් වහන්සේ ඊළඟ වස්සාවාස කාලය කපිලවස්තුව සමීපයේ නිග්‍රෝධ වනයේ ගත කරන්නට තීරණය කළෝය. බුදුරදුන් කපිලවස්තුව බලා පිටත් විය. ශාක්‍යවරුන් හා කෝලියවරුන් යුද්ධයකට සූදානම් වන බව උන්වහන්සේට දැන ගන්නට ලැබිණි.

රාජ්‍ය දෙක බෙදුනේ රෝහිණී නදියෙනි. සටනට මුල වූයේ රෝහිණී නදියේ ජලයයි. නදිය වියළීයාමට නිසා රාජ්‍යයන් දෙකේම කුඹුරුවලට අවශ්‍ය පමණට ජලය ලබා ගන්න ක්‍රමයක් තිබුණේ නැත. රාජ්‍ය දෙකම රෝහිණි නදියේ ජලාශයක් සඳහා බැම්මක් බඳින්න සූදානම් විය. ප්‍රථම සටන දෙපැත්තේ ගොවියන්ගෙන් ආරම්භ විය. ප්‍රශ්නය උග්‍ර වන විට දෙපැත්තෙන්ම ගල් ගැසීම ආදිය ආරම්භ විය. අවසානයේ දී රෝහිණී නදිය දෙපැත්තේ රාජ්‍ය දෙකේම ආරක්ෂක නිලධාරීන් පත් කරන ලදි. මේ ගැටුම දුටු සැම දෙනාම මහා යුද්ධයක් ඉක්මනින් ආරම්භ වේයැයි සිතුවෝය.

යුද්ධයක් වීමට හේතුව කුමක් ද බුදුරදුන් පළමුවෙන්ම සිතුවෝය. ශාක්‍ය රාජ්‍යයේ සේනාපතිවරුන්ගෙන් කරුණු ඇසූ විට කෝලිය රාජ්‍යයේ අය ශාක්‍යවරුන්ගේ සියලුම සම්පත්

බලයෙන් පැහැර ගැනීමට උත්සාහ ගන්නා බව පැවසුවෝය. කෝලිය රාජ්‍යයේ සෙන්පතිවරුන්ගෙන් විමසූ විට ඔවුන් පැවසුවේ ශාක්‍ය වංශයේ අය කෝලිය රාජ්‍යයේ අයගේ සම්පත් උදුරා ගැනීමට මහන්සි ගන්නා බවයි. ගොවියන්ගෙන් විමසූ විට දැනගන්න ලැබුණේ දෙපැත්තේම ගොවියන්ට වතුර හිඟකමෙන් ගොවිතැන් කිරීමට නොහැකි වීම නිසා රෝහිණී නදියේ ජලය බෙදා ගැනීමේ සිද්ධිය මුල් කරගෙන දෙපැත්තම සටනට සූදානම් වන බවයි.

ශාක්‍ය රාජ්‍යයේ සහ කෝලිය රාජ්‍යයේ සම්බන්ධය ඉතාම හොඳින් පැවතිණි. මේ නිසා බුදු රජාණන් වහන්සේ ශාක්‍ය රජු මහානාම හා කෝලිය රජ සුප්පබුද්ධ සමඟ කෙළින් ම සාකච්ඡා කරන්න ඉදිරිපත් විය. මේ සිද්ධිය හැකි ඉක්මනට විසඳීමට බුදුරදුන් උත්සාහ දැරුවෝය. යුද්ධයෙන් සිද්ධවන හානිය බුදුරදුන් මෙන්ම දෙපැත්තේම අය දැනගෙන සිටියෝය. වටිනාකමින් වැඩි මිනිස් ජීවිත ද ජලය ද යන ප්‍රශ්නය බුදුන් වහන්සේ දෙපැත්තේම රජවරුන්ගෙන් විමසා සිටියෝය.

බුදුරදුන්ගේ වචනය සත්‍ය බව දෙපැත්තේම රජවරුන් පිළිගත්හ. කුඹුරුවලට අවශ්‍ය තරම් ජලය නොලැබීම මේ යුද්ධයට මුල් වූ කාරණය බව ඔවුහු පැවසූහ. දෙපැත්තේම අහංකාරකම ටිකකට අමතක කර ප්‍රශ්නය ගැන සිතුවොත් මේ ප්‍රශ්නය විසඳන්න එතරම් අපහසු නැතැයි බුදුරදුන් පැවසූහ. යුද්ධයක් කිරීමට කිසිම අවශ්‍යතාවක් තිබුණේ නැත. ජල ප්‍රශ්නය සමඟ දෙපැත්තේ අහංකාරකමත් මේ සඳහා බලපා ඇති බව තමාට අවබෝධ වී යැයි ද අහංකාරකම සමඟ ඇති ක්‍රෝධය සහ මෝඩකම හදවතින් අයින් වූ විට මේ ප්‍රශ්නය විසඳීම අපහසු නැත යැයි ද සුහදව සාකච්ඡා කර දෙපැතතට ම ජලය සමසමව ලබා කටයුතු කරන ලෙස ද පැවසූහ.

යුද්ධයේ සාකච්ඡාවෙන් පසුව දෙපැත්තම යුද්ධය නතර කර ප්‍රශ්නය විසඳගන්න සාකච්ඡා කළහ. ඒ සාකච්ඡාවෙන් පසු දෙපැත්ත සූදානම් වූ යුද්ධය නතර විණි. ඊළඟ වස් කාලය ශාක්‍ය රාජ්‍යයේ ගත කරන ලෙස මහානාම රජතුමා ඉල්ලා සිටියේය. බුද්ධත්වයෙන් පසු යුද්ධ සිද්ධිය ඇති වුණේ අවුරුදු පහළොවකට පසුයි. ඉන් පසු බුදු හාමුදුරුවෝ දහසය වන වස් කාලය ආලවියේත් දා හත්වන වස් කාලය වේළුවනයේත් දහ අටවන වස් කාලය

කෝලිය නුවරත්. දහ නව වන වස් කාලය රජගහ නුවරත් ගත කළහ.

දහ නව වන වස් කාලයේ භික්ෂූන් වහන්සේලා රජගහනුවර වැඩසිටි අතර බුදුරජානන් වහන්සේ ගිජුකුළු පව්වේ වැඩ සිටියෝය. බිම්බිසාර රජතුමා බුදුරදුන් හමුවී ධර්මය ගැන සාකච්ඡා කිරීමට ගිජුකුළු පව්වට යෑම සිරිතක්ව තිබිණි. කන්දට පහසුවෙන් යාම සඳහා පඩි පෙළවල් සාදා තිබිණි. බුදුරජාණන් වහන්සේ වැඩ සිටි ගුහාව සමීපයේ තවත් කුටි කිහිපයක් තිබිණි. බුදුරදුන් වැඩසිටි කුටිය ඉතාම ප්‍රභාවශීලී බවක් දැක්විය. ගිජුකුළු පව්ව මුදුනේ සිට හිරු නැඟීම බැසීම ඉතාම හොඳින් දැක ගත හැකිවිය. ශාරිපුත්ත, උරුවේල කාශ්‍යප, මුගලන්, උපාලි, දේවදත්ත, ආනන්ද ආදී භික්ෂූන්ගේ කුටි තිබුණේ ගිජුකුළු පව්වේ බුදුරදුන් වැඩසිටි ප්‍රධාන කුටිය අවටිනි.

රජගහනුවර සමීපයේ ධ්‍යාන භාවනා ඒකේන්ද්‍ර දහ අටක් තිබිණි. වේළුවන, ගිජ්ජකූඨ, වේභාර වනය, ෂපකුණ්ඩලිකාව, සප්ත පර්ණී ගුහාව, ඉන්ද්‍රශාලා ගුහාව ආදී ස්ථානවල ධ්‍යන භාවනා කේන්ද්‍ර පවත්වා ගෙන යන ලදී. මේ සියල්ලෙන් අන්තිම ගුහා දෙකම අනෙක් ගුහාවලට වඩා විශාල විය.

අම්බපාලිගේ පුත්‍ර ජීවකත් වෛද්‍යවරයෙක් හැටියට ප්‍රසිද්ධව ගිජ්ජකූටය අසල කුටියක ජීවත් වූවේය. ජීවක බුදුරදුන්ගේ ඉතාම සමීප උපාසකයෙකු ද විය. සියලුම දිශාවල ජීවකගේ ගුණ ගායනා පැතිරී ගියේය. ඉතාම දරුණු රෝගවලට පවා ජීවක ප්‍රතිකාර කළේය. බිම්බිසාර රජතුමාගේ පෞද්ගලික වෛද්‍යවරයා ලෙස ජීවක පත් කර තිබිණි. බුදුරදුන් ඇතුළු භික්ෂූන්ගේ වෛද්‍ය පහසුකම් ද ජීවක සොයා බැලුවේය. ශීත කාලයට භික්ෂූන්ට අවශ්‍ය සිවුරු, ශීතට පොරවන දේ ආදිය තම ඔහු මිත්‍රයින් සමඟ සම්පාදනය ද කළේය. බුදුරජාණන් වහන්සේට තමන් විසින්ම සිවුරු පූජා කළෝය. රෝග සුව කිරිම හැර රෝග නොවී සිටීමේ ක්‍රම ද ජීවක ඉගැන් විය. පිරිසිදුකම ගැන භික්ෂූන්ට කරුණු කියා දුන් ජීවක පොකුණේ වතුර උණුකර බීම වඩාත් සුදුසු බවට ද උපදෙස් දුන්නේය. දින තුනකට වරක් සිවුරු සෝදා පිරිසිදු කිරීමට භික්ෂූන්ට අවවාද කළේය. විහාරයේ භික්ෂූන්ගේ ගණනේ හැටියට කැසිකිලි වැසිකිලි

ආදිය සූදානම් කිරීමට ඔහු උපකාර කළේය. අද පිණ්ඩපාත කළ දේ හෙට දානයට නොගන්නා ලෙස ද දන්වා සිටියේය. බුදුරදුන් ඇතුළු මහා සංඝයා ජීවකගේ යෝජනා ඉතාම ආදරයෙන් පිළිගත්හ.

උපාසකවරු භික්ෂූන්ට සාමාන්‍ය සිවුරු පූජා කිරීම සිදු කළෝය. දිනක් භික්ෂූන් වහන්සේ නමක් සිවුරු විශාල සංඛ්‍යාවක් කර මත තබා ගෙන යනු බුදුන් වහන්සේ දුටුවෝය. ''ඔබ සිවුරු කොපමණ ගණනක් ගෙන යනවා ද?'' යැයි බුදුන් වහන්සේ එම භික්ෂුවගෙන් ඇසුවෝය.

''නුඹට මෙච්චර සිවුරු ඕනෑ ද? යනුවෙන් ද බුදුන් වහන්සේ විමසීය. ''ගුරු දේවයිනි මෙච්චර අවශ්‍ය නැහැ. උපාසකවරු මට සිවුරු පූජා කළා. ඒ නිසා බාර ගත්තා,''

''ඔබ සිතන ආකාරයට එක භික්ෂුවකට කොපමණ සිවුරු ඕනෑ කරනව ද?''

''ගුරුතුමනි මා සිතන ආකාරයට එක භික්ෂුවකට සිවුරු තුනක් හොඳටම සෑහෙනවා. භික්ෂුවට ශිත, උෂ්ණ දෙකින්ම නිදහස්වීමට සිවුරු තුනකින් පුළුවන්කම තියනවා,'' යැයි භික්ෂුව පිළිතුරු දුන්නේය.

''නුඹගේ අදහස්වලට මාත් එකඟයි. ශීත, උෂ්ණ දෙකටම සිවුරු තුනක් සෑහේ,'' යැයි බුදුන් වහන්සේ එය අනුමත කළෝය. ''දැන් මම සියලු භික්ෂූන්ට කියන එක හොඳයි සිවුරු තුනයි, පාත්‍රය යි හොඳටම ඇති කියලා. ඊට වඩා කවුරු හරි සිවුරු දුන්නොත් ඒවා පිළිගත යුතු නැතැ,''යි බුදුන් වහන්සේ අනුදැන වදාළහ.

බුදුරදුන්ට නමස්කාර කර ඒ භික්ෂුව තම කුටිය වෙත ගියේය.

දවසක් කඳු මුදුනේ සිට බුදුරදුන් කුඹුරුවල වී පැහී තිබෙන ආකාරය බලා සිටියෝය. ''ආනන්ද අර බලන්න වී කරල් පැහුණු කුඹුරු රත්තරන් පාටට කොතරම් ලස්සන ද? භික්ෂූන්ගේ සිවුරේ පාටත් මේ ආකාරයට පාට වුණොත් කොයි තරම් ලස්සන වේවි ද?'' යනුවෙන් උන් වහන්සේ ආනන්ද හිමියන්ගෙන් ඇසුවෝය.

'' ගුරුතුමනි, මේ අදහස නම් ඉතාම අගෙයි. වී කුඹුරුවල පාටට සිවුරු සූදානම් කළොත් ලස්සනට තිබේවි. ඔබ වහන්සේ

කිවූ ආකාරයට සද්ධර්මය පාලනය කරන භික්ෂුව සරු කෙතක් හා සමානයි. ඒ නිසා මේ වර්ණය හොඳින් ගැලපෙනවා,'' යැයි ආනන්ද හිමි පැවසීය.

'' මගේ ශාසනයේ භික්ෂූන්ට මා නියම කරනවා කුඹුරේ වී පාටට සිවුරේ පාට සූදානම් කරගන්න කියලා. සිවුරට මා ගුණ ධර්ම පිරි කෙත කියා කියනවා,'' යැයි බුදුන් වහන්සේ පැවසූවෝය.

ඊළඟ වස්සාවාස කාලය ගත කිරීමට බුදුරදුන් ජේතවනයට වැඩම කළෝය. බුදුන් හමු වූ සුදත්ත උන් වහන්සේ බොහෝ කලකින් ජේතවනයේ වස් කාලය ගත නොකළ බව උන් වහන්සේට සිහිපත් කළේය. ඒ අනුව සුදත්තගේ ආරාධනය පරිදි එම වස් කාලය ජේතවනයේ ගත කිරීමට බුදුන් වහන්සේ තීරණය කළෝය. බුදුරදුන්ගේ වයස ද අවුරුදු පනස් පහ සම්පූර්ණ වී තිබිණි. බුදුරදුන්ගේ පැමිණීම ගැන අසා පසේනදී කොසොල් රජතුමා සතුටට පත් විය. දෙවන රැජින වන වෘෂභ මිත්‍රා, විඩූඩභ කුමාරයා, වජ්‍රා රජ කුමරිය සමඟ රජතුමා බුදුරදුන් හමු වීමට පැමිණියේය. කොසොල් රජතුමාගේ දෙවන බිසව ශාක්‍ය වංශයේ කාන්තාවකි. ඇයත් රජතුමා සමඟ පැමිණියාය. පසේනදී කොසොල් රජතුමා තුනුරුවන් සරණ සමාදන් වී බෞද්ධ උපාසකයෙකු බවට පත් වූ පසුව ශාක්‍ය වංශයෙන් කාන්තාවක විවාහ කර ගත්තේය. මහානාම රජු තමන්ගේ සුන්දර දියණිය වූ වෘෂභක්ෂත්‍රිය පසේනදී කොසොල් රජතුමාට විවාහ කර දුන්නේය.

වස්කාලය තුළ බුදුරදුන් කළ සියලුම ධර්ම දේශනා කොසොල් රජතුමා ද ශ්‍රවණය කළේය. බුදුරදුන්ගේ දේශනා ඇසීම සඳහා බොහෝ අය පැමිණියෝය. මේ අය අතර කාන්තාවන් විශාල පිරිසක් ද විය. කාන්තාවන්ගේ නායකත්වය දැරුවේ විශාකා මහා උපාසිකාවයි. විශාකා මහා උපාසිකාවත් බුදුරදුන්ට උයනක් පූජා කළාය. එය ජේතවනය තරම් විශාල එකක් නොවුවත් ජේතවනයට වඩා අලංකාර උයනක් විය.

විශාකාවත් තම සම්පූර්ණ ධනය වියදම් කර භාවනා කුටි, ගිලන් හල් ආදිය සමඟ අංග සම්පූර්ණ විහාරයක් සාදා බුදුරදුන් ඇතුළු භික්ෂු මහා සංඝයාට පූජා කළාය. ශාරිපුත්ත මහ රහතන් වහන්සේගේ අනුශාසනා පරිදි එකී විහාරයට පූර්වාරාම විහාරය

යනුවෙන් නම් තැබුවේය. ධර්ම දේශනා කරන ධර්ම ශාලාව විශාකා ශාලාව යනුවෙන් හැඳින්වීය.

විශාකා මහා උපාසිකාවගේ උපත අංග ජනපදයේ භද්‍රිකා නම් ජනපදයේ දී සිදු විය. භද්‍රිකා ජනපදයේ ධනවත් සිටුතුමා වූ ධනංජය විශාකාවගේ පියා විය. විශාකාවගේ ස්වාමි පුරුෂයා ශ්‍රාවස්තියේ ධනවත් සිටුවරයෙක් ලෙස ප්‍රසිද්ධව සිටියේය. විශාකාවගේ ස්වාමි පුරුෂයා සහ පුතා නිඝන්ඨනාථපුත්තගේ අනුගාමිකයින්ව සිටියෝය. මුල්ම කාලයේ බුදුරදුන් ගැන කිසිම පැහැදීමක් ඔවුන් තුළ තිබුණේ නැත. නමුත් විශාකාවගේ ධර්ම සේවා නිසා ක්‍රමයෙන් දෙදෙනාම බුදුරදුන් කෙරෙහි ශ්‍රද්ධාව ඇති කරගෙන බුදුරදුන්ගේ උපාසකයන් බවට පත් වූහ.

විශාකා මහා උපාසිකාව සහ ඇගේ යෙහෙළිය වූ සුප්‍රියා නිතර විහාරයට ඒම සිරිතක් කරගෙන තිබිණි. භික්ෂූන්ට අවශ්‍ය පරිදි සිවුරු, පිරිකර, බෙහෙත්, දාන ආදිය රැගෙන ඒම සිරිතක්ව පැවතිණි.

විශාඛා භික්ෂුණී මහා ප්‍රජාපතී සමඟ සාකච්ඡා කර ගඟේ අනෙක් පැත්තේ භික්ෂුණී නිවාස සෑදීමට තීරණය කළාය. විශාකා මහා උපාසිකාව භික්ෂුණීන්ට සෑම අංශයෙන්ම උපකාර කළාය.

භික්ෂුණීන් අතර සිදුවන පුංචි අඬදබර විසඳීමේ දී විශාකාව සෑම විටම උත්සාහ කළාය.

දිනක් ධර්ම සම්මේලනයේ දී ඉතා වැදගත් තීරණ දෙකක් ගනු ලැබිණි. එනම්, බුදුරජාණන් වහන්සේගේ ප්‍රධාන උපස්ථායකයා ලෙස ආනන්ද පත් කිරීමට ගත් තීරණයයි. දෙවන තීරණය සෑම වස්කාලයකම වස් පවාරණය සඳහා බුදුරජාණන් වහන්සේ ශ්‍රාවස්ථියට වැඩම කළ යුතු බවය.

පළමු යෝජනාව ඉදිරියේ කළේ ශාරිපුත්ත මහ රහතන් වහන්සේයි. "ආනන්දගේ මතක තබා ගැනීමේ ශක්තිය අපි සියලු දෙනාටම වඩා හොඳයි. බුදුරදුන් දේශනා කළ සියලු ධර්ම දේශනා ඉතා හොඳින් අකුරක් නැර මතක ඇති එකම භික්ෂුව ආනන්ද හාමුදුරුවෝ පමණ බුදුරදුන්ගේ වචන සුරක්ෂිතව රැකීමත් ඉතාම පූර්ණ කාරණයක්. නොසැලකිල්ල නිසා බුදුරදුන්ගේ බොහෝ දේශනා අප අතරින් අමතක වෙිගන යනවා. ආනන්ද, අනාගත පරපුර සඳහා අප සෑම දෙනාම එකතු වී බුදුරදුන්ගේ ශ්‍රී මුඛ

දේශනාව රැක ගැනීම අනිවාර්යයෙන්ම කළ යුතුයි,''යැයි ශාරිපුත්ත මහ රහතන් වහන්සේ පැවසීය.

ශාරිපුත්ත හිමියන්ගේ යෝජනාව සියලු දෙනා ඒකමතිකව ස්ථිර කළ අතර මේ කාර්යයේ දී මට ප්‍රශ්න කිහිපයකට මුහුණ දෙන්න සිද්ධ වනු ඇතැයි ආනන්ද හිමි ප්‍රකාශ කළේය.

''පළමුවෙනි කාරණය බුදුරදුන් මේ යෝජනාවට කැමති ද නැද්ද යන්නයි. දෙවන කාරණය මේ කාර්යයට බුදුරදුන් ශාක්‍ය වංශයේ කෙනෙකුව පත් කිරීමට කැමැත්තෙන් ඉන්නවා ද නැද්ද යන කාරණයි. තුන්වන කාරණය, තම මව වන මහා ප්‍රජාපතී ගෝතමියත් තද නීති යටතේ ඉතාම දුරින් තියලයි තියෙන්නේ. අනෙක රාහුලවත් තම කුටියට කවදාවත් ගත්තේත් නැහැ. කිසි දාක රාහුල සමඟ දානය වැළඳුවෙත් නැහැ. ප්‍රධාන උපස්ථායක හැටියට මාව පත් කළත් අපේම සහෝදර භික්ෂු පිරිස පසුව මේ සඳහා විරෝධය දක්වීම තව කාරණයක්. යම් කිසි ආකාරයකට බුදුරදුන් කිසි භික්ෂුවකගේ වැරදි සාදා ගැනීම සඳහා උපදෙස් දුන්නොත් බුදුරදුන්ගේ පක්ෂය ගත්තා කියලත් භික්ෂූන් මට දොස් කියාවි,'' යනුවෙන් සාධාරණ සමාජයක සිදුවන සිද්ධි අනුව ආනන්ද හිමි කරුණු ඉදිරිපත් කළේය.

'' මේ සැම දෙනාටම වඩා බුදුරදුන් සලකන්නේ ශාරිපුත්තට නිසා මේ පදවිය ශාරිපුත්තට ගැලපෙනවා. ඕනෑම ප්‍රශ්නයක දී බුදුරදුන් ඉස්සෙල්ලාම විචාරන්නේ ශාරිපුත්තගෙන්. අනෙක විහාරවල පරිපාලනය ගැන ශාරිපුත්තට ඇති දැනුම කාටවත්ම නැහැ. මේ නිසා මේ පදවිය ශාරිපුත්තම බාර ගන්න,'' යැයි ආනන්ද හාමුදුරුවෝ ශාරිපුත්ත හිමියන් දෙස බලා පැවසීය.

'' සමාජයේ එක් එක් අය තම තමන්ගේ දෘෂ්ඨි කෝණ අනුව විවේචනය කිරීම සිරිතයි. සමහර අය ඊර්ෂ්‍යාවෙනුත් එහෙම කරන බව අප සියලු දෙනාම දන්නවා. මේ කිසිම දෙයක් මා ගණන් ගන්නේ නැහැ. ඒ නිසා කරුණා කර මේ පදවිය බාර ගන්න. ඔබ මේ පදවිය බාර ගන්නේ නැතිනම් වර්තමාන සමාජයටත් අනාගත සමාජයටත් දෙකටම වෙන්නේ මහා හානියක්,'' යනුවෙන් ශාරිපුත්ත හිමි ඊට පිළිතුරු වශයෙන් කීවේය.

මේ සාකච්ඡාවෙන් පසු අනන්ද හිමි නිශ්ශබ්ද විය. මඳ වේලාවකට පසු ''මා මේ කාර්යය භාර ගන්නම්. බාර ගන්නේ බුදුරදුන් පහත සඳහන් කරුණු ගැන සම්මුතිය පළ කළහොත් පමණයි.

''පළවෙනි කාරණය බුදුරදුන්ට ලැබෙන සිවුරු කවදාවත් තමන්ට නොදෙන බව. බුදුරදුන්ට පිණ්ඩපාතයෙන් ලැබෙන දානය කවදාවත් තමන්ට නොදිය යුතු බව. බුදුන්ගේ කුටියෙහි ඉන්න කියා තමන්ට නොකිව යුතු බව. උපාසකවරුන්ගේ ගෙවල්වල දානයට වඩින විට ඒ සඳහා තමන්ට ආරාධනා නොකිරීම. යම්කිසි අකාරයකින් මට උපාසකවරුන් දානයකට ආරාධනා කළොත් බුදුන් ඒ සඳාහා මා සමග වැඩම කර වීම. බුදුරදුන් හමු වීමට කෙනෙක් ආවොත් මුණගැස්වීම හෝ නොකිරීම මගේ කැමැත්ත අනුව සිදුවිය යුතු බව. බුදුන් දෙසූ යම් දෙයක් මට හරි හැටි අවබෝධ වුණේ නැත්නම් එය නැවත ඇසීමේ අවසරය තිබිය යුතු බව. මගේ අනුපස්තිථියෙන් දෙසූ ධර්මය නැවත මා හමුවෙහි දේශනා කිරීමට පොරොන්දු වීම. යන මේ කරුණු අට ගැන බුදුරදුන් සහමතිය ප්‍රකට කළොත් පමණක් මා මේ පදවිය බාර ගැනීමට සූදානම්,'' යැයි පැවසීය.

''ආනන්ද හාමුදුරුවන්ගේ අදහස් සියල්ලම පිළිගත හැකි ඒවා. මේ නිසා බුදුරදුන් මේ සියල්ලම කිසිදු අඩුවක් නැතිව බාර ගනීවි,''

''නමුත් හතරවන කාරණය පිළිගැනීම අපහසුයි. බුදුරදුන් වඩින දානයට ආනන්ද හාමුදුරුවන් නොගියොත් එදාට දේශනා කරන ධර්මය ආනන්ද හාමුදුරුවන් දැන ගන්නේ කොහොම ද කියලා. මේ නිසා අනාගත පරම්පරාව ගැන හිතලා හතරවන අදහස අත්හරින්න,'' යැයි උපාලි හාමුදුරුවන් නැඟී සිට කීවේය.

'' මේ යෝජනාව මා එතරම්ම අගය කොට සලකන්නේ නැහැ. හේතුව ආරාධනා කරන තැනැත්තා සමහරවිට කිහිප නමකට දානය දීමට නොහැකි කෙනෙක් වුනොත් අපි කිහිප නමක් දානය සඳහා වැඩම කළොත් ඒ දායකයා මහත් අපහසුතාවකට පත් වනවා,'' යි ආනන්ද හාමුදුරුවෝ කීවේය.

''එහෙම වුණොත් බුදුහාමුදුරුවොයි ඔබයි දෙදෙනා දානය අඩුවෙන් අරගෙන උපාසක තැනැත්තාගේ බර අඩු කර ගන්න පුළුවන් නේද?'' යැයි උපාලි හිමියන් ඇසුවේය.

සියලුම භික්ෂූහු මේ කතාව අසා සිනාසුණේය. බුදුරදුන්ට අවශ්‍ය නියම ප්‍රධාන උපස්ථායකයා සෙවීමේ කාර්යය සම්පූර්ණ වී යැයි සියලු දෙනා සිතූහ. ඊළඟ ප්‍රශ්නය වුයේ බුදුරජානන් වහන්සේ ජේතවනාරාමයේම මෙතරම් දීර්ඝ කාලයක් වස් වසන්නේ ඇයි ද යන්නයි.

'' සැවැත් නුවර ජේතවනාරාමය අංග සම්පූර්ණ ස්ථානයක්. කිසිම දෙයකින් කිසිම භික්ෂුවකට අපහසු බවක් කරදරයක් වෙන්න දෙයක් නැහැ. අනාථපිණ්ඩික සහ විශාකා මහා උපාසිකාව භික්ෂූන්ට දෙමාපියන් හැටියට පෙනී ඉන්නවා. අනිත් කාරණය ධර්මය ශ්‍රවණය කරන අයට එහෙමෙහෙ යන්නේ නැතිව එක තැනකට එකතු වීමටත් පහසුකම් තිබෙනවා,'' යැයි සියලු දෙනාම පිළිගත්හ.

ධර්ම සාකච්ඡාව අවසන් වූ පසු ගත් තීරණ සියල්ලම සෑම දෙනාටම දැනුම් දී බුදුන් වහන්සේ තම කුටියට වැඩියේය.

## පනස් තුන් වන පරිච්ඡේදය

# වර්තමාන කාලයේ ජීවත් වීම

ඊළඟ වසරේ බුදුරජානන් වහන්සේ කුරු ක්ෂේත්‍රයෙහි කම්මාසධම්මයෙහි තුන් සියයක් භික්ෂූන් සමඟ සතිපට්ඨාන ධර්මය දේශනා කළෝය. ධ්‍යාන භාවනා කිරීමට ආධාර භූත සූත්‍රය හැටියට සතිපට්ඨානය සැලකේ. ශරීරයට හා මනසට ශාන්තිය දීම සඳහා සෑම කෙනෙකුටම ගැලපෙන පරිදි බුදුන් සතිපට්ඨාන සූත්‍රය දේශනා කළෝය. දුකින් මිදී පරම සතුට ලබා ගැනීමට මේ සූත්‍රය බෙහෙවින් උපයෝගී වන බව සතිපට්ඨාන සූත්‍රය අනුව ධ්‍යාන කිරීමෙන් ලබාගත හැකි බව එහි සඳහන් වේ. බුදුරදුන් මේ දක්වා දෙසූ සූත්‍රවලින් ඉතාම බැරෑරුම්ම සූත්‍රය සතිපට්ඨාන සූත්‍රය බව ශාරිපුත්ත හිමි සියලුම භික්ෂූන් සමඟ කීවේය. සියලුම භික්ෂූන්ට හා භික්ෂූණීන්ට සතිපට්ඨාන සූත්‍රය කට පාඩම් කර ඒ අනුව ධ්‍යාන භාවනා කරන්න පුරුදු වෙන ලෙස දැන්වීය.

එදා රාත්‍රියේම ආනන්ද හාමුදුරුවෝ සතිපට්ඨාන සූත්‍රය සම්පූර්ණයෙන් ම කටපාඩම් කළෝය. සතියෙන් සිටීම ගැන විස්තර කළේය. සිහියෙන් සිටීමට සතිපට්ඨාන සූත්‍රයෙන් ගත හැකි ප්‍රයෝජන පෙන්නා දුන්නේය.

පළමුවෙන්ම භාවනාවට සූදානම් වන පුද්ගලයා තම ශරීරය කෙළින් තබාගත යුතුය. ඊට පසුව සතර ඉරියව්වෙන් එක ඉරියව්වක ඉඳගෙන හුස්ම ඇතුළට ඇද ගැනීම හුස්ම පිටකිරීම යන කාරණා දෙකම සිහියෙන් යුක්තව කළ යුතුය. සමහරවිට හුස්ම දිගට ගැනීම හෝ කෙටියෙන් ගැනීම හෝ සිදු විය හැකිය. මේ අවස්ථා දෙකෙහිම දීර්ඝකම ගැන හෝ කෙටියෙන් හුස්ම ගැනීම හෝ ගැන සිත යොමු කළ යුතුය. ඉස්සරහට පස්සට යාමේ දී, වස්ත්‍ර ඇඳීමේ දී කෑමේ දී බීමේ දී වැසිකිළි කැසිකිළි යාමේ දී කතා කිරීමේ දී යන සෑම ක්‍රියාවක දීම තම ශරීරයේ ඇති සෑම අංගයක් ගැනම සිහියෙන් යුක්ත විය යුතුය. පඨවි, ආපෝ, තේජෝ, වායෝ යන සතර මහා භූතයන් ගැන සිහි කල්පනාවෙන් සිටිය යුතුය. තම ශරීරය මේ කොටස් හතරට බෙදී වෙන් වන තෙක් ඒ ගැන සිහියෙන් යුක්ත වීම සතිපට්ඨානයේ ප්‍රධාන අංගය හැටියට විස්තර වෙයි.

''යම් කිසි හැඟීමක් ඇති වුවහොත් ඒ හැඟීම් ඇති වූයේ කෙසේ ද යන්න ගැන සිතීම අවශ්‍ය වේ. ඒ හැඟීම් විකසිත වන්නේ කෙසේද කියලත් සොයා බැලිය යුතුය. ඒ ගැන සිත යොමු කිරීම අවශ්‍යය, භාවනා කරන අවස්ථාවේ දී යම් කිසි ආකාරයකින් තැනක වේදනාවක් ඇති වුවහොත් සිත එතැනට රැගෙන යා යුතුයි. ඒ ගැන සිත යෙදිය යුතුයි.

මේ ක්‍රමය සම්පූර්ණ ජීවිතයේ සෑම දිනකම දවස පුරා ම සිදු කළ යුතුයි. එසේ නොමැතිව එහි ප්‍රතිඵල ලැබීමක් ගැන සිතිය නොහැකිය. සිත එහෙමෙහේ දුවන්නට නොදී එක තැනක තබා ගැනීමට හැකි නම් සතිපට්ඨානයෙන් ප්‍රයෝජන ගත්තා වන්නේය.

බුදුරදුන් තමන්ගේ සියලුම දේශනා පූර්ව විධානයක් අනුව දේශනා කළෝය. පූර්ව විධානයක් අනුව සතර සති පට්ඨානය ධ්‍යාන භාවනාවට සම්බන්ධ කරගත හොත් මේ ආත්මයේ දීම නිර්වාණය අවබෝධ කරගත හැකි බව විස්තර කළෝය.

බුදුහාමුදුරුවෝ සතර සති පට්ඨානය දේශනා කළේ පළමු වතාවට නොවේ යැයි දේශනාව අවසානයේ අස්සජි හාමුදුරුවෝ පැවසූහ. අද විශේෂයක් වූයේ සතර සතිපට්ඨානය ඉතාම විස්තර සහිතව දේශනා කිරීමයි. භික්ෂුභික්ෂුණී දෙපක්ෂයම මේ සූත්‍රය කටපාඩම් කරගෙන දිවා රෑ සිහිකළ යුතුයි කීය.

වසන්තය අන්තයේ බුදුරදුන් ජේතවනයෙන් ආපසු වඩින විට අතර මග දී අංගුලිමාල නම් මහා වදකයෙක් මග දී මුණ ගැසිණි. නගරයේ සියලුම දෙනා භය භීතව සිටි අංගුලිමාල බුදුරදුන් තම සරණයට ගත්තෝය. දිනක් බුදුරජාණන් වහන්සේ ශ්‍රාවස්ථී නුවරින් වඩින විට මුළු නගරයම සම්පූර්ණයෙන් භූතයන් අරගත් තැනක් ලෙස දුටුවේය. සියලුම නගර වාසීන් ගෙවල් ඇතුළට වී දොරවල් වසාගෙන එළියට එන්න භයෙන් සිටින බව දුටුවේය.

නගරයේ පාරවල් හිස්ව තිබිණි. බුදුහාමුදුරුවන්ට හැමදාම පිණ්ඩපාතය දෙන ගෙදරක දොරකඩට පැමිණි බුදුහාමුදුරුවෝ තනිවම සිටියෝය. ගෙදර අය දොර ඇර තරමක් බැලූවිට බුදුහාමුදුරුවෝ දොර ළඟ වැඩ සිටින බව දක්නට ලැබිණි. ගෙදර අයිතිකරු ඉක්මනටම එළියට පැමිණ බුදුහාමුදුරුවන්ට ඉක්මනට ඇතුළට එන්න යැයි කීවේය. බුදුහාමුදුරුවෝ ගේ තුළට වැඩි වහාම ගෙයි ස්වාමියා ගෙයි දොර අගුළු දැම්මේය. අගුළු දමා බුදුහාමුදුරුවන් ව වාඩි කර දානය පිරිනැමුවේය. ''ගුරුතුමනි, මේ දවස්වල නගරයේ හැසිරීම ඉතාම භයානකයි. අංගුලිමාල කියලා මහ දරුණු කෙනෙක් දූන් සෑහෙන්න මිනිස්සු මරලා. මරණ සෑම මිනිහෙකුගෙන්ම එක ඇඟිල්ලක් කපාගෙන ගෙලේ මාලයක් පළඳාගෙන ඉන්න බව ප්‍රසිද්ධ කාරණයක්. සමහර අය පණ බේරගෙන යම්තම් ගැලවිලා තියනවා. අංගුලිමාල ඉඳල තියෙන්නේ චාලිනී වනයේ. කිසිම කෙනෙක් ඒ වනය අසලින්වත් යන්නේ නැහැ. පසුගිය දවස්වල අංගුලිමාලව පණපිටින් අල්ලන්න විසි දෙනෙක් කැලයට ගිහින් තිබුණා. ඒ අයගෙන් දෙන්නයි පණ බේරගෙන වනාන්තරයෙන් ගමට ඇවිත් තිබුණේ. නගරයේ කිසිම කෙනෙක් මේ දවස්වල එළියට බහින්නේ නැහැ, බිය නිසා. අඩුම තරමින් කඩයක් වත් අරින්නේ නැහැ මරණ බය නිසා. කිසිම කෙනෙක් තමන්ගේ රැකියාවලට යන්නෙත් නැහැ,'' යැයි බුදුන් වහන්සේ සමඟ ගෙහිමියා පැවසීය.

අංගුලිමාල ගැන විස්තර දැන්වීම ගැන ස්තුති කළ බුදුහාමුදුරුවෝ තම ගමන් මඟට පිවිසුණෝය. ගෙහිමියා ගෙයින් පිටතට යන්න එපා ගේ ඇතුළට වෙලා ඉන්න යනුවෙන් හඬමින් බුදුන් වහන්සේගෙන් ඉල්ලා සිටියේය. නමුත් බුදුහාමුදුරුවෝ ඒ කිසිවක් පිළිගත්තේ නැත. බුදුහාමුදුරුවෝ, ''මම පිණ්ඩපාතයේ

නොගියොත් මිනිස්සු මා ගැනත් ඇති විශ්වාසය නැති කරගන්නවා,'' යැයි කීවෝය.

බුදුරදුන් වීථියේ වඩින විට කවුරු හෝ කෙනෙක් තමන් පිටිපස්සෙන් දුවගෙන එන බව ඇසිණි. ඒ අංගුලිමාල බව බුදුන් වහන්සේ දැන ගත්තෝය. අංගුලිමාල කොපමණ වේගයෙන් දිවුවත් බුදුහාමුදුරුවෝ තම පුරුදු ගමනින්ම ගමන් කළෝය. ''භික්ෂුව නතර වෙන්න,'' යැයි අංගුලිමාල ශබ්ද නඟා කීවේය.

බුදුරදුන් මේ කිසිවක් පුරුදු ගමනින්ම වැඩියෝය. අංගුලිමාල දුවන්නේ නැතිව හැකි ඉක්මනට අඩිය තබන බවත් ඔහු ගමන් කරන්නේ තමන් වහන්සේට නුදුරින්ම බවත් බුදුරදුන්ට දැනිණි. මේ වන විට බුදුරදුන් අවුරුදු පනස් හය සම්පූර්ණ තිබිණි. නමුත් ඇසීමේ හා පෙනීමේ ශක්තියත් යන දෙකම ඉතාම හොඳින් පැවතිණි.

මේ භික්ෂුව කිසි දේකට බය වෙන්නේ නැත්තේ ඇයි දැයි අංගුලිමාලට සිතිණි. බුදුහාමුදුරුවෝ අංගුලිමාල දෙස තම සහෝදරයෙක් දෙස බලන ආකාරයට අංගුලිමාල දෙස බැලුවෝය. උන් වහන්සේ අංගුලිමාලට ඒ නමින්ම කතා කළෝය. මේ භික්ෂුව මගේ දරුණුකම අනිවාර්යයෙන්ම දන්නා අයෙක් යැයි අංගුලිමාල සිතුවේය. මිනී මරුවකු ඉදිරිපිට මේ භික්ෂුව මෙතරම් ශාන්ත දාන්තව සිටින්නේ කෙසේ දැයි අංගුලිමාල පුදුමයට පත්විය. අංගුලිමාලට බුදුරදුන්ගේ සහනශීලී බව ඉවසිය නොහැකි තැන ''භික්ෂුව නුඹ කිවුවා නේද නුඹ ස්ථිරව එක තැනකට වෙලා දැන් හුඟ දවසක් කියලා. එහෙමනම් නුඹ දුවන්නේ ඇයි?'' මේ කියමනේ තේරුම මොකක් ද? අංගුලිමාල කීවේය.

අංගුලිමාල අන් අයට හිංසා කරදර කරන කටයුතු මා මීට බොහෝ කාලයකට පෙර නතර කරලා දැම්මා. මනුෂ්‍යයින්ව පමණක් නොවෙයි සෙසු ප්‍රාණීන්ව ද ආරක්ෂා කිරීමට මා ඉගෙන ගත්තා. අංගුලිමාල, සියලුම ප්‍රාණීන් තම පණට ආදරෙයි. කිසිම ප්‍රාණියෙක් කිසිම කරදරයක් වෙනවාට කැමති නැහැ,'' යැයි බුදුන් වහන්සේ පිළිතුරු දුන්නේය.

''මිනිස්සු මිනිස්සුන්ට ආදරය කරන්නේ නැහැ. ඒ නිසා මා අනිත් අයට ප්‍රේම කරන්නේ ඇයි? මනුෂ්‍යයෝ කිසිම දයාවක් නැහැ. අනෙක් අයව රවටනවා. මා කිසි ම දාක සැනසීමෙන් ඉන්නේ නැහැ. සියලුම දෙනාව මරලදාන තෙක්. ඔක්කොම මරපු දවසට මා සතුටින් ඉන්නවා,'' යැයි අංගුලිමාල කීවේය.

'' නුඹ මෙතරම් මිනිස් සංඛ්‍යාවක් මරලා විශාල පවක් කරගෙන තියෙන්නේ. මිනිස්සු කොතරම් කෲර ද කියලත් ප්‍රශ්න කළා. මේ කෲරකම නො දැනුවත්කම මෝඩකම ආදිය නිසා ඇති වන්නක්. නමුත් මිනිස්සු දැනුම් තේරුම් ඇති පිරිසක් ද ඉන්න බව තේරුම් ගන්න. නුඹ කවදා හරි කිසි භික්ෂුවක් මුණගැසී තියනවා ද? භික්ෂූන් මනුෂ්‍යයින් ඇතුළු සමස්ත ප්‍රාණීන්ව ආරක්ෂා කරන්න මෛත්‍රී කරන්න කැප වූ පිරිසක් බව දන්නවා ද? භික්ෂු ජීවිතය පමණක් නොවෙයි අනෙක් අය ද බුද්ධිමත්ව තේරුම් ගැනීමේ ශක්තියක් ඇති පිරිසක් විය හැකි යි. නුඹ අනාථයෙක් වෙන්න එපා. මගේ ධර්මය කෲර බව කරුණාවට පරිවර්තනය කර දෙනවා. නුඹ ඔය යන්නේ කෲර මාර්ගයෙහියි. මේ ගමන නුඹ නතර කරන්න ඕනෑ. මේ සියල්ල අතහැර ක්ෂමා, කරුණා ආදී ගුණ නුඹගේ හදවතට ඇතුළත් කරගන්න ඕනෑ,'' බුදුන් වහන්සේ පැවසුවෝය.

මහා කාරුණික බුදුරදුන්ගේ වචනවලින් අංගුලිමාල සැහීමකට පත් වුවත් සිතේ ඇති වී තිබුණු චංචල ගති ඒ ආකාරයෙන්ම පැවතිණි. ශරීරය ආයුධයකින් පලළා දැම්මාක් මෙන් වැනි වේදනාවක් අංගුලිමාලට දැනිණි. බුදුරදුන් අංගුලිමාල දෙස බැලුවේ ඉතාම කාරුණිකවය.

අංගුලිමාල මීට කලින් මහාකාරුණික බුදුරදුන්ගේ නම ගෞතම බුද්ධ නමින් අසා තිබිණි. නමුත් හමු වුයේ පළමු වතාවටය.

'' ගෞතම බුද්ධ කියන්නේ ඔබ ද? යැයි අංගුලිමාල බුදුරදුන්ගෙන් ඇසුවේය.

බුදුරදුන් එය අනුමත කිරීමට හිස සැළුවෝය.

'' මා කොතරම් අභාග්‍ය සම්පන්න කෙනෙක් ද ? මීට කලින් ඔබ මට හමු වුණේ නැහැ. මා විනාශයේ දොර ළඟටත් දැන් ඇවිත් ඉන්නේ. දැන් කාලය ගෙවී අවසානයි. මට ආපසු ඒමට ක්‍රමයක් නැහැ,'' අංගුලිමාල කීවේය.

''අංගුලිමාල, හොඳ වැඩ කරන්න කාලයේ සීමාවක් කවුරුවත් ම ඇති කර නැහැ,'' බුදුන් වහන්සේ කීවෝය.

''හොඳ කාර්ය කරන්න මා සුදුසු කෙනෙක් ද? යි අංගුලිමාල ඇසුවේය.

'' හිතේ ඇති හිංසා අදහස් අත් හැරලා අවිහිංසාව කරුණාව ඇති කරගන්න. දුක සාගරය ඉතා ම විශාලයි. අනෙක් පැත්ත

හැරිලා බැලුවොත් එහි අනන්තයක් පෙනෙන්නේ නැහැ,'' යි බුදුන් වහනසේ අංගුලිමාල අමතා කීවෝය.

''මා කොපමණ කැමති වුණත් ආපසු ඒම එතරම් පහසු නැහැ. මා කළ දේවල් අනුව සියල්ලම මා අත හැරියත් සමාජය මට යහතින් ජීවත් වෙන්න ඉඩ දෙන්නේ නැහැ,'' යි අංගුලිමාල කීවේය.

''හිංසාව අතහැරලා මෛත්‍රිය කරන්න සූදානම් නම් නුඹගේ අනාගත වගකීම හා ආරක්ෂාව දෙකම මා බාර ගන්නවා. අනෙත් කාරණය අනෙක් අයට සේවය කිරීමටත් සිතට ගත යුතුයි. නුඹ ඉතාම හොඳට තේරුම් පැහැදුම් ඇති කෙනෙක්. දුකින් මිදීමේ සසර කතරින් එතෙර වීමේ සුදුසුකම් ඔබ ළඟ ඇති බව මට ඉතාම පැහැදිලිව පෙනෙනවා,'' යැයි බුදුන් වහන්සේ පැවසූහ.

අංගුලිමාල බුදුරදුන් ඉදිරියේ දණ ගැසුවේය. පිටේ රඳවාගෙන තිබුණු කඩුව බිම තැබුවේය. බුදුරදුන්ගේ ශ්‍රී පාද පද්මය දෑතින් අල්ලලා වැන්දේය. බොහෝ වෙලාවක් දෑතින් මුහුණ වසාගෙන හැඬුවේය. අන්තිමේ දී ''මේ කෲර හිංසා මාර්ගය අත් හරින්න සූදානම්. මා ඔබ වහන්සේ අනුගමනය කරන අතර කරුණාවේ මාර්ගය මගේ ජීවිතයට සම්බන්ධ කරගන්නවා. ඔබගේ ශිෂ්‍යයෙක් හැටියට මා පිළිගන්නා ලෙස ඉතාම කරුණාවෙන් ඉල්ලා සිටිනවා; යැයි ද පැවසීය.

මේ ආරංචිය ශාරිපුත්ත, ආනන්ද, උපාලි, කිම්බිල ආදී භික්ෂූන් ද සිද්ධිය වූ ස්ථානයට පැමිණියෝය. උන් වහන්සේලා බුදුරදුන් සහ අංගුලිමාලව වට කර ගත්හ. බුදුරදුන් සුරක්ෂිතව සිටින බව දුටුවෝය. අංගුලිමාල පැවිදි වීමට කැමති බව දැන ගන්නන ලැබී සියලුම භික්ෂූහු සතුටට පත් වූහ. බුදුරදුන් ආනන්ද ලවා සිවුරු පාත්‍ර ගෙන්වා ගත්තේය. හිස මුඩුකර එතනදී ම අංගුලිමාල පැවිදි කළේය. පැවිදි කිරීමේ කටයුතුවලට මූලික වූයේ උපාලි මහ රහතන් වහන්සේයි. පැවිදි කිරීමෙන් පසුව අංගුලිමාල සමඟ බුදුරදුන් ජේතවනයට වැඩියෝය.

දින දහයක් පමණ යන තෙක් උපාලි සහ ශාරිපුත්ත යන හිමිවරු අංගුලිමාලට ශීලය ගැන විස්තර කර දුන්හ, භාවනා කරන ආකාරය කියා දුන්හ. පිණ්ඩපාතය යන ආකාරය, පාත්‍රය අල්ලන ආකාරය, දානය වළඳන ආකාරය මේ සියල්ලම පැහැදිලි කර දුන්හ. පැවිදි වී සති දෙකකින් අංගුලිමාලගේ පැවිදි ජීවිතයේ

ප්‍රගතිය දැක බුදුහාමුදුරුවෝ සතුටට පත් වූහ. සිතේ ස්ථිර බව මුහුණේ ඇති පැහැදීම ආදිය ඊට ප්‍රධාන හේතුව විය. කතා බහ කෙතරම් වෙනස් වීම කිවහොත් අනෙක් භික්ෂූහු ඔහුට අහිංසක යැයි නම තැබූහ. ගිහි ජීවිතේ අංගුලිමාල වීමට පෙර ඔහුගේ නම අහිංසක හැටියටයි කවුරුත් දැනගෙන සිටියේය. ස්වස්ති මේ නම ගැන සිතුවේය. සිතේ ඇති වී තිබෙන පරිවර්තනය සහ ගුණ සමුදාය නිසා මේ නම ඉතාම හොඳ නම හැටියට ස්වස්තියත් තීරණය කළේය.

දවසක් බුදුරදුන් ශ්‍රාවස්ථියේ පිණ්ඩපාතයේ වැඩම කළෝය. ඒ සමඟ අංගුලිමාලත් තවත් භික්ෂු පිරිසකුත් ගියේය. නගරයේ දොරටුව අසල පසේනදී කොසොල් රජතුමා තම සේනාව සූදානම් කරගෙන අසකු පිට නැඟී සිටිනවා දුටුවේය. මේ දර්ශනය එක් වරටම පෙනුනේ රජතුමා යම් කිසි යුද්ධයකට සූදානම් ව සිටින ආකාරයයි. රජතුමා බුදුරජාණන් වහන්සේ දැක අශ්වයාගේ පිටින් බැස බුදුරජාණන් වහන්සේට වැන්දෝය.

බුදුරජාණන් වහන්සේ රජතුමාගෙන් ''රජතුමනි අද මොකද විශේෂ සිද්ධියක් වෙන්න යනව ද? යනුවෙන් ඇසුවෝය.

කොසොල් රජතුමා ''අංගුලිමාල කියල මහ දරුණු මිනිහෙක් මුළු නගරය පුරාම මිනී මරමින් නිදහසේ සැරිසරනවා. ඒ අංගුලිමාලව අල්ලන්නයි මා මේ සේනාව සූදානම් කළේ,''යැයි පැවසීය.

'' ඔබට ඉතාම විශ්වාස ද අංගුලිමාල මේ තරම්ම භයානක යි කියලා,'' යනුවෙන් බුදුරජාණන් වහන්සේ ඇසුවෝය.

''ගුරු දේවයාණනි, අංගුලිමාල ස්ත්‍රී පුරුෂ, ළදරු කාටත් ඉතාම භයානක කෙනෙක්. කෙසේ හෝ අංගුලිමාලව අල්ලලා මරණීය දණ්ඩණයට පමුණුවන්න ඕනෑ'' රජතුමා කීවේය.

'' යම් කිසි විදියකින් අංගුලිමාල මිනී මැරීම නතර කරලා මින් පසු කිසිම ප්‍රාණියෙකුට කරදර කරන්නේ නැහැ කියලා පොරොන්දු වෙලා පැවිදි වෙලා අහිංසක ජීවිතයක් ගත කරනවා නම් ඒත් අල්ලලා මරණීය දණ්ඩනය දෙනවා ද? යනුවෙන් බුදුරජාණන් වහන්සේ ඇසුවෝය.

''යම් කිසි විදියකින් අංගුලිමාල පැවිදි වෙලා අහිංසක ජීවිතයක් ගත කරනවා නම් ඒ ගැන පළමුවෙන් ම සතුටු වෙන්නේ

කොසොල් රජු වන මමයි,'' යනුවෙන් කොසොල් රජතුමා පැවසීය. ''එහෙම වුණා නම් මම අංගුලිමාලට සිවුරු පිරිකර පිණ්ඩපාත ආදී සෑම පහසුකමක්ම සූදානම් කර දෙනවා. නමුත් මේ කතාව ගැන තවම මට හිතන්න අපහසුයි,'' ද පැවසීය. බුදුරදුන් අත දිගු කර ''මේ ඉන්නේ අංගුලිමාලයි. ඔහු පැවිදි වුණා. පසු ගිය සති දෙක ඇතුළත අංගුලිමලගේ ජීවිතයේ පුදුම පරිවර්තනයක් ඇති වී ඇති බව මට ම අවබෝධ වුණා,'' යනුවෙන් බුදුහාමුදුරුවෝ අංගුලිමාල ගැන රජතුමාට කරුණු පැහැදිලි කළෝය.

ඉතා ම දරුණු මිනී මරුවෙක් ළඟ යි මා ඉන්නේ යයි සිතා රජතුමා තරමක් බියට පත්විය.

'' මේ ගැන කිසිම බියක් වන්න එපා ඉස්සර අංගුලිමාල දූන් අහිංසක,'' යනුවෙන් බුදුහාමුදුරුවෝ පැවසූහ.

රජතුමා තරමක් කේන්තියෙන් අංගුලිමාල දෙස බලා දණ නමලා නමස්කාර කළේය. නමස්කාර කර ඇසීය. ඔබගේ ගම සහ පියතුමාගේ නම කුමක් දැයි ඇසීය.

'' මහ රජතුමනි, මගේ පියාගේ නම ''ගර්ග'' මවගේ නම ''මන්තානි,'' යැයි පැවසීය.

'' භික්ෂු ගර්ග-මන්තානි පුත්‍ර මට ඔබ වහන්සේට සිවුරු පිරිකර පූජා කරන්න අනුමැතිය දෙන්න,'' යැයි රජතුමා ඉල්ලා සිටියේය.

අංගුලිමාල භික්ෂුව ''මහ රජතුමනි, මා ළඟ සිවුරු තුනක් තියනවා. පිණ්ඩපාතයෙන් ආහාර ලැබෙනවා. බෙහෙත් හේත් ගැන කරදරයක් නැහැ. මේ සියල්ල ගැන සොයා බැලීම ගැන ස්තුතිවන්ත වෙනවා යමක අවශ්‍යතාවක් තිබුණොත් ඒ ගැන සුදුසු වෙලාවට දන්වන්නම්,'' යැයි කීවේය.

පසේනදී කොසොල් රජතුමා සතුටට පත්ව බුදුරජාණන් වහන්සේට ''ගුරු දේවයාණනි, ඔබගේ කරුණා මහිමය පුදුමයි. කිසිවකුට කළ නොහැකි දෙයක් ඔබ වහන්සේ කළේ. අංගුලිමාල ගැන මම සිතා සිටියේ මීට වඩා දරුණු ආකාරයට මේ සියල්ලේම සම්මානය ලැබෙන්නේ ඔබ වහන්සේට,'' යැයි කියමින් නැවත වරක් බුදුරජාණන් වහන්සේට නමස්කාර කළේය.

රජතුමා සේනාව තමන්ගේ දෛනික රාජකාරී කටයුතුවලට පිටත් කර හැරියේය. රජතුමාත් බුදුරජාණන් වහන්සේගෙන් අවසර ගෙන පිටත්ව ගියේය.

## පනස් හතර වන පරිච්ඡේදය

# සිත එකඟ කරගැනීමේ සතුට

අංගුලිමාල පැවිදි වූ බව මුළු නගරයේම ඉතා ඉක්මනට ප්‍රචාරය විය. මේ විස්තරය ඇසූ නගරයේ සියලුම දෙනා සතුටට පත් වූහ. අසල රාජ්‍යයන්හි ද මේ පණිවිඩය ප්‍රචාරය විය. බුදුරදුන් සහිත මහා සංඝයාට ආදර ගෞරවය තව තවත් වැඩි වෙන්න පටන් ගත්තේය.

සංඝ සමාජය පිළිබඳව තරුණ අයගේ ගෞරවය සමාජයේ දිනෙන් දින වැඩි විය. තමතමන් කලින් ඇදහූ දර්ශන අතහැර බුදු හාමුදුරුවන්ගේ ධර්මයට සිත යොමු කළේය. නිගණ්ඨනාථ පුත්තගේ ප්‍රධාන තම ශිෂ්‍යයෙකු වූ උපාලි බුදුහාමුදුරුවන් සරණ සමාදන් වුණේ මගධයේ සහ කෝසලයේ සියලු දෙනාම කතා කළහ. මේ සිද්ධිය මහා වාද විවාදයන්ට හේතුවක් විය. උපාලි තරුණයා උතුරු මගධයේ ධනවත්ම පවුලක කෙනෙක් හැටියට ප්‍රසිද්ධව යි සිටියේය. නිඝණ්ඨනාථ පුත්තගේ ප්‍රධාන දායක ලෙස සිටියේ උපාලියි. නිඝණ්ඨනාථ පුත්තගේ අනුගාමිකයන් ඉතාම ත්‍යාගශීලී අය විය. සමහර සාධුවරුන් නිර්වස්ත්‍රව ද සිටිය නිසා බොහෝ අය නිඝණ්ඨ සාධුවරුන් ගැන සිටියේ හොඳ පැහැදීමකිනි.

වසන්ත සමයේ දී බුදුරදුන් නාලන්දාව අසල පාවාරික උද්‍යානයේ වැඩ විසූහ. දිනක් නිගන්ඨනාථ පුත්තගේ ප්‍රධාන ශිෂ්‍යයන්ගෙන් එක් අයෙක් බුදුරදුන් හමු වීමට පාවාරික වනයට ආවේය. දීර්ඝ තපස් වී නමින් හඳුන්වනු ලැබූ ප්‍රධාන නිඝණ්ඨනාථ ශිෂ්‍යයා සමඟ බුදුරදුන් සාකච්ඡාවට යොමු වූ අවස්ථාවේ දීර්ඝ තපස් වී ''ජෛන ධර්මය අදහන්නේ කර්මය නොවෙයි කරන පවුවලට දඬුවම් ලැබීම ගැනයි සිතන්නේ. ජෛන ධර්මය අනුව පවු කරන ක්‍රම තුනක් තියනවා. පළවෙනි පවු කරන ක්‍රමය ශරීරය සම්බන්ධ කරගෙන, දෙවන ක්‍රමය වචනය සම්බන්ධ කරගෙන, තුන්වන ක්‍රමය පවු කිරීමට කරන විචාරය,'' යනුවෙන් ප්‍රකාශ කළේය.

'' මේ පවුවලින් වැඩිපුරම තද පව කුමක් ද?

''කය හා සම්බන්ධව කරන පවු අන්තිම භයානක යි,'' යනුවෙන් දීර්ඝ තපස් වී ප්‍රකාශ කළේය.

''පවුවලින් බර විචාර ධාරාවන් නරකම පවු හැටියට සද්ධර්මයේ අපි සලකනවා. මනස නැත්නම් සිත සෑම කරුණකටම මුල් වීම ඊට එකම හේතුව හැටියට දැක්විය හැකියි,'' යනුවෙන් බුදුරදුන් පැවසූහ.

කියූ දේ නැවත තුන් වරක් කියන්න යැයි දීර්ඝ ජෛන ආචාර්යවරයා බුදුරදුන්ගෙන් ඉල්ලා සිටියේය. බුදුරදුන් ඒ ආකාරයටම තුන්වරක් එම ප්‍රකාශය කීවෝය. ජෛන ආචාර්යවරයා මේ සාකච්ඡාව හොඳින් සිතට ගෙන නිඝණ්ඨ නාථ පුත්ත හමුවට ගොස් බුදුහාමුදුරුවෝ මේ ආකාරයේ ප්‍රකාශයක් කරන්නේ යැයි පැවසීය. නිඝණ්ඨ නාථ පුත්ත මේ කරුණ අසා තදින්ම සිනාසුණේය.

''ගෞතමට ලොකුම ලොකු අමතක වීමක් සිදුවෙලයි තියෙන්නේ. ඔය කියන කතාව නොවෙයි හරි. කයින් කරන පවයි ඉතාම භයානක. ඉන් ලැබෙන ප්‍රතිඵලත් ඉතාම භයානකයි. නුඹ ඉතාම දක්ෂ කෙනෙක් මගේ සියලුම ශික්ෂා නුඹ සිතට ගෙන සිටින බව දැනගන්න ලැබීම ලොකුම සතුටක්,'' නිඝන්ඨනාථපුත්ත පැවසුවේය.

මේ සාකච්ඡාව කරන අවස්ථාවේ දී බොහෝ ශිෂ්‍යයන් නිඝණ්ඨ නාථ පුත්ත වටා සිටියේය. මේ අය අතර උපාලිත් විය.

උපාලි බුදුරදුන් හමුවීමට අවශ්‍ය බව කීවේය. ඒ තර්කයට පිළිතුරු දීම පිණිසයි. නිඝණ්ඨ නාථ පුත්ත උපාලිට බුදුරදුන් හමුවීමට අවසර දුන්නේය. නමුත් උපාලි බුදුරදුන් හමුවීම සඳහා යාම ගැන දීර්ඝ තපස් වී සතුටු වූයේ නැත. දීර්ඝ තපස් වී ''උපාලි තරුණ කෙනෙක්. බුදුරදුන්ගේ තර්කවලට පැහැදී බුදුරදුන්ගේ ශිෂ්‍යයෙකු බවට පත් වේවි,'' දීර්ඝ තපස් වී පැවසීය. සමහරු කීහ. සමහර විට බුදුන් උපාලිගේ ශිෂ්‍යයෙක් වෙන්නත් බැරි නැහැ. බුදුන් වහන්සේ දීර්ඝ තපස් වී උපාලිගේ ගමන නතර කරන්න බෙහෙවින් උත්සාහ ගත්තෝය. නමුත් උපාලි යන්න හිතූ ගමන පිටත් විය.

උපාලි බුදුරදුන් හමුවට ගිය විට බුදුරදුන් තමන් අවබෝධ කරගත් දහම කෙටියෙන්, සරලව උපාලිට විස්තර කළෝය. ඒ සුළු විස්තරයෙන් උපාලි පැහැදීමට පත් විය. බුදුන් වහන්සේ උදාහරණ හතක් ඉදිරිපත් කර මනස සියල්ලටම ප්‍රධාන බව ඔප්පු කර පෙන්නුවෝය.

නිගණ්ඨ නාථ පුත්තගේ සම්ප්‍රදාය පරම අවිහිංසාව ඇදහීම බව බුදුරදුන් දැනගෙන මේ නිසා නිඝණ්ඨ සාදුවරුන් නිතරම පුංචි පුංචි ප්‍රාණීන් පවා බේරාගෙනයි ගමන් කරන්නේ යැයි බුදුහාමුදුරුවෝ දැනගන සිටියේය. ඒ ගැන බුදුහාමුදුරුවෝත් ප්‍රශංසා කළහ. බුදුරදුන් උපාලිගෙන් ඇහැව්වා ජෛන සාධුවරු පුංචි ප්‍රාණියෙකුටවත් කරදර කරන්නේ නැති බව ඇත්ත. ඒ වුණත් නොදැනුවත්ව යම් කිසි ප්‍රාණියෙක් තමන්ගේ අතින් මැරුනොත් කරන්නේ කුමක් ද?'' යැයි බුදුරදුන් උපාලිගෙන් ඇසුවෝය.

''ගුරුතුමනි නිඝන්ථ නාථ පුත්ත කියන්නේ ඒ සතාව මරන්න ඔබගේ සිතේ අදහසක් නොතිබුණා නම් ඉන් කිසිම පාපයක් වෙන්නේ නැති බව,'' යැයි උපාලි කීවේය.

''එහෙනම් නිඝන්ථ නාථ පුත්ත පිළිගන්නවා සිතෙහි ඇතිවන විචාරය සියල්ලටම ප්‍රමුඛ බව. එහෙනම් කයින් කරන පවු ඉතාම භයානක බව කොහොම ද පිළිගන්නේ? යැයි බුදුරදුන් ඇසුවෝය. උපාලි බුදුරදුන්ගේ සිතිවිලි ගැන සිතා බුදුරදුන්ගේ අදහස් නිවැරදි යැයි පිළිගත්තේය.

උපාලි ''ඔබවහන්සේගේ පළමු තර්කයම මාව ප්‍රභාවත් කළා කියලා. මේ ගැන මා තවත් විස්තර දැන ගන්න කැමතියි. මගේ අනෙත් හිතවත් අයටත් මේ ගැන කියලා දෙන්න නෑ,'' යැයි

පැවසුවේය. බුදුරදුන් හත්වන උදාහරණය ඉදිරිපත් කළ විට උපාලි දණ ගසා වැන්දේය. ''මා ඔබවහන්සේගේ ශිෂ්‍යයෙකු වීමට කැමතියි,'' යනුවෙන් ද ප්‍රකාශ කළේය.

''උපාලි නුඹ මාගේ ශිෂ්‍යයෙකු වීමට පෙර ඒ ගැන කිහිප වරක් සිතන්න. එකවරම ඒ ගැන තීරණ ගන්න එපා,'' යැයි බුදුරදුන් පැවසූහ. බුදුන් වහන්සේගේ ප්‍රකාශයෙන් පසුව උපාලිට බුදුරදුන් ගැන තවත් පැහැදීම වැඩි විය. තමන්ගේ සම්ප්‍රදාය උසස් කරලා පෙන්වන්න බුදුරදුන් අනෙත් ධර්ම ආචාර්යවරුන් ලෙස කරන්නේ නැත යැයි උපාලිට දැනිණි. වෙන කිසිම ධරමාචාර්යවරයෙක් කවදාවත් නැවත මේ ගැන සිතන්න යැයි පවසන්නේ නැහැ. '' බුදුරජාණන් වහන්ස, මේ ගැන මා තදින් ම සිතුවා. කරුණාකරලා මට බුද්ධ, ධම්ම, සංඝ යන තුනුරුවන් සරණ සමාදන් කරවන්න . සත්‍ය ධර්මය දැනගන්න මා ප්‍රසන්න වුණා. ඔබ වහන්සේට බොහෝ ම ස්තුති කරනවා,'' යැයි උපාලි කීවේය.

බුදුරදුන් උපාලිට '' උපාලි නුඹ හුග දවසක ඉඳලා ජෛන ධර්මයේ සංරක්ෂක හැටියට කටයුතු කරන කෙනෙක්. මගේ ශිෂ්‍යයෙක් වුණාට කමක් නැහැ. ජෛන සාධුවරුන්ට උපකාර කිරීම නතර කරන්න එපා,''යැයි බුදුන් වහන්සේ උපාලිට කීවෝය.

උපාලි '' ගුරුතුමනි, ඔබ ඉත ම උදාර කෙනෙක්. මෙහෙම කිසිම ගුරුවරයෙක් කවදාවත්ම කියන්නේ නැහැ,'' යනුවෙන් උපාලි කීවේය. දීර්ඝ තපස් වී නිඝන්ඨ නාථ පුත්තට හමුවී උපාලි බුදුන්, දහම්, සඟුන් සරණ ගොස් බෞද්ධ උපාසකයෙකු වී ඇති බව සැල කළේය. නමුත් මේ ගැන නිඝන්ඨ නාථ පුත්ත විශ්වාස කළේ නැත. උපාලිගේ ගෙදරට ම ගොස් උපාලිගෙන්ම මේ ගැන ඇසුවාට පසුවයි කාරණය පිළිගත්තේ.

මගධයේ සහ කෝසලයේ බොහෝ අය බුදුරදුන්ගේ ධර්මය පිළිගැනීම වැඩි වෙන්න පටන් ගත්තේය. මේ ආරංචිය සැවැත් නුවරට පැතිරිණි. සියලු භික්ෂූන් බුදුරජාණන් වහන්සේට ප්‍රසංශා කළෝය.

''කෝසලයේ හා මගධයේ බොහෝ අය සද්ධර්ම මාර්ගය පිළිගැනීමට ඒම ඉතාම සතුටට කරුණක්. නමුත් භික්ෂූන් වහන්සේලා සීල සමාධි ප්‍රඥා යන ත්‍රිවිධ ක්‍රියාවන්හි නිතර නිරත

වී කටයුතු උත්සාහයෙන් නොකළ හොත් ඔය ප්‍රචාරය අනෙත් පැත්තටත් යන්න ඉඩ තියනවා. ඒ නිසා භාග්‍ය සහ දුර්භාග්‍ය දෙකම ගැන මධ්‍යස්ථව සිතන්න පුරුදු වෙන්න,'' යැයි බුදුන් වහන්සේ ප්‍රකාශ කළෝය.

දිනක් බුදුරදුන් සමඟ භික්ෂු මහා සංඝයා පිණ්ඩපාතය සඳහා වැඩම කළ විට රාජ පුරුෂයින් කිහිප දෙනෙක් ජේතවන විහාරයට ඇතුළු වී මියගිය කාන්තාවකගේ මළ මිනියක් සොයන්න ගත්තෝය. ගැහැනු කෙනෙකුගේ මිනියක් සොයන්න රාජ පුරුෂයින් ජේතවන විහාරයට ඇතුළු වුණේ ඇයි දැයි සියලුම භික්ෂූහු පුදුම වූහ.

භද්දිය හිමි රාජ පුරුෂයින්ගෙන් මේ පිළිබඳ විමසුවෝය. වෙනත් ආගමක් අදහන සුන්දරී නම් සුන්දර කාන්තාවකගේ මළ මිනියක් ගැන සොයන්න තමන් ආ බව කීහ. එහෙම කෙනෙක් දූන් කාලෙක ඉඳලා බණ අහන්න ජේතවනයට එන බව නම් දන්න බවත් මළ මිනියක් ගැන නො දන්නා බවත් භද්දිය හිමි ප්‍රකාශ කළෝය. නමුත් රාජ පුරුෂයන් මළ මිනිය සෙවීමට සෑම උත්සාහයක් ම ගත්තේය.

බුදුරදුන්ගේ කුටිය පිටුපස ඇගේ මළ මිනිය වලලා තිබුණ ආකාරය දැක හැම දෙනාම පුදුම වූහ. ඇය මැරුවේ කවදා ද බුදුරදුන්ගේ කුටිය පිටුපස වැලලුවේ කවුද යනු කිසි කෙනෙක් දැනගෙන සිටියේ නැත.

භික්ෂූන් මේ සිද්ධිය බුදුරදුන්ට දැන්වීය. සිහි විකල් කරගන්නේ නැතිව හොඳ කල්පනාවෙන් කටයුතු කරන ලෙස පිණ්ඩපාතයේ වඩින්නට පෙර සියලුම භික්ෂු අමතා බුදුන් පැවසීය.

එදා හවස සුන්දරීගේ ධර්මය අදහන පිරිස සුන්දරීගේ මළ මිනිය රැගෙන නගරයේ පෙරහැරක් කළෝය. ''මේ සුන්දරීගේ මළ මිනියයි, ජේතවනයේ බුදුහාමුදුරුවන්ගේ කුටිය පිටිපස්සේ වලළලා තිබුණා, කියමින් මිනිය ඔවුන් රැගෙන ගියේ. ''බුදුහාමුදුරුවෝ ශාක්‍ය වංශයේ කෙනෙක් කියලා කියනවා. කරුණාව මෛත්‍රිය සමානාත්මතාව ගැන කියනවා. සිල් ගැන කියනවා. සමාධිය ගැන කියනවා මේ සියල්ලම සම්පූර්ණ බොරු බව දැන්වත් දැනගන්න. මේ සියල්ල ඔබ සැමගේ ඉදිරිපිටයි සිදුවෙන්නේ,'' යනුවෙන් බුදුරදුන්ට දොස් පැවරූහ.

ශ්‍රාවස්ථියේ සැම තැනකම මේ ගැන සියලු දෙනා සමඟ සාකච්ඡා කළහ. බුදුරදුන්ගේ දායක දායිකාවන්ටත් මේ සිද්ධිය මහා ප්‍රශ්නයක් විය. මේ කාර්යය බුදුරදුන්ට අවනම්බු කිරීම සඳහා ඉතාම හොඳට සංවිධානය කර කළ දෙයක් බව බුද්ධිමත් අය කවුරුත් පිළිගත්තෝය. කාරණය පැහැදිළිව දැනගත් අය සිද්ධිය ගැන අසා බොහොම දුකට පත් වූහ. බුදුරදුන්ගේ ධර්මය නිසා පාඩු විඳින ආගමික පරම්පරාවක අය මේ අවස්ථාව බුදුරදුන්ට හා සංඝයාට අවනම්බු කිරීමට හොඳ අවස්ථාවක් කරගත්තෝය. භික්ෂූන් වහන්සේලා පිණ්ඩපාතයේ යන විට නොයෙක් ඕපාදූප විහිලු නරක වචන පවසමින් අවනම්බු කිරීමට පටන් ගත්තාය.

නමුත් භික්ෂූන් කිසිම දේකට කම්පා වූයේ නැත. නමුත් නවක භික්ෂූන්ට මේ සිද්ධිය එතරම් ම සැනසීමට කාරණයක් නොවීය. නවක භික්ෂූන් නගරයේ පිණ්ඩපාත කිරීමට යාමට කැමැත්තක් දැක්වූයේ නැත.

''අභූත චෝදනා කවදා හෝ කවර තැනක දී හෝ ඕනෑම කෙනෙකුට හෝ කරන්න පුළුවන්. මේ සිද්ධිය නිසා ඔබ ලැජ්ජා විය යුතු නැත. ලැජ්ජා වෙන්න ඇත්තේ එකම කාරණයයි. ඒ ඔබ සැම ශිලසම්පන්නව, උත්සාහයෙන්, ධ්‍යානභාවනා නොකිරීම පමණයි,'' යැයි පවසමින් දිනක් අළුයම් කාලයේ භික්ෂූන් වහන්සේ සියලුම දෙනා කැඳවා ඔවුන් දිරිමත් කළෝය.

''අසත්‍ය දේ ටික දවසකින් ඉබේම නැති වෙලා යනවා. හෙට ඔබ සැම පිණ්ඩපාතය සඳහා වඩින විට මේ කාරණය ගැන ප්‍රශ්න කළොත් කියන්න මේ පව කවුද කළේ ඒ අය ඒකේ විපාක විඳියි කියලා,'' යනුවෙන් ද පැවසූහ.

බුදුරදුන්ගේ මේ කතාවෙන් භික්ෂූන් ශක්තිමත් විය. මේ ගැන විශේෂයෙන් දුකට පත් වූ විශාඛාව, අනේපිඬු සිටු තුමන් හමුවී සිද්ධිය ගැන දීර්ඝ සාකච්ඡාවක් කළාය. මේ සිද්ධිය පසුපස කවර සිටීදැයි රහසින්ම සොයා බැලීම දෙදෙනා තීරණය කළෝය. තම තීරණය ජේත කුමාරයාටත් දැන්වූහ. පරීක්ෂණයට සම්පූර්ණ සහයෝගය දීමට ජේත කුමාරයාත් පොරෙන්දු විය.

''දවස් හතකට පසු සිද්ධියට මුල් වූයේ කවුරුද සම්පූර්ණ හෙළි කර ගත්තේය. තදින් මත්පැනි බී සිටි දෙදෙනෙක් අඬදබර

කර ගනිමින් සිටියහ. ඒ දබරයේ දී සියලු කරුණු හෙළි විය. රාජකීය පරීක්ෂකයින් අපරාධකරුවන් අල්ලා ගත්තේය. අපරාධකාරයෝ සුන්දරී අදහන ආගමේ අය අපට මුදල් දී මේ අපරාධය කරන්න යැයි කී බවත් බුදුන්ටත් සංඝයාටත් ඉන් අවමාන විඳින්න සිදුවිය හැකි බවත් ඔවුහු පැවසුවෝය.

කාරණයේ ඇත්ත දැනගත කොසොල් රජතුමා වහාම ජේතවනයට ගොස් භික්ෂු මහා සංඝයා කෙරෙහි ඇති ශ්‍රද්ධාව ගැන කථා කළේය. සියලුම දෙනා ඇත්ත දැන ගත්තෝය.

රජතුමා අපරාධකරුවන්ට දඬුවම් දීමට සූදානම් වූ විට ඒ අයට සමාව දෙන්න, නැත්නම් ඒ අය තවත් දරුණු වේවි,'' බුදුරදුන් පැවසූහ.

ඉන් පසු ශ්‍රාවස්ථියේ ජනතාව බුදුරදුන්ට සහ සංඝයා ට පෙරට වඩා ආදර ගෞරව කරන්න පටන් ගත්තෝය.

## පනස් පස් වන පරිච්ඡේදය

# උදෑසන දුටු තාරකාව

දිනක් බුදුරදුන් සමඟ ආනන්ද හාමුදුරුවෝ නගරයෙන් පිට පුංචි පන්සලකට ගියහ. මේ අවස්ථාවේ දී සියලුම භික්ෂූන් පිණ්ඩපාතය සඳහා වැඩම කර තිබිණි. මේ නිසා බුදුරදුන් සක්මන් භාවනාවෙහි යෙදී සිටියෝය. මේ අතර කුටියක් තුළින් වේදනා හඬක් ඇසිණි. බුදුරදුන් හෙමින් සීරුවේ ඒ කුටියට ඇතුළු වී පරීක්ෂා කළ විට භික්ෂුවක් කුණු තැවරුණ සිවුරත් සමඟ වේදනාවෙන් අඬන ආකාරය දුටුවෝය. මුළු කුටියම දුගඳින් පිරී තිබිණි.

බුදුරදුන් උන්වහන්සේ ළඟට ගොස් ඔබ වහන්සේට ඇති වේදනාව කුමක් ද? යනුවෙන් ඇසුවෝය.

'' ගුරු දේවයාණනි, මට පාචන රෝගය හැදුණා,'' භික්ෂුව කීවේය.

'' ඔබට සාත්තු කරන්න කවුරුවත් ම නැද්ද? යනුවෙන් ද බුදුරදුන් ඇසුවෝය. ''සියලුම දෙනා පිණ්ඩපාතය සඳහා ගියා. මා හැර මෙතන කිසිවෙක් නැහැ. මා මුලින් ම අසනීප වූ අවස්ථාවේ දී මා ගැන බොහෝ භික්ෂූන් සොයා බැලුවා. නමුත් සනීප වුණාට පස්සේ මා කිවුවා මට දැන් කිසිවෙකුගේ අවශ්‍යතාවක් නැත

කියලා. ඒ නිසා කිසිවෙක් මා ගැන දත් සොයන්නේ නැහැ,''යි ඒ භික්ෂුව පැවසීය.

වතුර පනිට්ටුවක් රැගෙන එන ලෙස බුදුරදුන් ආනන්දට කීවෝය. ආනන්ද වතුර ගෙන ආ පසු බුදුන් විසින්ම අසනීපව සිටි භික්ෂුවව නැහැවූවෝය. අසුචිවලින් තැවරී තිබුණු සිවුර සෝදා පිරිසිදු සිවුරු ඇන්දුවෝය. ඔහුගේ කාමරයත් වතුර දමා හොඳින් සේදූවෝය.

භික්ෂුවගේ සේදූ සිවුර අව්වට දැමීමට සූදානම් වූ විට පිණ්ඩපාතය ගිය භික්ෂූන් ආපසු පැමිණියහ. ආනන්ද එක භික්ෂූන් වහන්සේ නමක් අමතා බෙහෙත් දීම සඳහා වතුර උණු කරන්න යැයි කීවේය.

සියලුම භික්ෂූන් එක් වී බුදුරදුන්ගෙන් හා ආනන්ද හිමියන්ගෙන් දානය වළඳන ලෙස ඉල්ලා සිටියෝය. දානය වැළඳීමෙන් පසුව ඒ භික්ෂුව පෙළෙන්නේ කුමන අසනීපයෙන් දැයි බුදුරදු ප්‍රශ්න කළෝය.

පාචන රෝගයෙන් බව භික්ෂූන් වහන්සේලා ප්‍රකාශ කළහ.

''කවුරුවත් ඔබ වහන්සේලා අතරින් ඒ භික්ෂුව ගැන සොයා බැලුවා ද?

''ගුරුතුමනි, අපි මුලින්ම ඒ ගැන සෙවුවා. පසුව උන්වහන්සේම කිවුවා කිසිවෙකුගේ අවශ්‍යතාවක් නැත කියලා.

''අපි සද්ධර්මය අනුගමනය කරන්න පැවිදි වූ විට අපේ මෑණියන්, පියාණන්, සහෝදර, සහෝදරියන් හිතමිත්‍රයන්ගෙන් ඈත් වෙනවා. අපි කවුරු හරි අසනීප වුණාම අප අප ගැනම එකමුතු වෙලා බැලුවේ නැත්නම් වෙන කවුරුත් අපිව බලන්න නැහැ නේ ද? හිතවත්කම කියන්නේ ඒකට. ජීවත් වීමේ අදහස ඒකයි. භික්ෂු සමාජයේ කවුරු හරි අසනීප වුණොත් එක්කෙනෙක් අනිත් කෙනා ගැන සොයා බැලිය යුතුයි. යම් කිසි ආකාරයකට මා අසනීප වුණොත් ඔබලා මාව බලන්නේ නැද්ද?'' යැයි බුදුරදුන් ඇසුවෝය.

''ඔබ වහන්සේ කියන්නේ කුමක් ද? අප කරන්නේ ඒ දෙයයි,'' යනුවෙන් භික්ෂූහු පිළිතුරු දුන්හ.

''යම් භික්ෂුවක් අසනීප වුණොත් ඒ භික්ෂූවට සැලකීම, සෙවීම අපට අයිති කාර්යයක් අනික ලෙඩ වූ භික්ෂුවකට

සලකනවා කියන්නේ බුදුරජාණන් වහන්සේට සැලකීම, හා සමානයි,'' යනුවෙන් බුදුරදුන් සියලු භික්ෂූන් ඉදිරියේ පැවසූහ.

සියලුම භික්ෂූහු කාරණය ඉතාම කරුණාවෙන් භාරගත් බව සටහන් කිරීම පිණිස එකට එකතු වී බුදුරදුන්ට නමස්කාර කළහ.

ඊළඟ වස් කාලය බුදුරදුන් ජේතවනයේ පූර්වාරාමයේ වැඩ සිටියහ. මේ කාලයේ භික්ෂුණී ප්‍රජාපතී භික්ෂුණීන් පුහුණු කිරීමේ යෙදී සිටියාය. මේ අය අතර බිම්බිසාර රජතුමාගේ පූර්ව රැජිනක් වූ ඛේමාත් සිටියේය. ඇය මීට අවුරුදු විස්සකට පමණ පෙර බුදුරදුන් සරණ ගියා වූ කෙනෙක වූවාය. මුලින් ම ඇය මහත් ආඩම්බරයකින් සිටි කාන්තාවකි. පසුව ක්‍රමයෙන් නිහතමානී විය. අවුරුදු හතරක් උපාසිකාවක ලෙස පුහුණු වීමෙන් පසුවයි ඇය භික්ෂුණී ජීවිතටම එළැඹියේ. ඇය ඉතාම උත්සාහයෙන් ධ්‍යාන භාවනා කළාය. අවසානයේ භික්ෂුණීන්ට නායකත්වය ද දුන්නාය. මේ කාලය තුළ නිතර විශාඛා පූර්වාරාමයට යමින්එමින් සිටියාය. දිනක් විශාඛා අනාථ පිණ්ඩික සිටුතුමාත් කැටුව විහාරයට පැමිණියාය. ඇය භික්ෂුණී ඛේමා, ධර්මිණී, උප්පලවන්නා, පටාචාරා යන ප්‍රධාන පෙළේ භික්ෂුණීන් සිටුතුමාට හඳුන්වා දුන්නාය. මේ සියලුම දෙනා පැවිදි වීමට පෙරත් විශාඛාවගේ යෙහෙළියන්ව සිටි අයයි. මේ සියලු දෙනාගේම ජීවිතය එක් කරුණා ගාථාවක් හැටියට කවුරුත් සැලකූහ.

දිනක් විශාඛාව අනාථපිණ්ඩික සිටුතුමා භික්ෂුණීන් පුහුණු වන භික්ෂුණී විද්‍යාලය වෙත ද කැඳවා ගෙන ගියාය. ධම්ම දින්නා භික්ෂුණිය එහි ප්‍රධාන අධ්‍යක්ෂිකාව හැටියට කටයුතු කළාය. ඇය විශාඛා මහ උපාසිකාවගේ ඥාතිවරියක ද වූවාය. එදා අනේපිඬු සිටුතුමාත් විශාඛාවත් දෙදෙනාම ධම්ම දින්නා භික්ෂුණියගේ ධර්ම දේශනාවක් ශ්‍රවණය කළෝය. ඇය එදා ධර්ම දේශනාවට මාතෘකා කර ගත්තේ පංචස්කන්ධය හා ආර්ය අෂ්ටාංගික මාර්ගයයි.

ධම්ම දින්නා භික්ෂුණියට මේ ගැන තිබුණු ගැඹුරු දැනුම ගැන විශාඛාව පුදුමයට පත් වූවාය. විශාඛාව බුදුරදුන් හමුවට ගිය විට ධම්ම දින්නාවගේ ධර්ම දේශනාව ගැන ප්‍රශංසා මුඛයෙන් කතා කළාය.

''මේ විෂය ගැන ඔබ මගෙන් ඇහුවා නම් මා දෙන උත්තරයත් ඒකම තමයි. ධම්ම දින්නා සතර මග සතර ඵලයට පත්

වූ ධර්මය ගැන ඉතාම හොඳ අවබෝධයක් ඇති කෙනෙක්,'' යනුවෙන් බුදුරජාණන් වහන්සේ අනුදැන වදාළහ. ''ධම්ම දින්නා කළ ධර්ම දේශනා කටපාඩම් කරගන්න. ඒ දේශනා සියලුම භික්ෂූන්ට උපයෝගී වෙනවා,'' බුදුන් වහන්සේ ආනන්ද හිමියන් අමතා ප්‍රකාශ කළහ.

භද්‍රකාපාලිනී භික්ෂුණියත් ධම්ම දින්නා සේම ධර්මදේශනා කිරීමට දක්ෂ වූ නිසා ඇයටත් ධර්ම දේශනා සඳහා බොහෝ ආරාධනා ලැබුණි.

භික්ෂුණී පටාචාරාවගේ කතාව ඉතා ම කරුණා උපදවන කතාවකි. ඇය ධනවත් සිටුවරයෙකුගේ දියණියකි. ඇයට තනිවම ගෙදරින් පිට කවදාවත් යන්න අවසර තිබී නැත. තරුණ වයසට පත් වූ විට ගෙදර සිටි සේවකයෙකු හට ප්‍රේම කරන්න පටන් ගත්තාය. ඇයට දෙමාපියන් විවාහ යෝජනා ගෙනා අතර ඇය සේවකයා සමඟ පැන ගොස් නගරයේ වෙනම ප්‍රදේශයක ජීවත් වූවාය.

මාස කිහිපයකින් ඇයට පුතෙක් ලැබිණි. දෙවන දරුවා ඉපදීමට සිටිද්දී ඇයට තම දෙමාපියන්ව දකින්න යන්න ආශාවක් ඇති විය. දෙමාපියන්ගේ ගමට යන අතර තුර ඇයට දරුවකු ලැබීමේ ප්‍රසූත වේදනාව ඇති විය. ඒ සමඟම මහා වැස්සක් සමඟ තද කුණාටුවක් පැමිණියේය. ස්වාමි පුරුෂයා ඇයත් දරුවාත් ප්‍රවේශම් කර ගැනීමට හා වැස්සෙන් බේරා ගැනීමට කොළ අතු ටිකක් කඩන්න කැලයට ගියේය. ඒ අතර සර්පයෙකු දෂ්ඨ කිරීම නිසා ස්වාමි පුරුෂයා මිය ගියේය. අවසානයේ නව ජාත කිරිකැටි රාත්‍රියේ උපන් පුංචි පුතාත් එක අතකින් වඩාගෙන අනෙක් පුතා අතින් අල්ලාගෙන තම දෙමාපියන්ගේ නිවස ඇති ශ්‍රාවස්ථිය බලා අඬ අඬා පිටත් වී ගියාය.

ශ්‍රාවස්ථියට යන අතරතුර මඟ දී එගොඩ වීමට තිබුණු ගඟත් වැස්ස නිසා තරමක් වතුර පිරී තිබිණි. වැඩමහල් පුතා එගොඩට ඇරලන්න දවසකට කලින් උපන් පුතා ගං ඉවුරේ තැබූ ඇය වැඩිමහල් පුතා ඔසවාගෙන ගඟේ අනෙක් ඉවුර වෙත ගියාය. ලොකු පුතා ගඟේ එගොඩ තැබූ ඇය ගඟ මැදට එන විට දවසකට කලින් උපන් පුංචි පුතා එගොඩ ඉවුරේ දී උකුස්සෙකු උස්සාගෙන

යනු දුටුවාය. මේ සිද්ධිය දැක දරුවා උකුස්සගෙන් බේරා ගැනීමේ අදහසින් අප්පුඩි ගසා කෑ ගැසුවාය. ලොකු දරුවා සිතුවේ අම්මා තමන්ට කතා කරනවා කියාය. දරුවා අම්මා ළඟට ඒමට වතුරට පැන්නේය. දරුවා වතුරේ ගසාගෙන ගියේය. අන්තිමට පටාචාරාවට දරුවෝ දෙන්නත් නැති විය.

ගඟ ඉවුරට පැමිණි ඇය වේදනාව උසුලා ගත නොහැකිව සිහි නැතිව ඇදගෙන වැටිණි. ඉතාම අමාරුවෙන් දවස් කිහිපයකට පසුව ශ්‍රාවස්තියේ තම නිවෙස් සමීපයට ඇය පැමිණියාය. එසේ පැමිණි විට මහා ගං වතුරකට යට වී ඇයගේ නිවස ඇතුළු තවත් නිවෙස් විනාශ වී තිබෙනු දුටුවාය. ඇයගේ පවුලම මරණයට පත් වී තිබිණි. එදා ඇයගේ දෙමාපියන්ගේ ආදාහන කටයුතුත් සිද්ධ වෙමින් තිබිණි.

පටාචාරා සිහි නැතිව මහපාරේම ඇදගෙන වැටිණි. ඇය තවදුරටත් ජීවත් වීමේ ඇති තේරුමක් නැතැයි ඇය සිතුවාය. කිහිප දෙනෙක් ඇයගේ දුක්ඛ දායක තත්වය දැක ඇය බුදුහාමුදුරුවන් සමීපයට රැගෙන ගියෝය.

පටාචාරාවගේ කතාව සම්පූර්ණයෙන් ම අසා දැනගෙන කිවුවා බුදුන් වහන්සේ පටාචාරා අමතා, ''පටාචාරා, නුඹ දැන් ඉන්නේ ජීවිතයේ අති ඉහළම වේදනාව විඳිමිනුයි. මේ දුක්වේදනාව සදාතනික දෙයක් නොවෙයි. නුඹ සද්ධර්ම මාර්ගය ගැන සිත යොමු කළොත් මේ වේදනාවම සිනහවකට පත් කරගන්න පුළුවන්,'' යැයි පැවසූහ.

පටාචාරාව වේදනාව මැදම බුදුරදුන්ගේ දේශනාව අසාගෙන සිට ඉන් පිහිටක් ලැබිය හැකි බව දැන ගත් පසුව පැවිදි වීමට කැමති වූවාය. බුදුරජාණන් වහන්සේ ඇය මහා ප්‍රජාපතී භික්ෂුණිය වෙත බාර දුන්නේය.

මහා ප්‍රජාපතී හා අනෙකුත් භික්ෂුණීන් ඇයට ඉතා කරුණාවෙන් සැලකූහ. පය සේදූ වතුර මහ පොළොවට උරා ගන්නා ආකාරය දිනක් පටාචාරා පා සෝදන විට දුටුවාය. ඇයට අනිත්‍යය පිළිබඳව පුංචි හැඟීමක් ඒ වන විටත් දැනී තිබිණි. කිහිප දිනක් ඇගේ භාවනාව මේ විෂය පිළිබඳවම යොමු කළාය. තවත් දිනක උදෑසන භාවනා කරන විට ජන්ම මරණ දෙක පිළිබඳව ඇයට අවබෝධයක් ලැබිණි. ඇයට ඇති වූ සතුට ඇය කවියකට නැඟුවාය.

දවසක් දෙපය සොදනවිට මා ජලය බිමට හෙළුවා
ඒ ජලය පොළොවට උරා ගන්න ආකාරය දුටුවා
මා මගෙන් ම ප්‍රශ්න කළා
ඒ ජලය ගියේ කොහේ ද කියා
උදෑසන මා සෞම්‍ය සුළඟේ භාවනා කළා
ශරීරය කෙළින් තබාගෙන සිත සිහියෙන් තබා ගත්තා
මා ඉන්ද්‍රිය හයේ ස්වභාවය දුටුවා
ඉතාම ඉක්මනට දුවන අශ්වයන් වගේ මට දැනුණා
දැල්වෙන පහනේ පහන් සිළුව දැක
ඒ අනුව භාවනා කළා
මා මගේ සිත එක් තැනකට ගත්තා
කාලය කොයි වෙලේ ගෙවුණා ද දන්නේ නැහැ
පහන තවම දැල් වෙනවා
මා ඉඳිකටුව ඉස්සුවා
දැල්වෙන පහන පසෙකට කළා
එළිය ඉක්මනට නැති වී ගියා
සියල්ල අඳුරේ ගිලුණා
එක එළියක් නිවී ගියා
නමුත් මගේ ආධ්‍යාත්මික ස්වරය විවෘත වුණා
මගේ සිත සියලුම බන්ධනවලින් නිදහස් වුණා
උදෑසන තරුව අහසේ ඉහළට නැගුණා

තම සතුට ප්‍රජාපතී භික්ෂුණියට කවියෙන් දැන් වූ විට ඇය බොහෝ සතුටට පත් වූවාය.

මේ තරම් දුක් කරදර විඳලත් මුගලන් මහ රහතන් වහන්සේගේ පිහිටෙන් ඇය ජීවිතය ජය ගත්තාය.

මෙසේ උත්පලවන්නා නමින් තවත් ඉතා රූමත් කාන්තාවක ද පැවිදි වී මේ අය අතර සිටියේය. ඇයත් මුගලන් මහ රහතන් වහන්සේගේ පිහිට පතාගෙන පැමිණියාය. දිනක් මේ භික්ෂුණියත් මුගලන් මහ රහතන් වහන්සේත් උද්‍යානයේ සක්මන් භාවනා කරමින් සිටියෝය. ඒ භික්ෂුණිය දෙස පුරුෂ පක්ෂයා බැලුවේ මලක් දෙස බලන ආකාරයටයි.

මුගලන් මහරහතන් වහන්සේ "ඔබ හිස මුඩු කළත් ඉතා ම ලස්සන කෙනෙක්. නමුත් ඔබගේ මුහුණේ විශාල දුකක් පිරිලා තියන බව හොඳටම පෙනෙනවා. ඔබ හිස මුඩු කළත් කහ සිවුරු හැන්දත් සිත ගමන් කරන්නේ වෙනත් අතක," යි ප්‍රකාශ කළෝය.

මුගලන් මහරහතන් වහන්සේ, ''අතීතය ගැන හිතලා දුක් වෙන්න එපා, හොඳින් වර්තමානයට හිත යොමු කරන්න. ජීවිතය සුන්දර වේවි,'' තව දුරටත් ප්‍රකාශ කළෝය.

''බුදුරදුන්ගේ ධර්මයෙහි සෑම දෙනෙකුටම සතුට දෙන රසයත් අඩංගුය. ඒ නිසා ඒ ගැන සිතන්න,'' යනුවෙන් ද උන් වහන්සේ පැවසූහ.

උත්පලවන්නා ''මගේ ජීවිතය පව්වලින් පිරිච්ච ගෙයක්. මම හිතන්නේ නැහැ බුදු හාමුදුරුවෝවත් මගේ මේ පවුකාර ජීවිතයෙන් මාව බේරගන්න ශක්තියක් ඇතිව ඉන්නවා කියලා'' උත්පලවන්නා කීවාය. එසේ කියූ උත්පලවන්නා තම ජීවිත කතාව මුගලන් මහ රහතන් වහන්සේට විස්තර කළාය. උත්පලවන්නාගේ විවාහය සිදු වී ඇත්තේ වයස අවුරුදු දහසයේ දී ය. ඇගේ නැන්දනිය ඇයගේ ස්වාමියා සමඟ වරදෙහි බැඳෙන බව ඇයට දැන ගන්නට ලැබිණි. උත්පලවන්නා එක් දුවක බිහි කළාය. එහෙත් තම සැමියාගේ හා නැන්දනියගේ කායික සම්බන්ධය ඉවසා ගත නො හැකිව ඇය නිවසින් පැන ගියාය. තමන්ගේ දියණියද නැන්දනිය ළඟ තනි කරමිනුයි, ඇය පැන ගියේ. වර්ෂ කිහිපයකට පසුව ඇය එක් ව්‍යාපාරිකයෙකු සමඟ නැවත විවාහ වූවාය. එම ව්‍යාපාරික ස්වාමි පුරුෂයා වෙනත් කාන්තාවක මුදල් ගෙවමින් ඇසුරු කිරීමට තබාගෙන සිටින බව ඇයට දැන ගන්න ලැබිණ. මේ ගැන උත්පලවන්නා සොයන්න ගත්තාය. අවසානයේ ඇයට දැනගන්නට ලැබුණේ ඒ කාන්තාව වෙන කවුරුත් නොව, නැන්දනිය ළඟ දමා ආ තමන්ගෙ දියණියයි බව.

උත්පලවන්නාගේ දුකත්, සමාජය ගැන ඇති වූ කෝපයෙන් නිම් හිම් නැති විය. ඇය කිසිම කෙනෙකුට ප්‍රේම කිරීම අතහැර නාට්‍යාංගනාවක වූවාය. ධනය එකතු කර භෞතික සැප සම්පත් විඳීම ආරම්භ කළාය. මුගලන් මහ රහතන් වහන්සේ ළඟින් වඩින විට උන් වහන්සේ වත් තම වසඟයට ගැනීමට උත්සාහ කළ බව ඇය පිළිගත්තා.

උත්පලවන්නා මේ කතාව පවසා මුහුණ දෑතින් වසාගෙන අඬන්න පටන් ගත්තාය. ඇඬීමෙන් ඇගේ සිත සැහැල්ලු වීමට මුගලන් මහ රහතන් වහන්සේ ඉඩ හැරියෝය. අන්තිමේ දී මුගලන් මහ රහතන් වහන්සේ උත්පලවන්නා බුදුරදුන් හමුවට රැගෙන ගියෝය. බුදුරදුන් ඇය මහා ප්‍රජාපතී භික්ෂුණියට බාර කළෝය. ඇය භික්ෂුණියක ලෙස වසර හතරක් ශීල සම්පන්නව භාවනා කිරීමෙන් පසු රහත් බව අවබෝධ කර ගත්තාය.

### පනස් හය වන පරිච්ඡේදය

# හුස්ම ගැනීමෙන් සිත එකඟ කර ගැනීම

භික්ෂුණීන් වහන්සේලාගේ ආරාමයේ ධර්ම දේශනා කිරීමට බුදුරදුන් හෝ සමහරවිට ජ්‍යෙෂ්ඨ භික්ෂූන් වහන්සේ නමක් හෝ යෑම සිරිතක්ව තිබිණි. වරක් මුගලන් මහ රහතන් වහන්සේගේ ඉල්ලීම පරිදි බුදුරදුන් වස්සාන කාලය මාසයකින් දිගු කළෝය. වස් කාලය දිගු කිරීමෙන් මුගලන් මහ රහතන් වහන්සේ වස් පවාරණය කර ඇත සිටින භික්ෂූන්ට ජේතවනයට පැමිණීමට ඉන් පහසුවක් ලැබේය යන සිතුවිල්ල නිසාය. ඊට අමතරව බුදුරජාණන් වහන්සේගේ ශ්‍රී මුඛයෙන් ඒ අයට ධර්ම දේශනා ශ්‍රවණයටත් ඉඩක් ලැබෙන නිසාය. ඒ අනුව බොහෝ අය පැමිණියෝය. උපාසක අනේපිඬු, විශාඛා ආදී පිරිස තුන්දහසක් භික්ෂූන්ට නතර වීමට සහ දානමාන ආදිය දීමට සූදානම් කළහ. හැම වසරකම වස් අවසානයේ දී සිදුවන අවසාන උත්සවය මෙවර කාර්තික පුන් පෝය දා සිද්ධ විණි.

සෑම වසරකටම කාර්තික පූර්ණිමා දවසේ සුදු කුමුදු සහ නෙළුම් මල් පිපීම ස්වාභාවික ය. මේ නිසා මේ පොහොය දිනය කුමුදු පොහොය නමින් ද හඳුන්වනු ලැබුවේය. එදා රාත්‍රියේ බුදුරදුන් තුන් දහසක් භික්ෂූන් සමඟ සඳ එළියේ සතුට වින්දෝය. කුමුදු

මල් සුවඳ පරිසරයම තවත් ආනන්දමය කළේය. සියලුම භික්ෂුභික්ෂුණීන් ශාන්තව වාඩි වී සිටියෝය. බුදුරදුන් සංඝයා දෙස සතුටු නෙතින් බලා සිටියෝය. භික්ෂූන්ගේ ධ්‍යාන භාවනා ගැන ප්‍රශංසා කළහ. මේ අවස්ථාව සිතත්, සිත එකඟ කර ගැනීමේ මාර්ගය ගැනත් දේශනා කිරීමට උපයෝගී කර ගත්තෝය.

එදා එතන සිටි සියලුම භික්ෂුභික්ෂුණීන්ට ආශ්වාස ප්‍රශ්වාස මාර්ගයෙන් සිත එකඟ කර ගැනීම ගැන විස්තර කර දුන්හ. බුදුරදුන්ගේ ශ්‍රී මුඛයෙන් මේ දේශනාව ඇසීමට මෙතරම් භික්ෂූන් වහන්සේලා ගණනකට ලැබුණු ප්‍රථම වතාවයි ඒ. ආනන්ද හාමුදුරුවන් මේ සූත්‍රය ඉතා හොඳින් අසාගන සිටියෝය. හේතුව අනෙක් ස්ථානවලටත් ගොස් අනෙත් අයටත් මේ සූත්‍ර දේශනාව කිරීම වැදගත් වූ නිසාය.

මේ අවස්ථාවට සහභාගී වූ පිරිස අතර යශෝදරා භික්ෂුණී, භික්ෂුණී සුන්දරි නන්දා යන අය ද සිටියහ. භික්ෂුණී ගෝතමී කපිලවස්තුවේ භික්ෂුණී විහාරයේ භික්ෂුණීන් පුහුණු කරමින් සිටියාය. යශෝදරා භික්ෂුණී බවට පත් වී අවුරුද්දකට පසුව භික්ෂුණීන්ගේ ප්‍රධානියෙක් බවට පත් වුවාය. සෑම වස් කාලයකම ජේතවනයේ අවට ඉන්න ඕනෑ යැයි භික්ෂුණීන් සියලුම දෙනා සිතුහ. හේතුව බුදුන් ඇතුළු ජ්‍යෂ්ඨ භික්ෂූන්ගේ දේශනා නොකඩවා ඇසීමට පහසු වීම නිසාය. මල්ලිකා බිසව සහ ගෝතමී භික්ෂුණිය සෑම දෙනාගේම සැප දුක් කිසිම අඩුවක් නැතිව සම්පාදනය කළහ. අවුරුදු දෙකක් ගත වන තෙක් රජ මැදුර ඕනෑම ආකාරයට භාවිත කිරීමට භික්ෂුණීන්ට ඉඩ හැරියාය. තුන් වන වසරේ මල්ලිකා බිසව සහ විශාඛාව එකතු වී පූර්වාරාමය සාදා දුන්හ. දැන් භික්ෂුණී ගෝතමිය මහළු වයසට පත්වෙමින් සිටින නිසා නවක භික්ෂුණීන්ට ඉදිරියට පැමිණ නායකත්වය ගැනීමට ඉඩ සලසලා තිබිණි. නවක නායක භික්ෂුණීන් අතර යශෝදරා, ශීලා, විමලා, සෝමා, නන්දුත්තරා යන අය ප්‍රධාන තැනක් ගත්හ.

එක් දිනක හවස මේ සියලු දෙනාම මුණ ගැසුණි. රාහුල භික්ෂු ශ්‍රේෂ්ඨව සහ ස්වස්ති, භික්ෂුණී යශෝදරා, සුන්දරි නන්දා යන අයට හඳුන්වා දුන්හ. ස්වස්ති මේ අය හමු වී නිසා ඉතාම සතුටට පත් විය. බුදුරදුන් තම සූත්‍ර දේශනාව ආරම්භ කළහ.

''මා මේ අමතන්නේ භික්ෂුභික්ෂුණී දෙපක්ෂය මයි. ආශ්වාස ප්‍රශ්වාස මඟින් සිත එකඟ කරගත හොත් සද්ධර්ම මාර්ගය අනුව ගමන් කිරීම පහසු වනවා සේම සසර දුකින් නිදහස් වීම ද පහසුයි. මේ සඳහා අවස්ථා හතරක් තිබෙනවා. ඉන් විසුද්ධියේ අංග හතක් ලැබෙනවා. ඉන් ප්‍රඥාව ද ඇති වෙනවා. නිර්වාණය අවබෝධ කර ගැනීම දක්වා යන්න හැකියාව තිබෙනවා. මේ සඳහා භාවනා කරන ක්‍රමය මෙහෙමයි.

''පළමු හුස්ම ගැනීම, දිගට හුස්ම ගැනීමේ දී සිතන්න ඕනෑ මා හුස්ම ගන්නේ දිගටයි. හුස්ම හෙළන විට දිග හුස්මක් හෙළනවා කියා සිතන්න ඕනෑ. දෙවැනිව, කෙටියෙන් හුස්ම ගනිද්දී කෙටියෙන් හුස්ම ගන්නා බව සිතන්නත් හුස්ම පිට කරන විට මා කෙටි හුස්මක් පිට කරනවා කියා දැනගෙන කරන්නත් ඕනෑ.

''මේ ක්‍රම දෙක ක්‍රමයෙන් වර්ධනය වන විට සිතට විකාර අදහස් ඒම ක්‍රමයෙන් අඩු වෙනවා. ඒ සමඟම සිතේ ඇති වන චංචල ගතියත් අඩු වෙනවා.

''වර්තමානයේ ඇතිවන ප්‍රශ්න විසඳීමට බුද්ධිය වර්ධනය වෙනවා. බුද්ධිය හොඳට පැහැදිලි වූ විට හොඳ නරක දෙක ගැන අවබෝධයක් ලැබෙනවා.

''තුන්වන හුස්ම ගැනීමේ ක්‍රමය

''ඇතුළේ ඇති හුස්ම ගැනීමේ දී මා මේ ශරීරය පිළිබඳව සිහි කල්පනාවෙන් මේ ක්‍රියාව හුස්ම ඉහළ පහළ දැමීම කරන්නේ කියලා හිතන්න ඕනෑ. මේ ක්‍රමය නිසා ශරීරය සමඟ ජීවිතය සම්බන්ධ කරන ක්‍රමය කුමක් ද කියා දැනෙනවා. ශරීරයේ ඇති වීම නැති වීම ගැන ද හැඟීමක් ඇති වෙනවා.

''හතර වන හුස්ම ගැනීමේ ක්‍රමය

''මා හුස්ම ඇතුළට ගන්නවා. මගේ ශරීරය මා ශාන්ත කරනවා. මේ ක්‍රමය නිසා ශරීරයට ශක්තිය හා මනසට ශක්තිය ලැබෙනවා. ඊට පස්සේ තමාට අවබෝධ වෙනවා. සිත ශරීරය ආශ්වාස ප්‍රශ්වාස යන මේ හතර ස්වභාව ධර්මය සමඟ ඇති කරුණු හතරක් කියලා.

''හුස්ම ගැනීමේ පස්වන ක්‍රමය.

''මා හුස්ම ඇතුළට ගන්නවා, සතුට දැනෙනවා. මා හුස්ම පිට කරනවා, සතුට දැනෙනවා කියා.

''හුස්ම ගැනීමේ හයවන ක්‍රමය

''මා හුස්ම ඇතුළට ගන්නවා, ප්‍රසන්න බව අනුභව කරනවා.

''මේ ආශ්වාස ප්‍රශ්වාස ක්‍රම දෙකින් ඔබ භාවනාවේ එක්තරා සන්ධිස්ථානයකට පත් වෙනවා. මේ ක්‍රම දෙකින් ශාන්තිය සහ සතුට ඇති වෙනවා. සිත සහ ශරීරයට සනීපයක් දැනෙනවා. තමන් කවුද කියලා අවබෝධ කරගන්න පුළුවන් වගේ ම වර්තමානය ගැන විමසිල්ලෙන් සිටීමටත් උපයෝගී වෙනවා. පරම සතුටේ ආරම්භය ද ඉන් ඇති වෙනවා. ඔබ ජීවත් වන්නේ ජීවිතයේ අතීත සිද්ධි මතයි. අතීත සිද්ධියක එල්ලුනේ නැත්නම් ඔබේ ජීවිතයට ලැබෙන්න දෙයක් නැත කියලයි ඔබ සිතන්නේ. නමුත් ආශ්වාස ප්‍රශ්වාස ක්‍රියාවෙන් ඔබ වර්තමානයේ සැපවත් ජීවිතයකට ප්‍රවේශ කරවනවා.

''හුස්ම ගැනීමේ හත්වන ක්‍රමය

''මම හුස්ම ගනිමි, සිතේ ඇතිවන ක්‍රියා ගැන කල්පනාවෙන් සිටිමි. හුස්ම ගැනීමේ දී පිට කිරිමේ දී මා සිහි කල්පනාවෙන් සිටිමි.

''හුස්ම ගැනීමේ අටවන ක්‍රමය

''මා හුස්ම ගන්නවා. සිතේ ඇතිවන ගතිවිධි ගැනත් ගතිවිධි ඇතිවන ආකාරයත් ගැන සිතනවා. මා සිත ශාන්ත කිරීමට උත්සාහ ගන්නවා. මේ ක්‍රම දෙක මෙතරම් දුරට ආවිට ඔබගේ සිත ගැන ඔබට නියම ස්වරූපය දැනගන්න පුළුවන්. ඉන්පසුව සිතේ ඇති වන සෑම සිතුවිල්ලක්ම කෝමලභාවයට පත් වෙනවා. මේ ක්‍රමය අනුව සිතේ ගතිවිධි ගැන විමසීමම භාවනාව නමින් හඳුන්වනවා. මේ සියල්ල ඔබට ඔබේ සිත පාලනය කිරීමේ හැකියාව ඉබේම ඇති වෙනවා.

''හුස්ම ගැනීමේ නව වන ක්‍රමය.

''මා හුස්ම ගන්නවා. මගේ සිත ගැන සිහියෙනුයි ඉන්නේ

''හුස්ම ගැනීමේ දහවන ක්‍රමය.

''මා හුස්ම ගන්නවා. සිත උත්සහව කරනවා.

''හුස්ම ගැනීමේ එකොලොස් වන ක්‍රමය

''මා හුස්ම ඉහළපහළ ගැනීම කරනවා. මගේ සිත එක්තැන් කිරීමත් ඒ සමඟම කරනවා.

''හුස්ම ගැනීමේ දොළොස්වන ක්‍රමය

''මා හුස්ම ගන්නවා. මගේ සිත නිදහස් කරනවා. මා හුස්ම පිට කරනවා. මගේ සිත නිදහස් කරනවා.

''මේ ක්‍රියා හතරෙන් හුස්ම ගැනීම මාධ්‍යයෙන් සිත කුමක් ද සිතේ ගති කෙසේ ද කියා දැන ගන්න පුළුවන්. නව වන හුස්ම ගැනීමේ ක්‍රමයෙන් සිතේ ඇති භේද භාව විචාර හර්ෂ සංඛා ආදිය ගැන දැනගැනීමට උපකාර වෙනවා. මේ ගැන තවතවත් සිතීමේ දී සිත එකඟ කර ගත හැකි ද නැද්ද යන්නත් දැනගන්න පුළුවන්.

''දහවන සහ එකොළොස්වන අවස්ථාවේ දී මේ ගතිය තව තවත් දියුණු වෙනවා. හුස්ම ගැනීමේ දහ තුන් වන ක්‍රමය මා හුස්ම ඇතුළට ගැනීම සහ පිට කිරීම සිදු කරනවා. සියලු ධර්ම අනිත්‍ය බවත් පෙනෙනවා. මේ තත්වය නැවත නැවත ඇති වෙනවා.

''දහ හතර වන හුස්ම ගැනීමේ ක්‍රමය

''මා හුස්ම ඇතුළට ගැනීම සිදු කරනවා. ඒ සමඟම සියලු ධර්මවල ක්ෂය වීම ද පෙනෙනවා. හුස්ම ඇතුළට ගැනීමේ දී පිට කිරීමේ දී සියලු ධර්ම ක්ෂය වීම පෙනෙනවා.

හුස්ම ගැනීමේ පහළොස්වන ක්‍රමය

''මා හුස්ම ඇතුළට ගෙන නිදහස් වීමේ ක්‍රමය අවබෝධ කර ගන්නවා. මා හුස්ම පිට කරන ගමන් නිදහස් වීමේ ක්‍රමය අවබෝධ කර ගන්නවා.

දහසය වන හුස්ම ගැනීමේ ක්‍රමය

''මා හුස්ම ඇතුළට ගන්නවා. මේ ලෝකයේ සම්පූර්ණ නැතිවීමක් ගැන දැනෙනවා. හුස්ම පිට කිරීමේ දීත් මා ලෝකයේ සම්පූර්ණ නැති වීමක් ගැන සිතනවා.

''මේ ක්‍රම හතර අනුගමනය කරන පුද්ගලයා තම සිතේ ඇති බලාපොරොත්තු අත් හරිනවා. ලෝකයේ සත්‍ය ස්වභාවය දකින ආකාරය මෙනෙහි කරනවා. සියලුම ස්වාභාව ධර්මයන් දැකීමක් මේ සමඟ සිද්ධ වෙනවා. පළමු අවස්ථාව සියලු ධර්මයන්ගේ අනිත්‍ය බවයි. ඉන් පස්සේ සියලු ධර්ම අනිත්‍ය නම් සියල්ල නැතිවීම ද ස්වාභාවිකයි. මේ අවස්ථා දෙකම අවබෝධ වූ විට ජන්ම මරණ යන දෙකින් නිදහස්වීම සිදු වෙනවා. ඉන් පස්සේ ඔබ නිර්වාණය අවබෝධ කරගත් කෙනෙක් බවට පත් වෙනවා. කුසල් අකුසල් සෑම විෂයකම සම්පූර්ණයෙන්ම අවසන් වූ විට නැවත ඉපදීමක් සිද්ධ වෙන්නේ නැහැ. නැවත ඉපදීමක් නූනොත් සසර සැරිසරණ කතාවත් මතු වෙන්නේ නැහැ. සියලුම බන්ධනවලින් නිදහස් වුණා කියන්නේ එදාටයි. මේ ක්‍රියාව තම

ජීවිතයට සම්බන්ධ කරගෙන දිගටම කළ යුතුයි. වරින්වර කිරීමෙන් නියම ප්‍රතිඵල ලැබීමක් ගැන සිතීම අපහසුයි. යමකින් හොඳ ප්‍රතිඵල ගන්න නම් ඒ හොඳ ක්‍රියාව දිගටම කරගෙන යා යුතුයි. උත්සාහයෙන් කළ විට මෙහි ප්‍රතිඵලත් ඉක්මනටම ලබා ගත හැකියි,'' බුදුරජානන් වහන්සේ දේශනාව අවසන් කළෝය.

ස්වස්ති මේ කරුණුවලින් කරුණු හතරක් මුලින්ම දැනගෙන තිබිණි. බුදුරදුන්ගේ දේශනාවෙන් පසුව ඊට අමතරවත් කළ යුතු පිළිපැදිය යුතු කරුණු ඇති බව ඔහු දැන ගත්තේය.

එදා රාත්‍රියේ සීතල සඳ එළියේ වාඩි වී බුදුරදුන් තුන් දහසක් භික්ෂු භික්ෂුණීන් හට මේ දේශනාව කළේ මොන තරම් අලංකාරව ද? මේ ආකාරයේ ස්ථානයක්, වේලාවක්, රැයක් තෝරා ගැනීම ගැන ස්වස්ති මහ මුගලන් රහතන් වහන්සේට මුව පුරා ස්තුති කළේය.

දෙවන දා අහිංසක හිමි පිණ්ඩපාතයෙන් ආපසු එන විට මුළු ශරීරයත් සිවුරුත් ලේවලින් පිරී තිබිණි. ශරීරයේ ඇතිවූ තුවාල නිසා ගමන් කිරීම ද අපහසු විණි. ස්වස්ති අහිංසක හිමියන්ගේ මේ තත්ත්වය දැක උන් වහන්සේ ළඟට ගියේය. මාව බුදු හාමුදුරුවෝ ළඟට එක්කගෙන යන්න කියා අහිංසක හිමියෝ ස්වස්තිගෙන් ඉල්ලා සිටියෝය. ''නගරයේ පිණ්ඩපාත වඩින විට කිහිප දෙනෙක් මා ඉස්සර අංගුලිමාල මිනීමරුවා නේද කියා දැනගෙන මා මාව වට කරගෙන හොඳටම මට තැලුවා. තලලා වද දුන්නා. නමුත් සියල්ල සිහි නුවණින් ඉවසුවා. මා ලේ වමනය කරන තෙක් ඒ අය මට තැලුවා, ''යැයි උන් වහන්සේ පැවසූහ.

අහිංසකගේ මුළු ශරීරයම ලේවලින් නැහැවී ඇති බව බුදුරදුන් දුටුවෝය. කැළෑවට ගොස් කර කොළ ස්වල්පයක් රැගෙන විත් තම්බා තුවාලවල තවරන ලෙස බුදුරදුන් ආනන්ද හිමියන් අමතා පැවසීය. ලේ ගැලීම නතර කරනු වස් ස්වස්ති කොළ පොතු වර්ග ගෙන ආවේය.

මේ සියලු දෙනා එකතු වී සියල්ලම කළත් අහිංසකගේ ශරීරයේ වේදනාව අඩු වූයේ නැත.

කෙතරම් අමාරු වුවත් අහිංසක ඇඬුවේ නැත; කෑ ගැසුවේත් නැත. ''නුඹගේ මේ වේදනා සියල්ල අතීතයේ පවු සේදීමක් හැටියට සිතන්න. ප්‍රේමය සහ සිතේ එකඟ බවින් දුකත්

ඉවසීම දහස් වරක් උපත ලැබීමෙන් වත් කළ හැකි දෙයක් නො වෙයි. නුඹගේ සිවුර නම් ගන්න දෙයක් නැහැ. කිසිසේත්ම පොරවන්න බැහැ. පාත්‍රය කොහේ ද?'' යනුවෙන් බුදුරදුන් ඇසුවෝය.

''ගුරුතුමනි, පාත්‍රය ඒ අය බිඳ දැම්මා,'' යැයි අහිංසක හිමියෝ පැවසූහ.

''නුඹට අලුත් සිවුරක් සහ පාත්‍රයක් දෙන්න කියා, මා ආනන්ද හිමියන්ට කියන්නම්,'' යැයි බුදුරදුන් පැවසූහ.

අහිංසකට බෙහෙත් ගල්වන අතර භික්ෂුවක් හැටියට තමන් ගැන කොච්චර හොඳ උදාහරණයක් දුන්නා ද? යැයි ස්වස්ති සිතුවේය.

අහිංසක හිමියනට මීට පෙර සිදු වූ සිද්ධියක් පිළිබඳව අහිංසක ස්වස්තිට විස්තර කළේය.

වනයක් අසලින් යන විට එක් කාන්තාවක් දරු ප්‍රසූතියෙන් වේදනා විඳින බව අහිංසක හිමියෝ දුටුවෝය. ඇය ඉතාම තද වේදනාවකින් පෙළෙන බව පැහැදිලිව පෙනිණි. දරුවාගේ උපත සිදු නොවීම නිසාය ඒ. මේ සිද්ධිය දුටු අහිංසකගේ හිතේ බලවත් වේදනාවක් ඇති විය. ඔහු ශ්‍රාවස්ථියේ සිටි බුදුරදුන් හමුවිණි. හමු වී මේ මෙවැනි වෙලාවට කළ යුත්තේ කුමක් දැයි උන් වහන්සේගෙන් අසා සිටියෝය.

''වහාම එතනට යන්න. නැඟනියනි, මා ආර්යයෙක් හැටියට ඉපදුණු දවසේ සිට (රහත් වූදා සිට) මේ දක්වා කිසිම ප්‍රාණ හිංසාවක් කළේ නැහැ. එබන්දක් ගැන සිතුවේත් නැහැ. මේ කාරණයේ සත්‍ය බලයෙන් ඔබටත් ඔබගේ ඉපදීමට සිටින දරුවාටත් කුසල ශාන්තියක් වේවා,'' යි ප්‍රාර්ථනා කරන ලෙස බුදුන් වහන්සේ ආනන්ද හිමියන්ගෙන් ඉල්ලා සිටියෝය.

අහිංසක හිමියන් බුදු වදන අසා කරුණා බරිත හදවතින් නැවත එම කාන්තාව දරුවා ප්‍රසූත කිරීමට සූදානම් වූ වනයට ගොස් බුදුන් ඉගැන්වූ වාක්‍ය කියැවුවෝය.

මවටත් දරුවාටත් කරදරයක් නොවී දරුවා මෙලොව එළිය දුටුවේය.

අහිංසක අංගුලිමාලගෙන් පස්සේ නැවත ''අහිංසක'' වූ පසු පැවිදි බව ලබා ආධ්‍යාත්මික වශයෙන් ලැබූ දියුණුව ගැන බුදුරදුන්ම තම මුඛයෙන් ප්‍රශංසා කළෝය.

## පනස් හත් වන පරිච්ඡේදය

# ඔරුව, ගඟ, ඉවුර නොවේ

ලැබූ සරත් ඍතුව බුදුරදුන් ගත කළේ වෛශාලියේය. දිනක් කූටාගාර ශාලාවේ බුදුන් සමාධි සුවයෙන් වැඩ සිටින අවස්ථාවක අනෙක් භික්ෂු ශාලාවක භික්ෂූන් කිහිප දෙනෙක් සිය දිවි නසා ගනු ලැබිණි.

බුදුරදුන්ට මේ පණිවිඩය ලැබුණු පසුව ඊට හේතුව කුමක් ද කියා උන් වහන්සේ විමසා සිටියෝය.

''අනිත්‍ය ගැන භාවනා කරන විට ශරීරය ගැන මහා අප්‍රසාදයක් ඇති වූ නිසා ඒ අය ජීවත් වීමට කැමැත්තක් දක් වූයේ නැහැයි,'' යනු ලැබුණ පිළිතුරයි.

මේ පිළිබඳව ඇසූ බුදුරජාණන් වහන්සේ පුදුමයට පත් වූයේ නැත. නමුත් ඉක්මනට අනෙක් භික්ෂූන් තමන් ඉදිරියට කැඳෙව්වෝය.

''භික්ෂුවරුනි, මා ශරීරයේ අනිත්‍ය ගැන කියා දෙන්නේ එහි නියම ස්වභාවය ගැන දැන ගන්නයි. දිවි නසා ගැනීමට මෙහි කිසිම හේතුවක් නැහැ. අනිත්‍ය ගැන සිතන විට මායා, මෝහ, බන්ධනයෙන් මිදීමත් පහසුයි. ජීවිත හානි කර ගැනීමෙන් සසර දික්වීමක් මිස කෙටිවීමක් වන්නේ නැහැ. ශරීරය ගැන ගැඹුරට දැනගත් විටයි මේ ගැන හොඳ අවබෝධයක් දැනෙන්නේ. මියගිය

මිත්‍ර භික්ෂූන් මේ ගැන මගෙන් විමසුවෙත් නැහැ. පලායන මාර්ගයට පිවිසුණා. මේ සිද්ධියෙන් ඒ අය ප්‍රාණ ගාථ අකුසලය කර ගත්තා. පවුකාර පිරිසක් බවට පත් වුණා, ''යැයි බුදුන් වහන්සේ ඒ අරඹයා පැවසූහ.

''භික්ෂුවරුනි, මුක්ත ප්‍රාණී ශරීරය කිසිම බන්ධනයකින් බැඳ ගන්නේ නැහැ. ශරීරය තමන්ගේ කියා බැඳ ගෙන තබා ගැනීමට ශරීරයට තෘෂ්ණා කිරීම යන දෙකම නිර්වාණ මාර්ගයට අහිත කරයි. මුක්තිය පතන අය මේ දෙකින්ම මිදීමට උත්සාහ දරනවා. මේ හර්ෂ අවස්ථාව මැනීම පහසු නැහැ. මා ඔබට විස්තර කරන ආශ්වාස ප්‍රශ්වාස ක්‍රියාව හොඳට පුහුණු කරන්න. ඒ ක්‍රමයෙන් ඔබට මේ ගැන හොඳ අවබෝධයක් ලැබේවි,'' යනුවෙන් ද ප්‍රකාශ කර සිටියෝය.

මින් පසුව බුදුරජානන් වහන්සේ සැවැත් නුවර ජේතවනාරාමයට ආපසු වැඩ කළෝය. මේ ගමනේ දී අරිට්ඨ නැමති භික්ෂුව බුදුරදුන්ගෙන් මෝහයෙන් මිදෙන්නේ කෙසේ ද යනුවෙන් ඇසුවේය. අරිට්ඨ භික්ෂුවත් ධර්මය ගැන සිහි කල්පනාව නැතිව ධර්මය ඇසූ තැනැත්තෙකි. ජේතවනයේ භික්ෂූන් තමන්ගේ ඉදිරිපිට වාඩි කරගෙන බුදුරදුන් ගැන මෙසේ විස්තර කළෝය.

''ධර්මය හරි හැටි ශ්‍රවණය කළේ නැත්නම් ඒ ගැන හොඳ අවබෝධයක් නැති වුණොත් ඉන් අයහපතක් මිස යහපතක් නො වේ. ධර්මය ශ්‍රවණය කරන විට බුද්ධියෙන් යුක්ත ඇසිය යුතුයි. භාවනාවේ දීත් ඒ ආකාරයමයි. භාවනාවත් හරි හැටි තේරුම් නොගෙන කළහොත් ඉන් ඇති වන්නෙත් මහා විපතක්.

''කාට හරි සර්පයෙකුව අල්ලා ගන්න ඕනෑ නම්, ඉස්සර වෙලාම කරුවක් තියලා ලීයකින් සර්පයාගේ හිස තද කරන්න ඕනෑ. ඊට පස්සේ වලිගයෙන් අල්ලන්න ඕනෑ. එහෙම නොකර සර්පයාව අල්ලන්න ගියොහොත් සර්පයා අනිවාර්යයෙන්ම ඌ අල්ලන්න ගිය පුද්ගලයාට දෂ්ඨ කරනවා. සර්පයෙකුව අල්ලන්න ඔබ ඔබේ බුද්ධිය කොහොම ද පාවිච්චි කරන්නේ? ඒ වාගේම ධර්මය හරි හැටි තේරුම් ගත්තේ නැතිව පිළිපදින්න ගියොහොත් ඉන් සිද්ධ වෙන්නේත් වැරදි විපාකයකි.

''භික්ෂුවරුනි, මේ ඉගැන්වීමේ ප්‍රධානම කරුණ නම් ඇති දෙය ඇති හැටියට පෙන්වා දීමයි. ඇඟිල්ලක් දිගු කර සඳ පෙන්වන විට සිතන්න එපා ඇඟිල්ල සඳයි කියා. යම් කිසි ආකාරයකින් නුඹ සිතුවහොත් ඇඟිල්ල සඳ කියා කවදාවත්ම සඳ දකින්න ලැබෙන්නේ නැහැ.

''ශික්ෂාව කියන්නේ කෙනෙකු එක් ඉවුරකින් තව ඉවුරකට රැගෙන යන ඔරුවක් පමණයි. තමන්ගේ සම්පත්තියක් කියා ඔරුව කරේ තබාගෙන යන්න ඕනෑ නැහැ. මේ ආකාරයට දේශනාවලම බැඳිලා ඉන්න එපා. ඒ ඔරුව නදියෙන් එගොඩට ගිය විට අත් හැර දාන්න ඕනෑ.

''භික්ෂුවරුනි, මා ඔබ සැමට ආර්ය සත්‍ය හතරක් දේශනා කළා මතක ද? මේ කරුණු හතර ගැනත් හොඳට හිත යොදන්න. මේ සියල්ලම ශාන්ත නිවන අවබෝධ කර ගැනීමට පමණක් බව සිතන්න. මේ දේශනාවල බැමිවලට බැඳෙන්න එපා,'' යැයි ද පැවසුවෝය.

භික්ෂුණී නිවාසයේ පන්සියක් භික්ෂුණීන් වාසය කළෝය. ඒ අය වරින්වර ජේතවනාරාමයට පැමිණ බුදුරදුන්ට හෝ වෙනත් ජ්‍යෙෂ්ඨ භික්ෂූන් වහන්සේ නමකට හෝ ධර්ම දේශානා කිරීමට ආරාධනය කරන සිරිතක් පැවතිණි. බුදුරදුන් මීට පෙර ජ්‍යෙෂ්ඨ භික්ෂූන් වහන්සේ නමක් යවා ඒ අයට ධර්ම දේශනා කරවන්න කටයුතු යොදා තිබිණි. දිනක් ජ්‍යෙෂ්ඨ භික්ෂූන් වහන්සේ නමක් වූ මාණ්ඩව ධර්ම දේශනාව සඳහා පිටත් කර යැවුවේය. භික්ෂු මාණ්ඩව භාවනාවෙන් හොඳට සිත දියුණු කරගෙන සිටිය නමුත් ධර්ම දේශනා කරන ක්‍රමයට දක්ෂයෙක් නොවුයේය.

දිනක් පිණ්ඩපාතය කර වනයේ ගසක් යට වළඳා ගෝතමී භික්ෂුණිය ආරාමයට පැමිණියෝය. එවිට බුදුන්වහන්සේ පැමිණ සිටියෝය. භික්ෂුනී ගෞතමී උන් වහන්සේ ඉතාම ගෞරවයෙන් පිළිගෙන ධර්ම දේශනා කරීම සඳහා ආසනයේ වාඩි කරවන ලදි.

උන් වහන්සේ තම ධර්ම දේශනා ආසනයේ වැඩ සිට කවි කිහිපයක් කීවෝය. ''නිරතුර ශාන්තියේ නිසලව සිටීම, ධර්මය හොඳින් අවබෝධ කර ගැනීම, කෲරකම සහ හිංසාව නැතිව මූල ධාරාව මාර්ගයෙන් අසීමිත සතුට සහ ශාන්තිය ලැබේ. සම්පූර්ණ ජීවිතය ගැන අවදිවීමෙන් ඇත්තෙන් ම ශාන්තිය ඇති වේ. සියලුම කර්මවලින් මිදීමම අන්තිම සතුටයි.''

ධර්ම දේශනාව අවසානයේ ධර්මාසනයේම වාඩි වී, භාවනා කරමින්ම උන් වහන්සේ සමාධියකට සම වැදුණේය.

කෙසේ වුවත්, තරුණ භික්ෂුණීන්, බුදු රජානන් වහන්සේගේ එම දේශනාව පිළිබඳව සතුටට පත්වූයේ නැත. ඒ නිසා, ''ඔබ වහන්සේගේ ධර්ම දේශනාවේ තවත් යමක් දේශනා කිරීමට ඉතිරිව ඇද්ද?'' යනුවෙන් බුදුන් වහන්සේගෙන් අසා සිටීමට ගෝතමී භික්ෂුණියට සිදු විය. මෙම ප්‍රශ්නයට පිළිතුරු වශයෙන් බුදුන්

වහන්සේ තම දේශනාවේ දී කිවූ කවි පන්තියම නැවත කියා, ධර්මාසනයෙන් නැගිට පිටත්ව ගියෝය.

දින කිහිපයකට පසුව භික්ෂු මාණ්ඩ, භික්ෂුණීන් උදෙසා කළ ධර්ම දේශනාවක් පිළිබඳව බුදුන් වහන්සේට දැන ගන්නට ලැබිණි. ඒ කාරණය දැනගත් බුදුන් වහන්සේ ධර්ම දේශනා සඳහා මාණ්ඩ භික්ෂුන් වහන්සේ වැනි භික්ෂූන් වහන්සේලා යොදවන ලෙස නියම කර සිටියෝය. අනෙක් භික්ෂුහු මාණ්ඩ භික්ෂුව හොඳ දේශකයන් වහන්සේ කෙනෙකු නොවන බව ප්‍රකාශ කර සිටියහ. ඒ අසා බුදුන් වහන්සේ ''වචන රාශියක් කතා කරනවට වඩා, හොඳින් භාවනා වඩන භික්ෂුවකගේ දේශනාව වටිනවා,'' යැයි ප්‍රකාශ කර සිටියෝය.

ඒ අතර කාලයේ දිනක් පිණ්ඩපාතයේ වැඩීමට සූදානම් වූ බුදුරජානන් වහන්සේට, ආනන්ද හිමියන් භික්ෂුන් අතර නොසිටි බව දැක ගන්නට ලැබිණි. රාහුල හිමියන්ගෙන් විමසූ විට, තමන් වහන්සේත් ආනන්ද හිමියන් නොදුටු බව කියා සිටියෝය. මේ අවස්ථාවේ එක් හිමි නමක්, ඇසතු ගස ඇති ගමේ ආනන්ද හිමියන් පිණ්ඩපාතයේ වඩින බව තමන් වහන්සේ දුටුවේ යැයි කියා සිටියෝය.

මෙය ඇසූ බුදුරජානන් වහන්සේ ඇසතු ගමට ගොස් ආනන්ද හිමියන් කැඳවාගෙන එන ලෙස රාහුල හිමියන්ට දැන්වීය. බුදුන් වහන්සේ විසින් රාහුල හිමියන් අත එවූ පණිවුඩය අනුව, ආනන්ද හිමියෝ බුදුන් වහන්සේ හමුවට ගියහ.

ආනන්ද හිමියන් සමඟ කාන්තාවෝ දෙදෙනෙකු ද පැමිණ සිටියහ. ඒ මව හා දියණිය බව පැහැදිලිව පෙනෙන්නට තිබිණි.

කුමන කරුණක් නිසා, තමන් වහන්සේ ඇසතු ගමේ ප්‍රමාද වූයේ ද යන කාරණය ආනන්ද හිමියෝ බුදුරජානන් වහන්සේට විස්තර කර දුන්හ. ''දින කිහිපයකට පෙර මේ ගමේ පිණ්ඩපාතය කරමින් සිටියා. ඒ අතර වතුර පිපාසයක් ආවා. ඇසතු ගමේ හොඳ ළිඳක් තිබුණා. මා ඒ ළිඳ වෙත යන විට, එක්තරා ගැහැනු ළමයෙක් ළිඳෙන් වතුර අදිමිනුයි සිටියේ. මං ඇයගෙන් ඉල්ලා හිටියා මට බීමට වතුර ලබා දෙන ලෙස. ඇය කීවා, මා අඩු කුලේ අයෙක්; ඒ නිසා කුලවත් ඔබ වහන්සේට වතුර ඇද දී, ඔබ වහන්සේ අපවිත්‍ර කළ නොහැකියි කියා. මේ අවස්ථාවේ දී මං කියා හිටියා, මට ජාති, කුල, ගෝත්‍ර ගැන තකන අයෙක් නොවෙයි; මට අවශ්‍ය පිපාසය සංසිඳවා ගැනීම සඳහා ජලයි, කියලා. ඒ නිසා මට, පානය සඳහා ජලය ස්වල්පයක් ලබා දෙන්න කියා මං

ඇයට කියා සිටියා. ඔබ කිසිදෙයකට බය වෙන්න එපා. ඔබගෙන් වතුර ස්වල්පයක් බී පමණින් මා අපවිත්‍ර නොවන බවත් මා ඇයට කියා සිටියා, යැයි "ආනන්ද හිමියෝ කියා සිටියෝය.

ඒ සුන්දර කාන්තාව ආන්නද හිමියන්ට බොන්න වතුර ලබා දුන්නාය. මේ ආකාරයෙන් මෘදු වචන ලස්සන වචන කතා කරන ආනන්ද හිමියන් පිළිබඳව ඒ කාන්තාව තුළ ඇති වූයේ ප්‍රේමණීය හැඟීමකි. එදා සිට දින ගණනාවක් ඇයට රාත්‍රියෙම නින්ද ගියේ නැත. නිදි නැති රාත්‍රිය පුරාම ඇය ආනන්ද හිමියන් සිහි කරමින් ගත කළාය.

පසුදින සිට දිනපතාම ළිඳ කරා ගිය ඇය ළිඳ ළඟ ආනන්ද හිමියන් පැමිණෙන තුරු බලා සිටියාය. අවසානයේ ඇය ආන්නද හාමුදුරුවන් වහන්සේට දානයක් පිරිනැමීමට, තම මෑණියන් කැමති කරවා ගත්තාය.

ආන්නද හාමුදුරුවන් වහන්සේ දෙවරක්ම දානය සඳහා වූ ඇයගේ ආරාධනාව පිළිගත්තේය. පසුව ඇය තමාට ප්‍රේම කරන බව ආන්න්ද හාමුදුරුවන්ට පෙනී ගියේය. ඒ නිසා ඉන් පසු දානය සඳහා කෙරුණු ආරාධනාව උන් වහන්සේ වෙතින් ප්‍රතික්ෂේප විය.

ඒ යුවතිය ආනන්ද හාමුදුරුවන් වහන්සේ පිළිබඳ වූ ප්‍රේමයෙන් උමතු වී ගියාය. ආන්නද ස්වාමීන් වහන්සේ නොදැක ගත කළ කාලය තුළ ඇය ආහාර නොගත්තාය. ඒ හෙයින් ඇය වැහැරී ගියාය. ශරීරය පාණ්ඩ පැහැයට පත්විය. අවසානයේ ඇය ආනන්ද හිමියන් සිවුරු හරවා තමාට විවාහ කර දෙන මෙන් ඇය තම මවගෙන් ඉල්ලා සිටියාය. ඇයගේ මව ඇයට තරවටු කළාය. එය කිසි දවසක කළ හැකි දෙයක් නොවන බව ඇයගේ මව කියා සිටියාය. එසේ වුවත් තම දියණියගේ අභිමතාර්ථය ඉෂ්ඨ කර දීමට හැකි සෑම කටයුත්තක්ම කිරීමට ඇයගේ මව ඉදිරිපත් වූවාය. ආනන්ද හිමියන් සමඟ විවාහ වීමට අවස්ථාවක් නොලද හොත් තමා දිවිනසා ගන්නා බව ඒ යුවතිය කියා සිටියාය. එම යුවතියගේ මව, මන්ත්‍රගුරුකම් කරන මාතංග කුලයට අයත් කාන්තාවක වූවාය. ඒ නිසා, ආනන්ද හිමියන් තම දියණියට විවාහ කර දීම පිණිස අවශ්‍ය මන්ත්‍රගුරුකම් කිරීම ආරම්භ කළේය.

එක් දිනක ප්‍රකෘති, එනම්, එම යුවතිය, මහමඟ රැක සිට, ආනන්ද හිමියන් හමුවී, ඇයගේ ගෙදර දනට වටින ලෙස ඉල්ලා සිටියාය. මේ අවස්ථාවෙන් කෙසේ හෝ, ආනන්ද හිමියන් සිවුරු හරවා තමන් සමඟ විවාහ වීමට පොළඹවා ගත යුතු යැයි අදහස්

කර ගෙන සිටියාය. මේ පිළිබඳ ආනන්ද හිමියන් තුළ ද සැකයක් ඇතිවී තිබිණි. එසේ වුවත් මේ මැණියන් හා දියණිය අතර ඇති මෙම බලාපොරොත්තුව ධර්ම දේශනාවක් මඟින් ඉවත් හළ යුතු යැයි ආනන්ද හාමුදුරුවන් වහන්සේ කල්පනා කළෝය.

එදින ආනන්ද ස්වාමීන් වහන්සේ, ප්‍රකෘතිගේ නිවසට ගිය විට, උන් වහන්සේට පානයක් ලබා දුන්නේය. ඒ පානය ලබා ගත් පසුව, තම සිහියට විකෘති වන බවත් උන් වහන්සේට දැනී ගියේය. මේ කාරණය අවබෝධ කර ගත් පසුව ආනන්ද හිමියන් ආශ්වාස ප්‍රාශ්වාස භාවනාව ආරම්භ කළහ. ආනන්ද හිමියන් සොයා ගිය භික්ෂුව ඇසතු ගම්මානය කරා යන විට, ආනන්ද හාමුදුරුවන් වහන්සේ ප්‍රකෘතිගේ නිවසේ කුටියක පද්මාසනයෙන් වැඩ සිටින බව දුටුවේය.

තමන් වහන්සේ හමුවට ආ ප්‍රකෘති නම් යුවතියගෙන්, ''ඔබ ආනන්ද හිමියන්ට බෙහෙවින් ආදරය කරනවා නොවේද?'' යනුවෙන් බුදුරජානන් වහන්සේ ප්‍රශ්න කළෝය.

''මම එක හිතින්ම ආනන්දට ආදරය කරනවා,'' යැයි ඊට පිළිතුරු වශයෙන් ප්‍රකෘති කීවාය.

''නුඹ ආදරය කරන්නේ ආනන්දගේ ශරීරයේ කුමන කොටසට ද? ඇසට, නාසයට, දොතොලට, කණට, අතපය, කතාකරන වචන ආදියෙන් නුඹ කැමති මොන දේට ද?'' යනුවෙන් බුදුන් වහන්සේ දෙවනුව ඇසූහ.

''ගුරු දේවයනි, මා ආනන්දගේ සම්පූර්ණ ශරීරයටම ආදරය කරනවා,'' යැයි ප්‍රකාති පැවසූවාය.

''මේ සියල්ලටම අමතරව, නුඹ නොදන්න තව ගුණ රාශියක් ආනන්ද තුළ තිබෙනවා,'' යැයි බුදුරජානන් වහන්සේ කීවෝය.

''ඒ මොන ගුණ ද, ගුරු දේවයනි, මා ඒවා ගැන දන්නේ නෑ,'' ප්‍රකෘති කීවාය.

''ඉස්සර වෙලාම ආනන්දගේ ප්‍රේමයෙන් බර හදවත නුඹ දන්නවා ද? ආනන්ද ප්‍රේම කරන්නේ කාට ද කියලා?'' බුදුරජානන් වහන්සේ ඇසුවෝය.

''නැහැ, ගුරු දේවයනි, ඒත් මං හොඳටම දන්නවා ආනන්ද මට ප්‍රේම නොකරන බව!'' ප්‍රකෘතිගේ පිළිතුර විය.

''එහෙම හිතන්න එපා, ප්‍රකෘති. ආනන්ද නුඹටත් ප්‍රේම කරනවා. නමුත් ඒ ප්‍රේමය නුඹ හිතන ආකාරයේ ප්‍රේමයක් නොවෙයි. ආනන්ද නිදහස, සතුට, වැනි දේවලටයි ප්‍රේම

කරන්නේ,'' බුදුරදුන් පැවසූවෝය. මේ කතාබහ අසා සිටි ආනන්ද හිමියෝ සිනා පහළ කළහ.

''ඒ විතරක් නොවෙයි, මේ ලෝකයේ එක් අයෙකුට පමණක් නොවෙයි, ලෝකයේ ජීවත් වන සෑම ප්‍රාණියෙකුටම ආනන්ද ප්‍රේම කරන බව මා ඉතා හොඳින් දන්නවා. ආනන්ද තමා ආසුරු කරන සෑම සියලු දෙනාම විමුක්ති මාර්ගයේ මඟියෙකු කරන්නට, මහන්සි ගත්තා. ඔහු සැමටම ආදරය කරන කෙනෙක්. ආනන්ද කැමති වෙන්නේ ඒ සියලු දෙනා සියලු ප්‍රාණීන් සතුටේ, නිදහසේ ඉන්නවා දකින්න. නුඹ ආනන්දගේ නියම ප්‍රේමය ගැන දැන ගතහොත් මීට වඩා සතුටට පත්වෙන බව මම දන්නවා. එහෙම වුනෙත් නුඹට දුක හෝ නිරාශා හෝ යන දෙකම අත් වන්නේ නැහැ. නුඹ ආනන්දට පමණයි ආදරය කරන්නේ. ඒ නුඹට ආනන්ද ඕනෑ කරන හින්දයි. එයින් නුඹට කලකිරීම, දුක පස්සේ කාලෙක දී ඇති වෙනවා. ඒ මිස වෙන කිසිදෙයක් ලැබෙන්නේ නෑ,'' බුදුන් වහන්සේ තවදුරටත් පැවසුවෝය.

මෙම ප්‍රකාශයට සවන් දී ගෙන සිටි ප්‍රකෘති, ''ගුරු දේවයාණෙනි, ආනන්ද, දක්වන ආකාරයේ ප්‍රේමයක් දක්වන්නේ කෙසේ ද?'' යි තමන්ට උගන්වන ලෙස බුදුන් වහන්සේගෙන් ඉල්ලා සිටියාය.

''ඔබ ප්‍රේම කරන්න. එසේ කළ යුත්තේ ආනන්දගේ ප්‍රේමයත් ආරක්ෂා වන ආකාරයටයි. භික්ෂු ආනන්ද අලුත් සුළං රැල්ලක් වාගෙයි. නුඹ නුඹගේ බන්ධනයෙන් ඔහු බඳවා ගතහොත් ඒ අලුත් සුළං රැල්ල වියැකී යාවි. ඒ සුළඟින් ඉන් පසුව ඔබටත් වැඩක් නැහැ; අන් කිසිවෙකුටත් වැඩක් නැති වී යාවි. ආනන්දට ආදරය කරනවානම්, ප්‍රේම කරනවානම්, අලුත් සුළඟට ප්‍රේම කරනවා නම්, අලුත් සුළඟට ප්‍රේම කර ආකාරයට ඒක කරන්න ඕනෑ. ඒ සුළඟේ නිරන්තරයෙන්ම සතුට, සැනසීම ගතට මෙන්ම සිතටත් ලැබෙන ආකාරයට ප්‍රේම කළ යුතුයි. ඒ මඟින් ඔබගේ පීඩාව වගේම අන් අයගේ පීඩාවත් දුරු වෙනවා,'' යැයි ද බුදුන් වහන්සේ පැවසූවෝය.

''ඒ විධියට ප්‍රේම කරන්න මටත් උගන්වන්න, ගුරු දේවයාණෙනි,'' යැයි ප්‍රකෘති නැවතත් කීවාය.

''ඔබත් ආනන්ද මෙන්ම ඒ මාර්ගයේම යන්න. එයින් ඔබට සතුට හා සැනසීම එක විට ලැබෙන බව මං හොඳින්ම දන්නවා. නුඹට පැවිදි බව ලබා දෙන්න මට පුළුවං,''

''ගුරුතුමනි, මං අඩු කුලයේ කෙනෙක්. මා පැවිදි වන්නේ කෙසේ ද?''

''මං අවබෝධ කර ගත් ධර්මයේ ජාති කුල ආදී භේදයක් නැහැ. විවිධ අය අඩු යැයි කියා ගන්නා කුලවලින් ඇවිත් පැවිදි බව ලබාගෙන තිබෙනවා. සුනීත පිළිබඳව ඔබ අසා ඇති. පසේනදි කොසොල් රජතුමා සුනීතට කෙතරම් ආදරය කරනවා ද යන්න ගැන සොයා බලන්න. නුඹ කැමති නම් නුඹට පැවිදි ජීවිතයක් ලබා ගන්න පුළුවන්. අඩු කුලයකින් එන කෙනෙක් හැටියට පැවිදි ජීවිතයට පත්වන පළමු තැනැත්තී ඔබ වෙනවා, නුඹ කැමති නම් මට ඛේමා භික්ෂුණියට කියන්නම් ඔබ පැවිදි කරන්න කියලා,'' බුදුන් වහන්සේ ප්‍රකෘති අමතා කීවෝය.

සතුට නිම් හිම් නැතිව සිටි ප්‍රකෘති බුදුරදුන් ඉදිරිපිට දණ නමා වැඳ නමස්කාර කර පැවිදි වීමට කැමති බව දන්වා සිටියාය.

බුදුරදුන් භික්ෂුණී ඛේමාට කතා කර ප්‍රකෘති බාර දුන්නෝය. භික්ඛුණී ඛේමාගේ පිටුපසින් සුන්දර යුවතිය පිටත්ව ගියාය. ඉන් පසුව බුදුරදුන් ආනන්ද දෙස බලා දේශනාව ආරම්භ කළෝය.

''භික්ෂුවරුනි, ආනන්දගේ පොරොන්දුව තවමත් එහෙම යි. නමුත් මා සියලුම දෙනාට කියන්න කැමතියි. බ්‍රහ්ම චරියාවේ හැසිරීමේ දී මීට වඩා කල්පනාකාරී විය යුතුයි. සිත එකඟ නොකර ගතහොත් මහා ප්‍රශ්න ගොඩකට මුහුණ පාන්න සිදුවෙනවා. ජීවිතයේ සෑම මොහොතකම හොඳ සිහියෙන් සිටීම ඉතාම වැදගත්. එය ඕනෑම ප්‍රශ්නයක් විසඳා ගැනීමට උපකාරී වෙනවා. ධ්‍යාන, සාධන, ප්‍රඥා මේ සියල්ල එකිනෙකට එකක් සම්බන්ධ වෙලයි තිබෙන්නේ. යම්කිසි ආකාරයකින් ඔබගේ වයසට වැඩි වයසක කාන්තාවක ඔබ ළඟට ආවොත් ඇය ඔබගේ වැඩිමහල් සහෝදරිය ලෙස සිතන්න පුරුදු වෙන්න. අඩු වයසේ කෙනෙක් ආවොත් නංගී නැත්නම් දුව කියලා හිතන්න. කිසිම කාන්තාවකගේ ශරීරය දිහා බලා එය තමන්ගේ භාවනාවට කරදරයක් කරගන්න එපා.

''කාන්තාවන්ගෙන් ඈත් වීමක් හෝ ඒ අය ඈත් කිරීමක් හෝ ගැන මා කියන්නේ නැහැ. නමුත් භාවනාවෙන් යම් ප්‍රයෝජනයක් ඉක්මනට ගන්න ඕනෑ නම් ඒ අයගේ ඇසුරින් කල්පනාකාරී වෙන්න. කතා කරන්න යම් දෙයක් ඇත්නම් ධර්මය සම්බන්ධ දේ ගැන පමණක් කතා කරන්න.''

මෙතරම් විවෘත අදහස් කිහිපයක් තමන්ගේ ඉදිරියේ තැබීම ගැන සියලුම භික්ෂූහු සතුටට පත් වූහ.

## පනස් අට වන පරිච්ඡේදය

# වටිනාකමින් බර අතලොස්සක් පමණ මැටි

දවසක් බුදුරදුන් දුප්පත්ම ගමක පිණ්ඩපාතයේ වැඩියෝය. පුංචි ළමයින් කිහිප දෙනෙක් දූවිලි පිරුණු මහ පාරක මැටි ගාගෙන සෙල්ලම් කරනවා උන් වහන්සේ දුටුවෝය. මේ පුංචි ළමයින් ටික වැලිවලින් සාදමින් සිටියේ නගරයකි. නගරයට අවශ්‍ය ප්‍රධාන තාප්පය, පුංචි ගෙවල්, ගබඩා ගෙවල්. නගරය අසලින් ගලන පුංචි නදියක් ආදී වශයෙන් අංග සම්පූර්ණ නගරයක් පුංචි අය වැලි සාදා තිබිණි.

බුදුරදුන් හා භික්ෂු මහා සංඝයා වඩින බව දැක පුංචි ළමයි ''බුදු හාමුදුරුවෝ, භික්ෂු මහා සංඝයා සමඟ අපේ නගරයට වඩිනවා. උන් වහන්සේට යම් කිසි තෑග්ගක් දිය යුතුයි නේද,'' යැයි කතිකා කර ගත්හ.

''අදහස නම් ඉතාම අගෙයි. නමුත් දෙන්නේ මොනවා ද කියා එක් දරුවෙක් ඇසුවේය.

ඒ ගැන හිතන්න දෙයක් නැහැ, අපේ ගබඩාවල හාල් පිරිලයි තියෙන්නේ. හාල් ටිකක් දෙමු,'' තව ළමයෙක් පැවසීය.

සියලුම ළමයි ඉතාම සතුටින් අත් පොළසන් දුන්නෝය. මේ අය තම ගබඩා ගෙවල්වලින් මැටි ටිකටික අරගෙන කොළ වල තබා බුදුරදුන් ඉදිරියට ගොස් දණ නමස්කාර කර ඔවුන් ගෙන ආ මැටි බුදුන් වහන්සේට පූජා කළහ. ''අපි නගර වාසීන්, අපේ ගබඩාවලින් ඔබ වහන්සේට හාල් පූජා කරනවා. කරුණාකරලා ඒ හාල් පිළිගන්න,'' සියලු දෙනාම ඉල්ලා සිටියෝය.

බුදුරදුන් පුංචි දරුවන්ගේ හිසට අත තබා ''මේ තරම් වටිනා හාල් තොගයක් මට පූජා කිරීම ගැන ඔබ සැමට ම ස්තුතිවන්ත වෙනවා,'' යනුවෙන් පැවසුවෝය.

''මේ වටිනා උපහාරය පිළිගන්න. විහාරයට අරන් ගිහිල්ලා වතුර කලවම් කර අනා මගේ කුටියේ බිත්තියට ගසන්න,'' යැයි බුදුන් වහන්සේ ආනන්ද හිමියන් අමතා කීවෝය.

ආනන්ද හාමුදුරුවෝ මැටි ටික අතට ගත්තෝය. ඒ අසල කන්ද ළඟ ඇති නුග ගහ යට වාඩි වන ලෙස ඒ පුංචි ළමයින් බුදුරදුන්ට ආරාධනය කර සිටියේය. ඒ අනුව ආනන්ද සහ අනිත් භික්ෂු පිරිස ගොස් නුග ගස යට වාඩි වූහ.

බුදුහාමුදුරුවෝ එතනට එකතු වූ භික්ෂූන්ටත් පුංචි අයටත් කතාවක් කියා දුන්නේය.

''බොහෝම ඉස්සර කාලේ එක් රජ කුමාරයෙක් සිටියා. ඔහු ඉතාම කරුණාවන්ත කෙනෙක්. දුප්පත් අයට ඉතාම හිතවත්ව උපකාර කළා. තමන් ළඟ ඇති වස්තුව පවා අවශ්‍ය අවස්ථාවල දී දුප්පත් අයට දුන්නා. රජ කුමාරයාගේ බිසව වූ භද්‍රාත් ඉතා ම කරුණාවන්ත කෙනෙක් හැටියට ප්‍රසිද්ධව සිටියා. රජතුමා කාට හරි උපකාරයක් කරනවා නම් බිසව ඒ ගැන දැනගතහොත් ඉතාම සතුටට පත් වීම සිරිතක්ව තිබුණා. තමන් සතු කිසිම දෙයක් දුන්නාට ඇය සතුටට පත් වූවා මිස කිසි දාක දුක් වූයේ නැහැ. මේ දෙදෙනාට දරුවන් දෙදෙනෙක් සිටියා. දුවගේ නම ක්‍රිෂ්ණ ජිනා, පුතා ජාලිය.

වරක් රටේ විශාල නියඟයක් ආවා. මේ අවස්ථාවේ රාජ්‍ය භාණ්ඩාගාරයෙන් මුදල් සහ ගබඩාවලින් ආහාර දීමට කුමාරයා අවසර ගත්තා. ජනතාවගේ අවශ්‍යතාව ඉතා විශාල වුණා. අන්තිමේ දී රාජ්‍ය ගබඩාව හිස් වුණා. මින් මන්ත්‍රී පිරිස බය වුණා. මන්ත්‍රී වරුන් සාකච්ඡා කළා රාජ කුමාරයාට මින් පස්සේ භාණ්ඩාගාරයට

අත නොතියන්න ක්‍රමයක් සොයන්න ඕනෑ කියලා. මන්ත්‍රීවරු කිවුවා රජුගේ මේ දන් දීමේ ක්‍රමය නිසා රටම විනාශ වෙලා යාවි කියලා. රාජකුමාරයා රාජකීය ඇතකුවත් දන් දුන්නා. මේ ගැන රජතුමාත් තරමක් සිතන්න ගත්තා. අන්තිමට රජතුමා ආඥාවක් නිකුත් කළා රජ කුමාරයා තනිකර තබන්න ඕනෑ කියලා. ජීවිතය කියන්නේ කුමක් ද කියලා තේරුම් ගන්න එදාට පුළුවන් වේවි කියලා. රාජ ආඥාවෙන් පස්සේ රාජ කුමාරයා ඔහුග් බිසව දරුවන් දෙදෙනා යන හතර දෙනාම රටින් පිටුවහල් කළා.

''රාජ්‍යයෙන් පිට වී යන විට පළමුවෙන්ම කුමාරයාට මුණගැසුනේ හිඟන්නෙක්. රාජ කුමාරයා හිඟන්නාට තම උඩුකයේ කමිසයට උඩින් අඳින එක් කොටසක් දුන්නා. ඉදිරියට යන විට තවතවත් දුප්පතුන් දකින්න ලැබුණා. බිසවගේ පුංචි දරුවන් දෙදෙනාට තිබුණු උඩුකය ඇඳුම් දුප්පතුනට දුන්නා. ක්‍රමයෙන් තමතමන් පැළඳ සිටි රත්‍රන් ආභරණ ආදිය ද දුප්පත් අයට දෙමින් ගියා. නතර වීම සඳහා තෝරාගත් පර්වතයට ළඟා වන විට මේ අය ළඟ කිසිවක් ම ඉතිරිව තිබුණේ නැහැ. අන්තිමට අශ්ව කරත්තය සහ අශ්වයත් දුප්පත් අයට දුන්නා. කුමාරයා කුමාරි දෑතට ගෙන වඩාගෙන පර්වතයට ළඟා වුණා. සිදු වූ සිද්ධිය ගැන රාජ කුමාරයා කිසිම වේදනාවකට පත් වූ බවක් දැන්වූයේ නැහැ. හදවත ශාන්තව තිබුණා.

''මාළිගයේ සිට පර්වතය දක්වා අශ්ව කරත්තයෙන් ගියත් කඳු පාමුල සිට පයින් ගමන් කළා. පයින් බොහෝ දුර යන්න තිබූ නිසා ගමන අවසන් වන විට දෙන්නාගේ ම දෙපාවලින් ලේ ගලන්නට ගත්තා.

''කන්දට නැඟීමට පෙර කඳු පාමුල එක් සාධුවරයෙකුගේ කුටියක් දුටුවා. මේ සිද්ධිය දැක සාදුවරයා දෙදෙනාගේ දෙපාවලට බෙහෙත් දමා විවේක ගන්න කොළ අතු අතුරලා දුන්නා. ඒ පර්වතය සහිත වනාන්තරයේ අවශ්‍ය තරම් කෑමට කොළ, පොතු, ගෙඩි, මුල්, අල ආදිය තිබුණා. සාදුවරයා තම ජීවිතය ගත කළේ මේ කැලයේ තිබුණු දේ විය. පුංචි රජ කුමාරයත් කුමාරියත් කැලයේ ඇති කෑමට ගත හැකි ගෙඩි, පොතු, කොළ, අල ආදිය ගෙනැවිත් දෙමාපියන් සමඟ ආහාරයට ගැනීමට පුරුදු වුණා. ගලන ගඟෙන් රෙදි සෝදන්න පුරුදු විය. කැලේ ඇති කටු කඩාගෙන කොළවල අකුරුත් ලිවීමට අම්මාගෙන් තාත්තාගෙන් ඉගෙන ගත්තා.

''මුළු පවුලේම ජීවත් වීම ඉතාම කටුක එකක් යැයි කීම අමුතුවෙන් කිවයුතු නැහැ. නමුත් ඒ ජීවන රටාවට ඒ අය පුරුදු වුණා. ඉන් ඒ අය සතුටට පත් වී සිටියා. අවුරුදු තුනක් මේ ආකාරයට ගෙවිණි. දවසක් රාජ කුමාරයත් බිසවත් කෑමට යමක් සෙවීමට කැලයට ගියා. මේ අතර සොරුන් කණ්ඩායමක් පැමිණ පුංචි කුමාරයායි කුමාරියවයි පැහැර ගෙන ගියා.

''තමන් සිටින ස්ථානයට පැමිණ බැලූ විට දරුවන් දෙන්නා දකින්නට හිටියේ නැහැ. මුළු ගමේම ඇවිද සැමගෙන්ම විමසුවා. නමුත් කිසිම ආරංචියක් ලැබුණේ නැහැ. අන්තිමට හොඳටම මහන්සි වී තම කුටියට දරුවන් දෙන්නා ආපසු එනු ඇතැයි  සිතුවා. එහෙත් දරුවන් දෙන්නා වෙනුවට රජ මහළින් රාජ පුරුෂයෙක් පැමිණෙන බව දැක්කා. රාජ පුරුෂයා පැමිණ දරුවන් දෙන්නා මාළිගාවේ සිටින බව කීවේය. රාජ කුමාරයාත් බිසවත් හදවත් මහත් පිරි සතුටින් අඬන්න පටන් ගත්තා.

''රාජ කුමාරයා  දරුවෝ දෙන්නා මාළිගාවට ගියේ කොහොමද අසා සිටියා. රාජ පුරුෂයෝ මාළිගාවේ වැඩ කරන මෙහෙකාරියක් නගරයේ වෙළඳ පොළට ගිය අතර මේ දරුවන් දෙන්නා කෙනෙක් තව කෙනෙකුට විකුණන්න උත්සාහ ගන්නවා දැක ඇති බවත් කීවේය. මේ කාරණය රාජ මාළිගාවේ මන්ත්‍රී කෙනෙක් වන ඇයගේ ස්වාමි පුරුෂයාට ඇය දන්වා සිටියා. මන්ත්‍රීවරයා ඉක්මනට විකුනන්න හැදූ දරුවන් දෙන්නා බේරගෙන රජ මාළිගාවට ගෙන ගොස් රජතුමාට බාර දුන්නා. සීයා වන රජතුමා පුංචි දරුවන් දෙන්නා හඳුනා ගත්තා. දරුවන් දෙදෙනාගේම රෙදි ඉරිලා මුහුණේ දූවිලි තැවරි තිබිණි. පිය රජතුමා ඔබ දෙදෙනා නිතර සිහිපත් කරන බව කීවේය. රජතුමා ඇහැව්වා දරුවෝ දෙන්නා හමු වූයේ කොතැන දී ද? ඒ අයව විකුණන්න සූදානම් වුණේ කීයට ද යනුවෙන් රජතුමාට දැන ගැනීමට අවශ්‍ය වූ බවද රාජ පුරුෂයෝ රාජ කුමාරයා සමඟ කීහ.

''පුංචි කුමාරිය රන් කාසි දාහයි. එළ හරක් දාහයි. පුංචි කුමාරයා රන් මසු කාසි සියයි. හරක් සියයි කියලා මිල කළා, මන්ත්‍රීවරයා කීවා. රජතුමා පුදුමයට පත්විණි. කුමාරයාගේ ගණනට වඩා කුමාරිගේ ගණන වැඩි ඇයි එතුමා ඇසුවා. පිරිමි දරුවන්ට වඩා ඔබ ගැහැනු දරුවන්ට ආදරය කරන බව ඒ අය දැන සිටියා,

යැයි ඔහු කීවා. ඔබ කිසි දිනක කිසිම රාජ කුමාරියකට දඬුවමක් දීලා නැහැ. කවදාවත් රජ මැඳුරේ සේවිකාවකටවත් කිසිම හිංසාවක් දඬුවමක් කළේ නහැ. එකම පුතා රාජ්‍යයෙන් පිටමන් කළා. ඒ කැලේ සිංහයෝ කොටි ආදී මහා භයානක සත්තු ඉන්නවා. ඒ කැලේ මාලිගාවේ වගේ කන්න දෙයක් නැහැ. කැලේ කොළ ගස්වල පොතු, අල ආදිය තමයි කන්නේ කියලා. ඔබ දුවලට පමණයි සලකන්නේ. පුතාලට සලකන්නේ නැහැ කියලා කවුරුත් දන්නවා, යි ඔහු ඊට පිළිතුරු වශයෙන් කීවා.

''රජතුමාගේ දෑසේ කඳුළු පිරණි. ''ඇති, ඇති තව කිසි දෙයක් කියන්න එපා. ඔබ කියන්නේ කුමක් ද කියලා දැන් මට දැනෙනවා. යැයි රජතුමා කීවා.

''කඳුකරයේ ව්‍යාපාරිකයෙකුගෙන් පුංචි දරුවෝ දෙන්නා මේ වෙළෙන්දෝ මිලයට ගත් බව රජතුමාට දැනගන්න ලැබුණා. රජතුමා වෙළෙන්දාට සම්පූර්ණ අයවිය යුතු දේ දුන්නා. දරුවන් සොරකම් කළ අය අල්ලන්න තම ආරක්ෂක භටයන්ව යැවීය. තම පුත්‍ර රාජ කුමාරයාගේ සහ ලේලිය වන කුමාරියගේ පිටමං කළ කාලය අවසන් කර කැටුව එන ලෙස රාජ පුරුෂයන්ට අණ කළා. දෙන්නාවම රජ මාළිගාවට දෙදෙනා ම මාළිගාවට ආවෝය.''

''බුදුහාමුදුරුවන් විස්තර කළ කතාවට පුංචි දරුවෝ බෙහෙවින් සතුටු විය. බුදුහාමුදුරුවෝ පුංචි ළමයි දෙස බලා සිනාසිණි. සිනාසී රාජ කුමාරයා ළඟ තවත් දෙයක් දෙන්න තිබුණා නම් ඒ ද දෙනු ඇතැයි පැවසූහ. ''අද නුඹලා ගොඩනැගූ නගරයේ ගබඩාවේ තිබුණ ඉතාම වටිනා මැටි ටිකක් මට දුන්නේ. නමුත් මා ඒ ගැන සතුටු වෙනවා. මේ ආකාරයට පුංචි පුංචි දෙයක් දීලා තම සිතේ උදාරකම ඇති කර ගන්න. ඉන් නුඹලාට සැපයක් ද ලැබේවි. ඉන් කවදාවත් දුකක් වෙන්නේ නැහැ. යම් කිසි විදියකින් තමන්ගේ මල් පාත්තියේ මල් තියනවා නම් ඉන් මලක් කඩාගෙන තමන්ගේ දෙමවුපියන් ඇතුළු වැඩිහිටි කෙනෙකුට දෙන්න කිවුවා. ඉන් ලැබෙන ප්‍රතිඵලය ඉතා උසස්. ස්තුති කිරීමෙන් සහ මෘදු වචනයෙන් බොහෝ අය සතුටට පත්වෙනවා. තමන්ගේ පවුලේ අයට හිතවත් අයට උපහාර කරමින් සිටින්න.

''දැන් ඉතින් මටත් මගේ භික්ෂු පිරිසටත් යන්න ඉඩ හරින්න. අද නුඹලා දුන්න උපහාරය මා හැමදාම ස්තුති පූර්වක ව සිහිපත් කරනවා.'' යැයි බුදුන් වහන්සේ වැඩි දුරටත් පැවසුවෝය.

''අපි තවත් මිතුරන් රැගෙන ඔබ වහන්සේව දකින්න ජේතවනයට එනවා. අපිට තවත් කතා කියලා දෙන්න,'' යැයි ළමයින් පිරිස කියා සිටියහ. ඊළඟ ග්‍රීෂ්ම ඍතුව ගත කරන්න බුදුරදුන් රජගහ නුවරට වැඩියෝය. ඊට පසුව ගිජුකුළු පවුවට ගියෝය. තමන්ගේ අඹවනයේ ටික දවසක් ඇවිත් ඉන්න යැයි ගිජු කුළු පව්වට පැමිණ ජීවක ඉල්ලා සිටියේය. ජීවකගේ ආරාධනාව බුදුරදුන් බාර ගත්තෝය. ආනන්ද හාමුදුරුවන් ද ඒ සමඟ සිටියේය. ජීවකගේ අඹවනය ඉතාම සුන්දර ශාන්ත පරිසරයකයි තිබුණේ. ජීවක බුදුරදුන්ට වැඩ සිටීමට කුටි සාදා දුන්නේය. සෑම දාම ශාකාහාරී භෝජන ද පූජා කළේය. ශ්‍රී පතුලේ තුවාලය හොඳට සුව වෙනතෙක් ටික දිනකට පිණ්ඩපාතය යන්න එපා, යැයි ජීවක පැවසුවේය. කැලෑ කොළපොතු අඹරා ජීවක බුදුරදුන්ට බෙහෙත් සාදා දුන්නේය.

දිනක් ජීවක බුදුරදුන් සමඟ සවස කතා බස් කරමින් සිටින අතර, ''ගුරු දේවයාණනි, සමහර අය කියනවා ඔබ වහන්සේ අවශ්‍යනම් ඕන කෙනෙක් මස් මාලු කෑමට ගත්තාට වරදක් නැතැයි කියනවා කියලා. සමහර අය කියනවා බුදුහාමුදුරුවෝ භික්ෂූන්ට කියනවා මස්මාලු කන්න කියලා. ඒකෙන් සමහර අය කියන්නේ බුදුහාමුදුරුවෝ ප්‍රාණ වධයට උපකාර කරනවා කියලා. නමුත් මේ කාරණය මා නම් පිළිගන්නේ නැහැ. එහෙත් මේ ගැන ඔබ වහන්සේගේ අදහස දැනගන්න මා කැමතියි,'' යැයි පැවසීය.

''ජීවක එහෙම කතාවක් කවුරුන් හෝ මා ගැන කිවුවානම් ඒක සම්පූර්ණ අසත්‍ය කතාවක්. මා මේ ගැන මීට කලින් කිහිප වතාවක්ම විස්තර කර තියනවා. කවුරුහරි කෙනෙක් පිණ්ඩපාතයේ දී මස් මාලු දීමට සූදානම් වුණොත් ඒ කෑම පිළි නොගැනීමට ඒ භික්ෂුවට පුළුවන්කම තියනවා. ඒ භික්ෂුව දැක්කානම් පශුව ද කරනවා, නැත්නම් පිණ්ඩපාතය බෙදන විට කිවුවොත් මේ පශුවදය ඔබ වහන්සේ සඳහායි කළේ කියලා එවිටත් ඒ පිණ්ඩපාතය පිළි නොගෙන ඉන්න පුළුවන්. ජීවක පිණ්ඩපාතය යන භික්ෂුවට දානය බෙදන අය දෙන්නේ මොනවා ද ඒක පිළිගන්න වෙනවා. භික්ෂූන් වහන්සේ ගැන හොඳට දන්න අය කවදාවත්ම මස් මාලු දානයට පිළිගන්වන්නේ නැහැ. තවත් කරුණක් තියනවා. සමහර සංයුත්ත පවුල්වල අය මාංශාහාර හා නිර්මාංශාහාර දෙවර්ගය ම හදනවා. දන්නෙම නැතිව භික්ෂුවත් වෙලාවට පිණ්ඩපාතයේ

එනවා. ඒ අයගේ ගෙදර හදලා තියෙන්නේ මොනවා ද ඒ දෙය පිණ්ඩපාතයට දෙනවා. පිණ්ඩපාතයේ ගිය භික්ෂුව ඒ දීපු දෙය බාරගන්න ඕනෑ. හේතුව එහෙම නොවුනොත් ඒ උපාසක පවුලේ අයගේ සිත නරක් වෙන්න පුළුවන්.

''ජීවක, ටික දවසක් යන විට උපාසකයන් දැනගනීවි භික්ෂූන්ට දානය දීමට ප්‍රාණඝාතය කිරීම සුදුසු නැත කියලා. මා අවබෝධ කරගත් දහම අනුව එළවලු කෑම වර්ග ආහාරයට ගැනීම හැම අතින්ම හිතකරයි කියලයි කියන්න පුළුවන්. ශරීර සනීපයට එළවලු කෑම ඉතාම වටිනවා. එළවලු වර්ග කෑමෙන් ශරීරය බර වෙන්නේ නැහැ. එළවලු ආහාරයට ගන්න පුද්ගලායා ලෙඩ වෙන්නේ ඉතාම අඩුවෙන්. මාත් දැනට අවුරුදු දහයක ඉඳලා එළවලුයි අනුභව කරන්නේ. එළවලු ආහාර ගැනීම කරුණා මෛත්‍රී ආදී යහපත් ගුණාංග වැඩි කර ගැනීමටත් උපයෝගී වෙනවා.

ඔබ වහන්සේගේ පැහැදිළි පිළිතුරට ඉතාම ස්තුතියි කියලා, යනුවෙන් ජීවක පැවසීය. භික්ෂූන් පෙරදින තැබූ කෑම බීම දෙවන දා කෑමට ගන්නේ නැහැ. ඒකත් ඉතාම වැදගත් කියලා. හේතුව දවසක් පසු වී ගන්නා කෑම ලෙඩ වීමට හේතුවක්. මේ නිසා භික්ෂූන්ගේ සනීපය දිහා බලලා ඒ තීරණය ගැනීම වෛද්‍ය වරයෙක් හැටියට මා අනුමත කරනවා යැයි ජීවක බුදුරදුන් සමඟ පැවසීය.

බුදුරදුන් ජීවකගේ අදහස්වලට ස්තුති කරමින්, දවසක හවස් වරුවක විහාරය පැත්තට එන්න. ඇවිත් භික්ෂූන්ට පිරිසිදුකමෙහි ඇති වැදගත්කම ගැන කරුණු කියලා දෙන්න කියලා, යැයි පැවසුවෝය.

## පනස් නව වන පරිච්ඡේදය
# සිද්ධාන්තයන්හි තර්ක ජාලය

ජීවකගේ අඹවනය විශාල වූත් ඉතාමත් ශාන්ත වූ වනයකි. එහි භික්ෂුණීන් සඳහාත් කුටි සාදවා තිබිණි. දවසක් සුභා යනුවෙන් හැඳින්වූ භික්ෂුණියක් ප්‍රශ්නයක් ගැන සාකච්ඡා කරන්න බුදුරදුන් සමීපයට පැමිණියාය. පිණ්ඩපාතය වැඩමවා ආපසු එන අතරමඟ දී භික්ෂුණියට එක තරුණයෙක් මුණගැසිණි. ඒ තරුණයා එක වරම භික්ෂුණිය ඉදිරියට පැමිණියේය.

මේ තරුණයාගේ අදහස කුමක් ද යන බව භික්ෂුණියට දැනිණි. ''සහෝදරයා මා බුදුරදුන්ගේ දහම අදහන කෙනෙක්. කරුණාකරලා මට කරදර නොකර යන්න පාර ඉඩ දෙන්න,'' යැයි ඇය ස්ථිර ලෙසින් ඉල්ලා සිටියාය.

''නුඹ හරි ලස්සනයි, තරුණයි. හිස මුඩු කරගෙන කහ සිවුරක් පොරවාගෙන මේ තරුණ ජීවිතය විනාශ කරගන්නේ ඇයි? නුඹේ ශරීරය කසී සලු අඳින්න තියන ශරීරයක්. මා මේ දක්වා නුඹ වගේ සුන්දර යුවතියක් දැකලාවත් නැහැ. මගෙත් එක්ක එන්න. ශරීර සුවයේ එක් සුවඳ පැත්තක් ඔබට පෙන්වන්න එන්න. මා සමඟ එන්න,'' යැයි තරුණයා ඇයගෙන් ඉල්ලා සිටියේය.

''මෝඩ වචන කතා කරන්න එපා. මා ජීවිතයේ නියම සතුට විඳින කෙනෙක්. මට වෙනමම සතුටක් ඕනෑ නැහැ. කරුණාකරලා මට යන්න දෙන්න. මං ඔබට ස්තුති වන්ත වෙනවා,'' සුභා නම් වූ ඒ තෙරණිය ඉතා ශාන්ත ස්වරයෙන් කීවාය.

නමුත් ඒ තරුණයා සුභා තෙරණිය පැවසූ කිසිවක් සැලකිල්ලට ගත්තේ නැත. ''නුඹගේ දෑස හරිම ලස්සනයි. මේ වාගේ සුන්දර දෑසක් මා කවදාවත් දැකලා නැහැ. මාව එතරම්ම මෝඩයෙක් හැටියට හිතන්න එපා, නුඹට යන්න දේවි කියලා. නුඹට මා සමඟ අද යන්නම වෙනවා,'' යැයි තරුණයා නැවතත් කීවේය.

තරුණයා සුභා භික්ෂුණිය අල්ලා ගන්නට උත්සාහ දැරුවත් ඇය ඉන් මිදුණි. ''සහෝදරයා මාව අල්ලන්න එපා. මා භික්ෂුණියක්. මගේ භික්ෂුණී ව්‍රතය නැති කරන්න එපා. මේ සියල්ලේ ඇති නිසරු බව දැකලයි මම පැවිදි වුණේ. නුඹ කියනවානම් මගේ දෑස ලස්සනයි කියලා මා දෑස නුඹට දෙන්නම්. නුඹගෙන් කෙලෙසෙනවාට වඩා අන්ධ වීමට මා කැමතියි,'' සුභා කීවාය. සුභා කතා කළේ දැඩි අධිෂ්ඨානයකිනි. තරුණයා සුභාගේ ඉදිරියේ දුර්වල විණි. ඔහු පාරෙන් අයින් වූයේය. ''මේ භික්ෂුණිය කියන්නේ කුමක් ද ඒ දෙය කරලා පෙන්වන බව සපීරයි'' යැයි තරුණයාට සිතිණි. භික්ෂුණියත් පිටිපස්සට ගියාය. ''සහෝදරය ඔබගේ ආශාව අපරාධයකට හරවන්න එපා කියලා. නුඹ දන්නවා ද? බිම්බිසාර රජු රාජාඥාවක් නිකුත් කර තිබෙනවා බුදුරදුන්ගේ ශිෂ්‍ය භික්ෂූන්ට සහ භික්ෂුණීන්ට කරදර කරන අයට තදින්ම දඬුවම් දෙනවා කියලා. යම් කිසි ක්‍රමයකින් නුඹ මට කරදර කළොත්, මාව සිරකර තබා ගැනීමට හෝ උත්සාහ කළොත් නුඹට තද දඬුවම් විඳීමට සිදුවන බව සිතා ගන්න,'' යැයි සුභා තෙරණිය තවදුරටත් කීවාය.

මේ සියල්ල ඇසීමෙන් පසු මා මෝඩකමින් අන්ධ වී කරන්න ගියේ මහා අපරාධයක් නොවේ දැයි තරුණයාට කල්පනා විය. තරුණයා පාරෙන් අයින් වී භික්ෂුණියට යන්න ඉඩ හැරියේය. ''සහෝදරිය, මගෙන් සිදුවූයේ ලොකු වරදක්. මට සමාවෙන්න. මම හොඳටම විශ්වාස කරනවා ආධ්‍යාත්මික පක්ෂයෙන් ඔබ ඉතාම ඉහළ තත්වයකට පත් වේවි කියලා,'' භික්ෂුණිය එතැනින් ඉවත් වන විට, තරුණයා ඇය දෙස බලා කීවේය.

මේ සියල්ල ඇය බුදුරදුන්ට විස්තර කර දී බුදුරදුන්ගෙන් පිළිතුරු ලැබෙන තෙක්ම නොසිට ආපසු යන්න ගියාය. තරුණ භික්ෂුණියගේ ශක්තිය පිළිබඳව වර්ණනනා කළ බුදුන් වහන්සේ, ''කවුරුත් නැති මඟක භික්ෂුණීන් තනිවම යාම සුදුසු නැහැ. මෙන්න මේ වගේ සිද්ධීන් නිසා තමයි මම කාන්තාවන් පැවිදි කිරීමට අකමැති වුණේ. අදින් පස්සේ කිසිම භික්ෂුණියක් තනිවම මඟක යන්න එන්න එපා. සමහර විට පිණ්ඩපාතය සඳහා වෙන්න පුළුවනි. සැතපීමේ දී සක්මන් කිරීමේ දී කුටියේ සිටීමේ දී සෑම විටම තව භික්ෂුණියක් තමන් ළඟ සිටිය යුතුයි. දෙවැනියෙක් සිටීමෙන් දෙදෙනාගේම ආරක්ෂාව හිතකරයි. මින් පසුව කිසිම භික්ෂුණියක් තනිවම නොසිටින්න කියලා මා සියලුම දෙනාට අවවාද කරනවා,'' යැයි ප්‍රකාශ කළෝය. බුදුරදුන් ආනන්ද හාමුදුරුවන්ට කතා කොට මේ සිද්ධිය ගැන වැඩිහිටි භික්ෂූන්ට දන්වන ලෙසත් භික්ෂුණී විනයට මේ සිද්ධියට අදාළ විනය නීතිය ගැන සෑම දෙනාටම දැනුවත් කරන ලෙසත් පැවසුවෝය.

බුදුරදුන් ජීවකගේ අඹවනයේ සිට නාලන්දාවට වැඩියෝය. බුදුරදුන් සමඟ තවත් බොහෝ භික්ෂූන් සිටියහ. භික්ෂූන් සමඟ සුප්‍රිය සහ බ්‍රහ්මදත්ත නමින් ප්‍රසිද්ධව සිටි සාදුවරුන් දෙදෙනෙකු පැමිණියහ. මේ දෙදෙනා ඉතාම උස් හඬින් බෞද්ධ ධර්මය ගැන සාකච්ඡා කළෝය. සුප්‍රිය බුදුරදුන්ගේ ධර්මය විවේචනය කළෝය. සුප්‍රියගේ ශිෂ්‍යය බුදුරදුන්ගේ දේශනාව ගැන ප්‍රශංසා කළෝය. බ්‍රහ්ම දත්ත තම ගුරුවර සුප්‍රියට ඉතාම අවංකවම අවශ්‍ය පරිදි පිළිතුරු දුන්නේය. භික්ෂූන් වහන්සේලාත් මේ සාකච්ඡාව ගැන හොඳින් කන් යොමාගෙන සිටියෝය. නමුත් කිසිම කරුණකට පිළිතුරු දුන්නේ නැත.

එදා රාත්‍රිය භික්ෂූන් ගත කළේ රජ පවුලකට අයිති සුන්දර උද්‍යානයක් වූ අම්බලට්ඨිකා වනයේයි.

ඕනෑම ධර්මයක ආචාර්යවරයෙකුට අවශ්‍ය අවස්ථාවක තම අම්බලට්ඨිකා උයනේ නතර වී විවේක ගන්න අවසර ඇති බව බිම්බිසාර රජතුමා පවසා තිබිණි. සුප්‍රිය සහ බ්‍රහ්මදත්තත් මේ උයනේම නතර වූහ.

පසු දා භික්ෂූන් වහන්සෙලා සුප්‍රිය සහ බ්‍රහ්මදත්තගේ සාකච්ඡාව ගැන කථා කළහ. මේ කතාව බුදුරජානන් වහන්සේට

ඇසිණි. ''මගේ දේශනාව ගැන කවුරු හරි ප්‍රශංසා කළොත් දොස් කිවුවොත් මේ දෙකටම ඔබ වහන්සේලා කලබල වෙන්න එපා. දෙපැත්තටම උත්තර දෙන්නත් යන්න එපා. ඉන් සිද්ධ වෙන්නේ තුනුරුවන්ට හානියක් මිස ලාභයක් නොවෙයි. ඒ දේ අහගෙන ඉඳලා කුමන දේ හරි ද කුමන දේ වැරදි ද කියලා ඔබ වහන්සේලාම සාකච්ඡා කරන්න. ඉන් පස්සේ තමන්ගේ ධ්‍යාන භාවනා විමුක්ති මාර්ගයට ඉන් ලබා ගත හැකි ප්‍රයෝජන ගැන සාකච්ඡා කරලා ඉන් ගත යුතු දේ පමණක් ගන්න.

''භික්ෂුවරුනි, කවුරු හරි කෙනෙක් බුද්ධ ධම්ම සංඝ ගැන හොඳ කියනවා නම් ඔහු ඒ ගැන සතුටු වෙච්ච කෙනෙක් වෙන්න ඕනෑ. බුදුරදුන් ඉතාම සරල ජීවිතයක් ගත කරන්නේ. ඉතාම ශාන්තයි නමුත් ඒ පුද්ගලයා ධර්මය ගැන යමක් සිතූ බව ඉන් දැනෙන්නේ නැහැ. එය වචන ගොඩක් පමණයි.

''භික්ෂුවරුනි, මේ සංසාරයේ ධර්ම, දර්ශන, සිද්ධාන්ත කොච්චර ද කියලා ඔබ වහන්සේලාට කියන්න පුළුවන් ද? එහි ගණන අනන්තයි. අප්‍රමාණයි. මේ ගැන සමාජය අනන්තර කාලයක් තිස්සේ කතා කරාවි. මා මේ සියල්ල ගැන සිතුවා. මගේ සිතට දර්ශන හැට දෙකක් ගැන කරුණු ඇතුළත් වෙලා තියනවා. මේ හැට දෙක තුළට තව දාහක් දෙදාහක් නැත්නම් ඊට වඩා ප්‍රමාණයක් ඇතුළත් කරන්න පුළුවන්. නමුත් මා අවබෝධ කරගත් දහමේ ඒ දර්ශනවල ධ්‍යාන, භාවනා, විමුක්ති මඟ ආදිය ගැන සඳහන් වන්නේ ඉතාම අඩුවෙන්. සමහර දර්ශනවල ඒ සඳහා බාධා පමුණුවන කරුණු සඳහන්වෙලා තියනවා,'' යැයි කීහ. ඉන් පසුව බුදුරදුන් හැට දෙකක් දෘෂ්ඨීන් ගැනත් ඒවායේ ඇති අඩුපාඩු ගැනත් විස්තර කළෝය. අතීත කාලය පිළිබඳව දේශනා කළ සිද්ධාන්ත දහ අටක් ගැන විස්තර කළහ. සිද්ධාන්ත හතරක් අනන්තය පිළිබඳවයි. සතරක් ආශිංක අනන්තය ගැනයි. සිද්ධාන්ත හතරක් නිත්‍ය සහ අනිත්‍ය ගැනයි. සිද්ධාන්ත හතරක් අනන්ත අනිශ්චය ගැනයි. සිද්ධාන්ත දෙකක් කර්මය, කර්ම කරන්නා යන දෙකම බාරගන්නේ නැත. හතලිස් පහක් සිද්ධාන්ත අනාගතය ගැනයි. දහසයක් සිද්ධාන්ත අනුව මිය යෑමෙන් පස්සේත් ආත්මය ඉතිරි වී පවතින විශ්වාසය ඇති සිද්ධාන්තය ඇති ඒවායි. තව සිද්ධාන්ත අටක මිය ගිය විට ආත්මය කිසිම දේකට නැති දෙයක් බව

සඳහන් වී ඇත. තව සිද්ධාන්ත අටක් මේ දෙකම පිළිගන්නේ නැත. සිද්ධාන්ත හතක මිය ගිය විට ආත්මය නැති වී යන බව සඳහන් කර ඇත. සිද්ධාන්ත පහක් වර්තමාන ජීවිතය තම යි නිවන යැයි සඳහන් වෙයි.

මේ ගැන කෙටි විස්තරයක් කරන බුදු හාමුදුරුවෝ ''මාළු අල්ලන අය දැල් දානවා. මාළු හෝ ඉස්සන් හෝ අල්ලන්න. මේ වුණත් සමහර-දක්ෂ මාලු කොහොම හරි දැලෙන් බේරිලා යනවා. නමුත් මාලු අල්ලන මිනිහා කියනවා කොහොම ගියත් කමක් නැහැ අන්තිමේ දී අහුවෙන්නේ දැලට නේ කියලා.

''මේ කාලයේ දෘෂ්ඨී හැට දෙකක් දඹදිව පමණක් ප්‍රසිද්ධ යි. මේ කොයි දර්ශනයකත් හැම දෙනා ම පැටළිලයි ඉන්නේ. මේ නිසා භික්ෂුවරුනි, තර්ක ජාලවලට අසුවෙන්න යන්න එපා. ඉන් සිදුවන්නේ තමන්ගේ කාලය විනාශ වීම පමණයි. බලාපොරොත්තු තබාගත තර්ක වල පැටලීමෙන් විනාශයක් මිසක් ලාභයක් වෙන්නේ නැහැ. භික්ෂුවරුනි, මෙතරම් ආගම් දහම් දෘෂ්ඨී ඇති වුණේ ඇයි ද කියලා දන්නවා ද? මිනිස්සුන්ට හරි හැටි හරි දේ තේරුම් ගන්න නො හැකි වීම නිස යි. ධ්‍යාන භාවනා නො කරන අයට මේ දෘෂ්ඨී ජාලය ගැන කිසිදු අවබෝධයක් ලැබෙන්නේ නැහැ. නුඹ ආශාවන්ගෙන් පිරී සිටිනවා නම් මෝඩ නම් ධ්‍යාන භාවනා කරන්නේ නැත්නම්. භයෙන් වෙලි වෙළී ඉන්නවා නම් මේ දෙසැටක් දෘෂ්ඨීන් ගැන අවබෝධයක් ලැබීම පහසු නැත කියලා,'' යනුවෙන් දේශනා කළෝය.

මේ දේශනාවෙන් පසුව ආනන්ද හාමුදුරුවෝ ඇවිදින ගමන් බුදුරදුන් දේශනා කළ සියලුම දේ වචනයක් පාසා සිතුවෝය. අන්තිමට තීරණය කළා. ඒ දේශනාවත් ඉතාම වැදගත් කියලා. මේ සූත්‍රයට බ්‍රහ්ම ජාල සූත්‍රය කියලා නම් කිරීම හොඳ බව තීරණය කළා. මේ ද ෘෂ්ඨී හැට දෙකට මේ ලෝකයේ ඇති සියලුම ධර්ම සිද්ධාන්ත ඇතුළත් කර ගත හැකි බව තීරණය කළා.

## හැට වන පරිච්ඡේදය

# මහා උපාසිකා විශාඛාවගේ කෙලෙස්

අම්බලට්ඨිකාවෙන් ධර්ම දේශනා කිරීමට නාලන්දාවට ගිය බුදුරදුන් ඉන්පසු අංග රාජ්‍යයේ රාජධානිය වූ චංපාවට ගියෝය. අංග දේශය බිම්බිසාර රජතුමාගේ ප්‍රාන්ථ රාජ්‍යයක් ලෙස පාලනය විණි. චම්පාවේ ගග්ගරා නදිය අසල සීතල සුළඟ ඇති වනයක බුදුරදුන් වැඩ සිටියෝය.

චම්පාවේ දී බුදුබණ ඇසීමට බොහෝ අය පැමිණියෝය. ස්වර්ණ දණ්ඩ නැමති ඉතාම ධනවත් බමුණෙකුත් මේ පැමිණි අය අතර සිටියේය. ඒ පළාතේ අය ස්වර්ණ දණ්ඩගේ තිබුණු බුද්ධිය ගැන මනා පැහැදීමකිනුයි සිටියේ. ස්වර්ණ දණ්ඩ බමුණා බුදුරදුන් හමුවීමට යාමට සූදානම් වූ විට ඔහුගේ මිත්‍රයෝ ''බුදුහාමුදුරුවන් මුණගැසීමට යන්න එපා. ඔබ ගියොත් බුදුන්ගේ සම්මාන තවත් වැඩි වෙනවා,'' යනුවෙන් පැවසූහ.

ස්වර්ණ දණ්ඩ ඉතාම කීර්තිමත් මේ වාගේ කෙනෙකු මා කිසි සේත්ම මුණ නොගැසී ඉන්නේ නැහැ,'' ස්වර්ණ දණ්ඩ

පැවසීය. ''මේ වාගේ ලාභයක් අවුරුදු දාහකටවත් ලැබෙන්නේ නැහැ. මගේ බුද්ධිය තවතවත් දියුණු කර ගැනීම සඳහා මේ ගමන මා අනිවාර්යයෙන්ම යන්න ඕනෑ. මට දැනගන්න ඕනෑ ගෞතම බුදුන් මට වඩා දන්නේ මොනවාද මා නොදන්නේ මොනවා ද?'' යනුවෙන් ද බමුණා පැවසීය.

දාහක් පමණ බමුණු පිරිසක් ස්වර්ණ දණ්ඩ සමඟ බුදුන් හමුවට යන්න සූදානම් වූවෝය. බ්‍රාහ්මණ ධර්මයට වඩා බුද්ධ ධර්මයේ යම් කිසි සාරයක් ඇති බව ඒ අයට අවබෝධ විය. ''අපි ස්වර්ණ බ්‍රාහ්මණ තුමාගේ හිස පාත් වෙන්න තියන්නේ නැහැ,'' යි කවුරුත් කීහ.

මහා සෙනඟ මධ්‍යයේ ස්වර්ණ දණ්ඩ බ්‍රාහ්මණතුමා බුදුරදුන්ගෙන් යමක් විමසීම සඳහා නැගී සිටියත් කුමක් ඇසිය යුතු දැයි තීරණය කිරීමට ඔහුට අපහසු විය. බුදුන් වහන්සේ තමන් යමක් කිවයුතු යයි තීරණය කර, ''ඔබට කියන්න පුළුවන් ද සත්‍ය වශයෙන් බ්‍රාහ්මණයෙකුගේ ගුණ මොනවා ද? ඔබට අවශ්‍ය නම් වේදයෙන් කරුණු ගෙන හැර දැක්වුවාට වරදක් නැහැ,'' බුදුන් වහන්සේ ස්වර්ණ දණ්ඩ අමතා ප්‍රකාශ කළෝය.

මෙය අසා ස්වර්ණ දණ්ඩ ඉතාම සතුටට පත් වුවේය. වේදය ගැන එතුමාගේ දැනුම ඉතාම ප්‍රගුණ එකක් වීම ඊට හේතුව විය. ''සත්‍ය බමුණෙක් ළඟ ගුණ පහක් අනිවාර්යෙන්ම තියෙන්න ඕනෑ. ආකර්ෂණී පෞර්ෂත්වය. නියම ක්‍රමයට මන්ත්‍ර උච්ඡාරණය කිරීම. කර්ම කාණ්ඩය කිරීමේ නිපුන බව, පරම්පරා හතක් දක්වා ලේවල පිරිසිදුකම. උදාර අදහස් ඇති බුද්ධිය,'' යනුවෙන් ස්වර්ණ දණ්ඩ පැවසීය.

''මේ ගුණවලින් වැඩිපුරම ඕනෑ කරන්නේ මොන ගුණය ද? මේ ගුණවලින් මොන ගුණය අඩු වූ විට ද බ්‍රාහ්මණත්වය නැති වෙන්නේ? යනුවෙන් බුදුන් වහන්සේ ඇසුවෝය.''

'' අන්තිම ගුණය අනිවාර්යයි,'' හොඳින් සිතා බැලූ ස්වර්ණ දණ්ඩ පැවසීය. පෞර්ෂත්වය, ශරීරය සුන්දර වීම, මන්ත්‍ර උච්ඡාරණය සහ පූජා කරන ආකාරය, ලේවල පිරිසිදුකම අනිවාර්ය නැති බවත් ඔහු පැවසුවේය. ස්වර්ණ දණ්ඩගේ මේ ප්‍රකාශය ඇසූ අනෙක් බ්‍රාහ්මණ පිරිසෙන් පන්සියයක් දෙනා සභාවෙන් නැගිට්ටෝය. නැඟී සිට ස්වර්ණ දණ්ඩගේ කතාවට විරෝධය පළ කළෝය. සියලුම දෙනා අදහස් කළේ ස්වර්ණ දණ්ඩ

බුදුහාමුදුරුවන්ගේ ප්‍රශ්න තේරුම් නොගෙන පිළිතුරු දී බ්‍රාහ්මණ වර්ගයාට අවනම්බු කළා යැයි මේ පන්සියයක් බ්‍රාහ්මණ පිරිස සභාවේ නැඟී සිට කෑ ගැසුවෝය. ''මිත්‍රවරුනි, ඔබ සැමට ස්වර්ණ දණ්ඩ ගැන විශ්වාස නම් කරුණාකරලා වාඩි වෙන්න. ඔහුට ඔහුගේ අදහස් සම්පූර්ණ කරන්න ඉඩ දෙන්න. එසේ නොමැතිනම් ස්වර්ණ දණ්ඩ වාඩි කර අපි සාකච්ඡා කරපු ප්‍රශ්නයට පිළිතුරු දෙන්න පුළුවන්. ඔබ සැම අතර යමක් සිටී නම් කරුණාකර මේ ගැන සාකච්ඡා කරන්න ඉදිරිපත් වෙන්න''යැයි බුදුන් වහන්සේ ප්‍රකාශ කළෝය.

මේ අතර ස්වර්ණ දණ්ඩ තම මිතුරන් අමතා ''මගේ මාමගේ පුතා කෝ,'' යැයි ඇසීය. අංගක නමින් හැඳින්වූ ඒ තරුණයා රූපයෙන් ඉතාම ලස්සන කෙනෙක්. අංගකගේ වචන ඉතාම මෘදුය. බුදුහාමුදුරුවන්ට සමාන කරන්න තරම් හැකියාවක් තිබිණි. ශරීර වර්ණයේත් මන්ත්‍ර උච්චාරණයේත් පූජා විධි කරවීමටත් ඔහු දක්ෂ විය. පරම්පරා හතකින් ලේ පිරිසිදුකම තිබිණි. මේ ගුණ නැතැයි කිසිවෙකුට කිව නොහැකි විය. ''නමුත් මේ සහෝදරයා මත් පැන් බීම කරනවානම් බොරු කියනවා නම් බලහත්කාරී වැඩ කරනවානම් එයාගේ සුන්දරකමින් මන්ත්‍ර උච්චාරණය කිරීමේ වැදගත්කමින් පරම්පරා හතක් ලේ පිරිසිදු වීමේත් ඇති පලය කුමක් ද? මිත්‍රවරුනි, අපි පිළිගන්න ඕනෑ සදාචාරකම, කර්ම සහ ඥානය සත්‍යය බමුණෙකුට අවශ්‍ය ගුණාංග කියලා. මේ සත්‍ය හැමදාම පිළිගත් සදාතනික එකක්, යැයි'' බුදුන් වහන්සේ පැවසූහ.

''මේ ගුණ දෙකිනුත් ඔබ වඩාත් සලකන්නේ මොන ගුණයට ද? යනුවෙන් බුදුරදුන් ප්‍රශ්න කළෝය.

''භික්ෂු ගෞතමයාණනි, සදාචාරයෙන් යුක්ත කර්ම කරන විට ඥානය වර්ධනය වීම සිද්ධ වෙනවා කියලා. මේ දෙක වෙන වෙනම සැලකීම වටින්නේ නැහැ. උදාහරණයකට ගතහොත් එක අතක් සේදීමට තව අතක් උපයෝගී කරගන්නවා සේ සදාචාරයෙන් යුක්ත කර්ම ප්‍රඥාවත් සමඟ තද සම්බන්ධයක් තියනවා. ප්‍රඥාවෙන් කර්ම ශ්‍රේෂ්ඨ වෙතත් මේ ගුණ දෙකම උසස් ජීවිතයකට ඉතාම අවශ්‍ය ගුණාංගයි,'' ස්වර්ණ දණ්ඩ ඊට පිළිතුරු වශයෙන් කීවේය.

බුදුරදුන් සෝණ දණ්ඩගේ වචන අසා ස්තුති වන්ත විය. ''ඔබ කියන්නේ ඇත්තයි. සත් කර්ම සහ ප්‍රඥාව ජීවිතයේ ඉතාම

වැදගත් අංග දෙකක්. ඔබට කියන්න පුළුවන් ද මේ දෙකින් ජීවිතයේ උසස්ම තත්වයට යන්නේ කොහොමද?'' යැයි බුදුරදුන් ප්‍රශ්න කළෝය.

සෝණ දණ්ඩ බුදුරජානන් වහන්සේට දෑත එකතු කර නමස්කාර කරමින්, ''මේ ගැන ඔබ වහන්සේගෙන් යමක් මා දැනගන්න කැමතියි. මා දන්නේ සිද්ධාන්ත පමණයි. ඔබ වහන්සේ මේ කරුණු ගැන ප්‍රායෝගික දැනුමක් ඇති කෙනෙක්. කරුණාකර කියන්න සද්ධර්මය සහ ප්‍රඥාවට සිත යොමු කරන්නේ කෙසේ ද කියා?'' යනුවෙන් ඉල්ලා සිටියේය.

බුදුරදුන් ස්වර්ණ දණ්ඩට විමුක්ති මාර්ගය කියා දුන්නෝය. ශීල, ධ්‍යාන හා ප්‍රඥා යන කරුණු තුන ගැන දේශනා කළෝය. ශීලය ආරක්ෂා කිරීමෙන් ධ්‍යාන භාවනා වර්ධනය වන බවත්. ධ්‍යාන භාවනාවෙන් ප්‍රඥාව වර්ධනය වන බවත්. ඉන් ශීල පාලනයට මහත් උපකාරයක් ලැබෙන බවත් ප්‍රකාශ කළෝය. ක්‍රමයෙන් ශීල ගුණය අධික වන අතර ඒ සමඟම ප්‍රඥාවත් ක්‍රමයෙන් පැහැදිලි වන බවත්. මේ නිසා සියලු දෙනා ලෝභ, ක්‍රෝධ සහ අඥානකම්වලින් මිදී ශාන්ත, ආනන්දමය ජීවිතයකට පා තබන මෙන් ප්‍රකාශ කළෝය.

ස්වර්ණ දණ්ඩ බුදුරදුන්ගේ වචන ඉතාම හොඳින් අසා සිටියේය. බුදුරදුන් තම දේශනාව අවසාන කළ වහාම සෝණ දණ්ඩ නැඟිට බුදුරදුන් අමතා, ''ගෞතමයාණනි, මාගේ නමස්කාරය පිළිගන්න. ඔබතුමා අද මගේ දෑස ඇහැරෙව්වා. අඳුරෙන් එළියට ගත්තා. දැන් ඉතින් මට තුනුරුවන්ගේ සරණ සමාදන් කරවන්න. ඔබ වහන්සේටත් භික්ෂු සංඝයාටත් මගේ ගෙදර මා දානයට ආරාධනා කරනවා,'' යැයි පැවසීය.

එදා සෝණ දණ්ඩ සහ බුදුන් අතර ඇති වූ සාකච්ඡාව මුළු පළාතේම ප්‍රසිද්ධයට පත් විය. බොහෝ බ්‍රාහ්මණ පිරිසත් උගත් පිරිසකුත් එදා තුනුරුවන් සරණ සමාදන් වූහ. මේ අය අතර ප්‍රසිද්ධ බ්‍රාහ්මණ ආචාර්යවරයෙකු වූ පොක්කරසාතීත් විය. ක්‍රමයෙන් බ්‍රාහ්මණ පිරිස බුදුරදුන්ගේ ශිෂ්‍ය භාවයට පත් වෙමින් තුනුරුවන් සරණ සමාදන් වීම අධික වීමට පටන් ගත්තේය. එතැන් පටන් අනෙක් ආගමික නායකයෝ බුදුන්ටත් ධර්මයටත් සංඝයාටත් අවනම්බු කිරීම අමතර වෙහෙසක් ගත්හ.

භික්ෂූන් වහන්සේලා අම්බලට්ටිකාවේ වැඩ සිටින අවස්ථාවේ දී ස්වස්ති එදා තිබුණ දර්ශන ගැන විස්තරයක් කරන්න හැකි දැයි මහා මුගලන් රහතන් වහන්සේගෙන් ඇසීය. මහ මුගලන් මහ රහතන් වහන්සේ ස්වස්තිට ඒ ගැන කෙටියෙන් විස්තර කර දුන්නේය.

''පළමු දර්ශනය පූර්ණ කාශ්‍යප ආචාර්යවරයාගේයි. සදාචාරය සහ එහි ස්වභාවය පිළිගන්න පිරිසක් මෙතුමාට සිටියා. එතුමා ප්‍රකාශ කළේ හොඳ හෝ නරක හෝ පරම්පරාවෙන් උපදින දේ කියලයි.

''මක්ඛලි ගෝසාල භාග්‍යය ගැන සිතූ කෙනෙක්. එතුමා ඉගැන්වූයේ පුද්ගලයාගේ ජීවිතයේ යම් දෙයක් සිද්ධ වෙන්න ඇති නම් එය තීරණය වන්නේ ක්ෂණයකින් කියලයි. කවුරු හරි කෙනෙකුට විමුක්තිය අවශ්‍යනම් ජන්ම පන්සියයක් වුණත් ගත වෙන්න පුළුවන් එය ලබා ගන්න. නමුත් ඒ ගැන කිසිවෙකුගේ උපකාරයක් අවශ්‍ය නොවන බව ඔහු ඉගැන්වූවා.

''ආචාර්ය අජිත කේසකම්බලී විශ්වාස කළේ ශරීරය පෘථිවි, ජලය, ගිනි, වායු යන දේවලින් සම්පූර්ණයි. කවුරු හරි මිය ගියහොත් කිසිම දෙයක් ඉතිරි වෙන්නේ නැහැ. මේ නිසා කවුරු හරි කෙනෙකුට මේ ජීවිතයේ යමක් කරන්න තියනවා නම් කරලා ඉවර කිරීමයි වැදගත් වන්නේ. නැවත ඉපදීමක් ගැන කවුද දන්නේ. එතුමා නැවත ඉපදීම ගැන සිතුවේම නැහැ.

''පකුදකච්ඡායන ආචාර්ය වරයාගේ ඉගැන්වීමේ සඳහන් වූයේ ආත්මය සහ ශරීරය කවර දාවත් නෂ්ට වන දෙයක් නො වන හැටියටයි. මිනිස්සු පෘථිවි, ජලය, අග්නි, වායු, දුක, සැප චේතනා යන කරුණුවලිනුයි සෑදී තිබෙන්නේ. ඉපදීම සහ මරණය බ්‍රහ්මයාගේ ආවරණයක් පමණයි. එයත් පදාර්ථ සතකින් සෑදුණු දෙයක්. එය ඇති වෙනවා; නැති වෙනවා. නමුත් ආත්මය මැරෙන්නේත් නැහැ, නැති වෙන්නේත් නැහැ.'' මුගලන් හිමි පැවසීය.

ශාරිපුත්ත මුගලන් දෙනමම ආචාර්ය සංජය බෙල්ලට්ඨිපුත්තගේ ශිෂ්‍යයින් හැටියටයි කලින් සිටියේ. ආචාර්ය සංජය සාපේක්ෂ සිද්ධාන්තයේ කෙනෙකි. කාලය, දේශය අනුව ඇත්ත වෙනස් වන බව ඔහු පිළිගත්තේය. එක් දෙයක් ගැන එක් දෙයක් සත්‍ය වුවත් ඒ දෙය ගැන අනිත් දෙය සත්‍ය වීම අවශ්‍ය

නොවන බවත් සියලුම දේ සම්බන්ධ මැනගැනීම චේතනාව සහ ප්‍රඥාව බවත් එතුමාගේ ඉගැන්වීම විය.

නිඝණ්ඨ නාථ පුත්ත සම්පූර්ණයෙන්ම සාම්ප්‍රදායික ආචාර්යවරයෙක් විය. ශරීරය පීඩනය කිරීම, තප කිරීම සිදු කළේය. එතුමා සහ එතුමාගේ භික්ෂූන් වස්ත්‍ර නැතිව සිටි අතර පරම අවිහිංසාව යන ශීලය ඉතාම කඨෝර ලෙස අනුගමනය කළේය. ජීව, අජීව දෙකම ඔහු විශ්වාස කළේය. මේ කාලයේ එතුමාගේ දර්ශනයට විශේෂ ස්ථානයක් තිබිණි. නිඝණ්ඨ ධර්මයේ සාධුවරුන් රෙදි නොඅඳින නිසා කිසිම දේකට ආශාවක් නැති නියම සාදුවරු හැටියට එදා සමාජය පිළිගත්තේය. නිඝණ්ඨ නාථ පුත්තගේ සාදුවරු බුදුරදුන්ගේ ශිෂ්‍යයින් හමු වීමටත් බුදුරදුන්ගේ ශිෂ්‍යයින් නිඝණ්ඨ සාදුවරු හමුවෙන්නත් නිතර ආවෝය. නමුත් මේ අය අතර දාර්ශනික වශයෙන් මත බේද තිබිණි. නිඝණ්ඨ නාථ පුත්තගේ සාධුවරු බෞද්ධ භික්ෂුන්ට තදින් ම විරෝධය පෑවෝය. මුගලන් මහ රහතන් වහන්සේ මේ අය අතිවාදී අය හැටියට සැලකූහ.

බුදුරදුන් සැවැත් නුවරට වැඩම කර පූර්වාරාමයේ වැඩ සිටියෝය. බුදුරදුන් හමු වීමට එන අයගේ ගණන ක්‍රමයෙන් අධික විය. දිනක් මහා උපාසිකා විශාඛා බුදුරදුන් හමු වීමට පැමිණියාය. වැස්සේ තෙමීම නිසා ඇගේ කෙස් වතුරෙන් පෙඟී තිබිණි. ''විශාඛා නුඹ එන්නේ කොහේ ඉඳලා ද? නුඹ තෙමී ඇත්තේ ඇයි?'' යනුවෙන් බුදුරදුන් ප්‍රශ්න කළෝය.

''මගේ පුංචි දුව මියගියා. දුක අධික වූ නිසා වැස්සට කුඩයක් වත් රැගෙන එන්න හිත දුන්නේ නැහැ. හිටි ගමන්ම ගෙදරින් පිට වුණා,''යැයි විශාඛා මහා උපාසිකාව හඬමින් පිළිතුරු දුන්නාය.

'' ඇගේ වයස කීය ද? මැරුණේ කෙසේ ද?'' යැයි බුදුරදුන් ඇසුවෝය.

'' ඇගේ වයස අවුරුදු තුනයි. මිය ගියේ පැපොල රෝගය නිසා,'' යැයි විශාඛා පැවසුවාය.

'' අනේ පුංචි දරුවා. විශාකා නුඹට දරුවන් කී දෙනෙක් ඉන්නවා ද? දරුවන්ගේ දරුවෝ කොච්චර ඉන්නවා ද? බුදුන් වහන්සේ ඇසුවෝය.

'' මට දරුවන් දහසය දෙනෙක් ඉන්නවා. මේ අයගෙන් නව දෙනෙක් විවාහ වෙලයි ඉන්නේ. මගේ දරුවන්ගේ දරුවෝ

අට දෙනෙක් ඉන්නවා. එක් අයෙක් මිය ගියා. දැන් ඉන්නේ හත් දෙනයි,'' යනුවෙන් ඇය පිළිතුරු දුන්නාය.

'' විශාඛාව, නුඹ කැමති ද නුඹගේ දරුවන්ට තවත් දරුවෝ ඇති වෙනවා නම්,'' යැයි බුදුරදුන් ඇසූහ.

''ඔව් ගුරුතුමනි, ඒ අයට දරුවන් අධික වන තරමට මා කැමතියි. සැවැත් නුවර අයට දරුවන් ඉන්නේ කොපමණ ද, ඒ පමණට දරුවන් මට ඇත්නම් මා කැමතියි,'' යැයි විශාඛා කීවාය.

'' විශාඛාව දන්නවා ද සැවැත්නුවර දවසකට කොච්චර දරුවෝ මිය යනවා ද කියා?''

'' සමහර දවසට දහයක්, සමහර දවසට අටක් වගේ සිද්ධ වෙනවා. නමුත් හරියටම ගණන කියන්න බැහැ,'' යැයි ඇය කීවාය.

'' සැවැත් නුවර ඉන්න තරම් ජනයා අනුව ඔබට දරුවන් සිටියොත් එක දවසකට අයෙක් ගානේ මිය ගියොත් අද ඔබගේ කෙස් සහ වස්ත්‍ර කෙසේ ද තිබෙන්නේ. එදාට කොහොම වෙයි ද?'' යනුවෙන් බුදුරදුන් ඇසුවෝය.

විශාඛා කාරණය තේරුම් ගත්තාය. ''කාරණය මට අවබෝධ වුණා, ඇත්ත වශයෙන්ම කොපමණ සෙනඟ ඉන්නවා ද? එපමණ දරුවන් සිටීම ගැන සතුටු වුවත් සෙනෙහස කොපමණ ද එපමණට දුක අධික වන බව මට වැටහිණි. ඔබ වහන්සේ විශේෂයෙන් මේ දේශනාව කළේ මා වෙනුවෙනුයි. නමුත් මේ දේශනාව ඉක්මනට ද අමතක වන්නේ ද මටමයි,'' යැයි විශාඛාව කීවාය.

බුදුරදුන් සෞම්‍ය සිනහවක් පහළ කළහ.

'' ගුරු දේවයාණනි, ඔබ වයන්සේ ගමන් අවසන් කරන්නේ වස් කාලය කිට්ටු වේගන එනවිට නේ ද? ඔබ වහන්සේ මේ ස්ථානයේ නො සිටීම ශිෂ්‍ය භික්ෂූන්ට වේදනාවක් දෙන දෙයක් වෙනවා නේ ද? මමත් විහාරයට එනවා. නමුත් විහාරයේ හිස් බවක් දැනෙනවා. මා ඔබ වහන්සේගේ වට තුනක් කරකැවිලා යන්න යනවා. තේරුම් ගන්න බැහැ කරන්නේ කුමක් ද කියා,'' යැයි විශාඛා කීවාය.

''මහන්සියෙන් භාවනා කිරීම වැදගත් වෙනවා. ඔබ විහාරයට එන සෑම වතාවකම උසස් භික්ෂූන්ගේ ධර්ම දේශනා ඇසීමට ලැබෙනවා නේ ද? ඔබගේ භාවනාවට අදාළ ප්‍රශ්න

ඇත්නම් ඒ ගැනත් ප්‍රශ්න කරන්න පුළුවන්. ගුරුතුමා සහ ගුරුතුමාගේ ශිෂ්‍යයන් ඉගැන්වීම් එකක් බව සිතන්න. මා මේ ස්ථානයේ නැහැ කියලා කවදාවත් ඔබගේ භාවනා ආදී කටයුතුවලට බාධාවක් ඇති වෙන්න දෙන්න එපා,'' යැයි බුදුරදුන් විශාඛා අමතා කීවෝය.

එතැන සිටි ආනන්ද හිමියන් මේ ගැන යෝජනාවක් කළේය. ''යම් කිසි ආකාරයකින් මේ ස්ථානයේ බෝධීන් වහන්සේ නමක් රෝපනය කළොත් හොඳ නේද? ඔබ වහන්සේ විහාරයේ නැති විටක එන අයට ඔබ වහන්සේ වෙනුවෙන් ඒ බෝධි වෘක්ෂයට පූජා කරලා යන්න පුළුවන්කම තියනවා නේ ද?'' යැයි උන් වහන්සේ ඇසීය.

''මා බෝධි වෘක්ෂයට තාප්පයක් බැඳලා දෙන්නම්. ඒ තාප්පය මත වාඩි වී භික්ෂූන්ට පූජා කිරීමටත් මද සුළගේ ආනන්දය ලැබීමටත් ප්‍රයෝජන වේවි. අනෙක් භික්ෂූන්ට බෝධීන් වහන්සේ වටේ ප්‍රදක්ෂිණා කිරීමටත් පුළුවන්කම ඇති වෙනවා නේ ද? නමුත් බෝධි වෘක්ෂයක් ලැබෙන්නේ කෙසේ ද?'' යැයි විශාඛාව ඇසුවාය.

'' ඔබ ඒ ගැන සිතන්න එපා. උරුවේලාවේ දී බුදුරදුන් ස්පර්ශ කළ ජය ශ්‍රී මහා බෝධියෙන් බීජයක් ගෙනැවිත් මා රෝපනය කරන්නම්. එය වැඩෙන තෙක් බලාගන්නම්,'' යනුවෙන් ආනන්ද හිමියන් පැවසීය.

විශාඛාවගේ සතුට නිම් හිම් නැතිව ගියේය. බුදුරදුන්ට සහ ආනන්ද හාමුදුරුවන්ට නමස්කාර කර විශාඛාව ආපසු ගියාය.

## හැට එක් වන පරිච්ඡේදය

# සිංහ නාදය

නැවත ඉපදීම ගැන සඳහන් වන භව චක්‍රය ඉතාමත් ගුප්ත ස්වභාවයෙන් යුක්තය. එය ඉක්මනින් අවබෝධ කර ගැනීම පහසු කාර්යක් නොවේ. වචන මගින් එහි රසය පමණක් උකහා ගත හැකිය. බුදුරජාණන් වහන්සේ මෙසේ පැවසූහ; ''උරුවේල කාශ්‍යප හා ශාරිපුත්ත භික්ෂුව තෙරුවන් සරණ සමාදන් වූයේ භව චක්‍රය පිළිබඳ දේශනාව ඇසීමෙන් පසුවයි. භව චක්‍රය හෙවත් පටිච්ච සමුප්පාදය නිතර මෙනෙහි කිරීම ඉතා වැදගත්, කොළයක් දැකීමෙන්, වර්ෂා ජල බිංදුවක් දැකීමෙන් භව චක්‍රයේ සමීප බව හා දුරස්ථ බව වටහා ගත හැකියි. ඒවා සම්භවය වූයේ කෙසේදැයි වටහා ගැනීමට උත්සාහ ගන්න. එසේම මේ ලෝකය විශාල ජාලයකින් වැසී ඇති බව තේරුම් ගැනීමටත් උත්සාහ ගන්න. එකක් නිසා තව එකක් පහළ වන බවත් තව එකක් පහළ නොවන්නේ නම්, කිසිවක් නැත, යන කාරණය තේරුම් ගැනීම උත්සාහවන්ත වන්න.

''එක් ධර්මතාවක ඉපදීම හා මරණය තවත් ධර්මතාවක ඉපදීම හා මරණයට හේතු වෙනවා. භව චක්‍රය පිළිබඳ සිද්ධාන්තය

එයයි. එය සත්‍යයකි. ප්‍රකෘතිය හෙවත් ස්වභාව ධර්මය එයයි. මේ කාරණය හරි හැටි තේරුම් ගත හොත් සසරින් මිදීම ඉතාමත් පහසුයි.

''භික්ෂුවරුනි, භව චක්‍රයේ ස්තර හා මට්ටම් කිහිපයක්ම තිබෙනවා. නමුත් හඳුනා ගත හැක්කේ කරුණු හතරක් පමණයි. මූලික හේතුව, සහයක හේතුව, ඊට ආසන්නම වූ පූර්ව හේතුව හා හේතුවේ විෂය යනුයි ඒ.

''යම් සංසිද්ධියක් ඇති වීමට නම් පළමුවෙන්ම කිසියම් තත්ත්වයක පැවැත්මක් අවශ්‍ය වෙනවා. නිදසුනක් ලෙස ගොයම් ගසක් උත්පාදනය වීමට වී ඇටයක් අවශ්‍ය වෙනවා. සහායක හේතු ලෙස උපකාරක තත්ත්ව දැක්විය හැකියි. වී ඇටයක පැළවීම සම්බන්ධයෙන් වූ විට ඊට උෂ්ණත්වය, ජලය, මැටි, දේශගුණය යන කාරණ අවශ්‍ය වෙයි. මේ අවශ්‍යතා සම්පූර්ණ නොවුන හොත් වී ඇටයක් ගොයම් ගසක් බවට වර්ධනය වී ගොයම් ගසකින් වී හට ගන්නේ නැත. මේ වැනි සියල්ල ආධාර භූත ලෙස සැලකිය හැකිය.

''භික්ෂුවරුනි, ඉපදීම සහ මරණය දුකට කාරණයක්. ඉපදීම සහ මරණය වෙන්නේ ඇයි? නොදැනුවත්කම, මෝඩකම හෙවත් අවිද්‍යාව නිසයි. ඉපදීම මරණය අතර මානසික තත්වය පෙනෙනවා. මෝහය අවිද්‍යාව නැති කිරීමට සියලු පදාර්ථ පිළිබඳව නිසි අවබෝධයක් තියෙන්න ඕනෑ. ජන්ම මරණ දෙක නැති කළ විට සියලු දුක් නැති වීම ස්වාභාවිකයි.

''භික්ෂුවරුනි, මරණය ගැන සිතන්න වෙන්නේ ඊට පෙර ඉපදීමක් තිබුනහොත් පමණයි. ඉපදීම හා මරණය යන දෙක පැවතීම පිළිබඳව මිනිසා රැවටීමක් වාගේ දෙයක්. නමුත් මිනිස් සමාජය ඉපදීම සහ මරණය ඇත්ත හැටියට සලකනවා. මේ ගැන අවබෝධයක් නැතිකම නිසා එය සිද්ධ වෙන්න කැමැත්තට අනුව යැයි සිතනවා. කැමැත්තත් ඇති වන්නේ මූල භූත කාරණා ගැන අවබෝධයක් නැතිකම නිසයි. මේ ගැන අවබෝධයක් ලැබීමට අපහසු මිනිස් වර්ගයා ඉන්ද්‍රියයන්ගේ සම්පූර්ණයෙන්ම වසඟයට පත්ව අන්ධකාරයේ සිටීම නිසයි. මේ නිසා සිතේ සිතුවිලි ස්වච්ඡ වෙන්නේ නැහැ. සිත ශාන්ත වෙන්නේ නැහැ. සිතේ එකඟ බව සහ අශාන්තිය ඇති වෙන්නේ නොයෙක් උත්තේජන සහ සංවේග ඇති වීම නිසයි. මේ නිසා භවයෙහි මේ කොටස් දොළහ එකකට

එකක් සම්බන්ධ වීම ස්වභාව ධර්මයයි. එක කොටසක් විස්තර කරන විට අනෙක් කොටස් එකොළහම අනිවාර්යයෙන්ම ඊට එකතු වීම ස්වාභාවිකයි.

''භික්ෂුවරුනි, මේ කාරණා දොළහ එකතු කරන කාරණයට කියන්නේ අඥානකම කියාලා. භව චක්‍රය පිළිබඳව ධ්‍යාන කරන විට එහි අඳුර දුරු කරලා සිත දුකින් නිදහස් කරගන්න පුළුවන්කම තියනවා. ආත්මය ගැන සිතන මිනිසා ජන්ම, මරණ දෙක යන කරුණු දෙකේ මැදි වෙනවා. අවධි වූ තැනැත්තා මේ කරුණු දොළහ උපයෝගී කරගෙන සසර දුකින් මිදෙන්න මහන්සි ගන්නවා. භික්ෂුවරුනි, ඉපදීම සහ මරණය යන අවස්ථා දෙකින් පිට පනින්න එපා. ඉන් නිදහස් වීමට උත්සාහ ගන්න. එහි අන්තිම ඵලය නිවන අවබෝධ කර ගැනීමයි.''

දේශනාවෙන් දින කිහිපයකට පසු මුගලන් හාමුදුරුවෝ භික්ෂූන් වහන්සේලා අමතා, ''බුදුහාමුදුරුවෝ මීට කලිනුත් භව චක්‍රය ගැන කිහිපවතාවක්ම අපිට කරුණු ඉදිරිපත් කළා මතක ද? බුදුරදුන් වරක් භව චක්‍රය මහ පොළොවේ ඇඳලත් විස්තර කළා, මතක ද? ගුරුතුමා කිවුවා නේද භව චක්‍රයේ සෑම දෙයක් ම දෑසින් දැකීමට හැකි දේ නොවුනත් එකක් තව එකකට සම්බන්ධ වී තිබීමම එහි ප්‍රධාන ලක්ෂණය හැටියට සලකන්න කියලා. මෝඩකම නිසා සිතේ කේන්තිය ඇතිවීම සංවේග ඇති වීම ආදිය සිද්ධ වෙනවා. මේ ගැන තව දුරටත් සොයා බැලුවොත් ඒකතාවේ අනේකතාව, අනේකතාවේ ඒකතාව දැකීමට පුළුවනි,'' යැයි පැවසුවෝය.

මේ කාලය තුළ බුදුරදුන්ට එරෙහි වූ එක්තරා බමුණු පිරිසක්, තරුණියක ගැබ්බර කළ ඇය මරා දැමුවේ යැයි උන් වහන්සේට චෝදනා කිරීමට සැලසුම් කළෝය. චිංචා නමින් ප්‍රසිද්ධව සිටි බමුණ යුවතියක ඔවුහු මේ සඳහා යොදා ගත්හ. බමුණු සමාජය බේරා ගැනීමට නම්, ඔවුන්ගේ සැලසුමට අනුව කටයුතු කරන මෙන් මේ බමුණු පිරිස චිංචිට කීවෝය. බමුණන් පැවසූ පරිදි හොඳින් හැඳපැළඳ, කොණ්ඩයේ මල් ගසාගෙන ඇය නිතර ජේතවනයට යාමට පටන් ගත්තාය. ධර්ම ශාලාවේ අසුන් නොගෙන හැමටම පෙනෙන පරිදි ඇය ධර්ම ශාලාවෙන් පිටත රැඳී සිටියාය. යන එන අයත් ඇයගෙන් තොරතුරු විමසීමට පටන් ගත්තෝය.

ඇය එසේ තොරතුරු විමසන අයට කීවේ ජේතවනයේ රාත්‍රී නිදා ගැනීම සැපදායක බවය.

මේ බව ඇසූ අය තුළ එතරම් හොඳ හැඟීමක් ඇති වූයේ නැත. උපාසකයන් තුළ විවිධ අදහස් පහළ වුව ද කිසිවෙක් කිසිවක් කීවේ නැත. දිනක් චිංචි බුදුන් වහන්සේ ධර්මය දේශනා කරන ස්ථානයට ආවාය. ඇය ගැබ් ගෙන ඇති බව කාටත් පෙනෙන්නට තිබිණි.

''ඔබ ලොකු ලොකු අයට නොයෙක් දේශනා කරනවා. රජවරු සිටු වරු ඔබ වට කරගෙන ඉන්නවා. නමුත් මේ තමන් වෙනුවෙන් මෙලොවට බිහිවෙන්න ඉන්න අහිංසකයා ගැන යමක් සිතන්නේ නැද්ද? මේ දරුවාගේ වගකීම භාර ගන්නේ කවුද කියා සෙනඟ මැද්දෙන් ඉදිරියට ආ ඇය බුදුන් වහන්සේගෙන් ඇසුවාය.

මුළු සංඝ සමාජයම මේ ගැන බැරෑරුම් ලෙස සිතුවෝය. සියලුම දෙනා බුදුරදුන් දෙස බලන්න ගත්හ. බුදුරදුන් කිසිවක් නොකියා සිනාසුණෝය. ''තරුණිය ඔබ ඔය කියන කතාවේ ඇත්ත දන්නේ ඔබයි මමයි පමණයි නේද?'' යැයි ඇසුවෝය.

''සම්පූර්ණ ඇත්ත මේ කියන කතාවේ සත්‍ය දන්නේ අප දෙන්නා පමණයි.'' සිනාසුණු චිංචිමානවිකාව කීවාය.

මේ සියල්ලම ඇසූ භික්ෂූන්ටත් කාරණය අවබෝධ විය. බොහෝ පෘථග්ජන අය මේ අසාධාරණ කතාවේ සත්‍ය දැනී කෝපයට පත්විය. චිංචි මානවිකාව බියට පත්විය. ඇය සෙනඟ අතරින් බේරී පැන යාමට සූදානම් වන විට කණුවක හැපිණි. මේ අතරින් ඇගේ බඩේ බැඳ තිබූ දර මිටිය කඩාගෙන වැටිණි. ලොකු දර කෑල්ලක් වැටීම නිසා ඇගේ කකුලේ ඇඟිල්ලක් ද තුවාල විය. වේදනාවෙන් ඇය වාඩි වූවාය. ඉන් පසු ඇගේ බඩ සම්පූර්ණයෙන් ම හිස් විය.

රැස්ව සිටි පිරිස සතුටට පත් විණි. බොහෝ අය සිනාසිණි. සමහර අය බමුණන්ට සහ චිංචාට අවනම්බු කළහ. භික්ෂුණී ඛේමා චිංචාට නැගිටින්නට උපකාර කළා. නැවත චිංචාව ධර්ම දේශනා කරන තැනට රැගෙන ගියාය. ඉන් පසු නැවත බුදුරදුන් තම දේශනය ආරම්භ කළහ.

''භික්ෂුවරුනි, මේ මොහොත ගැන සිතේ හොඳ සිහියෙන් සිටින විට අඥානකම ඉබේම නැති වෙනවා. සතර ආර්ය සත්‍යය,

අනිත්‍යතාව, සිහියෙන් සිටීමේ සතර සතිපට්ඨානය, ත්‍රිරත්නය, ආර්ය අෂ්ඨාංගික මාර්ගය මා විසින් දේශනා කළ මේ සියලු කරුණු සිංහ සර්ජනාවක් හැටියට සලකන්න. මින් අනන්ත බ්‍රම්ක සිද්ධාන්ත සරල ක්‍රමයට විසඳන්න හැකියාව තිබෙනවා.

''සිංහයා සියලුම පශු පරම්පරාවේ රජතුමායි. ගුහාවෙන් පිටවෙලා තද හඬක් පිට කරලා, හතර වට හොඳට බලනවා. දඩයම් කිරීමට පෙරත් ගර්ජනා කරනවා. මින් අන්‍ය ප්‍රාණීන් භය වෙලා පැනලා දුවනවා. කුරුල්ලෝ ආකාශයේ ඉහළ තලයටම යනවා. කිඹුල්ලු වතුර යටටම යනවා. නරිත් තම ගුහාව ඇතුළට යනවා. ඒ සමඟ ලොකුවටම දල ඇති ඇත්තු පවා කැලය ඇතුළට රිංගා ගන්නවා.

''භික්ෂුවරුනි, සද්ධර්ම දේශනාව සිංහ සර්ජනාව වගෙයි. බ්‍රාහ්මණ සිද්ධාන්ත ඇති ධර්මය අදහන අය භය භීත වෙනවා. දැන් සැමටම කාලය ඇවිත් තිබෙනවා බ්‍රාහ්මික සිද්ධාන්තවලින් මිදීමට.

''භික්ෂුවරුනි, සද්ධර්ම මාර්ගය බ්‍රහ්මික මාන ජාතික මෝඩ කමින් නිදහස් කිරීමට දැන් අගතැන් ගෙන තිබෙනවා. යම් කිසි කාලයක බුදු කෙනෙක් ලෝකයේ පහළ වෙනවා නම් එදා පටන් ලෝකයේ මෝඩකම් නැති වීම ආරම්භ වෙනවා.

''භික්ෂුවරුනි, මේ ලෝකයේ සත්වයින් කරුණු හතරක දී දැල්වල පැටලෙනවා. පළවෙනි ජාලය කැමැත්ත, දෙවන දැල මෝඩකම. බැඳීම තුන්වන දැලයි. සැක කිරීම හතර වන දැලයි.

''භික්ෂුවරුනි, භව චක්‍රය ගැන නැවත නැවත සිතන්න මේ ගැන පිරිසිදු දැනුමක් ඇති වූවොත් මෝහ දැලෙන් නිදහස් වීම පහසුයි.''

පසුදින බුදුරදුන් මේ සූත්‍රය ආනන්ද හාමුදුරුවන්ට නැවත දේශනා කළෝය. ආනන්ද හාමුදුරුවෝ මේ සූත්‍රයට සිංහනාද සූත්‍රය යනුවෙන් නම් තැබුවෝය.

මෙවර වස් කාලයේ භික්ෂූන් විශාල පිරිසක් මැලේරියාවෙන් සහ බඩේ අමාරුවෙන් පෙළුණෝය. සමහර භික්ෂූන්ගේ ශරීරය කෙතරම් දුබල වී ද කිවහොත් ඒ අයට පිණ්ඩපාතයේ යෑම පවා අපහසු විය. පිණ්ඩපාතයේ වැඩීමට භික්ෂූ තම පිණ්ඩපාතයෙන් කොටසක් අසනීප වූ භික්ෂූන්ටත් වෙන්

කර දුන්හ. ටික දිනක් ගත වන විට අසනීප වූ භික්ෂූන් ක්‍රමයෙන් සුව අතට පත් විය.

දිනක් බුදුරදුන් සමාධි සුවයෙන් වැඩ සිටින අතර මහා කුඹි රැලක් දුටුවෝය. ''ඇයි අද මෙතන මෙතරම් කුඹි,'' යැයි උන් වහන්සේ භික්ෂූන්ගෙන් ඇසුවෝය. භික්ෂූන් වහන්සේලා ''සමහර අසනීප භික්ෂූන්ට ගෙනා පිණ්ඩපාතය නොවළඳා තබා ඉර අවරට ගියාට පසු වළඳන්න බැරි නිසා සත්තුන්ට දැම්මා,'' යැයි භික්ෂූන් වහන්සේ කීහ. ''රෝගී භික්ෂූන්ට වෙලාවක් නියම නැහැ. අවශ්‍ය වෙලාවක දානය ගැනීමට තහනමක් නැත,'' යනුවෙන් බුදුන් වහන්සේ පැවසූහ.

ටික දිනකට පසුව රාජධානියේ ප්‍රසිද්ධ වෛද්‍ය වරයෙක් මුගලන් මහ රහතන් වහන්සේ මුණගැසෙන්නට පැමිණියේය. එසේ පැමිණ වන ඖෂධ කිහිපයක් සඳහන් කර ඒවා රෝගී භික්ෂූන් සඳහා පාවිච්චියට සුදුසු බව කීවේය. ටික දිනකින් ඒ ඖෂධ නිසා ඉතිරිව සිටි අසනීප භික්ෂූන් ද සුව විය.

## හැට දෙවන පරිච්ඡේදය

# ශාරිපුත්ත මහ රහතන් වහන්සේගේ නිවේදනය

වස්කාලය අවසන් වූ පසුව ධර්ම ප්‍රචාරය සඳහා බුදුරජානන් වහන්සේගෙන් අවසර ගත් මුගලන් මහරහතන් වහන්සේ පිටත් වීමට සූදානම් විය. ශරීර සැපය හා හැම අතින්ම ආරක්ෂාව සඳහා ආශීර්වාද කර බුදුහාමුදුරුවෝ මුගලන් මහ රහතන් වහන්සේ ධර්ම ප්‍රචාරක කටයුතු සඳහා පිටත් කළහ.

ශාරිපුත්ත මහ රහතන් වහන්සේ බුදුරදුන් සමීපයෙන් පිටත් වී ටික වේලාවකට පසුව බුදුරදුන් හමුවට එක් භික්ෂුවක් පැමිණ ශාරිපුත්ත මහ රහතන් වහන්සේගේ අභද්‍ර ව්‍යවහාරය ගැන චෝදනා කළේය.

'' ශාරිපුත්ත මහ රහතන් වහන්සේගෙන් යන්නේ කොහේද කියලා ඇහැව්වාම කිසිම උත්තරයක් නොදී තමන් වහන්සේව තල්ලු කර දැමුවා. ඒ නිසා තමන් බිම පෙරළිලා ගියා. ඒ කරපු වැරැද්දට සමාව ගත්තෙත් නැහැ. සද්ද නැතිව යන්න ගියා,'' ඒ භික්ෂුව පැවසුවේය.

''මා දන්න තරමින් ශාරිපුත්ත තවම වැඩි දුර ගොස් නැහැ. සාමණේර කෙනෙකු යවා ශාරිපුත්තට ආපසු ඇවිත් මා මුණගැසෙන්න කියන්න,'' යැයි බුදුරදුන් ආනන්ද හිමියන්ට පැවසූහ.

බුදුරජාණන් වහන්සේ පැවසූ පරිදි ආනන්ද හාමුදුරුවන් මුගලන් මහ රහතන් වහන්සේව නැවත ජේතවනයට කැඳවා ගත්තේය. ''අද හවස සියලුම භික්ෂූන්ගේ රැස්වීමක් තියනවා. සියලුම දෙනා ඒ සඳහා එකතු වෙන්න ඕනෑ බුදුරදුන් පැවසූහ. රැස්වීම අවස්ථාවේ බුදුරජාණන් වහන්සේ මුගලන් හාමුදුරුවන්ට අමතා ඔබ වහන්සේ එක් භික්ෂූන් වහන්සේ නමක් තල්ලු කර බිමට පෙරළලා ගියා, යැයි කියලා චෝදනාවක් තියනවා,'' යනුවෙන් පැවසූහ.

ශාරිපුත්ත ජ්‍යෙෂ්ඨයෙක් නිසා උන් වහන්සේ කළ වරදක් නම් බුදුරදුන් උන් වහන්සේව ඉන් නිදහස් කර ගැනීමට උත්සාහ දරාවි යනුවෙන් සමහර භික්ෂූන් සිතූහ. නමුත් එදා බුදුරදුන් ශාරිපුත්ත පමණක් නොව, අනෙක් භික්ෂූන්ගේ ද දොස් ගෙනහැර දැක්වූවෝය. ශාරිපුත්ත මහ රහතන් වහන්සේ බුදුරදුන් තමන් සමීපයේම වාඩි කර ගත් කාලයක් ද විය. ඒ නිසා සමහර පෘථග්ජන භික්ෂූහු ශාරිපුත්ත මහ රහතන් වහන්සේ ගැන ඊර්ෂ්‍යා සහගතව සිටියෝය.

දැනට අවුරුදු අටකට පෙර සැරියුත් මුගලන් දෙනම ගැන ගෝබලික භික්ෂුව කෙතරම් චෝදනා කළා දැයි ආනන්ද නහිමියන්ට සිහි විය. බුදුරදුන්ගේ අවවාදවලින් පසුවත් ගෝබාලික තම අදහස් අත් හැරියේ නැත. ශාරිපුත්ත මුගලන් දෙදෙනාම හරිම අහංකාරයි. තමන් ගැන ලොකුවට හිතාගෙන සිටින්නේ යැයි ගෝබාලික නිතරම කීවේය.

බුදුරදුන් තනිවම ගෝබාලික භික්ෂුවට කරුණු කීහ. අගසව් දෙනම අවංකවම තම කටයුතු සිද්ධ කරන බව පැහැදිලි යැයි පැවසූහ.

නමුත් ගෝබාලික ඊර්ෂ්‍යාව ඉවසාගත නොහැකි තැන රජගහ නුවරට ගොස් දේවදත්තගේ ප්‍රධාන සහායක හැටියට පත්විණි.

මෙවැනි කරුණු ආනන්ද හොඳින් දැනගෙන සිටියේය. ඒ නිසා ප්‍රධාන උපස්ථායක තනතුර බාර ගැනීමට දී ආනන්ද අදිමදි කළේය. බුදුරදුන්ගේ කුටියට නොයෑම. බුදුරදුන්ගේ දානය නොවැළඳීම ආදී කරුණු ගැන ආනන්ද හාමුදුරුවෝ සිතුවේ ගෝබාලික භික්ෂුව වැනි භික්ෂූන් කියන දේ උන් වහන්සේගේ කනට ඇසුණු නිසාය.

බුදුරදුන් තමන් වහන්සේලා ගැන එතරම්ම හිත යොමු කරවන්නේ නැතැයි යනුවෙන් සමහර භික්ෂූහු සිතූහ. මේ ආදී

කරුණු නිසා භික්ෂූන් අතර ඊර්ෂාව වර්ධනය වී, ඔවුන් බුදුන් වහන්සේ අතහැර යනු ඇතැයි ආනන්ද හිමි කල්පනා කළේය.

කෝසම්බියේ කම්මාසදම්ම ග්‍රාමයේ දී සිදු වූ සිද්ධියක් ආනන්ද හිමියන්ට සිහිපත් විය. මාගන්ධි නමින් හැඳින් වූ රූමත් මානවිකාවක් එහි සිටියේය. බුදුරජාණන් වහන්සේ ඇය කෙරේ අවධාන යොමු නොකරන්නේය යනුවෙන් කල්පනා කළ ඇය උන් වහන්සේ සමඟ වෛර බැඳ ගත්තාය. ඇයගේ රූමත් බව නිසා ඇය කෙරේ විශේෂත්වයක් දක්වනු ඇතැයි ඇය සැමවිටම සිතුවාය. ඇය බ්‍රාහ්මණ යුවතියකි. ඇය හමුවන විට බුදුන් වහන්සේ හතලිස් හතර වැනි වියට පත්ව සිටියෝය. මාගන්ධියගේ රූපය නිසා බුදුන් වහන්සේ ඇයට ප්‍රේම කරනු ඇතැයි ඇය කල්පනා කළාය. බුදුන් වහන්සේගේ රූප සම්පත්තිය නිසා ඇය වේදනා වින්දාය. ඇය බුදුරදුන්ගේ අවධානය යොමු කර ගැනීමට හැකි සෑම දෙයක් ම කළාය. එහෙත් උන් වහන්සේ ඇය කෙරේ යොමු කළේත් අන් අය කෙරෙහි යොමු කරන අවධානයමය.

අවසානයේ ඇයගේ ප්‍රේමය වෛරයකට පෙරළිණි. ඇය බුදුරදුන් කෙරෙහි ඊර්ෂ්‍යා සහගත ද විය. ටික කලකින් ඇය උදේනි රජතුමා සමඟ විවාහ වූවාය. ඉන් පසුව බුදුරදුන්ගෙන් පළිගැනීම පිණිස මුළු රාජ්‍ය බලයට යෙදුවාය.

බුදුරදුන්ට විරුද්ධව නොයෙක් චෝදනා නැගුවාය. රජතුමා ඉතාම ප්‍රිය කරන අතියම් බිසවක් බුදුරදුන්ට වැඩිපුර සලකන්න ගත් විට ඇගේ නම සඳහන් කර අවනම්බු කිරීමට පටන් ගත්තාය.

මේ කරුණු සියල්ලම දැනගත් ආනන්ද ධර්ම ප්‍රචාරක කටයුතු ඉතා හොඳින් කරදරයක් නැතිව සිද්ධ කරන්න කෝසම්බිය අතහැර යාමට යෝජනා කළේය.

ඊළඟට යන තැනත් මෙවැන්නක් සිදුවුවහොත් කරන්නේ කුමක්දැයි බුදුරදුන් ඇසුවෝය.

එතැනත් අතහැරලා අපි වෙන දිහාවකට යමු යැයි ආනන්ද හිමියෝ කීහ. බුදුහාමුදුරුවෝ මේ යෝජනාව පිළිගත්තේ නැත. ''අමාරුවක්, අවනම්බුවක් ඇති වූ විට සිත දුර්වල කරගන්න එපා. කරදරය, අවමානය අතරින් ඉන් නිදහස් වීමේ මාර්ගය සොයාගන්න මහන්සි ගන්න ඕනෑ. යම් කිසි ආකාරයකින් අපි සම මෙත සාදාගෙන ප්‍රශ්නය දෙස බැලුවොත් මේ ලෝකයේ කිසිම ප්‍රශ්නයකට බය වෙන්න අවශ්‍ය නැහැ. තමන් විසින් කරන හැසිරීම හෙවත් ආචරණය තමයි තමන්ට දුක හෝ සැප හෝ පමුණුවන්නේ.

යම් කිසි කෙනෙක් උඩ බලාගෙන කෙළ ගැසුවොත් එය එන්නේ තමන්ගේ මුහුණටමයි,'' යැයි පැවසූහ.

ආනන්ද කිසි දිනක ශාරිපුත්තගේ ප්‍රශ්නය ගැන සිතා කරදරයට පත් වූයේ නැත. බුදුරදුන් උන් වහන්සේ ගැන සිතූ ආකාරයත් නිවැරදියි යැයි පිළිගත්තේය. ශාරිපුත්ත හිමියන් සංඝ සමාජයේ ඉතා විශිෂ්ඨ ගණයේ කෙනෙක් ලෙස කවුරුත් පිළිගෙන තිබුණේය. උන් වහන්සේගේ ඇති අති විශිෂ්ඨ ගතිය නිසාම බුදුරදුන් උන් වහන්සේගේ මාර්ග දර්ශනය භික්ෂූන්ට ලැබිය යුතු බව පිළිගත්තේය. ශාරිපුත්ත මහ රහතන් වහන්සේ හත්ථිපාද සූත්‍රය හෙවත් හත්ථිපදෝපම සූත්‍රය ආදී සූත්‍ර කිහිපයක්ම දේශනා කළෝය. එකී සූත්‍රවල චතුරාර්ය සත්‍යය, ස්කන්ධ පහ ආදිය ගැන සවිස්තරව කරුණු සඳහන් විය.

බුදුරජාණන් වහන්සේ දම් සභා මණ්ඩපයට ඇතුළු වන විටම සියලුම භික්ෂූන් නැගිට දෑත් එකතු කර බුදුරදුන්ට නමස්කාර කළහ. බුදුරජාණන් වහන්සේ දම්සභා මණ්ඩපයට ඇතුළු වී භික්ෂූන්ටත් වාඩි වන ලෙස දන්වා ශාරිපුත්ත හිමියන්ට තමන් ඉදිරිපිට පුටුවේ වාඩිවෙන ලෙස කීවෝය. ''ඔබ වහන්සේ ගැන එක් භික්ෂුවක් චෝදනා කළා. උන් වහන්සේව තල්ලු කරලා බිම දාලා ගියා, අඩුම තරමින් සමාව ගත්තේත් නැහැ. ඔබට මේ ගැන යමක් කියන්න තියනවා ද?'' යනුවෙන් ශාරිපුත්ත හිමියන්ගෙන් බුදුන් වහන්සේ ඇසූහ.

ශාරිපුත්ත මහරහතන් වහන්සේ නැගී සිට බුදුරජාණන් වහන්සේට නමස්කාර කළෝය. ඊට පසු භික්ෂු මහා සංඝයාට නමස්කාර කළෝය. ''ආචාර්යවරයාණනි, යම් කිසි භික්ෂුවක් ධ්‍යාන භාවනා කරන්නේ නැත්නම් ශරීරයේ ක්‍රියා කලාප ගැන සිත යොමු කරන්නේ නැත්නම් ඒවාගේ කෙනෙකුව තල්ලු කරන්න පුළුවන්. සමාව ගන්නේ නැතිව යන්නත් පුළුවන්. ඔබ වහන්සේත් අවුරුදු දහ හතරකට පෙර භික්ෂු රාහුලට කළේ ඒක නේ. ඒ කාරණය අදත් මට හොඳටම මතකයි,'' යනුවෙන් ශාරිපුත්ත මහ තෙරණුවෝ පැවසූහ.

''ඒ කාලයේ ආනන්දගේ වයස අවුරුදු දහ අටයි. මට මතකයි ඔබ වහන්සේ ආනන්දට කිවුවා පෘථිවි, ජලය, අග්නි, වායු යන කරුණු හතර ගැන ධ්‍යාන කරන්න කියලා. මාත් ඒ ගැන අහගෙන හිටියා. ඉඳලා දූනට අවුරුදු දහ හතරක සිට මේ ධ්‍යාන

භාවනාව කරනවා. ඉන් මට විශේෂ ප්‍රතිඵල ලැබුණා. මේ ගැන ඔබ වහන්සේට ඉතාම ස්තුතියි.

''මා පෘථිවිය වගේ වෙන්න කියලා අභ්‍යාස කළා. පෘථිවිය විශාලයි කියා නිතර සිතුවා. ඕනෑ දෙයක් බාර ගැනීමට සහ පරිවර්තනය කිරීමේ ශක්තිය එහි තියනවා. ගඳ සුවඳ දෙකම පෘථිවිය පිළිගන්නවා. මේ දෙකින්ම පෘථිවිය අසතුටට හෝ සතුටට හෝ පත් වන්නේ නැහැ. මේ නිසා මා ශරීරය පෘථිවිය සේ වෙන්න ඕනෑ ක්‍රමයට භාවනා කළා.

''මා ජලය වගේ වෙන්න කියලා භාවනා කළා. ජලයට හොඳ දේ හරි නරක දේ හරි දාන්න. ජලය මේ දෙකම පිළිගන්නවා. ජලය ප්‍රවාහිකයි. මේ නිසා එහි අඩංගු දේ පරිවර්තනය කිරීමට හැකියාව තියනවා. මා මගේ ශරීරය සිත යන දෙක ජලය වගේ කරන්න ඕනෑ කියලා භාවනා කළා.

''ගින්දර ශුද්ධ අශුද්ධ හැම දේම සම සමව පුච්චලා දානවා. මාත් මගේ සිත සහ ශරීරය ගින්දර වගේ කරන්න භාවනා කළා. ගුරු දේවයාණනි. මා මගේ සිත හා කය වායුව වගේ කරන්න භාවනා කළා. යම් කිසි භික්ෂුවක් ශරීරය කය වශයෙන් බලන්නේ නැත්නම් ශරීරයේ ක්‍රියා කලාප ගැන සිහියෙන් නැත්නම් ඒ භික්ෂුව තල්ලු කරලා බිම පෙරළන්න පුළුවන්. සමාව නොඉල්ලා යන්නත් පුළුවන්. නමුත් මා එසේ කරන කෙනෙක් නොවෙයි.

''බුදුරජාණන් වහන්ස, කැලිකැලිවලට කැපූ සිවුරක් අඳින, අනුන් දෙන පිණ්ඩපාතයෙන් යැපෙන මා වැනි කෙනෙක් ළඟ අහංකාරයක් තියෙන්නේ කොහොම ද? මගේ හදවත පුංචි දරුවෙකුගේ හදවත වගේ කරන්න මා හැම විටම මහන්සි වෙනවා. මා නිහතමානී ගතිය හිතේ ඇති කර ගැනීමට අභ්‍යාස කළා. කිසි කෙනෙකුව පහත් කරලා කිසි කෙනෙකුට උඩින් යන්න මා උත්සාහ ගත්තේත් නැහැ.

''යම්කිසි භික්ෂුවක් කය ගැන සිතන්නේ නැත්නම් කයේ ක්‍රියාකලාපය, ගැන සිතන්නේ නැත්නම් එකී භික්ෂුව තල්ලු කරලා යන්නත් පුළුවන්. සමාව නොඉල්ලන්නත් පුළුවන්. නමුත් මට එහෙම කරන්න අවශ්‍ය නැහැ.'' ශාරිපුත්ත මහ රහතන් වහන්සේ තවත් යමක් කීමට උත්සාහ ගත්තෝය. චෝදනා කරන ලද භික්ෂූන් වහන්සේ නැඟී සිට සිවුර ඒකාන්ස කර දෑත් එකතු කර කළ චෝදනාවට සමාව ගත්තේය. ''මා ශීලාචාරය උල්ලංඝණය කළා. ශාරිපුත්ත හිමියන්ට විරුද්ධව අසත්‍යය සත්‍ය කරන්න මහන්සි

ගත්තා. සියලුම භික්ෂූන් ඉදිරියේ නැවතත් මා සමාව අයදිනවා. අනාගතයේ දී ශීලය රැකීමට සියලුම දෙනා ඉදිරියේ දී පොරොන්දු වෙනවා,'' යැයි කීවේය.

''ශීලය බිඳ ගැනීම ගැන ඔබ බුදුරදුන් ඇතුළු භික්ෂු මහා සංඝයා ළඟ සමාව ගත්ත එක වැදගත් දෙයක්. ඔබ කළ අපරාධය පිළිගැනීම ගැන මා සතුටු වෙනවා,'' බුදුරදුන් පැවසූහ.

''මගේ සහෝදර භික්ෂුව ගැන මා කිසිම අහිතක් හිතන්නේ නැහැ. නොදැනීමකින් හෝ අතීතයේ මගෙන් සුළු වරදක් හෝ උණානම් ඒ ගැන මට සමාවෙන්න,'' යැයි ශාරිපුත්ත මහරහතන් වහන්සේ ඉන්පසු පැවසූහ.

චෝදනා කළ භික්ෂුව ශාරිපුත්තට දෑත් එක්කොට මස්කාර කළේය. ප්‍රශ්නය ඉතාම ප්‍රශන්නතා පූර්වකව අවසන් වීම නිසා කවුරුත් සතුටු විය. ආනන්ද හාමුදුරුවෝ දෑත් එක්කොට ශාරිපුත්ත මහ රහතන් වහන්සේට නමස්කාර කොට ''තව ටික දවසක් උන් වහන්සේ සමඟ ඉන්න. චෝදනාවට සමාව ගත් භික්ෂූන් වහන්සේ ඔබ වහන්සේ සමඟ තව ටික දවසක් ධර්මය ගැන සාකච්ඡා කරන්න එකට ඉන්න කැමතියි,'' යනුවෙන් ඉල්ලා සිටියේය. ශාරිපුත්ත මහරහතන් වහන්සේ සිනා සී යෝජනාව බාරගත්තේය.

වර්ෂා කාලය අවසන් වීම සමඟම බුදුරදුන් ගමේ ධර්මප්‍රචාරය සඳහා වැඩියෝය. දිනක් කාලාම ගමේ කේස පුත්තට ධර්ම දේශනා කරමින් සිටියෝය. මේ දේශනාව ශ්‍රවණය කිරීමට තරුණ පිරිස බොහෝ රැස් වී සිටිහ. මේ තරුණ පිරිස බුදුරදුන් ගැන බොහෝ ගුණ අසා තිබිණි. නමුත් බුදුරදුන් පළමු වරට දුටුවේ එදිනය.

එක් තරුණයෙක් නැගිට, ''ගුරුතුමනි බොහෝ කාලයක සිට කේසපුත්ත ගමට නොයෙක් උගත් බමුණු පිරිස නිතරනිතර ඇවිත් දේශනා පවත්වලා යනවා. ඒ අය ධර්මය ගැන විවිධ මත පළ කරනවා. සියලුම දෙනා තම මතය අනෙක් අයගේ මතයට වඩා හොඳ බව කියනවා. මේ ගැන අපට කිසි දෙයක් තේරුම් ගන්න අපහසුයි. ඇත්තම කියනවා නම් අපට දැන් මේ දහම් දර්ශන හොඳටම තිත්ත වෙලයි තියෙන්නේ.

''අප අසා තිබෙනවා ඔබ වහන්සේ බුද්ධත්වය අවබෝධ කරගත් කෙනෙක් කියලා. කරුණාකරලා අපට කියන්න මොන මඟ ද යන්න හොඳ? මොන මඟ ද නරක කියලා,'' යැයි ඉල්ලා සිටියේය.

''මට අවබෝධ වෙනවා ඔබ කියන්නේ කුමක් ද කියලා. මිත්‍රවරුනි, කිසිම දෙයක් හෝ කිසිම පුද්ගලයෙකු හෝ ඉක්මනටම

විශ්වාස කරන්න එපා. ඒ කීම කිහිප වරක් කිවුවා වෙන්න පුළුවන්. මේ කියමන වැදගත් ධර්ම ග්‍රන්ථයක ලියලා තියෙන්නේ, මේ කාරණය ප්‍රසිද්ධ ආචාර්යවරයෙක් කියලා තියෙන්නේ, කියලා ඒ කාරණය පිළිගන්න එපා.

''ඔබගේ බුද්ධියට වැටහෙන්නේ මොන කාරණය ද ඒ කාරණය ගැන ඉතාම හොඳට සොයලා බලලා හිතට ගන්න. ඒ දේ තමන්ට සහ තමන් සිටින සමාජයට ප්‍රයෝජනවත් වෙන්නේ කොහොම ද? යන කාරණය ගැනත් හිතන්න,'' යැයි බුදුන් වහන්සේ පැවසුවෝය.

තවත් ධර්මය ගැන කරුණු කියන්න යැයි, ඉන්පසු කාලාම ගමේ අය බුදුරජාණන් වහන්සේගෙන් සිටියෝය.

''මිත්‍රවරුනි, කවුරු හරි කෙනෙකුට ක්‍රෝධය, ලෝභය සහ අඥාන කම ඇතිව කරන කාර්යයේත් කියන දෙයින්, හිතන දෙයින් ඇති වන්නේ දුකක් ද සැපක් ද?''

''මේ සිතුවිලිවලින් නරකක් මිසක් හොඳක් වෙන්නේ නැහැ. ඉන් තමන්ටත් අනුන්ටත් වෙන්නේ සැපක් නොවෙයි දුකක්. කරුණාව මෛත්‍රිය සමානාත්මතාව, සහනභූති බව සතුට අනෙක් අයගේ දුකේ දී දුක් වන අනේක අයට සතුට දෙන අන් අයගේ සතුට දකින්න කැමති මේ පුද්ගලයාට ඇති වන්නේ දුකක් ද සැපක් ද? බුදුන් වහන්සේ පිළිතුරු දුන්නෝය.

''ගුරුතුමනි, ඒවාගේ ගුණ ඇති අය නිසා තමන්ටත් අවට ඉන්න අයටත් සැපතක් මිස දුකක් වෙන්න කිසිම හේතුවක් නැහැ.''

''ප්‍රේම පූර්ණ කරුණාව ඇති, සතුටින් සිටින ඥාණවන්ත සහ ගුණවන්ත පුද්ගලයාට ජන සමර්ථය ලැබෙනවා ද නැද්ද?''

''ගුරුතුමනි, සම්පූර්ණයෙන්ම ලැබෙනවා.''

''මිත්‍රවරුනි, මේ කාගේත් ක්‍රියා, වචන, සියල්ලම හොඳ හැටි තේරුම් ගැනීමේ ශක්තියක් ඔබ සැමටම තියනවා නේ ද? තමන්ට නොගැලපෙන දෙයක් ඇත්නම් ඒ ටික අත්හැරලා දාන්න.''

කාලාම ගමේ තරුණ පිරිස බුදුරදුන්ගේ දේශනාවෙන් සතුටට පත්වූහ. බුදුන් වහන්සේගේ ධර්මය පිළිපැදීමට කිසිම බැඳීමක් නැති නිසා නිදහස අදහස් සහ සත්‍යය අනුව සම්මාන පූර්වකව පිළිගන්න පුළුවන්කම ඇති බව කවුරුත් පිළිගත්තෝය.

එදා කාලාම ගමේ බොහෝ තරුණයෝ බුදුරදුන්ගේ පාමුල තුනුරුවන් සරණ සමාදන් වූහ.

## හැට තුන් වන පරිච්ඡේදය

# මහ මුහුද දක්වා ගමනක්

තම ධර්ම ප්‍රචාරක ගමනේ දී බුදුරදුන් අලවි ගමේ නතර වූවෝය. ඒ ගමේ ඇති පොදු සමාජ සේවා ගොඩනැගිල්ලක බුදුරදුන් භික්ෂූන් සහ අනෙක් අයට දානය පිළිගන්වන ලදි. දානයෙන් පසුව බුදුරදුන් තම දේශනාව ආරම්භ කිරීමට සූදානම් වූහ. මහන්සියෙන් යුක්ත ගොවියෙක් බුදුරදුන් ඉදිරියට පැමිණියේය. ඒ ගොවියා තම මීහරකා සොයන ගමනුයි මෙතනට පැමිණ සිටියේ.

නැති වූ මී හරකා නොලැබීමත් මහන්සියත් බඩගින්නත් තුනම මේ ගොවියාට දුකට හේතුවක් වී තිබිණ. මේ ගොවියාට කෑම කිසිවක් ලැබී නැති බව බුදුරදුන්ට දැනිණි. ''ඉස්සර වෙලා මේ ගොවියාට කෑම ටිකක් දෙන්න. ඉන් පස්සේ ධර්ම දේශනාව ආරම්භ කරනවා,'' යැයි බුදුන් වහන්සේ පැවසූහ. ''මේ ගොවියා නිසා ධර්ම දේශනාව ප්‍රමාද කළේ ඇයි ද?'' යි භික්ෂූන්ට වටහා ගත නොහැකි විය.

''සහෝදරවරුනි, අපේ එක් සහෝදරයෙක් හොඳටම බඩගින්නේ ඉන්නවිට මා ධර්ම දේශනා කළොත් ඔහුට ඒ ධර්ම

දේහනාව කොහාම හිතට අල්ලයි ද?''යනුවෙන් රැස්ව සිටි පිරිසගෙන් ඇසුවෝය.

''බඩගින්න තරම් ලොකු ලෙඩක් මේ ලෝකයේ නැහැ. බඩගින්න අපේ ශරීර ශක්තිය අඩු කරනවා. අපේ සැපත, සතුට, වර්ණය, ආයුෂය, අඩු කරනවා. බඩගින්නේ ඉඩන්නේ කවුද? ඒ අයව අප අමතක කරන්න හොඳ නැහැ. එක් වරක් කෑම නො ලැබුනොත් කොච්චර අපහසු වෙනවා ද? දවසක්, සුමානයක් කාට හරි කෑම ලැබුනේ නැත්නම් ඒ මනුෂ්‍යයා ගැන හිතන්න කොහාම ද කියලා. කාලය ඇවිත් තියනවා. අපිට සොයන්න වෙලා තියනවා යම් කිසි මාර්ගයක් මේ ලෝකයේ කිසිම කෙනෙකුව බඩගින්නේ නො තියන්න,'' බුදුන් වහන්සේ තවදුරටත් පැවසූහ.

ආලවියෙන් පසුව බුදුරදුන් ගංගා නදියේ උතුරු පශ්චිම පිහිටි කෝසම්බියට ගියෝය. ටික දුරක් යනවිට නදියේ දර කොටයක් පාවෙන බව දුටුවෝය. බුදුරදුන් එය දෙස බලාගෙන සිටියෝය. අනෙක් භික්ෂූන් වහන්සේලාටත් කතා කොට පාවෙන දරකොටය පෙන්නුවෝය. භික්ෂුවරුනි, මේ දර කොටය නදී ඉවුරේ හිර වුනේ නැත්නම් නදියේ ගිලුනේ නැත්නම් වැලිවලින් වැසුනේ නැත්නම් ඇතුළෙන් සහ පිටින් කුණු වී දියවී ගියේ නැත්නම් කවුරු හෝ උස්සාගෙන ගියේ නැත්නම් කිසි දේකට පැටලුනේ නැත්නම් කෙළින් ම මහ මුහුද කරා යාම සිද්ධ වෙනවා නේද? දර කොටය පෙන්නීමෙන් අනතුරුව උන් වහන්සේ ඇසූහ.

මේ කාරණය ධර්මය ගැන ද සම්බන්ධ කරගන්න. දර කොටයට සඳහන් කළ කරදර කිසිවක්ට දර කොටය අසු වුනේ නැත්නම් සමුද්‍රයට යන්නා සේ ඔබ වහන්සේලාත් බව තරණය දී සද්ධර්මය ගැන සිත යෙදුවොත් සංසාර සාගරයෙන් නතර වීම නැමති සමුද්‍රයට හෙවත් නිවනට යා හැකිය; යනුවෙන් විස්තර කළෝය.

භික්ෂූන් වහන්සේලා ''ගුරුතුමනි, මේ ගැන තව ටිකක් විස්තර කරන්න. ගඟ අයිනේ නතර වීම, ගඟේ ගිලීම, වැලි තලයේ එරීම, ආදිය විස්තර කරදෙන්න,'' යැයි භික්ෂූහු ඉල්ලා සිටියහ.

''ගඟ අයිනේ නතර වීම කියන්නේ. ඉන්ද්‍රිය හයෙන් එකක හෝ දෙකක හෝ තුනක හෝ නැතිනම් හයෙන්ම හෝ සෑදීම. භාවනා කිරීමෙන් ඉන් මිදෙන්න පුළුවන්. ගිලෙන අදහස

ආශාවන්ගෙන් සිත පිරී යෑම. ආශාවන් අධික වූ විට භාවනා කිරීමේ සිත අඩු වෙනවා. වැලි වලින් වැසී යාමේ අදහස ආත්මාර්ථකාමී බව, සෑම විටම තමන්ගේ නම උසස් කර ගැනීම. තමන්ගේ ලාභය ගැන සිතීම. මින් සිදුවන්නේ ධ්‍යානයෙන් හෙවත් භාවනාවෙන සඳහටම තම හදවත ඈත් වීමයි. ජලයෙන් අයින් කිරීම යන්නෙන් අදහස් කළේ තම ජීවිතය කිසිම අර්ථයක් නැති දෙයක් බවට පත් වීම සහ තේරුමක් නැති පුහු මිනිසුන් සමඟ අතන මෙතන ඇවිදීම. අන්‍ය දෙයෙහි පැටලීම යන්නෙන් අදහස් කළේ කෑම ගැන, වාසනාව ගැන සිතීම නිදාගැනීම අලසකම නොලැබෙන දේ ගැන සිහින මැවීම යන දෙයයි. ඇතුළෙන් කුණු වෙන අර්ථය නම් සමාජයට පෙන්වන නැති හොඳ ගුණ, සංඝයා රැවටීම ධර්මය තම පෞද්ගලික කටයුතු සඳහා උපයෝගී කර ගැනීම.

''භික්ෂුවරුනි, ඔබ සෑම හරි හැටි මහන්සියෙන් ධ්‍යාන භාවනා කළොත් මේ ක්‍රම හයෙන් කිසිම දේකට හසු නොවී ඉන්න පුළුවන්. එමඟින් සසර දුක නැති කර නිවන් අවබෝධ කරගන්න පුලුවන්. අර දර කොටය සියලු බාධාවන්ගෙන් මිදී සමුද්‍රයට යනවා වගේ.'' දේශනාව ආරම්භ කළ බුදුන් වහන්සේ පැවසූහ.

බුදුරදුන් මේ කතාව භික්ෂූන්ට විස්තර කර දෙන විට එක ගොපලු දරුවෙක් එය අසාගෙන සිටියේය. ඒ ළමයාගේ නම නන්ද යි. මේ ළමයා බුදුරදුන්ගේ දේශනාවට බොහෝ සේ කැමති විණි. ''තමන්වත් සසුනට ඇතුළු කරගන්න යැයි ඉල්ලා සිටියේය. ගුරුතුමනි, මාත් මේ අය වගේ ඔබ වහන්සේගේ ශිෂ්‍යයෙක් වී ඔබතුමාගේ ධර්ම මාර්ගය අනුගමනය කරන්න කැමතියි. මම කවදාවත් ගඟ ඉවුරට ගිහිල්ලා නතර වෙන්නෙත් නැහැ. ගඟේ ගිලෙන්නෙත් නැහැ, වැලි වලට යට වෙන්නේත් නැහැ. වතුරෙන් ගොඩට එන්නෙත් නැහැ. වෙන කිසිවක පැටලෙන්නේත් නැහැ. ඇතුළෙන් කුණු වෙන්නේත් නැහැ. දිගටම සමුද්‍රයට යන්න සෑම උත්සාහයක්ම ගන්නවා.''යැයි කියුවේය. බුදුරදුන් තරුණයාව ගැන ප්‍රසන්න භාවයට පත් වූවේය. මේ ළමයා උත්සාහ වන්ත යමක් කිරීමට හැකි කෙනෙක් යැයි බුදුරදුන්ට දැනිණි. නමුත් කිසිම ඉගෙනීමක් හෝ ශිල්ප දැනුමක් හෝ ඔහුට තිබූ බවක් පෙනුණේ නැත.

''නුඹගේ වයස කීයද? යැයි බුදුරදුන් විමසුවෝය.

අවුරුදු එකොළහක් යැයි නන්ද කීවේය. අම්මා තාත්තා ජීවතුන් අතර නැති බවත් තමන්ගේ කියා පවුලේ කිසිවෙක් නැති බවත් ගමේ පොහොසත්ම තැනැත්තාගේ මී ගවයන් බලා ගැනීම කරන බවත් ඔහු වැඩිදුරටත් අසද්දී බුදුහාමුදුරුවන් සමඟ පැවසීය.

නුඹ දවසකට එක් වරක් කෑම කාලා ඉන්න පුළුවන්කම ඇති කෙනෙක් ද යැයි බුදුරදුන් ඇසුවෝය. ''දිනකට එක් වරක් කෑම කාලා ඉන්න එක මා දන් අවුරුදු ගණනක ඉඳලා කරන දෙයක්,'' යැයි නන්ද පැවසීය.

''නුඹගේ වයස අවුරුදු විස්ස සම්පූර්ණ වූ විට නුඹව පැවිදි කරන්න පුළුවන්කම තිබෙනවා. කිසිම කෙනෙක් අවුරුදු විස්ස සම්පූර්ණ වන්න කලින් තේරුම් ගන්නේ නැහැ ගිහිජීවිතය අත හැර පැවිදි වන්නේ ඇයි කියලා. නමුත් නුඹ අනෙක් ළමයින්ට වඩා වෙනස් කෙනෙක්. ඒ නිසා නුඹට පුංචි නිදහසක් දෙන්න පුළුවන්. නුඹ අවුරුදු හතරක් ගත වෙන තෙක් සාමනේර කෙනෙක් හැටියට කාලය ගත කරන්න. මේ කාලය තුළ ධ්‍යාන භාවනා ආදිය ඉතා හොඳින් කරන්න. ඉන් පසු නුඹව පැවිදි ජීවිතයට ඇතුළත් කර ගන්නවා. දන් ගිහිල්ලා මී ගවයන් අයිතිකාරයාට ඔවුන් බාර දීලා අද ඉඳලා රස්සාවට එන්නේ නැහැ කියලා කියලා එන්න. නුඹ එනතෙක් මා මෙතනම බලා ඉන්නම්,'' බුදුන් වහන්සේ ආනන්ද අමතා කීවෝය.

ගුරුතුමනි, එහෙම කරන් ඕනෑ නැහැ. මේ හරකුන් ඉතාම කීකරුයි. උන්ට පුරුදු කර තියන ආකාරයට අනුව සවසට යා යුතු තැනට උන් යනවා,'' ළමයා කීවේය.

''එහෙම කරන්න එපා. නුඹම මී හරක් ටික අරගෙන ගිහින් අයිතිකාරයාට බාර දීලා පැවිදි බිමට අවසර අරගෙන එන්න,'' බුදුන් වහන්සේ පැවසූහ.

''මා ආපසු එනවිට ඔබ වහන්සේ ගිහිල්ලා තිබුණොත්?'' යැයි නන්ද ප්‍රශ්න කළේය.

''නුඹ ඒ ගැන සැක සිතන්න එපා. නුඹ එන තෙක් මා මෙතැනින් යන්නේ නැහැ,''

''ස්වස්ති මා මේ ළමයාව නුඹට බාර දෙනවා. මා දන්නා හැටියට මේ ළමයාට හරි හැටි මාර්ග දර්ශනය දීමට නුඹට හැකියාව

තිබෙනවා,'' මී ගවයන් ටික අරගෙන ළමයා ආපසු ගිය විගස බුදුරදුන් ස්වස්තිට කතා කර කීවේය. ස්වස්ති දෑත එක් කොට නමස්කාර කළේය. ඊට පසුව සිනාසිණි. මේ වනවිට ස්වස්තිගේ වයස අවුරුදු තිස් නවය සම්පූර්ණ වී තිබිණි. බුදුහාමුදුරුවෝ නන්දට උගන්වන්න තමන්ට භාර දෙන්නේ ඇයිද යන්න ගැන ස්වස්ති දැන සිටියේය. මී ගවයන් හසුරුවන ආකාරය ගැන බුදුරදුන් මීට කලින් ස්වස්තිට කරුණු කී ආකාරය ගැන ඔහුට සිහිවිය. ස්වස්තිගේ මුල්ම ජීවිතය ගත වුයේ මී හරකුන් සමඟයි. ඒ නිසා නන්දට කරුණු ඉගැන්වීම ස්වස්තිට පහසු බව බුදුරදුන් පිළිගත්තෝය. වෙනත් අවශ්‍ය කරුණු ස්වස්ති රාහුලගෙන් ඉගෙන ගත්තේය. මේ සඳහා රාහුලගෙන් උපකාර ලැබෙන බවට ස්වස්ති තදින් විශ්වාස කළේය.

ස්වස්තිගේ පවුලේ සහෝදර සහෝදරියන් දැන් සුදුසු වයසට පත්වී ආවාහ විවාහ කරගෙන පවුල් ජීවිත ගත කරමින් සිටියහ. අවුරුද්දකට පෙර ස්වස්ති රාහුල සමඟ උරුවේලාවට ගියේය. නමුත් පරණ ජීවත් වූ මඩුව තිබුණ තැනක් වත් දැනගන්න අපහසු විණි. ස්වස්ති සහ රාහුල නේරංජනා නදියේ ඉවුරට ගියෝය. කවදා හෝ දවසක රාහුල මී හරකෙකු පිට අරගෙන යන බව සඳහන් කළ ස්වස්තිට සිහිපත් විය. අසල සිටි මීහරක් බලන ළමයෙකුට කතා රාහුල හාමුදුරුවන් මී හරකෙකු පිට නග්ගගෙන අරගෙන යන්න යැයි කීවේය. මී ගවයන් ඉතාම සරල බව දැනගෙන රාහුල සතුටට පත් විණි. ඉන්පසු ස්වස්ති මී හරකා පිටට නැග ගත්තේය. බුදුහාමුදුරුවෝ දැක්කොත් අපි මී හරක් පිට නැගලා ඉන්නවා මොනවා වෙයි ද දන්නේ නැත යැයි රාහුල සිතුවේය. ස්වස්ති සිතුවා රාහුල ගෙදර හිටියා නම් දැනට රජ කෙනෙකි. එහෙම වුණානම් මීහරක් පිට යන්න ලැබෙන්නේ නැහැනේ ද යැයි සිතුවේය.

නන්ද තමන් සමීපයට පැමිණි පසු ස්වස්ති තම පරණ මතකය අලුත් කර ගත්තේය. පරණ මතකය වර්තමානයට අරගෙන ඉන් උගත් දේ නන්දට උගැන් වූවේය. එදා ස්වස්ති නන්දගේ හිස බූ ගෑවේය. සිවුර පෙරවීම, පිණ්ඩපාත පාත්‍රය අල්ලන ක්‍රමය, වළඳන විදිය, නැගිටින, වාඩිවන ක්‍රමය යන භික්ෂු ජීවිතයේ එදිනෙදා කටයුතු කරන ආකාරය කියා දුන්නේය. නන්ද මේ ගැන

ඉතාම ඕනෑකමින් කටයුතු කරන ආකාරය දැක තවතවත් කරුණු ඉගැන්වීමට ස්වස්තිට හිත දුන්නේය. ස්වස්තිට අවුරුදු කිහිපයකට පෙර තරුණයින් දහ හත් දෙනෙක් වේළු වනයේ දී පැවිදි වූ ආකාරය සිහියට නැගිණි. ඉන් වැඩිමහලුම අය වූ උපාලිගේ වයසත් අවුරුදු දහ හතක් වී තිබිණි. අඩුම වයස්කාරයා අවුරුදු දොළහක කෙනෙකි. සියලුම දෙනා ඉතාම පොහොසත් ගෙවල් වල අය විය. ඔවුන් සැම කෙනෙකුම පැවිදිවීමට තම දෙමාපියන්ගෙන් අවසර ලබාවිත් තිබිණි. ඒ අයත් පැවිදි ජීවිතය ගත කිරීමට දවසට එක් වරක් කෑම ගැනීම කළෝය. මේ අතර සමහර වයස අඩු අය බඩ ගින්නේ රෑට අඬන්න ගත්තෝය. ඉන් පසු බුදුරදුන් වයස අවුරුදු විස්සට අඩු අයව සංඝ සමාජයට ඇතුළු කර විනය නීතියක් පැනවිවෝය.

ඒ ළමයින් සංඝ සමාජයේ තැබුවේය. නමුත් රාත්‍රියට කෑම ගන්න අවසර දුන්නේය. සියලුම ළමයි ඉතාම සතුටින් භික්ෂු ජීවිතය ගත කළහ. එදා අඩුම වයසේ සිටි දරුවා අද අවුරුදු විස්ස සම්පූර්ණ කළ බව ස්වස්ති දැන ගත්තේය.

## හැට හතර වන පරිච්ඡේදය

# ඉපදීම සහ මරණය පිළිබඳ චක්‍රය

දිනක් බුදුරදුන් භේසකලා වනයේ විවේක සුවයෙන් වැඩ සිටියෝය. මහා පුරුෂයින්ගේ මහා අනුභූති අටක් ගැන ඔබ සැමට ම විස්තර කරන්න ඕනෑ බව රැස්ව සිටි භික්ෂූන්ට කීවෝය. ''මීට කලින් අනුරුද්ද හාමුදුරුවෝ මේ ගැන ඔබ සැමට කියන්න ඇති. මේ කරුණු අට සම්බෝධිය අවබෝධ කරගැනීමට සහාය වෙනවා,''

''පළමු අනුභූතිය ලෙස සලකන්න තියෙන්නේ සියලුම දේ අනිත්‍යයි, අනාත්මයි යන අදහසයි. මේ ගැන සිතුවොත් දුකින් නිදහස් වෙන්න පුළුවන්. සතුට සහ සිතේ අවදි වීමත් ඇති වෙනවා.

''දෙවන අනුභූතිය ලෙස සලකන්නේ ආශා කොපමණ ද අධික එපමණය දුක ඇති වීම ස්වභාවිකයි. ජීවිතයේ කොපමණ දුක් ඇති වනවා ද ඒ සියල්ල ලෝභය කැමැත් යන කරුණු නිසා ඇති වන දේයි.

''තුන් වන අනුභූතිය නම් චාම් ජීවිතයයි. චාම් ජීවිතයේ කැමති දේ ඇත්තේ ඉතාම සීමිතවයි. එහි සතුටත් සුහදකමත් තිබෙනවා. චාම් ජීවිතයෙන් භාවනා කිරීමටත් අනෙක් අයට උපකාර කිරීමටත් අවශ්‍ය පහසුකම් ලැබෙනවා.

''හතර වන අනුභූතිය නම් උත්සාහයෙන් භාවනා කිරීමයි. අලස බව නිවන් අවබෝධ කර ගැනීමට බෝධි චිත්තය ලැබීමට ප්‍රබල බාධාවක්.

''පස් වන කාරණය නම් මෝඩකම නිසා ඉපදීමත් මරණයත් යන කරුණු දෙක මැද සසරේ බොහෝ වාර ගණන්වල නැවත නැවත ඉපදීම හා මරණයයි.

''හයවන අනුභූතිය දුප්පත්කමයි. දුප්පත්කම ඇති තැන තරහ ක්‍රෝධය වෛරය ආදිය ඇතිවීමයි. මේ නිසා සැම විටම නකාරාත්මක අදහස් ඇති වීම ස්වාභාවිකයි. භාවනා කරන පුද්ගලයා සතුරු මිතුරු දෙපැත්තම සමසේ දැකිය හැකි විය යුතුයි. අතීතයේ කළ වැරදි ගැන අඩුපාඩුකම් නොසොයා වර්තමානයේ ද ඇති අඩුපාඩුකම් ගැන ද නොසොයා කටයුතු කිරීමයි.

''හත්වන කාරණය මා සසර දුකින් මිදීම පිණිස කටයුතු කරන අතර සංසාරික බන්ධනවලින් බැඳීම නුසුදුසු බව. සද්ධර්මය සඳහා පුද්ගලයෝ ගිහි ගෙය අත් හරින්නේ. ඒ පුද්ගලයා ළඟ සිවුරු තුනයි එක පාත්‍රයකුයි තියෙන්නේ. සැම විටම චාම් ජීවිතයක් ගත කරන අතර සැම සත්වයකු ගැනම කරුණාවෙන් යුතු සිතිනුයි කල් ගත කරන්නේ.

''අටවන කාරණය මා ධ්‍යාන භාවනා කරන්නේ මා වෙනුවෙන් පමණක් නොවෙයි. දුක් විඳින අනෙක් සත්වයනුත් සඳහායි. මගේ ධ්‍යාන භාවනාවෙන් ලෝකයේ අනෙක් සත්වයන්ට ශාන්තියක් සිද්ධ කිරීම සඳහායි.

''භික්ෂුවරුනි, මේ මහා පුරුෂයින්ගේ අනුභූති අටයි. මේ දක්වා බුදුබව ලැබුවේ කවුද? නිවන් අවබෝධ කළේ කවුද? සැම දෙනාම මේ අනුභූති අට අනුගමනය නොකර ඒ තත්ත්වයට පත් වුණේ නැහැ.''

වක්කලී හාමුදුරුවෝ හොඳටම අසනීපෙන් පසුවන බවත්. උන් වහන්සේ මරණයට පෙර බුදුරදුන් දකින්න ආසයි පවසා තිබිණි. බුදුරදුන් රජගහනුවර වේළුවනාරාමයට වැඩම කළ විට දැනගන්න ලැබිණි. බුදුරජාණන් වහන්ස මගේ ගුරුතුමා ඉතාම අසාධ්‍ය තත්වයක දුප්පත් කුඹල්කරුවකුගේ ගෙදරයි ඉන්නේ මේ පණිවිඩය සමඟ තමුන්නාන්සේ ළඟට මට යන්න කීවා,'' යැයි පණිවිඩය ගෙන ගිය තැනැත්තා කීවේය.

බුදුරදුන් ආනන්ද හාමුදුරුවන් සමඟ වක්කලී හාමුදුරුවන් බැලීමට ගියේය. බුදුරදුන් වඩිනු දුටු විගස වක්කලී හාමුදුරුවන් සිටි තැනින් නැඟිටින්න මහන්සි ගත්තේය. බුදුරදුන් වක්කලි හාමුදුරුන්ට නැඟිටින්න එපා බුදුරදුන් වක්කලී හාමුදුරුවන් ළඟ තිබූ පුටුවක වාඩි වුවෝය. ශරීර සැපය ශක්තිය ඉස්සරට වඩා දැන් හොඳයි නේ ද යනුවෙන් බුදුරදුන් වක්කලී හිමියන්ගෙන් ඇසුවෝය. ''මට හොඳටම අමාරුයි. රිදීම එන්න එන්නම වැඩිවෙනවා මිසක් අඩු වෙන්නේ නැහැ,'' යි වක්කලී හිමියන් පැවසුවේය.

''මා හිතන්නේ ඔබට දුක්වෙන්න හෝ හිතන්න කිසිම කාරණයක් නැහැනේ?'' බුදුරදුන් ඇසුවෝය.

''ගුරුතුමනි, මට හිතන්නත් බොහෝ දේ තියනවා. දුක් වෙන්නත් බොහෝ දේ තියනවා,''උන්වහන්සේ කීවේය.

නුඹට මොනවා ගැනද හිතන්න තියෙන්නේ? මොනවා ගැන ද දුක් වෙන්න තියෙන්නේ?''

මා හිතහිතා ඉන්නේ හුග දවසක් වුණා ඔබ වහන්සේ දැක ගන්නට ලැබුණේ නැහැ,''

බුදුරදුන් ඉතාම කරුණාවෙන් කිවුවා, ''වක්කලී, ඒ ගැන හිතන්න එපා. නුඹ ධර්මය දැකලා තියනවා. මාගේ ශරීරය දැකීම වැදගත් නැහැ. මගේ ධර්මය ඔබ දැකලයි තියෙන්නේ. ඉතාම වැදගත් කාරණය වන්නේත් ධර්මය දැකීමයි. ශරීරය දැකීම වැදගත් නැහැ,'' බුදුරදුන් කරුණාවෙන් පැවසූහ.''වක්කලී, නුඹ දන්නවා ද නුඹගේ ශරීරයත් මගේ ශරීරයත් අනිත්‍යයි, විනාශ වී යන බව?'' මඳ වේලාවක් නිහඬව සිට බුදුරදුන් පැවසූහ.

''ගුරුතුමනි, ඒ කාරණය මා හොඳින්ම දන්නවා. ශරීරය, ඉපදීම, මරණය, නැති වීම අතර සිදුවන සිද්ධියක් කියලා. ඔබතුමන් මගේ අසනීප ගැන බලන්න එන්න කලින් මා පඤ්චස්කන්ධයේ අනිත්‍යතාව ගැනයි භාවනා කළේ. මට අවබෝධ වුණා මේ ලෝකයේ කිසිම දෙයක් නිත්‍ය නැති බව. සියල්ල අනිත්‍ය බව, මින් නිදහස් වූ කිසි කෙනෙක් නැති බව,'' යැයි වක්කලී හාමුදුරුවෝ පැවසූහ.

''වක්කලී, අද්භූතයි. ඔබ ධර්මය ගැන හොඳ අවබෝධයක් ඇතිව ඉන්න කෙනෙක්. මා ඒ ගැන දැනගන්න ලැබී සතුටට පත් වුණා. පඤ්චස්කන්ධය ගැන කිසිම කෙනෙකුගේ නිදහස් පාලනයක්

නැහැ. මේ ගැන බොහෝ අය සිතන්නේ නැහැ. සිතුවොත් සද්ධර්ම මාර්ගය අනුගමනය කිරීම ඉතාම පහසු වෙනවා. වක්කලී, සතරමහා භූතයින්ගෙන් සෑදී ඇති මේ ශරීරය ගැන සිදුවන දේ සිනාසී බාරගන්නවා හැර කළ හැකි වෙන කිසිවක් නැහැ. ශරීර ශක්තිය අධික වනවිට හෝ අඩු වනවිට හෝ සතුටින් සිටින්න පුළුවන්නම් එය ඉතා ම වැදගත්.''

වක්කලීගේ දෑසට කඳුළු ගැලුවේය. සතුටු කඳුළු හැළුවේය. බුදුරදුන් නැඟී සිට වක්කලී හාමුදුරුවන්ගෙන් වෙන් වී ගියෝය.

බුදුරදුන් හා ආනන්ද දෙනම එතැනින් නික්ම ගිය විට වක්කලී හාමුදුරුවෝ මාව කඳු මුදුනට එක්කගෙන යන්න යැයි පැවසීය. ''මා වගේ කෙනෙක් මේ වගේ කාමරයක සිරවී ඉන්නේ කෙසේ ද? කඳු මුදුනේ ආකාශය ඇති නිදහස් තැනක මා අවසන් හුස්ම හෙළන්න ඕනෑ. මගේ අන්තිම කැමැත්ත එයයි යනුවෙන් තවදුරටත් පැවසීය.

වක්කලී හාමුදුරුවන්ගේ මිත්‍ර පිරිස එකතු වී උන් වහන්සේ ව කඳු මුදුනට රැගෙන ගියෝය. ''ගිහිල්ලා වක්කලී හාමුදුරුවන්ට කියන්න කිසිම දේකට බය වෙන්න දෙයක් නැහැ. මරණය ඉතාම ශාන්ති පූර්වකව සිද්ධ වන නිසා. සිත ඉතාම ශාන්තව නිසලව තබා ගන්න. උන්වහන්සේ ගැන තමන් සිහිකරන්නේ ඉතාම ගෞරවයෙන් බව,'' එදා රාත්‍රිය ගත කළ බුදුරජාණන් වහන්සේ උදෑසන බ්‍රහ්ම මුහුර්තයෙන් අවධි වී අසල සිටි භික්ෂුවකට කීවේය.

බුදුරදුන්ගේ පණිවිඩය රැගෙන එක් භික්ෂූන් වහන්සේ නමක් වක්කලී හිමියන් ළඟට ගිය විට වක්කලී හාමුදුරුවන් තමන්ව ඇඳෙන් බස්සලා බිමට ගන්න. ''බුදුහාමුදුරුවන්ගේ පණිවිඩය උස ආසනයක ඉඳන් අහන්නේ කොහොම ද?'' යැයි ද උන් වහන්සේ පැවසූහ. ඒ අනුව උන් වහන්සේ බිමට බැස්සුවා. ඉන් පසුව බුදුරජාණන් වහන්සේගේ පණිවිඩය කියවුයේය.

'' කරුණාකරලා බුදුරජානන් වහන්සේට දෑත එකතු මා වෙනුවෙන් තුන් වරක් නමස්කාර කර කියන්න කායික වශයෙන් මා ඉන්නේ ඉතාම අපහසු තත්ත්වයකින්. ඒ වාගේම පඤ්චස්කන්ධය පිළිබඳව යථාභූත ඥාණයෙන් දැකීමේ ශක්තිය ඇතිව ඉන්න බවත්, සියලු භයින් තොරව සතුටින් සිටින අතර පඤ්චස්කන්ධයේ වේදනාවලින් කිසිම අඩුවක් නැති බව,'' වක්කලී හාමුදුරුවන් පැවසීය.

මේ සමඟ වක්කලී හාමුදුරුවන්ගේ දෑස පියවිණි. අවසන් හුස්ම හෙළා ටික වේලාවකින් ශරීරය සීතල විය. කඳු පාමුල තිබූ පුංචි කුටියේ වහලයෙන් දුම් රොදක් පිට විණි.

මේ ගැන බුදුරදුන්ට දැනගන්න ලැබුණා පමණයි බුදුරදුන් කිව්වා ''වක්කලී නිදහස් වුණා. කිසිම භූත ප්‍රේතයෙක් උන් වහන්සේට කරදර කරන්නේ නැහැ,'' මේ ප්‍රවෘත්තිය දැන ගත් විගස බුදුන් වහන්සේ පැවසූහ.

බුදුරදුන් නැවත තම ගමන ආරම්භ කළෝය. උන් වහන්සේ නාලන්දා සහ වෛශාලි බලා පිටත් විණි. ''මේ ලෝකයේ සියලුම ප්‍රාණීන්ට ශාරීරික වේදනා ඇති විම ස්වාභාවිකයි. ඒ වුණත් ධර්මය අනුව ජීවත්වන අයට ඒ කරදර වේදනා සිද්ධවන්නේ අන් අයට වඩා අඩුවෙන්,'' යැයි දිනක් බුදුරදුන් කුටාගාර ශාලාවේ ධර්ම දේශනා කරමින් විස්තර කළේය.

එදා උෂ්ණත්වය ඉතාම තදින් තිබිණි. එහෙත් බුදුරදුන් අනෙක් භික්ෂූන් සමඟ සල් ගසක් යට වැඩ සිටියේය. අතට මැටි පිඬක් රැගෙන ඇහැව්වා භික්ෂුවරුනි, මගේ අතේ ඇති මැටි ද වැඩි නැත්නම් පොළොවේ ඇති මැටි ද වැඩි,''ඇසුවෝය. අනෙක් භික්ෂූන් සමඟ සල් ගසක් යට වැඩ සිටි බුදුරදුන් පස් පිඬක් අත ගෙන පොළොවේ ඇති මැටි ප්‍රමාණය අධිකයි, යනුවෙන් භික්ෂූන් පිළිතුරු දුන්නේය.

''අන්න ඒ වගේ මේ ලෝකයේ ඥාණවන්ත අය ඉන්නවානම් මේ අතේ ඇති මැටි ප්‍රමාණය හා සමාන බව සිතන්න. මෝඩකම නිසා කරදර වැඩි වෙනවා. ශාරීරික සහ මානසික ප්‍රශ්න අධික වෙනවා. ප්‍රඥාව නිසා කරදර අඩු වෙනවා. මානසික සතුට ලැබෙනවා.

''ඒ නිසා භාවනාව ඉතාම ඕනෑකමින් කරන්න. භාවනාව කරන අයගේ කායික හා මානසික ශක්තිය ශාන්තිය වර්ධනය වෙනවා. එමඟින් ඉපදීම මරණය, ජරාව ආදියෙන් නිදහස් වෙන්න හැකියාව තිබෙනවා. මරණ මොහොතට කලින් ශරීරය ගැන සිතන්න ඕනෑ. ශරීරයේ විවිධ අවධි, අවයව ආදිය ගැන සිතන්න ඕනෑ. ශරීරය අශුභ වබ සිතීමෙන් මරණ භයින් නිදහස් වෙන්න පුළුවන්. ශරීරය මරණ භයින් නිදහස් වීමට දීපයක් හා සමාන බව සිතන්න ඕනෑ. ඉන් ශාන්තිය සහ සසරින් මිදීමට උපකාරයක් ලැබෙනවා.''

ඊළඟ වස් කාලය සඳහා බුදුරදුන් සැවැත් නුවරට වැඩම කළෝය. ධර්ම දේශනාවේ දී බුදුරදුන් භවචක්‍රය පිළිබඳව භික්ෂූන්ට විස්තර කළෝය. ''ගුරු දේවයාණනි, සියලු ධර්මවල විද්‍යාමාන භාවය, ඥානය සහ චේතනාව මත ආධාරව පවතිනවා ද?'' යනුවෙන් භවචක්‍රය පිළිබඳව අවබෝධයෙන් තොරව සිටි එක් භික්ෂුවක් ප්‍රශ්න කළේය.

''රූපය චේතනාවක එක විෂයක් පමණයි. කර්තෘ සහ විෂය එක කාසියක දෙපැත්තක් ලෙස හිතුවට වරදක් නැහැ. විෂයකින් තොරව කිසිම චේතනාවක් ඇති වන්නේ නැහැ. චේතනාව සහ විෂය නිදහස්ව වෙනවෙනම පවතින්නේ නැහැ. ආදි අන්ත දෙකම සිතෙහි අවධාරණය පමණයි. මෝඩ කමේ බැඳී සිටින නිසා මිනිස්සු ආදි අන්ත දෙක ගැන සිතනවා. මෝඩකම නිසා ඉපදීම හා මරණය යන දෙක මැද හිරවී සිටිනවා.

''ඉපදීම සහ මරණය අනන්ත නම් සත්වයා ඉන් මිදෙන්නේ කෙසේ ද?

''ඉපදීම සහ මරණය මෝඩකමෙන් ඉපදෙන ස්වභාවයක් පමණයි. අද මා ධර්මය ගැන කියන්නේ මෙපමණයි. තවත් දවසක මේ පිළිබඳව වෙනමම විස්තරයක් කරන්නම්,'' යැයි බුදුරදුන් ප්‍රකාශ කළෝය.

## හැට පස් වන පරිච්ඡේදය

# පිරී ද නැත, හිස්ව ද නැත

ධර්ම දේශනාවෙන් පසුව ස්වස්ති හාමුදුරුවෝ, අනෙක් හාමුදුරුවරු උදාසීනව සිටින ආකාරය දුටුවෝය. බුදුන් දේශනා කළේ මොනවා දැයි ස්වස්තිට අවබෝධ වූයේ ද නැත. මින් පසුව අසන ධර්ම දේශනා ඉතාම හොඳ කල්පනාවෙන් කළ යුතු යැයි, මින් පසුව ධර්ම දේශනා හොඳ සිහිබුද්ධියෙන් ඇසිය යුතුයැයි ස්වස්ති ඉටා ගත්තේය.

බුදුන් දේශනා කළ ධර්මයේ සාරාංශය පමණක් විස්තර කර දෙන්න ලෙස ඊළඟ ධර්ම දේශනාවෙන් පස්සේ සියලුම භික්ෂූන් ආනන්ද හාමුදුරුවන්ගෙන් ඉල්ලා සිටියෝය.

භික්ෂූන්ගේ පළමු ප්‍රශ්නය වුයේ ''බෝධිසත්ව, ලෝකය, ධර්මය'' යන මේ තුනේ සම්බන්ධය කුමක් ද යන්නය.

''ලෝකය යනු පරිවර්තන ශීලී පදාර්ථවලින් සමන්විතව සෑදුණු දෙයක් එය නිතර විනාශ වන ස්වභාවයෙන් යුක්තයි. සියලුම ධර්ම අංශ දහ අටකින් යුක්තයි. ඉන්ද්‍රිය හය, ඉන්ද්‍රිය හයට අසුවන ලක්ෂණ හය, ඉන්ද්‍රිය හයට අසුවන චේතනා හය ඉන්ද්‍රිය හය නම් දැකීම, ඇසීම, ගඳ සුවඳ දැනීම රසය විඳීම ස්පර්ශය සිතුවිලි මේ සියල්ලේම විෂය මනෝ චේතනාවයි. මේ ඉන්ද්‍රියයන්ගේ විෂය නම්, රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ සහ

සිතයි. දැකීම, ඇසීම, රසය, ගැනීම, ස්පර්ශ කිරීම තේරුම් ගැනීම. මේ කරුණු දහ අටට අමතර ව මේ ලෝකයේ කිසිම කරුණක් නැහැ. මේ කරුණු දහ අට ඉපදීම, මරණය, සමඟ කෙලින්ම සම්බන්ධයි. මේ නිසයි මා කියන්නේ ලෝකය සෑදී තිබෙන්නේ මේ පරිවර්තන ශීලී කරුණු දහ අටෙන් කියලා. එහි ස්වභාවයම පරිවර්තන සහ පෙරළෙන ස්වභාවයෙන් යුක්තයි.''

''ගුරුතුමනි ඔබ වහන්සේ හැම විටම කියනවා සියලුම ධර්ම ශූන්‍යතාවෙන් යුක්තයි කියලා. ඒ දේශනාවේ අදහස කුමක් ද? ආනන්ද හිමියෝ විමසූහ. සියලුම ධර්ම ශූන්‍යතාවෙන් යුක්ත යි කියල කිවුවේ කිසිම දේක ස්ථිරබවක් දැකීමට නැති නිසයි. ඉන්ද්‍රිය හය, විෂය හය, චේතනා හය යන මේ කිසිම දේක ස්ථිර බවක් දකින්නට නැහැ. නිතර වෙනස් වන, පරිවර්තනය වන, විනාශ වන, ස්වභාවයක් තියෙන්නේ,'' බුදුන් වහන්සේ ප්‍රකාශ කළහ. ''ගුරුතුමාණනි, ඔබතුමන් කිව්වා මිදීම ක්‍රම තුනකින් සිද්ධ වන බව. ශූන්‍ය තාව ස්ථිර බවක් නැතිකම, ලක්ෂයක් නැති බව. ඔබ එසේ කීවේ සියලුම ධර්ම පරිවර්තන ශීලී බව සහ ස්ථිර බවක් නැතිකම නිසා නේ ද?'' යනුවෙන් ආනන්ද හිමියෝ නැවත ඇසූහ.

''ආනන්ද මා හැම විටම ශූන්‍යතාව ගැන දේශනා කළා. ශූන්‍යතාවය ගැන තවත් විස්තර කරණවා නම් කියන්න තියෙන්නේ ඉපදීම, ජරාව, මරණය, කියන මේ තුනෙන් සදහටම නිදහස් වීමයි. මේ ගැන මා අද තව ටිකක් විස්තර කියන්නම්.

''ආනන්ද අප සියලු දෙනා දැන් මේ වාඩි වී ඉන්නේ ධර්ම ශාලාවේ. මෙහි වෙළඳ පොළක් ඇත්තේත් නැහැ. මී හරක් එළ හරක් ඇත්තේත් නහැ. ගමක් ඇත්තේත් නැහැ. මෙතන ඉන්නේ භික්ෂූන් පමණයි. ඒ අයත් වාඩි වෙලා ධර්මය ශ්‍රවණය කරනවා. මට කියන්න පුළුවන් ධර්ම ශාලාවේ මා කලින් සඳහන් කළ දේවල් නැති නිසා ධර්ම ශාලාව හිස් කියලා. නමුත් ඒ සමගම මට කියන්න පුළුවන් ධර්ම ශාලාව පිරිලා කියලා.

''මගේ මේ කතාව සත්‍ය ද නැද්ද? ව්‍යවහාරික වශයෙන් මේ කතාව ඇත්ත නේ ද?''

එහෙමයි ගුරුතුමාණනි, ඒ කතාව සම්පූර්ණ ඇත්තයි,'' යනුවෙන් සියලු භික්ෂූන් පිළිතුරු දුන්හ.

ධර්ම දේශනා කර මා ගිය විට ධර්ම ශාලාව වෙළඳ සැල මී හරක් ගම සහ භික්ෂූන්ගෙන් හිස් වෙනවා.

''ආනන්ද හිස් වීම සහ පිරීම යන දෙකේම කිසිම අර්ථයක් දැනෙනවා ද මේ දෙකේම කිසිම අර්ථයක් නැහැ. හිස් වෙනවා කියන්නේ යම්කිසි පදාර්ථයකින් හිස් වීම. ස්වභාවයෙන් හිස් බවක් දැනීම කාටත් පෙනෙනවා. මේ වාගේ පිරී තිබීමේ අර්ථයක් ඒ වගේමයි. යම්කිසි ආකාරයකින් මා කිව්වොත් සියල්ලම පිරිලා තියනවා කියලා හිස් වී තිබෙන්නේ මොන දෙයින් ද?

''භික්ෂුවරුනි, ධර්මය අනුව හිස් කියන අර්ථය දෙන්නේ ස්ථිර බවින් හා පරිවර්ථනශීලී බවින් හිස් වීමයි. මේ නිසා සියලුම ධර්ම ශුන්‍යතාවට අයත් ඔබ සියලුම දෙනා දන්නවා සියලුම ධර්ම පරිවර්තනශීලී බව. මේ නිසා කිසිම ධර්මයක ස්ථිර බවක් දකින්නට නැහැ. භික්ෂුවරුනි. හිස් බව කියන්නේ ස්ථිර බවින් හිස් වීම බව අවබෝධ කර ගන්න. ස්කන්ධ පහෙන් එකක් වත් ස්ථිරත් නැහැ. පරිවර්තන ශීලී නොවී තිබෙන්නේත් නැහැ. ශරීරය සහිත ශරීරයේ සියලුම අවයවයන්, ස්කන්ධ, භාවනාවන් අවධාරණා, භාවබෝධ, චේතනා යන මේ සියල්ලම ස්ථිර බවක් නැති දේයි. ස්ථිර වීමට නම් පරිවර්තන ශීලී බව නැති විය යුතු යි. නිදහස් බව ස්ථිර බවක් නැතිකම. පරිවර්ථන ශීලී බවක් දැකිය හැකි තැන ශුන්‍යතාවක් දැකීමට නැත.''

'' ඒ අනුව සියලුම ධර්ම ස්ථිර බවින් තොරයි. මට නම් දැන් කාරණය අවබෝධ වුණා. ඇත්ත වශයෙන්ම ධර්මය කියන්නේ මේ දේ තමයි,''යැයි ආනන්ද හිමියෝ පැවසූහ.

ආනන්ද හාමුදුරුවන්ගේ කතාවෙන් පස්සේ මේසය මත වූ භාජනය දෙස බැලූ බුදුහාමුදුරුවෝ මේ භාජනය පිරිලා ද හිස් ද යනුවෙන් ඇසූහ.

'' ගුරුතුමාණනි, මේ භාජනය වතුරින් පිරිලයි තියෙන්නේ,'' යනුවෙන් ඇසූහ.

''ආනන්ද මේ වතුර භාජනය පිටට රැගෙන ගොස් ජලය හිස් කරලා රැගෙන එන්න.''

ආනන්ද හිමියන් ඒ අනුව භාජනය හිස් කළේය.

බුදුරදුන් මේසය මත තිබූ හිස් භාජනය මුනින් අතට හරවා තබන භාජනය දැන් හිස් ද පිරිල ද යනුවෙන් ආනන්ද හිමියන්ගෙන් ඇසුවෝය. භාජනය දැන් හිස් එකක් බව ආනන්ද හාමුදුරුවෝ කීවෝය.

''ආනන්ද මේ භාජනය දැන් වතුරෙන් පිරිල නැහැ. නමුත් වායුවෙන් පිරිලයි තියෙන්නේ. මේ කාරණය නුඹ අමතක කළා. හිස් වීම කියන්නේ යම්කිසි දෙයකින් හිස් වීමයි. පිරෙනවා කියන්නේ යම් කිසි දෙයකින් පිරී තිබීමයි. මේ වෙලාවේ මේ භාජනය වතුරෙන් හිස් නමුත් වායුවෙන් පිරිලා.

''මේ දෙකම දැනෙන්නේ භාජනය පෙනෙන්න තිබෙන නිසයි. භාජනය නැත්නම් එහි පිරී තිබීම හෝ හිස් බව හෝ දැනෙන්නේ කොහොම ද ? මගේ කතාව ඔබ සැමට අවබෝධ වුණා නේ ද?''

සියලු ම දෙනාට කාරණය අවබෝධ වූ බව, සියලුම භික්ෂූන් වහන්සේ එක ස්වරයෙන් පැවසූහ.

''ආනන්ද ශබ්ද ජාලයේ පටලැවෙන්න එපා. එහි අර්ථයක් නැති නිසා. ධර්මය ස්ථිරත්වයක් නැති ශූන්‍ය දෙයක්. මේ කාරණය කොපමණ විස්තර කළත් සාමාන්‍ය අයට සාමාන්‍ය ඥානයට අවබෝධ වන්නේ නැහැ.

''ආනන්ද දැන් මා ඔබ සැමට පිරිච්ච සහ හිස් වෙච්ච භාජනයක් ගැන කිවුවා. ශූන්‍යතාව ගැනත් කිවුවා. දැන් මා පිරිච්ච දේ ගැන කියන්නම්. මා කිවුවා මතක ද මේසය මත ඇති භාජනය හිස් කියලා. මේ ගැන හොඳටම සිතුවොත් එහි සත්‍යතාවයක් නැහැ. හේතුව භාජනය යම් දෙයකින් ද හදලා තියෙන්නේ. ඒ හදල තියන දේට යම් ප්‍රමාණයක් ජලය එකතු කරලා තියනවා. ඒ ජලය ඔබට පෙනෙන්නේ නැහැ නේ ද?''

''ගුරු දේවයාණනි, එය සත්‍යයි. භාජනය හදන්න යම් කිසි ප්‍රමාණයක් ජලය අනිවාර්යයෙන්ම එකතු කළ යුතුයි. නමුත් ඒ එකතු කළ ජලය අපේ පියවි ඇසට පෙනෙන්නේ නැහැ. එය සම්පූර්ණ සත්‍යයි.'' ආනන්ද හිමියෝ කීහ.

''ආනන්ද දැන් ඔබට කාරණය සම්පූර්ණයෙන්ම අවබෝධ වූ බව මට දැනෙනවා. නමුත් මා කලින් කිවුවනේ භාජනයේ ජලය නැහැ කියලා. භාජනය දැකීමත්, ජලය දැකීමත් දෙකම එක යි. ආනන්ද නුඹ මේ භාජනයේ තේජෝ ධාතුව (ගින්දර) දකිනවා ද?''

ගුරුතුමනි, ගින්දර නැතිව භාජනය මේ තත්වයට ගන්න අපහසුයි.''

''මීට අමතරව ආනන්ද මේ භාජනයේ නුඹ දකින්නේ වෙන මොනවා ද?''

''මා මේ භාජනයේ වායුවත් දකිනවා. වායුව නොමැති නම් ගින්දරක් පත්තු වෙන්නේ නැහැ. මේ දෙකම නැත්නම් කුඹල් කරුවා ජීවත් වන්නේ නැහැ. මේ භාජනය දැකීමෙන් මා තවත් දේ දකිනවා. කුඹල්කරුවාගේ කාර්ය කුසලතාව, චේතනාව, ගිනි පත්තු කරන ලිප, වර්ෂාව, අව්ව, පෘථිවිය යන මේ සියල්ල ම මේ භාජනයේ මට දකින්න පුලුවනි. එකකට වෙනස් දහස් ගනන් දේ මේ භාජනය තුළ මට දකින්න පුළුවන්. මේ සියල්ලම එකතු වීමෙනුයි මේ භාජනය සෑදී තිබෙන්නේ.''

''ආනන්ද, ඉතා ම හොඳයි. භාජනය ගැන ගැඹුරට සිතීමෙන් මේ සියලු දේ ගැනම සිතන්න පුළුවන්. මේ සියලු දේම දකින්නත් පුළුවන්. නුඹගේ සිතුවිලි සමූහයත් මීන් එකක් බව සිතන්න. යම් කිසි ආකාරයකින් නුඹ රස්නය (තේජෝ ධාතුව) සූර්යා වෙතට නැවත දුන්නොත් මැටි පෘථිවියට නැවත එකතු කළොත් ජලය දිය ඇල්ලකට දැම්මොත් කුඹල් කරුවා එයාගේ දෙමාපියන්ට බාර දුන්නොත් පත්තු කළ දර කැලයට නැවත බාර දුන්නොත් අපට භාජනයක් දකින්න පුළුවන් වේවි ද මේ සියලු ම දේ එකකට එකක් සම්බන්ධයි. මේ දේ මේ ලෝකයේ සියලුම වස්තූන් හෙවත් ධර්මතාවන්ට සම්බන්ධයි. අන්තිම පෘථිවිය කියන දේ මේ භාජනයට සම්බන්ධයි. යම් විටක මා භාජනය දකිනවා නම් කුඹල් කරුවා ද දකිනවා. කුඹල්කරුවා දකින හැම විටම භාජනයත් දකිනවා. දිය ඇල්ල වතුරයි. වතුර දිය ඇල්ලයි. ආනන්ද දැන් මේ වෙලාවේ ධර්ම ශාලාවේ මී හරක් ඇත්තේත් නැහැ. ගමක් ඇත්තේත් නැහැ. නමුත් එය එක් තරා දෘෂ්ඨි කෝණයක් පමණයි. අන්තිමේ දී මී හරක් ගම නැති වුණොත් මේ ධර්ම ශාලාවේ කිසි දෙයක් නැහැ. නමුත් හිස් ධර්ම ශාලාව දකින ඔබ ගම, මී හරක් වෙළඳ සැල ආදියත් දකින්න ඕනෑ. මේ අනුව හිස් බව කියන්නේ ශූන්‍යතාවයි. භික්ෂූන් වහන්සේලා ඉතාම ශාන්ති පූර්වකව ධර්ම දේශනාව ශ්‍රවණය කළා. බුදුරදුන්ගේ දේශනාව භික්ෂූන්ට ඉතාම හොඳින් අවබෝධ වුණ බව කිව්වා. ටික වේලාවක් නතර වී බුදුරදුන් නැවතත් භාජනය දෙස බැලුවා. අතට භාජනය රැගෙන බුදුරදුන් කිව්වා මේ භාජනය නිදහස්ව තනිවම හැදිච්ච දෙයක්

නොවෙයි. මැටි, වතුර, සුළඟ, ගින්න, කුඹල්කරුවා යන මේ සියල්ලම එකතු වී සැදිච්ච දෙයක් බව දැන් ඔබ සැමටම අවබෝධ වුණා නේ ද? මේ සියල්ල ම එකකට එකක් වෙනස්. ඒ වුණත් සියල්ල ම එකට දකින්න පුළුවන්.

''පඤ්චස්කන්ධය පුද්ගලයෙකුගේ ආධාර භූතතත්ත්වයක් පමණයි. රූපාකාරයක ස්ථිරත්වයක් නැහැ. හේතුව රූපාකාරයත් නිදහස්ව ඇති වූ දෙයක් නොවේ. පඤ්චස්කන්ධයෙන් කිසිම ස්කන්ධයක් ස්වතන්ත්‍ර නැහැ. මේ සියල්ලම ස්කන්ධ රහිතයි.

''භික්ෂුවරුනි, ඉන්ද්‍රිය හය, විෂය හය, චේතනා හය යන මේ සියල්ලම ශූන්‍යයි. එකඑක ඉන්ද්‍රිය එකඑක විෂය එකඑක චේතනාව යන මේවා එකක් තව එකකට සම්බන්ධයි. මේ කිසිම දේක නිදහස් බවක් නැහැ. සියලුම ධර්ම තමන්ගේ හැඳිනීමට තව දෙයක් ආධාර කරගන්නවා. මේ නිසා සියලුම ධර්මවල හිස් බවක් තියනවා. එහි අදහස කිසිම ධර්මයක් ස්ව තන්ත්‍රව හැඳින්වීම අපහසු බවයි.''

'' සමහර උගත් අන්‍යාගමික නායකයෝ කියනවා, බුදුරදුන් අනාත්ම වාදය ශූන්‍යවාදය ගැන කියනවා කියලා. ඒ සමඟ ම ඒ අය කියනවා. බුදුරදුන් සියලුම දේ නැත කියන දේශනාව දේශනා කරන බව. මා හිතන ආකාරයට අන්‍යාගමික නායකයන් ඔබතුමන්ගේ දහම වැරදි ආකාරයකට ප්‍රචාරය කරනවා,'' යැයි ආනන්ද හිමියෝ පැවසූහ.

''මේ කාරණය බ්‍රාහ්මණ ආචාර්යවරුන් හෝ අන්‍යආචාර්යවරුන් අවබෝධ කර නොගැනීම පළවෙනි කාරණයයි. දෙවන කාරණය මා කිසිම කෙනෙකුට සම්පූර්ණ ජීවිතය අවසානය දක්වා සතුටින් ජීවත් වීමට ඇති පහසුකම් ගැන වැරදි හැඟීමක් දුන්නේ නැහැ. කිසිම දේක සකාරත්ම සත්‍යතාවය පෙන්නුවා හැර අනවශ්‍ය නකාරාත්මක දේවල් ගැන කිව්වේ නැහැ.

''ආනන්ද මේ ලෝකයේ ප්‍රමුඛ විචාර ධාරා දෙකක් තියනවා. මේ විචාර ධාරා දෙකේම සියලුම සත්වයෝ පටලැවිලයි ඉන්නේ. ඒ විචාර දෙක තමයි ඊෂ්වරවාදය සහ අනීෂ්වරවාදය. ඊෂ්වරවාදී මතයෙහි සියලුම ධර්ම ස්ථිර යි. අනීෂ්වර වාදය අනුව සියලුම දේ මායාවක් පමණි. මේ දෙකින් කොයි එකක හරි

පටලැවුනොත් සසර සත්‍යය කියන්නේ කුමක්ද කියලා කිසි කෙනෙකුට හිතා ගන්න අපහසුයි.

''ආනන්ද, වරක් භික්ෂු කච්ඡායන මගෙන් ඇහැව්වා බ්‍රමික විචාර මොනවා ද කියලා. මා කිවුවා ඊෂ්වරවාදය සහ අනීෂ්වර වාදය යන දෙකින් එකක ගැලීම බ්‍රමික මායාවේ දැලට හසු වීමක් හැටියට. සත්‍ය හැටියට දකින මා මේ බ්‍රමික සිතුවිලි දෙකින්ම නිදහස්වයි සිතන්නේ. සත්‍ය ගැන දන්න පුද්ගලයා ඉපදීම සහ මරණය දක්වා ඇති සාංසාරික ගති විධින් ගැන ගැඹුරට හිතලා ඒ ගැන අවබෝධයක් ලබා ගන්නවා. අන්න ඒ නිසයි මා මේ අදහස් දෙකටම නැඹුරු නොවන්න කියා පීඩාවක් ඇති වූ විට බුද්ධිමත් පුද්ගලයා පීඩාව ගැන අවබෝධයක් ඇතිව කටයුතු කරනවා. පීඩාව අඩු වන විට ඒ ගැනත් කල්පනාවෙන් කටයුතු කරනවා. සත්‍ය පිළිබඳව දෘෂ්ඨිය රකින්නා බ්‍රමික ජාලාවලට හසුවන්නේ නැහැ. ඒ දෙකින්ම නිදහස් මධ්‍යස්ථ මාර්ගයකට යොමු වෙන්න සිත යොදා ගන්නවා.

''ආනන්ද ඊෂ්වරවාදයේ සහ අනීෂ්වරවාදයේ සත්‍යයක් නැහැ.''

''ගුරුතුමනි. ඉපදීම සහ මරණය යන දෙකත් ශූන්‍ය ද එහෙම නැත්නම් ඒ දෙකත් අදහස් දෙකක් පමණක් ද?'' මේ සියල්ලම අසා සිට ආනන්ද හාමුදුරුවෝ නැවත ඇසුවෝය.

''ආනන්ද මා කියන්නේ සියලුම ධර්ම ඉපදීම නැතිවීම යන කරුණු දෙකට අන්තර් ගතයි කියලායි. නමුත් සම්‍යක් දෘෂ්ඨියෙන් බැලුවොත් ස්වභාවධර්මය පමණක් අජරයි අමරයි.

''උදාහරණයක් ගත හොත් මේ ධර්ම ශාලාව ඉදිරිපිට නුඹ රෝපනය කළ බෝධි වෘක්ෂය කවදාද ඇති වුණේ?''

''ගුරුතුමනි, මේ බෝධි වෘක්ෂය වසර හතරකට පෙර මා විසින් රෝපණය කළා. බෝධි වෘක්ෂයේ බීජය ඒ සඳහා සුදුසු වුණා. එදයි එය පැළ වුණේ.''

''ආනන්ද මීට කලින් ඔබ මේ බෝධි වෘක්ෂය මේ ආකාරයෙන් දැක්කා ද ?''

''නැත ගුරුතුමනි, කවදාවත් මා මේ බෝධි වෘක්ෂය මේ ආකාරයට මා දැක්කේ නැහැ.''

''නුඹ කියන ආකාරයට මේ බෝධි වෘක්ෂය ශූන්‍යයෙන්

ඇති වෙච්ච දෙයක්. මේ වාගේ කිසි ධර්මයක් ශූන්‍යතාවෙන් ආරම්භ වෙනවා ද?''

ආනන්ද හාමුදුරුවෝ නිහඬ වුවෝය.

බුදුරදුන් තමන් වහන්සේගේ දේශනය දිගට ම කරගෙන ගියෝය. ''මේ ලෝකයේ ශූන්‍යතාවකින් තොරව කිසිම දෙයක් පහළ වන්නේ නැහැ. බීජයක් නැතිව පැළයක් රෝපණය වන්නේ නැහැ. බෝධි වෘක්ෂයේ ඇති වීම සිදු වුණේ බීජය නිසයි. බීජය බිම දැමූ විට සෘතු රස්නය, තෙතමනය කියන මේ සැම දේ එකතු වූ විට පුංචි අංකුරයක් හට ගන්වා. ඒ පුංචි අංකුරය ලොකු ගසක් හෝ වැලක් හෝ බවට පත් වෙනවා.

''ආනන්ද, බීජය කවදාවත් මැරෙන්නේ නැහැ. මරණය කියන්නේ ඇති ස්වභාවයෙන් වෙනත් ස්වභාවයක ආකාරයක් ගැනීමයි. ඉපදීම හා මරණයත් ඒ වාගේ දෙයක්. බෝධි වෘක්ෂය ගැනත් ඇත්තේ ඒ වාගේ දෙයක්. බීජය කවරදාවත් මැරෙන්නේ නැහැ. එය වෘක්ෂයක් නැත්නම් වැලක් බවට පරිවර්තනය වෙනවා.

''ආනන්ද, සියලුම ධර්ම පූර්ණත් නැහැ ශූන්‍යත් නැහැ. සුවඳත් නැහැ ගඳත් නැහැ. අඩු වන්නේත් නැහැ. වැඩි වන්නේත් නැහැ. එන්නේත් නැහැ. යන්නේත් නැහැ. එකකුත් නොවෙයි ගොඩකුත් නොවෙයි. සියලුම ධර්ම මානසිකව හදාගත් සමාජයේ ගණන් මිනුම් සහ නීති රීතියි. සියලුම ධර්ම ගැන භාවනාව කරන තැනැත්තාට මේ කාරණය තේරුම් ගන්න පහසු වෙනවා.

''ආනන්ද සියලුම ධර්ම මූල ප්‍රකෘතිය අනුව කිසිම දෙයක් පිරිලත් නැහැ, කිසිම දෙයක් හිස්වෙලත් නැහැ. ආනන්ද, නුඹ කවදා හරි දවසක මහ මුහුදේ ඉවුරේ සිට එන රළ දැක්කා ද? ඒ රළ ඇවිත් විනාශ වෙනවා දැක්කා ද? අජර, අමර වීම ද ජලය හා සමාන බව සිතන්න. ඉපදීම හා මරණය මුහුදේ වෙරළට එන රළ වාගේයි. ආනන්ද රළ දිගටත් එනවා. කෙටියටත් එනවා. ඉතා ම ඉහළටත් යනවා. යටටත් යනවා. නමුත් ජලය ජලයමයි. ජලය නැතිව රළ හට ගැනීමක් වන්නේ නැහැ. රළ නැවත මුහුදට ගොස් ජලය බවට පත් වෙනවා. ජලය රළ බවත්, රළ ජලය බවත් කිව්වාට වරදක් නැහැ. රළය ඉක්මනට එනවා ඉක්මනට යනවා. මේ නිසා සියලුම ධර්ම ගැන ශූන්‍යතාව අනුව සිතූ විට යථා ස්වභාවය දැනගන්න පහසු වෙනවා.''

බුදුරදුන්ගේ දේශනය අවසාන විය. බුදුරදුන්ගේ දේශනාවලින් මා ඇසූ අද්භූතම දේශනාව මෙයයි. බුදුරදුන්ගේ ජ්‍යෙෂ්ඨ භික්ෂූන්ගේ දෙනෙත්වලින් සතුට පිළිබඳ අදහස් පිට වුණා. ස්වස්ති ශබ්ද ගැන අවබෝධයක් ලැබිණි. නමුත් එහි යථාර්ථය අවබෝධ වූයේ නැත. ස්වස්ති ආනන්ද හාමුදුරුවෝ මේ දේශනාව නැවත වරක් හැමෝටම දේශනා කරන බව ස්වස්ති දැනගෙන සිටියේය. එදාට වැඩිහිටි භික්ෂූන් සමග සාකච්ඡා කරන බව ස්වස්ති දැනගෙන සිටියේය. මේ ගැන තව විස්තර දැනගන්න පුළුවන් වේවි යැයි ඔහු සිතුවේය.

## හැට හය වන පරිච්ඡේදය

# පර්වත හතර

දවසක් උදෑසනම මුගලන් මහ රහතන් වහන්සේ බුදුරදුන් හමු වීමට ගියෝය. දෑසේ කඳුළු වැගිරෙමින් තිබිණි. දෑසින් කඳුළු වැගිරෙන්නේ කුමක් නිසා දැයි බුදුරදුන් මුගලන් හිමියන්ගෙන් ඇසූහ. ''මං භාවනා කරන විට තම ආදරණීය මෑණියන් සිහිපත් වුණා. මෑණියන් ගැන සිතෙන විට මා කල්පනා කළා තරුණ කාලේ මා ඇයට කොපමණ කරදර කළා ද? නමුත් ඒක මට දුකට කාරණයක් වුණේ නැහැ. මට දුක ඇය ජීවත්ව සිටි කාලයේ ඇයට මගෙන් කිසිම සේවයක් නූන එක ගැනයි. මගේ මෑණියන්ගේ කර්මය ද ඒ තරම් හොඳ නැති බව මා දුටුවා. ඇය තම ජීවිත කාලයේ සමහර නරක වැඩත් කිහිපයක් කළා. ඇය කළ වැරදි වැඩ ඇයට තවම කරදර කරනවා. ධ්‍යාන කරන විට මා දැක්කා පුංචි පිඟානක බත් ටිකක් තියනවා. මා අතට අරගෙන ඇයට ඒ බත් ටික කවන්න සූදානම් වූ විට ඒ බත් ගිනි ගුලි වෙලා ඇයගේ මුව පත්තු වෙන්න ගත්තා. ගුරුතුමනි, මේ චිත්‍රය මගේ සිතින් ඈත් වෙන්නේම නැහැ. මට හිතා ගන්න අපහසුයි. ඇගේ මේ පාප කර්මයෙන් ඇයව මුදා ගන්නේ කොහොම ද කියලා,'' යැයි මුගලන් මහ රහතන් වහන්සේ ඊට පිළිතුරු වශයෙන් කීවෝය.

ජීවත්ව ඉන්න අවස්ථාවේ දී ඇය කලේ මොන විදියේ පාපකර්මයක් දැයි බුදුන් වහන්සේ ප්‍රශ්න කර සිටියෝය.

''ඇය ජීවත්ව සිටි කාලයේ සද්ධර්මය ගැන කවර දාවත්ම සිත යෙදුවේ නැහැ. සතුන් මරණයට පත් කළා. ඇය බොහෝම කර්කශ පවු කළා. ඇගේ වචන වලින් අනිත් අයට හානි සිදු වුණා. ඇය ගස් පඳුරුත් භූතයින් බවට පත් කරලා මිනිසුන් භය ගැන්නුවා. ඇගේ පව් කර්ම ගණන් කරන්නත් අපහසුයි. කෙටියෙන් කියනවා නම් කියන්න තියෙන්නේ ඇය සම්පූර්ණ ජීවිත කාලයේ සියලුම පස් පව් කළා කියන එකයි. ගුරුතුමනි, මගේ මව කළ පව්වලට මා ඕනෑම දඬුවමක් විඳින්න සූදානම්. කරුණාකරලා කියන්න කරන්න ඕනෑ කුමක් ද කියලා,'' මුගලන් මහ රහතන් වහන්සේ පැවසූහ.

''මුගලන්, ඔබගේ මාතෘ ප්‍රේමය ගැන මා අති ප්‍රසන්න වුණා. මාපියන්ට ඇති ණය ගැන කතා කරනවා නම් ආකාශය හා සමාන විශාල මහා සමුද්‍රය හා ගැඹුරට වඩා විශාල බව සිතන්න. මේ ලෝකයේ පෘතග්ජනයන් මේ ගැන අමතක කරන්න හොඳ නැහැ. යම් කිසි දවසක බුදුවරුන් ලෝකයේ නැත්නම් ඒ වෙනුවට ඉන්නේ මෑණියන් සහ පියාණන් පමණයි. මුගලන්, ඔබගේ මව ජීවත්ව සිටි කාලයේ ඔබ හැකි පමණ සේවය කළ බව ඔබ දන්නවානේ. දැන් මව මේ ලෝකයේ නැති නිසා ඔබ ඒ ගැන හිතලා දුක් වෙනවා. ඉන් ඔබගේ මෑණියන්ට ඇති ආදරය ගැන දැන ගන්න පුළුවනි. මේ සිද්ධිය නිසා මා අති ප්‍රසන්න වුණා.

''ඔබගේ ආදරණීය මෑණියන්ගේ දුගතියෙන් බේරා ගැනීමට ඔබට කළ හැකි ක්‍රම කීපයක්ම තියනවා. පළමු ක්‍රමය තමයි ඔබ ගත කරන ශ්‍රේෂ්ඨ ශීලවන්ත ජීවිතය. දෙවන කාරණය තමයි ඔබ බොහෝ අයව සද්ධර්ම මාර්ගයට යොමු කළා. මේ ගැන මගෙත් යෝජනාවක් තියනවා. වස් අවසාන කාලයේ සියලුම භික්ෂූන් එකට එකතු වෙනවා. එදාට අපි සියලු දෙනාම එකතු වී භාවනා කරමු. අප අතර ඉතාම ශීලවන්ත ගුණවන්ත උසස් ඵල ලාභී රහතන් වහන්සේලා බොහෝ ඉන්වා. මේ සියලු දෙනාගේ භාවනා ශක්තිය එකතු වූ විට මහා ශක්තියක් බවට පත් වෙනවා. ඉන් ඔබගේ ආදරණීය මෑණියන්ට පින් අනුමෝදන් කරන්න පුළුවන්. එමඟින් ඔබගේ මෑණියන්ට දුගතියෙන් නිදහස් වෙන්න පුළුවන්. අප ආශ්‍රය කරන භික්ෂූන් අතර ඔබ වගේ තව කී දෙනෙක් ඇද්ද?

සියලු දෙනාගේම දෙමාපියන් වෙනුවෙන් මේ උතුම් කාර්යය කරන්න ඕනෑ. මේ ගැන අපේ සමාජයේ තරුණ අයටත් කියලා දෙන්න ඕනෑ.

''මොග්ගල්යාන, සමාජයේ බොහෝ අය තම දෙමාපියන්ව හඳුනන්නේ මිය ගිය විටයි. දෙමාපියන් ජීවත් වීම දරුවන්ට සැප ගෙන දෙන්නක්. දෙමව්පියන් දරුවන්ට සැප ගෙන දෙන ප්‍රධාන ආයතන දෙකයි. දෙමව්පියන් ජීවත්ව ඉන්න කාලයේ දී ඒ අයට සේවය කිරීම ඉතාම වැදගත්. ජීවත්ව සිටියත් මිය ගියත් දරුවන්ගේ වැදගත් වැඩ දැකලා ඒ අය සතුටට පත් වෙනවා. ඒ අයගේ හොඳ ගැන තම ජීවිතයට සම්බන්ධ කර ගන්න ඕනෑ. දුප්පත් අයට උපකාර කිරීම, විකලාංග අයට උපකාර කිරීම, අඳ ගොළු බිහිරි අයට උපකාර කිරීම, ගස් සිටවීම, මරණයට ගෙනයන සතුන් ඉන් නිදහස් කිරීම, වයසට පත්වූ අයට උපකාර කිරීම, ආදී කටයුතුවලින් තවතවත් පින් රැස් කරගන්න පුලුවන්. මේ සියලුම කාර්යයන්ගෙන් ද මිය ගිය දෙමාපියන්ට පින් අනුමෝදන් කරන්න පුලුවන්. වස් කාලය අවසන් වීමෙන් පසුව අප සැමට ම එහෙම කරන්න පුළුවන්,'' බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කළහ.

මේ දේශනාවෙන් පසුව මහ මුගලන් මහ රහතන් වහන්සේගේ සිතට සැනසීමක් ලැබිණි.

එදා සක්මන් භාවනාවෙන් පසුව පසේ නදී කොසොල් රජතුමා විහාරය ඉදිරිපිට දී බුදුරදුන් හමු විය. නිඝණ්ඨ සම්ප්‍රදායේ සාධුවරුන් හත් දෙනෙක් මේ දෙදෙනා ඉදිරියෙන් ගියේය. මේ අය නිර්වස්ත්‍රව සිටි අයයි. ඒ අය හිස බෑම, රැවුල් බෑම, ආදිය කළේ නැත. බුදුරදුන්ගෙන් අවසරගෙන පසේනදී කොසොල් රජතුමා ඒ සාදුවරුන් ළඟට ගියේය. ගිහිල්ලා කිව්වා ''ගෞරවණීය සාදු වරුණි, මා කොසොල් ජනපදයේ රජු පසේනදී,'' කියමින් තමාට තමා කවුදැයි ඔවුනට හඳුන්වා දුන්නේය. රජතුමා ඒ අයට තුන් වරක් නමස්කාර කළේය. නමුත් ඒ අය කිසිවක් පැවසුවේ නැත. සාධුවරුන් හත් දෙනා එතැනින් නික්ම ගිය පසු රජතුමා ඔබ වහන්සේ දන්න තරමින් මේ අය අතර සිද්ධි ප්‍රාප්ත කර ගත්ත හෝ කරගන්න පුළුවන් කවුරු හරි ඉන්නවා ද?'' යැයි බුදුරදුන්ගෙන් විමසා සිටියේය.

''ඔබ රජකම ගැන පමණයි දන්නේ. හේතුව ඔබ රජ කෙනෙක්. මේ අය කොපමණ දුරට ආධ්‍යාත්මික වශයෙන් දියුණු ද කියලා ඔබට තීරණය කරන්න කිසිසේත්ම අපහසුයි. කිසිම කෙනෙකුව දවසක් දෙකක් ආශ්‍රය කරලා ඒ ගැන තීරණය කරන්න අපහසුයි. මේ ගැන දැන ගන්න කාලයක් ආශ්‍රය කරන්න ඕනෑ. ඒ අය සමඟ සාකච්ඡා කරන්න ඕනෑ. ඒ අයගේ ගුණ ගැන සොයන්න ඕනෑ. කනබොන හැසිරෙන ආකාරය ගැන සොයන්න ඕනෑ. ඊට පස්සේ යම්කිසි තීරණයකට එන්න පුළුවන්,'' යැයි බුදුන් වහන්සේ පැවසුවෝය.

රජතුමාට බුදුරදුන් කී දේ අවබෝධ විය. ''චරපුරුෂයන් යම් දෙයකට පරීක්ෂාවකට යනවා නම් යවන්නේ මේ ක්‍රමයට තමයි. ඔබගේ කතාව සම්පූර්ණයෙන්ම සත්‍යයි. කෙනෙකුව දවසින් දෙකින් කිසි සේත්ම හඳුනගන්න අපහසුයි,'' රජතුමා පැවසුවේය.

බුදුරදුන් රජතුමාට තම කුටියට එන ලෙස ආරාධනා කළේය. රජතුමාට හිත හොඳට නිදහස් කරගෙන කතා කරන්න. යැයි උන් වහන්සේ රජතුමාට කීවෝය.

රජතුමා ඉතා ම සතුටට පත් වී ''මගේ වයස දැන් අවුරුදු හැත්තෑවයි. ඒ නිසා ජීවිතය ධාර්මික කාර්යයන් සඳහා යොදන්න තීරණය කළා. මේ දවස්වල වැඩිපුර කාලය ධ්‍යාන භාවනා ආදිය කරන්නයි මා යොදලා තිබෙන්නේ. රාජ කාර්යයත් මේ සමඟ කරන්න ඕනෑ. ඉඳහිට විවේකයක් රැගෙන ඔබ වහන්සේගේ ධර්මය ශ්‍රවණය කරලා ගියාම ශරීරයට මහන්සිකයත් දැනෙනවා. මගේ දෑස විවෘත්තව තබා ගන්න අපහසුයි. දිනක් කෑම කාලා මා භාවනා කරන්න පටන් ගත්තා. නිදිමත හැදුණා. ඊට පස්සේ නින්ද නැති කරන්න සක්මන් භාවනාව කළා,'' යැයි ප්‍රකාශ කළේය.

බුදුරදුන් සිනාසී, ''කතාව නම් ඇත්ත. ඒකට තියෙන්නේ කෑම පොඩ්ඩක් අඩු කරලා කන එකයි. එයින් ඔබගේ සිත හා කය සැහැල්ලු වීමත් සිද්ධ වෙනවා. ඔබගේ බිසව මල්ලිකාට, හරි කුමරියට, හරි කියන්න, ඔබගේ කෑම ගැන කල්පනාකාරී වෙන්න කියලා. ඔබගේ කෑම ප්‍රමාණය අඩු වෙනවා සමඟම පෝෂ්‍ය ගුණය අධික විය යුතු බව ද මතක තියාගන්න ඕනෑ,'' යි පැවසුවෝය.

රජතුමා බුදුරදුන්ගේ කතාව සාවදානම අහගෙන සිට එය පිළිගත්තේය.

බුදුරදුන් තම දේශනාව දිගටම කරගෙන ගියේය. ''ඔබ ධ්‍යාන භාවනා ගැන සිතනවා වගේම ශරීරය ගැනත් සිතන්න. එයත් ඉතා ම වැදගත්. දැන් ඔබගේ වයසේ හැටියට වැඩිපුර කාලයක් ජීවත් වෙන්න ලැබෙන්නේ නැහැ. මහ රජතුමනි, යම් කිසි ආකාරයකින් ඔබගේ ඉතාම හිතවත් කෙනෙක් ඇවිදින් කිවුවොත් මහා විශාල කන්දක් ආකාශයේ පාවී ඇවිත් පෙර දිගින් තමන් ඉන්න පැත්තට එනවා කියලා. එහෙම වුනොත් ඒ මඟදී හමුවන හැම දෙයක්ම විනාශ කරගෙන නේ ද එන්නේ? ඒ වගේම සතර දිගින් පර්වත හතරක් ඒ ආකාරයටම ආවොත් ඔබවත් විනාශ කරගෙන ඇති සියලු දේත් විනාශ කරගෙන යනවා නේ ද? ඔබත් විනාශයට පත් වෙනවා නේ ද? මේ වාගේ අවස්ථාවක ඔබ කරන්නේ කුමක් ද?

රජතුමා ටික වේලාවක් නිහඬ විය. මේ වාගේ වෙලාවක ඉතිරි වී තිබෙන කාලයෙන් උපරිම ප්‍රයෝජන ගන්නා බව රජතුමා කීවේය.

බුදුරදුන් රජතුමාට ප්‍රශංසා කළෝය. ඔබගේ කතාව සම්පූර්ණ ඇත්ත. සිද්ධ විය යුත්තේත් එයයි. මහා පර්වත හතර හැටියට මා සලකන්නේ ඉපදීම, වයසට පත්වීම, ලෙඩ වීම, මරණය යන මේ හතරයි. වයසට පත් වීම සහ මරණය අප දෙදෙනා ළඟට දැන් සමීප වෙලයි තියෙන්නේ. ඉන් අපව මුදවා ගන්න කෙනෙක් නැහැ,'' යි බුදුරදුන් රජතුමා අමතා කීවෝය.

රජතුමා දෑත එක්කොට බුදුරදුන්ට වැන්දේය. ආචාර්යවරයාණනි. වයසට පත් වීම සහ මරණය දැන් අප ළඟට ක්‍රමයෙන් සමීප වෙනවා. එනිසා ඉතිරිව තිබෙන කාලය ධ්‍යාන භාවනා දාන පුණ්‍යකර්මවල යෙදිලා තමුන්නාන්සේ කිව්වා වගේ ඉදිරි ආනාගතයේ අයට ආදර්ශයක් වන ආකාරයට ගත කරන්න ඕනෑ,'' යැයි කීවේය.

රජතුමා සිටි තැනින් නැගිටලා බුදුරදුන්ට තුන් වරක් නමස්කාර කළේය.

මෙවර ශ්‍රාවස්තියේ වස් කාලය තුළ විවිධ ධර්ම අදහන බොහෝ අය එකට එකතු විණි. විවිධ ධර්ම සම්ප්‍රදායවල අය

එකට එකතු වී තම තමන්ගේ ධර්ම සම්ප්‍රදාය ගැන සාකච්ඡා කිරීමට අවස්ථාවක් කර ගත්තෝය. බුදුරදුන්ගේ උපාසක පිරිස ද මේ සාකච්ඡාවන්වලට සම්බන්ධ වූහ. ඔවුහු විවිධ ධර්ම ගුරුවරුන්ගේ දේශනා ගැන බුදුරජානන් වහන්සේට දැනුම් දුන්හ. සියලුම දෙනා තමතමන්ගේ ධර්ම සම්ප්‍රදායවල ඇති වැදගත්කම ගැනමයි දේශනා සාකච්ඡා සියල්ලම ඉතාම ශාන්ති පූර්වකව අවසන් වෙමින් තිබිණි. නමුත් අවසාන දවස් කීපය ක්‍රෝධය පිරි කෝලාහළ ස්වරූපයක් ගත්තේය.

බුදුරදුන් මේ ගැන අසා භික්ෂූන්ට මේ සිද්ධිය අලලා එක්තරා කතාන්තරයක් කියා දුන්හ.

''දවසක් දක්ෂ රජ කෙනෙක් තම මාළිගාවට රාජ්‍යයේ සිටි අන්ධ පිරිසට එන්න කියලා ආරාධනාවක් කළා. කරලා ඒ අය මැදට ඇතෙකු ගෙනත් තැබුවා. පසුව ඒ අයට කිව්වා ඇතා කොහොමද කියලා තමන්ට දැනෙන ආකාරයට කියන්න කියලා. එක් අන්ධයෙක් ඇතාගේ කකුල අතගාලා කිව්වා ඇතා ගෙදර කණුව වගේ කියලා. තව කෙනෙක් ඇතාගේ වල්ගය අල්ලලා කිව්වා අවන්පත් දණ්ඩ වගෙයි ඇතා කියලා. තව කෙනෙක් හිස අතගාලා කිව්වා ඇතා කල ගෙඩිය වගෙයි කියලා. තව කෙනෙක් හොඬ වැල අතගාලා කිව්වා මහා සැරයටියක් වගෙයි කියලා. මේ අය සියලුම දෙනා එකට එකතු වෙලා සාකච්ඡා කළා ඇතාගේ ස්වරූපය ගැන. අන්තිමට කිසි තීරණයක් ගන්න බැරිව සියලුම දෙනා තම මතය තහවුරු කරන්න තමන් දුටු අදහස් ගෙන හැර දැක්වුවා. අන්තිමට ගාලගෝට්ටියක ස්වරූපයක් ගත්තා.

''භික්ෂුවරුනි, ඔබ දුටු ඇසූ දේ මේ මහා ගාලගෝට්ටියේ එක් අංශයක් පමණයි. මේ සාකච්ඡාව ගැන බොහෝ දුරට සිතුවොත් එහි සත්‍යය ඇත්තේ ඉතාම ටිකයි. සද්ධර්මය ගැන සිතන පුද්ගලයා ඉතාම නිහතමානීව සිතන්න ඕනෑ, ඔහුගේ දැනුම ඉතාම අල්පයි කියා. සද්ධර්මය ගැන තවතවත් දැන ගන්න උත්සාහ ගන්න ඕනෑ කියලා. සද්ධර්මය ඉගෙන ගන්න අය නිදහස් අදහස් ඇති අය වෙන්න ඕනෑ. තමන් දරන වර්තමාන අදහස්ම සම්පූර්ණ සත්‍ය හැටියට සලකන්න ගියොත් ඇත්ත කුමක් ද කියා දැන ගන්න අපහසුයි. සද්ධර්මය ගැන හොඳ අවබෝධයක් ලැබීමට කරුණු දෙකක් ප්‍රධාන වශයෙන්ම සාධක වෙනවා. පළවෙනි කරුණ නිහතමානී බව වන අතර දෙවන කරුණ විවෘත මනසකින් යුක්ත වීමයි.''

# හැට හත් වන පරිච්ඡේදය
# සාගර කවි

වස් කාලය අවසන්වීමත් සමඟම භික්ෂූන් වහන්සේ බුදුරදුන්ගෙන් අවසර ගෙන ධර්ම ප්‍රචාරය සඳහා පිටත්ව ගියෝය. බුදුරදුන්ගේ ප්‍රියතම භික්ෂුවක් වූ පුන්න, තමන්ගේ ගම් ප්‍රදේශයේ ධර්ම ප්‍රචාරය සඳහා යන බව කීවේය. පුන්න පෙර දිග සමුද්‍රය ප්‍රදේශයේ ස්වර්ණ දේශයේ කෙනෙක් විය.

බුදුරදුන් පුන්න අමතා ''මා අහල තියනවා තවම ඔබගේ ගමේ අය එතරම්ම උගත් අය නොවෙයි. ඒ සමඟ හිංසාව ආදියට යොමු වී ඇති බවත් සුළු සුළු දේට ආරවුල් ඇති කර ගන්න බවත්. මේ නිසා ඒ පැත්තේ ධර්ම ප්‍රචාරය සඳහා යාම ගැන මා එතරම්ම සතුටක් නැහැ,'' ප්‍රකාශ කළෝය.

පුන්න හාමුදුරුවෝ, ''එය සත්‍යයයි. ඒ ගමේ අය තවමත් නූගත් අය වගේම සුළු සුළු කාරණාවලට ආරවුල් ඇති කර ගන්න මහන්සි ගන්නවා. ඒ නිසයි මා එහි ධර්ම ප්‍රචාරය කරන්න යන්න කැමති. මා ගිහිල්ලා අහිංසාව, කරුණාව ආදී ගුණාංග ගැන ඒ අයට කියා දෙන්න ඕනෑ. මා විශ්වාස කරනවා මේ ගමනේ දී සාර්ථක ප්‍රතිඵල පෙන්විය හැකි බව,'' කීවෝය.

පුන්න ඒ අය ඔබට අවනම්බු කළොත් ඔබව ගණන් නොගෙන කෑකෝගහන්න පටන් ගත්තොත්?'' බුදුන් වහන්සේ ඇසුවෝය.

''ගෞරවණීය බුදුරජාණන් වහන්ස, ඒ කිසිම දෙයක් ලොකුවට මා ගණන් ගන්නේ නැහැ. ඒ අය මට ගල් ගහන එකක් නැහැනේ. ගඳ දේවල් මගේ ඇඟට විසි කරන එකක් නැහැනේ.'' පුන්න භික්ෂුව කීවේය.

''එහෙම කලොත්?'' බුදුන් වහන්සේ ඇසීය?

''එහෙම කළොත් මට ලී දඬු වලින් ගහන එකක් නැහැනේ.''

''ඔබට අල්ලගෙන හොඳටම තැලුවොත්?''

''එහෙම වුණත් ඒ අය මාව මරණයට පත් කරන එකක් නැහැනේ.''

''පුන්න, ඔබව මරණයට පත් කළොත්?''

''එහෙම වුණොත් මා සතුටු වෙනවා සද්ධර්මය අනුව කරුණාව මෛත්‍රිය අහිංසාව වැනි උතුම් ධර්ම ප්‍රචාරය කරන්න ගිහිල්ලා මේ සිද්ධියට මට මුහුණ පාන්න සිද්ධ වුණා කියලා.''

පුන්න හාමුදුරුවන්ගේ කතාව අසලා බුදුහාමුදුරුවෝ තම සතුට පළ කළෝය. ''ඔබ මගේ ස්තුතිය ලැබීමට සුදුසු කෙනෙක්. ධර්ම ප්‍රචාරය සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් ඔබ වහන්සේට තියනවා. මා කලින් අර තරම් ප්‍රශ්න ඇහැව්වේ අනිත් භික්ෂූන්ටත් දැනගන්නයි. ඔබගේ දක්ෂකම් පිළිබඳව මා මීට කලින් දැනගෙනයි සිටියේ,'' අවසානයේ බුදුන් වහන්සේ පැවසූහ.

පුන්න හාමුදුරුවෝ පැවිදිවීමට පෙර වෙළඳ ව්‍යාපාරිකයෙකු හැටියටයි ජීවත් වුණේ. තම ගම් ප්‍රදේශයේ උත්පාදන ශ්‍රාවස්තිය වැනි ධනවත් ප්‍රදේශවලට ගෙනැවිත් විකිණීම ඔහුගේ ව්‍යාපාරය විය. තම මස්සිනා සමඟ ගොන් කරත්ත මඟින් හෝ නදී මඟින් බඩු රැගෙන ඒම කළේය. දිනක් තම බඩු තොගයක් ශ්‍රාවස්තියට එනතෙක් ඔහු බලාගෙන සිටියේය. ඒ අතර භික්ෂූන් සමූහයක් පිණ්ඩපාතයේ වඩිනවා දුටුවේය. භික්ෂූන්ගේ සෞම්‍යකම දැක පැහැදී ජේතවනාරාමයට ධර්මශ්‍රවණය කරන්න ගියේය. ධර්ම ශ්‍රවණය කිරීමෙන් පසු ව්‍යාපාර කිරීම ගැන හිත යොමු වීම අඩු විමෙන් පසුව ව්‍යාපාරයේ සියලුම කටයුතු තම මස්සිනාට බාර දී පැවිදි විමට සිතා ගත්තේය. පැවිදිවීමෙන් පසුව ධ්‍යාන භාවනාවේත්

ශික්ෂාවේත් ඉතාම දියුණු තත්වයකට පත් විය. ධර්ම ප්‍රචාරය කරමින් මගධයේ සහ වෛශාලියේ බොහෝ කාලයක් ගත කළේය. පුන්න තම ගමේ සපලතා පූර්වකව ධර්ම ප්‍රචාරක කටයුතු ඇත යන්න ගැන සියලුම භික්ෂූන්ට දැඩි විශ්වාසයක් තිබිණි.

ඊළඟ වසන්ත ඍතුවේ බුදුරජාණන් වහන්සේ පෙර දිග පෙදෙසට වැඩම කළෝය. වෛශාලියේ සහ චම්පා වනයේ නතර වූහ; ගඟ දිගට ගොස් සමුද්‍රයට ළඟා වූහ. සමුද්‍ර වෙරළේ ටික වේලාවක් රළ දෙස බලා සිටින විට ආනන්ද හාමුදුරුවෝ ''ගුරුතුමනි, සමුද්‍රය වෙරළ සහ රළ දකින විට ශරීරයට සනීපයක් දැනෙනවා. ඒ සනීපය වෙන කිසිම තැනකින් ලැබෙන්නේ නැහැ,'' පැවසුවෝය.

මේ අතර සිටි සමහර භික්ෂු පිරිසක් මාලු අල්ලන පිරිස සමඟ කතාව ආරම්භ කළහ. ආනන්ද හාමුදුරුවොත් මේ අය අතරට ගොස් සමුද්‍රය ගැන ඇති අසිරිමත් දේ ගැන ආශාවෙන් කරුණු ඇසුවෝය. මාලු අල්ලන එක තරුණයෙක්, ''මට මහා සමුද්‍රයේ කරුණු කීපයක් ඉතාම හිත ගත් ඒවා හැටියට හඳුන්වන්න පුළුවන්. පළවෙනි කාරණය වෙරළ දක්වා රළ වැලි රැගෙන විත් දිගට කන්ද වගේ හදනවා. මේ නිසා අපේ ඔරු මුහුදට අදින විට කරදරයක් නැතිව ලෙහෙසියෙන් මුහුදට ඇදගන්න හැකි වෙනවා. අනෙක් කාරණය මුහුද බොහෝ විට තම සීමාවේමයි ඉන්නේ. මේ නිසා මා දන්නවා මුහුද අපට හමු වෙන්න හැකි කොතැන ද කියා. අනෙක් කාරණය මහ මුහුද කවාදාවත් කැත කුණු තමන් ළඟ තබා ගන්නේ නැහැ. මොන ක්‍රමයකින් හෝ වෙරළට ගෙන විත් දානවා. ගංගා, යමුනා, සරස්වතී, අචිරවතී යන නදී සමුද්‍රයට එකතු වූ විට ඒ ඒ නදීවල නමවත් නැතිවීම අනෙක් කාරණයයි. ගංගා කොපමණ ජලය ගෙන ආවත් මුහුද තම සීමාව දක්වා තම ගෞරවය රැක ගන්නවා. උතුරන්න දෙන්නේ නැහැ. මුහුදේ වතුර හැමදාම ලුණු රසයි. මුහුදේ ඉතාම වටිනා සත්තු වගේම වටිනා ගල් මුතු ආදිය ද තියනවා. ඉතාම පුංචි සතුන් මෙන්ම විශාල සතුන් පවා ජීවත් වෙනවා,'' යැයි කීවේය.

''දැන් ඔබ සැමටම දැනෙනවා ඇති මා සමුද්‍රයට මෙතරම් ආදරය කරන්නේ ඇයි කියා,'' යැයි ඔහු තවදුරටත් පැවසුවේය.

ආනන්ද හාමුදුරුවන් ස්තුති කරන ආකාරයෙන් මාලු අල්ලන ඒ තැනැත්තා දෙස බලා සිටියේය. දක්ෂ කවියෙක් මෙන්

මාළු අල්ලන මේ මනුෂ්‍යයා මුහුද ගැන කොච්චර හොඳ වර්ණනාවක් කළා ද කියා, උන් වහන්සේ කල්පනා කළෝය.

ආනන්ද හාමුදුරුවෝ ''මේ මනුෂ්‍යයා මුහුද ගැන විස්තර කිව්ව ආකාරය කොච්චර ලස්සන ද? අප සම්බෝධියට කොපමණ ආදරේ ද? ඒ වාගේ ඒ මාළු කාරයා මුහුදට ආදරය කරනවා. මේ ගැන ඔබ වහන්සේ යමක් දේශනා කරනවා ද? යැයි බුදුරදුන්ගෙන් ඇසුවෝය.

බුදුරදුන් සිනා සී සද්ධර්මය ගැනත් මහ මුහුද ගැනත් දේශනා කරන්න ගත්තෝය. ''මාළු අල්ලන මිත්‍රයා මහ මුහුදේ විශේෂතා කිහිපයක් ගැන සඳහන් කළේය. ඒවාගේ සද්ධර්මය පිළිබඳව මාත් ඔබට යමක් කියන්නම්. ධර්මය සමුද්‍රය වගෙයි. වැලි තලාවේ සිට ක්‍රමයෙන් ගැඹුරට යනවා සේ වන්නේ නැහැ. සද්ධර්මයට ළඟා වෙන්න කැමති පුද්ගලයා වෙහෙස මහන්සි වෙන්න ඕනෑ. උත්සාහ ගත්තේ නැත්නම් සද්ධර්ම සාගරයට ළඟා වෙන්නත් අපහසු යි.''

''ධර්මයේ අර්ථය ඉතා ම විශාලයි. තරුණ මහලු සියලුම මානසික ස්වභාවයන් එහි අන්තර්ගතයි.

''සමුද්‍රය වගේ ධර්මයත් කිසිම තැනදී සීමාව ඉක්ම වන්නේ නැහැ. තමන්ගේ තැනම ඉන්නවා.

ධර්මය කවදාවත් තම සිද්ධාන්ත මාරු කරන්නේ නැහැ. සීලය ස්වච්ඡ රූපයෙන් තේරුම් ගන්නත් පුලුවන්. තෝරන්නත් පුලුවන්. ඕනෑම කෙනෙකුට ඕනෑම තැනක ශීලය ආරක්ෂා කරන්නත් පුලුවන් කම තියනවා. ධර්මය කොහේවත් යන්නෙත් නැහැ. නැති වෙන්නෙත් නැහැ.

''මුහුද කැත කුණු ආදිය තමන් ළඟ තබා ගන්නේ නැහැ. ඒ වගේ ධර්මයත් ශීලවන්ත කම නැති කිරීම ආදී දේ ඉවසන්නේ නැහැ. අශීලාචාර අයව සමාජය තමන්ගේ ආශ්‍රයෙන් ඈත් කරනවා.

''සමුද්‍රය සියලුම නදී තමන්ගේ බවට පත් කර ගන්නවා. ඒවාගේ සද්ධර්මය සියලුම වර්ගවල සියලුම මිනිසුන්ව එකට එකතු කරනවා. සියලුම දෙනා සමාන දෘෂ්ඨියෙන් දකිනවා.

''සියලුම නදී සමුද්‍රයට ගිය විට නම් පළාත් නැති කරගන්නා සේ සද්ධර්මයට පිවිසුණු පුද්ගලයාගේ ජාති වංශ ආදිය ගැන සටහන් නැති වෙලා සියලු දෙනා එක මිනිස් සමාජයක් හැටියට සලකන්න ගන්නවා.

''සමුද්‍රය තම ජලයේ ප්‍රමාණය අඩු කරන්නෙත් නැහැ. වැඩි කරන්නේත් නැහැ. ඒ වාගේ සද්ධර්මයත් තම සීමාව අඩු කරන්නේත් වැඩි කරන්නේත් නැහැ. ධර්මය ශිෂ්‍යයින්ගේ සංඛ්‍යාව අනුව තීරණය කරන්න අපහසුයි.

''සමුද්‍රයේ ජලය හැමදාම ඇත්තේ එකම රසය යි. නොයෙක් මාර්ග ක්‍රම තිබුණත් ධර්මයේ රසය එකයි. එහි රසය විමුක්ති රසය යි.

''සමුද්‍රයේ වටිනා මුතු, මැණික්, සංඛ ආදිය තිබෙනවා. ඒවාගේ සද්ධර්මයේහිත් චතුරාර්ය සත්‍යය විසුද්ධි හතර පංච ගුණ ආර්ය අෂ්ඨාංගික මාර්ගය ශක්ති පහ, චරණ හත ආදී ඉතාම වැදගත් රත්නයන් රාශියක්ම දකින්න තිබෙනවා.

''මහ මුහුද ලොකු කුඩා සියලුම ප්‍රාණීන්ට ජීවත් වීමට ඉඩ දීල තියනවා. ධර්මයත් සියලුම ප්‍රාණීන්ට ජීවත්වීමේ ක්‍රමය කියා දීලා ජීවත් වෙන්න ඉඩ දීලා තියනවා. බෝධි සත්ව ගුණ ඇති අය හෝ අශීලාචාර අය මේ දෙපක්ෂයට ධර්මයේ ඉඩ තියනවා.

ආනන්ද හාමුදුරුවෝ දෑත එකතු කර වැඳලා, ආචාර්යතුමනි, ඔබ මහා ගුරුවරයෙක් සේම දක්ෂ කවියෙක්, යනුවෙන් පැවසුවෝය.

## හැට අට වන පරිච්ඡේදය

# නිවන් දැකීමේ දොරටු තුන

සමුද්‍ර වෙරළින් පිටත් වී බුදුරදුන් වෛශාලි සහ පාටලී පුත්‍ර නගරයට වැඩම කළෝය. නැවත තමන්ගේ රටට ආපසු වැඩියෝය. නිඝණ්ඨ නාථ පුත්ත කළුරිය කළ බවත් ශිෂ්‍ය පිරිස කොටස් දෙකකට බෙදී ඇති බවත් ශාක්‍ය ජනපදයට පිවිසුණ දවසේ උන් වහන්සේට දැනගන්න ලැබිණි. දෙපක්ෂය අතර මහා කයෝර මතභේද ඇති වූ බව ද දැනගන්න ලැබිණි. දෙපක්ෂය ම අනෙක් පක්ෂයට විරුද්ධව කළ හැකි සෑම චෝදනාවක්ම කළෝය. කුමන පැත්තක් අර ගත්තේ ද යන්න තෝරා බේරා ගැනීමට හැමට නොහැකි විය.

ශාරිපුත්ත මහරහතන් වහන්සේගේ අන්තේවාසික ජණ්ඩ, නිඝණ්ඨනාථපුත්තගේ මරණය හා ඇති වූ පක්ෂ දෙකේ ආරවුල ගැන ආනන්ද හාමුදුරුවන්ට විස්තර කළේය. අනන්ද හාමුදුරුවන්ටත් මේ ගැන කලින් සුළු සුළු ආරංචි ලැබී තිබිණි. ආනන්ද හාමුදුරුවෝ බුදුරජාණන් වහන්සේට මේ ගැන කියා ''ගුරුතුමනි ඔබ වහන්සේ නැති වූ දාට භික්ෂු මහා සංඝයා වහන්සේත් කොටස් දෙකකට බෙදී විසිර යාවි ද? බුදුරදුන් ආනන්ද

හාමුදුරුවන්ගේ උර මත අත තබා, ආනන්ද, මොකද භික්ෂූන් වහන්සේලා ධර්මය ගැන ධර්ම සාකච්ඡා ආදිය ගැන මොනවාහෝ කියනවා ද?'' යි ඇසුවෝය.

''ආචාර්ය තුමනි, කිසිම භික්ෂූන් වහන්සේ නමක් එහෙම කතා කරනවා මට ඇහිලා නැහැ. ඔබතුමන් අප ළඟනේ. මා හැමදාම ඔබතුමන්ගේ ඡායාව වගෙනේ ඉන්නේ. මා ඔබ වහන්සේගේ සෑම දේශනාවක්ම අහනවා. ශාන්ත පූර්වකව ධ්‍යාන භාවනාත් කරනවා. නමුත් ඔබතුමන් නැති දාට ධර්මය ගැන කරන සාකච්ඡාවල දී අසහමතියක් ඇති වෙන්න පුළුවන්. එහෙම වුණොත් ප්‍රශ්න ඇති වේවි. සංඝර්ෂය ඇති වුණොත් සංඝ සමාජය දෙකට බෙදීමත් ස්වාභාවික යි. ඒ සමඟම සද්ධර්මය ගැන තිබුණු විශ්වාසයත් නැති වෙනවා නේ ද? යැයි ආනන්ද හාමුදුරුවෝ පිළිතුරු දුන්හ.

''ආනන්ද, ඒ ගැන සිතන්න එපා. යම් කිසි ආකාරයකින් සංඝයා අතර ශික්ෂාව ගැන විවිධ අංග ගැන වාද විවාද ඇති වුනොත් ඒ ගැන හිතන්න ඕනෑ. නමුත් ශීල පාලනය, සංඝ සමාජයේ ව්‍යවස්ථාව, ධර්ම දික්ෂා, ආදිය ගැන සම්මුතියක් නැති නම් ඒ ගැන කිසි සේත්ම හිතන්න ඕන නැහැ,'' බුදුරදුන් පැවසූහ.

බුදුරදුන් එසේ ප්‍රකාශ කළත් ආනන්ද හාමුදුරුවන්ගේ සිතේ මේ ගැන ඇතිවූ චංචල ගතිය අඩු වූයේ නැහැ. බුදුරදුන්ගෙ පෞද්ගලික උපස්ථායක සුනක්ඛත්ත පෞද්ගලික කාරණයක් නිසා භික්ෂු සමාජයෙන් අස් වූ බව ආන්නද හාමුදුරුවන්ට දැනගන්න ලැබිණි. සුනක්ඛත්ත තැනතැන ගොස් කතා පවත්වමින් බුදුරදුන්ට ධර්මයට සහ සංඝයාට නිගරු කරන බව ආරංචි විය. ''බුදු හාමුදුරුවන්ගේ අමුතු ගුණයක් නැත. අනෙක් මිනිස්සු වගේ ම බුදු හාමුදුරුවොත් සාමාන්‍ය කෙනෙක්. ඔය කියන විශේෂ ගුණ කිසිවක් නැති බවත් පුද්ගලිකව මුක්තිය ලැබීම හැර සමාජය ගැන උන්වහන්සේගේ දේශනාවේ කිසි දෙයක් අන්තර්ගත නැති බවත්, යනුවෙන් සුනක්ඛත්ත සියලුම දෙනාට පවසමින් යන්නේ යැයි ද ආරංචි පැතිර ගියේය.

මේ කාරණය ශාරිපුත්ත මහ රහතන් වහන්සේටත් දැනගන්න ලැබිණි. උන් වහන්සේත් මේ සිද්ධිය ගැන සිටියේ කන්ස්සල්ලෙනුයි.

රජගහ නුවර අසතුටුදායක ආරංචි ක්‍රමයෙන් පැතිරෙන බව ආනන්දට දැනගන්න ලැබිණි. මේ සඳහා දේවදත්තගේ ප්‍රධානත්වයෙන් භික්ෂූන් වහන්සේලා කිහිප නමක් බුදුරජාණන් වහන්සේගෙන් වෙන් වී නිදහස් කණ්ඩායමක් සාදාගෙන අලුත් කණ්ඩායමකට එකතුව කටයුතු කරන්න සූදානම් වන ආරංචිය ද කෝකාලික, කටමෝරකතිස්ස, කඩ්දේව් පුත්‍ර සහ සමුදත්ත යන භික්ෂූන් වහන්සේලා දේවදත්ත හාමුදුරුවන්ට මේ සඳහා සහයෝගය දෙන බව ද දැනගන්නට ලැබිණි. දේවදත්ත බුදුරජානන් වහන්සේගේ ජ්‍යෙෂ්ඨ ශිෂ්‍යයින්ගෙන් දක්ෂම කෙනෙක් හැටියටයි කවුරුත් දැනගෙන හිටියේ. ශාරිපුත්ත මහ රහතන් වහන්සේ සැම දෙනා ඉදිරිපිට දීම සැම විටම දේවදත්ත හාමුදුරුවන් වහන්සේ ගැන ප්‍රශංසා කළෝය. ශාරිපුත්ත මහ රහතන් වහන්සේ දේවදත්ත හාමුදුරුවන් තම ඉතාම හිතවත් මිත්‍රයා ලෙසටත් හැඳින් වූවෝය. දේවදත්ත හාමුදුරුවෝ බුදුරජාණන් වහන්සේ ගැන මේ තරම් වෛර කරන්නේ ඇයි දැයි ආනන්ද හාමුදුරුවන්ට සිතා ගන්නටත් අපහසු විය. මේ සිද්ධිය ගැන මේ දක්වා කිසිම කෙනෙක් බුදු හාමුදුරුවන්ට කරුණු නොකී බව ආනන්ද හාමුදුරුවෝ දැනගෙන සිටියේය. මේ කණගාටුදායක ආරංචිය තමන් විසින්ම බුදුරජානන් වහන්සේට පැවසීමට සිද්ධ වීම ගැන ආනන්ද හාමුදුරුවො දුක් වූයේය.

ඊළඟ වස් කාලය ගත කිරීම පිණිස බුදු හාමුදුරුවෝ ශ්‍රාවස්තියට වැඩම කළෝය. දිනක්, ජේතවනාරාමයේ වැඩ සිටියේ භික්ෂූන් වහන්සේලා අමතලා බුදුරදුන් පැවසුවේය, ''අද මා ඔබ වහන්සේලාට ඉතාම වැදගත් සූත්‍රයක් දේශනා කරනවා. හිත නිදහස් කරගෙන කල්පනාවෙන් ඒ සූත්‍රය ශ්‍රවනය කරන්න,'' යනුවෙනි.

''භික්ෂුවරුනි, සමහර ධර්ම මුද්‍රාවලින් සත්‍යය පැහැදිලි වෙනවා. මගේ සැම දේශනාවකම මුද්‍රා තුනක් තියනවා. ශූන්‍යතා, අනිමිත්ත, අප්පහීනතා යන මේ තුනයි. මේ මුද්‍රා තුනේ දේශනාවලින් සසරින් එතෙරවීම කළ හැකියි. භික්ෂුවරුනි ශූන්‍යතාවයේ අදහස අනීශ්වර වාදය නොවෙයි. එහි අදහස නම් කිසිම දේක නිදහස් ස්වරූපයක් නැති කමයි. ඔබ සැම දන්නව ඊශ්වර වාදයෙහි සහ අනීශ්වර වාදයේ සත්‍යයක් නැති බව. සැම

ධර්මයක්ම සවභාවයක්ම තමන්ගේ හැඳින්වීම සඳහා තව දෙයක් උපයෝගී කරගන්නා බව. එකක් නැත්නම් තව එකක් විද්‍යාමාන වන්නේ නැහැ.

''භික්ෂුවරුනි, පටිච්ච සමුප්පාදය පිළිබඳව සිත යොමු කරන්න. ඉන් ඔබ සැමට දැනගන්න පුළුවන් එක ධර්මයක් තව ධර්මයක් සමග ඇති සම්බන්ධය. ඉන්ද්‍රිය හය, ඒ ඉන්ද්‍රියවල විෂය රූප හය, එහි චේතනා යන කරුණු දහ අට ගැන සිත යොමු කරන්න. ශරීරයේ ස්කන්ධ පහ කාය, චේතනා ගැන භාවනා කිරීමෙන් ඔබට දැන ගන්න පුළුවන් මේ ලෝකයේ සියලුම දේවල් එකකට එකක් තව එකක් සමඟ සම්බන්ධ බව. මේ සියල්ල ගැන ඔබ දැන ගතහොත් ශූන්‍යතාව කුමක් ද කියා ඔබට දැනගන්න හැකි වේවි. මේ ගැන හරි හැටි කරුණු අවබෝධ වූ විට ඔබ කිසිම ධර්මයක් අත්හරින්නේවත් දැඩිව අල්ලා ගන්නේවත් නැහැ. මේ නිසා නිවන අවබෝධ කර ගැනීමේ ප්‍රථම දොරටුව ලෙස ශූන්‍යතාවය මා දක්වනවා.

''භික්ෂුවරුනි, දෙවන මුද්‍රාව අනිමිත්තතාවයයි. අවධාරණ සහ භේද බුද්ධියෙන් ඉහළටම ගොස් සිතීම. මින් මානසික භේද භාවයන් කොටස් කරනවා. මේ ගැන සිතන විට ඔබට සිතේවි සාමාන්‍ය අවධාරණ අංගසම්පූර්ණ නැති බව. අවධාරණාවන් සාමාන්‍ය ප්‍රකෘති දෑසින් දකින හැකියාවක් නැහැ. මේ නිසා සමහර අය ලනුව සර්පයා හැටියට දකිනවා. නියම ආකාරයට ලනුව දුටු විට ඒ සර්පයෙක් නොවෙයි ලණුවකැයි කියා දැන ගන්නවා.

''භික්ෂුවරුනි, අස්තිථිව අනස්තිථිව ඉපදීම, මරණය එකක් වගේම අනෙකක් දෘෂ්‍යය අදෘෂ්‍යය අඩු වීම, වැඩි වීම ආදිය මානසික වශයෙන් සිදුවන මිනුම් පමණයි. සත්‍ය පිළිබඳ කරුණු මේ මිනුම් දණ්ඩෙන් බැඳ තබන්න කිසිසේත් ම පුළුවන්කමක් නැහැ. අස්ත්ථිව අනස්තිථිව ඉපදීම මරණය එකක් සමග අනෙකක් දැකීම හා නො දැකීම ඒම සහ යෑම යන මේ සියල්ල පිළිබඳව ඇත්ත තත්වය දැනගැනීම සඳහා ධ්‍යාන භාවනා කළ යුතුයි. ඉන් ඔබ බලාපොරොත්තු වන මුක්තිය හෝ විමුක්තිය ලබාගත හැකි යි.

''අනිමිත්තතාවය සසරින් නිදහස් වීමට ඇති දෙවන මග යි. තුන්වන මුද්‍රාව ආත්ම විහිනත්වය හෙවත් ආත්මයක් නැත

කියන භාවනාව. එහි ප්‍රධාන අදහස කිසි දෙයක් ලබා ගැනීමට එහි පසුපස දුවන්න අවශ්‍ය නැහැ. බොහෝ අය එක් ධර්මයක් සඳහා අනෙක් ධර්ම අතහැර එක ධර්මයක් පස්සේ කිසිම විචාරයක් නැතිව දුවනවා. අනෙක් ධර්මවලින් ප්‍රවේශම් වීමටත් උත්සාහ දරනවා.

දුප්පත්කම නැති කිරීමට පොහොසත්වීමට මහන්සි ගැනීම ස්වාභාවිකයි. ආධ්‍යාත්මික විමුක්තිය සඳහා ඉපදීම සහ මරණය ගැන සිතීම අත් හරිනවා. එක ධර්මයක් තව ධර්මයක් සමඟ සම්බන්ධ නම් එක ධර්මයක් අත් පත් කර ගැනීම සඳහා තව ධර්මයක් අත් හරින්නේ කොහොම ද? ඉපදීම සහ මරණය අතර නිර්වාණය දකින්න හැකියාව තිබෙනවා. නිර්වාණය සඳහා ඉපදීම මරණය යන දෙක පිළිගන්නේ නැත්නම් සියලුම ධර්ම පිළිබඳ පටිච්ච සමුප්පාදයෙහි මූලික ස්වරූපය පිළිගන්න අපහසුයි. මේ නිසා ආත්මයක් නැත හෙවත් අනාත්මය ගැන සිතීමේ දී එකක් ලැබීම සඳහා තව දෙයක් අත් හැරීමේ අදහසින් භාවනා කළොත් නිවන් අවබෝධ කරගැනීම පහසු වෙනවා.

''තමන් විසින් තමන්ගේ ප්‍රඥාව යොමු කර තමන් ධ්‍යාන භාවනා කිරීමෙන් දැන ගන්න පුළුවන් කිසිම දෙයක් ස්වතන්ත්‍ර නොමැති බව. ඔබ සොයන දේ ඇත්තේ ඔබ ළඟමයි. එය නිවන් අවබෝධ කර ගැනීමේ තුන්වන මාර්ගයයි.

''භික්ෂුවරුනි ධර්ම මුද්‍රාවල ශික්ෂාවන් මෙයයි. මේ ගැන ඉගෙන ගන්න ධ්‍යාන කරන්න එවිට ඔබ වහන්සේලාට මේ කාරණය ඉතා මහොඳින් අවබෝධ වේවි.''

බුදුරදුන් දේශනාව අවසන් කළ පසුව ශාරිපුත්ත මහරහතන් වහන්සේ බුදුරදුන් ඉදිරියට වැඩියෝය. ඒ සමඟ ම බුදුරදුන්ට ස්තුති කිරීම සඳහා අනෙක් භික්ෂූන් වහන්සේලාත් වැඩම කළහ. බුදුරජාණන් වහන්සේගේ මේ දේශනාව ගැන තව දුරටත් සාකච්ඡා කිරීමට අද සවස සියලුම භික්ෂූන් වහන්සේ එකට රැස්විය යුතු බව ශාරිපුත්ත මහ රහතන් වහන්සේ සියලුම භික්ෂූන් වහන්සේලාට දැනුම් දුන්නේය. බුදුරදුන් දේශානා කළ මේ සූත්‍රය ඉතාම ජටිල සූත්‍රයක් වගේ ම ගැඹුරු සූත්‍රයකි. මේ නිසා මේ ගැන තවත් සාකච්ඡා කර ඒ ගැන පුහුණු වීම කිරීමට කටයුතු යෙදිය යුතුය.

දේශනාව අවසානයේ දී මහා කාශ්‍යප ශාරිපුත්ත, පුන්න සහ මහා මොග්ගල්ලායන යන ප්‍රධාන ශිෂ්‍ය හිමිවරුන් මහත් සතුටකින් පිරී ඉතිරී සිටින ආකාරය ස්වස්ති හාමුදුරුවෝ දුටුවේය.

සියලුම භික්ෂූන් නැගී සිට දෑත් එකතු කර බුදුරජාණන් වහන්සේට හිස නමා නමස්කාර කළහ. පසු දා හවස් වරුවේ යමේලු සහ තේකුලී යන භික්ෂූන් වහන්සේලා දෙදෙනා බුදුරදුන් හමුවට ගියෝය. මේ භික්ෂූන් දෙදෙනාම බ්‍රාහ්මණ පවුල් වලින් පැමිණ පැවිදි වූ අයයි. ඔවුන් භාෂා ශාස්ත්‍ර සාහිත්‍ය ගැන විශේෂ දැනුවක් තිබුණු පිරිසකි. මේ දෙන්නා බුදුරදුන් සමීපයට ගොස් ''අප ඔබ තුමන්ගේ දේශාන ශෛලියේ භාෂාව ගැන යමක් සාකච්ඡා කරන්න ඕනෑ'' යැයි කීවෝය.

''ඔබ වහන්සේගේ දේශනාවන් කරන්නේ මාගධී භාෂාවෙන්. නමුත් බොහෝ භික්ෂූන් මාගධී (පාලි) භාෂාව දන්නේ නැහැ. මේ නිසා ඔබ වහන්සේගේ දේශනා අනෙක් භාෂාවන්ටත් පරිවර්තනය කරනවා නම් ඉතාම හොඳයි. අපට මීට කලින් වෙනත් භාෂාවලට ඉගෙන ගැනීමට ඉඩ තිබුණා. ඔබ වහන්සේගේ දේශනා වෙනත් භාෂාවන්ට පරිවර්තනය කිරීමේ දී විවිධ අර්ථවල හි අඩුපාඩු ඇතිවීම ස්වාභාවිකයි. නමුත් සියලුම භික්ෂූන් වෛදික භාෂාව දන්න නිසා වෛදික භාෂාවෙන් සියලුම ධර්ම දේශනා සිදු කරන්නේ නම් සියලුම දෙනාට පහසුවෙනවා. ඒ සමග දේශනාවේ කිසිම අඩුවක් නො වන්නත් වග බලාගන්න ඕනෑ,'' ඔවුහු තවදුරටත් කීහ.

බුදුරදුන් ටික වේලාවක් නිහඬව සිට, ''ඔබලාගේ යෝජනාව බාර ගැනීම එතරම්ම සුභදායක නැහැ. ධර්මය එක්තරා සත්‍යයක්. වරින්වර මාරුවන භාෂාවක්, තේරුම් ගැනීමට අපහසු භාෂාවක්, උපයෝගී කරගෙන ධර්ම දේශනා කිරීමට මා කැමති නැහැ. සෑම දෙනාම දන්න සරල භාෂාවක් වන මාගධී භාෂාව මා තෝරා ගත්තේ ඒ නිසයි,'' යනුවෙන් පැවසූහ.

බුදුරජාණන් වහන්සේගේ අදහස දැනගත් පසු උන් වහන්සේලා බුදුරදුන්ට වැඳ නමස්කාර කර එතැනින් පිටව ගියහ.

## හැට නව වන පරිච්ඡේදය
# ගෞතම තථාගත වූ වග

දවසක් මහා සුලි සුළඟක් හමන වෙලාවක උත්තිය නමින් ප්‍රසිද්ධව සිටි එක් තාපසයෙක් බුදුරජානන් වහන්සේ හමුවට පැමිණියේය. ආනන්ද හාමුදුරුවෝ ඒ තාපසතුමා බුදුරජාණන් වහන්සේ ළඟට රැගෙන ගොස් හඳුන්වා දුන්නා. බුදුරජාණන් වහන්සේ තාපස තුමාට වාඩිවෙන්න කිව්වා. ආනන්ද හාමුදුරුවන් වහන්සේ රෙදි කඩක් රැගෙන විත් සුලි සුළඟ නිසා ඇගේ තැවරුණු දූවිලි පිසදා ගන්න යැයි තාපස තුමාට කීවෝය.

උත්තිය තාපස තුමා බුදුරජානන් වහන්සේගෙන් ''ගෞතමයිනි, මේ මහා පෘථිවිය ස්ථිර ද නැත්නම් කවදා හරි විනාශ වෙනවා ද?'' යනුවෙන් ප්‍රශ්න කළේය.

බුදුරදුන් සිනහවක් පහළ කර උත්තිය ඔබතුමා මේ ගැන යමක් සිතන්නේ නැත්නම් මා මීට පිළිතුරු නොදී ඉන්න ද? යනුවෙන් ඇසුවෝය.

දෙවනුව උත්තිය ''මේ සසර අනන්ත ද අනන්තයෙන් පිට ද? යනුවෙන් ඇසුවෝය.

බුදුරදුන් ''මේ ප්‍රශ්නයත් මගෙන් පිළිතුරු නො ලැබෙන එකක්,''යි කීවෝය.

ඉන් පසුව ''ශරීරය සහ ආත්මය එකක් ද නැත්නම් කොටස් කොටස් හැටියට ද ඇත්තේ?'' යනුවෙන් ප්‍රශ්න කළේය.

මේ ප්‍රශ්නයටත් උත්තර දේන්නේ නැහැ කියලා බුදු හාමුදුරුවෝ ප්‍රකාශ කළෝය.

''ඔබ වහන්සේ පිරිනිවන් පෑමෙන් පස්සේ දකින්න හැකි වේවි ද නැද්ද?'' යනුවෙන් ඇසුවේය.

මේ ප්‍රශ්නයටත් පිළිතුරු නොදෙන බව බුදුහාමුදුරුවෝ පැවසූහ.

''ඒකේ අදහස ඔබ වහන්සේ දකින්නත් නැහැ. එහි කිසි දෙයක් ඉතිරි වන්නේත් නැහැ,'' උත්තිය නැවත ඇසීය.

''තපස් උත්තිය, මේ ප්‍රශ්නයටත් මා උත්තර දේන්නේ නැහැ.''

තාපස උත්තිය විශාල අසීරුතාවකට පත්විණි. ''ගෞතමයාණනි, ඔබ වහන්සේ මගේ සියලුම ප්‍රශ්නවලට උත්තර දීම ප්‍රතික්ෂේප කළා. ඔබ වහන්සේ මොන ප්‍රශ්නයට ද උත්තර දෙන්න සූදානම්?'' යැයි නැවත ඇසුවේය.

කවුරු හෝ කෙනෙක් ශරීරය, සිත යන මේ ගැන සිත පාලනය කිරීම ගැන, සිතේ ස්වභාවය ගැන, දුක, දුක ඇතිවීම ගැන, දුක නැති කිරීම, දුක නැති කිරීමේ මාර්ගය ගැන ඕනෑම කෙනෙක් අහන ප්‍රශ්නවලට මා පිළිතුරු දෙන්න සූදානම්. හේතුව එමගින් ඒ අය දුකින් මිදී සතුටට පත් වෙනවා,'' යැයි බුදුන් වහන්සේ ප්‍රකාහ කළහ.

''ඔබ වහන්සේගේ අදහස් අනුව ඔබ වහන්සේගේ දේශනා මාර්ගයෙන් කී දෙනෙකුව දුකින් නිදහස් කිරීමට හැකියාව තියනවා ද?'' යැයි උත්තිය නැවත ඇසුවේය.

බුදුරදුන් මේ සඳහාත් පිළිතුරු නොදී නිහඬව සිටියෝය. තාපස උත්තියත් කිසිවක් නොකියා නිහඬව සිටියේය.

උත්තිය තාපසයා ඔහුගේ ප්‍රශ්න ගැඹුරු නිසා බුදුරදුන් පිළිතුරු දීමට අසමර්ථව සිටිනවා ඔහු සිතනු ඇතැයි ආනන්ද හාමුදුරුවෝ අදහස් කළහ. ''උත්තිය ඔබ බුදුරජාණන් වහන්සේගේ අදහස කුමක් ද කියලා තේරුම් ගත්තා නේ ද?'' යැයි උන් වහන්සේ උත්තිය අමතා කීවෝය.

''උදාහරණයකට ගන්න බලවත් රජ කෙනෙක් රජ මැදුර හතර වටේ මුරකාවල් යොදාගෙන එක දොරටුවක ඉඳගෙන ඒ

දොරටුවෙත් තද මුරකාවල් ඇතිව ඉතාම හොඳට අඳුනන අයට පමණක් රජ මැඳුරට ඇතුළු වීමට දී මාළිගාවේ කිසිම බිත්තියක ඉරි තැලීමක් වත් නැතිව ඒ ගැනත් ඉතාම හොඳින් පරීක්ෂාකාරීව සිටින විට රජතුමාත් ඉතාම නිසසලව සිංහාසනයේ සිටින බව රජතුමාට දැන ගන්න නොලැබුනොත් එන්නේ කවුද? කීදෙනෙක් අවාද? යන්නේ කවුද? කියා රජතුමා හොඳටම දන්නවා මුරකාරයෝ මාළිගාව ඇතුළට එන්න දෙන්නේ තමන් ඉතා ම හොඳට දන්න අඳුනන අයට පමණක් කියලා. ගෞතම බුදුරජානන් වහන්සේගේ තත්වයත් ඒ වගේ.''

උන්වහන්සේ කිසිසේත්ම හිතන්නේ නැහැ උන් වහන්සේගේ ශිෂ්‍යවරුන් කොපමණ ද කියාලා. උන් වහන්සේ සිතන්නේ සද්ධර්මය ගැන පමණයි. ඉන් මිනිසුන්ගේ හදවතින් ලෝභ, හිංසා, මායා ජාලය, නැති කරන්නේ කොහොම ද? ඔබ මගේ ගුරුතුමාගෙන් අහන්න සිතෙහි, ශරීරයෙහි, අයිතිකරු වන්නේ කොහොම ද කියා. මේ ගැන උන් වහන්සේ ඔබතුමාට ඉතාම සාර්ථක පිළිතුරක් දෙනු ඇත,'' ආනන්ද හාමුදුරුවෝ තවදුරටත් පැවසූහ.

උත්තිය තාපසතුමා ආනන්ද හාමුදුරුවන්ගේ උදාහරණ ඉතාම හොඳින් අවබෝධ කර ගත්තේය. නමුත් උත්තිය තාපසතුමා තමන්ගේ ආධ්‍යාත්මික ප්‍රශ්නවල සිත පටලවාගෙනයි සිටියේ. මේ නිසා උත්තිය තවතවත් ප්‍රශ්න අසන්න සූදානම් වූයේ නැත. නමුත් බුදුරදුන් සමඟ සිදු වූ හමු වීම ගැන සතුටු වී එතැනින් නික්ම ගියේය.

ටික දිනකට පසුව වච්චගොත්ත නමින් ප්‍රසිද්ධ තාපසයෙකු බුදුරදුන් හමුවට ආවේය. ඒ තාපසතුමාත් උත්තිය ඇසූ ස්වභාවයේම ප්‍රශ්න ඉදිරිපත් කළේය. බුදුරදුන් කිසිම දෙයක් කතා නොකර නිහඬව සිටියේය. වච්චගොත්තත් නිහඬව ටික වේලාවක් ඉඳ නික්ම ගියේය. ඉන් පසු ආනන්ද හාමුදුරුවෝ ''ගුරුතුමනි, ඔබව හැම විටම ඔබගේ ධර්ම දේශනාවල දී අනාත්මය ගැන කියනවා. නමුත් ඔබ වහන්සේ වච්චගොත්ත ඇසූ ප්‍රශ්නයට පිළිතුරු නොදුන්නේ ඇයි?'' යනුවෙන් ඇසුවේය.

ආත්ම ශූන්‍යතාවය මා භාවනා කිරීම සඳහායි නියම කරන්නේ. එය සිද්ධාන්තයක් හැටියට සිතන්න එපා. කවුරු හරි කෙනෙක් එය සිද්ධාන්තයක් හැටියට සිතුවොත් මහා පඹගාලක

පටලැවුණා වගේ වෙනවා. මා හැමවිටම කියන්නේ මේ දේශනාව නදී තරණය කිරීමට ඔරුවක් පමණක් හැටියට හිතන්න කියලා බව ඔබ දන්නවනේ. වච්චගොත්තට ඕනෑ කළේ ආත්මය සහ අනාත්මය පිළිබඳව මගෙන් එක් පැත්තකට පිළිතුරක් ගන්නයි. නමුත් එහෙම කළා නම් වච්චගොත්තත් ධර්ම ජාලයෙහි අනිවාර්යයෙන්ම පටලැවෙන බව මා දැන ගත්තා. යම් කිසි ආකාරයකින් මා කීවා නම් ආත්මය තියනවා කියලා එය මගේ දේශනාවට සම්පූර්ණයෙන්ම විරුද්ධයි. යම් කිසි ආකාරයකින් මා කීවානම් ආත්මය තියනවා කියලා සිද්ධාන්තයට බැඳලයි තියෙන්නේ. ඉන් වච්චගොත්තට සිදුවන වාසියක් නැහැ. මේ නිසා ඒ වගේ ප්‍රශ්නවලට පිළිතුරු දෙනවට වඩා නිහඬව සිටීම ඉතා සුදුසු බවයි මගේ හැඟීම. කවුරු හරි හිතනවනම් මට මේ කිසි දේකට පිළිතුරු දෙන්න අපහසුයි කියලා ඒකේ අදහස ඒ අය විවිධ දෘෂ්ඨි ජාලාවන්ට මැදි වී ඒ ගැනම සිතසිතා සිටීම හැර වෙන දෙයක් නැහැ.''

දිනක් මඟදි අනුරුද්ධ හාමුදුරුවන් තාපසයෝ කිහිප දෙනෙක් වටකර ගත්තේය. අප අසන ප්‍රශ්නවල පිළිතුරු නොදෙන හොත් යන්න දෙන්නේ නැතැයි ඔවුහු කීහ. ''අපි අහලා තියනවා ගෞතම සර්වඥයි කිය ඔබත් උන් වහන්සේගේ ශිෂ්‍යයෙකු බව ආරංචියි. කරුණාකරලා අපට කියන්න භික්ෂු ගෞතම මරණින් පස්සේ දකින්න හැකි ද නැද්ද කියන කාරණය අප අහන කරුණු හතරෙන් එකක් තෝරාගෙන ඊට පිළිතුරු දෙන්න. පළවෙනි කාරණය බුදුහාමුදුරුවො පිරිනිවන් පෑ විට දකින්න පුලුවන්. බුදුරදුන් පිරිනිවන් පෑ විට දකින්න නැති වෙනවා. පිරිනිවන් පෑමෙන් පසුව බුදුරදුන් දකින්නත් පුළුවන් නොදකින්නත් පුලුවන්. පිරිනිවන් පෑමෙන් පසු බුදුරදුන් විද්‍යාමාන වෙන්නත් පුලුවන් නොවෙන්නත් පුළුවන්.'' යනු ඒ තාපසවරු ඇසූ ප්‍රශ්නයයි.

මේ අහන ප්‍රශ්න හතරම කිසිම පලයක් නැති ප්‍රශ්න බව අනුරුද්ධ හාමුදුරුවෝ දැනගෙන සිටියේය. අනුරුද්ධ හාමුදුරුවෝ කිසිවක්ම නොකියා නිහඬ වූහ. තාපස පිරිසට අනුරුද්ද හාමුදුරුවන්ගේ නිහැඬියාව ඉවසිය නොහැකි කරුණක් විය. ''මේ කරුණු හතරින් එකක් කෙසේ හෝ පිළිගන්න,'' යැයි ඔවුහු බල කළහ.

''ගෞතම බුදුරජාණන් වහන්සේගේ ජීවිත කතාවට මේ කරුණු හතරින් එකක් වත් පිළිගන්න කෙසේවත් නොහැකි යැයි,'' අන්තිමේ දී අනුරුද්ද හාමුදුරුවෝ පැවසූහ.

තාපසවරුන් හතර දෙනා ඉතාම උස් හඬින් සිනාසී, ''අප හිතන ආකාරයට මේ භික්ෂුව අලුත පැවිදි වූ කෙනෙක්. ඒ නිසා මේ කිසිවකට පිළිතුරු දීමට හැකියාවක් ඔහුට නැති නිසා මඟ හැර යන්නයි හදන්නේ. උන් වහන්සේට තවත් කරදර නො කර යන්න ඉඩදෙමු,'' පැවසුවෝය.

දින කිහිපයකට පසු අනුරුද්ධ හාමුදුරුවෝ බුදුරජාණන් වහන්සේ ළඟට ගොස් මේ වාගේ ප්‍රශ්නවලට පිළිතුරු දෙන්නේ කෙසේ දැයි ඇසුවෝය.

බුදුරදුන් අනුරුද්ධ හාමුදුරුවන්ට ''සාමාන්‍ය ඥාණයෙන් බුදුන් දැකීම පහසු නැත. ගෞතම බුදුන් කොහේ ද? රූපාකාරයෙන්, භාවනාවෙන්, භාවබෝධයෙන්, ප්‍රඥාවෙන්, නැත්නම් රූපකායෙන් යන මේ මොන දෙයින් ද බුදුන් දකින්න පුළුවන්කම තියෙන්නේ?'' යැයි බුදුරදුන් අනුරුද්ධ හාමුදුරුවන් අමතා කීවෝය.

''නැත, ගුරුතුමනි.''

''නුඹ බුදුරදුන් දකින්නේ කොහොම ද අනුරුද්ධ? මේ අවස්ථාවේ දී නුඹ බුදුරදුන් ඉදිරියේ ඉන්නේ. නුඹට පුළුවන් ද බුදුරදුන්ව අල්ලන්න. මරණින් පස්සේ. එය ඊටත් වඩා අපහසුයි. අනුරුද්ධ බුදුන් දකින්න නම් උන් වහන්සේගේ ධර්මය හරි හැටි දැන ගන්න ඕනෑ,'' බුදුරදුන් අනුරුද්ධ හිමියන්ට කීවෝය.

''අනුරුද්ධ යම් කිසි ආකාරයකින් නෙළුමක් ගැන නුඹට දැන ගන්න ඕනෑ නම් හිරු එළිය, විල, වලාකුළු, මඩ, යන මේ සියල්ල ගැනම සිතිය යුතුයි. මේ සියල්ල ගැන සිතූ විට සංකීර්ණ අදහස් නැති වෙනවා. මානසික භේද, භාව, බුද්ධියෙන් නිදහස් වෙන්න පුළුවන්. තාපසවරුන් ඇසූ ප්‍රශ්න කිහිපයෙහි සත්‍යයක් කිසි සේත් ම ගැබ්වී නැහැ.

''අනුරුද්ධ සත්‍ය වචනවලින් ව්‍යක්ත කරන්න අපහසුයි. ධ්‍යාන භාවනා කිරීමෙන් ලැබෙන නුවනින් පමණයි සත්‍ය අවබෝධ කර ගන්න පුළුවන් වන්නේ. අඹ රසය දැන ගන්න ඕනෑ නම් අඹ කන්න ඕනෑ. වචනවලින් අඹ ගැන වර්ණනා කරන්න පුළුවන්. මේ නිසා භික්ෂූන්ට මගේ උපදේශ නම් අනවශ්‍ය කරුණුවලට

පටලැවී වාද විවාද කිරීමට වඩා ඒ කාලය ධ්‍යාන භාවනාවට යොදන්න හොඳ බවයි. අනුරුද්ධ සියලුම ධර්මවල තත්වය නිරපේක්ෂයි. ඒ සඳහා ස්වාභාවික ශබ්දය තථතාවයි. තථතාවෙන් ඇති වූ පුද්ගලයාට තථාගත යයි කීම නිවැරදියි. තථතා වචනයේ කිසිම තැනකින් නොපැමිණෙන. කිසිම තැනකට නො යන. යන අදහස ඇති නිසා අද සිට මා මාහට තථාගත කියා ව්‍යවහාර කරනවා,

මේ වචනයට මා විශේෂයෙන්ම කැමති මේ වචනයේ මම, මට, මගේ යන ප්‍රයෝජනයට යොමු වන්නේ නැහැ,'' යැයි බුදුන් වහන්සේ තවදුරටත් අනුරුද්ධ හාමුදුරුවන් සමඟ පැවසුවෝය.

අනුරුද්ධ හාමුදුරුවෝ සිනාසී ''අප සෑම දෙනාම තථතාවෙන් උපදින්නේ කියලා. තථතාවෙන් ඉපදෙන අයගේ ආදි අන්ත දෙකක් ඇත්තේ නැහැ,'' පැවසුවෝය.

'' තථාගත ශබ්දය ඔබ උපයෝගී කරගත් ආකාරය ගැන මා සතුටු වෙනවා,'' යැයි බුදුරදුන් අනුරුද්ධ හාමුදුරුවන් හට පැවසීය.

ආනන්ද හාමුදුරුවෝ ''මේ සාකච්ඡාව සියලුම භික්ෂූන් ඉදිරියේ නැවත කරන්න ඕනෑ සියල්ලටම ප්‍රථම මා මේ සාකච්ඡාව ශ්‍රාවස්තියේ තාපස පිරිසට විස්තර කරන්න ඕනෑ නෑ,'' අනුරුද්ධ හාමුදුරුවෝ පැවසූහ.

## හැත්තෑ වන පරිච්ඡේදය

# ශිෂ්‍යයා කොහොම ද ශිෂ්‍යාවත් ඒ ආකාරයටයි

බුදුරදුන් කවරදාකවක් කිසිම කෙනෙකුගේ අඩුපාඩුවක් දැක ඒ අයට තරවටු කළේ නැත. ඒ අඩුපාඩුව ගැන සිත යොමු කරන්න පමණයි පැවසුවේ. සිත යොමු කර අඩුපාඩු හදා ගන්න අවවාද කළෝය. ස්වස්ති භික්ෂුව තම අඩුපාඩුකම් ගැන නිතරම සිතුවේය. ඊට හේතුව ස්වස්ති තම ඉන්ද්‍රිය භාවනාව මාර්ගයෙන් පාලනය කිරීමට ගත් උත්සාහය නිසයි. සොත්ථිය සිතූ තරම් ප්‍රතිඵල ඉන් ලැබුණේ නැති වුවත් ඒ ගැන නිතර සිත යොමු කළේය. කවුරු හෝ කෙනෙක් කාගේ හෝ අඩුවක් පෙන්වන විට ස්වස්ති සිතුවා ස්වස්තිගේ අඩුවක් පෙන්වනවා යැයි ඔහු සිතුවේය. මේ නිසා ඉන් ස්වස්ති ධ්‍යාන භාවනා කිරීමට තවතවත් ශක්තිය ලැබිණි. රාහුල හාමුදුරුවන්ගේ අඩුපාඩු ගැන කවුරුහරි කතා කරන විට තමන්ගේ අඩුපාඩුකම් ගැන කතා කරනවා යැයි ස්වස්ති හාමුදුරුවෝ සිතුවේය.

දිනක් හවස් වරුවක කැලෑවේ භාවනාවෙන් පසු ස්වස්ති අපි කොච්චර භාග්‍යවන්ත අය ද බුදු හාමුදුරුවන්ගේ ශිෂ්‍යයෝ හැටියට සමාජයේ ජීවත් වෙන්න ලැබීම ගැන, අපි දැන් ශාන්තව

සතුටු සිතින් කොච්චර හොඳට ජීවත් වෙනවා ද?'' ස්වස්ති හාමුදුරුවෝ පැවසූහ.

''නුඹ ඔය සතුටට ඔය තරම් දඟලන්න එපා. ඉන්ද්‍රිය පාලනය කිරීම භාවනාවේ සතුටයි. මේ සඳහා සැම විටම භාවනාවේ යෙදෙන්න ඕනෑ. කෙතරම් ජ්‍යෙෂ්ඨ ශිෂ්‍යයෙකු වුණත් ධ්‍යාන කිරීම භාවනා කිරීම අත් හරින්නේ නැහැ,'' යි රාහුල හාමුදුරුවෝ පැවසූහ.

රාහුල හාමුදුරුවො සොත්ථිය හාමුදුරුවන්ට වංගීස හාමුදුරුවන්ගේ කතාව කියා දුන්නේය. ''වංගීස හාමුදුරුවන් වහන්සේ භාෂාව ගැන හොඳ දැනුමක් තිබුණ කෙනෙක්. උන් වහන්සේ බුදුරජාණන් වහන්සේ ගැන කවි කතා බොහෝමයක් සම්පාදනය කළ භික්ෂූන් වහන්සේ නමක්. මේ ගැන බුදුරදුන් ද කීප වරක් ප්‍රශංසා කළා. නමුත් උන් වහන්සේ විෂය වාසනාව ගැන කිසිම ලාභයක් ලබා ගත් කෙනෙක් නොවෙයි. විහාරයට පැමිණි සැම විටම විහාරයට එන සුන්දර යුවතියන් දිහා බල බලා රස වින්දා. ආනන්ද හාමුදුරුවන් උන් වහන්සේට හැම විටම ශරීරය පිළිබඳව භාවනා කිරීමට උපදෙස් දුන්නා.

''මේ උපදෙස් අනුව භාවනා කිරීමෙන් වංගීස හාමුදුරුවෝ ධ්‍යාන භාවනා කළා. ශරීරය පිළිබඳ අනිත්‍යතාව අවබෝධ කර ගන්න උත්සාහ ගත්තා. ධ්‍යාන භාවනා කිරීමෙන් පසුව පුනර්භවය නැති කිරීම ගැන සිත යෙදුවා.

''ශාරිපුත්ත මහ රහතන් වහන්සේ තරුණ භික්ෂූන්ට ධර්මය ගැන විස්තර කරන විට වංගීස හාමුදුරුවන්ගේ ජීවිත කතාවේ වැදගත් දේ ගැනත් විස්තර කළා. සියලුම භික්ෂූන්ට හැම විටම තමන් ගැන ඇති නිහතමානයත් උච්ඡමානයත් මම මගේ කියන මේ අදහස්වලිනුත් හිත නිදහස් කර ගන්න ඕනෑ. සැම විටම සිහියෙන් යුක්ත විය යුතුයි. ඔබගේ සිතේ මොන ආකාරයේ අදහස් ඇති වෙනවා ද කියා සිහි කල්පනාවෙන් සිටිය යුතුයි.''

''වංගීස හාමුදුරුවෝ සමග සාකච්ඡා කරලා උන් වහන්සේ ආධ්‍යාත්මික වශයෙන් ලැබූ දියුණුව ගැන කතා කර තමනුත් ඉන් පාඩමක් ඉගෙනගන්න ඕනෑ යැයි ස්වස්ති හාමුදුරුවෝ කල්පනා කළේය.

වරක් බුදුරදුන් ඉන්ද්‍රියත් සාගරයත් දෙකම එකට සමාන කර ධර්ම දේශනයක් කළ බව ස්වස්ති හාමුදුරුවන්ගේ මතකයට

ආවේය. ඔබගේ දෑස මහා සමුද්‍රය වගෙයි. සමුද්‍රයෙහි භයානක සත්තු ඉන්නවා. ඒ වගේ ම තද සුළිසුළං වගේ ඊටත් වඩා තද දිය සුළි දිය රැලි තියනවා. යම් කිසි ආකාරයකින් ඔබ ඔබේ දෑස සංවර කර ගත්තේ නැත්නම් සංසාර සාගරයේ ඔබගේ නැව (නුඹ) ගිලෙන බව දැන ගන්න ඕනෑ. ඇස සංවර කරගත්තේ නැත්නම් ඔබගේ සිත සසර සාගරයේ මහා සුළි සුළඟටත් සාගරයේ මහා භයානක මසුන්ටත් හසු වී ජීවිතය විනාශ වනවා. මේ නිසා මේ ජීවිතයත් මහා සමුදුර වගේ සිතාගන්න ඕනෑ. මේ කතාව ඇසූ ස්වස්තිගේ ආධ්‍යාත්මික ශක්තිය වර්ධනය විය. ඉන්ද්‍රිය හය සම්පූර්ණ මහා සාගරය වගේ යැයි ස්වස්තිට සිතුණි. ඉන්ද්‍රිය හයේ සම්පූර්ණ භයානක දේ රැඳී ඇති බව ස්වස්ති සිතුවේය. රාහුල හාමුදුරුවන්ගේ කතාවත් සම්පූර්ණම සත්‍යයකි. මේ නිසා බුදුරජානන් වහන්සේගේ දේශනාව අනුව ධ්‍යාන භාවනා කළ යුතු බවය.

බුදුරදුන් තරුණ භික්ෂූනට ධර්ම දේශනා කරමින්, ''භික්ෂුවරුනි, ඔබ සෑම හැම විටම සිහියෙන් සිටිය යුතුයි. ඉන්ද්‍රිය හය තම වසඟයෙහි තබා ගන්න හැම විටම උත්සාහ ගත යුතුයි. ඔබගේ සිත සිහියෙන් තොර වුවහොත් මොහොතකට හෝ මාරයා ඔබව යටපත් කරගන්නවා. ඉන් මිදීම එතරම්ම පහසු වන්නේ නැහැ. ඉන් භයානක ප්‍රතිඵල ලැබෙනවා,'' යැයි පැවසූහ.

ස්වස්ති හාමුදුරුවෝ ධ්‍යාන භාවනා කර සිත ආධ්‍යාත්මික වශයෙන් දියුණු කරගත් භික්ෂූන්ගෙන් බොහෝ දේ ඉගෙන ගත්තේය.

දිනක් චිත්ත නමින් ප්‍රසිද්ධව සිටි උපාසක කෙනෙක් භික්ෂූන් වහන්සේට දානය සඳහා තම ගෙදරට ආරාධනා කළේය. එදා නවක භික්ෂූන් කෙතරම් දක්ෂ අය ද යනු ස්වස්ති හාමුදුරුවෝ දැන ගත්තේය. චිත්ත උපාසකතුමාත් බුදුරදුන්ගේ දේශනාව ගැන බලවත් ශ්‍රද්ධාවෙන් සිටි කෙනෙකි. දානයට ආරාධනා ලැබූ භික්ෂූන් අතර ස්වස්ති හාමුදුරුවන් සමඟ ඊසා දත්ත හාමුදුරුවෝ ද විය. දානය පූජා කිරීමෙන් පසු චිත්ත උපාසකතුමා සියලුම භික්ෂූන්ට ගෞරව ස්තුති කිරීම සඳහා හිස නමා ආචාර කළේය.

ඉන් පසුව චිත්ත උපාසකතුමා මිත්‍ර භික්ෂූවරුනි, මා බ්‍රහ්ම ජාල සූත්‍රය අසා තිබෙනවා. බුදුරදුන් එකී සූත්‍රයේ හැට දෙකක් සමකාලීන දර්ශන ගැන සඳහන් කර තියනවා. අනිත්

ධර්මාචාර්යවරුන්ගේ දර්ශන අනුව ඉපදීම, මරණය, ආත්මය යන දේවල් ගැන අහල තිබුණි. ආදරණීය භික්ෂුවරුනි, මේවාගේ ප්‍රශ්න ඇතිවීමට හේතුව කුමක් ද?

චිත්ත උපාසක තුමා තම ප්‍රශ්නය නැවතත් ඉදිරිපත් කළා. නමුත් කිසිම භික්ෂූන් වහන්සේ නමක් මේ ප්‍රශ්නවලට පිළිතුරු දුන්නේ නැත. මේ සිද්ධිය සොත්තිය හාමුදුරුවන්ට අවමානයක් සේ දැනුණි. ඊශ්වර දත්ත හාමුදුරුවන් නැඟී සිට මේ ප්‍රශ්නවලට පිළිතුරු දෙන්න අවසර ඉල්ලා සිටියේය.

''නුඹ කැමති නම් මේ සඳහා පිළිතුරු දෙන්න,'' යැයි සියලු දෙනා පැවසූහ.

චිත්ත උපාසකතුමා දෙස හැරී බලා ඊශ්වර දත්ත හාමුදුරුවෝ ''ප්‍රශ්න අහන පුද්ගලයා ආත්මය කියන වචනයේ එල්ලී ගැලී සිටිනවා. ආත්මය පිළිබඳ අදහස් අත් හැරියොත් අනාත්මය ගැන සිතුවොත් මේ විචාර සහ ප්‍රශ්න ඇති වීමක් සිදුවන්නේ නැහැ. සද්ධර්ම මාර්ගය, ඥානය පිළිබඳ දැනුමේ අඩුව යන කරුණු නිසා ශරීරය ආත්මය හැටියට සලකනවා. නැත්නම් ආත්මය ශරීරය කියා සලකනවා. මෙන්න මේ නිසා ඔය වගේ ප්‍රශ්න ඇති වීම ස්වාභාවිකයි,'' යැයි පැවසුවේය.

තරුණ භික්ෂුවගේ පිළිතුරට සතුටට පත් වූ චිත්ත උපාසකතුමා, ''ඔබතුමා මොන පළාතේ කෙනෙක් ද? යැයි ඇසුවේය.

අවන්ති රට කෙනෙක් යැයි තරුණ භික්ෂුව පිළිතුරු දුන්නේය.

''ගුරුවරුනි මට දැන ගන්න ලැබුණා අවන්ති දේශයේ ඊශා දත්ත නමින් ඉතාම උගත් තරුණ භික්ෂූන්වහන්සේ නමක් සිටින බව. මා උන්වහන්සේගේ නම අසා තිබෙනවා. කවදාවත් දැකලා නැහැ. ඔබ වහන්සේ ඊශ දත්ත හාමුදුරුවන්ව හමුවී තිබෙනවා ද?'' යි චිත්ත උපාසකතුමා ඇසුවේය.

''හා! චිත්ත. මා උන් වහන්සේ හමු වී තිබෙනවා.''

ඔබ වහන්සේට කියන්න පුළුවන් ද ඒ තරුණ භික්ෂුව දැන් ඉන්නේ කොහේ ද කියලා?

ඊශ්වර දත්ත හාමුදුරුවෝ කිසිම පිළිතුරක් දුන්නේ නැත.

චිත්ත උපාසකතුමාට සැක සිතිණි. ''ඊෂ්වර දත්ත හාමුදුරුවවෝ ඔබ වහන්සේ ද?'' යනුවෙන් ප්‍රශ්න කළේය.

''ඔව් මමයි ඊෂ්වර දත්ත කියන්නේ,'' යැයි ඊශ්වර දත්ත පැවසුවේය.

චිත්ත උපාසකතුමා සතුටින් පිරී ඉතිරී ගියේය. එසේ සතුටු වී ''මගේ අඹ වනයක් තිබෙනවා ඉතාම සනීප සතුටුදායක තැනක්. මා ඒ ස්ථානයේ ඔබ වහන්සේට දානය සිවුරු සහ නතර වීමේ සියලුම පහසුකම් සලසන්නම්,'' යැයි චිත්ත උපාසකතුමා කීවේය.

ඊෂ්වර දත්ත හාමුදුරුවෝ කිසිම පිළිතුරක් දුන්නේ නැත. ඊශ්වර දත්ත හාමුදුරුවෝ කිසිම දෙයක් කතා නොකර එතැනින් නික්ම ගියේය. කවදාවත් ඒ ස්ථානයට නැවත පැමිණියේ නැත. ඊශ්වර දත්ත උපහාර සහ ප්‍රශංසා දෙකම ප්‍රිය කලේ නැහැ. බොහෝ දිනකින් ස්වස්ති හාමුදුරුවෝ ඊශ්වර දත්ත හිමියන්ව මුණගැසී තිබුණේ ද නැත. නමුත් ඒ තේජස් වී නිහතමානී භික්ෂුවගේ රූපය ස්වස්ති හාමුදුරුවන්ගේ සිතේ තදින්ම ඇඳී තිබිණි. ඊෂ්වර දත්ත හාමුදුරුවන් තම ජීවිතයට උදාහරණයක් කර ගන්නවා යැයි ස්වස්ති හාමුදුරුවෝ පැවසූහ.

අනුන්ට සේවය කිරීමට සූදානම් තරුණ භික්ෂු පිරිස ඉතාම කල්පනාකාරීව කටයුතු කරන බව ස්වස්ති හාමුදුරුවෝ දැනගෙන සිටියේය. ඒ අයට බුදුරදුන් කොපමණ සෙනේහය කරනවා ද යන වගත් දැන සිටියේය. අනාගතයේ දී සද්ධර්මය ප්‍රචාරය සඳහා තරුණ භික්ෂූන් වහන්සේ ගැන තමන් වහන්සේ තද විශ්වාසයකින් සිටින බව බුදුරදුන් පැවසූහ. කිසි කෙනෙකුව විශේෂයෙන් සලකන්නේ නැතිව බුදුරදුන් තරුණ භික්ෂූන්ට ධර්මය ගැන කියා දුන්නේ සම සමවයි.

නමුත් සමහර භික්ෂූන් අනිත් අයට අනවශ්‍ය පරිදි කරදර කිරීම සිරිතක් කරගෙන තිබිණි. එක් භික්ෂූන් වහන්සේ නමක් හය හත් වතාවක් සිවුරු හැර ගියත් තවත් වතාවක් ඔහුට පැවිදි වීමට අවස්ථාව ලබා දීම සිරිතක්ව තිබිණි. ධ්‍යාන භාවනා කිරීමට මානසික වශයෙන් දුර්වල භික්ෂූන්ට කිහිප වරක්ම කරුණු විස්තර කර දීමට බුදුරදුන් හැමවිටම ඉදිරිපත් විය.

ජේතවනාරාමයේ සිටි මජලී නම් භික්ෂුව මානසික රූපයෙන් ඉතාම දුර්වල කෙනෙකි. විවිධ අඩුපාඩුකම් තිබුණත්

බුදුරදුන් දැනදනම ඒ අඩුපාඩුකම් මග හැරියා. ඒ භික්ෂුව බොහෝ විට විහාරයෙහි නියම බිඳීම සිදු කළේය. එකී භික්ෂුවගේ අභද්‍ර ව්‍යවහාර නිසා බොහෝ භික්ෂූන් උන් වහන්සේ මඟ හරින සිරිතක් පැවතිණි. මේ සියල්ල දැන ගත් පසුව දිනක් බුදුරදුන් භික්ෂු මහා සංඝයාව ඇමතුවෝය. ''සංඝ කියන්නේ එක්තරා සංස්ථාවක්. ඒ සංස්ථාවේ එක් පුද්ගලයෙක් දෙන්නෙක් ළඟ සුළු අඩුපාඩුකම් ඇති වෙන්න පුළුවන්. ඒවා එහෙම වුණත් ශ්‍රද්ධාවේ සහ කරුණාවේ සුළු අංශුවක් වත් උන් වහන්සේලාගේ සිත්වල ඇති වෙන්නට පුළුවන්. ඒ නිසා ඒ අයව ආශ්‍රය කරන විට සිතේ ඉතිරි වී ඇති ශ්‍රද්ධාව සහ ප්‍රේමය ප්‍රවේශම් වීමට කරුණු සිතා ආශ්‍රය කිරීම ඉතාම වැදගත්. ඒ සමඟ ම ඒ කරුණා මෛත්‍රියත් ක්‍රමයෙන් පෝෂණය වීමටත් වග බලා ගත යුතුයි. උදාහරණයකට ගතහොත් කිසි කෙනෙකුගේ දෑසින් එක් ඇසක් නරක් වුනොත් ඔහුගේ මිත්‍ර පිරිස ඉතිරි ඇස ප්‍රවේශම් කර ගැනීමට මහන්සි දරනවා, අනාගතේ ඉදිරියට ඔහුට කරදරයක් නොවීම සඳහා. මේ නිසා භික්ෂූවරුනි, කොතරම්ම නරක පුද්ගලයෙක් වුවත් ඔහුගේ කරුණාව සහ ප්‍රේමය ආරක්ෂා වන ආකාරයට කටයුතු කිරීම ඉතාම වැදගත්.''

බුදුරදුන් මේ ගැන කතා කරන විට ස්වස්ති එතන සිටියේය. බුදුරදුන්ගේ මහා කාරුණික අදහස් සිතට වැදී ස්වස්ති අපමණ සතුටට පත් විය. ස්වස්ති කොපමණ සතුටට පත් වී ද ආනන්ද හාමුදුරුවොත් එපමණටම සතුටට පත් විය. බුදුරදුන්ගේ උපකාර නොලැබූ අය අඳුරෙන් අඳුරටම ගියේය.

දිනක් බුදුරදුන් සහ අශ්වයන් පුහුණු කරන කේසි නම් පුද්ගලයා සමඟ අශ්ව පුහුණුව ගැන සාකච්ඡා කළෝය. බුදුරදුන් කේසීගේන් '' ඔබ කොහොමද අශ්වයෝ පාලනය කරන්නේ,'' යැයි ඇසූහ.

'' ආචාර්යතුමනි, අශ්වයින්ගේ මානසික ගති පැවතුම් විවිධයි. සමහර අශ්වයන්ට ආදරයෙන් කරුණු කී විට තේරුම් ගන්නවා. සමහර අශ්වයන්ට තරවටු කරලා කරුණු තේරුම් කරන්න වෙනවා. සමහර අශ්වයින්ව කසයකින්ම දඬුවම් දීලා හදාගන්න වෙනවා,'' යනුවෙන් කේසි පැවසීය.

'' එහෙම කරලත්, කීකරු නොවන අශ්වයෝ ඉන්නවා නම් කරන්නේ කුමක් ද? බුදුරදුන් ඇසුවෝය.

'' එහෙම අශවයන් මරලා දානවා. හේතුව එහෙම අකීකරු, හදන්න බැරි, අශ්වයෝ අනෙක් කීකරු අශ්වයින්වත් අකීකරු කරලා විනාශ කරන නිසා. එහෙම කිරීම සාධාරණයි,'' යැයි කේසී පැවසීය.

''ඔබ කරන්නේ කොහොම ද මාත් එහෙම තමයි පුහුණු කරන්නේ,'' බුදුරදුන් සිනා සී පැවසුවෝය.

''යම් කිසි භික්ෂුවක් කිසිම ආකාරයකින් කියන දේ අහන්නේ නැත්නම්, කීකරු නොවුනොත් ඔබ වහන්සේ උන් වහන්සේට කරන්නේ කුමක් ද?'' යැයි එවර කේසී ඇසුවේය.

''ඔබ කරන්නේ කුමක් ද මාත් කරන්නේ එයයි. මරලා දාන එකයි,'' බුදුරදුන් කීවෝය.

කේසි පුදුම විය. '' ඔබ වහන්සේ හිංසාවට විරුද්ධ නේ ද? එහෙම කරන්නේ කොහොම ද?'' යැයි ඇසුවේය.

බුදුරදුන් කේසිට කරුණු පැහැදිලි කළේය. ඉතාම කරුණාවෙන් දඬුවම් දීමෙන් කවුරු හරි පුද්ගලයෙක් නිසි මඟට එන්නේ නැත්නම් ඔහුව භික්ෂු ශාසනයට ඇතුළත් කර ගන්නේ නැහැ. සංඝ සමාජයට ඇතුළත් වෙන්න ඉඩ දෙන්නේ නැහැ. මේ වාසනාව ජන්ම දහස් ගණනකට පස්සෙයි ලැබෙන්නේ. එහෙම සිද්ධ වුණොත් ඔබ සිතන්න ඒ පුද්ගලයාගේ ආධ්‍යාත්මික මරණය නොවෙයි ද ඒක. නමුත් මගේ සිතේ ඒ පුද්ගලයා ගැන කරුණාව, ප්‍රේමය කිසිම අඩුවක් නැහැ. මා දන්නවා කවදා හරි දවසක ඒ පුද්ගලයා නැවත මා ළඟට මේ සඳහා එන බව,''

දිනක් රාත්‍රියේ බුදුරදුන් හමුවට නාඳුනන කෙනෙක් පැමිණියේය. උන්වහන්සේ සඳහා පානය කිරීමට පැන් ගෙන එන්න ලෙස ආනන්ද හාමුදුරුවෝ ස්වස්ති හාමුදුරුවන්ට කීවේය. මේ පුද්ගලයා හොඳ හැඩි දැඩි ශරීරයක් ඇති දිලිසෙන කඩුවක් ඉනේ දරාගත් කෙනෙක් විය. පසුව කඩුව ජේතවනාරාමයේ දොරටුව ළඟ නතර කර සිටි අශ්වයාගේ පටියෙහි හිර කළේය.

සැරියුත් මහ රහතන් වහන්සේ ඒ පුද්ගලයා බුදුරදුන් හමුවට රැගෙන ගියෝය. මේ පුද්ගලයාගේ නම රෝහිකාශ්ව යැයි ආනන්ද හාමුදුරුවෝ ස්වස්ති සමඟ කීවෝය.

ශාරිපුත්ත මහ රහතන් වහන්සේත් රෝහිකාශ්වත් බුදුරදුන් හමුවේ බිම වාඩි වී සිටින ආකාරය ස්වස්ති හාමුදුරුවෝ වතුර භාජනය රැගෙන යන විට දුටුවේය. ආනන්ද හාමුදුරුවෝ

බුදුරජාණන් වහන්සේගේ පිටුපස හිටගෙන හිටියා. ස්වස්ති හාමුදුරුවෝත් ආනන්ද හාමුදුරුවන් ළඟම හිටගෙන උන්නා. ජලය පානය කිරීමෙන් ටික වේලාවක් නිහඬව සිට රොහිකාශ්ව බුදුරදුන්ගෙන් ඇහැව්වා ආචාර්ය තුමනි, ඉපදීම මරණය ලෙඩ වීම වයසට පත් වීම නැති මරණයට පත් නොවන යම් තැනක් තියනවාද මරණයපත් නොවී ඒ ලෝකයට යා හැකි.

''මරණයෙන් මිදෙන්න කිසිම ලෝකයක් නැහැ. නුඹ ආලෝකයේ තරංග හා වේගයෙන් ගමන් කළත් ඉන් මිදෙන්න ක්‍රමයක් නැහැ,'' යි බුදුන් වහන්සේ ප්‍රකාශ කළහ.

රෝහිකාශ්ව දෑත් එකතු කොට බුදුරදුන්ට වැඳ ''ඔබතුමාගේ කතාව සම්පූර්ණ ඇත්ත. මරණයෙන් මිදීමට මේ ලෝකයේ කිසිම ක්‍රමයක් නැති බව මටත් අවබෝධ වුණා. මගේ ධාවන ශක්තිය මා දන්නවා. මගේ දුනු ශිල්ප ශක්තිය මා දන්නවා. අන්තිමට මරණින් ගැලවෙන්න අවුරුදු සියයක් දිව්වත් අවසානයේ මැරිලා ඇද වැටෙනවා හැර වෙන දෙයක් ලැබෙන්නේ නැහැ. ඔබතුමාගේ කතාව සියයට සියයක් සම්පූර්ණ සත්‍යයි,'' යැයි කීවේය.

''නමුත් මා කියන්නේ නැහැ පුද්ගලයාට ඉපදීම ජරාව මරණය යන මේ දෙයින් නිදහස් වීමට නොහැකියි කියා. රෝහිකාශ්ව අහන්න. මේ ක්‍රමයට ඔබ පිළිපැද්දොත් ඉපදීම ජරාව මරණය ආදියෙන් නිදහස් වීම අපහසු නැහැ. නුඹගේ මේ ශරීරයෙහි ඉපදීම සහ මරණය තිබෙන්නේ ඉන් මිදීමේ මාර්ගය තියෙන්නේත් මේ ශරීරයේමයි. නුඹ අනිත්‍ය, දුක්ඛ, අනාත්ම යන ත්‍රිලක්ෂණය ගැන භාවනා කරපන්. එවිට මේ කාරණය නුඹට අවබෝධ වේවි. නුඹ ඉදිරියේ දී ඉපදීම, මරණය යන ප්‍රශ්න විසඳී යාවි. ජන්මයක් නැති මරණයක් නැති ලෝකයක් නුඹ ඉදිරියේ දීම පෙනේවි. සියලු භයින් හා දුකින් නුඹට මිදෙන්නත් පුළුවන්. නුඹ කිසිම තැනකට යන්න එපා. මේ සියල්ලම නුඹගේ ශරීරයෙහි ම අන්තර් ගතයි,'' බුදුන් වහන්සේ පැවසූහ.

බුදුරදුන්ගේ දේශනාව අසා සැරියුත් මහ රහතන් වහන්සේ ගේ දෑස සතුටින් දිළිසෙන්නට ගත්තේය. රෝහිතේශ්වරගේ මුහුණත් සතුටින් පිරී ගියේය. ස්වස්ති හාමුදුරුවෝ ගැඹුරට සිත සිතා සිටියේය. මේ දේශනාව අධ්‍යාත්මික ජීවිතයට සංගීතයක් වගේ ම ඉපදීම, ජරාව, ව්‍යාධිය, මරණය යන මේ සියලු දෙයින් නිදහස් වී මේ එකම සූත්‍රය තම ශරීරය බව ස්වස්ති හාමුදුරුවන්ට දැනුණි.

## හැත්තෑ එක් වන පරිච්ඡේදය

# වීනාවේ තත් තද කරන කලාව

ධම්මචක්ක දේශනාවෙන් අවුරුදු තිස් හයකට පසු බුදුරදුන් නැවත බරණැස ඉසිපතනයට වැඩම කළහ. නමුත් එදා උන් වහන්සේ දුටු ඉසිපතනය අද ඒ ආකාරයෙන්ම දකින්න තිබුණේ නැත. ගංගානම් ගඟ දෙපස ප්‍රදේශවල ධර්මය ප්‍රචාරය වී තිබුණු අතර තමන් ප්‍රථම ධර්ම දේශනාව කළ ස්ථානයේ චෛත්‍යයක් ගොඩනගා තිබුණි. ඒ අසලම එක විහාරයක් සාදා තිබිණි. එකී විහාරයේ භික්ෂූන් වහන්සේ භාවනා කරමින් කාලය ගත කළහ. උන් වහන්සේලාට ධර්ම චර්යාවේ හැසිරීම සඳහා අවශ්‍ය උපදෙස් දී බුදුරදුන් ඉසිපතනයෙන් නික්ම ගියෝය.

බරණැසින් උරුවේලාවට වැඩි විට බුදුබව අවබෝධ කර ගැනීමට සෙවන දුන් බෝධීන් වහන්සේ ළා දලු දමා සුළඟින් ලෙළ දෙන අයුරු දුටුවේය. බෝධීන් වහන්සේ වටා කුඩා කුඩා කුටි සාදාගෙන භික්ෂූන් භාවනා කරනු දුටුවෝය. බිම්බිසාර රජතුමා ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ අභියස චෛත්‍යයක් කරවීමට කටයුතු සූදානම් කරමින් සිටියේය. ගමේ පුංචි දරුවන් දකින්නත් බුදුහාමුදුරුවෝ වැඩම කළහ. මෙතරම් අවුරුදු ගණනක් ගෙවී ගියත් ගමේත් දරුවන්ගේත් කිසිම වෙනසක් දකින්න ලැබුණේ

නැත. මුලින්ම මී හරක් දැක්කු ස්වස්තිගේ වයසත් දැන් අවුරුදු හතලිස් හත සම්පූර්ණ වෙලයි තිබුණේ. ඔහු සංඝ සමාජයේ ජ්‍යෙෂ්ඨ භික්ෂූන් වහන්සේ නමක් හැටියට කවුරුත් පිළිගෙන තිබිණි. ගමේ ළමයි බුදුරදුන්ට වැළඳීමට ඉදුණු පැපොල් ගෙඩියක් දුන්හ. පුංචි දරුවන් සියලු දෙනා බුද්ධං සරණං ගච්ඡාමි. ධම්මං සරණං ගච්ඡාමි, සංඝං සරණං ගච්ඡාමි යන තුන් සරණය ඉතාම හොඳින් උච්ඡාරණය කළහ.

බුදුරදුන් ගයාවෙන් රජගහනුවරට වැඩම කර එතැනින් ගිජ්ජකූඨ පර්වතයට වැඩම කළහ. ඒ අවස්ථාවේ දී පුන්න හාමුදුරුවන් ආදි වාසී නොහොත් කැලෑවේ ජීවත් වන මිනිසුන් අතර කරන ලද ධර්මදේශනා ගැන විස්තර සාකච්ඡා කළෝය. ස්වර්ණ දේශයෙහි සද්ධර්මය වැළඳගත් පිරිස පන්සියය දක්වා වැඩි වූ බව ඒ විස්තරයේ දී පුන්න හාමුදුරුවෝ බුදුරදුන්ට පැවසීය.

පසුව බුදුරදුන් ඒ ප්‍රදේශයට ගියෝය. රාත්‍රියේ භාවනා කරන අතර කවුරු හරි භික්ෂූන් වහන්සේ නමක් සූත්‍රයක් කියනවා නම් කොච්චර හොඳ ද? දැයි සිතුවේය. යමක් ඇසුණු නමුත් ඒ ශබ්දය මහන්සියක ශබ්දයක් හැටියටයි දැනුනේ. ඒ හඬ නිරාශා ජනක හඬක්. සෝණ හාමුදුරුවෝ ඊයේ රාත්‍රියේ සූත්‍ර පාඨ කියවූ බව පසුව දා උදෑසන ආනන්ද හාමුදුරුවෝ කීවෝය. වස් කාලයට පෙර බුදුරදුන් එකී භික්ෂූන් වහන්සේව ශ්‍රාවස්තියේ දී දැක තිබුණේය.

භික්ෂු සෝණ කුලීකර්ණව දැනට වසර කිහිපයකට පෙර මහා කච්ඡායන හාමුදුරුවන් විසින් පැවිදි කරන ලදි. සෝණ ධනවත් පවුලක ඉතා හොඳ දක්ෂකම් ඇති කෙනෙක් හැටියට කවුරුත් පිළිඅරන් තිබිණි. නමුත් ඔහු ශරීරය ඉතාම දුර්වල කෙනෙක් විය. භික්ෂු ජීවිතය ගත කිරීමට සෝණට හැකියාවක් තිබුණේ නැත. දවසට වරක් කෑම ගැනීම රාත්‍රියට ගස් යට සැතපීම, ආදිය සෝණට නුහුරුනුපුරුදු දේ වුවත් සියලුම කරදර විඳගෙන ධ්‍යාන වැඩීම සිදු කළේය. පැවිදි වීමෙන් වසරකට පසු සෝණගේ ආචාර්යවරයා සෝණ සැවැත්නුවර බුදුරදුන් හමුවට රැගෙන ගියේය. බුදුරදුන් සෝණගෙන් ඇසුවෝය. සෝණ ඔබගේ ශරීර සෞඛ්‍ය කෙසේද? ධර්ම සාධනා පිණ්ඩපාතය සඳහා කිසි කරදරයක් නැහැ නේ ද?

පිළිතුරු දෙමින් සෝණ, ''නැත ආචාර්යතුමනි, කිසිම කරදරයක් නැහැ. මගේ සියලුම කටයුතු ඉතා ම ප්‍රසන්නව සිද්ධ වෙනවා,'' යැයි කීවේය.

එදා රාත්‍රියේ බුදුන් වහන්සේ සෝණ හාමුදුරුවන්ට සැතපෙන්න බුදුකුටිය සූදානම් කරන්න යැයි ආනන්ද හිමියන් හට පැවසුවෝය. එදා රාත්‍රිය බුදුරදුන් උදෑසන තුන පමණ වන තෙක් සමාධියෙන් යුක්තව වැඩ සිටියහ. සෝණ හාමුදුරුවොත් ඒ දක්වා නිදා ගත්තේ නැත. බුදුරදුන් සෝණ හාමුදුරුවන්ට ''ඔබට නින්ද යන්නේ නැත්නම් මිහිරි හඬින් ගාථාවක් කියන්න'' යැයි සෝණ අමතා කීවෝය.

සෝණ හාමුදුරුවෝ හැකි මිහිරි ස්වරයෙන් ගාථා කියන්න ගත්තා. බුදුහාමුදුරුවෝ ගාථා අසා සෝණ හාමුදුරුවන්ට ප්‍රශංසා කළෝය.

සෝණ හාමුදුරුවෝ සූත්‍ර කියවනවා අසාගෙන සිට බුදුහාමුදුරුවෝ උන් වහන්සේ සූත්‍ර කියවන්න විශාල මහන්සියක් දැරූ බව, වටහා ගත්තෝය.

'' නුඹ පැවිදි වීමට පෙර තත් දහසයකින් යුක්ත වීනා වාදනය කළා නේ ද?'' යැයි බුදුරදුන් ඇසුවෝය.

සෝණ හාමුදුරුවන් ඔව්, කියන්න පෙර ''වීනාවේ තත් බුරුල් කළොත් නැත්නම් නැත්නම් හොඳටම තද කළොත් ඉන් මිහිරි හඬක් ඇති වෙනවා ද  යැයි බුදුන් වහන්සේ සෝණගෙන් ඇසුවෝය.

සෝණ හාමුදුරුවෝ කිව්වා ''ආචාර්යතුමනි, වීණාවේ තත් බුරුල් කළොත් ස්වර රහිත වෙනවා. ඕනෑවට වඩා තද කළොත් තත් කැඩිල යනවා. නියමිත ක්‍රමයට තත් තද කළ විට මිහිරි ස්වර පිටවනවා,'' යැයි සෝණ හාමුදුරුවෝ පැවසූහ.

''සෝණ ඔබගේ කතාව හරියට හරි. අලස වුණොත් ධ්‍යාන භාවනා කරන්න අපහසුයි. ඕනෑවට වඩා ධ්‍යාන භාවනා කළොත් මහන්සි වී ධ්‍යාන කිරීම එපා වෙනවා. නුඹ නුඹගේ ශරිර ශක්තිය කොපමණ ද කියා දන්නවා ද? ශරීරය සහ සිත සීමාව ඉක්මවා පාවිච්චි කරන්න එපා. එහෙම වුණොත් පමණයි නුඹට ධ්‍යාන භාවනා කරන්න පුළුවන් වෙන්නේ.

''සෝණ හාමුදුරුවන් බුදුරදුන්ගේ ආදර කරුණා වදන්වලට ස්තුති කිරීම සඳහා දෑත එකතු කර නැමී නමස්කාර කළෝය.

දවසක් දවල් වරුවේ ජීවක වෛද්‍යවරයා බුදුරදුන් හමුවීමට ආවා. බුදුරදුන් වේළුවනයේ සිට ආපසු වැඩම කරමිනුයි සිටියේ. ජීවක වෛද්‍යවරයා බුදුරජානන් වහන්සේගෙන් '' ඔබතුමා සමග

මාත් ගිජ්ජකූඨයට එන්න ද?'' යි ඇසුවේය. දෙදෙනා යන අතරතුර බුදුරදුන් පඩි නගින ආකාරය ජීවක වෛද්‍යවරයා බලාගෙන සිටියේය. වයස අවුරුදු හැත්තෑ දෙකක් ගත වීත් බුදුරදුන් පෙර සේම ශක්ති සම්පන්න බව ජීවක වෛද්‍යවරයාට අවබෝධ විය. බුදුන් වහන්සේ එක් අතකින් පිණ්ඩපාත පාත්‍රය රැගෙන අනෙක් අතින් සිවුර පොරවමින් හෙමින් පඩිපෙළ නැඟුණේය. ආනන්ද හාමුදුරුවොත් ඒ ක්‍රමයටම පඩිපෙළ නැග්ගෝය. ජීවක වෛද්‍යවරයා බුදුරදුන් අතින් පාත්‍රය තම අතට ගන්නා අතර ''මේ කඳු මුදුනට මා දහස් වරක් නැඟ තිබෙනවා'' යැයි කීවෝය. ගිජ්ජකූට කඳු මුදුනේ බුදුරදුන් ජීවක වෛද්‍යවරයා සමඟ ගලක් මත වාඩි වූහ. ජීවක වෛද්‍යවරයා බුදුරජාණන් වහන්සේගේ සැප දුක් ගැන ''ගුරුතුමනි, ඔබ වහන්සේගේ අලුත් සංඝ සමාජය කෙලින්ම වර්තමාන රාජ්‍යයේ රාජ නීති සමඟ සම්බන්ධයි'' දේවදත්ත සංඝයා අතර ඔබ වහන්සේගේ ස්ථානය ලබා ගන්න සූදානම් වනවා. දේවදත්තට උදව්වට තවත් භික්ෂූන් වහන්සේ කිහිප දෙනෙක් එකතු වූ බව ද දැනගන්නට ලැබුණා. කෝකාලික හාමුදුරුවෝ දේවදත්ත හාමුදුරුවන්ගේ ප්‍රධාන උපදේශකයි. දේවදත්ත දක්ෂ කථිකයෙක්. භික්ෂූන් වහන්සේ සේම උපාසක පිරිසත් උන් වහන්සේට සලකනවා. දේවදත්ත කෙළින්ම බුදුරදුන්ට විරුද්ධව කිසිවක් කී බවක් මා දන්නේ නැහැ. නමුත් බුදුරදුන් දැන් වයසට පත් බව නිතරනිතර කියනවා. දේවදත්ත කියනවා බුදුරදුන්ගේ බණ වර්තමාන සමාජයේ තරුණයන්ට ගැලපෙන්නේ නැති බව. බොහෝම ධනවත් පවුල් වල තරුණ ළමයි. දේවදත්තට සලකනවා. රාජ කුමාර අජාසත්තත් දෙවදත්තට සලකනවා. ගයා ශීර්ෂයේ දේවදත්තට විශාල මධ්‍යස්ථානයක් අජාසත්ත සාදා දුන්නා. දේවදත්තගේ සෑම කේන්ද්‍රයකට කෑම බීම දෙන්නේ අජාසත්ත රාජ කුමාරයයි. දේවදත්ත සෑම විටම සිටුවරුන්ව සහ අජාසත්ත කුමාරයාව පහදාගන්න මහන්සි ගන්නවා. අජාසත්ත දේවදත්ත හාමුදුරුවන්ගේ බණ අහන්නත් යනවා. දැනට භික්ෂූන් වහන්සේ පන්සිය නමක් පමණ දේවදත්ත හාමුදුරුවන්ගේ පැත්තට ගිහිල්ලා අවසානයි. නමුත් මට මේ කිසි දෙයක් ගැන එතරම්ම වේදනාවක් නැහැ. වයස සම්පූර්ණ වීමට පෙර අජාසත්ත සිංහාසනයේ වාඩි වෙන්නයි මේ ඔක්කොම කරන්නේ. මට සැකයක් තියනවා දේවදත්ත හාමුදුරුවෝ කුමක් හෝ භයානක නරක අදහසක්

අජාසත්ත කුමාරයාගේ සිතට ඇතුළු කරලා ඇති කියලා. යම් කිසි ආකාරයකින් බිම්බිසාර රජතුමාට යමක් සිද්ධ වුණොත් ඒ සඳහා භික්ෂු මහා සංඝයාවත් ඈඳා ගැනීම සිද්ධ වේවි. අන්න ඒ නිසා මේ කාරණය ගැන මීට වඩා කල්පනාකාරී වීම ඉතා හොඳයි,'' වෛද්‍යවරයා කීවේය.

මේ කරුණ තමා හමුවේ තැබීම ගැන බුදුරදුන් ජීවක වෛද්‍යවරයාට ස්තුති කළෝය. මේ අවාසනාවන්ත අවස්ථාවෙන් භික්ෂූන් මුදා ගැනීමට යම් කිසි පියවරක් ගන්නා බව ද උන් වහන්සේ පැවසූහ.

දින දහයකට පසු බුදුරදුන් වේළුවනාරාමයේ දී තුන්දාහක් භික්ෂූන්ට ධර්ම දේශනා කළෝය. බිම්බිසාර රජතුමාත් මේ අවස්ථාවේ දී එතැන සිටියේය.

ධර්ම දේශනාව අවසාන වීමත් සමඟ දේවදත්ත හාමුදුරුවෝ නැඟී සිටියේය. '' ගුරුතුමනි, දැන් ඔබ වහන්සේ මහළුයි. මෙතරම් භික්ෂු පිරිසක් පාලනය කිරීම ඔය මහලු වයසේ දී කරන්නට අපහසුයි. ඒ නිසා සංඝයා වහන්සේගේ සම්පූර්ණ පාලනය මට බාර දෙන්න. ඒ සඳහා මා සූදානම්,'' යැයි කියා සිටියේය.

බුදුරදුන් දේවදත්තගේ වචනවලට ස්තුති කර '' දේවදත්ත, භික්ෂූන් පාලනය කිරීමට තථාගතයන්ට තවම හොඳට ශක්තියක් තිබෙනවා,'' යැයි පැවසුවෝය.

බුදුරදුන්ගේ කථනයෙන් පසුව භික්ෂූන් තුන්සිය නමක් පමණ නැඟී සිට දේවදත්ත හාමුදුරුවන්ගේ ඒ අදහසට අප සියලු දෙනාම එකඟයි යනුවෙන් පැවසූහ. දේවදත්ත කිව්වා තමන් සමඟ තම අදහස සමග බොහෝ භික්ෂූන් සිටින නිසා භික්ෂූන්ගේ පාලනය තමන්ට බාරදෙන ලෙස දේවදත්ත හිමි ඉල්ලා සිටියේය.

දේවදත්තගේ කතාවෙන් පසු ''දේවදත්ත, මීට වඩා තව යමක් කියන්න එපා. මේ ගැන ඔබට වඩා විශිෂ්ඨ භික්ෂූන් මේ අතර වැඩ සිටින බව ඔබ නොදන්නේ ද? ඒ භික්ෂූන්ගෙන් වත් මා ඉල්ලා සිටියේ නැහැ භික්ෂු සමාජය පාලනය කරන්න කියලා. ඔබ ළඟ තවම සංඝ සමාජය පාලනය කරන්න සුදුසුකම් මා දුටුවේ නැහැ,'' බුදුරජුන් දේවදත්ත හිමි අමතා ප්‍රකාශ කළෝය.

මහා සංඝයා මධ්‍යයේ බුදුන් වහන්සේ තමන්ට අවනම්බු කළා යැයි දේවදත්ත හිමි සිතුවේය. තද ක්‍රෝධයෙන් යුක්තව නැවතත් නැඟී සිටි ඔහු පිය නඟමින් එතැනින් නික්ම ගියේය.

සංඝයා මාධ්‍ය දේවදත්තගේ ව්‍යවහාරය නුසුදුසු බව පසුදා උදෑසන බුදුරදුන් ආනන්ද හාමුදුරුවන් සමඟ පැවසුවෝය. තමාත් ඒ පිළිබඳව මහත්සේ දුක් වූ බව ආනන්ද හාමුදුරුවෝ පැවසූහ. ''මේ වගේ දෙයින් සිද්ධ වෙන්නේ සංඝයා අතර බේදබින්න වීමක් නිසා දේවදත්තව තනිවම තැනකට එක්කර සාකච්ඡා කිරීම  සුදුසු යැයි,'' ආනන්ද හාමුදුරුවෝ පැවසූහ.

බුදුරදුන්  ''මා සැම දෙනාම ඉදිරි පිට ඒ ආකාරයට කරුණු කිව්වේ කව්රුත් දැනගනීවි මා කවරදාවත් දේවදත්ත හාමුදුරුවන්ට භික්ෂූන්ගේ පාලනය භාර නොදෙන බව. ඊයේ රාත්‍රියේ දේශනාවේ දී රජතුමාත් සිටීම ගැන මා සතුටු වෙනවා,'' යැයි බුදුන් වහන්සේ පැවසූහ.

''අදින් පසු දේවදත්ත කරන්නේ කුමක් ද එහි සම්පූර්ණ වගකීම උන් වහන්සේ පිටයි. ආනන්ද ඔබට හැඟෙනවා නම් දේවදත්ත සමඟ කතා කිරීමෙන් හොඳ ප්‍රතිඵලයක් ලැබෙනවා කියා ඔබ කතා කරන්න,'' බුදුන් වහන්සේ කීහ.

ටික දිනකට පසු වෛද්‍ය ජීවක බුදුරදුන් හමුවීමට පැමිණ මට දැන ගන්න ලැබුණා දේවදත්ත සංඝ භේදයකට සූදානම් වන බව. නමුත් එය කරන්නේ කෙසේ ද කියා තමන් නොදන්නා බව,'' උන් වහන්සේ සමඟ පැවසුවේය.

## හැත්තෑ දෙ වන පරිච්ඡේදය

# මුනිවතින් අවනම්බුව

වේළුවනාරාමයේ බුදුරදුන්ගේ සති පතා ධර්ම දේශනාව පැවැත් වෙමින් තිබිණි. එදා ධර්ම දේශනාව ශ්‍රවණය කිරීමට බොහෝ සෙනඟ ඒකරාශි වී සිටියෝය. මේ අය අතර බිම්බිසාර රජතුමා සහ රාජ කුමාර අජාසත්තෘත් සිටියෝය. වෙනදාට වඩා අධික සංඛ්‍යාවක් භික්ෂූන් වහන්සේ ද වැඩම කර ඇති බව ආනන්ද හාමුදුරුවෝ දුටුවෝය. සැරියුත්, හා මහා කස්සප රහතන් වහන්සේලා දෙනම මැද දේවදත්ත භික්ෂුවත් වාඩි වී සිටිනවා දුටුවෝය.

දේශනාව අවසාන වනවාත් සමඟම දේවදත්ත හාමුදුරුවන් නැඟී සිට, ඔබ වහන්සේ සියලුම භික්ෂූන්ට චාම් ජීවිතයක් ගත කරන්න කියා නිතර උපදෙස් දෙනවා. මා යෝජනා පහක් ගේනවා. එමඟින් භිකක්ෂූන්ට චාම් ජීවිතයක් ගත කිරීමට මහත් රුකුලක් වේවි,'' යැයි පැවසුවේය.

''වනයේ වැඩ වසන භික්ෂූන් වහන්සේට ගමේ සහ නගරයේ සැතපීමට ඉඩ නොදෙන්න.

''පිණ්ඩපාතයේ යන භික්ෂූන් උපාසකඋපාසිකා පිරිසගේ ගෙවල දානය පිළිගැනීම භාර නොගත යුතුයි.

''භික්ෂූන් ඉරුණු සිවුරු ඇන්දාට වරදක් නැහැ. අවශ්‍ය සිවුරු දායක ආදීන්ගෙන් ඉල්ලා නොගත යුතුයි.

''සියලුම භික්ෂූන් කුටිවල සැතපෙන්නේ නැතිව ගස් යට ම සැතපිය යුතු යි.

''භික්ෂූන් නිතර නිර්මාංශාහාරී වියයුතු යි. මාංශ ආහාර නොගත යුතුයි.

''භික්ෂූන් වහන්සේ මේ නියම පහ පිළිපැද්දොත් චාම් ජීවිතයට ඉන් මහත් උපකාරයක් ලැබෙන බව ස්ථිරයි.''

''දේවදත්තගේ මේ සියල්ල පිළි ගැනීමට නොහැකියි. යම් කිසි භික්ෂුවක් වනයේ ම සිටීමට සූදානම් නම් එය එසේ කළ හැකියි. නමුත් අනෙක් භික්ෂූන් ගමේ නගරයේ කුටිවල සිටිය හැකියි. පිණ්ඩපාතය කරන භික්ෂූන් උපාසකඋපාසිකාවන්ගේ දාන පිළිගත හැකියි. අනෙක් භික්ෂූන්ට ද එකී පහසුකම් තිබිය යුතුයි. උපාසකඋපාසිකාවන්ගේ ආරාධනා භාරගත යුතුයි. ඉන් ධර්මය පිළිබඳව සාකච්ඡා කිරීමට ඉඩ ලැබෙන නිසා. යම් කිසි භික්ෂුවක් පරණ සිවුරු මසා සෝදා පෙරවීමට සූදානම් නම් එය එසේ කළ හැකියි. ඊට අමතරව උපාසකවරුන්ගේ සිවුරු අඳන පිළිගත හැකියි. නමුත් එකී භික්ෂුව ළඟ සිවුරු තුනකට වඩා නොතිබිය යුතුයි. යම් කිසි භික්ෂුවක් වෘක්ෂයන් යට සැතපීමට සූදානම් නම් ඒ සඳහා කිසිම තහනමක් නැහැ. නමුත් අනෙක් භික්ෂූන් කුටිවල සැතපෙනවා නම් එහි කිසිම තහනමක් ඇත්තේ නැහැ. කව්රු හරි භික්ෂූන් වහන්සේ නමක් නිර්මාංශාහාර ගන්නේ නම් ඉතාම වැදගත්. නමුත් යම් කිසි කෙනෙක් මාංශ ආහාරයට ගත්තත් ඒක තහනම් කරන්න අපහසුයි. නමුත් ඒ සඳහා පර පණ නැසීම කිසි සේත්ම නොකළ යුතුයි,

''දේවදත්ත, භික්ෂූන් වහන්සේ ජන සමාජය සමඟ ජීවත් වීම අවශ්‍යයි. හේතුව ජන සමාජය සමඟ ජීවත් වීමෙන් සද්ධර්මය ප්‍රචාරය කිරීමට පහසු වෙනවා,'' යනුවෙන් බුදුන් වහන්සේ පිළිතුරු දුන්හ.

දේවදත්ත හාමුදුරුවන් වහන්සේ කෝපයට පත්විය. ''එහෙම නම් ඔබ වහන්සේ මගේ ඉල්ලීම පිළිගන්නේ නැහැනේ?''යැයි පැවසීය.

''දේවදත්ත, තථාගතයන් ඔබගේ ඉල්ලීම් සියල්ලම ප්‍රතික්ෂේප කරන බව,'' බුදුන් වහන්සේ පැහැදිලිව ප්‍රකාශ කළෝය.

දෙවදත්ත බුදුරජාණන් වහන්සේට ආචාර කර වාඩි විය. දේවදත්තගේ සිතේ සතුටු සිනහ පිරී තිබිණි.

එදා රාත්‍රියේ වේළුවනයේ ආනන්ද හාමුදුරුවන් සමග සාකච්ඡා කරන වෙලාවේ බුදුහාමුදුරුවෝ, ''ආනන්දගේ අදහස් මට අවබෝධ වුණා. මා හිතන ආකාරයට තව ටික දවසකින් භික්ෂූන් වහන්සේ දෙකොටසකට කැඩීයාම සිදුවෙන්න පුළුවන්,'' යැයි ප්‍රකාශ කළෝය.

මින් පසු ආනන්ද හාමුදුරුවෝ ඉක්මනට ම රජගහ නුවරට ගොස් දේවදත්ත හාමුදුරුවෝ හමු වූහ. දේවදත්ත හාමුදුරුවෝ ''මා වෙනමම භික්ෂු සමාජයක් සූදානම් කරනවා. බුදුරදුන්ගේ සංඝයාට අමතරව මා සමඟ එන සංඝයා සමඟ උත්සව කිහිපයකුත් සූදානම් කරනවා,'' යැයි පැවසීය.

ඉතාම දුක්බර ස්වරයෙන් ආනන්ද හාමුදුරුවෝ බුදුරදුන්ට මේ පණිවිඩය දැනුම් දුන්නෝය. වේළුවනයෙහි ඇවැත් දෙසීම් කරන පොහොය සීමාවෙහි දී භික්ෂූන්ගේ පැමිණීම ඉතාම අඩු බව ආනන්ද හාමුදුරුවෝ දුටුවෝය. බොහෝ භික්ෂූන් දේවදත්ත හාමුදුරුවන්ගේ උත්සවයට සම්බන්ධ වීමට ගිය බව උන් වහන්සේට දැනගන්න ලැබිණි. උත්සවයෙන් පසුව භික්ෂූන් කිහිප නමක් බුදුරදුන් හමුවීමට පැමිණ ''දේවදත්ත හාමුදුරුවන්ගේ පිරිසට එකතු වූ සංඝයා පැමිණ පිරිසට එකතු වෙන්න කියලා වරින්වර ඒ අයට පවසා අතර දේවදත්තගේ නීති බුදුරදුන්ගේ නීතිවලට වඩා තද බව ද දන්වා සිටියා. ඔබ වහන්සේ දේවදත්ත හාමුදුරුවන්ගේ නියමයන් පහ බාර ගත්තේ නැහැ. ඒ වාගේම වේළුවනයේ ජීවිතය සාමාන්‍ය උපාසකවරුන්ගේ ජීවිතය වගෙයි. එහි කිසිම අමුතු වෙනසක් ඇත්තේ ද නැහැ. බුදුරදුන් බොහෝ දේ ගැන දේශනා කළත් තද නීතිරීති දමා භික්ෂූන් පාලනය කරන්නේ නැහැ. බුදුරදුන් ඒ සඳහා කිසි කැමැත්තකුත් නැහැ. නමුත් අපි උන් වහන්සේගේ තර්කවලට සතුටු නැහැ. ඔබ වහන්සේගේ බුද්ධිමත් බව ගැන අපි සතුටු වෙනවා. ඒ ගැන ශ්‍රද්ධාවත් තියනවා. සමහර තරුණ භික්ෂූන් දේවදත්තගෙන් පැවිදි බව ලැබූ අය. දේවදත්තගේ මේ වර පහ පිළිබඳව කැමැත්තක්

දක්වනවා. ඒ අය සංඝයා අතහැර දේවදත්තගේ පිරිසට එකතු වෙන්න යනවා. ඒ ගැන දැනුම් දෙන්නයි අපි ඔබවහන්සේ හමුවෙන්න ආවේ,'' යැයි පැවසූහ.

'' ඒ ගැන ලොකුවට හිතන්න එපා. වැදගත් වෙන්නේ ශිලය පාලනය කර ධ්‍යාන භාවනා කිරීමට කෙතරම් දුරට හිත භික්ෂූන් වහන්සේ යොදනවා ද කියන එක ගැනයි. අනික සංඝයා කොතරම් දුරට පිරිසිදු ජීවිතයක් හෙවත් ශීලවන්ත ජීවිතයක් ගත කරනවා ද කියනා කාරණය, යනුවෙන් බුදුරජුන් පැවසූහ.

දිනක් ජීවක වෛද්‍යවරයා ගිජ්ජකූඨ පර්වතයට පැමිණ බුදුන් හමුවී දේවදත්තගේ භික්ෂු පිරිස පන්සියයක් වූ බව දැනුම් දුන්නේය. මේ සියලුම භික්ෂූන් ගයාවේ ජීවත් වන බවත් ඔහු පැවසීය. රජගහනුවර හිඳිමින් දේවදත්ත කරන කියන කටයුතු ගැනත් ජීවක වෛද්‍යවරයා බුදුරජානන් වහන්සේට විස්තර කර දුන්නේය. ජීවක වෛද්‍යවරයා කෙළින් ම දැනුම් දෙන්න දේවදත්ත හාමුදුරුවෝ දැන් ඔබ වහන්සේගේ සංඝ සමාජයේ නැත කියන වග,'' ප්‍රකාශ කරන මෙන් ඉල්ලා සිටියේය.

දේවදත්ත හාමුදුරුවන්ගේ අලුත් සංඝ සමාජය පිළිබඳව ආරංචිය මුළු පළාතේ පුරාම ඉතාම ඉක්මනට ප්‍රචාරය විය. මේ ගැන කව්රු හරි මොනවා හරි දෙයක් කතා කළොත්, නරක දේ වැපිරුවොත්, නරක ඵල ලැබෙන බව පමණක් කියන්න යැයි ශාරිපුත්ත හාමුදුරුවෝ තම භික්ෂූන්ට කීවෝය. සංඝ භේදය සද්ධර්ම සමාජයේ ඉතාම භයානක සිද්ධියක් හැටියට ශාරිපුත්ත හාමුදුරුවෝ විස්තර කළහ.

ජීවක වෛද්‍යවරයා බුදුරදුන් හමුවේ කියූ දේ ක්‍රියාත්මක කිරීමට බුදුරදුන් භික්ෂු මහා සංඝයා සමඟ සාකච්ඡා කළෝය. ශාරිපුත්ත හාමුදුරුවෝ ''ආචාර්යතුමනි, මා දේවදත්ත ගැන සැමදෙනාගේම ඉදිරිපිට වර්ණනා කළා. දක්ෂකම ගැන කිව්වා. එහෙම කියල දැන් කොහොම ද දේවදත්තගේ නරක ගැන කතා කරන්නේ ? යැයි ප්‍රශ්න කළෝය.

'' ශාරිපුත්ත අපි දේවදත්ත ගැන මීට කලින් ප්‍රශංසා කළා. ඒ කතාව ඇත්ත. දැන් ඔහු ගැන නරක කියනවා. ඒකටත් කරුණු තියනවා. ඒ කතාවත් ඇත්ත නේද?'' යැයි බුදුන් වහන්සේ පැවසූහ.

ශාරිපුත්ත ඔව් කී විට බුදුරදුන් ඇත්ත කීමයි වැදගත් වන්නේ යැයි, බුදුන් වහන්සේ කීහ.

දේවදත්ත හාමුදුරුවන් බුදුරදුන් සංඝ සමාජයෙන් අයින් කළ බවත් මින් පසු දේවදත්ත කරන කියන දේ ගැන බුදුන් සහ සංඝ සමාජය කිසි දේකට වග නොකියන බවත් ටික දිනකට පසු රටේ ප්‍රසිද්ධ විය.

මේ සියලු සිද්ධීන් මැද ශාරිපුත්ත මහ රහතන් වහන්සේ සහ මුගලන් මහ රහතන් වහන්සේ නිහඬව සිටියෝය. ආචාර්යවරුනි, දේවදත්ත හාමුදුරුවන්ගේ සිද්ධියේ දී ඔබ වහන්සේලා දෙනම කිසිම දෙයක් කතා නො කර ඉන්නේ ඔබ දෙනමගේ වෙනමම යෝජනාවක් තියනවා ද ආනන්ද හාමුදුරුවෝ ඇසුවෝය.

''ගෞරවනීය ආනන්ද හිමියනි, ඔබගේ කතාව ඇත්ත. අප බුද්ධ, ධම්ම, සංඝ යන තුනුරුවන්ට අපේ ක්‍රමයට සලකන්න ඕනෑ කියා සාකච්ඡා කළා''මුගලන් මහ රහතන් වහන්සේ සිනා සී පැවසුවෝය.

මේ සියල්ලම වෙන්නේ පෞද්ගලික ඊර්ෂ්‍යාව නිසයි බොහෝ අය සිතන්න පටන් ගත්තෝය. ඒ නිසා අපට ඒ කිසි දෙකින් ඇති ඵලක් නැහැ. අප පුරුදු ක්‍රමයට තුනුරුවන්ට සලකමු,''යි ඔවුහු තීරණය කළහ.

බිම්බිසාර රජතුමා සිංහාසනය අත හැරීමට යන බව මේ අතර මුළු පළාතේ ම ආරංචියක් පැතිර ගියේය. මේ කාරණය ඇසූ ජනතාව පුදුමයට පත් විය. දින දහයකට පසු අජාසත්ත කුමරු රජු ලෙස පෝය දාට සිංහාසනයේ වාඩි වන බවත් ප්‍රසිද්ධ විය.

මේ තරම් වැදගත් සිද්ධියක් රජතුමා කෙළින්ම තමන් වහන්සේට නොකිව්වේ ඇයිද යන්න ගැන බුදුරදුන් කල්පනා කළෝය. මීට කලින් බිම්බිසාර රජතුමා ගත් සෑම වැදගත් තීරණයක් ගැනම මුලින් බුදුරදුන් සමඟ සාකච්ඡා කිරීම සිරිතක්ව පැවතිණි. දවස් කීපයකට පසු ජීවක වෛද්‍යවරයා බුදුරදුන් හමු වීමට ආ අවස්ථාවේ දී කාරණය බුදුරදුන්ට සම්පූර්ණයෙන්ම දන්වා සිටියේය.

ජීවක වෙදතුමා බුදුරදුන් සක්මන් කරන අතර තුර විස්තර කතා කළේය. අජාසත්ත කුමාරයා බිම්බිසාර රජතුමාව හිර අඩස්සියට ගත් බවත්, විදේහි රැජින හැර වෙන කිසි කෙනෙක් රජතුමා හමු වීම සම්පූර්ණ තහනම් කර ඇති බවත්, රජතුමාට

ඉතාම හිතවත් ඇමතිවරුන් දෙදෙනෙකුත් හිර අඩස්සියේ තබා ඇති ආකාරයත් ඉන් අජාසත්තෘ අදහස් කළේ තම රාජාභිෂේකය කිසිසේත් කිසිම බාධාවක් නැතිව සිද්ධ කරන්නට බවත් විස්තර කර ජීවක වෙදතුමා කීවේය. රජ මැඳුරේ රඳවා ගත් බව, රජයේ ඉතාම වැදගත් කාරණ කිහිපයක් සාකච්ඡා කිරීමට ඇති හෙයින් ප්‍රධාන ඇමතිවරුන් දෙදෙනා අජාසත්තෘ කුමාරයාට පවසා ඇතැයි ද ජීවක සඳහන් කළේය.

ජීවක වෛද්‍යවරයා මහ රජින අසනීප වී බෙහෙත් දීම සඳහා තමන්ව මාළිගාවට ගෙන් වූ විට මේ සියලු සිද්ධි දැනගන්නට ලැබුණු බව ද කීවේය. දිනක් මධ්‍යම රාත්‍රියේ රාජ කුමාරයා රජතුමාගේ නිදන කාමරයට අවසර නැතිව ඇතුළු වන්නට උත්සාහ ගත් විට රාජ භටයෝ අල්ලගත් බව ද බිසව කියා ඇත. සැකපිට පරීක්ෂා කළ විට රාජ කුමාරයා ළඟ මිනී මැරිය හැකි ආයුධයක් සඟවා තිබුණු බව ද සොයා ගෙන තිබිණි. රාජ පුරුෂයෝ රාජ කුමාරයාව අල්ලලා රජ්ජුරුවන් වෙත ගිය විට රජ්ජුරුවෝ, පුතේ අජාසත්ත, නුඹ මිනී මරන කඩුවක් රැගෙන මගේ නිදන කාමරයට ඇතුළුවෙන්න මහන්සි ගත්තේ ඇයි? දැයි අසා ඇත.

''පියතුමනි, මා ඔබව මරන්නයි ආවේ.''

''ඇයි පුතා, නුඹ මාව මරන්න මහන්සි ගන්නේ?''

''පිය රජුනි, මාත් හරි ආසයි රජෙක් වෙන්න.''

''රජකම වගේ දේකට ඇයි පියාව මරන්නේ? ඔබ ඒ ගැන මට කිව්වානම් මා ඔබව ඉතාම කැමැත්තෙන් සිංහාසනයේ වාඩි කරවනවා නේ.''

''මා හිතුවේ නැහැ ඔබ ඒ වගේ උසස් දෙයක් කරාවි කියා.''

''මගෙන් මහා අපරාධයක් සිද්ධ වුණේ. කරුණාකර මට සමාවෙන්න පියාණනි.''

''පුත් රජ කුමාරයාණනි, මේ වගේ අදහස් නුඹේ සිතට ආවේ කොහොම ද?''

කීප වතාවක් ඇසුවත් අජාසත්ත කුමාරයා කිසිවක් ම කීවේ නැත. අවසානයේ දී මේ සියලු අදහස් තම සිතට දුන්නේ දේවදත්ත හාමුදුරුවෝ යැයි කුමාරයා පවසා ඇත.

මධ්‍යම රාත්‍රියේ රජතුමා මේ ගැන කතා කිරීමට ප්‍රධාන ඇමතිවරුන් දෙදෙනා තමන් වෙතට කැඳෙව්වේය. එක්

ඇමතිවරයෙක් විස්තරය අසා, රාජ්‍යයේ සිදුවෙන්න ගිය අපරාධ වලින් මහා අපරාධයක් මේ. ඒ නිසා අජාසත්තට මරණීය දණ්ඩනය දී දේවදත්ත හාමුදුරුවන් ඇතුළු උන් වහන්සේගේ පිරිස් භික්ෂූන්ගේ හිස් ගසා දමන්න ඕනෑ,''

'' අජාසත්ත මගේම පුතායි. කිසිසේත්ම ඔහුට මරණීය දණ්ඩනය දිය නොහැකියි. භික්ෂූන් වහන්සේලා මුලින්ම දේවදත්තගේ කටයුතු ගැන උන් වහන්සේලා වග කියන්නේ නැති බව කීවා. බුදුරදුන්ගේ බුද්ධිමත් බව, මහා කරුණාව උන් වහන්සේ දේවදත්ත හාමුදුරුවන්ට දඬුවන් දීම ගැනත් පක්ෂ වුණේ නැහැ. උන්වහන්සේ සමඟ අවුරුදු ගණනක් ඉතාම ආදරයෙන් සිටි කෙනෙක්,'' යැයි රජතුමා කීවේය.

''මහරජතුමනි, ඔබ බුදුරජාණන් වහන්සේගේ නියම ශිෂ්‍යයෙක්. ඔබ පුදුම කරුණාවන්ත කෙනෙක්. නමුත් මේ ප්‍රශ්නය විසඳන්නේ කොහොම ද?'' යැයි දෙවන ඇමතිවරයා ප්‍රශ්න කළේය.

''ඇමතිතුමනි, මෙය ඉතාම සුළු දෙයක්. මා හෙටම ප්‍රසිද්ධ කරනවා මා මගේ පුත් අජාසත්තට සිංහාසනය බාරදුන් බව. දවස් දහයකට පස්සේ අජාසත්තට ඔටුනු පළන්දලා දේවදත්තට සහ අජාසත්තට කළ වරදට සමාව දෙනවා. මා විශ්වාස කරනවා මින් මේ දෙදෙනාටම කළ වරද අවබෝධ වේවි. මින් පස්සේ ඒ වාගේ වරදක් නො කරාවි කියා,'' රජතුමා පැවසීය.

ඇමතිවරුන් දෙදෙනා රජතුමාට වැඳ නමස්කාර කළහ. කාරණය ඉතාම රහසිගතව තබා ගන්නා ලෙස රජතුමා සියලුම ආරක්ෂකයන්ට කීවේය. රජතුමාගේ සියලුම ගති විධි දැනගත් දේවදත් හාමුදුරුවෝ එදාම නගරයට පැමිණ අජාසත්ත හමු විය. රාජාභිෂේකයේ සියලුම කටයුතු දේවදත්තගේ යටතේ සිද්ධ වන බව අජාසත්ත කුමාරයා කීවේය. නමුත් දේවදත්ත හමු වී දින දෙකකට පසු රජතුමා සහ ප්‍රධාන ඇමති වරුන් දෙදෙනාව හිර අඩස්සියට ගත්තේය.

ජීවක වෛද්‍යවරයා ''ආචාර්යතුමනි රාජාභිෂේකයෙන් පසුව රජතුමාව සහ ප්‍රධාන ඇමතිවරුන් දෙදෙනාව හිරෙන් නිදහස් කළොත් සුදුසු නොවේ ද? යි ඇසීය.

දෙවන දින රාජාභිෂේකය සඳහා සහභාගි වීමට බුදුරදුන්ට සහ මහා සංඝාට ආරාධනා රැගෙන රාජ පුරුෂයෝ පැමිණියහ.

සේනාව රාජාභිෂේකයට නගරය සැරසූ අතර දේවදත්ත හාමුදුරුවෝ පන්සියයක් පමණ භික්ෂූන් සමඟ රාජාභිෂේකයට සම්බන්ධ වන ආකාරය ගැන සාකච්ඡා කරමින් සිටියේය.

මේ රාජාභිෂේකයට තමන් වහන්සේ නොයන බවත්, තමන් වහන්සේ වෙනුවෙන් කිසිම භික්ෂූන් වහන්සේ නමක් මේ සඳහා සහභාගී නොවිය යුතු බවත් ඒ සඳහා බුදුරදුන් කීවේ මේ වාගේ දරුණු අපරාධවලට උදවු උපකාර කිරීමට සද්ධර්මයට උපකාර කර නො ගැනීම සඳහා මේ පියවර ගත් බවත් බුදුරජාණන් වහන්සේ ශාරිපුත්ත මහ රහතන් වහන්සේට දන්වා සිටියෝය.

රාජාභිෂේකය අවස්ථාවේ දී බුදුරදුන් හා භික්ෂු මහා සංඝයා නොසිටීම ජනතාවට ප්‍රශ්නයක් විය. බිම්බිසාර රජතුමාව සහ ප්‍රධාන ඇමති වරුන් දෙදෙනාව නිවාස අඩස්සියට ගත් බව සියලුම දෙනාට දැනගන්න ලැබිණි. අලුත පත් වූ රජතුමා ගැන කිසිම කෙනෙක් කිසි දෙයක් කීවේ නැත. ලැබුණු ආරංචි අනුව අලුත් රජතුමා ගැන හැම දෙනාම කතා කළේ පිළිකුලෙනි. නමුත් දේවදත්ත හාමුදුරුවෝ තමන් වහන්සේ භික්ෂූන් වහන්සේගේ නායකයා හැටියට සෑම තැනම තමන් විසින් ම හඳුන්වන්න පටන් ගත්තේය. නමුත් ජනතාව දේවදත්ත හාමුදුරුවන්ගේ සහ බුදුරජාණන් වහන්සේගේ භික්ෂූන් කවුද කියා ව්‍යවහාරයෙන් දැන ගත්තෝය.

අවසානයේ දී දේවදත්ත හාමුදුරුවන්ගේ භික්ෂූන්ට පිණ්ඩපාතය දීම නතර කළහ. දේවදත්ත සමඟ ජනතාව මෙසේ කළේ අලුත් රජතුමාට විරෝධය පෑමක් ලෙසටය.

රටේ සිද්ධවන මේ කටයුතු දැනගන්නට ලැබී අජාසත් රජතුමාට කෝපයට පත්විය. නමුත් බුදුරදුන්ට හෝ උන් වහන්සේ අනුගමනය කළ භික්ෂූන්ට විරුද්ධව කිසිවක් කිරීමට අජාසත්ත රජතුමා කැමති වූයේ නැත. බුදුරදුන් ඇතුළු මහා සංඝයාට විරුද්ධව යම් පියවරක් ගත හොත් ජනතාව තව තවත් කුපිත වීම සමගම බුදුරදුන්ට සලකන අසල් වාසී රාජ්‍යයන් ද තමන්ට විරුද්ධව නැගී සිටින බව අජාසත්ත රජතුමා දැන සිටියේය.

දේවදත්ත කොපමණ උපදෙස් දුන්නත් අජාසත්ත රජතුමා සිතුවේය. යම් කිසි ආකාරයකින් බුදුරජානන් වහන්සේට යම් කරදරයක් කළොත් පසේනදී කොසොල් රජතුමා නිහඬව නො සිටින බව. මේ නිසා මේ ගැන සාකච්ඡා කිරීම සඳහා අජාසත්ත රජතුමා දේවදත්ත හාමුදුරුවන් සමඟ සාකච්ඡා ආරම්භ කළේය.

### හැත්තෑ තුන් වන පරිච්ඡේදය

# බඩගින්නේ තබා මරා දැමීමට ගත් උත්සාහය

දිනක් මධ්‍යම රාත්‍රිය දක්වා බුදුරදුන් සමාධි භාවනාවෙන් ගත කර දෑස විවර කොට බැලූ විට කවුද පුද්ගලයෙක් ඇඳිරියේ තමන් ඉදිරියේ සිටි බව දක්නට ලැබිණි.

බුදුරදුන් හොඳින් බැලූ විට දකින්න ලැබුණේ කඩුවක් අතින් ගත් හැඩි දැඩි පුද්ගලයෙකි. මේ පුද්ගලයා බුදුරදුන් දෙස බලා ටික වේලාවකට පසුව කඩුව පසෙක තබා බුදුරදුන් ඉදිරියට විත් වැඳ නමස්කාර කළේය.

'' නුඹ කවුද? ඇයි මෙතනට ආවේ?'' යැයි බුදුරදුන් ඇසුවෝය.

'' ගෞරවනීය ගුරුතුමනි, ඔබතුමාව මරන්න කියලා මට නිර්දේශයක් දුන්නා. නමුත් මා එසේ කිරීමට සමත් නැහැ. ඔබ දෑස අඩවන් කරගෙන ඉන්න අතර මා අඩුම තරමින් දහ වරක් පමණ කඩුව ඉස්සුවා, තමුන්නාන්සේව මරන්න. නමුත් එසේ කරන්න බැරි වුණා. ඒ නිසා මට ලොකු බයක් තියනවා. මගේ ස්වාමියා මේ නිසා මාව මරා දමාවි,'' යැයි ඒ පුද්ගලයා පැවසුවේය.

බුදුරදුන් ඇහැව්වා තථාගත බුදුරජානන් වහන්සේ මරන්න කියලා කවුද නිර්දේශ කළේ,'' යනුවෙන් බුදුන් වහන්සේ විචාරෝය.

''ගුරුතුමනි, ඔහුගේ නම කියන්න තරම් මට හයියක් නැහැ,'' හා! හා! එයාගේ නම කියන්න ඕනෑ නැහැ.

කොහොම මොනවා කරන්න කියලා ද? යැයි බුදුන් වහන්සේ ඇසුවෝය.

''එයා මට කන්ද නඟින පාර පෙන්නුවා. පෙන්නලා කිව්වා කටයුතු සම්පූර්ණ වූ විට අනෙක් පාරකින් එන්න,'' කියා කීවා යැයි ඒ තැනැත්තා කීවේය.

''නුඹගේ බිරිඳ දරුවෝ එහෙම ඉන්නවා ද?''

''නැහැ ගුරුතුමනි, මගේ අම්මා පමණයි ඉන්නේ. මා විවාහ වූ කෙනෙක් නෙමෙයි.''

නුඹ අදම ගෙදර පලයන්. ගිහිල්ලා අම්මාත් අරගෙන කෝසල රාජ්‍යයට පලයන්. එහි ගොස් අලුත් ජීවිතයක් ගත කරපන්. නුඹගේ ස්වාමියා කිවු පාරෙම පලයන්. නැත්නම් ඒ අය නුඹව මරා දමාවි,''

බුදුරදුන් මරා දැමීමට පැමිණි පුද්ගලයා කඩුව පසෙක දමා බුදුරදුන්ට වැඳ එතැනින් නික්ම ගියේය.

දෙවන දා ශාරිපුත්ත, මුගලන් රහතන් වහ්නසේලා දෙනම බුදුරදුන් හමුවට පැමිණ ''අපි අනෙත් අයගේ පැත්තට ගිහිල්ලා ආවොත් හොඳ නේද? නොදැනීම නිසා පාර වෙනස් කළ අපේ අනෙක් සහෝදරයින්ට නියම පාර කියා දීම අපේ යුතු කමක්. අපි ඔබ වහන්සේගෙන් මේ සඳහා අවසර ඉල්ලනවා,'' යැයි පැවසූහ.

බුදුරදුන් යෑම අනිවාර්ය දෙයක් නම් ගියාට මගේ විරුද්ධත්වයක් නැහැ. නමුත් තමතමන්ගේ ජීවිත ගැන කල්පනාකාරී වීමත් වැදගත් බව මතක තියාගන්න,'' යැයි කීවෝය.

මේ සමඟම බුදුරදුන් ඉදිරියේ දමා තිබූ කඩුව දෙස ශාරිපුත්ත මහ රහතන් වහන්සේ නෙත් හෙළුවෝය. සංකේතයෙන් සියල්ල තේරුම් ගත් ශාරිපුත්ත මහරහතන් වහන්සේට බුදුහාමුදුරුවෝ, ''ඊයේ රාත්‍රියේ මාව මරන්න හමුදාවේ කෙනෙක් ආවා. ඔහුට මා වෙනමම මගක් පෙන්නුවා. ඔහු යන්න ගියා. නමුත් ජීවක පැමිණි විට ඒ පුද්ගලයාට ජීවත් වෙන්න මාර්ගයක් සාදා දෙන්න ඕනෑ. මේ කඩුව මෙතනම තියන්න. ජීවකටත් බලාගන්න පුළුවන්නේ,'' යැයි පැවසූහ.

මුගලන් මහරහතන් වහන්සේ ''මේ වාගේ වෙලාවක් අපි බුදුරජාණන් වහන්සේව තනි කරලා යන්න හොඳ නැහැ. ඔබ මේ ගැන කියන්නේ කුමක් ද?'' යැයි සැරියුත් මහ රහතන් වහන්සේගෙන් ඇසුවෝය.

සැරියුත් මහ රහතන් වහන්සේ යමක් කීමට පෙර බුදුරදුන් ජීවිතයේ ඕනෑම ප්‍රශ්නයකට පිළිතුර දෙන්න තථාගතයන් වහන්සේ සූදානම්. ඒ නිසා ඔබලා ඒ ගැන කම්පා වෙන්න එපා කියා,'' යැයි කීවෝය.

එදා බොහෝ භික්ෂූන් බුදුරදුන් හමු වීමට ජේතවනයට පැමිණියහ. බයභීත වූ සමහර භික්ෂූන්ගේ මුවින් කිසිම දෙයක් පිට වූයේ නැත. සමහර භික්ෂූන්ගේ දෑසින් කඳුළු ගලන්නට විය.

හේතුව කුමක්දැයි බුදුරදුන් ඒ භික්ෂූන්ගෙන් ඇසුවෝය.

අප එන අතර තුර ශාරිපුත්ත මුගලන් මහ රහතන් වහන්සේලා දෙනම යනවා දැක්කා යැයි එක් භික්ෂු නමක් පැවසුවේය. ''අපි ඇහැව්වා කොහෙද යන්නේ කියලා. ඒ දෙනම කිව්වා ගයාවේ අනෙක් පැත්තේ භික්ෂූන් ළඟට යන බව. මේ කතාව අහලා අපේ දෑසින් කඳුළු ගලන්න ගත්තා. පන්සියයක් භික්ෂූන් දේවදත්ත හාමුදුරුවන්ගේ පැත්තට ගියා. නමුත් මේ තරම් ජ්‍යෝෂ්ඨ භික්ෂූන් වහන්සේලා එහෙම කරාවි කියා අපි සිහිනෙකින් වත් සිතුවේ නැහැ,'' යැයි ඔවුහු කීහ.

බුදුරදුන් සිනා සී, ''භික්ෂුවරුනි කලබල වෙන්න එපා. ශාරිපුත්ත, මුගලන් ගැන තථාගතට හොඳ විශ්වාසයක් තියනවා., ඒ දෙනම කවදාවත්ම සංඝයාගේ විශ්වාසඝාතක වන්නේ නෑ,'' බුදුවදනින් සැනසීමට පත් භික්ෂූහු බුදු සිරිපා මුල වාඩි වූහ.

දෙවන දින ජීවක වෛද්‍යවරයා දානය සඳහා තම අඹ වනයට බුදුරදුන් ඇතුළු මහා සංඝයාට ආරාධනා කළේය. දානය සඳහා ආනන්ද හාමුදුරුවොත් වැඩම කළේය. දානයෙන් පසුව ජීවක වෛද්‍යවරයා විදේහි බිසව ඔබ වහන්සේව හමු වෙන්න අවශ්‍ය බව තමන්ට දැනුම් දුන් බවත් ඔබ වහන්සේ අවසර දෙන්නේ නම් මා ඒ කාර්යය කිරීමට සූදානම් බවත් කීවේය.

මේ රහස් හමු වීමේ කාර්යය ජීවක වෙද මහත්තයාගේ කාර්යයක් බව,'' බුදුරදුන් දැන ගත්තේය.

බුදුරදුන්ගේ අනුමැතිව ඇතිව ජීවක වෛද්‍යවරයා බිසව බුදුරදුන් හමුවට කැටුව ආවේය. බුදුරදුන් දැකීමෙන් මහ බිසව අඬන්න පටන් ගත්තාය.

කතාව මුල සිටම කියන්න යැයි බුදුරදුන් බිසවට කීවෝය. ඇය තම කතාව ආරම්භ කළා.

''ගුරුතුමනි, රජතුමා ඉන්නේ ඉතාම භයානක අවස්ථාවක. එතුමාගේ පණ කොයි මොහොතේ නැති වෙයි ද දන්නේ නැහැ. අජාසත්ත තම පියා බඩගින්නේ තබා මරා දැමීම සඳහා කටයුතු සූදානම් කරගෙන යනවා. රජතුමාට ආහාර ගෙනයාම මටත් තහනම්. රජතුමාව තම කාමරයේ හිර අඩස්සියේ සිටින විට කෑම ගෙන යාමට මට අවසර තිබුණා. දවසක් මා කෑම රැගෙන යන විට ආරක්ෂකයො කෑම භාජනය ඒ අය අතට ගත්තා. මා මේ ගැන හඬා වැලපුණා. නමුත් ඉන් කිසිම සහනයක් ලැබුණේ නැහැ. රජතුමා මට කියලා තිබුණා අජාසත්ත මගේ පුතා එයා කරන කියන කිසිම දේකට බාධා කරන්න එපා කියන කතාව. රජතුමා කිව්වා මා මැරෙන්න කැමතියි. නමුත් මේ නිසා රට තුළ කොලාහල වෙනවා දකින්න තමන් අකමැති බව.

දෙවන දා මම සහල් උයා කැඳ මෙන් සාදාගෙන ඇගේ තවරගෙන රජතුමා හමුවන්න ගියා. භාජනය හිස්ව තිබුණා. ආරක්ෂකයෝ හිස් භාජනය අතට ගෙන රැජිනට ඇතුළට යන්න දුන්නා. රජතුමාට ඇඟ ලෙවකන්න හැරලා ඇගේ තවරාගත් බත් රසවලින් දවස් කීපයක් රජතුමාව ජීවත් කෙරෙව්වා. ඊට පස්සේ පුතා කල්පනා කළා පිය රජතුමා තවම මිය ගියේ නැත්තේ ඇයි කියලා. මාව තවත් තදින් පරීක්ෂා කරන්න ගත්තා. ඇගේ තවරාගත් බත් රස හඳුනා ගත්තා. එදා සිට හමුවීමත් තහනම් කළා.

බිසව ඉතාම දුකින් හිස පහතට හෙලා අඬන්න ගත්තාය. ''ශාරීරික වශයෙන් රජතුමා ඉතාම දුර්වලව සිටිනවා. නමුත් සිතේ ශක්තිය තවමත් ඉතාම හොඳයි. රජතුමා ක්‍රෝධය ඊර්ෂ්‍යාව කවදාවත්ම හිතට ගත් කෙනෙක් නොවෙයි. හිර කරලා හිටියත් රජතුමා සක්මන් කරමින් භාවනා කරනවා රජතුමාව හිරකරලා තියන හිරගෙදර කුටියේ එක් ජනේලයක් ගිජ්ජකූඨ පර්වතය දෙසටයි හරවලා තියෙන්නේ. ඒ ජනේලයේ සමීපයේ වාඩි වෙලා රජතුමා භාවනා කරනවා. බොහෝ වෙලාවක් යන තෙක් ඒ ජනේලයෙන් බලා ඉන්නවා,'' යැයි බිසව තවදුරටත් පැවසුවාය.

තම සහෝදර පසේනදී කොසොල් රජතුමාට මේ කාරණය දන්නුවාද දැයි බුදුරදුන් බිසවගෙන් ඇසුවෝය. නමුත් බිසව පිළිතුරු දුන්නේ නැත. ''කැමතිනම් මා එක් භික්ෂුවක් සැවැත්නුවරට යවන්නම්. ඒ සමගම කියන්නම් යම් කිසි උපකාරයක් මේ වෙලාවේ කරන්න ඕනෑ නම් කරන්න කියලා, යැයි බුදුරදුන් කීවෝය.

බිසව බුදුරදුන්ට ස්තුති කළ බිසව අජාසත්තු මගේ කුසට ආ අවස්ථාවේදී නැකැත්කරුවන් මේ කාරණය සඳහන් කළා. අජාසත් ගැබ් ගත් වෙලාවේ දී මට දොළ දුකක් හැදුණා. රජතුමාගේ ඇඟිල්ලක් කපලා ලේ බොන්න. මා මේ දොළ දුක මතක් වෙන හැම විටම බය වෙනවා. මේ නිසා කුකුලන්, මාලුන් ආදී සතුන් කපන හැටි බලා සිටියොත් සිහිසන් නැතිව ඇද වැටෙනවා. නමුත් රජතුමාගේ ලේ බීමට තිබුණු ආශාව නැති වුණේ නැහැ. මේ ගැන බයත් ලැජ්ජාවත් නිසා රජතුමාට කිසිවක් කීවේත් නැහැ. නමුත් දිනෙන් දින බය සමග ලේ බීමේ ආශාව ද අධික වන්න ගත්තා. දවසක් රජතුමා පළතුරු ගෙඩියක් කපන කොට ඇඟිල්ලක් කැපිලා ලේ ගලන්න ගත්තා. මා ඉන් බින්දු කිහිපයක් බිව්වා. රජතුමා මගේ මේ ක්‍රියාව දැකලා පුදුම වුණා. රජතුමාගේ ලේ පානයෙන් පසුව මා සිහිනැතිව ඇදගෙන වැටුණා. සිහිය ආවාට පස්සේ රජතුමා ඇහැව්වා මේ වාගේ දෙයක් සිද්ධ වුණේ ඇයි ද යන වග.

''ඊට පසුව මම රජතුමාට සම්පූර්ණ කතාව කිව්වා. මම කිව්වා මේ සටනින් මා ජය ගන්න බොහොම මහන්සි ගත්තා. නමුත් අන්තිමට මා පරාජය වුණා කියලා. මේ සිද්ධියෙන් මා තේරුම් ගත්තා බඩේ ඉන්න දරුවා මොන ආකාරයක කෙනෙක් වේවි ද කියලා.

''අන්තිමට කරුණු දන්න හිතවත් සැම දෙනාම කිව්වා දන්ම කුසේ දිම දරු ගැබ විනාශ කරන්න. නැත්නම් අනාගතයේ දි මහා විපතක් වන බව. නමුත් අප දෙදෙනාම මේ ගැන එකඟ වුණේ නැහැ.

''දරුවා ඉපදීමෙන් පසුව කිසිම හතුරෙක් නැති අර්ථය අනුව රජ කුමාරයාට අජාසත්ත කියලා නම තැබුවා,'' යැයි පැවසුවාය.

'' දවස් තුනකට වරක් රජතුමා හමු වීම හොඳයි. එහෙම වුණහම අජාසත් තමන් ගැන සැක නොකරන බව. යන දවසට රජතුමා සමඟ වැඩිපුර කාලය ගත කරන්න,'' යැයි බුදුරදුන් බිසවට කීවෝය. බිසව බුදුරදුන් කී ආකාරයට දවස් තුනකට වරක් ශරීරයේ පෝෂ්‍යදායක ආහාර ලේපනය කරගන ගොස් රජතුමාට ලෙවකන්න දුන්නා. ඉන් රජතුමා ටික දිනක් ජීවත් කළ හැකි විය.

බිසවගෙන් සම්පූර්ණ කතාව අසා බුදුරදුන් අවශ්‍ය උපදෙස් දී ජීවක වෛද්‍යවරයා සමග සාකච්ඡාව අවසාන කරලා ගිජ්ජකූඨ පර්වතයට වැඩියෝය.

## හැත්තෑ හතර වන පරිච්ඡේදය

# ඇතින්නියකගේ මහා සටන

සැරියුත් මහ රහතන් වහන්සේ සහ මුගලන් මහ රහතන් වහන්සේ ගයාවේ මාසයක් පමණ කාලය ගත කර නැවත වේළුවනයට වැඩම කළෝය. සියලුම භික්ෂූන් එකතු වී උත්සව පූර්වකව දෙනමව පිළිගත්හ. දින කීපයකට පසු දේවදත්ත ළඟ සිටි භික්ෂූන්ගෙන් තුන්සිය නමක් නැවත වේළුවනයට පැමිණ බුදුරදුන් හමු වූහ. නැවතත් බුදුරදුන් හමුවට ආ භික්ෂූන් වහන්සේ ව වේළුවනයේ දී උන් වහන්සේ ඉතාම ආදර ගෞරව සහිතව පිළිගත්තෝය. ඊට පසුව නැවත අසූ දෙනෙක් පැමිණි බැවින් නැවත ආ පිරිස තුන්සිය අසූවක් විය.

සැරියුත් මහ රහතන් වහන්සේ සහ මුගලන් මහ රහතන් වහන්සේ යන දෙනමම බුදුරදුන් හමුවීමට ගිජ්ජකූට පර්වතයට වැඩම කළහ. බුදුරදුන් තම කුටියේ දොරටුවේ සිට අගසව් දෙනම භික්ෂූන් සමඟ වඩින ආකාරය බලාගෙන සිටියෝය. ගිජ්ජකූටයේ සිටි අනිත් භික්ෂූන් දේවදත්ත ළඟ සිට නැවත බුදුරදුන් හමුවට එන භික්ෂූන් පිළිගන්න ඉදිරියට ආවෝය. සැරියුත් මුගලන් දෙනම අනිත් භික්ෂූන්ගෙන් මිදී බුදුරදුන් සමඟ වෙනමම සාකච්ඡා කරන්න වෙන් වූහ. බුදුරදුන් අගසව් දෙනමව ඉතාම ආදරයෙන් පිළිගෙන

තමන් අසල වාඩිවෙන්න අවසර දුන්නේය. '' ආචාර්යතුමනි, අප භික්ෂූන් හාරසීයක් පමණ නැවත අප සමඟ එක්කගෙන ආවා,'' යැයි මුගලන් හාමුදුරුවෝ කීහ.

'' නුඹලා කළේ බොහෝම හොඳ වැඩක්, මට කියන්න කරුණාකරලා ඔබ දෙනම ඒ අයගේ දෑස විවර කළේ කොහොමද?'' බුදුරදුන් ඇසුවෝය.

මුගලන් මහරහතන් වහන්සේ කිව්වා අපි එතැනට යන වෙලාව වන විට දේවදත්ත හාමුදුරුවෝ දානේ වළඳලා බණ කියන්න සූදානම් වෙමින් සිටියා. දේවදත්ත හාමුදුරුවෝ ඔබ වහන්සේ අනුකරණය කරන්න බොහෝම මහන්සි ගන්න බව පෙනුණා. අපි එනවා දැකලා බොහෝම සතුටු වුණා. ශාරිපුත්ත මහ රහතන් වහන්සේට ආරාධනා කළා තමන් ළඟම තමන්ගේ ආසනයේ වාඩි වෙන්න කියා. නමුත් ශාරිපුත්ත හාමුදුරුවෝ භික්ෂූන්ගේ මැද්දේ වාඩි වුණා. මා අනෙක් පැත්තේ වාඩි වුණා. දේවදත්ත කිව්වා ඔබ සැමටම සුභ ආරංචියක්. සැරියුත් මුගලන් දෙනමත් අද අපේ කණ්ඩායමට ආ බව ඔබ සැමටම දන්වනවා කියා. දෙන්නාම මගේ ඉතාම පරණ හිත මිත්‍රයින් දෙදෙනෙක්. අද ධර්ම දේශනාව සඳහා මා ශාරිපුත්ත හිමියන්ට ආරාධනා කරනවා කියලා දේවදත්ත හාමුදුරුවෝ සැමගේ ම ඉදිරි පිට කිව්වා,'' යැයි මුගලන් මහ රහතන් වහන්සේ පැවසූහ.

''දේවදත්ත හාමුදුරුවෝ ශාරිපුත්ත හාමුදුරුවන් වහන්සේ දෙස හැරී දෑත් එකතු කර නමස්කාර කළා. ශාරිපුත්ත හාමුදුරුවෝ චතුරාර්ය සත්‍ය ඇතුළු කරුණු ඇතුව ඉතාම සාරසර්භ ධර්මදේශනාවක් කළා. සියලුම භික්ෂූන් ඉතාම ශාන්තව ධර්මය ශ්‍රවණය කළා. නමුත් දේවදත්ත හිටියේ නිදි මතින්. පසුගිය දවස්වල සිදුවුණ කටයුතුවල නිරත වී සිටි නිසා දේවදත්ත හාමුදුරුවෝ මහන්සි වී හති වැටීයි හිටියේ. ඒ නිසා ධර්ම දේශනා කරන අවස්ථාවේ දී නිදිමතෙන් සිටියා.

''අපි ගයාවේ මාසයක් පමණ ගත කළා. එහි සිද්ධ වන සැම සිද්ධියක් ගැනම ඉතාම ඕනෑකමින බලා සිටියා. සෑම දවස් තුනකට වරක් ශාරිපුත්ත හාමුදුරුවෝ ධර්ම දේශනා කරන සිරිතක් තිබුණා. උන්වහන්සේ සම්පූර්ණ මනෝ යෝගය සමඟයි ධර්ම දේශනා කළේ. දවසක් මා දැක්කා දේවදත්තගේ ප්‍රධාන උපදේශක කෝකාලික දේවදත්තගේ කනට කරලා මොනවද කියනවා. නමුත්

දේවදත්ත කෝකාලිකගේ කතාව ඒ තරම්ම ගණනකට ගත්තේ නැති බව පෙනුණා. මට හිතුණේ කෝකාලික කියන්න ඇති අප දෙනම ගැන එතරම් විශ්වාස නොකරන ලෙස. නමුත් දේවදත්ත හාමුදුරුවෝ සතුටු වුණා, ශාරිපුත්ත හාමුදුරුවෝ වගේ දක්ෂ කෙනෙක් ඉතාම ලාභයට ධර්ම දේශනා කිරීමට ලැබීම ගැන.

''දවසක් සතිපට්ඨානය ගැන ධර්ම දේශනා කරන අතරතුර ශාරිපුත්ත හාමුදුරුවෝ කිව්වා අද හවස මාත් මගේ මිත්‍රයාත් අපේ ආචාර්යවරයා වන බුදුරදුන් හමුවට යන බව. මිත්‍ර හිමිවරුනි, සම්මා සම්බුද්ධ ලෝකයේ සිටින්නේ එකම එක්කෙනයි. ඒ තමයි සංඝ ශාසනය පිහිටුවා වදාළ අපේ මහා කාරුණික බුදුහාමුදුරුවෝ. ඉන් එහා හෝ මෙහා හෝ වෙන අපට ආචාර්යවරයෙක් නැහැ. ඔබලා කව්රු හරි උන් වහන්සේ ළඟට යන්න සූදානම් නම් ඒ සැමවම උන් වහන්සේ ඉතා ආදරයෙන් පිළිගනීවි. මිත්‍ර වරුනි සංඝ භේදය තරම් වේදනාවක් තවත් ඇත්තේම නැහැ. මගේ ජීවිතයේ ඇත්ත වශයෙන්ම මට ලැබුණේ එකම ගුරුවරයායි. එතුමා තමයි මහා කාරුණික බුද්ධ. අපි අද යනවා. මේ පිරිස අතරින් කාට හෝ බුදුරදුන් සමීපයට යන්න ඕනෑ කරනවා නම් කරුණාකරලා වේළුවනයට එන්න. මාත් එහි ඉන්නවා. ඔබ සැම දෙනාවම බුදුන්ගේ දර්ශනය සඳහා එක්කරගෙන යන්නම්,'' යැයි කීවෝය.

''එදා දේවදත්ත හාමුදුරුවෝ යම් කිසි කාරණයක් සඳහා ගයාවෙන් පිට ගොස් සිටියා. නමුත් ඒ කතාවෙන් පස්සේ කෝකාලික නැගිටලා කතාවට විරුද්ධ වුණා. කැත වචන කිව්වා. නමුත් කිසිම දෙයක් ගණන් ගත්තේ නැතිව අපේ පාත්‍ර සිවුරු රැගෙන අපි වේළුවනය බලා පිටත් වුණා. දවස් කිහිපයකට පස්සේ ගයාවෙන් භික්ෂූන් තුන්සිය අසූවක් වේළුවනයට ආපසු ආවා.

''මේ අය නැවත පැවිදි කරන්න ඕනෑ නම් පැවිදි කරලා නැවත ඔබ වහන්සේ ළඟට රැගෙන එන්නම්,'' යැයි ශාරිපුත්ත හාමුදුරුවෝ පැවසූහ.

එහෙම කරන්න ඕනෑ නැහැ. මේ සියලුම දෙනා භික්ෂු සංඝයා ඉදිරියේ තමන් කළ වරද පිළිගතහොත් එය සෑහෙනවා යැයි බුදුරදුන් පැවසූහ. අගසව් දෙනම බුදුරදුන්ගෙන් සමුගෙන ගයාවෙන් පැමිණි භික්ෂූන් හමුවට ගියහ. ටික දිනකට පසු තවත්

භික්ෂූන් තිස් පස් දෙනෙක් බුදුරදුන් හමුවට පැමිණියෝය. ශාරිපුත්ත හාමුදුරුවෝ මේ සියලුම භික්ෂූන්ගේ දෝෂ මුක්ත සභාවෙන් සියලුම දෙනාව බුදුරදුන් හමුවට ගෙන ගියෝය. භික්ෂූන් හාරසිය නමක් තමන් අතහැර ගිය නිසා දේවදත්ත තද ක්‍රෝධයෙන් දවස් කිහිපයක් කිසිවකු සමඟ කතා නොකර සිටියෝය.

''නුඹලා නැවත බුදුරදුන් සමීපයට ආවේ කුමන කාරණයක් නිසා ද? ශාරිපුත්ත මුගලන් දෙනම මේ ගැන නුඹලාට කිව්වේ මොනවා ද?''යැයි ආනන්ද හාමුදුරුවෝ එක භික්ෂුවකගෙන් ඇසුවෝය.

'' ශාරිපුත්ත හා මුගලන් යන දෙනම ධර්මය හැර කිසි දෙයක් කිව්වේ නැහැ. මනෝ යෝගය අනුව තම ධර්මය දේශනා කළා. සැරියුත් හාමුදුරුවෝ භාවනා ගැන විස්තර කළා. ඒ දේශනා කිසි කෙනෙකුට කරන්න පුළුවන් දේශනා නොවෙයි. දේවදත්ත දේශනාවට ඉතාම දක්ෂයි. නමුත් සුදුසු පරිදි සැරියුත් මුගලන් දෙනම වාගේ මනෝ යෝගයෙන් ධර්ම දේශනා කිරීමට ශක්තිය ඇති කෙනෙක් නොවෙයි. අපත් දැන් පැවිදිවී අවුරුදු තුන හතරක් වුණා. හොඳ නරක තේරුම් ගන්න හැකියාව අපට තියනවා. ශාරිපුත්ත මුගලන් වැනි උගත් ධ්‍යාන ලාභී භික්ෂූන්ගේ ඇසුර ඒ අයගේ ධර්මය ගැන දැනුම කල්‍යාණ මිත්‍රතාව ආදී ගුණ ගැන අප සාකච්ඡා කළා. ඉන් පසුව තීරණය කළා දේවදත්ත හාමුදුරුවන් අතහැරලා බුදුන් හමුවට යන්න ඕනෑ කියලා,'' යැයි ඒ භික්ෂුව කීවේය.

''ඔබ සැම ගිය විට කෝකාලික හාමුදුරුවන් මොනවද කිව්වේ කියලා,'' ආනන්ද හාමුදුරුවන් ඇසුවෝය.

''කෝකාලික හාමුදුරුවන් කේන්තියෙන් අපට හොඳටම බැන්නා. ඒ නිසා අපගේ ගමන තවත් ස්ථිර වුණා.''

දිනක් බුදුරදුන් ගිජ්ජකූට පර්වතයේ දකුණු පැත්තේ කඳු බෑවුමේ සිට සූර්යස්තය දෙස බලමින් සන්ධ්‍යා සමය ගත කරමින් සිටින විට, ''ඔබගේ හිසට මහා ගලක් පෙරලෙන්නයි යන්නේ,'' කියා මහා හඬක් ඇසුණි. බුදුරදුන් හැරී බලන විට මහා ගලක් උන්වහන්සේ දෙසට පෙරළී එන බව දුටුවෝය. අවට තිබුණු අනෙත් ගල් කුළු නිසා එතනින් ඈත් වීමත් පහසු වූයේ නැත. නමුත් ගල බුදුරදුන්ගේ හිසට පෙරළී ඒමට කලින් ඉදිරියේ තිබුණු

ගල් දෙකක් මැද ඒ ගල හිරවිණි. නමුත් ඒ ගලෙන් කැඩුණු පතුරක් විසි වී බුදුරදුන්ගේ සිරිපතුලේ ගැටී ලේ පිට වෙන්න ගත්තා. බුදුරදුන් කඳු මුදුන දිහා බලන විට හැඩි දැඩි මිනිහෙක් එතැනින් ඉක්මනට දුව යනවා දුටුවෝය. කඳු පාමුල සිටි භික්ෂූහු මේ සිද්ධිය දැක දුවගෙන පැමිණියහ. මේක නම් කිසි කෙනෙකුගේ නො වෙයි දේවදත්තගේ ම වැඩක් යැයි එක් භික්ෂුවක් කීවේය. තවත් භික්ෂූන් කිහිප දෙනෙක් බුදුරදුන්ව ආරක්ෂා කිරීමට අපි ආරක්ෂා වලල්ලක් හදමු යැයි යෝජනා කළහ. බුදුරදුන් කිව්වා ''මගේ ආරක්ෂාවට කිසි දෙයක් කරන්න ඕනෑ නැහැ. ඔබ වහන්සේලා කුටි වලට ගිහිල්ලා තම තමන්ගේ භාවනා කරන්න. උපාසක චුන්දව පිටත් කරලා ජීවක වෛද්‍යවරයාට කියන්න මා හමුවෙන්න කියලා, බුදුරදුන් පැවසුවෝය.

පණිවිඩය ලැබුණු විගසම ජීවක වෛද්‍යවරයා පැමිණියේය. බුදුරදුන් දෝලාවක වැඩ හිඳුවාගෙන ජීවක අඹ වනයට එක්කගෙන ගියා. බුදුරදුන්ගේ පණ නැසීම සඳහා උත්සාහ ගත් බව දවස් දෙකක් ඇතුළත මුළු නගරයේ ම ප්‍රසිද්ධ විය. මේ සිද්ධියෙන් පස්සේ අගනුවර ජනයා ක්‍රෝධයෙන් ඉපිලී ගියෝය. ඒ සමඟම බිම්බිසාර රජතුමා මිය ගිය බව ආරංචියක් රටපුරා පැතිරිණි. රජතුමා මිය ගියේ කුමන ආකාරයකින් ද යන වග රටේ ප්‍රසිද්ධ විය. සිද්ධිය ඇත්ත බව රටේ අය දැනගත් පසුව ජනතාවගේ ක්‍රෝධය ක්‍රමයෙන් වර්ධනය විය. නමුත් කරුණාව, ශාන්තිය ගැන කවදත් සැලකූ ගිජ්ජකූටයේ වැඩසිටින බුදුරදුන් දෙස කාගේත් සිත යොමු විණි. රජතුමාගේ මරණය ගැන කොපමණ දුක් වුණා ද? එපමණට ම බුදුරදුන් ගැන ශ්‍රද්ධාව අධික වන්නට විය. මේ සියලුම සිද්ධීන් සම්පූර්ණයෙන් ම දැනගෙනත් බුදුරදුන් නිහඬව සිටියෝය. නමුත් මේ සියලුම දේ මුල සිට අග දක්වා බුදුරදුන් දැන සිටි බව ජනතාව දැන සිටියේය.

මිය යන විට බිම්බිසාර රජතුමාගේ වයස අවුරුදු හැට අටක් පිරී තිබිණි. බුදුරදුන්ගේ වයසින් අවුරුදු පහක් අඩු වයසිනුයි රජතුමා සිටියේ. වයස අවුරුදු පහළොවේ දී රජකමට පත් වූ බිම්බිසාර රජතුමා වයස තිස් එකේ දී බුද්ධං සරණං ගච්ඡාමි, ධම්මං සරණං ගච්ඡාමි, සංඝං සරණං ගච්ඡාමි කියා තුනුරුවන් සරණ සමාදන් විය. අවුරුදු පනස් දෙකක් රජකම් කළා. ගින්නෙන් විනාශ වූ රජගහනුවර නැවතත් රාජධානියක් ලෙස ගොඩනැගුවේ

එතුමායි. බිම්බිසාර රජතුමාගේ කාලයේ අංග දේශය සමග සිදු වූ යුද්ධය හැර සැම විටම ශාන්තිය පැවතිණි. අසල් වාසී රාජ්‍යයන් සමඟ මධුර සම්බන්ධය ආරක්ෂා කිරීමට බිම්බිසාර රජතුමා හැම විටම මහන්සි වුණා. මේ නිසා කෝසල ජනපදයේ රජකුමාරි කෝසලා දේවියවත් බිම්බිසාර රජතුමා සරණපාවා ගත්තේය. මද්‍ර සහ ලිච්ඡවී වංශයේ රාජකුමාරියන් සමඟ ද ආවාහවිවාහ කටයුතු සිදු විය. තම සහෝදරියගේ විවාහය කෝසල රජතුමාට විවාහ කර දුන්නේය. තම රාජකීය උද්‍යානයේ ස්ථූප සැදුවේය. එම චෛත්‍යයේ බුදුරදුන්ගේ කේශ ධාතු සහ නිය ධාතු තැන්පත් කරන ලදි. එම ස්ථූපවල හි පුද පූජා සඳහා ශ්‍රීමතී නමින් ප්‍රසිද්ධ කාන්තාවක් පත් කළේය. ඇය එකී චෛත්‍ය අවට මල් ගස් ආදිය සිටුවා අතුපතු ගා නිතර පිරිසිදු කළාය.

බුදුරදුන්ගේ හිසට ගල් පෙරළීමෙන් පසු දහවන දිනයේ පිණ්ඩපාතයේ වඩින විට ඇතෙක් කුපිත වී බුදුහාමුදුරුවන් දෙසට දිවගෙන එන බව ආනන්ද හාමුදුරුවෝ දුටුවෝය. නාලාගිරි නමින් ප්‍රසිද්ධව සිටි මේ ඇතින්න වියරු වියරු වැටී ඇති බවක් පෙනිණි. ඇත්ගාල රැක බලාගන්න පුද්ගලයා මේ ඇතින්නට පිටතට එන්න දුන්නේ ඇයිදැයි වටහා ගැනීමට ආනන්ද හාමුදුරුවෝ අපොහොසත් විය. භය වූ අය එහෙමෙහ දුවන්න පටන් ගත්හ. ඇතින්න හොඬවැල උස්සාගෙන බුදුරදුන් දෙසට දුවගෙන ආවේය. ආනන්ද හාමුදුරුවෝ බුදුරජාණන් වහන්සේගේ අතින් අල්ලාගෙන පැත්තකට එක්කරගෙන යන්න සූදානම් වුවත් බුදුරදුන් එසේ කරන්න ඉඩ තැබුවේ නැත. ශාන්ත දාන්තව, නිසලව වැඩ සිටියෝය. ජනතාව මහා භයියෙන් ඇතින්නගෙන් බේරෙන්න යැයි කෑගහන්න පටන් ගත්තේය. ආනන්ද හාමුදුරුවෝ සිහිසන් නැතිව ඇතින්නත් බුදුහාමුදුරුවෝත් අතරට පැමිණියේය.

නාලාගිරි ඇතින්නට බුදුරදුන්ට සමීප වෙන්න තිබුණේ ටික දුරකි. මඳ වේලාවකට පසු ඇතින්න බුදුරදුන් ඉදිරියට ඇවිත් දෙදන බිම තබා නමස්කාර කළාය. බුදුරදුන් එක් අතකින් ඇතින්නගේ හොඬය අල්ලා තව අතකින් නලළ පිරිමැද ඉතාම කීකරු ශිෂ්‍යයෙකු සමඟ යන්නා සේ වියරු වූ ඇතින් රාජකීය ඇත්හලට රැගෙන ගියෝය.

ඒ දුටු පිරිස පුදුමයට පත්විය. ආනන්ද හාමුදුරුවෝ සිනාසිණි. සිද්ධාර්ථ සමයේ කරන ලද ශිල්ප කලා ගැන එදා ආනන්දට සිහිපත් විය. මේ තරම් කෲර ඇතින්න තම පාලනයට ගත්තේ ඉතාම පුරාණ මිත්‍රයෙකුව පාලනයට ගන්නා ආකාරයටය.

බුදුරදුන් රාජකීය ඇත් හලට ගොස් ඇත්ගාල මේ ඇතින්න මේ ආකාරයට වියරු කර මා හමුවට එව්වේ කවුද කියල කියන්න ඕනෑ නැහැ. නමුත් නුඹ කළ මේ කාර්යයෙහි ප්‍රතිඵල ඒ තරම්ම හොඳ නොවන බව දන ගන්න. මිනිස්සු දහස් ගණනක් මරන්න පුළුවන් මේ ඇතින්න ඇයි එක් පුද්ගලයෙකුගේ කීම පිට අත් හැරියේ. අනාගතයේ දී එහෙම කරන්න එපා,'' යැයි ඇත්ගාල භාරකරුට කීවෝය. ඇත්ගාල රැකවලා බුදුන් වැඳ සමාව ගත්තේය. බුදුරදුන් ඇතින්න බාර දී භික්ෂූන් හමුවට ගියෝය.

බුදුරදුන් ඇතුළු භික්ෂු මහා සංඝයා භාරදහසක් පමණ රජතුමාගේ පාංශුකූලය සඳහා සහභාගී වූහ. විශාල ජනකායක් තම ආදරණීය රජතුමාට උපහාර දැක්වීම සඳහා එකතු විය. රජතුමාගේ මරණය කාටත් ඉතාම තද වේදනාවක් ගෙන දෙන දෙයක් විය. පාංශුකූලය දා රාත්‍රියේ බුදුරදුන් ජීවක වෛද්‍ය වරයා සමඟ ඔහුගේ අඹ වනයේම ගත කළෝය. වෛද්‍යවරයා '' විදේහී බිසවට අන්තිම මාස කීපයේ රජතුමා හමුවෙන්නම දුන්නේ නැහැ කියලා. අන්තිම කාලයේ රජතුමා හිර වී තනිවම කාලය ගත කළා. ගිජ්ජකූඨ පර්වතය පෙනෙන පැත්තේ ජනේලය දෙස ම නිතර බලා සිටියා,'' යැයි කීවේය.

බිම්බිසාර රජතුමාගේ පාංශුකූලයෙන් පසු එතුමාගේ පුත් අභය රාජ කුමරු ඔහුගේ බිසව පද්මාවතී යන දෙදෙනා බුදුරදුන්ගේ හමුවීමට පැමිණියේය. රාජකුමාරයා ''පැවිදි වීම සඳහා ත්‍රි රත්නය උච්ඡාරණය කිරීමට අවසර දෙන්න යැයි බුදුරදුන්ගෙන් ඉල්ලා සිටියේය.තම ආදරණීය පියාගේ මරණින් පසුව ධනය සහ බලය යන දේ ගැන ඇති හැඟීම නැති වූ බවත් ඔහු ප්‍රකාශ කළේය. ''ඔබ වහන්සේගේ ධර්මය මට හැම විටම සැනසීම ලබා දුන්නා. ඒ නිසා ඒ මග මගේ ජීවිතයට ගැලපෙන බව මා තීරණය කළා,'' පසු දා අභයරාජ කුමාරයා පැවිදි වූවේය.

## හැත්තෑ පස් වන පරිච්ඡේදය

# සතුටු කඳුළු

දින දහයක පසු බුදුරදුන් රජගහනුවරින් නික්මී කූටාගාර ශාලාව හරහා ශ්‍රාවස්තියට ළඟා වූහ. වස් කාලය පැමිණෙමින් තිබිණි. ඒ නිසා ඊළඟ වස් කාලය සඳහා ජේතවනාරාමයට වැඩම කරවීම සිදු විය යුතුව තිබිණි.

ශාරිපුත්ත, මුගලන්, ආනන්ද හාමුදුරුවරුන් සමඟ තුන්සියයක් භික්ෂූන් බුදුරජුන් සමඟ ගමන් ගත්තේය.

ශ්‍රාවස්තියට වැඩම කර කෙළින් ම ජේතවන විහාරයට වැඩම කරන ලදි. එහි බොහෝ භික්ෂූන්භික්ෂුණීන් බුදුරදුන් පිළිගැනීමට සූදානම්ව සිටියෝය.

මේ සියලුම දෙනා මගධයේ සිදු වූ සියලු දේ ආරංචියෙන් දැනගෙන සිටියෝය. බුදුරදුන්ට කිසිම පීඩාවක් නොවී තමන්ට දකින්න ලැබීම ගැන කවුරුත් සතුටු වූහ. භික්ෂුණීන් අතර භික්ෂුණී ඛේමාත් සිටියාය. ඇය ඒ අවස්ථාවේ දී භික්ෂුණීන්ගේ නායකත්වය දැරුවාය.

බුදුරදුන්ගේ වැඩම වීම ආරංචි වූ සැනින් පසේනදී කොසොල් රජතුමා බුදුන් හමුවීමට පැමිණියේය. පළමුවෙන්ම රජගහනුවර තොරතුරු දැනගන්න ඕනෑ බව රජතුමා කීවේය.

බුදුරදුන් සියලුම දේ විස්තර සහිතව කීවෝය. වේදිසා බිසව සමඟ කළ සාකච්ඡාවේ ද විස්තර පැවසුවෝය. ''ඇය දකින ඕනෑම කෙනෙක් සිතන්නේ ඇය හරිම ශාන්තයි කියලයි. නමුත් මා දන්න තරමින් ඇය ඇතුළෙන් ඉතාම දුක් වන කෙනෙක්. මා රාජ දූතයින් පිරිසක් රජගහනුවරට යැව්වා අජාසත්ත ගෙන් අහන්න කියල මොන හේතුවක් නිසා ද බිම්බිසාර රජතුමා හිර අඩස්සියට ගත්තේ කියලා. නමුත් මාසයක් ගත වෙලත් තවම කිසිම පිළිතුරක් අජාසත්තගෙන් මට ලැබුණේ නැහැ. ඒ නිසා තව පිරිසක් යැව්වා. ඒ පණිවිඩයේ සඳහන් කළේ අලුත් රජතුමා කෝසල රාජ්‍යට සුදුසු අවස්ථාවක පැමිණ කරුණු පැහැදිලි කරන්න කියලා. මගධය ගැන සතුට ප්‍රකාශ කිරීම සඳහා මා නැවත මගධ රාජ්‍යය මගේ රාජ්‍යය සමග සම්බන්ධ කළා. මගේ නැඟණියගේ විවාහය දා එහි සතුටට මා මගධය බිම්බිසාර රජතුමාට තෑග්ගක් හැටියටයි දුන්නේ. මගධය කාශී රට, වාරාණසියට සමීපව යි තිබුණේ,'' යැයි කොසොල් රජතුමා කීය.

වස්සාවාසයේ පළමු දින ආරම්භ විය. සියලුම මධ්‍යස්ථානවල භික්ෂුභික්ෂුණීන් එක තැනකට එකතු විය. සෑම දින දහයකට වරක් බුදු හාමුදුරුවෝ ධර්ම දේශනා කිරීම සිරිතක් හැටියට කළෝය. බුදු රජුන්ගේ පළවෙනි දේශනාවට මාතෘකාව වුණේ අත්‍යන්ත සතුටයි.

'' සතුට ස්වාභාවික මානසික ගතියක්. දෛනික ජීවතය ගත කරන අතරතුර එය ලබාගත හැකි බවයි. ඒ සතුට ඉන්ද්‍රිය සැපයෙන් ලබාගැනීම අපහසුයි. ඉන්ද්‍රිය සුඛයෙන් ලැබෙන සතුට එක්තරා අත්දැකීමක් පමණයි. ඒ සැපය පසු කාලයේ දී දුකට හේතු වෙනවා. ඒ සැපය උදාහරණයක් හැටියට ගත හොත් කකුලේ දදයක් ඇති කෙනෙක් ඉන් තාවකාලික සතුටක් ලැබීම සඳහා ඒ දදය ඇති කකුල ගින්දර රස්නයට කිට්ටු කරනවා වගේ දෙයක්. සැපය රස්නය ඇති තෙක් පමණයි. නමුත් එහෙම දදයක් නැති කෙනෙකුට ඒ රස්නයෙන් ඇති දෙයක් නැහැ. සරල ජීවිතය සමඟ පැතුම් අඩු කම ස්වාභාවික සතුටට හේතුවනවා. රාග, ද්වේෂ, යනාදීයෙන් මිදී වර්තමානයේ සිද්ධවන දේ සමඟ ජීවත් වීම ස්වාභාවික සතුටයි. ස්වාභාවික සතුටින් සිටින පුද්ගලයා වර්තමාන කාලයෙහි ශීතල මන්දමාරුතය, සුන්දර ආකාශය, ලස්සන මල්, උණ බට උයන්වල සිලිසිලි හඬ, පුංචි දරුවන්ගේ

සිනහ හඬ යන ස්වාභාවික දෙයින් සතුට ලබා ගන්නවා. ස්වාභාවික සතුට ඇල්මෙන් හෙවත් බැඳීමෙන් තොර වෙනවා. ස්වාභාවික සතුට විඳින්නා කිසිම භයකින් තොරව සතුටු ජීවිතයක් ගත කරනවා. ඒ පුද්ගලයා දන්නවා අද පිපී තිබෙන මල කවදාහරි දවසක පර වී යන බව. මේ නිසා මල් පරවෙනවා දැකලා දුක් වෙන්නේ නැහැ. ස්වාභාවික සතුට විඳින පුද්ගලයා ඉපදීමේ සහ මරණයේ නියම ස්වභාවය හොඳටම දන්නවා. ඒ පුද්ගලයා තමන්ගේ මරණය ගැන භයවෙන්නේ නැහැ.

''සමාජයේ සමහර අයගේ මතයක් තියනවා ඊළඟ උත්පත්තිය සැපවත් කර ගැනීමට මේ ජීවිතයේ දුක් විඳින්න ඕනෑ කියලා. මේ නිසා බොහෝ අය බොහෝ දුක් විඳිනවා. සිතට සහ ශරීරයට දෙකටම දුක් දෙනවා. එහෙම කරන්නේ ඊ ළඟ ජන්මය සැප දායක කර ගන්නයි. නමුත් ජීවිතය වර්තමානයේ ජීවත් විය යුතු එකක්. දුක් දී කරන පරිත්‍යාග වර්තමාන ජීවිතයට කරන තේරුමක් නැති දෙයක්.

''සමහර කෙනෙක් හිතනව ලබන ජීවිතය සැපවත් කිරීම සඳහා වර්තමාන ජීවිතයෙන් ඉක්මනට මිදෙන්න ඕනෑ කියලා. මේ නිසා ඒ අය ශරීරයට කරදර කරන තැවීම් ආදිය කරනවා. ව්‍රත උපවාස ආදිය කරනවා. සිතට සහ ශරීරයට දඬුවම් දෙනවා. මේ අනුව වර්තමානයත් අනාගතයක් දෙකටම කරදර ඇති කරගන්නවා. මීට අමතරව සමහර කෙනෙක් සිතනව ජීවිතයේ සියල්ලම වර්තමානය කියලා. ඒ අය අනාගතය ගැන කිසිවක්ම සිතන්නේ නැහැ. ජීවිතයේ සියලුම ඕනෑකම් මේ ජීවිත කාලයේ දීම සම්පූර්ණ කිරීමට උත්සහ ගන්නවා.

''මේ අනුව විෂය භෝගයට වශී වීම නිසා වර්තමානයත් අනාගතයත් දෙකම විනාශ කර ගන්නවා. අන්තිමට ඉන් ලැබෙන්නේ දුකක් පමණයි. මේ නිසා මේ අන්ත දෙකෙන්ම මිදෙන්න ඕනෑ. සියල්ලටම වඩා වැදගත් මාර්ගය එයයි. ඉන් වර්තමානය සහ අනාගතය යන දෙකේම ස්වාභාවික සතුට ලබාගන්න පුළුවන්. අනාගත සැපතක් බලාගෙන වර්තමාන ජීවිතයට කරදර කිරීම, තප කිරීම තේරුමක් නැහැ. භික්ෂූන් වහන්සේ තමන්ගේ දෛනික දානය ගන්නේ කෙසේ ද ස්වාභාවික සතුට තමන් පමණක් නොවෙයි අසල්වාසී අයවත් සතුටට පත් කරනවා. දවසට වරක් කෑම ගැනීමෙන් ශරීරය සැහැල්ලු වනවා

සේ ම ශරීරය නිරෝගී බව ද ඇති වෙනවා. ඉන් ධ්‍යාන භාවනා කිරීමටත් අවස්ථාවක් ලැබෙනවා. භික්ෂූන් වහන්සේ විවාහ වී නැහැ. දරුවන් නැහැ. මේ සියල්ලම ධ්‍යාන භාවනා සඳහා පමණක් නොවෙයි. අනෙක් අයට සේවය කිරීමට අධික කාලයක් ලබා ගැනීම සඳහා යි. මේ නිසා දෛනික ජීවිතයේ ඉතාම සතුටින් සිටිය හැකි පිරිසක්. යම් කිසි ආකාරයකින් භික්ෂූ පිරිස තමන්ගේ ශුද්ධ චරිතය ස්වාභාවික සතුටින් ඇත් කර ගන්නවා නම් ධර්මදේශනාවේ මූල ධර්ම වලින් බැහැරව ජීවත් වන කෙනෙක් හැටියට හැඳින් විය හැකියි. නියමානුසාර ජීවිතය ගත කළහොත් සම්පූර්ණ ශක්තිය , සතුට, ශාන්තිය ආදී මානසික ශක්තිය ලැබීම සිද්ධ වෙනවා. ඒ ජීවිතයෙ වර්තමාන අනාගත දෙකටම ස්වාභාවික සතුට ලබා දෙනවා,'' බුදුරදුන් දේහනා කළෝය.

ධර්ම දේශනාව අවසානයේ උපාසිකා පූර්ණ ලක්ෂණ බුදුරජුන්ගෙන් යමක් කීමට අවසර ඉල්ලා සිටියාය. ඇගේ ස්වාමි පුරුෂයා අනාථ පිණ්ඩික තදින්ම රෝගාතුර වි සිටින බවත් යම්තමින් හෝ සනීපෙන් සිටියනම් ඔබ වහන්සේගේ ධර්ම ශ්‍රවණයට කොහොම හරි එන බවත්. දිනෙන් දින ඔහුගේ රෝගය තත්වය උත්සන්න වන නිසා ඔහුට භයක් තියනව බුදුරදුන්ගේ දර්ශනය නොකර අන්තිම හුස්ම හෙළන්න සිද්ධවේවි ද කියලා,'' ප්‍රකාශ කළාය.

පසුවදා බුදුරජුන් ශාරිපුත්ත සහ ආනන්ද සමඟ සුදත්ත බලන්නට වැඩියෝය. බුදුරජුන් දැකීමෙන් සුදත්ත සතුටින් ඉපිලී ගියේය. සුදත්ත සිටුතුමාගේ මුහුණ අසනීප ගතිය නිසා සුදු මැලි වී තිබිණි. බුදුරජුන්ට ගෞරව කිරීමක් ඔහු වශයෙන් ඉතාම අපහසුවෙන් ආසනයෙන් නැගිට්ටේය.

''ඔබගේ ජීවිතය ඉතාම සාර්ථකව ප්‍රසන්නව ගෙවුණා. ගණන් කරන්න බැරි තරම් දුගී දුප්පත් අයට උපකාර කළා. ඒ නිසා සමාජයේ සැම කෙනෙක්ම ඔබට අනාථ පිණ්ඩික කියලා කියනවා. ජේතවනය විහාරය ඔබගේ උතුම් කාර්යයන්ගෙන් එක් දෙයක්. සැමදාම සද්ධර්මය ප්‍රචාරය සඳහා උත්සහ දැරුවා. සද්ධර්මය අනුව ජීවිතය ගත කළා. තමන්ගේ පවුලේ අය අසල්වාසීන් හැමවිටම සතුටු කළා. සැමට සහාය දුන්නා. දන් දෙන්න හැම විටම මහන්සි ගත්තා. දැන් ඉතින් විවේක ගන්න. මා ශාරිපුත්ත මහ රහතන්

වහන්සේට කිව්වා සෑමදාම ඇවිත් ඔබව බලලා සද්ධර්මය ගැන සාකච්ඡා කරන්න කියලා. විහාරයට එන්න උත්සහ ගන්න එපා. ඔබට ඔබගේ ශරීර ශක්තිය ආරක්ෂා කරගෙන තබා ගැනීම ඉතාම වැදගත්,'' යැයි බුදුරදුන් පැවසුවෝය.

සුදත්ත බුදු රජුන්ට ස්තුති කිරීම් වශයෙන් දෑත එකතු කර නමස්කාර කළේය.

දින පහළොවකට පසුව බුදුරජුන් සාමාන්‍ය උපාසකයින් ගේ ජීවිතය ගත කරන ආකාරය විස්තර කළෝය. උපාසකයින් තමන්ගේ එදිනෙදා ජීවිතයේ ඇත්තට ම සැප ලබා ගෙන සතුටින් ජීවත් වන්නේ මොන ක්‍රමයට ද යැයි විස්තර කළෝය. වර්තමානයේ ශාන්තිය අනාගත ශාන්තිය ගැන විස්තර කළහ. ''භික්ෂූන් වහන්සේ විවාහ නොවී වර්තමානයේ සතුටු සිතින් ජීවත් වෙනව. එය අනාගත සතුටට ද හේතු වෙනවා. උපාසක පිරිස් ද ගිහි ජීවිතය ගත කරමින් ඒ ජීවිතය සම්පූර්ණ සතුට ලබාගන්න ක්‍රම තියනවා. පළවෙනි කාරණය තමයි මුදල් ඉපයීමට මහන්සි වීම. ජීවත් වීමට මුදල් අවශ්‍යයි. ඒ සඳහා මහන්සි විය යුතුයි. නමුත් දවල් රෑ දෙකම මේ සඳහා යෙදුවොත් ගිහි ජීවිතයේ සතුට ඉන් නැති වෙනව. ප්‍රසන්න තාවය ජීවිතයේ ඉතා ම වැදගත් වෙනවා. තේරුම් පැහැදුම් ඇති බව සමාජයට හඳුන්වා දෙන්න ඕනෑ. සිනහවෙන් පිළිගැනීම, කරුණාවෙන් කතා කිරීම, ප්‍රේම පූර්වකය කෑම ගැනීම, නිතර සිහියෙන් කටයුතු කිරීම ආදී දේ වර්තමාන ජීවිතය සැපවත් කිරීමේ ඉතාම වැදගත් අදහස්, නිතරනිතර සිහි කල්පනාවෙන් සිටීමෙන් තමනුත් තමන්ගේ අසල් වැසියන්වත් විපත්වලින් බේරා ගන්න පුළුවන්. සිනහවට, සිනහවෙන් පිළිතුරු දීමෙන් ඔබට නිතර ස්වාභාවික සතුටින් ඉන්න පුළුවනි. ස්වාභාවික සතුට ළඟා කර ගැනීමට ධනය හෝ බලය උපයෝගීවන්නේ නැහැ,'' යැයි බුදුරදුන් පැවසූහ.

අවුරුදු කීපයකට පෙර රජගහනුවර සිඟාල නම් සිටු පුත්‍රයාට දෙසූ දේශනා ගැන ද විස්තර කළහ. මා දවසක් පිණ්ඩපාතය සඳහා වේළුවනයෙන් උදෑසන පිටත් වුණා. මා දැක්ක නගරයේ තරුණ ළමයෙක් දිසා හයට නමස්කාර කරනවා. කාරණය ඇහැව්වාම කිව්ව තමන්ගේ පියා පුංචි කාලේ ඉඳලා තමන්ට දිසා හයට වඳින්න කියල නියම කළා. ඒ නිසා මා ඒ කාර්ය ඒ ආකාරයෙන් ම කරනවා. නමුත් මෙහි අදහස කුමක් ද කියා තමන් නොදන්න බව ද පැවසුවා.

'' වැඳීමෙන් වර්තමානය සහ අනාගතය ප්‍රසන්න වන බව මා සඳහන් කළා. පූර්ව දිශාවට වඳින විට තම දෙමව්පියන් සිහි කරන්න. දකුණට වඳින විට ආචාර්යවරුන් සිහි කරන්න. පෙර දිගට වඳින විට භාර්යාව සහ දරුවන් සිහි කරන්න. උතුරට නමස්කාර කරන විට හිත මිත්‍රයින් සිහි කරන්න. පෘථිවියට නමස්කාර කරන විට තමන්ගේ සේවකයන් සිහි කරන්න. ආකාශයට නමස්කාර කරන විට පූජ්‍ය පක්ෂය සිහි කරන්න.

ඉන්පසු මා, බුදු රදුන් සිඟාලට පන්සිල් පිළිබඳව විස්තර කළා. ලොභ, ක්‍රෝධ, මෝහ යන කරුණු මුල් කරගෙන යමක් කරනවානම් ඒ ගැන ඉතාම ගම්භීරව සිතය යුතු බව විස්තර කළා. සුරාව, මත් වන දෙයින් වැළකීම. රෑ දවල් දෙකේ වැඩක් නැතිව මහ පාරේ නිකරුණේ කාලය ගත නොකිරීම, වැරදි කාන්තාවන් සිටින තැන්වලට නොයෑම, චරිතය කැත කරන අය ළඟට නො යෑම, කම්මැලි නොවීම, යත් මේ කරුණු හය ගැන කල්පනා කාරී නූනොත් තමන් විනාශයට පත් වන බව විස්තර කළා.

''මිත්‍ර වීමට සුදුසු අය කවුරුද කියාත් විස්තර කළා. ඉතාම හොඳ මිත්‍රයා කියන්නේ මිත්‍රත්වය ස්ථිර වශයෙන්ම රකින අයයි. ඔබගේ සැපේ දී ඔබගේ විපතේ දී ඔබගේ පාඩුවේ දී ඔබගේ ලාභයේ දී එක සේ සිටින මිත්‍රයා සැබෑ මිත්‍රයායි. ඔහුගේ අදහස් ගැන හෙල්ලෙන්නේ නැහැ. වෙනස් වෙන්නේ නැහැ. ඔබගේ දුක ඔහුගේ දුක. ඔබගේ සැප ඔහුගේ සැප. ඔබගේ පාඩුව ඔහුගේ පාඩුව, ඔබගේ ලාභය ඔහුගේ හැටියට සිතන මිත්‍රයා නියම කල්‍යාණ මිත්‍රයායි. ගිහි ජීවිතයේ ස්වාභාවික සතුට ලැබීම සඳහා ගුණවත් අය සමග සම්බන්ධය ඇති කරගෙන අයහපත් අයගෙන් ඈත් වන්න ඕනෑ බව විස්තර කළා.

''තමන් ගැන තමන් විශ්වාස කරන ආකාරයේ කටයුතු සම්පාදනය කරන්න ඕනෑ. සද්ධර්මය මෙන්ම ශීලය ද ආරක්ෂා කිරීමට මහන්සි ගන්න ඕනෑ. තම මව්පියන්, භාර්යාව, දරුවන් යන පවුලේ සැම දෙනාවම සමානව සලකන්න ඕනෑ.

''අනෙක් අයගේ සතුටේ දී සතුටුවන්න ඕනෑ. ශීලාචාර ධර්ම ජීවතයට එකතු කර ගැනීමට මහන්සි විය යුතු අතර මධ්‍යපානය, සූදු කෙළීම ආදියෙන් මුක්ත වෙන්න ඕනෑ.

''නිහතමානී බව, කෘත ගුණ සැලකීම, සරල ජීවනය ආදී කලාවන් ජීවිතයට සම්බන්ධ කර ගැනීම, සද්ධර්මය පිළිපදින භික්ෂූන් ආදී උගත් අය ආශ්‍රය කිරීම, සතර ආර්ය සත්‍යය පිළිබඳව දැනුමක් ඇති බව, ධ්‍යාන භාවනා කිරීමෙන් සිත එකඟ වීම සමඟම දුක් නැති වීමට ද මාර්ගයක් වෙනවා,'' යැයි බුදුරදුන් පැවසූහ.

සද්ධර්මය පාලනය කරමින් සමාජ සේවයේ යෙදී සිටින උපාසක වරුන් ගැන බුදු රජුන් ප්‍රශංසා කළහ. මේ ගැන විස්තර කිරීමේ දී අනාථ පිණ්ඩික සිටුතුමා ගැන විස්තර කිරීම අමතක කළේ නැත. සම්පූර්ණ ජීවිතය සාර්ථකව ගත කළ කෙනෙක් හැටියට සුදත්තව ගෙනහැර දැක්වූහ. එතුමාගේ හදවතේ තිබුණු උදාර ගතිය ගැන විස්තර කළහ. බොහෝ ධනය ඇති අය සමාජයේ සිටියත් අනෙක් අයගේ සැපත සඳහා තම ධනය යොදවන්නේ ඉතාම අඩුවෙන් බව සඳහන් කළහ.

බුදු රජුන්ගේ මුවින් අනාථපිණ්ඩික සිටුතුමා ගැන කළ විස්තරය අසා සිටු දේවි පද්ම ලක්ෂණ සතුටු කඳුළු වගුරන්න ගත්තාය.

ඇය බුදුරජුන්ට නමස්කාර කර ''ගුරුතුමනි, ධනවත් අයගේ ජීවිතය කාර්ය බහුලයි. ධාර්මික ජීවිතයක් ගත කරන්න නම් සුළු ව්‍යාපාරයක් කිරීම ඉතාම වැදගත්. මාත් කැමතියි සරල ජීවිතයක් ශාන්ත ජීවිතයක් ගත කරන්න. නමුත් ඇති කටයුතු කර්මාන්ත අනුව එසේ කිරීම ඉතාම අපහසුයි. මේ ගැන යමක් කරන්න උපදෙස් දෙන්න,'' යැයි පැවසුවාය.

'' භික්ෂූන්ටත් වගකීම් ඇති බව තිබෙනවා. විවාහ නොවී සිටින නිසා දිවා රෑ ශීලය ආරක්ෂා කිරීමට මහන්සි වෙන්න ඕනෑ. භික්ෂූන් තම ජීවිතය අනෙක් අයගේ ජීවිත සැපවත් කිරීමට සැම විටම යොදනවා. ඔබ සැමටම මා එක්තරා උපායක් කියන්නම්, භික්ෂූ ජීවිතයේ සතුට ලැබීම සඳහා. එය අටසිල් සමාදන් වීමයි. මාසෙකට වරක් එන පෝය දවසට දවල් දවස සහ රෑ අටසිල් සමාදන් වී විහාරයට වී සිටින්න. එදාට භික්ෂූන් වහන්සේ වගේම ඔබටත් දවසට වරක් භෝජනය ගැනීම කළ හැකියි. සක්මන් කරමින් හෝ පදමාසනයෙන් වාඩි වී හෝ භාවනා කළ හැකියි. පැය විසි හතරක් හිත විවේකීව තබාගන්න පුළුවන්. භික්ෂූන් වහන්සේ ජීවිතය ගත කරන්නේ කොහොම ද පැය විසි හතරක්ම ඒ ජීවිතය ගත කරන්න පුළුවන්. ඊට පස්සේ ගෙදර ගොස් නැවත

තම ගිහි ජීවිතය ඒ ආකාරයට ගත කරන් පුළුවන්. ගිහි ජීවිතයේ දී පංච ශීලය ආරක්ෂා කරන්න හැකියාව තියනවා. පෝය දාට විහාරයට ගොස් හෝ තම නිවසේ හෝ මේ කටයුතු කරන්න පුළුවන්. අවශ්‍ය නම් තම නිවසට භික්ෂූන් වැඩම කරවා ධර්ම දේශනා කරවන්න පුළුවන්,'' යැයි බුදුරදුන් පැවසුවාය.

බුදු රදුන්ගේ දේශනාව අසා පද්මා සිටු දේවිය සතුටට පත්විය. ඇය ඇහැව්ව අටසිල් කියන්නේ මොනවා ද යැයි ඇය ඇසුවාය.

'' සතුන් නොමැරීම, සොරකම් නො කිරීම, කාම සේවනය නොකිරීම, බොරු නො කීම, සුරාපානය නො කිරීම, රත්රන් රිදී නොපැළඳීම, සුඛෝපභෝගී උස් ආසන පාවිච්චි නොකිරීම, විකාලයෙහි කෑම නොගැනීම. යන කරුණු අට අටසිල්වලට ඇතුළත් වනවා,'' බුදුරදුන් විස්තර කළේය.

දින කිහිපයකට පසු සුදත්තගේ මාළිගාවෙන් පණිවිඩකරුවෙක් පැමිණ සුදත්තගේ අසනීප තත්වය අසාධ්‍යයු බව කියා සිටියේය. ශාරිපුත්ත මහ රහතන් වහන්සේ ආනන්ද හාමුදුරුවන් සමග සුදත්තව බලන්න ගියෝය. දකින්න ලැබුණා සුදත්ත ඉතාම අපහසුවෙන් ඇඳේ වැතිර සිටින ආකාරය උන් වහන්සේලාට දැක ගත හැකි විය. සැරියුත් මහරහතන් වහන්සේත් ආනන්ද හාමුදුරුවෝත් ඒ අසලම වාඩි වූහ.

සුදත්ත ඉතාමත් බරපතල තද ශාරීරික වේදනාවෙන් පෙළෙමින් සිටියේය. ''හිත බුද්ධ, ධම්ම, සංඝ යන තුනුරුවන් ගැන යොමු කරන්න. එවිට වේදනාව අඩුවේවි යැයි මේ බව දුටු ශාරිපුත්ත හිමි කීවෝය.

සුදත්ත තව වැඩි වේලාවක් ජීවතුන් අතර නො සිටින බව ශාරිපුත්ත හිමියන්ට අවබෝධ විය. ශරීරයට වේදනා ඇති වුවත් සිතේ ශක්තිය කිසිම අඩුවක් නැති බව දත් ශාරිපුත්ත මහ රහතන් වහන්සේ අනාථ පිණ්ඩිකට අවසාන මොහොතේ අනිත්‍ය ගැන පහත සඳහන් අයුරු දේශනා කළෝය.

''මගේ කියූ ඇස මගේ නොවේ. මගේ කියූ කණ මගේ නොවේ. මගේ කියූ නාසය මගේ නොවේ. මගේ කියූ දිව මගේ නොවේ. මගේ කියූ ශරීරය මගේ නොවේ. මගේ කියූ සිත මගේ නොවේ.''

අනේ පිඬු සිටු තුමා ශාරිපුත්ත මහ රහතන් වහන්සේ කියූ පරිදි ඒ සියල්ල ම කියෙව්වේය. ඉන්පසු සැරියුත් හිමි තවත්

භාවනා ක්‍රමයක් කියා දුන්නෝය. ''දැකීම මා නොවේ. ඇසීම මා නොවේ. ගඳ සුවඳ ගන්නා මා නොවේ. ස්පර්ශ කරන්නා මා නො වේ. පෘථිවිය ම මා නොවේ. ජලය, ගින්න, වායුව, ආකාශය මා නොවේ. ඉපදීම සහ මරණය මා ස්පර්ශ කළ නොහැකියි. මා ඉපදෙන්නෙත් නැහැ. මා මැරෙන්නෙත් නැහැ. ජන්මය කියා මගේ පැවැත්මක් නැහැ. මරණය කියා නැතිවීමක් නැහැ,''

මේ සියල්ල කියවන ගමන් සුදත්ත අඬන්න පටන් ගත්තේය.

ඔබ අඬන්නේ ඇයි? මරණයට බයයි ද? යැයි ශාරිපුත්ත හාමුදුරුවෝ ඇසුවෝය.

'' ශාරිපුත්ත හාමුදුරුවනේ, මා පොදක් වත් බය වුණේ නැහැ. කිසිම අපහසුවක් නැතිව මා ඔබ වහන්සේ කියූ දේ කිවුවා. මගේ හදවත සතුටින් අද පිරී ගියා. මා බුදුන් ඇතුළු මහා සංඝයාට සේවය කරන්න පටන් අරන් අවුරුදු 30 කට අධික වුණා. අද ඇසූ දේශනාව නිහඬව මේ තරම් හොඳට කවරදාක වත් නොඇසූ නිසා සතුටට ඇඬුණා,'' යැයි සුදත්ත පැවසුවේය.

මේ වගේ දේ බුදු හාමුදුරුවෝ නිතර දේශනා කරන්නේ භික්ෂු භික්ෂුණීන්ට ආනන්ද හාමුදුරුවෝ කීවේය.

'' ආනන්ද හාමුදුරුවනේ, උපාසකඋපාසිකා පිරිසත් මේ වගේ දේ තේරුම් ගැනීමට සමත් නිසා මේ වගේ දේශනා උපාසකඋපාසිකාවරුන්ටත් දෙන්න. කරුණා කරලා බුදු රදුන්ගෙන් ඉල්ලා සිටින්න,'' යැයි එවර සුදත්ත පැවසීය.

මඳ වේලාවකට පසුව අනේපිඬු සිටු තුමා අවසන් හුස්ම හෙළුවේය. ඒ අවස්ථාව වන විට ශාරිපුත්ත සහ ආනන්ද යන දෙදෙනා ම මෘත ශරීරය ළඟ අනිත්‍ය සම්ප්‍රයුක්ත දේශනා පැවැත්වීය. මුළු පවුලම තුනුරුවන් සරණ සමාදන් වී සද්ධර්මය අනුව ජීවිතය ගත කරන්න පොරොන්දු විය.

එතුමාගේ දුවක් අංග දේශයේ සාධුවරුන්ගේ මාර්ගය අනුගමනය කරන බව මරණයට දවස් කිහිපයකට පෙර සුදත්ත සඳහන් කළේය. ඒ දුව අංග දේශයේ රාජ්‍ය පාලකයෙකු සමග විවාහ වී සිටියාය. රාජ්‍ය පාල ''නාගා'' සාධු සම්ප්‍රදායේ අයව අනුගමනය කළාය. නගා සාධුවරුන් හමුවට යාමට රාජ්‍යපාල තම බිරිඳට කතා කළේය. නමුත් ඇය ඉතාම දක්ෂ ලෙස ඒ කාරණය මග හැරියාය. වෙලාව ආ විට තුනුරුවන් පිළිබඳව කරුණු කියා දී මුළු පවුලම තුනුරුවන් සරණ සමාදන් කෙරෙව්වේය.

## හැත්තෑ හය වන පරිච්ඡේදය

# භාවනාවේ සුප්‍රතිඵල

වස් කාලය අවසන් වෙමින් පැවතිණි. මගධය සහ කෝසලය අතර යුද්ධය ආරම්භ වූ බව සංඝයාට දැනගන්න ලැබිණි. අජාසත්ත රජතුමාගේ සේනාව ගංගා නදිය තරණය කර කෝසල රාජ්‍යයට අයිතිව තිබුණු කාශි ජනපදය යටත් කර ගත්තේය. රජතුමා සහිත සේනාව ඇත්, අස්, වෙඩි උණ්ඩ උපයෝගී කරගෙන කෝසල ජනපදය ආක්‍රමණය කර යටත් කර ගත්තේය. සටන ඉක්මනටම පටන් ගත් නිසා මේ ගැන බුදු රදුන්ට දැන්වීමට කොසොල් රජතුමාට අවස්ථාවක් ලැබුණේ නැත. ඒ නිසා සියලුම විස්තර බුදුරදුන් හමුවට ගොස් විස්තර කරන ලෙස ජේත කුමාරයාට කීවේය.

තම පියා මරා සිංහාසනය ගත් අජාසත්තගෙන් පියා මැරීමේ අකමැත්ත පෙන්වීමට කොසොල් රජතුමා විසින් තමන් දුන් කෝසල රාජ්‍යයේත් කොටසක් වූ බරණැස ආපසු කෝසල රාජ්‍යයට ඇඳාගත් බව බුදුරදුන් දැන සිටියෝය. බරණැසින් මාසිකව මගධයට ලක්ෂයක් රත්රන් කාසි බදු වසයෙන් ලැබිණි. අජාසත්ත රජු කිසිම හේතුවක් නිසාවත් සවර්ණ මුද්‍රා නැති කරගන්න කැමති වුණේ නැත. ඒ නිසා බරණැස යටත් කර ගත්තේය.

දෙරට ශාන්තිය සමාදානය ඇති වන තෙක් බුදුන් ඇතුළු මහා සංඝයා ශ්‍රාවස්තියේ ම ගත කළ යුතු බව ශාරිපුත්ත මහ රහතන් වහන්සේ යෝජනා කළෝය.

කෝසලයේ රජතුමා යුද්ධය පරාජය වූ බවත් මාස දෙකකට පස්සේ දැන ගන්න ලැබිණි. රජතුමා සහ සේනාධිපති ආපසු ශ්‍රාවස්තියට ආ බවත් පරිසරය සටන් කාමී වුවත් දැඩි සුරක්ෂා නිසා ශ්‍රාවස්තිය කොසොල් රජතුමා සතුරන් අතට පත් වුණේ නැත. නමුත් අජාසත්ත රජතුමාගේ සේනාව දිවා රෑ සටන් කරගෙන ගියේය. දක්ෂ ඇමතිවරයෙකුගේ උපදෙස් මත සටන් කිරීම නිසා කෝසල ජනපදය යුද්ධයෙන් දිනා ගත හැකි විය. අන්තිමේදී අජාසත්ත රජතුමා සමඟ සේනාපතිත් දහස් ගණනක් හමුදා භටයින්වත් අත්අඩංගුවට ගනු ලැබිණි. දාහකට වැඩි භටයින් පිරිසක් මරණයට පත් විය. සමහර භටයන් පැන ගියේය. ඊට අමතරව ඇත්, අශ්ව, වෙඩි උණ්ඩ විශාල ප්‍රමාණයක් කොසොල් රාජ්‍යයේ හමුදාව අතට පත් විණි.

යුද්ධය සම්පූර්ණයෙන් ම මාසයක් යන තෙක් පැවතිණි.

සැවැත් නුවර වාසීන් විජය උත්සව පැවැත්විය. සේනාවේ කටයුතු සංවිධානය කල කොසොල් රජතුමා බුදුරදුන් හමුවීමට ගියේය. යුද්ධයට බොහෝ වියදම් ගියා. අජාසත්තගෙන් රට බේරගන්න යුද්ධ කරන්න සිදු වුණා. මා හිතන විදිහට අජාසත්තගේ ඇමතිවරු ඔහුට වැරදි යෝජනාවක් කරලා තියෙන්නේ. ආචාර්යතුමනි, මගධයේ රජතුමා අජාසත් මගේ නංගිගේ පුතායි. ඒ නිසා මා ඔහුට මරණීය දණ්ඩනය දීමට හෝ ජීවිතාන්තය දක්වා හිරකර තැබීමට අදහසක් නැහැ. කරුණාකර මට කියන්න කරන්න ඕනෑ කුමක් ද කියා,'' කෙසොල් රජතුමා බුදුරදුන්ගෙන් ඉල්ලා සිටියේය.

''රජතුමනි, ඔබ ළඟ අවංක දක්ෂ සේනාවක් සහිත ඇමති පිරිසක් ඉන්නව. අජාසත්ත නරක පිරිසකින් වටවෙච්ච කෙනෙක්. මේ නිසා වැරදි පාරට වැටුණා. මේ නිසා මගධයට අපි කොතරම් සලකනව ද ඒ වාගේ අජාසත්තටත් සලකලා, කියන්න නරක මිත්‍රයින්ගේ ආශ්‍රය අත්හැර හොඳ පිරිසක් තම මන්ත්‍රී මණ්ඩලයටත් හමුදාවටත් නැවත බඳවා ගෙන රාජ්‍යය ධාර්මිකව කරගෙන යන ලෙස. ඔබගේ නංගීගේ පුතා නිසා ඔබගේ කීම අනිවාර්යයෙන්ම පිළිගනීවි. ඊට පස්සේ සමාව දීලා උත්සවයක් කරලා නැවත

මගධයටම යවන්න. දෙරටේ ශාන්තිය ගැන හිතන්න වෙන්නේ ඔබ මේ ප්‍රශ්නය විසඳන ආකාරයටයි, යනුවෙන් බුදුරජුන් පැවසූහ.

බුදුරජුන් එක් තරුණ භික්ෂුවක් කැඳවා පසේනදී කොසොල් රජතුමාව මුණගැස්විය. ඒ තරුණ භික්ෂුව බිම්බිසාර රජතුමාගේ පුතෙකි. අජාසත්ත රජතුමාගේ දෙවන මවගේ දරුවෙකි. බුද්ධිමත් තරුණයෙකු වූ ඔහු වයස අවුරුදු දහසයේ දී මුගලන් මහ රහතන් වහන්සේගේ යටතේ ධර්මය ඉගෙන ගත්තේය. මගධයේ යුද්ධයෙන් පසුව පැවිදි විය. මුගලන් මහ රහතන් වහන්සේ විසින් මේ තරුණ භික්ෂූන් වහන්සේ තවදුරටත් ධර්මය ඉගෙනීම පිණිස ශ්‍රාවස්තියට පිටත් කර යැවීය. හේතුව ඔහු අජාසත්තගේ කෲර ක්‍රියා ගැන හොඳට දැනගෙන සිටි නිසයි.

පසේනදී කොසොල් රජතුමා විස්තර ඇසූ විට මගධය අත්හරින දා සිට සිදු වූ සියලුම කරුණු තරුණ භික්ෂුව රජතුමාට විස්තර කළේය. තම මැරීමට මගධයේ මැරවරයෙකු යැවූ බවත් පැවසීය. නමුත් මැරවරයාගේ අදහස් වෙනස් වී පසුව භික්ෂුවක් විය. පසේනදී රජතුමා බුදුරජාණන් වහන්සේව වැඳ නමස්කාර කර රජ මාළිගාවට අජාසත්ත ඉක්මනටම හිරෙන් නිදහස් කර මගධයට ආපසු යෑමටත් අවසර දුන්නේය. අමනාපකම් නැති කිරීම සඳහා කොසොල් රජතුමා තම දුව වජ්‍රාව අජාසත්තට විවාහ කර දුන්නේය. කසී රටත් නැවත තෑග්ගක් හැටියට ආපසු දුන්නේය. ඒ අනුව කොසොල් රජතුමා බුදුරජුන් කී පරිදි කටයුතු කළේය.

යුද්ධය අවසන් වීමත් සමගම භික්ෂුභික්ෂුණීන් ධර්මප්‍රචාරක කටයුතුවල ආරම්භ කළහ. පසේනදී කොසොල් රජතුමා රාජධානියෙන් පිට රාජිකාරාමය නමින් විහාරයක් කර වූවේය.

බුදුරදුන් අවුරුදු දෙකක්ම කොසොල් දනව්වේ වැඩ සිටියහ. වස් කාලයට ජේතවනයට වැඩම කළහ. ඉතිරි කාලය තුළ සද්ධර්මය ප්‍රචාරය කළෝය. මගධයේ තොරතුරු වරින්වර එහි සිට එන භික්ෂූන්ගෙන් දැන ගන්නට ලැබිණි. බුදුරදුන් මගධයෙන් නික්ම ගිය පසු අජාසත්ත රජතුමා දේවදත්ත හාමුදුරුවන්ට සැලකිලි අඩු කළ බවත් ඒ අවස්ථාව වන විට දේවදත්ත හාමුදුරුවන්ට සිටියේ භික්ෂූන් සිය නමක් පමණක් බවත් භික්ෂූහු කීහ. ඒ පිරිසෙනුත් අසූ දෙනෙක් නැවත බුදු රදුන්ගේ සංඝයාට එකතු විය. දේවදත්ත තනි විය. පසුව ඔහු හිතේ වේදනා

නිසා අසනීප විය. යන්නඑන්න තරම් ශක්තියක් නැති විය. යුද්ධයෙන් පසුව අජාසත්ත රජතුමා එක වරක්වත් දේවදත්තව හමුවීමට ගියේ නැත. අජාසත්ත රජතුමා වේළුවනයට ගියෙත් නැත. වෙනත් ධාර්මික නායකයින් සමග සම්බන්ධය ඇති කර ගත්තේය. නමුත් සංඝයාගේ ධර්ම ප්‍රචාරක කටයුතු නිරන්තරයෙන් සිදුවිය. මගධයේ භික්ෂූන් සහ උපාසක පිරිස බුදුරදුන් නැවත වැඩම කිරීම පිළිබඳව විශාල බලාපොරොත්තුවකින් සිටින බව ද පැවසූහ. බුදුරදුන් නැතිව ගිජ්ජ කූටය සහ වේළුවනය පාළු විය හැකි බවක් දැනෙන බව කවුරුත් කීහ. ජීවක වෛද්‍යවරයාත් බුදුරදුන්ගේ ආපසු වැඩම වීම ගැන බලාපොරොත්තුවෙන් සිටින බව කීවේය.

කෝසල මල්ලිකාගේ මරණය නිසා කොසොල් රජතුමා දුකට පත් වී සැනසීම ගැන යමක් සාකච්ඡා කිරීමට බුදුරදුන් හමුවට ගියේය. රජතුමාගේ ආදරණීය උපදේශිකාව හැටියට කටයුතු කළේ කෝසල මල්ලිකාවයි. රජතුමාත් ඇයට පණ මෙන් ආදරය කළේය. රජතුමා බුදුරදුන්ටත් පණ මෙන් ආදරය කළේය. සද්ධර්මය ගැන ඉතාම පිරිසිදු දැනුමක් තිබිණි.

මරණයට පෙර කෝසල මල්ලිකා බුදුරදුන් සමඟ සද්ධර්මය ගැන සාකච්ඡා කළාය. දවසක් සිහිනයක් දැක බය වූ බවක් රජතුමා සඳහන් කළේය. යම් කිසි කරදරයක් අත ළඟ එන බව රජතුමාට සිතිණි. බ්‍රාහ්මණයින්ගෙන් මේ ගැන ඇසූ විට සත්වයින්ව බිලිදෙන පූජාවක් කරන්න නියම කරන ලදි. සතුන් බිලි දෙන්න එපා යැයි බිසව කීවාය. රජතුමා රාජ්‍යයේ රාජ නීති ගැන බිසව ගැන නිතර සාකච්ඡා කළාය. බිසව සද්ධර්මය සමඟ රාජ නීතිය ගැනත් හොඳ අවබෝධයක් ඇතිව සිටියාය. මේනිසා රාජකීය උද්‍යානයේ ධර්ම සාකච්ඡාව සඳහා වෙනමම තැනක් සාදා තිබිණි. ඒ ස්ථානයේ බුදුරජුන් සහ වරිෂ්ඨ ශිෂ්‍යයන්ට ආරාධනා කර ධර්ම සාකච්ඡා කිරීම සිරිතක්ව පැවතිණි. ඒ ධර්ම මණ්ඩපයේ වෙනත් ධර්ම අනුගමනය කරන අයටත් විවෘතව තිබුණේය.

අවුරුදු හතලිහක් පමණ සැපේ දී මෙන්ම දුකේ දී සිටි බිසව නැතිවීම රජතුමාට ඉවසීමට නොහැකි කාරණයක් විය. රජතුමා නිහඬව බුදුරදුන් හමුවට පැමිණ වාඩි වූවේය. බුදුරදුන්ගේ අවවාදය අනුව රජතුමා වැඩිපුර කාලය ධ්‍යාන භාවනා සඳහා වෙන් කළේය. තමන්ගේ අසල්වැසි අයව සතුටු කරන්න කටයුතු

කරන්න යැයි බුදුරදුන් රජතුමාට පැවසුවෝය. රටේ නීතිය මෙන්ම ආර්ථික තත්වය ද යහ මගට රජතුමාට බුදුරදුන් උපදෙස් දුන්නෝය.

''ශාරීරික වද දීම, මරණීය දණ්ඩනය, අපරාධ අඩු කිරීමට කිසි සේත්ම හේතු වන්නේ නැහැ. අපරාධයන්ට මුල බඩගින්න. කාමාශාව, දුප්පත්කම යන මේ කරුණු නිසා අපරාධ අධික වීම සිද්ධ වෙනවා. ජනතාවගේ සැපවත් සමාජයක් සඳහා අපරාධ අඩු කිරීම සඳහා රටේ ආර්ථික තත්වය ගොඩ නැගීම අනිවාර්ය යෙන් ම සිද්ධ විය යුතු දෙයක්,'' යැයි ද බුදුරදුන් පැවසූහ. රජතුමාගේ සහ බුදු රදුන්ගේ මේ කථනය ආනන්ද හාමුදුරුවෝ අසා සිටියෝය. මේ සාකච්ඡාව ආනන්ද හාමුදුරුවෝ කූට දන්ත සූත්‍රය ලෙස හැඳින්වූවේය. මේ සූත්‍රයේ බුද්ධ දේශනාවේ බුදුරදුන්ගේ ආර්ථික සහ දේශපාලන අදහස් සියල්ලම අන්තර්ගත වී ඇත.

දිනක් හවස් වරුවේ බුදු හාමුදුරුවෝ ''විශාකා ධර්ම සභාවේ'' පිට පැත්තේ හිරුට පිටු පා වැඩ ඉන්න ආකාරය දිනක් ආනන්ද හාමුදුරුවෝ දුටුවෝය. සාමාන්‍ය සිරිතක් හැටියට බුදු හාමුදුරුවෝ ඉර බහින වේලාවට එසේ ඉන්නා සිරිතක් තිබිණි. ඊට හේතුව ඇසූ විට මා සූර්ය රශ්මියෙන් පිට තවා ගන්නවා යැයි බුදු හාමුදුරුවෝ ආනන්ද හාමුදුරුවන්ට පැවසූහ. ආනන්ද හාමුදුරුවෝ ක්‍රමයෙන් බුදු රදුන්ගේ පිට තවා දෙපය මිරිකන්න පටන් ගත්තේය. ආනන්ද හාමුදුරුවෝ ''ගුරුතුමනි, මා අවුරුදු පහළොවක සිට ඔබ වහන්සේගේ අන්තේවාසිකයා. ඉස්සර ඔබ වහන්සේගේ ශරීරයේ හම කොච්චර සිනිඳුව තිබුණා ද? දැන් ශරීරය ක්‍රමයෙන් රැළි වැටීගෙන යනවා. කකුල්වල මාංශ පේශීන් බුරුල් වේගන යනවා. දැන් මා ඔබ වහන්සේ ගේ ශරීරයේ පිට කොන්දේ ඇට ගණන් කරන්නම්,'' යැයි ආනන්ද හාමුදුරුවෝ පැවසීය.

'' ආයුෂ දිග වූවා සේම මහලු බවත් ඇති වී ඇති නමුත් මගේ දැස, දෙකන, පෙර සේම ඉතාම හොඳින් ක්‍රියාත්මක වනවා. ආනන්ද, නුඹට ගිජ්ජකූටය හෝ වේළුවනය මතක් වෙන්නේ නැද්ද? ඒ කන්දට නැගලා නුඹ හිර අවරට යනවා දකින්න කැමති නැද්ද?'' බුදුරදුන් පැවසූහ.

''ගුරුතුමනි, ඔබතුමන් ගිජ්ජ කූටයට නැවත යනවා නම් මාවත් එක්කරගෙන යන්න අමතක කරන්න එපා. ඒ අවුරුද්දේ ග්‍රීෂ්ම ඍතුවේ දී බුදුරජුන් ගිජ්ජකූටයට වැඩම කළහ. ගමනේ දී

සියලුම ධර්ම ස්ථලවල නතර වී ධර්ම දේශනා කරමින් වැඩම කළහ. ශාක්‍යය, මල්ල, විදේහ සහ වජ්ජි යන රාජ්‍යයයන් පසු කරගෙන ගංගා නදිය තරණය කර මගධයට වැඩම කළෝය. එතැන් සිට රජගහනුවරට වැඩම කරවීමට පෙර නාලන්දාවට වැඩම කළහ..

ගිජ්ජකූටය සහ වේළුවනය පෙර සේම අලංකාරව තිබිණි. බුදුරජුන්ගේ වැඩම වීම ගැන අසා මග දෙපස බොහෝ අය එකතු වී සිටියා. රජගහනුවරට බුදුරජුන් වැඩම කරවා මාසයක් ගත වූවාට පසුව ජීවක වෛද්‍යවරයා තමන් අලුතින් ගොඩනැගූ ශාලාවේ බුදුරජුන් ඇතුළු මහා සංඝයාට දානය සඳහා ආරාධනා කළේය. අඹ වනයේ අලුතින් සෑදූ ශාලාවේ දාහකට වඩා අධික පිරිසක් වාඩි වෙන්න ඉඩකඩ තිබිණි.

බුදුරජුන් වැඩමකරවීමට පෙර ජීවක වෛද්‍යවරයා කුටියට වාඩි වී මගධයේ සිද්ධ වූ සිද්ධීන් ගැන සිතන්නට පටන් ගත්තේය. විදේහ බිසව සම්පූර්ණ නිර්මාංශ ආහාර කෑමට ගෙන සැනසිලි ජීවිතයක් ගත කිරීමට සද්ධර්ම මාර්ගය උපයෝගී කර ගත්තාය.

නමුත් අජාසත්ත රජු ඉතාම දරුණු මානසික පීඩනයකයි සිටියේ. පියතුමාගේ මරණය අජාසත්තගේ සිතට වරින්වර සිහිවීම ඔහුට මහා කරදරයක් විය. අජාසත්ත රජතුමාට නිදා ගැනීමේ අපහසුවක් ද තිබිණි. නින්ද ගියත් භායානක සිහින පෙනෙන්නට පටන් ගත්තේය. ලේ ගමන එන්න එන්න අධික විය. නොයෙක් වෛද්‍යවරුන්ගේ ධර්ම ආචාර්යවරුන්ගේ සරණ සෙව්වත් කිසිම පිහිටක් ලැබුණේ නැත.

දිනක් අජාසත්ත රජතුමා තම බිසව, පුතා උදයභද්‍ර සහ මව සමග කෑම ගැනීමට හිඳ ගත්තේය. වයස අවුරුදු තුනේ පුංචි කුමාරයට රජතුමා තම පන හා සමාන ආදරය කළේය. දැඩි ආදරය නිසා රාජ කුමාරයා හිතුවක්කාරීකම් කළේය. එදා කෑම කන වෙලාවේ එයා ආදරය කරන පුංචි බලු පැටියවත් මේසය උඩට ගන්න යැයි පුංචි කුමාරය කිව්වේය. මේ කාර්යය කිසි සේත්ම කළ හැකි දෙයක් නොවීය. නමුත් රජතුමා බලුපැටියව මේසය උඩට ගත්තේය.

විදේහ බිසව කිව්ව නුඹ නුඹේ දරුවට ඕනෑවට වඩා ආදරය කරන නිසා බල්ලා කෑම මේසය මතට ගත්තා. ඇය නුඹට මතකද වරක් නුඹගේ අතේ නියපොත්තක් කැඩිලා පුංචි ලේ

ගෙඩියක් ඇවිත් තිබිලා දවස් හතරයි රෑ හතරක් නුඹගේ පියා නිදා නොගෙන නුඹගේ ඉදිමුණ ඇඟිල්ල කටේ දාගෙන ඉරුවා. අන්තිමේදී ඉදිමුණ ගෙඩිය පිපිරුණා. රජතුමා නුඹගේ ඇඟිල්ලෙන් පිට වුණ සැරව කුණු ලේ සියල්ලම ගිලල දැම්මා. ඒකෙන් නුඹට හිතාගන්න පුළුවන් නේද නුඹගේ පියා නුඹට කොපමණ ආදරයෙන් සිටියා කියලා. මේ පුතාට ඇති දැඩි ආදරය නිසා නුඹ බලු පැටියව කෑම මේසයට ගන්න ඉඩ දුන්නා,'' යැයි විදේහි බිසව කීවාය.

අජාසත්ත රජතුමා තම දෑතින් හිස බදාගත්තේය. කෑම කන්නේ නැතිව නැඟිට ගියේය. එදා රාත්‍රියේ රජතුමාගේ මානසික තත්වය තවත් නරක් විය. අන්තිමට වෛද්‍ය ජීවකට පණිවිඩ යැවීය. ජීවක වෛද්‍යවරයා අජාසත්ත රජතුමා හමුවට ගිය විට ඔහු තම වේදනාව විස්තර කළේය. කිසිම ධර්මාචාර්යවරයකුගෙන් හෝ වෛද්‍යවරයෙකුගෙන් හෝ එතුමාට කිසිම සහනයක් නොලැබුණ බවත් කීවේය. මේ සියල්ලම අසා ජීවක වෛද්‍යවරයා නිහඬ විය. ජීවක ඔබ නිහඬ ඇයි අජාසත්ත රජතුමා ඇසුවේය ඔබතුමාගේ අසනීපයට බෙහෙත් දෙන්න පුළුවන් එකම වෛද්‍යවරයා ගෞතම බුදු රජුන් පමණයි මේ නිසා ඔබතුමා කරුණාකරලා ගිහිල්ලා ගෞතම බුදු හාමුදුරුවන් මුණගැසෙන්න. උන් වහන්සේ ඔබතුමාගේ රෝගය ඉතා හොඳින් සුව කරාවි,''යැයි ජීවක පැවසීය.

ටික වේලාවක් නිහඬව සිට ''ගෞතම බුදුරජුන් තමා සමඟ අසතුටින් පසුවන්නේ,'' යැයි අජාසත්ත රජතුමා කීවේය.

''එහෙම කියන්න එපා. ගෞතම බුදුරදුන් සැමටම සම මෙත් ඇති කෙනෙක්. උන්වහන්සේ ඔබ තුමාගේ පියාණන්ගේ ගුරුතුමා මෙන්ම මිත්‍රයෙක් බව කවුරුත් දන්නවා. උන්වහන්සේ ළඟට යෑම තම ආදරණීය පියාණන් ළඟට යෑම හා සමාන යි. උන්වහන්සේ හමුවට ගිය විට ඔබට සෑම අතින්ම සනීපය ලැබේවි. මා වෛද්‍යවරයෙක් තමයි. නමුත් ගෞතම බුදුරදුන් අනුව මා සුළු කෙනෙක්. උන් වහන්සේ වෛද්‍ය වරයෙක් නොවෙයි. වෛද්‍යවරුන්ගෙත් වෛද්‍ය වරයෙක්,''

සියල්ල ඇසූ රජතුමා ගෞතම බුදුරජුන් හමුවීමට තීරණය කළේය.

ගිජ්ජකූට පර්වතයේ මාසයක් පමණ කාලයක් ගත කිරීමෙන් පසුව බුදුරජුන් ජීවකගේ අඹ වනයට වැඩම කළහ. ජීවක වෛද්‍යවරයා අජාසත්ත රජතුමා මුණගස්සන්න මේ අවස්ථාව ප්‍රයෝජනයට ගත්තේය.

සඳ ඇති රැයේ රජතුමා තම බිසව සහ ආරක්ෂක භටයින් සමඟ ඇතුපිට නැගී බුදු රජුන් හමුවෙන්න පිටත් විය. අඹවනයට ළං වන විට වටේ තිබුණු නිසසල ගතිය දැනී රජතුමා බියට පත් විය. බුදු හාමුදුරුවෝ භික්ෂූන් දාහක් සමග වැඩ ඉන්න බව ජීවක කියා තිබිණි. එය එසේ නම් මේ තරම් නිහඬ බවක් පවතින්නේ කෙසේ ද? ජීවක මාව රවටන්න උත්සාහ ගත්තේ ද ජීවක මාව මරණයට හසු කරන්න කුමන්ත්‍රණයක් කළාද දන්නේ නැහැ. ජීවක මගෙන් පලිගන්න කුමන්ත්‍රණයක් කලා ද? යනුවෙන් සිතන්නට විය.

රජතුමාගේ සිත දැනගත් ජීවක සිනාසී ධර්ම දේශනා කරන ධර්ම ශාලාව පැත්තට අත දිගු කළේය.

බුදු රජුන් සහිත මහා සංඝයා ශාලාවේ පිරී සිටින ආකාරය රජතුමා දුටුවේය. රජතුමා ඇතාගේ පිටින් බැස බිසව සහ ආරක්ෂකයින් සමඟ ධර්ම ශාලාවට ඇතුළු විය.

පිරිස මැද උස ආසනයේ වැඩී වී සිටින්නේ ගෞතම බුදු රජුන් බව ජීවක පැවසීය.

ධර්මශාලාවේ තිබුණ නිහඬතාවය රජතුමාගේ හදවතට තදින්ම දැනිණි. දාහක් පමණ භික්ෂූන් වහන්සේ නිහඬව සිටින ආකාරය දැකලා පුදුම විය. අජාසත්ත රජතුමා කවරදාකවත් බුදු රජුන්ගේ ධර්මය ශ්‍රවණය කරන්න පැමිණ නැත. මේ නිසා මේ වාගේ දර්ශනයක් දුටු පළමු අවස්ථාව මෙයයි.

බුදුරජුන් රජතුමාට සහ රජ පවුලේ අයට ආසනවල හිඳගන්න කීවෝය. රජතුමා බුදු රජුන්ට වැඳ නමස්කාර කර ''මට මතකයි මා පුංචි කාලේ ඔබ වහන්සේ මාළිගාවේ ධර්ම දේශනා කරන්න ආ බව. මට අද ඔබ වහන්සේගෙන් යමක් දැනගන්න ඕනෑ. දහස් ගණන් අය ගිහිගෙය අතහැර පැවිදිවෙනවා. ඒ අයට ඉන් ලැබෙන ප්‍රතිඵලය කුමක් ද?,'' යැයි ඇසුවේය.

අද මා ඔබට කියලා දෙන්නම් සද්ධර්ම මාර්ගය අනුගමනය කිරීමෙන් ලැබෙන ප්‍රතිඵල මොන ආකාරද කියලා බුදුරදුන් පැවසූහ. අනාගතයෙත් ධර්මයෙහි ප්‍රතිඵල ලැබෙනවා දැයි අජාසත්ත ඇසීය. ඒ සඳහා දීර්ඝ විස්තරයක් අවශ්‍ය නැහැ මේ අතේ තියන නෙල්ලි ගෙඩිය දිහා බැලුවාම එය තේරුම් ගන්න හැකි වේවි යැයි බුදුරදුන් කීවෝය.

''රජතුමනි, මේ ගැන සිතන්න. එක ආඥාකාරී සේවකයෙක් උදේ සිට සවස් වනතුරු තම ස්වාමියාගේ කටයුතු සඳහා එහෙ

මෙහෙ මහන්සියෙන් ඇවිද්දා. දවසක් දා ඒ සේවකයා සිතුවා මාත් මනුස්සයෙක් මගේ ස්වාමියත් මනුස්සයෙක්. ඒ නිසා මා කුමට ද මගේ ස්වාමියාගේ වචනය අහලා මේ තරම් මහන්සි ගන්නේ. සේවකයා රස්සාව අතහැර පැවිදි වෙනව. සේවකය ගෙයක් නැති භික්ෂු ජීවිතයක් ගත කරන්න මහන්සි ගන්නවා. ඔහු පරිශුද්ධ පරිපූර්ණ ශීලවන්ත ජීවිතයක් ගත කරන් මහන්සි ගන්නවා. දවසට එක වරයි කෑම කන්නේ. සක්මන් කරමින් සහ වාඩි වී භාවනා කරනවා. ඔහුගේ සම්පූර්ණ ඉරියව් ඉතාම ශාන්ත වෙනවා. භික්ෂූන් අතර ඉතාම සම්මාන භික්ෂුවක් බවට පත් වෙනවා. අද ඔබ ඉදිරියේ ඒ සේවකයා ආවොත් ඔහුට ඔබ ආඥා කරනව ද වඳිනවා ද?

''මහරජතුමනි, පැවිදි වීමේ පළමු වන ඵලය එයයි. දෙවන කාරණය පැවිදිවීමෙන් පස්සේ පෞද්ගලික කිසිවක් ඉතිරි වෙන්නේ නැහැ. එතුමාට මනුස්සකමේ උසස්ම තත්වය හිමි වෙනවා.''

'' පුදුමයි ගුරුතුමනි, මට මේ ගැන තව ටිකක් කියන්න,'' යැයි රජතුමා කීවේය.

'' මනුස්සකමේ ඉහළම සම්මානය ලැබීම පළමු ප්‍රතිඵලයයි. එක භික්ෂුවක් එක් කෝටියක් සංවර ශීලය ආරක්ෂා කරන්න ඕනෑ. එමඟිනුත් උන් වහන්සේට ශාන්තියක් ලැබෙනවා. ශීලය පාලනය නොකරන්නා මුලාවට පත් වෙනවා. බොහෝ අය අසත්‍ය කතා කිරීම, සුරා පානය, පර ස්ත්‍රීන් සමග කායික සම්බන්ධය ඇති කර ගැනීම, සොරකම් කිරීම, මිනී මැරීම ආදී අපරාධ කරනවා. මේ වාගේ සිත් ඇති අය තම සිතටත් ශරීරයටත් පීඩා ඇති කර ගන්නවා. ඒ පුද්ගලයාව අල්ලගන්න පුළුවන් ඒ පුද්ගලයාට දඬුවම් දෙන්නත් පුළුවන්.

භික්ෂූන් වහන්සේ අහිංසාව සමඟ ශිලය පාලනය කරනවා. ඒ භික්ෂුව නිර්භයව ජීවත් වෙනවා. ශිලය ආරක්ෂා කරන්නා සම්පූර්ණ ජීවිතයක් ගත කරනවා. එයත් සද්ධර්ම පාලනයේ එක් ඵලයක්. ඒ ඵලයත් මේ ජීවිතයේ දීම ලැබිය හැකි දෙයක්.

මහ රජතුමනි, භික්ෂුවක් ළඟ සිවුරු තුනක් සහ පිණ්ඩපාතය සඳහා පාත්‍රයක් පමණයි තියෙන්නේ. ඒ නිසා හොර සතුරන්ගෙන් පරිස්සම් කරගන්න දෙයක් නැහැ. ප්‍රවේසම් කිරීමට

භය වෙන්න දේකුත් නැහැ. භය නැතිව ගස් යට සැතපෙන්න පුළුවනි. භයින් නිදහස් වීම ඉතාම සැපදායක සතුටක්. එය ධාර්මික පැවිදි ජීවිතයේ තව ලාභයක්.

''භික්ෂු ජීවිතය චාම්. දවසට වරක් පමණයි කෑම කන්නේ. එයත් ගෙවල් ගණනකින් එකතු කර ගත්ත දෙයක්. මේ නිසා ධනය හෝ යසස හෝ පිළිබඳවත් සිතන්න දෙයක් නැහැ. ජීවත් වීමට අවශ්‍ය කොපමණ ද එපමණක් ප්‍රයෝජනයට ගන්නවා. ආශාව, බලාපොරොත්තු ආදියෙන් නිදහස්. එයත් මේ ජීවිතයේ තවත් සතුටට කාරණයක්. එහි රසය මේ ජීවිතයෙ දී ලබාගත හැකියි. එයත් ආධ්‍යාත්මික ජීවිතයේ එක් ලාභයක්.

''මහරජතුමනි, ඔබ අනාපානසති භාවනාව කරන්න දන්නවා නම් ඉන් ඔබට විශාල සතුටක් සැනසීමක් ලබා ගන්න පුළුවන්. ආනාපානසති භාවනාවෙන් ශරීරය සහ සිත ශක්තිශීලී වෙනවා. ආනාපාන සති භාවනාවෙන් සිතේ සහ කයේ සියලුම වේදනා නැති වෙනවා. මේගැන විස්තර ඕනෑ තරම් කළ හැකියි. මේ ක්‍රියා කළ විට මෙහි ගුණ ඔබටම දැනගත හැකි වේවි. ඒ සතුට, සැපය, ශාන්තිය වර්තමාන ජීවිතයේ දීම ලැබෙන දෙයක්.

''මහ රජතුමනි, උත්සාහයෙන් සතිපට්ඨානය මෙනෙහි කිරීමෙන්, ශිලය ආරක්ෂා කිරීමෙන්, භික්ෂුවගේ සිත සෞම්‍ය වෙනවා. ඉන් සියලුම ධර්ම ප්‍රකට වෙනවා. සියලුම ධර්මයන්හි අනිත්‍ය බව ඇති වන නැති වන ස්වභාවය ගැන දැන ගන්නවා. මේ ගැන දැනුමක් ලැබුණු විට කිසිම දහමක් අල්ලා ගන්නේ එහි එල්ලෙන්නේ නැහැ. මේ අනුව ලෝභ, ක්‍රෝධ, මෝහ, අසත්‍ය ධාරණා ආත්මයක් ඇතැයි යන බ්‍රමික ධාරණා යන සියලුම වැරදි හැඟීම් නැති කර ගන්නවා. එමඟින් නියම ස්වතන්ත්‍ර බව ලබා ගන්නවා. ආත්මයක් නැහැ යන්න අවබෝධ වීම විශාලම නිදහසයි. මා ළඟ ඒ වාගේ භික්ෂු සමූහයක් මේ අවස්ථාවේ දී ඉන්නවා. සද්ධර්මයේ ප්‍රතිඵල මේ අවස්ථාවේදීම ඇති වෙනවා.''

''ආචාර්යතුමනි, ඔබ වහන්සේ අද්භූත පුදුම සහගත දෙයක් දේශනා කළේ. මේ ගැන තව මොනවා හරි වැඩිපුර දෙයක් ඇත්නම් මා කැමතියි අහගෙන ඉන්න,'' යැයි රජතුමා ඉතාම සතුටින් පැවසුවේය.

''මහ රජතුමනි, මේ ආකාරයන් අනුව ක්‍රියා කළ විට මූල භූත ප්‍රකෘතිය ගැන අවබෝධ වූ විගස භික්ෂූවට දැනෙනවා කිසිම ධර්මයක් කිසිවකු විසින් උත්පන්න නොකරන බවත් නැති නො කරන බවත්. අඩු කිරීමක් හෝ වැඩි කිරීමක් හෝ කිසිවකු විසින් නොකළ හැකි බව. එකකුත් නොව ගොඩකුත් නො වන බව. එන බවක් හෝ යන බවක් හෝ මේ ආකාරය අනුව කිසිම භික්ෂුවකගේ හිතේ කිසිම භේද භාවයක් ඇති වන්නේ නැහැ. සියලුම ධර්මයන් නිර්භයව සිතුවිලිවලින් තොරව දකිනවා. ඒ අනුව එහි ප්‍රාණීන්ට සද්ධර්ම මාර්ගයේ මාර්ග දර්ශනය කරනවා. ඉන් සතුට ලබනවා. මේ ජීවිතයේ ලබන මේ සතුට ලබන ජීවිතයේ දීත් ලබා ගත හැකි යි.

''මහ රජතුමනි, දැන් ඔබතුමාට දැනෙනවා ඇති භික්ෂුවක් පැවිදිවීම සමඟම සියලුම සද්ගුණවලින් පිරි කිසිම රාජ නීතියකට හසු නොවී සමාජයේ ශාන්තිය උන්නතිය සඳහා තම කාලය කැප කරන බව. ශීලවන්ත ගුණවන්ත භික්ෂුව තනි කෙනෙක් නොවේ. ඒ තැනැත්තා මුලු ලෝකයේම පරම වස්තුවක් බවට පත් වෙනවා.''

රජතුමා නැඟිටා දෑත එකතු කර බුදු රදුන්ට ආචාර කර ''ආචාර්යතුමනි, ඔබ වහන්සේගේ ධර්මඥානය ගැන වර්ණනා කිරීමට මා ළඟ වචන නැහැ. ඉතාම සරල වචනවලින් ඔබතුමා මගේ හිතේ තිබුණු සියලුම ප්‍රශ්න විසඳා දුන්නා. ඔබ තුමන්ගේ ධර්මයේ සම්පූර්ණ වටිනාකම අද මා අවබෝධ කර ගත්තා. අන්ධකාරයට ආලෝකයක් වුණා. ගුරුතුමනි, ඔබතුමන් මගේ පියා සහ මව ශිෂ්‍යයින් කරගත්තා වගේ මාවත් ඔබ වහන්සේගේ ශිෂ්‍යයෙකු කර ගන්න,'' යනුවෙන් ප්‍රකාශ කළේය.

රජතුමා බුදු රදුන් ඉදිරියේ නැවතත් දන ගසා වැන්දේය. රජතුමාව ශිෂ්‍යයෙකු හැටියට බාරගන්නා බව දැන්වීම සඳහා හිස සැලුවා. රජතුමාටත් බිසවත් තුන් සරණය උච්ඡාරණය කරවන්න යැයි බුදුරදුන් ශාරිපුත්ත මහ රහතන් වහන්සේට කීවෝය. ඒ සමඟම රජතුමා බිසව සමඟ එකට බුද්ධං සරණං ගච්ඡාමි, ධම්මං සරණං ගච්ඡාමි, සංඝං සරණං ගච්ඡාමි, කියා තුන් වරක් තිසරණ උච්චාරණය කළේය. ඉක්මන් වූ රජතුමා '' ගුරුතුමනි, ප්‍රමාද වුණා වැඩියි. පෙර සූදානම් කළ හමු වීමක් තිබුණ බව මට දැනුයි සිහි වුණේ. මට යන්න අවසර දෙන්න, යැයි ඉල්ලා සිටියේය.

රජතුමාගේ ඉල්ලීම බුදු රදුන් බාර ගෙන රජතුමාට යන්න අවසර දුන්නෝය.

රජතුමාගේ මානසික තත්වය මේ නිසා ඉතාම සීග්‍රයෙන් හොඳ අතට පත් විය. එදා රාත්‍රියේ රජතුමා සිහිනයෙන් තමන්ගේ පියා දුටුවේය. පියා තමන් සමග සිනහ විය. රජතුමා '' පියාණනි, වෙන් වූ හදවත නැවත සම්බන්ධ වුණා,'' රජතුමාගේ හදවත පරිවර්තනය විය. රජතුමා එතැන් පටන් ලෝක සේවයට හිත යොමු කළේය.

ඉන් පසු රජතුමා කිහිප වතාවක්ම බුදුරදුන් වරින්වර දැකීමට ගියේය. රජතුමා ඇතා පිට යෑම නතර කර පඩි නැඟ ගිජ්ජ කූටයට ගොස් බුදුන් හමු වීම සිරිතක් කර ගත්තේය. බිම්බිසාර රජතුමා කළ ආකාරයට අජාසත්ත රජතුමාත් කටයුතු කළේය. බුදුරදුන් සමඟ හමු වීමෙන් කරන ලද සාකච්ඡාවන් මගින් අජාසත්ත රජතුමා අතීතයේ සිදු වූ සියලුම දේ බුදුරදුන්ට විස්තර කළේය. කරන ලද අපරාධ සියල්ලම බුදුරදුන් ඉදිරිපිට දී පිළිගත්තේය. බුදු රදුන් අජාසත්ත රජතුමාව තමන්ගේ පුතකුට කරන ආදරය සමානව ආදරයක් දැක්වූවේය. හොඳ ගති ගුණ ඇති වැදගත් අය ආශ්‍රය කරන්න යැයි රජතුමාට පැවසුවෝය.

වස් කාලය අවසන් වන විට ජීවක වෛද්‍යවරයා බුදුරදුන්ගෙන් පැවිදි වීමට අවසර ඉල්ලා සිටියේය. බුදුරදුන් ජීවක වෛද්‍යවරයා පැවිදි කර විමල කොණ්ඩඤ්ඤ යනුවෙන් නම් තබා අඹ වනයේම කාලය ගත කරන්න අවසර දුන්නේය. කලින් සිටම අඹ වනයේ භික්ෂූන් වහන්සේ සිය නමක් පමණ සිටියේය. දේව දත්තගේ අනුදැනුම ඇතිව බුදුන් හිසට ගල් පෙරළූ අවස්ථාවේ දී පතුලේ සිදු වුණ තුවාලයට ජීවක වෙද මහතා බුදු සිරි පතුළට බෙහෙත් කළේ අඹ වනයේ දීමය. ලොකු අඹ ගස් නිසා පරිසරය ඉතාම ශාන්තව තිබිණි. භික්ෂු විමල කොණ්ඩඤ්ඤ කැලෑ කොළ පොතුවලින් බෙහෙත් සෑදීම දිගටම කරගෙන ගියේය.

## හැත්තෑ හත් වන පරිච්ඡේදය

# ඉපදීමේ සහ මරණයේ මායාව

වස්කාලය අවසන් වීමෙන් පසුව බුදුරදුන් ආනන්ද හාමුදුරුවන් සමඟ මගධයේ සංචාරය කළහ. සැම ධර්ම මධ්‍යස්ථානයකම නතර වී ධර්ම දේශනා කරමිනුයි ගමන කළේ. බුදුරදුන් සැම විටම ආනන්දට ස්වභාව ධර්මයේ ඇති සුන්දර තැන් ගැන වර්ණනා කළහ. ආනන්ද නිතර බුදුරජුන්ගේ සේවයේ සිටි නිසා සවභාව ධර්මය ගැන උන් වහන්සේට සිතන්නට වේලාවක් තිබුණේ නැත. අවුරුදු විස්සක සිට ආනන්ද හිමියන් බුදුරජුන්ගේ සේවයේ යෙදී සිටියේය.

අතීතය ගැන සිතන විට බුදුරජාණන් වහන්සේ ගිජ්ජකූට පර්වතයේ සිට සප්තපර්ණී ගුහාවේ සුන්දර දර්ශනය ගැන වර්ණනා කරන ආකාරය ආනන්ද හාමුදුරුවන්ට සිහිවිය. කුරිරු සමාජයේ කෙතරම් සතුරු කම් කළත් බුදු රජුන්ට එහි කිසි ම දෙයක සුළඟවත් නො වැදී ස්වභාවය අනුව තම ජීවිතය ගත කරන ආකාරය ආනන්ද හාමුදුරාවෝ දැන සිටියෝය.

ඊළඟ වස් කාලය සඳහා බුදුරජුන් ජේතවනයට වැඩම කළහ. වස් කාලය භාගයක් අවසන් වූ පසුව පසේනදී කොසොල් රජතුමා බුදුරජුන් හමුවීමට පැමිණියේය. ''මගේ ජීවිතය දැන හුඟක්

දුරට ගෙවිල අවසාන යි. ඒ නිසා රජකමටත් රජ මහළටත් මගේ ජීවිතය සීමා කරන්නෙ නැතිව රාජකාරි කටයුතු දක්ෂ මන්ත්‍රීවරුන්ට බාර දී අල්ලපු රාජ්‍යයන්හි දර්ශනීය ධාර්මික ස්ථානයන් දකින්නට යාමට අදහස් කරනවා,'' යැයි කීවේය.

අසල රාජ්‍යයකට යන කිසි ම දවසක රජතුමා තමන්ව පිළිගන්න උත්සව සූදානම් කරන්න ඉඩතැබුවේ නැත. සාමාන්‍ය වන්දනාකරුවකු මෙන් ගමන් කළේය. යන ගමනුත් යම් කිසි භාවනාවක් කරමිනුයි ගියේ. ඒ ගමන්වලින් එතුමා ඉතාම හොඳ සතුටක් ලබන බව රජතුමා බුදුරජාණන් වහන්සේ සමඟ කීවේය.

''මගේ ආදරණීය ආචාරයතුමනි, මගේ වයසත් ඔබතුමාගේ වයස මෙන් අවුරුදු හැත්තෑ අටක් වුණා. මා දන්නවා ඔබතුමන් සෞන්දර්යය රස විඳින බව. ඒ තැන්වලට ගොස් සෞන්දර්යයේ රස විඳින අතර ධර්මය අවශ්‍ය කරන අයට ධර්මයත් දේශනා කරනවා. මේ නිසා ඔබ තමන්ගේ ගමන්බිමත් ආලෝකය දෙන ගමන්හැටියට හඳුන් වන්ට පුළුවන්. නමුත් මගේ ගමන්වලින් කිසිම කෙනෙකුට ප්‍රයෝජනයක් වුණා කියල මා හිතන්නෙ නැහැ,''යි රජතුමා කීවේය.

රජතුමා බුදු රජුන්ට තමන්ගේ හිතේ තිබුණු පීඩාව විස්තර කළේය. ''අවුරුදු හතකට පෙර රජය පෙරළන්න උත්සහ ගත් රාජකීය කුමන්ත්‍රණයේ දී මා වැරදි හැඟීමක් නිසා ප්‍රධාන ඇමතිතුමාට මරණීය දණ්ඩනය නියම කළා. අවුරුද්දකට පස්සේ දැනගන්න ලැබුණා සේනාපතිතුමාගේ කිසිම වරදක් නැහැ කියලා. මට ඒ ගැන ඇති වූ වේදනාව කියා නිම කරන්න බැහැ. මේනිසා ඔහුගේ බිරිඳට කරන්න තිබුණු උදව් ඔක්කොම කළා. බෑන ප්‍රධාන සේනාපති හැටියට පත්ත කළා,'' යැයි ද පැවසීය.

වස් කාලයේ දෙවන භාගයේ දී රජතුමා සෑම දින දෙකකට වරක්ම බුදුරජුන් හමුවට පැමිණියේය. ධර්ම දේශනා කරන විට ධර්ම ශ්‍රවණය කළ අතර අනෙක් සෑමවිටම නිහඬව බුදුරදුන් සමීපයේ වාඩි වී සිටියේය. වස් කාලය අවසන් වීමත් සමඟම බුදුරදුන් ධර්ම යාත්‍රාව ආරම්භ කළහ. රජතුමාත් අසල් වාසී රාජ්‍යවල දර්ශනීය ස්ථාන බලන්න පිටත් විය. දිනක් බුදුරජාණන් වහන්සේ ශාක්‍ය ජනපදයේ වැඩ සිටින අවස්ථාවක පසේනදී කොසොල් රජතුමා කිසිම දැනුම් දීමකින් තොරව බුදු රජුන් සමීපයට පැමිණියේය.

මෙසේ පැමිණීමට පෙර රජකුමරු විද්‍යුතාභ සහ සේනාපති කාරායන යන දෙදෙනා සමඟ රජු ඒ ප්‍රදේශයේ ගැවසිණි. බුදුරජුන් ඒ ප්‍රදේශය සමීපයේ වැඩ ඉන්නා බවත් දවස් භාගයකින් පමණ බුදුරජුන් සිටින තැනට ළඟාවිය හැකි බවත් රජතුමාට දැනගන්නට ලැබිණි. රථය ඒ දිශාවට පදවන්න ලෙස රථාචාරියට කීවේය. ඒ අනුව රජතුමා බුදුරජුන් වැඩ සිටිය කුටියට ළඟා විණි.

කුටියේ දොර වසා තිබිණි. රජතුමා තම ඔටුන්න කඩුව සේනාපතිතුමාට දීල රථයේ තබන්න ලෙස පැවසීය. බුදුරජුන් පිටතට වඩින තෙක් රජතුමා කුටියේ පිට පැත්තේ සක්මන් කරමින් සිටියේය.

බුදුරජුන් කුටිය විවෘත කළ විට රජතුමා එළි මහතේ සක්මන් කරන ආකාරය දක්නට ලැබිණි. ඒ අවස්ථාවේ දී සැරියුත් මහ රහතන් වහන්සේත් ආනන්ද හාමුදුරුවොත් ඒ සමඟම සිටියෝය. බුදුරජුන් රජතුමාව සාදරයෙන් පිළිගත්තෝය. රජතුමා බුදුරජාණන් වහන්සේගේ සිරිපතුල වැඳ . ''මා කෝසල රාජ්‍යයේ රජ පසේනදී. ඔබතුමාට නමස්කාර කරනවා යැයි කිහිප වරක්ම කීවෝය.

බුදුරජුන් රජතුමාව සිටි තැනින් නැඟිටවා '' රජතුමනි, අපි දෙන්න බොහෝ කාලයක සිටම පරම මිත්‍රයෝ. අද මොකද අමුතුම ක්‍රමයකට ඇවිත් මා මුණගැසුණේ?,'' යැයි ඇසුවෝය.

''ගුරුතුමනි, මා දැන් මහලුයි. මට ඔබ වහන්සේ සමඟ කතා කරන්න බොහෝ දේ තියනවා. අනෙක මට දැනෙන්නේ නැහැ ඔබතුමන්ට ස්තුති කරන්නේ කොහොම ද කියා. ගුරුතුමනි, බුද්ධ, ධම්ම, සංඝ යන තුනුරුවන් ගැන මගේ සිතේ තියෙන්නේ අපරිමිත ශ්‍රද්ධාවක්. මා බොහෝ අයව දැක්කා අවුරුදු දහය, විස්ස, තිහ, හතලිහ පැවිදි ජීවතය ගත කර කාමභෝගී ජීවිතයට ආපසු යනවා. නමුත් මා දැක්කේ නැහැ, ඔබගේ ශාසනයේ කිසිම භික්ෂුවක් නැවත ගිහි ජීවිතයට යන වගක්.

''ගුරුතුමනි, මා දුටුවා රජවරු සමඟ සේනාපති, බමුණු ස්වාමි පුරුෂයා, බිරිඳ, සහෝදරයෝ, මිත්‍රයෝ, එකිනෙකා අඬ දබර කරනවා. නමුත් භික්ෂූන් අතර මා එවැනි දෙයක් දැක්කේ නැහැ. මා ගිය සෑම තැනකම ආධ්‍යාත්මික සාධනා කරන අයගේ මුහුණේ කරදරකාරී බවක් දැක්කා. නමුත් ඔබගේ භික්ෂු පිරිස ප්‍රසන්න මුහුණින් නිතර ඉන්නවා. මේ නිසා තුනුරුවන් ගැන මසිතේ ශ්‍රද්ධාව දවසින් දවස අධික වෙනවා.

''ආචාර්යතුමනි, මා රජ කෙනෙක්. ක්ෂත්‍රිය කුලයේ කෙනෙක්. මට අයිතිය තියනවා ඕනෑම කෙනෙකුට මරණීය දණ්ඩනය දෙන්න. නැත්නම් හිර අඩස්සියේ තැබීමට. එහෙම වුනත් මා කතා කරන සමහර අවස්ථාවලදී ඇමතිවරු මගේ කතාවට බාධා කරනවා. මා දැක්කා ඔබගේ භික්ෂු පිරිස කිසිම ශබ්දයක් නැතිව ඔබගේ කතාව අහගෙන ඉන්න ආකාරය. කිසිම කෙනෙක් සිවුරක් වත් සොලවන්නේ නැහැ. ඔබ කාටවත් දඬුවම් කරන්නේත් නැහැ. ඔබ ළඟ කඩු ඇත්තෙත් නැහැ. නමුත් මට වඩා ඔබට කවුරුත් ඉතා හොඳින් සලකනවා. මේ නිසා මා තුළ තුනුරුවන් ගැන ඇති සැලකිල්ල දියුණුවෙන් දියුණුවට පත් වෙනවා.

''ගුරුතුමනි, මා දැක්කා මහ උගත් අය මහා විවාද ඇති කර ඔබ වහන්සේගෙන් ප්‍රශ්න අහලා කරදර කරන්න එනවා. ඔබ ඒ අය සමඟ කරන සද්ධර්ම කථා නිසා ඒ අය අහන ප්‍රශ්න ඒ අයටම අමතක වෙලා යනවා. ඒ අය ඔබ වහන්සේට කලින් තිබුණාට වඩා අධිකව සම්මාන කරනවා. මේ කාරණයත් තුනුරුවන්ට සම්මාන කිරීම අධික වීමට හේතුවක්.

''ගුරුතුමනි මා ළඟ දක්ෂ අශ්ව පාලකයෝ දෙන්නෙක්ම මාළිගාවේ ඉන්නවා. වරක් ඒ දෙදෙනා සමග මා ගමනක් ගියා. මහා සුළි සුළඟක් ආ අවස්ථාවේ දී තල් අතු වලින් සෑදූ පුංචි මඩුවක පිහිට පතන්න සිදු වුණා. රාත්‍රියේ ම ඒ දෙදෙනා ඔබ වහන්සේගේ ධර්මය ගැනමයි කතා කළේ. නිදාගන්න වෙලාවේ මා දැක්කා දෙන්නාම හිස හරවලා තිබුණේ ගිජ්ජකූට පර්වතය දෙසටයි. මා දැක්කා ඔවුන් මට වඩා ඔබ තුමන්ට සලකන ආකාරය.

''ගුරුතුමනි, ඔබත් මාත් දෙදෙනාම ක්ෂත්‍රිය කුලයේ අය යි. අප දෙදෙනාගේම වයස අවුරුදු හැත්තෑ අටයි. අප දෙදෙනාගේ හිත මිත්‍රකම ගැන ඔබතුමන්ට ස්තුති කරන්නේ කොහොම ද?,'' යැයි රජතුමා කරුණු ගණනාවක්ම කීවේය. ඔබ වහන්සේ අවසර දෙනවා නම් මා යන්න සූදානම් වෙන්නම්.

''හා! හොඳයි යන්න. ඒ සමඟම තමන්ගේ ශරීර සෞඛ්‍ය පිළිබඳවත් මීට වඩා කල්පනාකාරී වෙන්න,'' යැයි බුදුරදුන් පැවසුවෝය. බුදුරදුන් රජතුමාව ඇරලන්න සූදානම් වන විට සැරියුත් හාමුදුරුවෝත් ආනන්ද හාමුදුරුවෝත් දෙදෙනාම දෑත එකතු කරගෙන වැඳගෙන ඉදිරිපිට ඉන්නා ආකාරය බුදුරදුන් දුටුවෝය. බුදුරදුන් ඒ දෙනාම '' රජතුමා මේ ටික වේලාවකට

පෙර තුනුරුවන් ගැන ප්‍රශංසා කර ගිය බව අමතා කීවේය. කරුණා කර මේ ගැන අනෙත් භික්ෂූන්ටත් කියන්න. ඒ අයත් තුනුරුවන් ගැන මීට වඩා සිතාවි,'' යැයි ද උන් වහන්සේ පැවසූහ.

මාස දෙකකට පසු බුදුරජුන් ගිජ්ජකූටයට නැවත වැඩම කළහ. කොසොල් රජතුමා අදහා ගත නොහැකි ආකාරයකට මිය ගිය බව බුදුරදුන්ට දැනගන්නට ලැබිණි.

පසේනදී කොසොල් රජතුමා ශ්‍රාවස්තියේ තම රජ මැදුරේ නොවෙයි රජගහ නුවර විශ්‍රාම ශාලාවකයි අන්තිම හුස්ම හෙළුවේ. එදා බුදුරජුන් රජතුමාව දුටු තැන රථ හතරක් වෙනුවට දක්කේ එක රථයකි. ඉතිරි රථ ශ්‍රාවස්තියට ගෙනගිය බව සේනාපතිතුමා කීවේය. සේනාපතිතුමා ළඟ තිබුණේ ඔටුන්නත් කඩුවත් පමණකි. සේනාපති, කාරායන රාජ කුමාරයාට අමතා ''රජතුමා දැන් හොඳටම වයසයි. එනිසා සිංහාසනය ඔබ බාරගන්න. ඔබ බාරගත්තේ නැත්නම් සිංහාසනය කරායන සේනාපති තුමා අයිති කර ගන්නා බව,'' රාජ කුමාරයාට රජකම භාර ගැනීම හැර වෙන කළ හැකි දෙයක් තිබුණේ නැත.

පසේනදී කොසොල් රජතුමා මේ බව දැනගෙන අජාසත්ත රජ තුමාගෙන් උදවු ගැනීමට රජගහ නුවරට ගියේය. රජතුමා මානසික වසයෙන් ඉතාම තද පීඩාවකින් සිටියේය. ආහාරවත් ගත්තේ නැත. බිව්වේ වතුර පමණකි . රාජගිරියට යනවිට බොහෝ රෑ බෝවී තිබූ නිසා රජමැදුරේ දොරවල් විවෘත කරවීම සුදුසු නැති බව එතුමා සිතුවේය. එක විශ්‍රාම ශාලාවක නතර විය. එදා රාත්‍රියේ රජතුමා තදින්ම අසනීප විය. රථාචාර්යවරයාගේ දෑත් මත අවසන් හුස්ම හෙළුවේය. පසුදා උදෑසන අජාසත්ත රජතුමාට මේ ගැන දැනගන්නට ලැබී රාජකීය සම්මාන සහිතව ආදාහන කටයුතු සිදු කළේය. රාජකුමාර විද්‍යුතාභව සිංහාසනයේ වාඩි කරවන්න අජාසත්ත රජතුමා සේනාවක් යවන්න සූදානම් විය. නමුත් කොසොල් රජතුමාගේ මරණයෙන් පසුව විද්‍යුතාභ (විඩූඩභ) සිංහාසනයට අනිවාර්යයෙන්ම අයිති වන බවත් ඒ නිසා කිසි සේත්ම යුද්ධ කිරීම අවශ්‍ය නැති බවත් විමල කොණ්ඩඤ්ඤ (ජීවක) පැවසීය. අජාසත්ත රජතුමා මේ කතාව අසා. විඩූඩභ රජතුමාව කොසොල් රජතුමන් හැටියට පිළිගත්හ. මුගලන් මහරහතන් වහන්සේ, ශාරිපුත්ත මහරහතන් වහන්සේ, කොණ්ඩඤ්ඤ මහරහතන් වහන්සේ යන මහ රහතන් වහන්සේලා

බුදුරදුන්ගේ ප්‍රධාන පෙළේ ශිෂ්‍යයින් හැටියට කවුරුත් පිළිගත්හ. බොහොමයක් වැඩි මහලු භික්ෂූන් මියගොස් සිටියහ. මේ අය අතරින් ප්‍රථම ශිෂ්‍යයින් පස් දෙනා ගෙන් කොණ්ඩඤ්ඤද කෙනෙක්. කාශ්‍යප, මහා ප්‍රජාපතී යන අයත් මියගොස් තිබිණි. යශෝදරාත් මියගොස්ය. රාහුල හාමුදුරුවොත් වයස අවුරුදු 51 සම්පූර්ණ කර තිබිණි.

මුගලන් මහ රහතන් වහන්සේ නිර්භයකම ගැන සහ ස්පෂ්ටතාවාදය ගැන ප්‍රසිද්ධව සිටියෝය. මේ නිසා අනෙක් ධර්ම සම්ප්‍රදායවල අය මුගලන් හාමුදුරුවන්ට නිරන්තරයෙන්ම එරෙහි විය.

දිනක් මුගලන් මහ රහතන් වහන්සේ තවත් භික්ෂූන් දෙනමක් සමඟ උදෑසන පිණ්ඩපාතය සඳහා පිටත් වූහ. මිනී මරුවන් විහාරය පිටුපස සිට මුගලන් මහ රහතන් වහන්සේ මරන්න ඉදිරියට පැන්නේය. මුගලන් මහරහතන් වහන්සේට හොඳටම තැළුවේය. මියගිය බව සිතූ ඔවුහු පැත්තකට විසිකර දැමූහ. ශබ්දය ඇසී භික්ෂූන් වහන්සේ පැමිණෙන විට මුගලන් මහ රහතන් වහන්සේ අවසන් හුස්ම හෙළා තිබුණු අතර බුදුරදුන් එතැනට වැඩම කිරීමට පෙර ආදාහන කටයුතු අවසන් කර තිබිණි.

තම සහෝදරයෙකු වූ සැරියුත් මහ රහතන් වහන්සේ ප්‍රියයන්ගෙන් වෙන් වීමේ දුක ලෝකයාට නොදැන්වීම සඳහා කුටියේ දොර වසා ගත්තේය.

බුදුරදුන් සැරියුත් මහ රහතන් වහන්සේගේ කුටියට වැඩම කළහ. මේ වැනි අවස්ථාවක බුදුරදුන්ට මොනවා සිතෙනවා ඇද්දැයි ආනන්ද හාමුදුරුවෝ කල්පනා කළේය.

බුදුරදුන් ආනන්ද හාමුදුරුවන් අමතා '' ආනන්ද නුඹගේ ස්මරණ ශක්තිය ගැන කවුරුත් ඉතාම තදින් ප්‍රශංසා කරනවා. නුඹ මගේ උපස්ථායක. ඒක ගැනත් කවුරුත් ප්‍රශංසා කරනවා. ඒ සියල්ලම මදි. මරණින් මිදීම සඳහා ධ්‍යාන භාවනා කරපන්.'' යැයි පැවසූහ. ආනන්ද හාමුදුරුවන් වහන්සේ සක්මන් භාවනාව ආරම්භ කළෝය.

පසුවදා බුදුරදුන් මුගලන් මහ රහතන් වහන්සේ ආදාහනය කළ තැනට වැඩම කර එකී ස්ථානයේ චෛත්‍යයක් සෑදීමට යෝජනා කළෝය.

## හැත්තෑ අට වන පරිච්ඡේදය

# දෙදාහක් සිවුරු

දිනක් හවස්වරුවේ බුදුරජාණන් වහන්සේ සක්මනේ යෙදී සිටියදී භික්ෂූන් දෙනමක් ඇඳක් මත තබාගෙන දේවදත්ත හාමුදුරුවන් ඔසවා ගෙන යනු දුටුවෝය. දේවදත්ත හාමුදුරුවන් අවුරුදු කිහිපයක සිට අසනීප ගතියෙන් පසු විය. මරණයට ආසන්න වූ අවස්ථාවේ දී දේවදත්ත හාමුදුරුවන් බුදු හාමුදුරුවෝ දකින්න අවශ්‍ය යැයි පවසා ඇත. අන්තිම කාලය වන විට දේවදත්ත හාමුදුරුවන් ළඟ සිටියේ භික්ෂූන් හය නමක් පමණකි. ඉතාම කිටුටුවෙන් සිටි කෝකාලික හාමුදුරුවෝ අවුරුදු කිහිපයකට පෙර අසනීපයකින් මිය ගියේය. අන්තිම කාලයේ දේවදත්ත ගයාවේ ඉඳිමින් තම ජීවිතයේ පසු කාලයේ කළ කී දේ ගැන සිතමින් ගත කළේය.

දේවදත්ත හාමුදුරුවන් අවසාන සමයේ තමන් වහන්සේ දැකීමට එන බව අසා උන්වහන්සේව පිළිගැනීම බුදුරදුන් කුටියෙන් එළියට පැමිණියෝය. දේවදත්ත ඉතාම දුර්වල වී සිටි නිසා නැගිටා වාඩි වෙන්න තරම් ශක්තියක් ඔහුට තිබුනේ නැත. ඉතාම අමාරුවෙන් දෑත එකතු කර ''බුද්ධං සරණං ගච්ඡාමි'' යැයි කීවේය. බුදුරදුන් තම ශ්‍රී හස්තය දේවදත්තගේ හිසට තැබුවෝය.

තද අසනීපයත් වයසට පත් වී සිටීමත් නිසා දේවදත්ත හාමුදුරුවෝ එදා රාත්‍රියේ ම අපවත් වූහ.

උෂ්ණ කාලය නිසා ආකාශය පැහැදිලිව නිල්පාටව පෙනිණි. බුදුරදුන් චාරිකාව සඳහා පිටත් වීමට සූදානම් වෙමිනුයි සිටියේ. අජාසත්ත රජතුමාගේ විදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා පැමිණ අවන්ති සහ වජ්ජි යන රාජ්‍ය දෙක යටත් කර ගැනීම පිණිස යුද්ධ කිරීමට අජාසත්ත රජතුමා සූදානම් වන බව බුදුරජාණන් වහන්සේට දන්වා සිටියේය. ඊට පෙර ඒ පිළිබඳව බුදුරදුන්ගේ අදහස දැනගැනීමට කැමති බව කියා සිටියේය. මේ අවස්ථාවේ දී ආනන්ද හාමුදුරුවෝත් බුදුරදුන් පිටුපස හිඳගෙන පවන් සලමින් සිටියේය.

''ආනන්ද නුඹ අහලා තියනවා නේද වජ්ජි රජවරු සමඟිව එකට වාඩි වෙලා රාජ නීති ගැන කතා කරන බව,'' බුදුරදුන් ආනන්ද හාමුදුරුවන්ගෙන් ඇසුවෝය.

''ගුරුතුමනි මා අහලා තියනවා වජ්ජි රජවරු එකට එකතු වී රාජ නීති ගැන සාකච්චා කරන බව," යැයි ආනන්ද හාමුදුරුවෝ කීවෝය.

''ඒකේ අදහස වජ්ජි රාජ්‍යය ක්‍රමයෙන් ශක්ති සම්පන්න වන බව නේද? ඒ අයගේ මේ සාකච්ඡා නිසා සහයෝගය එකඟතාව ක්‍රමයෙන් වැඩි වෙනවා නේද? වජ්ජි රජවරු සම්මත කරගත් නීති ක්‍රියාත්මක කිරීමේ දී එකමුතු බවක් පෙන්වනවා නේ ද? වජ්ජි රජවරු සුදුසු වැදගත් නායකයන්ට වැදගත් තාලයට සලකනවා නේ ද? ඒ අයගේ අනුශාසනා පිළිගන්නවා නේද? වජ්ජි රාජ්‍යයේ හිංසා කාරී කටයුතු බලහත්කාරකම් සිදුවන්නේ නැහැ නේද?'' යැයි බුදුරදුන් ඇසුවෝය.

ආනන්ද හාමුදුරුවෝ බුදුරදුන්ට පිළිතුරු දෙමින් මුලින් සඳහන් කළ සියලුම ගුණාංග වජ්ජීන් ළඟ ඇති බව කීවෝය.

'' එහෙම නම් වජ්ජීන් උන්නතිය කරා යාම අනිවාර්යයෙන් ම සිද්ධවනවා,'' බුදුරදුන් පැවසුවෝය.

''ආනන්ද මේ සියල්ලම මෙසේ සිද්ධ වෙන්නේ නම් වජ්ජි රාජ්‍යයේ උන්නතිය මිසක් අවනතියක් වන්නේ ම නැහැ.

''ආනන්ද වජ්ජි රජවරුන් තමන්ගේ මුතුන් මිත්තන්ගේ පරණ සමාධි චෛත්‍යය ආදිය ආදරයෙන් ආරක්ෂා කරනවා ද? විවිධ ධර්මාචාර්යවරුන්ට සැලකීම කරනවාද?" බුදුරදුන් ඇසීය.

මේ සියල්ලක් ඉතාම හොඳින් සිද්ධ වන බව ආනන්ද හාමුදුරුවන් පිළිතුරු දුන්හ.

එහෙනම් ආනන්ද වජ්ජි රජවරුන් දියුණුවෙන් දියුණුවට ම පත් වීම අනිවාර්යයෙන්ම සිදු වෙනවා.

මීට කලින් වතාවක බුදුරදුන්ට වජ්ජි රටේ නායකයන් සමඟ සාකච්ඡා කිරීමට අවස්ථාවක් උදා විය. මේ අවස්ථාවේ දී වජ්ජි රාජ්‍යය සමෘධිමත් කිරීමට කරුණු හතක් ඉදිරිපත් කරන ලදි.

ඒවා එකට එකතු වී සාකච්ඡා කිරීම, සහයෝගයෙන් කටයුතු කිරීම, රජය විසින් සම්පාදනය කරන ලද නීති ක්‍රියාත්මක කිරීම, සුදුසු නායකයන්ට සැලකීම සමගම ඒ අයගේ න්‍යාය මාර්ගවලට ගරු කිරීම. හිංසා සහ බලහත්කාරකම්වලින් මිදීම. ආදි මුතුන් මිත්තන්ගේ චෛත්‍ය ස්තූප ආදිය ආරක්ෂා කිරීම, යනුවේ. වජ්ජි රජවරුන් මේ කරුණු හත ආරක්ෂා කරන නිසා මගධ රජතුමා සිතන ආකාරයට වජ්ජි රාජ්‍යය පරාජය කර අත්පත් කර ගැනීම එතරම් පහසු කාර්යයක් නො වන බව,'' බුදුරදුන් ප්‍රකාශ කළෝය.

'' ආචාර්යතුමනි, වජ්ජි රජවරුන් මේ කරුණු හතෙන් එකක් හෝ අනුව පාලනය කරන්නේ නම් ඒ අය පරාජය කිරීම එතරම් පහසු කාර්යයක් නො වන බව,'' මන්ත්‍රීතුමා කීවේය.

ඒ සමගම ධන, බලය සහ සේනා බලය පමණක් මේ සඳහා ප්‍රමාණවත් වන්නේ නැත. යම් කිසි ක්‍රමයකින් වජ්ජි සේනාව තුළ මත භේද ඇති කළොහොත් ඉන් යම් කිසි සඵල බවක් ලබා ගත හැකි බව සිතන්න ඉඩ ඇති බව සඳහන් කළේය.

''ආචාර්යතුමනි, ඔබ තුමන්ගේ අදහස් ගැන බොහෝම ස්තුතියි. මට යන්න අවසර දෙන්න,'' යැයි මන්ත්‍රීතුමා කීවේය.

''ආනන්ද, මේ සේනාපති මහ කූට උපක්‍රම කාරයෙක්. අපි කොහොම මොනවා කීවත් අජාසත්තු වජ්ජි රාජ්‍යය ආක්‍රමණය කරන්න සේනාව පිටත් කිරීම සිදු කරාවි,'' යැයි බුදුරදුන් පැවසූහ.

රජගහ නුවර සිටින සියලුම භික්ෂු භික්ෂුණීන්ව ගිජ්ජකූටයට කැඳවන්න යැයි එදින සවස බුදු හාමුදුරුවෝ ආනන්ද හාමුදුරුවන්ට පැවසූහ. දවස් හතක් ඇතුළත සියලුම දෙනා එක තැනකට එකතු වුණු පිරිස දෙදහක් පමණ විය. ගිජ්ජකූට පර්වතය මුදුනේ කහ සිවුරු පොරවාගත් භික්ෂු, භික්ෂුණීන් දෙදහසක් දැකීම ම ඉතාම ප්‍රියංකර දර්ශනයක් විය.

බුදුරජුන් සෙමින් ගොස් ධර්මාසනය මත වැඩ සිටියෝය. සංඝ සමූහය දෙස බලා බුදුරදුන් සිනා සී "සංඝ සමාජයේ උන්නතිය, පිරිහීම ගැන කරුණු හතක් මා අද සැමටම විස්තර කර දෙනවා. දියුණුවට හේතු වන කරුණු අතර පළමු වන කාරණය නුඹලා සමූහයක් වශයෙන් එකමුතු වීමය. සද්ධර්මය පිළිබඳව සාකච්ඡා කළ යුතුයි, එකතු වීමේ දී සහ වෙන් වීමේ දී සමගිය පිළිබඳව සිත යොදවන්න ඕනෑ, නියමිත ක්‍රමයට ශීලය පාලනය කරන්න ඕනෑ, සංඝයා අතර ගුණවන්ත වැඩි මහලු අයට සලකන්න ඕනෑ, ඒ අයගේ අවවාද අනුශාසනා පිළිගන්න ඕනෑ. ආශාවෙන් හා ලෝභයෙන් මුක්ත විය යුතුයි. නිහතමානී, සැහැල්ලු ජීවිතයක් ගත කළ යුතුයි. ඉතා වේග සිතුවිලිවලින් තොරව ශාන්ති සිතිවිලිවලින් යුක්ත විය යුතුයි. සසරින් මිදීම පිළිබඳව සිත යොමු කළ යුතුයි. තම මිත්‍රයින්ටත් අධ්‍යාත්මය පිළිබඳව මාර්ග දර්ශනය කරන්න.

මේ නියමයන් හත පිළිපැද්දොත් සද්ධර්මයේ දියුණුවක් සිදුවීම අනිවාර්යයෙන්ම දැකිය හැකි බව බුදුරදුන් සඳහන් කළෝය. "සංඝ සමාජය ආපසු හැරී යන සමාජයක් නොවේ. පිට පැත්තෙන් එන කිසිම බලවේගයකට සංඝ සමාජය විනාශ කිරීමට ශක්තියක් නැහැ. සංඝයා තුළින්ම එන ප්‍රශ්න නිසාමයි කවදා හරි සංඝ සමාජය විනාශ වෙන්නේ. සිංහයා මිය ගිය විට උගේ මස් කිසිම සතෙක් කන්නේ නැහැ. උගේ ශරීරයේ ඇති වන පනුවන් විසින් ම උගේ කුණු මස් කාලා ඉවර කරනවා. මේ වාගේ තමයි සංඝ සමාජයේ සමගියත්.

"මා ඉහතින් සඳහන් කළ කරුණු හත ආරක්ෂා කිරීමෙන් සංඝ සමාජයේ ස්ථිරත්වය සිදු වෙනවා."

බුදුරදුන් සැම දෙනාටම "අනවශ්‍ය කතාවලට කාලය නො යොදවා වැඩිපුර නිදාගන්නේ නැතිව, ලෞකික ලාභ සහ ප්‍රසිද්ධියට නොගොස් නරක, චරිත ඇති අය සමඟ වැඩිපුර කාලය නො යොදා, සිහියෙන් යුක්තව ධර්මය ගැන සාකච්ඡා කර භාවනා කර සිත දියුණු කිරීමට කාලය යොදන ලෙස," යැයි බුදුන් වහන්සේ සියලු දෙනාම අමතා පැවසූහ.

දෙදහක් පමණ භික්ෂු භික්ෂුණීන් පිරිස දවස් දහයක් පමණ ගිජ්ජකූට පර්වතය අසල ගත කළහ. බුදුරදුන් සැමදා ම ඒ අයට ධර්ම දේශනා කළෝය. දහවන දා බුදුරදුන් සැමටම තම තමන්ගේ ආවාස විහාරවලට යන්න දැන්වූවෝය. පසුදා තමන් වහන්සේත් වේළුවනයට වඩින බව කීවෝය.

බුදුරදුන් හා ආනන්ද වේළුවනයේ බිම්බිසාර රජතුමන් සැදූ විහාරයේ වැඩ සිටියෝය. වරක් මෙකී විහාරයේ ශාරිපුත්ත - සහ රාහුල යන අයත් විශ්‍රාම ගත්හ.

අඹ උයනේ සිටි භික්ෂූන්ට බුදු රදුන් ශීල, සමාධි, ප්‍රඥා ගැන දේශනා කළහ.

ආනන්ද හාමුදුරුවන් ශාරිපුත්ත හාමුදුරුවන් සහ අනුරුද්ධ හාමුදුරුවන් ඇතුළු භික්ෂූන් සියක් නමක් නාලන්දාව බලා පිටත් වූහ. නාලන්දාවේ පාවාරිකා අඹ වනයේ මේ සියලු දෙනා වහන්සේ වැඩ විසූහ.

දවසක් ශාරිපුත්ත මහ රහතන් වහන්සේ බුදු රදුන් සමීපයට ගොස් නිහඬව ටික වේලාවකට පසු, භාග්‍යවතුන් වහන්ස, මේ ලෝකයේ මින් ඉදිරියට අතීතයේ, වර්තමානයේ හෝ අනාගතයේ ඔබ වහන්සේ වැනි ප්‍රඥාවන්ත ආධ්‍යාත්මික ගුරුවරයෙකු පහළ වේ ය කියා මා සිතන්නේ නැත," කීවෝය.

"ශාරිපුත්ත ඔබ අතීත, වර්තමාන, අනාගත සැම ගුරුවරයෙකුම හමු වුණා ද? ඒ අය ගැන මේ තරම් උසස් කතාවක් කරන්න තරම් සිතට ශක්තියක් එන්න ඒ අය සැම දෙනා ම ආශ්‍රය කරලා තියෙන්න ඕනෑ නේ ද?" යනුවෙන් ප්‍රශ්න කළේය.

"භාග්‍යවතුන් වහන්ස මා කාල තුනේ සියලුම ආචාර්ය වරුන් සමඟ හමු වීමක් කළේ නැහැ. නමුත් අවුරුදු හතලිහක් ඔබ වහන්සේ සමඟ එකට හිඳීමෙන්, ධර්මය ගැන සාකච්ඡා කිරීමෙන්, දිනචරියාව දැකීමෙන්, ඔබතුමන් ඉන්ද්‍රිය යන්ගේ ජය ගත් ආකාරය දැකීමෙන් මේ ගැන මට හොඳ අවබෝධයක් ලැබුණා. මේ නිසයි මේ කථාව මා කිවුවේ," යැයි ශාරිපුත්ත හාමුදුරුවෝ පැවසූහ.

බුදුරදුන් නාලන්දාවේ සිටි භික්ෂූන්ට ශීල, සමාධි, ප්‍රඥා ආදී ගුණාංග වර්ධනය කර ගැනීම සඳහා දේශනා කළහ. ඉන්පසු

බුදුරදුන් පාඨලී ග්‍රාමයට වැඩම කර ධර්ම දේශනා කළෝය. මේ අතර අවුරුදු සියයක් ආයු වැළඳූ උන් වහන්සේගේ ආදරණීය මෑනියන්ගේ සෞඛ්‍ය තත්වය නරක අතට හැරී යන බවට ශාරිපුත්ත මහ රහතන් වහන්සේට පණිවිඩයක් ලැබිණි. ශාරිපුත්ත මහ රහතන් වහන්සේ බුදුරදුන් සමීපයට පැමිණ තුන් වරක් වැඳ අවසර ගෙන චුන්ද නම් වූ සත්කාරයෙකු සමඟ මව දැකීම සඳහා පිටත් වූහ.

බුදුරදුන් සහ භික්ෂු මහා සංඝයා පාඨලී ගමෙන් පිට වී යෑමට සූදානම් වූ විට අජාසත්ත රජතුමාගේ මන්ත්‍රීවරුන් දෙදෙනෙක් පැමිණ පාඨලී ගම මහ නගරයක් කිරීමට රජ තුමා ඒ දෙදෙනාට බාරදුන් බව පැවසුවෝය. බුදුරදුන් පිට වුණු දොරටුව ඒ නගරයේ ගෞතමද්වාර හැටියට නම් කරන බව ඇමතිවරු ප්‍රකාශ කළහ. බුදුරදුන් ඔරුවට නැඟි ස්ථානය ගෞතම ඉවුර හැටියට නම් කරන බව ද පැවසූහ. තද වර්ෂාව නිසා ගංවතුර අධික විණි. ඔරු පහක නැඟී බුදුරදුන් සහිත මහා සංඝයා ගඟෙන් එගොඩ වූහ. ආනන්ද හාමුදුරුවන් බුදුරදුන් සමීපයේම ඉඳගෙන සිටියෝය. අවුරුදු විසි පහකට පෙර සිද්ධ වූ සිද්ධියක් ආනන්ද හාමුදුරුවන්ගේ මතකයට ආවේය. බුදුරදුන් විශාලා මහනුවරට වැඩි අවස්ථාවේ රෝග, දුර්භික්ෂ, අමනුෂ්‍ය යන තුන් බිය පැතිරී තිබිණි. මේ නිසා ගණන් කළ නොහැකි තරම් පිරිසක් මිය ගියේය. මේ භයානක සිද්ධි තුනෙන් ජනතාව බේරා ගැනීමට කිසිම වෛද්‍යවරයෙකු හෝ ආචාර්යවරයෙකු හෝ සමත් වූයේ නැත. මේ භයානක අවස්ථාවෙන් මිදීමට ජනතාව බුදුරජාණන් වහන්සේගෙන් කළ හැකි දෙයක් කිරීමට ඉල්ලා සිටියහ. බුදු රදුන් මාස තුනක් වෛශාලියේ වැඩ සිට රතන සූත්‍රය දේශනා කර මේ රෝග බිය, දුර්භික්ෂ බිය, අමනුෂ්‍ය බිය දුරු කර දුන්නෝය.

ගඟෙන් එගොඩ වූ විට ආනන්ද හාමුදුරුවන්ගේ අතීතයට ගිය සිත වර්තමානයට නැවත පැමිණියේය. බුදුරදුන් ගඟෙන් එතෙරව කෝටි ග්‍රාමයට ගොස් එහි සිටි බොහෝ භික්ෂූන්ට ධර්මය දේශනා කළහ.

තුනුරුවන් පිළිබඳ සම්පූර්ණ ගෞරවය රකින ලෙස බුදුරදුන් භික්ෂූන්ට දන්වා සිටියෝය. නදිකාවේදී, ශීල, සමාධි ප්‍රඥා ආදී ගුණාංග තුන භික්ෂූන්ට දේශනා කළහ.

නදිකාවෙන් පිට වී උන් වහන්සේ වෛශාලියට වැඩම කළහ. බුදුරදුන්ගේ වැඩම වීම ඇසූ විගස අම්‍රපාලී උන් වහන්සේ හමුවීමට පැමිණ බුදුරදුන් ඇතුළු මහා සංඝයාට පසුදා දවල් දානය සඳහා තම නිවසට වැඩම කරවන ලෙස ආරාධනා කළාය. දානය පූජා කිරීමෙන් පසුව අම්‍රපාලී භික්ෂුණී ශාසනයට ඇතුළත් වීමට අවසර ඉල්ලා සිටියාය. බුදුරදුන් භික්ෂු මහා සංඝයා සමග සාකච්ඡා කර අම්‍රපාලීව භික්ෂුණී ශාසනයට ඇතුළත් කර ගැනීමට තීරණය කළෝය.

බුදුරදුන් එතැනින් බේලුව ගමට වැඩම කළහ. එළඹෙන වස බේලුව ගමේ වැඩ සිටීමට උන් වහන්සේ තීරණය කළහ. බුදු බව අවබෝධ කරගැනීමෙන් පසුව බුදුරදුන්ගේ හතලිස් පස්වන වස් කාලය හැටියට බේලුව ගමේ වස සඳහන් කළ හැකියි.

වස් කාලයේ බුදුරදුන් අසනීප වූහ. අසනීපයෙන් බොහෝ වේදනා විඳින්නට උන් වහන්සේට සිදු විය. නමුත් කිසිම කෙනෙකුට මේ ගැන කිසිවක් කිවුවේ නැත. නිතරම ආශ්වාස ප්‍රශ්වාසය පිළිබඳව සිත යොමු කළහ. මේ ගම්භීර අවස්ථාව දැක සමහර අය බුදු රදුන් අන්තිම හුස්ම හෙළනු ඇතැයි සිතුහ. නමුත් ක්‍රමයෙන් ශරීර සෞඛ්‍ය තත්වය හොඳ අතට හැරිණ. ටික දවසකට පසුව කුටියෙන් එළියට විත් පුටුව මත වාඩි වූහ.

## හැත්තෑ නව වන පරිච්ඡේදය

# සඳුන් දරවලින් මල්

මෙච්චර කල් මා ඔබ වහන්සේ සමඟ එකට සිටිය නමුත් කවදාවත් ඔබ වහන්සේ මෙතරම් අසනීප වූ බවක් දැක තිබුණේ නැතැය ආනන්ද හාමුදුරුවන් බුදුරදුන් සමීපයේ වාඩි වී ඉතාම ආදරයෙන් පැවසූහ.

''මගේ සිත සිතුවිලිවලින් වෙලී ගියා. කරන්නේ කුමක් ද? නො කරන්නේ කුමක් ද කියා තේරුම් ගන්න බැරි වුණා. බොහෝ දෙනා සිතුවා ඔබ වහන්සේ ජීවතුන් අතර ඉතිරිවන එකක් නැහැ කියලා. නමුත් මා සිතුවා බුදුරදුන් තවම මට අන්තිම අවවාදය දුන්නේ නැති නිසා ඒ අය සිතන කිසි දෙයක් වන්නේ නැහැ, බුදුරදුන් ඉතා ම ඉක්මනින් හොඳ ශරීර සෞඛ්‍යයෙන් යුක්ත වන බව. මේ අදහස් සිතට දැනෙන විට මගේ සිතේ ආශාවේ කිරණ දකින්න ලැබුණා,'' යි ආනන්ද හාමුදුරුවෝ පැවසූහ.

''ආනන්ද ඔබ වහන්සේලාට අවසාන වශයෙන් මගෙන් දැනගන්න යමක් තියෙනවාද?'' යනුවෙන් ආනන්ද හාමුදුරුවන්ගෙන් අසමින් උන් වහන්සේ මෙසේ ප්‍රකාශ කළෝය. ''මගේ ධර්මයේ කිසිම දෙයක් මා සැඟ වූයේ නැහැ. ඇති සියල්ල ඇති හැටියට අවශ්‍ය පරිදි දේශනා කළා. ආනන්ද සද්ධර්මයේ සරණ නියම සරණ බව සිතන්න. සියලුම දෙනාට සද්ධර්මය

නියම සත්‍ය මාර්ගය දක්වන බව මතක තබා ගන්න. 'අත්ත දීපෝ භව' තමන්ට තමන්ම පමණක් වන්න. බුද්ධ, ධම්ම, සංඝ යන තුනුරුවන්ව තම හදවතේ තැන්පත් කරගන්න. සම්බෝධිය අවබෝධ කර ගැනීම බුද්ධත්වය හැටියට සිතන්න. සද්ධර්මය ඉගෙනීම ධර්මයයි. ලෝක සමුදායගේ සහයෝගය සංඝයි,''

වස්කාලය අවසාන වනවාත් සමගම බුදුරදුන්ගේ ශරීරය සෞඛ්‍යය හොඳ අතට හැරිණි.

දිනක් සාමනේර ඡන්න සාරිපුත්ත මහරහතන් වහන්සේ ට අන්තේවාසික ව සේවය කරන අතර ඔහු ආනන්ද හාමුදුරුවන් ව සොයාගෙන ආවේය. ශාරිපුත්ත මහ රහතන් වහන්සේ පිරිනිවන් පෑ බව ඡන්න ආනන්ද හාමුදුරුවන්ට දැන්වීය. ශාරිපුත්ත හිමියන්ගේ පාත්‍රය, සිවුරු ආදිය ආනන්ද හාමුදුරුවන් අතට බාර දුන්නේය. ඒවා දී ඡන්න අඬන්න පටන් ගත්තේය. ආනන්ද හාමුදුරුවොත් අඬන්න පටන් ගත්තෝය. ශාරිපුත්ත හාමුදුරුවෝ අන්තිම කාලය දක්වා තම ආදරණීය මවට ඉතා හොඳින් සේවය කළ බව ඡන්න කීවේය. මෑණියන්ගේ ආදාහන කටයුතු අවසන් වීමෙන් පසු ගමේ සැමටම ධර්ම දේශනා කළ ආකාරයත් ඔහු විස්තර කළේය. ත්‍රි රත්නය උච්ඡාරණය කිරීම, භාවනා කිරීම ගැන ඒ අයට විස්තර කළෝය. ඉන් පසුව තමන් විසින් පද්මාසනයෙන් වැඩ සිට පිරිනිවන් පෑ ආකාරය ගැන සඳහන් ඡන්න පැහැදිලි කළේය.

පිරිනිවන් පෑමෙන් පස්සේ තමන්ගේ සිවුරු පිරිකර සියල්ල බුදුරජානන් වහන්සේට බාර දෙන්න යැයි පිරිනිවන් පෑමට පෙර ශාරිපුත්ත මහරහතන් වහන්සේ ඉල්ලා ඇත. තමන්ගේ මරණින් පසුව ඡන්න බුදුරදුන්ට සේවය කරනවා දකින්න ශාරිපුත්ත මහ රහතන් වහන්සේ කැමති විය.

ආනන්ද හාමුදුරුවෝ කඳුළු පිසිමින් බුදුරදුන් සමීපයට ගියෝය. ආනන්ද හාමුදුරුවන් සමීපයට රැගෙන එන්නේ මොනවා ද කියා බුදුරදුන් කල් ඇතිවම දැනගෙන සිටියේය. ශාරිපුත්ත මහ රහතන් වහන්සේගේ පාත්‍ර සිවුරු දිහා බුදුරදුන් නිහඬව බලා සිටියේය. වචනයකුදු කතා නොකර බුදුරදුන් නිහඬව ඡන්නගේ හිස පිරිමැද්දේ.

කල්‍යාණ මිත්‍ර ශාරිපුත්ත මහ රහතන් වහන්සේගේ පිරිනිවන් පෑම ගැන අසා තමන් වහන්සේ බලවත් දුකට පත් වූ අතර කිසිවක් තේරුම් ගැනීමට අපහසු වූ බවත්, දුක නිවා ගැනීමට

කිසිම ක්‍රමයක් නැති බවත් ආනන්ද හාමුදුරුවෝ කීවෝය.

බුදුරදුන් ටික වේලාවක් නිහඬව සිට ''ආනන්ද නුඹගේ මිත්‍රයා මිය යන විට ශීලය, ධ්‍යාන, සමාධි, ප්‍රඥා ආදී දේත් රැගෙන ගියා ද? යැයි ඇසුවෝය. මට නිතර සිතෙන්නේ ශාරිපුත්ත දේශනා කළේ කුමක් ද ඒ අනුව තම ජීවිතය අකුරටම පිළිපැද්ද කාරණයේ ඇති වැදගත්කම ගැනයි. සැමටම ශික්ෂාව දුන්නා. ඒ අනුව කටයුතු කරන්න, මාර්ග දර්ශනය කළා. දූන් ශාරිපුත්ත, මොග්ගල්ලාන දෙන්නම අප ළඟ නැහැ. මේ දෙදෙනාම නැති නිසා අපි තනි වුණා කියලා දැනෙනවා. මේ කාරණය දුකට හේතුව නො වේ ද?'' ආනන්ද හාමුදුරුවෝ පැවසූහ.

''ආනන්ද මා කී සැරයක් කිවුවා ද ඉපදුණු සෑම කෙනෙක් ම මිය යෑම අනිවාර්යයෙන් ම සිද්ධ වන බව. හමු වීමක් වෙනවා නම් වෙන්වීමත් ඒ සමගම සිදු වන බව. සියලුම ධර්ම අනිත්‍ය බව. ඒ නිසා කිසිම දෙයක් සමග බන්ධනයක් ඇතිකර ගැනීම සුදුසු නැති බව. ඉපදීම, මරණය, වෙන් වීම යන මේවායෙන් නිදහස් වෙන්න ඕනෑ. ශාරිපුත්ත අපේ වෘක්ෂයේ තිබුණ ශක්තිමත් ම ශාඛාවක්. භික්ෂූන්ට සම්බෝධිය අවබෝධ කර ගැනීමට ශාරිපුත්ත තවමත් මාර්ග දර්ශනය කරන බව මා හොඳටම දන්නවා. නුඹ දෑස විවර කරලා බැලුවොත් ශාරිපුත්ත සද්ධර්මය සහ බුදුන් එක් විටම දකින්න පුළුවන්. දෑස විවර කළොත් ශාරිපුත්තව සෑම තැනකම දකින්න පුළුවනි. කවදාවත්ම සිතන්න එපා ශාරිපුත්ත අප සමඟ නැත කියලා. උන් වහන්සේ අප සමඟ සැමදාම සිටිනවා,''

''ආනන්ද ශාරිපුත්ත මහා ප්‍රඥාවන්ත අර්හත් කෙනෙක්. උන් වහන්සේ සැමටම සද්ධර්ම මාර්ගය ඉතාම පැහැදිලිව කියලා දුන්නා,'' බුදුරදුන් පැවසූහ.

එදා දහවල් ගංගා නදිය ඉවුරේ දී බුදුරජුන් ශාරිපුත්ත මහා රහතන් වහන්සේගේ පිරිනිවන් පෑම ගැන සැමටම දැනුම් දුන්හ.

දවසක් බුදුරජුන් සහ ආනන්ද හාමුදුරුවන් විශාලා මහ නුවර පිණ්ඩපාතයේ වැඩියහ. දෙදෙනම විවේක ගැනීම සඳහා චම්පාරණ්‍යයට ගියෝය. යන අතර බුදු රජුන් ස්වභාව ධර්මයේ සෞන්දර්ය රස වින්දෝය. ආනන්ද හාමුදුරුවන්ට බුදු හාමුදුරුවෝ ''ආනන්ද, වෛශාලිය කොපමණ සුන්දර ද? අප දූන් යන චාපාල විහාරයත් මීට වඩා අලංකාරයි,'' යනුවෙන් බුදුරදුන් පැවසූහ. චාපාල විහාරයේ බුදුරජුන්ගේ පහසුකම් සියල්ලම සලසා ආනන්ද

හාමුදුරුවන් කුටියේ ඉදිරිපිට සක්මන් භාවනාවේ යෙදිණි. මේ අතර මහා භූ කම්පාවක් ඇති විය. ආනන්ද හාමුදුරුවන් භූමි කම්පාවට භය වූහ. ආනන්ද හාමුදුරුවෝ ඉක්මනටම කුටිය තුළට ගියෝය. බුදුරජුන් ශාන්තව ඉන්න ආකාරය උන් වහන්සේ දුටුවෝය. ''මේ දැන් භූමි කම්පාවක් ඇති වුණා යැයි උන් වහන්සේ බුදුරදුන්ට කීවෝය. බුදුරජුන් ආනන්ද හාමුදුරුවන්ට කිසිම අමතර දෙයක් නො කියා, ආනන්ද, බුදුරජානන් වහන්සේ තීරණය කළා මාස තුනකින් පස්සේ මහා පරිනිර්වාණයට පත් වීමට,'' යැයි පැවසූහ.

මේ බව අසා ආනන්ද හාමුදුරුවන්ට තමන්ගේ අතපය සිත සමඟම අකර්මන්‍ය වී ගියා සේ මේ බව ඇසූ ආනන්ද හිමියන්ට දැනිණි.

මේ තරම් ඉක්මනට පිරිනිවන් නොපාන ලෙසත් තම ආදරණීය ශිෂ්‍යයා ගැනත් සිතන්න කියාත් ආනන්ද හාමුදුරුවෝ බුදුරජානන් වහන්සේ ළඟ දණ ගසා අයැද සිටියෝය. නමුත් බුදුරජාණන් වහන්සේ කිසිවක් ම නොකියා නිහඬව සිටියෝය.

''ආනන්ද, ඔබ කරුණු ඉතා හොඳින් දන්න කෙනෙක්. තථාගතයන් වහන්සේ පිරිනිවන් පාන්නේ සුදුසු අවස්ථාවේදියි. මා කිව්වේ මාස තුනකට පස්සේ පිරිනිවන් පාන බවයි. මේ නිසා සියලුම භික්ෂූන්ට මේ ගැන දන්වා සියලුම භික්ෂූන් මහා වනයේ කූටාගාර ශාලාවට කැඳවන්න,'' යැයි මඳ වේලාවකට පසු බුදුරජුන් ආනන්ද හාමුදුරුවන්ට කීවෝය.

දවස් හතකට පසු දෙදහස් පන්සියයක් පමණ භික්ෂූන් කූටාගාර ශාලාවට එකතු විය. බුදුරජුන් ආසනයේ වැඩ සිට භික්ෂූන්ට ධර්ම දේශනා කිරීම ආරම්භ කළෝය.

''භික්ෂු, භික්ෂුණීවරුනි, සියලුම ධර්ම අනිත්‍යයි. සියල්ල ම ඉපදීම සමඟම නැසීම ද ස්වාභාවිකයි. සියලුම ධර්මයන්හි විකාශනය සමඟ විනාශය ද සිද්ධ වෙනවා. සසර දුකින් නිදහස් වීමට සැමවිටම සිහියෙන් යුක්ත විය යුතුයි. ඒ සමගම ධ්‍යාන භාවනා කළ යුතුයි. තථාගතයන් වහන්සේ අදින් මාස තුනකට පස්සේ මහා පරිනිර්වාණයට පත් වෙනවා.

සියලු ම දෙනා බුදුරජාණන් වහන්සේගේ දේශනාව ඉතා ම සාවධානව අසාගෙන සිටියහ. බුදුරජාණන් වහන්සේගේ ශ්‍රී මුඛයෙන් ඇසූ අන්තිම වචන ටික මෙපමණයි සියලුම දෙනා සිතූහ. අදින් පසු බුදුරදුන් මහා පරිනිර්වාණයට පත් වෙනවා නේ ද යැයි මුලු ධර්ම ශාලාවේම දුක් බර අඳුරු ගතියක් ඇති විණි.

පසු දා බුදුරදුන් වෛශාලියේ පිණ්ඩපාතයේ වැඩම

කළෝය. වනාන්තරයේ දානය වළඳා වනාන්තරයේ ම විවේක ගත්තෝය. ඉන් පසුව තමන් සමඟ සිටි අනෙත් භික්ෂූන් සමඟ වෛශාලියෙන් පිටත් වී ටික දුරක් ගොස් බුදුරදුන් ආපසු හැරී බැලූහ. ''ආනන්ද, වෛශාලිය හරිම ලස්සනයි නේද? තථාගතයන් මේ නගරය දකින්නේ අන්තිම වතාවට යි, එසේ හැරී බලා ආනන්දට පැවසුවෝය.''

එදා හවස් වරුවේ බුදුරදුන් භික්ෂූන්ට ශීල, සමාධි, ප්‍රඥාව ගැන උපදෙස් දුන්හ. භණ්ඩ ග්‍රාමයෙන් බුදුරදුන් මට්ට ග්‍රාමයට වැඩම කළහ. අම්බ ග්‍රාමයෙන් ජම්බු ග්‍රාමයට වැඩම කර එතැනදී එහි සිටි භික්ෂූන්ට ධර්ම දේශනා කළහ. එතැනින් භෝග නගරයට වැඩම කළෝය. නමුත් ඒ ගමනට ආනන්ද හාමුදුරුවෝ එක් වූයේ නැත. ඒ ප්‍රදේශයේ බොහෝ භික්ෂූන් බුදුරජාණන් වහන්සේ ව පිළිගන්නට පැමිණියහ. උන් වහන්සේගේ දේශනා ක්‍රියාවට නගා බලන්න යැයි සියලුම භික්ෂූන්ට අවවාද දුන්හ. බුදුරදුන් එතැනින් පාවා නගරයට වැඩම කර චුන්ද නම් වූ රත්‍රන් කම්මල් කරුවාගේ අඹ වනයේ විවේක ගත්තෝය. බුදුරදුන් ඇතුළු තුන් සියයක් භික්ෂූන්ට දානය පිදීම සඳහා චුන්ද ආරාධනා කළේය. බුදුරජාණන් වහන්සේ සඳහා චුන්ද විශේෂයෙන් දානය සූදානම් කළේය. එකී දානයට චුන්ද සඳුන් මල්වලින් සූදානම් කළ එවකට සූකර මද්ද නමින් ප්‍රසිද්ධ වූ විශේෂ ව්‍යන්ජනයක් පිස පූජා කළේය. තමන් සඳහා සූදානම් කළ විශේෂ ව්‍යන්ජනය වෙන කිසි වකුට නො දී පොළවේ වලලන්න යැයි එය වෙන කිසි වකුට කෑමට නො දෙන ලෙස ද පැවසූහ.

දානයෙන් පසුව බුදුරදුන් චුන්දගේ අඹ වනයේ විවේක ගත්තෝය. එදා රාත්‍රියේ බුදුරදුන්ට ඉතා දරුණු බඩේ රිදුමක් ඇති විය. මුළු රාත්‍රියම නින්දක් නැතිව සිටියෝය. උදෑසන උන් වහන්සේ භික්ෂූන් සමඟ කුසිනාරාව බලා වැඩම කළහ. අතර මගදී බඩේ අමාරුව තවත් තදින් දැනිණි. අතර මඟ ගසක් යට විවේක ගත්තෝය. තද පිපාසයක් ඇති වී පානය කිරීමට ජලය ටිකක් රැගෙන එන ලෙස ආනන්දට කීවෝය.

මේ දූන් කරත්ත කිහිපයක් ගිය නිසා නදියේ ජලය බොර වී ඇති නිසා ඉදිරියට යන විට කුකුත්වා නදියේ ජලය පිරිසිදු නිසා එහි ජලය පානයට සහ අතපය සේදීමට ඉතාම යෝග්‍ය බව ආනන්ද හාමුදුරුවෝ පැවසූහ.

''ආනන්ද මට තද පිපාසයක් තියනවා. කරුණාකරලා පානය සඳහා ජලය ටිකක් ගේන්න යැයි නැවතත් බුදුරදුන් ආනන්ද හාමුදුරුවන්ට පැවසුවෝය.

ආනන්ද හාමුදුරුවෝ බොර ජලය ඇති නදියට පාත්‍රය දමනවාත් සමඟම බොර ජලය ඉතාම පිරිසිදු විය. බුදුරජුන් ජලය පානය කර ගස යටම නැවතත් විවේක ගත්තෝය. ඒ අසල අනුරුද්ද සහ ආනන්ද හාමුදුරුවවෝ සිටියහ. අනෙක් භික්ෂූන් වහන්සේ බුදුරදුන්ගේ අසනීප තත්වය ගැන තද සිතුවිල්ලෙන් ගත කළෝය.

මේ අතර තුර කුසිනාරා වාසී පුද්ගලයෙක් මේ පාර දිගේ යමින් සිටි අතර භික්ෂු මහා සංඝයාගේ රැස්වීම දැක එහි නතර විය. මල්ල වංශයේ කුසිනාරාවේ සිටින පුක්කුස යනුවෙන් ඔහු තමා හඳුන්වා ගත්තේය. එතුමාත් මීට කලින් ආලාරකාලාමගේ ශිෂ්‍යයෙකු හැටියට ඉගෙනීම කර තිබිණි. මෙතුමා බුදුරදුන් ගැන මීට කලින් බොහෝ දේ අසා තිබුණ බව සඳහන් කළේය. ඔහු තමන් අත තිබුණ සළු දෙක බුදුරදුන්ට පූජා කළේය. බුදුරදුන් එක සළුවක් පිළිගෙන දෙවන සළුව ආනන්ද හාමුදුරුවන්ට පූජා කරන්න යැයි ඉල්ලා සිටියෝය. තමන්වත් පැවිදි කරවන්න කියලා පුක්කුස බුදුන් වහන්සේගෙන් ඇයද සිටියේය. ත්‍රි රත්නය උච්ඡාරණය කර බුදුරදුන්ගෙන් ධර්මය ශ්‍රවණය කර පුක්කුස එතැනින් යන්න ගියා. මේ ගමනේ දී බුදුරදුන්ගේ වස්ත්‍ර සම්පූර්ණයෙන් ම අපිරිසිදු වී තිබිණි. ආනන්ද හාමුදුරුවන් පරණ සිවුරු අයින් කර බුදුරදුන්ට අලුත් සිවුරු ඇන්දෙව්වෝය. තරමක් සනීප වූ පසුව බුදුරදුන් කුසිනාරා නුවරට යෑමට භික්ෂූන්ට සන් කළෝය. කුකුත්වා නදියෙන් දිය නා අවශ්‍ය තරම් ජලය පානය කළෝය. ඊට පසුව අඹ වනයට වැඩම කළහ. තමන්ට විවේක ගැනීම සඳහා දෙපට සිවුර බිම එළන්න යැයි භික්ෂු ඡන්නට කීවෝය.

''චුන්දට කියන්න ඔහු දුන් දානය තමන් ගත් අන්තිම දානය බව. මගේ ජීවිතයේ සෑම දානයක්ම ඉතාම වැදගත්. නමුත් බුද්ධත්වය අවබෝධ කරගත් දා දුන් දානයත් පිරිනිවන් පෑමට පෙර වැළඳූ දානයත් දාන දෙකම ඉතාම වැදගත්. මා විශේෂයෙන්ම සඳහන් කරන්නේ චුන්දගේ දානය ගැනීමෙන් පසුව මා අසනීප වූ නිසා සමාජයෙන් චුන්දට දොස් නැඟීමෙන් වැළකීම සඳහායි. බුදුරදුන්ගේ වැදගත්ම දානවලින් එකක් චුන්ද පූජා කළා. එය ඉතාම වැදගත් සිද්ධියක්'' බුදුරදුන් ආනන්දට කතා කර පැවසූහ.

ටික වේලාවක් විවේක ගැනීමෙන් පසු බුදුරදුන් නැගිට්ටෝය. ''ආනන්ද මට හිරණ්‍යවතී නදියෙන් එගොඩ වන්න ඕනෑ. එගොඩ ඇති සාල වනය ඉතාම සුන්දරයි. ඒ උයන මල්ල රජවරුන්ට අයිති එකක්. ඒ උයන පිහිටා තිබෙන්නේ කුසිනාරාව ප්‍රදේශයේ,'' යැයි ආනන්ද හාමුදුරුවන් අමතා කීවෝය.

## අසූව වැනි පරිච්ඡේදය

# මහා පරිනිර්වාණය

බුදුරදුන් ඇතුළු භික්ෂු පිරිස කුසිනාරාවට ළඟා වන විට ක්‍රමයෙන් ඇඳිරි වැටෙමින් තිබිණි. තමන්ගේ දෙපට සිවුර සල් ගස් දෙක මැද්දේ එළන්න යැයි බුදුරදුන් ආනන්ද හාමුදුරුවන්ට කීවෝය. උතුරු දිසාවට හිස හරවා. බුදුරදුන් බිම දිගා වී වැඩ හුන්නෝය. සියලුම භික්ෂූන් උන් වහන්සේ වටා ඉඳගත්හ. බුදුහාමුදුරුවෝ අද රාත්‍රියේ පිරිනිවන් පාන බව සියලුම දෙනා දැනගත්හ.

''ආනන්ද, බලන්න වසන්ත ඍතුව තාම ආවේ නැහැ. ගස්වල කඳින් ළා රතු දළු ඒම ආරම්භ වී ඇති බව නුඹට පේනවා ද? බුදුරදුන්ගේ සහ භික්ෂූන්ගේ සිවුරු වලට මල්පෙති ඇද හැලෙන ආකාරය? මේ වනය කොපමණ සුන්දර ද? බසින හිරුගේ රූපයත් කොපමණ ලස්සන ද? සාල වනය සනසමින් එන මද සුළඟ කොපමණ සනීප ද? බුදුරදුන් උයනේ ඇති ගස් දෙස බලා පැවසුවෝය.

''භික්ෂූවරුනි, ඔබ වහන්සේලා ඇත්තටම බුදුරදුන්ට සලකනවා නම් උන් වහන්සේගේ දේශනා ගුණධර්ම තම ජීවිතයට සම්බන්ධ කරගන්න. එහෙම වුනොත් බුදුරදුන්ට සැලකුවා වෙනවා,'' යැයි ද පැවසූහ.

සවස් වරුවේ උෂ්ණය අධික වන්නට ගත්තේය. උපවාන හාමුදුරුවෝ බුදුරදුන්ට පවන් අත්තෙන් පවන් සලන්න විය. නමුත් බුදුරදුන් එය නතර කළහ. බසින හිරුගේ දර්ශනයට කිසිවෙකු බාධා කරනවාට බුදුරදුන් කැමති වුණේ නැත.

ආනන්ද හාමුදුරුවන් දකින්න නැත්තේ ඇයි දැයි බුදුරදුන් අනුරුද්ධ හාමුදුරුවන්ගෙන් ඇසුවෝය. ආනන්ද හාමුදුරුවන් සල් ගසක් අල්ලගෙන අඬනවා මා දැක්කා යැයි එක භික්ෂුවක් කීවේය. බුදුරදුන් ආනන්ද හාමුදුරුවන් තමන් ළඟට කැඳවා ගත්තෝය. ''ආනන්ද හාමුදුරුවන්ට කිවුවා ආනන්ද දුක්වෙන්න එපා. තථාගතයන් වහන්සේ වරින්වර ඔබට කිවුවා නේ ද ඉපදෙන සියලුම ධර්ම නැති වන ස්වභාවය ඇති බව. ඉපදීම සමග මරණයත් විකාශය සමග නැතිවීමත් සිදුවන බව මා බොහෝ වාරයක් කියා තිබෙනවා නේද? ආනන්ද ඔබ සිත කය වචනය සම්පූර්ණයෙන් ම යොදා මට කොපමණ හොඳට සේවය කළා ද? මේ ගැන මා ඔබ වහන්සේට ස්තුති වන්ත වෙනවා. ආනන්ද ඔබ වහන්සේ ළඟ අනන්ත ගුණ ඇති බව මා දන්නවා. ඔබ ඉනුත් ඉදිරියට යාහැකි කෙනෙක්. තව ටිකක් උත්සාහ ගත්තොත් ඔබට ඉපදීම මරණය දෙකින් නිදහස් වෙන්න හැකියාව තිබෙනවා. මේ ගැන මා තරම් සතුටු වන කෙනෙක් වෙන නැති බව ඔබ දන්නවා නේද? ඒ නිසා ප්‍රමාද වෙන්න එපා උත්සාහවන්ත වෙන්න. ධ්‍යාන භාවනා කරන්න සසරින් නිදහස් වීමට උත්සාහ දරන්න,'' බුදුරදුන් ආනන්ද හාමුදුරුවෝ අමතා කීහ.

බුදුරදුන් අනෙක් භික්ෂූන් අමතා, ආනන්ද වගේ හිතවත්, අවංක, සේවකයෙකු ලැබීම ඉතාම අපහසු බව. ආනන්ද කවදාවත් මගේ සිවුරු පාත්‍ර බිම දැම්මේ නැහැ. මගේ ලොකු කුඩා සියලුම දේ ඉතාම ආදරයෙන් දැනගෙන ඉටු කළා. ආනන්ද දැනගෙන සිටියා කවදා කවුරුන්ව කොයි වෙලාවේ මා සමග මුනගැස්විය යුතු ද කියා. සියලුම දෙනාගේ හමු වීම ඉතාම දක්ෂ ලෙස සංවිධානය කළා. අතීතයේ හෝ අනාගතයේ කිසි කෙනෙකුට ආනන්ද හාමුදුරුවන් වගේ දක්ෂ උපස්ථායකවරයෙකු ලැබීම දුර්ලභයි,'' පැවසූහ.

''ආචාර්ය වරයාණනි, දැන්ම පිරිනිවන් පාන්න එපා. කුසිනාරාව පිරිනිවන් පෑමට සුදුසු නගරයක් නොවෙයි. කුසිනාරාව ඉතාම පුංචි නගරයක්. ඒ පළාතේ ඇත්තේ පුංචි පුංචි මැටි ගෙවල්. රාජගිරිය, ශ්‍රාවස්තිය, කෝසම්බිය හා වාරාණසිය යන නගර ඔබ

වහන්සේගේ පිරිනිවීමට ඉතාම හොඳ නගර බවයි මට හැඟෙන්නේ,'' යැයි ආනන්ද හාමුදුරුවෝ දෑසේ කඳුළු පිස දමා කීවෝය.

බුදුරදුන් කිවුවා ''ආනන්ද කුසිනාරාව කුඩාවට සිතන්න එපා. පුංචි මැටි ගෙවල් තිබෙන්න පුළුවන්. දැන් නුඹට පෙනෙන්නේ නැද්ද සල් මල් පෙති මගෙත් භික්ෂූන්ගේත් සිවුරුවලට වැටෙන ආකාරය,'' යැයි බුදුන් වහන්සේ කීහ.

තථාගතයන් වහන්සේ අද අන්තිම යාමයේ දී මහා පරිනිර්වානයට පත් වෙනවා, යන ආරංචිය මල්ල රජ වංශයේ අය අතර පැතිර ගියේය. මේ ආරංචිය ලැබුණ විගසම බුදුරදුන්ව දැකීමට ඔවුහු ඉක්මනින්ම පැමිණියහ.

පැමිණි අය අතර සුභද්‍ර නමින් වයසක පූජකයෙක් ද විය. සියලුම දෙනා ක්‍රමානුකූලව බුදුන්ගේ ශරීරය දැකගෙන නමස්කාර කළහ. බුදුරදුන් දකින්න හැකි දැයි සුභද්‍ර ආනන්ද හාමුදුරුවන්ගෙන් ඇසුවේය. දැන් බුදුහාමුදුරුවෝ හොඳටම මහන්සි වෙලයි ඉන්නේ. ඒ නිසා කරදර කරන්න එපා කියා ආනන්ද හාමුදුරුවෝ කීවෝය. ආනන්ද හාමුදුරුවෝ සහ සුභද්‍ර අතර ඇති වූ කතාව බුදුරදුන්ට ඇසිණි. බුදුරදුන් ආනන්ද හාමුදුරුවන්ට කතා කොට සුභද්‍රට එන්න දෙන්න පැවසූහ.

සුභද්‍ර පිරිවැජි තුමා බුදුරදුන් ළඟටම ගොස් බුදුන්ට වැඳ නමස්කාර කළේය. සුභද්‍ර පිරිවැජියා ''මා ඔබ වහන්සේගේ දේශනා ගැන කවුරුත් වර්ණනා මුඛයෙන් කරන කතා ගැන අසා තිබෙනවා. නමුත් දැක ගන්නට ලැබුණේ අදයි. එය මගේ ජීවිතයේ ඉහළම සතුට හැටියට මා සලකනවා. ආචාර්යතුමනි, මා පූර්ණ කාශ්‍යප, මක්ඛලී ගෝසාල, අජිත කේසකම්බලී, පකුද කච්ඡායන, සංජය බෙල්ලට්ඨිපුත්ත, නිඝණ්ටනාථ පුත්ත යන ප්‍රසිද්ධම ආචාර්යවරුන් ගැන අසා තියනවා. ඔබ දන්නා හැටියට මේ අය සම්බෝධිය අවබෝධ කරගත් අයද නැද්ද කියා මා දැනගන්න සතුටුයි,'' සුභද්‍ර පිරිවැජියා පැවසීය.

බුදුරදුන් ''පරිබ්‍රාජක තුමනි, මේ අය සම්බෝධියට පත්වුණා ද නැද්ද යන්න ගැන දැනගැනීම එතරම්ම වැදගත් වන්නේ නැහැ. මා ඔබට ධර්මය ගැන යමක් කියන්නම්. එමඟින් ඔබට සම්බෝධිය අවබෝධ කරගත හැකියි, යනුවෙන් බුදුරදුන් පැවසුවෝය.

බුදුරදුන් සුභද්‍රට මධ්‍යම ප්‍රතිපදාව ගැන දේශනා කර තම හිත සම්පූර්ණයෙන් ම ධර්මය සඳහා විවෘත වූ බව සුභද්‍ර පරිබ්‍රාජකයාට දැනිණි. අන්තිමට තමන්ව පැවිදි කරන ලෙස සුභද්‍ර ඉල්ලා සිටියේය. සුභද්‍රව පැවිදි කරන්න යැයි බුදුරදුන් ආනන්ද හාමුදුරුවන්ට කීවෝය. ආනන්ද හාමුදුරුවෝ සුභද්‍රව පැවිදි කළහ. බුදුරදුන්ගේ අන්තිම ශිෂ්‍යයා හැටියට සුභද්‍රව පිළිගත්තේය. මේ සිද්ධිය සිදුවන විට බුදුරදුන් සමීපයේ භික්ෂූන් වහන්සේ පන්සීයක් පමණ සිටියහ.

''භික්ෂුවරුනි, මා ගැන, ධර්මය ගැන, යම් සැකයක් ඇත්නම් කරුණාකර ඕනෑම කෙනෙකුට සැකය නැතිකර ගැනීම සඳහා කාලය ඇති බව,'' සියලුම භික්ෂූන් අමතා බුදුරදුන් ප්‍රකාශ කළහ. මේ කාරණය සියලුම භික්ෂූන් ඉදිරියේ බුදුරදුන් තුන් වරක් ම ප්‍රකාශ කළෝය. නමුත් කිසිම කෙනෙක් මේ ගැන වචනයක් වත් ඇසුවේ කළේ නැත.

ආචාර්යතුමනි, කොපමණ අසිරියක් ද භික්ෂූන් ගැන ඔබ වහන්සේ සම්පූර්ණ විශ්වාස කරනවා. සියලුම භික්ෂූන් වහන්සේගේ දේශනාව ඉතාම ආදරයෙන් ගෞරවයෙන් තම හදවතට ඇතුළත් කර ගත් බව මෙයින් පේනවා. ඔබ වහන්සේ ගැන හෝ ඔබ වහන්සේගේ දේශනා ගැන හෝ කිසි කෙනෙකුට කිසිම සැකයක් නැති බව මින් තේරුම් ගන්න පුළුවන්,''යැයි ආනන්ද හාමුදුරුවෝ ප්‍රකාශ කළේය.

''ආනන්ද, නුඹ විශ්වාසය අනුව කියනවා. නමුත් බුදුරදුන්ට මේ කාරණාව ප්‍රත්‍යක්ෂ වුණා. මා දන්නවා සියලුම භික්ෂූන් ත්‍රිරත්නය ගැන දැඩි විශ්වාසයක් ඇති බව,'' යැයි බුදුරදුන් පැවසූහ.

බුදුරදුන් ඉතාම ශාන්ත භාවයෙන් භික්ෂූන් දෙස බැලූහ. ''භික්ෂුවරුනි, තථාගතයන් වහන්සේ දූන් කියන්නේ කුමක් ද කියා හොඳ සිහි කල්පනාවෙන් අහන්න. භික්ෂුවරුනි, ඉපදීම සිදුවුනොත් මරණය ස්වාභාවිකයි. සසරින් නිදහස් වීමට සැම විටම උත්සාහ දරන්න.''

බුදුරදුන් තම දෑස වසා ගත්තෝය. මුළු පෘථිවියම කම්පා විය. සල් ගස් සෙලවී මල් පියලි වර්ෂාවක් වැස්සේය. මහා කාරුණික බුදු පියාණන් වහන්සේ අවසන් හුස්ම හෙළා මහාපරිනිර්වාණයට පත් වූ බව සියලුම දෙනා දැන ගත්හ.

මේ පොත කියවීම දැන් නතර කරන්න. දෑස විනාඩියකට වසාගෙන ආශ්වාස ප්‍රශ්වාස කරන්න. ඊට පසුව නැවත පොත කියවන්න.

බුදුරදුන් මහා පරිනිර්වාණයට පත්වූහ. පෘතග්ජන භික්ෂූන් අඬමින් බිම පෙරළුණි. ''බුදුරදුන් දැන් අප ළඟ නැත. බුදුරදුන් මහා පරිනිර්වාණයට පත් වූහ. ලෝකයට ඥානාලෝකය දුන් ඇස වැසී ගියේය. දැන් අපට කාගේ පිහිට ද?'' යැයි භික්ෂූහු අඬ අඬ කීහ. සමහර භික්ෂූහු කිසිම දෙයක් නොකියා නිහඬව සිටියහ. අඬන භික්ෂූන් දැක අනුරුද්ධ හාමුදුරුවෝ ''ඔහොම අඬන්න එපා. බුදුරදුන් මීට පෙර ඉපදීම සහ මරණය ගැන කියා දුන්නා නේද? මේ ගැන කරුණු දන්නවා නම් ඒ කරුණු ඒ ධර්මය පාලනය කරන්න,'' යැයි අවවාද කළහ. මුළු රාත්‍රිය බුදු ගුණ ගැන කවුරු කවුරුත් කතා කළහ; සූත්‍ර දේශනා කළහ; භාවනා කළහ; සමහර භික්ෂූන් නිහඬව සිටියහ. මේ ආකාරයෙන් එදා රාත්‍රිය ගත විය.

## අසූ එක් වන පරිච්ඡේදය

# පැරණි අහසේ අලුත් සඳ

''මිත්‍රය, කුසිනාරාවේ නිලධාරීන්ට බුදුරජුන් පිරිනිවන් පෑ ප්‍රවෘත්තිය දෙන්න. ඒ සමඟම ආදාහන කටයුතු සිදුකරන්න අවශ්‍ය දේ සම්පාදනය කරන්න,'' යැයි පසුදා උදෑසන අනුරුද්ධ හාමුදුරුවෝ ආනන්ද හාමුදුරුවන් අමතා පැවසුවෝය.

ආනන්ද හාමුදුරුවෝ සිවුරු පෙරවා නගරයට ගියෝය. මේ අවස්ථාවේ දී මල්ල රජතුමාගේ නිලධාරීන් පළාතේ ප්‍රශ්න ගැන සාකච්ඡා කිරීමට රැස්වීමක් කැඳවා ඒ සාකච්ඡාවේ යෙදී සිටියේය. බුදුරජුන්ගේ පිරිනිවන් පෑම ගැන අසා සියලුම දෙනා දුකට පත් විය.

බුදුරජුන්ගේ ආදාහන කටයුතු සිදු කරන්න අවශ්‍ය නිසා ඉදිරි නියමිතව තිබුණු සාකච්ඡාව නතර කළහ. සවස් වන විට බුදුරජුන් මහා පරිනිර්වාණයට පත් වූ බව මුළු පළාතේම අයට දැනගන්න ලැබිණි. බොහෝ අය පපුවට ගසමින් අඬන්න පටන් ගත්හ. බුදුරජුන් ජීවත්ව සිටින කාලයේ දැකීමට නොහැකි වීම ගැන සමහර අය දුකට පත් විය. ජනතාව සුවඳ වර්ග, මල් වර්ග, පිදීමට රෙදිවර්ග සහ තව වාද්‍ය නාදද ඇතිව බුදුරජුන්ගේ ශරීරයේ

අන්තිම දර්ශනය සඳහා පැමිණියෝය. සිරිත් පරිදි බුදු ශරීරයට සමහර අය මල් පූජා කළහ; සමහර අය සුවඳ පූජා කළහ. සමහර තූර්ය වාදන මඟින් බුදුන් පිදූහ. සමහර අය ආදාහන කටයුතුවලට සහභාගී වීමට එන භික්ෂූන්ට අවශ්‍ය දානය ආදිය සම්පාදනය කළහ. ටික වේලාවකින් මහා සාල වනය මහා උත්සවයක් සිදුවන තැනක් බවට පත් විණි. භික්ෂූන් වහන්සේලාගේ සූත්‍ර දේශනා නිසා පරිසරයේ අමුතුම වාතාවරණයක් ඇති විය.

දවස් හයක් රෑ හයක් පාවා මුළු නුවරම කුසිනාරාව විවිධ සුවඳ වර්ගවලින් සුවඳවත් කළ අතර තව කෙනෙක් තූර්ය වාදනයෙන් දුක තුනී කිරීමට උත්සහ ගත්හ. සත්වන දා මල්ල රජවරු සුවඳ පැන්වලින් ස්නානය කර තම ශරීරය පිරිසුදු කරගෙන සම්බුදු සිරුර නගරයට රැගෙන ආවෝය. එතනින් රජතුමාගේ නියමය අනුව බුදු සිරුර මකුට බන්ධන මන්දිරය (කෝවිල) ඇති තැනට රැගෙන ගියේය.

රාජකාරියේ යුතුව සිටි නිලධාරීන් රජතුමාගේ නියමය අනුව ආදාහන කටයුතු වත් පිළිවෙත් අනුව සූදානම් කළහ.

බුදුසිරුර විවිධ වර්ගවල රෙදිවලින් කීප විටක්ම සුවඳ කවා ඔතා ඊට පසුව හඳුන් දරවලින් සූදානම් කළ දර සෑයක දේහය තැන්පත් කළේය. සෑයට ගින්දර දැල්වීමට මඳ වේලාවකට පෙර හාමුදුරුවෝ පන්සියයක් භික්ෂූන් සමඟ බුදු සිරුරේ අන්තිම දර්ශනය සඳහා වැඩම කරන බව පණිවිඩකරුවකු දන්වා සිටියේය.

මහා කාශ්‍යප මහරහතන් වහන්සේ චම්පාවෙහි ධර්ම දේශනා කරමිනුයි සිටියේ. වෛශ්‍යාලියේ දී බුදුරජුන් මහ පරිනිර්වාණයට පත් වන බව උන් වහන්සේට අසන්නට ලැබිණි. ඒ සමඟම බුදුරජුන් උතුරු දිසාවට වැඩම කළ බව ද දැනගන්නට ලැබිණි. මේ සමගම භික්ෂූන් සමඟ බුදුරජුන්ව සෙවීම සඳහා පිටත් විය. මහා කාශ්‍යප මහරහතන් වහන්සේ පාවා නුවරට වැඩම කළ විට විපරීත දිසාවෙන් සල්මල් මිටියක් රැගෙන කෙනෙක් එනවා දුටුවේය. දවස් හයකට පෙර බුදුරජුන් කුසිනාරාවේ සල් වනයේ දී මහා පරිනිර්වාණයට පත් වූ බව ඒ මඟියා කීවේය. මේ පණිවිඩය ලැබීමෙන් පසු මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ බුදුරජුන් සෙවීම නතර කළෝය. තමන් සමග

සිටි භික්ෂූන් පන්සියයත් රැගෙන කුසිනාරාව බලා පිටත් විය. මඟදී හමු වූ අශ්වාරෝහකයෙකු හැකි ඉක්මනට ගොස් මහා කාශ්‍යප මහරහතන් වහන්සේගේ වැඩම කරවීම දැනුම් දෙන බවට පොරොන්දු විය.

දවස් හත ගත වන දා දහවල් කාලයේ මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ පන්සියයක් භික්ෂූන් සමඟ මකුට බන්ධන කෝවිල ළඟට සැපත් විණි. සිවුරු විනයානුකූලව පොරවා චිතකය වටා තුන් වරක් පැදකුණු කළෝය. පන්සියයක් භික්ෂූන් සමඟ එක වරම බුදුරදුන්ගේ ශ්‍රී දේහයට නමස්කාර කළහ. ඉන් පසුව ශ්‍රී දේහයට ගිනි ඇවිලීම සිදු විණි. සියලුම භික්ෂූන් සහ උපාසක, උපාසිකා පිරිස හිස නමා ශ්‍රී දේහයට ගෞරව කළහ. ආදාහන කටයුතු අවසානයේ දී චිතකයේ ගිනි නිවුණු විට සුවඳ වතුරින් ඒ ප්‍රදේශයම සුවඳවත් කළේය. ඉතිරි වී තිබුණ ශරීරයේ කොටස් (ධාතු) රත්තරන් කලවලට දැමීය. මකුට බන්ධන දේවාලයේ ආසනය මත ධාතුන් වහන්සේලා පිරුණු රන් භාජන තැබුවේය.

බුදුරදුන්ගේ මහා පරිනිර්වාණය දඹදිව බොහෝ ප්‍රදේශ වලට දැනගන්න ලැබිණි. අසල්වාසී රටවල ජනයාත් බුදුරදුන්ට අන්තිම ගෞරව දක්වන්න එන්න පටන් ගත්තේය. බුදුරදුන්ගේ ශ්‍රී දේහයේ අන්තිම දර්ශනය කරගත නො හැකි අය උන් වහන්සේගේ ශරීරයේ ධාතුවලින් කොටසක් පුද පූජා කිරීම සඳහා ඉල්ලා සිටියේය. මගධ, වෛශාලි, ශාක්‍ය, කෝලිය, බූලය, පාවා, පේට, රාම ග්‍රාම ආදී ප්‍රදේශවල අය සර්වඥ ධාතු රැගෙන ගොස් ස්ථූප සාදා පුද පූජා පැවැත්වූහ.

බුදුරදුන්ගේ ධාතුන් කොටස් අටකට බෙදා වෙන් කරන ලදි. මගධයේ අය, රජගහ නුවර ලිච්ඡවී රජවරු, වෛශාලියේ ශාක්‍ය වරු, කපිලවස්තුවේ බූලී රජවරු, පේට දීපයේ මල්ල රජවරු කුසිනාරාවේ සහ පාවානුවර ස්ථූප සෑදූහ.

මේ කටයුත්ත අවසන් වී ප්‍රභුවරු තම තමන්ගේ ප්‍රදේශ වලට ගිය විට භික්ෂූන් ද තම තමන්ගේ ධර්ම ප්‍රචාර කටයුතු සඳහා පිටත්ව ගියෝය. මහා කාශ්‍යප හාමුදුරුවෝ, අනුරුද්ධ හාමුදුරුවෝ, ආනන්ද හාමුදුරුවෝ, යන තුන් දෙනා එකතු වී බුදු රදුන්ගේ පිණ්ඩපාත පාත්‍රය වේළුවනාරාමයට රැගෙන ගියෝය.

මාසයකට පසු මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ අජාසත්ත රජතුමාගේ සහභාගීත්වයෙන් ධර්මය එක්තැන් කිරීම සඳහා රජගහ නුවර දී සියලුම භික්ෂූන්ගේ අනුදැනුම ඇතිව ඉතාම සුදුසු භික්ෂූන් පන්සිය නමකගේ සහභාගීත්වයෙන් ප්‍රථම සංගීතිය පැවැත්වූහ. වස්සාන කාලයේ ආරම්භ වූ සංගීතිය මාස හයකින් සම්පූර්ණ විය.

කොණ්ඩඤ්ඤ, ශාරිපුත්ත, මුගලන් යන මහ රහතන් වහන්සේලා ගෙන් පසුව ජීවතුන් අතර සිටි වැඩි හිටිම භික්ෂූන් වහන්සේ මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ ය. ඉතාම සරල නිහතමානී ජීවිතයක් ගත කළ භික්ෂූන් වහන්සේ නමක ලෙස මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ ප්‍රධාන ස්ථානයක් දැරුවෝය.

අජාසත්ත රජතුමාගේ උපකාරයෙන් සිදු වූ ප්‍රථම සංගීතියේ විනය පිළිබඳව ප්‍රසිද්ධව සිටි උපාලි හාමුදුරුවන්ට විශේෂ ස්ථානයක් ලැබිණි. ආනන්ද හාමුදුරුවන් ධර්ම භාණ්ඩාගාරික නිසා බුදුරජානන් වහන්සේ දෙසූ සියලුම ධර්ම නැවත ඒ ආකාරයෙන් ම දේශනා කිරීමේ කාර්යය ආනන්ද හාමුදුරුවන්ටම පැවරුවෝය. නමුත් පන්සියයක් භික්ෂූන්ගේ (රහතන් වහන්සේලා) සහාය මේ සඳහා නොඅඩුවම ලැබිණි. මේ රැස්වීමේ දී ශීලය ගැන දෙසූ සියලුම දේ එක් රැස් කර එයට විනය පිටකය කියා නම් තැබවේය. සියලුම දේශනා ධර්ම පිටකය නමින් හැඳින්විණි.

බුදුරදුන් පිරිනිවීමට පෙර තමන් අමතා පුංචි සිකපද අනවශ්‍ය නම් අස් කර ගැනීමට අවසර දෙන බව මේ අතර ආනන්ද හාමුදුරුවෝ භික්ෂූන් වහන්සේලාට දන්වා සිටියෝය. ඒ සිකපද මොනවාද? ඒවා අයත් කර ගන්නේ දැයි භික්ෂූහු ඇසූහ. ඒවා අයින් කර ගත්තා ද කියලා. ආනන්ද හාමුදුරුවෝ කිවුවා බුදු හාමුදුරුවෝ එහෙම කිවුවාට ඒ ගැන අහන්න තමන්ට අමතක වූ බව ඉන් පස්සේ සියලුම දෙනා තීරණය කළා බුදුරදුන් දේශනා කළ සියලුම දේශනා ඒ ආකාරයෙන් ම කිසිම වෙනසක් නො කර අනුගමනය කරන්න ඕන කියලා. කවුරුත් ඒ තීරණය ඉතා ම ගෞරවයෙන් බාර ගත්තා. වෛදික මන්ත්‍ර අනුව සංස්කෘත භාෂාවෙන් නො කිරීමටත් තීරණය කළා. සූත්‍ර පිටකය සහ විනය පිටකය පුංචි කොටස් වලට බෙදා එක එක භික්ෂූන්ට බාර දුන්නා

කටපාඩම් කර ගන්න. පරම්පරාවෙන් පරම්පරාවට බුදුබණ කට පාඩම් කිරීම ආරම්භ වුණේ එදා යි.

***************************************

නේරංජනා නදී ඉවුරේ සිටගෙන සොත්ථිය ගලා බසින වතුර දෙස බලාගෙන සිටියේය. ගඟේ අනිත් පැත්තේ මී හරකුන් බලන දරුවෙක් මී හරකුන් ගඟෙන් එගොඩට ගෙන යෑමට සූදානම් කරන බව දුටුවේය.

දනට අවුරුදු හතලිහකට පෙර තමන් කළ දෙය සොත්ථියට සිහිපත් විය. බුදුරදුන් මේ නදියේ ස්නානය කළ ආකාරයත් සිහිපත් කළේය. එදා දුටු ඇසතු (බෝ ගස) වෙනදාට වඩා අතු කොළ වැඩී විශාල වී තිබෙන ආකාරයත් දුටුවේය. සොත්ථිය එදා රෑ නිදා ගත්තේ බෝ ගස යටයි. ගයාව එදාට වඩා තරමක් ජනගහනය අධිකව තිබූ බවත් ඔහු දැක්කේය. පිප්පලි වෘක්ෂය බෝධි වෘක්ෂය වී දන් කවුරුත් ඒ ස්ථානය පූජා ස්ථානයක් ලෙස ශුද්ධ කර පූජා කරන ආකාරය දකින්න ලැබිණි.

සොත්ථිය සතුටට පත් විය. බුදුරදුන්ගේ ධර්මය සංග්‍රහ කිරීමේ ධර්ම සංගායනාවේ භික්ෂූන් පන්සියය අතර සොත්ථිය ද කෙනෙක් වූ නිසාය ඒ. එසමයේ සොත්ථිය හාමුදුරුවන්ගේ වයස අවුරුදු පනස් හයක් වී තිබිණි. සොත්ථිය හාමුදුරුවන්ගේ අතිජාත ම මිත්‍රයා වූ රාහුල මීට අවුරුදු පහකට කලින් අපවත් වූහ. රාහුල රජ ගෙදරක කෙනෙකි. නමුත් ඉතාම සරල ජීවිතයක් ගත කළේය. මේ නිසා සොත්ථිය හාමුදුරුවෝ රාහුලට තවත් ආදරය කළේය.

රජගහනුවර සිට කුසිනාරාව දක්වා සොත්ථිය හාමුදුරුවෝ බුදුරදුන් සමගයි සිටියේ. බුදුරදුන් මහා පරිනිර්වාණයට පත් වන අවස්ථාවේත් සොත්ථිය හාමුදුරුවෝ බුදුරදුන් සමගම යි සිටියේය. පාවා නුවර සිට කුසිනාරාවට වඩින විට සෑම දෙනා ම ඇසූ ඔබ වඩින්නේ කොහේට ද යන ප්‍රශ්නයට බුදුරදුන් පිළිතුරු දුන්නේ මා යන්නේ උතුරු දිසාවට යන වචනය පමණි. ඉන් ඉදිරියට සිද්ධවන්නට යන්නේ කුමක් ද යැයි සොත්ථිය අවබෝධ කර

ගත්තේය. බුදුරදුන් පා ගමනින් වඩින කිසිම දවසක ගමනේ ලක්ෂයක් ගැන සිතුවේ ඔහු සිතුවේ නැත. වර්තමානයේ ජීවත් වූ වර්තමානයට හිත යොමු කර වර්තමානය මත ශ්‍රී පතුල තැනූ බුදුරදුන්ගේ ගමන් ගැන සොත්ථිය හාමුදුරුවෝ හොඳට දැනගෙන සිටියේය. සෑම ගමනක දී ම බුදුරදුන් විඳි සතුට කොපමණ ද කියා සොත්ථිය හාමුදුරුවෝ දුටුවේය.

බුදුරදුන්ගේ අන්තිම දර්ශනයේ දී මහා කාශ්‍යප මහරහතන් වහන්සේ සමග සුභද්‍ර කළ අභද්‍ර ව්‍යවහාරය ගැන සොත්ථියගේ සිතට කරුණු මතුවෙන්න ගත්තේය. පාවා නුවර සිට කුසිනාරාව දක්වා ගමනේ දී බුදුරදුන් මහා පරිනිර්වාණයට පත් වූ බව අසා තරුණ මදයෙන් මත් වූ සුභද්‍ර ''කමක් නැහැ. වයසක මිනිහා මිය ගියා. දැන් අපට ඕනෑ දෙයක් ඕනෑ ආකාරයකට කරන්න පුළුවන්,'' යැයි කියා සතුටු විය. තරුණ මදයෙන් මත් වූ සුභද්‍රගේ වචනයට මහා කාශ්‍යප හාමුදුරුවෝ කිසිවක් ම නො කියා නිහඬ විය. මේ නිගරු කථාව අසා මහා කාශ්‍යප හාමුදුරුවෝ පුදුමයට පත් විය. නමුත් මේ ගැන ඉවසීම ඉක්ම වූ ආනන්ද හාමුදුරුවෝ සුභද්‍රට පිළිතුරු දුන්නෝය.

''ඔබ ධර්මය ගැන කොපමණ දැන ගත්තත් තවම රහත් භාවයට පත් වුණේ නැති නිසා ප්‍රථම සංගීතියේ දී රහතන් වහන්සේ පමණක් රැගෙන ඔබ වහන්සේව ඉන් නිදහස් කිරීමට තීරණය කළ බව, සංගායනාවට දවස් තුනකට පෙර මහා කාශ්‍යප හාමුදුරුවෝ ආනන්ද හාමුදුරුවන්ට කියුවේය.

මේ ප්‍රශ්නයේ දී ආනන්ද හාමුදුරුවන් පිරිසෙන් වෙන් වී යාවි යැයි කවුරුත් සිතුවේය. නමුත් ආනන්ද හාමුදුරුවන් මහා කාශ්‍යප මහ රහතන් වහන්සේගේ තීරණය ඇසීමෙන් පසු තම කුටියට ගොස් දොර වසාගෙන භාවනා කළහ. සංගායනාව පටන් ගන්නා දවසේ උදෑසන වන විට ආනන්ද හාමුදුරුවෝ අරහත් බව අවබෝධ කර ගත්තෝය.

උදෑසන මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ ආනන්ද හාමුදුරුවන් හමු වූ අවස්ථාවේ මුහුණ දැකීමෙන් කාරණය අවබෝධ කරගෙන නැවත අප දෙදෙනා සංගායනාව වෙලාවට හමුවෙමු යි කීවේය.

නිල් අහසේ සුදු වලාකුළු පා වන ආකාරය සොත්ථියට දැක ගන්න ලැබිණි. හිරු රැස්ද ක්‍රමයෙන් නගිමින් තිබිණි. නදිය ඉවුරේ තණ ගස් මද සුළඟ සමග නැළවෙන ආකාරය වාරාණසී, ශ්‍රාවස්ති, රජගහ නුවර ආදී ප්‍රදේශවල බුදුරදුන් සමඟ ඇවිදීමෙන් ඒ පා ගමන් සමග ලැබූ සතුට ගැන සොත්ථිය වරින්වර සිතුවේය.

බුදුරදුන් තම ශරීරය අත් හැරියෝය. නමුත් සොත්ථියට හැම විටම බුදුන් ජීවමාන බව දැනිණි.

''අවුරුදු හතලිස් පහකට පෙර කිසි කෙනෙක් සම්බෝධිය, බුද්ධත්තවය ආදී වචනවත් අසා තිබුණේ නැත. අද සිවුරු පොරවා ගත් භික්ෂු භික්ෂුනීන් කොපමණ දකින්න ඉන්නවාද? ධර්මය ගැන ඉගෙන ගන්න ධර්ම කේන්ද්‍ර ස්ථාන කොපමණ විවෘත කර තියනවා ද? විවිධ ප්‍රාන්ත වල රජ පවුල්වල අය කොපමණ තුනුරුවන් සරණ සමාදන් වී තියනව ද? සමාජයේ කිසිම පිළිසරණක් නැතිව සිටි කොපමණ පිරිසක් සද්ධර්මය සරණ සමාදන් වී තිබෙනවා ද? අවුරුදු හතලිස් පහකට පමණ පෙර මාත් කොපමණ දුප්පත් පවුලක කෙනෙක් හැටියට ද සිටියේ. අද මාත් සමාජය පිළිගත් භික්ෂූන් වහන්සේ නමක් නේ ද? සොත්ථිය ඔබට දිළින්දාගේ සිට රජතුමා දක්වා ගෞරව කරනවා නේ ද?''

බුදුරදුන් කවුද? සමාජයේ මේ තරම් පරිවර්තනයක් කළේ කොහොම ද? නදිය අසබඩ තණකොළ කපන ළමයි දැක වරින් වර සොත්ථිය හාමුදුරුවන්ගේ මනසට තම අතීත ජීවිතයේ විවිධ දේ මතකයට ආවේය. බුදුරදුන්ට කලින් හා පසුව උන් වහන්සේගේ ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය භික්ෂූන් පිරිනිවන් පෑවේය. නමුත් ඍද්ධි බල ඇති බොහෝ භික්ෂූන් බොහෝමයක් තවම ජීවතුන් අතර ඉන්න බව සොත්තිය දැනගෙන සිටියේය. මේ අය අතර බොහෝ අය තරුණ අයයි.

ළමයි පිරිස මී හරක් ටික නදියෙන් එගොඩට ගන්න ආකාරය දැක සොත්ථිය හාමුදුරුවෝ සතුටින් සිනාසිණි. බොහෝ අය බුදුරදුන් පිරිනිවන් පෑ බව කියති. නමුත් ස්වස්තිට බුදුරදුන් තවම ජීවත් වන බව පෙනේ. බුදුහාමුදුරුවෝ පිරිනිවන් පෑ බව ස්වස්ති හාමුදුරුවෝ කවදාවත්ම පිළිගත්තේ නැත. ස්වස්ති හාමුදුරුවෝ බලන්නේ කොහේ ද? ඒ හැම තැනම දැක්කේ

බුදුරදුන්වමයි. බෝධීන් වහන්සේ නේරංජනා ගඟ, ගං ඉවුර, සුදු වලාකුළු, ගස්වල කොළවල ආදී සෑම තැන ම දුටුවේ බුදුරදුන්මය.

බුදුරදුන් මෙන් කරුණාවෙන් සිනාසීම ජීවිතයේ ඉතා වටිනා දෙය ලෙස සොත්ථිය හාමුදුරුවෝ සිතුවේය.

ලස්සන දිය ඇල්ලක මුල බුදුහාමුදුරුවෝයි. සොත්ථිය හාමුදුරුවන් ඇතුළු මීහරක් බළන ළමයි ඒ දිය ඇල්ලේ ලස්සන අතුළු අපි සැමත් ඒ දිය ඇල්ලේ නාමු. සැම තැනම බුදු රදුන්ම දැකීමට ලැබේවි.

**සමාප්තයි.**

# පැරණි අහසේ අලුත් සඳ

## ආචාර්ය පූජ්‍ය දොඩම්ගොඩ රේවත හිමි



මේ සමගම ස්වස්ති එතනට ළගා විය. ස්වස්ති තමා වෙත දිව එන බව දුටු සිද්ධාර්ථ සිනහසිණි. ටික දුරකට විත් ස්වස්ති සිද්ධාර්ථ දැක මඟ නතර විය. ඔහුගේ මුව විවර විය. සිද්ධාර්ථ ඔහුට කතා කළේය. ''ස්වස්ති,'' ඒ ඇසූ ස්වස්ති, ''ගුරු දේවයාණනි,'' යි පිළිතුරු දුන්නේය. ඔහු දෑත් එකතු කර නමස්කාර කළේය. ටික දුරක් ඉදිරියට පැමිණි ඔහු නැවතත් නතර විය. ඔහු විමතියෙන් යුතුව යළිත් සිද්ධාර්ථ දෙස බලා සිට ''ගුරු දේවයාණනි, ඔබ අද පෙරට වඩා බොහෝ වෙනස්,'' යැයි කීය. සිද්ධාර්ථ ස්වස්තිට ළඟට එන්නැයි කතා කළේය. විමතියෙන් යුතුව ළගට පැමිණි ස්වස්තිගේ අතින් අල්ලාගත් සිද්ධාර්ථ ''ඔබට මොන වගේ වෙනසක් ද අද මගේ පෙනෙන්නේ,'' යැයි ඇසීය.

සිද්ධාර්ථ දෙස ඇසිපිය නොහෙළා බලා සිටිමින් ස්වස්ති පිළිතුරු දුන්නේය. ''මට හරියටම කියන්න බැහැ. ඔබගේ ලොකු වෙනසක් ඇති බව විතරයි කිව හැක්කේ. හරියට ඔබ තරුවක් වෙලා වගෙයි.''

සිද්ධාර්ථ ස්වස්තිගේ හිස පිරිමදිමින් ''වෙන කොයි වගේ වෙනස්කම් ද නුඹට මගේ පෙනෙන්නේ,'' යි ඇසීය.

''ඔබව පෙනෙන්නේ මේ දැන් පිපුණු නෙළුම් මලක් වගෙයි. හරියට ඔබ ගයා ශීර්ෂ කඳු වැටිය මුදුනෙන් සඳ නැඟෙනවා වගෙයි.''

With bad advisors forever left behind,
From paths of evil he departs for eternity,
Soon to see the Buddha of Limitless Light
And perfect Samantabhadra's Supreme Vows.

The supreme and endless blessings
of Samantabhadra's deeds,
I now universally transfer.
May every living being, drowning and adrift,
Soon return to the Pure Land of Limitless Light!

**✻ The Vows of Samantabhadra ✻**

I vow that when my life approaches its end,
All obstructions will be swept away;
I will see Amitabha Buddha,
And be born in His Western Pure Land of
Ultimate Bliss and Peace.

When reborn in the Western Pure Land,
I will perfect and completely fulfill
Without exception these Great Vows,
To delight and benefit all beings.

**✻ The Vows of Samantabhadra Avatamsaka Sutra ✻**

# DEDICATION OF MERIT

May the merit and virtue
accrued from this work
adorn Amitabha Buddha's Pure Land,
repay the four great kindnesses above,
and relieve the suffering of
those on the three paths below.

May those who see or hear of these efforts
generate Bodhi-mind,
spend their lives devoted to the Buddha Dharma,
and finally be reborn together in
the Land of Ultimate Bliss.
Homage to Amita Buddha!

## NAMO AMITABHA
## 南無阿彌陀佛

【斯里蘭卡文：OLE PATH WHITE CLOUDS】
財團法人佛陀教育基金會 印贈
台北市杭州南路一段五十五號十一樓
Printed and donated for free distribution by
**The Corporate Body of the Buddha Educational Foundation**
11F., 55 Hang Chow South Road Sec 1, Taipei, Taiwan, R.O.C.
Tel: 886-2-23951198 , Fax: 886-2-23913415
Email: overseas@budaedu.org
Website:http://www.budaedu.org
**This book is strictly for free distribution, it is not for sale.**
**නොමිලයේ බෙදාදීම පිණිසයි.**
Printed in Taiwan
3,900 copies; September 2010
SR056-8879